බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලා: 28

## සූත්‍රාන්ත පිටකයෙහි

18වන ග්‍රන්ථය

# ඛුද්දකනිකාය

ප්‍රථම භාගය

## ඛුද්දකපාඨ ධම්මපදපාළි උදානපාළි ඉතිවුත්තකපාළි

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි

ලංකා ආණ්ඩුව මගින් ප්‍රකාශිත යි

---

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 28

The Eighteenth Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (1)**

**18**

# KHUDDAKANIKĀYA (I)

## Khuddakapātha Dhammapadapāli Udānapāli Itivuttakapāli

With the Sinhala translation by

**The Tripitaka Translation Committee**

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

*තෙරුවන් සරණයි.*

## බෝදාගම චන්දිම නායක ස්ථවිර

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

- 2557 / 2013 -

**බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ**

**බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක**
**වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි**
**තායිවානයේ ප්‍රධාන සංඝනායක**

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- ❆ පූජ්‍ය අත්තුඩාවේ ඥාණානන්ද නාහිමි
- ❆ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❆ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❆ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- ❆ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ❆ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❆ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❆ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- ❆ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❆ මිලිනා සුමතිපාල මැතිණිය
- ❆ ජගත් සුමතිපාල මැතිතුමා
- ❆ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❆ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❆ සුජිත් මොහොට්ටි මහත්මා
- ❆ රංජිත් අමරසිංහ මහත්මා
- ❆ ගාමිණී කාරියවසම් මහත්මා
- ❆ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❆ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❆ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❆ සිරිසේන හේරත් මැතිතුමා
- ❆ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

පඨමො භාගො

සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකාය

ප්‍රථමභාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"–

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTENTS


| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | පිටුව |
| සංස්කාරක නිවේදනය | ... | .. | | ... | xi |
| ත්‍රිපිටකපරිවර්තන සංස්කාරක මණ්ඩලය | | ... | | ... | xiii |
| උත්තරිතර සංස්කාරක මණ්ඩලය | | ... | | ... | xili |
| සංඥාපනය | ... | ... | ... | ... | xiv-xix |
| සංක්ෂිප්ත නිරූපණය — ABBREVIATIONS | | | | ... | xx |
| පාළිහෝඩිය — PĀLI ALPHABET | | ... | | ... | xxi |
| විෂයසූචි | ... | ... | ... | ... | xxii-xxix |
| පෙළ හා පරිවර්තනය | ... | ... | | ... | 2-485 |
| ගාථාදිපාදානුක්කමණිකා | ... | ... | | ... | 487-496 |
| සඤ්ඤානාමානුක්කමණිකා | ... | ... | | ... | 497-498 |
| පදානුක්කමණිකා | ... | ... | | ... | 499-544 |
| ඛුද්දකපාඨ උපග්‍රන්ථය | ... | ... | | ... | 1-8 |
| ධම්මපද උපග්‍රන්ථය | ... | ... | | ... | 9-33 |
| උදාන උපග්‍රන්ථය | ... | ... | | ... | 34-44 |
| ඉතිවුත්තක උපග්‍රන්ථය | ... | ... | | ... | 45-51 |

# සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක පාළියෙහි සූත්‍රාන්තපිටකයට අයත් **ඛුද්දකනිකායාන්තර්ගත** ඛුද්දකපාඨ ධම්මපද උදාන ඉතිවුත්තක යන ග්‍රන්ථ සතරෙහි පාළි හා සිංහල පරිවර්තනයෙන් යුත් මේ ප්‍රථම භාගය **බුද්ධජයන්ති ග්‍රන්ථමාලාවෙහි** සඞ්ඛ්‍යා වශයෙන් 24 වන ග්‍රන්ථය වේ.

ලඞ්කාබෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වූ දූනට විද්‍යෝදයපරිවෙණාධිපති **කළුකොඳයාවේ සිරි පඤ්ඤාසේඛර** මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් ඛුද්දකපාඨය ද, වැලිතර අම්බරුක්කාරාමයෙහි සුගතශාසනෝදය පරිවෙණාධිපති පණ්ඩිත **අහුන්ගල්ලේ විමලකිත්ති** මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් ධම්මපදපාළිය ද, බලගල්ලේ සරස්වතීපරිවෙණාධිපති පණ්ඩිත **සපුවලානේ ඤාණාලෝක** ස්ථවිරයන් වහන්සේ විසින් උදානපාළි-ය ද, මාතලේ ශ්‍රී ධර්මරාජපරිවෙණාධිපති **ගම්මුල්ලේ චන්දජෝති** නායක ස්ථවිරයන් වහන්සේ විසින් ඉතිවුත්තකපාළිය ද සිංහල භාෂාවට පරිවර්තනය කරණ ලදී. මේ අධිකාරයෙහි සහභාගි වූ පරිවර්තක ස්ථවිරයන් වහන්සේ සතර නම අප හැමගේ කෘතඥතාවට හිමි වෙති. පණ්ඩිත **අහුන්ගල්ලේ විමලකිත්ති** මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් සිංහලයට පරිවර්තනය කොට උපග්‍රන්ථයක් ද ලියන ලද ධම්මපදය පැසසිය යුතු සේ සකස්ව තුබූ බව සිහිපත් කළ යුතු වේ.

ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක සභාවේ අනුමතියෙන් මේ ග්‍රන්ථයන්ගේ සංශෝධනය උත්තරිතර සංස්කාරක මණ්ඩලයට අයත් අග්ගමහාපණ්ඩිත **බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය** මහානායක ස්ථවිරයන් වහන්සේට පවරණ ලදී. ප්‍රාචීන ප්‍රතීචීන භාෂාන්තරයන්හි ප්‍රවීණ වූ බුද්ධධර්මවිෂයයෙහි ධර්මාන්වය-ඥානයෙන් වැඩි සිටුනා වූ, පාළි සංස්කෘත ප්‍රාකෘත ග්‍රන්ථාගත බුද්ධධර්මය පිළිබඳ මතාන්තර හා අර්ථාන්තර විභාවනයෙහි බුහුටි වූ **මෛත්‍රෙය** නායක ස්ථවිරයන් වහන්සේ ස්වකාර්යය මැනැවින් ඉටු කළහ. උන්වහන්සේ විසින් පාළියෙහි බොහෝ තැන් අමුතු ව ලා ව්‍යාඛ්‍යාන කොට පාළිපාඨාන්තර ද, මේ ග්‍රන්ථාගත කරුණු පිළිබඳ සංස්කෘත-ප්‍රාකෘත ග්‍රන්ථයන්හි එන සදෘශ-විසදෘශතා දැනීමට උපයෝගී වූ ශ්ලෝකයන් ද අධොලිපි වශයෙන් යොදා ගාථාදිපාද අනුක්ක-මණිකා ආදිය හා ඛුද්දකපාඨ උදාන ඉතිවුත්තක පොත් තුනට උපග්‍රන්ථ ද සම්පාදනය කරණ ලදී. කටයුතු බොහෝ ඇතත් ස්වායත්ත කොට ගත් කාර්යයෙහි උද්‍යෝගීස්වභාව ඇති නායක ස්ථවිරයානෝ ග්‍රන්ථය මුද්‍රණයෙහි පවත්නා කල්හි ශොධ්‍යපත්‍ර බැලීමෙහි ද යෙදුනාහ.

ධර්මව්‍යාකරණයෙහි නිපුණවූ ස්වතන්ත්‍රබුද්ධිප්‍රභා ඇති පණ්ඩිත **කෝදාගොඩ ඤාණාලෝක** දක්ෂිණලඞ්කාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ විසින් මෙහි ඇතුළත් ඛුද්දකපාඨාදි ග්‍රන්ථයන් පිණිස ඒ ඒ අර්ථකථා-ශ්‍රයයෙන් ලියූ ව්‍යක්ත සංක්ෂෙපනය ඒ ඒ ග්‍රන්ථයන්ගේ ආශයස්වරූප නිරූපණය

කරන්නා සේ ම දූනට විසම්මතියෙන් හා අනභ්‍යාසනයෙන් හානභාගීව යන අපගේ ජාතික සාහිත්‍යයට - ධර්මාර්ථව්‍යාඛ්‍යානයට නිසි වූ සිංහල භාෂාවට රුකුල් දෙන්නේ ද වේ. මෙසෙයින් උන්වහන්සේ සංශෝධකයන් වහන්සේගේ ද අපගේ ද සාධුවාදයට හිමි වෙති. අපගේ අවසාන සංස්කරණයෙන් මුද්‍රිත වූ මේ ග්‍රන්ථයෙහි ද ශෝධ්‍යපත්‍ර බැලීම් ආදියෙන් **පණ්ඩිත ගලගම ධම්මික** ස්ථවිරයන් වහන්සේ ද සහාය වූහ.

ඛුද්දකනිකායෙහි ප්‍රථම භාගය **සම්බුද්ධජයන්ති** නිමිත්තෙන් මුද්‍රිත වන සිංහල පරිවර්තනයෙන් යුත් ත්‍රිපිටක පාළියෙහි සූත්‍රාන්තපිටකයට අයත් ග්‍රන්ථ සඞ්ඛ්‍යාවෙන් අටොළොස්වන ග්‍රන්ථය වේ.

මෙය මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කිරීම සඳහා උපකාරී වූ **ලඞ්කාආණ්ඩුව** ද එහි **සාංස්කෘතික කාර්යාංශයෙහි** අධිකාරීහු ද, **සිංහලජාතියමුද්‍රණාලයෙහි** අධිකාරීන් හා මුද්‍රණ ශිල්පීහු ද, ග්‍රන්ථ පරිවර්තනය හා සංශෝධනය කිරීමෙහි යෙදුනු මහාස්ථවිරයන් වහන්සේ ද ධර්මදානමය පුණ්‍යමහිමයෙන් සුඛභාගී වෙත්වා යි ආශංසනය කරම්හ.

**පරවාහැර වජිරඤාණ ස්ථවිර.**
ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක.

ත්‍රිපිටක කාර්යාලය, ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
දෙමටගොඩ, කොළඹ.

## ත්‍රිපිටක පරිවර්ත්තන සංස්කාරක මණ්ඩලය

1. වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ (සභාපති),
2. පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ (සම්පාදක),
3. කොසෙල්වතුගොඩ රතනජෝති නායක ස්ථවිරයන් වහන්සේ,
4. බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ,
5. හාල්දඬුවන ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේ,
6. අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ,
7. කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරයන් වහන්සේ,
8. පලන්නොරුවේ විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ,
9. දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ,
10. වේරගොඩ අමරමෝලි නායක ස්ථවිරයන් වහන්සේ,
11. පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ,
12. ගලගම සරණඞ්කර ස්ථවිරයන් වහන්සේ,
13. හැගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ,
14. කටුකුරුන්දේ දේවානන්ද නායක ස්ථවිරයන් වහන්සේ,
15. ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
16. කෝදාගොඩ ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ,
17. ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ,
18. මිඩිහේ පඤ්ඤාසීහ නායක ස්ථවිරයන් වහන්සේ,
19. කොස්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ,
20. වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ,
21. තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ,
22. අකුරටියේ අමරවංස නායක ස්ථවිරයන් වහන්සේ,
23. මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ,
24. කරතම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

### උත්තරීතර සංස්කාරක මණ්ඩලය

පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ,
ආචාර්ය පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ,
බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක ස්ථවිරයන් වහන්සේ,
පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක නායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥාපනය

**ඛුද්දකපාඨපාළි:**

**ඛුද්දකපාඨ** යනු "සරණ – සික්ඛාපද – ද්වත්තිංසාකාර – කුමාරපඤ්හ – මඞ්ගලසුත්ත – රතනසුත්ත – තිරොකුඩ්ඩසුත්ත – නිධිකණ්ඩසුත්ත – මෙත්තසුත්ත" විසින් නවප්‍රකාර පාඨයන්ගේ සඞ්ග්‍රහය වෙයි. තෙල පාඨයෝ ධර්මස්කන්ධ වශයෙන් ගනුත් මැ මහත් නො වෙති. එයින් 'ඛුද්දකපාඨ' යනු අන්වර්ථ වෙයි. පඤ්චනිකාය අතර **ඛුද්දකනිකායෙහි** මුලැ සිටුනා පෙළ ද 'ඛුද්දකපාඨ'ය වේ.

මෙහි ලා ශාසනාවතරණය සරණගමනයෙන් වන හෙයින් 'සරණ'ය පළමු වැ ලා දැක්විණ. සසුන්වත් කුලදරුවන් විසින් පළමු හික්මියැ යුතු වන බැවින් දෙවනු 'සික්ඛාපද' දැක්විණ. සික්පෙදෙහි සිටුනා කුලදරුවන්ගේ චිත්තභාවනා පිණිසැ, 'ද්වත්තිංසාකාර'ය තෙවනු කොට දැක්විණ. චිත්තභාවනායෙන් පසු නානාප්‍රකාරයෙන් ප්‍රඥාභාවනාමුඛ දක්වනු පිණිසැ 'කුමාරපඤ්හ'ය සිවුවැනි කොට දැක්විණ. මෙ හැම පරමමඞ්ගල වන හෙයින් 'මඞ්ගල' සූත්‍රය පස්වනු කොට දැක්විණ මඞ්ගල කාරණයෙහි සිටුනාහට ආත්මාරක්ෂාව ස්වයංසිද්ධ නු යි පරාරක්ෂාව පිණිසැ 'රතනසුත්ත'ය සවැනි කොට දැක්විණ. රතනසූත්‍රයෙහි උත්පත්තිය භූතදෝෂවේ නු යි කිසි භූත කෙනකුන් දක්වනු පිණිසැ 'තිරොකුඩ්ඩ' සූත්‍රය සත්වැනි කොට දැක්විණ. තිරොකුඩ්ඩයෙන් පුණ්‍යවිරහිතයන්ගේ විපත් පැවැසේ නු යි පිනැතියන්ගේ සැපත් දක්වනු පිණිසැ 'නිධිකණ්ඩ' සූත්‍රය අටවැනි කොට දැක්විණ. ද්වත්තිංසාකාරයෙන් රාගප්‍රහාණය හා කුමාරප්‍රශ්නයෙන් මෝහප්‍රහාණය හා සිදු කරන කමටහන් පැවැසේ නු යි ද්වෙෂප්‍රහාණයට නිසි කමටහනක් ද කියනු සඳහා 'මෙත්ත' සූත්‍රය නවවැනි කොට දැක්විණ. මේ නව පාඨයන්ගේ නිඃක්ෂෙපයෙන් ඛුද්දකපාඨය සම්පූර්ණ වෙයි. තෙල නිඃක්ෂෙපක්‍රමය පිණිස අර්ථකථාචාරීන් කියන අර්ථාන්තර දනුකැමැතියන් 'අටුවා' බලා දත්තේ යැ.

කුදුගත්සඟියෙහි ඇතුළත් වැ සිටුනා **ධම්මපද – උදාන** ආදියෙහි නොලැබෙන 'පාඨ' ශබ්දය ගෙනැ 'ඛුද්දකපාඨ' යැ යි මෙහි සංඥාතිදේශ වියැ. එහි ලා විශෙෂාර්ථයෙක් ඇද්ද, යනු විමසනු වටනේ යැ. පැරැණියන් එහි විශෙෂාර්ථ උදුරා නොදැක්වුව ද, සසුන් වත් කුලදරුවන් විසින් පාඨ්‍ය පුස්තක වශයෙන් එහි යි **පාඨ** ශබ්දානුසාරයෙන් විශේෂාර්ථය සිතියැ හෙත්තේ යැ. මූලකර්මස්ථාන සඳහා, මඞ්ගලාවමඞ්ගලයෙහි බණ වදාරනු සඳහා, පිරිත් කරනු සඳහා, සතතයෙන් පඨන පාඨනයට නිසි ධර්මප්‍රවචන මෙහි එකසේ පෙනේ.

"බුද්ධං සරණං ගච්ඡාමි – යානි ච අන්තලික්ඛෙ – බුද්ධෙ රතනං පණීතං– වනප්පගුම්බෙ" ආදි පදසටනා ශබ්දයුක්ති අතින් විශෙෂස්ථාන වෙයි. 'යානි වා'යි තුබුව මනා දීර්ඝය 'යානි ව' යි හ්‍රස්ව වැ සිටුනාසේ මෙහි පෙනේ. ස්වරයා පරකල්හි හ්‍රස්වවිධිය පාළියෙහි අප්‍රකට වෙයි. 'රතනතානං' යි තුබුව මනා පදය භාවප්‍රත්‍යයලෝපය ගෙනැ 'රතනං' යි සිටුනාසේ පෙනේ. මෙ ද අප්‍රකට ප්‍රයොගයෙකි. 'වනප්පගුම්බෙ'යි ප්‍රථමෛකවචනයෙහි ඒකාරාන්ත රූපය ද අප්‍රකට ප්‍රයොගයෙකි. මේ පදසටනා දුර්ලභප්‍රයොග විසින් මුගලන් ඇදුරෝ එළවත්. 'සරණං ගච්ඡාමි' යන තැනැ 'සරණං ඉති ගච්ඡාමි' යී. අධ්‍යාහාර්‍ය්‍ය 'ඉති' ශබ්දයෙක් ඇති යි ද, මෙහි 'ඉති' ශබ්දය ලුප්තනිර්දිෂ්ට යැ යි ද, එයින් 'සරණං' යනු ප්‍රථමාන්ත යැ යී ද වෛයාකරණයෝ කියත්. එය භාවනපුංසක වශයෙන් සලකන ඇදුරෝ ද ඇත. මෙසේ වෛයාකරණයන්ගේ විමැසිල්ල ලත් පදරාශියෙක් 'ඛුද්දකපාඨ'යෙහි ඇත.

තෙල ‘ඛුද්දකපාඨය’ සතතයෙන් පරිචිත වේ නම් ඉතා මැනැව. ආත්මාරක්ෂාව උදා වෙයි. පරරක්ෂාව උදා වෙයි. ශීලයෙහි සිටියා වෙයි. කමටහන් නොහලේ ද වෙයි. මඞ්ගලාවමඞ්ගලයෙහි ඔවා දෙන්නට සමත් වූයේ ද වෙයි. එයින් මෙහි ශ්‍රද්ධාපූර්වක වැ ආදරය කරන්නේ මැනැවි.

**ධම්මපදපාළි:**

“ධම්මො ච සො පදඤ්චාති ධම්මපදං” යනු නිරුක්ති වන බැවින් ධර්මසඞ්ඛ්‍යාත පදය ‘ධම්මපද’ නම් වෙයි. මෙහි ‘ධම්ම’ ශබ්ද පාළිය කියයි. “ඉධ භික්ඛවෙ ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං” යනාදි තන්හි සෙයිනි. ‘පද’ ශබ්ද පිහිට කියයි. “සන්තිපදං” යන තන්හි සෙයිනි. කොටස හෝ කියයි. “තස්ස තානි ධම්මපදා අපිලාපනානි” යන තන්හි සෙයිනි. මෙසේ පාළ්‍යර්ථයෙන් ධර්ම වනුයේත්, පිහිට අර්ථයෙන් වේවයි කොටස් අර්ථයෙන් වේවයි පද වනුයේත්, එකෙක් මැ නු යි හේ ‘ධම්මපද’ නම් වන්නේ යැ. මෙහි පිහිට අර්ථ නම්: දුර්ගතියෙහි ද සසරෙහි ද නොවැටියැදෙන අර්ථ යි. කොටස් අර්ථ නම්: පාළිධර්මයෙහි අවයව විසින් සිටුනා බව යි. ‘ධම්මපද’ ශබ්දයෙහි මතු වන නිරුක්ති - අර්ථය මෙසේ හැමට සාධාරණ වතුදු, මෙතැන එකුන්තුන්සියක් කථාවස්තු පිණිසැ දෙසූ සාරසියතෙවිසි ගයෙක් වෙන් කොට දක්වනු ලැබේ. රත්පැහැ නෙසු මලෙහිත් ඇත ද ‘රත්මල්’ කිව එක මැ මලක් ගන්නා සෙයිනි.

සඞ්ගීතිකාරක මහරහත්හු සාරසියතෙවිසි ගය එක්තැන් කොටගෙනැ ‘ධම්මපද’ නමින් වෙන් කොට හඳළහ. එසේ වෙන් කොට ගන්නට හේතු නම්: බුදුන් දිවමන් දවසත් මෙ නියර දෙශනා ‘ධම්මපද’ නැමින් වෙන් කොට හඳළ බව යි. කියන ලද මැ යැ **ධම්පියාටුවාගැටපදසන්නයෙහි**: “බුදුන් සඳ ජු මෙ නියර දේශනා ධම්මපද නම් යී වෙන් කොට හජාරන බැවින් යෙජෙ මෙ”යි. සඞ්ගීතිකාරකයන් විශේෂනාමයෙකින් වෙන් කොට හඳළ තෙල ධර්මපදදේශනාව නම් වෛනෙයසන්තානයෙහි කෙලෙස් විධමා ලන හෙයිනුදු, උත්තානපදව්‍යඤ්ජන හා ගම්භීරාර්ථ ඇති වන බැවිනුදු, ශ්‍රැතිරම්‍ය වැ විමර්දනක්ෂම වන බැවිනුදු, බහුජනප්‍රිය වැ සිටුනාසේ ලොවැ පළට වෙයි.

මෙහි යමක, අප්පමාද, චිත්ත, පුප්ඵ, බාල, පණ්ඩිත, අරහන්ත, සහස්ස, පාප, දණ්ඩ, ජරා, අත්ත, ලොක, බුද්ධ, සුඛ, පිය, කොධ, මල, ධම්මට්ඨවග්ග, පකිණ්ණක, නිරය, නාග, තණ්හා, භික්ඛු, බ්‍රාහ්මණ විසින් වර්ගයෝ සවිසිදෙනෙක් ඇත.

හැමැට පළමු වන ‘යමකවර්ග’ය කථාවස්තු තුදුසක් ඇසිරි කොට සිටුනේ යැ. අප්‍රමාදවර්ගයෙහි නවයෙකැ, චිත්තවර්ගයෙහි නවයෙකැ, පුෂ්පවර්ගයෙහි එකොළොසෙකැ, බාලවර්ගයෙහි තුදුසෙකැ, පණ්ඩිතවර්ගයෙහි එකොළොසෙකැ, අරහන්තවර්ගයෙහි දශයෙකැ, සහස්‍රවර්ගයෙහි තුදුසෙකැ, පාපවර්ගයෙහි දොළොසෙකැ, දණ්ඩවර්ගයෙහි දශයෙකැ, ජරාවර්ගයෙහි නවයෙකැ, අත්තවර්ගයෙහි දශයෙකැ, ලෝකවර්ගයෙහි එකොළොසෙකැ, බුද්ධවර්ගයෙහි නවයෙකැ, සුඛවර්ගයෙහි අටෙකැ, ප්‍රියවර්ගයෙහි නවයෙකැ, ක්‍රෝධවර්ගයෙහි අටෙකැ, මලවර්ගයෙහි දොළොසෙකැ, ධම්මට්ඨවර්ගයෙහි දශයෙකැ, මාර්ගවර්ගයෙහි දශයෙකැ, ප්‍රකීර්ණකවර්ගයෙහි නවයෙකැ, නිරයවර්ගයෙහි නවයෙකැ, නාගවර්ගයෙහි අටෙකැ, තෘෂ්ණාවර්ගයෙහි දොළොසෙකැ, භික්ෂුවර්ගයෙහි දොළොසෙකැ, බ්‍රාහ්මණවර්ගයෙහි එකුන්සතළිසෙකැ යි හැම එකතු කොට ගනුත් මැ, එකුන්තුන්සියක්වන් නිසා වදළ සාරසියතෙවිසිගයෝ වර්ගවිසින් සවිසිබෙයින් බෙදුණේ වෙයි.

වග බැඳැ වෙත් කිරීමෙහි ලා පළමු වන වගෙහි වැටෙන 'යමක' ශබ්ද යුවළ කියයි. **කෘෂ්ණ** - ශුක්ලවිසින් උභයපක්ෂය ඇසිරි කොට වදාළ ගාථා දෙක දෙක ගත්වන බැවින් **'යමකවර්ග'** නම් වෙයි. යමකවර්ගයෙහි මුල් ගය **සක්පල්** තෙරුන් අරභයා වදාළහ. දෙවන ගය අන් කලෙකැ **මට්ඨකුණ්ඩ-ලීන්** අරභයා වදාළහ එක් මැ වස්තුවක් නිසා එක් මැ දිනෙකැ නො වදාළ ද, සඞ්ගීතිකාරක මහරහතුන් ඖචිත්‍යවශයෙන් ලං කොට ගෙනැ 'යමක' නැමින් හඳුන්වමින් වර්ග බෙදමින් පෙළ තැබූසේ සලකන්නේ යැ 'අප්‍රමාදවර්ග' ආදි සෙසු වර්ග ගෙනැ ද නම් ගෙතූ සැටි දූ, පෙළ තැබූ සැටි දූ මෙනියරින් මැ සිතන්නේ මැනැවැ. අප බුදුන් ඒ ඒ කරුණ නිසා ඒ ඒ තන්හි වදාළ ගාථා 'ධම්මපද' නැමින් විසිරැ සිටියෙන් එ හැම එක්තු කොට 'ධම්මපදපාළි' විසින් තබාලූහ ධර්මසංග්‍රාහක මහරහත්හු. මේ යැ 'ධම්මපද' නම්.

ප්‍රාකෘතධර්මපද යැ, දෛවීභාෂාමය ධර්මපද යැ, චීනධර්මපද යැ යි පැරැණි භාෂාන්තරයෙන් ලියූ 'ධර්මපද' ද ඇත. **ඛෝතාන්** දේශයෙහි දී මතු කොට ගත් ප්‍රාකෘතධර්මපදය අපරිපූර්ණ වූවෙකි. චීනධර්මපදය වර්ග එකුන්සාලිසෙකිනුදු, ගාථා සත්සියදෙපනසෙකිනුදු, මහත් වැ සිටුනේ යැ. **උදාන** නමින් වර්ගයෙකුදු එහි ඇතුළු වෙයි. ඵාක්‍යූකිංග් – චූයෞකිංග් යන දෙනමින් පළට ධර්මපදයෝ දෙදෙනෙක් චීනදේශයෙහි ඇත. සකුවෙන් ලියූ 'ධර්මපදය' චීනබසින් නගා ගනුත් මැ ඒ ඒ ඇදුරන් කළ අඩුවැඩිකම් නිසා ඇති වැ ගිය වෙනසැ යි සලකති. මෙකලැ ඒ ඒ දේශයෙහි දේශභාෂායෙන් අරවාගත් ධර්මපද බෙහෙවි. එ හැම 'පාළිධම්මපද'යෙහි අර්ථසඞ්ග්‍රහ වශයෙන් සලකති.

**මිහිඳු** මාහිමියන් මෙරට බුදුසසුන් බබුළුවාලූ තැන් පටන් ධම්මපදය සියබසින් ව්‍යාඛ්‍යාන කළ ආචාර්යවරයෝ බොහෝ වෙති. එහෙයින් මුලැ සිට මැ මෙරට බෞද්ධයන් කෙරෙහි 'ධර්මපද' ය ප්‍රීතිප්‍රමෝද වඩවමින් වන-පොත් වැ සිටුනේ යැ. 'ජාතකකථා' මෙරට බෞද්ධයන්ගේ මන වඩන්නාක් සෙයින් මැ ධර්මපද ද මන වඩනුයේ ම වෙයි. රාගයැ, ද්වේෂ යැ, මෝහ යැ, මද යැ, මාන යැ, සාරම්භ යැ යනාදි හැම කෙලෙස් නිගන්නා උපදේශයෝ මෙහි ඇත. මවුවරුන් පියවරුන් පටන් කොට ආර්යචාරිත්‍රවිධි ඇත. නිද්‍රා තන්ද්‍රා භය ආලස්‍ය දීර්ඝසූත්‍රතා ආදි හානිකර දූය පහ කරන උපදේශයෝ ඇත. යාවුතු සත්පථය නොදැන, උන්මාර්ගයෙහි යමින් අඳුරට වැටෙන, ගුණයෙන් ධනයෙන් පිරිහිනෙහි වැටෙන, යම් මැ කෙනකුන් සත්පථයෙහි නංවා ගුණයෙන් ධනයෙන් අභිවෘද්ධියෙහි පිහිටුවන, උපදෙශමඤ්ජූෂාව නම් ධර්මපදය වෙයි. බෞද්ධයන්ගේ සම්‍යගාජීවය ඔප් නංවන 'ධර්මපදය' ද මෙරට ගිහිපැවිදි දෙපසෙහි 'දිවි-එළි'ය විසින් පළට වැ සිටුනේ යැ. මෙහි වටනාකම දත් පැරැණි තෙරවරුන් පැවිදි වන කුලදරුවන් ලා මුලැදී මැ 'ධම්මපදය' වනපොත් කරවාලූසේ පැරැණි 'කතිකා'බණිනුදු පෙනේ. ''සැදැහැයෙන් පැවිදි-වියටි වැ ආ කෙනෙක් වූ නම් ඇණවුම් සකස්කඩ සතරබණවර **ධම්පියා** පුහුණු කරවා පෙර කී ලෙස ම ජාතිගොත්‍ර විචාරා රෝග බලා නායකනැන් දක්වා වඳවා කතිකාබණ පුහුණු කරවා පැවිදි දිය යුතු'' යන **දඹදෙණි කති-කාවත්** පාඨය විමසන්නේ යැ. ඇදුරෙල් නොවිහිද කළ කතිකා වන බැවින් ඉන් පෙරැ ආචාර්යකුලයෙහි ධම්මපදය වනපොත් කරවා ලීම පැවැතිසේ සල-කන්නේ යැ. එසේ සලකත් මැ මිහිඳු දවස පටන් කොට චාරිත්‍රවශයෙන් අද දවස දක්වා සසුන් වදනා කුලදරුවන් ලා පුහුණු කරවන දහම්පොතක් විසින් තෙල පාළිය ඉතිහාසගත විය. පෙරැ මතු නො වෙයි. අද වුව ද, මෙරට 'ධම්මපදභාණකයෝ' ඇත. බණ වදරන දේශකයෝ හස්තසාරය වශයෙන්

මෙය සලකා ගනිත්. ගිහියන් කෙරෙහි ද අත්පොතක් විසින් මෙය තුබූයේ 'කැප්පිටිපොල' වීරයා මෙලොව හැරපියන කෙණෙහි ඉණවටා දවටාගෙන, තුබූ ධම්මපදය අතට ගෙනැ මිත්‍රයාණ කෙනකුන්ට අවසාන පරිත්‍යාගය වශයෙන් දුන් දනින් දන්නේ යැ. තෙල දහම්පොත ඇසිරි කොට **සාහිත්‍ය-ධර්මසේන** මහතෙරණුවන් සැළ **රතනාවලිය ද** පැරණි ගැටපද සන්න ආදිය ද මෙහි අගය කියනුයන් ප්‍රයෝජන කියනුයෙන් දෙලෝවැඩ කැමැතියන් මෙහි ලා ආදරය කරන්නේ මැනැවි.

**උදානපාළි:**

"කෙනට්ඨෙන උදානං? උදානනට්ඨෙන උදානං. කිමිදං උදානනං නාම? පීතිවෙගසමුට්ඨාපිතො උදාහාරො" යනු අටුවා වචන වන බැවින් උදානනාර්-යෙන් 'උදාන' නම් වෙයි. 'උදානන' නම් ප්‍රීතිවේගයෙන් නඟාලූ තෙපුලි. ප්‍රීති-සෞමනස්‍යහේතුයෙන් ඉතිරැ ගිය තෙපුල 'උදාන' වනසේ මෙහි පැවැසිණ. බොහෝ සෙයින් මෙසේ කියනු ද ධර්මසංවෙගාදීන් ඉතිරැ ගිය තෙපුල ද 'උදාන' ශබ්දයෙන් කියන්නේ යැ. 'උදාන' ශබ්දයෙහි කෙවලනිරුක්තිඅර්ථය බලත් මැ, මූවින් ඉතිරැගිය තෙපුල ගන්නේ යැ. ඉතිරැ යැමෙහි හේතුව ප්‍රීතිසෞමනස්‍යය වෙයි. ධර්මසංවේගාදිය හෝ වෙයි. එයින් ප්‍රීතිසෞම-නස්‍යය නිසා වේවයි, ධර්මසංවේගාදිය නිසා වේවයි මූවින් ඉතිරැ ගිලිහෙන යම් මැ තෙපුලෙක් ඇද්ද හේ 'උදාන' විසින් සලකන්නේ යැ. ශ්‍රාවකනිර-පෙක්‍ෂක වැ නඟන තෙපුල් වන බැවින් 'උදාන' නිසා අභිගමසිද්ධියෙක් නැත. ශ්‍රාවකාපෙක්‍ෂක වැ වදාරන දේශනාධර්මයෙහි ද උදානධර්මයෙහි ද වෙනස එයින් දන්නේ මැනැවැ. ඒ උදානධර්මය ද ගාථාබන්ධ වශයෙනු ද වාක්‍යබන්ධ වශයෙනුදු දෙපරිදි වැ සිටුනේ යැ.

සර්වසඞ්ග්‍රහවශයෙන් සලකත් මැ තෙල උදානධර්මය බුද්ධභාෂිත යැ, ප්‍රත්‍යෙකබුද්ධභාෂිත යැ, ශ්‍රාවකභාෂිත යැ යි තෙවැදෑරුම් වෙයි. එහි ප්‍රත්‍යෙකබුද්ධභාෂිතය 'ඛග්ගවිසාණ' සූත්‍රයෙහි එයි. ශ්‍රාවකභාෂිතය ථෙර-ගාථා 'ථෙරීගාථා'යෙහි එයි, ශක්‍රාදි දෙවියෝ ද ආරාමදණ්ඩ බ්‍රාහමණාදීහු ද ශ්‍රාවකගණයෙහි වැටෙති. ඔවුන්ගේ උදානයෝ ද තෙවළායෙහි ඒ ඒ තැනැ සඳහන් ලත්හ. සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ උදාන මිසැ, උන්ගේ උදාන තෙල **උදානපාළි**යෙහි සඞ්ග්‍රහය පිණිසැ නො එන්නේ යැ. පයර්‍යාප්තිය නවප්‍රකාරයෙන් බෙද වදාරන බුදුන් විසින් තමන් වහන්සේ වදාළ උදන් මිසැ සෙසු උදන් 'උදාන' ශබ්දයෙන් නවඟ සසුන්හිලා නොගත්වන බැවිනි. **අනෙකජාතිසංසාරං**' යනාදිය හා '**අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො**' යනාදිය හා බුද්ධභාෂිත උදන් වුව ද කාරණාන්තරහේතුයෙන් **උදානපාළි**යෙහි සඞ්ග්‍රහය පිණිසැ නොඑනසේ අටුවායෙහි දැක්විණ.

මෙහි බෝධි, මුචලින්ද, නන්ද, මෙඝිය, සොණ, ජච්චන්ධ, චූලල, පාටලිගාමිය විසින් වර්ගයෝ අටදෙනෙක් ඇත. සූත්‍ර වශයෙන් අසූදෙනෙක් ඇත. ගාථා වශයෙන් අනූපස්දෙනෙක් ඇත. බණවර විසින් අඩක් හළ නවදෙනෙක් ඇත. අනුසන්ධි වශයෙන් අසූඑක්දෙනෙක් ඇත මෙසෙයින් තෙල **උදාන-පාළිය** වර්ගාදීන් බෙදී 'උදානාඞ්ග' වශයෙන් නවඟසසුනෙහි බැසැගෙනැ සිටුනේ යැ.

අප බුදුරජාණන් වහන්සේගේ ප්‍රීතිවාක්‍ය එක්තැන් කොට ගෙන හඳුරන්නට ලැබීම නම්, බෞද්ධයනට මහා ලාභයෙක් මැ යි. ප්‍රීතිවාක්‍ය පහළ වනුයේ අරමුණෙහි ප්‍රීතිචෛතසිකයාගේ බලවත්කම් නිසා වෙයි. මෙවන් ප්‍රීතිවාක්‍යයක් තමන්හට උපන් බලවත් අරමුණ කිමෙක් යනු උදානපාළිය කියවා දතහෙන්නේ යැ. අරමුණු විසින් සිටුනා කථා බලත් මැ, බුද්ධචරිතය ගැන ද, ලොකචාරිත්‍ර ගැන ද, දෘෂ්ටිවාද ගැන ද, අවබොධයෙක් නිතැතින් ලැබියැ හෙන්නේ වෙයි පහළ කළ ප්‍රීතිවාක්‍යයෙහි අර්ථ පරීක්ෂා කරත් මැ ධර්මාගීයෙහි පාටවයෙක් ද උදා වෙයි. එසින් බෞද්ධයන් තෙල 'උදාන' වන පොත් කැරුනන්නේ මැනැවි.

මෙහි සත්සති පිළිවෙළින් නො එයි. එසේ නොඑනුයේ හැම සතියෙක පහළ කළ 'උදාන' නැති හෙයිනි. ආනන්ද තෙරණුවන් ම 'නිදාන' තැබුව ද, "එවං මෙ සුතං ... අථ ඛො ආයස්මා ආනන්දො" (6.10.) යනාදි විසින් තැබූ නිදානපාඨයෙක් වෙයි. තමන් ගැන ම එසේ 'නිදාන' තබනු කිම යනු සොයන්නට වටනේ යැ. නිදානපාඨ එක්මහක් ගෙන තුබුව මනා බැවින් ඒ සැටියෙන් තැබිණ. කථාසිද්ධිය තමන් පිළිබඳ වුව ද, "එවං මෙ සුතං"යි නිදාන තබනු 'නිදානසම්ප්‍රදාය' පිණිසැ වෙයි.

මෙසියවර්ගයෙහි **ගොපාලසූත්‍රයෙහි** ලා 'අඤ්ඤතරො ගොපාලකො' යනුවෙන් සඳහන් කළ ගොපාල නම් නන්දගොපාල වෙයි. උන්ගේ මරණය දක්වමින් 'ලුද්දකො විජ්ඣිත්වා මාරෙසි'යි ධම්මපියාටුවායෙහි කීහ "අඤ්ඤතරෙන පුරිසෙන සීමන්තරිකාය ජීවිතා වොරොපිතො" යි උදාන් පෙළෙහි වදාළහ ධම්මපියාටුවාගැටපදයෙහි දී "වැද්දෙක් විද මැරී. හෙළටුවායෙහි වෙරියෙක් විද මැරිය යෙත්. උදාන් අටුවායෙහි වටක් නිසා වෙරබද් මිනිසෙක යෙත්" යනු කියති. මෙ හැම සසඳත් මැ ඒ ඒ ඇදුරෙල්'හි නන්දගොපාලයන්ගේ මරණය වෙන් වෙන් ලෙසෙකින් ගත්සේ පෙනේ. ගැටපදයෙහි 'වට' ශබ්දයෙන් 'ආවාට'ය කියති යි අදහස් ගනුත් මැ, උදාන් අටුවායෙහි දී 'තළාක' ශබ්දයෙන් එය පැවැසිණැ යි නිශ්චය කළහෙන්නේයැ. ගැටපදය හෙළටුවායෙහි සිට "උදාන සුත්තන්තෙන විත්ථාරෙත්වා කථෙතබ්බං" යි උදානසූත්‍රාන්තයෙන් විස්තර කළමනාසේ කියතුදු අද ඒ විස්තරය ඇතිසේ නොපෙනේ. හෙළටුවා නැතිහෙයිනි. හෙළටුවායෙහි සිටි විස්තරාර්ථ පාළිඅටුවා කළතැන් සිට අභාවයට ගිය බව මෙබඳු නොයෙක් තැනින් පෙනේ.

**ඉතිවුත්තකපාළි:**

"වුත්තං හෙතං භගවතා, වුත්තමරහතාති මෙ සුතං" යනු 'ඉතිවුත්තක' පාළියෙහි මූලපාඨ එන සැටි වෙයි. දීඝාගමාදියෙහි දී 'එවං මෙ සුතං එකං සමයං' යනාදීන් දෙශකාල ආදි කරුණු රැසක් නිදානයෙහි ලා එළවතුදු, මෙහි දෙශකමාත්‍ර මිසැ තෙසු කිසිදු දෑයෙක් ප්‍රකට වැ නො එයි. **ඛුජ්ජුත්තරාවන්** බුදුන් හමුයෙහි ඇසූ ඇසූ බණ **උදයන** රජුගේ **සාමාවතී** ආදී ඇතොරනට දෙසත් මැ, ඇය තැබූ පාඨ වන හෙයින් දෙශකාලාදිය ඉතිවුත්තකයෙහි නැතිසේ කෙව්වාද විසින් කියති. මේ පාළිය සූත්‍ර ප්‍රමාණවශයෙන් වේවයි, වර්ගසංයුක්තාදි වශයෙන් වේවයි චතුරාගමයෙහිදු ගණනට නො එයි. එසින් මූලපාඨයෙහි සිටුනා 'වුත්ත' ශබ්දය හා 'ඉති' ශබ්දය හා දෙක එක් කොට ගෙනැ 'ඉතිවුත්තක'යැ යි සංඥානිර්දේශය වියැ. මූලපාඨයෙහි 'වුත්තං හි එතං භගවතා'යි පද බිඳ ගත් කලැ 'හි-කාර'ය ව්‍යාඛ්‍යානීය දෙයි. තෙල සූත්‍රරාශිය

භාග්‍යවතුන් වහන්සේගේ මැ භාෂිත බව එයින් හෙළි කරන්නේ යැ. “භාග්‍යවතුන් වහන්සේගේ මැ භාෂිතයෙකැ, අනෙකෙකුගේ භාෂිත නොවෙති”යි ආප්තප්‍රමාණ වශයෙන් ගතම්නාසේ දක්වන්නේ යැ.

මෙහි ඒකක-ද්වික-ත්‍රික චතුෂ්ක වශයෙන් නිපාතයෝ සතර දෙනෙකි සූත්‍රපිටකපර්‍ය්‍යාපන්න වෙයි. පඤ්චනිකාය අතුරෙන් ‘ඛුද්දකනිකාය’ පර්‍ය්‍යාපන්න වෙයි. නවාඞ්ගශාසනයෙහි ලා ‘ඉතිවුත්තකාඞ්ග’ වෙයි. සූත්‍රවශයෙන් පරිගණනා කරත් මැ එකකනිපාතයෙහි සත්විස්සෙකැ, දුකනිපාතයෙහි දෙවිස්සෙකැ, තිකනිපාතයෙහි පනසෙකැ, චතුක්කනිපාතයෙහි තෙලෙසෙකැයි සූත්‍රයෝ එක්සිය දොළොස්දෙනෙක් ඇත. මෙසේ ‘ඉතිවුත්තකපාළි’ ය සම්පූර්ණ වෙයි.

**ව්‍යාඛ්‍යානය.**

‘ඛුද්දකපාඨ - ධම්මපද - උදාන - ඉතිවුත්තක’ යන සතරෙහි ව්‍යාඛ්‍යාන තෙල ග්‍රන්ථයෙහි සියබසින් තබා ඇත. දේශභාෂායෙහිදු තර්කව්‍යාකරණාදි ශාස්ත්‍රයෙහිදු ස්වසමයසමයාන්තරයෙහිදු හසළ බුද්ධි ඇති, අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක හිමිපාණන් සකස් කළ තෙල ව්‍යාඛ්‍යාන අත්‍යර්ථයෙන් මැ ආඪ්‍ය වෙයි. අර්ථකථානුගත කොට කළ ව්‍යාඛ්‍යාන වන හෙයින් මෙහි අර්ථශුද්ධි ඇත. සියබසෙහි සංවර්ධනය පිණිසැ හිතකර වන ලෙසින් ව්‍යක්තභාෂායෙන් නිබන්ධ වන බැවින් භාෂාවිශයෙනුදු ආඪ්‍යභාවය ඇත. ධර්මප්‍රදේශ අවබෝධයට නිසියේ ගැට බිඳැ ලියුවන බැවින් ප්‍රසාදගුණය ද ඇත. මෙසේ තෙල ව්‍යාඛ්‍යාන මනහරසේ කියම්හ.

කියැ යුතු දැයෙක් ඇත. ධම්මපදපාළියෙහි පාඨාන්තරරාශියෙක් මෙහි යෙදිණ. එ හැමයෙහි මූලය ධම්මපදපාළිය මැ වෙයි. මහාභාරත-මනුස්මෘති ආදියෙහි දු ධම්මපද ආදියෙහි දු අර්ථවශයෙන් සම්පාඨ ඇත. වෙනස භාෂා නානාත්වය වෙයි. එබඳු පාඨ දක්නා, ගුරුපාශ්‍රය නොලත්, සැදූ නැති කිසි කෙනෙක් උත්පථයෙහි යමින් “අසෝ තැනින් ගෙනැ බස බිඳැ ලියු දැයෙකැ මේ” යි ඇඟිලි නඟා ඇතැම් ධම්පද ගාථා දක්වති. ඒ උන්ගේ මතිමාත්‍ර වස් මුත් යථාර්ථ නො වෙයි. මෙහි ලියූ පාඨාන්තර දකුත් මැ, “එයින් බසැ බිඳැ ධම්මපද ගෙතිණැ” යි නොගන්නේ මැනැවි.

මෙහි ලා කුදුගත් සතරක් සැකෙවින් හඳුන්වා ලූම්හ. සඟි පිළිබඳ කොට වේවයි, සඬහීනි පිළිබඳ කොට වේවයි, භාෂ්‍යකථා දනුකැමැතියන් **මනවගට ලියූ ප්‍රස්තාවනා** බලන්නේ ය. දවරැය වෙහෙස ධරමින් ජිනචක්‍රය දියුණු කරනු වස් සියබසින් ලියන තෙල ව්‍යාඛ්‍යාන සියදනහට දෙලොව වැඩ සඳහා වේවයි පතම්හ. මේ සංඥාපනය සැපැයීමෙහි දී පණ්ඩිත පරවාහැර **පඤ්ඤානන්ද** (බී. ඒ.) ස්ථවිරයන් වහන්සේ ද කරුණු උපුටා ගැනීමෙහි ලා වහල් වූයේ අවසානවශයෙන් ඔබට තියු පිරිනමමින් සඳහන් කරම්හ.

**කෝද්දූගොඩ ඤාණාලෝක ස්ථවිර**

විද්‍යාවංශ පිරිවෙන,
අගංගම.

# සඞ්කේතනිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සී. | —— | සීහළ-තාලපණ්ණපොත්ථකං |
| සීමු. | —— | සීහළක්ඛර-මුද්දිතපොත්ථකං |
| ස්‍යා. | —— | ස්‍යාමක්ඛර-මුද්දිතපොත්ථකං |
| මජසං. | —— | මරම්මඡට්ඨසඞ්ගීති-පිටකපොත්ථකං |
| PTS. | —— | Pali Text Society-editions |

# THE PĀLI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

යya රra ලla වva සsa හha ළḷa අංṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙkē | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhē | ඛොkhō |
| ගga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්කkka | ඤ්චñca | ත්වtva | ම්ඵmpha |
| ක්ඛkkha | ඤ්ඡ=ඤ්ඡñcha | ද්දdda | ම්බ=ම්බmba |
| ක්‍යkya | ඤ්ජ=ඤ්ජñja | ද්ධ=ද්ධddha | ම්භmbha |
| ක්‍රිkri | ඤ්ඣñjha | ද්‍රdra | ම්මmma |
| ක්වkva | ඤ්ඤñña | ද්ව=ද්වdva | ම්හmha |
| ඛ්‍යkhya | ඤ්හñha | ධ්වdhva | ය්‍ය=ය්‍යyya |
| ඛ්වkhva | ට්ටṭṭa | න්තnta | ය්හyha |
| ග්ගgga | ට්ඨ=ට්ඨṭṭha | න්ථntha | ල්ලlla |
| ග්ඝggha | ඩ්ඩḍḍa | න්දnda | ල්‍යlya |
| ග්‍රgra, | ඩ්ඪḍḍha | න්ධndha | ල්හlha |
| ඞ්කṅka | ණ්ටṇṭa | න්නnna, | ව්හvha |
| ඞ්ඛṅkha | ණ්ණṇṇa | න්හnha | ස්මsma |
| ඞ්ගṅga | ණ්ඨṇṭha | ප්පppa | ස්වsva |
| ඞ්ඝṅgha | ණ්ඩ=ණ්ඩṇḍa | ප්ඵppha | ස්සssa |
| ච්චcca | ණ්හṇha | බ්බbba | හ්මhma |
| ච්ඡccha | ත්තtta | බ්භbbha | හ්වhva |
| ජ්ජjja | ත්ථttha | බ්‍රbra | ළ්හḷha |
| ජ්ඣjjha | ත්‍රtra | ම්පmpa | |

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

# ඛුද්දකනිකායො

## පඨමභාග-විසයසූචි

### ඛුද්දකපාඨපාළි


| විසයා | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 1. | සරණගමනං | ... | ... | ... | 2 |
| 2. | දසසික්ඛාපදං | ... | .... | ... | 2 |
| 3. | ද්වත්තිංසාකාරං | ... | ... | ... | 4 |
| 4. | කුමාරපඤ්හා | ... | ... | ... | 4 |
| 5. | මඞ්ගලසුත්තං | ... | ... | ... | 6-8 |
| 6. | රතනසුත්තං | ... | ... | ... | 8-14 |
| 7. | තිරොකුඩ්ඩසුත්තං | ... | ... | ... | 14-16 |
| 8. | නිධිකණ්ඩසුත්තං | ... | ... | ... | 16-20 |
| 9. | මෙත්තසුත්තං | ... | ... | ... | 20-22 |


ඛුද්දකපාඨපාළි නිට්ඨිතා.

---

### ධම්මපදපාළි


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | යමක | වග්ගො | ... | ... | ... | 26-30 |
| 2. | අප්පමාද | ,, | ... | ... | ... | 30-32 |
| 3. | චිත්ත | ,, | ... | ... | ... | 34-36 |
| 4. | පුප්ඵ | ,, | ... | ... | ... | 36-38 |
| 5. | බාල | ,, | ... | ... | ... | 38-40 |
| 6. | පණ්ඩිත | ,, | ... | ... | ... | 40-44 |
| 7. | අරහන්ත | ,, | ... | ... | ... | 44-46 |
| 8. | සහස්ස | ,, | ... | ... | ... | 46-50 |
| 9. | පාප | ,, | ... | ... | ... | 50-54 |
| 10. | දණ්ඩ | ,, | ... | ... | | 56-60 |
| 11. | ජරා | ,, | ... | ... | ... | 60-64 |
| 12. | අත්ත | ,, | ... | ... | ... | 64-66 |
| 13. | ලොක | ,, | ... | ... | ... | 66-70 |
| 14. | බුද්ධ | ,, | ... | ... | ... | 70-74 |


පඨමක භාණවාරං


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15. | සුඛ | වග්ගො | ... | ... | ... | 74-78 |
| 16. | පිය | ,, | ... | ... | ... | 78-80 |
| 17. | කොධ | ,, | ... | ... | ... | 80-84 |
| 18. | මල | ,, | ... | ... | ... | 84-88 |
| 19. | ධම්මට්ඨ | ,, | .... | ... | ... | 88-92 |

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| 20. | මග්ග | වග්ගො | 92-96 |
| 21. | පකිණ්ණක | ,, | 96-100 |
| 22. | නිරය | ,, | 100-104 |
| 23. | නාග | ,, | 104-108 |
| 24. | තණ්හා | ,, | 108-114 |
| 25. | භික්ඛු | ,, | 114-118 |
| 26. | බ්‍රාහ්මණ | ,, | 118-128 |

වග්ගුද්දානං

ගාථුද්දානං

ධම්මපදපාළි නිට්ඨිතා.

---

# උදානපාළි

**1. බොධිවග්ගො** **130-146**

| | | | |
|---|---|---|---|
| 1. | පඨමබොධි | සුත්තං | 130 |
| 2. | දුතිය බොධි | ,, | 132 |
| 3. | තතිය බොධි | ,, | 132-134 |
| 4. | නිග්‍රොධ | ,, | 134 |
| 5. | ථෙර | ,, | 136 |
| 6. | කස්සප | ,, | 136-138 |
| 7. | පාවා | ,, | 138 |
| 8. | සඞ්ගාමජි | ,, | 138-140 |
| 9. | ජටිල | ,, | 140 |
| 10. | බාහිය | ,, | 142-146 |

බොධිවග්ගො පඨමො.

**2. මුචලින්දවග්ගො** **148-168**

| | | | |
|---|---|---|---|
| 1. | මුචලින්ද | සුත්තං | 148 |
| 2. | රාජ | ,, | 148-150 |
| 3. | දණ්ඩ | ,, | 150 |
| 4. | සක්කාර | ,, | 152 |
| 5. | උපාසක | ,, | 154 |
| 6. | ගබ්භිනී | ,, | 154-156 |
| 7. | එකපුත්ත | ,, | 156-158 |
| 8 | සුප්පවාසා | ,, | 158-164 |
| 9. | විසාඛා | ,, | 164-166 |
| 10. | භද්දිය | ,, | 166-168 |

මුචලින්දවග්ගො දුතියො.

| විෂයා | | පිටඅඞ්කා |
|---|---|---|
| | **3. නන්දවග්ගො** | **170-194** |
| 1. | කම්ම සුත්තං ... ... ... | 170 |
| 2. | නන්ද ,, ... ... ... | 170-176 |
| 3. | යසොජ ,, ... ... ... | 176-182 |
| 4. | සාරිපුත්ත ,, ... ... ... | 182 |
| 5. | කොලිත ,, ... ... .... | 182 |
| 6. | පිලින්දිවච්ඡ ,, ... ... ... | 184 |
| 7. | කස්සප ,, ... .... ... | 184-186 |
| 8. | පිණ්ඩපාතික ,, ... ... ... | 188-190 |
| 9. | සිප්ප ,, ... ... ... | 190-192 |
| 10. | ලොකවොලොකනසුත්තං ... ... ... | 192-194 |
| | **නන්දවග්ගො තතියො.** | |
| | **4. මෙඝියවග්ගො** | **194-220** |
| 1. | මෙඝිය සුත්තං ... ... ... | 194-200 |
| 2. | උද්ධත ,, .... ... ... | 202 |
| 3. | ගොපාල ,, ... ... ... | 202 204 |
| 4. | ජුණ්හ ,, ... ... ... | 204-206 |
| 5. | නාග ,, ... ... ... | 208-210 |
| 6. | පිණ්ඩොල ,, ... ... ... | 210-212 |
| 7. | සාරිපුත්ත ,, ... ... ... | 212 |
| 8. | සුන්දරී ,, ... ... ... | 212-218 |
| 9. | උපසෙන ,, ... ... ... | 218 |
| 10. | සාරිපුත්ත ,, ... ... ... | 218-220 |
| | **මෙඝියවග්ගො චතුත්ථො.** | |
| | **5. සොණවග්ගො** | **220-248** |
| 1. | රාජ සුත්තං ... ... ... | 220-222 |
| 2. | අප්පායුක ,, ... ... ... | 222 |
| 3. | සුප්පබුද්ධකුට්ඨි ,, ... ... ... | 222-226 |
| 4. | කුමාරක ,, ... ... ... | 228 |
| 5. | උපොසථ ,, ... ... ... | 228-238 |
| 6. | සොණ ,, ... ... ... | 238-244 |
| 7. | රෙවත ,, ... ... ... | 246 |
| 8. | ආනන්ද ,, ... ... ... | 246 |
| 9. | සද්ධායමාන ,, ... ... ... | 248 |
| 10. | පන්ථක ,, ... ... ... | 248 |
| | **සොණවග්ගො පඤ්චමො.** | |
| | **6. ජච්චන්ධවග්ගො** | **250-276** |
| 1. | ආයුසඞ්ඛාරඔස්සජ්ජන සුත්තං ... ... | 250-254 |
| 2. | ජටිල ,, ... ... | 254-256 |
| 3. | පච්චවෙක්ඛන ,, ... ... | 258 |

| විසයා | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 4. පඨමනානාතිත්ථිය | සුත්තං | ... | ... | 258-262 |
| 5. දුතියනානාතිත්ථිය | ,, | ... | ... | 264-266 |
| 6 තතියනානාතිත්ථිය | ,, | ... | ... | 266-270 |
| 7. සුභූති | ,, | ... | ... | 272 |
| 8. ගණිකා | ,, | ... | .... | 272-274 |
| 9. උපාති | ,, | ... | ... | 274 |
| 10. තථාගතුප්පාද | ,, | ... | ... | 276 |

ජච්චන්ධවග්ගො ඡට්ඨො.

| | | | | |
|---|---|---|---|---|
| | **7. චූළවග්ගො** | | | **278-288** |
| 1. පඨමභද්දිය | සුත්තං | ... | ... | 278 |
| 2. දුතියභද්දිය | ,, | ... | ... | 278 |
| 3. සත්ත | ,, | ... | ... | 280 |
| 4 දුතියසත්ත | ,, | ... | ... | 280 |
| 5. ලකුණ්ටකභද්දිය | ,, | ... | ... | 282 |
| 6. තණ්හාක්ඛය | ,, | ... | ... | 282-284 |
| 7. පපඤ්චක්ඛය | ,, | ... | ... | 284 |
| 8. කච්චාන | ,, | ... | ... | 284 |
| 9. උදපාන | ,, | ... | ... | 286 |
| 10. උදෙන | ,, | ... | ... | 288 |

චූළවග්ගො සත්තමො.

| | | | | |
|---|---|---|---|---|
| | **8. පාටලිගාමියවග්ගො** | | | **290-316** |
| 1. පඨමපරිනිබ්බාන | සුත්තං | ... | ... | 290 |
| 2. දුතියපරිනිබ්බාන | ,, | ... | ... | 290 |
| 3. තතියපරිනිබ්බාන | ,, | ... | ... | 292 |
| 4. චතුත්ථපරිනිබ්බාන | ,, | ... | ... | 292-204 |
| 5. චුන්ද | ,, | ... | ... | 294-302 |
| 6. පාටලිගාමිය | ,, | ... | ... | 302-310 |
| 7. ද්විධාපථ | ,, | ... | ... | 310 |
| 8. විසාඛා | ,, | ... | ... | 312-314 |
| 9. පඨමදබ්බ | ,, | ... | ... | 314-316 |
| 10. දුතියදබ්බ | ,, | ... | ... | 316 |

පාටලිගාමියවග්ගො අට්ඨමො.


උදානපාළි සමත්තා.

# ඉතිවුත්තකපාළි

## එකකනිපාතො


| විසයො | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| | **පඨමො වග්ගො** | | **318-326** |
| 1. | ලොභ | සුත්තං | 318 |
| 2. | දොස | ,, | 318 |
| 3. | මොහ | ,, | 320 |
| 4. | කොධ | ,, | 320 |
| 5. | මක්ඛ | ,, | 320-322 |
| 6. | මාන | ,, | 322 |
| 7. | සබ්බපරිඤ්ඤ | ,, | 322-324 |
| 8. | මානපරිඤ්ඤ | ,, | 324 |
| 9. | ලොභපරිඤ්ඤ | ,, | 324-326 |
| 10. | දොසපරිඤ්ඤ | ,, | 326 |
| | **පාටිභොගවග්ගො පඨමො.** | | |
| | **දුතිය වග්ගො** | | **328-338** |
| 1. | මොහපරිඤ්ඤ | සුත්තං | 328 |
| 2. | කොධපරිඤ්ඤ | ,, | 328 |
| 3. | මක්ඛපරිඤ්ඤ | ,, | 330 |
| 4. | අවිජ්ජානීවරණ | ,, | 330 |
| 5. | තණ්හාසංයොජන | ,, | 332 |
| 6. | පඨමසෙඛ | ,, | 332 |
| 7. | දුතියසෙඛ | ,, | 334 |
| 8. | සඞ්ඝභෙද | ,, | 334 |
| 9. | සඞ්ඝසාමග්ගි | ,, | 336 |
| 10. | පදුට්ඨපුග්ගල | ,, | 336-338 |
| | **වග්ගො දුතියො.** | | |
| | **තතියො වග්ගො** | | **338-348** |
| 1. | පසන්නචිත්ත | සුත්තං | 338 |
| 2. | මාපුඤ්ඤභායි | ,, | 340 |
| 3. | උභොඅත්ථ | ,, | 342 |
| 4. | අට්ඨිපුඤ්ජ | ,, | 342 |
| 5. | සම්පජානමුසාවාද | ,, | 344 |
| 6. | දානසංවිභාග | ,, | 344 |
| 7. | මෙත්තාචෙතොවිමුත්ති | ,, | 346-348 |
| | **වග්ගො තතියො.** | | |


**එකකනිපාතො නිට්ඨිතො.**

## දුකනිපාතො


| විසයා | | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|---|
| | **පඨමො වග්ගො** | | | | | **348-358** |
| 1. | පඨමභික්ඛු | සුත්තං | ... | ... | ... | 348 |
| 2 | දුතියභික්ඛු | ,, | ... | ... | ... | 350 |
| 3. | තපනීය | ,, | ... | ... | ... | 350 |
| 4. | අතපනීය | ,, | ... | ... | ... | 352 |
| 5. | පාපකසීල | ,, | ... | ... | ... | 352 |
| 6. | භද්දකසීල | ,, | ... | ... | ... | 354 |
| 7. | අනාතාපී | ,, | ... | ... | ... | 354 |
| 8. | පඨමජනකුහන | ,, | ... | ... | ... | 356 |
| 9. | දුතියජනකුහන | ,, | ... | ... | ... | 356 |
| 10. | සොමනස්ස | ,, | ... | .. | | 358 |

**වග්ගො පඨමො.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **දුතියවග්ගො** | | | | | **360-376** |
| 1. | විතක්ක | සුත්තං | ... | ... | ... | 360 |
| 2. | දෙසනා | ,, | ... | ... | ... | 362 |
| 3. | විජ්ජා | ,, | ... | ... | ... | 362 |

**(පඨමක භාණවාරං)**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4. | පඤ්ඤාපරිහානි | ,, | ... | ... | ... | 364 |
| 5. | සුක්කධම්ම | ,, | ... | ... | ... | 364-366 |
| 6. | අජාත | ,, | ... | ... | ... | 366 |
| 7. | නිබ්බානධාතු | ,, | ... | ... | ... | 368 |
| 8. | පටිසල්ලාන | ,, | ... | ... | ... | 370 |
| 9. | සික්ඛානිසංස | ,, | ... | ... | ... | 370 |
| 10. | ජාගරිය | ,, | ... | ... | ... | 372 |
| 11. | ආපායික | ,, | ... | ... | ... | 372-374 |
| 12. | දිට්ඨිගත | ,, | ... | ... | ... | 374-376 |


**වග්ගො දුතියො.**

**දුකනිපාතො නිට්ඨිතො.**

## තිකනිපාතො


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **පඨමො වග්ගො** | | | | | **378-386** |
| 1. | අකුසලමූල | සුත්තං | ... | ... | ... | 378 |
| 2. | ධාතු | ,, | ... | ... | ... | 378 |
| 3 | පඨමවෙදනා | ,, | ... | ... | ... | 380 |
| 4. | දුතියවෙදනා | ,, | ... | ... | ... | 380 |
| 5. | පඨමඑසනා | ,, | ... | ... | ... | 382 |

| විසයා | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 6. දුතියඑසනා | ,, | ... | ... | ... | 382 |
| 7. පඨමආසව | ,, | ... | ... | ... | 384 |
| 8. දුතියආසව | ,, | ... | ... | ... | 384 |
| 9. තණ්හා | ,, | ... | ... | ... | 386 |
| 10. මාරධෙය්‍ය | ,, | ... | ... | ... | 386 |

වග්ගො පඨමො.

| දුතිය වග්ගො | | | | | 388-396 |
|---|---|---|---|---|---|
| 1. පුඤ්ඤකිරියවත්‍ථු සුත්තං | | ... | ... | ... | 388 |
| 2. චක්ඛු | ,, | ... | ... | ... | 388 |
| 3. ඉන්ද්‍රිය | ,, | ... | ... | ... | 390 |
| 4. අද්ධා | ,, | ... | ... | ... | 390-392 |
| 5. දුච්චරිත | ,, | ... | ... | ... | 392 |
| 6. සුචරිත | ,, | ... | ... | ... | 392 |
| 7. සොචෙය්‍ය | ,, | ... | ... | ... | 394 |
| 8. මොනෙය්‍ය | ,, | ... | ... | ... | 394 |
| 9. පඨමරාග | ,, | ... | ... | ... | 394-396 |
| 10. දුතියරාග | ,, | ... | .... | ... | 396 |

දුතියොවග්ගො.

| තතියො වග්ගො | | | | | 398-414 |
|---|---|---|---|---|---|
| 1. මිච්ඡාදිට්ඨිකම්මසමාදාන සුත්තං | | | ... | . | 398 |
| 2. මිච්ඡාදිට්ඨිකම්මසමාදාන | ,, | | ... | ... | 400 |
| 3. නිස්සරණීය | ,, | | ... | ... | 402 |
| 4. සන්තතර | ,, | | ... | ... | 402 |
| 5. පුත්ත | ,, | | ... | ... | 404-406 |
| 6. වුට්ඨි | ,, | | ... | ... | 406-408 |
| 7. සුඛපත්‍ථනා | ,, | | ... | ... | 408-410 |
| 8. භිදුර | ,, | | ... | ... | 410 |
| 9. ධාතුසංසන්දන | ,, | | ... | ... | 412 |
| 10. පරිහාන | ,, | | ... | ... | 414 |

වග්ගො තතියො.

| චතුත්‍ථො වග්ගො | | | | | 416-436 |
|---|---|---|---|---|---|
| 1. විතක්ක සුත්තං | | ... | ... | ... | 416 |
| 2. සක්කාර | ,, | ... | .... | ... | 416-418 |
| 3. දෙවසද්ද | ,, | ... | ... | ... | 418-420 |
| 4. පුබ්බනිමිත්ත | ,, | ... | ... | ... | 420-422 |
| 5. බහුජනහිත | ,, | ... | ... | ... | 424-426 |
| 6. අසුභානුපස්සී | ,, | ... | ... | ... | 426-428 |
| 7. ධම්මානුධම්මපටිපන්න සුත්තං | | | ... | . | 428 |

| විසයා | | පිට්ඨඞ්කා |
|---|---|---|
| 8. | අධිකරණ සුත්තං ... ... ... | 430–432 |
| 9. | අන්තරමල " ... ... ... | 432–434 |
| 10. | දෙවදත්ත " ... ... ... | 434–436 |
| | **වග්ගො චතුත්ථො.** | |
| | **පඤ්චමො වග්ගො** | **438–456** |
| 1. | අග්ගප්පසාද සුත්තං ... ... ... | 438–440 |
| 2. | ජීවිකා " ... ... ... | 440–442 |
| 3. | සඞ්ඝාටිකණ්ණ " ... ... ... | 442–444 |
| 4. | අග්ගි " ... ... ... | 444–446 |
| 5. | උපපරික්ඛ " ... ... ... | 446 |
| 6. | කාමූපපත්ති " ... ... ... | 446–448 |
| 7. | කාමයොග " ... ... ... | 448 |
| | **(තතියභාණවාරං)** | |
| 8. | කල්‍යාණසීල " ... ... ... | 450–452 |
| 9. | දාන " ... ... ... | 452 |
| 10. | තෙවිජ්ජ " ... ... ... | 454–456 |
| | **පඤ්චමො වග්ගො.** | |
| | **තිකනිපාතො නිට්ඨිතො.** | |
| | **චතුක්කනිපාතො** | **458–484** |
| 1. | බ්‍රාහ්මණ සුත්තං ... ... ... | 458 |
| 2. | චතුරනවජ්ජ " ... ... ... | 460 |
| 3. | ආසවක්ඛය " ... ... ... | 460–462 |
| 4. | සමණබ්‍රාහ්මණ " ... ... ... | 462–464 |
| 5. | සීලසම්පන්න " ... ... ... | 464–466 |
| 6. | තණ්හුප්පාද " ... ... ... | 466–468 |
| 7. | සබ්‍රහ්මක " ... ... ... | 468–470 |
| 8. | බහුකාර " ... ... ... | 470 |
| 9. | කුහ " ... ... ... | 472 |
| 10. | පුරිසපියරූප " ... ... ... | 472–474 |
| 11. | චර " ... ... ... | 474–478 |
| 12. | සම්පන්නසීල " ... ... ... | 478–480 |
| 13. | ලොකාවබොධ " ... ... ... | 482–484 |
| | **චතුක්කනිපාතො නිට්ඨිතො.** | |
| | **ඉතිවුත්තකපාළි නිට්ඨිතා.** | |
| | ගාථාදිපාදානුක්කමණිකා ... ... ... | 487–496 |
| | සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 497–498 |
| | පදානුක්කමණිකා ... ... ... | 499–543 |

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

පඨමො භාගො

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

(පඨමො ගන්ථො)

## ඛුද්දකපාඨපාළි

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

### 1. සරණගමනං[1]

බුද්ධං සරණං ගච්ඡාමි.
ධම්මං සරණං ගච්ඡාමි.
සඞ්ඝං සරණං ගච්ඡාමි.

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.

**සරණගමනං.**[1]

### 2. දසසික්ඛාපදං

පාණාතිපාතා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
අදින්නාදානා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
අබ්‍රහ්මචරියා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
මුසාවාදා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
විකාලභොජනා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
නච්චගීතවාදිතවිසූකදස්සනා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
උච්චාසයනමහාසයනා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.
ජාතරූපරජතපටිග්ගහණා වෙරමණීසික්ඛාපදං සමාදියාමි.

**දසසික්ඛාපදං.**

1. සරණත්තයං. මජස.

සූත්‍රපිටකයෙහි

# ඛුද්දක සඟිය

(ප්‍රථම ග්‍රන්ථය)

## ඛුද්දකපාඨ පෙළ

ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

---

### 1. ශරණගමනය.

බුදුරජුන් සරණයෙමි (පිහිට යැ යි දැන ගණිමි.)
දහම් සරණ යෙමි (පිහිට යැ යි දැන ගණිමි.)
සඟ සරණ යෙමි (පිහිට යැ යි දැන ගණිමි.)
දෙවනු ද බුදුරජුන් සරණ යෙමි.
දෙවනු ද දහම් සරණ යෙමි.
දෙවනු ද සඟ සරණ යෙමි.
තෙවනු ද බුදුරජුන් සරණ යෙමි.
තෙවනු ද දහම් සරණ යෙමි.
තෙවනු ද සඟ සරණ යෙමි.

**ශරණගමනය යි.**

### 2. දසසික‍පද

පණිවායෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
අයිනා දනින් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
මෙවුන්දම්න් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
අබ්‍රම්සරින් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
මුසා වායෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
මදයටත් ප්‍රමාදයටත් හේතු වූ රහමෙර පීමෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
විකල් බොජුනෙන් වැළක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
නටනු ගයනු වයනු විසුළුදස්නෙන් වැළැක්මවූ සිකපදය මනා කොට ගණිමි.
අවු තැන් පිරවීමටත් සැරසීමටත් කරුණු වූ මල් ගඳ විලෙවුන් දැරීමෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
උසසුන්මහස්නෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.
රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්ම වූ සිකපදය මනා කොට ගණිමි.

**දසසිකපද යි.**

## 3. ද්වත්තිංසාකාරං

අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨී අට්ඨිමිඤ්ජං[1] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝානිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුඞ්ගන්ති.

ද්වත්තිංසාකාරං.

---

## 4. කුමාරපඤ්හා

එකං නාම[2] කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා.

ද්වෙ නාම කිං? නාමඤ්ච රූපඤ්ච.

තීණි නාම කිං? තිස්සො වෙදනා.

චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි.

පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා.

ඡ නාම කිං? ඡ අජ්ඣත්තිකානි ආයතනානි.

සත්ත නාම කිං? සත්ත බොජ්ඣඞ්ගා.

අට්ඨ නාම කිං? අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

නව නාම කිං? නව සත්තාවාසා.

දස නාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහා'ති වුච්චතීති.

කුමාරපඤ්හා.

---

1. අට්ඨිමිඤ්ජා - ශ්‍යාම.
2. එකං නාම කිං. පොත්ථ.

## 3. දෙතිස් ආකාරය

මෙ සිරුරෙහි කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුලු ය, වකුගඩු ය, හදවත ය, අක්මාව ය, දලබුව ය, බඩදිව ය පපුමස ය, අතුනුවැටිය ය, අතුනුබහන් ය, උදරිය (උදරයෙහි වූ නොපැසුණු අහර පැන් ආදිය) ය, වසුරු ය, පිත ය, සෙම ය, පූයා ය, ලේ ය, ඩහදිය ය, හැසුනු (මිදි ගිය) තෙල් ය, කඳුළු ය, වුරුණු (දිය ව ගිය) තෙල් ය, කෙල ය, මුකුණු (සොටු) ය, සඳමිදුලු ය, මුත්‍ර ය, හිස් කබල් තුළ පිහිටි මිදුලු රස ය යන දෙතිස් කුණප කොටස් කෙනෙක් ඇත්තාහ.

**දෙතිස් ආකාර යි.**

---

## 4. කුමාරප්‍රශ්න

එක නම් කිම? සියලු සත්හු අහරින් සිටින්නෝ ය.

දෙක නම් කිම? නම් රූ දෙක ය.

තුණ නම් කිම? (සුඛ දුඃඛ උපෙක්ෂා යන) තුන් වේදනාවෝ ය.

සතර නම් කිම? (දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන) සතර ආර්‍ය්‍ය සත්‍යයෝ ය.

පස නම් කිම? (රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන) උපාදානස්කන්ධ පස ය.

සය නම් කිම? (චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මන යන) තමා කෙරෙහි වූ ආයතන සය ය.

සත නම් කිම? (සති ධම්මවිචය පීති විරිය පස්සද්ධි සමාධි උපෙක්ඛා යන) බොධ්‍යඞ්ග සත ය.

අට නම් කිම? (සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන) ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ය.

නවය නම් කිම? (නානත්තකාය නානත්තසඤ්ඤී ය, නානත්තකාය එකත්තසඤ්ඤී ය, එකත්තකාය නානත්තසඤ්ඤී ය, එකත්තකාය එකත්තසඤ්ඤී ය, අසඤ්ඤී ය, අකාසානඤ්චායතනූපග ය, විඤ්ඤාණඤ්චායතනූපග ය, ආකිඤ්චඤ්ඤායතනූපග ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග ය යන) සත්ත්වාවාස නවය ය.

දශය නම් කිම? (අසෙඛ සම්මාදිට්ඨි ය, අසෙඛ සම්මාසඞ්කප්ප ය, අසෙඛ සම්මාවාචා ය, අසෙඛ සම්මාකම්මන්ත ය, අසෙඛ සම්මාආජීව ය, අසෙඛ සම්මාවායාම ය, අසෙඛ සම්මාසති ය, අසෙඛ සම්මාසමාධි ය, අසෙඛ සම්මාඤාණ ය, අසෙඛ සම්මාවිමුත්ති ය යන) අඞ්ග දශයෙන් යුත් වූයේ රහත් තෙමේ ය යි කියනු ලැබේ.

**කුමාරප්‍රශ්න යි.**

---

# 5. මඞ්ගලසුත්තං

**එ**වං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1. බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං,
ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි මඞ්ගලමුත්තමං.

2. අසෙවනා ච බාලානං පණ්ඩිතානං ච සෙවනා,
පූජා ච පූජනීයානං එතං මඞ්ගලමුත්තමං.

3. පතිරූපදෙසවාසො ච පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච එතං මඞ්ගලමුත්තමං.

4. බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා එතං මඞ්ගලමුත්තමං.

5. මාතාපිතුඋපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහො
අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං.

6. දානං ච ධම්මචරියා ච ඤාතකානඤ්ච සඞ්ගහො
අනවජ්ජානි කම්මානි එතං මඞ්ගලමුත්තමං.

7. ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමො
අප්පමාදො ච ධම්මෙසු එතං මඞ්ගලමුත්තමං.

8. ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලෙන ධම්මස්සවණං එතං මඞ්ගලමුත්තමං.

9. ඛන්ති ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං
කාලෙන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං.

10. තපො ච බ්‍රහ්මචරියඤ්ච අරියසච්චාන දස්සනං
නිබ්බාණසච්ඡිකිරියා ච එතං මඞ්ගලමුත්තමං.

# 5. මඞ්ගලසූත්‍රය

**මා විසින් මෙසේ අසන ලදී:** එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** නිසා **ජේතවන** නම් වූ **අනේපිඬු** මහ සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රෑ (පෙර යම) ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීරශොභා ඇත්තේ සියලු ජේතවනය (සවකීය) ශරීරශොභායෙන් බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එ තැනට එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙව් තෙම භාග්‍යවතුන්වහන්සේට ගාථායෙන් (මෙසේ) කීයේ ය:

1. ස්වස්ථභාවය කැමැති බොහෝ දෙවියෝ ද මිනිස්සු ද (දෙලෝ වැඩ සලසන) මඞ්ගල කාරණයන් සිතූහ. වැඩ සලසන උතුම් මඟුල් (මඞ්ගල කාරණ) වදාළ මැනැවි.

[බුදුරජුහු වදාළහ:]

2. බාලයන් ඇසුරු නොකිරීම ද මඟුලෙකි. පණ්ඩිතයන් ඇසුරු කිරීම ද මඟුලෙකි. පිදිය යුත්තන් පිදීම ද මඟුලෙකි. මේ (එක එකෙක්) උතුම් මඟුල් ය (මඞ්ගල කාරණය).

3. සුදුසු පෙදෙසෙහි විසීම ද, පෙරකළ පින් ඇති බව ද, සිය අත්බව (ශීලාදි) මනා දහම්හි පිහිටුවීම ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

4. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, (ගිහි පැවිදි) සිප්හි අත් හුරු බව ද, මොනොවට හික්මුනු කා විසි මුනි තුන් දොර ඇති බව ද, මොනොවට කියන ලද වචනය ද (මුසවා ආදියෙන් වැළැකි වචනය ද) යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

5. මවුට උවටැන ද, පියාට උවටැන ද, අඹුදරුවනට සඞ්ග්‍රහය ද, *(ගොවි-තැන් ආදි) නිරවුල් කර්මාන්ත ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

6. දානය ද, දස කුසල්දහම්හි හැසිරීම ද, නෑයනට සංග්‍රහය ද, පෙහෙවස් විසීම් ආදි නිවැරදි කර්ම ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

7. මානසික අකුශලයෙන් වැළැක්ම ද, කායික වාචසික අකුශලයෙන් වැළැක්ම ද, මත්පැනෙන් වැළැක්ම ද, කුසල්දහම් වැඩීමෙහි නොපමා බව ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

8. ගරු කටයුත්තනට ගරු කිරීම ද, මත් නැති බව ද (නිහතමාන බව) ද, ලද දෑයින් සතුටු වන බව ද, කෙළෙහි ගුණ දන්නා බව ද, සුදුසු කල්හි බණ ඇසීම ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

9. ඉවැසීම ද, සුවච බව ද, ශ්‍රමණයන් දැක්ම ද, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

10. තපස ද (ඉන්ද්‍රියසංවරය හා වීර්‍ය්‍යය ද,) බඹසර ද (මෙවුන්දමින් වැළැක්ම, මහණදම, සසුන් බඹසර යන තුන් බඹසර ද), චතුරාර්‍ය්‍යසත්‍යයන් දැකීම ද (මාර්ගදර්ශනය ද), නිවන්පසක් කිරීම ද යන මේ (එක එකෙක්) උතුම් මඟුල් ය.

11. පුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං එතං මඞ්ගලමුත්තමං.

12. එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මඞ්ගලමුත්තමන්ති.

මඞ්ගලසුත්තං.

---

## 6. රතනසුත්තං

1. යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ[1]
සබ්බෙව භූතා සුමනා භවන්තු අථො'පි සක්කච්ච සුණන්තු භාසිතං.

2, තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ මෙත්තං කරොථ මානුසියා පජාය.
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා.

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා[2]
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොති.

5. යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං[3]
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

---

1. යානීහ භූතානි සමාගතානි
භූම්‍යානි වා යානි වා අන්තරීක්ෂෙ
සර්වාණි වා ආත්තමනානි භූත්වා
ශ්‍රෘණ්වන්තු ස්වස්ත්‍යයනං ජිනෙන භාෂිතම්
(මහාවස්තු)

2. ඉමස්මිං ලොකෙ පරස්මිං වා පුනඃ
ස්වර්ගෙෂු වා යද්‍රත්නං ප්‍රණීතම්
න තත්සමං අස්ති තථාගතෙන
දෙවාතිදෙවෙන නරොත්තමෙන
ඉදම්පි බුද්ධෙ රත්නං ප්‍රණීතං
එතෙන සත්‍යෙන සුස්වස්ති භොතු (මහාවස්තු)

1. යම්බුද්ධශ්‍රෙෂ්ඨඃ පරිවර්ණයෙත් ශුචිං
යමාහු ආනන්තරිකං සමාධිං
සමාධිනො තස්‍ය සමො න විද්‍යතෙ
ඉදම්පි ධර්මෙ රත්නං ප්‍රණීතං
එතෙන සත්‍යෙන සුස්වස්ති භොතු. (මහාවස්තු)

12. අට ලෝදහමින් පහස්නා ලද (ස්පර්ශකරන ලද, මඩනා ලද) යමක්හුගේ සිත නො සැලේ ද, ශෝක රහිත ද, රාගාදි රජස් රහිත ද, කාමයෝගාදීන්ගෙන් නිරුපද්‍රත ද, එ බඳු වූ රහත්හුගේ සිතෙහි වූ ඒ නොසැලෙන බව ආදි එක එකෙක් උතුම් මඟුල් ය.

13. යම් කෙනෙක් මෙබඳු වූ බාලයන් ඇසුරු නොකිරීම් ආදි මඞ්ගල කාරණයන් කිරීමෙන් හැම තන්හි (දෙලෙව්හි ම) නොපැරදුනෝ ව සියලු ඉරියව්වෙහි සවස්ථ ව වෙසෙත් ද, එය (ඒ බාලයන් ඇසුරු නොකිරීම් ආදිය) ඔවුනට උතුම් මඟුල් ය.

**මඞ්ගලසූත්‍රය සි.**

---

## 6. රතන සූත්‍රය

1. පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූහු ද, ඒ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිතැත්තෝ වෙත්වා. තව ද මගේ වචනය සකසා අසත්වා.

2. භූතයිනි, එ බැවින් සියලු තෙපි (මගේ වචනය) අසවු. මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රිය කරවු. යම් කෙනෙක් දහවල් ද රෑ ද පුද පඬුරු එළවත් ද, එහෙයින් නො පමා ව ම ඔවුන් රකිවු.

3. මේ මිනිස්ලොව හෝ නාලෝ ආදි අන් ලොවෙක හෝ යම් ධනයෙක් වේ ද දෙව්ලෝහි හෝ මහඟු රුවනෙක් වේ ද (ඔවුන් අතුරෙහි) තථාගතයන් හා සදෘශයෙක් නැත් ම ය. මෙ කරුණින් ද බුදුරජුහු උතුම් රුවනෙකි (නොහොත් මෙය බුදුරජුන් ගේ රත්නභාවය යි.) මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

4. ශාක්‍යමුනි තෙම (ආර්‍යමාර්ග සමාධියෙන්) එකඟ වූ සිත් ඇත්තේ, කෙලෙස් නැසීමට නිමිති වූ, රාගයෙන් වෙන් වීමට නිමිති වූ, මරණයක් නැති, උතුම් වූ (මහත් වූ) යම් නිවනක් පසක් කෙළේ ද, ඒ දහම හා සම වූ කිසිවෙක් නැත්තේ ය. මෙ කරුණින් ද නිවන්දහම උතුම් රුවනෙකි. මේ සත්‍යවචනානුභාවයෙන් සෙත් වේවා.

5. බුද්ධශ්‍රේෂ්ඨ තෙම අත්‍යන්තපරිශුද්ධ වූ යම් මාර්ගසමාධියක් වර්ණනා කෙළේ ද, බුද්ධාදීහු ආනන්තරික (අනතුරුව ම පල දෙන) සමාධිය යැ යි යමකට කියත් ද, ඒ සමාධිය හා සදෘශ(අන් සමාධි)යෙක් නැත. මේ කරුණින් ද ආර්‍යමාර්ගධර්මය උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

6. යෙ පුග්ගලා අට්ඨසතම්පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි.
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[4]

7. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතමසාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා.
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[5]

8. යථින්දඛීලො පඨවිංසිතො සියා
චතුබ්භි වාතෙභි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදාමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති.
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[6]

9. යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[7]

---

4. යෙ පුද්ගලා අෂ්ට සදා ප්‍රශස්තා
චත්වාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ෂිණීයා සුගතස්‍ය ශ්‍රාවකා
එතෙෂු දත්තානි මහත්ඵලානි
ඉදම්පි සංඝෙ රත්නං ප්‍රණීතං
එතෙන ..........
(මහාවස්තු)

5. යෙ යුක්තයොගී මනසා සුදෘඪෙන
නෛෂ්ක්‍රාම්‍යිනො ගෞතමශාසනස්මින්
තෙ ප්‍රාප්තිප්‍රාප්තා අමෘතං 'විගාහ්‍ය
විමුක්තචිත්තා නිර්වෘතිං භුංජමානාඃ
ඉදම්පි සංඝෙ.........
(මහාවස්තු)

6. යථෙන්ද්‍රකීලො පෘථිවිශ්‍රිතො ස්‍යා-
ච්චතුර්භි වාතෙභි අසම්ප්‍රකම්පී
තථොපමං සත්පුරුෂං වදෙමි
යො ආර්යසත්‍යානි සුදෙශිතානි
ගම්භීරඅර්ථානි අවෙත්‍ය පශ්‍යති
ඉදම්පි.................. (මහාවස්තු)

7. යෙ ආර්‍යසත්‍යානි විභාවයන්ති
ගම්භීරප්‍රඥෙන සුදෙශිතානි
කිඤ්චාපි තෙ හොන්ති භෘශං ප්‍රමත්තා
න තෙ භවා අෂ්ටම උපාදියන්ති
ඉදම්පි සංඝෙ....... (මහාවස්තු)

6. සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්‍ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද නොහොත් ප්‍රශස්ත වූ යම් අටෝරාසියක් අර්‍ය පුගුලෝ වෙත් ද, මොහු හැම දෙන සතර යුග කෙනෙක් වෙති. සුගත් බුදුරජුන්ගේ සවු වූ ඔහු තුමූ දක්ෂිණාවට (කර්මය ද කර්මවිපාකය ද අදහා දෙන දානය පිළිගැන්මට) සුදුස්සෝ වෙති. මේ බුදුසව්වන් කෙරෙහි දෙන ලද දානයෝ මහත් පල ඇත්තෝ වෙත්. මේ කරුණින් ද බුද්ධශ්‍රාවක සඞ්ඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

7. ගොයුම්බුදුරජුන් ගේ සස්නෙහි වූ, සුවිශුද්ධ කායවාක්කර්ම සංඛ්‍යාත ශීලස්කන්ධයෙන් යුක්ත වූ, සථිර සිතින් (හෙවත් සමාධිගත සිතින්) යුක්ත වූ, ප්‍රඥව කරණ කොට ගෙණ සියලු කෙලෙසුන්ගෙන් නික්මුනා වූ යම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු තුමූ (අරමුණු කිරීම් වශයෙන්) නිවනට බැස ගෙණ නො මිලයේ ම රහත්පල සමවත ලැබ ගෙණ එය විඳින්නාහු වෙති. මේ කරුණින් ද ආර්‍යසඞ්ඝයා උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

8. යම්සේ පොළොව තුළ වැද ගෙණ සිටි ඉන්ද්‍රකීලය තෙම සිවු දිගින් හමන සුළඟින් සෙලවිය හැකි නො වේ ද, ආර්‍යසත්‍යයන් ප්‍රඥයෙන් බැස ගෙණ දක්නා සත්පුරුෂයා (හෙවත් සෝවාන් පුඟුලා) එබන්දකු කොට කියමි. මේ කරුණින් ද ආර්‍යසඞ්ඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය-බලයෙන් සෙත් වේවා.

9. යම් සෝවාන් පුඟුල් කෙනෙක් ගැඹුරු නුවණැති බුදුරජුන් දෙසූ ආර්‍යසත්‍යයන් තමනට ප්‍රකට කෙරෙත් ද, ඔහු (දෙව්සුව සක්විති රජ-සුව ආදි පමාවට කරුණු වන තැනකට පැමිණ) බෙහෙවින් පමා වූවාහු නුමුදු අටවන භවයක් නො ගණිති. මෙ කරුණින් ද ආර්‍යසංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡ චාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[1]

11. කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා.
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු[2].

12. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු[3].

13. වරො වරඤ්ඤූ වරදො වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි.
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං.
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො.
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.[4]

---

1. සහෛව යස්‍ය දර්ශනසම්පදාය.
ත්‍රයොස්‍ය ධර්මා ජහිතා භවන්ති
සත්කායදෘෂ්ටිං විචිකිත්සිතං ච
ශීලව්‍රතං වාපි යදස්ති කිඤ්චිත්
ඉදම්පි සංඝෙ......... (මහාවස්තු)

2. කිඤ්චාපි ශෛක්ෂො ප්‍රකරොති පාපං
කායෙන වාචා අථ චෙතසාපි
අභව්‍යො සො තස්‍ය නිගූහනාය
අභව්‍යතා දෘෂ්ටපදෙෂු උක්තා
ඉදම්පි සංඝෙ......... (මහාවස්තු)

3. වනෙ ප්‍රගුල්මා යථ පුෂ්පිතාග්‍රා
ග්‍රීෂ්මාණමාසෙ ප්‍රථමෙ චෛත්‍රස්මින්
වාතෙරිතා තෙ සුරභිං ප්‍රවාන්ති
එවංවිධා ධ්‍යායිනො බුද්ධපුත්‍රාඃ
ශීලෙනුපෙතා සුරභිං ප්‍රවාන්ති
ඉදම්පි සංඝෙ......... (මහාවස්තු)

4. ක්ෂීණං පුරාණං නවො නාස්ති සංභවො
විමුක්තචිත්තා ආයතිකෙ භවස්මින්
තෙ ක්ෂීණබීජා අවිරූඪධර්මා
නිර්වාන්ති ධීරා යථා තෛලදීපාඃ
ඉදම්පි සංඝෙ රතනං ප්‍රණීතං
එතෙන සත්‍යෙන සුස්වස්ති හොතු
(මහාවස්තු)

10. මේ සෝවාන්හුගේ දර්ශනසම්පත්තිය (පළමු වන නිවන් දැක්ම) හෙවත් සෝවාන් මඟ නුවණ පහළ වීම සමග ම සත්කායදෘෂ්ටිය ද, (බුදුආදී අට තන්හි) සැකය ද, යම් මිථ්‍යාශීලව්‍රත කෙතෙක් වූහු නම් ඒ සියල්ල ද යන මේ තුන් සංයෝජනයෝ දුරු කරණ ලද්දෝ වෙත්. හෙතෙම සතර අපායයන් කෙරෙන් මිදුනේ ද වේ. (ආනන්තර්‍ය කර්ම පසත් මිථ්‍යාදෘෂ්ටියත් යන බැරැරුම් වූ පව් සය කරන්නට ද හේ අභව්‍ය ය (ඔහු විසින් ඒ පව් සය නො කට හැක්ක). මෙ කරුණින් ද ආර්‍යසඞ්ඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

11. ඒ (සෝවාන්) පුද්ගල තෙම (ප්‍රමාදයෙකින්) කයින් හෝ වචනයෙන් හෝ නැත හොත් සිතින් හෝ ප්‍රඥප්තිවද්‍යමාත්‍ර වූ කිසි වරදක් කරන්නේ නුමුදු, හේ එය සඟොවන්නට නො හැක්කේ ය. දක්නා ලද නිර්වාණපදය ඇති සෝවාන්හුගේ (වරද සැඟෙවීමෙහි) අභව්‍ය බව (හෙවත් වරද සැඟෙවිය නො හැකි බව) (බුදු රජුන් විසින්) වදාරන ලද්දේ ය. මේ කරුණින් ද ආර්‍යසඞ්ඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

12. වන ලැහැබ තෙමේ ග්‍රීෂ්මර්තුව සම්බන්ධ වූ ප්‍රථම ග්‍රීෂ්ම මාසයෙහි (හෙවත් බක් මස) සුපිපි අග් ඇත්තේ යම්සේ ද, එසේ වූ නිවන්පුර පමුණුවන පර්‍ය්‍යාප්තිධර්මරත්නය පරමහිතාවහ වූ නිවන් පිණිස (ඒ බුදුරජ තෙම) දෙසී ය. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

13. උතුම් වූ නිවන් දන්නා වූ, උතුම් නිවන දෙන්නා වූ, උතුම් නිවන් මඟ ගෙන හැර පාන්නා වූ, නිරුත්තර වූ බුදුරජ තෙම උතුම් දහමක් දෙසී ය. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍යබලයෙන් සෙත් වේවා,

14. යම් කෙනෙකුන්ගේ පුරාතන කර්ම (මෙයින් මත්තෙහි ප්‍රතිසන්ධියක් දිය නො හැක්කේ) රහත්මඟින් ක්ෂීණ වූයේ ද, (කර්මක්ෂය කළ බැවින් මත්තෙහි විපාක දිය හැකි) අළුත් කර්මයන්ගේ පහළ වීමෙකුත් නැද්ද, මතු භවයක් කෙරෙහි නො ඇලුණු සිතැති, ක්ෂීණ වූ ප්‍රතිසන්ධිවිඥාන සඞ්ඛ්‍යාත බීජ ඇති, පුනර්භව සඞ්ඛ්‍යාත සංස්කාර වෘද්ධිය කෙරෙහි කැමැත්තක් නැති, ධෛර්‍යසම්පන්න වූ ඒ රහත්හු මේ පහන මෙන් අවසන් සිත නිරුද්ධ වීමෙන් පිරිනිවෙත්. මේ කරුණින් ද සඞ්ඝයා උතුම් රුවනි නොහොත් මේ ද සඞ්ඝයාගේ උතුම් රුවන් බවෙකි). මේ සත්‍යබලයෙන් සෙත් වේවා.

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.[1]

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු.[2]

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.[3]

**රතනසුත්තං.**

---

## 7. තිරොකුඩ්ඩසුත්තං

1. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිඞ්ඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං.

2. පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා.

3. එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං.

4. ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො
තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා

5. පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ.
"චිරං ජීවන්තු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ.
අම්හාකං ච කතා පූජා" දායකා ච අනිප්ඵලා.

6. න හි තත්ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති.
වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාකයං.
ඉතො දින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං.

7. උන්නමෙ උදකං වට්ටං[4] යථා නින්නං පවත්තති
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

---

1, 2, 3, විපශ්‍යිස්මිං විශ්වභූවික්‍රකුච්ඡන්දෙ
කාමකානකමුනිස්මිං කාශ්‍යපෙ
මහායශෙ ශාක්‍යමුනිස්මිං ගෞතමෙ
එතෙෂු බුද්ධෙෂු මහර්ද්ධිකෙෂු
යා දෙවතා සන්ති අභිප්‍රසන්නා
වාණිම්පි නා රක්ෂන්තු ච සාරොහන්තු
සර්වසත්ත්වායතනං මානුෂියා ප්‍රජායෙ
යො ධර්මචක්‍රං අභිභූය ලොකං
ප්‍රවර්තයති සර්වභූතානුකම්පී
එතාදෘශං දෙවමනුෂ්‍යශ්‍රෙෂ්ඨං
බුද්ධං නමස්‍යාම සුස්වස්ති හොතු.
ධර්මං නමස්‍යාම සුස්වස්ති හොතු.
සඞ්ඝං නමස්‍යාම සුස්වස්ති හොතු.
-(මහාවස්තු)

4. වුට්ඨං (සී. මු.

(සක්දෙව්රජ කී ය:)

**15.** **පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද, මම් ද (අපි) දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ නමදිමු. (සත්ත්වප්‍රජාවට) සෙත් වේවා.**

16. පොළොවෙහි හෝ අහසෙහි හෝ වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද මම් ද දෙව්මිනිසුන් විසින් පුදන ලද, (බුද්ධාදීන්) විසින් අවබෝධ කරන ලද බැවින් තථාගත වූ ධර්මය නමදිමු. (සත් වගට) සෙත් වේවා.

17. පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙ තන්හි රැස් වූහු ද, ඔහු ද මම් ද දෙව්මිනිසුන් විසින් පුදන ලද (ආත්ම-හිතයෙහි පිළිපන්නවුන් විසින් යා යුතු මඟෙහි ගැම් ආදී අරුතින්) තථාගත වූ සඞ්ඝයා නමදිමු. සෙත් වේවා.

**රතන සූත්‍රය සි.**

---

## 7. තිරොකුඩ්ඩ සූත්‍රය.

(ඥාතිප්‍රෙතයෝ) තමන් පෙර වුසු ගෙය කරා අවුත් බිත්තියෙන් පිටත්හි ද ගෘහසන්ධි භිත්තිසන්ධි සතරමංහන්දි තුන්මංහන්දි යන මේ තන්හි ද දොරබා නිසා ද සිටිත්.

2. බොහෝ වූ ආහාරපාන ද ඛාද්‍යභොජ්‍ය ද පිළියෙල ව ඇති කල්හි (පවා) ඒ ප්‍රේතලෝකයෙහි උපන් සත්ත්වයන්ගේ අකුශලකර්ම හේතුවෙන් කිසි ම නෑදෑයෙක් ඔවුන් සිහි නො කෙරෙයි.

3,4.5. නෑයන් අතුරෙන් යම් කෙනෙක් ඔවුනට අනුකම්පා කරන්නාහු වෙත් ද, ඔහු තුමූ "මේ පින පරලොව ගිය අප නෑයනට වේවා. ඒ නෑයෝ සුවපත් වෙත්වා"යි කියා, ඔවුන් අවුත් සිටි කල්හි, ඒ නෑයන් උදෙසා පවිත්‍ර වූ ප්‍රණීත වූ කැප වූ ආහාර පාන දන් දෙත්. ඒ ඥාති ප්‍රේතයෝ ද ඒ දන් දෙන තැනට නොයෙක් දිශාභාගයෙන් අවුත් එක් රැස් වූවාහු, තමන් උදෙසා බොහෝ ආහාරපාන දෙනු ලබන කල්හි සකසා (කම් පල අදහා) පින් අනුමෝදන් කෙරෙත් (හෙවත් එය අනුව සතුටු වෙත්). "යම් කෙනෙකුන් නිසා (පින් අනුමෝදන් කළ) මෙ කෙණෙහි සම්පත් ලබම්මෝ ද, ඒ අප නෑයෝ බොහෝ කල් ජීවත් වෙත්වා. ඔවුන් විසින් දන් දී පින් පැමිණවීම් වශයෙන් අපට ද පූජා කරනු ලදී" යි ද තුති කෙරෙත්. ඒ දන් දුන් දායකයෝ ද ඵල රහිතයෝ නො වෙති.

6 ඒ ප්‍රේතලෝකයෙහි සී සෑමෙක් නැත්තේ ය. ගව පාලනයෙක් එහි නැත්තේ ය. (සම්පත් ලැබීමට හෙතු වූ) එබඳු වෙළෙඳාමෙකුත් නැත්තේ ය. රන්රිදියෙන් කරණ ගණුදෙනුවෙක් ද නැත්තේ ය. (හුදෙක්) මැරී ඒ ප්‍රේතවිෂයයට පැමිණියෝ මේ මිනිස්ලොව වසන නැමිතුරන් විසින් දෙන ලද පිණෙකින් ඒ ප්‍රේතයොනියෙහි යැපෙත්.

7. යම්සේ උස් බිමෙක වට ජලය මිටි බිම කරා ගලා බසී ද, එ පරිද්දෙන් ම මේ මිනිස්ලොවෙහි දී ඥාත්‍යාදීන් විසින් දුන් දානය (එහි විපාක වශයෙන්) ප්‍රේතයන්හට පැමිණේ (ලැබේ).

8. යථා වාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

9. අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං.

10. න හි රුණ්ණං ව සොකො වා යා වඤ්ඤා පරිදෙවනා
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො.

11. අයං ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති.

13. සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතාන පූජා ච කතා උළාරා
බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකං.

**තිරොකුඩ්ඩසුත්තං.**

---

## 8. නිධිකණ්ඩසුත්තං.

1. නිධිං නිධෙති පුරිසො ගම්භීරෙ ඔදකන්තිකෙ
අත්ථෙ කිච්චෙ සමුප්පන්නෙ අත්ථාය මෙ භවිස්සති.

2. රාජතො වා දුරුත්තස්ස චොරතො පීළිතස්ස වා
ඉණස්ස වා පමොක්ඛාය දුබ්භික්ඛෙ ආපදාසු වා,
එතදත්ථාය ලොකස්මිං නිධි නාම නිධීයති.

3. තාව සුනිහිතො[1] සන්තො ගම්භීරෙ ඔදකන්තිකෙ
න සබ්බො සබ්බදා එව තස්ස තං උපකප්පති.

---

1. තාවසුනිහිතො (ඝොසුචි පොත්ථකෙසු)

8. යම් සේ මහා නදීහු කුඩා ගං හෝ ආදියෙහි රැස් වන දියෙන් පිරුණාහු සාගරය පුරාලත් ද, එ පරිද්දෙන් ම මේ මිනිස්ලොවෙහිදී ඥාතෘාදීන් විසින් දුන් දානය (එහි විපාක දීම් වශයෙන්) ප්‍රේතයන්හට පැමිණේ (ලැබේ).

9. "මට මෙබඳු ධනයක් හෝ ධාන්‍යයක් හෝ දුන්නේ ය යි ද, මගේ මේ කටයුත්ත කෙළේ ය යි ද, මොහු තුමූ මගේ නෑයෝ ය යි ද, මිත්‍රයෝ ය යි ද, (අසුවලා වැලි කෙළියෙහි පටන්) මාගේ යහළුවා ය" යි ද මෙසේ පෙර කරන ලද උපකාර සිහි කෙරෙමින් මිය පරලොව ගියවුන් උදෙසා දන් දිය යුත්තේ ය.

10. හැඬීමක් හෝ ශෝක කිරීමක් හෝ යම් අනෙක් වැලැපීමෙක් හෝ වේ ද, එය පරලොව ගියවුන්ගේ ප්‍රයෝජනය පිණිස නො වේ. ඒ ප්‍රේතයෝ එහි උපන් පරිද්දෙන් ම සිටිත්. (මේ ඇඬුම්වැලැපුම්වලින් වැඩෙක් නො වේ.)

(මහරජ, ඔබ විසින් අද තමන්ගේ ඥාතිසමූහයා උදෙසා) යම් දානයෙක් දෙන ලද්දේ ද, ඒ මේ දක්ෂිණාව (නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර හෙයින්) සඞ්ඝයා කෙරෙහි සුපිහිටියේ වන්නේ ය. එ හෙයින් එය ඒ ප්‍රේතසමූහයාට දීර්ඝ කාලයක් හිත සැප පිණිස විපාක දෙයි එ කෙණෙහි ම (පහළ වීම් වශයෙන්) විපාක දෙයි.

12. (මේ දක්ෂිණාවදෙන්නාවූ ඔබ විසින්)නෑයන් විසින් නෑයන් සඳහා කට යුතු වූ ඥාතිධර්මය දක්වන ලදී. (නිරර්ථක වූ හැඬීම් වැලපීම් ආදිය ඥාතිධර්මය නො වෙයි.) (ප්‍රේතයන් ප්‍රේතභාවයෙන් මුදවා දිව්‍යසම්පත්තියට පමුණුවන්-නාවූ ඔබ විසින්) ප්‍රේතයනට මහත් වූ පූජාවෙක් ද කරණ ලදී. (බුද්ධප්‍රමුඛ සඞ්ඝයා ආහාරපානාදීන් සන්තර්පණය කරවන්නාවූ ඔබ විසින්) භික්ෂූන්හට ශක්තිය ද දෙන ලදී. ඔබ විසිනුදු මහත් වූ පිනෙක් රැස් කර ගන්නා ලදී.

තිරොකුඩ්ඩ සූත්‍රය යි.

---

## 8. නිධිකණ්ඩ සූත්‍රය.

1. "අභිවෘද්ධිදායක යම් කිසි කටයුත්තක් ඇති වූ කල්හි මගේ ප්‍රයෝ-ජනය පිණිස වන්නේ ය" යි සලකා පුරුෂයෙක් ජලය තාක් ගැඹුරු වූ තැනෙක්හි නිධානයක් කෙරෙයි.

2. 'මෙ තෙමේ සොරෙක අපරාධකාරයෙකැ'යි සතුරන් විසින් රජුට දැන්වූ කල්හි (එසේ දෝෂාරොපණ වශයෙන්) නපුරු කොට කියන ලද්දහුට රජුගෙන් මිදීම පිණිස ද, සොරුන් විසින් පෙළන ලද්දහුට ඔවුන්ගෙන් මිදීම පිණිස ද, (නයහිමියන් තමන්ගේ නයමුදල් ඉල්ලා බල කරණ කල්හි ඒ) නයින් මිදීම පිණිස ද, දුර්භික්ෂ කාලයෙක්හි හෝ විපතක් පැමිණි කල්හි හෝ ප්‍රයොජනය පිණිස වන්නේ ය යි සලකා ලෝකයෙහි (රන්රුවන් ආදි) ධනය නිධාන කොට තබනු ලැබේ.

3. ජලයට සමීප තාක් ගැඹුරු වූ තැනෙක්හි එතරම් සුරක්ෂිත ලෙස තැන්පත් කොට තබන ලද්දවූ ඒ සියලු ධනය හැම කල්හි ම ඔහුගේ කාර්‍යසිද්ධිය පිණිස නො වෙයි.

4. නිධි වා ඨානා චවති සඤ්ඤා වාස්ස විමුය්හති
නාගා වා අපනාමෙන්ති යක්ඛා වාපි හරන්ති නං

5. අප්පියා වාපි දායාද උද්ධරන්ති අපස්සතො
යදා පුඤ්ඤක්ඛයො හොති සබ්බමෙතං විනස්සති

6. යස්ස දානෙන සීලෙන සංයමෙන දමෙන ච
නිධී සුනිහිතො හොති ඉත්ථියා පුරිසස්ස වා

7. චෙතියම්හි[1] ච සඞ්ඝෙ වා පුග්ගලෙ අතිථීසු වා
මාතරි පිතරි චාපි අථො ජෙට්ඨම්හි භාතරි

9, එසො නිධී සුනිහිතො අජෙය්‍යො අනුගාමිකො
පහාය ගමනීයෙසු එතං ආදාය ගච්ඡති

8. අසාධාරණමඤ්ඤෙසං අචොරහරණො නිධි
කයිරාථ ධීරො පුඤ්ඤානි යො නිධී අනුගාමිකො

10. එස දෙවමනුස්සානං සබ්බකාමදදො නිධි
යං යදෙවාභිපත්ථෙන්ති සබ්බමෙතෙන ලබ්භති.

11. සුවණ්ණතා සුස්සරතා සුසණ්ඨාන සුරූපතා
ආධිපච්චපරිවාරං සබ්බමෙතෙන ලබ්භති.

12. පදෙසරජ්ජං ඉස්සරියං චක්කවත්තිසුඛං පියං
දෙවරජ්ජම්පි දිබ්බෙසු සබ්බමෙතෙන ලබ්භති.

13. මානුසිකා ච සම්පත්ති දෙවලොකෙ ච යා රති
යා ච නිබ්බානසම්පත්ති සබ්බමෙතෙන ලබ්භති.

14. මිත්තසම්පදමාගම්ම යොනිසොව පයුඤ්ජතො
විජ්ජාවිමුත්තිවසීභාවො සබ්බමෙතෙන ලබ්භති.

1. තං පනෙතං තිවිධං හොති පරිභොගචෙතියං උද්දිස්සකචෙතියං ධාතුචෙතියන්ති. තත්ථ බොධිරුක්ඛො පරිභොගචෙතියං. බුද්ධපටිමා උද්දිස්සකචෙතියං. ධාතුගබ්භථූපා සධාතුකා ධාතුචෙතියං (අට්ඨකථා).

4. නිධානය හෝ තුබූතැනින් ඉවත් වෙයි. නිධාන කළ තැන පිළිබඳ ඔහුගේ සංඥාව හෝ මුළා වෙයි. (තුබූ තැන හැඳින ගත නොහැකි වෙයි.) නාගයෝ හෝ නිධානය තුබූ තැනින් ඉවත් කෙරෙත්. යක්ෂයෝ හෝ එය හැර ගෙණ යත්.

5. අප්‍රිය වූ දායාදයෝ (උරුමක්කාරයෝ) හෝ ඔහු නො දක්කදී පොළොව සාරා නිධානය ගොඩ ගණිත්. යම් කලෙක්හි පින් ගෙවී යෑමක් වේ ද, එකල්හි මේ සියල්ල වැනසෙයි.

6. යම් ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ දානයෙන් ද ශීල-යෙන්ද චිත්තසංයම සඞ්ඛ්‍යාත සමාධියෙන් ද කෙලශොපශම සඞ්ඛ්‍යාත ප්‍රඥයෙන් ද මනා සේ නිධානයක් කරණ ලද්දේ වේ ද,

7. චෛත්‍යය[1] කෙරෙහි ද, සඞ්ඝයා කෙරෙහි ද, යම් පුද්ගලයකු කෙරෙහි ද, ආගන්තුකයකු කෙරෙහි ද, මව කෙරෙහි ද, පියා කෙරෙහි ද, නැවත වැඩිමහලු සහෝදරයා (හෝ සහෝදරිය) කෙරෙහි ද,

8. දානාදි විධියෙන් මනා සේ තැන්පත් කරණ ලද මේ නිධානය ද, අන්‍යයන් විසින් දිනා ගන්නට නො හැකි ය. පරලොව යන කල්හි ද විපාක දීම් වශයෙන් තමා අනුව යන්නේ වෙයි. මරණාවස්ථාවෙහි හැර දමා යා යුතු වස්තූන් ඇති කල්හි මේ පුණ්‍යනිධානය රැගෙණ පර ලොව යෙයි.

9. පුණ්‍යනිධානය තෙමේ අන්‍යයන්ට සාධාරණ නො වේ. සොරුන් විසින් පැහැර ගත නො හැකි ය. (පර ලොව යන කල්හි ද) තමා අනු ව යන්නාවූ යම් පුණ්‍යනිධානයෙක් වේ ද, නුවණැත්තේ ඒ පින්කම් කරන්නේ ය.

10. මේ පුණ්‍යකර්මය තෙමේ දෙවිමිනිසුන්ට සියලු කැමැති සම්පත් දෙන නිධානය යි. ඔහු යමක් යමක් ප්‍රාර්ථනා කෙරෙද්ද ඒ සියල්ල මේ පුණ්‍ය නිධානය කරණ කොට ගෙණ ලැබේ.

11. සුන්දර ඡවිවර්ණ ඇති බව ද, මධුර වූ ස්වර ඇති බව ද, අඟපසඟ පිළිබඳ මනා සටහන් ඇති බව ද, සුන්දර ශරීර ඇති බව ද, අධිපතිභාවය හා පිරිවර ජනයා (පිරිස්) ද යන සියල්ල මේ පුණ්‍යනිධානය කරණ කොට ගෙණ ලැබේ.

12. ප්‍රදේශරාජ්‍යය ද, එක් එක් දිවයිනෙහි අණසක පැවැත්වීම නම් වූ ද්වීපචක්‍රවර්තිරාජ්‍යය ද, ප්‍රිය වූ මුළු සතර මහ දිවයිනේ අණසක පැවැත්වීම් සඞ්ඛ්‍යාත චක්‍රවර්තිරාජ්‍ය සැපය ද දෙව්ලොව දිව්‍ය සැපය ද යන සියල්ල මේ පුණ්‍යනිධානය කරණ කොට ගෙණ ලැබේ.

13. යම් මනුෂ්‍ය සම්පත්තියක් ඇද්ද, දෙව්ලොව යම් සුඛයක් හා සුඛ වස්තුවකුත් ඇද්ද, යම් නිර්වාණසම්පත්තියකුත් ඇද්ද, ඒ සියල්ල මේ පුණ්‍යනිධානයකරණ කොට ගෙණ ලැබේ.

14. කල්‍යාණමිත්‍රසම්පත්තිය නිසා උපායමනසිකාරයෙන් භාවනායොග-යෙහි යෙදෙන්නහුට පූර්වේනිවාසානුස්මෘතිඥනාදි ත්‍රිවිද්‍යාවෝ ය, අෂ්ටසමාපත්ති හා නිර්වාණධර්මසඞ්ඛ්‍යාත විමුක්තිය යන මොවුන් කෙරෙහි වශීභාවය ද යන සියල්ල මේ පුණ්‍යනිධානය කරණ කොට ගෙණ ලැබේ.

---

1. ඒ චෛත්‍යය වනාහි පරිභොග චෛත්‍යය උද්දිස්සක චෛත්‍යය ධාතු චෛත්‍යය යි ත්‍රිවිධ වෙයි. ඔවුන් අතුරෙන් බෝරුක පරිභොගචෛත්‍යය යි. බුදුපිළිමය උද්දිස්සක චෛත්‍යය යි. ධාතු සහිත දාගැබ් ස්තූප ධාතුචෛත්‍යය යි. (අටුවා යි.)

15. පටිසම්භිදා විමොක්ඛා ච යා ච සාවකපාරමී
පච්චෙකබොධි බුද්ධභූමි සබ්බමෙතෙන ලබ්භති.

16. එවං මහත්ථිකා එසා යදිදං පුඤ්ඤසම්පදා
තස්මා ධීරා පසංසන්ති පණ්ඩිතා කතපුඤ්ඤතං.

**නිධිකණ්ඩසුත්තං.**

---

## මෙත්තසුත්තං.

1. කරණීයමත්ථකුසලෙන
යන්තං[1] සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සුජූ ච[2]
සුවචො චස්ස මුදු අනතිමානී.

2. සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති,
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො

3. න ච ඛුද්දං සමාචරෙ[3]
කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා[4] ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.

4. යෙ කෙචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා[6],
දීඝා වා යෙ මහන්තා වා[7]
මජ්ඣිමා රස්සකා'ණුකථූලා.[8]

5. දිට්ඨා වා යෙව අදිට්ඨා[9]
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසී වා[10]
සබ්බෙ සත්තා[11] භවන්තු සුඛිතත්තා.

---

1. යන්තසන්තං. මජස 2. සුහුජු ච. (මජස ), සද්දනීතියම්පි. 3. ඛුද්දමාචරෙ (මජස) 4. ව. (මජස) 5. සබ්බසත්තා (මජස) 6. ථාවරාවනවසෙසා (මජස) 7. යෙ ච මහන්තා (මජස) 8. රස්සකා අණුකථූලා (මජස) 9. අදිට්ඨා. 10. භූතා ව සම්භවෙසී ව. (මජස) 11. සබ්බසත්තා. (මජස)

15. අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභාන ප්‍රඥාසඞ්ඛ්‍යාත පටිසම්භිදාවන් ද, අෂ්ටවිධ විමොක්ෂයන් ද, බුද්ධශ්‍රාවකයන් විසින් ලැබිය යුතු වූ ශ්‍රාවකසම්පත්තිය සිද්ධ කරණ යම් ශ්‍රාවකපාරමිතාවක් ඇත් නම් එය ද, ස්වයම්භූභාවය සිද්ධ කරණ යම් ප්‍රත්‍යෙකබෝධියක් (පසේ බුදුබවක්) ඇත් නම් එය ද, සියලු සත්ත්වයන්ට උතුම් බව සිද්ධ කරණ අනුත්තර බුද්ධභූමියක් (ලොවුතුරු බුදු බවක්) ඇත් නම් එය ද යන සියල්ල මේ පුණ්‍යනිධානය කරණ කොට ගෙණ ලැබේ.

16. යම් මේ පුණ්‍යසම්පත්තියක් වේ ද, එය මෙසේ මහත් අභිවෘද්ධිය පිණිස පවත්නේ ය. එහෙයින් ධීර ගුණයෙන් යුත් පණ්ඩිතයෝ කළ පින් ඇති බව පසසත්.

**නිධිකණ්ඩ සූත්‍රය යි.**

---

## මෙත්ත සූත්‍රය.

1. යම් ඒ ශාන්තපද සඞ්ඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, එයට පැමිණ නොහොත් එය අවබොධ කොට වසනු කැමැති අභිවෘද්ධිය සලසා ගැණීමෙහි දක්ෂයා විසින් එයට සුදුසු දෙය කළ යුතු ය. නිවණට පැමිණ වසනු කැමැත්තේ සත්‍යප්‍රතිවෙධය පිණිස පිළිපදින්නට නොහොත් කිසුණු පිරියම් කිරීම් වත් සමාදන් වීම් ආදි සියලු කාර්‍ය්‍යයන් කරන්නට දක්ෂයෙක් වන්නේ ය. (දක්ෂයකු විය යුතු ය.) සෘජු වන්නේ ය. එක් වරක් සෘජු වීමෙන් නො නැවතී දිවි ඇති තාක් මනා කොට සෘජු වන්නේ ය. අන්‍යයන් ගේ අවවාද මනා කොට පිළිගැණීම් වශයෙන් සුවච වන්නේ ය. මෘදු වන්නේ ය. අතිමාන ඇත්තේ නො වන්නේ ය.

2. ලද දෙයින් සතුටු වන්නෙක් ද පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් ද (ස්වකීය ශ්‍රමණධර්මය කිරීමට පමණක් සීමා වූ) සවල්ප කටයුතු ඇත්තෙක් ද, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් ද, සන්හුන් ඉඳුරන් ඇත්තෙක් ද, ප්‍රඥා ඇත්තෙක් ද, හැඞි දැඞි අසංවර ගති නැත්තෙක් ද, කුලයන් කෙරෙහි (සිවු පසයෙහි ඇලීම් ආදි වශයෙන්) නො ඇලුනෙක් ද වන්නේ ය.

3. නුවණැති අන්‍යයන් නිඳා කරණ සුළු වරදක් වත් නො කරන්නේ ය. “සියලු සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත් වා, සුඛිත සිත් ඇත්තෝ වෙත්වා’යි ද,

4. තෘෂ්ණාභය සහිත හෙයින් තැති ගන්නා සුලු වූ ද තෘෂ්ණා භය ප්‍රහීණ කළ හෙයින් ස්ථාවර වූ ද යම් කිසි සත්ත්වයෝ ඇත්තාහු නම්, ඒ සියලුදෙනා ද, (නාගාදි) දික් ශරීර ඇත්තෝ ද, (මත්ස්‍ය කැස්බ් අසුරාදි) මහත් ශරීර ඇත්තෝ ද, (අශ්වගවමහිෂාදි) මධ්‍යමප්‍රමාණ ශරීර ඇත්තෝ ද, (වාමනාදී) මිටි සිරුරු ඇත්තෝ ද, (පියෙවි ඇසට නොපෙණෙන) ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, (මස් කැසුබු ආදි) ස්ථූල ශරීර ඇත්තෝ ද,

5. ඇස් හමුවට පැමිණීම් වසයෙන් දුටු සත්තු ද, ඈත සිටි හෙයින් නුදුටු සත්තු ද, යම් සත්ත්ව කෙනෙක් දුරත් ලඟත් වසත් නම් ඔහු ද, ඉපදීම අවසන් කළ සත්ත්වයෝ ද (ක්ෂීණාශ්‍රවයෝ ද), මතු ඉපදීම සොයන (ශෛක්ෂ පෘථග්ජන) සත්ත්වයෝ ද යන මේ සියලු සත්ත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා‘යි ද මෙත් වඩන්නේ ය.

6. න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

7. මාතා යථා නියං පුත්තං
ආයුසා[1] එකපුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං.

8. මෙත්තඤ්ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං[2]

9. තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු[3]

10. දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො,
කාමෙසු විනෙය්‍ය ගෙධං[4]
න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති.

**මෙත්තසුත්තං**

## ඛුද්දකපාඨපාළි නිට්ඨිතා.

---

1. පුත්තමායුසා. (මජ්ඣ) 2. අවෙරමසපත්තං. (මජ්ඣ.)
3. විහාරමිධ මාහු. (මජ්ඣ) 4. විනය ගෙධං. (මජ්ඣ)

6. එකෙක් අනෙකකු නො රවටන්නේ ය. (නො රවටාවා). අනෙකකුට අවමන් නො කරන්නේ ය (නො කෙරේවා). ඛ්‍යාරොසනා නම් වූ කය හා වචනය පිළිබඳ විකෘතියෙන් ද ප්‍රතිඝසංඥා සඞ්ඛ්‍යාත මනෝවිකාරයෙන් ද එකෙක් අනෙකකුට දුකක් නො කැමැති වන්නේ ය (නො කැමැති වේවා).

7. මව යම්සේ තමා ගෙන් ඇතිවූ එක ම ඖරස පුත්‍රයා ජීවිත-පරිත්‍යාගයෙන් වුවත් රක්නේ ද, එ පරිද්දෙන් ම සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රීසහගත සිත වඩන්නේ ය.

8. උඩ ද යට ද සරස ද (සතුරන් ය යි කියන ලද) සීමාවකුදු නැති ව අතරතුර වත් වෛර චේතනා පහළ වීමක් නැති ව, සතුරන් රහිත ව සියලු ලෝකසත්ත්වයා කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රීසහගත සිත වඩන්නේ ය.

9. සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම් තාක් මෛත්‍රීසහගත සිහිය ඉටනු කැමැත්තේ ද, ඒ තාක් පහ වූ මිද්ධය (අලසබව) ඇති ව ඉටන්නේ ය. මේ මෛත්‍රීවිහරණය මේ බුද්ධශාසනයෙහි ශ්‍රෙෂ්ඨ විහරණයැ යි ප්‍රකාශ කළහ.

10. (සත්ත්වයෙක් පුද්ගලයෙක් ඇත්තේ ය යන) මිථ්‍යාදෘෂ්ටියට නො පැමිණ (ලොකොත්තරශීලයෙන්) සිල්වත් වූයේ (සොතාපත්තිමග්ගසම්මාදිට්ඨි ය යි කියන ලද) දර්ශනයෙන් යුක්ත වූයේ (සකෘදගාමි අනාගාමි මාර්ග දෙකින්) වස්තුකාමයන්හි ගිජුබව දුරු කොට, ඒකාන්තයෙන් ම නැවත ගර්භයෙක්හි විසීමට නො පැමිණෙන්නේ ය. (ශුද්ධාවාසයයෙක ඉපිද එහි දී ම රහත්බවට පැමිණ පිරිනිවන් පාන්නේ ය.)

**මෙත්ත සුත්‍රය යි.**

## ඛුද්දකපාඨ පෙළ නිමියේ ය.

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

## (දුතියො ගන්ථො)

## ධම්මපදපාළි

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

## (දුතියො ගන්ථො)

# ධම්මපදපාළි

---

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

## 1. යමකවග්ගො

1. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා 1
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති චක්කං'ව වහතො පදං.

2. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා 2
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති ඡායා'ව අනපායිනී.

3. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ 3
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති

4. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ 4
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

5. න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං 5
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො.

6. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ 6
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

7. සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං 7
භොජනම්හි අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං
තං වෙ පසහති මාරො වාතො රුක්ඛං'ව දුබ්බලං.

---

3 ආක්‍රොශන්මාමවොචන්මාම් ජයන්මාමහාරයත්
අත්‍ර යෙ උපනහ්‍යන්ති වෛරං තෙෂාං න ශාම්‍යති
4. ආක්‍රොශන්මාමවොචන්මාමජයන්මාමහාරයත්
අත්‍ර යෙ නොපනහ්‍යන්ති වෛරං තෙෂාං ප්‍රශාම්‍යති.
(මූලසර්වාස්තිවාදිවිනය. කොශාම්බකවස්තු)
5. න හි වෛරෙණ වෛරාණි ශාම්‍යන්තීහ කදාචන
ක්ෂාන්ත්‍යා වෛරාණි ශාම්‍යන්ති එෂ ධර්මඃ සනාතනඃ
6. පරෙ'ත්‍ර න විජානන්ති වයමත්‍රොද්‍යමාමහෙ
අත්‍ර යෙ තු විජානන්ති තෙෂාං ශාම්‍යන්ති මෙධකාඃ
(මූලසර්වාස්තිවාදිවිනය. කොශාම්බකවස්තු)

# සූත්‍රපිටකයෙහි

# ඛුද්දගත් සඟිය

---

## (දෙවෙනි ග්‍රන්ථය)

# ධම්මපියාපෙළ

## ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේට නමස්කාර වේවා.

## 1. යමකවග්ගය

1. (වෙදනාදි) චෛතසිකධර්මයෝ සිත පෙරටු කොට ඇතියහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇතියහ. සිතින් ම උපදනාහ. ඉදින් කිලිටි සිතින් (මුසාවාදාදි චතුර්විධ වාග්දුශ්චරිතය) කියන්නේ නම් හෝ (ප්‍රාණඝාතාදි ත්‍රිවිධ කාය දුශ්චරිතය) කරන්නේ නම් හෝ ඒ හේතුවෙන් දුක ඔහු ලුහු බඳියි. ගොනු අනුව යන ගැල් සක මෙනි. 1

2 (වෙදනාදි චෛතසික) ධර්මයෝ සිත පෙරටු කොට ඇතියහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇතියහ. සිතින් ම උපදනාහ. ඉදින් පහන් සිතින් කියන්නේ නම් හෝ කරන්නේ නම් හෝ ඒ හේතුවෙන් සැපය ඔහු කාටුව යෙයි. නොහැර කාටුව යන සෙවණැල්ල මෙනි. 2

3. 'මට ආක්‍රොශ කෙළේ යැ' යි ද, 'මට පහර දුන්නේ යැ යි' ද, 'මා දිනී යැ' යි ද, 'මා සතු දෑ පැහැර ගත්තේ යැ' යි ද, යම් කෙනෙක් ඒ ක්‍රෝධය සිතැ බඳිත් නම් ඔවුන්ගේ වෛරය නො සංහිඳේ. 3

4. 'මට ආක්‍රොශ කෙළේ යැ' යි ද, 'මට පහර දුන්නේ යැ යි' ද, 'මා දිනී යැ' යි ද, 'මා සතු දෑ පැහැර ගත්තේ යැ' යි ද, යම් කෙනෙක් ඒ ක්‍රොධය සිත නො බඳිත් නම් ඔවුන්ගේ ඒ වෛරය සංහිඳේ. 4

5. මේ ලෝකයෙහි කිසි කලෙකත් වෛරයෝ වෛරයෙන් නො සංහිඳෙත්. අවෛරයෙන් (ක්‍ෂාන්තියෙන් හා මෛත්‍රියෙන්) ම සංහිඳෙත්. මෙය පුරාතන වූ (බුදු පසේබුදු රහතුන් විසින් පුරුදු කොට ආ) සිද්ධාන්ත ධර්මයෙකි. 5

6 'මේ කලහයෙහිදී අපි නැසෙමු' යි කලහකාරී අන්‍යයෝ නො දන්නාහ. එහි යම් කෙනෙක් 'අපි නැසෙමු' යි දනිත් ද එයින් කලහයෝ සංහිඳෙත්. 6

7. (අරමුණු) ශුභ වශයෙන් බලමින් වසන, ඉන්ද්‍රියයන් කෙරෙහි සංවරය නැති, භෝජනයෙහි පමණ නො දන්නා වූ, කාමවිතර්කාදි මිථ්‍යා-විතර්කයනට වසඟ බැවින් කුසීත වූ, වීර්‍ය්‍ය නැති ඒ පුද්ගලයා ඒකාන්ත-යෙන් (ක්ලෙශ) මාර තෙමේ මැඩ ලයි. වාතය දුබල රුකක් මැඩ ලන්නාක් මෙනි. 7

8 අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං 8
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං
තං වෙ නප්පසහති මාරො වාතො සෙලං'ව පබ්බතං.

9. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති 9
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

10. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො 10
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති.

11. අසාරෙ සාරමතිනො සාරෙ චාසාරදස්සිනො 11
තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසංකප්පගොචරා.

12. සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො 12
තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසඞ්කප්පගොචරා.

13. යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති 13
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.

14. යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති 14
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති.

15. ඉධ සොචති පෙච්ච සොචති පාපකාරී උභයත්ථ සොචති 15
සො සොචති සො විහඤ්ඤති දිස්වා කම්ම කිලිට්ඨමත්තනො.

16. ඉධ මොදති පෙච්ච මොදති කතපුඤ්ඤො උභයත්ථ මොදති 16
සො මොදති සො පමොදති දිස්වා කම්ම විසුද්ධිමත්තනො.

17. ඉධ තප්පති පෙච්ච තප්පති පාපකාරී උභයත්ථ තප්පති 17
පාපං මෙ කතන්ති තප්පති භිය්‍යො තප්පති දුග්ගතිං ගතො

18. ඉධ නන්දති පෙච්ච නන්දති කතපුඤ්ඤො උභයත්ථ නන්දති 18
පුඤ්ඤං මෙ කතන්ති නන්දති භිය්‍යො නන්දති සුග්ගතිං ගතො.

8. උඹුමාතකාදි දශ අශුභයන් අතුරෙන් එක්තරා අශුභයක් අනුව 8
බලමින් වසන, ඉඳුරන් කෙරෙහි මනා සංවරය ඇති, භෝජනයෙහි පමණ
දන්නා වූ, ශ්‍රද්ධා ඇති, සතර ඉරියව්හි වඩන ලද වීර්‍යය ඇති, මෙබඳු
පුද්ගලයා ක්ලේශමාර තෙමේ ඒකාන්තයෙන් මැඩ නො පවත්වයි.
වාතය ඒකඝන ගල් පර්වතයක් මැඩ ලිය නො හෙන්නාක් මෙනි.

9. රාගාදි කෙලෙස්කසට සහිත වූ ඉන්ද්‍රියදමනයෙන් ද වාක් 9
සත්‍යයෙන් ද තොර වූ යමෙක් කසාවත් හඳනේ පෙරෝනේ වේ ද,
ඒ පුද්ගලයා කසාවත් දැරීමට සුදුසු නො වෙයි.

10. යම් ආර්‍ය පුද්ගලයෙක් වමාරා ලූ කෙලෙස් කසට ඇත්තේ 10
වන්නේ ද. සිවු පිරිසිදු සිල්හි මොනොවට පිහිටියේ වේ ද, ඉන්ද්‍රිය-
දමනයෙන් හා වාක්සත්‍යයෙන් හා යුක්ත ද, හෙ තෙම කසාවත්
දැරීමට ඒකාන්තයෙන් සුදුසු වෙයි.

11. අසාරයෙහි සාරය යන දෘෂ්ටි ඇති, ශීලාදි සාරයෙහි අසාරය 11
යන දෘෂ්ටි ඇති, මිථ්‍යාසඞ්කල්පය ගොදුරු කොට ඇති ඒ අඥාන
ජනයෝ ශීලාදි සාරයට නො පැමිණෙත්.

12. (ශීලසාරාදි) සාර දැය සාර වශයෙන් ද, අසාර දැය අසාර 12
වශයෙන් ද දැන (වසන) නොවැරැදි අදහස් ගොදුරු කොට ඇති
ඒ ප්‍රාඥයෝ ශීලාදි සාරයට පැමිණෙත්.

13. නොමනා සේ සෙවිලි කළ කිසි ගෙයක් වැසි දහර යම් සේ 13
විනිවිද යේ ද, එසේ ම කාමරාග තෙමේ භාවනා වශයෙන් නො වැඩූ
සිත අතිශයින් විනිවිද යෙයි.

14. වැසි දහර සකස් කොට සෙවිලි කරන ලද ගෙයක් යම් සේ 14
විනිවිද නො යන්නේ ද, එ පරිදි ම කාමරාග තෙමේ භාවනා වශයෙන්
මොනොවට වැඩූ සිත විනිවිද නො යයි.

15. පව් කරන සුලු පුද්ගල තෙම (මැරෙන කාලයෙහි 15
කර්මානුස්මරණ වශයෙන්) මෙ ලොව දී ශෝක කරයි. විපාකානුභව
වශයෙන් පරලොව දී ශෝක කරයි. (මෙසේ) දෙලොවදී ම ශොක
කරයි. තමාගේ කිලිටි කර්ම දැක හෙ තෙම (මෙ ලොව දී) ශොක
කරයි. (නොයෙක් සැටියෙන් වැලපෙන්නේ) වෙසෙසින් පෙළෙයි.

16. පින් කළ පුද්ගල තෙම මෙ ලොව දී කුශලකර්මානුස්මරණයෙන් 16
සතුටු වෙයි. පරලොව දී විපාකානුභවයෙන් සතුටු වෙයි. දෙලොව දී ම
සතුටු වෙයි. තමාගේ විශුද්ධ වූ පුණ්‍යකර්මය දැක්මෙන් හෙ තෙම
මෙ ලොව දී සතුටු වෙයි. පරලොව දී ද බොහෝ සෙයින් සතුටු වෙයි.

17. පව් කරන සුලු පුද්ගල තෙම මෙ ලොව දී (කර්මසන්තාපයෙන්) 17
තැවෙයි. පරලොව දී විපාකසන්තාපයෙන් තැවෙයි. දෙලොව දී ම
තැවෙයි. ම විසින් පව් කරන ලදැයි (මෙලොව දී) තැවෙයි. දුගතියට
ගියේ (අනිෂ්ට විපාක සන්තාපයෙන්) බෙහෙවින් තැවෙයි.

18. පින් කළ පුද්ගල තෙමේ මෙලොව දී (කර්මනන්දනයෙන්) තුටු 18
වෙයි. පරලොව දී (විපාකනන්දනයෙන්) තුටු වෙයි. දෙලොව දී ම තුටු
වෙයි. මා විසින් පින් කරන ලදැයි මෙලොව දී තුටු වෙයි. සුගතියට
ගියේ ඉෂ්ටවිපාකනන්දනයෙන් බෙහෙවින් තුටු වෙයි.

19. බහුම්පි චෙ සහිතං භාසමානො 19
න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති.

20. අප්පම්පි චෙ සහිතං භාසමානො 20
ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති.

**යමකවග්ගො පඨමො**

---

## 2. අප්පමාදවග්ගො

1. අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං 21
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

2. එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා 22
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා.

3. තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා 23
ඵුසන්ති ධීරා නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං

4. උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො 24
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසො'භිවඩ්ඪති.

5. උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච 25
දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති.

---

1. අප්‍රමාදෝ හ්‍යමෘතපදං ප්‍රමාදෝ මෘත්‍යුනඃ පදම්.
අප්‍රමත්තා න ම්‍රියන්තෙ යෙ ප්‍රමත්තාඃ සදා මෘතාඃ (උදානවර්ග-අප්‍රමාදවර්ග v. 6)
අප්‍රමදු අමතපද ප්‍රමදු මචුනො පද
අප්‍රමත න මියති යෙ ප්‍රමත යධ මුතු. (ප්‍රාකෘතධම්පද)

2. ඒතද් විශෙෂතො ඥාත්වා හ්‍යප්‍රමාදස්‍ය පණ්ඩිතඃ
අප්‍රමාදෙ ප්‍රමොදෙත නිත්‍යමාර්‍යඃ ස්වගොචරම්. (උදානවර්ග-අප්‍රමාදවර්ග v 10)
එත විශෙෂධ ඤත්ව අප්‍රමදස පනිදතො
අප්‍රමදි ප්‍රමොදිඅ අරිඅන ගොයරි රතො. (ප්‍රා. ධ.)

4. උත්ථානවතඃ ස්මෘතාත්මනඃ ශුචිචිත්තස්‍ය නිශම්‍යචාරිණඃ:
සංයතස්‍ය හි ධර්මජීවිනො හ්‍යප්‍රමත්තස්‍ය යශො'භිවර්ධති (උදානවර්ග-අප්‍රමාදවර්ග v. 6)
උඨනමතො ස්මතිමතො සුයිකමස නිශමචරිනො
සඤ්ඤත හි ධම්ජිවිනො අප්‍රමතස යශිධවඪති (ප්‍රා. ධ. A. [3] 8)

5. උත්ථානෙනාප්‍රමාදෙන සංයමෙන දමෙන ච
ද්වීපං කරොති මෙධාවී තමොඝොනාභිමර්දති. (උදාන-අප්‍රමාද. v. 5.)
උඨනෙන අප්‍රමදෙන සඤ්ඤමෙන දමෙන ච
දිවු කරොති මෙධවි ය ජර නාභිමර්දති. (ප්‍රා. ධ. A [3] 7)

19. යමෙක් ත්‍රිපිටක බුද්ධ වචනය බොහෝ කොට කියන්නේ 19
නමුදු, තෙමේ පමා වූයේ, ඉදින් එය නො කරන්නේ (තමා කියන
පරිදි නො පිළිපදනේ) නම්, හේ (කුලියට) අනුන් ගේ ගෙරින් රක්නා
ගොපල්ලා මෙන් ශ්‍රාමණ්‍යයට (සතරඵලයනට) හිමි නො වෙයි.

20. යමෙක් ත්‍රිපිටක බුද්ධවචනය සවල්ප කොට කියන්නේ නුමුදු, 20
තෙමේ ධර්මානුධර්මප්‍රතිපත්තිය කරන්නේ නම්, (නවලෝකෝත්තර
ධර්මයට අනුරූප වූ පූර්වභාග ප්‍රතිපත්තිය කරන්නේ නම්), රාගයත්
ද්වේෂයත් මෝහයත් නසා පිරිසිඳිය යුතු දහම් පිරිසිඳ දන්නේ,
මෙලොවෙහි හෝ පරලොවෙහි හෝ (ආධ්‍යාත්මික හෝ බාහිර හෝ) කිසිදු
සකන්ධ ධාතු ආයතනයක් තෘෂ්ණාදි වශයෙන් නො ගන්නේ ශ්‍රාමණ්‍යයට
(සතර ඵලයටත් ආර්‍යශීලාදි අශෛක්‍ෂ ධර්මස්කන්ධ පසටත්) හිමි වෙයි.

**පළමු යමකවර්ගය**

---

# 2. අප්‍රමාද වර්ගය

1. (සුචරිතධර්ම විෂයයෙහි) නොපමා බව (සිහි නොමුළා බව) 21
නිර්වාණාධිගමයට කරුණු ය. (සුචරිතධර්ම විෂයෙහි) පමා බව (පමා
වූවහු ඉපදීමටත් එයින් මරණයටත් පැමිණෙන බැවින්) මරණයට
කරුණු ය. (කල්‍යාණධර්මයෙහි) නො පමා වූවෝ නො මියෙති. යම්
කෙනෙක් ධර්මයෙහි පමා වෙත් ද, ඔහු (ජාත්‍යාදියෙන් නොමිදුණු
බැවින්) මළවුන් වැනි වෙත්.

2. නුවණැත්තෝ අප්‍රමාදයෙහි වූ මේ ගුණය වෙසෙසින් දැන 22
අප්‍රමාදයෙහි සතුටු වෙති. ආර්‍යයන්හට ගෝචර වූ බෝධිපාක්‍ෂිකධර්මය
නව ලෝකෝත්තර ධර්මය යන මෙහි ඇලුනෝ වෙත්.

3. ධ්‍යාන වඩන සුලු, සතතයෙන් පැවැති වීර්‍යය ඇති, නිතර 23
පැවැති දැඩි පැරැකුම් ඇති ඒ ප්‍රාඥයෝ කාමාදි යෝගයන්ගෙන්
නිර්භය වූ අනුත්තර වූ නිර්වාණය සපයී කරති.

4. උත්ථාන (සංඛ්‍යාත වීර්‍ය)යෙන් යුක්ත වූ, (කුදු මහත් 24
කටයුත්තෙහි) එළඹ සිටුනා සිහි ඇති, නිර්දෝෂ කායකර්මාදිය ඇති,
(සියලු කටයුතු) පරීක්‍ෂා කොට කරන සුලු වූ, සංයත වූ කායවාක්කර්ම
ඇති, ධාර්මික ජීවිකායෙන් ජීවත් වන්නාවූ, (කෘෂිවණික්කර්මාන්ත
රාජසේවාදියෙහි) අප්‍රමත්ත වූ, පුරුෂයාගේ (ඓශ්වර්‍ය භොග පරිවාර
සම්මාන සංඛ්‍යාත වූ ද කීර්තිවර්ණ සංඛ්‍යාත වූ ද) යශස (ඔදවැඩි) මුහුද
මෙන් වඩනේ ය.

5. (කායික මානසික වීර්‍ය සංඛ්‍යාත) උත්ථානයෙන් ද, (සුසිරිත් 25
දහම්හි) සිහි ඇති බව යැ යි කියන ලද අප්‍රමාදයෙන් ද, (සිවු පිරිසිදු සිල්
යැ යි කියන ලද) කායවාක් සංයමයෙන් ද, (සදොරට හමු වූ අරමුණෙහි
ලෝභ ද්වේෂ මෝහ නො උපදවා යෝනිසොමනස්කාරය පැවැත්මය යි
කියන ලද) ඉන්ද්‍රිය දමනයෙන් ද, (විවසුන් නුවණින් යුත්) ප්‍රාඥ තෙම,
යම් ප්‍රතිෂ්ඨාවක් (කාමෞඝාදි වූ) කෙලෙස් මහවතුර නො නසා ද
(නසාපිය නො හේ ද), ඒ (රහත්පල නැමැති) ප්‍රතිෂ්ඨාව කරන්නේ ය.

6. පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා 26
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං'ව රක්ඛති.

7. මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං 27
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං.

8. පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො 28
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො'ව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති.

9. අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො 29
අබලස්සං'ව සීඝස්සො හිත්වා යාති සුමෙධසො.

10. අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො 30
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා.

11. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා 31
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගීව ගච්ඡති.

12. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා 32
අභබ්බො පරිහාණාය නිබ්බාණස්සෙව සන්තිකෙ.

**අප්පමාදවග්ගො දුතියො.**

---

6. ප්‍රමද අනුයුජති බල දුමෙධිනො ජන
අප්‍රමද තු මෙධවි ධන ශෙඨි ව රජති (ප්‍රා. ධ. A. [illegible] 14)
ප්‍රමාදමනුවර්තන්තෙ බාලා දුර්මේධසො ජනාඃ
අප්‍රමාදං තු මෙධාවී ධනං ශ්‍රෙෂ්ඨම් ව රක්ෂතෙ. (උදානවර්ග-අප්‍රමාදවර්ග v. 10)
7. ප්‍රමාදං නානුයුජ්‍යෙත න කාමරතිසංස්තවම්
අප්‍රමත්තඃ සදධ්‍යායී ප්‍රාප්නුතෙ පරමං සුඛං (උදානවර්ග- (iv. v. 11)
න ප්‍රමද සමයු අප්‍රති අසව ජහි.
අප්‍රමතො හි ඣයතු ප්‍රනොති පරමු සුහු (ප්‍රා. ධ.)
අප්‍රමදි ප්‍රමොදිය ම ගාමරති සම්හමු
අප්‍රමතො හි ඣයතු විශෙෂ අධිගඡති (ප්‍රා. ධ )
8. ප්‍රමාදමප්‍රමාදෙන යදා නුදති පණ්ඩිතඃ
ප්‍රඥාප්‍රසාදමාරුහ්‍ය ත්වශොකඃ ශොකිනීං ප්‍රජාම්
පර්වතස්ථ ඉව භූමිෂ්ඨාන් ධීරො බාලානවෙක්ෂතෙ (උදාන-අප්‍රමාද. v. 4)
ප්‍රඥාප්‍රසාදමාරුහ්‍යාශොච්‍යඃ ශොචතො ජනාන්
භූමිෂ්ඨානිව ශෛලස්ථඃ සර්වාන් ප්‍රාඥො'නුපශ්‍යති (යොගභාෂ්‍ය I. 40)
ප්‍රමද අප්‍රමදෙන යද නුදති පනිතු.
ප්‍රඥ ප්‍රසද අරුහි අශොක ශොකිනො ජන
ප්‍රවතශොව භුමඨ ධීරු බල අවෙක්ෂති. (ප්‍රා. ධ. A [illegible]. 15)
9. අප්‍රමතු ප්‍රමතෙෂු සුතෙෂු බහු ජගරු.
අබලශ ව භද්‍රශු හිතු යති සුමෙධසු.
10. අප්‍රමාදං ප්‍රශංසන්ති ප්‍රමාදො ගර්හිතඃ සදා.
අප්‍රමාදෙන මඝවාන් දෙවානාං ශ්‍රෙෂ්ඨතාං ගතඃ (උදානවර්ග iv v. 24)
අප්‍රමදෙන මඝව දෙවන සමිධි ගතු.
අප්‍රමද ප්‍රශංසති ප්‍රමදු ගරහිතු සද (ප්‍රා. ධ. A [illegible]. 17.)
11. අප්‍රමාදරතො භික්ෂුඃ ප්‍රමාදෙ භයදර්ශකඃ
දුර්ගාදුද්ධරත ආත්මානං පඞ්කසන්නා ඉව කුඤ්ජරඃ (උදානවර්ග අප්‍රමාද - 13)
2 අප්‍රමද රතු යො භිඛු ප්‍රමදි භයදර්ශි වා
අභවු පරිහනඑ නිවනසෙව සන්තිකෙ. (ප්‍රා. ධ. B. 32)

6. දෙලෝ වැඩ නොදන්නා අනුවණ සත්ත්වයෝ ප්‍රමාදයෙහි යෙදී 26
පවත්නාහ (ප්‍රමාදයෙන් දවස් යවන්නාහ). නුවණැත්තේ අප්‍රමාදය
(කුලවංශාගත) උතුම් ධනයක් මෙන් රක්නේ ය.

7. ප්‍රමාදය නහමක් පුරුදු කරන්නේ ය (ප්‍රමාදයෙහි යෙදී නො 27
වසන්නේ ය). (වස්තුකාම ක්ලේශකාම දෙක්හි රතිය යි කියන ලද)
තෘෂ්ණාසංස්තවයෙහි නහමක් යෙදෙන්නේ ය. එළඹ සිටි සිහි ඇති
(නොපමා වූ), භාවනා කරන පුද්ගල තෙමේ මහත් නිවන් සුවයට
පැමිණෙන්නේ ය.

8. ප්‍රාඥ වූ ආර්‍යශ්‍රාවක තෙම යම් කලෙක කුසල්හි (සිහි ඇති බව 28
යැ යි කියන ලද) අප්‍රමාදයෙන් ප්‍රමාදය (සිහිමුළාව) දුරු කෙරේ ද,
එකල්හි (දිව්‍යැස්නුවණැ යි කියන ලද) ප්‍රඥාප්‍රාසාදයට නැඟී, (අනාගාමි
මගින් උදුරා හළ ශෝකශල්‍ය ඇති බැවින්) ශෝක රහිත වූ ප්‍රාඥ වූ ඒ
රහත් තෙම නො උදුරා හළ ශෝක ඇති බැවින් ශෝකී වූ ප්‍රජාව (හෙවත්
චුත වන උපදනා ශෝක සහිත සත්ත්ව සමූහය) බලන්නේ ය. බිම
සිටියවුන් (සුවසේ බලන) පර්වත මුදුනෙක්හි සිටි එකක්හු මෙන්
(නොසුන් තෘෂ්ණා ඇති බැවින් චුත වන උපදනා) බාලජනයන්
දිවැසින් සුව සේ දක්නේ ය.

9. පමා වූවන් අතුරෙහි නොපමා වූ, (කෙලෙස් නින්දෙන්) නිදන 29
සතුන් අතුරෙහි (කෙලෙස් නිදි නැති හෙයින්) බොහෝ පිබිද සිටින,
සොඳුරු නුවණ ඇති රහත් තෙමේ කොර පා ඇති ජවහීන දුබල අසකු
හැර පියා යන සීඝ්‍ර ජව ඇති සෛන්ධව අසකු මෙන්, පමා වූ සතුන්
(ආගමාධිගම දෙකින් ම) පසු කොට පියා (සසරින් නික්ම) නිවන් පුරට
යන්නේ ය.

10. සක්දෙව් තෙම මඝමාණවක කාලයෙහි පුරුදු කළ අප්‍රමාද 30
හේතුයෙන් (දෙව්ලොවැ) දෙවියනට උතුම් බවට (රජ බවට) පැමිණියේ
ය. (එහෙයින්) (බුද්ධාදි පණ්ඩිතයෝ) නොපමාබව පසසත්. පමාබව
වනාහි හැම කල්හි ම (බුද්ධාදීන් විසින්) ගරහන ලද්දේ ය.

11. නොපමාබව්හි ඇලුනු, පමායෙහි බිය දක්නා සුළු, මහණ 31
තෙම (ඌර්ධ්වභාගිය වශයෙන්) කුඩා වූ ද, (ඔරම්භාගිය වශයෙන්) මහත්
වූ ද, සංයෝජන සියල්ල ලැව්ගින්නක් සෙයින් (රහත්මග නුවණ
ගින්නෙන්) දවමින් යන්නේ ය.

12. නොපමාබව්හි ඇලුනු, පමායෙහි බිය දක්නා සුළු මහණ තෙම 32
(ශමථ විදර්ශනා කෙරෙන් හෝ මාර්ගඵලාධිගමය කෙරෙන් හෝ) පිරිහීමට
අයෝග්‍ය ය. හේ නිවන වෙතැම වෙයි.

**දෙවෙනි අප්‍රමාදවර්ගය යි.**

# 3. චිත්තවග්ගො

1. ඵන්දනං චපලං චිත්තං දූරක්ඛං දුන්නිවාරයං 3
උජුං කරොති මෙධාවී උසුකාරො'ව තෙජනං.

2. වාරිජො'ව ථලෙ ඛිත්තො ඔකමොකත උබ්භතො 34
පරිඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ.

3. දුන්නිග්ගහස්ස ලහුනො[1] යත්ථකාමනිපාතිනො 35
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං.

4. සුදුද්දසං සුනිපුණං යත්ථකාමනිපාතිනං 36
චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං.

5. දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං 37
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා.

6. අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො 38
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.

7. අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො 39
පුඤ්ඤපාපපහීනස්ස නත්ථි ජාගරතො භයං.

8. කුම්භූපමං කායමිමං විදිත්වා නගරූපමං චිත්තමිදං ඨපෙත්වා 40
යොධෙථ මාරං පඤ්ඤායුධෙන ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා.

9. අචිරං වතයං කායො පඨවිං අධිසෙස්සති 41
ඡුඩ්ඩො අපෙතවිඤ්ඤාණො නිරත්ථං'ව කලිඞ්ගරං.

10. දිසො දිසං යන්තං කයිරා වෙරී වා පන වෙරිනං 42
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො තං තතො කරෙ.

---

1. ස්පන්දනං චපලං චිත්තං දුරක්ෂං දුර්නිවාරණම්
ඍජුං කරොති මෙධාවී ඉෂුකාර ඉව තෙජනම් (උදානවර්ග-චිත්ත. 8)
දුරජ දුැනිවරණ.) ප්‍රා. ධ. A. 8)

2. වාරිජ ඉව ස්ථලෙ ක්ෂිප්තශ්චොකාද්‍යෞකාත් සමුද්ධෘතඃ
පරිස්පන්දති වෛ චිත්තං මාරධෙයං ප්‍රහාතවෙ (උදානවර්ග V. 2)

5. දුරගම එකචර අශරිර ගුහශය
යෙ චිත සඤමෙශති මොචති මරබනන (ප්‍රා. ධ.)

6. අනවස්ථිත චිත්තස්‍ය සද්ධර්මමවිජානතඃ
පරිප්ලවප්‍රසාදස්‍ය ප්‍රඥා න පරිපූර්යතෙ (උදානවර්ග. 31, V. 28)
අනවඨිත චිතස (ප්‍රා. ධ. A. 1)

7. අනවශ්‍රුත චිතස (ප්‍රා. ධ. A 4)

9. අචිරෙත වත ඉ කයු පඨවි.. සිති
රුජ......විඤන නිරථ බ කඩිගරු (ප්‍රා. ධ. C VO 11)
අචිරං බත කායො'යං පෘථිවීමධිශෙෂ්‍යති
ශූන්‍යො'ව්‍යපෙතවිඥානො නිරස්තං වා කඩංගරම් (උදාන වර්ග V. 35)

# 3. චිත්තවග්ගය

1. නොයෙක් අරමුණෙහි සැලෙන, (එක් අරමුණෙක නොපිහිටන 33
හෙයින්) චපල වූ (අනවස්ථිත වූ), රක්නට දුෂ්කර වූ, (දුසිරිත් කෙරෙන්
වළක්වන්නට දුෂ්කර වූ) සිත නුවණැත්තේ සෘජු කරනනේ ය. හීවඩුවා
හීදණ්ඩක් ඇද මැඩ ඉදි කරන්නාක් මෙනි.

2. උදක සංඛ්‍යාත වාසස්ථානයෙන් නගන ලද, ගොඩ බිම හෙළන 34
ලද මසකු මෙන් මේ (අභාවිත) සිත (නොයෙක් අරමුණෙහි පරිභ්‍රමණ
වශයෙන්) සැලෙන්නේ ය. (එහෙයින් ම) මාරධෙය්‍යය (කෙලෙශවෘත්තය)
පහ කටයුතු යි.

3. නිගන්නට (මැඩ්ඩ කැරැ ගන්නට) නොපිළිවන්, ලඝු වූ (වහා ඉපිද 35
වහා බිඳෙන සුලු), (යුතු හෝ අයුතු) යම් කැමැති අරමුණෙක හෙන
සුලු වූ සිත (අරි මඟින්) නිපොපි කිරීම මැනැවි. මේ සිත දමූතේ (නිපොපි
කැරැතේ) මඟපල සුව ද නිවන් සුව ද එළවන්නේ ය. (එහෙයිනි)

4. දක්නට ඉතා නොපිළිවන්, ඉතා සියුම් වූ, යම් කැමැති අරමුණෙක 36
බැස වැටෙන සුලු වූ සිත නුවණැත්තේ රක්නේ ය. සිත (නොයෙක්
අරමුණෙහි විසිර පැවැත්ත නො දී එක් භාවනා අරමුණෙහි පිහිටුවා)
රක්නා ලද්දේ ලොවී ලොවුතුරු සුව එළවන්නේ ය.

5. (යොදුන් දහසෙකින් දුර වූ ද අරමුණු ගන්නා බැවින්) දුරට 37
යන්නා වූ ම, හුදෙකලා හැසිරෙන (එක් විට දෙසිතක් නො ඉපද
එක් සිතක් ම උපදනා බැවින් එකක් ව ම හැසිරෙන), (අරූපී ධර්ම
බැවින් පැහැ සටහන් නැත්තු සි) අශරීර වූ, (ශරීර නැමැති) ගුහායෙහි
පවත්නා වූ සිත යම් කෙනෙක් සංවරයෙහි පිහිටුවද්ද, ඔහු මාරබන්ධ-
නයෙන් (ත්‍රෛභූමික වෘත්තයෙන්) මිදෙන්නාහු ය.

6. (දහවෙසියා රුසෙක හිඳු වූ කණුවක් මෙන් කලෙක නිවටු ව ද 38
කලෙක තවුස් ව ද කලෙක ගිහි ව දු සි යන ආදි වශයෙන්) අනවස්ථිත
සිත් ඇති, (බෝපැකි) දහම් නොදන්නා, (අචල ප්‍රසාදයෙහි නො
පිහිටි හෙයින් හෝ සැදැහැ මඳ හෙයින්) ඉපිලෙන සැදැහැ ඇත්තාහට
(කාමාවචරාදි ප්‍රභෙද ඇති) ප්‍රඥාව නො පිරෙයි

7. රාගයෙන් නොතෙත් වූ සිතැති, ද්වෙෂයෙන් නොපැහැරුණු 39
සිතැති, (රහත්මඟින්) කුසල් අකුසල් ප්‍රහීණ කළ, (ශ්‍රද්ධාදි පංච
ජාගර ධර්මයෙන් යුක්ත බැවින්) නො නිදන රහත්හට කෙලෙසුන්ගෙන්
බියෙක් නැත.

8. මේ ශරීරය කුඹල්බඳුනක් වැනි යැ යි දැන, මේ විදර්ශනාචිත්තය 40
ස්ථිර නුවරක් සේ තබා, ප්‍රඥ නැමැති ආයුධයෙන් කෙලෙශමාරයා
පහරින්නේ ය. උපදවන ලද තරුණ විදර්ශනාව රක්නේ ය. සමාපත්තිය
ගෙය කොට ගෙණ එහි නො වසන්නේ ය.

9. මහණ, තාගේ මේ කය නොබෝ කලෙකින් ඒකාන්තයෙන් 41
පහ වූ සිතැති ව, ඉවත ලන ලදු ව, දිරා ගිය දඬු කඩක් මෙන්
පොළොව මත හෝනේ ය.

10. සොරෙක් සොරකු දැක ඔහුට යම් නපුරක් කෙරේ ද, බද්ධ 42
වෛර ඇති පුද්ගලයෙක් වෛර බැඳුනකු දැක ඔහුට යම් අවැඩක් කෙරේ
ද, වරදවා පිහිටුවන ලද සිත එයට වඩා ඔහු පවිටකු කරන්නේ ය.

11. න තං මාතා පිතා කයිරා අඤ්ඤෙ වා පි ච ඤාතකා 43
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙ.

**චිත්තවග්ගො තතියො.**

---

## පුප්ඵවග්ගො

1. කො ඉමං පඨවිං විචෙස්සති[a] 44
* යමලොකඤ්ච ඉමං සදෙවකං
කො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමිව පචෙස්සති.

2. සෙඛො පඨවිං විචෙස්සති 45
යමලොකඤ්ච ඉමං සදෙවකං
සෙඛො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමිව පචෙස්සති.

3. ඵෙණූපමං කායමිමං විදිත්වා 46
මරීචිධම්මං අභිසම්බුධානො
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි[b]
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ.

4. පුප්ඵානි හෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං 47
සුත්තං ගාමං මහොඝො'ව මච්චු ආදාය ගච්ඡති.

5. පුප්ඵානි හෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං 48
අතිත්තං යෙව කාමෙසු අන්තකො කුරුතෙ වසං.

6. යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං 49
පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ.

7. න පරෙසං විලොමානි න පරෙසං කතාකතං 50
අත්තනො'ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච.

8. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං 51
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො.

9. යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං 52
එවං සුභාසිතා වාචා සඵලා හොති පකුබ්බතො.

---

1. *(යමලොක ඡ්) ඉත සදෙවක
කො ධමපද සුදෙශිත කුශල පුෂ්පම්ව පචෙෂිති (ප්‍රා. ධ. C. 1.)

2 බුධු ප්‍ර ධ......ෂිති යම්ලොක ඡ් එත සදෙවක.
බුධු ධම්පද සුදෙසිත කුශල පුෂ්පම්ව පචෙෂිති (ප්‍රා ධ. C 2)

a විජෙස්සති ඉති බහුසු

b සපුප්ඵකානීති කොසුචි.

සුප්තං ව්‍යාඝ්‍රං මහෞඝො වා මෘත්‍යුරාදාය ගච්ඡති. සංචින්වානකමෙවෛනං කාමානාමවිතෘ-තකම්. (ශාන්තිපර්ව. 9939. මහාභාරත.) 5. පුෂ්පාණීව විචින්වන්තමන්‍යත්‍රගතමානසම්. අනවාප්තෙෂු කාමෙෂු මෘත්‍යුරභ්‍යෙති මානවම්. (ශාන්තිපර්ව. 6540. මහාභාරත.)

11. ඒ කරුණ සිය මව නො ද කරන්නී ය. පිය තෙම නො ද 43
කරන්නේ ය. සෙසු නෑයෝ නො ද කරන්නා හ. මොනොවට පිහිටුවන ලද
සිත ඒ කුශලක්‍රියාවන්හි පිහිටීම් හෙතුවෙන් ඒ පුද්ගලයා වඩා උතුමකු
කරන්නේ ය.

**තෙවෙනි චිත්තවර්ගය සි.**

---

## පුෂ්පවර්ගය

1. කවරෙක් ආත්මභාව සංඛ්‍යාත මේ පෘථිවිය ප්‍රත්‍යක්ෂ කොට දැන 44
ගන්නේ ද? දෙව්ලොව සහිත මේ මිනිස්ලොවත් සිවු අපායත් ප්‍රත්‍යක්ෂ
කොට දැන ගන්නේ ද? කවරෙක් දක්ෂ මල්කරුවකු මල් නෙලන්නා සේ
සත්තිස් බෝපැකි දහම් ප්‍රත්‍යක්ෂ කරන්නේ ද?

2. සත්වැදෑරුම් ශෛක්ෂ තෙම මේ පෘථිවිය (මේ අත්බව) ප්‍රත්‍යක්ෂ 45
කරන්නේ ය. දෙව්ලොව සහිත මේ මිනිස්ලොව හා අපායලොකය ප්‍රත්‍යක්ෂ
කරන්නේ ය. ශෛක්ෂ තෙම දක්ෂ මල්කරුවකු මල් නෙලන්නාක් මෙන්
සත්තිස් බෝපැකිදහම් පසක් කරන්නේ ය.

3. මහණ තෙම මේ කය පෙණ පිඩක් වැනි කොට දැන, මේ කය 46
මිරිඟුවක් බඳු යැ යි ද දැන ගන්නේ, මාරයාගේ ප්‍රපුෂ්පකයන් (ත්‍රෛභූමක
වෘත්තය)ආර්‍යයි මාර්ගයෙන් සිඳ මෘත්‍යුමාරයාට අවිෂය වූ අමා මහනිවනට
පැමිණෙන්නේ ය.

4. මල් නෙලන්නකු මෙන් පස්කම් මල් සොයන, විවිධ කාම- 47
ගුණයන්හි ඇලුණු සිතැති සත්ත්වයා, නිදන ගම්වැසියන් මුහුද කරා ගෙන
යන ගැඹුරු මහ වතුරක් මෙන්, මෘත්‍යුමාර තෙම අපාය සංඛ්‍යාත
මුහුදට ගෙන යයි.

5. මල් නෙලන්නකු මෙන් පස් කම් ගුණ නැමැති මල් සොයන, 48
විවිධ කාමගුණයන්හි ඇලුනු සිතැති, කාමයන්හි සෑහීමට නො
පැමිණියා වූ ම සත්ත්වයා මර තෙම සිය වශයට පමුණුවයි.

6. යම් සේ බමරෙක් මල ද පැහැය ද ගඳ ද නො නසමින් මල්රස 49
පමණක් ගෙන නැගී යේ ද, එ පරිද්දෙන් ම මුනි තෙම ගමෙහි
හැසිරෙන්නේ ය.

7. මෙරමාගේ පරෙස් බස් මෙනෙහි නො කරන්නේ ය (නො කට 50
යුතු). මෙරමා කළ නො කළ දුසිරි සුසිරි නො බලන්නේ ය. තමා කළ
දුසිරි ද නො කළ සුසිරි ද බලන්නේ ය (බැලිය යුතු).

8. සිත්කලු වූ, මනා පැහැසටහන් ඇති, සුවඳ නැති මල් යම්සේ ද, 51
එසේ ම මොනොවට දෙසන ලද ත්‍රිපිටක බුඩවචනය නො කරන්නහුට
(ඇසීම ඉගෑනීම දැරීම පිළිපෑදීම නො කරන්නහුට) නිෂ්ඵල වේ.

9. සිත්කලු වූ මනා පැහැති සුවඳැති මල යම්සේ ද, එසේ ම මනා 52
කොට දෙසන ලද ත්‍රිපිටක බුඬවචනය එය කරන්නහුට සඵල වේ.

10. යථාපි · පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ 53
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං.

11. න පුප්ඵගන්ධො පටිවාතමෙති න චන්දනං තගරමල්ලිකා වා 54
සතඤ්ච ගන්ධො පටිවාතමෙති සබ්බා දිසා සප්පුරිසො පවාති.

12. චන්දනං තගරං වාපි උප්පලං අථ වස්සිකී 55
එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො.

13. අප්පමත්තො අයං ගන්ධො යායං තගරචන්දනී 56
යො ච සීලවතං ගන්ධො වාති දෙවෙසු උත්තමො.

14. තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං 57
සම්මදඤ්ඤා විමුත්තානං මාරො මග්ගං න වින්දති.

15. යථා සඞ්කාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ 58
පදුමං තත්ථ ජායෙථ සුචිගන්ධං මනොරමං.

16. එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ 59
අතිරොචති පඤ්ඤාය සම්මාසම්බුද්ධසාවකො.

**පුප්ඵවග්ගො චතුත්ථො.**

---

# 4. බාලවග්ගො

1. දීඝා ජාගරතො රත්ති දීඝං සන්තස්ස යොජනං 60
දීඝො බාලානං සංසාරො සද්ධම්මං අවිජානතං.

2. චරඤ්චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො 61
එකචරියං දළ්හං කයිරා නත්ථි බාලෙ සහායතා.

3. පුත්තා මත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති 62
අත්තා හි අත්තනො නත්ථි කුතො පුත්තා කුතො ධනං.

4. යො බාලො මඤ්ඤති බාල්‍යං පණ්ඩිතො වා'පි තෙන සො 63
බාලො ච පණ්ඩිතමානී ස වෙ බාලො'ති වුච්චති.

5. යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති 64
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා.

6. මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති 65
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා.

---

15. යධ සගර උඩ්මස උඣිතස මහ පථි
පදුම් තත්‍ර ජඑඅ සුයි ගන්ධ මනොරමු. ( ප්‍රා. ධ. C 3 )

16. යධි සඞ්ක ධම්‍ර අ අන්ධභූත ප්‍රුධිජනෙ.
අභිරොයති ප්‍රඤ්ඤාය සම්සබුධසවක ( ප්‍රා. ධ. C. 4 )

10. දක්‍ෂ මාලාකාරයෙක් මල් රැසෙකින් යම්සේ බොහෝ මල්දම් 53
කරන්නේ ද, එසේ ම උපන් සත්ත්වයා විසින් බොහෝ කුසල් කටයුතු.

11. මල්සුවඳ උඩු සුළඟට නොයෙයි. සඳුන් තුවරලා සීනිද්ද 54
බෝලිද්ද සුවඳ ද උඩු සුළඟට නො යෙයි. බුඩාදි සත්පුරුෂයන්ගේ
සිල් ආදි ගුණසුවඳ උඩු සුළඟට යෙයි. සත්පුරුෂයා ගුණසුවඳින්
සියලු දිගුන් පැතිරැ හමයි.

12. සඳුන් තුවරලා මානෙල් දෑසමන් යන මෙකී සුවඳ දෑ අතුරෙහි 55
බුද්ධාදීන්ගේ සිල් සුවඳ ම උතුම් ය.

13. තුවරලා සඳුන් පිළිබඳ යම් සුවඳෙක් වේ ද, ඒ මේ සුවඳ ස්වල්ප- 56
මාත්‍ර එකෙකි. සිල්වතුන්ගේ යම් උතුම් ගුණසුවඳෙක් වේ ද, එය
දෙවියන් මිනිසුන් අතුරෙහි ද හමයි.

14. පිරිපුන් සිල් ඇති, සිහියෙන් යුතු විසුම් ඇති, මනා කොට සිවු 57
සස් දැන සියලු කෙලෙසුන්ගෙන් මිදුනු ඔවුන් ගිය මඟ මාර තෙම නොදනී.

15. මහමඟැ බහා ලන ලද කසළ ගොඩෙක සුවඳැති සිත්කලු 58
පියුමෙක් යම්සේ හටගැනේ ද,

16. එසේ ම කසළගොඩක් බඳු වූ නුවණ නැති පුහුදුන් 59
ලෝවැස්සා කෙරෙහි උපන්, සම්‍යක්සම්බුඩශ්‍රාවක (රහත්) තෙම ප්‍රඥයෙන්
සෙස්සන් ඉක්ම බබලයි.

**සිවුවන පුෂ්පවර්ගය යි.**

---

# 4. බාලවර්ගය

1. නොනිදන්නාට රැය දික් ය. ගමන් විඩා ඇත්තාට යොදුන 60
දික් ය. සදහම් නොදත් අනුවණයනට සසර දික් ය.

2. ශීලසමාධිප්‍රඥයෙන් තමාට වඩා උතුම්කු හෝ තමා හා සම 61
වූවකු හෝ සොයන නැතැත්තේ, එබන්දකු නො ලබන්නේ නම්, හුදෙ-
කලා වැ විසීම දැඩි කරන්නේ ය. අනුවණයා කෙරෙහි යහලු බවෙක් නැත.

3. ‘මට පුත්තු ඇත, මට ධනය ඇතැ’යි මෙසේ අඥන තෙමේ 62
දුකට පැමිණේ. ඒ එසේ ම ය. තෙමේත් තමහට නැත. පුත්‍රයෝ
කොයින් ද ? ධනයෙක් කොයින් ද ?

4. යමෙක් නුවණ නැත්තේ තමාගේ අනුවණබව දනී ද, ඒ 63
කාරණයෙන් හෙ තෙම පණ්ඩිත හෝ වන්නේ ය. (පණ්ඩිත සමාන හෝ
වන්නේ ය). යම් අනුවණයෙක් තෙමේ පණ්ඩිතමානී වේ ද ( තමා
පණ්ඩිතයකු කොට සිතා ද ), ඒ පුද්ගල තෙමේ ඒකාන්තයෙන් අනුවණ-
යෙකැ යි කියනු ලැබේ.

5. අනුවණ පුහුල් තෙමේ දිවිහිමියෙනුදු නුවණැත්තන් සෙව්නේ ද, 64
හෙ තෙම දහම් දැන නො ගන්නේ ය. සූපව්‍යංජන රසය නො දන
හෙන සැන්ද මෙනි.

6. නුවණැත්තේ මොහොතක් නමුදු බුඩාදි ප්‍රාඥයන් සෙව්නේ ද, 65
හේ වහා (ස්‍රෝතාපත්ති ප්‍රතිවෙධ) ධර්මය දැන ගනී. සූපව්‍යංජනයෙහි රස දැන
ගන්නා දිව මෙනි.

7. චරන්ති බාලා දුම්මේධා අමිත්තෙනෙව අත්තනා 66
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං.

8. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති 67
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති.

9. තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති 68
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති.

10. මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති 69
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති.

11. මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං 70
න සො සඞ්ඛාතධම්මානං කලං අග්ඝති සොළසිං.

12. න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරං'ව මුච්චති 71
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නො'ව පාවකො.

13. යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති 72
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධමස්ස විපාතයං.

14. අසතං භාවනමිච්ඡෙය්‍ය පුරෙක්ඛාරඤ්ච භික්ඛුසු 73
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච.

15. මමෙව කතං මඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො 74
මමෙව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මිචි
ඉති බාලස්ස සංකප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති.

16. අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී 75
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ.

බාලවග්ගො පඤ්චමො.

---

## 6. පණ්ඩිතවග්ගො

1. නිධීනං'ව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං 76
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො.

---

11. මාසෙ මාසෙ කුශාග්‍රෙණ බාලො භුඤ්ජෙය භොජනම්
න සො බුද්ධෙ ප්‍රසාදස්‍ය කලාමර්ඝති ෂොඩශීම්. (මහාවස්තු iii 436 පිට)
මසි මසි කුශගෙන යො භුජෙඅ භොයණ ච
න සො සංඛධම්මිණ කල අවෙති ෂොඩශි. (ප්‍රා. ධ. c. 14)

7. මෙලෝ පරලෝ වැඩ අවැඩ නොදන්නාවූ බාලයෝ, යම් කර්මයක් දුක් විපාක උපදවන්නේ ද, එ බඳු පාපකර්ම කරමින් තමන්හට සතුරකු වැනි වූ ආත්මයෙන් යුක්ත ව කල් යවති. 66

8. යම් කර්මයක් කොට සිහි කළ කෙණෙහි තැවේ ද, යම් කර්මයක්හුගේ අනිෂ්ට විපාකය කඳුළු වැකුණු මුහුණැති ව හඬමින් අනුභව කෙරේ ද, එබඳු අකුසල් කම් කිරීම නො මැනැවි. 67

9. යම් කර්මයක් කොට සත්ත්ව තෙම නො තැවේ ද, යම් කර්මයක් හුගේ ඉෂ්ට විපාකය ප්‍රීතිවේගයෙන් පිණා ගියේ සොඳුරු සිතැති ව අනුභව කෙරේ ද, එබඳු කුශල කර්ම කිරීම මැනැවි. 68

10. අකුශල කර්මය යම් තාක් විපාක නො දේ ද, ඒ තාක් අඥාන තෙම එය මී මෙන් මිහිරි කොට සිතන්නේ ය. යම් කලෙක අකුශල කර්මය විපාක දේ ද, එ විට අඥාන තෙම බලවත් දුකට පැමිණෙයි. 69

11. අඥාන පුද්ගල තෙම් මසක් පාසා තණ අගින් ගෙණ බොජුන් අනුභව කරන්නේ ද, හෙ තෙම චතුරාර්‍යසත්‍යයන් පිරිසිඳ දත් ක්ෂීණාස්‍රව-යන්ගේ සොළොස් වන කලාව පමණට ද නො අගී. 70

12. අකුශල කර්මය කළ සත්ත්වයාහට එය කළ ඇසිල්ලෙහි ම දෙනගේ තනයෙන් දෝනා ලද කෙණෙහි ම මිදී නොයන කිරි මෙන් එ කෙණෙහි විපාක නො දෙන්නේ ය. හලුයෙන් වැසුන සහලගුරු රැසක් මෙන් ඒ පාපියා දවමින් ඔහු ලුහුබඳී. 71

13. අඥානයා විසින් දන්නා ලද ශිල්පය හෝ ඔහුගේ ඉසුරුබව ඒ බාලයාහට අවැඩ පිණිස ම වන්නේ ය. එය බාලයාගේ ප්‍රඥා නැමැති හිස පළමින් ඔහුගේ කුසල් කොටස නසයි. 72

14. අඥාන භික්ෂු තෙම නුසුදුසු බුහුමන් ද, භික්ෂූන් පිරිවැරීම ද, සඞ්ඝිකාවාසයෙහි ඉසුරු බව ද, අන් උපාසකකුලයන්හි ප්‍රත්‍යය පූජාව ද කැමැති වෙයි. 73

15. 'ගිහි පැවිදි දෙකොටස විහාරයෙහි හැම කටයුතු මා විසින් කරණ ලද්දු යි සිතත් වා, කිසියම් කුදු මහත් කටයුතු මා විචාරා ම කෙරෙත්වා'යි මෙසේ බාලයාහට විතර්ක ද තෘෂ්ණා ද උපදනේ ය. එයින් ඔහුගේ මානය වැඩෙයි. 74

16. ලාභ උපදවන පිළිවෙත අනෙකෙක් ම ය. නිවනට පමුණුවන පිළිවෙත අනෙකෙක් ම ය. බුද්ධශ්‍රාවක භික්ෂු තෙම මේ කාරණය විශේෂයෙන් දැන නොදැහැමින් උපන් සත්කාරය නො ඉවසන්නේ ය. කායාදි ත්‍රිවිධ විවේකය වඩන්නේ ය. 75

**පස්වන බාලවර්ගය යි.**

---

## 6. පණ්ඩිතවර්ගය

1. වරද දක්නා සුලු, නිගා කොට බණන සුලු, යම් කලණ මිතුරකු නිදන් සැල තුබූ තැන කියන්නකු වැනි කොට දක්නේ ද, එබඳු පණ්ඩිතයා සෙවුනේ ය. එබන්දකු සෙවුනහුට යහපතෙක් ම වන්නේ ය. අවැඩෙක් නො වන්නේ ය. 76

2. ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ 77
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො.

3. න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ 78
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙ.

4. ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා 79
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො

5. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං 80
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා.

6. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති 81
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා.

7. යථාපි රහදො ගම්භීරො විප්පසන්නො අනාවිලො 82
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතා.

8. සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති න කාමකාමා ලපයන්ති සන්තො 83
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති.

9. න අත්තහෙතු න පරස්ස හෙතු 84
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.

10. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො 85
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

11. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො 86
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

12. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො 87
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.,

---

යො අත්ම හෙතු න පරස හෙතු.
පවනි කමනි සමයසර අ.
න ඉජිඅ අධමෙන සමිධි අත්මනො.
ස ශිලව පනිතු ධම්මිහො සිඅ. (ප්‍රා. ධ. උ. 26)

2. යම් කලණ මිතුරෙක් තිසිවකුට අවවාද කෙරේ ද, අනුශාසනා 77
කෙරේ ද, අකුශලධර්මයෙන් වළකා ද, මෙබඳු කලණ මිතුරා බුද්ධාදි
සත්පුරුෂයන්හට ප්‍රිය වෙයි. අසත්පුරුෂයන්හට අප්‍රිය වේ.

3. පාපමිත්‍රයන් සේවනය නො කරන්නේ ය. අධම පුරුෂයන් 78
සේවනය නො කරන්නේ ය. කලණ මිතුරන් භජනය කරන්නේ ය.
උත්තම පුරුෂයන් භජනය කරන්නේ ය.

4. ලොවුතුරා දහම් රසය විඳිනා මහණ තෙම සුවසේ වෙසෙයි. 79
නුවණැති මහණ තෙමේ වෙසෙසින් පහන් සිතින් බුද්ධාදි ආර්යයන්
විසින් දක්නා ලද ධර්මයෙහි හැම කල්හි ම ඇලෙන්නේ ය.

5. දියඇලුවෝ තමන් කැමැති තැනකට දිය ගෙන යති. හී වඩුවෝ 80
හී දඬු නමති. ලී වඩුවෝ දැව නමති. නුවණැත්තෝ සිත දමනය කරත්.

6. ඒකඝන වූ ශෛලපර්වතය ප්‍රචණ්ඩ වාතයෙන් යම්සේ නො 81
සැලේ ද, එපරිදි ම නුවණැත්තෝ නින්දා ප්‍රශංසා දෙක්හි නො සැලෙත්.

7. ගැඹුරු වූ මහ මුහුද යම්සේ වෙසෙසින් පහන් වේ ද, 82
නො කැළඹේ ද, එ පරිදි ම පණ්ඩිතයෝ දහම් අසා වෙසෙසින් පහදිත්.

8. බුද්ධාදි උත්තම පුරුෂයෝ සකන්ධාදි සියලු ධර්මයෙහි පවත්නා 83
ඡන්දරාගය දුරු කෙරෙති. ඒ සත්පුරුෂයෝ වස්තුකාමයන් කැමැති ව,
සිත් ගන්නා තෙපුල් නො පවසති. සුවයෙන් පහස්නා ලද නොහොත්
දුකින් පහස්නා ලද නුවණැත්තෝ උස් පහත් ගති නො දක්වත්.

9. පණ්ඩිත තෙම තමා හේතු කොට ගෙන ද (තමා පිණිස ද) පව් 84
නො කරන්නේ ය. මෙරමා හේතු කොට ගෙන ද (අනුන් පිණිස ද) පව්
නො කරන්නේ ය. පව්කම් කිරීමෙන් ලැබිය යුතු පුතකුදු නො කැමැති
වන්නේ ය. පව්කම් කිරීමෙන් ලැබිය යුතු ධනය ද නො කැමැති
වන්නේ ය. පව්කම් කිරීමෙන් ලැබිය යුතු රට ද නො කැමැති
වන්නේ ය. අධර්මයෙන් ලැබිය යුතු සමෘද්ධිය ද නො කැමැති
වන්නේ ය. මෙසේ වූ ඒ පුද්ගල තෙමේ සිල්වත් නමුදු ප්‍රඥාවත් නමුදු
ධාර්මික නමුදු වන්නේ ය.

85

10. මිනිසුන් අතුරෙහි යම් ජනකෙනෙක් නිර්වාණපාරයට (නිවන්
නැමැති පරතෙරට) යන සුල්ලෝ ද, ඔහු ස්වල්පය හ. වැලි ඔවුන්
කෙරෙන් අන්‍ය වූ (නිවනට නොයන සුලු) මේ සත්ත්වසමූහයා වූ කලි
(සත්කාය සංඛ්‍යාත) මෙ තෙර ම දිවැ ඇවිදින්නේ ය.

11. යම් නුවණැති කෙනෙක් මොනොවට දෙසන ලද පර්යාප්තිධර්ම- 86
යෙහි ධර්මානුවර්ත්ති වෙත් ද (දහම් අනුව පිළිපදින්නෝ වෙත් ද), ඒ
ජනයෝ තරණයට දුෂ්කර වූ, කෙලෙස්මරුව වාසස්ථාන වූ ත්‍රෛභූමක
වෘත්තය ඉක්මැ (නිර්වාණ නමැති) පරතෙරට පැමිණෙන්නාහ.

12. නුවණැත්තේ කළු දහම් (හෙවත් අකුසල්) දුරු ලා, ආලයයෙන් 87
(ගිහිගෙන්) නික්මැ පැවිදි බිමට පැමිණ (නොහොත් නිරාලය සංඛ්‍යාත
නිවන පිණිස) සුදු දහම් (කුසල්) වඩන්නේ ය. යම් උපධිවිවෙකයෙක්හි
(නිවනෙක්හි) මේ සත්ත්වයන් විසින් ඇලෙන්නට නො හැකි ද,

13. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො 88
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

14. යෙසං සම්බොධිඅඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං 89
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා.

**පණ්ඩිතවග්ගො ඡට්ඨො**

---

# 7. අරහන්තවග්ගො

1. ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි 90
සබ්බගන්ථප්පහීණස්ස පරිළාහො න විජ්ජති.

2. උය්‍යුඤ්ජන්ති සතිමන්තො න නිකෙතෙ රමන්ති තෙ 91
හංසා'ව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ.

3. යෙසං සන්නිචයො නත්ථි යෙ පරිඤ්ඤාතභොජනා 92
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යෙස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං ගති තෙසං දුරන්නයා.

4. යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො 93
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං පදං තස්ස දුරන්නයං.

5. යස්සින්ද්‍රියානි සමථං ගතානි 94
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීණමානස්ස අනාසවස්ස
දෙවා'පි තස්ස පිහයන්ති තාදිනො.

6. පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදි සුබ්බතො 95
රහදො'ව අපෙතකද්දමො සංසාරා න භවන්ති තාදිනො.

13. ඒ නිවනෙහි ඇල්ම කැමැති වන්නේ ය. නුවණැත්තේ වස්තු- 88
කාම ක්ලේශකාමයන් දුරු කොට (සිතින් පහ කොට) ක්ලේශපරිබෝධ
රහිත වූයේ (නොහොත් පුත්‍ර දර ගොම්හිෂාදි පළිබොධයක් නැත්තේ)
චිත්තක්ලේශයන් (පංච නීවරණයන්) කෙරෙන් තමා (තම සිත) පිරිසිදු
කරන්නේ ය.

14. යම් කෙනකුන්ගේ සිත බෝධ්‍යඞ්ගධර්ම විෂයයෙහි මනා කොට 89
වඩන ලද ද, උපාදාන රහිත වැ (මම ය මගේ යැ යි නො ගෙන), උපාදාන
ග්‍රහණ රහිත නිවනෙහි යම් කෙනෙක් ඇලුනාහු ද, ඥානානුභාව ඇති,
දුරලූ ආස්‍රව ඇති ඒ ආර්‍යයෝ ලොවෙහි පිරිනිවියෝ නම් වෙති.

**සවන පණ්ඩිතවග්ගය සි.**

---

## 7. අර්හද්වර්ගය.

1. සසර කතරමඟ ඉක්මි, පහ වූ ශෝක ඇති, (ස්කන්ධාදි) සියලු 90
දහම්හි නො ඇලී එයින් මිදුනු, (අභිජ්ඣාකායගන්ථාදී) සියලු ග්‍රන්ථ ප්‍රහීණ
කළ රහත්හට චෛතසික පරිදාහයෙක් නැත්තේ ය.

2. සිහි ඇතියෝ (රහත්හු) තමන් පිළිවිදි ධ්‍යානාදි ගුණයන්හි 91
ආවර්ජනාදි වශයෙන් යෙදෙන්නාහ. ඔහු ආලයයෙහි (පංචකාමයෙහි ද ගිහි
ගෙහි ද) නො ඇලෙන්නාහ. (ගොදුරු ගත්) විල හැරැ පියා යන හංසයන්
මෙන් ආලයයක් ආලයයක් පාසා (හෙවත් සියලු ආලයයන්) හරනාහ.
(විහාරාදියෙහි ඇලුම් හැර පක්ෂීන් මෙන් නිරපෙක්ෂක ව ම යන්නාහ.)

3. යම් රහත් කෙනකුන්ගේ (කර්‍ම හෝ චීවරාදිය) රැස් කිරීමෙක් 92
නැත් ද, යම් රහත් කෙනෙක් පිරිසිඳැ දත් ආහාර ඇත්තාහු ද, යම්
රහත් කෙනෙක්හට ශූන්‍යතා නම් වූ ද අනිමිත්ත නම් වූ ද නිවන අරමුණු
වේ ද, ඔවුන් ගේ උත්පත්තිගතිය, අහසෙහි පක්ෂීන් ගිය මඟ මෙන්,
නො දත හැකි ය.

4. යමක්හුගේ කාමාදී ආස්‍රවයෝ මුළුල්ල ක්ෂීණ වූවාහු ද, 93
ආහාරයෙහිත් යමෙක් නො ඇලුනේ ද, (රාගාදියෙන් ශූන්‍ය හෙයිනුත්
ඔවුන්ගෙන් මිදුණු හෙයිනුත්) ශූන්‍යතා විමොක්ඛ නම්වූ ද, (රාගාදි නිමිති
රහිත හෙයිනුත් ඔවුන්ගෙන් මිදුණු හෙයිනුත්) අනිමිත්තවිමොක්ෂ නම්
වූ ද නිවන යමකුහට අරමුණු වේ ද, ඒ රහත්හුගේ පිය සටහනක්,
අහසැ පක්ෂීන්ගේ පිය සටහනක් මෙන්, නො දත හැක්කේ ය.

5. යමක්හුගේ (චක්ෂුරාදි) ඉඳුරෝ දක්ෂ රියැදුරක්හු විසින් 94
මොනොවට දමනය කරන ලද ආජානේය අශ්වයන් මෙන් ශමථයට
ගියෝ ද (නිපොපි බවට පැමිණියෝ ද), ප්‍රහීණ වූ මාන් ඇති, ආස්‍රව
රහිත වූ, අට ලෝදහමින් නො සැලෙන, ඒ රහත්හුගේ දූක්ම
දෙවියෝ ද (මිනිස්සු ද) කැමැති වන්නාහ.

6. පොළොව හා සම වූ, ඒෂිකාස්තම්භයක් බඳු වූ, අටලෝ දහමින් 95
නො සැලෙන, සුන්දර වූ ධූතාඞ්ගාදි ව්‍රත ඇති යම් රහතෙක් (තමාට
ආක්‍රොශ කරන්නහුට ද තළන්නහුට ද පෙළන්නහුට ද) විරුද්ධ නො වේ ද
(හෙවත් නො කිපේ ද), පහ වූ මඩ ඇති විලක් මෙන් ප්‍රසන්න වේ ද,
අටලෝ දහමින් නොපෙරැළෙන ඒ රහත්හට (සුගති දුගති දෙක්හි ච්‍යුති
ප්‍රතිසන්ධි වශයෙන්) සංසරණයෝ නො වන්නාහ.

7. සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච 96
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො.

8. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො 97
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො.

9. ගාමෙ වා යදි වා රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ 98
යත්ථාරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං.

10. රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී ජනො 99
වීතරාගා රමිස්සන්ති න තෙ කාමගවෙසිනො.

**අරහන්තවග්ගො සත්තමො.**

---

## 8. සහස්සවග්ගො

1. සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා 100
එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

2. සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා 101
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

3. යො චෙ ගාථාසතං භාසෙ අනත්ථපදසංහිතං 102
එකං ධම්මපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

---

1. සහස්‍රමපි වාචානාමනර්ථපදසංහිතා
එකා අර්ථවතී ශ්‍රෙයා යං ශ්‍රුත්වා උපශාම්‍යති (මහාවස්තු 3. 436 පිට)
සහස බි ය වශන අනථ පද සහිත
එක ගධ පද ශෙහ ය ෂුත්ව උවශමති (ප්‍රා. ධ. c. 72

2. සහස්‍රමපි ගාථානාමනර්ථපදසංහිතා
එකා අර්ථවතී ශ්‍රෙයා යං ශ්‍රුත්වා උපශාම්‍යති. (මහාවස්තු 3. 436 පිට)

3. ජ ගධ ශත භෂෙ අනත පද සහිත.
එක ගධ පද ශෙහො ය ෂුත්ව උවශමති. (ප්‍රා. ධ. c. 10)

7. මනා කොට (නය හෙයින් කාරණ හෙයින්) චතුසත්‍යයන් දැන, 96
(තදඞ්ගවිමුක්ත්‍යාදි පංචවිධ විමුක්තියෙන්) වෙසෙසින් මිදුනු, අචලෝ
දහමින් නො සැලෙන, ඒ රහත්හුගේ සිත (තුන් මනෝදුශ්චරිතයෙන්
දුරු හෙයින්) ශාන්ත ම (සන්හුන්නේ ම, නිවී ගියේ ම) වන්නේ ය.
(වාග්දුශ්චරිත රහිත හෙයින්) වචනය ද ශාන්ත (නිවී ගියේ) වේ. (කාය-
දුශ්චරිතයෙන් දුරු වූ හෙයින්) කායකර්මය ද ශාන්ත ම (නිවී ගියේ ම) වේ.

8. යම් පුද්ගලෙක් (ලොවී ලොවුතුරු දහම් තමා ම පසක් කොට දත් 97
හෙයින්) අනුන්ගේ බසින් නො අදහා ද (නොහොත් බුදුරජුන් විනා අන්‍ය
ශාස්තෘවක්හු කෙරේ ඇදහිලි නැත්තේ ද), (දිව්‍යාදි කිසිවක්හු විසින්
නො කරන ලද හෙයින් අකෘත නම් වූ) නිර්වාණය (අරමුණු කිරීම් වශයෙන්)
ප්‍රත්‍යක්ෂ කොට දත්තේ ද, වෘත්තසන්ධියත් සංස්කාරසන්ධියත් සිඳැපී ද,
(කර්මසංඛ්‍යාත ප්‍රතිසන්ධිබීජය ක්ෂීණ හෙයින්) නසන ලද ප්‍රතිසන්ධ්‍යවකාශ
ඇත්තේ ද, (චතුර්විධ ආර්යමාර්ගඥාන මුඛයෙන්) වමනය කරන ලද (කාම
තෘෂ්ණාදි) සියලු ආශා ඇත්තේ ද, ඒ පුද්ගල් තෙම ඒකාන්තයෙන් (පිළි-
විදි නව ලොවුතුරු දහම් ඇති හෙයින් සියලු ලොවට අග්‍ර දක්ෂිණෙය්‍ය නු සි)
උත්තම පුරුෂ නම් වේ.

9. ගමෙක අරණෙක වළ තැනෙක නොහොත් ගොඩ තැනෙක 98
හෝ යම් කවර තැනෙක රහත්හු වෙසෙත් ද, ඒ බිම රමණීය සි
(සිත් කලු සි).

10. මහා අරණ්‍යයෝ රමණීය හ (සිත් අලවන්නාහ). යම් මහ 99
අරණෙක්හි (වස්තුකාම ක්ලේශකාම සොයන සුලු) ලෞකික මහජන තෙම
නො ඇලේ ද, පහ වූ රාග ඇති රහත්හු (පියුමට බට බමරුන් මෙන්
ප්‍රීත ව) එහි ඇලෙන්නාහු ය. කුමක් හෙයින්? යත්: ඒ රහත්හු වස්තුකාම
ක්ලේශකාම සොයන සුල්ලෝ නො වෙත්. එහෙයිනි.

**සත්වන අර්හද්වර්ගය සි**

---

## සහස්සවර්ගය

1. (ආකාශවර්ණනාදි) අනර්ථපදයෙන් යුත් (අවැඩ කොවසින් යුත්) 100
නෙපුල්හු දහසක් නමුදු උතුම් නො වෙති. යම් (පංචස්කන්ධාදි වූ) එක්
අර්ථපදයකුදු අසා පුගුල් තෙම (කෙලෙස් සංහිඳීමෙන්) සංහිඳේ ද,
එසේ වූ (නිර්වාණ ප්‍රතිසංයුක්ත වූ, ස්කන්ධාදිය ප්‍රකාශ කරන) අර්ථසාධක එක්
පදය පවා උතුම්.

2. අනර්ථපදයෙන් යුත් ගාථා දහසක් වූ නමුදු ඔහු උතුම් 101
නො වෙති. යම් එක් ගාථාපදයකුදු අසා පුගුල් තෙම (කෙලෙස් සංහිඳී-
මෙන්) සංහිඳේ ද, .එසේ වූ එක් ගාථාපදය ම උතුම්.

3. යමෙක් ඉදින් අනර්ථපදයෙන් යුක්ත වූ ගාථා සියක් කියේ නමුදු 102
ඔහු උතුම් නොවෙති. යමක් අසා පුගුල් තෙම කෙලෙස් සංහිඳීමෙන්
සංහිඳේ ද, එසේ වූ එක් ධර්මපදය ම උතුම්.

4. යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ 103
එකඤ්ච ජෙය්‍ය අත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො.

5. අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා 104
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො.

6. නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහ බ්‍රහ්මුනා 105
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනො.

7. මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං 106
එකඤ්ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං.

8. යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ 107
එකඤ්ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං.

9. යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ 108
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො
සබ්බම්පි තං න චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො.

10. අභිවාදනසීලිස්ස නිච්චං වද්ධාපචායිනො 109
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණො සුඛං බලං.

---

4. යො ශතානි සහස්‍රාණාං සංග්‍රාමෙ මනුජාන් ජයෙත්.
යො චෛකං ජයෙදාත්මානං ස වෛ සංග්‍රාමජිද්වරඃ (මහාවස්තු 3. 436 පිට)
යො සහස සහසනි සගමි මනුෂ ජිනි.
එක ජි.....:අතමන සො හො සගමු උතමු (ප්‍රා. ධ. c. 6).

7. වර්ෂේ වර්ෂේශ්වමෙධෙන යො යජෙත ශතං සමාඃ
මාංසානි ච න ඛාදෙද්‍යස්තයොඃ පුණ්‍යඵලං සමම්. (මනු. v. 53)
යො යජෙත සහස්‍රාණාං මාසෙ මාසෙ ශතාශතම්
න සො බුද්ධෙ ප්‍රසාදස්‍ය කලාමර්ඝති ෂොඩශීම්. (මහාවස්තු 3. 436 පිට)
මසි මසි සහසින යො යජෙච ශතෙන ච
නෙව් බුධි ප්‍රසදස කල අවෙති ෂොඩශ. (ප්‍රා. ධ.)

8. යො ච වර්ෂශතං ජීවෙදග්නිං පරිචරන්වනෙ
පත්‍රාහාරො ජමාවාසී කුර්වාණො විවිධං තපම්.
යශ්චෛකං භාවිතාත්මානං මුහූර්තමපි පූජයෙත්
සා එකා පූජනා ශ්‍රෙයො න ච වර්ෂශතං හුතාම් (මහාවස්තු 3. 436 පිට)
ය ජ වෂ ශත ජතු අගි පරියර වනෙ
..... ස පි නෙපලන දිව රත්‍ර අතන්ද්‍රිත
එක ජි භවිතත්මන මුහූතව්ච පුඅඑ
සනෙව පුයන ශ්‍රෙහ යජි වෂ ශත නෙහාතු. (ප්‍රා. ධ. C. 20, 21)

9. යත් කිංචිදිෂ්ටං ච හුතං ච ලොකෙ
සංවත්සරං යජති පුණ්‍යප්‍රෙක්ෂා
සර්වං පි තං න චතුර්භාගමෙති
අභිවාදනං උජ්ජුගතෙෂු ශ්‍රෙයම්. (මහාවස්තු 3. 436 පිට)
ය කිජි යිඨ ච හොත ච ලොකෙ.
...............................
...............................
අභිවදන උජුකතෙෂු ශ්‍රෙහො (ප්‍රා. ධ. C. 22)

10. අභිවාදනශීලස්‍ය නිත්‍යං වෘද්ධොපසෙවිනඃ
චත්වාරි සම්ප්‍රවර්ධන්තෙ ආයුර්විද්‍යා යශො බලම්. (මනුසම්ෘති 2. 121)
අභිවදනශිලිස නිච වුඩවචයිනො
චතුරි තස වර්ධති අයො කිර්ති සුහ බල. (ප්‍රා. ධ. C. 34.)

4. යමෙක් දහසෙකින් ගුණිත ලද දහසක් මිනිසුන් (දශලක්‍ෂයක් 103
මිනිසුන්) එක ම යුද්ධයෙහි දිනුයේ නමුදු (උත්තම යෝධ නම් නො වේ.)
වැලි යමෙක් එක ම තමා කෙලෙස් දිනීමෙන් දිනුයේ ද, හේ ඒකාන්ත-
යෙන් යුද්ධයෙහි දිනුවවුන්හට උත්තම යෝධ නම් වේ.

5. ආත්මය තෙම දිනන ලද්දේ (නොහොත් සිත් සතන්හි උපන් 104
කෙලෙසුන් දිනීම් වශයෙන් තමා දිනන ලද්දේ) ඒකාන්තයෙන් උතුම්. යම්
මේ සෙසු සත්ත්ව සමූහයෙක් (දූ කෙළිම් ආදියෙන්) යමක්හු විසින් දිනන
ලද ද, (ඒ දිනීම් උතුම් නො වේ). කවර හෙයින යත්: තමා දමනය කළ,
සතතයෙන් කයින් වචසින් සංයතවූ පැවැතුම් ඇති පුරුෂයාගේ
දිනීම නො දිනුවා නො කට හැකි ද, එහෙයිනි.

6. එ බඳු පුද්ගලයාගේ කෙලෙස් දිනීම දෙවියෙක් ද නොදිනුවා කට 105
හැකි නො වන්නේ ය. (තිම්බරු නාරදාදී) ගන්ධර්වයෙක් ද නොදිනුවා කට
හැකි නො වන්නේ ය. මහබඹුහු හා මර තෙමේ ද නොදිනුවා කට
හැකි නො වන්නේ ය.

7. මසක් මසක් පාසා දහසක් වියදම් කිරීමෙන් හවුරුදු සියයක් 106
මුළුල්ලෙහි යමෙක් ලොවී මහාජනයාට දන් දුන්නේ වේ ද, යමෙක් වනාහි
ශීලාදිගුණ වශයෙන් වඩන ලද සිතැති එක ම ආර්‍ය්‍යයක්හු ඇසිල්ලකුදු
(බත් කෙණෙස්සක් හබු සරලුවක් පෙරත්කඩයක් පමණ වූ ද කඩ-
පොල්ලක් දීමෙන් හෝ) පිදුයේ වේ ද, ඉදින් හවුරුදු සියයක් මුළුල්ලෙහි
දෙන ලද යම් දානයෙක් ඇත් ද, එයට වඩා ඇසිල්ලෙක ද ආර්‍ය්‍යයනට
කරණ ලද ප්‍රත්‍යයපූජාව ම උත්තම යි.

8. යම් පුරුෂයෙක් වෙනෙහි වැස (වෙනෙහිදී) ඉදින් හවුරුදු සියක් 107
මුළුල්ලෙහි (කිරිබත් ගිතෙල් මී සකුරු ඉසීමෙන් සිදුහතු සුන්සාල් හීතණ
ආදි යාග ද්‍රව්‍ය ගින්නෙහි බහා) වහ්නිපූජාව කෙළේ වේ ද, යම් පුරුෂයෙක්
වනාහි (ශීලාදි ගුණ වශයෙන්) වඩන ලද සිත් ඇති එක් ආර්‍ය්‍යපුද්ගලයක්හු
ඇසිල්ලකුදු (ආහාරාදියෙන්) පිදුයේ වේ ද, හවුරුදු සියයක් මුළුල්ලෙහි
කරණ ලද යම් වහ්නිපූජාවට වඩා ඇසිල්ලෙක ද ආර්‍ය්‍යයනට කරණ ලද
ඒ ප්‍රත්‍යයපූජාව ම උත්තම යි.

9. මේ සත්ලොවෙහි පින්කිරීමෙහි අපෙක්‍ෂා ඇති පුරුෂ තෙම 108
(මඟුල් දවස් ආදියෙහි දිය යුතු) කිසි යම් කුඩා දානවස්තුවක් හෝ (කම්පල
අදහා සකස් කොට සරහා දෙන ලද අමුතු මහ දනක් හෝ) හවුරුද්දක්
මුළුල්ලෙහි (මුළු සක්වළැ ලොවී මහජනයාහට නිරතුරු) දුන්නේ ද, ඒ
සියලු දානය ම (ආර්‍ය්‍යයන් කෙරෙහි පහන් සිතින් කය නමා වඳනාහුගේ
එක් චේතනා පැවැති කුශලචේතනාව) සතර භාගයක් කළ කල එයින්
එක් භාගයකුදු නො අගනේ ය. එ හෙයින් (කායවඞ්කාදි රහිත හෙයින්)
ඍජු බවට පැමිණි ආර්‍ය්‍යයනට කය නමා කළ වන්‍දනාව ම උත්තම යි.

10. සිල්වතුන් එක්වත් වඳනා සුලු වූ, සතතයෙන් ගුණවෘද්ධයන් 109
පුදන සුලු වූ පුද්ගලයාහට ආයුෂය, ශරීරවර්ණය, කායිකචෛතසික සුඛය,
කායබල ඥානබල යන මේ සතර ගුණයෝ වඩනාහු ය.

11. යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො 110
එකාහං ජීවිතං සෙය්‍යො සීලවන්තස්ස ඣායිනො.

12. යො ච වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො 111
එකාහං ජීවිතං සෙය්‍යො පඤ්ඤවන්තස්ස ඣායිනො.

13. යො චෙ වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො 112
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං.

14. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං 113
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයං.

15. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං 114
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදං.

16. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං 115
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමං.

**සහස්සවග්ගො අට්ඨමො.**

---

## 9. පාපවග්ගො

1. අභිත්ථරෙථ* කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ 116
දන්ධං හි කරොතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො.

---

11. යො ච වර්ෂශතං ජීවෙද්දුඃශීලො අසමාහිතඃ
එකාහං ජීවිතං ශ්‍රෙයඃ ශීලවන්තස්‍ය ධ්‍යායතො. (මහාවස්තු 3. 436 පිට)

13. යො ච වර්ෂශතං ජීවෙත් කුසීදො හීනවීර්‍ය්‍යවාන්
එකාහං ජීවිතං ශ්‍රෙයඃ ශීලවන්තස්‍ය ධ්‍යායතො. (මහාවස්තු 3. 436 පිට)
ය ජී වෂ ශත ජීවි කුසිදු හිනවිරියව
මුහුතු ජීවිත ශෙහ විරිය අරහතො දඪ. (ප්‍රා. ධ. C 17)

14. යො ච......අපශ්‍යං උදයව්‍යයම්
......පශ්‍යතො උදයව්‍යයම්. (මහාවස්තු 3. 436 පිට)
ය ජී වෂ ශත ජීවි අපශු උදකවය
මුහුත ජීවිත ශෙහු පශතො උදකවය. (ප්‍රා. ධ. C 18)

15. යො ච......අපශ්‍යං අමෘතං පදම්
......පශ්‍යතො අමෘතං පදම්. (මහාවස්තු. 3. 436 පිට)

16. යො ච......අපශ්‍යං ධර්මමුත්තමම්
......පශ්‍යතො ධර්මමුත්තමම්. (මහාවස්තු 3. 436 පිට)
ය ජ වෂ ශත ජීවි අපශු ධමු උතමු
මුහුත ජීවිත ශෙහු පශතු ධමු උතමු. (ප්‍රා. ධ G. 19).

* අභිත්වරෙථ - බහුසු.

11. දුශ්ශීල වූ, (උපචාරසමාධි අර්පණාසමාධියෙන්) සමාහිත නොවූ, 110
යම් පුගුලෙක් ඉදින් හවුරුදු සියයක් ජීවත් වන්නේ ද, ඔහුගේ ජීවත්
වීමට වඩා සිල්වත් වූ, ශමථවිදර්ශනාභාවනායෙහි යෙදුනහුගේ එක්
දවසකුදු ජීවත් වීම උතුම්.

12 (ශමථවිදර්ශනාප්‍රඥාය මාර්ගඵලප්‍රඥාය යන ලෞකික ලොකොත්තර 111
ප්‍රඥායෙන් යුක්ත නොවන හෙයින්) ප්‍රඥා නැත්තාවූ, (උපචාරසමාධි
අර්පණාසමාධියෙන්) සමාහිත නොවූ, යම් පුද්ගලයකු ඉදින් හවුරුදු සියයක්
ජීවත් වූ නමුදු, ඔහුගේ ජීවත් වීමට වඩා ශමථවිදර්ශනාප්‍රඥායෙන් ද
මාර්ගඵලප්‍රඥායෙන් ද යුක්ත වූ, ශමථවිදර්ශනාභාවනායෙහි නියුක්ත වූවහුගේ
එක් දවසකුදු ජීවත් වීම උතුම්.

13. කුසීත වූ (වත් පිළිවෙත් කිරිමෙහි හැදෑරීම් පිරුවීම්හි මැලි වූ), 112
කායික චෛතසික වීර්‍ය නැති, යම් පුගුලෙක් ඉදින් හවුරුදු සියයක්
ජීවත් වූයේ නමුදු, ඔහුගේ ජීවත් වීමට වඩා දැඩි කොට කායික චෛතසික
වීර්‍යය වඩන භික්ෂුහුගේ එක් දවසෙක ජීවත් වීම උතුම්.

14. (පංචස්කන්ධයන්ගේ) උදයව්‍යයය නොදක්නා වූ (හෙවත් 113
'අවිජ්ජාසමුදයා රූපසමුදයො' යන ආදීන් පස්විසි අයුරින් පංචස්කන්ධ-
යන්ගේ උදයය ද 'අවිජ්ජා නිරොධා රූපනිරොධො' යන ආදීන් පස්විසි
අයුරින් පංචස්කන්ධයන්ගේ ව්‍යයය ද නොදක්නාවූ) යම් පුගුලෙක් ඉදින්
හවුරුදු සියයක් ජීවත් වූයේ නමුදු (ඔහුගේ ජීවත් වීමට වඩා)
පංචස්කන්ධයන්ගේ උදයව්‍යයය නුවණැසින් දක්නාහුගේ එක් දවසෙක
ජීවත් වීම උතුම්.

15. මරණරහිත පදය (හෙවත් අමෘත මහානිර්වාණය) නොදක්නාවූ 114
යම් පුද්ගලයෙක් ඉදින් හවුරුදු සියයක් ජීවත් වූයේ නමුදු (ඔහුගේ
ජීවත් වීමට වඩා) අමා මහනිවන නුවණැසින් දක්නා පුගුලාගේ එක්
දවසෙක ජීවත් වීම උතුම්.

16. උතුම් (නව ලොවුතුරා) දහම් නුවණැසින් නොදක්නා යමෙක් 115
ඉදින් හවුරුදු සියයක් ජීවත් වූයේ නමුදු, (ඔහුගේ ජීවත් වීමට වඩා)
උතුම් (නව ලොවුතුරා) දහම් නුවණැසින් දක්නාහුගේ එක් දවසක්
ජීවත් වීම උතුම්.

**අටවන සහස්‍රවර්ගය යි.**

---

## 9. පාපවර්ගය.

1. (දාන ශීලාදි) සුචරිතධර්මවිෂයයෙහි යුහු යුහු වන්නේ ය (වහවහා 116
කට යුත්තේ ය). කායදුශ්චරිතාදි අකුශල කර්මයෙන් (හෙවත් අකුශල
චිත්තොත්පාදයෙන්) සිත (හෙවත් නොයෙක් තැනින් වැද ගොයම් කන
කුළු ගොනකු මෙන් නොරැක්ක හැකි විසභාග අරමුණට දිවෙන හෙයින්
තුන් දුසිරිතෙන් නොවැළැක්විය හැකි වූ මේ කුළු සිත) වළකන්නේ ය.
කුමක් හෙයින යත්: දානාදි කුශල කර්මය (යම් හෙයෙකින්) දන්ධ වැ
(හෙවත් 'දෙම් දෙහෝ,' 'නොදෙම් දෙහෝ,' 'කෙරෙම් දෙහෝ,' 'නො
කෙරෙම් දෙහෝ,' 'කොට පියා හෙම් දෙහෝ,' 'නො කොට පියා හෙම්
දෙ හෝ' යි මෙ ලෙස ලැසි ගෙණ) කරන්නහුගේ සිත (මසුරුමල ආදි)
අකුශලයෙහි ඇලේ. එ හෙයිනි.

2. පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං 117
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො.

3. පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙතං පුනප්පුනං 118
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො.

4. පාපො'පි පස්සති භද්‍රං යාව පාපං න පච්චති 119
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති

5. භද්‍රො'පි පස්සති පාපං යාව භද්‍රං න පච්චති 120
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති.

6. මා'වමඤ්ඤෙථ පාපස්ස න මන්තං ආගමිස්සති 121
උදබින්දුනිපාතෙන උදකුම්භො'පි පූරති
පූරති බාලො පාපස්ස ථොකථොකම්පි ආචිනං.

7. මා'වමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති 122
උදබින්දුනිපාතෙන උදකුම්භො' පි පූරති
පූරති ධීරො පුඤ්ඤස්ස ථොකථොකම්පි ආචිනං.

2. පුරුෂ තෙම ඉදින් ප්‍රාණවධාදි අකුශල කර්මයක් (ප්‍රමාද දොෂ- 117
යෙකින් වත් අසත්සමවායයෙකින් වත් එක් වරෙක) කොට පූයේ වී
නමුත් ඒ අකුශල කර්මය නැවැත නැවැත නො කරන්නේ ය. (නොදූත
සාලහුරු මැඩ ගත් එකාක්හු වහා පය හයා ගන්නා සේ එකෙණෙහි ම
ප්‍රත්‍යවේක්‍ෂා කොට මෙවැනි ලාමකක්‍රියා කිරීම තාගේ ජාත්‍යාදියට
නොසුදුසු ය යි සලකා ඒ පාපය නො කරන්නේ ය). ඒ අකුශලයෙහි
ආලයක්, රුචියක් නො කරන්නේ ය. කුමක් හෙයින් ද? යත්: (ප්‍රාණ-
වධාදී අකුශල) කර්මයාගේ රැස් කිරීම (මෙ ලොව ද පර ලොව ද කාය-
චිත්තදුඃඛය එළවන හෙයින්) දුකි. (අකුසල් රැස් කිරීම නම් යම් හෙයකින්
මෙ ලොව ද පරලොව ද දුකට කාරණ ද එහෙයින් දුකැ යි යේ යි).

3. පුරුෂ තෙම ඉදින් දානාදි එක්තරු කුශල කර්මයක් එක් වරෙක ද 118
කෙළේ වී නම් එය නැවත නැවැත ද කරන්නේ ය. ඒ කුශලයෙහි ආලය
රුචිය කරන්නේ යි. කුමක් හෙයින් ද? යත්: දානාදි කුශලයාගේ රැස්
කිරීම (යම් හෙයෙකින් සගමොක් සැපතට කාරණ ද එහෙයින්) සුව යි.

4. යම් තාක් කල් පුරුෂයා විසින් කරණ ලද අකුශල කර්මය 119
මෙලොවැ හෝ පරලොවැ හෝ විපාක නො දේ ද, ඒ තාක් කල් පාපකර්ම-
සමන්විත පුද්ගල ද යහපත දක්නේ ය (පාපී පුද්ගල ද පූර්වජන්මයෙහි
කළ සුචරිත බලයෙන් වැඩ දක්නේ ය, සුව විඳුනේ ය. යම් කලෙක
වනාහි ඔහු කළ පාපකර්මය දෘෂ්ටධර්මවේද්‍ය ව එම ජන්මයෙහි හෝ
උපපද්‍යවේද්‍ය ව හෝ අපරාපර්යවේද්‍ය ව) විපාක දේ ද, එකල්හි පව්
කළ පුද්ගල තෙම (මෙලොවැ වධබන්ධනාදියට ද පරලොවැ අපාය දුකට
ද භාජන වීමෙන්) පාපඵලයන් දක්නේ ය.

5. යම් තාක් කල් පුරුෂයා විසින් කරන ලද කුශල කර්මය 120
(මෙ ලොව හෝ පරලොවැ) විපාක නො දේ ද, ඒ තාක් කල් කුශලකර්ම
සමන්විත පුද්ගල ද (පූර්ව කර්මයෙහි කළ දුශ්චරිත බලයෙන් වන අකුශල
විපාක වූ) අවැඩ දක්නේ ය (දුක් විඳුනේ ය). යම් කලෙක වනාහි ඔහු
කළ සුචරිතය (මෙ ලොවැ ම හෝ පරලොවැ හෝ) විපාක දේ ද, එ කල්හි
කුසල් කරණ සත්පුරුෂ තෙම (මෙ ලොවැ ලාභසත්කාරාදි සුව ද පර
ලොවැ දෙව්සැපත් ආදි සුව ද අනුභව කරන්නේ) භද්‍ර වූ ඉෂ්ට
විපාකයන් දක්නේ ය.

6. ඒ සවල්පමාත්‍ර වූ අකුශලකර්මය මා කරා (විපාක දීම් වශයෙන්) 121
නො එන්නේ යැ යි, අකුශල කර්මය සවල්ප යැ යි, අවඥා නො කරන්නේ ය.
නිතර එකෙකි දිය බිඳක්හුගේ හීමෙන් (වැසි වස්නා අබවසැ විවෘත වූ
මුඛ ඇති) කුඹල් බඳුනෙක් යම්සේ ක්‍රමක්‍රමයෙන් පිරී යේ ද, එ
පරිද්දෙන් ම මඳ මඳ කොට ද පව් රැස් කරන අඥාන තෙමේ පාපකර්ම-
යෙන් (ක්‍රමයෙන්) පිරෙන්නේ ය.

7. ඒ සවල්පමාත්‍ර කුශල කර්මය මා කරා (විපාක දීම් වශයෙන්) 122
නො එන්නේ යැ යි (මෙය සවල්පමාත්‍ර එකෙක. කවර කලෙක මට
විපාක දේ ද, එය සවල්ප එකෙකැ යි) අවමන් නො කරන්නේ ය. කුමක්
හෙයින? යත්: නිරන්තරයෙන් එකෙකි දිය බිඳක්හු හීමෙන් කුඹල්
බඳුන ද ක්‍රමක්‍රමයෙන් පිරෙන්නේ ය. එ පරිද්දෙන් ම මඳ මඳ කොට ද
කුශලකර්ම රැස් කරන ප්‍රාඥ තෙම දානශීලාදි කුශලකර්මය ක්‍රමක්‍රමයෙන්
පුරන්නේ ය.

8. වාණිජො'ව භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො 123
විසං ජීවිතුකාමො'ව පාපානි පරිවජ්ජයෙ.

9. පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං 124
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො.

10. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති 125
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතං'ව ඛිත්තො.

11. ගබ්භමෙකො'පපජ්ජන්ති නිරයං පාපකම්මිනො 126
සග්ගං සුගතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා.

12. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ 127
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා.

13. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ 128
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු.

**පාපවග්ගො නවමො.**

---

නරකං පාපකර්මාණඃ කෘතපුණ්‍යාස්තු ස්වර්ගතිම් (උදානවර්ග v. 24)
න වාන්තරීක්ෂෙ න සමුද්‍රමධ්‍යෙ
න පර්වතානාං විවිධප්‍රදෙශෙ
න මාතෘමූර්ධනි ප්‍රධෘතස්තථාඞ්කෙ
ත්‍යක්තුං ක්ෂමඃ කර්ම කෘතං නරො හි. (ගරුඩපුරාණ අධ්‍යා: 113-20)

8. (සොරුන් සිටි හෙයින් භය කටයුතු වූ මග වළහන්නා වූ) 123
කැටි වැ යන සාත්තුවක් නැති (හෝ මඳ වූ සාථ පිරිසක් ඇති) බොහෝ ධන ඇති, වෙළෙඳක්හු මෙන් ද, හලාහල විෂයක් දුරු කරණ, ජීවත් වනු කැමැති එකක්හු මෙන් ද, අකුශල කර්ම දුරු කරන්නේ ය.

9. ඉදින් අත්ලෙහි ව්‍රණයෙක් නො වී නම්, අත්ලෙන් විෂය ගත් 124
නේ ය (හෙවත් ගන්නට පොහොසත් වන්නේ ය). කුමක් හෙයින? යත්: අත්ලෙහි ව්‍රණයක් නැත්තහු අනුව (ස්ථාවර ජඞගම වශයෙන් විප්‍රකාර වූ ම) විෂය නො යන්නේ ය (අත්ලෙහි ව්‍රණයක් නැත්තහු අතින් ගත් විෂය ඔහු සිරුරැ ව්‍යාප්ත නො වන්නා සේ) (තුන් දොරින්) පව් නොකරන්නාහු. (ශරවාපාදිය එළවා දුන් නමුදු අකුශල චෙතනා නැති හෙයින් සිදු වන) අකුශල කර්මයෙක් නැත.

10. (තමහට වත් සියලු සත්නට වත්) අදූෂට වූ (හෙවත් නිරප- 125
රාධවූ එ හෙයින් ම සියලු සතුන් කෙරෙහි ම මෛත්‍රීපර වූ නොකැලැඹුණු සිත් ඇති), නිරපරාධ වූ සිත් ඇති හෙයින් පිරිසිදු වූ, නිඃකෙලශි වූ, ('නර' ය 'පුරුෂ'යැ යි කියන ලද) සත්ත්වයකුහට යම් පුද්ගලයෙක් දූෂට වේ ද (අතින් පයින් සැතින් දඬුයෙන් පැහැරීම් ආදියෙන් අපරාධ කෙරේ ද), ඔහු විසින් කරන ලද ඒ පාපකර්මය තෙම උඩු සුළඟට දමන ලද සියුම් රජසක් මෙන් (නිරපරාධයකට අපරාධ කළාවූ) ඒ අඥානයා කරා (මෙ ලොව හෝ පර ලොවැ නරකාදියෙහි හෝ විපාක දුක් දෙමින්) පැමිණෙන්නේ ය.

11. සමහර සත්ත්ව කෙනෙක් මව් කුසට උත්පත්ති වශයෙන් 126
පැමිණෙන්නාහ. පව්කම් කළෝ නරකයට උත්පත්ති වශයෙන් පැමිණෙත්. පින් කළ හෙයින් සුන්දර ගති ඇති සත්ත්වයෝ දෙව්ලොවට යන්නාහ. ක්ෂය කළ ආස්‍රව ඇති රහත්හු නිරුපධිශේෂ පරිනිර්වාණධාතුයෙන් පිරිනිවෙන්නාහ.

12. යම් තැනෙක සිටි සත්ත්ව තෙම තමා විසින් කරණ ලද පාප- 127
කර්මයෙන් (විපාක දුක් අනුභව නොකොට) මිදී යේ ද, (කෙසගක් පමණ වූ ද එසේ වූ භූමිප්‍රදෙශයෙක් නැත. ආකාශයෙහි දු (පාපකර්මයෙන් මිදෙන්නට හැකි ප්‍රදෙශයෙක්) නැත. සමුද්‍රමධ්‍යයෙහි දු (පාපකර්මයෙන් මිදෙන්නට හැකි ප්‍රදෙශයෙක්) නැත. පර්වතයන්ගේ විවරයට වැද ද පාපකර්මයෙන් මිදෙන්නට හැකි ප්‍රදෙශයෙක් නැත.

13. යම් තැනෙක්හි සිටි සත්ත්වයා මරණ තෙම අභිභවනය නො 128
කෙරේ ද, (හෙවත් මැඩැ නො පියා ද), (කෙසගක් පමණ වූ ද) එසේ වූ භූමිප්‍රදෙශයෙක් නැත. ආකාශයෙහි දු මරණින් මිදෙන්නට හැකි ප්‍රදේශයෙක් නැත. සමුද්‍රමධ්‍යයෙහි දු මරණින් මිදෙන්නට හැකි ප්‍රදේශයෙක් නැත. පර්වතයන්ගේ විවරයට වැද ද මරණින් මිදෙන්නට හැකි ප්‍රදේශයෙක් නැත.

**නව වන පාපවර්ගය යි.**

---

## 10. දණ්ඩවග්ගො

1. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො 129
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ.

2. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං 130
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ.

3. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති 131
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං.

4. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති 132
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛං.

5. මා'වොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං 133
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙය්‍යු තං.

6. ස චෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා 134
එස පත්තො'සි නිබ්බානං සාරම්භො තෙ න විජ්ජති.

7. යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාචෙති ගොචරං 135
එවං ජරා ච මච්චු ච ආයුං පාචෙන්ති පාණිනං.

8. අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති 136
සෙහි කම්මෙහි දුම්මෙධො අග්ගිදඩ්ඪො'ව තප්පති.

---

1. ප්‍රාණා යථාත්මනො'භීෂ්ටා භූතානාමපි තෙ තථා
ආත්මෞපම්‍යෙන භූතෙෂු දයාං කුර්වන්ති සාධවඃ. (හිතොපදෙශ 1. 2)

3. අහිංසකානි භූතානි දණ්ඩෙන විනිහන්ති යඃ
ආත්මනඃ සුඛමිච්ඡන් ස ප්‍රෙත්‍ය නෛව සුඛී භවෙත්. (මහාභාරත 13. 5565)
යො'හිංසකානි භූතානි හිනස්ත්‍යාත්මසුඛෙච්ඡයා
ස ජීවංශ්ච මෘතශ්චෛව න ක්වචිත් සුඛමෙධතෙ. (මනුස්මෘති. 5. 45)

# 10. දණ්ඩවර්ගය

1. (කෙශර සිංහයන් හා ආජානෙය හස්ත්‍යශ්වයන් හා ක්ෂීණාශ්‍රවයන් 129
තබා සෙසු) සියලු සත්ත්වයෝ ම (වධබන්ධනාදී) කායදණ්ඩනයට ත්‍රස්ත
වෙති. (ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු) සියලු සත්හු ම මරණයට බිති.
ක්ෂීණාශ්‍රවයෝ වනාහි ජීවිතයෙහි ද මරණයෙහි ද උපේක්ෂක ම වෙත්.)
එබැවින් තමා උපමා කොට (හෙවත් මම් යම් සේ දණ්ඩනයට බම් ද එසේ ම
සියලු සත්ත්වයෝ ද දණ්ඩනයට බිති. මගේ ජීවිතය මට යම්සේ ප්‍රිය ද
එසේ ම සියලු සතුන්ගේ ජීවිත ද ඔවුනට ප්‍රිය යැ' යි මෙසේ) තමා උපමා
කොට (නුවණැති පුරුෂ තෙම) කිසි දු සතක්හු (අතින් පයින් දංඩෙන්
සැතින්) නො මරන්නේ ය. අනුන් ලවා ද නො මරවන්නේ ය.

2. (සාමාන්‍යයෙන්) සියලු සත්ත්වයෝ ම කායදණ්ඩනයට ත්‍රස්ත 130
වෙති. රහතුන් තබා සෙසු සියල් සත්නට ම ජීවිතය ප්‍රිය ය. (රහත්හු
ජීවිත මරණ දෙක්හි උපෙක්ෂක වෙති.) එබැවින් තමා උපමා කොට
නුවණැත්තේ කිසි සතක්හු නො මරන්නේ ය. අනුන් ලවා ද නො
මරවන්නේ ය.

3. යම් පුද්ගලයෙක් (අනුන් මිරු තළා අනුන් ගැති කොට ගෙණ) 131
තමහට සුව කැමැති වූයේ, කායික චෛතසික සුව කැමැති සත්ත්වයන්
වාග්දණ්ඩ ධනදණ්ඩ කායදණ්ඩයෙන් පෙළා ද (දුකට පමුණුවා ද), හෙ
තෙම පරලොව දෙව්මිනිස් සුව ද නිවන් සුව ද නො ලබන්නේ ය.

4. යම් පුද්ගලයෙක් තමහට සුව කැමැති වූයේ, සුව කැමැති සතුන් 132
(වාග්දණ්ඩාදී) දණ්ඩයෙන් නො පෙළා ද (දුකට නො පමුණුවා ද), ඒ
පුද්ගල තෙම පර ලොවදී සුව ලබන්නේ ය.

5. කිසි එක ද පුද්ගලයක්හට පරුෂ වචනයක් නහමක් කියව. තා 333
විසින් පරොස් තෙපුල් කියන ලද්දවූ අන්හු තට තැවැත පෙරළා පරොස්
තෙපුල් බණන්නාහු ය. යම් හෙයකින් (කරණොත්තරකරණ යැ යි
කියන ලද) යුගග්‍රාහ කථාව දුක් ද (හෙවත් දුකට කාරණ ද) එ හෙයින්
කායදණ්ඩාදි ප්‍රතිදණ්ඩයෝ තා සපශී කරන්නාහු ය (තා කරා පැමිණෙන්-
නාහු ය)

6. ඉදින් වටින් කඩා හරණ ලද ලොහොතලියක් මෙන් (තාගේ) 134
සිත නිශ්චල කරන්නට පොහොසත් වීහි නම්, එසේ (මේ පිළිවෙත පුරන)
ඒ තෝ (දුත් නිවනට නො පැමිණිය ද) නිවනට පැමිණියේ නම් වෙහි.
එසේ කලැ තට ('දුශ්ශීලයෙමි මම ද? නොයි දු දුශ්ශීලයෙහි යන ආදීන්
කියන) යුගග්‍රාහය නො වන්නේ ය.

7. යම්සේ ගොපලු තෙම දඬුයෙන් (පැහැර පැහැර) ගෙරින් 135
ගොචර භූමියට (හෙවත් තණබිමට) පමුණුවා ද (ගෙණ යේ ද), එ පරිද්-
දෙන් ම (ප්‍රකට ජරා ද අප්‍රකට ජරා ද යන ද්විවිධ) ජරා ද, (සන්තති
විච්ඡෙද යන) මරණ ද (යන මොහු දෙදෙන) ප්‍රාණීන්ගේ ජීවිතෙන්ද්‍රියය
ක්ෂයයට පමුණුවන්නාහු ය.

8. ඒ මහු නො 'වෙයි. ප්‍රාණවධාදි පව් කම් කරණ අඥාන තෙම (මා 136
විසින් කරණ ලද මේ පාපකර්මයාගේ මෙසේ වූ අනිෂ්ට විපාකයෙක් ඇතැ
යි) නො දන්නේ ය (නො සලකන්නේ ය). ඒ නුවණ නැත්තේ ස්වකීය
පාප කර්මයෙන් (නරකයෙහි උපන්නේ) ගින්නෙන් දැවුනක්හු මෙන්
(කායික චෛතසික සන්තාපයෙන්) තැවෙන්නේ ය.

9. යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති 137
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති.

10. වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං 138
ගරුකං වාපි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ.

11. රජතො වා උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං 139
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං

12. අථ වාස්ස අගාරානි අග්ගි ඩහති පාවකො 140
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති.

13. න නග්ගචරියා න ජටා න පඞ්කා 141
නානාසකා ථණ්ඩිලසායිකා වා
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං.

14. අලඞ්කතො චෙ'පි සමං චරෙය්‍ය 142
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු.

---

13. න නාග්නචර්‍යා න ජටා න පඞ්කා
නානාශනං ස්ථණ්ඩිලශායිකා වා
න රජොමලං නොත්කුටුකප්‍රධානං
විශොධයෙන්මාහමවිතීර්ණකාංක්ෂම්. (දිව්‍යාවදාන)

14. අලයිතො ය වි චරෙඅ ධ්‍රමු
දතු ශතු සඤතු බ්‍රම්මයරි
සව්‍යෙසු භුතෙසු නිහාඉ දන
සො බ්‍රමණො සො ශමණො සො භිඛු. (ප්‍රා. ධ. B. 39)

අලංකෘතශ්චාපි චරෙත ධර්මං
දාන්තෙන්ද්‍රියඃ ශාන්තඃ සංයතො බ්‍රහ්මචාරී
සර්වෙෂු භූතෙෂු නිධාය දණ්ඩං
ස බ්‍රාහ්මණඃ ස ශ්‍රමණඃ ස භික්ෂුඃ. (දිව්‍යාවදාන)

9. කායදණ්ඩ වාග්දණ්ඩ ධනදණ්ඩ රහිත වූ, (තමහට වත් අන් හට 137
වත්) අද්‍රෝහී වූ, එ හෙයින් ම සියලු සතුන් කෙරෙහි මෛත්‍රීපර වූ ක්‍ෂීණා-
ස්‍රවයන් විෂයයෙහි යම් පුද්ගලයෙක් තෙම කායදණ්ඩාදි දණ්ඩයෙන්
අපරාධ කෙරේ ද, හෙ තෙම දශවිධ දුඃඛකාරණයන් අතුරෙන් එක්තරු
දුඃඛකාරණයකට වහා ම පැමිණෙන්නේ ය. හේ කවර යත්:

10. කර්කශ වූ, (අත් පා බිඳීම් ආදියෙන්හෝ චක්‍ෂූරෝග ශෝත- 138
රෝගාදියෙන් හෝ උපන් බලවත් ශරීර) වේදනාවකට හෝ, (මහ නැවි
නැසීම් නිධාන අපවත් වීම් ආදි වූ මහත් අර්ථ)හානියකට හෝ (අත් පා
කැපීම් බිඳීම් හිස පැළීම් ආදි වූ) ශරීරභේදයකට හෝ නැවත (කාශ ශ්වාස
අතිසාර සොපොදර කුෂ්ඨ ගණ්ඩ කිලාසශෝෂාදි) බලවත් රෝග දුකකට
හෝ (කාණ කුණී බංජ පීඨසප්පි ආදි බවට හෝ), යක්‍ෂොන්මාදයට
පිත්තොන්මාදයට හෝ පැමිණෙන්නේ ය.

11. රජුන් කෙරෙන් වන (තනතුරු උදුරා ගැන්මෙන්, දන වොලො 139
ගැන්මෙන්) උපද්‍රවයකට හෝ දරුණු වූ (අසෝ තැන උමං බුත්තේ,
මං පහළයේ, මිනී මැරුයේ, අසෝ රජාපරාධය කෙළේ තෝ වෙහි ද සි
නො ඇසූ නොකී නොබිණූ නොකළ දෑ පිළිබඳ) බලවත් අභ්‍යාඛ්‍යානයකට
හෝ (තමාගේ සුව දුක බැඳී පිහිට වන්නව නිසි වැඩී සිටි) නෑයන්ගේ
විනාශයට හෝ (රන්රන් අඟුරු වීම ය, මුතු කපුඇට වීම ය, කහවණු
කැටකැබිලිති වීම ය යන ආදි වූ) භෝගවිනාශයකට හෝ පැමිණෙන්නේ ය.

12. නො හොත් ඒ පාපී පුද්ගලයාගේ වාසාගාරයන් ගිනි තෙමේ 140
දවන්නේ ය. (අනික් දවන කෙනෙක් නැත් නම් සෙන ගිනි හෝ ලැවු
ගිනි හෝ දවන්නේ ය.) ඒ අඥාන පුද්ගල තෙම ජීවිතෙන්ද්‍රියොපච්ඡේදයෙන්
මත්තෙහි (ඒකාන්තයෙන්) නිරයට ද පැමිණෙන්නේ ය:

13. (පුබ්බන්තාපරන්තාදි අට තන්හි උපදනා අෂ්ටවස්තුක ශංකාව 141
නො ඉක්මුණු හෙයින්) එ හෙර නො වූ ශංකා මහවතුරු ඇති පෘථග්ජන
සත්ත්වයා (අචෙලව්‍රත සමාදානයෙන්) නග්න වැ ඇවිද කරණ තපස්හු ද
ශුද්ධ නො කරන්නාහ (ලොකනිඃසරණයට හෙවත් නිවනට නො පමුණු
වන්නාහ). ජටාවෝ ද ශුද්ධ නො කරන්නාහ. දන්තමලධාරණය, ඇඟ මඩ
ගැල්වීම් යන මොහු ද ශුද්ධ නො කරන්නාහ. අහර නොවළඳා කරණ
තපස්හු ද ශුද්ධ නො කරන්නාහ. (අජව්‍රත ගොව්‍රත සමාදානයෙන්) බිමැ
හෙවැ කරණ තපස්හු ද ශුද්ධ නො කරන්නාහ. ආගන්තුක රජස් දූරීමය,
නොනහා වෙරළ දූලි ඉසිලීම ය, උත්කුටිකායෙන් ම හිඳ ඇවිද කරණ
තපස් ය යන මොහු ද (ඒ සත්ත්වයා) ශුද්ධ නො කරන්නාහ. (නිවනට
නො පමුණුවන්නාහ).

14. වස්ත්‍රාභරණයෙන් සැරැසුනු පුද්ගල ද ඉදින් (කායවිෂමතා- 142
දියෙන් තොර වැ) කායසමාධි සංයමයෙහි යෙදී පවතී ද, (රාගාදි කෙලෙසුන්
සංහුන් බැවින්) ශාන්ත ද, ඉන්ද්‍රිය දමනයෙන් දැමුනේ වී ද, (චතුර්විධ මාර්ග
නියමයෙන්) නියම් කරණ ලද සත්තක්ඛත්තුපරමතා ආදි බව් ඇත්තේ
වේ ද, ශාසනබ්‍රහ්මචර්‍යී මාර්ගබ්‍රහ්මචර්‍යී ඇත්තේ වේ ද, සියලු සතුන්
කෙරෙහි (කායදණ්ඩාදි) දණ්ඩ බහා තබා දුරු කොට වෙසේ ද, මෙ බඳු
ගුණයුක්ත වූ ඒ රහත් තෙම (බාහිත පාප ඇති බැවින්) බ්‍රාහ්මණ
නමුදු වේ. (සංසිඳුණු පව් ඇති හෙයින්) සමණ නමුදු වේ. (බුන් කෙලෙස්
ඇති බැවින්) භික්‍ෂු නමුදු වේ.

15\. හිරීනිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති 143
යො නින්දං අපබොධති අස්සො භද්‍රො කසාමිව.

16\. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො 144
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච වීරියෙන ච
සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං.

17\. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං 145
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතා.

දණ්ඩවග්ගො දසමො.

---

## ජරාවග්ගො

1\. කො නු හාසො කිමානන්දො නිච්චං පජ්ජලිතෙ සති 146
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ.

2\. පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං 147
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

---

1\. කා නු ක්‍රීඩා කා නු රති එවං ප්‍රජ්වලිතෙ සදා
අන්ධකාරෙ ’ස්මින් ප්‍රස්ඛිතා ප්‍රදීපං න ගවෙෂථ.
කො නු හර්ෂො කොනු ආනන්දො එවං ප්‍රජ්වලිතෙ සදා
අන්ධකාරෙ, ස්මින් ප්‍රක්ෂිප්තා ආලොකං න ප්‍රකාශයෙ. (මහාවස්තු. 3. 376 පිට)

15. සැම්ටිය වලහන්නාවූ (හෙවත් 'මේ සැම්ටියෙන් පහරින්නු ලබම් 143
ද'සි තමා ඇඟෑ සැම්ටිය ගසා ලිය නො දෙන්නාවූ), සුශික්ෂිත උතුම්
අශ්වයක්හු මෙන් යම් මහණෙක් තෙම නිඳුව (තමා සතන්හි උපන්
අකුශල විතර්කය) තම සන්තානයෙන් පහ කෙරේ ද, එබඳු වූ (මා වැනි
ජාතිගෝත්‍ර සමපන්න ශ්‍රුතවෘද්ධ වයෝවෘද්ධ බහුශ්‍රුත ශ්‍රද්ධාසම්පන්න කුල-
පුත්‍රයක්හට අකුශලවිතර්ක වශග වීම තරම් ද සි මෙසේ) පාපයෙහි
ලජ්ජායෙන් අකුශලවිතර්ක දුරු කරන පුරුෂයෙක් සත්ත්වලෝකයෙහි
කිසිවෙක් ම ඇත්තේ ය (සුලභ නො වන්නේ ය).

16. (කිසි ප්‍රමාද හෙතුවෙකින්) සැම්ටියෙන් පහරින ලද, (මමත් 144
සැම්ටියෙන් පහර ලදිම් ද සි එතැන් පටන් අප්‍රමාද වැ වීර්‍ය්‍ය කරන්නාවූ
සුශික්ෂිත) උත්තම අශ්වයක්හු මෙන් වීර්‍ය්‍යවත් වවු. සංසාරයෙහි උද්වෙග-
බහුල වවු. (මෙසේ වසන) තෙපි (ලොව්ලොවුතුරා විසින් දෙවැදෑරුම්)
සැදැහැයෙන් ද, සිවු පිරිසිදු ශීලයෙන් ද, (වන් පිළිවෙත් පුරණ හදරණ
පිරිවහන) කායිකවීර්‍ය්‍යයෙන් ද, කෙලෙසුන් තවන චෛතසික වීර්‍ය්‍යයෙන්
ද, (රූපාරූප අෂ්ටසමාපත්ති සංඛ්‍යාත) සමාධියෙන් ද, (කාරණාකාරණ
දැන්ම ලකුණු කොටැති) ධර්මවිනිශ්චයයෙන් ද (හෙවත් විදර්ශනාප්‍රඥයෙන්
ද) සමන්විත වැ, සම්පූර්ණ වූ විද්‍යාචරණ ඇති වැ, (සියලු කුදුමහත්
කටයුත්තෙහි එළැඹ සිටි සිහි ඇති බැවින්) ස්මෘතිසම්පන්න වැ, අනල්ප වූ
(ඉතා බොහෝ වූ) මේ සසර දුක දුරු කරවු.

17. දියාඑවෝ (කෙත්වත් ආදියට දිය ගෙණ යන්නාහු) (සිත් පිත් 145
නැති) දිය (ඇල බිඳ ගෙණ, පිහිලි පටවා ගෙණ, වෙහෙලි තගා ගෙණ
තමන් කැමැති තැනකට) ගෙණ යන්නාහ. හීවඩුවෝ (සිත් පිත් නැති)
හීදඬු (තවා ඇද මැඩ තමන් කැමැති ලෙසට) තමන්නාහ. ලීවඩුවෝ
(සිත් පිත් නැති) දඬු (නිම්වළලු ආදිය පිණිස වක් කොට ද ඉදි කොට ද
සැස තමන් කැමැති ලෙස) තමන්නාහ. සුව සේ අවවාද අනුශාසන
කට හැකි සුවචයෝ තමන් සිත දමනය කරන්නාහ (තමන් සිත දමනය
කොට රහත් පලයට පැමිණෙන්නාහ).

**දශ වන දණ්ඩවර්ගය සි.**

---

## ජරාවර්ගය

1. සතතයෙන් (මේ ලොකසන්නිවාසය රාගාදි එකොළොස් ගින්- 146
නෙන්) ඇවිල ගෙණ දිලියෙන කල්හි (තොප හැම දෙනාට) සොම්නසෙක්
වත් සතුටෙක් වත් කවරේ ද? (දුඃඛාදි අට තන්හි උපදනා සමොහ
යැ සි කියන ලද) අවිද්‍යාන්ධකාරයෙන් වළඳනා ලද්දා වූ තෙපි (ඒ මොහඳුර
නසනු පිණිස මාර්ගඵලප්‍රඥ සංඛ්‍යාත) ප්‍රදීපය කුමට නො සොයවු ද?

2. යම් මේ සිරුරෙක නිත්‍ය පැවැත්මෙක් නැද්ද, (නව මහා ව්‍රණමුඛ- 147
යන්ගේ වශයෙන් ව්‍රණස්වභාව වූ ව්‍රණසමූහ වූ) තුන් සියයක් ඇටින් ගළපා
සිටුවන ලද්දා වූ, (හැම කල්හි ම කැවීමෙන් පෙවීමෙන් නැහැවීමෙන්
ඉලීමෙන් ඉරියවු පෙරළීම් ආදියෙන් පරිහරණය කට යුතු හෙයින්
සතතයෙන්) ගිලන් වූ, බොහෝ දෙනා විසින් ශුභය ශුචි යැ සි කල්පනා
කරණ ලද්දවූ, (වස්ත්‍රාභරණාදියෙන් සරහා) විසිතුරු කරණ ලද්දා වූ මේ
ශරීරය, මේ මෘතකලෙබරය (අසුචි දුගඳ පිළිකුල් සේ) බල.

3. පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභඞ්ගුරං 148
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං.

4. යානිමානි අපත්ථානි අලාපූනෙව සාරදෙ 149
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති.

5. අට්ඨීනං නගරං කතං මංසලොහිතලෙපනං 150
යත්ථ ජරා ච මච්චු ච මානො මක්ඛො ච ඔහිතො.

6. ජීරන්ති වෙ රාජරථා සුචිත්තා 151
අථො සරීරම්පි ජරං උපෙති.
සතඤ්ච ධම්මො න ජරං උපෙති
සන්තො හවෙ සබ්භි පවෙදයන්ති.

7. අප්පස්සුතායං පුරිසො බලිවද්දො'ව ජීරති 152
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති.

8. අනෙකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං 153
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

---

3. පරිජීර්ණමිදං රූපං රොගනීඩං ප්‍රභඞ්ගුරම්
භිද්‍යතෙ පූති සන්දෙහං මරණාන්තං හි ජීවිතම්. (උදානවර්ග V 34)
පරිජිනමිද රූ රොවු අ නිඩ ප්‍රභගුනො
භෙංසිති..............(ප්‍රා. ධ. C VO 3)

4. යානිමාන්‍යපවිද්ධානි වික්ෂිප්තානි දිශො දශ.
කාපොතවර්ණාන්‍යස්ථීනි තානි දෘෂ්ට්වෙහ කා රතිඃ. (දිව්‍යාවදාන - 561 පිට)
ඉමානි යාන්‍යපස්ථානි අලාබූනීව ශාරදෙ
ශංඛවර්ණානි ශීර්ෂාණි තානි දෘෂ්ට්වෙහ කා රතිඃ. (දිව්‍යාවදාන. 561 පිට)
යනි මනි ප්‍රභගුනි විවිතනි දිශො දිශ
කවොතක අඨිනි තනි දිෂ්ටන ක රතී. (ප්‍රා. ධ C VO 16)

5. අස්ථිස්ථූණං ස්නායුයුතං මාංසශොණිතලෙපනම්
චර්මාවනද්ධං දුර්ගන්ධි පූර්ණං මූත්‍ර පුරීෂයොඃ
ජරාශොකසමාවිෂ්ටං රොගායතනමාතුරම්
රජස්වලමනිත්‍යං ච භූතාවාසමිදං ත්‍යජෙත්. (මනුස්මෘති. VI. 77)

6. ජීර්‍යන්ති වෛ රාජරථාඃ සුචිත්‍රා
හ්‍යථො ශරීරම්පි ජරාමුපෛති
සතාංතු ධර්මො න ජරාමුපෛති
සන්තො හි තං සත්සු නිවෙදයන්ති. (උදානවර්ග V. 28)

ජියරති හි රයරධ සුචිත්‍ර
අධ ශරිර බි ජර උවෙති.
සත තු ධම් න ජර උවෙති.
සනො හිව සසි ප්‍රවෙදසිති (ප්‍රා. ධ COV 21)

3. මේ රූපය (පාලු වැ ගිය හෙයින්) ඉතා ජීර්ණ ව ගියේ, වැලිත් 148
නොයෙක් රෝගයනට කැදැල්ලක් බඳු ය. එයා නස්නා සුලු ය. (රන්වන්
වුව ද නව දෙරින් සතතයෙන් වැගෙන කුණු ඇති බැවින්) කුණු වූ මේ
කය තෙම (නොබෝ කලෙකින්) බිඳෙන්නේ ය. කුමක් හෙයින? යත්:
සියලු සතුන්ගේ ජීවිතය තෙම යම් හෙයකින් මරණය ම අන්ත
කොටැත්තේ ද, එහෙයිනි.

4. සරත්කාලයෙහි ඒ ඒ තන්හි දමන ලද ලබු වැනි වූ කොබෝවන් 149
පැහැ ඇත්තාවූ, යම් මේ මිනී ඇට කෙනෙක් ඇද්ද, ඒවා දැක කවර නම්
කාමරතියෙක් තොපට වේ ද? (කාමරතියක් ඉපැදැවීම තොපට සුදුසු ද?)

5. යම් තැනෙක්හි ස්කන්ධපරිපාකලක්ෂණ වූ ජරා ද, ස්කන්ධ- 150
භේදලක්ෂණ වූ මරණ ද, නවවිධ මානය ද, (මෙරමා කළ උපකාර මැකීම
ලකුණු කොටැති) මකු කෙලෙස් ද පිහිටුවන ලද ද, එහි මසින් හා ලෙහෙ-
යෙන් ගල්වන ලද නුවරක් (නොහොත් කොටුගෙයක්) ඇටින් කරණ ලදී.
(තුන් සියයක් ඇට පිහිටුවා නව සියයක් නහරවැලින් වෙළා කරණ ලදී).

6. (මුතු මිණි ඈ සත්රුවනින් ද සෙසු රථාලංකාරයෙන් ද) විශෙෂ- 151
යෙන් විසිතුරු කරණ ලද රජුන්ගේ මඟුල් රථයෝ ද ඒකාන්තයෙන්
ජරාවට පැමිණෙති (මහලු ව දිරති). නැවත (කවා පොවා නහවා උළා
හඳවා පලඳවා නොයෙක් ලෙස පරිහරණය කරණ ලද) මේ සිරුර ද
(වයස් මිහිකිරීමෙන් ඛාණ්ඩිත්‍යාදියට පැමිණෙමින්) ජරාවට එළැඹෙයි.
(බුද්ධාදි සත්පුරුෂයන්ගේ) නව ලෝකොත්තර ධර්මය වනාහි ජරාවට
නො පැමිණෙයි. (බුද්ධාදි) සත්පුරුෂයෝ සත්පුරුෂයන් හා සමඟ
ඒකාන්තයෙන් බණත්තාහු ය.

7. (යටත් පිරිසෙයින් සූත්‍ර දෙකක් හෝ නොපුහුණු බැවින්) 152
අල්පශ්‍රැත වූ මේ පුරුෂ තෙම (මවට වත් පියාට වත් සෙසු නෑයනට වත්
කිසි ප්‍රයෝජනයක් පිණිස නො මුහුකුරා නිරර්ථක ව ම මුහුකුරණ) ගොනකු
මෙන් (උපාධ්‍යාය වතක් ආචාර්ය වතක් ගිලන් වතක් නොකොට භාවනා-
යෙක නොයෙදී නිරර්ථක ව ම) මුහුකුරන්නේ ය. ඒ (හියට නො
තිසි යැ යි වලා හැරපු පාබුන් ගොන්මාල්ලකු වලැ ම කා හැවිද මස් වැඩී
තර වැ ගියා මෙන් ආචාර්ය උපාධ්‍යායාදීන් විසින් හරණ ලද්දු ව සඞ්ඝයාට
උපන් සිවුපසය වළඳා වමන විරේචනාදියෙන් කායපොෂණයෙහි
නියුක්ත) මහණහට ශරීරමාංසයෝ ම වඩනාහ. ඔහුට (ලෞකික වූ ද
ලෝකොත්තර වූ ද) ප්‍රඥාව මඳසාදු නො වැඩේ.

8. භවයෙහි නැවත නැවත උත්පත්තිය යම් හෙයකින් දුක් ද, 153
එහෙයින් ආත්මභාව සංඛ්‍යාත ගෙය කරණ තෘෂ්ණා නැමැති වඩුවා
සොයන මම (යම් නුවණෙකින් ඔහු දක්නට පිළිවන් ද, ඒ බොධිඥානාධි-
ගමය පිණිස (දීවකුරු පාමුලැ දී කරණ ලද අභිනීහාර ඇත්තෙම්,
මෙ නෙක් කල් මුළුල්ලෙහි නොයෙක් ජාතිකෝටිසහස්‍ර යැ යි කියන
ලද සසරවටෙහි (ඒ බෝධිඥානය නො ලබන්නෙම් ම) ච්‍යුතිප්‍රතිසන්ධි
වශයෙන් නැවත නැවත හැවිද්දෙම්.

9. ගහකාරක දිට්ඨො'සි පුන ගෙහං න කාහසි 154
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.

10. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං 155
ජිණ්ණකොඤ්චා'ව ඣායන්ති ඛීණමච්ඡෙ'ව පල්ලලෙ.

11. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං 156
සෙන්ති චාපා'තිඛිත්තා'ව පුරාණානි අනුත්ථුනං.

**ජරාවග්ගො එකාදසමො.**

## 12. අත්තවග්ගො

1. අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං 157
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො.

2. අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ 158
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිසෙය්‍ය පණ්ඩිතො.

3. අත්තානඤ්චෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති 159
සුදන්තො වත දමෙථ අත්තා හි කිර දුද්දමො.

4. අත්තා හි අත්තනො නාථො කො හි නාථො පරො සියා 160
අත්තනා'ව සුදන්තෙන නාථං ලභති දුල්ලභං.

---

ආත්මාහි ආත්මනො නාථඃ කො නු නාථඃ පරො භවෙත්
ආත්මනා හි සුදාන්තෙන ස්වර්ගං ප්‍රාප්නොති පණ්ඩිතඃ. (බොධිචර්යාවතාර 490 )

9. (අත්බව් නැමැති මේ ගෙය කරණ තෘෂ්ණා නැමැති) වඩුව, 154
(සර්වඥතාඥානය ප්‍රතිවෙධ කරණ මා විසින්) දුටු දක්නා ලද්දේ වෙහි.
නැවත (අත්බව්) ගෙයක් තෝ මට නො කරන්නෙහි ය. තාගේ සියලු
(කෙලෙස් නැමැති) පරාළයෝ තාක් (නොහොත් සියලු ගෘහොප-
කරණයෝ මා විසින් ) බිඳෑ පියන ලදහ. (තා කළ අත්බව් ගෙහි) අවිද්‍යා
නැමැති කැණිමඬල (මා විසින් රහත් මඟ නුවණ නැමැති පොරොවින්
පළා) විසුරුවා පියන ලදී. දුටු මා සිත (අරමුණු කිරීම් වශයෙන්)
නිවනට වන. තෘෂ්ණාවන්ගේ ක්‍ෂය යැ සි කියන ලද රහත්පලයට මම්
පැමිණියෙමි.

10. (පැවිද්දට යොග්‍ය වූ තරුණ වයස පැවිදි වැ ගෙණ) බඹසරවස් 155
නො වැස, (නූපන් භොග උපදවන්නට ද උපන් භොග රක්නට ද යොග්‍ය
වූ) යෞවන වයසෙහි (කෘෂි වණික්කර්මාදියෙන් ලැබියැ හැකි වූ) ධනය
ලැබ නොගෙන, පමා වැ වුසූ අඥනයෝ දිය හුන් හෙයින් මසුන් නැති
විලෙක මඩ පිට හිඳ නැවෙන, (ගොදුරු ඇති විලකට නැඟී යන්නට බල
නැති පත් වගුළ) මහලු කොස්ලිහිණියන් මෙන් නැවෙන්නාහ.

11. තරුණ වයසෙහි බඹසරවස් නොවැස, යොවුන් වයසෙහි 156
ධනය නොසපයා, පමා වැ වුසූ අනුවණයෝ හරණ ලද සැර මෙන් (හෙවත්
දුන්නෙන් විදිනා ලදු ව වළා හුනු සැර හුනු තැන ම තිබී දිරා නස්නා
මෙන්) (පෙරැ මෙසේ කැම්හ, මෙසේ පූම්හ යන ආදීන්) පෙර වුන් සුව
සැපතට සොස්මින් හොවින්.

**එකොළොස් වන ජරාවර්ගය යි.**

---

## 12. ආත්මවග්ග ය.

1. ඉදින් තමා තමහට ප්‍රිය යැයි දන්නේ වී නම්, එය සුරක්‍ෂිත 157
කොට රක්නේ ය. (යමෙක් තමා රකිමි යි වැසූ දොරකවුළු ඇති
ගෙයකට වැද රකවළ ඇති වැ වසන්නේ ද, අකුසල් කෙරේ නම්, හේ තමා
රක්නේ නම් නො වේ. යමෙක් එළිමහනැ සිටින්නේ නුමුදු අකුසලින් දුරු
වැ දනාදි සුචරිතයෙහි යෙදේ නම්, හේ තමා රක්නා නම් වේ. එහෙයින්
නුවණැත්තේ තුන් වයසෙන් එක්තරා වයසෙක අකුසලින් දුරු කොට
තමා රක්නේ ය.

2. පළමු කොට තමා ම සුදුසු ගුණයෙක්හි පිහිටුවන්නේ ය. 158
(යමෙක් අපිස්බව් ආදි ගුණයෙකින් අනුනට ඔවා දෙනු කැමැත්තේ නම්,
ඔහු විසින් පළමු කොට ඒ ගුණයෙහි පිහිටිය යුතු යි.) ඉක්බිත්තෙන් පරු
හට (තමා පිහිටි ගුණයෙන්) අනුශාසන කරන්නේ ය. මෙසේ කරණ
නැනැත්තේ නො කෙලෙසෙන්නේ ය (නො නැවෙන්නේ ය).

3. අනෙකකුට යම්සේ අනුශාසන කෙරේ ද, එසේ ම තමා ප්‍රතිපත්ති- 159
සාරයකු කරන්නේ වී නම්, හේ තෙමේ මනා වැ දැමුනේ අනුන් දනන
කරන්නේ ය. යම් හෙයකින් තමා දමනය කිරීම දුෂ්කර ද (හෙවත් ආත්ම
දමනය උගහට ද,) එ හෙයිනි. (යම් ලෙසෙකින් තමා දනන කරණ
ලද්දේ මොනවට දැමුනේ නම් වේ ද එ ලෙස දැමිය යුතු).

4. තමාහට තමා ම පිහිට වන්නේ ය. තමා හැර අන් කවරෙක් 160
තමහට පිහිට වන්නේ ද? ඉන්ද්‍රියදමනයෙන් මනා කොට දැමුනාවූ තමා
කරණ කොට ගෙණ ම පරමදුර්ලභ වූ (රහත්පල යැ යි කියන ලද)
ප්‍රතිෂ්ඨාව ලබන්නේ ය.

5. අත්තනා'ව කතං පාපං අත්තජං අත්තසම්භවං 161
අභිමත්ථති දුම්මෙධං වජිරං'වස්මමයං මණිං.

6. යස්ස අච්චන්තදුස්සීල්‍යං මාලුවා සාලමිවොත්ථතං 162
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡතී දිසො.

7. සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච 163
යං වෙ හිතඤ්ච සාධුඤ්ච තං වෙ පරමදුක්කරං.

8. යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං 164
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලති.

9. අත්තනා'ව කතං පාපං අත්තනා සංකිලිස්සති 165
අත්තනා අකතං පාපං අත්තනා'ව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො විසොධයෙ

10. අත්තදත්ථං පරත්ථෙන බහුනා'පි න හාපයෙ. 166
අත්තදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතො සියා

**අත්තවග්ගො ද්වාදසමො.**

---

## 13. ලොකවග්ගො.

1. හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ 167
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවඩ්ඪනො

2. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ 168
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

---

5. ආත්මනා විහිතං දුඃඛමාත්මනා විහිතං සුඛම්.
ගර්භශය්‍යාමුපාදාය භුංක්තෙ වෛ පෞර්වදෛහිකම්. (ගරුඩ පුරාණ. 119 අධ්‍යාය. 19.

6. යස අචත දුශිලිඅ මලුඅ වචි ලත වනි.
කුය සු තධතමන යධ න විෂමු ඉජති. (ප්‍රා. ධ. C 32)

1. හීනං ධර්මං න සෙවෙත ප්‍රමාදෙන න සංවසෙත්
මිථ්‍යාදෘෂ්ටිං න සෙවෙත න භවෙල්ලොකවර්ධනඃ (උදානවර්ග 4. 5. 8.)
හින ධම න සෙවෙඅ ප්‍රමදෙන න සවසි
මිඡා දිඨි න රොයෙඅ න සිඅ ලොකවඪනො. (ප්‍රා. ධ. A. 5 6)

2. උත්තිෂ්ඨෙන්න ප්‍රමාද්‍යෙත ධර්මං සුචරිතං චරෙත්.
ධර්මචාරී සුඛං ශෙතෙ හ්‍යස්මින් ලොකෙ පරත්‍ර ච. (උදානවර්ග 4. 5. 35)
උථිඨෙ න ප්‍රමජෙඅ ධමු සුචරිත චරි.
ධමචරි සුහු ශෙති අස්මි ලොකි පරස යි. (ප්‍රා. ධ. A 5 6)

5. තමා කෙරෙන් ම ජනිත වූ, තමා කෙරෙන් ම උපන්නා වූ, තමා 161
විසින් ම කරණ ලද්දා වූ අකුශල කර්මය තෙම (අකුශලකාරී වූ ඒ) අනුවණයා
මඩනේ ය. (සිවු අවාහි ගලා දුක් දෙන්නේ ය.) (පාෂාණමය වූ පාෂාණ-
යෙන් ම උපන්) විදුර තමහට උත්පත්තිස්ථාන වූ පාෂාණය (කා, සිදුරු
විසිදුරු කොට, කඩ කොට) අපරිභෝගාඞ්ග කරන්නාක් මෙනි.

6. යමක්හුගේ ඒකාන්ත දුශ්ශීලභාවය, සල්රුකක් වැලැඳ ගෙන සිටි 162
මාලුවා වැලක් මෙන්, ඒ දුශ්ශීලයා වැලැඳ ගෙණ සිටියේ වේ ද, එක්තරු
එකක්හුගේ සතුරෙක් ඒ තමාගේ සතුරාට යම්සේ අනර්ථයක් කොට පියනු
කැමැති වේ ද, ඒ දුශ්ශීල පුද්ගල ද තමහට එසේ ම අනර්ථ කරන්නේ ය.

7. යම් කර්ම කෙනෙක් සාවද්‍ය හෙයින් අසාධු ද, (අපාය සාධක 163
බැවින්) තමහට අහිත ද, එසේ වූ (අකුශල) කර්මයෝ (වළ තැනට ගෙණ යන
දිය සෙයින්) සුව සේ කටහැක්කාහු ය. යම් කර්මයෙක් කරණ ලද්දේ
(සුගතිසාධක බැවින්) තමහට හිත ද, (නිරවද්‍ය බැවින්) සාධු ද, ඒ (කුශල)
කර්මය (පැදුම් දෙසට නතු වූ ගහක් පෙරලා පැළ දෙසට නතු කරණු
සෙයින්) අතිදුෂ්කර සි (කරන්නට ඉතා ම නො පිළිවනි).

8. යම් අඥාන පුද්ගලයෙක් (තමහට වන ලාභසත්කාරයට හානි 164
වෙනැ යි බියෙන්) ලාමක වූ දෘෂ්ටිය නිසා නිකෙලෙස් වූ, දැහැමින් ජීවත්
වන සුලු වූ, (බුද්ධාදි) ආර්යයන්ගේ අනුශාසනය වළකා ද, (ඔහුගේ ඒ ප්‍රති-
ක්‍රොශනය ද ලාමක දෘෂ්ටිය ද) හුනගස්හුගේ පල ගැන්ම මෙන් ආත්මවධය
පිණිස (තමහට විනාශය පිණිස) පල ගන්නේ ය (හෙවත් නිපදනේ ය).

9. තමා විසින් ම පව් කරණ ලද නම් (සිවුඅපාහි ඉපිද දුක් විඳින්නේ) 165
තෙමේ ම කෙලෙසෙන්නේ ය (තැවෙන්නේ ය). තමා විසින් ම පව් නො
කරණ ලද නම්, එයින් තෙමේ ම විශුද්ධ වන්නේ ය. ශුද්ධිය ද අශුද්ධිය ද
තමා පිළිබඳ ය. අනෙකෙක් අනෙකකු ශුද්ධ නො කරන්නේ ය.

10. බොහෝ වූ ද පරාර්ථය නිසා ආත්මාර්ථය නො පිරිහෙළන්නේ ය. 166
ආත්මාර්ථය වෙසෙසා දැන, අර්හත්ඵලාධිගම නම් වූ ස්වාර්ථයෙහි
නියැලියෙක් වන්නේ ය.

**දෙලොස්වන අත්ත වර්ගය සි.**

---

## 13. ලොකවර්ගය.

1. ලාමක ධර්මය (පංචකාමගුණය) නො සෙවුනේ ය. ප්‍රමාදය හා 167
එක් ව නො වසන්නේ ය. මිථ්‍යාදෘෂ්ටිය ද සේවනය නො කරන්නේ ය.
ලොව වඩන්නෙක් නො වන්නේ ය (සසර නො වඩන්නේ ය).

2. ගෙපිළිවෙළින් පිඩු සිඟා ලැබිය යුතු කෙණෙසි අහරෙහි නො පමා 168
වන්නේ ය. භික්ෂාචර්යාධර්මය සකසා පුරුදු කරන්නේ ය. භික්ෂාචර්යාධර්මය
අනුව හැසිරෙන මහණ තෙම මෙ ලොවෙහි ද පරලොවෙහි ද සුවසේ
වෙසෙසි.

3. ධම්මං චරෙ සුචරිතං න තං දුච්චරිතං චරෙ 169
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

4. යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං 170
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

5. එථ පස්සථිමං ලොකං චිත්තං රාජරථූපමං 171
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගො විජානතං.

6. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති 172
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

7. යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති 173
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

8. අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති 174
සකුණො ජාලමුත්තො'ව අප්පො සග්ගාය ගච්ඡති.

9. හංසාදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා 175
නීයන්ති ධීරා ලොකම්හා ජිත්වා මාරං සවාහිනිං.

10. එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො 176
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං.

---

ධර්මං චරෙත් සුචරිතං න තං දුශ්චරිතං චරෙත්
ධර්මචාරී සුඛං ශෙතෙ අස්මිංලොකෙ පරත්‍ර ච (මහාවස්තු 1 220 පිට)
ධමු චරි සුචරිත.........චරිත චරි.
ධමචරි සුහ ශෙති අසමි ලොකි පරස ඕ. (ප්‍රා. ධ. C. 30)

යො තු පුව් ප්‍රමජති පජ සු න ප්‍රම්ජති.
සො ඉම ලොකු ඔහාසෙති අභ්‍රමුතො ව සුරිඋ (ප්‍ර. ධ. A [illegible] 3)

3. (භික්ෂාචර්‍ය්‍යා) ධර්මය (අනෙස්නෙන් තොර වැ පිඬු සිඟීමෙන්) මනා 169
කොට පුරන්නේ ය. එය (වෙසියගොචරාදි අගොචරයෙහි හැසිරීම්
වශයෙන්) නපුරු කොට නො පුරන්නේ ය. භික්ෂාචර්‍ය්‍යාධර්මය මනා ව පුරනා
මිහණ තෙමේ මේ ලොවෙහි ද පරලොවෙහි ද සිවු ඉරියව්හි ම සුව සේ
වෙසෙයි.

4. දිය බුබුලක් (ඉපිද වහා නස්නේ යැ යි තුච්ඡ යැ යි අසාර යැ යි) 170
යම්සේ බලා ද, (පවනින් සැලුනු ඉරු රැස යැ යි කියන ලද) මිරිඟුව
ගන්නට නොනිසි යැ යි දක්නේ ද, එ පරිද්දෙන් ම (ස්කන්ධායතනධාතු-
සංඛ්‍යාත) ලෝකය (ඉපිද වහා නස්නේ ය, තුච්ඡ ය, අසාර ය, ආත්ම
ආත්මීය භාවයෙන් ගන්නට නො නිසි යැ යි) නුවණැසින් බලනු
තැනැත්තහු මෘත්‍යුරජ තෙමේ (මරණ තෙම) (තමාට අවිෂය වූ නිවන්
පුරයට ගිය හෙයින්) නො දක්නේ ය.

5. මෙහි එවු. යම් අත්බැවෙක්හි අනුවණයෝ (තෘෂ්ණා දෘෂ්ටි 171
වශයෙන්) ගැලෙද් ද, නුවණැත්තනට යම් අත්බැවෙක්හි (රාගසඞ්ගාදි)
කිසි සඞ්ගයෙක් නැද්ද, (රන් රිදී ඈ රුවනින්) විසිතුරු වූ, රාජරථයක්
බඳු වූ (හෙවත් රජදරුවන් නැගෙන මඟුල් රියක් සේ වස්ත්‍රාභරණාදියෙන්
විසිතුරු කරණ ලද) (ස්කන්ධාදි ලොක යැ යි කියන ලද) මේ අත්බව බලවු.

6. යම් පුද්ගලයෙක් පූර්වභාගයෙහි (වත් පිළිවෙත් පිරීමෙන් හෝ 172
බණ හැදෑරුම් ආදියෙන් හෝ යොනිසොමනස්කාරයෙහි) ප්‍රමත්ත ව ද,
හෙ තෙම පසු වැ (මඟ පල සුවයෙන් දවස් යවන්නේ යොනිසොමනස්-
කාරයෙහි) නො පමා වේ ද, හෙ තෙම වලාපටලයෙකින් මිදුනු පුන්සඳ
අහස්ලොව (බබුලුවන්නා) සේ (ස්කන්ධාදිසංඛ්‍යාත) මේ ලොව (ඥාන-
ලෝකයෙන් බබුලුවන්නේ ය.

7. යමකු විසින් කළ පාපකර්මය (අර්හත්මාර්ගසම්ප්‍රයුක්ත චේතනා 173
සංඛ්‍යාත) කුසලයෙන් පිහියේ ද (මුවා ව යේ ද), හෙ තෙම වලා
පටලයෙකින් මිදුනු පුන් සඳු (අහස බබුලුවන්නා) මෙන් (ස්කන්ධාදි-
සංඛ්‍යාත) මේ ලෝකය ඥානාලෝකයෙන් බබුලුවන්නේ ය.

8. මේ ලොවී මහ ජන තෙම නුවණැස් නැතියෙන් අන්ධ ය. 174
මේ මහජනයා අතුරෙහි ස්වල්ප සත්ත්වයෙක්ම අනිත්‍යාදි වශයෙන්
ස්කන්ධපංචකය දක්නේ ය. (ලිහිණිවැද්දකු දූමූ) දැලට හසු වැ එයින් මිදී
පලා යන වටුවකු මෙන් (මාරජාලයෙන් වැසුනු සත්ත්වයන් අතුරෙන්)
ස්වල්ප වූ කිසි සත්ත්වයෙක් ම (සුෂ්ටු අග්‍ර හෙයින් ස්වර්ග යැ යි
කියන ලද) සුගතියට ද නිවනට ද යන්නේ ය.

9. හංසයෝ (කර්මවිපාකජර්ද්ධියෙන්) අහසෙහි යෙති. (යොගීහු) 175
භාවනාමයර්ද්ධියෙන් අහසෙහි යෙති. (හෙතු සම්පන්න කෘතාධිකාර
ඇති) ප්‍රාඥයෝ සෙන් සහිත මරහු දිනා ලෝකයෙන් (සසරවටින්)
නික්මෙන්නාහ (නිවන් යන්නාහ).

10. එක ම වාක්සත්‍ය ධර්මය ඉක්ම ගිය, බොරු බොහෝ කොට 176
කියන සුලු වූ, (දෙව් මිනිස් සැපට ද නිවන් සැපට ද හිමි නො වන බැවින්)
හරණ ලද පර ලොව ඇති; සත්ත්වයා විසින් නොකට හැකි
අකුසලෙක් නම් නැත.

11. න වෙ කදරියා දෙවලොකං වජන්ති 177
බාලා හවෙ නප්පසංසන්ති දානං
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ.

12. පථව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා 178
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං.

**ලොකවග්ගො තෙරසමො**

---

## 14. බුද්ධවග්ගො.

1. යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො යාති කොචි ලොකෙ 179
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.

2. යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ 180
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.

3. යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා 181
දෙවා'පි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං.

4. කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන ජීවිතං 182
කිච්ඡං සද්ධම්මසවනං කිච්ඡො බුද්ධානං උප්පාදො.

---

යස්ස ජිතං නාවජීයති ජිතමස්ස න ජීනාති අන්තකො
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ. (මහාවංසය 3. 92 පිට)

යස්ස ජාලිනී විසත්තිකා. තණ්හා නාස්ස කුහිම්පි නෙත්තිකා.
තම්බුද්ධමනන්තවික්කමං අපදං කෙන පදෙන නෙස්සථ (මහාවංසය 3. 92 පිට)

11. තද මසුරු සත්ත්වයෝ ඒකාන්තයෙන් දෙව්ලොවට 177
නො යන්නාහ. (දෙලෝ වැඩ නොදන්නා) අනුවණයෝ ඒකාන්තයෙන්
(අනුන් දුන්) දනට (කළ සේ යහපතැයි) ප්‍රශංසාවක් නො කරන්නාහ.
(අනුන් දුන්) දනය අනුමෝදන් කරන්නා වූ ප්‍රාඥ වූ ඒ පුරුෂ තෙම
වනාහි ඒ දනානුමෝදනාමය වූ කුශලකර්මයෙන් පරලොව්හි (කායික
චෛතසික සුඛයෙන්) සුවපත් වන්නේ ය.

12. මුළු පොළොවෙහි සක්විති රජ ඉසුරට වඩා (සව්සි වැදෑරුම්) 178
ස්වර්ගයට යෑමට ද වඩා, (නාගලොකාදිය සහිත) මේ සියලු ලෝකයෙහි
අධිපති බවට ද වඩා සෝවාන් ඵලය ම උතුම්. මෙ තෙක් තැන අධිපති
කොටත් සත්ත්ව තෙම අපායෙන් නො මිදුනේ ම වෙයි. සෝවාන්
පුහුල් තෙම අපායෙක නො උපදී. අට වන භවයක් නො ලබයි. එහෙයින්
මුළු ලොව ම අධිපති බවට වඩා සෝවාන් ඵලය උතුම්.

**තෙළෙස් වන ලොකවර්ගය යි.**

---

# 14. බුද්ධවර්ගය.

1. යමක්හු විසින් දිනන ලද රාගාදි කෙලෙශජාතය (නැවත 179
නොඋපදනා බැවින්) නපුරු කොට දිනන ලද්දේ නම් නො වේ ද (හෙවත්
නො දිනුවා නම් නො වේ ද), ඒ බුදුහු විසින් (ඒ ඒ මඟින් දිනන ලද)
ඒ කෙලෙශජාතය ලොවෙහි එක ද කෙලෙශයෙක් ලුහුබැඳ නො යේ ද,
(අනන්තාලම්බන වූ සර්වඥතාඥාන වශයෙන්) අපර්යන්ත වූ ගෝචර ඇති
(තුන් භවයෙහි පරිභ්‍රමණයට කාරණ වූ රාගපදාදීන් අතුරෙන්) එක ද
පදයක් නැති ඒ සම්‍යක්සම්බුද්ධයා කවර පදයෙකින් (කවර
කාරණෙකින්) ගෙණ යවු ද? (නොප වශයට පමුණුවවු ද?)

2. (හිව්න වලදනා අරුතින් දැලක් බඳු වන බැවින්) ජාලිනී නම් වූ, 180
(රූපාදි පංචාලම්බනයෙහි ආසක්ත විෂක්ත වන හෙයින්) විසත්තිකා
නම් වූ තෘෂ්ණාවෙක් යමකු කිසි භවයකට පමුණුවන්නට නැත්තේ ද,
(සර්වඥතාඥාන වශයෙන්) අනන්ත ආලම්බන ඇති භවයෙහි ගමනට
කාරණ වූ රාගාදි කිසි ද පදයක් නැති ඒ සම්‍යක්සම්බුද්ධයා කවර
පදයෙකින් (වශයට) පමුණුවවු ද?

3 යම් ප්‍රාඥ කෙනෙක් (ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන 181
වශයෙන් ද්විප්‍රකාර) ධ්‍යානයෙහි (ආවර්ජනාදි පංච වශිතාවන්ගේ
වශයෙන්) යුක්තප්‍රයුක්තයෝ ද, නෛෂ්ක්‍රම්‍ය සංඛ්‍යාත කෙලෙශව්‍යපශමයෙහි
(නිවනෙහි) ඇලුනාහු ද, සිහි ඇති, ඒ සම්‍යක්සම්බුද්ධයනට දෙවියෝත්
මිනිස්සුත් කැමැති වෙත්. (අපිත්) බුදු වූමෝ නම් යෙහෙකැ යි බුදු
බව කැමැති වන්නාහු ප්‍රාර්ථනා කෙරෙත්.

4. මිනිසත්බව පිළිලැබීම නම් (මහත් වෑයමෙන් මහත් කුසලින්) 182
පිළිලැබියැ යුතු බැවින්) දුර්ලභය. සත්ත්වයන්ගේ ජීවිතය (හෙවත්
ජීවිකාව) ද (නිරතුරු ගොවිතැන් වෙළෙඳාම් ඈ කොට දිවි පවත්වන
බැවිනුත් මඳ කලක් පවත්නා බැවිනුත් කෘච්ඡ්‍ර ය (දුක් ය). දහම්
ඇසීම ද (නොයෙක් කප් කෙළ සුවහස්හි දහම් දෙසන්නකු දුලබ
හෙයින්) කෘච්ඡ්‍ර ය (දුර්ලභ ය) සම්‍යක්සම්බුද්ධවරයන් ගේ ඉපැත්ම ද
(මහත් වෑයමින් අභිනිර්හාරය සමෘද්ධ වන බැවිනුත් සමෘද්ධාභි-
නිහාර ඇති මහපුරිසක්හුගේ උපත ද නොයෙක් කප් කෙළ සුවහස්හි දු
දුලබ බැවින්) කෘච්ඡ්‍ර ය (දුලබ ය).

5. සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා 183
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං.

6. ඛන්ති පරමං තපො තිතික්ඛා 184
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො.

7. අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො 185
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධාන සාසනං.

8. න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති 186
අප්පස්සාදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

9. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති 187
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො.

10. බහූ වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච 188
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා.

11. නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං 189
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

---

5. සර්වපාපස්‍යාකරණං කුශලස්‍යෝපසම්පදා
සචිත්තපර්‍ය්‍යෝදපනමෙතද්බුද්ධානුශාසනම් (මහාවස්තු 3. 420 පිට)

10 බහවඃ ශරණං යාන්ති පර්වතාංශ්ච වනානි ච
ආරාමාංශ්චෛත්‍ය වෘක්ෂාංශ්ච මනුෂ්‍යා භයතර්ජිතාඃ

11. න හ්‍යෙතච්ඡරණං ක්ෂෙමං නෛතච්ඡරණමුත්තමම්
නෛතච්ඡරණමාගම්‍ය සර්වදුඃඛාත් ප්‍රමුච්‍යතෙ

5. (ප්‍රාණවධාදි) සියලු අකුශලකර්ම නොකිරීම ද, (ගේ හැර 183
පැවිදි වූ තැන් පටන් රහත් පලයට පැමිණෙන තැන් දක්වා සියලු
ලොව් ලොවුතුරා කුසල් ඉපැදවීම ද, උපදවන ලද කුසලයේ වැඩීම ද,
(පංච නීවරණ කෙරෙන්) තමා සිත පිරිසිදු කිරීම ද, යන මේ සියල්ල
සියලු බුදුවරයන් ගේ අනුශාසන යි (අවවාද යි).

6. (පරූපකාර පරූපවාද ඉවැසීම යන මේ) අධිවාසනක්‍ෂාන්තිය 184
(අකුශලධර්ම තවන හෙයින් මේ ශාසනයෙහි) උතුම් තපසෙක. සියලු
බුදු පසේබුදු රහත්හු නිවන (ශාන්තතාප්‍රණීතතාදි සර්‍වාකාරයෙන්)
උතුමැ යි කියත්. පරහට හිංසා කරණ සුලු වූයේ (හෙවත් මෙරමා දිවි
නසන සුලු වූයේ) පැවිදි නම් නො වෙයි. (පාණිප්‍රහාරාදියෙන්) පරහට
වෙහෙස දෙන්නේ ද මහණ නම් නො වන්නේ ය.

7. (ජාත්‍යාදියෙන් පරහට ආක්‍රොශාදි වශයෙන්) වචසින් 185
උපවාදයක් නොකිරීම ද, (පාණිප්‍රහාරාදි වශයෙන් පරහට) කයින්
උපඝාතයක් නොකිරීම ද, පාතිමෝක්ඛයෙහි සංවරය ද, (පාමොක් සිල්
රැක්ම ද), ආහාරයෙහි මාත්‍රඥතාව ද (හෙවත් අහර පිරියෙස්නෙහිත්
පිළිගැන්මෙහිත් වැළැඳීමෙහිත් පරහට දීමෙහිත් පමණ දන්නා බව ද)
(නොහොත් දැහැමින් සෙමෙන් උපන් සතර පසය පස්විකා වළඳන
බව ද) (ජනවිවික්ත) ප්‍රාන්ත ශයනාසනයෙහි ඇල්ම ද (හෙවත් ගමට
දුරු වූ ගැඹුරු වල්හි වූ සෙනස්නෙහි ඇල්ම ද), රූපාරූප අෂ්ට-
සමාපත්තියෙහි සතතයෙන් යෙදීම ද යන මේ සියල්ල සියලු බුදුවරයන්
ගේ අනුශාසන යි (අවවාද යි).

8. කහවනු වැස්සෙනුදු (අහස බලා අත පොළාපු කල්හි දෙලොස් 186
යොත්නක් තන්හි හිනක් පමණ වස්නා සත්රුවන් වැස්සෙනුදු)
වස්තුකාම කෙලෙශකාමයෙහි තෘප්තියෙක් නො වේ. වස්තුකාමකෙලෙශ-
කාමයෝ (සිහිනෙන් පු පැනක් මෙන්) ආස්වාද රහිතයහ. බොහෝ දුක්
ඇත්තාහ. නුවණැති මහණ තෙම (කාමයෝ ආස්වාද රහිතයහ. බොහෝ
දුක් ඇත්තාහ යි) මෙසේ දැන,

9. (මානුෂක කාමයන් තබා) දිව්‍ය වූ පංචකාමයෙහි ද ඒ නුවණැති 187
මහණ තෙම ඇල්මකට නො පැමිණෙන්නේ ය. සම්‍යක්සම්බුද්ධශ්‍රාවක
තෙම (තෘෂ්ණාවගේ ක්‍ෂයාන්තයෙහි උපන් හෙයින් තෘෂ්ණාක්‍ෂය නම් වූ)
රහත්පලෙහි ද (තෘෂ්ණාක්‍ෂයයට නිමිති වූ හෙයින් තෘෂ්ණාක්‍ෂය නම් වූ)
නිර්‍වාණයෙහි ද ඇලෙන්නේ ය. (එය පතමින් කැමැති වැ වසන්නේ ය )

10. (රාජභයාදි) බියෙන් නැති ගත් බොහෝ මිනිස්සු (ඉසිගිලි 188
වෙපුල්ල ආදි) පර්‍වතයන් ද (සුභගවන මහාවන ගොසිංගසාලවනාදි)
වනයන් ද, (වෙළුවන ජීවකම්බවනාදි) ආරාමයන් ද ඒකාන්තයෙන් සරණ
යන්නාහ. (සරණ කොට සලකන්නාහ.)

11. මෙ කී සියලු ශරණය නිරූපද්‍රව (නිර්භය) නො වෙයි. මෙ කී 189
ශරණය (මේ නිසා එක ද සත්හු ජාතිජරාමරණයෙන් නොමිදෙන
බැවින්) උතුම් ද නො වෙයි. මෙ කී (පර්‍වතාදි) ශරණයට පැමිණ සියලු
දුකින් (කිසි කලෙකත්) නො මිදෙන්නේ ය.

12. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො 190
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

13. දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං 191
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං,

14. එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං 192
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

15. දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති 193
යත්ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති.

16. සුඛො බුද්ධානං උප්පාදො සුඛා සද්ධම්මදෙසනා 194
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපො සුඛො.

17. පූජාරහෙ පූජයතො බුද්ධෙ යදි ව සාවකෙ 195
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ.

18. තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ 196
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තමපි කෙනචි

**චුද්දසමො බුද්ධවග්ගො**

**පඨමකභාණවාරං**

---

## 15. සුඛවග්ගො.

1. සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො 197
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො.

---

12. යශ්ච බුද්ධං ච ධර්මං ච සඞ්ඝං ච ශරණං ගතඃ
ආර්යසත්‍යානි චත්වාරි පශ්‍යති ප්‍රඥයා සදා

13. දුඃඛං දුඃඛසමුත්පාදං දුඃඛස්‍ය සමතික්‍රමම්
ආර්යං චාෂ්ටාංගිකං මාර්ගං ක්ෂෙමං නිර්වාණගාමිනම් (උදානවර්ග 17 28-31)

14. එතද්ධි ශරණං ශ්‍රෙෂ්ඨං එතච්ඡරණමුත්තමම්
එතච්ඡරණමාගම්‍ය සර්වදුඃඛාත් ප්‍රමුච්‍යතෙ (උදානවර්ග 27 - 31.)

15. දුර්ලභඃ පුරුෂාජානෙයො නාසෞ සර්වත්‍ර ජායතෙ.
යත්‍රාසෞ ජායතෙ වීරඃ තත් කුලං සුඛමෙධතෙ. (මහාවස්තු 3 109 පිට)
දුලභො පොරුෂ ජඤො න සො සවත්‍ර ජයති.
යත්‍ර සො ජයති වීරු ත කුලු සුහුමෙධති. (ප්‍රා. ධ. CVD 35)

16. බුද්ධානාං සුඛමුත්පාදඃ සුඛා ධර්මස්‍ය දෙශනා
සුඛා සඞ්ඝස්‍ය සාමග්‍රී ශ්‍රමණානාං තපස්සුඛම්. (ප්‍රාතිමොක්ෂ සූත්‍ර 9)

1. සුසුඛං වත ජීවාමො වෛරිකෙෂු ත්වවෛරිකාඃ
වෛරිකෙෂු මනුෂ්‍යෙෂු විහරාමො හ්‍යවෛරිකාඃ (උදානවර්ග 5 44)
සුහඹු වත ජීවමු වෙරනෙෂු අවෙරන
වෙරනෙෂු මනුශෙෂු විහරමු අවෙරන (ප්‍රා. ධ CVQ 28)

12. යමෙක් සම්‍යක්සම්බුද්ධයන් ද සද්ධර්මය ද අෂ්ටාර්‍යපුද්ගල 190
සඞ්ඝයා ද සරණ ගියේ වේ නම් (සරණ යැ යි දත්තේ වේ නම්), සතර
ආර්‍ය සත්‍යයන් මනා කොට විදර්ශනාඥාන ඇසින් දක්නේ වේ නම්,

13. (ත්‍රෛභූමකවෘත්තසංඛ්‍යාත) දුඃඛසත්‍යයත් (ඒ දුක 191
උපදවන තෘෂ්ණාසංඛ්‍යාත) සමුදයසත්‍යයත් ඒ දුඃඛයාගේ ඉක්මීමට
කාරණ වූ (නිර්වාණසංඛ්‍යාත) නිරොධසත්‍යයත් (දුඃඛනිරොධයට පමුණුවන
උතුම් වූ අෂ්ටාඞ්ගිකමාර්ග සංඛ්‍යාත) මාර්ගසත්‍යයත් මනා කොට නුවණැසින්
දක්නේ වේ නම්,

14. (රත්නත්‍රයය ශරණ යෑම් ය, චතුරාර්‍යසත්‍යයන් මොනොවට 192
දැක්ම ය යන) මේ ශරණය ම නිර්භය ය. මේ ශරණය ම (සියලු දුකින්
මිදීමට කරුණු වූ හෙයින්) උතුම් ය. මේ ශරණයට පැමිණ සත්ත්ව තෙමේ
සියලු සසරදුකින් මිදෙන්නේ ය.

15. පුරුෂාජානෙය (හෙවත් උත්තම පුරුෂ) තෙම දුර්ලභ ය. 193
හෙ තෙම හැම තැන්හි ම උපදනේ නො වෙයි. ඒ ප්‍රාඥ තෙම යම්
කුලයෙක උපදනේ ද, ඒ කුලය සුවයට පැමිණෙන්නේ ය. (සැපතින්
වැඩෙන්නේ ය.)

16. සම්‍යක්සම්බුද්ධවරයන්ගේ ඉපැද්ම සුවයට කාරණ ය. සද්ධර්ම- 194
දෙශනාව ද සුවයට කාරණ ය. සඞ්ඝයා ගේ සමඟ බව ද (එක් සිත් බව ද)
සුවයට කාරණ ය. සමඟ වූ භික්‍ෂූන් ගේ තපස ද (බුද්ධවචනය උගන්නට ද
ධූතාංග පරිහරණයට ද මහණදම් රක්නට ද පිළිවන් හෙයින්) සුවට
කාරණ ය.

17. (ආමිස ප්‍රතිපත්ති දෙකින්) පිදීමට සුදුසු වූ, (තෘෂ්ණා දෘෂ්ටි 195
මාන යන තුන්) ප්‍රපංචයන් මොනොවට ඉක්මියා වූ, ඉක්ම ගිය ශොක
පරිදෙව ඇති (හෙවත් ශොකපරිදෙව දුඃඛයෙන් එතෙර ට ගියා වූ) බුදු
පසේබුදුන් ද නොහොත් බුදුසව්වන් ද වන්දනමානනාදියෙන් සිව්
පසයෙනුත් යමෙක් පුදා ද,

18. රාගාදි කෙලෙස්ගිනි නිවීමෙන් නිවුනු සිත් ඇති, කිසි 196
බියෙකින් වත් අරමුණෙකින් වත් උවදුරක් නැත්තා වූ, එ බඳු (හෙවත්
මෙකී ගුණෙන් යුත්) ඒ බුදු පසේබුදු සව්වන් (දිවමන් කල්හි ද පිරිනිවි
කල්හි ද) පුදන්නහුගේ පින්කම් මේ මෙතෙකැ යි ගණින්නට කිසි
පුද්ගලයකු විසිනුදු නො පිළිවනි.

**තුදුස්වන බුද්ධවර්ගය යි**

**පළමු බණවර යි**

---

## 15. සුඛවර්ගය.

1. (ප්‍රාණවධාදි පංචවිධ වෛරයෙන්) වෛරි වූ මනුෂ්‍යයන් 197
අතුරෙහි (දුශ්චරිතවෛර නැතියෙන්) අවෛරි වූ අපි, මනුෂ්‍යයන්
දුශ්චරිත වෛරයෙන් වෛරි වැ පවත්නා කල්හි අවෛරි ව වසමෝ ද,
එසේ වූ අපි එකාන්තයෙන් ඉතා සුව සේ ජීවත් වමු.

2. සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා 198
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා.

3. සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා 199
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකා.

4. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං 200
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා.

5. ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො 201
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයං.

6. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි 202
නත්ථි ඛන්ධසමා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛං.

7. ජිඝච්ඡාපරමා රොගා සඞ්ඛාරපරමා දුඛා 203
එතං ඤත්වා යථාභූතං නිබ්බාණපරමං සුඛං

8. ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨීපරමං ධනං 204
විස්සාසපරමා ඤාතී නිබ්බාණපරමං සුඛං.

9. පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච 205
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං.

---

3. සුසුඛං වත ජීවාමො හ්‍යුත්සුකෙෂු ත්වනුත්සුකාඃ
උත්සුකෙෂු මනුෂ්‍යෙෂු විහරාමො හ්‍යනුත්සුකාඃ (උදානවර්ග. 5. 47)

4. සුසුඛං වත ජීවාමො යෙෂාං නො නාස්ති කිංචනම්
ප්‍රීතිභක්ෂා භවිෂ්‍යාමො දෙවා හ්‍යාභාස්වරා යථා. (උදානවර්ග 30. 49.)
සුසුඛං වත ජීවාමි යස්‍ය මෙ නාස්ති කිංචන
මිථිලායාං ප්‍රදීප්තායාං න මෙ දහ්‍යති කිංචන (මහාභාරත 12. 9917)
සුහඃ වත ජීවමු යෙස මු නථි කිංජනි
කිංජනෙෂු මනුශෙෂු විහරමු අකිංජන (ප්‍රා. ධ. C VO 30)

5. ජයො වෛරං ප්‍රසවති දුඃඛං ශෙතෙ පරාජිතඃ
උපශාන්තඃ සුඛං ශෙතෙ හිත්වා ජයපරාජයම්. (අවදානශතක)
ජය වෙර ප්‍රසහති දුඛු ශයති පරයිතු
උවශතු ශොහු ශයති හිච ජය පරජය අ (ප්‍රා. ධ. C VO 43.]

8. අරොග පරම ලභ සතුඨි පරම ධන
විශොශ පරම මිත්‍ර නිවන පරමො සුහ. (ප්‍ර, ධ. C___ 24)

2. ආශවසීයෙකි! අපි කෙලෙස්ශාතුරයන් අතුරෙහි අනාතුර වන්නමෝ 198
ඉතා සුවසේ ජීවත් වමු. (මෙසේ) මිනිසුන් කෙලෙස්ශාතුර වන කල්හි අපි
එයින් ආතුර නොවී වසමු.

3. ආශවසීයෙකි! අපි පස්කම් සෙවීමෙහි උත්සුක මිනිසුන් අතුරෙහි 199
එහි අනුත්සුක වන්නමෝ ඉතා සුවසේ ජීවත් වමු. (මෙසේ) මිනිසුන්
පස්කම් සෙවීමෙහි උත්සුක වන කල්හි අපි එහි අනුත්සුක ව වසමු.

4. ආශවසීයෙකි! යම් බඳු අපට රාගාදි කිසි පළිබොධයෙක් නැද්ද, 200
එබඳු වූ අපි ඉතා සුව සේ ජීවත් වමු. ආභාස්වර බ්‍රහ්මයන් මෙන්
ප්‍රීතිය ම ආහාර කොට ඇත්තෝ වම්හ.

5. මෙරමා දිනන්නේ (හෙවත් දූකෙළීම් ආදියෙන් අනුන් 201
පරදවන්නේ), වෛර උපදවයි. (වෛරීන් ඇති කෙරෙයි). අනුන් විසින්
දිනන ලදුයේ දුක සේ වසයි. කෙලෙස් සංහිඳුනු ක්ෂීණාස්‍රව තෙම දිනුම්
පැරදුම් දුරලා සුව සේ වසයි.

6. රාගය හා සම ගින්නෙක් නැත. ද්වෙෂය හා සම අපරාධයෙක් 202
නැත. පඤ්චස්කන්ධ දුඃඛය හා සම දුකෙක් නැත. නිර්වාණ සැපයට වැඩි
තරම් සුවයෙක් නැත.

7. රෝගයෝ සාදුක පරම කොට ඇත්තාහ. දුඃඛයෝ තාක් 203
සංස්කාරයන් (පංචස්කන්ධයන්) පරම කොට ඇත්තාහ. මේ දෙකරුණ
තත් වූ පරිදි දැන (නුවණැත්තෝ නිවන් පසක් කරති.) නිවණ
උතුම් වූ සුමය යි.

8. සියලු ලාභයෝ තාක් නීරෙග බව පරම කොටැත්තාහ. (රෝගීහු 204
ලත් ලාභයෝ ලාභ නම් නො වෙත් නු යි නිරෙග බව උත්තම ලාභ නම්
වෙයි.) ධනය සතුට පරම කොටැත්තේ ය. (යම් ධනයෙක් තමා විසින්
ලබන ලද නම්, යම් ධනයෙක් තමා සතු නම්, එයින් ම සතුටු වන බව
සෙසු ධනයට වඩා උතුම් ධනයෙක) නෑයෝ නම් විශ්වාස්‍ය පරම-
කොටැත්තෝ ය. (මාපියෝ ද යමකු හා විශ්වාස නැත්නම් හෙ තෙම
නො නෑ ම ය. යමෙක් වනාහි නොනෑ වුව ද විශ්වාස වී නම් හේ
උතුම් නෑ ය.) සුවය නිවන පරම කොටැත්තේ ය (නිවන් හා සම
සුවයෙක් නැත. එ බැවින් නිවන උතුම් ම සුවය යි.)

9. කායචිත්තවිවේකයෙන් උපන් (සුව සොම්නසැ යි කියන ලද) 205
රසය ද, කෙලෙසවූපශම යැ යි කියන ලද නිවනේ රසය ද බී, (දුඃඛසත්‍යය
පිරිසිඳ දැනීම් ආදිය කෙරෙමින් නිවන අරමුණු වශයෙන් ප්‍රත්‍යක්ෂ කරමින්
අනුභව කොට නවලොකොත්තර ධර්ම වශයෙන් උපන් ප්‍රීතිරසය
බොන්නාවූ රහත් මහණ තෙම (මේ උභය රසපානයෙන් රාගදරථාදීන්
නැති හෙයින්) පීඩා රහිත ද වන්නේ ය. පව් නැත්තෙක් ද වන්නේ ය.

10. සාහු දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො 206
අදස්සනෙන බාලානං නිච්චමෙව සුඛී සියා.

11. බාලසඞ්ගතචාරී හි දීඝමද්ධාන සොචති 207
දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙනෙව සබ්බදා
ධීරො ච සුඛසංවාසො ඤාතීනං'ව සමාගමො.

12. තස්මා හි,
ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච 208
ධොරය්හසීලං වතවන්තමරියං
තං තාදිසං සප්පුරිසං සුමෙධං
භජෙථ නක්ඛත්තපථං'ව චන්දිමා.

**පණ්ණරසමො සුඛවග්ගො**

---

# 16. පියවග්ගො.

1. අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිඤ්ච අයොජයං 209
අත්ථං හිත්වා පියග්ගාහී පිහෙතත්තානුයොගිනං.

2. මා පියෙහි සමාගඤ්ඡි අප්පියෙහි කුදාචනං 210
පියානං අදස්සනං දුක්ඛං අප්පියානඤ්ච දස්සනං.

3. තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො 211
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්ථි පියාප්පියං.

4. පියතො ජායතී සොකො පියතො ජායතී භයං 212
පියතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

5. පෙමතො ජායතී සොකො පෙමතො ජායතී භයං 213
පෙමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

10. සුඛං දර්ශනමාර්යාණාං සංවාසො'පි සතාං සුඛඃ
අදර්ශනෙන බාලානාං නිත්‍යමෙව සුඛං භවෙත් (ප්‍රාතිමොක්ෂසූත්‍ර. 10)
සුහ දශීන අරිඅන සවසො ච සද සුහො
අදශනෙන බලන නිචමෙව සුහි සිඅ (ප්‍රා. ධ. CVO 37)

11. බල සගතචරිඋ දීඝමධ්වන ශොචිශු
දුඛ බෙලෙහි සවසු අමිත්‍රෙහි ච සව්‍රසි (ප්‍රා. ධ. CVO 38)
ධිරො ච සුඛ සවස ඤතිහි ව සමුසි (ප්‍රා. ධ. CVO 38)

12. ධිර හි ප්‍රඥමු භයය පතිතො
ධොරෙය ශිල වතමත අරිය
ත තදිශ සපුරුෂ සුමෙධ
භය... ත ණත්‍රපථ ව චද්‍රිමු
රංධ අරොවචමස පරිකිච උවකෂ (ප්‍රා. ධ CVO 39.40)

4. ප්‍රියෙභ්‍යො ජායතෙ ශොකඃ ප්‍රියෙභ්‍යො ජායතෙ භයම්
ප්‍රියෙභ්‍යො විප්‍රමුක්තානාං නාස්ති ශොකඃ කුතො භයම් (අවදානශතක. 8)

10. බුද්ධාදි ආර්යයන් (මසැසින් ද නුවණැසින් ද) දැක්ම යහපති. 206
(හුදෙක් දැක්ම පමණක් නොව) ඔවුන් හා එක් තැන විසීම ද (ඔවුන්
වැඳ පුදා ගැන්ම ද වතාවත් කැරුම ද) හැම කල්හි ම සුව ය. (දෙලෝ
වැඩ නොදන්නා) අනුවණයන් නොදැක්මෙන් සතතයෙන් ම සත්ත්ව තෙම
සුඛිත වන්නේ ය.

11. එසේ ම ය. බාලයන් හා එක් ව හැවිදිනා සුලු වූයේ දික් කලක් 207
ශෝක කෙරෙයි. (බාලයන් හා යහළු වූයේ නොකටයුත්තෙහි යෙදුනේ
වරද කොට මේ ලොවැ දඬුවම්ට ද පර ලොව නිරා දුක් ආදියට ද පැමිණ).
බොහෝ කලක් සෝස්නේ ය. බාලයන් හා එක් වැ විසීම කඩු ගත් අත්
ඇති සතුරකු හා සමග වාසයක් මෙන් හැම කල්හි ම දුක්ය.
නුවණැත්තෝ වනාහි ප්‍රිය නෑයන්ගේ සමාගමයක් මෙන් සුව වූ
සහවාසය ඇත්තෝ ය.

12. එහෙයින්,
ධෘතිසම්පන්නයා ද, ලොවී ලොවුතුරු ප්‍රඥයෙන් යුක්ත නුවණැත්තා 208
ද, ආගමාධිගමසම්පන්න බහුශ්‍රුතයා ද, (රහත්ඵලයට පමුණුවන
ප්‍රතිපත්තිධුරය උසුලන බැවින්) ධුරවහන ශීලයා ද (ශීලව්‍රත ධුතාංගව්‍රත
වලින් යුත්) ව්‍රතසම්පන්නයා ද, කෙලෙසුන් කෙරෙන් දුරු වූ ආර්යයා ද
යන සුන්දර ප්‍රඥා ඇති එබඳු වූ ඒ සත්පුරුෂයා නිර්මල ආකාශපථය
සෙවුනා සඳහු මෙන් සෙවුනේ ය.

**පසළොස්වන සුඛවර්ගය යි.**

---

# 16. ප්‍රියවර්ගය.

1. තමා නොයෙදියයුතු තැන (අගොචරසෙවනයෙහි, අයොනිසො- 209
මනසිකාරයෙහි) යොදන්නාවූ ද, යෙදියයුතු තැන (සතිපට්ඨානගොචර-
යෙහි) නො යොදන්නාවූ ද පුද්ගල තෙම අර්ථය (ත්‍රිශික්‍ෂාව) දුරලා ප්‍රිය දැයම
(පස්කම්) ගන්නා සුලු වූයේ අත් වැඩෙහි යෙදුනහු පතයි. (මමත් මෙබඳු
වීම් නම් යෙහෙකැයි මෙසේ ඔවුන් කැමැති වන්නේ ය.)

2. ප්‍රියයන් සමග ද අප්‍රියන් සමග ද කිසි කලෙකත් (තෘෂ්ණා- 210
සංස්තව වශයෙන්) එක් නො වව. ප්‍රියයන්ගේ නොදැක්ම දුකෙකි.
අප්‍රියයන්ගේ දර්ශනය ද දුකෙකි (එ හෙයිනි).

3. එ හෙයින් කිසිවෙක් (කිසි සත්ත්වයකු හෝ කිසි සංස්කාරයක්) 211
ප්‍රිය නො කරන්නේ ය. ඒ එසේ මැ යි. ප්‍රියයන්ගේ වියෝගය ලාමක ය.
යම් කෙනකුන්හට ප්‍රියාප්‍රිය වස්තුවෙක් නැද්ද, ඔවුන්හට (අභිධ්‍යාදි
චතුර්විධ) කායග්‍රන්ථයෝ නැත්තාහ (ඔවුන්ගේ සන්තානයෙහි
නො පවත්නාහු ය)

4. ප්‍රිය වූවන් නිසා ශෝකය උපදී. ප්‍රිය වූවන් නිසා භය උපදී. ප්‍රිය 212
වූවන් ගෙන් මිදුන සිතැත්තහුට කිසි ශෝකයෙක් නැත. බියෙක්
කොයින් ද?

5. ප්‍රේමය නිසා ශෝකය උපදී. ප්‍රේමය නිසා භය හටගනී. 213
ප්‍රේමයෙන් මිදුනු සිතැත්තහුට කිසි ශෝකයෙක් නැත. බියෙක්
කොයින් ද?

6. රතියා ජායතී සොකො රතියා ජායතී භයං 214
රතියා විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

7. කාමතො ජායතී සොකො කාමතො ජායතී භයං 215
කාමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

8. තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං 216
තණ්හාය විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං.

9. සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවෙදිනං 217
අත්තනො කම්ම කුබ්බානං තං ජනො කුරුතෙ පියං.

10. ඡන්දජාතො අනක්ඛාතෙ මනසා ච ඵුටො සියා 218
කාමෙසු ච අප්පටිබද්ධචිත්තො උද්ධංසොතො'ති වුච්චති.

11. චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං 219
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං.

12. තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං 220
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතීව ආගතං.

**සොළසමො පියවග්ගො.**

## 17. කොධවග්ගො.

1. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං 221
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා.

2. යො වෙ උප්පතිතං කොධං රථං භන්තං'ව ධාරයෙ 222
තමහං සාරථිං බ්‍රූමි රස්මිග්ගාහො ඉතරො ජනො.

---

ශීලමතු සුයි සජො ධම්ඨො සච්චවදො
අත්මනො කරණො සධු හ ජනො කුරති ප්‍රිඋ. (ප්‍රා. ධ. C. 24)
ධර්මස්ථං ශීලසම්පන්නං
හ්‍රීමන්තං සත්‍යවාදිනම්
ආත්මනඃ කාරකං ශාන්තං
තං ජනඃ කුරුතෙ ප්‍රියම් (සංස්කෘතධර්මපද 5. 24)

6. (පංචකාමගුණ) රතිය නිසා ශෝකය උපදී. රතිය නිසා භය 214
හටගනී. රතියෙන් මිදුනු සිතැත්තහුට කිසි ශෝකයෙක් නැත. බියෙක්
කොයින් ද?

7. (වස්තුකාම ක්ලේශකාමයැ යි ද්විවිධ වූ) කාමයන් නිසා ශොකය 215
උපදී. කාමයන් නිසා භය හටගනී. කාමයන්ගෙන් මිදුනු සිතැත්තහුට
කිසි ශොකයෙක් නැත. බියෙක් කොයින් ද?

8. තෘෂ්ණාව නිසා ම ශෝකය උපදනේ ය. තෘෂ්ණාව නිසා ම 216
භය උපදනේ ය. තෘෂ්ණායෙන් මිදුනහුට ශෝකයෙක් නැත. බියෙක්
කොයින් ද?

9. සිවු පිරිසිදු ශීලයෙන් ද මාර්ගඵල සම්ප්‍රයුක්ත සම්‍යග්දෘෂ්ටි- 217
යෙන් ද යුක්ත වූ ලොවුතුරා දහම්හි පිහිටි සිවුසස් දත්තාවූ, (තුන් සික
පිරීම වූ) තමාගේ කාර්‍ය්‍ය කරණ ඒ රහත්හු ලොව් මහජන තෙම ප්‍රිය
කරන්නේ ය.

10. යම් මහණෙක් (පැහැ සටහන් වශයෙන් මෙබඳු යැ යි) නො 218
කියන ලද නිවන කෙරෙහි (නිවන් පසක් කිරීමෙහි) (කත්තුකම්‍යතා
වශයෙන්) හටගත් ඡන්දය ඇත්තේ ද, යට තුන් මග තුන් පල සිතින්
පිරුණේ වේ ද, පස්කම්හි නො ඇලුනු සිතැත්තේ වේ ද මෙසේ වූ මහණ
තෙම උඩු බලා පැවැති ප්‍රතිසන්ධි ස්‍රොතස් ඇත්තේ යැ යි (උද්ධංසොත
යැ යි) කියනු ලැබේ.

11. බොහෝ කලක් පිට රට ගොස් වුසූ, දුරු රටැ සිට සුවසේ 219
ආ පුරුෂයක්හු ඥාති නෑයෝ ද මිතුරෝ ද යහළුවෝ ද ඔහුගේ පැමිණීම
සාදර ව පිළිගනිත්.

12. එ පරිද්දෙන් ම කළ පින් ඇති මෙ ලොවින් පරලොවට 220
ගිය පුරුෂයා ද, ඔහු කළ කුසල්හු දුර සිට ආ ප්‍රියයකු පිළිගන්නා
නෑයන් සේ පිළිගන්නාහු ය.

**සොළොස්වන ප්‍රියවර්ගය යි.**

---

## 17. ක්‍රෝධවර්ගය.

1. ක්‍රෝධය දුරු කරන්නේ ය. මානය පහ කරන්නේ ය. (කාම- 221
රාගාදි) සියලු සංයොජන ඉක්මෙන්නේ ය. නාමරූප දෙක්හි (මගේ රූපය
මගේ වෙදනාව යන ආදීන්) ඇලුම් නොකරන්නාවූ, (කෙලෙසුන් නැති
හෙයින්) අකිංචන වූ ඒ පුද්ගලයා (කායික චෛතසික දුඃඛයෝ) අනුව
නො පවත්නාහු ය.

2. යමෙක් උපන් ක්‍රෝධය භ්‍රාන්ත රථයක් (හෙවත් වෙගයෙන් 222
දුවන රියක් වළකා වළකා තමා කැමැති තැනට මෙහෙයන්නාක්) මෙන්
නිගන්නේ ද (වළකා ලන්නේ ද), ඒ පුගුලා රියැදුරු යි මම් කියමි.
රජාදීන්ගේ අන් රියැදුරු ජන තෙමේ රශ්මිග්‍රාහක (රැහැන ගන්නා)
නම් වෙයි. (උතුම් රියැදුරු නම් නො වෙයි.)

3. අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ 223
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං.

4. සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි යාචිතො 224
එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙ.

5. අහිංසකා යෙ මුනයො නිච්ච ං කායෙනසංවුතා 225
තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ.

6. සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං 226
නිබ්බාණං අධිමුත්තානං අත්ථං ගච්ඡන්ති ආසවා.

7. පොරාණමෙතං අතුල නෙතං අජ්ජතනාමිව 227
නින්දන්ති තුණ්හිමාසීනං නින්දන්ති බහුභාණිනං
මිතභාණිම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො.

8. න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති 228
එකන්තං නින්දිතො පොසො එකන්තං වා පසංසිතො.

9. යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ 229
අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං.

10. නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති 230
දෙවා'පි තං පසංසන්ති බ්‍රහ්මුනා'පි පසංසිතො.

11. කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා 231
කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ.

12. වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා 232
වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ

13. මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා 233
මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ.

---

3. අක්‍රොධෙන ජයෙත් ක්‍රොධං
අසාධුං සාධුනා ජයෙත්.
ජයෙත් කදර්‍යං දානෙන
සත්‍යෙනා නෘත වාදිනම් (මහාභාරත)

3. ක්‍රෝධී පුද්ගලයා ක්‍රෝධ නො කිරීමෙන් දිනන්නේ ය. අසාධු 223
පුද්ගලයා සාධු ගුණයෙන් දිනන්නේ ය. තද මසුරු තමා සතු දෑ දීමෙන් දිනන්නේ ය. බොරු කියන්නහු සැබෑ කීමෙන් දිනන්නේ ය.

4. සත්‍යය ම කියන්නේ ය. නො ම කිපෙන්නේ ය. ඉල්ලන 224
ලදුයේ, දෙන දෑ ස්වල්ප වෑ ඇති කල්හි නමුදු, එයින් මඳ දෑයක් නමුදු දෙන්නේ ය. මේ කරුණු තුනින් දෙවියන් වෙතට යන්නේ ය.

5. යම් මුනි කෙනෙක් අනුනට හිංසාවක් නො කෙරෙද්ද, සතත- 225
යෙන් කයින් සංවෘත වූවෝ ද, ඒ අශෙක්ෂ මුනිහු, සත්ත්වයෝ යම් තැනකට ගොස් ශෝක නො කෙරෙද්ද, මරණයක් නැති ඒ අමා මහ නිවන් නැමැති තැනට (අරමුණු කිරීම් වශයෙන්) පැමිණෙන්නාහ.

6 හැම කල්හි පිබිදි සිටින (කෙලෙස් නින්දෙන් නො නිදන), 226
දිව රෑ දෙක්හි තුන් සිකෙහි හික්මෙන, කෙලෙස් පිරිනිවනෙහි ඇලුනු යොගාවචරයන්ගේ ආශ්‍රවයෝ විනාශයට යන්නාහ.

7. අතුල ය, මේ ගැරැහුම් පැසැසුම් දෙක පුරාතන ය. මෙය අද 227
පමණක් වූ දෑයෙක් නො වේ. මුවෙන් නො බැණ උන්නවුනට ද නිඥු කෙරෙත්. බොහෝ කොට බණන සුල්ලනට ද නිඥු කෙරෙත්. මඳ කොට බණන සුල්ලහුට ද නිඥු කෙරෙති. (එහෙයින්) ලොවෑ සර්වප්‍රකාර- යෙන් අනිඥිත සත්ත්වයෙක් නම් නැති.

8 එකාන්තයෙන් ගැරැහුම් ලත් පුරුෂයෙක් හෝ එකාන්තයෙන් 228
පසස්නා ලද පුරුෂයෙක් හෝ අතීතයෙහි ද නො වී ය. අනාගතයෙහි ද නො වන්නේ ය. දැන් වර්තමාන කාලයෙහි ද නැත්තේ ය.

9. ඉදින් නුවණැත්තෝ දවස දවස විමසා, නිඥුවට ද ප්‍රශංසාවට ද 229
කාරණය දැන, යමකුට ප්‍රශංසා කෙරෙත් ද, අච්ඡිද්‍ර වූ ශික්ෂායෙහි පවත්නා (නොහොත් අච්ඡිද්‍ර ජීවිතවෘත්ති ඇති) ධර්මෞජසප්‍රඥව ඇති (විවසුන් නුවණ ඇති), ලොව්ලොවුතුරා නුවණින්නුත් සිවු පිරිසිදු ශීලයෙනුත් සමන්විත වූ,

10. ඒ මහණහට ජාම්බෝනද කනකපුංජයකට මෙන් නින්ද 230
කරන්නට කවරෙක් සුදුසු ද? ඒ මහණහට දෙවියෝ ද (නුවණැති මිනිස්සු ද) ප්‍රශංසා කෙරෙති. මහබඹුහු විසිනුදු හේ පසසන ලදුයේ ම වේ.

11. (ත්‍රිවිධ කායදුශ්චරිතය රක්නේ ය (හෙවත් කායදුශ්චරිත- 231
යෙන් දුරු වන්නේ ය). කායද්වාරයෙන් සංවෘත වන්නේ ය. කායදුශ්චරිතය හැර කයින් සුසිරිත් පුරන්නේ ය.

12 (චතුර්විධ) වාග්දුශ්චරිතය රක්නේ ය (හෙවත් වාග්දුශ්චරිත- 232
යෙන් දුරු වන්නේ ය.) වාග්ද්වාරයෙන් සංවෘත වන්නේ ය. වාග් දුශ්චරිතය හැර වාග්ද්වාරයෙන් සුචරිතය පුරන්නේ ය.

13. (ත්‍රිවිධ) මනොදුශ්චරිතය රක්නේ ය (හෙවත් මනොදුශ්චරිත- 233
යෙන් දුරු වන්නේ ය.) මනොද්වාරයෙන් සංවෘත වන්නේ ය. මනොදුශ්චරිතය දුරු කොට මනඃසුචරිතය පුරන්නේ ය.

14. කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා 234
මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා.

සත්තරසමො කොධවග්ගො.

---

# 18. මලවග්ගො

1. පණ්ඩුපලාසො'ව දානි'සි යමපුරිසා'පි ච තං උපට්ඨිතා 235
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති.

2. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව 236
නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිමෙහිසි.

3. උපනීතවයො ච දානි'සි සම්පයාතො'සි යමස්ස සන්තිකෙ 237
වාසො'පි ච තෙ නත්ථි අන්තරා පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති.

4. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව 238
නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං උපෙහිසි.

5. අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ 239
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

6. අයසා'ව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති 240
එවං අතිධොනචාරිනං සකකම්මානි නයන්ති දුග්ගතිං.

7. අසජ්ඣායමලා මන්තා අනුට්ඨානමලා ඝරා 241
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං.

8. මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං 242
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච.

14. යම් ප්‍රාඥ කෙනෙක් කායද්වාරයෙන් සංවෘත ද, නැවත 234
වාග්ද්වාරයෙන් සංවෘත ද, මනොද්වාරයෙන් සංවෘත ද, ඒ නුවණැත්තෝ
ඒකාන්තයෙන් මනා කොට වසා රැක ගත් තුන් දොර ඇත්තෝ ය.

**සතොලොස් වන ක්‍රොධවර්ගය සි.**

---

# 18. මලවර්ගය

1. දැන් (සිඳී බිමැ හුනු) පඬු පැහැ පරණලා පතක් මෙන් විහි. 235
යමදූතයෝ ද තට එළැඹ සිටියහ. (හෙවත් මරණය තට එළැඹ
සිටියේ ය). පරිහානිමුඛයෙහි ද සිටියෙහි ය. පරලොව යන තට
කුසල් නැමැති මාර්ගෝපකරණයෙකුදු නැත්තේ ය.

2. ඒ තෝ තමහට (නැව බුන් කල්හි පිහිට වන) දිවයිනක් (මෙන් 236
කුසල් නමැති පිහිටක්) කරව. (කරන්නෙහි දු) වහා වෑයම් කරව.
(එහි ලා) නුවණැති වව. (සන්තානයෙන්) පහ කළ රාගාදි මල
ඇත්තෙහි, එහෙයින් ම රාගාදී අඞ්ගණ නැත්තෙක් වූයෙහි, දිව්‍යානු-
භාව ඇති (නොහොත් ශොභාවත්) ආර්‍යභූමියට (හෙවත් ශුද්ධාවාසයට)
පැමිණෙන්නෙහි ය.

3. දැන් තෝ ගියා වූ වයස් ඇත්තෙහි ද වෙහි. (තුන් වයස් ම 237
ඉක් මැ) මරුමුවෙහි සිටියෙහි. යමයා සමීපයට (මරුමුවට) යන්නට
සැරසී සිටියෙහි. තට අතුරෙහි වාසයකුදු නැත. (පරලොව යන
තට අතරමඟ ලැග්මෙකුදු නැත. තට මාර්ගෝපකරණයෙකුදු නැත.

4. තේ තෝ තමහට පිහිටක් කරව. වහා වීර්‍ය කරව. කුසල් 238
කිරීමෙහි නුවණැති වව. දුර ලූ රාගාදි මල ඇත්තෙහි, එ හෙයින් ම
(රාගාදි) අඞ්ගණ නැත්තෙහි, නැවත ජන්මජරාව්‍යාධිමරණයනට නො
පැමිණෙන්නෙහි ය.

5 (ධර්මෞජස්ප්‍රඥයෙන් සමන්විත) ප්‍රාඥ තෙමෙ ක්‍ෂණක්‍ෂණයෙහි 239
(ලද ලද අවකාශයෙහි) මඳ මඳ කොට කරන්නේ, ස්වර්ණයේ ආගන්තුක වූ
කෘත්‍රිම දොෂ දවන රන්කරුවකු මෙන්, තමාගේ කෙලෙස්මල දුරු
කරන්නේ ය.

6. යකඩින් ම නැංගාවූ මලය එයින් ම නැඟ එය ම යම් සේ 240
කා ද, එසේ ම සිවුපසය පස් විකා පරිභොග කරණ ප්‍රඥයෙන්
ඉක්මුනුහු (හෙවත් පසය නොපස්විකා වළඳන මහණා) ස්වකීය ඒ
පාපකර්මයෝ දුගතියට පමුණුවන්නාහ.

7. හදාළ ශාස්ත්‍රයෝ නොපිරුවීම මල කොටැතියහ. ගෘහයෝ 241
වීර්‍ය නොකිරීම මල කොට ඇත්තාහ. ශරීරවර්ණයට කුසීත බව
මලයෙක. (කෙත්වත් ආ) රක්නාහට ප්‍රමාදය මලයෙක (කිලිටෙක).

8. ස්ත්‍රියට දුශ්චරිතය (ධූර්තවීම) මලයෙක (කිලිටෙක). දන් දෙන්- 242
නාහට මසුරුබව මලයෙක (කිලිටෙක). අකුශල ධර්මයෝ මේ ලොව ද
පර ලොව ද ඒකාන්තයෙන් මලයෝ ය (කිලුටු ය).

9\. තතො මලා මලතරං අවිජ්ජා පරමං මලං 243
එතං මලං පහන්ත්වාන නිම්මලා හොථ භික්ඛවො.

10\. සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා 244
පක්ඛන්දිනා පගබ්භෙන සංකිලිට්ඨෙන ජීවිතං.

11\. හිරීමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා 245
අලීනෙනාප්පගබ්භෙන සුද්ධාජීවෙන පස්සතා.

12\. යො පාණමතිපාතෙති මුසාවාදං ච භාසති 246
ලොකෙ අදින්නං ආදියති පරදාරං ච ගච්ඡති.

13\. සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති 247
ඉධෙව පොසො ලොකස්මිං මූලං ඛණති අත්තනො.

14\. එවං භො පුරිස ජානාහි පාපධම්මා අසඤ්ඤතා 248
මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං.

15\. දදාති වෙ යථා සද්ධං යථා පසාදනං ජනො 249
තත්ථ වෙ මඞ්කු යො හොති පරෙසං පානභොජනෙ
න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.

16\. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං 250
ස වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.

17\. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො ගහො 251
නත්ථි මොහසමං ජාලං නත්ථි තණ්හාසමා නදී.

18\. සුදස්සං වජ්ජමඤ්ඤෙසං අත්තනො පන දුද්දසං 252
පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථා භුසං
අත්තනො පන ඡාදෙති කලිං'ව කිතවා සඨො.

19\. පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො 253
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා.

9. මහණෙනි, ඒ සියලු මලයට වඩා අධිකතර මලයක් නොපට දක්- 243
වමි. (දුඃඛාදි අට තැන පැවැති නො දැන්මැ යි කියන ලද) අවිද්‍යාව
මහත් ම මලය ය (කිලුට ය). මේ අවිද්‍යා නැමැති මලය (රහත් මග
නුවණින්) පහකොට නිර්මල වවු.

10. පවෙහි හිරි ඔතප් නැති, ගසා කැමෙහි සුරු කවුඩකු වැනි වූ, 244
මෙරමා ගුණ මකන, ගෙන් ගෙට දිවෙන සුලු, බුහුටි වූ, කිලිටි ආජීව
ඇති මහණහු විසින් ජීවත් වීම සුවයේ සාට හැක්කේ ය.

11. පාපයෙහි හිරි ඔතප් ඇති, පිරිසිදු කායකර්මාදිය සතතයෙන් 245
සොයන සුලු වූ, ප්‍රගල්භ රහිත (බුහුටි නොවූ), (අනෙස්නෙන් දුරු වූ
බැවින්) පිරිසිදු ආජීව ඇති, එය ම සරු කොට දක්නා මහණහු විසින්
ජීවත් වීම දුකයේ කට යුතු ය) රූක්‍ෂ ජීවිකායෙන් ජීවත් විය යුතු ය).

12. යමෙක් පණ නසා ද, බොරු කියා ද. (මේ) සත්ලොවෙහි 246
නොදුන් දෑ පැහැරැ ගනී ද, පරඹුවන් කරා යේ ද,

13. යම් මිනිසෙක් රහමෙර පිමෙහිත් යෙදේ ද, මෙබඳු පුහුල් 247
තෙම මෙ ලොව්හි දී ම තමාගේ ප්‍රතිෂ්ඨාමූලය කණන්නේ ය.

14. භවත් පුරුෂය, (අකුශල)ධර්මයෝ සංයම නැත්තෝ යැ යි මෙසේ 248
දනුව. ලොභය ද ද්වේෂය ද යන අකුශලමූලයෝ දෙදෙන තා බොහෝ
කලක් නරකාදි දුකට නො පමුණුවත්වා.

15. ජන තෙමේ ශ්‍රද්ධාවට අනුරූප පරිද්දෙන්, තමාගේ ප්‍රසාදයට 249
අනුරූප පරිද්දෙන්, අනුනට දෙන්නේ ය. ඒ පානභොජනයෙහි යම්
මහණෙක්, (රූක්‍ෂ දෑ ලදැ යි) දෙම්නස් ඇත්තේ වේ ද, හෙ තෙම එකාන්ත-
යෙන් දවලෙක වත් රාත්‍රියෙක වත් සමාධියකට නො පැමිණෙන්නේ ය.

16 යම් මහණකු විසින් වනාහි මේ මකු බව මුලින් සිඳුනා ලද ද, 250
(අවිද්‍යා තෘෂ්ණා නැමැති) කෙලශමූලය මොනවට නසන ලද ද, හෙ තෙම
ඒකාන්තයෙන් දවල් හෝ රෑ හෝ සමාධියට පැමිණෙන්නේ ය.

17. රාගය හා සම ගින්නෙක් නැත. ද්වේෂය හා සම ඩැහැගැන්- 251
මෙක් නැත. මොහය හා සම දැලෙක් නැත. තෘෂ්ණාව හා සම නදියෙක්
නැත.

18. අනුන්ගේ අණුමාත්‍ර වූ වරද සුව සේ දැක්ක හැක්ක. තමාගේ 252
වූ කලි මහත් වූ වරද ද දැක්ක නොහෙන්නේ ය. ඒ අනුන්ගේ වරද
සොයන පුද්ගල තෙම මිදු වූ ද අනුන්ගේ දෙෂයන් උස් තැනෙක
සිට රෙඩු බොල් පොලන එකක්හු මෙන් පොලන්නේ ය (නගා පාන්-
නේ ය). තමාගේ වූ කලි මහත් වරද පවා වසන්නේ ය. (පැටි
කරන්නේ ය, වලහන්නේ ය). කොල පැලැලි ආදියෙන් සිරුර මූවහ
කරණ වංචක ලිහිණිවැද්දා මෙනි.

19. අනුන්ගේ වරද දක්නා සුලු වූ, සතතයෙන් අනුන් උදහන 253
සුලු වූ (අනුන්හට දෙස් කියන සුලු වූ) ඒ මහණහට ආශ්‍රවයෝ වඩනාහ.
හෙ තෙම රහත් බැවින් දුරු යි.

20. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ 254
පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා.

21. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ 255
සඞ්ඛාරා සස්සතා නත්ථි නත්ථි බුද්ධානං ඉඤ්ජිතං.

මලවග්ගො අට්ඨාරසමො

---

## 19. ධම්මට්ඨවග්ගො

1. න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ 256
යො ච අත්ථං අනත්ථඤ්ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො.

2. අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ 257
ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨො'ති පවුච්චති.

3. න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති 258
ඛෙමී අවෙරී අභයො පණ්ඩිතො'ති පවුච්චති.

4. න තාවතා ධම්මධරො යාවතා බහු භාසති 259
යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති
ස වෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජති

5. න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො 260
පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණො'ති වුච්චති.

---

4. න තාවතා ධර්මධරො යාවතා බහු භාෂතෙ
යස්ත්වල්පමපි ශ්‍රුත්වා ධර්මකායෙන වෛ ස්පෘශෙත්
ස වෛ ධර්මධරො භවති යො ධර්මෙ න ප්‍රමාද්‍යතෙ. (උදානවර්ග 4. 5. 21)
න තවත ධමධරො යවත බහො හශති
යො තු අප බි ශුණිත ධමු කඑන ඵශති
ස හො ධමධරො හොති යො ධමු න ප්‍රමජති (ප්‍රා. ධ. A 3. 10)

5. න තෙන වෘද්ධො භවති යෙනාස්‍ය පලිතං ශිරඃ
යො වෛ යුවා'ප්‍යධීයානස්තං දෙවාඃ ස්ථවිරං විදුඃ (මනුස්මෘති. 2. 158

20. අහසෙහි පිය සටහනෙක් නැත. බාහිර ශාසනයෙක මාර්ගඵ- 254
ඵලස්ථ මහණෙක් නැත. නිත්‍ය ව පවත්නා සංස්කාර කෙනෙක් නැත
(සත්ත්වලෝක සංඛ්‍යාත) ප්‍රජාව (තෘෂ්ණා මාන දෘෂ්ටි සංඛ්‍යාත) ප්‍රපංච-
යෙහි ඇලුනේ ය. තථාගතවරු ප්‍රපංච රහිතයෝ ය.

21. අහසෙහි පිය සටහනෙක් නැත. සස්නෙන් බැහැර මහණෙක් 255
නැත. නිත්‍ය ව පවත්නා සංස්කාර කෙනෙක් නැත. බුදුවරුන්ගේ
(තෘෂ්ණා මාන දෘෂ්ටිප්‍රපංචයන් අතුරෙහි යම් ඉංජිතයක් නිසා සංස්කාරයෝ
ශාශ්වත හ යි ගණිද්ද එසේ වූ) එක ද ඉංජිතයෙක් නැත.

**අමොලොස් වන මලවර්ගය යි.**

---

# 19. ධර්මස්ථවර්ගය.

1. යම් කරුණෙකින් විනිශ්චය කටයුතු වූ අර්ථය (විනිශ්චය කොට 256
දත යුතු ජයපරාජය) (ඡන්දාගති ආදියෙහි පිහිටා) සාහසයෙන් (බොරු
කීමෙන්) දිනුම පැරදුමට පමුණුවා ද, එයින් විනිශ්චය ධර්මයෙහි පිහිටියේ
නම් නො වෙයි. නුවණැති යමෙක් විනිශ්චය කටයුතු වූ භූත වූ කාරණය ද
අභූත වූ කාරණය ද යන දෙක නිශ්චය කෙරේ ද (නියම කොට කියා ද),

2. අසාහසයෙන් (නිබොරු තෙපුලෙන්), විනිශ්චය ධර්මයෙන්, 257
අනුන් ජයපරාජයට පමුණුවා ද, විනිශ්චය ධර්මය විසින් රක්නා ලද
නුවණැති පුරුෂ තෙම ධර්මස්ථ යැ යි (විනිශ්චය ධර්මයෙහි පිහිටියේ
යැ යි) කියනු ලැබේ.

3. යම් පමණ කාරණයෙකින් සඟ මැද ආදියෙහි (අභ්‍යාකාංක්‍ෂත 258
පරවම්භන වශයෙන්) බොහෝ කොට බෙණේ ද, එපමණ කාරණයෙකින්
ධර්මධර නම් නො වෙයි. යමෙක් වනාහි තෙමේ ක්‍ෂෙමී වේ ද,
(පංචදුශ්චරිත වෛරයන් නැති හෙයින්) වෛර නැත්තේ ද, (පංච
වෛරයන් කෙරෙන්) භය නැත්තේ ද (නොහොත් අනුන් නො බිවා ද)
හෙතෙම පණ්ඩිත යැ යි කියනු ලැබේ.

4. (බණ හැදෑරීම් ආදී) යම් පමණ කාරණයෙකින් බොහෝ කොට 259
බෙණේ ද, එ පමණෙකින් ධර්මධර නම් නො වෙයි. යමෙක් වනාහි මඳ
දෑයකුදු අසා (ධර්මය දැන, අර්ථය දැන, ධර්මානුධර්මයට පැමිණ) නාම කයින්
(දුක් ආදීන් පිරිසිඳ දත්තේ) සිව් සස්දහම් දක්නේ ද, යමෙක්
වඩනා ලද වැර ඇති ව (අද අද ම රහත්පල ගණිමි යි) ප්‍රතිවෙධය
කැමැති වෙමින් වෙසේ ද, ඒ මහණ තෙම ඒකාන්තයෙන් ධර්මධර නම්
වෙයි.

5. යම් වයෝවෘද්ධ කාරණයෙකින් ඔහුගේ හිස පලිත වේ ද 260
(හිස නර ව යේ ද) (ඒ නර නැගි) කරුණින් හේ ස්ථවිර නම් නො වෙයි.
ඔහුගේ වයස මුහුකළ බවට පැමිණියේ වෙයි. හේ (ඇතුළත ශීලාදී
ස්ථවිර කරණ ධර්ම නැති හෙයින්) හුවජ ජිණ්ණ යැ යි කියනු ලැබේ.

6. යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සංයමො දමො 261
ස වෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති.

7. න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා 262
සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො.

8. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං 263
ස වන්තදොසො මෙධාවී සාධුරූපො'ති වුච්චති.

9. න මුණ්ඩකෙන සමණො අබ්බතො අලිකං භණං 264
ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති.

10. යො ච සමෙති පාපානි අණුංථූලානි සබ්බසො 265
සමිතත්තා හි පාපානං සමණො'ති පවුච්චති.

11. න තෙන භික්ඛු හොති යාවතා භික්ඛතෙ පරෙ 266
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා.

12. යො'ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්වා බ්‍රහ්මචරියවා 267
සඞ්ඛාය ලොකෙ චරති ස වෙ භික්ඛූ'ති වුච්චති.

13. න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු 268
යො ච තුලං'ව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

---

1. භික්ෂුර්න තාවතා භවති යාවතා භික්ෂතෙ පරාන්
විෂමාන් ධර්මාන් සමාදාය භික්ෂුර්භවති න තාවතා. (මහාවස්තු. 3 පිට 423)
න භිඛු තාවත හොති යවත භිජති පර
විශපධර්ම් සමාදාය භිඛු හොති න තවත. (ප්‍රා. ධ. B. 26 )

2. යස්තු කාමාංශච පාපං ච ඛීකාසෘත්වා බ්‍රහ්මචර්යවාන්
නිඃශ්‍රේණීභූතො සුප්‍රශාන්ත ස වෛ භික්ෂුරිති උච්‍යතෙ (මහාවස්තු 3. පිට 423)
යො තු බහෙති පවන වත ච බ්‍රමචියව.
සඞ්ඛ චරති ලොකු සො තු භිඛු තු වුචති. (ප්‍රා ධ B. 27)

6\. යම් පුගුලක්හු කෙරෙහි වනාහි (සොළොස් අයුරින් පිළිවිදුනා 261
ලද) සත්‍යය ද (ප්‍රඥයෙන් පිළිවිදුනා ලද) නව ලොවුතුරු දහම් ද,
අහිංසාව ද (හෙවත් මෛත්‍රී කරුණා මුදිතා උපේක්‍ෂා ද), කායවාක්
සංයමය ද (හෙවත් පාතිමොක්ඛ සීලය ද) යන මේ ගුණ ඇද්ද, (රහත්
මං නැණින්) වැමෑරූ රාගාදී මල ඇති, ධෘතිසම්පන්න වූ ඒ මහණ තෙම
(සත්හි ස්ථවිර භාවය කරණ මේ ගුණවලින් යුක්ත බැවින්) ස්ථවිර
යැ යි කියනු ලැබේ.

7\. (ජිත්‍යාස්වර භින්නස්වර ගද්ගදස්වර කාකස්වර නො ව ගම්භීර- 262
ස්වරතාදි වශයෙන්) ලක්‍ෂණ සම්පන්න තෙපුල් ඇති පමණෙකින් හෝ
ශරීර වර්ණය යහපත් බැවින් හෝ (පරලාභාදියෙහි) ඊර්ෂ්‍යා ඇති, (ආවාස-
මාත්සර්‍යාදි පස් වැදෑරුම්) මසුරු බැවින් යුත්, (කෛරාටික පක්‍ෂය
භජනය කිරීමෙන්) වංචක වූ මිනිස් තෙම සාධු වූ ස්වරූප ඇත්තේ
නො වෙයි.

8\. යමක්හු විසින් වනාහි මේ (ඊර්ෂ්‍යාදි) ද්වේෂජාතය මුලින් සිඳිනා 263
ලද ද, (අවිද්‍යාදි කෙලශමූලය හා සමග රහත්මගනැණින්) නසන ලද ද,
වැමෑරූ කෙලෙස් දොස් ඇති, (ධර්මෞජස් ප්‍රඥයෙන් යුක්ත වූ) ඒ පුද්ගල
තෙම සාධුස්වරූප ඇත්තේ යැ යි කියනු ලැබේ.

9\. ව්‍රතරහිත (ශීලව්‍රත ධුතාංගව්‍රත විරහිත වූ), බොරු කියන පුහුල් 264
තෙම හිස මුඩු පමණෙකින් ශ්‍රමණ නම් නො වෙයි. (අසම්ප්‍රාප්ත
අරමුණෙහි) ඉච්ඡායෙන් ද, (සම්ප්‍රාප්ත අරමුණෙහි) ගේධයෙන් ද සමන්විත
වූයේ කෙසේ නම් ශ්‍රමණ වේ ද, (හේ ශ්‍රමණ නම් නො වෙයි යේ යි.)

10\. යමෙක් වනාහි අණු වූ ද මහත් වූ ද, අකුසලයන් සර්වප්‍රකාර- 265
යෙන් (රහත්මග නැණින්) මුළු මනින් සංහිඳුවා ද, අකුසල් සංහිඳු වූ
බැවින් ශ්‍රමණ යැ යි කියනු ලැබේ.

11\. යම් පමණෙකින් අනුන් සිඟා ද (හෙවත් යම් කාරණයෙකින් 266
අනුන් ගේ දොර දොර සිට සිඟා ද) එ කරුණින් භික්‍ෂු නම් නො වෙයි.
විෂම වූ පාපධර්ම සමාදන් වැ (නො හොත් දුගඳ වහනය කරණ කාය-
කර්මාදිය සමාදන් ව) වසන්නේ ඒ (දොර දොර සිටැ සිඟන) පමණෙකින්
භික්‍ෂු නම් නො වේ.

12\. මෙ සස්නෙහි යම් මහණෙක් කුසල් ද අකුසල් ද යන දෙක ම 267
(මගබඹසරින්) දුරු කොට, මගබඹසර ඇත්තේ (ස්කන්ධාදි) ලෝකයෙහි
සර්ව ධර්මයන් නුවණින් සලකා හැසිරේ ද (හෙවත් මොහු ආධ්‍යාත්මික
ස්කන්ධයහ මොහු බාහ්‍යස්කන්ධයහ යි සියලු ධර්මයන් දන්න වෙසේ ද),
හෙ තෙම ඒකාන්තයෙන් (මගනුවණින් බුන් කෙලෙස් ඇති හෙයින්)
භික්‍ෂු යැ යි කියනු ලැබේ.

13\. මුස වූ (තුච්ඡ වූ) ස්වරූප ඇති අනුවණ පුහුල් තෙමේ මුවෙන් 268
නොබැණ හුන් පමණින් මුනි නම් නො වෙයි. නුවණැති යමෙක්
වනාහි ඉදින් තුලාවක් ගෙණ සිටි එකක්හු මෙන් (හෙවත් තරාදියක්
ගෙණ කිරන්නට සිටියක්හු මෙන්) ගත යුතු උතුම් දෑය ගෙණ වෙසේ ද,

14. පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි 269
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති.

15. න තෙන අරියො හොති යෙන පාණානි හිංසති 270
අහිංසා සබ්බපාණානං අරියො'ති පවුච්චති.

16. න සීලබ්බතමත්තෙන බාහුසච්චෙන වා පන 271
අථ වා සමාධිලාභෙන විවිච්ච සයනෙන වා.

17. ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසෙවිතං 272
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං.

**ධම්මට්ඨවග්ගො එකූනවීසතිමො.**

---

## 20. මග්ගවග්ගො

1. මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා 273
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා.

2. එසො'ව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා 274
එතං හි තුම්හෙ පටිපජ්ජථ මාරස්සෙතං පමොහනං.

3. එතං හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ 275
අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසත්ථනං.

---

6. න ශීලව්‍රතමාත්‍රෙණ බාහුශ්‍රුත්‍යෙන වා පුනඃ
අථ වා සමාධිලාභෙන ප්‍රාන්තශය්‍යාසනෙන ච
න ශිලවතමත්‍රෙන බහොසුතකෙ ච පනො
අධ සමධිලභෙන විවිතශයනෙන ච (ප්‍රා. ධ. B. 22)

7. ස්පෘශාමි නෛෂ්ක්‍රාම්‍යසුඛං අපෘථග්ජනසෙවිතම්
භික්ෂු විශ්වාසමාපාදෙ අප්‍රාප්‍ය ආශ්‍රවක්ෂයං. (උදානවර්ග)
ඵුසමු නෙඛමසුඛු අප්‍රුධජනසෙවි
භිඛු විශෙශම........අපතෙ අශව ඛයෙ (ප්‍රා. ධ. B. 25)

1. මග්ගන අඨංගිඔ ශෙඨො සචන චඋරි පද
විරකු ශෙඨො ධමන ද්‍රුපදන ච චකුම (ප්‍රා. ධ. A 4)

14. දුරලිය යුතු අකුසල් දුරලා ද, ඒ මුනි තෙමේ ඒ කරුණින් මුනි 269
නම් වේ. (ඒ එසේ ම ය.) යමෙක් (ආධ්‍යාත්මික සකන්ධ බාහ්‍ය සකන්ධ යැ යි කියන ලද) උභය ලෝකයන් (තරාදියට නඟා කිරන්නක්හු මෙන්) නුවණින් පිරිසිඳ දනී ද, එ කරුණින් හේ මුනි යැ යි කියනු ලැබේ.

15. යම් කරුණෙකින් ප්‍රාණීන් තසා ද (ප්‍රාණීනට හිංසා කෙරේ ද), 270
එ කරුණින් හේ ආර්‍ය නම් නො වෙයි. සියල් සත්නට (පාණිප්‍රහාරාදියෙන්) හිංසා නොකිරීම හේතු කොට ගෙණ (මෛත්‍රීභාවනාදියෙහි පිහිටි බැවින්, හිංසායෙන් දුරු වැ සිටි බැවින්) ආර්‍ය යැ යි කියනු ලැබේ.

16. සිවුපිරිසිදු සිල් පමණෙකින් හෝ තෙළෙස් ධුත ගුණ 271
පමණෙකින් හෝ, තැවැත බහුශ්‍රැතභාව (ත්‍රිපිටකධර භාව) මාත්‍රායෙකින් හෝ තොහොත් සවිතර්කසවිචාරසමාධි අවිතර්කවිචාරමාත්‍රසමාධි අවිතර්කඅවිචාරසමාධි යන ත්‍රිවිධ සමාධි ලාභයෙන් හෙවත් රූපාරූප අෂ්ටසමාපත්ති ලද පමණින්) හෝ විවික්තශයනායෙන් (හෙවත් ගණසඞ්ගණිකායෙන් වෙන් වැ කායවිවේකයෙන් යුක්ත ව විසීම් පමණෙකින්) හෝ (සුඛිත යෙමි සි නො සිතිය යුතු.)

17. මහණ, පුහුදුනන් විසින් නො සෙවුනා ලද නෙක්ඛම්ම සුඛය 272
(හෙවත් අනාගාමිඵල සුඛය) නාමකයින් ස්පර්ශ කෙරෙමි සි හෝ ආශ්‍රවක්‍ෂයයට (රහත් පලයට) නොපැමිණි තෝ භවයෙහි විශ්වාසයට නො පැමිණෙව.

**එකුන්විසි වන ධම්මට්ඨවග්ගය සි.**

---

## 20. මාර්ගවර්ගය

1. මාර්ග අතුරෙන් අෂ්ටාඞ්ගිකමාර්ගය (අෂ්ටමිථ්‍යාත්වයන් දුරු ලන 273
බැවිනුත් සිවුසස්හි දුක් පිරිසිඳීම් ආදිය කරණ බැවිනුත්) උතුම් ය. (වාක්සත්‍යය සම්මුතිසත්‍යය දෘෂ්ටිසත්‍යය පරමාර්ථසත්‍යය යන මේ) සත්‍ය අතුරෙන් දුඃඛසත්‍යාදි සත්‍යපද සතර (සත්‍යාර්ථයෙන්) උතුම්හ. (ප්‍රත්‍යයයෙන් උපන් නොඋපන්) සියලු ධර්ම අතුරෙන් විරාගධර්මය (හෙවත් නිවන) උතුම්. දෙ පා ඇති සියලු සතුන් අතුරෙහි පසැස් ඇත්තේ (බුදුරජ තෙම) උතුම්.

2. (මාර්ගඵල) දර්ශනයාගේ විශුද්ධිය පිණිස මෙය ම මඟ ය. අන් 274
මඟෙක් නැත. තෙපි මෙ මඟෙහි පිළිපදිවු. මේ අර් අටැඟි මඟ මරහු මුළා කරන්නේ ය. (කෙලෙස් මරසෙන් සහිත දෙව්පුත් මරහු වංචිත කරන්නේ ය.)

3. මේ අර් අටැඟි මඟෙහි පිළිපන් තෙපි සියලු සසර දුක 275
කෙළවර කරවු. රාගාදි ශල්‍යයන් මඩනා (තොහොත් රාගාදි උල් උදුරා ලන) (අනුශ්‍රව අනුමාන නැති වැ) ප්‍රත්‍යක්‍ෂයෙන් ම දන නිවනට පමුණුවන මේ මාර්ගය ඒකාන්තයෙන් මා විසින් කියන ලදී.

4\. තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා 276
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා.

5\. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති යදා පඤ්ඤාය පස්සති 277
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

6\. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති යදා පඤ්ඤාය පස්සති 278
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

7\. සබ්බෙ ධම්මා අනත්තා'ති යදා පඤ්ඤාය පස්සති 279
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා.

8\. උට්ඨානකාලම්හි අනුට්ඨහානො 280
යුවා බලී ආලසියං උපෙතො
සංසන්නසඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති.

9\. වාචානුරක්ඛී මනසා සුසංවුතො 281
කායෙන ච අකුසලං න කයිරා
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං.

10\. යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයො 282
එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති.

---

5\. සව් සඞර අනිච ති යද ප්‍රඥය පශති
තද නිව්නති දුඛ එෂො මගු විසොධි අ.

6\. සව් සඞර දුඛ ති යද ප්‍රඥඑ ශ්‍රධති
තද නිව්නති දුඛ එෂො මගො විසොධිඅ. (ප්‍රා. ධ. A [3] 1. 2.)

7\. සර්ව ධම අනත්ම ති යද පශති චක්‍ෂුම
තද නිව්නති දුඛ එෂො මගො විසොධි අ. (ප්‍රා. ධ. A [3]. 3)

8\. උත්ථාන කාලෙෂ්වනුත්ථිහානො යුවා බලී...... තො හිරාශඃ
සන්නෙව සංකල්පමනඃ කුසීදො ප්‍රඥාස්‍ය මාර්ගං සතතං න වෙත්ති. (උදානවර්ග අප්‍රමාද 5 21.)
උථනෙ අලස අනුථහතු යොඛු බලි අලසඑ උවිතො
සංසන සගප මනො සමතිම ප්‍රඥඑ මග අලසු න විනති. (ප්‍රා. ධ. A [9] 9)

4. මහණෙනි, දූන් තොප විසින් (කෙලෙස් තවන හෙයින් 276
ආතප්ප නම් වූ) සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය කට යුතු යි. සර්‍වඥවරයෝ
හුදෙක් නිවන් මඟ කියන්නාහු ම වෙති. (අත අල්ලා ගෙන නිවන්
පමුණුවන්නෝ නො වෙති.) මේ මඟ පිළිපන් (ආලම්බනොපනිධ්‍යාන
ලක්‍ෂණොපනිධ්‍යාන වශයෙන්) ධ්‍යායී වූ (හෙවත් ශමථ විදර්‍ශනා
භාවනායෙහි යෙදුනු) යොගාවචරයෝ මාරබන්ධනයෙන් (ත්‍රෛභූමක-
වෘත්තයෙන්) මිදෙන්නාහු ය.

5. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ යි යම් කලෙක විවසුන් 277
නුවණින් දක්නේ ද එ කල්හි මේ (ස්කන්ධපරිහරණය යැයි කියන ලද)
දුකෙහි (මුදුන් පත් වූව්‍යුත්ථානගාමිනීවිපස්සනා වශයෙන්) කළකිරෙන්නේ ය.
(එසේ කලකිරුණේ දුඃඛපරිඥතාදි විසින් සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය.
එ හෙයින්) මේ සංස්කාරයන් කෙරෙහි නිර්‍වේදය, නිර්මල වීමට
(නොහොත් නිවනට) මඟ ය.

6. සියලු සංස්කාරයෝ (උදයව්‍යයයෙන් පෙළෙන හෙයින්) 278
දුක්හ යි යම් කලෙක විවසුන් නුවණින් දකී ද, එකලැ මේ ස්කන්ධ-
පරිහරණයෙහි (දුකෙහි) කළකිරෙන්නේ ය. (එසේ කලකිරුණේ
සත්‍යයන් පිළිවිදුනේ ය.) මේ සංස්කාරයන් කෙරෙහි කළකිරීම, නිර්මල
බවට (නොහොත් නිවනට) මඟය (කාරණ ය).

7. සියලු පස් කඳහු (තමා වසයෙහි නොපවත්නා හෙයින්) 279
අනාත්මහ යි යම් කලෙක විවසුන් නුවණින් දක්නේ ද, එ කල්හි
මේ දුකෙහි (ස්කන්ධපරිහරණයෙහි) කළකිරෙන්නේ ය. (එසේ කළකි-
රුණේ සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය.) එහෙයින් මේ සංස්කාරයන්හි
කලකිරීම, නිර්මල බවට (නොහොත් නිවනට) මඟ ය.

8. වීර්‍ය්‍ය කරන්නට සුදුසු කල්හි වීර්‍ය්‍ය නොකරණ මහණ තෙම 280
ප්‍රථම යෞවනයෙහි සිටියේ ද, කායබලසම්පන්න වූයේ ද, ඉදින් ආලස්‍ය-
යෙන් යුක්ත වූයේ නම් (බඩ පුරා බත් වළඳා පියා කිසි ද මහණදමක්
නොකොට වැද හෝනේ ම වේ ද), (කාමවිතර්‍කාදී තුන් විතර්‍කයන්
විසින්) මොනොවට යට ගලන ලද සම්‍යක්සංකල්ප චිත්ත ඇති, කුසීත
වූ ඒ මහ මැලියා ප්‍රඥයෙන් දක්ක යුතු ආර්‍ය්‍යමාර්‍ගය නො ලබන්නේ ය.
(නොහොත් ලොවී ලොවුතුරු ප්‍රඥවට උපායක් නොලබන්නේ ය.)

9. යමෙක් (චතුර්විධ වාග්දුශ්චරිත දුරු ලීමෙන්) වචස රක්නා 281
සුලු වේ ද, ත්‍රිවිධ මනොදුශ්චරිත දුරු ලීමෙන් මනසින් මොනවට
හැවුරුනේ වේ ද, කයින්ුත් (ත්‍රිවිධ කායදුශ්චරිත සංඛ්‍යාත) අකුසල්
නො කරන්නේ ද, (කායදුශ්චරිතාදි) මේ තුන් කර්‍මපථ පිරිසිදු
කරන්නේ ද; ඒ (පුද්ගල තෙම බුද්ධාදි) ඍෂින් විසින් පිළිවිදුනා ලද
ආර්‍ය්‍යමාර්‍ගය සිද්ධ කරන්නේය (ආර්‍ය්‍යමාර්‍ගයට පැමිණෙන්නේ ය.)

10. (පෘථිවිකසිණාදී අටතිස් අරමුණෙහි යොනිසොමනස්කාරයෙහි) 282
යෙදීමෙන් ලොවුතුරු නුවණ ඒකාන්තයෙන් උපදී. ඒ භාවනාමන-
ස්කාරයෙහි නොයෙදීමෙන් (ලොවීලොවුතුරු) ප්‍රඥවගේ විනාශය වේ. වැඩ
පිණිස ද අවැඩ පිණිස ද පවත්නාවූ යොගය ද අයොගය ද යන මේ දෙමඟ
දැන, සම්සේ ප්‍රඥව වැඩේ නම්; එ සේ තමා (යොනිසොමනස්කාරයෙහි)
පිහිටුවන්නේ ය.

11. වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං 283
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බනා හොථ භික්ඛවො.

12. යාවං වනථො න ඡිජ්ජති අනුමත්තො'පි නරස්ස නාරිසු 284
පටිබද්ධමනො'ව තාව සො වච්ඡො ඛීරපකො'ව මාතරි.

13. උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං'ව පාණිනා 285
සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බාණං සුගතෙන දෙසිතං.

14. ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්ත ගිම්හිසු 286
ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣති.

15. තං පුත්තපසුසම්මත්තං ව්‍යාසත්තමනසං නරං 287
සුත්තං ගාමං මහොඝො'ව මච්චු ආදාය ගච්ඡති.

16. න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා 288
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා.

17. එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො 289
නිබ්බාණගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ.

**මග්ගවග්ගො වීසතිමො.**

---

# 21. පකිණ්ණකවග්ගො.

1. මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං 290
චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං.

2. පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති 291
වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති.

---

14. ඉහ වර්ෂං කරිෂ්‍යාමි හෙමන්තං ග්‍රීෂ්මමෙව ච
බාලො විචින්තයතීති හ්‍යන්තරායං න පශ්‍යති (අනිත්‍යවර්ග 5. 38)

15. තං පුත්‍රපශුසම්පන්නං ව්‍යාසක්තමනසං නරම්
සුප්තං ව්‍යාඝ්‍රො මෘගමිව මෘත්‍යුරාදාය ගච්ඡති (මහාභාරත. 12. 175)
තං පුත්‍රපශුසම්මත්තං ව්‍යාසක්තමානසං නරම්
සුප්තංග්‍රාමං මහෞඝ ඉව මෘත්‍යුරාදාය ගච්ඡති (උදානවර්ග 1. 5. 39)

1. මාත්‍රාසුඛ පරිත්‍යාගාද්‍යඃ පශ්‍යෙද්විපුලං සුඛම්
ත්‍යජෙන්මාත්‍රාසුඛං ධීරඃ සංපශ්‍යන් විපුලං සුඛම්. (උදානවර්ග-සුඛවර්ග 5. 30)

2. පර දුඃඛොපධානෙන යො ආත්මනො සුඛමිච්ඡති
වෛර සංසග්ග සංසට්ඨො සො දුඃඛ න පරිමුච්චති (ප්‍රා.ධ. Cvp. 42)

11. මහණෙනි, කෙලෙස් වනය සිඳිවූ. වැලි ද රුක් නො සිඳිවූ. 283
කෙලෙස් වනයෙන් බිය උපදී. (භවෝත්පත්තිය කරවන) මහ කෙලෙස්
වනය ද, (ප්‍රවෘත්තිවිපාකදායක) මඳ කෙලෙස් වනය ද රහත් මග නැණ
සැතින් සිඳ වනරහිතයෝ වවු.

12. ස්ත්‍රීන් කෙරෙහි පුරුෂයාගේ සවල්පමාත්‍ර වූ ද තෘෂ්ණාවෙක් 284
යම්තාක් කල් නො සිඳී පවත්නේ ද, ඒ තාක් ම හෙ තෙම මව කෙරෙහි
(ප්‍රෙමයෙන් ඇලුනු) කිරි බොන ලමා වස්සකු මෙන් ස්ත්‍රීන් කෙරෙහි
පිළිබඳ සිතැත්තේ ම වේ.

13. (වප් හිල් දෙ මස වූ) සරත් කල්හි කුමුදු මලක් අතින් ගෙණ 285
උදුරන්නකුහු මෙන්, තමාගේ තෘෂ්ණාව රහත්මගනැණින් මුලින් සිඳුව.
නිවන් පමුණුවන අටැඟි මඟ ම වඩව (නා සතන්හි උපදව). නිවන සුගත්
බුදුහු විසින් යම් හෙයකින් දෙසන ලද ද එ හෙයින් එයට පමුණුවන
අටැඟි මඟ ම උපදව.

14. "වැසි සාර මස (මේ මේ කටයුතු කෙරෙමින්) මෙහි ම වෙසෙන් 286
නෙමි. හිමින් සාර මස ද, ගිම්හන් සාරමස ද මෙහි ම වෙසෙන්නෙමි" යි මෙසේ
(දෙලෝ වැඩ නොදන්නා) අනුවණ තෙම නොයෙක් පරිදි සිතයි. අතුරෙහි
තමහට වන ජීවිතාන්තරාය නො දනී.

15. දරුවන් ද ගවමහිසාදීන් ද කරණ කොට (මා දරුවෝ රූ 287
ඇත්තෝ ය බලැත්තෝ ය, නැණැත්තෝ ය, හැම කටයුත්තෙහි දක්‍ෂයෝ
යැ යි මෙසේ දරුවන් නිසා ද, මගේ ගොන් බලවත් ය යන ආදීන්
ගෝමහිසාදීන් නිසා ද) ඉතා මත් වූ, (තොලප් දූ පැතිම් විසින් ද ලත්
දූයෙහි ගිජු වීම් විසින් ද පස්කම්හි) විශෙෂයෙන් ලග්න වූ සිත් ඇති ඒ
පුරුෂයා නිදන ගමක් (නිදි ගත් ගම් වැසි සමූහයක්) මුහුදට ඇද ගෙන
යන මහ වතුරක් මෙන් මරණය තෙම (අපාය මුහුදට) හැර ගෙන යයි.

16. මරහු විසින් මඩනා ලද සත්ත්වයාට ආරක්‍ෂා පිණිස දූ පුත්හු 288
නො වන්නාහ. පියා ද ආරක්‍ෂා පිණිස නො වන්නේ ය. වැලි (සෙසු
මල් බෑ බුහුන ආදී) නෑයෝ ද ආරක්‍ෂා පිණිස නො වන්නාහ.
නෑයන් කෙරෙහි ඔහුට පිහිට වන බවෙක් නැත්තේ ය.

17. මෙ කරුණ දැන, නුවණැත්තෝ ශීලයෙන් රක්‍ෂිත ගොපිත 289
වූයේ, නිවනට යන මඟ වහා ම පිරිසිදු කරන්නේ ය.

**විසි වන මාර්‍ගවර්‍ගය යි.**

---

## 20. ප්‍රකීර්‍ණක වර්‍ගය.

1. ඉදින් සවල්පමාත්‍ර සුවයක් හැරීමෙන් මහත් වූ සුවය (යම් 290
හෙයෙකින්) දක්නේ ද, එ හෙයින් මහත් වූ නිවන් සුව දක්නා
(කැමැති වූ) නුවණැත්තේ ඒ මඳ වූ සුවය හරනේ ය.

2. (අනුන් තළා පෙළා ගැති කොට ගෙණ) පරහට දුක් දීමෙන් 291
යමෙක් තමාට සුව කැමැති වේ නම්, හෙ තෙම (බිණුවාහුට පෙරළා
බිණීම ය, ගැසුවහුට පෙරළා ගැසීමය යන ආදීන් උනුනට කරණ ලද)
වෛර සංසර්‍ගයෙන් මිශ්‍ර වූයේ වෛරයෙන් නො මිදෙන්නේ ය. (වෛර
වශයෙන් සතතයෙන් දුකට පැමිණෙන්නේ යි යේ යි).

3. යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති 292
උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.

4. යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතා සති 293
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා.

5. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ 294
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො.

6. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ 295
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො.

7. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 296
යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති.

8. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 297
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති.

9. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 298
යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති.

10. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 299
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති.

11. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 300
යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො.

---

4. යෙෂාං තු සුසමාරබ්ධා නිත්‍යං කායගතා ස්මෘතිඃ
අකාර්‍යං තෙ න කුර්වන්ති කාර්‍යෙ සාතත්‍යකාරිණඃ
ස්මෘතානාං සම්ප්‍රජානානාමස්තං ගච්ඡන්ති ආශ්‍රවාඃ (උදානවර්ග 4. 19. 20.)

5. සුප්‍රඋබු ප්‍රඋජති ඉමි ගොතමශවක
යෙෂ දිවය රති ච නිච බුධකත සමති (ප්‍රා. ධ. A [4] 5)

8. සුප්‍රඋබු......නිච ධමකත සමති (ප්‍රා. ධ. A. [4] 5)

9 සුප්‍රඋබු ප්‍රඋඣති සද ගොතමශවක
යෙෂ දිව ය රති ච නිච සඝකත සමති (ප්‍රා. ධ. A [4]. 6)

10. සුප්‍රඋබු......නිච කයකත සමති (ප්‍රා. ධ. A. [4] 7)

11. සුප්‍රඋබු......අහිංසෘ රතො මනො (ප්‍රා. ධ. A [4] 8)

3. යමක් මහණුන් විසින් කටයුතු නම් එය (ඒ පාමොක් සිල් 292
රැකුම් ධුතාංග පිරීම් ආදිය) හැර පියත ලද්දේ ද, මහණුන් විසින් නො කටයුතු (සිරුර සැරසීම් ආදි) අකාය්‍ය්‍යය වනාහි කරණු ලැබේ ද, (හුවන ලද මාන තල ඇති, සමාහිවිප්‍රවාසයෙන්) ප්‍රමාදි වූ ඒ පුගුලන්ගේ කාමාදි ආස්‍රවයෝ වැඩෙත්නාහ.

4. යම් කෙනකුත් විසින් කායිගයාසි භාවනාව සතතයෙන් 293
මොනොවට වඩන ලද ද, මහණුන් විසින් කටයුතු (සිල් පිරුම් දුහඟ වැඩුම් භාවනායෙහි ඇලීම් යන) කාය්‍යයෙහි සතතකාරී වූ ඔහු (ශරීර-මණ්ඩන පරිෂකාර මණ්ඩනාදි) අකාය්‍යය නො සෙවිනාහ. සිහි ඇති, (චතුසම්පජඤ්ඤ වසයෙන්) සම්පජානකාරි වූ ඒ පුගුලන්ගේ ආස්‍රවයෝ පරික්‍ෂයයට (විනාශයට) යන්නාහ.

5. (තෘෂ්ණා නැමැති) මව ද, (අසම්මාන නැමැති) පියා ද, (ශාශ්වත- 194
දෘෂ්ටි උච්ඡෙදදෘෂ්ටි නැමැති) ක්‍ෂත්‍රිය රජුන් දෙ දෙනා ද (රහත්මඟ නැණ නැමැති) කඟින් වනසා, (නන්දිරාග නැමැති) අයකැමියා සහිත (ද්වාදශායතන නැමැති) රට ද වනසා, බාහිතපාප බ්‍රාහමණ තෙම (රහත් තෙම) නිදුක් වැ (නිවන් පුර) යන්නේ ය.

6. (තෘෂ්ණා නැමැති) මව ද (අසම්මාන නැමැති) පියා ද, 295
(ශාශ්වතොච්ඡෙදදෘෂ්ටි නැමැති) බමුණු රජුන් දෙදෙනා ද (රහත්මඟ නුවණ නැමැති කඟින්) නසා, (විචිකිච්ඡා නැමැති) ව්‍යාඝ්‍රසංචාර මාර්ගය පස්වනු කොටැති නීවරණ ද නසා, (ක්‍ෂීණාස්‍රව) බ්‍රාහමණ තෙමේ නිදුක් වූයේ නිවන්පුර යෙයි.

7. යම් කෙනකුන්හට දහවලුත් රෑත් නිතර බුදුගුණ ඇරබැ 296
උපදනා සිහිය ඇත්තේ ද, ඒ ගෞතම ශ්‍රාවකයෝ හැම කල්හි සුප්‍රබුද්ධ ව පුබුදින්නාහ. (බුදුගුණ සලකා ගෙණ යෙහෙන් නිදා යෙහෙන් පුබුදින්නාහ).

8. යම් කෙනකුන්හට දහවලුත් රෑත් නිතර (සපය්‍යාපනික නව 297
ලෝකෝත්තර) ධර්මය අරබයා උපදනා සිහිය ඇද්ද, ඒ ගොයුම්සව්වෝ හැම කල්හි සුප්‍රබුද්ධ ව පුබුදින්නාහ.

9. යම් කෙනකුන්හට දහවලුත් රෑත් සඟගුණ ඇරබැ උපන් 298
සිහිය ඇද්ද, ඒ ගොයුම්සව්වෝ හැම කල්හි සුප්‍රබුද්ධ ව පුබුදින්නාහ.

10 යම් කෙනකුන්හට දහවලුත් රෑත් නිතර (ද්වාත්‍රිංසාකාර 299
වශයෙන් හෝ නවසීවථිකා වශයෙන් හෝ චතුධාතුවවත්ථාන වශයෙන් හෝ අජ්ඣත්තික නීලකසිණාදී වශයෙන් හෝ) කය ඇරබැ උපදනා සිහිය ඇද්ද, ඒ ගොයුම් සව්වෝ හැම කල්හි සුප්‍රබුද්ධ ව පුබුදින්නාහ.

11. යම් කෙනකුන්ගේ සිත දහවලුත් රෑත් අහිංසාභාවනායෙහි 300
(කරුණා භාවනායෙහි) ඇලුනේ ද ඒ ගොයුම්සව්වෝ හැම කල්හි මනා පිබිදීමෙන් පුබුදිත්.

12. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා 301
යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො.

13. දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා 302
දුක්ඛො'සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ
තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා.

14. සද්ධො සීලෙන සම්පන්නො යසොභොගසමප්පිතො 303
යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො.

15. දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තො'ව පබ්බතො 304
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිං ඛිත්තා යථා සරා.

16. එකාසනං එකසෙය්‍යං එකො චරමතන්දිතො 305
එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියා.

**එකවීසතිමො පකිණ්ණකවග්ගො.**

---

## 22. නිරයවග්ගො.

1. අභූතවාදී නිරයං උපෙති යො වාපි කත්වා න කරොමීති චාහ 306
උභො'පි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ.

---

2. සුප්‍රටිබු ......භවනඉ රතො මනො (ප්‍රා. ධ. A [4] 8)

4. සද්ධු ශීලෙන සබනො යශ භොග සමපිතු
යෙන යෙනෙව වයති තෙන තෙනෙව පුයිත, (ප්‍රා. ධ. C. 25

12. යම් කෙනකුන්ගේ සිත දහවලුත් රාත් (මෙත්) බවුන්හි 301
ඇලුනේ ද, ඒ ගොයුම්සව්වෝ හැම කල්හි මනා ව පුබුදිත්.

13. (භොගසම්පතුත් බන්ධුජනයාත් හැර දමා) මෙ සස්නැ මහණ 302
වීම දුෂ්කාර ය. (උගහට ය.) පැවිදි වූවහු විසින් ද (පිඩු සිඟා දිවි පැවැත්-
වීම් ද සිල් රැක්මෙත් ධර්මානුධර්මප්‍රතිපත්තිය පිරීම් ද වශයෙන්) සස්නෙහි
සිත ඇලැවීම දුෂ්කර ය (උගහට ය). ගෘහයෝ හෙවත් ගෘහවාසයෝ
(ගිහිගෙහි වසන්නවුන් විසින් තමහට ඉසුරු ව සිටින්නවුනට කළ
මනා කාර්‍ය්‍ය ද පරිජනයාටත් මහණබමුණනට ත් කටයුතු සංග්‍රහ ද ඇති
බැවින්) දුක් හ. (උගහටයහ.) අසමාන අදහස් ඇත්තවුන් හා එක්
වැ විසීම ද දුක් ය (උගහට ය). සසර නැමැති අදත් මඟට පැමිණියේ
දුක විසින් ලුහුබඳනා ලදහ. එ බැවින් සසර අදත් මඟට පැමිණියෙක්
නො වන්නේ ය, සසර දුක විසින් ලුහුබඳනා ලද්දෙක් ද නො වන්නේ ය.

14. (තෙරුවන් ඇදහීම ලක්ෂණ කොට ඇත්තාවූ ද කම්පල 303
ඇදහීම ලක්ෂණ කොට ඇත්තාවූ ද) ලොවී ලොවුතුරු සැදැහැ ඇති, ගිහි
ශීලයෙන් යුත් (පිරිවර ද ධනධාන්‍ය ද සත් ආර්‍ය්‍ය ධන ද යන) විවිධ
යසසින් හා භොගසම්පතින් යුක්ත වූ කුලපුත්‍ර තෙම යම් යම් පෙදෙසක්
භජනය කෙරේ ද (යම් යම් පෙදෙසකට එළැඹේ ද) ඒ ඒ සියලු තන්හි දී
(දෙවිමිනිසුන් විසින්) මහත් ලාභසත්කාරයෙන් පුදනු ලදුයේ වන්නේ ය.

15. (උත්සන්න කුසල් මුල් ඇති, භාවිත භාවනා ඇති) සාධූහු 304
දුර සිටියාහු ද, හිමවත්පව්ව මෙන් බුදුනුවණට ප්‍රකට වෙති.
මෙහි (මෙ ලොව ම ගරු කොට සිතන) අඥාන පුද්ගලයෝ රෑ විදුනා
ලද ඊයක් මෙන් නො පැණෙත්.

16. (ගණසඞ්ගණිකායෙන් ද කෙලශ සඞ්ගණිකායෙන් තොර වැ) 305
හුදෙකලා ඉඳීම සෙව්නේ ය. (මාහැඟි යහන්හි නුමුදු සිහි එළවා මූලකර්ම-
ස්ථානයෙන් යෙදී හෝනා) ඒකශය්‍යාව සෙව්නේ ය. (පිඬු සිඟා ජීවත් වන
බැවින්) අකුසීත වැ (සිවු ඉරියවුහි ම) හුදෙකලා ව පවතිමින් හුදෙකලා
වැ තමා දමනය කරණ මහණ තෙම ගැඹුරු වෙනෙහි ම ඇලුනෙක්
වන්නේ ය. (හුදෙකලා වැ වැස මිස ආකීර්ණවිහාරී වැ තමා දමනය
කරන්නට නො පිළිවන් බැවිනි.)

**එක්විසිවන ප්‍රකීර්ණක වර්ගය යි.**

---

## 22. නිරයවර්ගය

1. (පරහට දෙස් නැගීම් වසයෙන්) බොරු කියන පුද්ගල තෙම 306
නිරයට යන්නේ ය. තව ද යමෙක් පව් කොට 'නො කෙළෙමි'යි
කියා නම්, හේ ද නිරයට යන්නේ ය. පහත් ක්‍රියා ඇති ඒ මිනිස්සු
දෙ දෙන ම මෙයින් මියැ ගොස් පරලොවැ දී (නරකොපපත්ති
හෙතුයෙන්) ගති වශයෙන් සම වන්නාහ.

2. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා 307
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ.

3. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො 308
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො.

4. චත්තාරි ඨානානි නරො පමත්තො 309
ආපජ්ජති පරදාරූපසෙවී
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං
නින්දං තතියං නිරයං චතුත්ථං.

5. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා 310
භීතස්ස භීතාය රතී ච ථොකිකා
රාජා ච දණ්ඩං ගරුකං පණෙති
තස්මා නරො පරදාරං න සෙවෙ.

6. කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති 311
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති.

7. යං කිඤ්චි සිථිලං කම්මං සංකිලිට්ඨං ච යං වතං 312
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං.

8 කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ 313
සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජං.

9. අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං 314
කතං ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති.

---

9. අකිත කුකිත ශෙහු - පජ තවති දුකිත.
කිත ඩු සුකිත ශෙහු - යකිච්ච නනුතපති. (ප්‍රා. ධ. C. 40)
අකෘතං කුකෘතාච්ඡ්‍රෙයඃ - පශ්චාත්තපති දුෂ්කෘතම්
ශොචතෙ දුෂ්කෘතං කෘත්වා - ශොචතෙ දුර්ගතිං ගතඃ
කෘතං තු සුකෘතං ශ්‍රෙයො - යත්කෘත්වා නානුතප්‍යතෙ.
නන්දතෙ සුකෘතං කෘත්වා - නන්දතෙ සුගතිං ගතඃ. (උදානවර්ග. 29. vv. 44)

2. කසාවතින් වෙළන ලද ග්‍රීවා ඇති (හෙවත් දසරුවෙහි ලූ 307
කසා කඩ ඇති) ලාමක ස්වභාවය ඇති (මහණ පිළිවෙතෙහි නොයෙදුනු)
කායවාක් සංයම රහිත පුද්ගලයෝ බොහෝ වූහ. ඒ පාප පුද්ගලයෝ
(තමන්ගේ) පව් කම්වලින් (මරණින් මතු) නිරයට යන්නාහ.

3. සිල් නැති, කාය වාක් සංයම නැති පුද්ගල තෙම (රට- 308
වැස්සන්) සැදැහැයෙන් දුන් අහර ('මමත් මහණෙකිමි' යි පිළිින කොට)
වළඳන්නේ ය යන යමක් ඇද්ද, එයට වඩා දිලියුණු ගිනිසුලක්
බඳු වූ යවට වළඳන ලද්දේ උතුම්.

4. පරඹුන් සෙවිනා සුළු, පමා වූ පුරුෂ තෙම පළමු වන 309
අකුසල ප්‍රතිලාභය ද, දෙවෙනි වූ නිකාමශයයාව (කැමැති සේ වැදෑ හීම)
නො ලැබීම ද, (හෙවත් මඳ නිදි ඇති බව ද), තෙවෙනි වූ මෙ ලොව
ලබන නින්දාව ද, සතර වනු නිරයෙහි ඉපැද්ම ද යන දුක් කරුණු
සතරට පැමිණෙයි.

5. ඔහුට අකුශලප්‍රතිලාභය ද, එයින් වන (නරකොපපත්ති- 310
සංඛ්‍යාත) ලාමක විපාක ගතිය ද වේ, බියපත්හුගේ බියපත් ස්ත්‍රිය
හා සංසර්ගයෙන් උපදනා කාමරතිය ද ස්වල්ප වේ. රජ ද ගරු වූ
දඬුවම් පණවයි. එහෙයින් පුරුෂ තෙම පරඹුවන් නො සෙවිනේ ය.

6. කිසි කර තණයෙක් වරදවා ගන්නා ලද්දේ (නො පිටට 311
අදනා ලද්දේ) එය ගත් අත ම යම් සේ සිඳී ද, එ පරිද්දෙන් ම
මහණදම ද (ඛණ්ඩසීලතාදි වශයෙන්) වරදවා ගන්නා ලද්දේ, නරකයට
ඔහු ඇද හෙළයි (නිරයෙහි උපදවයි).

7. (පසු බැස බැස) ලිහිල් කොට කරන ලද යම් කුශල කර්මයෙක් 312
ඇද්ද, (අගොචරයෙහි හැසිරීමෙන්) සකිලිටි වූ යම් ව්‍රතයෙක් (ශීලයෙක්)
වේ ද, (ලාභාපෙක්ෂායෙන් කළ) සකිලිටි වූ යම් (ධුතාංග) ව්‍රතයෙක් ඇද්ද,
(රැස් වන සඞ්ඝයා දුක මට දඬුවම් කරන්නට රැස් වූහ යි) සැකයෙන්
යුතු ව හැසිරීමට කරුණු වූ (හෝ අනුන් විසින් සැක කටයුතු වූ පැවතුම්
ඇති) යම් බ්‍රහ්මචර්යයෙක් ඇද්ද, ඒ සියල්ල (ප්‍රතිසන්ධිප්‍රවෘත්ති විපාක
වශයෙන්) මහත්ඵල ඇත්තේ නො වේ.

8. (එහෙයින්) ඉදින් කුශලයක් කරන්නේ නම් එය කරන්නේ ම ය. 313
ඒ කුශලකර්මය ද තර කොට ම (අවසපිත සමාදාන ඇතිව ම)
කරන්නේ ය. යම් හෙයකින් ඛණ්ඩාදිභාවයට පමුණුවන ලද ශ්‍රමණ-
ධර්මය වඩා ලා ම (බොහෝ කොට ම) රාගාදි රජස ඔහු සතන්හි
වත් කරන්නේ ද. එහෙයිනි.

9. දුෂ්කෘතය (අකුශලය) නො කරණ ලද්දේ ම උතුම්. අකුශල 314
කර්මය තෙම පසු ව සිහි කළ විටක් පාසා මෙ ලොවැ විපිළිසර
තැවිල්ලෙන් ද පර ලො වැ අපායතාපයෙන් ද තවන්නේ ය.
එ හෙයින් යමක් කොට පසු වැ නො තැවේ ද, එසේ වූ කුශල කර්මය
තෙම කරණ ලද්දේ උතුම්.

10. නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං 315
එවං ගොපෙථ අත්තානං ඛණො වො මා උපච්චගා
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.

11. අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ 316
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

12 අභයෙ භයදස්සිනො භයෙ චාභයදස්සිනො 317
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

13. අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො 318
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං.

14. වජ්ජං ච වජ්ජතො ඤත්වා අවජ්ජං ච අවජ්ජතො 319
සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතිං.

**නිරයවග්ගො ද්වාවීසතිමො.**

---

## 23. නාගවග්ගො

1. අහං නාගො'ව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං 320
අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො.

2. දන්තං නයන්ති සමිතිං දන්තං රාජා'භිරූහති 321
දන්තො සෙට්ඨො මනුස්සෙසු යො'තිවාක්‍යං තිතික්ඛති.

3. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා 322
කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං.

4. න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං 323
යථා'ත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.

---

1. අහං නාග ඉව සංග්‍රාමෙ චාපතඃ පතිතං ශරම්
අතිවාක්‍යං තිතික්ෂාමි දුඃශීලො හි මහාජනඃ (උදානවර්.)
අහො නාගො ව සඞ්ගමි චවදි චතිත ශර
අතිවක නි ......... දුඃශීලො හි බහො ජනො (ප්‍රා. ධ. C. 31)

10. ප්‍රත්‍යන්තයෙහි (හෙවත් රට කෙළවර පිහිටි) (ද්වාරප්‍රාකාරා- 315
දිය තර කිරීමෙන්) ඇතුළත හා සහිත කොට, (දොරටු අටලු පදනම්
අගල් ආදිය තර කිරීමෙන්) පිටත සහිත කොට (නොහොත්
ඇතුළතින් පිටතින්) සොරුන් නොවැද්ද හැකි සේ රක්නා ලද
නුවරෙක් යම් සේ ද, එ පරිද්දෙන් ම ආත්මය (හෙවත් සිත) රකිවු.
යම් හෙයකින් ක්‍ෂණසම්පත් ඉක්මියාහු නිරයෙහි පිහිටියෝ
(නිරයෙහි උපන්නෝ) ශෝක කෙරෙත් ද, එ හෙයින් (දුෂ්ට ක්‍ෂණයෙන්
මිදුනු) ක්‍ෂණසම්පත්තිය ඒකාන්තයෙන් තොප තහම්ක් ඉක්මේවා.

11. ලජ්ජා නො කටයුතු තන්හි යම් කෙනෙක් ලජ්ජා 316
කෙරෙත් ද, ලජ්ජා කටයුතු තන්හි ලජ්ජා නො කෙරෙද් ද, (ලජ්ජා නො
කළ මනා තැන ලජ්ජා කිරීම ය, ලජ්ජා කටයුතු තැන ලජ්ජා නො කිරීම ය
යන මේ) තුච්ඡ වූ විපරීත වූ දෘෂ්ටිය ගෙණ වසන අඥාන සත්ත්වයෝ
(සතර) අපායට යන්නාහ.

12. බිය නො දක්ක මනා තන්හි බිය දක්නා සුලු වූ, බිය දක්ක 317
මනා තන්හි නොබිය දක්නා සුලු වූ, (මෙසේ) විපරීත දෘෂ්ටි ගෙණ
වසන අඥාන සත්ත්වයෝ නරකාදි දුගතියට යන්නාහ.

13. නිරවද්‍ය ධර්මයන් පිළිබඳ වැ මෙය සාවද්‍ය යැ යි හටගත් බුද්ධි 318
ඇති, සාවද්‍ය ධර්මයෙහි නිරවද්‍ය යැ යි දක්නා සුලු වූ, මෙ බඳු විපරීත
ලබ්ධිය පිළිගෙණ හැසිරෙණ සත්ත්වයෝ දුගතියට පැමිණෙත්.

14. සාවද්‍ය ධර්මයන් සාවද්‍ය වශයෙන් ද නිරවද්‍යධර්මයන් නිරවද්‍ය 319
ධර්ම වශයෙන් ද තත් වූ පරිදි දැන අවිපරීත වූ ලබ්ධිය පිළිගෙණ
හැසිරෙන සත්ත්වයෝ සුගතියට පැමිණෙත්.

**දෙවිසිවන නිරයවර්ගය යි.**

---

## 23. නාගවර්ගය.

1. යම් හෙයකින් ලෞකික මහ ජන තෙම ශීලසංවරයෙන් 320
විනිර්මුක්ත ද එ හෙයින් දුන්නෙන් ගිලිහී තමන් වෙරා හුණු ශරප්‍රහාර-
යන් ඉවසන ඇතකු මෙන් මම් (මෙරමාගේ) රළු බස් ඉවසමි.

2. බොහෝ දෙනා රැස් වන තැනකට දැමුනු සතකු පමුණුවත්, 321
රජ ද දැමුනු ඇතකු හෝ අසකු පිට නගී. යමෙක් රළු බස් ඉවසා ද
හෙ තෙම සිවු අරියමගින් දාන්ත වූයේ මිනිසුන් අතුරෙහි උතුම් වෙයි.

3. අශ්වතරයෝ ද දැමුනාහු මැ උතුම් වෙත්. ආජානෙය නම් 322
අශ්වයෝ ද දැමුනාහු උතුම් වෙත්. සෛන්ධව අශ්වයෝ ද දැමුනාහු
මැ උතුම් වෙත්. ඇත්තු ද දැමුනාහු මැ උතුම් වෙත්. ඔවුන් හැම දෙනාට
වඩා තමා දමනය කරණ ලද්දේ උතුම් වෙයි.

4. මහණ තෙම (පූර්වභාගයෙහි ඉන්ද්‍රිය දමනයෙන්) දැමුනු, (අපර 323
භාගයෙහි අරිමග වැඩීමෙන්) මනා වැ දැමුනු සිතින් දාන්ත වූයේ,
සිහිනෙනුදු නොගිය විරූ (දාන්තභූමි වූ) නිවන දෙසට යම්සේ යේ ද,
එසේ මේ (ඇත් අස් ආදි) යානවලින් යා හැකි නො වන්නේ ය.

5. ධනපාලකො නාම කුඤ්ජරො කටුකප්පභෙදනො දුන්නිවාරයො 324
බද්ධො කබළං න භුඤ්ජති සුමරති නාගවනස්ස කුඤ්ජරො.

6. මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා සම්පරිවත්තසායී 325
මහාවරාහො'ව නිවාපපුට්ඨො පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

7. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං 326
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො.

8. අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ 327
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නො'ව කුඤ්ජරො.

9 සචෙ ලභෙථ නිපකං සහායං 328
සද්ධිං චරං සාධු විහාරි ධීරං
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

10. නො චෙ ලභෙථ නිපකං සහායං 329
සද්ධිං චරං සාධු විහාරි ධීරං
රාජා'ව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙ'ව නාගො.

11. එකස්ස චරිතං සෙය්‍යො 330
නත්ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙ'ව නාගො.

12 අත්ථම්හි ජාතම්හි සුඛා සහායා 331
තුට්ඨී සුඛා යා ඉතරීතරෙන
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං.

---

8. අප්‍රමාදරතා භවත සුශීලා භවත භික්ෂවඃ
සුසමාහිතසංකල්පාඃ ස්වචිත්තමනුරක්ෂත. (උදානවර්ග. අප්‍රමාද 5 36)
අප්‍රමදරත භොධ සධමි සුප්‍රවෙදිත
දුඛ උඩවරධ අත්මන පග සන ව කුඤරු. (ප්‍රා. ධ.)

9. ස චෙල්ලභෙත නිපකං සහායකං
සාර්ධං චරං සාධුවිහාරිධීරම්
අභිභූය සර්වාණි පරිස්‍රවාණි
චරෙත තෙනාත්තමනාඃ ප්‍රතිස්මෘතඃ (මූලසර්වාස්තිවාද විනය. කො. ව.)

10. නො චෙල්ලභෙත නිපකං සහායකං
සාර්ධංචරං සාධුවිහාරිධීරම්
රාජෙව රාෂ්ට්‍රං විපුලං ප්‍රහාය
එකශ්චරෙතන ච පාපානි කුර්‍යාත්. (මූලසර්වාස්තිවාද විනය කො. ව.)

11. එකස්‍ය චරිතං ශ්‍රෙයො න තු බාලෙ සහායතා.
අල්පොත්සුකශ්චරෙදෙකො මාතංගරණ්‍යනාගවත් (මූලසර්වාස්තිවාද විනය. කො ව)

5. ධනපාලක නම් (මාතෘපෝෂක) ඇත් තෙම දෙකන් සිලින් 324
වැගෙන තිව්‍ර වූ මද ඇත්තේ, කිසිවක්හු විසින් නොවැළැකිය හැකි වූයේ, (ඇත්හලට ගෙණවුත් විසිතුරු තිරයෙන්) පරික්‍ෂිප්ත කරණ ලදුයේ, (රජහු එළැවූ නොයෙක් රසවිලෙන් යුත්) රාජ භොජනය පවා (මාතෘ-වියොගයෙන් දුඃඛිත බැවින්) නො කන්නේ ය. ඒ ඇත් තෙම (මව වසන) නාගවනය ම සිහි කරන්නේ ය.

6. පුරුෂ තෙමේ යම් කලෙක මිද්ධබහුල (ථිනමිද්ධයෙන් මඩනා 325
ලදුයේ) වේ ද, (පමණ නොදන) බොහෝ කොට කන්නේ වේ ද, (කුඩු දඹුකඩ නියුඩු කැද ආදී) සූකරභක්තයෙන් පුෂ්ට ලද (ස්ථූල ශරීර ඇති) මහ ගම්හූරකු මෙන් (හුන් සිටි තැන) නිදන්නේ ම පෙරළී පෙරළී හෝනේ වේ ද, තිලකුණු මෙනෙහි කැරුමක් නැති ඒ අඥාන තෙම නැවැත නැවැත මව් කුසට එළැඹෙන්නේ ය (ගර්භවාසයෙන් නො මිදෙන්නේ ය).

7. මේ (අනවස්ථිත) සිත පෙර කැමැති අයුරින් කැමැති අරමුණෙහි 326
සුව සේ බොහෝ කල් හැරි සරු ඇවිද්දේ ය. එය අද මම් නුවණින් ගිලි හුනු මද ඇති ඇතකු නිගන්නා අකුසක් ගත් ඇතරුවක්හු සෙයින්, නිගන්නෙමි (වළකන්නෙමි).

8. නොපමාබව්හි ඇලුනෝ වවු. සිය සිත (නානා අරමුණෙන් 327
වළකා) රකිවු. ගැඹුරු මඩෙහි ගැලුනු ඇතු (වැයම් කොට එයින් නැගී ගොඩැ පිහිටියා) මෙන් තෙපි (යොනිසොමනසිකාරයෙන් යුක්ත ව වීර්‍ය්‍ය කොට) තමන් කෙලෙස් දුදලෙන් ගොඩැ නඟවු.

9. ප්‍රඥාව ඇති, තමා හා සමග වසන්නට නිසි, යහපත් වාස ඇති, 328
ධෘතිසම්පන්න, කල්‍යාණ මිත්‍රයකු ඉදින් ලද්දේ වී නම්, සියලු උපද්‍රව නාක් මැඩ, ඔහු හා සතුටු සිතැති වැ සිහි නුවණින් යෙදී වසන්නේ ය.

10. ප්‍රඥාව ඇති, තමා හා සමග වසන්නට නිසි, යහපත් වාස ඇති, 329
ධෘතිසම්පන්න, කල්‍යාණමිත්‍රයකු ඉදින් නො ලද්දේ වී නම්, දිනන ලද (අනව පත්) රට හැර පියා එකලා වැ වනයට වැද තවුස් පැවිද්ද ගත් මහාජනක රජු මෙන් ද, (ඇත්මුළු හැර පියා) රක්‍ෂිත වනයෙහි (හුදෙකලාවැ වසන) මාතඞ්ග ඇතු මෙන් ද, ගණයා හැර එකලා වැ වසන්නේය.

11. එකලාහුගේ වාසය උතුම්. (දෙලෝ වැඩ නොදක්නා) 330
අනුවණයා කෙරෙහි (ශිල ධූතාංග විදර්ශනා මාර්‍ගඵල ත්‍රිවිද්‍යා අභිඥා නිර්වාණ යන මේ) සහාය බව නැත. (ඔහු නිසා එය ලැබිය නො හැක්ක.) එ හෙයින් ගණයා හැර එකලා වැ වසන්නේ ය. මඳ වූ ද පව් නො ම කරන්නේ ය. ගණයා හැර වෙනෙහි වසන මාතඞ්ග (පාරිලෙය්‍යක) ඇතු මෙන් (ගණ පරිහරණයෙහි) නිරුත්සාහ වැ වසන්නේ ය.

12. කටයුත්තක් උපන් කල්හි (එය සපයන්නට සමත්) යහළුවෝ 331
සුවයහ. හීන වූ ද ප්‍රණීත වූ ද, මඳ වූ ද බොහෝ වූ ද, (තමා සතු පසයෙකින් උපදනා) යම් සතුටෙක් ඇද්ද, එය සුව ය. මරණය ළං වූ කල්හි මහත් කොට කළ පින සුව ය. සියලු සසර දුක දුරු ලීම (හෙවත් රහත්බව) සුව ය.

13. සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො පෙත්තෙය්‍යතා සුඛා 332
සුඛා සාමඤ්ඤතා ලොකෙ අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා.

14. සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා 333
සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛං.

**නාගවග්ගො තෙවීසතිමො**

---

## 24. තණ්හාවග්ගො

1. මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය 334
සො පලවති හුරාහුරං ඵලමිච්ඡං'ව වනස්මිං වානරො.

2. යං එසා සහතී ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා 335
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨං'ව බීරණං.

3. යො චෙ තං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං 336
සොකා තම්හා පපතන්ති උදබින්දු'ව පොක්ඛරා.

4 තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා 337
තණ්හාය මූලං ඛණථ උසීරත්ථො'ව බීරණං
මා වො නළං' ව සොතො'ව මාරො භඤ්ජි පුනප්පුනං.

5. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ 338
ඡින්නො'පි රුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං.

6. යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා 339
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා.

7. සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති 340
තඤ්ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ.

---

4. තා පු වදම් හද්‍රක්‍ෂු යවන්නෙත්‍ථ සමාගත
අප්‍රමිද රත හොධ සධම් සුප්‍රවෙදිනි. (ප්‍රා. ධ. A. ɪ. 7)

13. ලොවැ මවු කෙරෙහි මොනොවට පිළිපැදීම සුව ය. නැවැත 332
පියා කෙරෙහි මොනොවට පිළිපැදීම සුව ය. ලොවැ මහණුන් කෙරෙහි
මොනොවට පිළිපැදීම සුව ය. නැවැත (බුදු පසේබුදු රහත් යන) ක්ෂීණා-
ස්‍රව බ්‍රාහ්මණයන් කෙරෙහි මොනොවට පිළිපැදීම සුව ය.

14. සීලය (තරුණයනට ද වෘද්ධයනට ද එක සේ හොබනා බැවින්) 333
ජරා වයස දක්වා සුව ය. (ලොවී ලොවුතුරු) සැදැහැව නිසල වැ පිහිටියා
සුව ය. (ලොවී ලොවුතුරු) නුවණ ලැබීම සුව ය. පව් නොකිරීම සුව ය.

**තෙවිසිවන නාගවර්ගය යි.**

---

## 24. තෘෂ්ණාවර්ගය.

1. පමා වැ වසන පුරුෂයාට තෘෂ්ණාව (රුකට) මාලුවා වැලක් 334
මෙන් ඔහුගේ විනාශය පිණිස වැඩෙයි. ඒ තෘෂ්ණාවශග පුද්ගල
තෙම වනයෙහි පල කැමැති (වැ රුකින් රුකට පනන) වඳුරකු
මෙන් භවයෙන් භවයට දිවැ යන්නේ ය.

2. අරමුණෙහි ඇලෙන ලාමක වූ මේ තෘෂ්ණාව යමකු මැඩැ 335
පවතී ද, ඒ පුගුලාහට මහාවැස්සෙන් තෙමුනු හොට තණ (වැඩෙන්නා) සේ
ශොකයෝ වඩනාහු ය.

3. ලාමක වූ ඉක්මිය නොහැකි වූ මේ තෘෂ්ණාව යමෙක් වනාහි 336
මැඩ පවතී ද, ඔහු කෙරෙන් ශොකයෝ පොකුරුපතින් දියබිඳු සේ
ගිලිහෙන්නාහු ය. (පහ වන්නාහු ය).

4. යම් පමණ කෙනෙක් මෙහි රැස් වූහු ද, ඒ තොප හැම 337
දෙනාට වැඩෙක් වේ වා. ඒ කාරණයෙන් තොප හැම දෙනාහට මේ
අවවාදය කියමි. එ නම්: සුවඳහොටමුලින් ප්‍රයොජන ඇතියක්හු
මෙන් තෘෂ්ණාවගේ මුල (හෙවත් අවිද්‍යාව) කණිවු. ගංතෙර හටගත්
රණහුණ හෝ බටහුණ පඳුරක් කැණ ගෙණ යන වතුරක් මෙන්
(කෙලශ මෘත්‍යු දිව්‍යපුත්‍ර යන ත්‍රිවිධ වූ) මාර තෙම නැවැත නැවැත
තොප නගමක් බිඳී වා.

5. යම්සේ වෘක්ෂයක්හුගේ මූලය උපද්‍රවයකට නොපැමිණ 338
ස්ථිරභාවයට පත් කලැ ඒ වෘක්ෂය සිඳින ලද්දේ නමුදු යළිත් වැඩේ ද,
එසේ මැ තෘෂ්ණාවගේ අනුශය සිඳ නොපියන ලද කල මේ දුඃඛජාතය
නැවත නැවතත් උපදී.

6. යම් කිසිවකුහට සතිස් වැදෑරුම් තෘෂ්ණාශ්‍රොතසින් සමන්විත 339
වූ මනාප වූ රූපාදි අරමුණෙහි ස්‍රවණය වන්නාවූ තෘෂ්ණා තොමෝ
බලවත් වැ උපදී ද, අඥ වූ ඒ පුද්ගලයා රාගය ඇසුරැ කළාවූ විතර්කයෝ
බලවත් වූවාහු අපායට පමුණුවති.

7. තෘෂ්ණාප්‍රවාහයෝ හැම තන්හි පවත්නාහු වෙති. ලතා නම් 340
වූ තෘෂ්ණා තොමෝ සදොරෙහි ඉපද රූපාදි අරමුණෙහි පවතී. වනයෙහි
ජාත වූ ඒ තෘෂ්ණාලතාව දැක මාර්ගප්‍රඥාවෙන් මුලින් මැ සිඳ ලවු.

8. සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො 341
තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ ජාතිජරූපගා නරා.

9. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො’ව බාධිතො 342
සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය.

10. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො’ව බාධිතො 343
තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී විරාගමත්තනො.

11. යො නිබ්බනථො† වනාධිමුත්තො වනමුත්තො වනමෙව ධාවති 344
තං පුග්ගලමෙථ පස්සථ මුත්තො බන්ධනමෙව ධාවති.

12. න තං දළ්හං බන්ධනමාහු ධීරා 345
යදායසං දාරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙඛා.

13. එතං දළ්හං බන්ධනමාහු ධීරා 346
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛං පහාය.

14. යෙ රාගරත්තානුපතන්ති සොතං 347
සයං කතං මක්කටකො’ව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය.

15. මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ 348
සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි.

16. විතක්කපමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස සුභානුපස්සිනො 349
භිය්‍යො තණ්හා පවඩ්ඪති එස ඛො දළ්හං කරොති බන්ධනං.

---

12. න තද්දෘඪං බන්ධනමාහුර්ධීරා යදායසං දාරවං බල්බජං ච.
සංරක්තචිත්තා මණිකුණ්ඩලෙෂු පුත්‍රෙෂු දාරෙෂු ච යා අවෙක්ෂාඃ

13. එතද්දෘඪං බන්ධනමාහුර්ධීරාඃ සමං තතඃ සුසීරං දුෂ්ප්‍රමුංචම්
එතදපි ඡිත්වා පරිව්‍රජන්ති අනපෙක්ෂිණඃ කාමසුඛං ප්‍රහාය (උදානවර්ග කාම v v 5, 6)

12. න ත ද්‍රිඪ බඬන ධිර ය අස දරුව බබක ච
සරත චිත මනි කුනලෙෂු පුත්‍රෙෂු දරෙෂු ය ය අවෙඛ.

13. එත ද්‍රිඪ බඬන මහු ධිර ඔහරින සිහිල දුපමුඤ්ඣ
එත බි ඡිත්වන පරිව්‍රයන්ති අනවෙක්ඛිණො කාම සුඛු ප්‍රහඥ. (ප්‍රා. ධ. G VO 31, 32)

14. යෙ රඝරත අනුවතන්ති සොත
සඤ්ගත.........................
එත බි ඡෙත්වන පරිව්‍රයන්ති
අනවෙක්ඛිණො කාම සුහ ප්‍රහඥ (ප්‍රා. ධ. C VO 33
† පුග්ගලමෙව සී. මු.

15. මුංච පුරතො මුංච පශ්චතො මධ්‍යෙ මුංච භවස්‍ය පාරගඃ
සර්වත්‍ර විමුක්තමානසො න පුනර්ජාතිජරාමුපෙෂ්‍යසි. (උදානවර්ග 29. 66)
මුඤ්ජ පුරතු මුඤ්ජ පජතු මඣතු මුඤ්ජ භවස පරගො
සර්වත්‍ර විමුත්තමනසො න පුන ජතිජර උවෙහිසි (ප්‍රා. ධ. C VO 22)

8. රූපාදි අරමුණෙහි විසිර ගියාවූ තෘෂ්ණාස්නෙහයෙන් ගැල්වූන 341
සොම්නස්හු තෘෂ්ණාවශික සත්ත්වයාහට වෙති. ඒ පුද්ගලයෝ පස්කම්
සුව ඇසුරු කළාහු සැප සොයන සුල්ලෝ වෙති. එබඳු සත්ත්වයෝ
ජාතිජරාව්‍යාධිමරණයනට එකාන්තයෙන් පැමිණෙත් මැ යැ.

9. තෘෂ්ණාව විසින් පිරිවරන ලද්දවූ සත්ත්වයෝ බඳනා ලද සාවකු 342
මෙන් බිය වෙති. සංයෝජනසඞ්ගයෙන් බැඳුනාහු බොහෝ කල්
නැවත නැවතත් දුකට පැමිණෙති.

10. තෘෂ්ණාව විසින් පිරිවරණ ලද (හෙවත් වළඳනාලද) මේ සත්හු 243
(වැද්දා විසින්) බඳනා ලද සාවකු මෙන් බිය පත් වන්නාහ. එහෙයින්
රාගවිගමනය (නිවන) කැමති වන භික්ෂු තෙම තෘෂ්ණාව රහත්මඟ
නැණින් ප්‍රහීණ කරන්නේ ය.

11. යමෙක් තෘෂ්ණා රහිත වූයේ, තපොවනයෙහි (දිව්‍යවිහාරයෙහි) 344
ඇලුනේ, තෘෂ්ණාවනයෙන් (ගිහිබැම්මෙන්) මිදුනේ, නැවැත ගිහිබැම්මට
ම දිවේ ද, එවූ, ඒ පුද්ගලයා මෙසේ ව්‍යසනයට පැමිණියහු බලවු.

12. යකඩින් කරණ ලද්ද වූ ද දඬුයෙන් කරණ ලද්ද වූ ද 345
බුබුස් තණින් කරණ ලද්ද වූ ද යම් බන්ධනයෙක් වේ ද, ඒ සියල්ල ම
(කඩු ආදියෙන් සින්ද හැකි බැවින්) දැඩි බැඳුම් යැ යි පණ්ඩිතයෝ
නො කියති. මිණිකොඬොල්හි ඉතා ඇලුනාවූ යම් කෙනෙක් වෙත්
නම් (ඔවුන්ගේ ඒ රාගය ද,) දූදරුවන් කෙරෙහිත් අඹුවන් කෙරෙහිත්
යම් අපෙක්‍ෂාවෙක් (තෘෂ්ණාවෙක්) වේ ද,

13. මේ කෙලෙස් බැම්ම ප්‍රාඥයෝ (අපායෙහි ඇද හෙලන හෙයින්) 346
යට බලා යන්නා වූ, (බැඳි තැන සිවි ආදිය නො සිඳ ලේ නො සොල්ලා
බැඳි බව ද නො දන්වා හැම කර්මාන්ත ද කරණුවට අවසර දෙන
හෙයින්) ලිහිල් වූ, උනා හැරපියන්නට දුෂ්කර වූ දැඩි බැම්ම යැ යි
කියත්. (නුවණැත්තෝ) මෙය පවා (නුවණ කඟින්) සිඳ, (වස්තුකාම
කෙලශකාමයෙහි) අපේක්‍ෂා නැත්තෝ කම්සුව හැර පැවිදි වන්නාහ.

14 රාගයෙන් රත් වූ (ද්වෙෂයෙන් දුෂ්ට වූ මොහයෙන් මුළා වූ) 347
යම් සත්ත්ව කෙනෙක් තමන් විසින් කරණ ලද දැල අනුව පවත්නා
එහි ම වැද හෝනා මකුළුවා මෙන්, තමන් ම උපදවා ගත් තෘෂ්ණාස්‍රොත-
සෙහි ම වැටී හෙත් ද, ප්‍රාඥයෝ වනාහි මෙය ද සිඳ පියා විවිධ කාමයෙහි
නිරාලය ව සියලු දුක් දුරු ලා නිවන් පුර යන්නාහ.

15. අතීත පස්කඳ කෙරෙහි තෘෂ්ණාව හරු. අනාගත පස්කඳ 348
කෙරෙහි තෘෂ්ණාව ද හරු. වර්තමාන පස්කඳ කෙරෙහි තෘෂ්ණාව ද
හරු. මෙසේ තුන් භවයේ පර තෙරට ගිය හෝ හැම ප්‍රත්‍යයසමුත්පන්න-
ධර්ම කෙරෙන් මිදුනු සිත් ඇත්තෙහි, නැවැත ජාතියට ජරාවට නො පැමි-
ණෙන්නෙහි.

16 කාමවිතර්කාදි අකුශලවිතර්කයෙන් මැඩුනු, දැඩි කාමරාග ඇති, 349
අරමුණු ශුභ වශයෙන් බලන සුලු වූ සත්ත්වයාහට බොහෝ කොට ම
තෘෂ්ණාව වැඩේ. මේ පුද්ගල තෙම වනාහි තෘෂ්ණාබන්ධනය තර
කරන්නේ ය.

17. විතක්කූපසමෙ ච යො රතො අසුභං භාවයතී සදා සතො 350
එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙච්ඡති මාරබන්ධනං.

18. නිට්ඨංගතො අසන්තාසී වීතතණ්හො අනඞ්ගණො 351
අච්ඡින්දි භවසල්ලානි අන්තිමො'යං සමුස්සයො.

19. වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො 352
අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බපරානි ච
ස වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසො'ති වුච්චති.

20. සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි 353
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

21. සබ්බදානං ධම්මදානං ජිනාති 354
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති.

22. හනන්ති භොගා දුම්මෙධං නො වෙ පාරගවෙසිනො 355
භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙ'ව අත්තනං.

23. තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා 356
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං.

24. තිණදොසානි ඛෙත්තානි දොසදොසා අයං පජා 357
තස්මා හි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං.

---

20. සර්වාභිභූ සර්වවිදෙ'හමස්මි සර්වෙහි ධර්මෙහි අනොපලිප්තඃ
සර්වඥො'හං තෘෂ්ණාක්ෂයෙ විමුක්තො ස්වයං අභිඥාය කමුද්දිශෙයම්. (මහාවස්තු. 325)

17. යමෙක් අකුශලවිතර්කවූපශමයෙහි කියන ලද දශඅශුභා- 350
ලම්බනයෙහි උපන් ප්‍රථමධ්‍යානයෙහි ඇලුනේ වේ ද, හැම කල්හි ම සිහි ඇතියේ ඒ අශුභධ්‍යානය වඩා ද, මෙ තෙම වනාහි තෘෂ්ණාව ක්‍ෂය කරන්නේ ය. මෙ තෙම මාරබන්ධනය (හෙවත් ත්‍රෛභූමකවෘත්තය) සිඳ ලන්නේ ය.

18. යම් මහණෙක් නිෂ්ඨාවට (රහත්පලයට) පැමිණියේ වේ ද, 351
(රාගාදි සන්ත්‍රාස නැති හෙයිනුත් ජීවිතාශා ප්‍රහීණ කළ හෙයිනුත් සිංහාදීන් ගෙන් වන සන්ත්‍රාසයක් ද නැතියෙන්) නො තැති ගන්නා සුළු වේ ද, පහ වූ තෘෂ්ණා ඇත්තේ වේ ද, එහෙයින් ම රාගාදි අඞ්ගණ රහිත වේ ද (හෙවත් නිඃක්ලේශ වේ ද), භවගාමී සියලු ක්ලේශශල්‍යයන් උදුරා හැරැ පී ද, ඔහුගේ මේ අන්තිම ආත්මභාවය යි.

19. යම් මහණෙක් රහත්මගින් පහ කළ භවතෘෂ්ණා ඇත්තේ ද, 352
සකන්ධාදියෙහි ආත්ම ආත්මීය වශයෙන් ගැනුම් නැත්තේ ද, නිරුක්ති-පදයන්හි (හෙවත් සිවු පිළිසැඹියාහි) දක්‍ෂ ද, අක්‍ෂරසමූදයයන් පූර්වා-පරාක්‍ෂරයන් (යෙදෙන සැටි)ත් දන්නේ ද, කෙළවර අත්බව්හි සිටි හෙ තෙම එකාන්තයෙන් මහාප්‍රාඥයැ යි ද (සියලු කෙලෙසුන්ගෙන් මිදුනු හෙයින්) මහාපුරුෂයැ යි ද කියනු ලැබේ.

20. මම් සියලු (ත්‍රෛභූමක) ධර්මයන් මැඩැලූයෙම් වෙමි. සියලු 353
(චාතුර්භූමක) ධර්මයන් දන්නෙම් වෙමි. සියලු (ත්‍රෛභූමක) ධර්මයන්හි (තෘෂ්ණාදෘෂ්ටිලේපයෙන්) අනුපලිප්තයෙමි. (නො ඇලීනිමි.) සියලු (ත්‍රෛභූමක) ධර්ම පහ කොට සිටියෙමි. තෘෂ්ණාක්‍ෂයයෙහි (රහත් පෙලෙහි) (අශෛක්‍ෂ විමුක්තියෙන්) මිදුනෙමි. ඒ මම් (චතුස්සත්‍යයන්) තෙමේ ම ප්‍රත්‍යක්‍ෂ කොට දැන අන් කවරක්හු තම් සිය ගුරුහු කොට කියම් ද?

21. ධර්මදානය තෙම් සියලු ආමිස දානය පරදවයි (ධර්මදානය ම 354
උත්තම යි.) (බෝපැකි දහම් නව ලොවුතුරා දහම් නැමැති) ධර්ම රසය (ලොවැ ඇති ලවණාදි) සියලු රස පරදවයි. (ධර්මරසය ම උතුම්.) (දම් දෙසන්නහුට ද අසන්නහුට ද උපදනා ප්‍රීතිය වූ) ධර්මරතිය (දූ පුත් ආදීන් නිසා ඇති වන තාක්) සියලු රතිය (ප්‍රීතිය) පරදවයි (ධර්මරතිය ම උතුම්.) තෘෂ්ණාක්‍ෂයය (රහත්පලය) (සසරදුක් මැඩ ලන්නා බැවින්) සියලු දුක් පරදවයි.

22. (වස්ත්‍රාදි උපභෝග වස්තුහු ද දාසිදාසාදි පරිභෝග වස්තුහු ද 355
යන) සියලු භෝගයෝ අනුවණයා නසන්නාහ. නිවන් නැමැති පරතෙර සොයන සුළු නුවණැත්තවුන් නො නසන්නාහ. අඥාන පුද්ගල තෙමේ භොගයන්හි උපන් තෘෂ්ණාවෙන් (පච් කොට) අනුන් නසන්නක්හු මෙන් තමා නසන්නේ ය. (තමා අපායෙහි හෙළන්නේ ය).

23. කෙත්හු (මාරතු කුඩුමැටි ආදි) තණ දෙස් ඇත්තාහු ය. එසේ ම 356
මේ සත්ත්වප්‍රජාව ද රාගය දෙස් කොට ඇත්තේ ය. එ හෙයින් පහ වූ රාගය ඇතියන් කෙරෙහි (රහතුන් කෙරෙහි) දුන් දන මහත් පල වේ.

24. කෙත්හු තණ දෙස් ඇත්තෝ ය. මේ සත් කැල ද ද්වේෂ 357
සංඛ්‍යාත දෙෂය ඇත්තාහ. එ හෙයින් පහ වූ ද්වේෂය ඇතියන් (ක්‍ෂීණා-ස්‍රවයන්) කෙරෙහි දුන් දන මහත්පල වේ.

25. තිණදොසානි ඛෙත්තානි මොහදොසා අයං පජා 358
තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං.

26. තිණදොසානි ඛෙත්තානි ඉච්ඡාදොසා අයං පජා 359
තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං.

**තණ්හාවග්ගො චතුවීසතිමො.**

---

## 25. භික්ඛුවග්ගො.

1. චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො 360
ඝාණෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො.

2. කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො 361
මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති.

3. හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො 362
වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො
අජ්ඣත්තරතො සමාහිතො
එකො සන්තුසිතො තමාහු භික්ඛුං.

4. යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො 363
අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතං.

5. ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං 364
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති.

6. සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ 365
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති.

7. අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති 366
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවිං අතන්දිතං.

---

1. චක්ෂුෂා සංවරො සාධු සාධු ශ්‍රොත්‍රෙණ සංවරඃ
ඝාණෙන සංවරො සාධු මනසා සාධු සංවරඃ
සර්වත්‍ර සංවෘතො භික්ෂුඃ සර්වදුඃඛාත් ප්‍රමුච්‍යතෙ. (මහාවස්තු 3. පි. 423)

2 කඑන සඤමු සධු සධු වයඅ සඤමු.
මනෙන සඤමු සධු සධු සවත්‍ර සඤමු.
සවත්‍ර සඤදො භිඛු සව දුගතිඔ ජහි. (ප්‍රා. ධ. B. 9)

3. හතසඤදු පදසඤදු වයසඤදු සඤුතිද්‍රිඔ
අඣත්මරදො සමහිදො එකො සතුසිදො තමහු භිඛු (ප්‍රා. ධ. B. 10)

4. යො මුහෙන සඤදො භිඛු මනභණි අනුධදො
අර්ථධර්මු ච දෙසෙති මධුරු තස භසිත. (ප්‍රා. ධ B. 11)

5. ධර්මාරාමො ධර්මරතො ධර්මමනුවිචින්තයන්
ධර්මං සමනුස්මරන් භික්ෂුඃ සද්ධර්මාන්න පරිහායති. (මහාවස්තු. 3. පි 421)

6. සලභු නතිමඤෙය අ නඤෙෂ ස්පිහඔ සිඅ.
අඤෙෂ සද්ධර්මිහ භිඛු සමධි නධිගඡති. (ප්‍රා. ධ. B. 20)

25. ක්ෂේත්‍රයෝ (සාමාකාදී) තෘණයන් දෙස් කොට ඇත්තෝ 358
වෙත්. (ශෂ්‍යඵල සමෘද්ධ නො වෙයි). මේ සත්ත්වප්‍රජාව (තත්ත්වප්‍රතිච්ඡා-
දක) මොහය දෙස් කොට ඇත්තේ ය. එ හෙයින් මෝහය දුරලූ
අශෛක්ෂවරයන්හට දෙන ලද්ද මහත්ඵල වෙයි.

26. ක්ෂේත්‍රයෝ (සාමාකාදී) තෘණයන් දෙස් කොට ඇත්තෝ වෙත්. 359
(ශෂ්‍යඵල සමෘද්ධ නො වෙයි.) මේ සත්ත්වප්‍රජාව ඉච්ඡාව දෙෂ කොට
ඇත්තේ ය. එහෙයින් තෘෂ්ණාව දුරලූ අශෛක්ෂවරයන්හට දෙන ලද්ද
මහත්ඵල වෙයි.

**සූවිසි වන තෘෂ්ණාවර්ගය සි.**

---

## 25. භික්ෂුවර්ගය.

1. ඇසින් (චක්ෂුර්ද්වාරයෙන්) සංවරය යහපති. කණින් (ශ්‍රොත්‍ර- 360
ද්වාරයෙන්) සංවරය යහපති. නැහැයෙන් (ඝ්‍රාණද්වාරයෙන්) සංවරය
යහපති. දිවින් (ජිහ්වාද්වාරයෙන්) සංවරය යහපති.

2. කයින් (කායද්වාරයෙන්) සංවරය මැනැවි. වචසින් (වාග්ද්වාර- 361
යෙන්) සංවරය යහපති. සිතින් (මනොද්වාරයෙන්) සංවරය යහපති.
චක්ෂුරාදි වූ සදෙර රැකීම මැනැවි. චක්ෂුරාදි සදෙරෙහි ම සංවෘත වූ භික්ෂු
තෙම සියලු සසර දුකින් මිදෙයි.

3. (යමෙක්) අතින් සංයත ද, පයින් සංයත ද, වචනයෙන් සංයත ද, 362
කයින් සංයත ද, කමටහන් වැඩීමෙහි ඇලුනෝ ද, සමාධියෙන් යුක්ත ද,
එකලා ව හැසිරෙන්නෝ ද, තුටු සිතැත්තෝ ද, ඔහු භික්ෂුහු කොට
කියති.

4. මුඛසංයත වූ යම් මහණෙක් නුවණින් යෙදී බණන සුලු ද, 363
සන්හුන් සිතැත්තේ ද, අර්ථයත් පාළියත් සකසා දක්වා ද, ඔහුගේ
වචනය මිහිරි වෙයි.

5. (ශමථවිදර්ශනා) ධර්මය නිවාසස්ථාන කොට ඇති, ධර්මයෙහි ඇලුනු, 364
ධර්මය නැවත නැවත සිතන, ධර්මය නැවත නැවත සිහි කරන භික්ෂු තෙම
සද්ධර්මයෙන් නො පිරිහෙයි.

6. ස්වකීය ලාභයට (තමා ලත් දෑයට) අවමන් නො කරන්නේ ය. 365
මෙරමාගේ ප්‍රණීත වූ ලාභය පතමින් නො හැසිරෙන්නේ ය. අනුන්ගේ
ප්‍රත්‍යයලාභය කැමැති වන භික්ෂු තෙම සමාධියට නො පැමිණෙයි.

7. ප්‍රත්‍යයලාභී නො වූ ද මහණ තෙම ඉදින් (ගෙපිළිවෙළින් සිඟා 366
ලත්) තමාගේ ලාභය හෙලා නො දක්නේ ද, පිරිසිදු වූ ජීවිකා ඇති
(ජඞ්ඝාබල නිසා ජීවත් වන බැවින්) අකුසීත වූ ඒ මහණහට
එකාන්තයෙන් දෙවියෝ ද සතුති කෙරෙත්.

8. සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං 367
අසතා ච න සොචති ස වෙ භික්ඛූ'ති වුච්චති.

9. මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ 368
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

10. සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති 369
ඡෙත්වා රාගං ච දොසං ච තතො නිබ්බාණමෙහිසි.

11. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ 370
පඤ්චසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චති.

12. ඣාය භික්ඛු මා ච පාමදො 371
මා තෙ කාමගුණෙ භමස්සු චිත්තං
මා ලොහගුළං ගිලී පමත්තො
මා කන්දි දුක්ඛමිදන්ති ඩය්හමානො.

13. නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො 372
යම්හි ඣානං ච පඤ්ඤා ච ස වෙ නිබ්බාණසන්තිකෙ.

14. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො 373
අමානුසී රති හොති සම්මා ධම්මං විපස්සතො.

15. යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං 374
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං.

16. තත්‍රායමාදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො 375
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨී පාතිමොක්ඛෙ ච සංවරො.

---

8. සවසු නාමරුවස යස නාථි මමඉත
අසත ඉ න ශොයති සො හු භිඛු තු වුචති (ප්‍රා. ධ. B. 39)

9. මෛත්‍රීවිහාරී යො භික්ෂුඃ ප්‍රසන්නො බුද්ධශාසනෙ
අධිගච්ඡති පදං ශාන්තං අසෙචනං ච මොචනම්. (මහාවස්තු 3. 421)
මෙත්‍ර විහර යෙ භිඛු ප්‍රසනු බුධ ශස......
පඩිවිඣු පද ශත සඞ්ඛරවොශමු සුහ. (ප්‍රා. ධ. B. 29)

10 සිංච භික්ෂො ඉමාං නාවං සික්තා තෙ ලඝුමෙෂ්‍යති.
ඡිත්වා රාගං ච ද්වෙෂං ච තතො නිර්වාණමෙෂ්‍යසි (මහාවස්තු 3. 421)
සිඤ භිඛු ඉම නාම සිත ති ලහු මෙශිති
ඡෙත්ව රග ඤ දොෂ තතො නිවන එශිසි. (ප්‍රා. ධ. B. 35)

11. පඤ ඡිඳ පඤ ජහි පඤ උතරි භවඉ
පඤ සඞ්ගතිඟ භිඛු ඔඝතිණො'ති වුචති. (ප්‍රා. ධ. B. 37)

12. ඣඉ භිඛු ම යි ප්‍රමදි ම තෙ කමගුණ භමෙංසු චිතං
ම ලොහගුඩ ගිලි ප්‍රමත කන්ද දුඛමිද ති ඩජ්ඣමනො (ප්‍රා. ධ. B. 34)

13. නාථි ඣන අප්‍රඤස ප්‍රඤ නාථි අඣයතො
යස ඣන ච ප්‍රඤ ය සො හො නිර්වනස සති අ. (ප්‍රා. ධ. B. 16)

14. ශුඤගරෙ ප්‍රවිඨස ශතචිතස භිඛුනො
අමනුශ රති හොති සමෙ ධම විවශතු (ප්‍රා. ධ. B. 12)

15. යතො යතො සමශති ඛන්ධන උදයවය.
ලහති ප්‍රිති ප්‍රමොජ්ජ අමුදු ත විජනතු (ප්‍රා. ධ. B. 17)

16 තත්‍රඉ අදි භවති තධ ප්‍රඤස භිඛුනො
ඉද්‍රියගොති සතුඨි ප්‍රතිමුඛෙච... (ප්‍රා. ධ. B. 17)

8. යමකුහට නාමරූප දෙක්හි සව් ප්‍රකාරයෙන් ම මමායනයෙක් 367
(මම ය මගේ යැ යි ආත්ම ආත්මීය වශයෙන් ගැන්මෙක්) නැද්ද,
ඒ නාමරූප නැසී යෑම හේතු කොට ගෙණත් ශෝක නො කෙරේ ද,
ඒ ක්ෂීණාස්‍රව තෙම භින්නක්ලේශ බැවින් භික්ෂු යැ යි කියනු ලැබේ.

9. යම් මහණෙක් මෛත්‍රීවිහරණ ඇත්තේ ද, බුදුසස්නෙහි අචල 368
ශ්‍රද්ධා ඇත්තේ ද, එ බඳු මහණ තෙම සියලු සංස්කාරයන් සන්හිඳුවන
අත්‍යන්ත සුඛය වූ ශාන්තපදය (නිවණ) ලබන්නේ ය.

10. මහණ, මේ (අත්බව් නැමැති) නැව (එහි වූ මිථ්‍යාවිතර්ක 369
නැමැති ජලය ඉසීමෙන්) ඉස පිය. තා විසින් ඉස පියන ලද එය
වහා ම (සසර සයුරෙ නො ඇලී) නිවන්පුරට යන්නේ ය. රාග
බැම්ම ද ද්වේෂ බැම්ම ද සිඳ ඉක්බිත්තෙන් නිවණට පැමිණෙන්නෙහි ය.

11. (සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමරාග ව්‍යාපාද 370
යන) සංයෝජන පස (සෝවාන් ආදි යට තුන් මගින්) සිඳින්නේ ය.
(රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන) උද්ධම්භාගිය සංයෝජන
පස රහත් මගින් සිඳැ දුරු ලන්නේ ය. (උද්ධම්භාගිය සංයෝජනයන්
නසනු පිණිස) ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය පස අධික කොට වඩන්නේ ය. මෙසේ
කොට (රාග ද්වේෂ මෝහ මාන දෘෂ්ටි යන) සඞ්ග පස ඉක්මුනු මහණ
තෙම කාමෞඝාදි සතර මහ වතුරෙන් එතෙර වූයේ යැ යි කියනු ලැබේ.

12. මහණ, ධ්‍යාන වඩව. තුන් සුසිරිතෙහි පමා නො වව. 371
තාගේ සිත පස්කම් කොටස්හි නහමක් බමව. පමා වූයේ (පස්කම්හි
ගිජු වූයේ) නිරයෙහි ඉපිද ලොහොගුළ නො ගිල. නිරා ගින්නෙහි
දැවෙමින් මේ දුකැ යි නහමක් හඬ.

13. (ධ්‍යානොත්පාදක වීර්‍ය්‍ය සම්ප්‍රයුක්ත) ප්‍රඥව නැත්තහුට ධ්‍යාන- 372
යෙක් නැත. භාවනා නො කරන්නාට ප්‍රඥව නැත. යමක්හු කෙරෙහි
ධ්‍යානයත් ප්‍රඥවත් ඇද්ද, හෙ තෙම ඒකාන්තයෙන් නිවනට සමීප ව
සිටියේ ම වේ.

14. ශූන්‍යාගාරයකට (ජනවිවික්තස්ථානයකට) වන්, නිවුණු සිත් 373
ඇති, රූපාරූපධර්ම මොනවට අනිත්‍යාදී වශයෙන් වෙසෙසින් බලන
මහණහට අමානුෂික වූ (අෂ්ටසමාපත්ති සංඛ්‍යාත වූ) දිව්‍ය රතිය වේ.

15. යම් යම් කලෙක රූපාදි ස්කන්ධයන්ගේ උදය ව්‍යය දෙක 374
සම්මර්ශනය කෙරේ ද (නුවණින් සලකා ද), එකල්හි යම් ධර්මප්‍රීතියක්
ධර්මප්‍රාමෝද්‍යයක් ලබා ද, එය නුවණැත්තවුනට (අමා මහ නිවන් පමුණුවන
හෙයින්) අමා නම් වේ.

16. මේ සස්නෙහි 'නුවණැති මහණහට ඒ ස්කන්ධයන්ගේ උදය- 375
ව්‍යය දෙක සැලැකීමෙහි මෙ සිව් පිරිසිදු සිල් පූර්වස්ථානය (පූර්ව කාරණය)
වේ. හේ කවර හ? යත්: ඉන්ද්‍රිය සංවරය ද, සිව් පසයෙහි (යථාලාභ යථා-
බල යථාසාරුප්‍ය විසින් ත්‍රිවිධ වූ) සතුට ද, පාතිමොක්ඛයෙහි (ප්‍රධාන-
ශීලයෙහි පරිපූරකාරී බව ද යන මෙය යි.

17. මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ 376
පටිසන්ථාරවුත්‍යස්ස ආචාරකුසලො සියා
තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සසි.

18. වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති 377
එවං රාගං ච දොසං ච විප්පමුඤ්චෙථ භික්ඛවො.

19. සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො 378
වන්තලොකාමිසො භික්ඛු උපසන්තො'ති වුච්චති.

20. අත්තනා චොදයත්තානං පටිමාසෙ'ත්තමත්තනා 379
සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි.

21. අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති 380
තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රං'ව වාණිජො.

22. පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ 381
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං.

23. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ 382
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.

**භික්ඛුවග්ගො පඤ්චවීසතිමො.**

---

## 26. බ්‍රාහ්මණවග්ගො.

1. ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ 383
සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූ'සි බ්‍රාහ්මණ.

2. යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො 384
අථස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො.

---

17. මිත්‍ර භජෙඅ පඩිරූව සුධජීව අ...
පඩිසරවුති අස අප්‍රක්...
දතු අයරකුශලො සුහු භිඛු විහමිසි. (ප්‍රා. ධ. B. 18)

22. ප්‍රමොජබහුලු යො භිඛු අභිවුයු පරිප්‍රිය
අධිගජී පද ශත අසෙයන මොයක. (ප්‍රා. ධ. B. 51)
[අසෙයන = අසෙචනකං]
[මොයක = මොචකං]

1. ඡින්ධි ස්‍රොතඃ පරාක්‍රම්‍ය කාමාන් ප්‍රණුද බ්‍රාහ්මණ
නාප්‍රහාය මුනිඃ කාමාන් එකත්වමධිගච්ඡති. (උදානවර්ග 10. 1)

17. පිරිසිදු ආජීව ඇති, අකුසීත වූ, කලණ මිතුරන් සෙවිනේ ය. 376
පිළිසඳර පැවැතුම් (ධර්මාමිෂ දෙකින් සංග්‍රහ කරණ බව) ඇත්තෙක්
වන්නේ ය. (ශීලය ද වත්පිළිවෙත් කිරීම ද යන) ආචාරයෙහි දක්ෂ
වන්නේ ය. එයින් (එ පිළිසඳර පැවැතුම් ආචාරයෙහි දක්ෂ බව යන
දෙකින් උපන් ධර්මප්‍රාමොද්‍යයෙන්) ප්‍රීතිබහුල වූ තෝ සසර දුක් කෙළවර
කරන්නෙහි.

18. පර වැ මැලැවී ගියා වූ මල් වස්සිකා ලතාව (සමන් වැල්)(යම්සේ 377
තුවවූයෙන් මුදා හිමැ හෙළා පියා ද), එ පරිද්දෙන් ම මහණෙනි, රාගය ද
ද්වේෂය ද තොපගේ සන්තානයෙන් මුදා හැර පියවු.

19. ශාන්ත වූ කායද්වාර ඇති, ශාන්ත වූ වාග්ද්වාර ඇති, ශාන්ත වූ 378
මනොද්වාර ඇති, තුන්දොර මොනොවට පිහිටි, පහ කළ ලොකාමිෂය
(හෙවත් පස්කම්ගුණ) ඇති මහණ තෙම උපශාන්තයැ යි කියනු ලැබේ.

20. යුෂමත් තෙමේ තමාට චෝදනා කරව. තෝ ම තා පිරික්සා 379
කරව. මහණ, එසේ වූ තෝ තමා විසින් ම රක්නා ලද්දෙහි ස්මෘතිමත්
වූයෙහි (සිවු ඉරියවුහි ම) සුවයෙන් වසන්නෙහි.

21. යම් හෙයෙකින් තෙමේ තමාගේ පිහිට වේ ද, යම් හෙයෙකින් 380
තෙමේ ම තමාගේ පිළිසරණ වේ ද, එහෙයින් උතුම් අසසු (කවා
පොවා) රක්නා අස්වෙළෙඳක්හු මෙන්, (අකුසලුන් සිතැ වැද්දැ නො දී)
තමා මොනොවට රක්නේ ය

22. පියෙවියෙන් ම බුදුරජුන් කෙරෙහි සතුට බහුල වූ, බුදුසස්නෙහි 381
පහන් වූ මහණ තෙම එ හෙයින් ම එකාන්ත සුඛ වූ ශාන්තපදයට
(නිවනට) පැමිණෙන්නේ ය.

23. ළදරු වූ යම් මහණෙක් බුද්ධානුශාසනයෙහි (හෙවත් කමට- 382
හන්හි) යෙදේ ද, හෙ තෙම වලාපටලින් මිදුනු පුන්සඳුහු මෙන් මෙ ලොව
එකාන්තයෙන් නුවණ එළියෙන් බබුළුවන්නේ ය.

**පස්විසි වන භික්ෂුවර්ගය යි.**

## 26. බ්‍රාහ්මණ වර්ගය.

1. බමුණ, වීර්‍ය කොට තෘෂ්ණා දියපහර සිඳ පිය. (එය පිණිස) 383
වස්තුකාම ක්ලේශකාමයන් (සිතෙන්) පහ කරව. බමුණ, සංස්කාරයන්ගේ
විනාශය විවසුන් නුවණින් දැන, අකෘතඥ (නිවන් දන්නෝ) වෙහි ය.

2. බමුණු තෙම (හෙවත් රහත් තෙම) යම් කලෙක ශමථවිදර්ශනා 384
දහම් දෙක්හි පර තෙරට ගියේ වේ ද, එ කලැ චතුස්සත්‍යයන් මොනොවට
දන්නා ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණයාගේ සියලු සංයොගයෝ (කාමයොගාදීහු)
ක්ෂයයට පැමිණෙන්නාහ.

3\. යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති 385
වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

4\. ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං 386
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

5\. දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා 387
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො
අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා.

6\. බාහිතපාපො'ති බ්‍රාහ්මණො සමචරියා සමණො'ති වුච්චති 388
පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතො'ති වුච්චති.

7\. න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො 389
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධී යස්ස මුඤ්චති.

8\. න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො 390
යදා නිසෙධො මනසො පියෙහි
යතො යතො හිංසමනො නිවත්තති
තතො තතො සම්මතිමෙව දුක්ඛං.

9\. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං 391
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

10\. යම්හා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං. 392
සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තං'ව බ්‍රාහ්මණො

---

4\. ඣයි පරයසත බුධු කිතකිච අනසවු
බුධු දශබලු වෙතු තමහු බ්‍රොමි බ්‍රමණ. (ප්‍රා. ධ. B. 5)

5\. දිව තවති අදිචු රති අභඤු චද්‍රිමු
සනධු ක්‍ෂත්‍රිඔ තවති ඣඤු තවති බ්‍රමණො
අධ සර්ව අහොරත්‍රු බුධු තවති තෙයස. (ප්‍රා. ධ.)

3. යම් ආර්යශ්‍රාවකයක්හට එතෙර ද (හෙවත් ආධ්‍යාත්මික ෂඩායත- 385
නය ද) මෙතෙර ද (හෙවත් බාහිර ෂඩායතන ද) එතෙර මෙතෙර
දෙක ම ද නැත්තේ නම් (මම යැ යි මගේ යැ යි ගැන්මෙක් නැත්තේ
නම්) පහ වූ කෙලශපීඩා ඇති, සියලු කෙලෙසුන් ගෙන් වෙන් වූ ඒ
රහත්හු බ්‍රාහමණ නැමැ යි මම් කියමි.

4. ධ්‍යාන කරණ (ශමථ විදර්ශනා වඩන), රාගාදි රජස් නැති, හුදෙ- 386
කලා වැ හුන්, සිවු මඟින් කළ සොළොස් වැදෑරුම් කිස ඇති, අනාස්‍රව වූ,
උත්තමාර්ථයට (රහත් පලයට) පැමිණි ඒ රහත්හු බ්‍රාහමණයකු කොට
මම් කියමි.

5. හිරු දහවල්හි දිලිසෙයි. සඳු රැයෙහි දිලිසෙයි. රජ තෙම 387
අබරණින් සැරැහී සිවුරඟ සෙනඟින් පිරිවැරුණේ ම දිලිසෙයි.
(හොබනේයි). බමුණු තෙම (හෙවත් රහත් තෙම) සමවතට සමවන්නේ
දිලිසෙයි (හොබනේයි). නැවැත සියලු දිවා රෑ දෙක්හි සම්‍යක්සම්බුද්ධ තෙම
(චරණ ගුණ ඥාන පුණ්‍ය ධර්ම යැ යි පස්වැදෑරුම් වූ) තෙජසින් දිලිසෙයි.

6. යම් හෙයෙකින් සන්තානයෙන් බැහැර කරණ ලද පාප ධර්ම 388
ඇත්තේ නු යි බ්‍රාහමණ නැමැ යි කියනු ලැබේ ද, අකුසල් සන්හිඳුවා
වසන හෙයින් ශ්‍රමණ යැ යි කියනු ලැබේ ද, එසේ ම යම්හෙයෙකින්
තමාගේ රාගාදි මල (තදඞ්ගප්‍රහාණාදියෙන්) පහ කෙරේ ද, එ හෙයින්
ප්‍රව්‍රජිතයා යි කියනු ලැබේ.

7. බමුණු තෙමේ (රහත් තෙමේ) බමුණකුට (රහත්බමුණකුට හෝ 389
ජාති බමුණකුට) පහර නො දෙන්නේ ය. බමුණු තෙම (රහත් තෙම)
තමාට පහර දුන් පුද්ගලයාට කොප නො කරන්නේ ය. බමුණහුට
පහර දෙන්නහුට නින්‍දා වේ වා. යමෙක් තමාට පහර දුන්නහුට කොප
කෙරේ නම් ඒ පහර දුන්නහුට වඩා ඔහුට නින්‍දා වේ වා.

8. (පහර දුන්නහුට පෙරළා පහර නොදීමය, පරොස් බසින් බිණූ- 390
වහුට පෙරළා නොබිණීමය යන) මෙය රහත් බමුණුහට ස්වල්පමාත්‍ර වූ ද
ශ්‍රෙයසෙක් නො වේ. යම් කාලෙක්හි ක්‍රෝධී පුද්ගලයාගේ මනසට
ප්‍රිය වූ ක්‍රෝධචිත්තොත්පාදය කෙරෙන් යම් වැළැක්මෙක් වේ ද,
මේ ක්‍රෝධනිග්‍රහය ක්ෂීණාස්‍රව බ්‍රාහමණයානට ස්වල්පමාත්‍ර වූ ශ්‍රෙයසෙක්
නො වේ (මහත් වූ ම ශ්‍රෙයසෙකි). යම් යම් කරුණෙකින් ක්‍රෝධ සිත
නවතී ද, ඒ ඒ කරුණින් සසර දුක සන්හිඳේ ම ය.

9. යම් පුගුලකුගේ කයින් ද වචසින් ද මනසින් ද සිදු වන අකුශල 391
කර්මයෙක් නැද්ද, මේ තුන් තැනින් (මේ තුන් දෙරින් වදනා අකුසලුන්
ගේ වැළැක්ම පිණිස) වැසුනු දොර ඇති ඒ ක්ෂීණාස්‍රවයා බමුණකු කොට
මම් කියමි.

10. යමක්හු කෙරෙන් සම්‍යක්සම්බුද්ධයන් විසින් දෙසන ලද්ද වූ 392
පර්යාප්ති ධර්මය යමෙක් දන්නේ වී නම්, ඒ ආචාර්යයා අග්නිහෝත්‍රයට
පූජා කරණ බමුණකු මෙන් සකසා නමදින්නේ ය.

11. න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති බ්‍රාහ්මණො 393
යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො’ච බ්‍රාහ්මණො.

12. කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා 394
අබ්භන්තරං තෙ ගහණං බාහිරං පරිමජ්ජසි.

13. පංසුකූලධරං ජන්තුං කිසං ධමනිසන්ථතං 395
එකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

14. න චාහං බ්‍රාහ්මණං බ්‍රූමි යොනිජං මත්තිසම්භවං 396
භොවාදී නාම සො හොති සචෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

15. සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති 397
සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

16. ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දාමං සහනුක්කමං 398
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

17. අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති 399
ඛන්තිබලං බලානීකං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

18. අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං 400
දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

19. වාරි පොක්ඛරපත්තෙ’ව ආරග්ගෙරිව සාසපො 401
යො න ලිප්පති කාමෙසු තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

20. යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො 402
පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

11. බඳනා ලද ජටාවන් කරණ කොට ගෙණ බ්‍රාහමණ නම් 393
නො වෙයි. ගෝත්‍ර කරණ කොට ගෙණ ද බ්‍රාහමණ නම් නො වෙයි.
ජාතිය කරණ කොට ගෙණ ද බ්‍රාහමණ නම් නො වෙයි. යමකු
කෙරෙහි සත්‍යඥනය ද, නවලොවුතුරු දහම් ද ඇත්තේ නම්, පිරිසිදු
තැනැත්තේ හේ ම ය, බ්‍රාහමණ නමැත්තේත් හේ ම ය.

12. අනුවණය, තගේ ජටායෙන් කවර වැඩෙක් ද? තගේ තෙල 394
අඳුන් දිවිසමින් කවර වැඩෙක් ද? තගේ ඇතුළත කෙලෙසුන්ගෙන්
ගහණය. එතෙකුදු වුවත් (ඇතුළත නො ව) පිටත ම සිලුටු කරන්නෙහි ය.

13. පවුල් සිවුරු දරණ, කෘශ සිරුරු ඇති, නහර ඉල්පුනු කය 395
ඇති, ගැඹුරු වෙනෙහි හුදෙකලා වැ භාවනා කරන ඒ පුගුලහු බ්‍රාහමණ
යැ යි මම් කියමි.

14. මවගේ යොනි මගින් උපන්, බැමිණියක කුසැ උපන්නාහට 396
එ පමණෙකින් බ්‍රාහමණ යැ යි මම් නො කියමි. ඉදින් යමෙක්
කෙලශපරිබොධ ඇත්තේ වී නම්, හේ (දුටු දුටුවන්ට 'භො භො'යි
කියා ඇවිදිනා හෙයින්) භොවාදී නම් වෙයි (බ්‍රාහමණ නම් නො වෙයි).
කෙලශපරිබොධ නැති තෘෂණාදෘෂටි වශයෙන් කිසිත් නොගන්නා
තැනැත්තහු බ්‍රාහමණ නමැ යි මම් කියමි.

15. සියලු සංයෝජන සිඳැ සිටි හෙයින් යම් රහත් පුගුලෙක් 397
එකාන්තයෙන් (ජීවිතාශා නැති හෙයින්) තො තැති ගණී ද, රාගසඞගාදි
සත් සඞගයන් ඉක්මුණු, කෙලෙසුන්ගෙන් වියුක්ත ඒ රහත් පුද්ගලයා
බ්‍රාහමණ යැ යි මම් කියමි.

16. (ක්‍රොධ සඞඛ්‍යාත) හදඩිය හෙවත් දළ වර ද, තෘෂණා නැමැති 398
වරපට ද, අනුශයානුක්‍රම සහිත වූ (ද්වාෂෂට්දෘෂටි නැමැති) මහ දම ද, (ඒ ඒ
මාර්ගයෙන්) සිඳලා, උදුරු දැමූ (අවිද්‍යා නැමැති) අගුල ඇති සිවුසත්
අවබොධ කළ ඒ ක්ෂීණාස්‍රවයා බ්‍රාහමණ නමැ යි මම කියමි.

17. යම් පුද්ගලයෙක් තෙම ආක්‍රොශය ද (පාණිප්‍රහාරාදි) වධය ද 399
(අන්දුබන්ධනාදී) බන්ධනය ද යන හැම අපරාධ නොකිපි සිතැත්තෙක් ව
ඉවසා ද, ක්ෂාන්තිබලය බල කොට ඇති ඒ ක්ෂීණාස්‍රවයා බ්‍රාහමණ
නමැයි මම කියමි.

18. නොකිපෙන (ධුතාඞග) ව්‍රතයෙන් යුක්ත වූ ශීලයෙන් 400
පරිපූර්ණ වූ (තෘෂණා සෙනහයෙන්) තෙත් නොවූ දැමුනාවූ (භව කෙලවර
සිටි හෙයින්) අන්තිම ආත්මභාවයෙන් යුත් ඒ ක්ෂීණාස්‍රවයා බ්‍රාහමණ-
යෙකි යි මම කියමි.

19. යම් පුද්ගලයෙක් තෙම පියුම්පතෙහි (නොරැඳෙන) දිය බිඳු 401
මෙන් ද හිඳි අග (පිහිටා නොසිටින) අබ ඇට මෙන් ද කාමයන්හි
නො ඇලේ ද, ඒ අශෛක්ෂයා බ්‍රාහමණයෙකි යි මම් කියමි.

20. යම් පුද්ගලයෙක් තෙම මේ ආත්මභාවයෙහි ම තමා පිළිබඳ 402
(සකන්ධ) දුඃඛයාගේ විනාශය දනී ද, සකන්ධභාරය බහා තැබූ කෙලෙසුන්
කෙරෙන් මිදුනු ඒ ක්ෂීණාස්‍රවයා බ්‍රාහමණයෙකි යි මම් කියමි.

21. ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං 403
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

22. අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං 404
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

23. නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච 405
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

24. අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං 406
සාදානෙසු අනාදානං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

25. යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො 407
සාසපො රිව ආරග්ගා තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

26 අකක්කසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ 408
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

27. යො'ධ දීඝං ච රස්සං වා අණුං ථූලං සුභාසුභං 409
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

28. ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච 410
නිරාසයං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

29. යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී 411
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

30. යො'ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා 412
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

31. චන්දං'ව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං 413
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

21. ගැඹුරු ප්‍රඥාවෙන් යුක්ත වූ විදර්ශනාඥානයෙන් මේධාවී වූ 403
(මේ දුගති මග යැ මේ සුගති මග යැ මේ නිවන් මග යැ යි මෙසේ)
මාර්ගාමාර්ගයන්හි දක්ෂ වූ (අර්හත්වසඞ්ඛ්‍යාත) උත්තමාර්ථයට සම්ප්‍රාප්ත වූ
ඒ වීතරාග පුද්ගලයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

22. ගිහියන් ද පැවිද්දන් ද යන දෙ පිරිස සමග සංසර්ග රහිත වූ 404
(තෘෂ්ණාසඞ්ඛ්‍යාත) ගිහි හැසිරීමෙන් බැහැර වූ අල්පේච්ඡ වූ මෙබඳු
අශෛක්ෂ පුද්ගලයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

23. යම් පුද්ගලයෙක් (තෘෂ්ණාසන්ත්‍රාසයෙන්) බිය සහිත වූ ද 405
(තෘෂ්ණාසන්ත්‍රාස රහිත හෙයින්) බිය රහිත වූ ද සියලු ජනයන් විෂය-
යෙහි කායාදි දණ්ඩය බහා තබා තෙමේ (කිසිවකු නො තසා ද) කිසිවකු
මෙරමා ලවාත් නො තස්වා ද, එබඳු ක්ෂීණාස්‍රවයා බ්‍රාහ්මණ යැ යි මම්
කියමි.

24. විරුද්ධ ලෞකික මහාජනයා අතුරෙහි අවිරුද්ධ වූ, (පරහිංසාව 406
සඳහා) දඬුගත් ලෞකික මහජනයා අතුරෙහි නිවුනු සිතැති, පඤ්චස්කන්ධ-
විෂයයෙහි මමත්වය සැලකූ ලෞකික මහා ජනයා අතුරෙහි (පස් කඳ
පිළිබඳ ව මම ය මාගේ යි) ගැණීමක් නැති ඒ වීතරාග පුද්ගලයා
බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

25. යම් කිසිවකු විසින් රාගය ද ද්වේෂය ද මානය ද (ගුණ 407
මැකීම් ලක්ෂණ වූ) මක්ඛය ද, හිදි අග තොරඳන අබැටක් මෙන් (ඒ ඒ
මග නුවණින්) බැහැර ලන ලද්දේ ද එබඳු අශෛක්ෂයා බ්‍රාහ්මණ යැ යි
මම් කියමි.

26. යම් වචනයෙකින් කිසිවකු කුප්වා ද, එබඳු, රළු නොවූ, 408
දෙලෝ වැඩ හඟවන්නාවූ සබවස යමෙක් පවසන්නේ ද, එසේ වූ
ක්ෂීණාස්‍රව පුද්ගලයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

27. යම් පුද්ගලයෙක් මෙ ලොවෙහි දිගු වූ හෝ ලුහුඬු වූ හෝ 409
අණුවූ හෝ සථූල වූ හෝ යහපත් වූ හෝ අයහපත් වූ හෝ (හිමියන්
විසින්) නොදෙන ලද (මෙරමා සතු) දූයක් සොර සිතින් පැහැර නො
ගණී ද ඔහු බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

28. යම් පුද්ගලයකුහට මෙ ලොව පරලොව පිළිබඳ (රූපාදි අර- 410
මුණු උදෙසා පවත්නා) තෘෂ්ණාවෙක් නොමැත්තේ ද, තෘෂ්ණා නැති,
කෙලෙසුන් කෙරෙන් සිත බැහැර ගිය ඔහු බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

29. යමකුට තෘෂ්ණාව නැත් ද, (බුද්ධාදි අෂ්ටවස්තූන් යථාභූත 411
වශයෙන්) දැන (එය පිළිබඳ වූ) විචිකිච්ඡාව පහ ව ගියේ ද, නිර්වාණයට
ඇතුළත් ව එ ම ක්ෂෙමභූමියට පැමිණියා වූ වීතරාග පුද්ගලයා
බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

30. මෙ ලොවෙහි දී යම් පුද්ගලයෙක් කුශලාකුශල උභය පක්ෂය ම 412
(රහත් මග නැණින්) ප්‍රහීණ කෙළේ ද, රාගාදි සඞ්ගයන් බැහැර කෙළේ ද
ශෝකයන් ඉක්ම වූ, රාගාදී රජස් දුරු වූ (උපක්ලේශාපගමනයෙන්) පිරි-
සුදු වූ ඒ අශෛක්ෂයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

31. පුණ් චන්ද්‍රයා මෙන් නිර්මල වූ, පිරිසිදු වූ, චෙතෙසින් පහන් වූ, 413
නිරාකුලවූ, භවත්‍රයය පිළිබඳ තෘෂ්ණාව ක්ෂය කළා වූ ඒ ක්ෂීණාස්‍රවයා
බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

32. යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහමච්චගා 414
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

33. යො'ධ කාමෙ පහන්ත්වාන අනාගාරො පරිබ්බජෙ 415
කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

34. යො'ධ තණ්හං පහන්ත්වාන අනාගාරො පරිබ්බජෙ 416
තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

35. හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා 417
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

36. හිත්වා රතිං ච අරතිං ච සීතිභූතං නිරූපධිං 418
සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

37. චුතිං යො'වෙදි සත්තානං උපපත්තිං ච සබ්බසො 419
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

38. යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා 420
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

39. යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං 421
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

40. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං 422
අනෙජං න්හාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

32. යම් භික්ෂුවෙක් මේ (රාගාදි) පළිපථය (මඩ සහිත මගත් කෙලෙස්දුර්ගයත් මේ සංසාර වෘත්තයත් මොහයත්) ඉක්මැවී ද, (කාමෞඝාදි) සැඩ පහරින් එතෙර වූයේ ද, (පාරසඞ්ඛ්‍යාත) නිර්වාණයට පැමිණියේ ද, ධ්‍යාන වඩන්නේ ද, (එජාසඞ්ඛ්‍යාත) තෘෂ්ණාව රහිත වූයේ ද, බුද්ධාදි අෂ්ට වස්තූන් පිළිබඳ සැක නැත්තේ ද, කාමොපාදානාදීන් (උපාදානවශයෙන්) දැඩි සේ නොගෙන කෙලශපරිනිර්වාණයෙන් නිවුනේ ද, ඒ වීතරාග පුද්ගලයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 414

33. මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් තෙම කාමයන් දුරලා ගෘහ-වාසය හැර පියා පැවිදි වේ ද, කාමතෘෂ්ණා භවතෘෂ්ණා ක්ෂීණ කළා වූ ඒ අශෛක්ෂයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 415

34. මෙ ලොව යම් පුද්ගලයෙක් තෘෂ්ණාව දුරු කොට ගෘහවාසය බැහැර ලා නික්මේ ද, කාමතෘෂ්ණා භවතෘෂ්ණාවන් ක්ෂීණ කළා වූ ඒ ක්ෂීණාස්‍රවයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 416

35. මේ සත් ලොවැ මානුෂක ආයුෂ හා පඤ්චකාම ගුණය හැර පියා දිව්‍ය ආයුෂ හා පඤ්චකාම ගුණ ද යමෙක් ඉක්මැ යේ ද, (කාමාදි) යොග-යන්ගෙන් වෙසෙසින් වෙන් වූ ඒ වීතරාග පුද්ගලයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 417

36 පස්කම්ගුණෙහි ඇලීම ද, අරණ්‍යවාසයෙහි උකටලී බව ද දුරලා, නිවී ගිය සිතැති, උපධිරහිත වූ (සීලාදිගුණවලින් සිය ලු ලොකය මැඩලූ, ප්‍රධානවීර්යය ඇති ඒ අශෛක්ෂයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 418

37. යම් ශ්‍රමණයෙක් සත්ත්වයන්ගේ ච්‍යුති (ආසන්න) ය ද ප්‍රතිසන්ධි (ආසන්න) ය ද සර්වප්‍රකාරයෙන් ප්‍රකට කොට දන්නේ ද, (තෘෂ්ණා වශයෙන්) අලගත වූ මනා ගති ඇති සිවුසස් පසක් කළ ඒ උත්තමයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 419

38. යම් ක්ෂීණාස්‍රවොත්තමයකු ගේ පහළ වීම නොහොත් (නිෂ්ඨාව) (ශක්‍රබ්‍රහ්මාදි) දෙවියෝ ද, ගන්ධර්වයෝ ද, මනුෂ්‍යයෝ ද (කිසි ලෙසෙකින්) නො දනිත් ද, චතුරාස්‍රවයන් ක්ෂීණ කළා වූ, කෙලෙසුන් කෙරෙන් සර්ව-ප්‍රකාරයෙන් දුරු වූ ඔහු බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 420

39. යම් පුද්ගලයකු විෂයයෙහි අතීත ස්කන්ධයන් පිළිබඳ වූ ද අනාගත ස්කන්ධයන් පිළිබඳ වූ ද, වර්තමාන ස්කන්ධයන් පිළිබඳ වූ ද, (තෘෂ්ණාග්‍රහණ සඞ්ඛ්‍යාත) පළිබොධයෙක් නැද් ද, රාගාදි කිඤ්චන රහිත වූ තෘෂ්ණා දෘෂ්ටි මාන ග්‍රහණයක් නැති ඒ වීතරාග පුද්ගලයා බ්‍රාහ්මණයැ යි මම් කියමි. 421

40. (භය සන්ත්‍රාස රහිත බැවින්) වෘෂභාජානීයයකු බඳු වූ (උත්තමාර්ථයෙන්) ප්‍රවර වූ (වීර්යසම්පන්න බැවින්) වීර වූ (මහත් වූ ශීලාදි ධර්මස්කන්ධයන් එෂණය කළ බැවින්) මහර්ෂි වූ (ස්කන්ධකෙලශ-මෘත්‍යු) මාරයන් දිනූ තෘෂ්ණාවන්ගෙන් වියුක්ත වූ (මාර්ගොදක සලිලයෙන්) කෙලෙස්මල සෝදා දැමූ, සිවු සස් පසක් කළ ඒ අශෛක්ෂයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි. 422

41\. පුබ්බෙනිවාසං යො'වෙදී සග්ගාපායං ච පස්සති 423
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි
සබ්බවොසිතවොසානං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

**බ්‍රාහ්මණවග්ගො ඡබ්බීසතිමො.**

---

## වග්ගුද්දානං

1\. යමකප්පමාදෙ චිත්තං පුප්ඵං බාලෙන පණ්ඩිතො
අරහන්තො සහස්සෙන පාපදණ්ඩෙන තෙ දස.

2\. ජරා අත්තා ච ලොකො ච බුද්ධො සුඛපියෙන ච
කොධො මලං ච ධම්මට්ඨො මග්ගවග්ගෙන වීසති

3\. පකිණ්ණං නිරයො නාගො තණ්හා භික්ඛු ච බ්‍රාහ්මණො
එතෙ ඡබ්බීසති වග්ගා දෙසිතාදිච්චබන්ධුනා.

---

## ගාථුද්දානං

1\. යමකෙ වීසති ගාථා අප්පමාදම්හි ද්වාදස
එකාදස චිත්තවග්ගෙ පුප්ඵවග්ගම්හි සොළස

2\. බාලෙ ච සොළස ගාථා පණ්ඩිතම්හි චතුද්දස
අරහන්තෙ දස ගාථා සහස්සෙ හොන්ති සොළස.

3\. තෙරස පාපවග්ගම්හි දණ්ඩම්හි දස සත්ත ච
එකාදස ජරාවග්ගෙ අත්තවග්ගෙ භවෙ දස.

4\. ද්වාදස ලොකවග්ගම්හි බුද්ධෙ ට්ඨාරස භවෙ
සුඛෙ ච පියවග්ගෙ ච ගාථායො හොන්ති ද්වාදස.

5\. චුද්දස කොධවග්ගම්හි මලවග්ගෙකවීසති
සත්තරස ච ධම්මට්ඨෙ මග්ගවග්ගෙ තථෙව ච.

6\. පකිණ්ණෙ සොළස ගාථා නිරයෙ නාගෙ චතුද්දස
ඡබ්බීසති තණ්හාවග්ගම්හි තෙවීස භික්ඛුවග්ගිකා.

7\. එකතාළීසගාථායො බ්‍රාහ්මණෙ වග්ගමුත්තමෙ
ගාථා සතානි චත්තාරි තෙවීස ච පුනාපරෙ
ධම්මපදෙ නිපාතම්හි දෙසිතාදිච්චබන්ධුනා'ති.

**ධම්මපදපාළි නිට්ඨිතා.**

---

41. යමෙක් පෙර වුසු කඳපිළිවෙළ (ප්‍රකට කොට) දනී ද, ස්වර්ගය ද 423
නිරය ද දිවැසින් දකී ද, යළි (ජාතික්‍ෂය සඞ්ඛ්‍යාත) අර්හත්ඵලප්‍රාප්ත වූයේ ද, විශිෂ්ටඥානයෙන් දත නිෂ්ඨාප්‍රාප්ත ද, සියලු කෙලෙසුන්ගේ අවසානය වූ අර්හත්මාර්ගඥාන නැමැති බ්‍රහ්මචර්යය වැස නිම කළ ඒ ක්‍ෂීණාස්‍රවොත්තමයා බ්‍රාහ්මණ යැ යි මම් කියමි.

**සවිසි වන බ්‍රාහ්මණ වර්ගය යි.**

---

## වර්ගයන්ගේ උද්දානය

1. යමකවර්ගය, අප්‍රමාදවර්ගය, චිත්තවර්ගය, පුෂ්පවර්ගය, බාලවර්ගය, පණ්ඩිතවර්ගය, අර්හද්වර්ගය, සහස්‍රවර්ගය, පාපවර්ගය, දණ්ඩවර්ගය යන ඒ දස වර්ග ද,

2. ජරාවර්ගය ද ආත්මවර්ගය ද ලෝකවර්ගය ද බුද්ධවර්ගය ද සුඛවර්ග-ප්‍රියවර්ග ද ක්‍රෝධවර්ගය ද මලවර්ගය ද ධර්මස්ථවර්ගය මාර්ගවර්ගය හා [මේ) විසි වර්ග ද,

3. ප්‍රකීර්ණකවර්ගය ද නිරයවර්ගය ද නාගවර්ගය ද තෘෂ්ණාවර්ගය ද බ්‍රාහ්මණවර්ගය දැ යි මේ සවිසි වර්ගයෝ සූර්යබන්ධු වූ බුදුරජුන් විසින් දෙසන ලදුහ.

---

## ගාථාවන්ගේ උද්දානය

1. යමකවර්ගයේ ගාථා විස්සෙක. අප්‍රමාදවර්ගයෙහි දොළොසෙක. චිත්ත-වර්ගයෙහි එකොළොසෙක. පුෂ්පවර්ගයෙහි සොළොසෙක.

2. බාලවර්ගයෙහි ද ගාථා සොළොසෙක. පණ්ඩිතවර්ගයෙහි තුදුසෙක. අර්හද්වර්ගයෙහි ගාථා දසයෙක. සහස්‍රවර්ගයෙහි සොළොසෙක් වේ.

3. පාපවර්ගයෙහි ගාථා තෙළෙසෙකි. දණ්ඩවර්ගයෙහි සතොළොසෙක් ද ජරාවර්ගයෙහි එකොළොසෙක් ද ආත්මවර්ගයෙහි දසදෙනෙක් ද වෙති.

4. ලෝකවර්ගයෙහි දොළොසෙකි. බුද්ධවර්ගයෙහි අටොළොසෙක් ද වේ. සුඛවර්ගයෙහි දොළොසෙක් ද ප්‍රියවර්ගයෙහි දොළොසෙක් ද ගාථාවෝ වෙති.

5. ක්‍රෝධවර්ගයෙහි තුදුසෙක් ද මලවර්ගයෙහි එක්විස්සෙක් ද ධර්මස්ථ-වර්ගයෙහි සතොළෙසෙක් ද, එසේ ම මාර්ගවර්ගයෙහිත් සතොළොසෙක් ද ගාථාවෝ වෙති

6. ප්‍රකීර්ණකවර්ගයෙහි සොළොසෙක් ද, නිරයවර්ගයෙහි තුදුසෙක් ද, නාගවර්ගයෙහිත් තුදුසෙක් ද, තෘෂ්ණාවර්ගයෙහි සවිස්සෙක් ද, භික්‍ෂුවර්ගයට අයත් තෙවිස්සෙක් ද, ගාථාවෝ වෙති.

7. උතුම් බ්‍රාහ්මණවර්ගයෙහි ගාථා එක්සාළිසෙකි. ධර්මපදසංඛ්‍යාත ගාථා සඞ්ග්‍රහයෙහි සූර්යබන්ධු වූ බුදුරජුන් විසින් දෙසන ලද ගාථා සාරසියෙක් ද, නැවත තවත් ගාථා තෙවිස්සෙක් ද (ගාථාවෝ සාරසිය තෙවිසිදෙනෙක්) වෙති.

**ධම්මපදපාළිය නිමවන ලදී.**

---

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

## (තතියො ගන්ථො)

# උදානපාළි

---

## බොධිවග්ගො පඨමො

## නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

**1. 1.**

### පඨමබොධිසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන[1] භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති විමුත්තිසුඛපටිසංවෙදී.

අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමං සාධුකං මනසාකාසි: ‘‘ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී’’ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

> යදා හවෙ පාතුභවන්ති ධම්මා
> ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
> අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
> යතො පජානාති සහෙතුධම්මන්ති.

---

1. තෙන සමයෙන, විනයපාළි

# සූත්‍රපිටකයෙහි

# ඛුද්දක නිකාය

## (තෙවන ග්‍රන්ථය)

# උදාන පාළිය

---

## පළමුවන බෝධිවර්ගය

### ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධෝත්තමයන් වහන්සේට නමස්කාර වේ වා.

**1. 1.**

**ප්‍රථම බොධිසූත්‍රය.**

මා විසින් මෙසේ අසන ලදී: **එක් සමයෙක්හි** භාග්‍යවතුන් වහන්සේ අභිසම්බොධියට පැමිණ (බුදුවූ) පළමු කොට ම උරුවෙල්දනව්හි නේරංජරා ගඟ තෙර බෝරුක්මුලැ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රහත්ඵල සමවත්සුව විඳිනා සේක්, සතියක් එක් පලඟින් හුන් සේක් වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ සතිය ඇවෑමෙන් ඒ සමාධියෙන් නැඟී සිටැ රෑ පළමු යම්හි, "මෙසේ මේ අයුරින් මේ ප්‍රත්‍යය ඇතිවත් මැ මේ ඵලය වෙයි. මේ ප්‍රත්‍යය ඉපැද්මෙන් මේ ඵලය උපදනේ"යැ යි අනුලොම් පිළිසසමුපාව මොනොවට මෙනෙහි කළ සේක. හෙ කෙසේයයත්: "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයයෙන් නාමරූපය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතන වේ. ෂඩායතනප්‍රත්‍යය-යෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ. වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය වේ. උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ ශෝක පරිදේව දුක් දෙම්නස් උපායාස යන මොහු වෙත්. (පහළ වෙත්.) මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ ඉපැද්ම වේ" යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (හැම අයුරින්) මේ අර්ථය දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

"කෙලෙස් තවන වැර ඇති, දහන් වඩන බ්‍රාහ්මණයාට (පව් බැහැර කළාහට – රහත්හට) යම් ක්ෂණයෙක බෝපැකිදහම්හු උපදිත් ද, එ කල්හි ඔහුගේ හැම සැක දුරු වේ. යම් හෙයෙකින් හේ සහෙතුක වූ දුඃඛස්කන්ධ-ධර්මය දන්නේ ද එ හෙයිනි" යනු යි.

## 1. 2.

## දුතියබොධිසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන[1] භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති විමුත්තිසුඛ-පටිසංවෙදී.

අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා රත්තියා මජ්ඣිමං යාමං පටිච්චසමුප්පාදං පටිලොමං සාධුකං මනසාකාසි: "ඉති ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාති-නිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදීති.

## 1. 3.

## තතියබොධිසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන[1] භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති විමුත්තිසුඛ-පටිසංවෙදී.

අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා රත්තියා පච්ඡිමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමපටිලොමං සාධුකං මනසාකාසි: "ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොක-පරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

---

1. තෙන සමයෙන, විනයමහාවග්ගො.

## 1. 2.

## ද්විතීය බොධිසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අභිසම්බොධියට පැමිණ පළමු කොට ම උරුවෙල්දනව්හි නිල්දලා හෝ නෙරු බෝරුක්මුලැ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රහත්පල සම්වත්සුව විඳුනා සේක්, සතියක් එක් පලඟින් හුන් සේක් වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ සතිය ඇවෑමෙන් ඒ සමාධියෙන් නැඟී සිටැ රෑ මැදුම් යම්හි, "මෙසේ මෙය නොමැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ යැ"යි ප්‍රතිලොම ප්‍රතීත්‍යසමුත්පාදය මොනොවට මෙනෙහි කළ සේක. හේ කෙසේයත්: "අවිද්‍යානිරොධයෙන් සංස්කාර නිරොධය වේ. සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වේ. විඥාන-නිරොධයෙන් නාමරූපනිරොධය වේ. නාමරූප නිරොධයෙන් ෂඩායතන-නිරොධය වේ. ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ. වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ. තෘෂ්ණා-නිරොධයෙන් උපාදානනිරොධය වේ. උපාදානනිරොධයෙන් භවනිරොධය වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ ශොකපරිදෙව දුක්දොම්නස් උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ නිරොධය වේ"යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (හැම අයුරින්) මේ අර්ථය දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"කෙලෙස් තවන වැර ඇති, දහන් වඩන බ්‍රාහ්මණයාහට (බාහිතපාප පුද්ගලයාහට - රහත්හට) යම්ක්ෂණයෙක බෝපැකිදහම්හු උපදිත් ද එ කල්හි - යම් හෙයෙකින් හේ ප්‍රත්‍යයයන්ගේ නිරොධය පිළිවිදියේ ද එහෙයින් - ඔහුගේ සියලු සැක දුරු වැ යේ" යනු යි.

## 1. 3.

## තෘතීය බොධිසූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අභිසම්බොධියට පැමිණ පළමුවෙන් ම උරුවෙල්දනව්හි නිල්දලා හෝ නෙරු බෝරුක්මුලැ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රහත්පල සමවත්සුව විඳුනා සේක්, සතියක් එක් පලඟින් හුන් සේක් වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ සතිය ඇවෑමෙන් ඒ සමාධියෙන් නැඟී සිට, රෑ පැසිම් යම්හි, "මෙසේ මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපැද්මෙන් මෙය උපදනේ ය. මෙය නොමැති කල්හි මෙය නො වේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ යැ"යි අනුලොම් ප්‍රතිලොම ප්‍රතීත්‍යසමුත්පාදය මොනොවට මෙනෙහි කළ සේක. හෙ කෙසේයත්: "අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයයෙන් නාමරූපය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායත-නය වේ. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ. වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය වේ උපා-දානප්‍රත්‍යයයෙන් භවය වේ, භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ ශොකපරිදෙව දුක්දොම්නස් උපායාස යන මොහු වෙත් (උපදිත්.) මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ ඉපැද්ම වේ.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී''ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියො'ව ඔභාසයමන්තලික්ඛන්ති.

## 1. 4.

## නිග්‍රොධසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **අජපාලනිග්‍රොධමූලෙ**[1] පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති විමුත්තිසුඛ-පටිසංවෙදී.

අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨාසි. අථ ඛො අඤ්ඤතරො හුහුඞ්කජාතිකො[2] බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

"කිත්තාවතා නු ඛො භො ගොතම බ්‍රාහ්මණො හොති? කතමෙ ච පන බ්‍රාහ්මණකරණා ධම්මා?"ති[3]

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

යො බ්‍රාහ්මණො බාහිතපාපධම්මො
නිහුහුඞ්කො[4] නික්කසාවො යතත්තො
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
ධම්මෙන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙති.

1. නිග්‍රොධ-කෙසුචි පොත්ථකෙසු 2. හුහුංකජාතිකො, මජසං. 3. බ්‍රාහ්මණකරණා ධම්මා, සී. බ්‍රාහ්මණකාරකා කෙසුචි පොත්ථකෙසු 4. නිහුහුඞ්කො, විම. නිහුංහුංකො, මජසං

අවිද්‍යාවගේ ම වූ කලි නිරවශේෂ නිරොධයෙන් සංස්කාරයන්ගේ නිරොධය වේ. සංස්කාරයන්ගේ නිරොධයෙන් විඥානයාගේ නිරොධය වේ. විඥානනිරොධයෙන් නාමරූපනිරොධය වේ. නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වේ. ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ. ස්පර්ශනිරොධයෙන් වේදනානිරොධය වේ. වේදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ. තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ. උපාදානනිරොධයෙන් භවනිරොධය වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ ශොකපරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ නිරොධය වේ.”

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැම අයුරින් මේ අර්ථය දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

“කෙලෙස් තවන වැර ඇති, දහන් වඩන බ්‍රාහමණයාට (රහත්හට) යම් ක්‍ෂණයෙක බෝපැකිදහම්හු උපදිත් ද, එ කලැ හේ හිරුහු (අඳුර දුරලා) අහස බබුළුවන්නහු මෙන් මරසෙන් විධ්වංසන (කම්පිත) කෙරෙමින් සිටී” යනු යි.

## 1. 4.

## න්‍යග්‍රොධසූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බුදු වැ පළමු ව (පස්වන සතියෙහි) උරුවෙල්දනව්වෙහි නිල්දලා නී තෙර අජපල් නුගරුක මුලැ වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රහත්පල සමවත්සුව විඳිනා සේක් සතියක් එක් පලඟින් හුන් සේක් වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සතිය ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගී සිටි සේක. එ කල්හි හුහුංකජාතික වූ එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එ තැනට එළඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු වන්නට නිසි සිතැ රැඳැවිය යුතු (සිහි කටයුතු) කථා කොට නිමවා එක් පසෙක සිටියේ ය. එක් පසෙක සිටියේ ම එ බමුණු භාග්‍යවතුන් වහන්සේට “භවද්ගෞතමයිනි, කොතෙකින් බමුණෙක් වේ ද? බමුණුබව කරණ දහම්හු කවුරු නම් වෙත් ද?”සී මේ වචන කී ය.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

“යම් බමුණෙක් බැහැරැ ලූ පාපධර්ම ඇතියේ ද, (ක්‍රොධ මාන විසින්) හුහුංකාර නැත්තේ ද, කෙලෙස්කසට නැත්තේ ද, සංයත වූ සිතැත්තේ ද, සිවුමග නුවණින් නිවනට පැමිණියේ වේ ද, වැසනිමැ වූ මගබඹසර ඇත්තේ ද, යම්කුගේ (සතන්හි) ලොවැ කිසි අරමුණෙක්හි දු උත්සදයෝ (නැඟ එන රාගාදිහු) නැත් ද, හෙ තෙමේ “මම් බමුණුමි”සි බ්‍රහමවාදය කියනුයේ දහම් හසින් කියන්නේ ය” යනු යි.

## 1. 5.

### ථෙරසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාමොග්ගල්ලානො** ආයස්මා ච **මහාකස්සපො** ආයස්මා ච **මහාකච්චායනො** ආයස්මා ච **මහාකොට්ඨිතො** ආයස්මා ච **මහාකප්පිනො** ආයස්මා ච **මහාචුන්දො** ආයස්මා ච **අනුරුද්ධො** ආයස්මා ච **රෙවතො** ආයස්මා ච **ආනන්දො**[1] යෙන භගවා තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො භගවා තෙ ආයස්මන්තෙ දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන භික්ඛූ ආමන්තෙසි. "එතෙ භික්ඛවෙ බ්‍රාහ්මණා ආගච්ඡන්ති, එතෙ භික්ඛවෙ බ්‍රාහ්මණා ආගච්ඡන්තී"ති.

එවං වුත්තෙ අඤ්ඤතරො බ්‍රාහ්මණජාතිකො භික්ඛු භගවන්තං එතදවොච: "කිත්තාවතා නු ඛො භන්තෙ, බ්‍රාහ්මණො හොති? කතමෙ ච පන බ්‍රාහ්මණකරණා ධම්මා?"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

> බාහිත්වා පාපකෙ ධම්මෙ යෙ චරන්ති සදා සතා,
> ඛීණසංයොජනා බුද්ධා තෙ වෙ[2] ලොකස්මිං බ්‍රාහ්මණා'ති.

## 1. 6.

### කස්සපසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකස්සපො** පිප්ඵලිගුහායං[3] විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා මහාකස්සපො අපරෙන සමයෙන තම්හා ආබාධා වුට්ඨාසි.

අථ ඛො ආයස්මතො මහාකස්සපස්ස තම්හා ආබාධා වුට්ඨිතස්ස එතදහොසි. "යන්නූනාහං රාජගහං පිණ්ඩාය පවිසෙය්‍ය"න්ති.

තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි දෙවතාසතානි උස්සුක්කං ආපන්නානි හොන්ති ආයස්මතො මහාකස්සපස්ස පිණ්ඩපාතපටිලාභාය.

අථ ඛො ආයස්මා මහාකස්සපො තානි පඤ්චමත්තානි දෙවතාසතානි පටික්ඛිපිත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි, යෙන දළිද්දවිසිඛා කපණවිසිඛා පෙසකාරවිසිඛා.

අද්දසා ඛො භගවා ආයස්මන්තං මහාකස්සපං රාජගහෙ පිණ්ඩාය චරන්තං, යෙන දළිද්දවිසිඛා කපණවිසිඛා පෙසකාරවිසිඛා. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1. නන්දො, මජසං. 2. තෙව, සී. 3. පිප්ඵලිගුහායං. සයා.

## 1. 5.

### ස්ථවිර සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් වූ **අනේපිඩු සිටුහුගේ** ආරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් **ශාරිපුත්‍ර** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යායන** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාකාත්‍යායන** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාකොට්ඨිත** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාකප්පින** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **මහාචුන්ද** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **අනුරුද්ධ** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **රේවත** ස්ථවිරයන් වහන්සේ ද, ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාහ. භාග්‍යවතුන් වහන්සේ එන්නාවූ ඒ ආයුෂ්මතුන් දුර දී ම දුටු සේක. දැක "මහණෙනි, මේ බමුණෝ එති. මහණෙනි, මේ බමුණෝ එති"යි භික්ෂූන් ඇමැතූ සේක.

මෙසේ වදාළ කල්හි බ්‍රාහ්මණ ජාතික වූ එක්තරා භික්ෂුවෙක් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කොපමණෙකින් බමුණෙක් වේ ද? බමුණු බව කරන ධර්මයෝ කවරහු ද?"යි මෙය කී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"යම් කෙනෙක් ලාමක අකුශල ධර්මයන් දුරු කොට හැම කල්හි සමෘතිමත් ව හැසිරෙත් ද, ක්ෂය කරන ලද සංයෝජන ඇති, චතුරාර්‍ය්‍ය-සත්‍යාවබෝධය කළා වූ ඔවුහු ඒකාන්තයෙන් ලෝකයෙහි බ්‍රාහ්මණ වෙත්.

## 1. 6.

### කාශ්‍යප සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ**නුවර සමීපයෙහි **කාලන්දකනිවාප** නම් වූ වේළුවනා-රාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ ආබාධික ව දුඃඛිත ව දැඩි ගිලන් ව **පිප්ඵලි** ගුහාවෙහි වසන සේක.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පසු කලෙක ඒ ආබාධයෙන් නැඟී සිටි සේක. පසු කලෙක ඒ ආබාධයෙන් නැඟී සිටි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට "මම් රජගහනුවරට පිඬු පිණිස පිවිසෙන්නෙම් නම් මැනැවැ"යි මෙබඳු සිතෙක් පහළ විය.

එසමයෙහි පන්සියයක් පමණ දෙවඟනෝ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පිණ්ඩපාතය පිළිලබවනු පිණිස උත්සුක බවට පැමිණියාහු වෙති.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඒ පන්සියයක් පමණ දෙවඟනන් පිළිකෙවු කොට පෙරවරු වේලෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන රජගහනුවර දිළිඳුන් වසන, දුප්පත් මිනිසුන් වසන, පෙහෙරුන් වසන වීදියට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර දිළිඳුන් දුගීන් පෙහෙරුන් වසන වීදියෙහි පිඬු පිණිස හැසිරෙන ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ දුටු සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:

''අනඤ්ඤපොසිං අඤ්ඤදුතං¹ දන්තං සාරෙ පතිට්ඨිතං,
ඛීණාසවං වන්තදොසං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණ''න්ති.

## 1. 7.

### පාවාසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **පාවායං**² විහරති **අජකලාපකෙ චෙතියෙ අජකලාපකස්ස** යක්ඛස්ස භවනෙ. තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අබ්භොකාසෙ නිසින්නො හොති. දෙවො ච එකමෙකං ඵුසායති. අථ ඛො අජකලාපකො යක්ඛො භගවතො භයං ඡම්භිතත්තං ලොමහංසං උප්පාදෙතුකාමො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො අවිදූරෙ තික්ඛත්තුං 'අක්කුලො පක්කුලො'ති අක්කුලපක්කුලිකං අකාසි, 'එසො තෙ සමණ පිසාචො'ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

යදා සකෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො,
අථ එතං පිසාචඤ්ච පක්කුලඤ්චාතිවත්තතීති.

## 1. 8.

### සඞ්ගාමජිසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සඞ්ගාමජි** සාවත්ථිං අනුප්පත්තො හොති භගවන්තං දස්සනාය. අස්සොසි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා 'අය්‍යො කිර සඞ්ගාමජි සාවත්ථිං අනුප්පත්තො'ති. සා දාරකං ආදාය ජෙතවනං අගමාසි.

තෙන ඛො පන සමයෙන ආයස්මා සඞ්ගාමජි අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා යෙනායස්මා සඞ්ගාමජි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'ඛුද්දපුත්තාම්හි සමණ, පොස ම'න්ති. එවං වුත්තෙ ආයස්මා සඞ්ගාමජි තුණ්හී අහොසි.

දුතියම්පි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'ඛුද්දපුත්තාම්හි සමණ, පොස ම'න්ති. දුතියම්පි ඛො ආයස්මා සඞ්ගාමජි තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'ඛුද්දපුත්තාම්හි සමණ, පොස ම'න්ති. තතියම්පි ඛො ආයස්මා සඞ්ගාමජි තුණ්හී අහොසි.

2. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා තං දාරකං ආයස්මතො සඞ්ගාමජිස්ස පුරතො නික්ඛිපිත්වා පක්කාමි 'එස තෙ සමණ, පුත්තො. පොස න'න්ති.

1. අනාඤ්ඤපොසිං අඤ්ඤඤාතං. මජසං. 2. පාටලියං. ඉ.

4. “අනෙකකු පොෂණය නො කරන සුලු, ප්‍රසිද්ධ වූ, (ඉන්ද්‍රිය දමනයෙන්) දමුණු, (විමුක්ති) සාරයෙහි පිහිටි, ක්ෂීණ ආශ්‍රව ඇති, දුරු කරන ලද (රාගාදි) දෙස් ඇති, ඒ උත්තමයා බ්‍රාහ්මණයෙකැ යි මම් කියමි”

## 1. 7.

## පාවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **පාවානුවර අජකලාපක** (නම්) චෛත්‍යය සමීපයෙහි අජකලාපක නම් යක්ෂයාගේ දෙවොලෙහි වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රෑ බොල් අඳුරුයෙහි අභ්‍යවකාශයෙහි වැඩ හුන් සේක. වැස්ස ද එක එක බිඳුව හෙළයි. එ කල්හි අජකලාපක යක්ෂ තෙමේ භාග්‍යවතුන් වහන්සේට බිය, තැති ගැන්ම, ලොමුදහ ගැන්ම උපදවනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි තුන් වරක් ‘අක්කුල පක්කුල’ යැ යි (අනුකරණ ශබ්දයක්) කෙළේ ය. “ශ්‍රමණයන් වහන්ස, මුබ වෙත මේ පිසාචයෙක් පැමිණියේ යැ” යි කීයේ ය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක.

“යම් කලෙක්හි (බාහිත පාප) බ්‍රාහ්මණ තෙමේ ස්වකීය ධර්මයන්හි පරතෙරට ගියේ (වේ ද), එ කල්හි (ඒ බ්‍රාහ්මණ තෙමේ) මේ පිසාචයා ද පක්කුල ශබ්දය ද ඉක්මැ සිටී.”

## 1. 8.

## සඞ්ග්‍රාමජිත් සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ දකිම පිණිස සැවැත්නුවරට පැමිණියේ ය. ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන්ගේ පුරාණ භාර්‍ය්‍යාව “සඞ්ග්‍රාමජිත් ආර්‍ය්‍යයන් වහන්සේ සැවැත් නුවරට වැඩියෝ ලු”යි ඇසුවා ය. ඕ තොමෝ දරුවා රැගෙන ජේතවනයට ගියා ය.

එසමයෙහි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිර තෙමේ එක්තරා රුකක් මුල දිවාවිහාරයෙහි හුන්නේ වෙයි. එකල්හි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන්ගේ පෙරබිරිය සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන් වෙත එළැඹියා ය. එළැඹ ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරුන්හට “ශ්‍රමණයන වහන්ස, කුඩා පුතකු ඇතියමු. මා පුස්නේ යැ”යි කීවා ය. මෙසේ කී කල්හි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිර තෙමේ නිශ්ශබ්ද විය.

දෙවෙනි වරත් ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරුන්ගේ පුරාණ භාර්‍ය්‍යාව ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරුන්හට “ශ්‍රමණයන් වහන්ස, කුඩා පුතකු ඇතියමු. මා පොෂණය කරන්නැ”යි කීවා ය. දෙවෙනි වරත්, ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. තුන්වැනි වරත් ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරුන්ගේ පුරාණ භාර්‍ය්‍යාව ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරහුනට “ශ්‍රමණයන් වහන්ස, කුඩා පුතකු ඇතියමු. මා පොෂණය කරන්නැ”යි කීවා ය. තුන්වැනි වරත් ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිර තෙමේ තුෂ්ණීම්භූත විය.

ඉක්බිති ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන්ගේ පුරාණ භාර්‍ය්‍යාව ඒ දරුවා ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන් ඉදිරියෙහි දමා “ශ්‍රමණයන් වහන්ස, මේ තෙමේ තොපගේ පුත්‍රයා ය. මොහු පොෂණය කරන්නැ”යි කියා නික්ම ගියා ය.

2. අථ ඛො ආයස්මා සඞ්ගාමජි තං දාරකං නෙව ඔලොකෙසි, නපි ආලපි. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා අවිදූරං ගන්ත්වා අපලොකෙන්තී අද්දස ආයස්මන්තං සඞ්ගාමජිං තං දාරකං නෙව ඔලොකෙන්තං නපි ආලපන්තං. දිස්වානස්සා එතදහොසි: 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො'ති. තතො පටිනිවත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකාය එවරූපං විප්පකාරං.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ආයන්තිං නාභිනන්දති පක්කමන්තිං න සොචති,
සඞ්ගා සඞ්ගාමජිං මුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණ'න්ති.

## 1. 9.

## ජටිලසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **ගයායං** විහරති **ගයාසීසෙ.** තෙන ඛො පන සමයෙන සම්බහුලා ජටිලා සීතාසු හෙමන්තිකාසු රත්තීසු අන්තරට්ඨකෙ හිමපාතසමයෙ ගයායං උම්මුජ්ජන්ති'පි, නිමුජ්ජන්ති'පි, උම්මුජ්ජනිමුජ්ජම්පි කරොන්ති, ඔසිඤ්චන්ති'පි, අග්ගිම්පි ජුහන්ති ඉමිනා සුද්ධී'ති.

අද්දසා ඛො භගවා තෙ සම්බහුලෙ ජටිලෙ සීතාසු හෙමන්තිකාසු රත්තීසු අන්තරට්ඨකෙ හිමපාතසමයෙ ගයායං උම්මුජ්ජන්තෙ'පි නිමුජ්ජන්තෙ'පි උම්මුජ්ජනිමුජ්ජං කරොන්තෙ'පි ඔසිඤ්චන්තෙ'පි අග්ගිම්පි ජුහන්තෙ 'ඉමිනා සුද්ධී'ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

න උදකෙන සුචී හොති බහ්වෙත්ථ න්හායතී ජනො
යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණො'ති.

2. එකල්හි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් තෙරණුවෝ ඒ දරුවා (දෙස) නො ද බැලූහ. (දරුවා හා) නො ද බිණූහ. එකල්හි ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන්ගේ පුරාණ භාර්‍ය්‍යාව නො දුරට ගොස් පෙරළා බලන්නී ඒ දරුවා (දෙස) නො බලන, (දරුවා හා) නො තෙපලන ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන් දුටුවා ය. දැක, ඇයට "මේ ශ්‍රමණ තෙමේ පුත්‍රයාගෙනුදු ප්‍රයොජන නැත්තෙකැ"යි මේ සිත විය. ඕ එතැනින් පෙරළා අවුත් දරුවා රැගෙන ගියා ය. භාග්‍යවතුන් වහන්සේ පිරිසුදු වූ, මිනිසැස ඉක්මැ සිටියා වූ, දිවැසින් ආයුෂ්මත් සඞ්ග්‍රාමජිත් ස්ථවිරයන්ගේ පුරාණ භාර්‍ය්‍යාවගේ මෙබඳු වූ ඒ විප්‍රකාරය දුටු සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැනැ ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"එන්නියට ද සතුටු නො වෙයි. (බැහැර) යන්නිය දැක ද ශොක නො කරයි. (රාගාදි පඤ්චවිධ) සඞ්ගයෙන් මිදුණු ඒ සඞ්ග්‍රාමජිත් භික්‍ෂු 'බ්‍රාහ්මණයෙකැ'යි මම් කියමි"

## 1. 9.

## ජටිල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයා පෙදෙසෙහි වූ ගයාශීර්ෂයෙහි වැඩ වසන සේක. එසමයෙහි බොහෝ ජටිලයෝ ශීත වූ හිම සෘතුව පිළිබඳ රාත්‍රීන්හි (නවන් මැදින් දෙමසැ) අතර හිම වැටෙන අට දවසක් පමණ වූ කාලයෙහි 'මෙයින් ශුද්ධිය වෙතැ'යි සිතා ගයා තීර්ථයෙහි දියේ ගිලී උඩ ඊම ද කෙරෙති. (නැවත) දියේ ගිලීම ද කෙරෙති. (නැවැතැ නැවැතැ) දියේ ගිලීම හා මතු වීම ද කෙරෙති. දිය වත් කිරීම ද කෙරෙති. ගිනි පිදීම ද කෙරෙති.

භාග්‍යවතුන් වහන්සේ 'මෙයින් ශුද්ධිය වෙතැ'යි ශීත වූ හිම සෘතුවෙහි රාත්‍රීන්හි අතර අට දවසක් පමණ වූ හිම වැටෙන කාලයෙහි ගයා-තීර්ථයෙහි දියෙන් නැගෙන්නාවූ ද දියෙහි ගිලෙන්නාවූ ද නැගීම හා ගිලීම කරන්නාවූ ද දිය වත් කර ගන්නාවූ ද, ගිනි පුදන්නාවූ ද ඒ බොහෝ ජටිලයන් දුටු සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"මෙහි (ගයා තීර්ථයෙහි) බොහෝ දෙනෙක් නාති. (එහෙත්) ජලයෙන් පිරිසුදු වීමෙක් නැත. යමකු කෙරෙහි සත්‍යයත්, ධර්මයත් ඇත් නම් හෙ තෙමේ පිරිසුදු ය. හෙ තෙමේ බ්‍රාහ්මණයෙක් වේ"

## 1. 10.

## බාහියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන බාහියො දරුචීරියො සුප්පාරකෙ පටිවසති සමුද්දතීරෙ සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවර-පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අථ ඛො **බාහියස්ස දරුචීරියස්ස** රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යෙ ච ඛො කෙචි[1] ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා, අහං තෙසං අඤ්ඤතරො'ති.

අථ ඛො බාහියස්ස දරුචීරියස්ස පුරාණසාලොහිතා දෙවතා අනුකම්පිකා අත්ථකාමා බාහියස්ස දරුචීරියස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය, යෙන බාහියො දරුචීරියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බාහියං දරුචීරියං එතදවොච: 'නෙ ච ඛො ත්වං බාහිය අරහා. නාපි අරහත්තමග්ගං වා සමාපන්නො. සාපි තෙ පටිපදා නත්ථි යාය වා ත්වං අරහා අස්ස,[2] අරහත්තමග්ගං වා සමාපන්නො'ති. 'අථ කෙ චරහි සදෙවකෙ ලොකෙ අරහන්තො වා, අරහත්තමග්ගං වා සමාපන්නා?'ති. 'අත්ථි බාහිය උත්තරෙසු ජනපදෙසු සාවත්ථි නාම නගරං. තත්ථ සො භගවා එතරහි විහරති අරහං සම්මාසම්බුද්ධො. සො හි බාහිය භගවා අරහා චෙව, අරහත්තාය ච ධම්මං දෙසෙතී'ති.

අථ ඛො බාහියො දරුචීරියො තාය දෙවතාය සංවෙජිතො තාවදෙව සුප්පාරකා[3] පක්කාමි සබ්බත්ථ එකරත්තිපරිවාසෙන. යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො[4] තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො බාහියො දරුචීරියො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: 'කහන්නු ඛො භන්තෙ එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො? දස්සනකාමම්හා මයං තං භගවන්තං[5] අරහන්තං සම්මාසම්බුද්ධ'න්ති. 'අන්තර-ඝරං පවිට්ඨො ඛො බාහිය, භගවා පිණ්ඩාය'ති.

2. අථ ඛො බාහියො දරුචීරියො තරමානරූපො ජෙතවනා නික්ඛ-මිත්වා සාවත්ථිං පවිසිත්වා අද්දස භගවන්තං සාවත්ථියං පිණ්ඩාය චරන්තං පාසාදිකං පසාදනියං සන්තින්ද්‍රියං සන්තමානසං උත්තමදමථසමථම-නුප්පත්තං[6] දන්තං ගුත්තං යතින්ද්‍රියං නාගං. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙ සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: 'දෙසෙතු මෙ භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති.

---

1. යෙ ඛො කෙචි, මජසං. 2. අස්සසි, ස්‍යා. 3. සුප්පාරකම්හා, මජසං. 4. භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, සී. 5. දස්සනකාමම්හා භගවන්තං, මජසං. 6 උත්තමසමථදමථමනුප්පත්තං, මජසං.

## 1. 10.

## බාහිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වසන සේක.

එසමයෙහි (දරවැහැරි දරන හෙයින්) **දරුචීරිය** නම් වූ **බාහිය** තෙමේ ජනයා විසින් සත්කාර කරන ලද්දේ, ගුරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ, පුදන ලද්දේ, අපචායනය (යටත් පැවැතුම්) කරන ලද්දේ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර ලබන සුලු වූයේ, මුහුදු තෙර **සුප්පාරක** පටුනෙහි වෙසෙයි. එකල්හි රහසිගත වූ, හුදෙකලා වූ, බාහිය දරුචීරියහට "ලොකයෙහි රහත් වූ හෝ රහත්මගට පිළිපන් හෝ යම් කිසි කෙනෙක් (වෙත් නම්) මම් ඔවුනතුරෙන් එකෙකි-මි"යි මෙසේ චිත්තසංකල්පනාවෙක් පහළ විය.

එකල්හි ඒ දරවැහැරිසිවුරු දරන බාහිය පිරිවැජියාගේ පැරැණි සහලේ නෑ දෙවියෙක් අනුකම්පා කරනුයේ වැඩ කැමැත්තේ දරුචීවරික පිරිවැජි-යාගේ චිත්තපරිවිතක්කය සිය සිතින් දැන, දරුචීරිය බාහිය පිරිවැජියා වෙත පැමිණියේ ය. පැමිණ දරුචීරිය බාහියහට මෙසේ කී ය; "බාහියය, තෝ රහතෙක් නො වෙහි. රහත්මඟට පිළිපන්නෙක් ද නො වෙහි. යම් ප්‍රතිපත්තියෙකින් තෝ රහත් හෝ වන්නෙහි නම්, රහත්මඟට පිළිපන්නෙක් හෝ වන්නෙහි නම්, ඒ ප්‍රතිපත්තිය ද තට නැතැ"යි කී ය. "එසේ නම් දෙවියන් සහිත ලොකයෙහි දැන් කවරෙක් නම් රහත් හෝ රහත්මගට පැමිණියේ හෝ වේ ද?"යි හේ ඇසී ය. "බාහියය, උතුරුජනව්යෙහි සැවැත් නම් නුවරෙක් ඇත. එහි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් වසන සේක. බාහියය, ඒ භාග්‍යවතුන් වහන්සේ රහත් ද (වෙති] රහත්බව පිණිස ධර්මය ද දෙසති"යි කී ය.

ඉක්බිති දරුචීරිය බාහිය තෙමේ ඒ දෙවියා විසින් සංවෙගයට පමුණු-වන ලදු ව එකෙණෙහි ම සුප්පාරක පටුනෙන් පිටත් විය. සියලු තැන්හි එක්රැයක් (පමණක්) විසීමෙන් සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහුගේ ජෙතවනාරාමයට එළැඹියේ ය. එසමයෙහි බොහෝ භික්ෂූහු අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙති. ඉක්බිති දරුචීරිය බාහිය තෙමේ ඒ භික්ෂූන් කරා එළැඹියේ ය. එළැඹ ඒ භික්ෂූන්හට "ස්වාමීනි, ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වාසය කරන සේක් ද? අපි ඒ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමැත්තාම්හ"යි කී ය. "බාහියය, ඒ භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ඇතුළුගමට පිවිසි සේකැ"යි ඒ භික්ෂූහු කීහ.

ඉක්බිති දරුචීරිය බාහිය තෙමේ වේළෙවී ස්වභාව ඇත්තේ ජේතවන-යෙන් නික්මැ සැවැත්නුවර පිවිස, සැවැත්නුවර පිඬු පිණිස හැසිරෙන්නාවූ, ප්‍රසාදවහ වූ, ප්‍රසාදනීය වූ, සන්හුන් ඉඳුරන් ඇති, සන්හුන් සිත් ඇති, උතුම් වූ (ඉන්ද්‍රිය) දමනයට හා (ඉන්ද්‍රිය) ශමථයට පැමිණැ සිටි, (කයින්) දැමුණු (වචන යෙන්) රැකුණු (සිතින්) සංවර වූ ඉන්ද්‍රියයන් ඇති, (ඡන්දාදියෙන් අගතියට නොයන හෙයින්) නාග (ශ්‍රෙෂ්ඨ) වූ භාග්‍යවතුන් වහන්සේ දිටී ය. දැකැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේගේ දෙපාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් ධර්මයක් මට බොහෝ කාලයක් හිත පිණිස සුව පිණිස පවත්නේ ද, ඒ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මට දෙසන්වා. සුගතයන් වහන්සේ ධර්මය දෙසන්වා"යි කී ය.

එවං වුත්තෙ භගවා බාහියං දාරුචීරියං එතදවොච: 'අකාලො ඛො තාව බාහිය. අන්තරඝරං පවිට්ඨම්හා පිණ්ඩායා'ති.

දුතියම්පි ඛො බාහියො දාරුචීරියො භගවන්තං එතදවොච: "දුජ්ජානං ඛො පනෙතං භන්තෙ භගවතො වා ජීවිතන්තරායානං, මය්හං වා ජීවිතන්තරායානං. දෙසෙතු මෙ භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

දුතියම්පි ඛො භගවා බාහියං දාරුචීරියං එතදවොච: "අකාලො ඛො තාව බාහිය. අන්තරඝරං පවිට්ඨම්හා පිණ්ඩායා"ති.

තතියම්පි ඛො බාහියො දාරුචීරියො භගවන්තං එතදවොච: "දුජ්ජානං ඛො පනෙතං භන්තෙ, භගවතො වා ජීවිතන්තරායානං, මය්හං වා ජීවිතන්තරායානං. දෙසෙතු මෙ භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

තස්මාතිහ තෙ බාහිය, එවං සික්ඛිතබ්බං: "දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සතී"ති. එවං හි තෙ බාහිය, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ බාහිය, දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති. විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති, තතො ත්වං බාහිය න තෙන. යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්ථ. යතො ත්වං බාහිය න තත්ථ, තතො ත්වං බාහිය නෙවිධ, න හුරං, න උභයමන්තරෙ[1]. එසෙවන්තො දුක්ඛස්සා"ති.

3. අථ ඛො බාහියස්ස දාරුචීරියස්ස භගවතො ඉමාය සංඛිත්තාය ධම්මදෙසනාය තාවදෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි.

අථ ඛො භගවා බාහියං දාරුචීරියං ඉමිනා සංඛිත්තෙන ඔවාදෙන ඔවදිත්වා පක්කාමි.

අථ ඛො අචිරපක්කන්තස්ස භගවතො බාහියං දාරුචීරියං ගාවී තරුණවච්ඡා අධිපාතෙත්වා ජීවිතා වොරොපෙසි.

---

1 උභයමන්තරෙන. සී.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ බාහිය දාරුචීරියහට "පිඬු පිණිස ඇතුළු ගමට පිවිසියම්හ. එහෙයින් දැන් (බණ කීමට) නො කල් යැ"යි වදාළ සේක.

දෙවෙනි වරත් දාරුචීරිය බාහිය තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අන්තරායකර ධර්මයන්ගේ හෝ මගේ ජීවිතයට අන්තරායකර ධර්මයන්ගේ ඇති බව හෝ නැති බව දැනගත නො හැකි ය. (එහෙයින්) වහන්ස, යම් ධර්මයෙක් මට බොහෝ කලක් මුළුල්ලෙහි හිත පිණිස, සුව පිණිස (පවත්තේ නම්) ඒ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මට දෙසන්වා. සුගතයන් වහන්සේ ඒ ධර්මය දෙසන්වා යැ"යි කී ය.

දෙවෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ දාරුචීරිය බාහියහට "ඇතුළු ගමට පිඬු පිණිස පිවිසියම්හ. බාහියය, දැන් (බණ කීමට) නොකල් යැ"යි වදාළ සේක. තුන්වැනි වරත් දාරුචීරිය බාහිය තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අන්තරායකර ධර්මයන්ගේ හෝ මගේ ජීවිතයට අන්තරායකර ධර්මයන්ගේ හෝ (ඇති නැති බව) දැනගත නො හැකි ය. (එහෙයින්) වහන්ස, යම් ධර්මයෙක් මට බොහෝ කලක් මුළුල්ලෙහි හිත පිණිස, සුව පිණිස, පවත්නේ නම් ඒ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මට දෙසන්වා, සුගතයන් වහන්සේ ඒ ධර්මය දෙසන්වා"යි කී ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: 'එසේ නම් බාහියය, මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු ය: දක්නා ලද්දෙහි (රූපයෙහි) දක්නා ලද පමණක් වන්නේ ය. අසන ලද්දෙහි (ශබ්දයෙහි) අසන ලද්ද පමණක් වන්නේ ය. දන්නා ලද්දෙහි (=ගන්ධ රස ස්පෘෂ්ටව්‍යයන්හි) දන්නා ලද්ද පමණක් වන්නේ ය. සිතන ලද්දෙහි සිතන ලද්ද පමණක් වන්නේ ය. බාහියය, මෙසේ තොප විසින් හික්මිය යුතු ය.

"බාහියය, යම් කලෙක්හි (තොහොත්) යම් හේතුවෙකින් තොපට දක්නා ලද්දෙහි දක්නා ලද පමණක් වන්නේ ද, අසන ලද්දෙහි අසන ලද්ද පමණක් වන්නේ ද, දන්නා ලද්දෙහි දන්නා ලද්ද පමණක් වන්නේ ද, විශේෂයෙන් දන්නා ලද්දෙහි විශෙෂයෙන් දන්නා ලද්ද පමණක් වන්නේ ද, එකල්හි (තොහොත්) ඒ හෙතුවෙන් තෝ ඒ (රූපාදිය) හා නො බැඳුණු තැනැත්තෙක් (වන්නෙහි ය). බාහියය, යම් කලෙක්හි (තොහොත්) යම් හෙතුවෙකින් තෝ ඒ (රූපායතනාදිය) හා නොබැඳුණු තැනැත්තෙක් වන්නෙහි ද එකල්හි (තොහොත්) ඒ හෙතුවෙන් තෝ එහි නො බැඳුණු තැනැත්තෙක් (වන්නෙහි)ය. යම් කලෙක්හි (තොහොත්) යම් හෙතුවෙකින් බාහිය ය, තෝ එහි (=රූපායතනාදියෙහි) නො බැඳුණු තැනැත්තෙක් වන්නෙහි ද, එකල්හි (තොහොත්) ඒ හෙතුවෙන් බාහියය, තෝ මේලොව ද නො උපදින්නෙහි, පරලොව ද නො (උපදින්නෙහි), දෙ ලොවෙහි ම ද නො (උපදින්නෙහි). දුක පිළිබඳ කෙළවර මෙය ම වන්නේ ය"යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ මේ සංක්ෂිප්ත ධර්මදේශනාවෙන් එකෙණෙහි ම දාරුචීරිය බාහියයාගේ සිත උපාදාන රහිත වැ ආස්‍රවයන් කෙරෙන් මිදිණි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දාරුචීරිය බාහියහට මේ සංක්ෂිප්ත අව-වාදයෙන් අවවාද කොට වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් ළදරු වස්සකු ඇති දෙනක් දාරුචීරිය බාහියයා බිමැ හෙළා ජීවිතයෙන් තොර කළා ය.

අථ ඛො භගවා සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං නගරම්හා නික්ඛමිත්වා අද්දස බාහියං දාරුචීරියං කාලකතං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: "ගණ්හථ භික්ඛවෙ බාහියස්ස දාරුචීරියස්ස සරීරකං. මඤ්චකං ආරොපෙත්වා නීහරිත්වා ඣාපෙථ. ථූපඤ්චස්ස කරොථ. සබ්‍රහ්මචාරී වො භික්ඛවෙ කාලකතො"ති.

"එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා බාහියස්ස දාරුචීරියස්ස සරීරකං මඤ්චකං ආරොපෙත්වා නීහරිත්වා ඣාපෙත්වා ථූපඤ්චස්ස කරිත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "දඩ්ඪං භන්තෙ බාහියස්ස දාරුචීරියස්ස සරීරං. ථූපො චස්ස කතො. තස්ස කා ගති? කො අභිසම්පරායො?"ති.

"පණ්ඩිතො භික්ඛවෙ, බාහියො දාරුචීරියො පච්චපාදි ධම්මස්සානුධම්මං. න ච මං ධම්මාධිකරණං විහෙසෙසි. පරිනිබ්බුතො භික්ඛවෙ බාහියො දාරුචීරියො"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති,
න තත්ථ සුක්කා ජොතන්ති ආදිච්චො නප්පකාසති,
න තත්ථ චන්දිමා භාති තමො තත්ථ න විජ්ජති.

යදා ච අත්තනා වෙදී මුනි මොනෙන බ්‍රාහ්මණො,
අථ රූපා අරූපා ච සුඛදුක්ඛා පමුච්චතී"ති.

අයම්පි උදානො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**බොධිවග්ගො පඨමො.**

**තස්සුද්දානං** භවති:

තයො ච බොධි නිග්‍රොධො තෙ ථෙරා කස්සපෙන ච,
පාවාය සඞ්ගාමජි ජටිලා බාහියෙන තෙ දසාති.

---

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස හැසිර බතින් පසු (පස්වරුවෙහි) පිණ්ඩපාතයෙන් වැළකුණු සේක්, බොහෝ භික්ෂූන් සමග නුවරින් නික්මැ, කලුරිය කළ දරුචීරිය බාහියයා දුටු සේක. දැකැ භික්ෂූන් ඇමැතූ සේක: “මහණෙනි, දරුචීරිය බාහියයාගේ ශරීරය ගනුව. ඇදෙක තංවා බැහැර ගෙන ගොස් දවව. ඔහුට සතූපයක් ද කරව. මහණෙනි, තොපගේ සබ්‍රහමචාරියෙක් කලුරිය කෙළේ යැ”යි වදාළ සේක.

‘ස්වාමීනි, එසේයැ’යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, දරුචීරිය බාහියයාගේ ශරීරය ඇදෙක තංවා බැහැර ගෙන ගොස් දවා, ඔහුට සතූපයක් ද කොට, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෝ ය.

එළැඹැ භාග්‍යවතුන් වහන්සේ වැඳැ එක්පසෙක හුන්හ. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගෙන් “ස්වාමීනි, බාහිය (නම්) දරුචීරිය (භික්ෂූහු)ගේ ශරීරය දවන ලද්දේය. ඔහුගේ සතූපය ද කරන ලද්දේ ය. ඔහුගේ ගතිය කවර? අභිසම්පරාය (පරලොව) කවරේ දැ?”යි මෙසේ විචාළහ:

“මහණෙනි, බාහිය දරුචීරිය පණ්ඩිතයෙක (ලොකොත්තර) ධර්මය පිළිබඳ අනුධර්මයට (ශීල විශුද්ධි ආදි ප්‍රතිපද්ධර්මයට) පිළිපන්නේ ය. ධර්මය නිසා මා නො වෙහෙසී ය මහණෙනි, බාහිය දරුචීරිය තෙමේ පිරිනිවියේ යැ”යි වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි මේ උදානය (ප්‍රීති වාක්‍යය) පහළ කළ සේක:

“යම් නිර්වාණ ධාතුවෙක අපොධාතුව ද පෘථිවී ධාතුව ද තෙජො ධාතුව ද වායොධාතුව ද නො පිහිටා ද, එහි තාරකාවෝ නො බබළති, සූර්යයා නො බබළයි, එහි චන්ද්‍රයා නො බබළයි, එහි අන්ධකාරය නැත. මෞන සඞ්ඛ්‍යාත මාර්ග ඥානයෙන් (යුක්ත හෙයින්) මුනි (නම්) වූ බ්‍රාහමණ තෙමේ යම් කලෙක්හි තෙමේ ම (නිර්වාණය) අවබොධ කෙළේ ද, එකල්හි රූපලොක-ප්‍රතිසන්ධියෙන් ද, අරූපලොකප්‍රතිසන්ධියෙන් ද, සුඛ දුඃඛ සඞ්ඛ්‍යාත කාමා-වචරප්‍රතිසන්ධියෙන් ද මිදේ”.

මේ උදානය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදැ යි මා විසින් අසන ලදී.

**පළමුවන බොධි වර්ගය යි.**

එහි **උද්දානය**:

බොධි සූත්‍ර තුන ද, නිග්‍රොධ සූත්‍රය, ස්ථවිර සූත්‍රය, කාශ්‍යප සූත්‍රය, පාවා සූත්‍රය, සඞ්ගාමජි සූත්‍රය, ජටිල සූත්‍රය, බාහිය සූත්‍රය යන මෙයින් ඒ සූත්‍ර දසයෙක් වේ.

# මුචලින්දවග්ගො දුතියො

## 2. 1.

## මුචලින්දසුත්තං.

එවං මෙ සුතං: එකං සමයං භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ **මුචලින්ද**මූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති, විමුත්තිසුඛපටිසංවෙදී.

තෙන ඛො පන සමයෙන මහා අකාලමෙඝො උදපාදි සත්තාහවද්දලිකා සීතවාතදුද්දිනී. අථ ඛො **මුචලින්දො** නාගරාජා සකභවනා නික්ඛමිත්වා භගවතො කායං සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරි මුද්ධනි මහන්තං ඵණං විහච්ච අට්ඨාසි: "මා භගවන්තං සීතං, මා භගවන්තං උණ්හං, මා භගවන්තං ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සො"ති. අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨාසි.

අථ ඛො මුචලින්දො නාගරාජා විද්ධං විගතවලාහකං දෙවං විදිත්වා භගවතො කායා භොගෙ විනිවෙඨෙත්වා සකවණ්ණං පටිසංහරිත්වා මාණවකවණ්ණං අභිනිම්මිනිත්වා භගවතො පුරතො අට්ඨාසි පඤ්ජලිකො භගවන්තං නමස්සමානො.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

සුඛො විවෙකො තුට්ඨස්ස සුතධම්මස්ස පස්සතො
අබ්‍යාපජ්ජං[1] සුඛං ලොකෙ පාණභූතෙසු සංයමො.

සුඛා විරාගතා ලොකෙ කාමානං සමතික්කමො
අස්මිමානස්ස යො විනයො එතං වෙ පරමං සුඛන්ති.[2]

## 2. 2.

## රාජසුත්තං.

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තානං උපට්ඨානසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි:

"කො නු ඛො ආවුසො ඉමෙසං ද්වින්නං රාජූනං මහද්ධනතරො වා මහාභොගතරො වා මහාකොසතරො වා මහාවිජිතතරො වා මහාවාහනතරො වා මහබ්බලතරො වා මහිද්ධිකතරො වා මහානුභාවතරො වා රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො, රාජා වා පසෙනදි කොසලො"ති. අයඤ්චරහි තෙසං භික්ඛූනං අන්තරා කථා හොති විප්පකතා.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා සන්නිපතිතා, කා ච පන වො අන්තරා කථා විප්පකතා?"ති.

1. අබ්‍යාපජ්ඣං-සතප.

2. සුඛො විවෙකස්තුෂ්ටස්‍ය ශ්‍රුතධර්මස්‍ය පශ්‍යතඃ
අව්‍යාබාධ්‍යං සුඛං ලොකෙ ප්‍රාණිභූතෙෂු සංයමඃ
සුඛා විරාගතා ලොකෙ කාමානාං සමතික්‍රමඃ
අස්මින් මානස්‍ය විනය එතද්වෙ පරමං සුඛම් (ලලිතවිස්තර)

# දෙවෙනි මුචලින්ද වර්ගය

## 2. 1.

## මුචලින්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බුදු ව පළමු කොට **උරුවෙල්දනව්වෙහි නේරඤ්ජරා** නදීතීරයෙහි **මිදෙල්ල** ගස මුල වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පලසමවත්සුව විඳිනා සේක්, සත්දවසක් මුළුල්ලෙහි එක්පලඟින් වැඩහුන් සේක.

එසමයෙහි සිහිල්පවනින් වැලලී වූ සද්දූ වදුලු ඇති මහ අකල් වැස්සෙක් උපන. ඉක්බිති මුදලිඳු නාරජ සිය බවනෙන් නික්මැ අවුත්, භාග්‍යවතුන් වහන්සේ කරා ශීතයෙක් නො පැමිණේවා. භාග්‍යවතුන් වහන්සේ කරා උෂ්ණයෙක් නො පැමිණේවා. භාග්‍යවතුන් වහන්සේ කරා මැසි මදුරු වා අවු දිග්දූ (දීඝජාතිකයන්ගේ) පහසෙක් නො වේවා' යි භාග්‍යවතුන් වහන්සේගේ සිරුර සත්වරක් දරණවැලින් වට කොට, හිස මතැ මහත් පෙණය කොට, සිටියේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත්දවස ඇවෑමෙන් ඒ සමාධියෙන් නැඟී සිටි සේක.

ඉක්බිති මුදලිඳු නාරජ පහ වැ ගිය වලාකුළු ඇති අහස පිරිසිදු වූවා දැනැ බුදුරජුන් සිරුරෙන් දරණවැල ඉවත් කොට සවකීය වෙශය අතුරුදහන් කොට කුමරවෙසක් මවා ගෙන බුදුරජුන් ඉදිරියෙහි බඳැඳිලි ව බුදුරජුන් දිසාවට වැඳ ගෙන සිටියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි මේ උදන් ඇනූ සේක:

(චතුර්මාර්ගඥානසන්තොෂයෙන්) සතුටු වූ, පහළ කරන ලද (නිවන්) දහම් ඇති, (නුවණැසින්) දක්නා වූ රහතුන් වහන්සේට (නිර්වාණ සඞ්ඛ්‍යාත උපධි) විවේකය සැප යි. නො කිපෙන බව සැප යි. ලොවැ සතුන් කෙරෙහි අවිහිංසාව සැප යි.

ලෝකයෙහි කාමයන්ගේ (යම්) ඉක්මීමෙක් වේ නම් ඒ විරාගතාව සැප යි. අස්මිමානයාගේ යම් දුරු කිරීමෙක් වේ නම් මේ (රහත්බව) උතුම් සැපය යි.

## 2. 2.

## රාජසූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එ සමයෙහි පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළැකුණු, දම්සබා මඩුවෙහි හුන්නාවූ, (ඒ ඒ තැනින්) රැස් වූ බොහෝ භික්ෂූන් අතර මේ අතුරු කථාව උපන:

"ඇවැත්නි, මගධාධිපති සේනිය බිම්බිසාර රජ හෝ කොශලාධිපති පසේනදි රජ හෝ (යන) මේ දෙ රජුන් අතුරෙන් කවරෙක් අතිශයින් මහද්ධන ඇත්තේ හෝ අතිශයින් මහද්භොග ඇත්තේ හෝ අතිශයින් මහත් භාණ්ඩාගාර ඇත්තේ හෝ අතිශයින් මහත් විජිත ඇත්තේ හෝ අතිශයින් මහත් වාහන ඇත්තේ හෝ අතිශයින් මහත් බල ඇත්තේ හෝ අතිශයින් මහත් ඍද්ධි ඇත්තේ හෝ අතිශයින් මහත් අනුභාව ඇත්තේ හෝ වේ ද?" යනු යි. ඒ භික්ෂූන්ගේ මේ අතුරු කථාව වූ කලි කොට අඩාල වූයේ වෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැඟී සිටි සේක්, දම්සබාමඩුව වෙත වැඩි සේක. වැඩැ පණවන ලද අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ (එහි) වැඩැ හිඳැ, "මහණෙනි, (තෙපි) දැන් මෙහි රැස් වූවාහු කවර නම් කථාවෙකින් යුක්ත ව හුන්නාහු ද? තොපගේ අඩාළ වූ අතුරු කථාව කවර ද"යි භික්ෂූන් ඇමැතූ සේක.

ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨාන-සාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "කො නු ඛො ආවුසො ඉමෙසං ද්වින්නං රාජූනං මහද්ධනතරො වා මහාභොගතරො වා මහාකොසතරො වා මහාවිජිතතරො වා මහාවාහනතරො වා, මහබ්බල-තරො වා මහිද්ධිකතරො වා මහානුභාවතරො වා, රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො, රාජා වා පසෙනදී කොසලො'ති. අයං ඛො නො භන්තෙ අන්තරාකථා විප්පකතා, අථ ඛො භගවා අනුප්පත්තො?"ති.

"න ඛ්වෙතං භික්ඛවෙ තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං, යං තුම්හෙ එවරූපිං කථං කථෙය්‍යාථ. සන්නි-පතිතානං වො භික්ඛවෙ ද්වයං කරණීයං ධම්මී වා කථා අරියො වා තුණ්හී-භාවො"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යඤ්ච කාමසුඛං ලොකෙ යඤ්චිදං දිවියං සුඛං,
තණ්හක්ඛයසුඛස්සෙතෙ කලං නාග්ඝන්ති සොළසි"න්ති.

## 2. 3.

## දණ්ඩසුත්තං.

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන සම්බහුලා කුමාරකා අන්තරා ච සාවත්ථිං අන්තරා ච ජෙතවනං අහිං දණ්ඩෙන හනන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සම්බහුලෙ කුමාරකෙ අන්තරා ච සාවත්ථිං අන්තරා ච ජෙතවනං අහිං දණ්ඩෙන හනන්තෙ.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං.

සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛ"න්ති.

ස්වාමීනි, මෙහි පස්වරුයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණු දම්සබා මඩුවෙහි (ඒ ඒ තැනින්) රැස් වූ අප අතර, "ඇවැත්නි, මගධාධිපති සේනිය බිම්බිසාර රජ හෝ කෝශලාධිපති පසේනදි රජ හෝ (යන) මේ දෙ රජුන් අතුරෙන් කවරෙක් අතිශයින් මහද්ධන ඇත්තේ හෝ අතිශයින් මහද්භෝග ඇත්තේ හෝ, අතිශයින් මහත් භාණ්ඩාගාර ඇත්තේ හෝ, අතිශයින් මහත් විජිත ඇත්තේ හෝ, අතිශයින් මහත් වාහන ඇත්තේ හෝ, අතිශයින් මහත් බල ඇත්තේ හෝ අතිශයින් මහත් සෘද්ධි ඇත්තේ හෝ අතිශයින් මහත් අනුභාව ඇත්තේ හෝ වේ දැ" යි මේ අතුරු කථාව උපන. ස්වාමීනි, අපගේ මේ අතුරු කථාව අඩාළ විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩ වදාළ සේක" යි කීහු.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: "මහණෙනි, තෙපි මෙබඳු කථා කරන්නහුය යන යමෙක් ඇද්ද, එය ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්මැ ශාසනයට පැමිණි කුලපුත්‍ර වූ තොපට සුදුසු නො වෙයි. මහණෙනි, (යම් තැනකට) රැස්වූ තොප විසින් දෙකක් කටයුතු ය: දැහැමි කථාව හෝ ආර්‍ය්‍ය වූ තුෂ්ණීම්භාවය හෝ යි".

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"ලෝකයෙහි යම් කාම සැපයෙක් වේ ද, යම් මේ දෙව්ලොව උපදනා (දෙවියන්ගේ ද මනුෂ්‍යයන්ගේ ද රූපසම්පත්ති) සැපයෙක් වේ ද, මේ (සියලු) සැප තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිවන් සැපයාගේ සොළොස් කලාවෙන් කලාවක් ද නො අගනේ ය" යනු යි.

## 2. 3.

## දණ්ඩසූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජෙතවන** නම් වූ, **අනේපිඩු** සිටුහු ගේ **ආරාමයෙහි** වැඩ වසන සේක.

එසමයෙහි බොහෝ කුඩා දරුවෝ සැවැත්නුවරටත් ජෙතවනයටත් අතරෙහි දී නයකු දණ්ඩෙකින් පෙළත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පා සිවුරු ගෙනැ සැවැත්නුවරට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරටත් ජෙතවනයටත් අතරෙහි නාගයකු දණ්ඩෙකින් පෙළන ඒ බොහෝ කුඩා දරුවන් දුටු සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැනැ ඒ වෙලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"යමෙක් තමාහට සුව සොයන්නේ, සුව කැමැති සතුන් දඬුවමින් පෙළා ද, හේ පරලොවැ සුවක් නො ලබයි.

යමෙක් තමාගේ සුව සොයන්නේ සුව කැමැති සතුන් දඬුවමින් නො පෙළා ද, හෙ තෙමේ පරලොවැ සුව ලබයි".

## 2. 4.

### සක්කාරසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරානං. භික්ඛුසඞ්ඝො'පි සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරානං.

අඤ්ඤතිත්ථියා පන පරිබ්බාජකා අසක්කතා හොන්ති අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා, න ලාභිනො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙ-සජ්ජපරික්ඛාරානං. අථ ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා භගවතො සක්කාරං අසහමානා භික්ඛුසඞ්ඝස්ස ච, ගාමෙ ච අරඤ්ඤෙ ච භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති විහෙසෙන්ති.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

"එතරහි භන්තෙ භගවා සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. භික්ඛුසඞ්ඝො'පි සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අඤ්ඤතිත්ථියා පන පරිබ්බාජකා අසක්කතා අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා, න ලාභිනො[1] චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං.

අථ ඛො තෙ භන්තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා භගවතො සක්කාරං අසහමානා භික්ඛුසඞ්ඝස්ස ච, ගාමෙ ච අරඤ්ඤෙ ච භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති විහෙසෙන්තී"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ගාමෙ අරඤ්ඤෙ සුඛදුක්ඛඵුට්ඨො
නෙවත්තතො නො පරතො දහෙථ[2]
ඵුසන්ති ඵස්සා උපධිං පටිච්ච
නිරූපධිං කෙන ඵුසෙය්‍යුං ඵස්සාති.

1. අලාභිනො, සී. 2. රංහථ, සෑව්

## 2. 4.

## සත්කාරසූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ සත්කාර කරන ලද්දාහු, ගුරුකාර කරන ලද්දාහු, බුහුමන් කරන ලද්දාහු, පුදන ලද්දාහු, අපචායන කරන ලද්දාහු, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන් ලබන සුලු වූවාහු වෙති. භික්ෂුසඞ්ඝයා ද සත්කාර කරන ලද්දේ, ගුරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ, පුදන ලද්දේ, අපචායන කරන ලද්දේ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයන් ලබන සුලු වූයේ වෙයි.

අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ වූ කලි සත්කාර නො කරන ලද්දාහු, ගුරුකාර නො කරන ලද්දාහු, බුහුමන් නො කරන ලද්දාහු, නො පුදන ලද්දාහු, අපචායනය නො කරන ලද්දාහු, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන් නො ලබන සුලු වෙති. යළි ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂුසඞ්ඝයාට ද (කරනු ලබන) සත්කාර නො ඉවසන්නෝ, ගමෙහි ද වෙනෙහි ද භික්ෂූන් දැක අසභ්‍ය වූ කර්කශ වූ වචනවලින් ආක්‍රොශ කෙරෙති. තර්ජනය කෙරෙති. දොස් කියති. වෙහෙසති.

ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියෝ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නෝ ය. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට, මෙපවත් සැළ කළහ:

“ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේ සත්කාර කරන ලද සේක්, ගුරුකාර කරන ලද සේක්, බුහුමන් කරන ලද සේක්, පුදන ලද සේක්, අපචායනය කරන ලද සේක්, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයන් ලබන සුලු සේක් වෙති. භික්ෂුසඞ්ඝයා ද සත්කාර කරන ලද්දේ, ගුරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ පුදන ලද්දේ, අපචායනය කරන ලද්දේ, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලාන-ප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයන් ලබන සුලු වෙයි. අන්‍යතීර්ථක-පරිව්‍රාජකයෝ වූ කලි සත්කාර නො කරන ලද්දාහු, ගුරුකාර නො කරන ලද්දාහු, බුහුමන් නො කරන ලද්දාහු, නො පුදන ලද්දාහු, අපචායනය නො කරන ලද්දාහු, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය-පරිෂ්කාරයන් නො ලබන සුලු වෙති. වැළි දු ස්වාමීනි, ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේට ද, භික්ෂුසඞ්ඝයාට ද (කරනු ලබන) සත්කාර නො ඉවසන්නාහු ගමෙහි ද, වෙනෙහි ද, භික්ෂූන් දැක අසභ්‍ය වූ, කර්කශ වූ, වචනයෙන් ආක්‍රොශ කෙරෙති, තර්ජනය කෙරෙත්, දොස් කියති, වෙහෙසති” යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:'

ගමෙහි හෝ වෙනෙහි සුව දුක් දෙකින් ස්පර්ශ කරන ලද්දේ (හෙවත්) සුව දුක් විඳින්නේ තමාගේ වශයෙන් හෝ මෙරමාගේ වශයෙන් හෝ නො සලකන්නේ ය. (සුව දුක් වශයෙන් විඳිද යුතු) ස්පර්ශයෝ (ඛන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත) උපධිය නිසා ස්පර්ශ කෙරෙති. ස්පර්ශයෝ උපධි රහිත තැනැත්තහු කිමෙකින් ස්පර්ශ කෙරෙත් ද. (නො කෙරෙත් ම ය.)

## 2. 5.

### උපාසකසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ඉච්ඡානඞ්ගලකො උපාසකො සාවත්ථිං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සො උපාසකො සාවත්ථියං තං කරණීයං තීරෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං උපාසකං භගවා එතදවොච: "චිරස්සං ඛො ත්වං උපාසක, ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනායා"ති.

"චිරපටිකාහං භන්තෙ භගවන්තං දස්සනාය උපසඞ්කමිතුකාමො, අපි චාහං කෙහිචි කෙහිචි කිච්චකරණීයෙහි ව්‍යාවටො. එවාහං නාසක්ඛිං භගවන්තං දස්සනාය උපසඞ්කමිතු"න්ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

සුඛං වත තස්ස න හොති කිඤ්චි
සඞ්ඛාතධම්මස්ස බහුස්සුතස්ස,
සකිඤ්චනං පස්ස විහඤ්ඤමානං
ජනො ජනස්මිං පටිබද්ධරූපො[1]ති.

## 2. 6.

### ගබ්භිනිසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පරිබ්බාජකස්ස දහරා මාණවිකා පජාපතී හොති ගබ්භිනී උපවිජඤ්ඤා.

අථ ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහාර, යං මෙ විජාතාය භවිස්සතී"ති. එවං වුත්තෙ සො පරිබ්බාජකො තං පරිබ්බාජිකං එතදවොච: "කුතො පනාහං හොති තෙලං ආහරාමී"ති. දුතියම්පි ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහර, යං මෙ විජාතාය භවිස්සතී"ති. දුතියම්පි ඛො සො පරිබ්බාජකො තං පරිබ්බාජිකං එතදවොච: "කුතො පනාහං හොති තෙලං ආහරාමී"ති. තතියම්පි ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහර, යං මෙ විජාතාය භවිස්සතී"ති.

1 පටිබන්ධරූපො. සී. මු.

## 2. 5.

## උපාසක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයේ වූ **ජේතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එසමයෙහි **ඉච්ඡානඞ්ගල** නම් බමුණුගමැ වැසි එක්තරා උපාසකයෙක් කිසි යම් කටයුත්තෙකින් සැවැත්නුවරට පැමිණියේ ය. ඉක්බිති ඒ උපාසක තෙමේ සැවැත්නුවර ඒ කටයුත්ත නිමවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය එළැඹ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ උපාසකයාට භාග්‍යවතුන් වහන්සේ උපාසකයෙනි, තෙපි බොහෝ කලෙකින් මෙහි පැමිණියහු යැ''යි වදාළ සේක.

''ස්වාමීනි, මම් බොහෝ කලෙක පටන් භාග්‍යවතුන් වහන්සේ දකින්නට එනු කැමැත්තෙම් වීමි. එසේ වුවත් මම යම් යම් කුදු මහත් කටයුතුවල යෙදී සිටියෙමි. මේ හෙයින් ම මට භාග්‍යවතුන් වහන්සේ දකින්නට එන්නට නො හැකි වී යැ''යි. ඊවසු කී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

''යමකුට (රාගාදි) පළිබොධයෙක් නැත් ද, මනා කොට සිඳ්ධ කරන ලද (මාගී) ධම් ඇති, (එහෙයින්ම ප්‍රතිවෙධ බහුශ්‍රැතභාවයෙන්) බහුශ්‍රැත වූ, ඒ ක්ෂීණාස්‍රවයාට එකාන්තයෙන් සුවෙකි. එහෙත් ම පෙළෙන (රාගාදි) පළිබොධ සහිත පුද්ගලයා බලව. ජන තෙමේ (අන්‍ය) ජනයා කෙරෙහි බැඳී ගිය ස්වභාව ඇත්තේය.''

## 2. 6.

## ගර්භිනී සූත්‍රය

**මා විසින් මෙසේ** අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් **අනේපිඩු** සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එ සමයෙහි එක්තරා පරිව්‍රාජකයකුගේ තරුණ වූ මෙණෙවියක් (බමුණුදුවක්) භාර්‍යා වූවා, හටගත් දරුගප් ඇත්තී (අද හෙටැයි) එළැඹ සිටි වදන කල්ඇත්තී වෙයි.

ඉක්බිති ඒ පරිව්‍රාජිකාව පරිව්‍රාජකයාහට, ''බ්‍රාහමණය තෝ යා. යම් ඒ තෙලක් වැදූ මට උපකාර වේ ද එබඳු තෙලක් ගෙනෑ එව''යි මෙ බස් කිවු ය. මෙසේ කී කල්හි ඒ පරිව්‍රාජක තෙමේ ඒ පරිව්‍රාජිකාවට ''පින්වතිය, මම කොයින් තෙල් ගෙන එන්නෙම් ද?'' යි කී ය. දෙවෙනි වරත් ඒ පරිව්‍රාජිකාව ඒ පරිව්‍රාජකයාට, ''බ්‍රාහමණය, තෝ යා. යම් තෙලක් වැදූ මට උපකාර වේ ද, එබඳු තෙලක් ගෙනෙව''යි කිවු ය. දෙවෙනි වරත් ඒ පරිව්‍රාජක තෙමේ ඒ පරිව්‍රාජිකාවට ''පින්වතිය, මම් කොයින් තෙල් ගෙන එන්නෙම්ද?''යි කී ය තුන්වන වරත් ඒ පරිව්‍රාජිකාව ඒ පරිව්‍රාජකයාට ''බ්‍රාහමණය, තෝ යා. යම් තෙලක් වැදූ මට උපකාර වේ නම් එබඳු තෙලක් ගෙනෙව''යි කිවු ය.

2. තෙන ඛො පන සමයෙන රඤ්ඤො **පසෙනදිස්ස** කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දීයති නො නීහරිතුං.

අථ ඛො තස්ස පරිබ්බාජකස්ස එතදහොසි: "රඤ්ඤො ඛො පන[1] පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දීයති නො නීහරිතුං. යන්නූනාහං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා උග්ගිරිත්වාන[2] දදෙය්‍යං, යං ඉමිස්සා විජාතාය භවිස්සතී"ති.

අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො. සො දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො ආවට්ටති, පරිවට්ටති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා තං පරිබ්බාජකං දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨං ආවට්ටමානං පරිවට්ටමානං.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

සුඛිනො වත යෙ අකිඤ්චනා
වෙදගුනො හි ජනා අකිඤ්චනා,
සකිඤ්චනං පස්ස විහඤ්ඤමානං
ජනො ජනස්මිං පටිබද්ධචිත්තො[3]ති.

## 2. 7.

## **එකපුත්තසුත්තං.**

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස උපාසකස්ස එකපුත්තකො පියො මනාපො කාලඞ්කතො හොති. අථ ඛො සම්බහුලා උපාසකා අල්ලවත්ථා අල්ලකෙසා දිවා දිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ උපාසකෙ භගවා එතදවොච: "කින්නු ඛො තුම්හෙ උපාසකා, අල්ලවත්ථා අල්ලකෙසා ඉධූපසඞ්කන්තා දිවා දිවස්සා"ති.

එවං වුත්තෙ සො උපාසකො භගවන්තං එතදවොච: "මය්හං ඛො භන්තෙ එකපුත්තකො පියො මනාපො කාලඞ්කතො. තෙන මයං අල්ලවත්ථා අල්ලකෙසා ඉධූපසඞ්කන්තා දිවා දිවස්සා"ති.

---

1. රඤ්ඤා ඛො. මජසං. 2 උච්ඡාදිත්වා. අට්ඨකථා. උච්ඡඩ්ඩිත්වාන. මජසං. 3 පටිබන්ධ-චිත්තා සී.මු.

එසමයෙහි පසේනදි කොසොල් රජුගේ කොෂ්ඨාගාරයෙහි ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට ගිතෙල් හෝ තලතෙල් ආදි තෙල් හෝ ඇති තාක් බොන්නට දෙනු ලැබේ. බැහැර ගෙනා යන්නට නො දෙනු ලැබේ.

ඉක්බිති ඒ පරිව්‍රාජකයාහට "පසේනදි කොසොල් රජුගේ කොෂ්ඨාගාර යෙහි ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට හෝ ගිතෙල් හෝ (තලතෙල් ආදි) තෙල් හෝ ඇති තාක් බොන්නට දෙනු ලැබේ. බැහැර ගෙනා යන්නට නො දෙනු ලැබේ. යම් හෙයෙකින් මම පසේනදි කොසොල් රජුගේ කොෂ්ඨාගා- රයට ගොස් යම් ඒ තෙලක් වැදූ මැයට උපකාර පිණිස වන්නේ නම්, ඒ තෙල් ඇති තාක් බී ගෙට අවුත් වමාරා දෙන්නෙම් නම් මැනැවැ"යි මෙබඳු සිතෙක් විය.

ඉක්බිති ඒ පරිව්‍රාජක තෙමේ පසේනදි කොසොල් රජුගේ කොෂ්ඨාගාරයට ගොස් තෙල් ඇති තාක් බී ගෙට අවුත් වමාරන්නට ද නො හැකි වෙයි. විරේක කරන්නට ද නො හැකි වෙයි. හේ දුක් වූ, තියුණු වූ, කර්කශ වූ, කටුක වූ, වේදනාවන්ගෙන් ස්පර්ශ කරන ලද්දේ ඔබ මොබ පෙරළෙයි. හාත්පස පෙරළෙයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පෙරව පාසිවුරු ගෙනා සැවැත් නුවරට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ දුක් වූ, තියුණු වූ, කර්කශ වූ, කටුක වූ, වේදනාවන්ගෙන් ස්පර්ශ කරන ලද, ඔබ මොබ පෙරළෙන, හාත්පස පෙරළෙන, ඒ පරිව්‍රාජකයා දුටු සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"යම් කෙනෙක් (රාගාදි) පළිබොධ නැත්තාහු ද (ඔහු) ඒකාන්තයෙන් සුඛිත වෙත්. (ආර්‍ය මාර්ග සඞ්ඛ්‍යාත) වේදයෙන් (නිවනට) පැමිණි ඒ ක්ෂීණා- ස්‍රවයෝ තුමූ ඒකාන්තයෙන් (රාගාදි) පළිබොධ නැතියව්හ. ජන තෙමේ (අන්‍ය) ජනයා කෙරෙහි බැඳී ගිය සිත් ඇත්තේ ය. (එහෙයින්) දුකට පැමිණෙන (රාගාදි) පළිබොධ සහිත පුද්ගලයා බලව."

## 2. 7.

## ඒකපුත්‍ර සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර සමීපයෙහි ජේතවන** නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වසන සේක.

එසමයෙහි එක්තරා උපාසකයකු ගේ ප්‍රිය වූ මනාප වූ එක ම පුත්‍රයා කලුරිය කෙළේ වෙයි. ඉක්බිති බොහෝ උපාසකයෝ තෙත් වූ වස්ත්‍ර ඇත්තාහු තෙත් වූ කෙස් ඇත්තාහු මධ්‍යාහ්න වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියෝ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නෝ ය. භාග්‍යවතුන් වහන්සේ එකත්පසෙක හුන්නාවූ ඒ උපාසකයනට "උපාසකයිනි, කවර හෙයෙකින් තෙපි මධ්‍යාහ්නවේලා- වෙහි තෙත් වූ වස්ත්‍ර ඇත්තාහු තෙත් වූ කෙස් ඇත්තාහු මෙහි පැමිණි- යහු දැ?" යි අසා වදාළ සේක.

මෙසේ වදාළ කල්හි ඒ උපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මට ප්‍රිය වූ මනාප වූ එක ම පුත්‍රයෙක් විය. ඒ පුත්‍රයා කලුරිය කෙළේ ය. ඒ හේතුවෙන් අපි තෙත් වූ වස්ත්‍ර ඇත්තමෝ, තෙත් වූ කෙස් ඇත්තමෝ මධ්‍යාහ්නවේලාවෙහි මෙහි පැමිණියම්හ යි කී ය.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

පියරූපස්සාදගධිතාසෙ[1] දෙවකායා පුථූ මනුස්සා ච,
අඝාවිනො පරිජුන්නා මච්චුරාජස්ස වසං ගච්ඡන්ති.

යෙ වෙ දිවා ච රත්තො ච අප්පමත්තා ජහන්ති පියරූපං,
තෙ වෙ ඛනන්ති අඝමූලං මච්චුනො ආමිසං දුරතිවත්තන්ති.

## 2. 8.

## සුප්පවාසාසුත්තං.

එවං මෙ සුතං: එකං සමයං භගවා **කුණ්ඩියායං**[2] විහරති **කුණ්ඩධානවනෙ.** තෙන ඛො පන සමයෙන **සුප්පවාසා** කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙති සත්තාහං මූළ්හගබ්භා. සා දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨා තීහි විතක්කෙහි අධිවාසෙති:

"සම්මාසම්බුද්ධො වත සො භගවා ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය ධම්මං දෙසෙති, සුප්පටිපන්නො වත තස්ස භගවතො සාවකසඞ්ඝො, යො ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය පටිපන්නො. සුසුඛං වත තං නිබ්බානං යත්ථිදං[3] එවරූපං දුක්ඛං න සංවිජ්ජතී"ති.

අථ ඛො සුප්පවාසා කොලියධීතා සාමිකං ආමන්තෙසි: "එහි ත්වං අය්‍යපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: "සුප්පවාසා භන්තෙ කොලියධීතා භගවතො පාදෙ සිරසා වන්දති. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී"ති. එවඤ්ච වදෙහි: "සුප්පවාසා භන්තෙ කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙති, සත්තාහං මූළ්හගබ්භා. සා දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨා තීහි විතක්කෙහි අධිවාසෙති: "සම්මාසම්බුද්ධො වත සො භගවා, යො ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය ධම්මං දෙසෙති. සුප්පටිපන්නො වත තස්ස භගවතො සාවකසඞ්ඝො, යො ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය පටිපන්නො. සුසුඛං වත තං නිබ්බානං, යත්ථිදං එවරූපං දුක්ඛං න සංවිජ්ජතී"ති.

1 පියරූපා සාතගධිතාසෙ-සී 2. කුණ්ඩිකායං-මජසං. 3. යදිදං-මජසං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

ප්‍රිය සවභාවය ඇති රූපසකන්ධාදීන්හි (සුබ) වේදනාසවාදයෙන් බැඳී-ගිය සිත් ඇති බොහෝ (චාතුර්මහාරාජිකාදි) දෙවසමූහයෝ ද, මනුෂ්‍යයෝ ද (කායික චෛතසික දුකින්) දුඃඛිත වූවාහු (රෝගාදි විපත්තියෙන් හා යෞවනාරෝග්‍යාදි සම්පත්තියෙන් ද) පිරිහුනාහු මෘත්‍යුරජයාගේ වශයට යෙති.

යම් කිසි කෙනෙක් දහවල්හි ද, රාත්‍රියෙහි ද අප්‍රමත්ත ද, ඔවුහු ඒකාන්තයෙන් ප්‍රියරූපය දුරු කෙරෙති. ඔවුහු මාරයාගේ ආමිෂය වූ (මේ ශාසනයෙන් පිටත කිසිවකු විසිනුත්) ඉක්මෙන්නට නොහැකි දුකට මුල් වූ තෘෂ්ණාව ඒකාන්තයෙන් සාරා දමත්.

## 2. 8.

## සුප්‍රවාසා සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **කුණ්ඩියා** (නම්) නගරය සමීපයෙහි **කුණ්ඩධාන** (නම්) වනයෙහි වැඩ වසන සේක. එසමයෙහි **සුප්පවාසා** නම් කෝලිය දුහිතෘ තොමෝ සත් වසක් මුළුල්ලෙහි ගර්භයක් දරයි: සත්දවසක් මුළුල්ලෙහි මූඪගර්භ ව සිටියි. ඕ තොමෝ දුක් වූ තියුණු වූ කර්කශ වූ කටුක වූ, වේදනාවන්ගෙන් ස්පර්ශ කරන ලද්දී ත්‍රිවිධ විතර්කයන් කරණ කොට ගෙන ඉවසනු හැකි වෙයි:

"යම් කෙනෙක් මෙබඳු මේ දුක දුරු කිරීම පිණිස දහම් දෙසන සේක් ද, ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධයහ. යමෙක් මෙබඳු මේ දුක දුරු කිරීම පිණිස පිළිපන්නෝ ද, ඒ භාග්‍යවතුන් වහන්සේගේ සඞ්ඝ තෙමේ ඒකාන්තයෙන් සුපිළිපන්නේ ය. යම් නිවනෙක මෙබඳු මේ දුකෙක් නො මැත්තේ ද, ඒ නිවන ඒකාන්තයෙන් උතුම් ම සුවය" යනු ත්‍රිවිධ විතර්කය යි.

ඉක්බිති සුප්පවාසා කෝලිය දුහිතෘ තොමෝ හිමියා අමතා, "ආර්‍ය්‍යපුත්‍රය, මුඹ (මෙහි) එන්න: භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹෙන්න. එළැඹ මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ පා වඳින්න. ආබාධ නැති නියා ද, රෝග නැති නියා ද, සැහැල්ලු පැවැතුම් ඇති නියා ද, (ශරීර) බලය ද, පහසු විහරණය ද විචාරන්න. "සවාමීනි, සුප්පාවාසා කෝලිය දුහිතෘ තොමෝ හිසින් භාග්‍යවතුන් වහන්සේගේ පා වඳියි. ආබාධ නැති නියා ද, රෝග නැති නියා ද, සැහැල්ලු පැවැතුම් ඇති නියා ද (ශරීර) බලය ද පහසු විහරණය ද විචාරයි. සවාමීනි, සුප්පාවාසා කෝලිය දුහිතෘ තොමෝ සත්-අවුරුද්දක් මුළුල්ලෙහි ගබක් දරයි. සත්දවසක් මුළුල්ලෙහි මූඪගර්භ ව සිටියි. ඕ තොමෝ දුක් වූ තියුණු වූ කර්කශ වූ කටුක වූ වේදනාවන්ගෙන් ස්පර්ශ කරන ලද්දී 'යම් කෙනෙක් මෙ බඳු මේ දුක දුරු කරනු පිණිස දහම් දෙසන සේක් ද, ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධයහ. යමෙක් මෙබඳු මේ දුක දුරු කිරීම පිණිස පිළිපන්නෝ ද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඒකාන්තයෙන් සුපිළිපන් ය. යම් නිවනෙක මෙබඳු මේ දුකෙක් නො මැත් ද ඒ නිවන ඒකාන්තයෙන් උතුම්ම යැ යන තුන් විතර්ක හේතු කොට ගෙන ඒ දුක් ඉවසනු හැකි වේ යැ යි සැළ කරන්න"යි කීවු ය.

3. පරමන්ති ඛො සො කොලියපුත්තො සුප්පවාසාය කොලියධීතාය පටිස්සුණිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො කොලියපුත්තො භගවන්තං එතදවොච:

“සුප්පවාසා භන්තෙ කොලියධීතා භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති. එවඤ්ච වදෙති: ‘සුප්පවාසා භන්තෙ කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙති සත්තාහං මූළ්හගබ්භා සා දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨා තීහි විතක්කෙහි අධිවාසෙති: ‘සම්මාසම්බුද්ධො වත සො භගවා, යො ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය ධම්මං දෙසෙති. සුප්පටිපන්නො වත තස්ස භගවතො සාවකසඞ්ඝො, යො ඉමස්ස එවරූපස්ස දුක්ඛස්ස පහානාය පටිපන්නො. සුසුඛං වත තං නිබ්බානං, යත්ථිදං එවරූපං දුක්ඛං න සංවිජ්ජතී”ති.

“සුඛිනී හොතු සුප්පවාසා කොලියධීතා අරොගා, අරොගං පුත්තං විජායතූ”ති. සහ වචනා ච පන භගවතො සුප්පවාසා කොලියධීතා සුඛිනී අරොගා අරොගං පුත්තං විජායි.

‘එවං භන්තෙ’ති ඛො සො කොලියපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සකං ඝරං පච්චායාසි.

අද්දසා ඛො කොලියපුත්තො සුප්පවාසං කොලියධීතරං සුඛිනිං අරොගං, අරොගං පුත්තං විජාතං. දිස්වානස්ස එතදහොසි: “අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍ර හි-නාමායං සුප්පවාසා කොලියධීතා සහ වචනා ච පන භගවතො සුඛිනී අරොගා අරොගං පුත්තං විජායිස්සතී”ති. අත්තමනො පමුදිතො පීතිසොමනස්සජාතො අහොසි.

අථ ඛො සුප්පවාසා කොලියධීතා සාමිකං ආමන්තෙසි: “එහි ත්වං අය්‍යපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, සුප්පවාසා භන්තෙ කොලියධීතා භගවතො පාදෙ සිරසා වන්දතී”ති. එවඤ්ච වදෙහි: “සුප්පවාසා භන්තෙ කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙසි, සත්තාහං මූළ්හගබ්භා. සා එතරහි සුඛිනී අරොගා, අරොගං පුත්තං විජාතා. සා සත්තාහං බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙති. අධිවාසෙතු කිර භන්තෙ භගවා සුප්පවාසාය කොලියධීතාය සත්ත භත්තානි සද්ධිං භික්ඛුසඞ්ඝෙනා”ති.

3. 'මැනැවැ' යි ඒ කොලිය පුත්‍ර තෙමේ සුප්පාවාසා කොලිය දුහිතෘවට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ ඒ කොලියපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය:

"වහන්ස, සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ හිසින් භාග්‍යවතුන් වහන්සේගේ පා වඳියි. ආබාධ රහිත නියා ද, රොග රහිත නියා ද, සැහැල්ලු පැවතුම් ඇති නියා ද (ශරීර) බලය ද, පහසු විහරණය ද විචාරයි. මෙසේත් කියයි: 'වහන්ස, සුප්පාවාසා කොලියදුහිතෘ තොමෝ සත් අවුරුද්දක් මුළුල්ලෙහි ගබක් දරයි. සත් දවසක් මුළුල්ලෙහි මූඪගර්භ ව ඕ තොමෝ දුක් වූ තියුණු වූ කර්කශ වූ කටුක වූ වෙදනාවන්ගෙන් ස්පර්ශ කරන ලද්දී "යම් කෙනෙක් මෙ බඳු මේ දුක දුරු කරනු පිණිස දහම් දෙසත සේක් ද, ඒ භාග්‍යවතුන් වහන්සේ එකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධයහ. යමෙක් මෙ බඳු මේ දුක දුරු කරනු පිණිස පිළිපන්නෝ ද, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ එකාන්තයෙන් සුපිළිපන් ය. යම් නිවනෙක මෙ බඳු මේ දුක නැත් ද, ඒ නිවන එකාන්තයෙන් උතුම් ම සුව යැ"යි මේ ත්‍රිවිධ විතර්කයෙන් ඉවසා ය' යනු යි.

"සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ සුඛිත වේවා, නීරොග වේවා, නීරොග පුත්‍රයකු වදාවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේගේ ඒ වචනය සමග ම සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ සුඛිත වූවා නීරොග වූවා නීරොග පුත්‍රයකු වැදූවා ය.

"වහන්ස, එසේ යැ"යි ඒ කොලියපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන, නැවතත් සතුට ප්‍රකාශ කොට අස්නෙන් නැඟිට භාග්‍යවතුන් වහන්සේ වනා කොට වැඳ පැදකුණු කොට සවකීය ගෘහය කරා ගියේ ය.

කොලියපුත්‍ර තෙමේ නීරොග පුත්‍රයකු වැදූවා වූ සුඛිත වූ නීරොග වූ සුප්පාවාසා කොලියදුහිතෘ දුටුයේ ය. දැක ඔහුට "යම් බඳු වූ මේ කොලියදුහිතෘ තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ වචනයත් සමග ම සුව පත් වූවා, නීරොග වූවා, නීරොග වූ පුත්‍රයකු වැදූ ද, පින්වත්නි, ඒ තථාගතයන් වහන්සේගේ මහත් සෘද්ධි ඇති බව මහත් අනුභාව ඇති බව ඒකාන්තයෙන් ආශ්චර්ය්‍ය. එකාන්තයෙන් අද්භූත යැ"යි මෙ බඳු සිතෙක් විය. හේ සතුටු සිත් ඇත්තේ අතිශයින් ප්‍රමොදය ඇත්තේ, හටගත් බලවත් ප්‍රීතිය හා සොම්නස ඇත්තේ විය.

ඉක්බිති සුප්පාවාසා කොලියදුහිතෘ තොමෝ හිමියා ඇමැතුවා ය: "ආර්‍ය්‍යපුත්‍රය, මුඹ මෙහි එන්න. භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹෙන්න. එළැඹ 'වහන්ස, සුප්පවාසා කොලියදුහිතෘ භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳී' යන මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳින්න. මෙසේත් කියන්න. 'වහන්ස, සුප්පවාසා නම් කොලිය දුහිතෘ තොමෝ සත් අවුරුද්දක් මුළුල්ලෙහි ගබක් දැරුවා ය. සත් දවසක් මුළුල්ලෙහි මූඪගර්භ ව සිටියා ය. ඕ දැන් සුඛිත වූවා, නීරොග වූවා, නීරොග වූ පුත්‍රයකු වැදූවා ය. ඕ තොමෝ සත් දවසක් මුළුල්ලෙහි බුදුපාමොක් භික්-සඟනට බතින් නිමතයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයාත් සමග සුප්පවාසා කොලියදුහිතෘවගේ සත් බතක් ඉවසා වදාරන සේක්වා'යි කියන්න"යි කීවු ය.

6. පරමන්ති බො සො කොලියපුත්තො සුප්පවාසාය කොලියධීතාය පටිස්සුණිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවා-දෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො සො කොලියපුත්තො භගවන්තං එතදවොච: "සුප්පවාසා භන්තෙ කොලියධීතා භගවතො පාදෙ සිරසා වන්දති. එවඤ්ච වදෙති: සුප්පාවාසා භන්තෙ කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙසි. සත්තාහං මූළ්හගබ්භා. සා එතරහි සුඛිනී අරොගා අරොගං පුත්තං විජාතා. සා සත්තාහං බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙති. අධිවාසෙතු කිර භන්තෙ භගවා සුප්පවාසාය කොලිය-ධීතාය සත්ත භත්තානි සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති.

7. තෙන බො පන සමයෙන අඤ්ඤතරෙන උපාසකෙන බුද්ධපමුඛො භික්ඛුසඞ්ඝො ස්වාතනාය භත්තෙන නිමන්තිතො හොති. සො ච උපාසකො ආයස්මතො **මහාමොග්ගල්ලානස්ස** උපට්ඨාකො හොති. අථ බො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං ආමන්තෙසි: "එහි ත්වං මොග්ගල්ලාන, යෙන සො උපාසකො තෙනුපසඞ්කමෙය්‍යාසි:[1] උපසඞ්කමිත්වා තං උපාසකං එවං වදෙහි: "සුප්පවාසා ආවුසො කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙසි, සත්තාහං මූළ්හගබ්භා. සා එතරහි සුඛිනී අරොගා අරොගං පුත්තං විජාතා. සා සත්තාහං බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙති. කරොතු සුප්පවාසා කොලියධීතා සත්තභත්තානි. පච්ඡා සො කරිස්සති.[2] තුය්හෙසො උපට්ඨා-කො"ති.

8. "එවං භන්තෙ"ති බො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො පටිස්සුණිත්වා යෙන සො උපාසකො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං උපාසකං එතදවොච: "සුප්පවාසා ආවුසො කොලියධීතා සත්තවස්සානි ගබ්භං ධාරෙසි. සත්තාහං මූළ්හගබ්භා. සා එතරහි සුඛිනී, අරොගා, අරොගං පුත්තං විජාතා. සත්තාහං බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙති. කරොතු සුප්පවාසා කොලියධීතා සත්තභත්තානි. පච්ඡා ත්වං කරිස්සසී[2]"ති. "සචෙ මෙ භන්තෙ අය්‍යො මහාමොග්ගල්ලානො තිණ්ණං ධම්මානං පාටිභොගො භොගානඤ්ච ජීවිතස්ස ච සද්ධාය ච, කරොතු සුප්පවාසා කොලියධීතා සත්ත-භත්තානි. පච්ඡා අහං කරිස්සාමී"ති. "ද්වින්නං බො තෙ අහං ආවුසො ධම්මානං පාටිභොගො භොගානඤ්ච, ජීවිතස්ස ච. සද්ධාය පන ත්වංයෙව පාටිභොගො"ති. "සචෙ මෙ භන්තෙ අය්‍යො මහාමොග්ගල්ලානො ද්වින්නං ධම්මානං පාටිභොගො භොගානඤ්ච, ජීවිතස්ස ච. කරොතු සුප්පවාසා කොලියධීතා සත්තභත්තානි. පච්ඡා අහං කරිස්සාමී"ති.

1. තෙනුපසඞ්කම, ම. 2. පච්ඡා ත්වං කරිස්සසී'ති සක්ඛිපෙති, ම

6. ඒ කොලියපුත්‍ර තෙමේ **සුප්පවාසා** කොලිය දුහිතෘවට ‘මැනැවැ’යි පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නාවූ ඒ කොලිය පුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට “වහන්ස **සුප්පවාසා** කොලිය දුහිතෘ තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ පා හිසින් වඳියි. වහන්ස, **සුප්පවාසා** කොලිය දුහිතෘ තොමෝ සත් වසක් මුළුල්លෙහි ගබක් දැරුවා ය. සත් දවසක් මුළුල්ලෙහි මූඪ ගැබ් වූවා ය. ඕ තොමෝ දැන් සුඛිතවූවා, නීරෝග වූවා, නීරෝගවූ පුත්‍රයකු වැදූවා ය. ඕ තොමෝ සත් දවසක් මුළුල්ලෙහි බුදුපාමොක් බික් සඟනට බතින් නිමතයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග **සුප්පවාසා** කොලිය දුහිතෘවගේ සත් බත ඉවසා වදාරන සේක්වා යි මෙසේත් කියා ය” යි සැළ කෙළේ ය.

7. එසමයෙහි එක්තරා උපාසකයකු විසින් බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා හෙට දවස පිණිස බතින් නිමන්තන ලද්දේ වෙයි. ඒ උපාසක තෙමේ ද ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යායන** ස්ථවිරයන් වහන්සේගේ උපස්ථායක වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිර-යන් වහන්සේ අමතා, “මෞද්ගල්‍යායනයෙනි, තෙපි මෙහි එව. ඒ උපාසකයා වෙත එළැඹෙව. එළැඹ ඒ උපාසකයාට “ඇවැත්නි, **සුප්පවාසා** කොලිය දුහිතෘ තොමෝ සත් වසක් මුළුල්ලෙහි ගබක් දැරුවා ය, සත් දවසක් මුළුල්-ලෙහි මූඪගැබ් වූවා ය. ඕ තොමෝ දැන් සුඛිත වූවා, නීරෝග වූවා, නීරෝග වූ පුත්‍රයකු වැදූවා ය. ඕ තොමෝ සත් දවසක් මුළුල්ලෙහි බුදුපාමොක් බික්සඟන බතින් නිමතයි. සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ සත් බතක් පවත්වාවා, පසු ව ශේ දන් දෙනු හැකි වන්නේ යයි කියව. ඒ උපාසක තෙමේ තොපගේ උපස්ථායකයෙකැ”යි වදාළ සේක.

8. මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ “වහන්ස, එසේයැ”යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ උපාසකයා වෙත එළැඹියහ. එළැඹ ඒ උපාසකයාහට “ඇවැත්නි, සුප්පවාසා කෝලිය දුහිතෘ තොමෝ සත් වසක් මුළුල්ලෙහි ගබක් දැරුවා ය. සත් දවසක් මුළුල්ලෙහි මූඪගැබ් වූවා ය. ඕ තොමෝ දැන් සුඛිත වූවා, නීරෝග වූවා, නීරෝග වූ පුත්‍රයකු වැදූවා ය. සත්-දවසක් මුළුල්ලෙහි බුදුරජුන් ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට බතින් නිමන්ත්‍රණ කරයි. සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ සත් බත පවත්වා වා, පසුව තෙපි සඞ්ඝයාට දන් දීම කරව” යි කීහ. “ඉදින් ආර්‍ය්‍ය වූ මෞද්ගල්‍යායන ස්ථවිර-යන් වහන්සේ මගේ වස්තු ජීවිත ශ්‍රද්ධා යන කරුණු තුන පිළිබඳ ව ඇප වන්නාහු නම් සුප්පවාසා කෝලියදුහිතෘ තොමෝ සත් බත් පවත්වා වා. පසු ව මම දන් දෙන්නෙමැ”යි කීයේ ය.

“ඇවැත්නි, තොපගේ වස්තු ජීවිත යන කරුණු දෙක පිළිබඳ ව මම ඇපකාරයෙකිම් වෙමි. ශ්‍රද්ධාව පිළිබඳව වූ කලි තොපට තෙපි ම ඇප වව යි වදාළ සේක. “වහන්ස, ඉදින් ආර්‍ය්‍ය වූ මෞද්ගල්‍යා-යන ස්ථවිරයන් වහන්සේ වස්තු ජීවිත යන කරුණු දෙක පිළිබඳව ඇපවන සේක් නම්, සුප්පවාසා කොලියදුහිතෘ තොමෝ සත් බත් පවත්වා වා. පසු ව මම දන් දීම කරන්නෙමැ”යි උපාසක තෙම කීයේ ය.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං උපාසකං සඤ්ඤාපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච:

"සඤ්ඤත්තො භන්තෙ සො උපාසකො මයා, කරොතු සුප්පවාසා කොලියධීතා සත්තභත්තානි, පච්ඡා සො කරිස්සතී"ති.

9. අථ ඛො සුප්පවාසා කොලියධීතා සත්තාහං බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. තඤ්ච දාරකං භගවන්තං වන්දාපෙසි, සබ්බඤ්ච භික්ඛුසඞ්ඝං.

10. අථ ඛො ආයස්මා සාරිපුත්තො තං දාරකං එතදවොච: "කච්චි තෙ දාරක, ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි න කිඤ්චි දුක්ඛ"න්ති. "කුතො මෙ භන්තෙ සාරිපුත්ත, ඛමනීයං. කුතො යාපනීයං. සත්තවස්සානි මෙ ලොහිතකුම්භියං[1] වුත්ථානී"ති.

11. අථ ඛො සුප්පවාසා කොලියධීතා "පුත්තො මෙ ධම්මසෙනාපතිනා සද්ධිං මන්තෙතී"ති, අත්තමනා පමුදිතා[2] පීතිසොමනස්සජාතා අහොසි.

12. අථ ඛො භගවා සුප්පවාසං කොලියධීතරං අත්තමනං පමුදිතං[3] පීතිසොමනස්සජාතං දිස්වා[4] සුප්පවාසං කොලියධීතරං එතදවොච: "ඉච්ඡෙය්‍යාසි ත්වං සුප්පවාසෙ, අඤ්ඤම්පි එවරූපං පුත්ත"න්ති. "ඉච්ඡෙය්‍යා-මහං භගවා අඤ්ඤානි'පි එවරූපානි සත්ත පුත්තානී"ති.

13. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං,
දුක්ඛං සුඛස්ස රූපෙන පමත්තමතිවත්තතී"ති.

## 2. 9.

### විසාඛාසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. තෙන ඛො පන සමයෙන විසාඛාය මිගාරමාතුයා කොචිදෙව අත්ථො රඤ්ඤෙ පසෙනදිම්හි කොසලෙ පටිබද්ධො හොති. තං රාජා පසෙනදි කොසලො න යථාධිප්පායං තීරෙති.

අථ ඛො විසාඛා මිගාරමාතා දිවාදිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච: "හන්ද කුතො නු ත්වං විසාඛෙ, ආගච්ඡසි දිවාදිවස්සා"ති.

---

1. සත්ත මෙ වස්සානි ලොහිතකුම්භියා - ම. 2 පමොදිතා - ම. 3. පමොදිතං - ම.
4. විදිත්වා - ම.

ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලායන ස්ථවිරයන් වහන්සේ ඒ උපාසකයාහට දන්වා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"වහන්ස, මා විසින් ඒ උපාසකයාහට දන්වන ලද්දේ ය. **සුප්පවාසා** කෝලියදුහිතෘ තොමෝ සත් බත් පවත්වා වා. පසු ව හේ කරන්නේ යැ"යි.

9. ඉක්බිති **සුප්පවාසා** කෝලියදුහිතෘ තොමෝ සත් දවසක් මුළුල්ලෙහි බුදුරජුන් ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ ඛාද්‍යයෙන් ද, භොජ්‍යයෙන් ද සිය අතින් සන්තර්පණය කළා ය. සම්ප්‍රවාරණය කළා ය. ඒ දරුවා ලවා භාග්‍යවතුන් වහන්සේ ද සියලු භික්ෂුසඞ්ඝයා ද වැන්දවූ ය.

10. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ දරුවාට, "කිම, දරුව තොපට සැහිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම කිසියම් දුකෙක් නැත් ද?"යි වදාළ සේක. "වහන්ස, ශාරිපුත්‍රයන් වහන්ස, මට සැහිය හැක්කෙක් කොයින් ද, යැපිය හැක්කෙක් කොයින් ද මා විසින් සත් හවුරුද්දක් ලේසැළියෙක වාසය කරන ලදි"යි දරු කී ය.

11. එකල්හි සුප්පවාසා කෝලියදුහිතෘ තොමෝ "මා පුතා දම්සෙනෙවි සැරියුත් හිමියන් සමග කථා කෙරේ යැ"යි සතුටු සිත් ඇත්තී, ප්‍රමුදිත වූවා හටගත් ප්‍රීති සෞමනස්‍යය ඇත්තී වූ ය.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සතුටු සිත් ඇති ප්‍රමුදිත වූ හටගත් ප්‍රීති සෞමනස්‍යය ඇති, සුප්පවාසා කෝලියදුහිතෘව දැක, "සුප්පවාසාවෙනි, තෙපි අන්‍ය වූ ද මෙ බඳු පුතකු කැමැත්තාව"යි වදාළහ "භාග්‍යවතුන් වහන්ස, මම අන්‍ය වූ ද මෙ බඳු සත් පුතුන් කැමැත්තමු"යි ඕ කිවු ය.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන, ඒ වෙලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"අමධුර දෑ මධුරස්වභාවයෙනුත් අප්‍රිය දෑ ප්‍රියස්වභාවයෙනුත් දුක සුඛස්වභාවයෙනුත් ප්‍රමාදී පුද්ගලයා ඉක්මැ යේ."

## 2. 9.

## විශාඛාසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **පූර්වාරාමයෙහි මෘගාරමාතෘප්‍රාසාදයෙහි** වැඩ වසන සේක. එසමයෙහි මෘගාරමාතෘ නම් වූ **විශාඛාවට** පසේනදි කොසොල් රජ්ජුරුවන් කෙරෙහි පිළිබඳ වූ (පසේනදි රජුලවා කරවා ගත යුතු) කිසියම් කටයුත්තෙක් වෙයි. එය පසේනදි කොසොල් රජ ඇයගේ අදහස පරිදි තීරණය නො කරයි.

ඉක්බිති මෘගාරමාතෘ විශාඛා මධ්‍යාහ්න වෙලාවෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹුණු. එළැඹ භාග්‍යවතුන් වහන්සේ මනා කොට වැඳ එකත් පසෙක හුන. එකත් පසෙක හුන්නා වූ මෘගාරමාතෘ වූ විශාඛාවට භාග්‍යවතුන් වහන්සේ "විශාඛාවෙනි, තෙපි දූන් දෙවෙන් දවහලැ කොහි සිට එන්නහු දෑ?"යි වදාළහ.

"ඉධ මෙ භන්තෙ කොචිදෙව අත්ථො රඤ්ඤෙ පසෙනදිම්හි කොසලෙ පටිබද්ධො හොති. තං රාජා පසෙනදී කොසලො න යථාධිප්පායං තීරෙතී"ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සබ්බං පරවසං දුක්ඛං සබ්බං ඉස්සරියං සුඛං,
සාධාරණෙ විහඤ්ඤන්ති යොගා හි දුරතික්කමා"ති.

## 2. 10.

### භද්දියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා අනුපියායං විහරති අම්බවනෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා භද්දියො කාළිගොධාය පුත්තො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙති: "අහො සුඛං, අහො සුඛ"න්ති. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ ආයස්මතො භද්දියස්ස කාළිගොධාය පුත්තස්ස අරඤ්ඤගතස්ස'පි රුක්ඛමූලගතස්ස'පි සුඤ්ඤාගාරගතස්ස'පි අභික්ඛණං උදානං උදානෙන්තස්ස "අහො සුඛං අහො සුඛ"න්ති. සුත්වාන තෙසං එතදහොසි: "නිස්සංසයං ඛො ආවුසො ආයස්මා භද්දියො කාළිගොධාය පුත්තො අනභිරතො බ්‍රහ්මචරියං චරති, යං'ස පුබ්බෙ අගාරියභූතස්ස රජ්ජසුඛං, සො තමනුස්සරමානො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙති: අහො සුඛං අහො සුඛ"න්ති.

2. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ආයස්මා භන්තෙ භද්දියො කාළිගොධාය පුත්තො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙති: "අහො සුඛං අහො සුඛ"න්ති. නිස්සංසයං ඛො භන්තෙ ආයස්මා භද්දියො කාළිගොධාය පුත්තො අනභිරතො බ්‍රහ්මචරියං චරති, යං'ස පුබ්බෙ අගාරියභූතස්ස රජ්ජසුඛං, සො තමනුස්සරමානො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙති: "අහො සුඛං අහො සුඛ"න්ති.

3. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: "එහි ත්වං භික්ඛු, මම වචනෙන භද්දියං භික්ඛුං ආමන්තෙහි: සත්ථා තං ආවුසො භද්දිය ආමන්තෙතී"ති.

"වහන්ස, මට මෙහි පසේනදි කොසොල් රජ්ජුරුවන් අයත් කිසියම් කටයුත්තෙක් වෙයි. එය පසේනදි කොසොල් රජ මා අදහස පරිදි නිරණය නො කෙරේ යැ" යි සැළ කළා ය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක.

"අනුන් අයත් සියල්ල දුක් ය. සියලු ලොව් ලොවුතුරු ඉසුරු බව සුව ය. සාධාරණය ඉටු කරවා ගැනීමෙහි ලා සියල්ලෝ දුකට පැමිණෙති. (කාමාදි) යොගයෝ ඉක්මීමෙහි දුෂ්කර වෙති.

## 2. 10.

### භද්දියසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනුපියනුවර අඹවෙනෙහි වැඩ වසන සේක. එසමයෙහි කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ වනයට ගියාහු ද, රුක්මුලට ගියාහු ද, ශූන්‍යාගාරයට ගියාහු ද, හැම විට ම "අහෝ සුවයෙක අහෝ සුවයෙකැ"යි උදන් අනන සේක. බොහෝ භික්ෂූහු වනයට ගියාවූ ද, රුක්මුලට ගියාවූ ද ශූන්‍යාගාරයට ගියාවූ ද කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේගේ නිතර "අහෝ සුවයෙකි අහෝ සුවයෙකැ"යි පහල කරන උදානය ඇසූහ. අසා ඔවුනට "ඇවැත්ති නිසැකයෙන් ම කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ (ශාසනයෙහි) නො ඇලුණාහු බඹසර හැසිරෙති. පෙර ගිහිගෙයි සිටි ඔහුට යම් රජසුවයෙක් වී නම් හෙ තෙමේ එය සිහි කරන්නේ වනයට ගියේ ද රුක්මුලට ගියේ ද ශූන්‍යාගාරයට ගියේ ද "අහෝ සුවයෙකි, අහෝ සුවයකැයි උදන් පහල කෙරේ යැ"යි මෙබඳු සිතෙක් විය

2. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියෝ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ මනා කොට වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිර තෙමේ වනයට ගිය ද, රුක්මුලට ගිය ද, ශූන්‍යාගාරයට ගිය ද නිතර "අහෝ සුවයෙකි, අහෝ සුවයෙකැ"යි උදන් අනයි. වහන්ස, නිසැකයෙන් ම කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිර තෙමේ ශාසනයෙහි නො ඇලුණේ බඹසර හැසිරෙයි. පෙර ගිහිගෙයි සිටි ඔහුට යම් රජසුවයෙක් වී නම් හේ එය සිහි කරමින් වනයට ගියේ ද රුක්මුලට ගියේ ද ශූන්‍යාගාරයට ගියේ ද නිතර ම "අහෝ සුවයෙක, අහෝ සුවයෙකැ"යි උදන් අනායි කීහ.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේක. "මහණ තෝ (මෙහි) එ. 'ඇවැත, භද්දියය, ශාස්තෲන් වහන්සේ තා අමතති'යි මාගේ වචනයෙන් භද්දිය භික්ෂු කැඳව"යි වදාළ සේක.

"එවං භන්තෙ"ති බො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා භද්දියො කාළිගොධාය පුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං භද්දියං කාළිගොධාය පුත්තං එතදවොච "සත්ථා තං ආවුසො භද්දිය, ආමන්තෙතී"ති.

"එවමාවුසො"ති බො ආයස්මා භද්දියො කාළිගොධාය පුත්තො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං බො ආයස්මන්තං භද්දියං කාළිගොධාය පුත්තං භගවා එතදවොච: "සච්චං කිර ත්වං භද්දිය, අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙසි: අහො සුඛං අහො සුඛ"න්ති. 'එවං භන්තෙ"ති. කිං පන ත්වං භද්දිය, අත්ථවසං සම්පස්සමානො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙසි: 'අහො සුඛං අහො සුඛ'න්ති.

"පුබ්බෙ මෙ භන්තෙ අගාරියභූතස්ස රජ්ජං කාරෙන්තස්ස අන්තො'පි අන්තෙපුරෙ රක්ඛා සුසංවිහිතා අහොසි. බහි'පි අන්තෙපුරෙ රක්ඛා සුසංවිහිතා අහොසි. අන්තො'පි නගරෙ රක්ඛා සුසංවිහිතා අහොසි. බහි'පි නගරෙ රක්ඛා සුසංවිහිතා අහොසි. අන්තො'පි ජනපදෙ රක්ඛා සුසංවිහිතා අහොසි බහි'පි ජනපදෙ රක්ඛා සුසංවිහිතා අහොසි. සො බො අහං භන්තෙ එවං රක්ඛිතගොපිතො සන්තො භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රාසී[1] විහාසිං. එතරහි බො පනාහං භන්තෙ අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි එකො අභීතො අනුබ්බිග්ගො අනුස්සඞ්කී අනුත්‍රාසී[2] අප්පොස්සුක්කො පන්නලොමො පරදවුත්තො[3] මිගභූතෙන චෙතසා විහරාමි. ඉදං බො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො අරඤ්ඤගතො'පි රුක්ඛමූලගතො'පි සුඤ්ඤාගාරගතො'පි අභික්ඛණං උදානං උදානෙමි:[4] "අහො සුඛං අහො සුඛ"න්ති.

4. අථ බො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්සන්තරතො න සන්ති කොපා
ඉති භවාභවතඤ්ච වීතිවත්තො,
තං විගතභයං සුඛිං අසොකං
දෙවා නානුභවන්ති දස්සනායා"ති.

මුචලින්දවග්ගො දුතියො.

තස්සුද්දානං:

මුචලින්දො රාජා දණ්ඩෙන සක්කාරෙ උපාසකෙන ච
ගබ්භිනී එකපුත්තො ච සුප්පවාසා විසාඛා ච
කාළිගොධාය භද්දියොති

1. උත්‍රාසෙසා - ම. 2. අනුත්‍රාසෙසා - ම. 3. පරදුවත්තො - සී මු. 4. උදානෙසි. - සීමු.

"වහන්ස, එසේ යැ"යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ කාළිගොධාවගේ පුත්‍ර වූ භද්දිය ස්ථවිරයන් වහන්සේට "ඇවැත භද්දිය ය, ශාස්තෘන් වහන්සේ තා කැඳවන සේකැ"යි කිය.

"ඇවැත, එසේ යැ"යි කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂුහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වඳා කොට වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන්නාවූ කාළිගොධාවගේ පුත්‍ර වූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ- "සැබව, භද්දිය ය, වනයට ගිය ද, රුක්මුලට ගිය ද, ශූන්‍යාගාරයට ගිය ද තෝ නිතර 'අහෝ සුවයෙකි අහෝ සුවයෙකැ'යි උදන් අනයි?" වදාළහ. "එසේය වහන්ස"යි හේ කී ය "භද්දිය ය, වනයට ගිය ද, රුක්මුලට ගිය ද, ශූන්‍යාගාරයට ගිය ද තෝ කවර ප්‍රයොජනයක් දකිමින් නිතර ම 'අහෝ සුවයෙක අහෝ සුවයෙකැ'යි උදන් අනයි ද"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"වහන්ස, පෙර ගිහිගෙයි සිටි රජය කරන මට අන්තඃපුරයෙහි ඇතුළත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. අන්තඃපුරයෙහි පිටත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. නගරයෙහි ඇතුළත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. නගරයෙහි පිටත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. ජනපදයෙහි ඇතුළත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. ජනපදයෙහි පිටත ද ආරක්ෂාව සලසන ලද්දේ විය. වහන්ස, ඒ මම් මෙසේ රක්ෂිත ගොපිත වූයෙම් ම බිය වූයෙම් බියෙන් සැලුනෙම් නැගුණු සැක ඇත්තෙම් තැති ගැනුම් ඇත්තෙම් වාසය කෙළෙම්. වහන්ස, දැන් වනාහි මම වනයට ගියෙම් ද, රුක්මුලට ගියෙම් ද, ශූන්‍යාගාරයට ගියෙම් ද, හුදෙකලා වූයෙම් ද, බිය නොවූයෙම් බියෙන් නො සැලුණෙම් නැගුණු සැක නැතියෙම් තැතිගැනුම් නැතියෙම් ලොමුදහ නැතියෙම් අනුන් විසින් දෙන ලද චීවරාදියෙන් යැපෙන්නෙම්, මුවාගේ සිත වැනි (කිසිවක් කෙරෙහි අපෙක්ෂා නැති) සිතෙකින් (යුක්ත ව) වසම්. වහන්ස, මම මේ කාරණය බලමින් වනයට ගියෙම් ද, රුක්මුලට ගියෙම් ද, ශූන්‍යාගාරයට ගියෙම් ද, 'අහෝ සුවයෙකි අහෝ සුවයෙකැ'යි උදන් පහළ කෙරෙම්"යි තෙරණුවෝ කීහ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"යමකුගේ අභ්‍යන්තරයෙහි කොපයෝ නැත් ද, යම් හෙයෙකින් සම්පත් විපත් ආදි භවාභවතාව ඉක්මැ සිටියේ ද, මෙබඳු වූ පහ ව ගිය භය ඇති, සුඛිත වූ, ශොක නැති, ක්ෂීණාස්‍රවයා දකින්නට දෙවියෝ අසමර්ථ වෙත්."

**දෙවෙනි මුචලින්ද වර්ගය යි.**

එහි උද්දානය:

මුචලින්ද, රාජ, දණ්ඩ, සක්කාර, උපාසක, ගබ්භිනී, එකපුත්ත, සුප්පවාසා, විසාඛා, භද්දිය යි සූත්‍ර දශයෙකි.

# නන්දවග්ගො තතියො

## 3. 1.

## කම්මසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පුරාණකම්මවිපාකජං දුක්ඛං තිබ්බං[1] ඛරං කටුකං වෙදනං අධිවාසෙන්තො සතො සම්පජානො අවිහඤ්ඤමානො.

2. අද්දසා ඛො භගවා තං භික්ඛුං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පුරාණකම්මවිපාකජං දුක්ඛං තිබ්බං[1] ඛරං කටුකං වෙදනං අධිවාසෙන්තං සතං සම්පජානං අවිහඤ්ඤමානං.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සබ්බකම්මජහස්ස භික්ඛුනො ධුනමානස්ස පුරෙකතං රජං,
අමමස්ස ඨිතස්ස තාදිනො අත්ථො නත්ථි ජනං ලපෙතවෙ."

## 3. 2.

## නන්දසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙති: "අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති.

2. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙති. "අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති.

3. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි. "එහි ත්වං භික්ඛු, මම වචනෙන නන්දං භික්ඛුං ආමන්තෙහි "සත්ථා තං ආවුසො නන්ද, ආමන්තෙතී"ති. 'එවං භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා නන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නන්දං එතදවොච: "සත්ථා තං ආවුසො නන්ද, ආමන්තෙතී"ති.

---

1. තිප්පං - සී

# තුන්වන නන්ද වග්ගය

## 3. 1.

### කම්මසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වසන සේක. එසමයෙහි එක්තරා පැවිද්දෙක් භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි පලග් බැඳ කය සෘජු කොට තබා පැරණි කම්මවිපාකයෙකින් හටගත් දුක් වූ තියුණු වූ කර්කශ වූ කටුක වූ වෙදනා ඉවසමින් . සමෘතිමත් වූයේ සම්ප්‍රඥාන ඇත්තේ නො ගැටෙමින් හුන්නේ වෙයි.

2. භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි පලග් බැඳ කය සෘජු කොට තබාගෙන පැරණි කම්මවිපාකයෙකින් හටගත් දුක් වූ තියුණු වූ කර්කශ වූ කටුක වූ වෙදනාව ඉවසන්නා වූ සමෘතිමත් වූ සම්ප්‍රඥාන ඇති නො ගැටෙමින් හුන් ඒ මහණ දුටු සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ බව දැන ඒ වේලාවෙහි මේ උදානය පහළ කළ සේක:

"දුරු කළ සියලු කර්මයන් ඇති, පෙර කරන ලද රජස් සඞ්ඛ්‍යාත කම්මවිපාකය කම්පා කොට හරින්නා වූ මමඞ්කාරයක් නැත්තා වූ නිර්වාණ ස්ථලයෙහි සිටියා වූ තාදී ගුණ ඇත්තා වූ මහණහුට (මට බෙහෙත් කරව ආදි වශයෙන්) ජනයා බණින්නට කාරණෙක් නැත."

## 3. 2.

### නන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේගේ භ්‍රාතෘ වූ සුළුමවුපුත් ආයුෂමත් නන්ද තෙමේ බොහෝ භික්‍ෂූනට "ඇවැත්නි, මම් සස්නෙහි නො ඇලුණෙම් බඹසර සරමි. බඹසර උසුලන්නට නො හැක්කෙමි. ශික්‍ෂාව හැරැ පියා ගිහිබවට පෙරළෙන්නෙම්'යි දන්වයි.

2. එ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළැඹැ සකසා වැඳ, "වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ භ්‍රාතෘ වූ සුළුමවුපුත් ආයුෂමත් නන්ද තෙම බොහෝ භික්‍ෂූනට "ඇවැත්නි, මම් සස්නෙහි නොඇලු-ණෙම් බඹසර සරමි. බඹසර උසුලන්නට නොහැක්කෙමි. ශික්‍ෂාව හැර පියා ගිහිබවට පෙරළෙන්නෙමි"යි කියා යැ යි මෙ පවත් සැළ කෙළේ ය.

3 එ විට භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු බණවා, "මහණ, මෙහි එ, "ඇවැත් නන්දයෙනි, ශාස්තෘහු තොප කැඳවතැ'යි මගේ වචනයෙන් නන්ද භික්‍ෂූහු කැඳව"යි වදාළ සේක. 'එසේ ය, වහන්සැ'යි කියා ම ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ආයුෂමත් නන්ද භික්‍ෂූ කරා එළැඹියේ ය. එළැඹ "ඇවැත් නන්දයෙනි, ශාස්තෘන් වහන්සේ මුඹ කැඳවන සේකැ'යි කීයේ ය.

4. ‘එවමාවුසො’ති ඛො ආයස්මා නන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං නන්දං භගවා එතදවොච: සච්චං කිර ත්වං නන්ද, සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි “අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමීති. “එවං භන්තෙ”ති. “කිස්ස පන ත්වං නන්ද, අනභිරතො බ්‍රහ්මචරියං චරසි? න සක්කොසි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සසී?”ති. “සාකියානී මං භන්තෙ ජනපදකල්‍යාණී ඝරා නික්ඛමන්තස්ස උපඩ්ඪුල්ලිඛිතෙහි[1] කෙසෙහි අපලොකෙත්වා මං එතදවොච: “තුවටං ඛො අය්‍යපුත්ත, ආගච්ඡෙය්‍යාසී”ති. සො ඛො අහං භන්තෙ තමනුස්සරමානො අනභිරතො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී”ති.

5. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය[2] ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි.

6. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං ආමන්තෙසි: “පස්සසි නො ත්වං නන්ද, ඉමානි පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානි?”ති. “එවං භන්තෙ”ති.

7. තං කිං මඤ්ඤසි නන්ද, කතමා නු ඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී ඉමානි වා පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?”ති.

“සෙය්‍යථාපි භන්තෙ පලුට්ඨමක්කටී කණ්ණනාසච්ඡින්නා. එවමෙව ඛො භන්තෙ සාකියානී ජනපදකල්‍යාණී ඉමෙසං පඤ්චන්නං අච්ඡරාසතානං උපනිධාය සඞ්ඛම්පි න උපෙති, කලම්පි න උපෙති, කලභාගම්පි න උපෙති,[3] උපනිධිම්පි න උපෙති. අථ ඛො ඉමානි පඤ්ච අච්ඡරාසතානි අභිරූපතරානි චෙව දස්සනීයතරානි ච පාසාදිකතරානි චා”ති.

“අභිරම නන්ද, අභිරම නන්ද, අහං තෙ පාටිභොගො පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදාන”න්ති.

“සචෙ මෙ භන්තෙ භගවා පාටිභොගො පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදානං, අභිරමිස්සාමහං භන්තෙ භගවති බ්‍රහ්මචරියෙ”ති.

1. උපඩ්ඪලිඛිතෙහි, ම. අඩ්ඪුල්ලිඛිතෙහි, සී. 2. බාහායං, ම. 3. සඞ්ඛ්‍යම්පි නොපෙති කලභාගම්පි නොපෙති, ම.

4. 'එසේ ය, ඇවැත්නි'යි කියා ම ආයුෂ්මත් නන්ද තෙම ඒ මහණහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක හිඳ ගත්තේ ය. එක් පසෙක හුන්නාවූ ම ආයුෂ්මත් නන්දහට භාග්‍යවතුන් වහන්සේ 'සැබැව, නන්ද ය, "ඇවැත්නි, නො ඇලුණෙම් මම් බඹසර සරමි. බඹසර උසුලන්නට නො හැක්කෙමි. ශික්‍ෂාව හැරපියා ගිහිබවට පෙරළෙන්නෙමි" යි බොහෝ මහණුනට මෙසේ දන්වූයෙහි දැ?' යි අසා වදාළ සේක. "එසේ ය වහන්සැ"යි ආයුෂ්මත් නන්ද තෙම කී ය. කවර හෙයින් නො ඇලුණක් වැ බඹසර සරයි දැ? බඹසර උසුලන්නට නො හැක්කෙහි දැ? ශික්‍ෂාව හැරපියා ගිහිබවට පෙරළෙන්නෙහි දැ?"යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක. "වහන්ස, මා ගෙන් නික්මෙද්දී සෑ දු දනවුකලණ අඩක් පණාගැසූ හිසකෙසින් උපලක්‍ෂිත වැ මා බලා, 'ස්වාමිපුත්‍රය, වහා ම එන්නැ'යි මට කිවූ ය. වහන්ස, එය සිහි කරන මම් නොඇලී බඹසර සරමි. බඹසර උසුලන්නට නො හැක්කෙමි. ශික්‍ෂාව හැරපියා ගිහි බවට පෙරළෙන්නෙමි"යි නන්ද තෙම කීය.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දයා අත ගෙන යම්සේ කාබලැති මිනිසෙක් වක් කළ අත දික් කරන්නේ හෝ දික් කළ අත වක් කරන්නේ ද, එ පරිද්දෙන් ම දෙව්රම්හි අතුරුදන් වැ තව්තිසා දෙව්ලොවැ පහළ වූ සේක.

6. එ සමයෙහි පරෙවිපා බඳු රත් පැහැ පා ඇති පන්සියක් පමණ වූ දෙවඟනෝ සක්දෙව්දුට උවටැනට ආවා වෙති. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දයන් අමතා "නන්දයෙනි, තෙපි පරෙවිපා බඳු රත්පැහැ පා ඇති මේ පන්සියක් පමණ වූ දෙවඟනන් දක්නහු දැ?"යි අසා වදාළ සේක. "එසේ ය වහන්සැ"යි නන්දයෝ කීහ.

7. "නන්දයෙනි. එය කිමැ යි සිතවු දැ? සැහැවූ ජනවුකලණ ද පරෙවිපා බඳු රත් පැහැ පා ඇති මෙ පන්සියක් පමණ දෙවඟනෝ ද යන මොවුන්ගෙන් කවර කෙනෙක් වඩා විශිෂ්ට රූපසම්පත් ඇත්තෝ ද, වඩා දැකුම් කට-යුත්තෝ ද? වඩා ප්‍රසාද එළවන්නෝ දැ?"යි අසා වදාළ සේක.

"වහන්ස, සැහැවූ ජනවුකලණ කන්නාසා සුත් පුළුටු වැඳිරිය බඳු ය. මේ පන්සියක් දෙවඟනන් සමීපයෙහි ලා සැලැකීමෙහි දී ඕ ගණනට ද නො එයි. සොළොස් වන කලාවට ද නො එයි. කලාවෙන් කලාවට ද නො එයි. මොවුන් හා මෝ සමාන යැ යි ලඟ තැබීමට ද නො එයි. වැලිදු මේ පන්සියක් දෙවඟනෝ ම වඩා විශිෂ්ට රූපසම්පත් ඇත්තෝ ද, වඩා දැකුම් කටයුත්තෝ ද, වඩා ප්‍රසාද එළවන්නෝ ද වෙති"යි ආයුෂ්මත් නන්දයෝ කීහ.

"නන්දයෙනි, සස්නෙහි සිත් අලව. නන්දයෙනි, සස්නෙහි සිත් අලව. මම් තොපට පරෙවිපා බඳු රත් පැහැ පා ඇති දෙවඟනන් පන්සියක් ලැබවීමට ඇප වෙමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වහන්ස, ඉදින් පරෙවිපා වැනි රත්පැහැ පා ඇති දෙවඟනන් පන්-සියක් ලබා දීමට භාග්‍යවතුන් වහන්සේ ඇප වන සේක් නම්, මම් භාග්‍ය-වතුන් වහන්සේ වෙත සඳුන්බඹසර රැක්මෙහි සිත් අලවන්නෙමි"යි (ආයුෂ්මත් නන්දයෝ කීහ.)

8. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසි.

9. අස්සොසුං ඛො භික්ඛූ "ආයස්මා කිර නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො අච්ඡරානං හෙතු බ්‍රහ්මචරියං චරති, භගවා කිරස්ස පාටිභොගො පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදානන්"ති. අථ ඛො ආයස්මතො නන්දස්ස සහායකා භික්ඛූ ආයස්මන්තං නන්දං භතකවාදෙන ච උපක්කිතකවාදෙන ච සමුදාචරන්ති. "භතකො කිරායස්මා නන්දො, උපක්කිතකො කිරායස්මා නන්දො, අච්ඡරානං හෙතු බ්‍රහ්මචරියං චරති. භගවා කිරස්ස පාටිභොගො පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදානන්"ති.

10. අථ ඛො ආයස්මා නන්දො සහායකානං භික්ඛූනං භතකවාදෙන ච උපක්කිතකවාදෙන ච අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං; කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා නන්දො අරහතං අහොසි.

11. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච: "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති. භගවතො'පි ඛො ඤාණං උදපාදි: "නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති.

12. අථ ඛො ආයස්මා නන්දො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා නන්දො භගවන්තං එතදවොච: "යං මෙ භන්තෙ භගවා පාටිභොගො, පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදානං, මුඤ්චාමහං භන්තෙ භගවන්තං එතස්මා පටිස්සවා"ති. මයාපි ඛො තෙ නන්ද[1] චෙතසා චෙතො පරිච්ච විදිතො: "නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති.

1. මයාපි ඛො නන්ද, ම

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දයන් අත ගෙන ශක්තිමත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ දිගු කළ අතක් හකුළුවන්නේත් යම්සේ ද, එසේ තව්තිසාවැසි දෙවියන් කෙරෙහි අතුරුදහන් වැ දෙව්රම්හි පහළ වූ සේක.

9. “භාග්‍යවතුන් වහන්සේගේ භ්‍රාතෘ වූ සුළුමවුපුත් ආයුෂ්මත් නන්දයෝ දෙවඟනන් පිණිස බඹසර සෙරෙත්ල, භාග්‍යවතුන් වහන්සේ ඔවුනට පරෙවිපා වැනි රත්පැහැ පා ඇති දෙවඟනන් පන්සියක් ලැබවීමට ඇප වූහු ලු”යි භික්ෂූහු ඇසූහ. ඉක්බිති ආයුෂ්මත් නන්දයන්ගේ යහළු භික්ෂූහු “ආයුෂ්මත් නන්දයෝ වනාහි බැළමෙහෙකරුහු ලු, විකුණා ගන්නා ලද්දෝ ලු, දෙවඟනන් පිණිස බඹසර සෙරෙත් ලු. භාග්‍යවතුන් වහන්සේ පරෙවිපා බඳු රත්පැහැ පා ඇති පන්සියක් දෙවඟනන් ලැබවීමට ඔවුනට ඇප වූ සේක් ලු”යි ආයුෂ්මත් නන්දයනට භෘතකවාදයෙන් ද උපක්‍රීතකවාදයෙන් ද (භෘතකයෝ ය, උපක්‍රීතකයෝ ය යි) ව්‍යවහාර කෙරෙත්.

10. ඉක්බිති ආයුෂ්මත් නන්දයෝ යහළු භික්ෂූන්ගේ ‘බැළයෙක, විකුණා ගන්නා ලද්දෙක’ යන වචනයෙන් පෙළනු ලබනුවෝ ලජ්ජාපත් කරනු ලබනුවෝ ගරහනු ලබනුවෝ හුදෙකලා වැ චිත්තවිවෙකයෙන් විවික්ත වැ, අප්‍රමත්ත වැ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති වැ, නිවන් කරා මෙහෙයන ලද සිත් ඇති වැ වසනුවෝ, යමක් පිණිස කුලදරුවෝ මොනොවට ම ගිහිගෙන් නික්මැ සසුන් වදිත් ද, ඒ නිරුත්තර වූ මාර්‍ගබ්‍රහ්මචර්‍ය්‍යාවසානය (හෙවත් රහත් බව) නොබෝ කලෙකින් ම, මෙ අත්බව්හි ම, තුමූ ම විශිෂ්ට නුවණින් දැන, නුවණැසට හමු කොට ලැබ වාසය කළහ. “පුනර්භවය ක්ෂීණ විය. මගබඹසර වැස නිමැවිණ. සත්‍යාවබොධය පිණිස කටයුතු දෑය කොට නිමැවිණ. මේ රහත්බව පිණිස තවත් කටයුත්තෙක් නැතැ”යි දැන ගත්හ. ආයුෂ්මත් නන්දයෝ රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වූහ.

11. ඉක්බිත්තෙන් එක්තරා දෙවියෙක් රැය බොහෝ ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීරප්‍රභා ඇත්තේ සියලු දෙව්රම බබුලුවා, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක සිටියේ ය. එක් පසෙක සිටියා වූ ම ඒ දෙවි “වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ භ්‍රාතෘ වූ සුළුමවුපුත් වූ ආයුෂ්මත් නන්දයෝ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵලසමාධිය ද ඵලඥානය ද මෙ අත්බව්හි ම තුමූ ම විශිෂ්ට නුවණින් දැන පසක් කොට ලැබ වෙසෙති”යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. ‘නන්දයෝ ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලඥානයත් මෙ අත්බව්හි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලැබ වෙසෙති’යි භාග්‍යවතුන් වහන්සේට ද නුවණ පහළ විය.

12. ඉක්බිත්තෙන් ආයුෂ්මත් නන්දයෝ ඒ රැය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ ම ආයුෂ්මත් නන්දයෝ ‘වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පරෙවියන්ගේ පාබඳු රත්පැහැ පා ඇති පන්සියක් දෙවඟනන් ලැබෙන බවට මට ඇප වූ සේක් ද, වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ මේ ඇපයෙන් මුදමි”යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. “නන්දයෙනි’ මා විසින් ද තොප සිත මා සිතින් පිරිසිඳ; “නන්දයෝ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵලසමාධියත්, ඵලඥානයත් මෙ අත්බව්හි ම තුමූ විශිෂ්ට නුවණින් දැන පසක් කොට ලැබ වෙසෙති’යි දන්නා ලද්දේ ය.

13. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසි: “ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී”ති. යදෙව ඛො තෙ නන්ද අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං,[1] අථාහං මුත්තො එතස්මා පටිස්සවා”ති.

14. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

“යස්ස නිත්තිණ්ණො පඞ්කො ච[2] මද්දිතො කාමකණ්ටකො,
මොහක්ඛයං අනුප්පත්තො සුඛදුක්ඛෙසු න වෙධතී ස භික්ඛූ”ති.[3]

## 3. 3.

## යසොජසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන යසොජපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි හොන්ති, භගවන්තං දස්සනාය. තෙ ච ඛො[4] ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤාපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා[5] අහෙසුං. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘කෙ පනෙතෙ ආනන්ද, උච්චාසද්දාමහාසද්දා[5] කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ’?ති.

“එතානි භන්තෙ යසොජපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙ’තෙ ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤාපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා”ති.

‘තෙනහානන්ද මම වචනෙන තෙ භික්ඛූ ආමන්තෙහි “සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී”ති. ‘එවං භන්තෙ’ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: ‘සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී’ති.

‘එවමාවුසො’ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: “කින්නු තුම්හෙ භික්ඛවෙ උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ”ති.

---

1. විමුච්චි, - මජසං. 2. යස්ස තිණ්ණො කාමපඞ්කො, ධම්මපදට්ඨකථා 3. සුඛදුක්ඛෙසු න වෙධති, මජසං. 4. තෙ ඛ. - සී. මු. 5. උච්චාසද්ද මහාසද්දා, මජසං.

13. දෙවියෙක් ද 'වහන්ස,...නන්දයෝ...පසක් කොට ලැබ පෙසෙති'යි මට මෙ කරුණ සැළ කෙළේ ය. නන්දයෙනි, යම් විටෙක ම තොප සිත උපාදාන රහිත ව ආශ්‍රව කෙරෙන් මිදුණේ ද, එ විට මම මේ ඇපයෙන් මිදුණෙමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

14. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමකු විසින් දෘෂ්ටි නැමැති මඩවගුර හෝ සසර නැමැති මඩවගුර තරණය කරන ලද ද, කෙලෙස් නැමැති කටුව මඩිනා ලද ද, යමෙක් මොහක්ෂයයට (රහත්පලයට) පැමිණියේ ද, ඒ මහණ සුවදුක් දෙක්හි නො සැලේ."

## 3. 3.

## යශෝජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ **අනේපිඬුසිටුහු** අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **යසොජ** තෙරුන් ප්‍රමුඛ පන්සියක් පමණ මහණහු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත්නුවරට පැමිණියාහු වෙති. ඒ ආගන්තුක මහණහු ද නේවාසික භික්ෂූන් හා පිළිසඳරින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු, පාසිවුරු සුරැකි කොට තබන්නාහු, උස්හඬ මහ-හඬ ඇත්තෝ වූහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, "ආනන්දයෙනි, තෙල කවුරු නම් මස්වොලෝහි[1] කෙවුළන් සේ උස් හඬ මහහඬ ඇත්තෝ දැ"යි අසා වදාළ සේක.

"වහන්ස, මේ යසොජ තෙරුන් ප්‍රමුඛ තෙල පන්සියක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස සැවැතට පැමිණියාහු ය. ඒ ආගන්තුක භික්ෂූහු නෙවාසික භික්ෂූන් හා පිළිසඳර විසින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු, පාසිවුරු සුරැකි කොට තබන්නාහු, උස් හඬ මහහඬ ඇත්-තාහු"යි අනඳ තෙරණුවෝ වදාළහ.

"ආනන්දයෙනි, එසේ වී නම් මගේ වචනයෙන් ශාස්තෘ තෙම ආයුෂ්මතුන් අමතා ය යි ඔවුන් කැඳව"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "එසේ ය, වහන්සැ"යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ භික්ෂූන් වෙත එළඹ "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවනසේකැ"යි ඒ භික්ෂූන්ට කී ය.

'එසේ ය, ඇවැත්නි'යි ඒ මහණහු අනඳ තෙරුනට පිළිවදන්දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන් අමතා භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කවර හෙයින් තෙපි මස්වොලොව්හි කෙවුළන් සේ උස් හඬ මහහඬ ඇතියව් දැ?"යි අසා වදාළ සේක.

---

1. මත්ස්‍ය විලොපයෙහි - මසුන් අල්ලනා තැන. මසුන් ලබාගන්නට වූයේ ඝාලබල කරන්-නවුන් සංසිඳුවන්නට කෑකෝ ගැසීමෙහි.

2. එවං වුත්තෙ ආයස්මා යසොජො භගවන්තං එතදවොච: "ඉමානි භන්තෙ පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙ'මෙ ආගන්තුකා භික්ඛු නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා"[2]ති.

"ගච්ඡථ භික්ඛවෙ, වො පනාමෙමි. න වො මම සන්තිකෙ වත්ථබ්බ"න්ති.

"එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛු භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන වජ්ජී, තෙන චාරිකං පක්කමිංසු වජ්ජීසු අනුපුබ්බෙන චාරිකං චරමානා යෙන වග්ගුමුදා නදී, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා වග්ගුමුදාය නදියා තීරෙ පණ්ණකුටියො කරිත්වා වස්සං උපගච්ඡිංසු.

3. අථ ඛො ආයස්මා යසොජො වස්සූපගතො භික්ඛු ආමන්තෙසි: "භගවතා මයං ආවුසො පණාමිතා අත්ථකාමෙන හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය. හන්ද මයං ආවුසො තථා විහාරං කප්පෙම, යථා නො විහරතං භගවා අත්තමනො අස්සා"ති.

'එවමාවුසො'ති ඛො තෙ භික්ඛු ආයස්මතො යසොජස්ස පච්චස්සොසුං. අථ ඛො තෙ භික්ඛු වූපකට්ඨා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා තෙනෙවන්තරවස්සෙන සබ්බෙව තිස්සො විජ්ජා සච්ඡාකංසු.

4. අථ ඛො භගවා සාවත්ථියං යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලී තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලී තදවසරි තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා වග්ගුමුදාතීරියානං භික්ඛූනං චෙතසා චෙතො පරිච්ච මනසි කරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ආලොකජාතා විය මෙ ආනන්ද, එසා දිසා. ඔභාසජාතා විය මෙ ආනන්ද, එසා දිසා. යස්සං දිසායං වග්ගුමුදාතීරියා භික්ඛු විහරන්ති. ගන්තුං අප්පටිකූලාසි මෙ මනසි කාතුං. පහිණෙය්‍යාසි ත්වං ආනන්ද වග්ගුමුදාතීරියානං භික්ඛූනං සන්තිකෙ දූතං, සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති. සත්ථා ආයස්මන්තානං දස්සනකාමො"ති.

'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන අඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "එහි ත්වං ආවුසො. යෙන වග්ගුමුදාතීරියා භික්ඛු, තෙනුපසඞ්කමෙය්‍යාසි[1] උපසඞ්කමිත්වා වග්ගුමුදාතීරියෙ භික්ඛු එවං වදෙහි: සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති. සත්ථා ආයස්මන්තානං දස්සනකාමො"ති.

1. උපසඞ්කම, ම.

2. මෙසේ වදාළ කල්හි යසෝජ තෙරණුවෝ "වහන්ස, මේ පන්සියයක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස සැවැතට පැමිණියාහු ය. ඒ මේ ආගන්තුක භික්ෂූහු නේවාසික භික්ෂූන් හා පිළිසඳරින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු පාසිවුරු සුරැකි කොට තබන්නාහු උස්හඬ මහහඬ ඇතියවු හ"යි සැළ කළහ.

"යව, මහණෙනි, තොප නෙරපමි. තොප මා වෙත නො විසිය යුතු" ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'එසේ ය වහන්සැ'යි කියා ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට සෙනසුන් සුරැකි කොට තබා පාසිවුරු ගෙන වැදූරට බලා සැරි සරා වැඩියහ. වැදූරට පිළිවෙළින් සැරි සරන්නාහු වග්ගුමුදු නදිය කරා එළැඹි-යහ. එළැඹ වග්ගුමුදු නදිය තෙර පන්සල් කොට වස් එළැඹියහ.

3. ඉක්බිති යසෝජ තෙරණුවෝ වස් එළැඹියෝ භික්ෂූන් බණවා "ඇවැත්නි, අපට වැඩ කැමැති හිත පතන අනුකම්පා කරන භාග්‍යවතුන් වහන්සේ විසින් අනුකම්පාව සඳහා අපි නෙරපන ලද්දමු. එ බැවින් අපි යම්සේ වසන අපට භාග්‍යවතුන් වහන්සේ සතුටු වන සේක් ද, එසේ විසීම කරමු"යි වදාළහ.

'එසේ ය ඇවැත්නි'යි කියා ඒ මහණහු යසෝජ තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ඉක්බිත්තෙන් ඒ මහණහු විවිකත වූවාහු නොපමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් කරා මෙහෙයූ සිතැති ව වසන්නාහු ඒ වස් සමය ඇතුළත ම සියල්ලෝ ම ත්‍රිවිද්‍යා පසක් කළහ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි රිසි තාක් කල් වැස විසල්පුර බලා සැරි සරා වැඩි සේක. පිළිවෙළින් සැරි සරන සේක් විසල්පුරට පැමිණ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි විසල්පුර මහාවෙනෙහි කූටාගාරශාලා වෙහෙරෙහි වැඩ වසන සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදුතීර වැසි මහණුන්ගේ සිත් සිය සිතින් පිරිසිඳ මෙනෙහි කොට අනඳ තෙරුන් බණවා, "ආනන්දයෙනි, යම් දෙසෙක වග්ගුමුදුතීරවාසී මහණහු වෙසෙත් ද, එ දෙස මට පහළ වූ එළිය ඇත්තක් මෙනි. පහළ වූ ආලෝකය ඇත්තක් මෙනි. යන්නට මෙනෙහි කරන්නට මට නොපිළිකුල් ය. (මනාප ය). ආනන්දයෙනි, තොප 'ශාස්තෘ තෙම ආයුෂ්මතුන් කැඳවයි. ශාස්තෘ තෙම ආයුෂමතුන් දකිනු කැමැතිය'යි වග්ගුමුදුතීර වැසි මහණුන් වෙතට දූතයකු යවන්නෙ"යි වදාළ සේක.

'එසේ ය වහන්සැ'යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, එක්තරා මහණකු කරා එළැඹියහ. එළැඹ ඒ මහණහු බණවා "ඇවැත්නි, තෙපි මෙහි එව. වග්ගුමුදුතීරවාසී මහණුන් වෙතට යව. එළැඹ වග්ගුමුදුතීරවාසී මහණුනට "ඇවැත්නි, ශාස්තෘ තෙම ආයුෂ්මතුන් කැඳවයි. ශාස්තෘ තෙම ආයුෂමතුන්ගේ දැක්ම කැමැත්තේ ය"යි මෙසේ කියන්න.

“එවමාවුසො”ති ඛො සො භික්ඛු ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව මහාවනෙ කූටාගාරසාලායං අන්තරහිතො වග්ගුමුදාය නදියා තීරෙ තෙසං භික්ඛූනං පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛු වග්ගුමුදාතීරියෙ භික්ඛූ එතදවොච: “සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති, සත්ථා ආයස්මන්තානං දස්සනකාමො”ති.

‘එවමාවුසො’ති ඛො තෙ භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව වග්ගුමුදාය නදියා තීරෙ අන්තරහිතා මහාවනෙ කූටාගාරසාලායං භගවතො සම්මුඛෙ පාතුරහෙසුං.

5. තෙන ඛො පන සමයෙන භගවා ආනෙඤ්ජෙන සමාධිනා නිසින්නො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි “කතමෙන නු ඛො භගවා විහාරෙන එතරහි විහරතී”ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “ආනෙඤ්ජෙන ඛො භගවා විහාරෙන එතරහි විහරතී”ති. සබ්බෙව ආනෙඤ්ජෙන සමාධිනා නිසීදිංසු.

6. අථ ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පඨමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පඨමො යාමො. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ. පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහී”ති.

7. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො මජ්ඣිමො යාමො. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ, පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහී”ති දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධතෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පච්ඡිමො යාමො. උද්ධතො අරුණො. නන්දිමුඛී රත්ති. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ, පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහී”ති.

අථ ඛො භගවා තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “සචෙ ඛො ත්වං ආනන්ද ජානෙය්‍යාසි, එත්තකම්පි තෙ නප්පටිභාසෙය්‍ය. අහඤ්ච ආනන්ද, ඉමානි ච පඤ්ච භික්ඛුසතානි සබ්බෙව ආනෙඤ්ජසමාධිනා නිසීදිම්හා”ති.

'එසේ ය, ඇවැත්නි'යි කියා ඒ මහණ තෙම ආයුෂ්මත් අනඳ තෙරුන්ට පිළිවදන් දී ශක්තිමත් පුරුෂයෙක් හැකුළු අත දිග හරින්නා සේ ම දිග හළ අත හකුළන්නා සේ ම මහවෙනෙහි කූටාගාරශාලා විහාරයෙහි අතුරුදන් ව වග්ගුමුදානදිය තෙර ඒ මහණුන් ඉදිරියේ පහළ විය. ඉක්බිත්තෙන් ඒ මහණ වග්ගුමුදාතීරවාසී මහණුනට "ශාස්තෲන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවන සේක. ශාස්තෲන් වහන්සේ ආයුෂ්මතුන් දක්නා කැමැති සේකැ"යි මෙ බස් පැවැසී ය.

'එසේ ය, ඇවැත්නි'යි කියා ඒ මහණහු යට කී මහණහට පිළිවදන් අස්වා සෙනසුන් සුරැකි කොට තබා පාසිවුරු ගෙන බලවත් පුරුෂයකු හැකුළු අතක් දික් කරන සේ දික් කළ අත හකුළන්නා සේ ම වග්ගුමුදා-තීරයෙන් අතුරුදහන් වූවාහු මහවෙනෙහි කූළාරහල්වෙහෙරෙහි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි පහළ වූහ.

5. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ආනෙඤ්ජ සමාධියෙන් (චතුර්-ධ්‍යානය පාදක කොටැති රහත්පල සමවතින්) වැඩ හුන් සේක් වෙති. එකල්හි ඒ මහණුනට භාග්‍යවතුන් වහන්සේ කවර නම් විහරණයෙකින් දැන් වසන සේක් දැ?'යි මේ සිත විය. ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ ආනෙඤ්ජසමාධියෙන් දැන් වසන සේකැ'යි මේ සිත විය. ඉක්බිති සියල්ලෝ ම ආනෙඤ්ජසමාධියෙන් හුන්හ.

6. ඉක්බිති අනඳ තෙරණුවෝ රැය ගෙවුණු කල්හි පළමු යම ගත වුණු කල්හි භාග්‍යවතුන් වහන්සේ දිශාවට දෙහොත් මුදුන් තබා වැඳ සිවුර එකස් කොට පෙරෙවැ භාග්‍යවතුන් වහන්සේ දසාවට ඇදිලි බැඳ ගෙන "වහන්ස, රැය බොහෝ ඉක්ම ගියේ ය. පළමු යාමය නික්මුණේ ය. ආගන්තුක භික්ෂූහු බොහෝ වේලා හුන්නාහු වෙති. වහන්ස, ආගන්තුක භික්ෂූන් හා පිළිසඳරින් තුස්නකතා කෙරේවා"යි සැළ කළහ.

7. මෙසේ සැළ කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. දෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රැ බොහෝ වේලා ගත වූ කල්හි මැද යම නික්මුණු කල්හි හුනස්නෙන් නැගී සිට සිවුර එකස් කොට පෙරෙවැ භාග්‍ය-වතුන් වහන්සේ දසාවට දෙහොත් මුදුන් තබා වැඳ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, රැය බොහෝ ඉක්මැ ගියේ ය. මැදුම් යම නික්මුණේ ය. ආගන්තුක භික්ෂූහු හුන් බොහෝ වේලා ඇත්තාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කතා කරන සේක්වා"යි සැළ කළහ. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. තෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රැ බොහෝ ඉක්මැ ගිය කල්හි පැසිම් යම්හි අරුණු නැගි කල්හි රැ පාන් වන කල්හි හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් දසාවට දෙහොත් මුදුනැ තබා වැද "වහන්ස, රැ බොහෝ ඉක්මිණ. පැසිම් යම ගෙවිණ අරුණු නැගිණ. රැ පහන් වෙයි. ආගන්තුක භික්ෂූහු හුන් බොහෝ කල් ඇත්තෝ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කතා කරන සේක්වා"යි සැළ කළහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සමාධියෙන් නැගී සිට අනඳ තෙරුන් බණවා "ආනන්දයෙනි, ඉදින් තෙපි දන්නහු නම්, මෙ පමණකුදු තොපට නො වැටැහෙන්නේ ය (නො සිතෙන්නේ ය). ආනන්දයෙනි, මමත් මේ පන්සියක් භික්ෂූහුත් යන අපි හැමදෙනමෝ ආනෙඤ්ජසමාධියෙන් හුන්නම්හ"යි වදාළ සේක.

8. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්ස ජිතො කාමකණ්ටකො
අක්කොසො ච වධො ච බන්ධනඤ්ච,
පබ්බතො විය සො ඨිතො අනෙජො
සුඛදුක්ඛෙසු න වෙධති ස භික්ඛූ"ති.

## 3. 4.

## සාරිපුත්තසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** භගවතො අවිදූරෙ නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අද්දසා ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

2 අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යථාපි පබ්බතො සෙලො අචලො සුප්පතිට්ඨිතො,
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතො'ව න වෙධතී"ති.

## 3. 5.

## කොලිතසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා මහා-**මොග්ගල්ලානො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං සූපට්ඨිතාය. අද්දසා ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං සූපට්ඨිතාය.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සති කායගතා උපට්ඨිතා ඡසු ඵස්සායතනෙසු සංවුතො,
සතතං භික්ඛු සමාහිතො ජඤ්ඤා නිබ්බානමත්තනො"ති.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන (සලකා) එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමක්හු විසින් කෙලෙශකාම නැමැති කටුව දිනන ලද්දේ (ප්‍රහත කරන ලද්දේ) වේ ද, ආක්‍රොශ ද වධ ද බන්ධන ද දිනන ලද්දේ වේ ද, ඒ මහණ පර්වතයක් මෙන් අචල ව සිටියේ සුව දුක්හි කම්පිත නො වේ."

## 3. 4.

## ශාරිපුත්‍ර සූත්‍රය.

1 මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා සමාධි අරමුණට සිහිය යොමු කොට එළවා තබා වැඩ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය සෘජු කොට තබා අරමුණට අභිමුඛ කොට සිහිය එළවා නොදුරෙහි වැඩ හුන් සැරියුත් තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යම්සේ ගල්පව්වෙක් අචල වැ මොනොවට පිහිටියේ ද, එසේ ම මහණ තෙම මොහය ක්ෂීණ වීමෙන් පව්වක් මෙන් නො සැලේ".

## 3. 5.

## කොලිත සූත්‍රය

1: මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයේ **දෙව්රම්** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි **මහමුගලන්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ, උඩුකය සෘජු කොට පිහිටුවා සිය සතන්හි මොනොවට එළඹැ සිටි කය අරමුණු කොට පැවැති සිහියෙන් යුතු වැ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා සිය සතන්හි මොනොවට එළඹැ සිටි කය අරමුණු කොට පැවැති සිහියෙන් යුතු වැ නොදුරෙහි වැඩැ හුන් මහමුගලන් තෙරුන් දුටු සේක.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ උදන් ඇනූ සේක

"යමක්හුගේ කය අරමුණු කොට ඇති සිහිය එළඹැ සිටියේ වේ ද, යමෙක් සපර්ශයට කාරණ වූ සදෙරෙහි සංවෘත වූයේ ද, (සදෙරෙහි ඉන්ද්‍රිය සංවරයෙන් සංවෘත ද) එසේ වූ නිරතුරු විපස්සනා සමාධියෙන් සමාහිත වූ මහණ තෙම තමාගේ (පසක් කිරීමෙන්) නිවන දන්නේ ය."

## 3. 6.

## පිලින්දිවච්ඡසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **පිලින්දිවච්ඡො**[1] භික්ඛූ වසලවාදෙන සමුදාචරති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: 'ආයස්මා භන්තෙ පිලින්දිවච්ඡො භික්ඛූ වසලවාදෙන සමුදාචරතී'ති.

2. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: එහි ත්වං භික්ඛු, මම වචනෙන පිලින්දිවච්ඡං භික්ඛුං ආමන්තෙහි: සත්ථා තං ආවුසො පිලින්දිවච්ඡ ආමන්තෙතී'ති. 'එවං භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං එතදවොච: 'සත්ථා තං ආවුසො ආමන්තෙතී'ති. 'එවමාවුසො'ති ඛො ආයස්මා පිලින්දිවච්ඡො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං පිලින්දිවච්ඡං භගවා එතදවොච: 'සච්චං කිර ත්වං වච්ඡ, භික්ඛූ වසලවාදෙන සමුදාචරසී'ති. 'එවං භන්තෙ'ති.

3. අථ ඛො භගවා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පුබ්බෙනිවාසං මනසිකරිත්වා භික්ඛූ ආමන්තෙසි: "මා ඛො තුම්හෙ භික්ඛවෙ වච්ඡස්ස[2] භික්ඛුනො උජ්ඣායිත්ථ. න භික්ඛවෙ වච්ඡො දොසන්තරො, භික්ඛූ වසලවාදෙන සමුදාචරති. වච්ඡස්ස භික්ඛවෙ භික්ඛුනො පඤ්ච ජාතිසතානි අබ්බොකිණ්ණානි බ්‍රාහ්මණකුලෙ පච්චාජාතානි. සො තස්ස වසලවාදො දීඝරත්තං සමුදාචිණ්ණො.[3] තෙනායං වච්ඡො භික්ඛූ වසලවාදෙන සමුදාචරතී"ති.

4. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යම්හි න මායා වසති[4] න මානො
යො වීතලොභො අමමො නිරාසො,
පනුණ්ණකොධො[5] අභිනිබ්බුතත්තො
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛූ"ති.

## 3. 7.

## කස්සපසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකස්සපො** පිප්ඵලිගුහායං[6] විහරති. සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති අඤ්ඤතරං සමාධිං සමාපජ්ජිත්වා.

---

1. පිලින්දවච්ඡො, ම. 2. ආයස්මතො වච්ඡස්ස, සී. 3. අජ්ඣාචිණ්ණො, 4. වසන්ති, සාළ්වි 5 පණුන්නකොධො, සී 6. සිම්බලිගුහායං, ම පිප්පලිගුහායං, සාළ්වි

## 3. 6.

## පිලින්දිවච්ඡ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි වූ කලන්දකනිවාප නම් වූ **වෙළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **පිලින්දිවච්ඡ** තෙරණුවෝ ('එව වසලය, ඉවත යා වසලය' යන ආදී වශයෙන්) වසල වාදයෙන් මහණුනට කතා කෙරෙති. එකල්හි බොහෝ මහණහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන්නාවූ ම ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ආයුෂ්මත් පිලින්දිවච්ඡයෝ භික්ෂූන්හට වසලවාදයෙන් කතා කෙරෙති"යි මෙ පවත් සැල කළහ.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකුහු බණවා, "මහණ තෝ මෙහි එ. 'ඇවැත්නි, පිලින්දිවච්ඡයිනි, ශාස්තෲහු තොප කැඳවති'යි මා වචනයෙන් පිලින්දිවච්ඡයා කැඳව"යි වදාළ සේක. 'එසේ ය, වහන්සැ'යි කියා ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පිලින්දිවච්ඡ තෙරුන් කරා එළැඹියේ ය. එළැඹ පිලින්දිවච්ඡ තෙරුනට 'ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ මුඹ කැඳවති'යි කීහ. 'එසේ ද ඇවැත්නි?'යි කියා පිලින්දිවච්ඡ තෙරණුවෝ ඒ මහණහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හිඳ ගත්හ. එකත්පසෙක හුන්නාවූ ම **පිලින්දිවච්ඡ** තෙරුනට භාග්‍යවතුන් වහන්සේ වච්ඡයෙනි, තොප වසලවාදයෙන් මහණුන් අමතති යනු සැබෑ දැ?"යි අසා වදාළ සේක. 'එසේ ය වහන්සැ'යි තෙරණුවෝ වදාළහ.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිලින්දිවච්ඡ තෙරුන්ගේ පෙර වුසු කඳපිළිවෙළ මෙනෙහි කොට, 'මහණෙනි, තෙපි වච්ඡ මහණුනට උජ්ඣායන (පහත් කොට සිතීම) නො කරව. මහණෙනි, වච්ඡයෝ ද්වේෂ සහගත සිත් ඇති වැ මහණුනට වසලවාදයෙන් කතා නො කරති. වච්ඡ මහණුන්දගේ අතීත පන්සියක් ම අත්බව්හු අතරක් නැතිව ම බමුණු කුලයෙහි උපන්නාහ. ඔවුන්ගේ ඒ 'වසලයා' යන වචනය බොහෝ කලක් කියා ගෙන එන ලද්දෙකි. එහෙයින් මේ වච්ඡයෝ මහණුනට ('වසලයා'යි) වසලවාදයෙන් (පෙර පුරුද්ද අනුව) කතා කෙරෙති.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

"යමෙක්හු කෙරෙහි මායාවෙක් නො පවත්නේ ද, මානයෙක් නො පවත්නේ ද, යමෙක් පහ වූ ලොභය ඇත්තේ ද, මමායන රහිත ද, ආශා රහිත ද, මුල් සුන් කළ ක්‍රොධය ඇත්තේ ද, (කෙලෙස් පිරිනිවතින්) නිවුණු සිතැත්තේ ද, බ්‍රාහ්මණයාත් හේ ම ය, ශ්‍රමණයාත් හේ ම ය, භික්ෂුවනුයේත් හේ ම ය.

## 3. 7.

## කාශ්‍යප සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයේ කලන්දකනිවාප නම් වූ **වෙළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **මහකසුප්** තෙරණුවෝ පිප්ඵලීගුහායෙහි වැඩ වෙසෙති. (එසේ වැඩ වසනුවෝ) එක්තරා සමාධියකට සම්වැද එක් පලඟින් වැඩහුන්නාහු වෙති.

2. අථ ඛො ආයස්මා මහාකස්සපො තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨාසි: අථ ඛො ආයස්මතො මහාකස්සපස්ස තම්හා සමාධිම්හා වුට්ඨිතස්ස එතදහොසි: 'යන්නූනාහං රාජගහං පිණ්ඩාය පවිසෙය්‍ය'න්ති. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි දෙවතාසතානි උස්සුක්කං ආපන්නානි හොන්ති, ආයස්මතො මහාකස්සපස්ස පිණ්ඩපාතපටිලාභාය. අථ ඛො ආයස්මා මහාකස්සපො තානි පඤ්චමත්තානි දෙවතාසතානි පටික්ඛිපිත්වා පුබ්බන්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි.

3: තෙන ඛො පන සමයෙන සක්කො දෙවානමින්දො ආයස්මතො මහාකස්සපස්ස පිණ්ඩපාතං දාතුකාමො හොති පෙසකාරවණ්ණං අභිනිම්මි-නිත්වා තන්තං විනාති. සුජා[1] අසුරකඤ්ඤා තසරං පූරෙති.

4. අථ ඛො ආයස්මා මහාකස්සපො රාජගහෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සක්කස්ස දෙවානමින්දස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. අද්දසා ඛො සක්කො දෙවානමින්දො ආයස්මන්තං මහාකස්සපං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ඝරා නික්ඛමිත්වා පච්චුග්ගන්ත්වා හත්ථතො පත්තං ගහෙත්වා ඝරං පවිසිත්වා ඝටියා ඔදනං උද්ධරිත්වා පත්තං පූරෙත්වා ආයස්මතො මහාකස්සපස්ස පාදාසි. සො අහොසි පිණ්ඩපාතො අනෙකසූපො අනෙකබ්‍යඤ්ජනො අනෙක-සූපරසබ්‍යඤ්ජනො.

5. අථ ඛො ආයස්මතො මහාකස්සපස්ස එතදහොසි: 'කො නු ඛො අයං සත්තො, යස්සායං එවරූපො ඉද්ධානුභාවො'ති. අථ ඛො ආයස්මතො මහා-කස්සපස්ස එතදහොසි: 'සක්කො ඛො අයං දෙවානමින්දො'ති. ඉති විදිත්වා සක්කං දෙවානමින්දං එතදවොච: කතං ඛො තෙ ඉදං කොසිය. මාස්සු පුනපි එවරූපමකාසී'ති.

6. 'අම්හාකම්පි භන්තෙ කස්සප, පුඤ්ඤෙන අත්ථො: අම්හාකම්පි පුඤ්ඤෙන කරණීය''න්ති. අථ ඛො සක්කො දෙවානමින්දො ආයස්මන්තං මහාකස්සපං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ තික්ඛත්තුං උදානං උදානෙසි: ''අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතං, අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිත''න්ති.

7. අස්සොසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය[2] සක්කස්ස දෙවානමින්දස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ තික්ඛත්තුං උදානං උදානෙන්තස්ස ''අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතං, අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිත''න්ති.

8. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

''පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තභරස්ස අනඤ්ඤපොසිනො,
දෙවා පිහයන්ති තාදිනො උපසන්තස්ස සදා සතීමතො''ති

1. සුජාතානි, බහූසු 2. මානුසකාය, බහූසු

2. ඉක්බිති මහකසුප් තෙරණුවෝ ඒ සතිය ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගී සිටියහ. ඉක්බිති ඒ සමාධියෙන් නැගී සිටි මහකසුප් තෙරුනට 'මම් රජගහනුවරට පිඬු පිණිස පිවිසෙන්නෙම් නම් යෙහෙකැ'යි මේ සිත වී ය. එ සමයෙහි වනාහි පන්සියක් පමණ දේවතාවෝ මහකසුප් තෙරුනට පිණ්ඩපාතය පිළිලබවනුවට (බොජුන් පිරිනමන්නට) උත්සුක බවට පැමිණියෝ වෙති. එ කල්හි මහකසුප් තෙරණුවෝ ඒ පන්සියක් පමණ දෙවතාවන් පිළිකෙවු කොට, පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පා සිවුරු ගෙන රජගහපුරයට පිඬු පිණිස පිවිසුණහ.

3. එ සමයෙහි සක්දෙවිඳු මහකසුප් තෙරුනට පිඬුපා දෙනු කැමැත්තේ වෙයි. හේ පෙහෙර වෙසක් මවාගෙන හු කටියි. අසුර දූ සුජා තොමෝ නඩාව (පිළී වියන සරස් දණ්ඩ) පුරා ලයි.

4. එ කල්හි මහකසුප් තෙරණුවෝ රජගහනුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙනුවෝ වෙස්වළා හුන් සක්දෙවිඳුහුගේ ගෙය කරා එළඹියහ. සක්දෙවිඳු වනාහි මහකසුප් තෙරුන් දුර දී ම දිටී. දැක ගෙන් නික්ම පෙර ගමන් කොට අතින් පාත්‍රය ගෙන ගෙට වැද සැළියෙන් බත් ගෙන පාත්‍රය පුරා මහකසුප් තෙරුනට දුන. ඒ පිණ්ඩපාත භොජනය නොයෙක් සූප ඇත්තේ නොයෙක් ව්‍යඤ්ජන ඇත්තේ නානාවිධ අග්‍රරස සහිත සූපව්‍යඤ්ජන ඇත්තේ විය.

5. එ කල්හි මහකසුප් තෙරුනට 'යමක්හට මෙ බඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ නම් ඒ මේ සත්ත්ව තෙම කවරෙක් නම් වේ දැ?'යි මේ සිත විය. ඉක්බිති මහකසුප් තෙරුනට 'මේ වනාහි සක්දෙවිඳු යැ'යි මේ සිත විය. මෙසේ දැන, 'කොසිය ය, මෙය තා විසින් කරන ලද්දෙක. යළි දු මෙ බන්දක් නො කරව'යි වදාළහ.

6. "වහන්ස, අපටත් පිනෙන් වැඩ ඇත. අපටත් පිනෙන් කටයුතු ඇතැ"යි සක්දෙවිඳු කී. ඉක්බිති සක්දෙවිඳු මහකසුප් තෙරුන් සකසා වැඳ පැදකුණු කොට අහස් නැඟ අහසෙහි දී, "ආශ්චර්‍ය්‍ය ය! කසුප් තෙරුන් කෙරෙහි සුපිහිටි දනෙකි! උතුම් දනෙකි! ආශ්චර්‍ය්‍ය ය! කසුප් තෙරුන් කෙරෙහි සුපිහිටි දනෙකි! උතුම් දනෙකි"යි තෙවරක් උදන් ඇනී ය.

7. භග්‍යවතුන් වහන්සේ මිනිසුන්ගේ ඇසුම් ඉම ඉක්මැ අසන්නට ඉවහල් වූ පිරිසිදු දිව කනින් "ආශ්චර්‍ය්‍ය ය! කසුප්තෙරුන් කෙරෙහි සුපිහිටි දනෙකි. උතුම් දනෙකි"යි අහස් නැඟ උදන් අනන සක්දෙවිඳුගේ වචනය ඇසූහ.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අරුත දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

"පිණ්ඩපාතිකාඞ්ගය පුරන තමා ම පුස්නා ආමිෂයෙන් අනුන් නො පුස්නා අටලෝ දහමින් නො සැලෙන උපශාන්ත වූ හැම කල්හි සිහි ඇති මහණහට දෙවියෝ ආදර උපදවත්."

## 3. 8.

## පිණ්ඩපාතිකසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරිමණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි:

“පිණ්ඩපාතිකො ආවුසො භික්ඛු පිණ්ඩාය චරන්තො ලභති, කාලෙන කාලං මනාපිකෙ චක්ඛුනා රූපෙ පස්සිතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ සොතෙන සද්දෙ සොතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ ඝානෙන ගන්ධෙ ඝායිතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ ජිව්හාය රසෙ සායිතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ කායෙන ඵොට්ඨබ්බෙ ඵුසිතුං. පිණ්ඩපාතිකො ආවුසො භික්ඛු සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො පිණ්ඩාය චරති. හන්ද ආවුසො මයම්පි පිණ්ඩ-පාතිකා හොම. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ චක්ඛුනා රූපෙ පස්සිතුං. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ සොතෙන සද්දෙ සොතුං. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ ඝානෙන ගන්ධෙ ඝායිතුං. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ ජිව්හාය රසෙ සායිතුං. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ කායෙන ඵොට්ඨබ්බෙ ඵුසිතුං. මයම්පි සක්කතා ගරුකතා මානිතා පූජිතා අපචිතා පිණ්ඩාය චරිස්සාමා”ති. අයඤ්චරහි තෙසං භික්ඛූනං අන්තරා කථා හොති විප්පකතා.

2. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන කරෙරිමණ්ඩලමාළො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: “කායනුත්ථ භික්ඛවෙ, එතරහි කථාය සන්නිසින්නා කා ච පන වො අන්තරා කථා විප්පකතා”ති.

3. ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරි-මණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: “පිණ්ඩපාතිකො ආවුසො භික්ඛු පිණ්ඩාය චරන්තො ලභති කාලෙන කාලං මනාපිකෙ චක්ඛුනා රූපෙ පස්සිතුං ලභති කාලෙන කාලං මනාපිකෙ සොතෙන සද්දෙ සොතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ ඝානෙන ගන්ධෙ ඝායිතුං. ලභති කාලෙන කාලං මනාපිකෙ ජිව්හාය රසෙ සායිතුං ලභති කාලෙන කාලං මනාපිකෙ කායෙන ඵොට්ඨබ්බෙ ඵුසිතුං. පිණ්ඩපාතිකො ආවුසො භික්ඛු සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො පිණ්ඩාය චරති. හන්ද ආවුසො මයම්පි පිණ්ඩපාතිකා හොම. මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ චක්ඛුනා රූපෙ පස්සිතුං. -පෙ- මයම්පි ලච්ඡාම කාලෙන කාලං මනාපිකෙ කායෙන ඵොට්ඨබ්බෙ ඵුසිතුං. මයම්පි සක්කතා ගරුකතා මානිතා පූජිතා අපචිතා පිණ්ඩාය චරිස්සාමා”ති අයං ඛො නො භන්තෙ අන්තරා කථා හොති විප්පකතා. අථ ඛො භගවා[1] අනුප්පත්තො”ති.

4. නඛ්වෙතං භික්ඛවෙ තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං. යං තුම්හෙ එවරූපිං කථං කථෙය්‍යාථ “සන්නිපතිතානං ඛො භික්ඛවෙ ද්වයං කරණීයං, ධම්මී වා කථා අරියො වා තුණ්හීභාවො”ති.

---

1. අථ භගවා, ම.

## 3. 8.

## පිණ්ඩපාතික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ අනේපිඬුසිටුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි පසුබත්සමයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා පැමිණි, **කරේරි-මණ්ඩලමාලකයෙහි** එක් වැ හුන්, එක් රැස් වූ, මහණුන් අතරැ මේ කථාව පහළ විය:

"ඇවැත්නි, පිණ්ඩපාතිකාඞ්ගය රක්නා මහණ තෙම පිඬු පිණිස හැසිරෙන්නේ කලින් කලැ ඇසින් මන වඩන රූප දක්නට ලබයි. කලින් කලැ කනින් මන වඩන හඬ අසන්නට ලබයි. කලින් කලැ මන වඩන ගඳ ආඝ්‍රාණ කරන්නට ලබයි. කලින් කලැ මන වඩන රස ආස්වාද කරන්නට ලබයි. කලින් කලැ මන වඩන ස්පෘෂ්ටව්‍යයන් ස්පර්ශ කරන්නට ලබයි. ඇවැත්නි, පිණ්ඩපාතික මහණ තෙම සත්කාර ලද්දුයේ ගෞරව ලද්දුයේ බුහුමන් ලද්දුයේ පුදන ලද්දුයේ යටත් පැවතුම් ලද්දුයේ පිඬු පිණිස හැසිරෙයි. එබැවින් ඇවැත්නි, අපි ද්‍ද පිණ්ඩපාතිකාඞ්ගය රක්නමෝ වමු: අපි දු කලින් කලැ ඇසින් මන වඩන රූප දකින්නට ලබන්නමු, අපි දු කලින් කලැ කනින් මන වඩන හඬ අසන්නට ලබන්නමු. අපි දු කලින් කලැ ඝ්‍රාණයෙන් මන වඩන ගඳ ආඝ්‍රාණ කරන්නට ලබන්නමු. අපි දු කලින් කලැ දිවින් මන වඩන රස ආස්වාද කරන්නට ලබන්නමු. අපි දු කලින් කලැ කයින් මන වඩන ස්පෘෂ්ටව්‍ය ස්පර්ශ කරන්නට ලබන්නමු. අපි දු සත්කාර ලද්දුමෝ ගුරුකාර ලද්දුමෝ බුහුමන් ලද්දුමෝ පුදන ලද්දුමෝ යටත් පැවැතුම් ලද්දුමෝ පිඬු පිණිස හැසිරෙන්නමු" යනු යි. ඒ භික්ෂූන් අතරැ මේ කථාව අඩාළ වී ය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි චිත්තවිවේකයෙන් නැඟී සිටි සේක්, කරේරිමණ්ඩලමාලය කරා එළැඹි සේක. එළැඹ පණවන ලද අස්නෙහි වැඩ හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිද ම භික්ෂූන් අමතා "මහණෙනි, දැන් තෙපි කවර නම් කථාවෙකින් හුන්නහු ද? තොපගේ කවර නම් කථාවෙක් අඩාළ වී ද?"යි අසා වදාළ සේක.

3. "වහන්ස, පසුබත් සෙමෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආ කරේරි-මණ්ඩලමාලකයෙහි එක් වැ හුන් එක් රැස් වූ අප අතරැ මේ කථාව පහළ විය. ඇවැත්නි, පිණ්ඩපාතිකාඞ්ගය රකිනා මහණ තෙම පිඬුපිණිස හැසි-රෙන්නේ කලින් කලැ ඇසින් මන වඩන රූප දක්නට ලබයි...අපිදු සත්කාර ලද්දුමෝ ගුරුකාර ලද්දුමෝ බුහුමන් ලද්දුමෝ පුදන ලද්දුමෝ යටත් පැවැතුම් ලද්දුමෝ පිඬු පිණිස හැසිරෙන්නමු" යනු යි. වහන්ස, අප අතරැ මේ කථාව අඩාළ වූයේ වෙයි. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ"යි ඒ මහණහු කීහු:

4. "මහණෙනි, තෙපි මෙබඳු කථාවක් කියන්නහුය යන යමෙක් ඇද්ද, මෙය සැදැහෙන් ගිහිගෙන් නික්ම සසුන් වන් කුලදරු වූ තොපට නොනිසිය. මහණෙනි, එක්රැස් වූ තොප විසින් දැහැමි කතාව හෝ ආර්‍ය්‍ය තූෂ්ණීම්භා-වය යන මේ කටයුතු දෑ දෙකෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

5. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තභරස්ස අනඤ්ඤපොසිනො,
දෙවා පිහයන්ති තාදිනො නො චෙ සද්දසිලොකනිස්සිතො"ති,

## 3. 9.

### සිප්පසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "කො නු ඛො ආවුසො සිප්පං ජානාති, කො කිං සිප්පං සික්ඛි, කතරං සිප්පං සිප්පානං අග්ග"න්ති.

2. තත්රේකච්චෙ එවමාහංසු. "හත්ථිසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "අස්සසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "රථසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ධනුසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ථරුසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "මුද්දාසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ගණනසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "සඞ්ඛානසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ලෙඛාසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "කාවෙය්‍යසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ලොකායතසිප්පං සිප්පානං අග්ග"න්ති එකච්චෙ එවමාහංසු: "ඛත්තවිජ්ජාසිප්පං[1] සිප්පානං අග්ග"න්ති. අයඤ්චරහි තෙසං භික්ඛූනං අන්තරා කථා හොති විප්පකතා.

3. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන මණ්ඩලමාලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතා"ති.

4. ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි; "කො නු ඛො ආවුසො සිප්පං ජානාති, කො කිං සිප්පං සික්ඛි, කතරං සිප්පං සිප්පානං අග්ග"න්ති. තත්රේකච්චෙ එවමාහංසු: "හත්ථිසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: 'අස්සසිප්පං සිප්පානං අග්ග''න්ති. එකච්චෙ එවමාහංසු: "රථසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ධනුසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: 'ථරුසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "මුද්දාසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ගණනසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "සඞ්ඛානසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ලෙඛාසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "කාවෙය්‍යසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: "ලොකායතසිප්පං සිප්පානං අග්ග"න්ති. එකච්චෙ එවමාහංසු: ඛත්තවිජ්ජා සිප්පං[1] සිප්පානං අග්ග"න්ති. අයං ඛො නෙ භන්තෙ අන්තරා කථා හොති විප්පකතා. අථ ඛො භගවා[2] අනුප්පත්තොනාති.

---

1. ඛෙත්තවිජ්ජාසිප්පං, සී, ම. 2. අථ භගවා.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන, එවේලෙහි මේ උදන් ඇනූ සේක:

"යම් මහණෙක් තමා පිළිබඳ යසගීහඬ ඇසුරු නො කෙළේ නම් (නො පතා නම්) පිණ්ඩපාතිකාඞ්ගය රක්නා තමා ම පුස්නා අනෙකකු නො පුස්නා අවලෝදගමින් නොසැලෙන ඒ මහණහට දෙවියෝ (ද) ආදර කෙරෙත්."

## 3. 9.

## ශිල්ප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **දෙව්රම්** නම් වූ අනේපිඬුසිටුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි පසුබත් සෙමෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආ මණ්ඩලමාළයෙහි එක්වැ හුන් එක්රැස් වූ මහණුන් අතුරෙහි "ඇවැත්නි, කවරෙක් නම් ශිල්ප දනී ද? කවරෙක් කවර ශිල්පයක් උගත්තේ ද? කවර ශිල්පයෙක් ශිල්ප අතුරෙහි අග්‍ර දැ?"යි මේ කථාව උපන.

2. එහි ඇතැම් කෙනෙක් 'හස්තිශිල්පය ශිල්ප අතුරෙහි අග්‍ර යැ යි කීහ. සමහරු අශ්වශිල්පය ශිල්ප අතුරෙහි අග්‍ර යැ' යි කීහ. 'රථශිල්පය ශිල්ප අතුරෙහි අග්‍රයැ' යි කෙනෙක් කීහ. 'ධනුශශිල්පය ශිල්ප අතුරෙහි අග්‍ර යැ" යි ඇතැම්හු කීහ. ආයුධශිල්පය සිප් අතුරෙහි අග්‍ර යැ' යි සමහරු කීහ. 'මුද්‍රාශිල්පය ශිල්ප අතුරෙන් අග්‍ර යැ' යි සමහරු කීහ. 'ගණනාශිල්පය ශිල්ප අතුරෙහි අග්‍ර යැ' යි සමහරු කීහ. සඞ්ඛ්‍යානශිල්පය ශිල්පඅතුරෙන් අග්‍ර යැ'යි සමහරු කීහ. 'ලෙඛනශිල්පය ශිල්ප අතුරෙහි අග්‍ර යැ' යි සමහරු කීහ. 'කාව්‍යශිල්පය ශිල්ප අතුරෙන් අග්‍ර යැ' යි කෙනෙක් කීහ. ලොකායත (විතණ්ඩ) ශිල්පය ශිල්ප අතුරෙන් අග්‍ර යැ' යි කෙනෙක් කීහ. 'ක්‍ෂත්‍රවිද්‍යා-ශිල්පය (නීතිශාස්ත්‍රය) ශිල්ප අතුරෙන් අග්‍ර යැ' යි කෙනෙක් කීහ. ඒ භික්‍ෂූන් අතර මේ කථාව අඩාළ වූයේ වෙයි.

3. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි සමවත් සුවෙන් නැගී සිටි සේක් මණ්ඩලමාළය කරා එළැඹි සේක. එළැඹ පණවන ලද අස්නෙහි වැඩ හුන් සේක. වැඩහිඳ ම භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දැන් කවර නම් කථාවෙකින් එක් වැ හුන්නහු ද? තොපගේ කවර නම් කථාවෙක් අඩාළ වී දැ?"යි භික්‍ෂූන් අමතා වදාළ සේක.

4. "වහන්ස, මෙහි පසුබත් සමයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආ මණ්ඩලමාළයෙහි එක් වැ හුන් එක්රැස් වූ අප අතර "ඇවැත්නි, කවරෙක් නම් ශිල්ප දනී ද? කවරෙක් කවර ශිල්පයක් උගත්තේ ද? කවර ශිල්පයෙක් ශිල්ප අතුරෙහි අග්‍ර වේ දැ?"යි මෙසේ කථාවෙක් පහළ විය. එහි ඇතැම් කෙනෙක් 'හස්තිශිල්පය ශිල්පඅතුරෙහි අග්‍ර යැ'යි කීහ...ක්‍ෂත්‍රවිද්‍යාශිල්පය (නීතිශාස්ත්‍රය) ශිල්ප අතුරෙන් අග්‍ර යැ' යි කෙනෙක් කීහ. වහන්ස, අප අතර මේ කථාව අඩාළ වූයේ වේ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ"යි ඒ භික්‍ෂූහු සැළ කළහ.

5. "නඛ්වෙතං භික්ඛවෙ තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං, යං තුම්හෙ එවරූපිං කථං කථෙය්‍යාථ. සන්නිපතිතානං වො භික්ඛවෙ ද්වයං කරණීයං, "ධම්මී වා කථා අරියො වා තුණ්හීභාවො"ති.

6. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

අසිප්පජීවී ලහු අත්ථකාමො යතින්ද්‍රියො සබ්බධි විප්පමුත්තො,
අනොකසාරී අමමො නිරාසො හිත්වා මානං එකචරො ස භික්ඛූ"ති.

## 3. 10.

## ලොකවොලොකනසුත්තං.

1. එවං මෙ සුත්තං: එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පන සමයෙන භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති විමුත්තිසුඛ-පටිසංවෙදී.

2. අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙසි. අද්දසා ඛො භගවා බුද්ධ-චක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අනෙකෙහි සන්තාපෙහි සන්තප්පමානෙ අනෙකෙහි ච පරිළාහෙහි පරිඩය්හමානෙ රාගජෙහිපි දොසජෙහිපි මොහජෙහිපීති.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අයං ලොකො සන්තාපජාතො ඵස්සපරෙතො රොගං වදති අත්තතො,
යෙන යෙන හි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා.

අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවපරෙතො භවමෙවාභිනන්දති,
යදභිනන්දති තං භයං යස්ස භායති තං දුක්ඛං.
භවවිප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති.

5. "මහණෙනි, තෙපි මෙබඳු කථාවක් කරන්නහු ය යන යමෙක් ඇද්ද, සැදැහැයෙන් ගිහිගෙන් නික් මැ සසුන් වන් කුලදරු වූ තොපට මෙය නොසුදුසු ය. මහණෙනි, එක් රැස් වූ තොප විසින් දැහැමි කථාව හෝ ආර්‍ය්‍ය තූෂ්ණීම්භාවය යන කටයුතු දෑ දෙකෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"ශිල්පයෙකින් දිවි නොරක්නා සැහැල්ලු පැවැතුම් ඇති, දෙවියන් සහිත ලෝවැස්සාට වැඩ කැමැති සංයත වූ ඉඳුරන් ඇති හැම තන්හි මිදුණු ෂඩායතනයන්හි නොහැසිරෙන මමායන රහිත වූ ආශාරහිත වූ මානය දුරු කොට (ගණසඞ්ගණිකාව හැර) එකලා වැ හැසිරෙන යම් ඒ මහණෙක් වේ ද, හේ (බුන් කෙලෙස් ඇත්තේ පරමාර්ථ වශයෙන්) භික්ෂු නම්.

## 3. 10.

## ලෝකව්‍යවලෝකනසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නේරඤ්ජරාගංතෙර බෝරුක්මුලැ බුදු වැ පළමු කොට ම වාසය කරන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ රහත්පල සමවත් සුව විඳිනාසේක් සත් දවසක් එක්පලගෙකින් හුන්සේක් වෙති.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ සතිය ඇවෑමෙන් ඒ සමාධි-යෙන් නැඟී සිට බුදුඇසින් ලොව බැලූ සේක. භාග්‍යවතුන් වහන්සේ බුදු-ඇසින් ලොව බලනසේක් රාගයෙන් උපන් ද, ද්වෙෂයෙන් උපන් ද, මොහයෙන් උපන් දෑ යි නොයෙක් සතැවිලියෙන් තැවෙන නොයෙක් දැවිල්ලෙන් දැවෙන සත්ත්වයන් දුටුසේක් ම ය.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"මේ ලොව හටගත් සතැවිලි ඇත්තේ වෙයි. (එහෙයින් ම) දුක් පහසින් මඩනා ලද්දේ ය. පහසින් උපදනා වේදනා නැමැති රෝගය (මම සුවපත් වෙමි, මම සුවපත් වෙමි ආදීන්) තමා වශයෙන් කියයි. යම් යම් අයුරෙකින් සිතන්නේ ද, එයින් අන් සැටියෙකින් ම එය වේ.

තමන්ගේ භිතසුවෙහි ම ඇලුණු සත් ලොව තමා සිතන සැටියෙන් අන් පරිද්දෙකින් ම වන සුලු ය. (එසේ ඇති කල්හි දු) ලෝවැසි තෙම (මඤ්ඤනා වශයෙන් කල්පනා කොට ගන්නා ලද (අභිවෘද්ධියෙහි ආශායෙන් මඩනා ලද්දේ අවිද්‍යමාන වූ වෘද්ධියක් ම කැමැති වෙයි. යම් කාමාදිභවයක් (හෝ යසඉසුරු ආදි වෘද්ධියක්) කැමැති වේ ද (සිතින් පිළිගනී ද) ` එය (අනිත්‍යාදි විපරිණාම සවභාව හෙතුයෙන්) බියෙකි. (බිය උපදවන්නෙකි). යම් අනිත්‍යතාදියෙකින් බිය ගනී ද, එය දුකෙකි. කාමභවාදි භවයාගේ දුරලීම පිණිස ම මේ මගබඹසර පුරනු ලැබේ.

යෙ හි කෙචි සමණා වා
බ්‍රාහ්මණා වා භවෙන භවස්ස
විප්පමොක්ඛමාහංසු
සබ්බෙ තෙ අවිප්පමුත්තා භවස්මාති වදාමි.

යෙ වා පන කෙචි සමණා වා
බ්‍රාහ්මණා වා විභවෙන භවස්ස නිස්සරණමාහංසු
සබ්බෙ තෙ අනිස්සටා භවස්මාති වදාමි.

උපධිං[1] පටිච්ච දුක්ඛමිදං සම්භොති
සබ්බුපාදානක්ඛයා නත්ථි දුක්ඛස්ස සම්භවො.
ලොකමිමං පස්ස පුථු
අවිජ්ජාය පරෙතා භූතා භූතරතා
භවා අපරිමුත්තා.

යෙ හි කෙචි භවා
සබ්බධි සබ්බත්ථතාය[2]
සබ්බෙ තෙ භවා අනිච්චා
දුක්ඛා විපරිණාමධම්මා.

එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො
භවතණ්හා පහීයති විභවං නාභිනන්දති
සබ්බසො තණ්හානං ඛයා අසෙසවිරාගනිරොධො නිබ්බානං.

තස්ස නිබ්බුතස්ස භික්ඛුනො අනුපාදා පුනබ්භවො න හොති,
අභිභූතො මාරො විජිතසඞ්ගාමො උපච්චගා සබ්බභවානි තාදී''ති.

**නන්දවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

කම්මං නන්දො යසොජො ච සාරිපුත්තො ච කොලිතො,
පිලින්දි කස්සපො පිණ්ඩො සිප්පං ලොකෙන තෙ දසාති.

---

## මෙඝියවග්ගො චතුත්ථො

### 4. 1.

### මෙඝියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා චාලිකායං විහරති චාලිකෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා මෙඝියො භගවතො උපට්ඨාකො හොති. අථ ඛො ආයස්මා මෙඝියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: 'ඉච්ඡාමහං භන්තෙ ජන්තුගාමං පිණ්ඩාය පවිසිතු'න්ති. ''යස්සදානි ත්වං මෙඝිය කාලං මඤ්ඤසී'ති.

---

1. උපධිං, සී. 2. සබ්බත්ථතාය, සී

යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ භවයෙකින් භවයෙක (හෝ සියලු භවයෙන් ම හෝ) මිදීමක් කීහු ද, ඒ සියලු අත්තොවුවෝ භවයෙන් නොමිදුණහ යි කියමි.

යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ උච්ඡේදදෘෂ්ටියෙන් භවයෙන් නික්මීම කීහු ද, ඒ සියල්ලෝ භවයෙන් නොමිදුණෝ යැ යි කියමි.

උපධිප්‍රත්‍යයයෙන් මේ දුක් හටගනී. සියලු උපාදානයන්ගේ ක්‍ෂයයෙන් දුක් හටගැන්ම නො වේ. මේ බොහෝ වූ ලොව බලව. අවිද්‍යායෙන් මඩනා ලද, කර්මක්ලේශයන්ගෙන් උපන්, අන් සතුන් කෙරෙහි තෘෂ්ණායෙන් ඇලුණු සත්ත්වයෝ භවයෙන් නොමිදුණෝ ය.

කාමභවාදි යම් භව කෙනෙක් වෙත් ද, ඒ හැම තන්හි (සවර්ගාපාය මනුෂ්‍යාදි) සර්වභාවයෙන් ඒ සියලු භවයෝ (රූපවේදනාදි ධර්මයෝ) අනිත්‍යයහ, දුක්හ, පෙරළෙන සුලුහ.

මෙසේ මෙය ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥායෙන් දක්නහුගේ භවතෘෂ්ණාව පහ වෙයි. (උච්ඡේද දෘෂ්ටිය දුරු වූ බැවින්) විච්ඡේදය නො පතයි. සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්‍ෂයයෙන් නො ඉතිරි ව ආර්‍ය්‍යමාර්ගයෙන් නැවැත නොඋපදනා පරිදි නිරුද්ධ වීමෙක් වේ ද ඒ (සොපාදිශෙෂ) නිර්වාණ යි.

ඒ කෙලෙස් නිවීමෙන් නිවුණු මහණහට උපාදාන නැති බැවින් පුනර්භවයෙක් නො වේ. මරු මඩනා ලද්දේ ය. මෙසේ දිනූ මරයුද ඇති රහත් තෙම සියලු භවයන් ඉක්මියේ ය."

**තෙවෙනි නන්‍දවර්ගය යි.**

එහි **උද්දානය**:

කම්ම නන්‍ද යසොජ සාරිපුත්ත කොලිත පිලින්‍දිවච්ඡ කස්සප පිණ්ඩපාත සිප්ප ලොක යන මෙයින් ඒ සූත්‍ර දශයෙකි.

---

# සිවුවන මෙඝිය වර්ගය.

## 4. 1.

### මෙඝිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **චාලිකා නුවරට** නොදුරෙහි වූ **චාලිකා පර්වතයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **මෙඝිය** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙති. එ කල්හි මෙඝිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියාවූ මෙඝිය තෙරණුවෝ 'වහන්ස, මම් **ජන්තුග්‍රාමයට** පිඩු පිණිස පිවිසෙන්නට කැමැත්තෙමි'යි භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. 'මෙඝියයෙනි, තෙපි යම් ගමනකට කාලය යැ යි සිතාවූ නම් එය කරව' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

2. අථ ඛො ආයස්මා මෙඝියො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ජන්තුගාමං පිණ්ඩාය පාවිසි. ජන්තුගාමෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන කිමිකාළාය නදියා තීරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කිමිකාළාය නදියා තීරෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අද්දසා ඛො අම්බවනං පාසාදිකං රමණීයං. දිස්වානස්ස එතදහොසි: "පාසාදිකං වතිදං අම්බවනං රමණීයං. අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානාය. සචෙ මං භගවා අනුජානෙය්‍ය ආගච්ඡෙය්‍යාහං ඉමං අම්බවනං පධානායා"ති.

3. අථ ඛො ආයස්මා මෙඝියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: "ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ජන්තුගාමං පිණ්ඩාය පාවිසිං. ජන්තුගාමෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන කිමිකාළාය නදියා තීරං තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා කිමිකාළාය නදියා තීරෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අද්දසං අම්බවනං පාසාදිකං රමණීයං. දිස්වාන මෙ එතදහොසි: 'පාසාදිකං වතිදං අම්බවනං රමණීයං. අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානාය. සචෙ මං භගවා අනුජානෙය්‍ය, ආගච්ඡෙය්‍යාහං ඉමං අම්බවනං පධානායාති. සචෙ මං භන්තෙ භගවා අනුජානාති, ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායා'ති.

4. එවං වුත්තෙ භගවා ආයස්මන්තං මෙඝියං එතදවොච: 'ආගමෙහි තාව මෙඝිය, එකකම්හා යාව අඤ්ඤො කොචි[1] භික්ඛු ආගච්ඡතී'ති.[2] දුතියම්පි ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: "භගවතො භන්තෙ, නත්ථි කිඤ්චි උත්තරි[3] කරණීයං, නත්ථි කතස්ස වා පතිචයො. මය්හං ඛො පන භන්තෙ, අත්ථි උත්තරි[3] කරණීයං, අත්ථි කතස්ස පතිචයො. සචෙ මං භන්තෙ, භගවා අනුජානාති ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායා"ති. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං මෙඝියං එතදවොච: "ආගමෙහි තාව මෙඝිය, එකකම්හා යාව අඤ්ඤො කොචි[4] භික්ඛු ආගච්ඡතී"ති. තතියම්පි ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: "භගවතො භන්තෙ, නත්ථි කිඤ්චි උත්තරි[3] කරණීයං, නත්ථි කතස්ස වා පතිචයො. මය්හං ඛො පන භන්තෙ, අත්ථි උත්තරි[3] කරණීයං, අත්ථි කතස්ස පතිචයො. සචෙ මං භන්තෙ, භගවා අනුජානාති, ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායා"ති.

5. "පධානන්ති ඛො මෙඝිය, වදමානං කින්ති වදෙය්‍යාම? යස්සදානි ත්වං මෙඝිය, කාලං මඤ්ඤසී"ති. අථ ඛො ආයස්මා මෙඝියො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන තං අම්බවනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අම්බවනං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මතො මෙඝියස්ස තස්මිං අම්බවනෙ විහරන්තස්ස යෙභුය්‍යෙන තයො පාපකා අකුසලා විතක්කා සමුදාචරන්ති. සෙය්‍යථීදං? "කාමවිතක්කො, බ්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කො"ති. අථ ඛො ආයස්මතො මෙඝියස්ස එතදහොසි: "අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සද්ධාය ච වතම්හි අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පනිමෙහි තීහි පාපකෙහි අකුසලෙහි විතක්කෙහි අන්වාසත්තො. සෙය්‍යථීදං? "කාමවිතක්කෙන, බ්‍යාපාදවිතක්කෙන, විහිංසාවිතක්කෙනා"ති.

---

1. අඤ්ඤොපි කොචි, සී. 2 දිස්සති නවඞ්ගුත්තරපාළි 3. උත්තරිං, සී.

2. ඉක්බිත්තෙන් මෙඝිය තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙන ජන්තුග්‍රාමයට පිඬු පිණිස පිවිසියහ. ජන්තුග්‍රාමයෙහි පිඬු පිණිස හැසිර පසුබත් කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු කිමිකාළා නදියගේ තීරය කරා එළැඹියහ. එළැඹ කිමිකාළා නදිය තෙර ජඞ්ඝාවිහාරය පිණිස සක්මන් කරනුවෝ හැවිද්නුවෝ සිත් පහදවන සිත්කලු අඹවනයක් දුටහ. දුටීමෙන්, "මේ අඹවනය එකාන්තයෙන් සිත පහදවන සුලු ය, සිත්කලු ය. මෙය ප්‍රධන්වීර්‍ය වඩනු කැමැති කුලපුතක්හට ප්‍රධන් වඩනු පිණිස සුදුසු ම ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මට අනුදන්නා සේක් නම්, බවුන් වඩනු පිණිස මේ අඹවනයට එන්නෙමි"යි මේ සිත විය.

3. ඉක්බිත්තෙන් මෙඝිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ, එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් මෙඝිය තෙරණුවෝ "වහන්ස, මෙහි මම් පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන ජන්තුග්‍රාමයට පිඬු පිණිස පිවිසියෙමි. ජන්තුග්‍රාමයෙහි පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් නැවැතුණෙමි, කිමිකාළානදිය තෙරට එළැඹියෙමි. එළැඹ, කිමිකාළා නදිය තෙර ජඞ්ඝා-විහාරයෙහි යෙදී සක්මන් කරනුයෙමි, හැවිදිනුයෙමි, ප්‍රසාද එළවන, සිත්-කලු අඹවනයක් දිටිමි. දුටීමෙන් මට 'මේ අඹවනය මහණදම් කරනු කැමැති කුලපුතක්හට ප්‍රධන් වඩනුවට ඒකාන්තයෙන් සුදුසු යැ'යි මේ සිත විය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම්, මම් ප්‍රධන් වඩනු පිණිස මේ අඹවනයට එන්නෙමි'යි මේ සිත විය. වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මට අනුදන්නා සේක් නම්, ඒ අඹවනයට මම් ප්‍රධන් වඩනු පිණිස යන්නෙමි"යි කීහ.

4. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙඝිය තෙරුනට, 'මෙඝියයෙනි, මම් හුදෙකලා වෙමි. අන් මහණකු එන තෙක් කුඩා තමක් බලව'යි වදාළ සේක. දෙවෙනි වර ද මෙඝිය තෙරණුවෝ කියනුවෝ, 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මත්තෙහි කටයුතු දෑයෙක් නැත. කළ දෑයෙහි යළි රැස් කැරුමෙක් නැත. වහන්ස, මට වනාහි මත්තෙහි කටයුතු දෑ ඇත. කළ දෑයෙහි යළි රැස් කැරුම් ඇත. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මට අනුදන්නා සේක් නම්, ඒ අඹවනයට ප්‍රධන් වඩනු පිණිස යන්නෙම්වා'යි කීහ. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ "මෙඝිය තෙරුනට, 'මෙඝියයෙනි, මම් හුදෙකලා වෙමි. අන් කිසි මහණකු එන තුරු කුඩා තමක් බලව"යි වදාළ සේක. තෙවෙනි වර ද මෙඝිය තෙරණුවෝ "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මත්තෙහි කටයුතු දෑයෙක් නැත. කළ දෑයෙක හෝ යළි වැඩීමෙක් නැත. මට වනාහි වහන්ස, මත්තෙහි කටයුතු ඇත. කළ දෑයෙහි වැඩුම් ඇත. ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම්, ඒ අඹවනයට ප්‍රධන් වඩනු පිණිස මම් යන්නෙමි"යි කීහ.

5. "මෙඝියයෙනි, මහණදම් කරමි යි කියන තොපට අපි අන් කුමක් නම් කිය හැක්කමෝ ද? යමකට දැන් තෙපි කල් යැ යි සිතවු නම් එය කිරීම තොප අයත් වැඩෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිත්තෙන් මෙඝිය තෙරණුවෝ හුනස්නෙන් නැඟී සිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට, ඒ අඹවනය කරා එළැඹියහ. එළැඹ ඒ අඹවනයට බැස ගෙන එක්තරා රුක්මූලෙක දිවාවිහාරය පිණිස හිඳගත්හ ඉක්බිත්තෙන් (මෙසේ) ඒ අඹවෙනෙහි වසන මෙඝිය තෙරුනට කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්ක යන තුන් ලාමක අකුශල කල්පනාවෝ බෙහෙවින් පහළ වෙත්. එකල්හි මෙඝිය තෙරුනට, "ආශ්චර්‍යයෙක පින්වත්නි! නොවූවිරි-යෙක පින්වත්නි! මම් සැදැහැයෙන් ම ගිහිගෙන් නික්ම සසුන් වනිමි. එහෙත් කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්ක යන මේ තුන් ලාමක අකුශල විතර්ක-වලින් ලැගුණමෝ වම්හ"යි මේ සිත විය.

6. අථ ඛො ආයස්මා මෙඝියො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, තස්මිං අම්බවනෙ විහරන්තස්ස යෙභුය්‍යෙන තයො පාපකා අකුසලා විතක්කා සමුදාචරන්ති. සෙය්‍යථීදං: කාමවිතක්කො, බ්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කොති. තස්ස මය්හං භන්තෙ, එතදහොසි: "අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සද්ධාය ච වතම්හි අගාරස්මා අනගාරියං පබ්බජිතො, අථ ච පනිමෙහි තීහි පාපකෙහි අකුසලෙහි විතක්කෙහි අන්වාසත්තා.[1] සෙය්‍යථීදං: "කාමවිතක්කෙන, බ්‍යාපාදවිතක්කෙන, විහිංසාවිතක්කෙනා"ති.

7. අපරිපක්කාය මෙඝිය, චෙතොවිමුත්තියා පඤ්ච ධම්මා පරිපාකාය සංවත්තන්ති. කතමෙ පඤ්ච? ඉධ මෙඝිය, භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං පඨමො ධම්මො පරිපාකාය සංවත්තති.

පුනචපරං මෙඝිය, භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අපරිපක්කාය මෙඝිය, චෙතොවිමුත්තියා අයං දුතියො ධම්මො පරිපාකාය සංවත්තති.

පුනචපරං මෙඝිය, භික්ඛු යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. සෙය්‍යථීදං? අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤාකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා. එවරූපාය කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී; අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං තතියො ධම්මො පරිපාකාය සංවත්තති.

පුනචපරං මෙඝිය, භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං චතුත්ථො ධම්මො පරිපාකාය සංවත්තති.

පුනචපරං මෙඝිය, භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං පඤ්චමො ධම්මො පරිපාකාය සංවත්තති.

අපරිපක්කාය මෙඝිය, චෙතොවිමුත්තියා ඉමෙ පඤ්ච ධම්මා පරිපාකාය සංවත්තන්ති.

1. අන්වාසත්තොතිපි පාඨො- අට්ඨ:

6. ඉක්බිත්තෙන් මේඝිය තෙරණුවෝ සවස් වේලෙහි පිළිසලනින් නැගී සිටියෝ, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් මේඝිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට, "වහන්ස, මෙහි ඒ අඹවෙනෙහි වසන මට කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්ක යන තුන් ලාමක අකුශල විතර්කයෝ බෙහෙවින් පහළ වෙත්. වහන්ස, ඒ මට "පින්වත්නි, එකාන්තයෙන් ආශ්චර්යයක. පින්වත්නි, එකාන්තයෙන් අද්භූතය. එකාන්තයෙන් මම සැදැහැයෙන් ම ගිහිගෙන් නික්ම සසුන් වනිමි. එහෙත් මේ කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්ක යන තුන් විතර්කවලින් ලැගුණමෝ වම්හ"යි මේ පවත් සැළ කළහ.

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:)

7. "මේඝියයෙනි, නොමුහු කළ චිත්තවිමුක්තියගේ මුහු කිරීම පිණිස ධර්මයෝ පස් දෙනෙක් පවතිත්. කවර පස් දෙනෙක යත්: මේඝියයෙනි, මෙහි මහණ තෙම කලණමිතුරන් ඇත්තේ කලණ යහළුවන් ඇත්තේ, කලණ පුද්ගලනට නැමුණේ වෙයි ද, මේ පළමු දහම නො මුහු කළ චිත්තවිමුක්තියගේ මුහු කිරීම පිණිස පවතී.

තව ද මේඝියයෙනි, මහණ තෙමේ සිල්වත් වේ ද, ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවෘත ව වෙසේ ද, ආචාරගොචර දෙකින් සම්පූර්ණ වේ ද, ස්වල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නා සුලු වේ ද, සමාදන් කොට ගෙන සික්පදයන්හි හික්මේ ද, මේ දෙවෙනි දහම නොමුහු කළ චෙතොවිමුක්තියගේ මුහු කිරීම පිණිස පවතී.

තව ද මේඝියයෙනි, අල්පෙච්ඡකථා සන්තුෂ්ටිකථා ප්‍රවිවේකකථා අසංසර්ග-කථා වීර්‍ය්‍යාරම්භකථා ශීලකථා සමාධිකථා ප්‍රඥාකථා විමුක්තිකථා විමුක්තිඥාන-දර්ශනකථා යන කෙලෙස් තුනී කරන, සිතේ ආවරණ දුරලීමට (හෙවත් සමථවිපස්සනා වැඩීමට) සැප වූ යම් කථාවෙක් එකාන්තයෙන් සසර දුකෙහි කලකිරෙනු පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, සියලු කෙලෙස් සංසිඳීම පිණිස, දත යුතු දෑ දැනීම පිණිස, සම්බොධය පිණිස, නිවන පිණිස පවතී ද, මෙබඳු කථාවෙහි නිකාමලාභී (මෙබඳු කථා කැමැති පරිදි අසන්නට ලබන සුලු) වේ ද, සුව සේ ලබන සුලු වේ ද, මහත් සේ ලබන සුලු වේ ද, මේඝියයෙනි, මේ තෙවෙනි ධර්මය නො මුහු කළ චිත්තවිමුක්තියගේ මුහුකිරීම පිණිස පවතී.

තව ද මේඝියයෙනි, මහණ තෙම අකුසල් දහම් දුරු ලනු පිණිස, කුසල් දහම් සිය සතන්හි උපදවනු පිණිස සම්පූර්ණ කළ වීර්‍ය ඇත්තේ වේ ද, කුසල් දහම්හි උත්සාහවත් වේ ද, දැඩි වීර්‍ය ඇති වේ ද, නො බහාලූ වැර ඇත්තේ වේ ද, මේඝියයෙනි, මේ සතරවන ධර්මය නො මුහු කළ චිත්තවිමුක්තියගේ මුහු කිරීම පිණිස පවතී.

මේඝියයෙනි, තව ද මහණ තෙම නිදෙස් වූ, නිර්වේධභාගික වූ, දුඃඛක්ෂයය (ආර්‍ය්‍යමාර්ගය) කරා මොනොවට යන, ස්කන්ධයන්ගේ උදයව්‍යය දෙක පිළිවිදුනා ප්‍රඥායෙන් සමන්විත වේ ද, මේඝියයෙනි, මේ පස්වන ධර්මය නො මුහුකළ චිත්තවිමුක්තියගේ මුහු කිරීම පිණිස පවතී.

මේඝියයෙනි, නො මුහුකළ චිත්තවිමුක්තියගේ මුහු කිරීම පිණිස මේ දහම් පස් දෙන පවතිත්."

8. “කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය, භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස යං සීලවා භවිස්සති, පාතිමොක්ඛසංවරසංවුතො විහරිස්සති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛිස්සති සික්ඛාපදෙසු. කුල්‍යාණමිත්තස්සෙතං මෙඝිය, භික්ඛුනො පාටිකඞ්ඛං[1] කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.[2] සෙය්‍යථිදං? අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤාකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා. එවරූපාය[3] කථාය නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභී.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය, භික්ඛුනො පාටිකඞ්ඛං[1] කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස යං ආරද්ධවිරියො භවිස්සති[4] අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය, භික්ඛුනො පාටිකඞ්ඛං[1] කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස යං පඤ්ඤවා භවිස්සති. උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා.

තෙන ච පන මෙඝිය, භික්ඛුනා ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය චත්තාරො ධම්මා උත්තරි[5] භාවෙතබ්බා. “අසුභා භාවෙතබ්බා රාගස්ස පහානාය, මෙත්තා භාවෙතබ්බා බ්‍යාපාදස්ස පහානාය, ආනාපානස්සති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය, අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමානසමුග්ඝාතාය. අනිච්චසඤ්ඤිනො මෙඝිය, අනත්තසඤ්ඤා සණ්ඨාති, අනත්තසඤ්ඤී අස්මිමානසමුග්ඝාතං පාපුණාති, දිට්ඨෙව ධම්මෙ නිබ්බානං”ති.

9. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ඛුද්දා විතක්කා සුඛුමා විතක්කා අනුග්ගතා මනසො උප්පිලාවා,[6]
එතෙ අවිද්වා මනසො විතක්කෙ හුරාහුරං ධාවති භන්තචිත්තො.
එතෙ ච විද්වා මනසො විතක්කෙ ආතාපි යො සංවරතී සතීමා,
අනුග්ගතෙ මනසො උප්පිලාවෙ[7] අසෙසමෙතෙ පජහාසි බුද්ධො”ති

1. පාටිකඞ්ඛං, සී. 2. සංවත්තති, සී 3. එවරූපියා, සී. 4. විහරිස්සති, ව. 5. උත්තරිං. සී.
6. උබ්බිලාපා, සී. 7 උබ්බිලාපෙ, සී.

8. "මේඝියයෙනි, 'සිල්වත් වන්නේ ය, ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවෘත ව ආචාරගොචරසම්පන්න ව, අල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නා සුලු ව වසන්නේ ය, සමාදන් කොට ගෙන ශික්ෂාපදයන්හි හික්මෙන්නේ ය යන මෙය කලණමිතුරන් ඇති, කලණ යහළුවන් ඇති කලණ පුගුලනට නැමුණු මහණහු විසින් ඒකාන්තයෙන් කැමැති විය යුතු. මේඝියයෙනි, අල්පෙච්ඡකථා ය, සන්තුෂ්ටිකථා ය, ප්‍රවිවේකකථා ය, අසංසර්ගකථා ය, වීර්යාරම්භකථා ය, ශීලකථා ය, සමාධිකථා ය, ප්‍රඥාකථා ය, විමුක්තිකථා ය, විමුක්තිඥානදර්ශනකථා ය යන කෙලෙස් තුනී කරන, සිතැ ආවරණ දුරලීමට (සමථවිපස්සනාවනට) සැප වූ යම් කථාවෙක් ඒකාන්තයෙන් සසර කලකිරෙනු පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, කෙලෙස් සංසිඳුවීම පිණිස, දතයුතු ද දැන ගැන්ම පිණිස, සතරඟ නුවණින් සිවුසස් අවබොධ කරනු පිණිස, නිවන් පිණිස පවතී ද, මෙබඳු කථා කැමැති පරිදි අසන්නට ලබන සුලු වේ, සුව සේ ලබන සුලු වේ, මහත් සේ ලබන සුලු වේ යන මෙය කලණමිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුගුලනට නැමුණු මහණහු විසින් ඒකාන්තයෙන් කැමැති විය යුතු.

මේඝියයෙනි, අකුසල් දහම් පහ කරනු පිණිස කුසල් දහම් වඩනු පිණිස ශක්තිමත් ය, දැඩි වැර ඇත්තේ ය, කුසල් දහම්හි නොබහාලූ වීර්ය ඇත්තේ ය යන මෙය කලණමිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුගුලනට නැමුණු මහණහු විසින් කැමැති විය යුතු.

මේඝියයෙනි, උදයව්‍යය පිළිවිදුනා නිදෙස් වූ නිර්වේධභාගික වූ මොනොවට (දුක් නසන) ආර්‍යමාර්ගයට පැමිණෙන ප්‍රඥායෙන් ප්‍රඥාවත් වන්නේ ය යන යමක් ඇද්ද, මෙය කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුගුලනට නැමුණු භික්ෂුහු විසින් අපෙක්ෂා කටයුතු ය.

මේඝියයෙනි, ඒ මහණහු විසින් මේ දහම් පසෙහි පිහිටා, මත්තෙහි සතර දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. රාගය පහ කරනු පිණිස අශුභභාවනාව වැඩිය යුතු. ව්‍යාපාදය පහ කරනු පිණිස මෛත්‍රිය වැඩිය යුතු. විතර්ක නසනු පිණිස ආනාපාන ස්මෘතිය වැඩිය යුතු. අස්මිමානය නසනු පිණිස අනිත්‍යසංඥාව වැඩිය යුතු. මේඝියයෙනි, අනිත්‍යසංඥාව ඇත්තහුට අනාත්මසංඥාව දැඩිව පිහිටයි. අනාත්මසංඥාව ඇත්තේ අස්මිමාන විනාශයට, මෙ අත්බව්හි ම අප්‍රත්‍යය පරිනිර්වාණයට පැමිණෙයි."

9. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලායෙහි මේ උදන් ඇනූ සේක:

"(කාමවිතර්කාදි) කුඩා විතර්ක ද (ඥාතිවිතර්කාදි) සියුම් විතර්ක ද යි සිතින් අනුවර්ත්තිත වූ චිත්තයාගේ උත්පලාවන කෙනෙක් (සිතේ මතුවීම්) වෙත් ද, මේ මනොවිතර්කයන් නොදැන, අවිද්‍යාතෘෂ්ණාවන්ගේ වශයෙන් භ්‍රාන්තවූ සිතැත්තේ (මෙලෝ පරලෝ වශයෙන්) අනෙක් අනෙක් භවයට දිවෙයි.

සිහි ඇති වීර්යවත් තැනැත්තේ සිතේ මේ විතර්කයන් දැන ඥානසංවරයෙන් වසා ලයි. සිවුසස් අවබෝධ කළ ආර්යශ්‍රාවක තෙම නව ම නොපහළ වූ (එහෙත් පහළ වන්නට සුදුසු වැ සිටි) සිතේ මේ සියලු උත්පලාවයන් මුල්සුන් කෙළේ ය. (නැවැත නොපහළවන්නවුන් ම කෙළේ ය)."

## 4. 2.

### උද්ධතසුත්තං

1 එවං මෙ සුතං: එකං සමයං භගවා **කුසිනාරායං** විහරති, **උපවත්තනෙ** මල්ලානං **සාලවනෙ**. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරන්ති, උද්ධතා[1], උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා.

2. අද්දසා ඛො භගවා තෙ සම්බහුලෙ භික්ඛූ අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරන්තෙ උද්ධතෙ උන්නළෙ චපලෙ මුඛරෙ විකිණ්ණවාචෙ මුට්ඨස්සතිනො අසම්පජානෙ අසමාහිතෙ විබ්භන්තචිත්තෙ පාකතින්ද්‍රියෙ.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අරක්ඛිතෙන කායෙන මිච්ඡාදිට්ඨිගතෙන ච,
ථිනමිද්ධාභිභූතෙන වසං මාරස්ස ගච්ඡති.
තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො,
ථිනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ"ති.

## 4. 3.

### ගොපාලසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසලෙසු**[2] චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අථ ඛො භගවා මග්ගා **ඔක්කම්ම** යෙන අඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො අඤ්ඤතරො **ගොපාලකො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං ගොපාලකං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි.

2. අථ ඛො සො ගොපාලකො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච: අධිවාසෙතු මෙ භන්තෙ, භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො සො ගොපාලකො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො ගොපාලකො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පහූතං අප්පොදකපායාසං පටියාදාපෙත්වා නවඤ්ච සප්පිං, භගවතො කාලං ආරොචෙසි: 'කාලො භන්තෙ, නිට්ඨිතං භත්තං'ති.

---

1. උද්ධතා හොන්ති, සී. 2. ජනපදෙසු, සගාව්

## 4. 2.

## උද්ධත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **කුසිනාරානුවර සමීපයේ මල්ලරජුන්ගේ උපවත්තන** නම් සල්වෙනෙහි වැඩ වසන සේක. එ සමයෙහි බොහෝ භික්ෂූහු නොසංහුන් වූවෝ, ඔසොවා ගත් මාන තල ඇත්තෝ, පාසිවුරු සැරසීම් ආදී වූ චපල බැවින් යුත් වූවෝ, පරොස් බස් ඇත්තෝ, (තිරිසන් කථා බහුල බැවින්) ව්‍යාකුල කථා ඇත්තෝ, මුළා සිහි ඇත්තෝ, සම්පජඤ්ඤ රහිතයෝ, අසමාහිතයෝ, විභ්‍රාන්ත සිතැත්තෝ, අසංයත ඉන්ද්‍රිය ඇත්තෝ, භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි අරණ්‍යකුටිකායෙක වෙසෙත්.

2. භාග්‍යවතුන් වහන්සේ නොසංහුන් සිතැති, ඔසොවා ගත් මාන තල ඇති, චපල බැවින් යුත්, පරොස් බසැති, ව්‍යාකුල කථා ඇති, මුළා සිහි ඇති, සම්පජඤ්ඤ රහිත, අසමාහිත විභ්‍රාන්ත සිතැති, අසංයත ඉන්ද්‍රිය ඇති නොදුරෙහි අරන්කිළියෙහි වසන ඒ බොහෝ මහණුන් දුටු සේක.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"මිථ්‍යාදෘෂ්ටිය වැද ගත්, නැනමිද්ධයෙන් මඩනා ලද, නොරක්නා ලද ෂඩ්විඥාන සංඛ්‍යාත කය හෙතු කොට ගෙන සත්ත්ව තෙමේ මරහු වශයට යෙයි.

එහෙයින් සම්‍යක්සඞ්කල්පනා ගොදුරු කොටැත්තේ, රක්නාලද සිතැත්තේ වන්නේ ය. සම්‍යග්දෘෂ්ටිය පෙරදැරි කොටැත්තේ (සකන්ධයන්ගේ) උදයව්‍යය දැන, නැනමිද්ධ දෙක මැඩැලන මහණ තෙමේ සියලු දුර්ගතීන් දුරු ලන්නේ ය."

## 4. 3.

## ගෝපාල සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා හා **කොසොල්** රට සැරි සරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත් වැ එක්තරා රුක්මුලක් කරා එළැඹි සේක. එළැඹ පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක. එකල්හි එක්තරා ගොපල්ලෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ ගොපල්ලාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතාවෙන් (කුශලාදී ධර්මයන්) මොනොවට දැක්වූ සේක. (ශීලාදි ධර්ම) මොනොවට ගැන්වූ සේක. එහි මොනොවට උත්සාහවත් කළ සේක. එහි සතුටු කැරවූ සේක.

2. ඉක්බිත්තෙන් ඒ ගොපලු තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතායෙන් කරුණු දක්වන ලද, (ශීලාදිය) මොනොවට ගන්වන ලද, එහි උත්සාහවත් කරන ලද, එහි තුටු පහටු කරවන ලද ඒ ගොපලු තෙම භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ බත බික්සඟන සමග සෙට දවසට ඉවසන සේක්වා'යි මෙ බස් කී ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවැසූ සේක. එකල්හි ගොපලු තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවැසීම දැන, හුනස්නෙන් නැගී සිට, භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ, පැදකුණු කොට තික්මැ ගියේ ය. ඉක්බිති ඒ ගොපලු තෙම ඒ රැ ඇවෑමෙන් සිය ගෙහි බොහෝ දිය නොමුසු කිරිබත් ද අලුත් ගිතෙල් ද පිළියෙල කරවා, 'වහන්ස, කල් වෙයි. බත් (පිළියෙල කොට) නිමියේ යැ'යි භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වී ය.

3. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන තස්ස ගොපාලකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සො ගොපාලකො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං අප්පොදකපායාසෙන නවෙන ච සප්පිනා සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. අථ ඛො සො ගොපාලකො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං ගොපාලකං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා, සමාදපෙත්වා, සමුත්තෙජෙත්වා, සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො අචිරපක්කන්තස්ස භගවතො තං ගොපාලකං අඤ්ඤතරො පුරිසො සීමන්තරිකාය ජීවිතා වොරොපෙසි.

4. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "යෙන භන්තෙ, ගොපාලකෙන අජ්ජ බුද්ධපමුඛො භික්ඛුසඞ්ඝො අප්පොදකපායාසෙන නවෙන ච සප්පිනා සහත්ථා සන්තප්පිතො සම්පවාරිතො, සො කිර භන්තෙ, ගොපාලකො අඤ්ඤතරෙන පුරිසෙන සීමන්තරිකාය ජීවිතා වොරොපිතො"ති.

5. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"දිසො දිසං යන්තං කයිරා වෙරී වා පන වෙරිනං,
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ"ති.

## 4. 4.

### ජුණ්හසුත්තං[1]

1. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති. වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො කපොතකන්දරායං විහරන්ති. තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො ජුණ්හාය රත්තියා නවොරොපිතෙහි කෙසෙහි අබ්භොකාසෙ නිසින්නො හොති, අඤ්ඤතරං සමාධිං සමාපජ්ජිත්වා. තෙන ඛො පන සමයෙන ද්වෙ යක්ඛා සහායකා උත්තරාය දිසාය දක්ඛිණං දිසං ගච්ඡන්ති, කෙනචිදෙව කරණීයෙන. අද්දසංසු ඛො තෙ යක්ඛා ආයස්මන්තං සාරිපුත්තං ජුණ්හාය රත්තියා නවොරොපිතෙහි කෙසෙහි අබ්භොකාසෙ නිසින්නං. දිස්වාන එකො යක්ඛො දුතියං යක්ඛං එතදවොච: "පටිභාති මං සම්ම, ඉමස්ස සමණස්ස සීසෙ පහාරං දාතු"න්ති. එවං වුත්තෙ සො යක්ඛො තං යක්ඛං එතදවොච: "අලං සම්ම, මා සමණං ආසාදෙසි. උළාරො සො සම්ම සමණො මහිද්ධිකො මහානුභාවො"ති. දුතියම්පි ඛො සො යක්ඛො තං යක්ඛං එතදවොච: "පටිභාති මං සම්ම, ඉමස්ස සමණස්ස සීසෙ පහාරං දාතු"න්ති. දුතියම්පි ඛො සො යක්ඛො තං යක්ඛං එතදවොච: "අලං සම්ම, මා සමණං ආසාදෙසි. උළාරො සො සම්ම, සමණො මහිද්ධිකො මහානු-භාවො"ති. තතියම්පි ඛො සො යක්ඛො තං යක්ඛං එතදවොච: "පටිභාති මං සම්ම, ඉමස්ස සමණස්ස සීසෙ පහාරං දාතු"න්ති. තතියම්පි ඛො සො යක්ඛො තං යක්ඛං එතදවොච: "අලං සම්ම, මා සමණං ආසාදෙසි. උළාරො සො සම්ම, සමණො මහිද්ධිකො මහානුභාවො"ති.

---

1. යක්ඛපහාරසුත්ත, මජසං.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙනැ, භික්සඟන සමග ඒ ගොපල්ලාගේ ගෙට එළැඹි සේක. එළැඹැ පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක. ඉක්බිත්තෙන් ඒ ගොපලු තෙම බුදුපාමොක් සඟන දිය නොමුසු කිරිබතින් (හුදුකිරිබතින්) ද අලුත් ගිතෙලින් ද සැතැපවී ය, පැවැරැවී ය. එ කල්හි ඒ ගොපලු තෙම දන් වැළැඳූ පාත්‍රයෙන් ඉවතට ගත් අතැති භාග්‍යවතුන් වහන්සේට එකත්පසැ එක්තරා මිටි අස්නක් ගෙනැ හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ ගොපලුහට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාවෙන් කරුණු දක්වා, සිල් ඈ ගන්වා, එහි උත්සාහවත් කොට, සතුටු කොට හුනස්නෙන් නැඟී සිට නික්මැ ගියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නික්මැ වැඩි නොබෝ කල්හි ගම් මායිම් අතරෙහි දී එක්තරා මිනිසෙක් ඒ ගොපල්ලා දිවියෙන් තොර කොළේ ය.

4. එ කල්හි බොහෝ මහණහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, එකත්පසෙකැ හුන්හ. එකත්-පසෙකැ හුන්නාවූ ඒ මහණහු 'වහන්ස, අද යම් ගොපල්ලකු විසින් බුදුපාමොක් සඟන දිය නොමුසු කිරිබතිනුත් අලුත් ගිතෙලිනුත් සියතින් සතපන ලද ද, පවරවන ලද ද, වහන්ස, ඒ ගොපලු තෙම එක් මිනිසකු විසින් ගම්මායිම් අතරැදී දිවියෙන් තොර කරන ලදැ'යි භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

5. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන, එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

“සතුරෙක් සතුරකුට හෝ වෛරියෙක් වෛරියකුට යම් අනය ව්‍යසනයක් කරන්නේ නම්, වරදවා පිහිටුවන ලද සිත ඔහු එයටත් වඩා පාපතරයකු කරන්නේ ය.”

## 4 4·

## ජුණ්හ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වෙළුවනයෙහි වැඩ වසන සේක. එ සමයෙහි සැරියුත් තෙරණුවෝ ද මහමුගලන් තෙරණුවෝ ද කොබෝ-කඳුරෙහි වෙසෙති. එ සමයෙහි වනාහි සැරියුත් තෙරණුවෝ පුරපසැ රැයෙක අලුත බෑ හිසකෙසින් යුතු වැ, එක්තරා සමවතකට සමවැද එළිමහන්හි හුන්නාහු වෙති. එ කල්හි යහළු වූ යක්කු දෙදෙනෙක් කිසි කටයුත්තෙකින් උතුරු දෙසින් දකුණු දෙසට යෙති. ඒ යක්කු පුරපසැ රැයෙහි අලුත බෑ හිසකෙසින් යුතු වැ එළිමහනැ හුන් සැරියුත් තෙරුන් දුටහ. දැක එක් යකෙක් දෙවෙනි යකු බණවා, 'යහළු, මේ මහණහු හිසෙහි පහරක් දෙන්නට මට සිතේ'යැ යි කී ය. මෙසේ කී කලැ ඒ යක් තෙම අනෙකාට 'යහළු, කම් නැත මහණහට පහර නො දෙව. ඒ මහණ උතුම් ගුණැත්තෙක. මහත් සෘද්ධි ඇත්තෙක. මහානුභාව ඇත්තෙකැ' යි කී ය. දෙවෙනි වරැ ද ඒ යක් තෙම අනෙකාට යහළු, මේ මහණහු හිසැ පහර දෙන්නට මට සිතේ'යැ යි කී ය දෙවෙනි වරැ ද ඒ යක් තෙම අනෙකාට, 'යහළු,' කම් නැත. මහණහට පහර නො දෙව. යහළු, ඒ මහණ උතුම් ගුණැත්තෙක, මහත් සෘද්ධි ඇත්තෙක, මහත් අනුභාව ඇත්තෙකැ' යි කී ය. තෙවෙනි වරැ ද ඒ යක් තෙම අනෙකා බණවා, 'යහළු, මෙ මහණහු හිසැ පහරක් දෙන්නට මට සිතේ'යැ යි කී ය. තෙවෙනි වරැ ද ඒ යක් තෙම අනෙකාට, යහළු, කම් නැත. මහණහට පහර නො දෙව. හේ උතුම් ගුණැත්තෙක, මහත් තෙද බලැත්තෙකැ'යි කී ය.

2. අථ ඛො සො යක්ඛො තං යක්ඛං අනාදියිත්වා ආයස්මතො සාරිපුත්තත්ථෙරස්ස සීසෙ පහාරං අදාසි: තාව මහාපහාරො අහොසි, අපි තෙන පහාරෙන සත්තරතනං වා අඩ්ඪට්ඨරතනං වා නාගං ඔසාදෙය්‍ය[1] මහන්තං වා පබ්බතකූටං පදාලෙය්‍ය. අථ ච පන සො යක්ඛො 'ඩය්හාමි, ඩය්හාමී"ති තත්ථෙව මහානිරයං අවත්ථාසි.[2]

3. අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තෙන යක්ඛෙන ආයස්මතො සාරිපුත්තස්ස සීසෙ පහාරං දීයමානං. දිස්වාන යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "කච්චි තෙ ආවුසො ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි න කිඤ්චි දුක්ඛං?"ති. "ඛමනීයං මෙ ආවුසො මොග්ගල්ලාන, යාපනීයං මෙ ආවුසො මොග්ගල්ලාන, අපි ච මෙ සීසෙ ථොකං දුක්ඛං"ති.

4. "අච්ඡරියං ආවුසො සාරිපුත්ත, අබ්භුතං ආවුසො සාරිපුත්ත, යාව මහිද්ධිකො ආයස්මා සාරිපුත්තො මහානුභාවො. ඉධ තෙ ආවුසො සාරිපුත්ත, අඤ්ඤතරො යක්ඛො සීසෙ පහාරං අදාසි. තාව මහාපහාරො අහොසි, අපි තෙන පහාරෙන සත්තරතනං වා අඩ්ඪට්ඨරතනං වා නාගං ඔසාදෙය්‍ය[1] මහන්තං වා පබ්බතකූටං පදාලෙය්‍ය. අථ ච පනායස්මා සාරිපුත්තො එවමාහ: "ඛමනීයං මෙ ආවුසො මොග්ගල්ලාන, යාපනීයං මෙ ආවුසො මොග්ගල්ලාන, අපි ච මෙ සීසෙ ථොකං දුක්ඛං"ති. "අච්ඡරියං ආවුසො මොග්ගල්ලාන, අබ්භුතං ආවුසො මොග්ගල්ලාන, යාව මහිද්ධිකො ආයස්මා මහාමොග්ගල්ලානො මහානුභාවො. යත්‍ර හි නාම යක්ඛම්පි පස්සිස්සති, මයං පනෙතරහි පංසුපිසාචකම්පි න පස්සාමා"ති. අස්සොසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය තෙසං උභින්නං මහානාගානං ඉමං එවරූපං කථාසල්ලාපං.

5. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්ස සෙලූපමං චිත්තං ඨිතං නානුපකම්පති,
විරත්තං රජනීයෙසු කොපනෙය්‍යෙ න කුප්පති,
යස්සෙවං භාවිතං චිත්තං කුතො තං දුක්ඛමෙස්සතී"ති

1 ඔසාරෙය්‍ය, කත්ථචි. 2. අපතාසි, මජසං.

2. ඉක්බිති ඒ යක් තෙමේ අනෙකාගේ බස නො තකා, සැරියුත් තෙරුන්ගේ හිසෑ පහරක් දුන්නේ ය. ඒ පහරින් සත්රියන් හෝ සත්රියන් වියත් පමණ වූ හෝ ඇතකු බිමෑ ගැලහිය හෙන්නේ නම්, මහගිරිකුළක් හෝ පලා දමියෑ හෙන්නේ නම්, ඒසා මහපහරෙක් විය. එතෙකුදු වුවත් ඒ යක් තෙම 'දවෙමි, දවෙමි'යි කියමින් එහි ම (පොළොවෙහි ගැළ) මැරී මහා නිරයට වැටුණේ ය. (අවීචි නිරයෙහි උපන්නේ ය.)

3. මහමුගලන් තෙරණුවෝ මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මෑ සිටි පිරිසිදු වූ දිවැසින් ඒ යකු විසින් සැරියුත් තෙරුන්ගේ හිසෑ දුන් පහර දුටහ. දැක සැරියුත් තෙරුන් කරා එළැඹියහ. එළැඹ සැරියුත් තෙරුන් අමතා, 'ඇවැත්නි, කිම? ඔබට සැහිය හැකි ද? කිම? යැපිය හැකි ද? කිම කිසි දුකෙක් නැද්ද?'යි අසා වදාළහ. 'ඇවැත්නි, මුගලන් තෙරණුවනි, මට සැහිය හැක්ක. මට යැපිය හැක්ක. එහෙත් මා හිසෑ මඳ රිදුමෙක් වේ'යි සැරියුත් තෙරණුවෝ වදාළහ.

4. "ඇවැත් සැරියුත්නි, සැරියුත් තෙරණුවෝ කොතරම් මහර්ද්ධිමත් ද, කොතරම් මහානුභාව ඇත්තෝ ද! යනු ආශ්චර්ය ය, අද්භූත ය. ඇවැත් සැරියුත්නි, එක්තරා යකෙක් මෙහි ඔබ හිසෑ පහරක් දුන්නේ ය. ඒ පහරින් සත්රියන් හෝ සත්රියන් හමාරක් පමණ වූ හෝ ඇතකු තමුදු බිමෑ ගැලහිය හෙන්නේ නම් මහත් වූ පව්කුළක් තමුදු පලා ලියෑ හෙන්නේ නම් ඒසා මහපහරෙක් විය. එතෙකුදු වුවත් සැරියුත් තෙරණුවෝ "ඇවැත් මොග්ගල්ලානයෙනි, මට සැහිය හැක්ක, ඇවැත් මොග්ගල්ලානය, මට යැපියෑ හැක්ක, එහෙත් මා හිසෑ මඳ රිදුමෙක් වේ යැයි මෙසේ කියති"යි මහමුගලන් තෙරණුවෝ වදාළහ. එවිට සැරියුත් තෙරණුවෝ, "අපි තම් දැන් මෙහි පාංශුපිශාචයකුදු නො දකුම්හ. එසේ වූ මේ තාන්හි යකකුදු දක්නා තරම් මහමුගලන් තෙරණුවෝ මහර්ද්ධිමත්ය මහානුභාව ඇත්තෝ ය. ආශ්චර්ය ය, ඇවැත් මහමුගලන් තෙරුනි, අද්භූත ය, මහමුගලන් තෙරුනි"යි වදාළහ. භාග්‍යවතුන් වහන්සේ මිනිස්විසය ඉක්මෑ පැවැති පිරිසිදු දිවකන්නුවණින් ඒ අගසවු දෙනමගේ මේ මෙ බඳු කථාසංලාපය අසා වදාළ සේක.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමකුගේ සිත ගල්පව්වක් මෙන් සිටියේ අටලෝදහමින් නො සැලේ ද,
රාගය ඉපැත්මට හේතු වූ සියලු ත්‍රෛභූමක ධර්මයන්හි නො ඇලේ ද,
කෝපය ඉපැත්මට හේතු වූ සියලු ආඝාතවස්තුයෙහි නො කිපේ ද,
යමක්හුගේ සිත මෙසේ වඩනා ලද ද, ඔහු කරා දුකෙක් කොයින් එන්නේ ද?
නො එන්නේ ම ය."

## 4. 5.

## නාගසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසම්බියං** විහරති, **ඝොසිතාරාමෙ.** තෙන ඛො පන සමයෙන භගවා ආකිණ්ණො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. ආකිණ්ණො දුක්ඛං, න ඵාසු විහරති.

2. අථ ඛො භගවතො එතදහොසි "අහං ඛො එතරහි ආකිණ්ණො විහරාමි, භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. ආකිණ්ණො දුක්ඛං, න ඵාසු විහරාමි. යන්නූනාහං එකො ගණම්හා වූපකට්ඨො විහරෙය්‍යං"න්ති.

3. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කොසම්බියං පිණ්ඩාය පාවිසි. කොසම්බියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සාමං සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය අනාමන්තෙත්වා උපට්ඨාකෙ, අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං, එකො අදුතියො යෙන **පාරිලෙය්‍යකං** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන පාරිලෙය්‍යකං තදවසරි. තත්‍රසුදං භගවා පාරිලෙය්‍යකෙ විහරති, **රක්ඛිතවනසණ්ඩෙ** භද්දසාලමූලෙ.

4 අඤ්ඤතරො'පි ඛො හත්ථිනාගො ආකිණ්ණො විහරති, හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි.[1] ඡින්නග්ගානි චෙව තිණානි ඛාදති. ඔභග්ගොභග්ගඤ්චස්ස සාඛාභඞ්ගං ඛාදන්ති. ආවිලානි ච පානීයානි පිවති. ඔගාහා චස්ස උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති. ආකිණ්ණො දුක්ඛං, න ඵාසු විහරති. අථ ඛො තස්ස හත්ථිනාගස්ස එතදහොසි: "අහං ඛො එතරහි ආකිණ්ණො විහරාමි, හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි.[1] ඡින්නග්ගානි චෙව තිණානි ඛාදාමි. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදන්ති. ආවිලානි ච පානීයානි පිවාමි. ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති. ආකිණ්ණො දුක්ඛං, න ඵාසු විහරාමි. යන්නූනාහං එකො ගණම්හා වූපකට්ඨො විහරෙය්‍යං"න්ති.

5. අථ ඛො සො හත්ථිනාගො යූථා අපක්කම්ම යෙන පාරිලෙය්‍යකං රක්ඛිතවනසණ්ඩො භද්දසාලමූලං, යෙන භගවා තෙනුපසඞ්කමි. තත්‍ර සුදං[2] සො හත්ථිනාගො යස්මිං පදෙසෙ භගවා විහරති, තං පදෙසං අප්පහරිතඤ්ච කරොති, සොණ්ඩාය භගවතො පානීයං පරිභොජනීයඤ්ච උපට්ඨපෙති.[3]

---

1. හත්ථිච්ඡාපකෙහි, සී. 2. උපසඞ්කමිත්වා, තත්‍රසුදං, ස්‍යා. 3. උපට්ඨාපෙති, මජ්සං.

## 4. 5.

## නාගසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: **එක් සමයෙක්හි** භාග්‍යවතුන් වහන්සේ **කොසොඹෑනුවර** සමීපයේ වූ **ඝෝෂිතාරාමයේ** වැඩවසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගෙන් භික්ෂුණීන්ගෙන් උපාසකයන්ගෙන් උපාසිකාවන්ගෙන් රජුන්ගෙන් රාජමහාමාත්‍යයන්ගෙන් තීර්ථකයන්ගෙන් තීර්ථකශ්‍රාවකයන්ගෙන් **ආකීර්ණ** වැ (සම්බාධයට පැමිණි සේක් වැ) දුක සේ වසන සේක. පහසුවෙන් නො වසන සේක.

2. **එකල්හි** භාග්‍යවතුන් වහන්සේට 'මම් වූ කලි දැන් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා රාජ රාජමහාමාත්‍ය තීර්ථක තීර්ථකශ්‍රාවක යන මොවුන්ගෙන් **ආකීර්ණ** වැ දුක සේ වසමි. සුව සේ නො වසමි. මම් ගණයාගෙන් වෙන් වැ හුදෙකලා වැ වසන්නෙම් නම් යෙහෙකැ'යි මේ සිත විය.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන කොසොඹෑනුවරට පිඬු පිණිස පිවිසි සේක. කොසොඹෑනුවරෙහි පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් පෙරළා වැඩි සේක්, තමන් වහන්සේ ම සෙනසුන් සඟවා තබා, පාසිවුරු ගෙන, උපස්ථායකයන් ද නො අමතා, භික් සඟනට ද නොදන්වා, හුදෙකලා වැ, දෙවැන්නකු නැති වැ, **පාරිලෙය්‍යක** ගම බලා සැරි සරා වැඩි සේක. පිළිවෙළින් සැරි සරා වඩනා සේක්, පාරිලෙය්‍යක ගමට පැමිණි සේක. භාග්‍ය-වතුන් වහන්සේ එහි පාරිලෙය්‍යක ගම සමීපයෙහි **රක්ඛිත** (ඇත්හු විසින් රක්නා ලද) වනලැහැබෙහි භද්‍රශාල වෘක්ෂමූලයෙහි (සොඳුරු සල්රුක් මුල්හි) වැඩ වසන සේක.

4 එක්තරා ඇත්රජෙක් ද ඇතුන් ඇතිනින් ඇත්තහඹුන් ඇත්පොව්වන් විසින් සම්බාධයට පැමිණියේ වෙසෙයි. සුන් අග ඇති තණ ද බුදී. ඒ ඇත්රජු විසින් බිඳ බිඳ හෙළන ලද අතු කැබැලි සෙස්සෝ කත්. කැලත් දිය ද බොති. ඇතින්නෝ දියෙන් ගොඩ නැංගා වූ ඔහුගේ ඇඟ සටමින් යෙත්. හේ මෙසේ සම්බාධයට පැමිණියේ සැප නැති ව දුක සේ වෙසෙයි. ඉක්බිත්තෙන් ඒ ඇත්රජුට 'මම් වනාහි දැන් ඇතුන් ඇතිනින් තහඹු ඇතුන් ඇත්පොව්වන් විසින් ආකීර්ණ වැ වෙසෙමි. සුන් අග ඇති තණ ද කමි. මා බිඳ හෙළු හෙළු අතුකැබැලි මොහු කත්. මොවුන් නිසා බොර වූ දිය ද බොමි. පැන්-තොටින් ගොඩ නැගුණු මා ඇඟ ගගමින් ඇතින්නෝ යෙත්. මොවුන්ගෙන් සම්බාධයට පැමිණියෙම් දුකින් නො පහසුයෙන් වෙසෙමි. මම් ගණයාගෙන් වෙන් වැ හුදෙකලා වැ වෙසෙම් නම් යෙහෙකැ''යි මේ සිත විය.

5. ඉක්බිත්තෙන් ඒ ඇත්රජ රැළෙන් වෙන් වැ, පාරිලෙය්‍යක ගම යම් තැනෙක ද රක්ෂිත වනලැහැබ යම් තැනෙක ද, භද්‍රශාලවෘක්ෂමූලය යම් තැනෙක ද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එහි එළැඹියේ ය. එහි ඒ ඇත්රජ, යම් පෙදෙසෙක භාග්‍යවතුන් වහන්සේ වසන සේක් ද, එ පෙදෙස තණපැලැටි නැතියක් කෙරෙයි. (තණ හා පැලැටි උදුරා අතු කැබැල්ලෙකින් හමදී.) සොඬින් භාග්‍යවතුන් වහන්සේට බොන පැන් ද සෙසු පරිභොගයට දිය ද එළවයි.

6. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අහං ඛො පුබ්බෙ ආකිණ්ණො විහාසිං, භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. ආකිණ්ණො දුක්ඛං, න ඵාසු විහාසිං. සො'ම්හි එතරහි අනාකිණ්ණො විහරාමි, භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. අනාකිණ්ණො සුඛං ඵාසු විහරාමී"ති.

7. තස්සපි ඛො හත්ථිනාගස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: අහං ඛො පුබ්බෙ ආකිණ්ණො විහාසිං, හත්ථීහි හත්ථිනීහි හත්ථිකළභෙහි හත්ථිච්ඡාපෙහි. ඡින්නග්ගානි චෙව තිණානි ඛාදිං. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදිංසු. ආවිලානි ච පානීයානි පිවාසිං, ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො අගමංසු. ආකිණ්ණො දුක්ඛං න ඵාසු විහාසිං. සො'ම්හි එතරහි අනාකිණ්ණො විහරාමි, හත්ථීහි හත්ථිනීහි හත්ථිකළභෙහි හත්ථිච්ඡාපෙහි. අච්ඡින්නග්ගානි චෙව තිණානි ඛාදාමි. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං න ඛාදන්ති. අනාවිලානි ච පානීයානි පිවාමි. ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො න කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති. අනාකිණ්ණො සුඛං ඵාසු විහරාමී"ති.

8. අථ ඛො භගවා අත්තනො ච පවිවෙකං විදිත්වා තස්ස ච හත්ථිනාගස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"එතං නාගස්ස නාගෙන ඊසාදන්තස්ස හත්ථිනො,
සමෙති චිත්තං චිත්තෙන යදෙකො රමතෙ[1] වනෙ"ති.

## 4. 6.

## පිණ්ඩොලසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා පිණ්ඩොලභාරද්වාජො භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය, ආරඤ්ඤිකො[2], පිණ්ඩපාතිකො, පංසුකූලිකො, තෙචීවරිකො, අප්පිච්ඡො, සන්තුට්ඨො, පවිවිත්තො, අසංසට්ඨො, ආරද්ධවිරියො, ධුතවාදො, අධිචිත්තමනුයුත්තො.

2. අද්දසා ඛො භගවා ආයස්මන්තං පිණ්ඩොලභාරද්වාජං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය, ආරඤ්ඤිකං, පිණ්ඩපාතිකං, පංසුකූලිකං, තෙචීවරිකං, අප්පිච්ඡං, සන්තුට්ඨං, පවිවිත්තං, අසංසට්ඨං, ආරද්ධවිරියං, ධුතවාදං අධිචිත්තමනුයුත්තං.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1. රමති, සබ්බත්ථ. 2. ආරඤ්ඤකො, සී.

6. ඉක්බිත්තෙන් එකලා වැ චිත්තවිවේකයෙන් හුන් භාග්‍යවතුන් වහන්සේට "මම් වනාහි පූර්වයෙහි සම්බාධයට පැමිණ විසීමි. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා රාජ රාජමහාමාත්‍ර තීර්ථක තීර්ථකශ්‍රාවක යන මොවුන්ගෙන් ආකීර්ණ වැ පහසු නැති වැ දුක සේ විසීමි. ඒ මම් දැන් සම්බාධ නැති වැ වෙසෙමි. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා රාජ රාජමහාමාත්‍ර තීර්ථක තීර්ථකශ්‍රාවකයන්ගෙන් අනාකීර්ණ වැ පහසුයෙන් සුව සේ වෙසෙමි"යි මේ චිත්තසංකල්පනාව පහළ විය.

7. ඒ ඇත්රජුට ද "මම් වනාහි පෙරළ ඇතුන් ඇතිනින් නහඹු ඇතුන් ඇත්පොව්වන් විසින් සම්බාධ ඇති වැ විසීමි. අගසුන් තණ ද කැයෙමි. මා විසින් බිඳ හෙළු හෙළු අතුකැබැලි අන්‍යයෝ කැහ. අනුන් නිසා බොර වූ පැන් ද පිමි. ඇතින්නෝ පැන් තොටින් ගොඩ නැංගා වූ මා ඇඟ ගහමින් ගියහ. සම්බාධ ඇති ව පහසු නැති වැ දුක සේ විසීමි. ඒ මම් දැන් ඇතුන් ඇතිනින් නහඹු ඇතුන් ඇත්පොව්වන් විසින් සම්බාධ නැති වැ වෙසෙමි. අග නොසුන් තණ ද කමි. මා විසින් බිඳ හෙළු හෙළු අතු කැබැලි අන් කෙනෙක් නො කත්. නො කැලැඹුණු දිය ද බොමි. පැන්තොටින් ගොඩ නැගුණු මාගේ කය සටමින් ඇතින්නෝ නො යෙත්. එබැවින් සම්බාධ නැති වැ පහසු සේ වෙසෙමි"යි මෙසේ චිත්ත සංකල්පනාවෙක් පහළ විය.

8. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ කායවිවෙකය ද සලකා, ඒ ඇත්රජුගේ ද චිත්තසංකල්පය තමන් සිතින් දැන ඒ වේලෙහි මේ උදන් ඇනු සේක.

"යම් හෙයෙකින් මේ ඇත් තෙම හුදෙකලා වැ වනයෙහි ඇලේ ද, එ කරුණින් රියඉස් වැනි දත් ඇති ඇත්රජුහුගේ මේ සිත බුද්ධනාගයාගේ සිත හා එක්බඳු වේ."

## 4. 6.

### පිණ්ඩෝල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** නම් වූ අනේපිඬුසිටු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **පිණ්ඩෝලභාරද්වාජ** තෙරණුවෝ ආරණ්‍යක වූවෝ, පිණ්ඩපාතික වූවෝ, පාංශුකූලික වූවෝ, ත්‍රෛචීවරික වූවෝ, අල්පෙච්ඡ වූවෝ, සන්තුෂ්ට වූවෝ, ප්‍රවිවික්ත වූවෝ, ගිහියන් හා අසංසෘෂ්ට වූවෝ, සම්පූර්ණ කළ වීර්‍ය්‍ය ඇත්තෝ, ධූතවාද වූවෝ, රහත්පලසමවතෙහි යෙදුණෝ භාග්‍යවතුන් වහන්සේ නොදුරු තන්හි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා වැඩ හුන්නාහු වෙති.

2 භාග්‍යවතුන් වහන්සේ තමනට නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා හුන් ආරණ්‍යකවූ පිණ්ඩපාතික වූ පාංශුකූලික වූ, ත්‍රෛචීවරික වූ, අල්පෙච්ඡ වූ, සන්තුෂ්ට වූ,. ප්‍රවිවික්ත වූ, අසංසෘෂ්ට වූ, සම්පූර්ණ කළ වීර්‍ය්‍ය ඇති, ධූතවාද වූ රහත්පල සමවත්හි යෙදුනු පිණ්ඩෝලභාරද්වාජ තෙරුන් දුටු සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනු සේක:

"අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච[1] සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධාන සාසනං"ති.

## 4. 7.

## සාරිපුත්ත සුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය, අප්පිච්ඡො, සන්තුට්ඨො, පවිවිත්තො, අසංසට්ඨො, ආරද්ධවිරියො, අධිචිත්තමනුයුත්තො. අද්දසා ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අප්පිච්ඡං සන්තුට්ඨං පවිවිත්තං අසංසට්ඨං ආරද්ධවිරියං අධිචිත්තමනුයුත්තං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අධිචෙතසො අප්පමජ්ජතො මුනිනො මොනපථෙසු සික්ඛතො,
සොකා න භවන්ති තාදිනො උපසන්තස්ස සදා සතීමතො"ති.

## 4. 8.

## සුන්දරිසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානං. භික්ඛුසඞ්ඝොපි සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවර පිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරානං. අඤ්ඤතිත්ථියා පන පරිබ්බාජකා අසක්කතා හොන්ති අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා. න ලාභිනො චීවර පිණ්ඩපාත සෙනාසනගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානං.

2. අථ ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා භගවතො සක්කාරං අසහමානා භික්ඛුසඞ්ඝස්ස ච. යෙන **සුන්දරී** පරිබ්බාජිකා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා සුන්දරිං පරිබ්බාජිකං එතදවොචුං: "උස්සහසි භගිනි, ඤාතීනං අත්ථං කාතුං?"ති. "ක්‍යාහං අය්‍යා, කරොමි, කිං මයා න සක්කා කාතුං?[2] ජීවිතම්පි මෙ පරිච්චත්තං ඤාතීනං අත්ථායා"ති.

---

1. පඤ්ඤච, සී. 2. කිං මයා සක්කා කාතුං, සී. ස්‍යා.

"වචනයෙන් කිසිවකුට උපවාද නො කිරීම ද, කයින් කිසිවකුට පීඩා නො කිරීම ද, ප්‍රාතිමෝක්ෂයෙහි සංවරය කිරීම ද, බොජුන්හි පමණ දැනීම ද, භාවනානුකූල ජනවිවිත්ත සෙනසුන ද, රහත්පලසිත උපදවනු සඳහා ශමථවිදර්ශනා වශයෙන් උත්සාහය ද යන මෙය බුදුවරුන්ගේ අවවාදනුශාසන"යි.

## 4. 7.

## ශාරීපුත්‍රසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** නම් වූ අනේපිඬු අරම්හි වැඩවසන සේක. එ සමයෙහි වනාහි **සැරියුත් තෙරණුවෝ** අල්පේච්ඡ වූවෝ, සන්තුෂ්ට වූවෝ, ප්‍රවිවිත්ත වූවෝ, අසංසෘෂ්ට වූවෝ, ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තෝ, රහත්පල සමවතැ යෙදුණෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරු තන්හි හුන්නාහු වෙති. භාග්‍ය-වතුන් වහන්සේ අල්පේච්ඡ වූ සන්තුෂ්ට වූ ප්‍රවිවිත්ත වූ අසංසෘෂ්ට වූ ආරබ්ධ-වීර්‍ය්‍ය ඇති රහත්පල සමවත්හි යෙදුණු පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා නොදුරෙහි හුන් සැරියුත් තෙරුන් දුටු සේක් ම ය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"අධිචිත්තයෙන් යුක්ත, පමා නොවන, මෞනපථයන්හි හික්මෙන, උපශාන්ත වූ, හැම කල්හි සිහි ඇති, අටලෝ දහමින් නොසැලෙන, මුනිහට ශෝකයෝ නො වෙත්."

## 4. 8.

## සුන්දරී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර, ජේතවන** නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ ලෝවැස්සා විසින් සත්කාර කරන ලද ගරු කරන ලද බුහුමන් කරන ලද පුදන ලද යටත්පැවැතුම් දක්වන ලද සේක් වෙති. සිවුරු බොජුන් සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන සේක් වෙති. අන්තොටු පිරිවැජ්ජෝ වනාහි සත්කාර නොලදුවෝ, ගුරුකාර නො ලදුවෝ, බුහුමන් නොලදුවෝ, පූජා නො ලදුවෝ, යටත්පැවැතුම් නො ලදුවෝ වෙති. සිවුරු බොජුන් සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබන සුල්ලෝ වෙති.

2. ඉක්බිත්තෙන් ඒ අන්තොටු පිරිවැජ්ජෝ භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂුසඞ්ඝයාට ද ලැබෙන සත්කාර නො ඉවසන්නෝ, සුන්දරී පිරිවැජිය කරා එළැඹුණාහ. එළැඹ, "බිහිනිය, නෑයනට වැඩක් කරන්නට හැක්කහු ද?"යි කීහ. "ආර්‍ය්‍යයෙනි, කුමක් කෙරෙම් ද? මා විසින් කට නොහැකි කිමෙක් ද? නෑයන්ගේ යහපත පිණිස දිවි පවා මා විසින් පරිත්‍යක්ත යැ"යි ඕ කිවු ය.

3. "තෙන හි භගිනි, අභික්ඛණං ජෙතවනං ගච්ඡාහී"ති. "එවමය්‍යා"ති ඛො සුන්දරී පරිබ්බාජිකා තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං පටිස්සුත්වා අභික්ඛණං ජෙතවනං අගමාසි. යදා තෙ අඤ්ඤිංසු" අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා "වොදිට්ඨා[1] ඛො සුන්දරී පරිබ්බාජිකා බහුජනෙන අභික්ඛණං ජෙතවනං ගච්ඡතී"ති.[2] අථ නං ජීවිතා වොරොපෙත්වා තත්ථෙව ජෙතවනස්ස පරිඛාකූපෙ නිඛණිත්වා[3] යෙන රාජා පසෙනදි කොසලො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොචුං: "යා සා මහාරාජ, සුන්දරී පරිබ්බාජිකා, සා නො න දිස්සතී"ති. "කත්ථ පන තුම්හෙ ආසඞ්කථා"ති. "ජෙතවනෙ මහාරාජා"ති. "තෙන හි ජෙතවනං විචිනථා"ති

4. අථ ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ජෙතවනං විචිනිත්වා යථා නිඛණිතං පරිඛාකූපා[5] උද්ධරිත්වා මඤ්චකං ආරොපෙත්වා සාවත්ථිං පවෙසෙත්වා රථියා රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා මනුස්සෙ උජ්ඣාපෙසුං:

"පස්සථය්‍යා, සමණානං සක්‍යපුත්තියානං කම්මං, අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා පාපධම්මා මුසාවාදිනො අබ්‍රහ්මචාරිනො. ඉමෙ හි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං. නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං. නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං? කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං? අපගතා ඉමෙ සාමඤ්ඤා. අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. කථං හි නාම පුරිසො පුරිසකිච්චං කරිත්වා ඉත්ථිං ජීවිතා වොරොපෙස්සතී"ති.

5. තෙන ඛො පන සමයෙන සාවත්ථියං මනුස්සා භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි[6] වාචාහි අක්කොසන්ති, පරිභාසන්ති, රොසෙන්ති[4] විහෙසෙන්ති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා පාපධම්මා මුසාවාදිනො අබ්‍රහ්මචාරිනො, ඉමෙ හි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං, නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං, නට්ඨං ඉමෙසං සාමඤ්ඤං, නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං, කුතො ඉමෙසං සාමඤ්ඤං? කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං? අපගතා ඉමෙ සාමඤ්ඤා, අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. කථං හි නාම පුරිසො පුරිසකිච්චං කරිත්වා ඉත්ථිං ජීවිතා වොරොපෙස්සතී?"ති.

1. තෙ දිට්ඨා, සී. 2. ආගච්ඡතීති, සී. 3. පරිඛාකූපෙ නික්ඛිපිත්වා, මජසං. 4. රොසන්ති, මජසං.

3. "එසේ නම් බිහිනිය, එක්වත් දෙව්රමට යව"යි ඔහු කීහ. "එසේ ය, ආර්‍යයෙනි"යි කියා ම සුන්දරී පිරිවැජිය ඒ අන්තොටු පිරිවැජ්ජනට පිළිවදන් දී එක්වත් දෙව්රමට ගියා ය. 'බොහෝ දෙනා විසින් දක්නා ලද්දු ව සුන්දරී පිරිවැජිය එක්වත් දෙව්රම් යේ' යැ යි යම් විටෙක ඒ අන්තොටු පිරිවැජ්ජෝ දැන ගත්තාහු ද, එකල්හි ඇය දිවියෙන් තොර කොට, එහි ම ජේතවනයේ දිය අගලෙහි වළා ලා පසේනදී කොසොල්රජු වෙත එළැඹියහ. එළැඹ, "මහරජ, යම් සුන්දරී නම් පිරිවැජියක් වූ ද, ඕ අප විසින් නො දක්නා ලබාය"යි සැළ කළහ. "තෙපි කොහි සැක කරවු ද?"යි රජ පිළිවිත. "මහරජ, ජේතවනයෙහි යැ"යි ඔහු කීහ. "එසේ නම් ජේතවනය සොයා බලව" යි රජ කී ය.

4. ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජෝ ජේතවනය පුරා සොයා හැවිද, තමන් වළා ලූ පරිදි ම දිය අගලා වළෙන් ගොඩට ගෙන ඇඳෙක තංවා, සැවැත්-නුවරට පිවිස්වා (ඇතුළු කොට) වීථියෙන් වීථියට, තුන්මංහන්දියෙන් තුන්මං-හන්දියට එළැඹ, මිනිසුන්හට මෙසේ කීහ:

"ආර්‍යයෙනි, ශාක්‍යපුත්‍රිය මහණුන්ගේ කමක් බලව. මේ ශාක්‍යපුත්‍රිය මහණහු අලජ්ජීහු ය. දුශ්ශීලය හ. නිහීන පැවැතුම් ඇතියහ. මුසවා කියන්නෝ ය. බඹසර නැත්තෝ ය. මොහු වූ කලි 'කුසල්දහම් සරනුවම්හ. සම හැසුරුම් ඇතියම්හ, බඹසැරියම්හ, සබවස් ඇතියම්හ, සිල්වතුම්හ, කලණ-සැහැවි ඇතියම්හ' යි පිළිත දුන්හුය. මුන්ගේ මහණදමෙක් නැත. මුන්ගේ පව් බැහැර කළ බවෙක් නැත. මොවුන්ගේ මහණබව් නටුයේ ය. මොවුන්ගේ පව් බැහැර ලූ බව් නටුයේ ය. මොවුනට මහණබවෙක් කොයින් ද? මොවුන්ගේ පව් බැහැර ලූ බවෙක් කොයින් ද? මොහු මහණ බැවින් පහ වූහ. මොහු පව් බැහැර ලූ බව කෙරෙන් පහ වූහ. කෙසේ නම් පිරිමියෙක් මෙවුන්දම් සෙව සත්‍රියක දිවි ගළවා ද?" යනු යි.

5. එ කලැ සැවැත්හි මිනිස්සු භික්ෂූන් දැක, "මේ ශාක්‍යපුත්‍රිය ශ්‍රමණයෝ අලජ්ජීහු ය, දුශ්ශීලයෝ ය, පාපස්වභාව ඇත්තෝ ය, මුසාවාදීහු ය. අබ්‍රහමචාරීහු ය. අපි ධම්චාරීම්හ සමචාරීම්හ, බ්‍රහමචාරීම්හ, සත්‍යවාදීම්හ, සිල්වතුම්හ, කලණදහම් ඇතියම්හ'යි මොහුදු පිළිත දුන්හු. මොවුන්ගේ මහණකමෙක් නැත, මොවුන්ගේ බ්‍රාහමණ බවෙක් නැත. මොවුන්ගේ මහණ බව නටුයේ ය, මොවුන්ගේ බ්‍රාහමණ බව නටුයේ ය. මොවුනට මහණ බවෙක් කොයින් ද? මොවුනට බ්‍රාහමණ බවෙක් කොයින් ද? මොහු මහණ බැවින් බැහැර වූවෝ ය. බ්‍රාහමණ බැවින් බැහැර වූවෝය. කෙසේ නම් පිරිමියෙක් මෙවුන්දම් සෙවැ සත්‍රිය දිවියෙන් තොර කෙරේ දැ?"යි නොසැබි පරොස් බසින් ආක්‍රොශ කෙරෙත්, පරිභව කෙරෙත්, රොස් උපදවත්, වෙහෙසත්.

6. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ''එතරහි භන්තෙ, සාවත්ථියං මනුස්සා භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසන්ති, පරිභාසන්ති, රොසෙන්ති, විහෙසෙන්ති. 'අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා පාපධම්මා මුසාවාදිනො අබ්‍රහ්මචාරිනො, ඉමෙ හි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං. නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං. නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං? කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං? අපගතා ඉමෙ සාමඤ්ඤා. අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. කථං හි නාම පුරිසො පුරිසකිච්චං කරිත්වා ඉත්ථිං ජීවිතා වොරොපෙස්සති?''ති.

7. නෙසො භික්ඛවෙ සද්දො චිරං භවිස්සති. සත්තාහමෙව[1] භවිස්සති. සත්තාහස්ස අච්චයෙන අන්තරධායිස්සති. තෙන හි භික්ඛවෙ යෙ මනුස්සා භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසන්ති, රොසෙන්ති, විහෙසෙන්ති. තෙ තුම්හෙ ඉමාය ගාථාය පටිචොදෙථ:

''අභූතවාදී නිරයං උපෙති
යො වාපි කත්වා න කරොමි චාහ,[2]
උභො'පි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථා'ති.

8. අථ ඛො තෙ භික්ඛූ භගවතො සන්තිකෙ ඉමං ගාථං පරියාපුණිත්වා යෙ මනුස්සා භික්ඛූ දිස්වා අසබ්භාහි ඵරුසාහි වාචාහි අක්කොසන්ති පරිභාසන්ති රොසෙන්ති, විහෙසෙන්ති. තෙ මනුස්සෙ ඉමාය ගාථාය පටිචොදෙන්ති:

''අභූතවාදී නිරයං උපෙති
යො වාපි කත්වා න කරොමි චාහ,[2]
උභො පි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථා''ති.

9. මනුස්සානං එතදහොසි: ''අකාරකා ඉමෙ සමණා සක්‍යපුත්තියා, නයිමෙහි කතං, සපන්ති ඉමෙ සමණා සක්‍යපුත්තියා''ති. නෙව සො සද්දො චිරං අහොසි. සත්තාහමෙව අහොසි, සත්තාහස්ස අච්චයෙන අන්තරධායි. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ''අච්ඡරියං භන්තෙ! අබ්භුතං භන්තෙ! යාව සුභාසිතඤ්චිදං භන්තෙ, භගවතා 'නෙසො භික්ඛවෙ සද්දො චිරං භවිස්සති, සත්තාහමෙව භවිස්සති, සත්තාහස්ස අච්චයෙන අන්තරධායිස්සතී'ති. අන්තරහිතො සො භන්තෙ සද්දො''ති.

---

සත්තාහමෙව සො සද්දො, සී. 2. න කරොමීති චාහ, සී.

6. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන, සැවැතට පිඬු පිණිස පිවිසියහ. සැවැතෙහි පිඬු පිණිස හැසිර පසුබත් සමයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හිඳ ගත්හ. එකත්පසෙක හුන්නාවූ ම ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ: "වහන්ස, දැන් සැවැත්නුවර මිනිස්සු භික්ෂූන් දැක," මේ ශ්‍රමණශාක්‍ය පුත්‍රියයෝ අලජ්ජීහු ය, දුශ්ශීලයෝ ය, පාපසවභාව ඇත්තෝ ය, මුසාවාදීහු ය, අබ්‍රහමචාරීහු ය, මොහු තම් 'තුමූ ධර්මචාරිම්හ යි, සමචාරිම්හ යි, බ්‍රහමචාරිම්හ යි, සත්‍යවාදිම්හ යි, සිල්වතුම්හ යි, කලණදහම් ඇත්තම්හ යි පිළිත දුත්හ. මොවුනට මහණබවෙක් නැත. මොවුනට බ්‍රාහමණබවෙක් නැත. මොවුන්ගේ මහණ බව නටුයේ ය, මොවුන්ගේ බ්‍රාහමණ බව නටුයේ ය. මොවුනට මහණබවෙක් කොයින් ද? මොවුනට බ්‍රාහමණ බවෙක් කොයින් ද? මොහු මහණ බැවින් පහ වූවෝ ය. මොහු බ්‍රාහමණ බැවින් පහ වූවෝ ය. කෙසේ නම් පිරිමියෙක් පුරිස්කිස (මෛථුන්දම) කොට සත්‍රිය දිවියෙන් තොර කෙරේ දැ?"යි අසභ්‍ය වූ පරුෂ වචනයෙන් ආක්‍රොශ කෙරෙත්, පරිභව කෙරෙත්, රොස් දනවත්, වෙහෙසත්" යනු යි.

7. "මහණෙනි, මේ ශබ්දය බොහෝ කල් නො පවත්නේ ය. සතියක් ම මෙය පවත්නේ ය. සතිය ඇවෑමෙන් අතුරුදන් වන්නේ ය. මහණෙනි, එබැවින්, යම් මිනිස් කෙනෙක් භික්ෂූන් දැක, අසභ්‍ය පරුෂ වචනයෙන් ආක්‍රොශ කෙරෙත් නම්, පරිභව කෙරෙත් නම්, රොස් නංවත් නම්, වෙහෙසත් නම් ඔවුනට තෙපි මේ ගාථායෙන් පෙරළා චොදනා කරව:

"බොරු කියන තැනැත්තේ නිරයට පැමිණේ. යමෙක් කොට 'නො කෙළෙම්'යි කියා නම්, හේ ද නිරයට පැමිණේ. පහත් කම් ඇති ඒ මිනිස්සු දෙදෙන ම පරලොව ගොස් පරලොව්හි දී (විපාක දුක් විසින්) සම වෙත්"

8. ඉක්බිත්තෙන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථා ඉගෙන, යම් මිනිස් කෙනෙක් භික්ෂූන් දැක නොසැබි පරොස් බසින් ආක්‍රොශ කෙරෙත් නම්, පරිභව කෙරෙත් නම්, රොස් දනවත් නම්, වෙහෙසත් නම්, ඒ මිනිසුන්හට මේ ගාථායෙන් පෙරළා චෝදනා කෙරෙත්:

"බොරු කියන තැනැත්තේ නිරයට පැමිණේ. යමෙක් කොට 'නො කෙළෙම්'යි කියා නම්, හේ ද නිරයට පැමිණේ. පහත් කම් ඇති ඒ මිනිස්සු දෙදෙනා ම පරලොව ගොස් පරලොව්හි දී (විපාක දුක් විසින්) සම වෙත්."

9. (භික්ෂූන්ගේ වචන ඇසූ) මිනිසුන්හට "මේ ශාක්‍යපුත්‍රිය ශ්‍රමණයෝ මේ අපරාධය නො කළෝ ය. මොවුන් විසින් මෙය නො කරන ලදි. මේ ශාක්‍ය-පුත්‍රිය ශ්‍රමණයෝ ශාප දෙත්"යැ යි මේ සිත විය. ඒ ශබ්දය බොහෝ කල් නො පැවැත්තේ ය. සතියක් ම එය පැවැත්තේ ය. සතිය ඇවෑමෙන් අතුරුදහන් විය. ඉක්බිත්තෙන් බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ආශ්චර්‍ය යි! වහන්ස, අද්භූත යි! වහන්ස, "මේ ශබ්දය බොහෝ කල් නො පවත්නේ ය. සතියක් ම මෙය පවත්නේය. සතිය ඇවෑමෙන් අතුරුදහන් වන්නේ යැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් අත්‍යර්ථයෙන් සුභාෂිතය. වහන්ස, ඒ ශබ්දය අතුරුදහන් වියැ"යි මෙය සැළ කළහ.

10. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"තුදන්ති වාචාය ජනා අසඤ්ඤතා
සරෙහි[1] සඞ්ගාමගතං'ව කුඤ්ජරං,
සුත්වාන වාක්‍යං ඵරුසං උදීරිතං
අධිවාසයෙ භික්ඛු අදුට්ඨචිත්තො"ති.

## 4. 9.

## උපසෙනසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති, **වෙළුවනෙ** කලන්දකනිවාපෙ. අථ ඛො ආයස්මතො **උපසෙනස්ස** වඞ්ගන්තපුත්තස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, සත්ථා ච මෙ භගවා අරහං සම්මාසම්බුද්ධො. ස්වාක්ඛාතෙ චම්හි ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො. සබ්‍රහ්මචාරිනො[2] ච මෙ සීලවන්තො කල්‍යාණධම්මා. සීලෙසු ච'ම්හි පරිපූරකාරී, සමාහිතො ච'ම්හි එකග්ගචිත්තො. අරහා ච'ම්හි ඛීණාසවො, මහිද්ධිකො ච'ම්හි මහානුභාවො. භද්දකං මෙ ජීවිතං භද්දකං මරණං"ති.

2. අථ ඛො භගවා ආයස්මතො උපසෙනස්ස වඞ්ගන්තපුත්තස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යං ජීවිතං න තපති මරණන්තෙ න සොචති,
ස වෙ දිට්ඨපදො ධීරො සොකමජ්ඣෙ න සොචති.
උච්ඡින්නභවතණ්හස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවො"ති.

## 4. 10.

## සාරිපුත්තසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අත්තනො උපසමං පච්චවෙක්ඛමානො. අද්දසා ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අත්තනො උපසමං පච්චවෙක්ඛමානං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1. පරෙහි, සී. 2. සබ්‍රහ්මචාරියො, මුද්දිතපාළි, සබ්‍රහ්මචාරයො, මුද්දිතට්ඨකථා.

10. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

යුදවත් ඇතුට, සතුරු යොධයෝ ශරයෙන් මෙන්, සංවර නැති (නොහික්මුණු) බාලජනයෝ වචනයෙන් විදිත්. මහණ තෙම අනුන් විසින් කියන ලද පරොස් බස් අසා නොකිපි සිතැත්තේ ඉවසන්නේ ය."

## 4. 9.

### උපසෙන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර කලන්‍දකනිවාප නම් වූ **වෙළුවනයෙහි** වැඩ වසන සේක. එ කල්හි එකලා වූ, චිත්තවිවෙකයෙන් යුක්ත වූ වඞ්ගන්තපුත්‍ර **උපසෙන** තෙරුනට "අහෝ! මේ මනුෂ්‍යත්වාදීහු එකාන්තයෙන් මා ලත් ලාභයෝ ය. මා ලත් සඟතු, පැවිදි උපසපු ආදිය අහෝ! එකාන්තයෙන් මොනොවට ම ලද්දේ ය! භාග්‍යවත් වූ මාගේ ශාස්තෘ ද එකාන්තයෙන් සම්‍යක්සම්බුද්ධ ය. මොනොවට වදාරන ලද දහම් විනය ඇති කල්හි ගිහිගෙන් නික්ම සසුන් වනිමි. මාගේ සබ්‍රම්සරුහු ද සිල්වත්හ, කලණ දහම් ඇත්තෝ ය. මම් ද ශීලයන්හි පරිපූර්කාරී වෙමි. එකග වූ සිතැතියෙම් සමාහිත ද වෙමි. ආස්‍රව ක්‍ෂීණ කළ රහතෙකිම් ද වෙමි. මහත් සෘද්ධි ඇතියෙම්, මහත් අනුභාව ඇතියෙම් ද වෙමි. මාගේ ජීවත් වීම ද මැනැවි. මාගේ මරණය (ස්කන්ධපරිනිර්වාණය) ද මැනැවි"යි මෙසේ චිත්තසංකල්පයෙක් පහළ විය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සිය සිතින් වඞ්ගන්තපුත්‍ර වූ උපසෙන තෙරුන්ගේ චිත්තපරිවිතර්කය දැන එවේලෙහි මේ උදන් ඇනූ සේක:

"ජීවිතය තෙම (හෙවත් නැවැත ස්කන්ධයන්ගේ පැවැත්ම) යම් පුඟුලකු නො පෙළා ද, මරණ සඞ්ඛ්‍යාත අවසානයෙහි හෝ නො සොවී ද, දක්තා දුඃඛාදි සත්‍යපද ඇති ධීර තෙම ශොකහෙතුන් මැද නො සොවී.

මුල් සුන් කළ භවතෘෂ්ණා ඇති, සංහුන් සිතැති මහණහුගේ ජාත්‍යාදි වූ සංසාරය වෙසෙසින් ක්‍ෂීණ වූයේ වේ. ඔහුට පුනර්භවයෙක් නැත."

## 4. 10.

### ශාරිපුත්‍ර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජෙතවන** නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **සැරියුත්** තෙරණුවෝ පලක් බැඳ, කය සෘජු කොට පිහිටුවා තමන්ගේ කෙලශව්‍යුපශමය නුවණින් සලකා බලනුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි වැඩ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා තමන්ගේ කෙලශව්‍යුපශමය නුවණින් සලකා බලමින් වැඩ හුන් සැරියුත් තෙරුන් දුටු සේක් ම ය.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"උපසන්තසන්තචිත්තස්ස නෙත්තිච්ඡින්නස්ස භික්ඛුනො,
වික්ඛීණො ජාතිසංසාරො මුත්තො සො මාරබන්ධනා"ති.

**මෙඝියවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

මෙඝියං[1] උද්ධතං[2] ගොපාලං[3] ජුණ්හං[4] නාගෙන පඤ්චමං
පිණ්ඩොලො සාරිපුත්තො ච සුන්දරී භවති අට්ඨමං,
උපසෙනො වඞ්ගන්තපුත්තො සාරිපුත්තො ච තෙ දසාති.

---

## සොණවග්ගො[5] පඤ්චමො

### 5. 1.

### රාජසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන රාජා **පසෙනදි කොසලො** මල්ලිකාය දෙවියා සද්ධිං උපරිපාසාදවරගතො හොති. අථ ඛො රාජා පසෙනදි කොසලො මල්ලිකං දෙවිං එතදවොච: "අත්ථි නු ඛො තෙ මල්ලිකෙ, කොචඤ්ඤො අත්තනා පියතරො?"ති.

"නත්ථි ඛො මෙ මහාරාජ, කොචඤ්ඤො අත්තනා පියතරො"ති.

"තුය්හං පන මහාරාජ, අත්ථඤ්ඤො කොචි අත්තනා පියතරො?"ති.

"මය්හම්පි ඛො මල්ලිකෙ, නත්ථඤ්ඤො කොචි අත්තනා පියතරො"ති.

2. අථ ඛො රාජා පසෙනදි කොසලො පාසාදා ඔරොහිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච:

"ඉධාහං භන්තෙ, මල්ලිකාය දෙවියා සද්ධිං උපරිපාසාදවරගතො මල්ලිකාදෙවිං එතදවොචං: "අත්ථි නු ඛො තෙ මල්ලිකෙ, කොචඤ්ඤො අත්තනා පියතරො?"ති. එවංවුත්තෙ මල්ලිකාදෙවී මං එතදවොච: "නත්ථි ඛො මෙ මහාරාජ, කොචඤ්ඤො අත්තනා පියතරො"ති. "තුය්හං පන මහාරාජ, අත්ථඤ්ඤො කොචඤ්ඤො අත්තනා පියතරො"ති. එවං වුත්තෙ අහං භන්තෙ, මල්ලිකං දෙවිං එතදවොචං: "මය්හං පි ඛො මල්ලිකෙ, නත්ථඤ්ඤො කොචි අත්තනා පියතරො"ති.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1. මෙඝියො, සී. 2. උද්ධතා, සී. 3. ගොපාලො, සී. 4. ජුණ්හා, සී. 5. සොණත්ථෙරස්ස. සී

"උපශාන්ත වූ සංහුන් සිතැති, සුන් කරන ලද භවතෘෂ්ණා ඇති, මහණහුගේ ජාත්‍යාදි සංසාරය වෙසෙසින් ක්ෂීණ ය. හේ මරු බැම්මෙන් මිදුණේ ය.

එහි උද්දානය:

මෙඝිය, උද්ධත, ගොපාල, ජුණ්හ, නාග සූත්‍රයන් පස්වැන්න ද, පිණ්ඩෝල, සාරිපුත්ත, අටවන සුන්දරී, උපසෙනවංගන්තපුත්ත, සාරිපුත්ත ද යි ඒ සූත්‍ර දශයෙකි.

---

## පස්වන සෝණවග්ගය

### 5. 1.

### රාජ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි පසේනදී කොසල රජ මල්ලිකාදෙවිය හා පහයෙහි උඩුමහල්තලයට පැමිණියේ වේ. එ කල්හි පසේනදී කොසල රජ තෙම මල්ලිකා දේවිය බණවා, "මල්ලිකාවනි, තමනට වඩා ප්‍රිය වූ කිසි අන් කෙනෙක් තොපට ඇද් දැ?"යි ඇසී ය.

"මහරජාණනි, මට තමාට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් නැත් ම ය.

මහරජාණනි, මුඹට වනාහි තම්නට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් ඇත් දැ" යි මල්ලිකා දේවී ඇසුවා ය.

"මටත් මල්ලිකාවනි, තමාට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් නැතැ"යි පසේනදී කොසොල් රජ කී ය.

2. ඉක්බිත්තෙන් පසේනදි කොසොල් රජ පහයෙන් බැස, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, එකත්පසෙකැ හිඳ ගත. එකත්පසෙක හුන්නාවූ ම පසේනදී කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය.

"වහන්ස, මෙහි මම් මල්ලිකා දේවිය හා පහයෙහි උඩුමහල්තලයට පැමිණියෙමි, මල්ලිකා දේවිය බණවා, "මල්ලිකාවනි, තමනට වඩා ප්‍රිය වූ කිසි අන් කෙනෙක් තොපට ඇද්දැ?යි ඇසීමි. එසේ ඇසූ කල්හි මල්ලිකා දේවී මට "මහරජාණනි, මට තමාට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් නැත් ම යැ"යි සැළ කළා. "මහරජාණනි, මුඹට වනාහි තම්නට වඩා ප්‍රිය වූ අන් කිසි කෙනෙක් ඇත් දැ?යි ඕ ද පුළුවුත්. වහන්ස, එසේ පුළුවුත් කල්හි "මල්ලිකාවනි, මටත් තමාට වඩා ප්‍රිය වූ අන් කිසිවෙක් නැතැ'යි මම් කීමි" යනු යි.

3. එ කල්හි භාග්‍යවතුන් මේ කාරණය සලකා, ඒ වෙලායෙහි මේ උදන් ඇනූ සේක:

"සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා
නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි,
එවං පියො පුථු අත්තා පරෙසං
තස්මා න හිංසෙ පරමත්තකාමො"ති.

## 5. 2.

## අප්පායුකසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අච්ඡරියං! භන්තෙ, අබ්භුතං! භන්තෙ, යාව අප්පායුකා හි භන්තෙ, භගවතො මාතා අහොසි. සත්තාහජාතෙ භගවති භගවතො මාතා කාලමකාසි. තුසිතං කායං උපපජ්ජී"ති.[1] "එවමෙතං ආනන්ද, අප්පායුකා හි ආනන්ද, බොධිසත්තමාතරො හොන්ති, සත්තාහජාතෙසු බොධිසත්තෙසු බොධිසත්තමාතරො කාලං කරොන්ති, තුසිතං කායං උපපජ්ජන්තී"ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යෙ කෙචි භූතා භවිස්සන්ති
යෙ වාපි සබ්බෙ ගමිස්සන්ති පහාය දෙහං,
තං සබ්බං ජානිං කුසලො විදිත්වා
ආතාපියො බ්‍රහ්මචරියං චරෙය්‍යා"ති.

## 5. 3.

## සුප්පබුද්ධකුට්ඨිසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන රාජගහෙ සුප්පබුද්ධො නාම කුට්ඨී අහොසි, මනුස්සදළිද්දො මනුස්සකපණො මනුස්සවරාකො.

2. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො නිසින්නො හොති. අද්දසා ඛො සුප්පබුද්ධො කුට්ඨී තං මහාජනකායං දූරතොව සන්නිපතිතං. දිස්වානස්ස එතදහොසි: "නිස්සංසයං ඛො එත්ථ කිඤ්චි ඛාදනීයං වා භොජනීයං වා භාජීයිස්සති. යන්නූනාහං යෙන සො මහාජනකායො තෙනුපසඞ්කමෙය්‍යං. අප්පෙවනාමෙත්ථ කිඤ්චි ඛාදනීයං වා භොජනීයං වා ලභෙය්‍යන්ති".

1. උපපජ්ජති. සී.

"සියලු දශ දිශාවන් සෙවීම් වශයෙන් සිතින් අනුව ගොස්, තමහට වඩා ප්‍රියයකු සොයන්නේ කිසි තැනෙකත් නො දක්නේ ය. මෙසේ ඒ අන් සත්ත්වයනට වෙන වෙන ම තම තමා වඩා ම ප්‍රිය වේ. එහෙයින් තමාගේ සුව කැමැති තැනැත්තේ මෙරමා නො පෙළන්නේ ය."

## 5. 2.

## අප්පායුක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එකල්හි **අනඳ** තෙරණුවෝ සවස් වේලෙහි චිත්තවිවේකයෙන් නැඟී සිටියාහු භාග්‍ය-වතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ ඔබ සකසා වැඳ එක් පසෙක හුන්හ. එක් පසෙක හුන් ම අනඳ තෙරණුවෝ, "වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ මෑණියෝ අතිශයයෙන් අල්පායුෂ්කා වූහු ය" යන්න ආශ්චර්යයී සි. වහන්ස, අද්භූතයි! භාග්‍යවතුන් වහන්සේගේ මෑණියෝ මුඹ උපන් සත්-දවසෙහි කලුරිය කළහ. තුෂිත දෙවනිකායට (උත්පත්ති වශයෙන්) පැමිණියහ" සි භාග්‍යවතුන් වහන්සේට කීහ. "ආනන්දයෙනි, එය එසේ ය. ආනන්දයෙනි, බෝසත් මවුවරු අල්පායුෂ්කා වෙත්. බෝසතුන් උපන් සත් දවස වූ කල්හි බෝසත් මවුහු කලුරිය කරත්. තුෂිත දෙවනිකායට පැමිණෙත්."

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යම් කිසි සත්හු කෙනෙක් පෙරැ වූවාහු ද, මතු ද වෙද්ද, යම් හැම කෙනෙක් මේ කය හැර දෙව්ලොවට යන්නාහු ද, ඒ සියලු පිරිහීම නුවණැත්තේ දැන කෙලෙස් තවන වැර ඇත්තේ බඹසර කරන්නේ ය."

## 5. 3.

## සුප්පබුද්ධකුට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවරැ කලන්දකනිවාප නම් වූ **වේළුවනයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි වනාහි රජගහ නුවරෙහි මිනිසුන්ගෙන් ඉතා දිළිඳු වූ, මිනිසුන් අතුරෙහි ඉතා ම දුගී වූ මිනිසුන් අතුරෙහි ඉතා ම දීන වූ **සුප්‍රබුද්ධ** නම් කුෂ්ඨරෝගියෙක් විය.

2. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහ පිරිසක් විසින් පිරිවරන ලදු වැ දහම් දෙසමින් හුන්සේක් වෙති. සුප්‍රබුද්ධ කුෂ්ඨී තෙම රැස්ව සිටි ඒ මහජන මුළුව දුරැ දී ම දිටී. දැක ඔහුට 'නිසැකයෙන් ම මෙහි කිසි කැයුතු බිදියැ යුතු දැයෙක් බෙදෙයි. ඒ මහජන මුළුව කරා ගියෙම් නම් මතා මැ නු! මෙහි දී කිසි කැයුතු බිදියැ යුතු දැයක් ලැබ ගත හැකි වීම් නම් මැනැවැ"යි මේ සිත විය.

3. අථ ඛො සුප්පබුද්ධො කුට්ඨී යෙන සො මහාජනකායො තෙනුපසඞ්කමි. අද්දසා ඛො සුප්පබුද්ධො කුට්ඨී භගවන්තං මහතියා පරිසාය පරිවුතං ධම්මං දෙසෙන්තං නිසින්නං. දිස්වානස්ස එතදහොසි: “න ඛො එත්ථ කිඤ්චි ඛාදනීයං වා භොජනීයං වා භාජීයති, සමණො අයං ගොතමො පරිසතිං ධම්මං දෙසෙති. යන්නූනාහම්පි ධම්මං සුණෙය්‍යන්ති. තත්ථෙව එකමන්තං නිසීදි. “අහම්පි ධම්මං සොස්සාමී”ති. අථ ඛො භගවා සබ්බාවන්තං පරිසං චෙතසා චෙතොපරිච්ච මනසාකාසි ‘කො නු ඛො ඉධ භබ්බො ධම්මං විඤ්ඤාතුං?”ති.

4. අද්දසා ඛො භගවා සුප්පබුද්ධං කුට්ඨිං තස්සං පරිසායං නිසින්නං, දිස්වානස්ස එතදහොසි: “අයං ඛො ඉධ භබ්බො ධම්මං විඤ්ඤාතුං”ති. සුප්පබුද්ධං කුට්ඨිං ආරබ්භ ආනුපුබ්බිකථං[1] කථෙසි. සෙය්‍යථිදං? දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං, නෙක්ඛම්මෙ ච[2] ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි, සුප්පබුද්ධං කුට්ඨිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං. අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි, දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාලකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය. එවමෙව සුප්පබුද්ධස්ස කුට්ඨිස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: ‘යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්මන්ති.’

5. අථ ඛො සුප්පබුද්ධො කුට්ඨී දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ, උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුප්පබුද්ධො කුට්ඨී භගවන්තං එතදවොච: “අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී”ති. එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත”න්ති.

6. අථ ඛො සුප්පබුද්ධො කුට්ඨී භගවතා ධම්මියා කථාය සන්දස්සිතො, සමාදපිතො, සමුත්තෙජිතො, සම්පහංසිතො, භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

1. අනුපුබ්බිකථං, සී. කත්ථචි.

3. ඉක්බිත්තෙන් සුප්‍රබුද්ධකුෂ්ඨී තෙමේ ඒ මහජන මුළුව වෙත එළැඹියේ ය. එහි මහපිරිසක් විසින් පිරිවරන ලදු වැ දහම් දෙසමින් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දිටී ය. දැක ඔහුට "මෙහි කිසි කැයුතු හෝ බිදිය යුතු හෝ දැයෙක් නො බෙදෙයි. මේ මහණ ගොයුම්හු පිරිසෙහි දම් දෙසති. මමත් දහම් අසම් නම් මැනැවැ"යි මේ සිත විය. හෙ තෙම 'මමත් බණ අසන්නෙමි"යි එහි ම එක් පසෙක හිඳ ගත්තේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එකකුදු නො හැර මුළු පිරිස ම ඔවුන් සිත් සිය සිතින් පිරිසිඳ 'මෙහි කවරෙක් නම් දහම් දැන ගන්නට (මාර්ගඵලාවබෝධයට) භව්‍ය දැ?"යි (උපනිඃශ්‍රය සම්පන්න දැයි) බැලූ සේක.

4. භාග්‍යවතුන් වහන්සේ ඒ පිරිසෙහි හුන් සුප්‍රබුද්ධ කුෂ්ඨියා දුටු සේක. දැක උන් වහන්සේට 'මේ තෙමේ ඒකාන්තයෙන් මෙහි ධර්මය අවබෝධ කරන්නට තරම් උපනිඃශ්‍රය සම්පත් ඇත්තෙකැ'යි මේ සිත විය. ඉක්බිති සුප්‍රබුද්ධ කුෂ්ඨියා ඇරැබ, දානකථා ද ශීලකථා ද ස්වර්ගකථා ද කාමයන්ගේ දොෂ ද ලාමකබව ද කෙලෙසීම ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුහස් ද පැවැසූ සේක. යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ සුප්‍රබුද්ධ කුෂ්ඨීහු කර්මණ්‍ය සිත් ඇතියහු කෙලෙස් පහ ව මොළොක් සිත් ඇතියහු නීවරණ පහ වූ සිතැත්තහු, (මනා පිළිවෙත්හි) ඔදවැඩි සිතැත්තහු සැදැහැයෙන් පහන් සිතැත්තහු දුටු සේක් ද, එ විටැ දුක් යැ සමුදය යැ නිරොධ යැ මාර්ගය යැ යන බුදුවරුන්ගේ යම් සාමුක්කංසිකී දෙශනාවෙක් වේ නම් එය පැවැසූ සේක. පහ වූ කළුබව් ඇති ශුද්ධ වස්ත්‍රය යම්සේ රඳන් පිළිගන්නේ ද, එ පරිද්දෙන් ම සුප්‍රබුද්ධ කුෂ්ඨියානට ඒ ආසනයෙහි ම, 'යමක් හටගන්නා ස්වභාවය ඇත් නම් ඒ සියල්ල නැසෙන ස්වභාවය ඇත්තේ යැ'යි පහ වූ කෙලෙස් රජස් ඇති, පහ වූ කෙලෙස්මල ඇති දහම් ඇස පහළ විය.

5. එ කල්හි සුප්‍රබුද්ධ කුෂ්ඨී තෙම දක්නා ලද සිවුසස් දහම් ඇත්තේ නුවණින් පැමිණි සිවුසස් දහම් ඇත්තේ, ප්‍රකට වූ සිවුසස් දහම් ඇත්තේ, නුවණින් බැස ගත් සිවුසස් දහම් ඇත්තේ, ඉක්මි සැක ඇත්තේ, පහවූ විමති ඇත්තේ, ශීලාදිගුණයන්හි විශාරද බවට පැමිණියේ, බුද්ධශාසනයෙහි පරප්‍රත්‍යය නැත්තේ, හුනස්නෙන් නැගී සිටැ, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ ගත්තේ ය. එකත්පසෙක හිඳ ගත්තා වූ ම සුප්‍රබුද්ධ කුෂ්ඨී තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ ය: "වහන්ස, දේශනාව අභිකාන්ත ය. වහන්ස, දේශනාව අභිකාන්ත ය. වහන්ස, යම්සේ මුණින් නමා තබන ලද්දක් උඩුකුරු කොට තබන්නේ ද, වැසුණු දැයක් හෝ විවර කරන්නේ ද, මංමුළා වූවකුට මඟ කියන්නේ ද "ඇස් ඇත්තෝ රූප දකිත්නාහ"යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද, එ පරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පවසන ලද්දේ ය. වහන්ස. ඒ මම් භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි, භාග්‍යවතුන් වහන්සේ අද පටන් මා දිවිහිම් කොට සරණ ගිය උපාසකයකු කොට සලකන සේක් වා"යනු යි.

6. එකල්හි සුප්‍රබුද්ධ කුෂ්ඨී තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථායෙන් දක්වන ලද්දේ, උත්සාහවත් කරන ලද්දේ, සතුටු කරන ලද්දේ භාග්‍යවතුන් වහන්සේගේ වචන පිළිගෙන, සතුටු ව, හුනස්නෙන් නැගී සිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

අථ ඛො සුප්පබුද්ධං කුට්ඨිං අචිරපක්කන්තං[1] ගාවී තරුණවච්ඡා අධිපාතෙත්වා ජීවිතා වොරොපෙසි.

7. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "යො සො භන්තෙ, සුප්පබුද්ධො නාම කුට්ඨී භගවතා ධම්මියා කථාය සන්දස්සිතො, සමාදපිතො, සමුත්තෙජිතො, සම්පහංසිතො, සො කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො"ති?

8. "පණ්ඩිතො භික්ඛවෙ, සුප්පබුද්ධො කුට්ඨී, පච්චපාදි ධම්මස්සානුධම්මං, න ච මං ධම්මාධිකරණං විහෙසෙසි. සුප්පබුද්ධො භික්ඛවෙ, කුට්ඨී තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො"ති.

9. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො යෙන සුප්පබුද්ධො කුට්ඨී අහොසි, මනුස්සදලිද්දො මනුස්සකපණො මනුස්සවරාකො?"ති.

10. "භූතපුබ්බං භික්ඛවෙ සුප්පබුද්ධො කුට්ඨී ඉමස්මිං යෙව රාජගහෙ සෙට්ඨිපුත්තො අහොසි. සො උය්‍යානභූමිං නිය්‍යන්තො අද්දස තගරසිඛිං පච්චෙකබුද්ධං නගරං පිණ්ඩාය පවිසන්තං, දිස්වානස්ස එතදහොසි: "ක්වායං කුට්ඨී කුට්ඨිචීවරෙන හි විචරතී"ති, නිට්ඨුභිත්වා අපසබ්‍යතො[2] කරිත්වා පක්කාමි. සො තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්ථ. තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන ඉමස්මිං යෙව රාජගහෙ කුට්ඨී අහොසි, මනුස්සදලිද්දො මනුස්සකපණො මනුස්සවරාකො. සො තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම සද්ධං සමාදියි, සීලං සමාදියි, සුතං සමාදියි, චාගං සමාදියි, පඤ්ඤං සමාදියි. සො තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම සද්ධං සමාදියිත්වා සීලං සමාදියිත්වා සුතං සමාදියිත්වා චාගං සමාදියිත්වා පඤ්ඤං සමාදියිත්වා කායස්ස භෙදා පරං මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නො දෙවානං තාවතිංසානං සහබ්‍යතං. සො තත්ථ අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා චාති.

11. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"චක්ඛුමා විසමානීව විජ්ජමානෙ පරක්කමෙ,
පණ්ඩිතො ජීවලොකස්මිං පාපානි පරිවජ්ජයෙ"ති.

---

1 අථ ඛො සුප්පබුද්ධං අචිරපක්කන්තං, සී. 2. අපසබ්‍යාමකතො, සභා. අපසාදං,-ධම්මපදට්ඨකථා. - අපසහව්‍යතං=ඉහවතට හිසිනස?.

ඉක්බිත්තෙන් නික්මැ ගිය නොබෝ වේලා ඇති සුප්‍රබුද්ධ කුෂ්ඨියා පැටවස්සකු ඇති දෙනක් අනින් ඇන බිම හෙළා දිවියෙන් තොර කළා ය.

7. එ කල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැද, එකත්පසෙක හුන්නාහ. එකත්පසෙක හුන්නාවූ ම ඒ භික්ෂූහු "වහන්ස, යම් සුප්‍රබුද්ධ නම් කුෂ්ඨියෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු ලා දක්වන ලද්දේ ද, සමාදන් කරවන ලද්දේ ද, උත්සාහවත් කරන ලද්දේ ද, සතුටු කරන ලද්දේ ද, හේ කළුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කවර යැ, පරලොව පැවැත්ම කවර යැ"?යි ඇසූහ.

8. "මහණෙනි, සුප්‍රබුද්ධ නම් කුෂ්ඨි තෙම පණ්ඩිත ය. ධර්මානුධර්ම ප්‍රතිපන්න වී ය. ධර්මාවබොධ කාරණයෙන් මා නො වෙහෙසී ය. මහණෙනි, සුප්‍රබුද්ධ කුෂ්ඨි තෙම තුන් සංයොජනයන්ගේ පරික්ෂයයෙන් සෝවන් වූයේ, අපායට නොවැටෙන සවභාව ඇත්තේ, සම්‍යක්ත්වනියමයෙන් නියත වූයේ, ඉදිරි මාර්ගත්‍රය (සම්බොධිය) ප්‍රතිෂ්ඨා කොට ඇත්තේ වී යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

9. මෙසේ කී කල්හි එක්තරා මහණෙක් "වහන්ස, යමෙකින් සුප්‍රබුද්ධ තෙම කුෂ්ඨ ඇත්තේ වී ද, මිනිසුන් අතුරෙහි ඉතා දිළින්දෙක්, මිනිසුන් අතුරෙහි ඉතා දුගියෙක්, මිනිසුන් අතුරෙහි ඉතා ම දීනයෙක් වී ද, එයට හෙතුව කවරේ ද, ප්‍රත්‍යය කවරේ දැ"?යි ඇසී ය.

10. "මහණෙනි, පෙර වූවක් කියමි. සුප්‍රබුද්ධ කුෂ්ඨි තෙම මේ රජගහ පුරයෙහි ම සිටුපුතෙක් විය. හේ උයන්බිමට යන්නේ නුවරට පිඬු පිණිස පිවිසෙන තගරසිඛී පසේබුදුහු දිටී. දැක ඔබට "සිවුරෙන් ඇඟ වසා හැසිරෙනා මේ කුෂ්ඨියා කවරෙක් දැ?"යි මේ සිත විය. මෙසේ සිතා කෙළ එව අපසව්‍ය (නිගරු) කොට නික්ම ගියේ ය. හේ ඒ කර්මයේ විපාකයෙන් බොහෝ හවුරුදු, බොහෝ සිය ගණන් හවුරුදු, බොහෝ දහස්ගණන් හවුරුදු, බොහෝ සිය-දහස්ගණන් හවුරුදු නිරයේ පැසුණේ ය. ඒ කර්මයේ ම ඉතිරි විපාකයෙන් මේ රජගහ පුරයෙහි ම මිනිස්දිළින්දෙක් වූ මිනිස්දුගියෙක් වූ මිනිස්දීනයෙක් වූ කුෂ්ඨියෙක් විය. හේ තථාගතයන් දෙසූ ධර්මවිනය නිසා සැදැහැ සමාදන් කොට ගත්තේ ය. සිල් සමාදන් කොට ගත්තේ ය. බහුශ්‍රැත බව සමාදන් කොට ගත්තේ ය. ත්‍යාගය සමාදන් කොට ගත්තේ ය. ප්‍රඥාව සමාදන් කොට ගත්තේ ය. හේ තථාගතප්‍රවේදිත ධර්මවිනය නිසා ශ්‍රද්ධාව සමාදන් කොට ගෙන, ශීලය සමාදන් කොට ගෙන, ශ්‍රැතය සමාදන් කොට ගෙන, ත්‍යාගය සමාදන් කොට ගෙන, ප්‍රඥාව සමාදන් කොට ගෙන, කාබුන් මරණින් මතු සුගති වූ සගලොව පැමිණියේ, තව්තිසාවැසි දෙවියන්ගේ සහභාවයට පැමිණියේ ය. හේ එහි පැහැයෙන් ද යශසින් ද අන් දෙවියන් ඉක්මැ බබලා"යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

11. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූහ :

"නුවණැස් ඇති පණ්ඩිත තෙමේ කායික වීර්‍යය පවත්නා කල්හි විෂම ඇත් අස් ආදීන් මෙන් මේ සත්ලොවෙහි පාපයන් දුරු ලන්නේ ය."

## 5. 4.

## කුමාරකසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා කුමාරකා අන්තරා ච සාවත්ථිං අන්තරා ච ජෙතවනං මච්ඡකෙ බාධෙන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා තෙ සම්බහුලෙ කුමාරකෙ අන්තරා ච සාවත්ථිං අන්තරා ච ජෙතවනං මච්ඡකෙ බාධෙන්තෙ. දිස්වාන යෙන තෙ කුමාරකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ කුමාරකෙ එතදවොච: "භායථ තුම්හෙ[1] කුමාරකා, දුක්ඛස්ස? අප්පියං වො දුක්ඛං?"ති. "එවං භන්තෙ, භායාම මයං[2] දුක්ඛස්ස, අප්පියං නො දුක්ඛං"ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සචෙ භායථ දුක්ඛස්ස සචෙ වො දුක්ඛමප්පියං,
මා'කත්ථ පාපකං කම්මං ආවි වා යදි වා රහො.

සචෙ ච පාපකං කම්මං කරිස්සථ කරොථ වා,
න වො දුක්ඛා පමුත්‍යත්ථි උපෙච්ච පි පලායතං"ති.

## 5. 5.

## උපොසථසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ**. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝපරිවුතො නිසින්නො හොති. අථ ඛො ආයස්මා **ආනන්දො** අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පඨමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ, රත්ති. නික්ඛන්තො පඨමො යාමො. චිරනිසින්නො භික්ඛුසඞ්ඝො. උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං පාතිමොක්ඛං"ති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො මජ්ඣිමො යාමො. චිරනිසින්නො භික්ඛුසඞ්ඝො. උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං පාතිමොක්ඛං"ති. දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධස්තෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පච්ඡිමො යාමො. උද්ධස්තො අරුණො, නන්දිමුඛී රත්ති. චිරනිසින්නො භික්ඛුසඞ්ඝො. උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං පාතිමොක්ඛං"ති. 'අපරිසුද්ධා ආනන්ද පරිසා'ති.

---

1. වො තුම්හෙ, කත්ථචි. 2 මයං භන්තෙ, කත්ථචි.

## 5. 4.

## කුමාරකසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර ජේතවන** නම් වූ **අනේපිඩු** අරමෙහි වැඩ වසන සේක. එසමයෙහි වනාහි බොහෝ දරුවෝ සැවැතටත් දෙව්රමටත් අතර මසුන් පෙළත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැතට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ සැවැතටත් දෙව්රමටත් අතර මසුන් පෙළන ඒ දරුවන් දුටු සේක. දැක ඒ දරුවන් කරා එළැඹියහ. එළැඹ "දරුවෙනි, තෙපි දුකට බිය ඇත්තවු ද? දුක තොපට අප්‍රිය දැ?"යි අසා වදාළ සේක. "එසේ ය වහන්ස, අපි දුකට බමු. අපට දුක අප්‍රිය යැ"යි ඔහු කීහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

'ඉදින් දුකට බවු නම්, ඉදින් දුක තොපට අප්‍රිය නම්, එළියේ හෝ රහසේ හෝ පව්කම් තො කරවු.

ඉදින් පව්කම් කරවු නම් හෝ කරන්නහු නම් හෝ එය දැන පලා යන්නා වූ ද තොපට දුකින් මිදීමෙක් නැත."

## 5. 5.

## උපොසථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර සමීපයෙහි වූ මාගාරිමාතාප්‍රාසාද නම් වූ **පූර්වාරාමයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ පොහොලත් එදින භික්සඟන විසින් පිරිවැරුණාහු වැඩහුන් සේක් වෙති. එකල්හි **අනඳ** තෙරණුවෝ රැ බොහෝ වේලා ඉක්මැ ගිය කල්හි, පළමු යම ගෙවුණ කල්හි හුනස්නෙන් නැඟී සිට සිවුර එකස් කොට භාග්‍යවතුන් දසට ඇඳිලි නමා "වහන්ස, රැ බොහෝ ඉක්මියේ ය. පෙර යම ගෙවිණ. භික්සඟ හිඳගත් බොහෝ වේලා ඇත්තේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූනට පාමොක් උදෙසන සේක්වා"යි කීහ. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. දෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රැය බොහෝ ඉක්මුණු කල්හි, මැදුම්යම ගෙවුණ කල්හි, හුනස්නෙන් නැඟිට, සිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේ දසට ඇඳිලි නමා, "වහන්ස, රැ බොහෝ ඉක්මැ ගියේ ය. මැදුම් යම ගෙවිණ.......පාමොක් උදෙසන සේක්වා"යි කීහ. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. තෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රැ බොහෝ ඉක්මි කල්හි, පැසිම් යම ගෙවුණු කල්හි අරුණු නැඟි කල්හි රැ පාන් වන වේලෙහි හුනස්නෙන් නැඟී සිට සිවුර එකස් කොට, භාග්‍යවතුන් වහන්සේ දසට ඇඳිලි නමා "වහන්ස, රැ බොහෝ ඉක්ම ගියේ ය. පැසිම් යම ගෙවුණේ ය. අරුණු නැංගේ ය. රැ පාන් වීමට ළං වැ ඇත. භික්සඟහු හිඳගත් බොහෝ වේලා ඇත්තාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූනට පාමොක් උදෙසන සේක්වා"යි කීහ. 'අනඳයෙනි, පිරිස අපිරිසිදු යැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

2. අථ ඛො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස එතදහොසි: "කං නු ඛො භගවා පුග්ගලං සන්ධාය එවමාහ 'අපරිසුද්ධා ආනන්ද, පරිසා'ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සබ්බාවන්තං භික්ඛුසඞ්ඝං චෙතසා චෙතො පරිච්ච මනසාකාසි. අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං දුස්සීලං පාපධම්මං අසුචිසඞ්කස්සරසමාචාරං පටිච්ඡන්නකම්මන්තං අස්සමණං සමණපටිඤ්ඤං අබ්‍රහ්මචාරිං බ්‍රහ්මචාරිපටිඤ්ඤං අන්තොපූතිං අවස්සුතං කසම්බුජාතං මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නං. දිස්වාන උට්ඨායාසනා යෙන සො පුග්ගලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං පුග්ගලං එතදවොච: 'උට්ඨෙහාවුසො, දිට්ඨොසි භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො'ති. අථ ඛො සො පුග්ගලො තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: 'උට්ඨෙහාවුසො, දිට්ඨොසි භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො'ති. දුතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: "උට්ඨෙහාවුසො, දිට්ඨොසි භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො'ති. තතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි.

3. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං බාහායං ගහෙත්වා බහිද්වාරකොට්ඨකා නික්ඛාමෙත්වා සූචිඝටිකං දත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "නික්ඛාමිතො භන්තෙ, සො පුග්ගලො මයා. පරිසුද්ධා පරිසා. උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං පාතිමොක්ඛං"ති. "අච්ඡරියං මොග්ගල්ලාන, අබ්භුතං මොග්ගල්ලාන, යාව බාහා ගහණාපි නාම සො මොඝපුරිසො ආගමෙස්සතී"ති.

4. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "න දානාහං භික්ඛවෙ, ඉතොපරං උපොසථං කරිස්සාමි පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තුම්හෙව දානි භික්ඛවෙ ඉතොපරං උපොසථං කරෙය්‍යාථ, පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං තථාගතො අපරිසුද්ධාය පරිසාය උපොසථං කරෙය්‍ය, පාතිමොක්ඛං උද්දිසෙය්‍ය."

5. අට්ඨිමෙ භික්ඛවෙ, මහාසමුද්දෙ අච්ඡරියා අබ්භුතා ධම්මා, යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති. කතමෙ අට්ඨ[1]

(1.) මහාසමුද්දො භික්ඛවෙ, අනුපුබ්බනින්නො, අනුපුබ්බපොණො, අනුපුබ්බපබ්භාරො, නායතකෙනෙව පපාතො. යං භික්ඛවෙ මහාසමුද්දො අනුපුබ්බනින්නො, අනුපුබ්බපොණො, අනුපුබ්බපබ්භාරො, නායතකෙනෙව පපාතො. අයං භික්ඛවෙ, මහාසමුද්දෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති

(2.) පුන චපරං භික්ඛවෙ, මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති. යං භික්ඛවෙ, මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති. අයම්පි භික්ඛවෙ මහාසමුද්දෙ දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

---

1. න දානාහං භික්ඛවෙ අජ්ජතග්ගෙ උපොසථං කරිස්සාමි පාතිමොක්ඛං උද්දිසිස්සාමීති, අට්ඨකඞ්ගුත්තර පහාරාදසුත්තං''.

2. එකල්හි 'අනඳයෙනි, පිරිස අපිරිසිදු යැ'යි භාග්‍යවතුන් වහන්සේ කවර පුද්ගලකු සඳහා මෙසේ වදාළ සේක් දැ?'යි මහමුගලන් තෙරණුවනට මේ සිත විය. ඉක්බිති මහමුගලන් තෙරණුවෝ එක් කෙනකුනුදු නොහැර සියලු ම භික්ෂුසඞ්ඝයා සිය සිතින් ඔවුන් සිත පිරිසිඳැ බැලූ සේක. පාපස්වභාවය ඇති, සැකයෙන් සිහි කටයුතු පැවැතුම් ඇති, වැසුණු කම් ඇති, අශ්‍රමණ වූ, ශ්‍රමණයෙමි යි ප්‍රතිඥා ඇති, බඹසර නැති, බඹසැරිමි යි පිළිත ඇති, ඇතුළත කුණු වූ, රාගාදි කෙලෙස් වැස්සෙන් තෙත් වූ, හටගත් කෙලෙස් කසළ ඇති, භික්සඟන මැද හුන් ඒ දුසිල් පුද්ගලා ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ දුටහ. දැක හුනස්නෙන් නැගිට ඒ පුගුලා වෙත වැඩියහ. වැඩ ඇවැත, නැඟිසිටුව, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි. තොපට භික්ෂූන් හා සහවාසයෙක් නැතැ යි වදාළහ. එකලැ එ පුගුල් නිහඬ වැ හුන්නේ ය. දෙවෙනි වර ද මහමුගලන් තෙරණුවෝ එ පුගුලාට 'ඇවැත, නැඟිසිටුව. භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි. තොපට භික්ෂූන් හා එක් වැ විසීමෙක් නැතැ'යි වදාළහ. දෙවෙනි වර ද එ පුගුලා නිහඬ වැ හුන්නේ ය. තෙවෙනි වර ද, මහමුගලන් තෙරණුවෝ 'ඇවැත, නැඟිසිටුව. භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි. තොපට භික්ෂූන් හා එක් වැ විසීමෙක් නැතැ''යි වදාළහ. තෙවෙනි වර ද ඒ පුගුලා නිහඬ වැ හුන්නේ ය.

3. එකල්හි මහමුගලන් තෙරණුවෝ ඒ පුගුලා අතැ ගෙන දොරොටුවෙන් පිටතට නික්මවා අගුල්හිද්ද ද මත්තෙහි සචිකාව ද ලා (මොනොවට දොර වසා) භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට, ''වහන්ස, ඒ පුගුලා මා විසින් නික්මවන ලද්දේ ය. පිරිස පිරිසිදු ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට පාමොක් උදෙසන සේක්වා''යි සැළ කළහ. ''ආශ්චර්යය, මුගලනෙනි, අද්භූත ය, මුගලනෙනි, අතින් ගන්නා තුරු ම ඒ හිස් පුරිස් තෙම ලැසි වූයේ යැ!'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක: ''මහණෙනි, දැන් මෙයින් මතු පොහෝ නො කරන්නෙමි. පාමොක් නො උදෙසන්නෙමි. මහණෙනි, දැන් මෙයින් මතු තෙපි ම පොහෝ කරවු. පාමොක් උදෙසවු. මහණෙනි, 'තථාගත තෙම අපිරිසිදු පිරිසෙහි පොහෝ කරන්නේ ය, පාමොක් උදෙසන්නේ ය' යන යමෙක් ඇද් ද, මෙය නොකරුණෙකි, නොවිය හැක්කෙකි.

5. මහණෙනි, යම් දෑ දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් මහමුහුදෙහි වූ මේ අසිරිමත් පුදුම අටෙකි. කවර අටෙක් ද? යත්:

(1.) මහණෙනි, මහමුහුද පිළිවෙළින් නිම්න ය. පිළිවෙළින් නැඹුරු ය. පිළිවෙළින් නිම්නයට බර වූයේ ය. එක එල්ලේ ම බෑවුම නො වේ. මහණෙනි, මහමුහුද පිළිවෙළින් නිම්න ය, පිළිවෙළින් නැඹුරු ය. පිළිවෙළින් නිම්නයට බර වූයේ ය, එක එල්ලේ ම බෑවුම නො වේ යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් ඒ පළමුවන ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

(2.) තව ද මහණෙනි, මහමුහුද ස්ථිත ස්වභාව ඇත්තේ වෙරළ ඉක්ම නො යෙයි. මහණෙනි, මහමුහුද ස්ථිත ස්වභාව ඇත්තේ වෙරළ ඉක්ම නොයේ යන යමෙක් ඇද්ද, මහණෙනි, මේ තෙම යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් ඒ දෙවෙනි ආශ්චර්ය අද්භූත ධර්මය යි.

(3.) පුන චපරං භික්ඛවෙ, මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති. යං හොති මහාසමුද්දෙ මතං කුණපං, තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති,[1] ථලං උස්සාදෙති[2]. යං භික්ඛවෙ මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති, යං හොති මහාසමුද්දෙ මතං කුණපං, තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති, ථලං උස්සාදෙති. අයම්පි භික්ඛවෙ, මහාසමුද්දෙ තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

(4.) පුන චපරං භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී. තා මහාසමුද්දං පත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. යං භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී. තා මහාසමුද්දං පත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. අයම්පි භික්ඛවෙ මහාසමුද්දෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

(5). පුන ච පරං භික්ඛවෙ, යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. යං භික්ඛවෙ, යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයම්පි භික්ඛවෙ, මහාසමුද්දෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතධම්මො,[3] යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

(6). පුන ච පරං භික්ඛවෙ, මහාසමුද්දො එකරසො ලොණරසො. යං භික්ඛවෙ, මහාසමුද්දො එකරසො ලොණරසො, අයම්පි භික්ඛවෙ, මහාසමුද්දෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

(7). පුනච පරං භික්ඛවෙ මහාසමුද්දො බහුරතනො, අනෙකරතනො. තත්‍රිමානි රතනානි. සෙය්‍යථීදං: මුත්තා, මණි, වෙළුරියො, සඞ්ඛො, සිලා, පවාළං, රජතං, ජාතරූපං, ලොහිතඞ්කො, මසාරගල්ලං. යං භික්ඛවෙ මහාසමුද්දො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි. සෙය්‍යථීදං: මුත්තා, මණි, වෙළුරියො, සඞ්ඛො, සිලා, පවාළං, රජතං, ජාතරූපං, ලොහිතඞ්කො, මසාරගල්ලං. අයම්පි භික්ඛවෙ මහාසමුද්දෙ සත්තමො අච්ඡරියො අබ්භුතධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

1. පාපෙති, සොසු වි. 2. උස්සාරෙති, සී. මු. 3 අබ්භුතො ධම්මො, සී.

(3.) තව ද මහණෙනි, මහමුහුද මළකුණු හා එක් වැ නො වසයි. මහ-මුහුදෙහි යම් මළකුණෙක් වේ නම්, එය වහා ම මුහුදුතෙරට පමුණුවයි, ගොඩට නගයි. මහණෙනි, මහමුහුද මළකුණු හා එක් වැ නො වසයි, මළකුණු ගොඩට නගයි යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ද අසුරයෝ යමක් දක දක මහමුහුදෙහි ඇලෙත් නම්, මහමුහුදෙහි ඒ තෙවෙනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(4.) තව ද මහණෙනි, ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී යන යම් මහා නදී කෙනෙක් වෙත් ද, ඔහු මහමුහුදට පැමිණියෝ පළමු නම් ගොත් හරිත්. මහ-මුහුදු යි ම ව්‍යවහාරයට යෙත්. මහණෙනි, ගඞ්ගා යමුනා...යම් නදී කෙනෙක් වෙත් ද, ඔහු මහ මුහුදු යි ම ව්‍යවහාරයට යන යමෙක් ඇද්ද, මෙය ද මහණෙනි, යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම්, ඒ සිවුවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(5.) තව ද මහණෙනි, ලොවැ යම් ගං හෝ කෙනෙක් මහමුහුදට ගලා බසිත් ද, අහසින් යම් වැසිදහර කෙනෙක් වැටෙත් ද, එයින් මහමුහුදේ අඩුබවෙක් හෝ පිරුණු බවෙක් හෝ නො පැණෙයි. මහණෙනි, යම් ගං හෝ කෙනෙක් ගලා බසිත් ද, අහසින් යම් වැසිදහර කෙනෙක් හෙත් ද, එයින් මහමුහුදේ අඩුබවෙක් හෝ පිරුණු බවෙක් නො පැණේ යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ද යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම්, ඒ මහමුහුදෙහි වූ පස්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(6.) තව ද මහණෙනි, මහමුහුද එක් රස ම ඇත්තේ ලුණුරස ඇත්තේ වේ. මහණෙනි, මහමුහුද එක් රස ම ඇත්තේ ලුණුරස ඇත්තේ වේ යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් මෙය ද මහමුහුදෙහි වූ ඒ සවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(7.) තව ද මහණෙනි, මහමුහුද බොහෝ රුවන් ඇත්තේ ය. නොයෙක් රුවන් ඇත්තේ ය. එහි මුතු මිණි වෙරළු සක් සිලා පබුළු රිදී රන් රත්මිණි මැසිරිගල් යන මේ රුවන්හු වෙත්. මහණෙනි, මහමුහුද බොහෝ රුවන් ඇත්තේ ය...මේ රුවන්හු වෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ද, යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම්, ඒ සත්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(8.) පුන චපරං භික්ඛවෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි, තිමිඞ්ගලො, තිමිරපිඞ්ගලො, අසුරා, නාගා, ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජනසතිකාපි අත්තභාවා, තියොජනසතිකාපි අත්තභාවා, චතුයොජනසතිකාපි අත්තභාවා, පඤ්චයොජනසතිකාපි අත්තභාවා. යං භික්ඛවෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි, තිමිඞ්ගලො, තිමිරපිඞ්ගලො, අසුරා, නාගා, ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජනසතිකාපි අත්තභාවා, තියොජනසතිකාපි අත්තභාවා, චතුයොජනසතිකාපි අත්තභාවා, පඤ්චයොජනසතිකාපි අත්තභාවා. අයම්පි භික්ඛවෙ, මහාසමුද්දෙ අට්ඨමො අච්ඡරියො අබ්භූතධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

ඉමෙ ඛො භික්ඛවෙ, මහාසමුද්දෙ අට්ඨ අච්ඡරියා අබ්භූතධම්මා[1] යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

6. එවමෙව ඛො භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භූතධම්මා[1] යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති. කතමෙ අට්ඨ?

(1.) සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො අනුපුබ්බනින්නො, අනුපුබ්බපොණො, අනුපුබ්බපබ්භාරො, නායතකෙනෙව පපාතො, එවමෙව ඛො භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපදා, නායතකෙනෙව අඤ්ඤාපටිවෙධො. යං භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපදා, නායතකෙනෙව අඤ්ඤාපටිවෙධො. අයං භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ පඨමො අච්ඡරියො අබ්භූතධම්මො,[2] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(2.) සෙය්‍යථාපි භික්ඛවෙ මහසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, එවමෙව ඛො භික්ඛවෙ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං, තං මම සාවකා ජීවිතහෙතු පි නාතික්කමන්ති. යං භික්ඛවෙ මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතු පි නාතික්කමන්ති. අයම්පි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ දුතියො අච්ඡරියො අබ්භූතධම්මො,[2] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(3.) සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති, යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති, ථලං උස්සාදෙති. එවමෙව ඛො භික්ඛවෙ යො සො පුග්ගලො දුස්සීලො පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො, අස්සමණො සමණපටිඤ්ඤො, අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො, අන්තොපූති අවස්සුතො කසම්බුජාතො, න තෙන සඞ්ඝො සංවසති. අථ ඛො නං ඛිප්පඤ්ඤෙව සන්නිපතිත්වා උක්ඛිපති.

---

1. අබ්භූතා ධම්මා, සී. 2. අබ්භූතො ධම්මො, සී.

(8.) තව ද මහණෙනි, මහමුහුද මහත් සත්ත්වයනට වාසස්ථානය වේ. එහි තිමි තිමිඞ්ගල තිමිරපිඞ්ගල අසුර නාග ගන්ධර්ව යන මේ සත්ත්වයෝ වෙති මහමුහුදෙහි යොදුන් සියක් පමණ වූ අත්බව් ඇත්තෝ ද, යොදුන් දෙසියක් පමණ අත්බව් ඇත්තෝ ද, යොදුන් තුන්සියක් පමණ අත්බව් ඇත්තෝ ද, යොදුන් සාරසියක් පමණ අත්බව් ඇත්තෝ ද, යොදුන් පන්සියක් පමණ අත්බව් ඇත්තෝ ද වෙත්. මහණෙනි, මහමුහුද මහත් සතුන්ගේ වාසස්ථානය වෙයි....එහි...යොදුන් පන්සියක් පමණ අත්බව් ඇත්තෝ ද වෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම්, මෙය ද මහමුහුදෙහි වූ ඒ අටවන ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

මහණෙනි, යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් මොහු ඒ ආශ්චර්ය අද්භූත ධර්ම අට ය.

6. මහණෙනි, එපරිද්දෙන් ම යම්ද දැක දැක මහණහු මේ සස්නෙහි ඇලෙත් ද, එසේ වූ ආශ්චර්ය අද්භූත ධර්මයෝ අට දෙනෙක් මෙ සස්නෙහි ඇත. කවර අට දෙනෙක් ද? යත්:

(1). මහණෙනි, මහමුහුද යම් සේ පිළිවෙළින් නිම්න වූයේ පිළිවෙළින් ගැඹුරු වූයේ, පිළිවෙළින් නිම්නයට බර වූයේ, එක එල්ලේ ම බෑවුම් නැත්තේ වේ ද, එසේ ම මහණෙනි, මේ සස්නෙහි අනුපූර්වශික්ෂා අනුපූර්වක්‍රියා අනුපූර්ව-ප්‍රතිපද වේ. පිළිවෙළ ඉක්මැ (ශීලසමාධිප්‍රඥ නො පුරා) එක්වන ම රහත්බව් පැමිණීම නො වේ. මහණෙනි, මේ සස්නෙහි අනුපූර්වශික්ෂා....වේ...එක් වන ම රහත්බව් පැමිණීම නො වේ යන යමෙක් ඇද්ද, මහණෙනි, මේ තෙම, යමක් දැක දැක මහණහු මෙ සස්නෙහි ඇලෙත් නම්, ඒ මෙ සස්නෙහි ඇති පළමු වන ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

(2). මහණෙනි, යම් සේ මහාසමුද්‍රය ස්ථිතස්වභාව ඇත්තේ වෙරළ ඉක් මැ නො යේ ද, එසේම මහණෙනි, මා විසින් සව්වනට යම් සිකපද-යෙක් පණවන ලද නම්, එය මා සව්වෝ (සෝවන් ආදි ආර්යශ්‍රාවකයෝ) ජීවිතහේතුයෙනුදු ඉක්මැ නො යෙත්. මහණෙනි, මා විසින් සව්වනට යම් සිකපදයෙක් පණවන ලද නම් එය මා සව්වෝ ජීවිතහේතුයෙනුදු ඉක්මැ නොයෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ද, යමක් දැක දැක මහණහු මෙ සස්නෙහි ඇලෙත් නම්, මෙ සස්නෙහි වූ ඒ දෙවෙනි ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

(3). මහණෙනි, යම් සේ මහමුහුද මළකුණු හා එක් වැ නො වෙසේ ද, මහමුහුදෙහි යම් මළ කුණෙක් වී නම් එය වහා ම මුහුදු තෙරට පමුණුවා ද, ගොඩට නඟා ද, එසේ ම මහණෙනි, දුශ්ශීල වූ පාපස්වභාව ඇති, අශුද්ධ වූ, සැකයෙන් සිහි කටයුතු පැවැතුම් ඇති, වැසුණු කර්ම ඇති, අශ්‍රමණ වැ ශ්‍රමණයෙමි යි පිළින කරන, අබ්‍රහ්මචාරී වැ බ්‍රහ්මචාරීමි යි පිළින කරන, ඇතුළත කුණු වූ, රාගාදියෙන් තෙත් වූ, හටගත් කෙලෙස් කසළ ඇති යම් පුඟුලෙක් වේ ද, සඞ්ඝයා ඔහු හා එක් වැ නො වෙසේ. වැලි බික්සඟන වහා ම රැස් වැ ඔහු නෙරපයි.

කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො, අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා, සඞ්ඝො ච තෙන. යං භික්ඛවෙ, යො සො පුග්ගලො දුස්සීලො, පාපධම්මො, අසුචිසඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො, අස්සමණො සමණපටිඤ්ඤො, අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො, අන්තොපූති, අවස්සුතො, කසම්බුජාතො, න තෙන සඞ්ඝො සංවසති. අථ ඛො නං ඛිප්පඤ්ඤෙව සන්නිපතිත්වා උක්ඛිපති, කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො, අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා, සඞ්ඝො ච තෙන. අයම්පි භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ තතියො අච්ඡරියො අබ්භුතධම්මො,[1] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(4). සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී. තා මහාසමුද්දං පත්වා[2] ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො මෙ වණ්ණා ඛත්තියා, බ්‍රාහ්මණා, වෙස්සා, සුද්දා. තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, සමණා සක්‍යපුත්තියාත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. යං භික්ඛවෙ චත්තාරො මෙ වණ්ණා ඛත්තියා, බ්‍රාහ්මණා, වෙස්සා. සුද්දා, තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, සමණා සක්‍යපුත්තියාත්වෙව සඞ්ඛං ගච්ඡන්ති අයම්පි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතධම්මො[1], යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(5.) සෙය්‍යථාපි භික්ඛවෙ යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. එව මෙව ඛො භික්ඛවෙ, බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. යං භික්ඛවෙ, බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති, න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයම්පි භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතධම්මො.[1] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(6.) සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො එකරසො ලොණරසො. එවමෙව ඛො භික්ඛවෙ, අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො. යං භික්ඛවෙ, අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො. අයම්පි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතධම්මො.[1] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

---

1. අබ්භුතො ධම්මො, සී. 2. පත්තා, ම.

හේ බික්සඟන මැද හුන්නේ වී නමුදු වැලි හේ සඞ්ඝයා කෙරෙන් ද සඞ්ඝයා ඔහු කෙරෙන් ද ඈත් ම යැ. මහණෙනි, දුශ්ශීල වූ පාපස්වභාව ඇති, අශුද්ධ වූ...හටගත් කෙලෙස් කසළ ඇති යම් පුගුලෙක් වේ ද...සඞ්ඝයා ඔහු කෙරෙන් ඈත් ම යැ. යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ද යමක් දැක දැක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් නම් ඒ තෙවෙනි ආශ්චර්ය අද්භුත ධර්මය වේ.

(4). මහණෙනි, ගඞ්ගා ... මහී යන යම් මහා නදී කෙනෙක් වෙත් ද, යම් සේ ඔහු මහමුහුදට පැමිණ පළමු නම්ගොත් හරිත් ද, මහමුහුද යැ යි ම ව්‍යවහාරයට යෙත් ද, එසේ ම මහණෙනි, කැත් බමුණු වෙළෙඳ සුදුරු යන මේ සතර කුලයෝ වෙත් ද, ඔහු ගිහිගෙත් නික්මැ තථාගත ප්‍රවිදිත ශාසනයෙහි පැවිදිවැ පළමු නම්ගොත් හරිත්, ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ ම යැ යි ව්‍යවහාරයට යෙත්. මහණෙනි, කැත් ... යන සතර කුලයෝ වෙත් ද, ඔහු ... පළමු නම් ගොත් හරිත් ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ යී ම ව්‍යවහාරයට යෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි මෙය ද, යමක් දැක දැක භික්ෂූහු මේ සස්නෙහි ඇලෙත් නම්, මෙ සස්නෙහි වූ ඒ සතර වන ආශ්චර්ය අද්භුත ධර්මය වේ.

(5). මහණෙනි, ලොවැ යම් ගං හෝ කෙනෙක් මහමුහුදට ගලා බසිත් ද, අහසින් යම් වැසි දහර කෙනෙක් වැටෙත් ද, එයින් මහමුහුදේ අඩුබවෙක් හෝ පිරුණු බවෙක් නො පැණේ ද, එසේ ම මහණෙනි, බොහෝ වූ ද භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නුමුදු එයින් නිර්වාණධාතුවෙහි අඩුබවෙක් හෝ පිරුණු බවෙක් නො පැණේ. මහණෙනි, බොහෝ වූ ද භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නමුදු එයින් නිර්වාණධාතුවෙහි අඩුබවෙක් හෝ පිරුණුබවෙක් යම් සේ නො පැණේ ද, මෙය ද මහණෙනි, යමක් දැක දැක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් නම්, ඒ පස්වන ආශ්චර්ය අද්භුත ධර්මය වේ.

(6). මහණෙනි, මහමුහුද යම් සේ එක ම රස ඇත්තේ, ලුණුරස ඇත්තේ වේ ද, එසේ ම මහණෙනි, මේ සස්න එක ම රස ඇත්තේ විමුක්තිරස ඇත්තේ වේ. මහණෙනි, මෙ සස්න එක ම රස ඇත්තේ විමුක්තිරස ඇත්තේ වේ යන යමෙක් ඇද්ද, මෙය ද මහණෙනි, යමක් දැක දැක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් නම් ඒ සවන ආශ්චර්ය අද්භුත ධර්මය වේ.

(7). සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි: සෙය්‍යථීදං? මුත්තා, මණි, වෙළුරියො සඞ්ඛො, සිලා, පවාළං, රජතං, ජාතරූපං, ලොහිතඞ්කො, මසාරගල්ලං. එවමෙව ඛො භික්ඛවෙ අයං ධම්මවිනයො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි: සෙය්‍යථීදං? චත්තාරි සතිපට්ඨානානි,[1] චත්තාරි සම්මප්පධානානි,[2] චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්තබොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, යං භික්ඛවෙ, අයං ධම්මවිනයො බහුරතනො, අනෙකරතනො තත්‍රිමානි රතනානි: සෙය්‍යථීදං? චත්තාරි සතිපට්ඨානානි, චත්තාරි සම්මප්පධානානි,[3] චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි. සත්තබොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. අයම්පි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ සත්තමො අච්ඡරියො අබ්භුතධම්මො[4], යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

(8). සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි, තිමිඞ්ගලො, තිමිරපිඞ්ගලො, අසුරා, නාගා, ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජනසතිකාපි අත්තභාවා, තියොජනසතිකාපි අත්තභාවා, චතුයොජනසතිකාපි අත්තභාවා, පඤ්චයොජනසතිකාපි අත්තභාවා. එවමෙව ඛො භික්ඛවෙ, අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: සොතාපන්නො, සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සකදාගාමී, සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමී, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අරහා, අරහත්තඵලසච්ඡිකිරියාය[5] පටිපන්නො. අයං භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතධම්මො,[4] යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

ඉමෙ ඛො භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භුතධම්මා.[6] යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තී''ති.

7. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

''ඡන්නමතිවස්සති[7] විවටං නාතිවස්සති,
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සතී''ති.

## 5. 6.

## සොණසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකච්චායනො අවන්තීසු** විහරති, **කුරරඝරෙ පවත්තෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන **සොණො** උපාසකො **කුටිකණ්ණො** ආයස්මතො මහාකච්චායනස්ස උපට්ඨාකො හොති. අථ ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ''යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.

1. චත්තාරො සතිපට්ඨානා, සබ්බත්ථ. 2. චත්තාරො සම්මප්පධානා, සබ්බත්ථ 3 චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා, සබ්බත්ථ. 4. අබ්භුතො ධම්මො, සී. 5. අරහත්තාය, ම. 6. අබ්භුතා ධම්මා, සී. 7. ඡන්නං අතිවස්සති, සී.

(7). මහණෙනි, මහමුහුද යම් සේ බොහෝ රුවන් ඇත්තේ ද, නොයෙක් රුවන් ඇත්තේ ද, එහි මුතු මිණි .... මැසිරිගල් යන මේ රුවන්හු වෙත් ද, එසේ ම මහණෙනි, මෙ සස්න බොහෝ රුවන් ඇත්තේ ය, නොයෙක් රුවන් ඇත්තේ ය. එහි සතර සිවටන්හු ය, සතර සම්‍යක් ප්‍රධාන ය, සතර ඉද්දිපා ය, පස් ඉඳුරෝ ය, පස් බල ය, සත් බොදඟහු ය, අරි අටඟි මඟ ය. යන මේ රුවන්හු වෙත්. මහණෙනි, මෙ සස්න බොහෝ රුවන් ඇත්තේ ය. ... එහි සතර සිවටන්හු ය ... අරි අටඟිමඟ ය යන මේ රුවන්හු වෙත් යන යමෙක් ඇද්ද, මෙය ද මහණෙනි, යමක් දක දක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් නම් ඒ මෙ සස්නැ සත්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

(8). මහණෙනි, මහමුහුද යම් සේ මහත් සත්ත්වයනට වාසස්ථාන වේ ද, යම් සේ එහි තිමි තිමිඞ්ගල ... ගන්ධබ්බ යන මේ සත්ත්වයෝ වෙත් ද, යම් සේ මහමුහුදෙහි සියක්යොදුන් අත්බව් ඇති සත්හු ද ... පන්සියක් යොදුන් අත්බව් ඇති සත්හු ද, මහණෙනි, එ පරිද්දෙන් ම මෙ සස්න මහත් සත්ත්වයන්ගේ වාසස්ථානය වේ. එහි සෝවන් ය, සෝවන්පල පසක් කිරීමට පිළිපන්නේ ය, සෙදගැමි ය, සෙදගැමිපල පසක් කිරීමට පිළිපන්නේ ය, අනැගැමි ය, අනැගැමි පල පසක් කිරීමට පිළිපන්නේ ය, රහත් ය, රහත්පල පසක් කිරීමට පිළිපන්නේ ය යන මේ මහත් සත්හු වෙති.

මෙය ද මහණෙනි, යමක් දක දක භික්ෂූහු මෙ සස්නැ ඇලෙත් නම් ඒ මෙ සස්නෙහි ඇති අටවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මය වේ.

මහණෙනි, යම් ද දක දක භික්ෂූහු මෙ සස්නැ ඇලෙත් ද, මහණෙනි, මේ වනාහි මෙ සස්නෙහි වූ ඒ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මයෝ අට දෙන වෙති යනු යි.

7. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"වැසුණ වරද ඉතා වසී. විවෘත වූයේ ඉතා නො වසී. එ හෙයින් වැසුණ වරද හෙළි කරන්නේ ය. මෙසේ එය ඉතා නො වසී."

## 5. 6.

## සෝණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි මහකසසින් තෙරණුවෝ අවන්තිරට කුරරඝර නුවර සමීපයෙහි පවත්ත නම් පව්වෙහි වැඩ වසන සේක. එ කල්හි සොණ කුටිකණ්ණ උපාසක තෙම මහකසසින් තෙරුන්ගේ උපස්ථායක වෙයි. එකලැ වනාහි එකලා වූ චිත්තවිවෙකයෙන් යුක්ත වූ සොණකුටිකණ්ණ උපාසකයාට, "ආර්‍ය්‍ය වූ මහ-කසසින් තෙරණුවෝ යම් යම් සේ දහම් දෙසත් ද, එසේ එසේ නුවණින් සලකා බලන මට ගිහි ගෙහි වසන මා විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට ඒකාන්තයෙන් පිරිසිදු කොට ශංඛලිඛිතයක් සේ කොට මේ බඹසර රක්නට නො හැකි වේ, මම් කෙහෙරවුළු බා කසාවත් හැඳ ගිහි ගෙන් නික්මැ සසුන් වදින්නෙම් නම් ඉතා යෙහෙකැ"යි මේ සිත විය.

2. අථ ඛො සොණො උපාසකො කුටිකණ්ණො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණො උපාසකො කුටිකණ්ණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. පබ්බාජෙතු මං භන්තෙ, අය්‍යො මහාකච්චායනො"ති.

3 එවං වුත්තෙ ආයස්මා මහාකච්චායනො සොණං උපාසකං කුටිකණ්ණං එතදවොච: "දුක්කරං ඛො සොණ, යාවජීවං එකභත්තං එකසෙය්‍යං බ්‍රහ්මචරියං, ඉඞ්ඝ ත්වං සොණ, තත්ථෙව අගාරිකභූතො සමානො බුද්ධානං සාසනං අනුයුඤ්ජ, කාලයුත්තං එකභත්තං එකසෙය්‍යං බ්‍රහ්මචරියං"ති. අථ ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස යො අහොසි පබ්බජ්ජාභිසඞ්ඛාරො සො පටිප්පස්සම්භි.

4. දුතියම්පි ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති. දුතියම්පි ඛො සොණො උපාසකො කුටිකණ්ණො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලී-ණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති. "පබ්බාජෙතු මං භන්තෙ, අය්‍යො මහාකච්චායනො"ති.

2. ඉක්බිත්තෙන් සොණ කුටිකණ්ණ උපාසක තෙම මහකසයින් තෙරුන් කරා එළැඹියේ ය. එළැඹ මහකසයින් තෙරුන් ආදරයෙන් වැඳ එකත්පසෙක හුන්නේ ය. එක් පසෙක හුන් සොණකුටිකණ්ණ උපාසක තෙම මහකසයින් තෙරුනට "වහන්ස, මෙහි හුදෙකලා ව චිත්තවිවෙකයෙන් යුක්ත වූ මට මේ සිත විය: "යම් යම් සේ ආයී මහකසයින් තෙරණුවෝ දහම් දෙසත් ද, එසේ එසේ නුවණින් සලකන මට 'මේ සසුන් බඹසර ගිහිගෙහි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට ශඞ්ඛලිඛිතය සේ කොට පුරන්නට පහසු නො වේ. මම් කෙහෙ රවුළු බා කසාවත් හැඳ ගිහි ගෙන් නික්මැ සසුන් වදින්නෙම් විම් නම් යෙහෙකැ'යි මේ සිත විය. වහන්ස, ආයී වූ කසයින් තෙරණුවෝ මා පැවිදි කෙරෙත්වා" යි මෙ බස් කී ය.

3. මෙසේ කී කල්හි මහකසයින් තෙරණුවෝ සොණකුටිකණ්ණ උපාසකයාට, "සොණයෙනි, දිවි ඇතිතාක් එක්බත, එකලා ශයනය, බඹසර යන මෙය දුෂ්කර ය. එ බැවින් සොණයෙනි, තෙපි එහි ගිහිව ම චාතුද්දසී පඤ්චදසී ආදි සුදුසු කාලය හා යෙදුණු එක්බත එකලා ශයනය බඹසර යන බුදුවරුන්ගේ ශාසනයෙහි යෙදෙවු"යි වදාළහ. එකල්හි සොණ කුටිකණ්ණ උපාසකයාට, පැවිද්දට යම් උත්සාහයෙක් වී නම් එය සංසිඳිණ.

4. දෙවෙනි වර ද, හුදෙකලා වූ චිත්තවිවෙකයෙහි යෙදුණු සොණ කුටිකණ්ණ උපාසකයාට "යම් යම් සේ ම ආයී වූ මහකසයින් තෙරණුවෝ දහම් දෙසත් ද, ඒ ඒ අයුරින් නුවණින් සලකා බලන මට "ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට, ශඞ්ඛ-ලිඛිතය සේ කොට මේ බඹසර පුරන්නට පහසු නො වේ. මම් කෙස්රවුළු බා කසාවත් හැඳ ගිහිගෙන් නික්මැ සසුන් වන්නෙම් වීම් නම් ඉතා යෙහෙකැ"යි මේ සිත විය. දෙවෙනි වර ද සොණ කුටිකණ්ණ උපාසක තෙම මහකසයින් තෙරුන් කරා එළැඹියේය. එළැඹ ඔබට, "වහන්ස, යම් යම් සේ ආයී මහකසයින් තෙරණුවෝ දහම් දෙසත් ද, එසේ එසේ නුවණින් සලකන මට මේ සසුන් බඹසර ගිහි ගෙහි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්ත-යෙන් පිරිසිදු කොට, ශඞ්ඛලිඛිතය සේ කොට පුරන්නට පහසු නො වේ. මම් කෙහෙ රවුළු බා දමා කසාවත් හැඳ පෙරෙව ගිහි ගෙන් නික්මැ සසුන් වදින්නෙම් නම් ඉතා යෙහෙකැ'යි මෙහි හුදෙකලා ව චිත්තවිවෙකයෙන් යුක්ත වූ මට මේ සිත විය. ආයී වූ මහකසයින් තෙරණුවෝ මා පැවිදි කෙරෙත්වා"යි කී ය.

5. දුතියම්පි ඛො ආයස්මා මහාකච්චායනො සොණං උපාසකං කුටිකණ්ණං එතදවොච: "දුක්කරං ඛො සොණ, යාවජීවං එකභත්තං එකසෙය්‍යං බ්‍රහ්මචරියං, ඉඞ්ඝ ත්වං සොණ, තත්ථෙව අගාරිකභූතො සමානො බුද්ධානං සාසනං අනුයුඤ්ජ, කාලයුත්තං එකභත්තං එකසෙය්‍යං බ්‍රහ්මචරියං"ති. දුතියම්පි ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස යො අහොසි පබ්බජ්ජාභිසඞ්ඛාරො සො පටිප්පස්සම්භි.

6. තතියම්පි ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

තතියම්පි ඛො සොණො උපාසකො කුටිකණ්ණො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණො උපාසකො කුටිකණ්ණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යථා යථා ඛො අය්‍යො මහාකච්චායනො ධම්මං දෙසෙති. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති. "පබ්බාජෙතු මං භන්තෙ, අය්‍යො මහාකච්චායනො"ති.

7. අථ ඛො ආයස්මා මහාකච්චායනො සොණං උපාසකං කුටිකණ්ණං පබ්බාජෙසි. තෙන ඛො පන සමයෙන අවන්තිදක්ඛිණාපථො අප්පභික්ඛුකො හොති. අථ ඛො ආයස්මා මහාකච්චායනො තිණ්ණං වස්සානං අච්චයෙන කිච්ඡෙන කසිරෙන තතො තතො දසවග්ගං භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා ආයස්මන්තං සොණං උපසම්පාදෙසි.

8. අථ ඛො ආයස්මතො සොණස්ස වස්සං වුත්ථස්ස රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "න ඛො මෙ සො භගවා සම්මුඛා දිට්ඨො. අපි ච සුතො යෙව මෙ සො භගවා ඊදිසො ච ඊදිසො චා'ති. සචෙ මං උපජ්ඣායො අනුජානෙය්‍ය, ගච්ඡෙය්‍යාහං තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

අථ ඛො ආයස්මා සොණො සායන්හසමයං පතිසල්ලාණා වුට්ඨිතො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සොණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි, "න ඛො මෙ සො භගවා සම්මුඛා දිට්ඨො. අපි ච සුතො යෙව මෙ සො භගවා ඊදිසො ච ඊදිසො චා'ති. සචෙ මං උපජ්ඣායො අනුජානෙය්‍ය, ගච්ඡෙය්‍යාහං තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධන්ති. "සාධු, සාධු, සොණ, ගච්ඡ ත්වං සොණ, තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධ"න්ති.

5. දෙවෙනි වර ද මහකසයින් තෙරණුවෝ සොණකුටිකණ්ණ උපාසකයාට, "සොණයෙනි, දිවි ඇති තාක් එක්බත, එකලා ශයනය, බඹසර යන මේ ද දුෂ්කර ය. එබැවින් සොණයෙනි, තෙපි එහි ගිහි ව ම සුදුසු කල් හා යෙදුණු එක්බත, එකලා ශයනය, බඹසර යන බුද්ධශාසනයෙහි යෙදෙව්"යි වදාළහ. දෙවෙනි වර ද සොණ කුටිකණ්ණ උපාසකයාට, යම් පැවිද්දෙහි උත්සාහයෙක් වී නම්, එය සංසිඳුණේ ය.

6. තෙවෙනි වර ද එකලා වූ චිත්තවිවේකයෙන් යුක්ත වූ සොණ උපාසකයාට "යම් යම් සේ ආර්ය මහකසයින් තෙරණුවෝ දහම් දෙසත් ද, එසේ එසේ නුවණින් සලකා බලන මට ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට ශඞ්ඛලිඛිතය සේ කොට බඹසර පුරන්නට පහසු නො වේ. මම් කෙහෙරවුළු බා කසා වත් හැඳ ගිහිගෙන් නික්මැ සසුන් වදනෙම් නම් ඉතා යෙහෙකැ"යි මේ සිත විය.

තෙවෙනි වර ද සොණ කුටිකණ්ණ උපාසක තෙම මහකසයින් තෙරුන් කරා එළැඹියේ ය. එළැඹ ඔබ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස්ව හුන් හෙතෙම ඒ තෙරුනට "වහන්ස, යම් යම් සේ ආර්ය මහකසයින් තෙරණුවෝ දහම් දෙසත් ද, එසේ එසේ නුවණින් සලකන මට මේ සසුන් බඹසර ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට, ශඞ්ඛලිඛිතය සේ කොට පුරන්නට පහසු නො වේ. මම් කෙහෙරවුළු බා දමා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම සසුන් වදින්නෙම් නම් ඉතා යෙහෙකැ'යි මෙහි හුදෙකලා වැ චිත්තවිවෙකයෙන් යුක්ත වූ මට මේ සිත විය. ආර්ය වූ මහකසයින් තෙරණුවෝ මා පැවිදි කෙරෙත්වා"යි මෙ බස් කී ය.

7. ඉක්බිත්තෙන් මහකසයින් තෙරණුවෝ සොණ කුටිකණ්ණ උවසහු පැවිදි කළහ. එ සමයෙහි වනාහි අවන්ති දක්ෂිණාපථය කිහිප නමක් පමණක් භික්ෂූන් ඇත්තේ වේ. එ කල්හි මහකසයින් තෙරණුවෝ තුන් වසක් ඇවෑමෙන් දුකින් ආයාසයෙන් ඒ ඒ තැනින් දස නමක් වූ බික්සඟ මුළුවක් රැස් කොට ආයුෂ්මත් සොණයන් උපසපන් කළහ.

8. ඉක්බිත්තෙන් වස් වැස නිමැ වූ, හුදෙකලා වූ චිත්තවිවෙකයෙන් හුන්නාවූ ආයුෂ්මත් සොණයනට "මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ ඇස් හමුයෙහි නො දක්නා ලද සේක් ම ය. එහෙත් ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු ද මෙබඳු ද වන සේකැ යි ඇසූ පමණ ම ය. ඉදින් උපාධ්‍යායයන් වහන්සේ මට අනුදන්නා සේක් නම්, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දක්නට මම් යන්නෙම් වා"යි චිත්ත සංකල්පනාවෙක් පහළ විය.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් සොණයෝ සවස් වේලෙහි චිත්තවිවෙකයෙන් නැඟී සිටියාහු මහකසයින් තෙරුන් කරා එළඹියහ. එළැඹ මහකසයින් තෙරුන් සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ම ආයුෂ්මත් සොණයෝ මහකසයින් තෙරුනට "වහන්ස, මෙහි එකලා වැ චිත්තවිවෙක යෙන් යුක්ත වූ මට මෙසේ චිත්ත සංකල්පනාවෙක් පහළ විය: "මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ ඇස්හමුවෙහි නො දක්නා ලද සේක. එතෙකුදු වුවත් ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු මෙබඳු වන සේකැ යි ඇසූ පමණ ම ය. ඉදින් උපාධ්‍යායයන් වහන්සේ මට අනුදන්නා සේක් නම් ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දක්නට මම් යන්නෙම් වා"යි මෙය සැළ කළහ. "සොණයෙනි, මැනැවි මැනැවි සොණයෙනි, ඒ භගවත් අර්හත් සම්‍යක්-සම්බුද්ධයන් වහන්සේ දක්නට තෙපි යවු.

9. දක්ඛිස්සසි ත්වං සොණ, තං භගවන්තං පාසාදිකං පසාදනීයං සන්තින්ද්‍රියං සන්තමානසං උත්තමසමථදමථමනුප්පත්තං දන්තං ගුත්තං යතින්ද්‍රියං නාගං. දිස්වාන මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරඤ්ච පුච්ඡ:[1] උපජ්ඣායො මෙ භන්තෙ, ආයස්මා මහාකච්චායනො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරඤ්ච පුච්ඡතී'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා සොණො ආයස්මතො මහාකච්චායනස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සොණො භගවන්තං එතදවොච: උපජ්ඣායො මෙ භන්තෙ, ආයස්මා මහාකච්චායනො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරඤ්ච පුච්ඡතී''ති. කච්චි භික්ඛු ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි'සි අප්පකිලමථෙන අද්ධානං ආගතො? න ච පිණ්ඩකෙන කිලන්තොසී?''ති. ඛමනීයං භගවා, යාපනීයං භගවා, අප්පකිලමථෙන චාහං භන්තෙ, අද්ධානං ආගතො න ච පිණ්ඩකෙන කිලන්තොම්හී''ති.

10. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ඉමස්සානන්ද ආගන්තුකස්ස භික්ඛුනො සෙනාසනං පඤ්ඤපෙහී'ති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: යස්ස ඛො මං භගවා ආණාපෙති, ඉමස්සා'නන්ද, ආගන්තුකස්ස භික්ඛුනො සෙනාසනං පඤ්ඤපෙහී'ති. ඉච්ඡති භගවා තෙන භික්ඛුනා සද්ධිං එකවිහාරෙ වත්ථුං. ඉච්ඡති භගවා ආයස්මතා සොණෙන සද්ධිං එකවිහාරෙ වත්ථුං, යස්මිං විහාරෙ භගවා විහරති තස්මිං විහාරෙ ආයස්මතො සොණස්ස සෙනාසනං පඤ්ඤපෙසි. අථ ඛො භගවා බහුදෙවරත්තිං අබ්භොකාසෙ නිසජ්ජාය වීතිනාමෙත්වා පාදෙ පක්ඛාලෙත්වා විහාරං පාවිසි. ආයස්මා'පි ඛො සොණො බහුදෙවරත්තිං අබ්භොකාසෙ නිසජ්ජාය වීතිනාමෙත්වා පාදෙ පක්ඛාලෙත්වා විහාරං පාවිසි. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය ආයස්මන්තං සොණං අජ්ඣෙසි, පටිභාතු තං භික්ඛු ධම්මො[2] භාසිතුන්ති. එවං භන්තෙ'ති ඛො ආයස්මා සොණො භගවතො පටිස්සුත්වා සොළස අට්ඨකවග්ගිකානි සබ්බානෙව සරෙන අභණි. අථ ඛො භගවා ආයස්මතො සොණස්ස සරභඤ්ඤපරියොසානෙ අබ්භනුමොදි: සාධු! සාධු! භික්ඛු, සුග්ගහිතානි භික්ඛු, සොළස අට්ඨකවග්ගිකානි සුමනසිකතානි සූපධාරිතානි, කල්‍යාණියාසි[3] වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා, කතිවස්සො'සි ත්වං භික්ඛූ?'ති. 'එකවස්සො අහං භගවා'ති. කිස්ස පන ත්වං භික්ඛු එවං චිරං අකාසී?''ති. චිරදිට්ඨො මෙ භන්තෙ කාමෙසු ආදීනවො, අපි ච සම්බාධො ඝරාවාසො බහුකිච්චො බහුකරණීයො'ති.

11. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"දිස්වා ආදීනවං ලොකෙ ඤත්වා ධම්මං නිරූපධිං,
අරියො න රමතී පාපෙ පාපෙ න රමතී සුචී''ති.

---

1 පුච්ඡාහීති, ම. 2. ධම්මං, සී. 3. කල්‍යාණියාච, ම.

9. සෝණයෙනි, තෙපි ප්‍රසාද එළවන්නාවූ. පැහැදීමට නිමිති වූ සංහුන් ඉඳුරන් ඇති, සංහුන් සිත් ඇති, උතුම් ශමථයට ද දමථයට ද පැමිණ සිටි, දාන්ත කායසමාචාර ඇති, රැකුණු වාක්සමාචාර ඇති, සංයත මනඉන්ද්‍රිය ඇති, නාග (ශ්‍රේෂ්ඨ) වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නහු ය. දක මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිස තමා වඳින්න ආබාධරහිත බව රොග රහිත බව, ලහුට්ඨාන කායබලය සැප විහරණය ද විචාරන්න. වහන්ස, මාගේ උපාධ්‍යාය වූ මහකසයින් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිස තමා වඳිති. ආබාධරහිත බව රොගරහිත බව...කායබලය, සැප විහරණය ද විචාරති''යි කියන්නැ යි මහකසයින් තෙරණුවෝ වදාළහ. 'එසේ ය, වහන්සැ'යි කියා ම ආයුෂ්මත් සෝණයෝ මහකසයින් තෙරුන්ගේ වචනය පිළිගෙන, සතුටු වැ හුනස්නෙන් නැඟී සිට, මහකසයින් තෙරුන් ආදරයෙන් වැඳ පැදකුණු කොට, සෙනසුන් සුරැකි කොට තබා, පාසිවුරු ගෙන සැවැත්නුවර බලා සැරිසරා වැඩියහ. පිළිවෙළින් සැරි සරනුවෝ, සැවැත්නුවර දෙව්රම් නම් අනේපිඬු අරමට භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නා වූම ආයුෂ්මත් සෝණයෝ, ''වහන්ස, මාගේ උපාධ්‍යාය වූ ආයුෂ්මත් මහකසයින්හු භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිස තමා වඳිති. ආබාධ නැති නියා, රොග නැති නියා ද කායබලය ද සුඛවිහරණය ද විචාරති''යි කීහ. ''මහණ, සැහිය හැකි ද? යැපියැ හැකි ද? මෙතෙක් දුර ආයාසයෙක් නැතිව ආයෙහි ද? අහරින් ක්ලාන්ත නො වූයෙහි දැ?''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක 'භාග්‍යවතුන් වහන්ස, ඉවැසියැ හැකි යි. භාග්‍යවතුන් වහන්ස, යැපියැ හැකි යි. වහන්ස, ක්ලාන්ත රහිත ව ද දික් මඟ ආමි. අහරින් ක්ලාන්ත නො වීමි'යි සෝණයෝ කීහ.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන් බණවා ''ආනන්දයෙනි, මේ ආගන්තුක භික්ෂු නමට සෙනසුන් පණවන්නැ'යි වදාළ සේක. එකල්හි ආනන්දතෙරුනට ''ආනන්දයෙනි මේ ආගන්තුක භික්ෂුනමට සෙනසුන් පණ-වන්නැ'යි භාග්‍යවතුන් වහන්සේ යමකු සඳහා මට අණවන සේක් ද, භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂු නම සමග එක් වෙහෙරෙහි වසන්නට කැමැති සේක. භාග්‍ය-වතුන් වහන්සේ ආයුෂ්මත් සෝණයන් හා එක් වෙහෙරෙහි ම වසන්නට කැමැති සේකැ''යි මේ සිත විය. ඉන් පසු ආනන්ද තෙරණුවෝ යම් වෙහෙරෙක භාග්‍යවතුන් වහන්සේ වසන සේක් ද, ඒ වෙහෙරෙහි ආයුෂ්මත් සෝණයනට සෙනසුන් පැණැවූහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලා එළිපහනෙහි හිඳීමෙන් කල් යවා, පා දෙව වෙහෙරට පිවිසි සේක. ආයුෂ්මත් සෝණයෝ ද රෑ බොහෝ වේලා එළිමහනැ හිඳීමෙන් කල් යවා පා දෙවා වෙහෙරට පිවිසියහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම්හි නැඟී සිට ආයුෂ්මත් සෝණයනට 'මහණ, දහමක් කියන්නට තොපට වැටැහේවා (දහමක් දෙසවු')යි වදාළ සේක. ''එසේ ය වහන්සැ' යි ම ආයුෂ්මත් සෝණයෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී (සූත්‍රනිපාතයෙහි) අෂ්ටකවර්ගයට අයත් සියලු ම සොළොස් සූත්‍ර සවරභණ්‍යයෙන් කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සෝණයන්ගේ සවරභණ්‍යාවසානයෙහි මැනැව, මැනැව, මහණ, අෂ්ටකවර්ගයට අයත් සොළොස් සූත්‍ර මොනොවට උගන්නා ලදි. මොනොවට මෙනෙහි කරන ලදි, අරුත් විසින් මොනොවට සලකා බලන ලදි. විමුක්ත වූ නිදෙස් වූ අදහස් කළ අරුත් හඟවනු සමත් වූ කලණ වචනයෙන් සමන්විතයෙහි ය. මහණ, තෙපි වස් කීයක් ඇත්තාව?''යි වදාළ සේක. වහන්ස, මම් එක්වස් ඇතියෙමි'යි සෝණයෝ කීහ. ''මහණ, තෝ කවර හෙයින් මෙසේ පැවිදි වන්නට බොහෝ කල් යැවීහි දැ''යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. ''වහන්ස, මා විසින් කාමයන්හි ආදීනව දක්නා ලද බොහෝ කල් විය. එහෙත් ගිහිගෙහි විසීම සම්බාධ ය. කෘත්‍යබහුල ය. කරණී බෙහෙව (එහෙයින් එයින් නික්මෙන්නට කල් ගත වී යැ'')යි සෝණයෝ කීහ.

11. ඒ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ උදන් ඇනූහ.

''ආර්ය තෙමේ සියලු සංස්කාර ලෝකයෙහි දොස් දැක, උපධිරහිත නිර්වාණ-ධර්මය දැන, ස්වල්ප වූ ද ලාමක දෑයෙහි නො ඇලේ. පිරිසිදු පුගුල් තෙමේ කිලිටි දෑයෙහි නො ඇලේ.''

5. 7.

## රෙවතසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **කඞ්ඛා-රෙවතො** භගවතො අවිදූරෙ නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අත්තනො[1] කඞ්ඛාවිතරණවිසුද්ධිං පච්චවෙක්ඛමානො. අද්දසා ඛො භගවා ආයස්මන්තං කඞ්ඛාරෙවතං අවිදූරෙ 'නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අත්තනො කඞ්ඛාවිතරණවිසුද්ධිං පච්චවෙක්ඛ-මානං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යා කාචි කඞ්ඛා ඉධ වා හුරං වා සකවෙදියා වා පරවෙදියා වා,
ඣායිනො[2] තා පජහන්ති සබ්බා ආතාපිනො බ්‍රහ්මචරියං චරන්තා"ති.

5. 8.

## ආනන්දසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති, **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **ආනන්දො** තදහු-පොසථෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො **දෙවදත්තො** ආයස්මන්තං ආනන්දං රාජගහෙ පිණ්ඩාය චරන්තං, දිස්වාන යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: අජ්ජතග්ගෙ දානාහං ආවුසො ආනන්ද, අඤ්ඤත්‍රෙව භගවතා අඤ්ඤත්‍ර භික්ඛුසඞ්ඝා උපොසථං කරිස්සාමි සඞ්ඝකම්මානි වා'ති. අථ ඛො ආයස්මා ආනන්දො රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසිං. අද්දසා ඛො මං භන්තෙ දෙවදත්තො රාජගහෙ පිණ්ඩාය චරන්තං. දිස්වාන යෙනාහං තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා මං එතදවොච: 'අජ්ජතග්ගෙ දානාහං ආවුසො ආනන්ද, අඤ්ඤත්‍රෙව භගවතා අඤ්ඤත්‍ර භික්ඛුසඞ්ඝා උපොසථං කරිස්සාමි සඞ්ඝ-කම්මානි වා'ති. අජ්ජ භන්තෙ දෙවදත්තො සඞ්ඝං භින්දිස්සති උපොසථඤ්ච කරිස්සති සඞ්ඝකම්මානි වා'ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සුකරං සාධුනා සාධු සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං පාපමරියෙහි දුක්කරං"ති.

---

1. අත්තනො ච, ම. 2. යෙ ඣායිනො, ම.

5. 7.

## රේවත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ අනේපිඩු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි **කඞ්ඛාරේවත** තෙරණුවෝ පලක් බැඳ කය ඍජු කොට පිහිටුවා තමන්ගේ කාඞ්ක්‍ෂාවිතරණවිශුද්ධිය නුවණින් බලනුවෝ භාග්‍යවතුන්ට නොදුරෙහි හුන්නාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය ඍජු කොට පිහිටුවා තමන්ගේ කාඞ්ක්‍ෂාවිතරණවිශුද්ධිය නුවණින් බලමින් නොදුරෙහි හුන් කඞ්ඛාරේවත තෙරුන් දුටු සේක.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"මේ අත්බව්හි හෝ අතීතානාගත අත්බව්හි, සිය අත්බව් අරමුණු කොට පවත්නා හෝ මෙරමා අත්බව් අරමුණු කොට පවත්නා හෝ යම් සැකයෙක් වේ ද, ඒ සියල්ල කෙලෙස් තවන වැර ඇති, බඹසර සරන්නා වූ ධ්‍යානයෙහි ඇලුණාහු දුරු ලති."

5. 8.

## ආනන්ද සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර කලන්දකනිවාප නම් වූ **වෙළුවනයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි **ආනන්ද** තෙරණුවෝ පොහොලත් එදින පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන රජගහ නුවරට පිඬු පිණිස පිවිසියහ. **දෙව්දත්** තෙර රජගහ නුවරැ පිඬු පිණිස හැසිරෙන අනඳ තෙරුන් දිටී. දැක, අනඳ තෙරුන් වෙත එළැඹියේ ය. එළැඹැ අනඳ තෙරැනට 'ඇවැත් අනඳය, අදින් ඉදිරියට මම් භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන් ව ම, භික්‍ෂුසඞ්ඝයාගෙන් වෙන් ව ම පොහො ද සඞ්ඝකම් ද කරන්නෙමි'යි කී ය. එකල්හි අනඳ තෙරණුවෝ රජගහ නුවරැ පිඬු පිණිස හැසිරැ බතින් පසු, පිණ්ඩපාතයෙන් පෙරලා ආයේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියෝ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නෝ ය. එක් පසෙක හුන්නාවූ ම අනඳ තෙරණුවෝ 'වහන්ස, මම් පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන මෙහි රජගහ නුවරට පිඬු පිණිස පිවිසියෙමි. වහන්ස, රජගහ නුවර පිඬු පිණිස හැසිරෙන මා දෙව්දත්තෙර දිටී ය. දැක මා වෙත ආයේ ය. අවුත් මට "ඇවැත් අනඳ ය, අදින් ඉදිරියට මම් භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන් ව ම, භික්‍ෂුසඞ්ඝයාගෙන් වෙන් ව ම, පොහෝ කරන්නෙමි, සඞ්ඝකම් ද කරන්නෙමි'යි මට මෙය කී ය. වහන්ස, අද දෙව්දත් තෙම සඞ්ඝයා දෙකඩකට බිඳින්නේ ය, වෙන් ව ම පොහෝ ද සඞ්ඝකම් ද කරන්නේ යැ"යි සැල කළහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන, එ වේලෙහි මේ උදන් ඇනූහ:

"සත්පුරුෂයා විසින් හොඳ දැය සුව සේ කට හැකි ය. පවිටහු විසින් හොඳ දැය කරනු නො හැක්ක. පවිටා විසින් පව සුව සේ කට හැකි ය. ආර්‍ය්‍යයන් විසින් පව කරනු නො හැක්ක."

## 5. 9.

### සද්ධායමානසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසලෙසු** චාරිකා චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන සම්බහුලා මාණවකා භගවතො අවිදූරෙ සද්ධායමානරූපා[1] අතික්කමන්ති. අද්දසා ඛො භගවා සම්බහුලෙ මාණවකෙ අවිදූරෙ සද්ධායමානරූපෙ අතික්කමන්තෙ.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"පරිමුට්ඨා පණ්ඩිතාභාසා වාචාගොචරභාණිනො,
යාවිච්ඡන්ති මුඛායාමං යෙන නීතා න තං විදූ"ති.

## 5. 10.

### පන්ථකසුත්තං.

1: එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **චූලපන්ථකො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අද්දසා ඛො භගවා ආයස්මන්තං චූලපන්ථකං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"ඨිතෙන කායෙන ඨිතෙන චෙතසා
තිට්ඨං නිසින්නො උද වා සයානො,
එවං[2] සතිං භික්ඛු අධිට්ඨහානො,
ලභෙථ පුබ්බාපරියං විසෙසං.

ලද්ධාන පුබ්බාපරියං විසෙසං
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ"ති.

**සොණවග්ගො පඤ්චමො.**

**තස්සුද්දානං:**

රාජා අප්පායුකා කුට්ඨී කුමාරකා ච උපොසථො
සොණො ච රෙවතො භෙදො සද්ධාය පන්ථකෙන චාති.

---

1. පද්ධායමානරූපා, ම.

## 5. 9.

## සද්ධායමාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසමූහයක් හා කොසොල් රටැ සැරි සරන සේක. එ සමයෙහි වනාහි බොහෝ (බමුණු) තරුණයෝ මෙරමාට හෙලා තලා බස් දෙඩන්නාහු භාග්‍යවතුන් වහන්සේට නොදුරු තන්හි ඉක්මැ යෙත්. භාග්‍යවතුන් වහන්සේ එසේ අනුනට හෙලා තලා බස් දෙඩමින් යන ඒ බමුණු තරුණයන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන එ වේලෙහි මේ උදන් ඇනූහ:

"මුළා සිහි ඇති, පණ්ඩිතප්‍රතිරූපක වූ, මුඛාරූඪ වූවක් ම කියන සුලු, යම් පමණට මුව ඇරීම කැමැති ද, එ පමණ ම කියන්නාවූ, මුළාසිහි ඇති බව් ආදි යමෙකින් මෙහෙයන ලද්දහු 'අපි මේසේ නො සුදුසු බසක් ම කියමු'යි නො දනිත්."

## 5. 10.

## පන්ථක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත් නුවර දෙව්රම්** නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **චූලපන්ථක** තෙරණුවෝ පලක් බැඳ, කය ඍජු කොට පිහිටුවා, සිහිය අරමුණෙව් යොමු කොට එළවා, භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි හුන්නාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය ඍජු කොට පිහිටුවා සිහි අරමුණට යොමු කොට තබා නොදුරෙහි හුන් චූලපන්ථක තෙරුන් දුටු සේක.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන, එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

'ස්ථාවර සිටි කයින්, සමාධිගත වැ සිටි සිතින්, සිටින්නේ හෝ හිඳින්නේ හෝ වැද හෝනේ මේ සිහිය ඉටන (මේ එළැඹ සිටි සිහියෙහි පිහිටා සිටුනා) මහණ තෙමේ (ශමථ විදර්ශනා වශයෙන්) පෙර පසු පවත්නා භාවනා විශේෂය ලබන්නේ ය. පෙර පසු විසින් පැවැති භාවනා මඟින් ලත් විශේෂ ධර්මය (රහත් බව) ලැබ මෘත්‍යුරාජයාගේ (මරණයාගේ) අදර්ශනයට (මරහුට ගොදුරු නොවන තැනට) යන්නේ ය."

## පස්වන සොණවග්ගය යි.

එහි **උද්දානය**:

රාජ, අප්පායුක, කුට්ඨි, කුමාරක, උපෝසථ, සොණ, රේවත,
නන්ද, සද්ධ, පන්ථක යනු මෙහි සූත්‍රයෝ ය.

# ජච්චන්ධවග්ගො ඡට්ඨො.

## 6. 1.

### ආයුසංඛාරවොස්සජ්ජනසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති, මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ගණ්හාහි ආනන්ද, නිසීදනං. යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමිස්සාම[1] දිවාවිහාරායා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිසීදනමාදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. අථ ඛො භගවා යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො[2] භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං. යස්ස කස්සචි ආනන්ද, චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො[3] කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද, චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. ආකඞ්ඛමානො ආනන්ද, තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි: තිට්ඨතු භන්තෙ, භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'රමණීයා -පෙ- තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො ආයස්මා ආනන්දො -පෙ- යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: රමණීයා -පෙ- තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො ආයස්මා ආනන්දො -පෙ- යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

2. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ගච්ඡ ත්වං ආනන්ද, යස්'දානි කාලං මඤ්ඤසී'ති. එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි:

---

1 ආයස්මා පි ඛො ආනන්දො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, මහාපරිනිබ්බාන සුත්ත, ම. 2. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං, තත්‍රෙව. 3. ආකඞ්ඛමානො ආනන්ද, ම.

# සවන ජාත්‍යන්ධවර්ගය.

## 6. 1.

### ආයුසංඛාරවොස්සජන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර මහවනයෙහි** කූටාගාරශාලා විහාරයෙහි වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන විසල්පුරට පිඬු පිණිස පිවිසි සේක. විසල්පුර පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩි සේක්, **අනඳ** තෙරුන් බණවා, අනඳයෙනි, හිඳිනා ඇතිරිය ගනුව. දිවාවිහරණය පිණිස **චාපාල** චෛත්‍යය වෙත යන්නමු'යි වදාළ සේක. 'එසේ ය වහන්සැ'යි කියා ම අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, හිඳිනා ඇතිරිය ගෙන, භාග්‍යවතුන් පසුපසින් වැඩියහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ චාපාලචෛත්‍යය කරා එළැඹි සේක. එළැඹ, **පණවන** ලද අස්නෙහි වැඩ හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ ම, 'අනඳයෙනි, විසල්පුරය සිත්කලු ය, **උදේන** චෛත්‍යය සිත්කලු ය, **ගෝතමක** චෛත්‍යය සිත්කලු ය, **සත්තම්බ** චෛත්‍යය සිත්කලු ය, **බහුපුත්‍ර** චෛත්‍යය සිත්කලු ය, **සාරන්දද** චෛත්‍යය සිත්කලු ය, **චාපාල** චෛත්‍යය සිත්කලු ය. ආනන්දය, යම් කිසිවකු විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දාහු නම්, බහුල වශයෙන් කරන ලද්දාහු නම්, යුක්තයානයක් මෙන් කරන ලද්දාහු නම්, පිහිටන තැනක් මෙන් කරන ලද්දාහු නම්, සිද්ධ කරන ලද්දාහු නම්, පුරුදු කරන ලද්දාහු නම්, මොනොවට නිපදවන ලද්දාහු නම්, හෙ තෙම කැමැත්තේ නම්, හෙ තෙම ආයුෂ්කල්පයක් (**ඒ කාලයෙහි මිනිසුන්ගේ සම්පූර්ණ ආයුෂ-ප්‍රමාණ කාලයක්**) හෝ එයට වැඩියක් කල් සිටිය හැකි වන්නේ ය. අනඳ-යෙනි, තථාගතයන් විසින් සතර ඍද්ධිපාදයෝ භාවිතයහ, බහුලීකෘතයහ, යානීකෘතයහ, වාස්තු කෘතයහ, අනුෂ්ඨිතයහ, පරිචිතයහ, සුසමාරබ්ධයහ. අනඳයෙනි, තථාගතයෝ කැමැත්තෝ නම්, ආයුෂ්කල්පයක් හෝ එයට වැඩි කලක් සිටිය හැක්කාහුයැ'' යි වදාළ සේක. මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් දැඩිවූ සංඥා ඉපැදවීම කරනු ලබන කල්හි, ඖදාරික අවභාසය කරනු ලබන කල්හි, ආනන්ද තෙරණුවෝ එය දැනැ ගන්නට නොහැකි වූහ. මරහු විසින් මඩනාලද සිතැත්තක්හු සේ,, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා සඳහා, දෙව් මිනිස්නට යහපත පිණිස, හිත පිණිස, සුව පිණිස කල්පයක් හෝ කල්පය කට වැඩියක් කල් වැඩ සිටිත සේක්වා'යි, සුගතයන් වහන්සේ කල්පයක් හෝ කල්පයකට වැඩියක් කල් වැඩ සිටිත සේක්වා' යි භාග්‍යවතුන් වහන්සේ නො යැද්දහ.

දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා. "...සිත්කලු ය...තථාගතයෝ කැමැත්තාහු නම් කල්පයක් හෝ කල්පයකට වැඩි කලක් හෝ සිටිය හැක්කාහ''යි වදාළ සේක. තෙවෙනි වර ද භාග්‍ය-වතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, ''...සිත්කලු ය...තථාගතයෝ කැමැත්තාහු නම්,' කල්පයක් හෝ කල්පයකට වැඩි කලක් හෝ සිටිය හෙන්නාහ''යි වදාළ සේක. මෙසේත් අනඳ තෙරණුවෝ...මරහු විසින් මඩනා ලද සිතැත්තක්හු සේ...නො යැදූහ.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් බණවා, "අනඳයෙනි, යම් දිවාවිහරණයකට කලැ යි සිතවු ද එයට යවු'' යැ''යි වදාළ සේක. 'එසේ ය වහන්සැ 'යි කියා ම අනඳ තෙරණුවෝ, භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, හුනස්නෙන් නැඟී සිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, පැදකුණු කොට, නොදුරෙහි එක්තරා රුක්මුලෙක හිඳ ගත්හ.

3. අථ ඛො මාරො පාපිමා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මාරො පාපිමා භගවන්තං එතදවොච: 'පරිනිබ්බාතු[1] භන්තෙ, භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො' දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති, වියත්තා විනීතා විසාරදා යොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං[2] ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තී'ති.

සන්ති ඛො පන භන්තෙ එතරහි භික්ඛූ භගවතො සාවකා වියත්තා විනීතා විසාරදා යොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීං කරොන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු[3] භන්තෙ, භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ, භගවතො.

4. භාසිතා ඛො පනෙසා භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි, යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා -පෙ- අනුධම්මචාරිනියො -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තී'ති. සන්ති ඛො පන භන්තෙ, එතරහි භික්ඛුනියො භගවතො සාවිකා වියත්තා -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු -පෙ- වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි, යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තී'ති. සන්ති ඛො පන භන්තෙ, එතරහි උපාසකා භගවතො සාවකා වියත්තා -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු -පෙ-.

5. භාසිතා ඛො පනෙසා භගවතො වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි, යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා -පෙ- අනුධම්මචාරිනියො -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තී'ති. සන්ති ඛො පන භන්තෙ, එතරහි උපාසිකා භගවතො සාවිකා වියත්තා -පෙ- අනුධම්මචාරිනියො -පෙ- සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු -පෙ-.

1. පරිනිබ්බාතුදානි, සබ්බත්ථ 2. යෙ සකං, ම. 3. පරිනිබ්බාතු දානි, සබ්බත්ථ.

3. එකල්හි පවිටු මර අනඳ තෙරුන් නික්මැ වැඩි නොබෝ වේලායෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ එක් පසෙක සිටියේ ය. එක් පසෙක සිටියා වූ ම පවිටු මර භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය: "වහන්ස, භගවත්හු පිරිනිවෙත්වා, සුගතයෝ පිරිනිවෙත්වා දැන් භගවත්තට පිරිනිවෙන්නට කල් ය. වහන්ස, "යම් තාක් කල් මේ සවු මහණහු ව්‍යක්ත ද විනීත ද විශාරද බවට පැමිණියෝ ද යොගක්ෂෙම ද බහුශ්‍රැත ද ධර්මධර ද ධර්මානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුරූප-ධර්මයෙහි හැසිරෙන සුලු ද වූවෝ සිය ආචාර්‍ය්‍යවාදය ඉගෙන උගන්වන්නාහු ද, කියවන්නාහු ද, පවසන්නාහු ද, පිහිටුවන්නාහු ද, හෙළි කරන්නාහු ද, බෙදා දක්වන්නාහු ද, ප්‍රකට කරන්නාහු ද, උපන් පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට නිගහා නෛර්‍ය්‍යාණික කොට දහම් දෙසන්නාහු ද එතෙක් නො ම පිරිනිවෙන්නෙමි"යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ම ය.

4. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ භික්ෂූහු ව්‍යක්තයෝ විනීතයෝ විශාරදයෝ යොගක්ෂෙමයෝ...බහුශ්‍රැතයෝ ධර්මධරයෝ ධර්මානු-ධර්මප්‍රතිපන්නයෝ සම්‍යක්ප්‍රතිපන්නයෝ අනුධර්මචාරීහු ඇත: ඔහු සිය ආචාර්‍ය්‍යවාදය ඉගෙන උගන්වත්, කියවත්. දෙසත්, පිහිටුවත්, හෙළි කෙරෙත්, බෙදා දක්වත්, ප්‍රකට කෙරෙත්, උපන් පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට නිගහා නෛර්‍ය්‍යාණික වන තෙක් කොට දහම් දෙසත්· වහන්ස, භගවත්හු දැන් පිරිනිවෙත්වා. සුගතයෝ පිරිනිවෙත්වා. වහන්ස, දැන් භගවත්නට පිරිනිවෙන්නට කල් ය. වහන්ස, 'යම් තාක් කල් මාගේ ශ්‍රාවක මෙහෙණහු ව්‍යක්ත ද... අනුධර්මචාරිණීහු නොවන්නාහු ද නෛර්‍ය්‍යා-ණික කොට දහම් දෙසන්නාහු ද ඒතාක් නොපිරිනිවෙන්නෙමැ යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. වහන්ස, දැන් භාග්‍යවතුන්ගේ ව්‍යක්ත වූ මෙහෙණහු දැන් ඇත. ඔහු නෛර්‍ය්‍යාණික කොට දහම් දෙසන්නාහ. වහන්ස, භගවත්හු පිරිනිවෙත්වා...භාග්‍යවතුන් විසින් 'යම්තාක් කල් මාගේ ශ්‍රාවක වූ උපාසකයෝ ව්‍යක්තත්...නොවන්නාහු ද... නෛර්‍ය්‍යාණික කොට දහම් දෙසනු හැකි නො වන්නාහු ද, පවිට ඒ තාක් කල් නො පිරිනිවෙන්නෙමි යි මෙ වචනය කියන ලද්දේ ය. වහන්ස,...පිරි-නිවෙත්වා...වහන්ස, දැන් භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූ උපාසකයෝ ව්‍යක්ත ද ...වෙත්. නෛර්‍ය්‍යාණික කොට දහම් දෙසත්...පිරිනිවෙත්වා...

5. භගවතුන් විසින් යම්තාක් කල් මාගේ ශ්‍රාවිකා වූ උපාසිකාවෝ ව්‍යක්ත ද ...නොවන්නාහු ද...අනුධර්මචාරිණීහු නොවන්නාහු ද...ධර්මය නෛර්‍ය්‍යාණික කොට නො දෙසන්නාහු ද ඒතාක් නොපිරිනිවෙන්නෙමි'යි මේ වචනය වදාරන ලද්දේ ය. වහන්ස, දැන් භාග්‍යවතුන්ගේ සවු වූ උපාසිකාවෝ ව්‍යක්ත ද... අනුධර්මචාරිණීහු ද වෙත්...නෛර්‍ය්‍යාණික කොට දහම් දෙසන්නාහ. භගවත්හු දැන් පිරිනිවෙත්වා...

6. භාසිතා ඛො පනෙසා භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි, යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිත'න්ති. එතරහි ඛො පන භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං. පරිනිබ්බාතු'දානි භන්තෙ, භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො"ති.

එවං වුත්තෙ භගවා මාරං පාපිමන්තං එතදවොච: අප්පොස්සුක්කො ත්වං පාපිම, හොහි. න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී'ති. අථ ඛො භගවා **චාපාලෙ චෙතියෙ** සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජි. ඔස්සට්ඨෙ ච භගවතා ආයුසඞ්ඛාරෙ මහාභූමිචාලො අහොසි, භිංසනකො ලොමහංසො. දෙවදුන්දුභියො ච ඵලිංසු.

7. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"තුලමතුලඤ්ච සම්භවං භවසඞ්ඛාරමවස්සජි[1] මුනි,
අජ්ඣත්තරතො සමාහිතො අභින්දි කවචමිවත්තසම්භවං"ති.[2]

## 6. 2

## ජටිලසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ**. තෙන ඛො පන සමයෙන භගවා සායන්හසමයං පටිසල්ලාණා වුට්ඨිතො බහිද්වාරකොට්ඨකෙ නිසින්නො හොති.

අථ ඛො **රාජා පසෙනදි** කොසලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. තෙන ඛො පන සමයෙන සත්ත ච ජටිලා, සත්ත ච නිගණ්ඨා, සත්ත ච අචෙලකා, සත්ත ච එකසාටකා, සත්ත ච පරිබ්බාජකා, පරූළ්හකච්ඡනඛලොමා ඛාරිවිවිධමාදාය භගවතො අවිදූරෙ අතික්කමන්ති.

---

1. භවසංඛාරමොස්සජි, සී.
2. තුල්‍යමතුල්‍යං ච සම්භවං භවසංස්කාරමපොත්සෘජන්මුනිඃ
අධ්‍යාත්මරතඃ සමාහිතො හ්‍යභිනත්කොශමිවාණ්ඩසම්භවඃ. (දිව්‍යාවදාන. 17·1)

6. "පවිට යම් තාක් කල් මාගේ මේ ශාසනය (ධ්‍යානෝත්පාද විසින්) සමෘද්ධ ද, (අභිඥාසම්පත්ති විසින්) සඵිත ද, (ඒ ඒ දෙසැ පිහිටීම් විසින්) පැතුරුණෝක් ද (බොහෝ දෙනා සත්‍යාවබෝධ කිරීම් විසින්) බොහෝ දෙනා අතර ප්‍රකට ද නුවණැති දෙව්මිනිසුන් හැම දෙනා විසින් මොනොවට ප්‍රකාශිත ද නො වේ නම් ඒතාක් මම් නොපිරිනිවෙන්නෙමි"යි භාග්‍යවතුන් විසින් මේ වචන කියන ලද ම ය. වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන්ගේ ශාසනය සමෘද්ධ ද පැතුරුණෝක් ද බොහෝ දෙනා අතර ප්‍රකට ද දෙව්මිනිසුන් හැම දෙනා විසින් සුප්‍රකාශිත ද වේ. වහන්ස, දැන් භාග්‍යවත්හු පිරිනිවෙත්වා. සුගතයෝ පිරිනිවෙත්වා. වහන්ස, දැන් භාග්‍යවත්නට පිරිනිවෙන්නට කල් ය" යනු යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ පවිටු මරහට "පවිට, තෝ නිරුත්සුක වව. නොබෝ කලෙකින් තථාගතයන්ගේ පිරිනිවන වන්නේ ය. මෙයින් තුන් මසක් ඇවෑමෙන් තථාගත තෙම පිරිනිවෙන්නේයැ"යි වදාළ සේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ **චාපාල චෛත්‍යයේ දී** එළැඹැ සිටි සිහි ඇත්තාහු නුවණින් පිරිසිඳැ දන්නාහු ආයුසංසකාරය හළ සේක. (ඒ තෙමස **පමණක්** සමවත් සමවදිමින් කය රැකි උන්වහන්සේ එයින් මතු කය රැකුම්වස් සමවත් නොසමවදින්නෙමියි අදහස් කළ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුස්සංසකාරය හළ කල්හි ම බිහිසුණු ලොමුදහ ගන්වන මහද්භූමිකම්පනයෙක් විය. දෙව්බෙර නද දුන්හ. (ක්‍ෂණික වැස්සෙක් වට)

7. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ:

"පුනර්භවය සකස් කරන, භවෝත්පත්තියට කාරණ වූ කාමාවචර රූපාවචර කර්ම ද අරූපාවචර කර්ම ද බුද්ධමුනි තෙමේ හළේ ය. නිජකාධ්‍යාත්මයෙහි ඇලුණේ (හෙවත් උපචාරාර්පණාසමාධි විසින්) සමාහිත වූයේ තමා කෙරෙහි වූ කෙලෙස් කවචයක් (සන්නාහයක්) මෙන් බිඳැ දැමී ය. නොහොත් පස්කඳ අනිසැ යි නිවන නිත්‍ය යැ යි ආදීන් තුලනය (තීරණය) කරනුයේ, බුද්ධමුනි තෙමේ භවගාමී කර්මයන් (කර්මක්‍ෂයකර) ආර්යමාර්ගයෙන් හළේ ය. කෙසේ ද? විවසුන් විසින් සිය පස්කඳෙහි ඇලුණේ ශමථ විසින් සමාහිත වූයේ, තමා කෙරෙහි වූ කෙලෙස් නැමැති කවචය බෝමුලැදී ම හළ භවසංසකාර ඇත්තේ, සමාපත්ති බලයෙන් රැඳවූ අත්බව මෙයින් මතු එයට නො සමවදිමියි ආයුස්සංසකාරය හළේ ය."

## 6. 2.

## ජටිල සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** මෘගාරිමාතෘප්‍රාසාද නම් වූ **පූර්වාරාමයෙහි** වැඩ වසන සේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ සවස්වේලෙහි චිත්තවිවෙකයෙන් නැගී සිටි සේක්, ප්‍රාසාදද්වාරකොෂ්ඨයෙන් පිටත්හි වැඩ හුන් සේක් වෙති.

එ කල්හි **පසේනදි** කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, එකත්පසෙක හුන්නේ ය. එ සමයෙහි සත් දෙනෙක් ජටිලයෝ ද, සත් දෙනෙක් නිවටහු ද, සත් දෙනෙක් අචෙලකයෝ ද, සත් දෙනෙක් එකසාටක නිවටහු ද, සත් දෙනෙක් පිරිවැජියෝ ද වැඩුණු කිසිලිලොම් ද නියපොතු ද ඇත්තාහු නන් වැදෑරුම් පැවිදි පිරිකර බඩු රැගෙන භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි (නුවර දෙසට) ඉක්ම යෙත්.

2. අද්දසා ඛො රාජා පසෙනදි කොසලො තෙ සත්ත ච ජටිලෙ, සත්ත ච නිගණ්ඨෙ, සත්ත ච අචෙලකෙ, සත්ත ච එකසාටකෙ, සත්ත ච පරිබ්බාජකෙ, පරූළ්හකච්ඡනඛලොමෙ ඛාරිවිවිධමාදාය භගවතො අවිදූරෙ අතික්කමන්තෙ. දිස්වාන උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙන තෙ සත්ත ච ජටිලා, සත්ත ච නිගණ්ඨා, සත්ත ච අචෙලකා, සත්ත ච එකසාටකා, සත්ත ච පරිබ්බාජකා තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං නාමං සාවෙසි: රාජාහං භන්තෙ පසෙනදි කොසලො'ති.

3. අථ ඛො රාජා පසෙනදි කොසලො අචිරපක්කන්තෙසු තෙසු සත්තසු ච ජටිලෙසු සත්තසු ච නිගණ්ඨෙසු සත්තසු ච අචෙලකෙසු සත්තසු ච එකසාටකෙසු සත්තසු ච පරිබ්බාජකෙසු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: "යෙ ච ඛො භන්තෙ, ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා, එතෙ තෙසං[1] අඤ්ඤතරා"ති.

"දුජ්ජානං ඛො පනෙතං මහාරාජ, තයා ගිහිනා කාමභොගිනා පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තෙන කාසිකචන්දනං පච්චනුභොන්තෙන මාලාගන්ධවිලෙපනං ධාරයන්තෙන ජාතරූපරජතං සාදියන්තෙන: ඉමෙ වා අරහන්තො ඉමෙ වා අරහත්තමග්ගං සමාපන්නා'ති. සංවාසෙන ඛො මහාරාජ, සීලං වෙදිතබ්බං. තඤ්ච ඛො දීඝෙන අද්ධුනා. න ඉත්තරෙන, මනසිකරොතා නො අමනසිකරොතා. පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන. සංවොහාරෙන[2] ඛො මහාරාජ, සොචෙය්‍යං වෙදිතබ්බං, තඤ්ච ඛො දීඝෙන අද්ධුනා -පෙ- නො දුප්පඤ්ඤෙන. ආපදාසු ඛො මහාරාජ, ථාමො වෙදිතබ්බො. සො ච ඛො දීඝෙන අද්ධුනා -පෙ- නො දුප්පඤ්ඤෙන. සාකච්ඡාය ඛො මහාරාජ, පඤ්ඤා වෙදිතබ්බා, සා ච ඛො දීඝෙන අද්ධුනා -පෙ- නො දුප්පඤ්ඤෙනා'ති.

4. "අච්ඡරියං! භන්තෙ, අබ්භුතං! භන්තෙ, යාව සුභාසිතඤ්චිදං භන්තෙ භගවතා: දුජ්ජානං ඛො පනෙතං -පෙ- අරහත්තමග්ගං සමාපන්නා'ති, සංවාසෙන -පෙ- නො දුප්පඤ්ඤෙනා'ති. එතෙ භන්තෙ, මම පුරිසා චොරා ඔචරකා ජනපදං ඔචරිත්වා ආගච්ඡන්ති[3]. තෙහි පඨමං ඔතිණ්ණං අහං පච්ඡා ඔතරිස්සාමි[4]. ඉදානි තෙ භන්තෙ, තං රජොජල්ලං පවාහෙත්වා නහාතා සුවිලිත්තා කප්පිතකෙසමස්සු ඔදාතවත්ථවසනා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙස්සන්තී'ති.

5. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"න වායමෙය්‍ය සබ්බත්ථ නාඤ්ඤස්ස පුරිසො සියා,
නාඤ්ඤං නිස්සාය ජීවෙය්‍ය ධම්මෙන න වණිං චරෙ"ති[5].

---

1. එතෙසං, මජ්ඣං. 2. සබ්බොහාරෙන, මජ්ඣං. 3. ගච්ඡන්ති, මජ්ඣං. 4. ඔසරිස්සාමි, ම. ඔසාදිස්සාමි, ඔසාසිස්සාමි, කෙසුචි පොත්ථකෙසු. 5. න වාණිජ්ජං චරෙ, කෙසුචි පොත්ථකෙසු.

2. පසේනදි කොසොල් රජ වැඩුණු කිසිලිලොම් හා නියපොතු ඇති ඒ සත් ජටිලයන් ද, සත් නිවටුන් ද, සත් අචෙලකයන් ද, සත් එකසාටකයන් ද, සත් පිරිවැජියන් ද පිරිකර බර ගෙන භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි මඟින් ඉක්මෑ යන්නවුන් දිටී ය. දැක හුනස්නෙන් නැඟී සිට උතුරුසළුව එකස් කොට දකුණු දණමඬල බිමෑ හැන, ඒ සත් ජටිලයන් ද, සත් නිවටුන් ද, සත් අචෙලකයන් ද, සත් එකසාටකයන් ද, සත් පිරිවැජියන් ද දසාවට ඇඳිලි නමා 'වහන්ස, මම් පසේනදි කොසොල්මි'යි තුන් වරක් සිය නම ඇස්වී ය.

3. ඉක්බිත්තෙන් පසේනදි කොසොල් රජ ඒ සත් ජටිලයන්...ඉක්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ වැඳ එක්පසෙක හුන්නේ ය. එක් පසෙක හුන්නා වූ ම පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, ලොවෑ යම් රහත් කෙනෙක් හෝ රහත් මඟට පැමිණි හෝ යම් කෙනෙක් වෙත් නම්, මොහු ඔවුන්ගෙන් එක්තරු කෙනෙක් වෙති"යි කී ය.

"මහරජාණෙනි, අඹුදරුවන් නිසා හටගත් සම්බාධ ඇති ගෙහෙක් ඇති වෑ වසන, කසිවත් හා සියුම් සඳුන් පරිභොග කරන, මල්ගඳ විලෙවුන් දරන රන් රිදී ඉවසන කාමභොගි ගිහි වූ තොප විසින් 'මොහු රහත්හු ද නොහොත් රහත්මඟට පිළිපන්නෝ දැ?'යි යන මෙය නො දත හැකි ය. මහරජාණෙනි, එක් වෑ විසීමෙන් වනාහි ශීලය දත යුතු. එ ද දික් කලෙකිනි. මඳ කලෙකින් නො වේ. එ ද කටහැක්කේ සිල් පිරිසිඳින්නෙම්සි මෙනෙහි කරන්නහු විසිනි. මෙනෙහි නොකරන්නහු විසින් නො වේ. ප්‍රඥ ඇත්තහු විසිනි, ප්‍රඥ නැත්තහු විසින් නො වේ. මහරජාණෙනි, කථායෙන් පිරිසිදු බව දත යුතු. එ ද දික් කලෙකිනි. මඳ කලෙකින් නො වේ...ප්‍රඥ නැත්තහු විසින් නො වේ. මහරජාණෙනි, විපත්හිදී ඥනසථාමය දත යුතු. එ ද දික් කලෙකිනි. ...ප්‍රඥව නැත්තහු විසින් නො වේ"යෑ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

4. "වහන්ස, ආශචර්‍ය ය! වහන්ස, අද්භූත ය! ......රහත්මඟට පිළිපන්නෝ දැ?"යි මෙය දත නො හැක්කේ ය. .. එක් වෑ විසීමෙන් ... ප්‍රඥ නැත්තහු විසින් නො වේ"යෑ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ මේ වචනය ඉතා මැනැවින් වදාරන ලද්දේය. වහන්ස, මොහු පැවිදි වෙසින් සිට රට වැසියන්ගේ පිණ්ඩභොජනය වළඳන මාගේ චරපුරුෂයෝ ය. මොහු දනව්වල නතු විමසා බලා එති. පළමුවෙන් මොවුන් බැස්ස ඒ පෙදෙසට ඔවුනට පසු ව මම බස්නෙමි. වහන්ස, ඔහු දූත් දූවිලි මල සෝදා හැර මොනොවට නැවාහු මොනොවට විලෙවුන් දරුවාහු කැපූ කෙහෙරවුළු ඇත්තාහු, සුදුවත් හඳින්නාහු පස් කම්ගුණ හා ඇලුණෝ එක් වූවෝ ඉදුරන් කාමවසනුන්හි හසුරුවත්"යෑ යි පසේනදී කොසොල් රජ කී ය.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ.

"මහණ තෙම (දූතමෙහෙවර චරපුරුෂ මෙහෙවර ආදි වූ) සියලු ලාමක-කම්හි වැයම් නො කරන්නේ ය. අනෙකකුගේ සේවකයෙක් නො වන්නේ ය. අන් අධිපති ආදි කෙනකුන් ඇසුරු කොට ජීවත් නො වන්නේ ය. ධම්යෙන් වෙළෙඳම් නො කරන්නේ ය (ධන ආදිය පිණිස බණ නො කියන්නේ ය.)

9

## 6. 3.

## පච්චවෙක්ඛනසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා අත්තනො අනෙකෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ පච්චවෙක්ඛමානො නිසින්නො හොති, අනෙකෙ ච කුසලෙ ධම්මෙ භාවනාය පාරිපූරිං ගතෙ.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අහු පුබ්බෙ තදා නාහු නාහු පුබ්බෙ තදා අහු,
න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජතී"ති.

## 6. 4.

## පඨම නානාතිත්ථිය සුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[1] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති, නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (1)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (2)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (3)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අනන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (4)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'තං ජීවං තං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (5)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (6)

1. සමණබ්‍රාහ්මණා, කෙසුචි පොත්ථකෙසු.

## 6. 3.

## ප්‍රත්‍යවේක්ෂණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර නොදුරු නොළං තන්හි වූ **දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ ප්‍රහීණ වූ නොයෙක් ලාමක අකුසල් දහම් ද, භාවනායෙන් පිරිපුන් බවට පැමිණි නොයෙක් කුසල් දහම් ද නුවණින් සලකා බලමින් වැඩ හුන්නාහු වෙති.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ.

(රහත්මඟ නුවණ ලබන්නට) පෙරැ (රාගාදි කෙලෙස් මා සතන්හි) විය. (ආර්‍යමාර්ගක්ෂණයෙහි) ඒ නො වී ය. (දැන් භාවනායෙන් පිරිපුන් බවට පැමිණි අප්‍රමාණ කුශලධර්ම අග්‍රමාර්ගක්ෂණයට පූර්ව වූ) ඒ පුහුදුන් සමයෙහි නො වී ය. (අග්‍රමාර්ගඥානය උපන්) එදා මේ සියලු අනවද්‍යධර්ම පහළ විය. (යම් ආර්‍යමාර්ග-යෙක් මට බෝමැඩදී පහළ වී ද, මාර්ගක්ෂණයෙන් පෙරැ) එය මට නො වී ය. මතුත් නො වන්නේ ය. සියලු කෙලෙස් නසා අවසන් බැවින් කෙලෙස් නසන ආර්‍යමාර්ගයෙක් දැනුත් මට නැත.

## 6. 4.

## ප්‍රථමනානාතීර්ථක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවරැ **ජේතවන** නම් වූ අනේපිඬුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි නානාවිධ දෘෂ්ටි ඇති නානාවිධ මත උසුලන, නානාවිධ රුචි ඇති, නානා දෘෂ්ටිනිශ්‍රයයෙහි ඇලුණු බොහෝ නන්තොටු මහණ බමුණු පිරිවැජියෝ සැවැත් නුවරැ වෙසෙත්.

(ඔවුන් අතුරෙහි) 'ලොව ශාශ්වත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණෝ ඇත. (1)

'ලොව අශාශ්වත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (2)

'ලොව අන්තවත් ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (3)

'ලොව අනන්තය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් ය'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (4)

''ජීවයත් ශරීරයත් දෙක ම එකෙක් ය, මෙය සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (5)

'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (6)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (7)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (8)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'හොති ච න හොති ච තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.(9)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'නෙව හොති ච, න න හොති ච තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤ'න්ති. (10)

තෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති 'එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො'ති.

2. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ, සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණ[1] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති නානාදිට්ඨිකා නානා-ඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා. සන්තෙකෙ-පෙ-නෙදි-සො ධම්මො එදිසො ධම්මො'ති.

3. අඤ්ඤතිත්ථියා භික්ඛවෙ, පරිබ්බාජකා අන්ධා, අචක්ඛුකා, අත්ථං න ජානන්ති[2] අනත්ථං න ජානන්ති, ධම්මං න ජානන්ති, අධම්මං න ජානන්ති. තෙ අත්ථං අජානන්තා අනත්ථං අජානන්තා, ධම්මං අජානන්තා, අධම්මං අජානන්තා භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: 'එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො'ති.

4. භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරො රාජා අහොසි. අථ ඛො භික්ඛවෙ, සො රාජා අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස, යාවතකා[3] සාවත්ථියා[4] ජච්චන්ධා තෙ සබ්බෙ එකජ්ඣං සන්නිපාතෙහී'ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සො පුරිසො තස්ස රඤ්ඤො පටිස්සුත්වා යාවතකා සාවත්ථියා ජච්චන්ධා, තෙ සබ්බෙ ගහෙත්වා යෙන සො රාජා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං රාජානං එතදවොච: 'සන්නිපාති-තා[5] ඛො තෙ දෙව, යාවතකා සාවත්ථියං ජච්චන්ධා'ති. 'තෙන හි භණෙ, ජච්චන්ධානං හත්ථිං දස්සෙහී'ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සො පුරිසො තස්ස රඤ්ඤො පටිස්සුත්වා ජච්චන්ධානං හත්ථිං දස්සෙසි. එදිසො ජච්චන්ධා, හත්ථීති:

1. සමණබ්‍රාහ්මණා, 2. තෙ අත්ථං නජානන්ති, ම. 3. යාවතිකා, සබ්බත්ථ.
4. සාවත්ථියං, සී. 5. සන්නිපතිතා, ම.

'ආත්මය මරණින් මතු ඇත. මෙය ම සත්‍යය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති මහණබමුණු කෙනෙක් ඇත. (7)

'ආත්මය මරණින් මතු නැත මෙය ම සත්‍යය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති මහණබමුණු කෙනෙක් ඇත. (8)

'ආත්මය මරණින් මතු ඇත්තේත් නැත්තේත් වේ. මෙය ම සත්‍යය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති මහණබමුණු කෙනෙක් ඇත (9)

'ආත්මය මරණින් මතු නො ඇත්තේත් නොම නැත්තේත් වේ. මෙය ම සත්‍යය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත. (10)

ඔහු ධර්මය මෙබඳුය, එබඳු නො වේ ය. ධර්මය එබඳු නොවේ. මෙබඳු යැ'යි හටගත් භණ්ඩන ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විවාදයට බටුවෝ උනුන් මුඛ නැමැති අඬයටිවලින් විදුනාහු වෙසෙත්.

2. එ කල්හි බොහෝ භික්ෂූහු පෙරවරු සමයෙහි හැඳ පෙරෙව, පා සිවුරු ගෙන සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්හි පිඬු පිණිස හැසිර පසුබත් සමයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ: "වහන්ස, මෙහි නානාවිධ දෘෂ්ටි ඇති නානාවිධ මත උසුලන, නානාවිධ රුචි ඇති, නානාදෘෂ්ටිනිඃශ්‍රයයෙහි ඇලුණු බොහෝ නත් තොටු මහණ බමුණු පිරිවැජියෝ සැවැත් නුවර වෙසෙත්. (ඔවුන් අතුරෙහි) 'ලොව ශාශ්වත ය...ඔහු 'ධර්මය මෙ බඳු නොවේ, ධර්මය එබඳු යැ' යි.. මුඛ නැමැති අඬයටි-වලින් විදුනාහු වෙසෙත්" යනු යි.

(එය අසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:)

3. "මහණෙනි, අන්තොටු පිරිවැජ්ජෝ අන්ධයෝ ය, පැණැස නැත්තෝ ය. වැඩ නො දනිත්. අවැඩ නො දනිත්. දහම නො දනිත්. නොදහම නො දනිත්. ඔහු වැඩ නො දන්නාහු, අවැඩ නොදන්නාහු, දහම නො දන්නාහු, නොදහම නො දන්නාහු, 'දහම මෙබඳු ය, දහම එබඳු නො වේ. දහම එබඳු නො වේ, දහම මෙ බඳු යැ'යි හටගත් භණ්ඩන ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විවාදයට බටුවෝ, උනුන් මුඛ අඬයටිවලින් විදුනාහු වෙසෙත්.

.4 "මහණෙනි, පෙර වූවක් කියමි. මේ සැවැත් නුවරෙහි ම එක්තරා රජෙක් විය. එ කල්හි ඒ රජ. එක් පුරුෂයකු බණවා, 'එම්බා, පුරුෂය, තෝ මෙහි එව. සැවැතෙහි යම් පමණ දෑ අඳහු වෙත් නම්, උන් හැම එකට රැස් කරව'යි ඇණැවී ය. මහණෙනි, 'එසේ ය, දෙවයිනි'යි කියා ම, ඒ පුරුෂ තෙම, එ රජුට පිළිවදන් දී, සැවැතෙහි යම් පමණ දෑ අඳහු වූහු නම් උන් හැම ගෙන එ රජු කරා එළැඹියේ ය. එළැඹ, එ රජුට 'දෙවයිනි, සැවැතෙහි ඇති තාක් හැම දෑ අඳහු ම රැස් කරන ලද්දහ'යි සැල කෙළේ ය 'එසේ වී නම්, සගය, දෑ අඳනට ඇතකු දක්වව'යි රජ කීය. ඒ පුරුෂ තෙම, 'එසේ ය දෙවයිනි'යි කියා එ රජුට පිළිවදන් දී දෑ අඳනට 'දෑ අඳනි, ඇතා මෙ බඳු'යි කියා ඇතු දැක්වී ය:

එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස සීසං දස්සෙසි. 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස කණ්ණං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස දන්තං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස සොණ්ඩං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස කායං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස පාදං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස සත්ථිං[1] දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස නඞ්ගුට්ඨං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති. එකච්චානං ජච්චන්ධානං හත්ථිස්ස වාලධිං දස්සෙසි, 'එදිසො ජච්චන්ධා, හත්ථී'ති.

අථ ඛො භික්ඛවෙ, සො පුරිසො ජච්චන්ධානං හත්ථිං දස්සෙත්වා යෙන සො රාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං රාජානං එතදවොච: 'දිට්ඨො ඛො තෙහි දෙව, ජච්චන්ධෙහි හත්ථී, යස්ස'දානි දෙවො කාලං මඤ්ඤසී'ති.

5. අථ ඛො භික්ඛවෙ සො රාජා යෙන තෙ ජච්චන්ධා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ජච්චන්ධෙ එතදවොච: 'දිට්ඨො වො ජච්චන්ධා හත්ථී'ති. 'එවං දෙව, දිට්ඨො නො හත්ථී'ති. වදෙථ ජච්චන්ධා, 'එදිසො[2] හත්ථී'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස සීසං දිට්ඨං අහොසි, තෙ එවමාහංසු: 'එදිසො දෙව, හත්ථී, සෙය්‍යථාපි කුම්භො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස කණ්ණො දිට්ඨො අහොසි, තෙ එවමාහංසු, 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි සුප්පං[3] 'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස දන්තො දිට්ඨො අහොසි, තෙ එවමාහංසු, 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි ඵාලො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස සොණ්ඩො දිට්ඨො අහොසි, තෙ එවමාහංසු, 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි නඞ්ගලීසා'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස කායො දිට්ඨො අහොසි, තෙ එවමාහංසු, එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි කොට්ඨො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස පාදො දිට්ඨො අහොසි, තෙ එවමාහංසු 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි ථූණො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස සත්ථි[4] දිට්ඨො අහොසි, තෙ එවමාහංසු 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි උදුක්ඛලො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස නඞ්ගුට්ඨං දිට්ඨං අහොසි, තෙ එවමාහංසු 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි මුසලො'ති. යෙහි භික්ඛවෙ ජච්චන්ධෙහි හත්ථිස්ස වාලධි දිට්ඨො අහොසි, තෙ එවමාහංසු 'එදිසො දෙව හත්ථී සෙය්‍යථාපි සම්මජ්ජනී'ති. තෙ 'එදිසො හත්ථී නෙදිසො හත්ථී, නෙදිසො හත්ථී එදිසො හත්ථී'ති. අඤ්ඤමඤ්ඤං මුට්ඨීහි සංඛුභිංසු.[5] තෙන ච පන භික්ඛවෙ සො රාජා අත්තමනො අහොසි.

එවමෙව ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා -පෙ- නෙදිසො ධම්මො එදිසො ධම්මො'ති.

6. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"ඉමෙසු කිර සජ්ජන්ති එකෙ සමණබ්‍රාහ්මණා,
විග්ගය්හ නං විවදන්ති ජනා එකඞ්ගදස්සිනො"ති.

1. පිට්ඨිං, සී. 2. කීදිසො, සී. 3. සුප්පො, සී. 4. පිට්ඨි, සී. 5. සංයුජ්ඣිංසු, සී.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ හිස දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ කන දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ දනක් දක්වී ය.

'දූ අඳුනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ සොඬ දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ කඳ දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ පයක් දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැයි ඇතැම් දූ අඳනට ඇතුගේ කලවෙය දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ නඟුට දක්වී ය.

'දූ අඳනි, ඇතා මෙබඳු යැ'යි ඇතැම් දූ අඳනට ඇතුගේ වලග දක්වී ය.

ඉක්බිත්තෙන් මහණෙනි, ඒ පුරුෂ තෙම දූ අඳනට ඇතු දක්වා, ඒ රජු කරා එළැඹියේ ය. එළැඹ එ රජුට 'දේවයිනි, ඒ දූ අඳන් විසින් ඇත් තෙම දක්නා ලද්දේ ය. ඔවුන්ගෙන් යම් විමැසුමකට දෙවයන් වහන්සේ සිතන සේක් නම්, එයට දැන් කල් යැ'යි සැළ කෙළේ ය.

5. මහණෙනි, එ කලැ ඒ රජ ඒ දූ අඳුන් කරා එළැඹියේ ය. එළැඹ 'දූ අඳනි, තොප විසින් ඇතා දක්නා ලද දූ?'යි ඇසී ය. "එසේ ය, දේවයන් වහන්ස, අප විසින් ඇතා දක්නා ලදූ"යි ඔහු කීහ. දූ අඳනි, ඇතා මෙ අයුරුයැ යි කියව' යි රජ කී ය. යම් දූ අඳුන් විසින් ඇතුගේ හිස අත ගානා ලද්දේ වී ද,. ඔහු 'කළය යම් බඳු නම් ඇතා එබඳු යැ' යි කීහ. ඇතුගේ කන් අත ගෑ දූ අඳහු ඇතා කුල්ලක් බඳු යැ'යි කීහ. ඇතුගේ දත් දුටු දූ අඳහු 'දේවයිනි, ඇතා සීවැල බඳු යැ' යි කීහ. ඇතුගේ සොඬ අත ගෑ දූ අඳහු 'ඇතා නඟුලිස බඳු යැ' යි කීහ. ඇතුගේ සිරුරු අත ගෑ දූ අඳහු 'ඇතා අටුව බඳු යැ' යි කීහ. ඇතුගේ පය අත ගෑ දූ අඳහු 'ඇතා ටැඹක් බඳු යැ' යි කීහ. ඇතුගේ කලවෙ අත ගෑ දූ අඳහු 'ඇතා වංගෙඩිය බඳු යැ' යි කීහ. ඇතුගේ නඟුට අත ගෑ දූ අඳහු 'ඇතා මොහොල බඳු යැ' යි කීහ. ඇතුගේ වලග අත ගෑ දූ අඳහු 'ඇතා මුස්න බඳු යැ' යි කීහ. ඔහු 'ඇතා මෙබඳු ය, එබඳු නො වේ. ඇතා එබඳු නො වේ මෙබඳු යැ' යි උනුන් මිටින් පහර දුන්හ. මහණෙනි, එයින් රජ සතුටු විය.

මහණෙනි, එ පරිද්දෙන් ම අන්තොටු පිරිවැජ්ජෝ නුවණින් අන්ධ වූවෝ, නුවණැස් නැත්තෝ...'දහම එබඳු නො වේ, දහම මෙ බඳු යැ' යි ...මුව අඩයටිවලින් විදුනාහු වෙසෙත්".

6. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූහ:

"ඇතැම් මහණ බමුණෝ (ශාශ්වතාදී අසාර වූ) මේ දෘෂ්ටීන්හි ඇලෙත්. එක් අඞ්ගයක් ම දක්නාහු ('තෝ මෙය නො දනිහි. මම් දනිම්'යි යන ආදීන්) එය (ශාශ්වතාදි වශයෙන්) උනුනට විරුද්ධ වැ ගෙන විවාද කෙරෙත්.',

## 6. 5.

## දුතියනානාතිත්ථියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[1] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති, නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (1)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: – 'අසස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (2)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අසස්සතො[2] අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (3)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (4)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයං කතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (5)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'පරං කතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (6)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතො පරංකතො[3] අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (7)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසයංකාරො අපරංකාරො[4] අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (8)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.[2] (9)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (10)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතං අසස්සතං[5] සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (11)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'නෙව සස්සතං නාසස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (12)

---

1. සමණබ්‍රාහ්මණා, සී. 2. සස්සතො ච, අසස්සතො ච. මජ්සං. 3 සයංකතො ච පරංකතො ච, සබ්බත්ථ. 4. අසයංකාරො ච අපරංකාරො ච, තථා. 5. සස්සතඤ්ච අසස්සතඤ්ච, තථා

6. 5.

## ද්විතීයනානාතිත්ථක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **දෙව්රම්** නම් වූ අනේපිඬු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වනාහි බොහෝ තන් තොටු මහණ බමුණු පිරිවැජියෝ නානා දෘෂ්ටි ඇත්තාහු, නානා ලබ්ධි ඇත්තාහු, නානා රුචි ඇත්තාහු, නානා දෘෂ්ටි නිඃශ්‍රය ඇසුරු කළාහු, සැවැත් නුවරැ වෙසෙත්.

ඔවුන් අතුරෙහි ආත්මයත් ලෝකයත් ශාශ්වත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත. (1)

'ආත්මයත් ලෝකයත් අශාශ්වතය මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත. (2)

'ආත්මයත් ලෝකයත් ශාශ්වතත් අශාශ්වතත් වෙතියි, 'මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (3)

'ආත්මයත් ලෝකයත් ශාශ්වතත් නොවෙති. අශාශ්වතත් නොවෙති. මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (4)

'ආත්මයත් ලෝකයත් ස්වයංකෘත යැ, 'මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (5)

'ආත්මයත් ලෝකයත් පරකෘත යැ, මෙය ම සත්‍යය, සෙස්ස හිස් යැ යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (6)

ආත්මයත් ලෝකයත් ස්වයංකෘත ද පරකෘත ද වෙත්. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ගත් ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (7)

'ආත්මයත් ලෝකයත් තමන් ම මවා ගැන්මක් හෝ අනුන්ගේ මැවීමක් ඇතියෝ නො වෙත්. යදෘච්ඡාසමුත්පන්න ය (කාරණයක් නැති ව තුමූ ම පහළ වූහ). මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (8)

'සුව දුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම ශාශ්වත ය. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ''යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (9)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මෙ හැම අශාශ්වතය, මෙයම සත්‍යය. සෙස්ස හිස් යැ යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (10)

සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම ශාශ්වත ද අශාශ්වත ද වේ. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ' යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (11)

සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම නොම ශාශ්වතය, නොම අශාශ්වතය. මෙ යම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (12)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (13)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'පරංකතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (14)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතං පරංකතං[1] සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (15)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (16)

තෙ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: 'එදිසො ධම්මො, නෙදිසො ධම්මො. නෙදිසො ධම්මො, එදිසො ධම්මො'ති.

2. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

ඉධ භන්තෙ සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[2] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා. සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති -පෙ- 'නෙදිසො ධම්මො, එදිසො ධම්මො'ති.

3. අඤ්ඤතිත්ථියා භික්ඛවෙ, පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා අත්ථං න ජානන්ති.[3] අනත්ථං න ජානන්ති. ධම්මං න ජානන්ති. අධම්මං න ජානන්ති. තෙ අත්ථං අජානන්තා අනත්ථං අජානන්තා ධම්මං අජානන්තා අධම්මං අජානන්තා භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: 'එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො'ති.

4. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"ඉමෙසු කිර සජ්ජන්ති එකෙ සමණබ්‍රාහ්මණා,
අන්තරාව විසීදන්ති අප්පත්වාව තමොගධං"ති.

### 6. 6.

### තතිය නානාතිත්ථියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[4] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති, නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා.

---

1. සයංකතඤ්ච පරංකතඤ්ච, සබ්බත්ථ 2. සමණබ්‍රාහ්මණා, සී 3. තෙ අත්ථං න ජානන්ති, ම.
4. සමණබ්‍රාහ්මණා, සී.

‘සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම ස්වයංකෘත ය. මෙ යම සත්‍ය ය. සෙස්ස හිස් යැ’යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (13)

‘සුවදුක් ද ආත්මය ද ලෝකය ද පරකෘත ය. මෙ යම සත්‍ය ය. සෙස්ස හිස් යැ’යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (14)

සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම ස්වයංකෘත්‍යය පරකෘතයැයි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (15)

සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මෙ හැම ස්වයංකාර පරකාර රහිත ය, යදෘච්ඡාසමුත්පන්න ය. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ’යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (16)

ඔහු “ධර්මය මෙබඳු ය. ධර්මය එබඳු නො වේ. ධර්මය මෙබඳු නො වේ. ධර්මය එබඳු යැ”යි හටගත් ඩබර ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විරුද්ධ-වාදයට බටුවෝ උනුන් මුව තැමැති අඩයටිවලින් විදිමින් වෙසෙත්.

2. එ කල්හි බොහෝ භික්ෂූහු පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන, සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර, පසුබත් සමයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන්නා වූ ම ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළහ.

“වහන්ස, මෙහි බොහෝ තත්තොටු මහණ බමුණු පිරිවැජියෝ නානාදෘෂ්ටි ඇත්තාහු, නානාලබ්ධි ඇත්තාහු, නානා රුචි ඇත්තාහු, නානා දෘෂ්ටිකාරණයෙහි ඇලුණාහු සැවැත්නුවරෙහි වෙසෙත්. “ආත්මය ද, ලෝකය ද ශාශ්වත යැ යි, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් ය...ධර්මය මෙබඳු නො වේ ධර්මය එබඳු යැ යි හටගත් ඩබර ඇත්තෝ...උනුන් මූවඅඩයටිවලින් විදිමින් වසත්” ය යි.

මහණෙනි, එ පරිද්දෙන් ම අන්තොටු පිරිවැජ්ජෝ නුවණින් අඳ වූවෝ, නුවණැස් නැත්තෝ...‘දහම එබඳු නො වේ, දහම මෙ බඳු යැ’යි.. මුව අඩයටිවලින් විදුනාහු වෙසෙත්”.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

‘ ඇතැම් මහණ බමුණෝ මේ අසාරදෘෂ්ටීන්හි ඇලෙත්. ඔහු ඒ නිවනට නො පැමිණ ම අතර දී ම සසරමහවතුරෙහි ගිලෙත්,”

## 6. 6.

## තෘතිය නානාතීර්ථක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම් වූ අනේපිඬුහු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි වූ කලි බොහෝ තත්තොටුවෝ මහණ බමුණු පිරිවැජියෝ නානා දෘෂ්ටි ඇත්තෝ, නානා ලබ්ධි ඇත්තෝ, නානාරුචි ඇත්තෝ, නානා දෘෂ්ටිකාරණයෙහි ඇලුණාහු, සැවැත්නුවර වෙසෙත්.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (1)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (2)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අසස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (3)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (4)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (5)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'පරංකතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (6)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතො පරංකතො[1] අත්තා ච ලොකො ච. ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (7)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසයංකාරො අපරංකාරො[2] අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (8)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (9)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අසස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (10)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතං අසස්සතං.[3] සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (11)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'නෙව සස්සතං නාසස්සතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (12)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. (13)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'පරංකතං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති. (14)

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සයංකතං පරංකතං[4] සුඛදුක්ඛං අත්තා ච ලොකො ච. ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති. (15)

---

1. සයංකතො ච පරංකතො ච, සබ්බත්ථ. 2. අසයංකාරො ච අපරංකාරො ච, තථා.
3. සස්සතඤ්ච අසස්සතඤ්ච, තථා, 4. සයංකතඤ්ච පරංකතඤ්ච, තථා.

(ඔවුන් අතුරෙහි) 'ආත්මය ද ලෝකය ද ශාශ්වත ය. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ' යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත. (1)

'ආත්මයත් ලෝකයත් අශාශ්වතය, මෙය ම සත්‍ය ය. සෙස්ස හිස්යැ' යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත (2)

'ආත්මයත් ලෝකයත් ශාශ්වතත් අශාශ්වතත් වේ. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (3)

'ආත්මයත් ලෝකයත් ශාශ්වතත් නො ම වේ, අශාශ්වතත් නො ම වේ. මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ' යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (4)

'ආත්මයත් ලෝකයත් ස්වයංකෘත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (5)

'ආත්මයත් ලෝකයත් පරකෘත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ' යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (6)

'ආත්මයත් ලෝකයත් ස්වයංකෘත ද පරකෘත ද වේ. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (7)

'ආත්මයත් ලෝකයත් අස්වයංකාර ද අපරකාර ද වේ. යදෘච්ඡාසමුත්පන්න ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ' යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (8)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මෙ හැම ශාශ්වත ය, මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (9)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මෙ හැම අශාශ්වත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (10)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද ශාශ්වතත් අශාශ්වතත් වේ. මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ-බමුණු කෙනෙක් ඇත. (11)

සුවදුක් ද ආත්මය ද ලෝකය ද ශාශ්වතත් නොම වේ. අශාශ්වතත් නොම වේ යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (12)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද ස්වයංකෘත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති, ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (13)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද පරකෘත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති, ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (14)

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මෙ හැම ස්වයංකෘතත් පරකෘතත් වේ. මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (15)

සන්ති පනෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ‘අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. (16)

තෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: ‘එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො’ති.

2. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

ඉධ භන්තෙ සම්බහුලා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[1] පරිබ්බාජකා සාවත්ථියං පටිවසන්ති නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා නානාදිට්ඨිනිස්සයනිස්සිතා. සන්තෙකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ‘සස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති. –පෙ– තෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති ‘එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො’ති.

අඤ්ඤතිත්ථියා භික්ඛවෙ පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා අත්ථං න ජානන්ති[2] අනත්ථං න ජානන්ති ධම්මං න ජානන්ති අධම්මං න ජානන්ති. තෙ අත්ථං අජානන්තා අනත්ථං අජානන්තා ධම්මං අජානන්තා අධම්මං අජානන්තා භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: ‘එදිසො ධම්මො නෙදිසො ධම්මො, නෙදිසො ධම්මො එදිසො ධම්මො’ති.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

“අහඞ්කාරපසුතායං පජා පරඞ්කාරූපසංහිතා,
එතදෙකෙ නාබ්භඤ්ඤිංසු න නං සල්ලන්ති අද්දසුං.

එතඤ්ච සල්ලං පටිච්ච[3] පස්සතො
අහං කරොමී’ති න තස්ස හොති,
පරො කරොතීති න තස්ස හොති,

මානුපෙතා අයං පජා මානගන්ථා මානවිනිබද්ධා,
දිට්ඨීසු සාරම්භකථා සංසාරං නාතිවත්තතී”ති.

1. සමණබ්‍රාහ්මණා, සී. 2. තෙ අත්ථං න ජානන්ති, ම. 3, පටිගච්ච, සී.

'සුවදුක් ද ආත්මය ද ලෝකය ද යන මේ හැම අසවයඞකාරත් අපරකාරත් වේ, යදෘච්ඡාසමුත්පන්න යැ'යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. (16)

ඔහු හටගත් ඛබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විවාදයට පැමිණි යාහු. 'ධර්මය මෙබඳු යැ, එබඳු නො වේ. ධර්මය මෙබඳු නොවේ, එබඳු යැ'යි මුවඅඬයටිවලින් උනුනට අනින්නාහු වෙසෙත්.

2. එ කල්හි බොහෝ භික්ෂූහු පෙරවරු සමයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන සැවැතට පිඬු පිණිස පිවිසියහ. සැවැත්හි පිඬු පිණිස හැසිර පසුබත් කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක සිටියහ: එක්පසෙක සිටි ම එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ:

'වහන්ස, මේ සැවැත්නුවර නානාදෘෂ්ටි ඇති, නානාලබ්ධිගත්, නානා රුචි ඇති, නානාදෘෂ්ටිකාරණයෙහි ඇලුණු බොහෝ තන් තොටු මහණ බමුණු පිරිවැජියෝ වෙසෙත්. (ඔවුන් අතුරෙහි) ආත්මයත් ලෝකයත් ශාශ්වත ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ යි මෙසේ කියන, මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත...ඔහු 'ධර්මය මෙබඳු ය, ධර්මය එබඳු නො වේ. ධර්මය මෙබඳු නො වේ, ධර්මය එබඳු යැ' යි හටගත් ඛබර ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විවාදයට බටුවෝ මුව අඬයටින් උනුනට අනිමින් වෙසෙත්,' යනු යි.

''මහණෙනි, අන්තොටු පිරිවැජියෝ අන්ධයෝ ය. ඇස් නැත්තෝ ය. ඔහු වැඩ නො දනිත්. අවැඩ නො දනිත්. දහම් නො දනිත්. නොදහම් නො දනිත්. ඔහු වැඩ නො දන්නෝ, අවැඩ නො දන්නෝ, දහම් නො දන්නෝ, නොදහම් නො දන්නෝ, 'ධර්මය මෙ බඳු ය, ධර්මය එබඳු නො වේ. ධර්මය මෙබඳු නො වේ, ධර්මය එබඳු යැ'යි හටගත් ඛබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විවාදයට බටුවෝ උනුනට මුව අඬයටිවලින් අනින්නාහු වෙසෙත්,''යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක,

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

'මේ සත්කැල සවයංකාර [අහඞකාර) දෘෂ්ටියෙහි යෙදුණෝ ය. ඊශ්වරාදි අන් කිසිවෙක් සියල්ල කෙරේ' යැ යි පරකාර දෘෂ්ටිය හෝ ඇසුරු කළෝ වෙති. අන් කෙනෙක් මේ දෘෂ්ටි . දෙක ම නො අනුදත්හ. ඔහු ද තමන් ගත් යදෘච්ඡාසමුත්පන්න වාදය දුක් උපදවන හුලෙකැ යි නො දුටුහ.

මෙය හුලෙකැ යි මුල දී ම දක්නා ඒ ආරබ්ධ විදර්ශකයාට 'මම් කෙරෙම්'යි කියා සිතෙක් නො වේ. අනෙකෙක් කෙරෙයි' කියාත් ඔහුට සිතෙක් නො වෙයි.

මේ සත්කැල මානයෙන් යුක්ත ය. මාන නැමැති ග්‍රන්ථ (ගෙතුම්) ඇත්තෝ ය. මාන බැඳුම් ඇත්තෝ ය, දෘෂ්ටිවිෂයයෙහි විරොධකථාව සසර නො ඉක්මවයි.''

## 6. 7.

### සුභූතිසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සුභූති භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අවිතක්කසමාධිං[1] සමාපජ්ජිත්වා. අද්දසා ඛො භගවා ආයස්මන්තං සුභූතිං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය අවිතක්ක-සමාධිං[1] සමාපන්නං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්ස විතක්කා විධූපිතා
අජ්ඣත්තං සුවිකප්පිතා අසෙසා,
තං සඞ්ගමතිච්ච අරූපසඤ්ඤී
චතුයොගාතිගතො න ජාතුමෙතී"ති.

## 6. 8.

### ගණිකාසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති, වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන රාජගහෙ ද්වෙ පූගා අඤ්ඤතරිස්සා ගණිකාය සාරත්තා හොන්ති පටිබද්ධචිත්තා.[2] භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති, ලෙඩ්ඩූහිපි උපක්කමන්ති දණ්ඩෙහිපි උපක්කමන්ති, සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණමත්තම්පි දුක්ඛං.

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පවිසිංසු. රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ රාජගහෙ ද්වෙ පූගා අඤ්ඤතරිස්සා ගණිකාය සාරත්තා පටිබද්ධචිත්තා[2] භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති, ලෙඩ්ඩූහිපි උපක්කමන්ති, දණ්ඩෙහිපි උපක්කමන්ති, සත්ථෙහිපි උපක්කමන්ති, තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණමත්තම්පි දුක්ඛන්ති.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1. අවිතක්කං සමාධිං, සී 2 පටිබද්ධචිත්තාතිපි අපි

## 6. 7.

### සුභූති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම් වූ අනේපිඬුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි සුභූති තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා අවිතර්කසමාධියට (චතුර්ථධ්‍යාන පාදක අර්හත්ඵලසමාධියට) සමවැද හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා අවිතර්කසමාධියට සමවැද හුන් සුභූති තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වෙලාවෙහි මේ උදන් ඇනූ සේක:

"යමක්හු විසින් මිථ්‍යාවිතර්කයෝ පලවා හරින ලද්දාහු ද, සිය සතන්හි ඉතිරි නො කොට සිඳ පියන ලද්දාහු ද, රාගාදි සියලු සඞ්ග ඉක්මැ අරූපය (හෙවත් නිවන) අරමුණු කරන මාර්ගඵලසංඥා ඇති, කාමයොගාදි සතරයොගයන් ඉක්මැ ගිය ආර්ය්‍ය පුද්ගල තෙමේ එකාන්තයෙන් පුනර්භවයට නො එයි."

## 6. 8.

### ගණිකා සූත්‍රය

1: මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වසන සේක. එ සමයෙහි රජගහ නුවර ගණ දෙකෙක් එක්තරා ගණිකාවක කෙරෙහි ඇලුණාහු පිළිබඳ සිතැත්තාහු වෙත්. ඔහු හටගත් ඩබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විවාදයට බටුවාහු උනුනට අත්වලින් පහර දෙත්, ගල්කැටින් පහර දෙත්, දඬුවලින් පහර දෙත්, අවිවලින් පහර දෙත්. ඔහු එහි මරණයට ද පැමිණෙත්, මරණය පමණ වූ දුකට ද පැමිණෙත්.

2. එ කල්හි බොහෝ භික්ෂුහු පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන, රජගහ නුවරට පිඬු පිණිස පිවිසියහ. රජගහ නුවර පිඬු පිණිස හැසිර පසුබත්කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ, එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එක් පසෙක හිඳ ගත්හ. එක් පසෙක හිඳ ගත්තාවූම ඒ භික්ෂුහු 'වහන්ස, මේ රජගහ නුවර දෙ ගණ කෙනෙක් එක්තරා ගණිකාවක කෙරෙහි ඇලුණෝ බැඳුණු සිතැත්තෝ, හටගත් ඩබර ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විවාදයට පැමිණියෝ, උනුනට අතින් ද පහර දෙත්, කැටින් ද පහර දෙත්, දඬුයෙන් ද පහර දෙත්, සැතින් ද පහර දෙත්. ඔහු එහි මරණයට ද, මරණය තරම් වූ දුකට ද පැමිණෙත්.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූහ:

"යඤ්ච පත්තං යඤ්ච පත්තබ්බං, උභයමෙතං රජානුකිණ්ණං ආතුරස්සානුසික්ඛතො.

යෙ ච සික්ඛාසාරා, සීලබ්බතජීවිතබ්‍රහ්මචරියඋපට්ඨානසාරා,[1] අයමෙකො අන්තො.

යෙ ච එවංවාදිනො: 'නත්ථි කාමෙසු දොසො'ති, අයං දුතියො අන්තො. ඉච්චෙතෙ උභො අන්තා කටසිවඩ්ඪනා. කටසියො දිට්ඨිං වඩ්ඪෙන්ති. එතෙ තෙ උභො අන්තෙ අනභිඤ්ඤාය ඔලීයන්ති එකෙ අතිධාවන්ති එකෙ. යෙ ච ඛො තෙ අභිඤ්ඤාය තත්‍ර ච නාහෙසුං තෙන ච න මඤ්ඤිංසු. වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනායා"ති.

## 6. 9.

## උපාතිසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති. **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අබ්භොකාසෙ නිසින්නො හොති, තෙලප්පදීපෙසු ඣායමානෙසු. තෙන ඛො පන සමයෙන සම්බහුලා අධිපාතකා තෙසු තෙලප්පදීපෙසු ආපාතපරිපාතං අනයං ආපජ්ජන්ති, ව්‍යසනං ආපජ්ජන්ති. අද්දසා ඛො භගවා තෙ සම්බහුලෙ අධිපාතකෙ තෙසු තෙලප්පදීපෙසු ආපාතපරිපාතං අනයං ආපජ්ජන්තෙ ව්‍යසනං ආපජ්ජන්තෙ.[2]

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"උපාතිධාවන්ති න සාරමෙන්ති නවං නවං බන්ධනං බ්‍රූහයන්ති,
පතන්ති පජ්ජොතමිවාධිපාතකා[3] දිට්ඨෙ සුතෙ ඉතිහෙකෙ නිවිට්ඨා"ති.

---

1. සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානං, මුද්දිතට්ඨකථා. උපට්ඨානසාරො, මුද්දිතපාළි.
2. අනයව්‍යසනං ආපජ්ජන්තෙ, සබ්බත්ථ. 3. අධිපාතා, සී.

පැමිණි යම් පස් කම් සුවයෙක් ඇද්ද මතු පැමිණිය යුතු කොට පතන යම් පස් කම්සුවයෙක් ඇද්ද, මේ දෙක ම ක්ලේශාතුරයාගේ ද දුඃඛාතුරයාගේ ද රාගරජසිතුත් ද්වේෂරජසිතුත් වැසුණේ වෙයි:

මෙයින් සංසාරශුද්ධිය වේතැයි ගත් යම් ශීලව්‍රතාදි වූ ශික්ෂාසාර කෙනෙක් වෙත් ද, ශීලව්‍රත, ශාකභක්ෂකතාදි ජීවිකා, මෛථුනවිරති (ස්කන්ද දෙවපරිචරණාදි) උපස්ථානසාර කෙනෙක් වෙත් ද, මොහු ආත්මක්ලමථානුයොග පක්ෂය ගත් එක් අන්තයෙක. 'කාමයන්හි දොස් නැතැ'යි කියන යම් කෙනෙක් ඇත් ද, ඔවුන් ගත් මෙය කාමසුඛල්ලිකානුයොගය වූ දෙවෙනි අන්තය ය.

මෙසේ මෙ කී උභය අන්තයෝ කටසීන් (තෘෂ්ණා අවිද්‍යාවන්) වඩන්නෝ ය කටසීහු (අවිද්‍යාතෘෂ්ණාවෝ) දෘෂ්ටිය වඩත්.

මේ අන්ත දෙක නොදැන ඇතැම්හු කම්සුවෙහි යෙදීම් වශයෙන් හැකිළෙත්. කෙනෙක් සිය කය පෙළීම් වශයෙන් අතිධාවනය කරත්. යම් කෙනෙක් වනාහි ඔවුන් විශිෂ්ට නුවණින් දැන, ඒ අන්ත දෙක්හි පතිත නො වූහු ද, ඔහු (අන්තද්වයප්‍රහීණ කිරීමෙන් තෘෂ්ණාදි වශයෙන්) මියැදියනා නො කළහ. ඔවුනට (මරණින් මතු ඇතැයි) පණවන්නට (කම්වට්ට විපාකවට්ට ක්ලේශවට්ට යන) කිසි ම වට්ටයෙක් නැත."

## 6. 9.

## උපාති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම් වූ අනේපිඬුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ රෑ මහඅඳුරෙහි තෙල් පහන් දැල්වෙන කල්හි එළිපහනෙහි වැඩ හුන් සේක් වෙති. එ සමයෙහි බොහෝ පලගැටියෝ ඒ පහන් ඉදිරියට පැන ද පහන් වටා හැවිද පැන ද දුකටත් මරණයටත් පැමිණෙත්. භාග්‍යවතුන් වහන්සේ ඒ බොහෝ පලගැටියන් ඒ තෙල්පහන්හි ඉදිරියට පැන ද වටා හැවිද පැන ද දුකටත් මරණයටත් පැමිණෙන්නවුන් දුටු සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"සත්හු දෘෂ්ටිවිපර්‍ය්‍යාසයෙන් අතිධාවනය කරත්. (ශීලාදි) සාරයට නො පැමිණෙත්. තෘෂ්ණාදෘෂ්ටිසඞ්ඛ්‍යාත අලුත් අලුත් බැඳුම් වඩත්. මෙසේ ඇතැම්හු දුටු දෑයෙහි ද ඇසූ දෑයෙහි ද පලගැටියන් පහනට සෙයින් ඒ අරමුණු කෙරෙහි ශාශ්වතාදි වශයෙන් බැස ගත්තාහු එයට පතිත්."

## 6. 10

### තථාගතුප්පාදසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: යාවකීවඤ්ච භන්තෙ, තථාගතා ලොකෙ නුප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා, තාව අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සක්කතා හොන්ති ගරුකතා මානිතා පූජිතා අපචිතා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. යතො ච ඛො භන්තෙ, තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා, අථ[1] අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අසක්කතා හොන්ති අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා, න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. භගවා යෙව'දානි භන්තෙ, සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, භික්ඛුසඞ්ඝො චාති.

2. එවමෙතං ආනන්ද, යාවකීවඤ්ච ආනන්ද, තථාගතා ලොකෙ නුප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා. තාව අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සක්කතා හොන්ති ගරුකතා මානිතා පූජිතා අපචිතා, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. යතො ච ඛො ආනන්ද, තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා, අථ[1] අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අසක්කතා හොන්ති අගරුකතා අමානිතා අපූජිතා අනපචිතා, න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානං. තථාගතො'ව'දානි සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, භික්ඛුසඞ්ඝො චාති[3]

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"ඔභාසති තාව සො කිමි යාව න උග්ගමති[2] පභඞ්කරො,
වෙරොචනම්හි[3] උග්ගතෙ හතප්පභො හොති න චාපි භාසති.

එවං ඔභාසිතමෙව තක්කිකානං
යාව සම්මාසම්බුද්ධා ලොකෙ නුප්පජ්ජන්ති,
න තක්කිකා සුජ්ඣන්ති න චාපි සාවකා
දුද්දිට්ඨී න දුක්ඛා පමුච්චරෙ"ති.

**ජච්චන්ධවග්ගො ඡට්ඨො.**

තස්සුද්දානං

ආයු ජටිල වෙක්ඛණ තීණි තිත්ථියා සුභූති,[4]
ගණිකා[5] උපාති නවමො උප්පජ්ජන්ති'ති තෙදස.

---

1 අථ ඛො, සබ්බත්ථ. 2. උන්නමති, සී, උන්නාමතෙ, ම 3. විරොචනම්හි, සී. සවෙරොචනම්හි, ම 4. තයො තිත්ථිය සුභූති, සී 5. ආයුසමොසජ්ජනං ච පටිසල්ලා ආන්ධු තීනි තිර තිත්ථියා සත්තමමාන සුභූති· ගණිකා, සී.

## 6. 10.

## තථාගතොත්පාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරමෙහි වැඩ වසන සේක. එකල්හි **අනද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එක්පසෙක හුන්හ. එක් පසෙක හුන් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ.

"වහන්ස, යම් තාක් කල් ම තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරු ලොවැ නො උපදිත් ද. ඒ තාක් ම අන්තොටු පිරිවැජ්ජෝ සත්කාර ලද්දහු ගුරුකාර ලද්දහු බුහුමන් ලද්දහු පුදනු ලද්දහු යටත් පැවැතුම් ලද්දහු සිවුරුපිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන සුල්ලෝ වෙත්. වහන්ස, යම් කලෙක්හි ම තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරු ලොව උපදිත් ද, එකල්හි අන්තොටු පිරිවැජ්ජෝ සත්කාර නො ලද්දෝ ගුරුකාර නො ලද්දෝ බුහුමන් නො ලද්දෝ, නො පුදන ලද්දෝ, යටත් පැවැතුම් නො ලද්දෝ සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබන සුල්ලෝ වෙත්. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුසඞ්ඝයාත් ම සත්කාර ලද්දෝත් ගුරුකාර ලද්දෝත් බුහුමන් ලද්දෝත් පුදන ලද්දෝත් යටත් පැවැතුම් ලද්දෝත් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන සුල්ලෝත් වෙතී." යනු යි.

2. "අනඳයෙනි, එය එසේ ය. අනඳයෙනි, යම්තාක් කල් ම ලොවැ තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරු නො උපදිත් ද, ඒ තාක් ම අන්තොටු පිරිවැජියෝ සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර ලබන සුල්ලෝ ද වෙති. එහෙත් අනඳයෙනි, යම් කලෙක වනාහි තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරු ලොවැ උපදිත් ද, එ කල්හි අන්තොටු පිරිවැජියෝ අසත්කෘත ද අගුරුකෘත ද අමානිත ද අපූජිත ද අනපචිත ද, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර නොලබන සුල්ලෝ ද වෙත්. අනඳයෙනි, යම් කලෙක වනාහි තථාගත අර්හත් සම්‍යක් සම්බුදුවරු ලොවැ උපදිද් ද, එකල්හි අන්තොටු පිරිවැජියෝ අසත්කෘත ද අගුරුකෘත ද අමානිත ද අපූජිත ද අනපචිත ද, චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර නොලබන සුල්ලෝ වෙත්. දැන් තථාගත තෙමේත් භික්ෂු සඞ්ඝයාත් ම සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද, චීවරපිණ්ඩපාත ශයනාසනගලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර ලබන සුලු වෙති"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යම් තාක් හිරු නො නගී ද, ඒ තාක් ඒ කද්‍යෝපැණි තෙම බබලයි. හිරු නැගි කල්හි කද්‍යෝපැණි තෙම නටුවා වූ ප්‍රභා ඇත්තේ වේ. නො ද බබලයි.

එසේ යම් තාක් කල් සම්මාසම්බුදුහු ලොවැ නො උපදිත් ද ඒ තාක් ම තාර්කික වූ තීර්ථකයන්ගේ බැබලීම වේ. (යම් කලෙක බුදුහු පහළ වෙත් ද එ කල්හි) තාර්කිකයෝ (දෘෂ්ටිගතිකයෝ) නො බබලත්. ඔහු සව්වෝ ද නො බබලත්. මිසදිටු ගත් ඔහු දුකින් නො මිදෙත්."

### සවන ජාත්‍යන්ධවර්ගය යි.

එහි උද්දානය:

ආයු ජටිල පච්චවෙක්ඛණ යන සූත්‍ර ද, තීර්ථක සූත්‍ර තුන ද, සුභූති ගණිකා හා නවවන උපාතිධාවන සූත්‍රය ද, තථාගතුප්පාද සූත්‍රය ද යි ඒ සූත්‍ර දශ දෙනෙකි.

# චූළවග්ගො සත්තමො

## 7. 1.

### පඨමභද්දියසුත්තං

1. එවං මෙ සුත්තං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** ආයස්මන්තං **ලකුණ්ටකභද්දියං** අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. අථ ඛො ආයස්මතො ලකුණ්ටකභද්දියස්ස ආයස්මතා සාරිපුත්තෙන අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සියමානස්ස සමාදපියමානස්ස සමුත්තෙජියමානස්ස සම්පහංසියමානස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. අද්දසා ඛො භගවා ආයස්මන්තං ලකුණ්ටකභද්දියං ආයස්මතා සාරිපුත්තෙන අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සියමානං සමාදපියමානං සමුත්තෙජියමානං සම්පහංසියමානං, අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චමානං.[1]

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"උද්ධං අධො[2] සබ්බධි විප්පමුත්තො
අයමහමස්මී'ති[3] අනානුපස්සී,
එවං විමුත්තො උදතාරි ඔඝං
අතිණ්ණපුබ්බං අපුනබ්භවායා"ති.

## 7. 2.

### දුතියභද්දියසුත්තං

1 එවං මෙ සුත්තං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** ආයස්මන්තං **ලකුණ්ටකභද්දියං** සෙඛං මඤ්ඤමානො භිය්‍යොසොමත්තාය අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. අද්දසා ඛො, භගවා ආයස්මන්තං සාරිපුත්තං ආයස්මන්තං ලකුණ්ටකභද්දියං සෙඛං මඤ්ඤමානං[4] භිය්‍යොසොමත්තාය අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සෙන්තං සමාදපෙන්තං සමුත්තෙජෙන්තං සම්පහංසෙන්තං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"අච්ඡෙච්ඡි[5] වට්ටං බ්‍යගා නිරාසං විසුක්ඛා සරිතා න සන්දති,
ඡින්නං වට්ටං න වත්තති එසෙවන්තො දුක්ඛස්සා"ති.

---

1. විමුත්තං, සී. 2. අධො ච, සී. 3. අයං අහමස්මි, සී. සාළුවි. 4. මඤ්ඤමානො, සී.
5. අච්ඡෙජ්ජි, සීමු.

# සත්වන චූලවග්ගය

## 7. 1.

### ප්‍රථම භද්දියසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **දෙව්රම්** නම් වූ අනේපිඩුහු අරමෙහි වැඩ වසන සේක. එසමයෙහි වනාහි **සැරියුත්** තෙරණුවෝ **ලකුණ්ටකභද්දිය** තෙරුනට නොයෙක් කරුණින් දහැම් කතායෙන් අනිත්‍ය ලක්ෂණාදිය දක්වති. තිලකුණු අරමුණු කොට ඇති විවසුන ගන්වති. එහි ඔවුන් සිත තියුණු කරති. එහි ඔවුන් සිත තුටුපහටු කරවති. ඉක්බිත්තෙන් සැරියුත් තෙරුන් විසින් නොයෙක් කරුණින් දහැම් කතාවෙන් ත්‍රිලක්ෂණාදිය දක්වනු ලබන, විවසුන් ගන්වනු ලබන, එහි සිත තියුණු කරනු ලබන, එහි සිත තුටුපහටු කරනු ලබන ලකුණ්ටකභද්දිය තෙරුන්ගේ සිත ආස්‍රවයන් කෙරෙන් මිදුණේ ය. භාග්‍යවතුන් වහන්සේ, සැරියුත් තෙරුන් විසින් නොයෙක් කරුණින් දහැම් කතායෙන් අනිත්‍යලක්ෂණාදිය දක්වනු ලබන, විවසුන් ගන්වනු ලබන, එහි සිත තියුණු කරනු ලබන, එහි සිත තුටු කරවනු ලබන, උපාදාන රහිත ව ආස්‍රව-කෙරෙන් සිත මුදලන ලකුණ්ටකභද්දිය තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ:

"උඩ රූපාරූප ලොකයෙහි ද, යටැ කාම ලොකයෙහි ද සියලු සංස්කාර-යෙහි හැම අයුරෙන් ම (කෙලෙසුන්ගෙන්) මිදුණු (රූපාදියෙහි) "මේ මම් වෙමි'යි නො දක්නා, මෙසේ මිදුණු රහත් තෙමේ පෙර තරණය නො කළ කාමාදි චතුර්විධ ඕඝය නැවැත සසරැ නො වනු පිණිස (හෙවත් නිවන් පිණිස) තරණය කොට එ ගොඩැ සිටියේ ය."

## 7. 2.

### ද්විතීය භද්දිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි; එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර **දෙව්රම්** නම් වූ අනේපිඩුහු අරමැ වැඩ වසන සේක. එසමයෙහි වනාහි **සැරියුත්** තෙරණුවෝ **ලකුණ්ටකභද්දිය** තෙරුන් ශෛක්ෂයකු කොට හඟිනුවෝ පමණ ඉක්මැ නොයෙක් කරුණින් දහැම් කතාවෙන් අනිත්‍යාදිය දක්වයි, ගන්වයි, එහි තියුණු කෙරෙයි, තුටු පහටු කෙරෙයි. භාග්‍යවතුන් වහන්සේ ලකුණ්ටකභද්දිය තෙරුන් ශෛක්ෂයකු කොට හඟිමින් පමණ ඉක්මැ නොයෙක් කරුණින් දහැම් කතාවෙන් අනිත්‍යාදිය දක්වන, ගන්වන, එහි තියුණු කරන, තුටු පහටු කරන සැරියුත් තෙරුන් දුටු සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූහ:

"කෙලෙස්වට මුල් සින්දේ ය. නිරාශය (නිවන) අවබොධ කෙළේ ය. තෘෂ්ණාතදිය වියැලිණ. මෙයින් පසු එය නො ගලයි. (එ හෙයින්) කම්වට නො පවතී. මෙය ම දුකේ කෙළවර යි."

### 7. 3.

### සත්තසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**. තෙන ඛො පන සමයෙන සාවත්ථියා මනුස්සා යෙභුය්‍යෙන කාමෙසු අතිවෙලං සත්තා[1] රත්තා ගිද්ධා ගථිතා[2] මුච්ඡිතා අජ්ඣොපන්නා සම්මත්තකජාතා[3] කාමෙසු විහරන්ති. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ සාවත්ථියා මනුස්සා යෙභුය්‍යෙන කාමෙසු අතිවෙලං සත්තා[1] රත්තා ගිද්ධා ගථිතා[2] මුච්ඡිතා අජ්ඣොපන්නා සම්මත්තකජාතා[3] කාමෙසු විහරන්තී'ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා[4]
සඤ්ඤොජනෙ වජ්ජමපස්සමානා,
න හි ජාතු සඤ්ඤොජනසඞ්ගසත්තා
ඔඝං තරෙය්‍යුං විපුලං මහන්තං''ති.

### 7. 4.

### දුතියසත්තසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**. තෙන ඛො පන සමයෙන සාවත්ථියා මනුස්සා යෙභුය්‍යෙන කාමෙසු සත්තා[5] රත්තා ගිද්ධා ගථිතා[6] මුච්ඡිතා අජ්ඣොපන්නා අන්ධීකතා සම්මත්තකජාතා[7] කාමෙසු විහරන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සාවත්ථියා තෙ මනුස්සෙ යෙභුය්‍යෙන කාමෙසු සත්තෙ ගිද්ධෙ ගථිතෙ[2] මුච්ඡිතෙ අජ්ඣොපන්නෙ අන්ධීකතෙ සම්මත්තකජාතෙ[7] කාමෙසු විහරන්තෙ.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

''කාමන්ධා ජාලසඤ්ඡන්නා තණ්හාඡදනඡාදිතා,
පමත්තබන්ධුනා බද්ධා මච්ඡා'ව කුමිනාමුඛෙ,
ජරාමරණං ගච්ඡන්ති වච්ඡො ඛීරූපකොව මාතරං''ති.

---

1. සත්තා හොන්ති, සබ්බත්ථ. 2. ගධිතා, ම. 3. සම්පත්තකජාතා, සී. 4. කාමෙසු සඞ්ගා, සී. 5. සත්තා හොන්ති, සබ්බත්ථ. 6. ගධිතා, ම. 7 සම්පත්තකජාතා, සී.

## 7. 3.

### සත්ත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** **දෙව්රම්** නම් වූ අනේපිඩුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි සැවැත්නුවර මිනිස්සු බොහෝ සෙයින් අධික වෙලාවක් (ඉම ඉක්මැ)කාමයන්හි ඇලුණාහු රුඳුණාහු ගිජු වූවාහු වෙළුණාහු මුසපත් වූවාහු ගැලුණාහු, කාමයන්හි ඉතා මත් වූවාහු වෙසෙත්. එ කල්හි බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පෙරෙවැ, පාසිවුරු ගෙන, සැවැතට පිඩු පිණිස පිවිසියහ සැවැතෙහි පිඩු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, එක් පසෙක හුන්හ. එක් පසෙක හුන් ම ඒ භික්ෂූහු "වහන්ස, මෙහි සැවැත්හි මිනිස්සු බෙහෙවින් අධික වේලා (ඉම ඉක්මැ) කාමයන්හි ඇලුණාහු රුඳුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු, ගැලුණාහු, කාම-යන්හි ඉතා මත් වූවාහු වෙසෙති"යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"වස්තුකාමයන්හි ක්ලේශකාමයෙන් ඇලුණු, වස්තුකාමයන්හි රාගාදි සඞ්ගවලින් ලැගුණු, සංයොජනයෙහි (කාමරාගාදි ක්ලේශ සමූහයෙහි) දොස් නො දක්නා, සංයොජන සඞ්ඛ්‍යාත සඞ්ගයෙන් ත්‍රෛභූමක ධර්මයන්හි ඇලුණු සත්ත්වයෝ පතළා වූ මහත් වූ කාමාදි ඕඝය කිසි කලෙකත් තරණය කට හැකි නො වන්නාහ."

## 7. 4.

### දෙවෙනි සත්තසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී; එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** **දෙව්රම්** නම් වූ අනේපිඩුහු අරම්හි වැඩ වසන සේක. එ කල්හි වනාහි සැවැත්නුවර මිනිස්සු බෙහෙවින් කාමයන්හි ඇලුණෝ රුඳුණෝ ගිජු වූවෝ ගෙතුණෝ මුස පත් වූවෝ ගැලුණෝ අන්ධ බවට පමුණුවන ලදුවෝ, කාම-යන්හි ඉතා මත්වූවෝ වෙසෙත්. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙන සැවැතට පිඩු පිණිස වන් සේක. භාග්‍යවතුන් වහන්සේ ඒ මිනිසුන් සැවැතෙහි බෙහෙවින් කාමයන්හි ඇළුණවුන් රුඳුණවුන් ගිජුවූවන් ගෙතුණවුන් .මුස පත්වූවන් ගැලුණවුන් අන්ධබවට පමුණුවනු ලැබූවන් කාමයන්හි ඉතා මත්වූවන් දුටු සේක.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"කාමයෙන් අන්ධ වූ, තෘෂ්ණාදැලින් වැසුණු, තෘෂ්ණා සෙවෙණියෙන් වසා ගන්නා ලද, මරහු විසින් බඳනා ලද සත්හු කෙමනමුවට වන් මසුන් මෙන් කිරිබොන වස්සා මව අනුව යන්නාක් මෙන් ජරාමරණය කරා යෙත්."

## 7. 5.

### ලකුණ්ටකභද්දියසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **ලකුණ්ටකභද්දියො** සම්බහුලානං භික්ඛූනං පිට්ඨිතො පිට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං ලකුණ්ටකභද්දියං දූරතොව සම්බහුලානං භික්ඛූනං පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡන්තං දුබ්බණ්ණං දුද්දසිකං ඔකොටිමකං යෙභුය්‍යෙන භික්ඛූනං පරිභූතරූපං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං භික්ඛුං දූරතො'ව සම්බහුලානං භික්ඛූනං පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡන්තං දුබ්බණ්ණං දුද්දසිකං ඔකොටිමකං යෙභුය්‍යෙන භික්ඛූනං පරිභූතරූපන්ති.

2. එවං භන්තෙ'ති. එසො භික්ඛවෙ භික්ඛු මහිද්ධිකො මහානුභාවො. න ච සා සමාපත්ති සුලභරූපා යා තෙන භික්ඛුනා අසමාපන්නපුබ්බා. යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"නෙලඞ්ගො සෙතපච්ඡාදො එකාරො වත්තති රථො,
අනීඝං පස්ස ආයන්තං ඡින්නසොතං අබන්ධනං"ති.

## 7. 6.

### තණ්හාක්ඛයසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **අඤ්ඤාතකොණ්ඩඤ්ඤො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය තණ්හාසඞ්ඛයවිමුත්තිං පච්චවෙක්ඛමානො. අද්දසා ඛො භගවා ආයස්මන්තං අඤ්ඤාත[1] කොණ්ඩඤ්ඤං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය තණ්හාසඞ්ඛයවිමුත්තිං පච්චවෙක්ඛමානං.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

---

1 අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො, සද්දනීති.

## 7. 5.

## ලකුණ්ටකභද්දිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම්වූ අනේපිඬුසිටුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **ලකුණ්ටකභද්දිය** තෙරණුවෝ බොහෝ භික්ෂූන් පසු පසින් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. බොහෝ භික්ෂූනට පසුපසින් දුරින් ම එන දුර්වර්ණ වූ අප්‍රිය දකුම් ඇති, මිටිවූ බෙහෙවින් (ඡබ්බග්ගියාදි) පුහුදුන් මහණුන් විසින් පිරිහෙළන ලද අයුරු ඇති ලකුණ්ටකභද්දිය තෙරුන් භාග්‍යවතුන් වහන්සේ දුටු සේක. දක භික්ෂූන් බණවා, "මහණෙනි, දුරින් ම බොහෝ භික්ෂූනට පසුපසින් එන නොමනා පැහැ ඇති, නොමනා දකුම් ඇති, අඟුටු මිටි වූ, බෙහෙවින් පුහුදුන් මහණුන් විසින් පිරිහෙළන ලද අයුරු ඇති තෙල මහණහු තෙපි දක්නහු ද?"යි අසා වදාළ සේක.

2. "එසේ ය වහන්සැ"යි ඒ භික්ෂූහු කීහ. "මහණෙනි, මේ මහණ තෙම මහත් සෘද්ධි ඇත්තේ ය, මහත් අනුභාව ඇත්තේ ය. ඒ මහණහු යමක් නො සමවත් විරූ නම් එසේ වූ සමවතෙක් සුලභ නො වේ. යමක් පිණිස කුල-පුත්තු මොනොවට ගිහිගෙන් නික්මැ සසුන් වදිත් නම්, ඒ නිරුත්තර වූ, මගබඹසරෙහි කෙළවර වූ රහත්බව මෙ අත්බව්හි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ" යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා, එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

"සුපිරිසිදු සිල් නැමැති නිදෙස් මං ඇති, අර්හත්ඵල විමුක්ති නැමැති සුදු වැසුම් ඇති, සිහි නැමැති එක ම අරයක් ඇති, (එ මහණහුගේ) ආත්මභාව නැමැති රථය පවතී. සැලුම් නැති පිරිසුන් වැගුරුම් ඇති, බැඳුම් නැති එන්නා වූ එ මහණ බල."

## 7. 6.

## තණ්හාක්ඛය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ අනේපිඬුසිටුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා තෘෂ්ණාසංක්ෂය විමුක්තිය (හෙවත් රහත්පල සමවත) නුවණින් බලමින් හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා තෘෂ්ණාසංක්ෂය විමුක්තිය (හෙවත් රහත්පල සමවත) නුවණින් බලමින් හුන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යස්ස මූලා[1] ඡමා නත්ථි පණ්ණා නත්ථි කුතො ලතා,
තං ධීරං බන්ධනා මුත්තං කො තං නින්දිතුමරහති?
දෙවාපි තං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො"ති.

7. 7.

## පපඤ්චඛයසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා අත්තනො පපඤ්චසඤ්ඤාසඞ්ඛාපහාණං පච්චවෙක්ඛමානො නිසින්නො හොති.

2. අථ ඛො භගවා අත්තනො පපඤ්චසඤ්ඤාසඞ්ඛාපහාණං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"යස්ස පපඤ්චා ඨිති ච නත්ථි
සන්දානං[2] පලිඝඤ්ච වීතිවත්තො,
තං නං නිත්තණ්හං මුනිං චරන්තං
නාවජානාති සදෙවකො'පි ලොකො"ති.

7. 8.

## කච්චානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකච්චානො** භගවතො අවිදූරෙ නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතාය. අද්දසා ඛො භගවා ආයස්මන්තං මහාකච්චානං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතාය.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"යස්ස සියා සබ්බදා සති සතතං කායගතා උපට්ඨිතා,
නො චස්ස නො ච මෙ සියා න භවිස්සති න ච මෙ භවිස්සති,
අනුපුබ්බවිහාරී තත්ථ සො කාලෙනෙව තරෙ විසත්තිකං"ති.

---

1. මූලං, සී. 2. බන්ධනං, මුද්දිතට්ඨකථා

"යමකුහට අත්බවට මුල් වූ අවිද්‍යාවත් එයට පිහිටීමට හෙතු වූ (ආශ්‍රව නීවරණ අයොනිසොමනසකාර සංඛ්‍යාත) භූමියත් නැද්ද, මානාතිමානාදි ප්‍රභෙද ඇති කෙලෙස් ලතාවත් මදප්‍රමාද මායා ආදි කොළත් නැද්ද, එසේ වූ ඒ බන්ධනයෙන් මිදුණු ධීරයාට කවරෙක් නින්‍දා කරන්නට සුදුසු ද? දෙවියෝ ද ඔහු පසසති. බඹහු විසිනුත් හේ පුදන ලද්දේ වේ."

## 7. 7.

## පපඤ්චක්ඛය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර, දෙව්රම් නම් වූ අනේපිඩුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රපඤ්චයන් සහගිය සංඥාවන්ගේ කොටස්වල ප්‍රහාණය නුවණින් සලකමින් වැඩහුන් සේක් වෙති.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ ප්‍රපඤ්චසංඥාවන්ගේ කොටස්වලැ ප්‍රහාණය දැන (සලකා) එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමකුහට ප්‍රපඤ්චයෝත් ඔවුන් විසින් කරන ලද සසර සිටීමත් නැද්ද, සඥන සංඛ්‍යාත තෘෂ්ණා දණ්ඩහුත් නැද්ද, යමෙක් පළිඝ සංඛ්‍යාත අවිද්‍යාවත් ඉක්මැවී ද, සිව් ඉරියව්වෙන් කල් යවන, තෘෂ්ණාරහිත වූ ඒ මුනිහට දෙවියන් සහිත ලොව ද අවඥා නො කෙරේ."

## 7. 8.

## කච්චාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර, දෙව්රම් නම් වූ අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි මහකසසින් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ කය සෘජු කොට තබා කමටහන් අරමුණට යොමු කොට මොනොවට එළැඹැවූ කායගතසමෘතියෙන් වැඩ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ එසේ නොදුරෙහි පලක් බැඳ...... හුන් මහකසසින් තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමකුට හැම විට ම කායගතාසතිය එළඹ සිටිනී වේ ද, 'අතීත කර්මකෙලශ මාහට නො වී නම්, වර්තමාන අත්බව මාහට නො වන්නේ ය. වර්තමාන කර්මකෙලශ නොවී නම් අනාගතයෙහි මාහට අත්බවෙක් නො වන්නේ යයි දන්නේ ද, එහි පිළිවෙළින් උදයව්‍යයඥානාදීන් විදර්ශනා විහරණ ඇති හේ සුදුසු කල්හි ම තෘෂ්ණාව තරණය කරන්නේ ය."

## 7. 9.

## උදපානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **මල්ලෙසු** චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන **ථූනං**[1] නාම මල්ලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො, ථූනෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං ථූනං අනුප්පත්තො'ති. උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති.

2. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන අඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං **ආනන්දං** ආමන්තෙසි: 'ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ඉදානි සො භන්තෙ, උදපානො ථූනෙය්‍යකෙහි බ්‍රාහ්මණ-ගහපතිකෙහි තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරිතො, 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ -පෙ- අපංසූති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද එතම්හා උදපානා පානීයං ආහරා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සො උදපානො තෙනුපසඞ්කමි.

3. අථ ඛො සො උදපානො ආයස්මන්තෙ ආනන්දෙ උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: අච්ඡරියං වත! භො, අබ්භුතං වත! භො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසී'ති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: අච්ඡරියං' භන්තෙ, අබ්භුතං' භන්තෙ. තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සො භන්තෙ උදපානො මයි උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො[2] මඤ්ඤෙ අට්ඨාසි. පිවතු භගවා පානීයං, පිවතු සුගතො පානීයං'ති.

4. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"කිං කයිරා උදපානෙන ආපා චෙ[2] සබ්බදා සියුං,
තණ්හාය මූලතො ඡෙත්වා කිස්ස පරියෙසනං චරෙ"ති.*

---

* කිං කුර්‍යාදුදපානෙන ආපශ්චෙත් සර්වතො යදි
ඡිත්වා මූලං තෘෂ්ණායාඃ කස්‍ය පර්‍යෙෂණාං චරෙත්. (දිව්‍යාවදාන. 3,3.)

1. ථූණං, ම. 2 ආපා ච, සීමු.

# 7. 9.

## උදපාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා හා මල්ල රටෑ සැරි සරන සේක්, මල්ලයන්ගේ ථූන නම් වූ බමුණුගමට බැස වදාළ සේක 'සැහැපුත් වූ සැහැකුලයෙන් පැවිදි වූ මහණ ගොයුම්හු වනාහි මහත් භික්ෂුසඞ්ඝයා හා මල්ල රටෑ සැරිසරනුවෝ ථූන ගමට පැමිණියහ'යි ථූන ගම් වැසි බමුණු ගැහැවියෝ ඇසූහ. ඔහු ඒ මුඬු මහණහු පැන් නො බොත්ව'යි තණකොළින් ද පිදුරෙන් ද ළිඳ මුවවිට දක්වා ම පිරවූහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මඟින් ඉවත් වැ එක්තරා රුක්මුලක් කරා එළැඹි සේක. එළැඹ පණවන ලද අස්නෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ ම භාග්‍යවතුන් වහන්සේ අනඳතෙරුන් බණවා, අනඳයෙනි, තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව'යි වදාළ සේක. එසේ වදාළ කල්හි, ආනන්‍ද තෙරණුවෝ 'වහන්ස, 'ඒ මුඬු මහණහු පැන් නො බොත් ව'යි කියා ථූන ගම් වැසි බමුණු ගැහැවියන් විසින් ඒ ළිඳ තණකොළිනුත් පිදුරෙනුත් මුවවිට තෙක් ම දූත් පුරවන ලද'යි සැළ කළහ. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් බණවා, ... වදාළ සේක. දෙවෙනි වර ද අනඳතෙරණුවෝ ...'පැන් නොබොත් ව'යි තණකොළිනුත්...පුරවන ලද"යි සැළ කළහ. තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ 'අනඳයෙනි, තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව' යි වදාළ සේක. 'එසේ ය වහන්සැ'යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පාත්‍රය ගෙන ඒ ළිඳ කරා එළැඹියහ.

3. එ කල්හි ඒ ළිඳ අනඳ තෙරුන් එළැඹෙන විටැ ඒ සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට මුවවිට දක්වා ම පිරිසිදු නොකැලඹුණු වෙසෙසින් පැදුණු දියෙන් පිරුණේ පිටතට දිය නික්මවන්නක්හු මෙන් සිටියේ ය. එකල්හි අනඳ තෙරණුවන්හට 'පින්වත්නි, තථාගතයන් වහන්සේගේ මහත් සෘද්ධි ඇති නියාව මහත් අනුභාව ඇති නියාව ආශචර්‍ය්‍ය ය. අද්භූත ය! මේ ළිඳ මා එළැඹෙන කල්හි සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට පියා පිරිසිදු නොකැලැඹුණු වෙසෙසින් පහන් වූ දියෙන් මුවවිට දක්වා, පිරුණේ පිටතට දිය නික්මවමින් මෙන් සිටියේ යැ'යි මෙ සිත විය. මෙසේ සිතා පාත්‍රයෙන් පැන් ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළැඹ 'වහන්ස, තථාගතයන් වහන්සේගේ මහත් සෘද්ධි ඇති බව මහත් අනුභාව ඇති බව ආශචර්‍ය්‍යය අද්භූත ය. වහන්ස, ඒ මේ ළිඳ මා එළැඹෙන කල්හි සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට පියා පිරිසිදු නොකැලැඹුණු වෙසෙසින් පහන් වූ දියෙන් මුවවිට දක්වා පිරුණේ පිටතට දිය නික්මවමින් මෙන් සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ පැන් වළඳන සේක්වා, සුගතයන් වහන්සේ පැන් වළඳන සේක්වා'යි කීහ.

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"හැම කල්හි (හැමතැන ම) දිය ඇත් නම්, ඒ ළිඳෙන් කවර ප්‍රයොජන ද? තෘෂ්ණා පිපාසාවගේ මුල සිඳ සිටි මා වැන්නෙක් කවර හෙයින් දිය සොයා ඇවිදුනේ ද? නො ඇවිදුනේ ම ය."

## 7. 10.

### උදෙනසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ.** තෙන ඛො පන සමයෙන රඤ්ඤො **උදෙනස්ස** උය්‍යානගතස්ස අන්තෙපුරං දඩ්ඪං හොති, පඤ්ච ච ඉත්ථිසතානි කාලඞ්කතානි හොන්ති සාමාවතිප්පමුඛානි. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කොසම්බිං පිණ්ඩාය පවිසිංසු. කොසම්බියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ රඤ්ඤො උදෙනස්ස උය්‍යානගතස්ස අන්තෙපුරං දඩ්ඪං, පඤ්ච ච ඉත්ථිසතානි කාලඞ්කතානි හොන්ති සාමාවතිප්පමුඛානි. තාසං භන්තෙ, උපාසිකානං කා ගති, කො අභිසම්පරායො'ති.

2. සන්තෙත්ථ භික්ඛවෙ, උපාසිකායො සොතාපන්නා, සන්ති සකදාගාමිනියො, සන්ති අනාගාමිනියො, සබ්බා[2] තා භික්ඛවෙ උපාසිකායො අනිප්ඵලා කාලඞ්කතා'ති.[3]

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

"මොහසම්බන්ධනො ලොකො භබ්බරූපො'ව දිස්සති,
උපධිසම්බන්ධනො බාලො තමසා පරිවාරිතො,
සස්සති විය ඛායති පස්සතො නත්ථි කිඤ්චනං"ති.[4]

**චුල්ලවග්ගො සත්තමො.**

තස්සුද්දානං:

"ද්වෙ භද්දියා ද්වෙ ච සත්තා ලකුණ්ටකො තණ්හාක්ඛයො,[4]
පපඤ්චඛයො ච කච්චානො උදපානඤ්ච උදෙනො"ති.

---

2. සද්ධා, සී. 3. අනිප්ඵලානි කාලඞ්කතානි, සී.
4. මොහසංවර්ධිතො ලොකො භව්‍යරූප ඉව දෘශ්‍යතෙ
උපධිබන්ධනා බාලාස්තමසා පරිවාරිතාඃ
සන් සදිති පශ්‍යන්ති පශ්‍යතාං නාස්ති කිඤ්චන. (දිව්‍යාවදාන. 36. 24.)

## 7. 10.

## උදෙන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **කොසොඹෑ** නුවර **ඝොෂිතාරාමයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි **උදයන** රජ්ජුහු උයන් යාදී ඇතොවුර ගිත්තෙන් **දැවී** ගියේ වෙයි. සාමාවති **දෙවිය** ප්‍රමුඛ කොටැති පන්සියක් සත්‍රිහු කලුරිය කළාහු වෙත්. එ කල්හි බොහෝ **භික්ෂූහු** පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන කොසොඹෑ පුරයට පිඬු පිණිස පිවිසියහ. කොසොඹෑ පුරැ පිඬු පිණිස හැසිරැ පසුබත්හි පිණ්ඩපාත-යෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළඹැ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ, එක් පසෙකැ හුන්හ. එක් පසෙක හුන්නාවූ ම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මෙහි උදෙන රජ් උයන් යාදී ඇතොවුර දැ ගියේ ය. සාමාවති ප්‍රමුඛ පන්සියක් සත්‍රිහු කලුරිය කළාහු වෙති යි සැළ කොට 'වහන්ස, ඒ උවැසියන්ගේ මරණින් පසු ගතිය කවර යැ? පරලොව කවර යැ?'යි විචාළහ.

2. "මහණෙනි, ඔවුන් අතුරෙහි සෝවන් උවැසියෝ ඇත. සෙදගැමි උවැසියෝ ඇත. අනැගැමි උවැසියෝ ඇත. මහණෙනි, ඒ සියලු උවැසියෝ පැමිණි ශ්‍රාමණ්‍යඵල ඇත්තාහු ම එහෙයින් නිෂ්ඵල නො වැ කලුරිය කළහ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ:

"මොහය හා එකට බැඳුණු සත්ත්වලොකය හෙතු සමපන්නයක්හු මෙන් දක්නා ලැබේ. උපධීන් හා බැඳුණු අඥාන තෙම අවිද්‍ය අඳුරින් පිරිවැරුණේ සදහාවි මෙන් සලකයි. සංසකාරයන් අනිත්‍යාදීන් බලන්නහුට (රාගාදි) කිඤ්චනයෙක් නැත."

## සත්වන සුළුවගයි.

එහි උද්දානය:

භද්දිය සූත්‍ර දෙක ද, සත්තසූත්‍ර දෙක ද ලකුණ්ටකභද්දිය සූත්‍රය ද තණ්හා-ක්ඛය සූත්‍රය ද, පපඤ්චක්ඛය සූත්‍රය ද, කච්චාන සූත්‍රය ද උදපාන සූත්‍රය ද උදෙන සූත්‍රය දැ යි සූත්‍ර දශයෙකි.

# පාටලිගාමියවග්ගො අට්ඨමො

## 8. 1.

### පඨමනිබ්බානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බානපටිසංයුත්තාය ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා[1] මනසි කත්වා සබ්බං චෙතසො[2] සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"අත්ථි භික්ඛවෙ, තදායතනං, යත්ථ නෙව පඨවී, න ආපො, න තෙජො, න වායො, න ආකාසානඤ්චායතනං, න විඤ්ඤාණඤ්චායතනං, න ආකිඤ්චඤ්ඤායතනං, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, නායං ලොකො, න පරලොකො, න උභො චන්දිමසූරියා. තත්‍රාපාහං භික්ඛවෙ, නෙව ආගතිං වදාමි, න ගතිං, න ඨිතිං, න චුතිං, න උපපත්තිං. අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙවෙතං. එසෙවන්තො දුක්ඛස්සා"ති.

## 8. 2.

### දුතියනිබ්බානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බානපටිසංයුත්තාය ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"දුද්දසං අනතං[3] නාම න හි සච්චං සුදස්සනං,
පටිවිද්ධා තණ්හා ජානතො පස්සතො නත්ථි කිඤ්චනං"ති.

---

1. අට්ඨිකත්වා, සී. 2. සබ්බචෙතසො - ඉතිපි පාඨො.
3. අනත්තං - ඉතිපි පඨන්ති, අට්ඨකථා.

# අටවන පාටලිගාමිය වර්ගය

## 8. 1.

## පළමුවන නිර්වාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර **දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට නිවන් පිළිබඳ වූ ධර්මකථායෙන් නිවන්තතු දක්වන සේක. එය ගන්වන සේක. එය ගැන්මෙහි උත්සාහවත් කරන සේක. නිවන්ගුණයෙන් මොනොවට සතුටු කරන සේක. ඒ මහණහු ද ඒ දෙශනායෙන් ප්‍රයොජන ඇති ව, ඒ දෙශනාව සිත්හි කොට මුළු සිතින් සමනා නතු කළ කන් ඇත්තාහු බණ අසත්.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"මහණෙනි, යමෙක්හි පෘථිවිධාතුව නැද්ද, ආපොධාතුව නැද්ද, තෙජොධාතුව නැද්ද, වායුධාතුව නැද්ද, ආකාසානඤ්චායතන සිත නැද්ද, විඤ්ඤාණඤ්චායතන සිත නැද්ද, ආකිඤ්චඤ්ඤායතන සිත නැද්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත නැද්ද, මේ (සකන්ධ) ලොකය නැද්ද, මෙයින් උපදනා අන්‍ය (සකන්ධ) ලොකයෙකුත් නැද්ද, (එහි අඳුරක් නැති බැවින් අඳුර දුර ලන්නට) සඳහිරු දෙදෙනෙකුත් නැද්ද, එසේ වූ ඒ ආයතනය (මාර්ග ඵලසිතට අරමුණුවන නිවන) ඇත. මහණෙනි, එහිත් කිසිවකුගේ ඊමක් යැමක් සිටීමක් මරණයක් මැරී ඉපැත්මක් නො කියමි. මෙය කිසිවෙක නො පිහිටි, ප්‍රත්‍යයයන්ගෙන් නො පවත්නා, කිසි ම අරමුණෙක නො එල්බෙන දහමෙකි. මෙය ම දුකෙහි කෙළවර ය."

## 8. 2.

## දෙවන නිර්වාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර **දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට නිවන පිළිබඳ වූ ධර්මකථායෙන් නිවන් තතු දක්වන සේක. ගන්වන සේක. එහි උත්සාහවත් කරන සේක. සතුටු කරන සේක. ඒ මහණහු ද එයින් ප්‍රයොජන ඇති ව ඒ දෙසුම සිත්හි කොට මුල පටන් ම මොනොවට සිතට ගෙන (නුවණින් සලකා) නතු කළ කන් ඇත්තාහු බණ අසත්.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"(ස්වභාවයෙන් ගැඹුරු බැවින් ඉතා සියුම් බැවින් නුවණ නො මුහුකළවුන් විසින්) දක්ක නොහැකි, තෘෂ්ණා රහිත, එකාන්තයෙන් ඇත්තා වූ නිවන නම් සුවසේ දක්ක හැකි නො වේ. ප්‍රහාණාභිසමය වශයෙන් තෘෂ්ණාව පිළිවිදුනා ලදී. අරිමඟනුවණින් දන්නාහට දක්නාහට තෘෂ්ණා පරිබොධයෙක් නැත."

8. 3.

## තතියනිබ්බානසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බානපටිසංයුත්තාය ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අත්ථි භික්ඛවෙ, අජාතං අභූතං අකතං අසඞ්ඛතං. නො චෙ තං භික්ඛවෙ, අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායතී"ති.

8. 4.

## චතුත්ථනිබ්බානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූ නිබ්බානපටිසංයුත්තාය ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ ච භික්ඛූ අට්ඨිං කත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතා ධම්මං සුණන්ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

8. 3.

## තෙවන නිර්වාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර **දෙව්රම්** නම් වූ අනේපිඬුහු අරමෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට නිවන පිළිබඳ දහැමි කතායෙන් (නිවන් තතු) දක්වන සේක, ගන්වන සේක, එහි උත්සාහවත් කරන සේක, සතුටු කරන සේක. ඒ භික්ෂූහු ද ඒ දෙශනායෙන් ප්‍රයොජන ඇති ව, එය සිත්හි කොට, එය මුල පටන් ම මොනොවට සිතට ගෙන (නුවණින් සලකා), නතු කළ කන් ඇත්තාහු බණ අසත්.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"මහණෙනි, (වෙදනාදීන් මෙන් හෙතුප්‍රත්‍යය සමවායයෙන්) නො උපන්, (කාරණයෙන් තොර ව තෙමේ ම) පහළ නොවූ, කිසිවෙකින් නො කරන ලද, ප්‍රත්‍යයෙන් අසංසකෘත වූ නිර්වාණ ධර්මය (පරමාර්ථ වශයෙන්) ඇත. මහණෙනි, මේ හෙතුප්‍රත්‍යයයෙන් නො උපන්, නො පහළ වූ, නො කරන ලද අසංසකෘත නිර්වාණධාතුව (පරමාර්ථවශයෙන්) අවිද්‍යමාන නම්, මෙහි හෙතු-ප්‍රත්‍යයයෙන් උපන්, පහළ වූ, කරන ලද, සංසකෘත වූ, සකන්ධපංචකයාගේ නිඃශරණයෙක් (සංහිඳීමෙක්) නො පැනෙන්නේ ය. (නො ලැබියැ හැකි වන්නේ ය.) මහණෙනි, යම් හෙයෙකින් ම නො උපන්, නො පහළ වූ, නො කරන ලද, අසංසකෘත ධාතුවෙක් පරමාර්ථ වශයෙන් ඇත් ද, එහෙයින් උපන්, පහළ වූ, කරන ලද, සංසකෘත වූ සකන්ධපංචකයාගේ නිඃශරණ-යෙක් (සංහිඳීමෙක්) පැනේ."

8. 4.

## සිවුවන නිර්වාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර **දෙව්රම්** නම් අනේපිඬුහු අරමිහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට නිර්වාණප්‍රතිසංයුක්ත ධර්ම-කථායෙන් (නිවන් තතු) දක්වන සේක, ගන්වන සේක, එහි උත්සාහවත් කරන සේක, සතුටු කරන සේක. ඒ භික්ෂූහු ද ඒ දෙශනායෙන් ප්‍රයොජන ඇති ව, එය සිත්හි කොට, එය මුල පටන් ම මොනොවට සිතට ගෙන (නුවණින් සලකා), නතු කළ කන් ඇත්තාහු බණ අසත්.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක

"නිස්සිතස්ස චලිතං. අනිස්සිතස්ස චලිතං නත්ථි. චලිතෙ අසති පස්සද්ධි. පස්සද්ධියා සති නති න හොති. නතියා අසති ආගති ගති න හොති. ආගති ගතියා අසති චුතූපපාතො න හොති. චුතූපපාතෙ අසති නෙවිධ න හුරං න උභයමන්තරෙ. එසෙවන්තො දුක්ඛස්සා"ති.

## 8. 5.

## චුන්දසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **මල්ලෙසු** චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන **පාවා** තදවසරි. තත්‍ර සුදං භගවා පාවායං විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ.

2. අස්සොසි ඛො චුන්දො කම්මාරපුත්තො: භගවා කිර මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පාවං අනුප්පත්තො පාවායං විහරති මය්හං අම්බවනෙ'ති. අථ ඛො චුන්දො කම්මාරපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

3. අථ ඛො චුන්දො කම්මාරපුත්තො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච: 'අධිවාසෙතු මෙ භන්තෙ, භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

4. අථ ඛො චුන්දො කම්මාරපුත්තො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා පහූතඤ්ච සූකරමද්දවං, භගවතො කාලං ආරොචාපෙසි: කාලො භන්තෙ, නිට්ඨිතං භත්තන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන චුන්දස්ස කම්මාරපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා චුන්දං කම්මාරපුත්තං ආමන්තෙසි: යං තෙ චුන්ද, සූකරමද්දවං පටියත්තං, තෙන මං පරිවිස. යං පනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තං, තෙන භික්ඛුසඞ්ඝං පරිවිසාති.

(තෘෂ්ණාදෘෂ්ටි දෙකින්) සංස්කාරයන් ඇසුරු කළාහට (සුවදුක් ආදිය උපන් කල්හි) සිත්සතන්හි කම්පනය වේ. (තෘෂ්ණාදෘෂ්ටි දෙකින්) සංස්කාරයන් ඇසුරු නොකළාහට (හෙවත් විවසුන් වඩන්නාහට තෘෂ්ණාදෘෂ්ටීන් අනිඃශ්‍රිත බැවින්) කම්පනයෙක් නැත. කම්පනය නැති කල්හි සිත්සතන්හි සංහිඳීම වේ. සංහිඳීම ඇති කල්හි විවසුන් වඩනුවාහට අර්හත්ව මාර්ගක්ෂණයෙහි දී කාමාදි භවයන්හි නැමීම (හෙවත් තෘෂ්ණාව) නො වේ. භවයන්හි නැමීම නැති කල්හි පිළිසඳ විසින් මේ භවයට ඊමෙක් මෙයින් අන් භවයකට යැමෙක් නො වේ. භවයෙන් භවයට ඊමක් යැමක් නැති කල්හි ච්‍යුති උපපත්ති (මරණයට අනතුරු වැ ඉපැත්ම) නො වේ. ච්‍යුති උපපත්ති නැති කල්හි මෙහි (කාමභවයේ) ද එහි (අරූපභවයේ) ද මෙ දෙක අතරේ (රූපභවයේ) ද පැවැත්ම නැත. මෙය ම දුකේ කෙළවර ය."

## 8. 5.

## චුන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා හා **මල්ල** රටැ සැරි සරා වඩනා සේක්, **පාවා** නුවරට පැමිණ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි පාවා නුවර **චුන්ද** කාර්මාර පුත්‍රයාගේ අඹවනයෙහි වැඩ වසන සේක.

2. "භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සමූහයක් හා මල්ල රටැ සැරි සරන සේක්, පාවා නුවරට වැඩි සේක්, පාවානුවර සමීපයේ වූ මාගේ අඹවෙනෙහි වැඩ වසන සේක් ලු"යි චුන්ද කාර්මාරපුත්‍ර ඇසී ය. ඉක්බිති චුන්ද කාර්මාරපුත්‍ර භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එක් පසෙක හුන්නේ ය. එක් පසෙක හුන් චුන්ද කාර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතායෙන් කුසල් දහම් දක්වූ සේක, එය මොනොවට ගැන්වූ සේක, එහි උත්සාහවත් කළ සේක, එහි තුටුපහටු කළ සේක.

3. එ කල්හි චුන්දකාර්මාරපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතායෙන් කුසල් දහම් දක්වන ලද්දේ, මොනොවට ගන්වන ලද්දේ, උත්සාහවත් කරන ලද්දේ, තුටුපහටු කරන ලද්දේ, භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා හා සෙට මාගේ බත ඉවසන සේක්වා"යි කී ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක. ඉක්බිති චුන්ද කාර්මාරපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවැසීම දැන, හුනස්නෙන් නැඟී සිට, භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, පැදකුණු කොට, නික්මැ ගියේ ය.

4. ඉක්බිත්තෙන් චුන්දකාර්මාරපුත්‍ර තෙම එ රැය ඇවෑමෙන් සිය ගෙහි ප්‍රණීත ඛාද්‍ය භොජ්‍ය ද බොහෝ සූකරමාද්දව ද පිළියෙල කරවා "වහන්ස, කාලය පැමිණියේ ය. බත පිළියෙල කොට නිමියේ යැ"යි කල් දන්වා යැවී ය. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පා සිවුරු ගෙන, භික්සඟන හා චුන්ද කාර්මාරපුත්‍රයාගේ ගෙය කරා එළැඹි සේක. එළැඹ පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ ම භාග්‍යවතුන් වහන්සේ චුන්ද කාර්මාරපුත්‍රයා බණවා, "චුන්දයෙනි, යම් සූකරමාද්දවයෙක්[1] තොප විසින් පිළියෙල කරන ලද ද, එයින් මා වළඳවව. යම් අන් ඛාද්‍යභොජ්‍යයෙක් පිළියෙල කරන ලද ද එයින් භික්සඟන වළඳවව"යි වදාළ සේක.

1 සූකරමාර්දව යනු නොයෙක් ඇදුරෝ නොයෙක් ලෙසින් තෝරති. 'නමා මමළ ඌරකුගේ මොළොක් සිනිඳු මසැ'යි මහ අටුවාකරුවෝ කියති 'ඒ ඌරුමස් නොව ඌරන් මැඩි හුණ දළු යැ'යි කෙනෙක් ද, 'ඌරන් මැඩි බිමැ උපන් හතු ය'යි අන් කෙනෙක් ද, එය රසායන විශේෂයකැ'යි තවත් කෙනෙක් ද කියත්. 'මෙය වළඳා භාග්‍යවතුන් වහන්සේ බොහෝ කල් ජීවත් වුවොත් මැනැවැ'යි සිතා ශාස්තෘන් වහන්සේගේ දීර්ඝායුෂ පතා මෙය පිළියෙල කරන ලදැ'යි කෙනෙක් කියත්. (අටුවා.)

5 'එවං භන්තෙ'ති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා යං අහොසි සූකරමද්දවං පටියත්තං, තෙන භගවන්තං පරිවිසි. 'යං පනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තං, තෙන භික්ඛුසඞ්ඝං පරිවිසි.

6. අථ ඛො භගවා චුන්දං කම්මාරපුත්තං ආමන්තෙසි: යං තෙ චුන්ද, සූකරමද්දවං අවසිට්ඨං, තං සොබ්භෙ නිඛණාහි. නාහං තං චුන්ද, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යස්ස තං පරිභුත්තං සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙනා'ති. 'එවං භන්තෙ'ති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා යං අහොසි සූකරමද්දවං අවසිට්ඨං, තං සොබ්භෙ නිඛණිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

7. අථ ඛො භගවතො චුන්දස්ස කම්මාරපුත්තස්ස භත්තං භුත්තාවිස්ස ඛරො ආබාධො උප්පජ්ජි ලොහිතපක්ඛන්දිකා. බාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා. තත්‍ර සුදං භගවා සතො සම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානො.

8. "අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ආයාමානන්ද, යෙන කුසිනාරා තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

"චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා කම්මාරස්සා'ති මෙ සුතං,
ආබාධං සම්ඵුසී ධීරො පබාළ්හං මාරණන්තිකං.

භුත්තස්ස ච සූකරමද්දවෙන
බ්‍යාධිප්පබාළ්හො උදපාදි සත්ථුනො,
විරිච්චමානො භගවා අවොච:
ගච්ඡාමහං කුසිනාරං නගරන්ති."*

* සඞ්ගීතිකාරකත්ථෙරානං ගාථායො.

5. 'එසේය වහන්සැ'යි කියා චුන්ද කාර්මාරපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පිළියෙල කරන ලද යම් සූකරමාද්දවයෙක් වී නම් එයින් භාග්‍යවතුන් වහන්සේ වැළැඳැවීය. යම් අන් ඛාද්‍යභොජ්‍යයෙක් පිළියෙල කරන ලද නම් එයින් භික්සඟන වැළැඳැවීය.

6. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ චුන්දකාර්මාරපුත්‍ර බණවා "චුන්දයෙනි, යම් සූකරමාද්දවයෙක් ඉතිරි ව ඇද්ද, එය වළ ලවු. චුන්දයෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්‍වප්‍රජායෙහි, යමකු විසින් එය වළඳන ලද්දේ මොනොවට දිරීමට යන්නේ නම්, එ වැන්නකු තථාගතයන් හැර මම් නො දකිමි"[1]යි වදළ සේක. 'එසේ ය, වහන්සැ'යි කියා චුන්ද කාර්මාරපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, යම් ඉතිරි සූකරමාද්දවයෙක් වී නම් එය වළ ලා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ වැඳ එක් පසෙක හුන්නේ ය. එක් පසෙක හුන්නාවූ චුන්ද කාර්මාරපුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමිකතායෙන් කටයුතු නොකටයුතු දක්වා, කටයුතු දැය මොනොවට සිතට ගන්වා, එහි උත්සාහවත් කොට, සතුටු කොට හුනස්නෙන් නැඟී වැඩිසේක.

7. ඉක්බිත්තෙන් චුන්ද කාර්මාරපුත්‍රයාගේ බත වැළැඳූ භාග්‍යවතුන් වහන්සේට, (එයින් තුන් මසකට පෙර බෙළුව ගමෙහි දී උපන් ආබාධය මේ තාක් ම දින පතා සමවත් සමවදිමින් මැඩ පවත්වා යට පත් කරන ලද නුමුත් සිය සිරුරෙන් ම සත්ත්වයනට සංවෙගය උපදවන අදහසින් චුන්දයාගේ දානයෙන් පසු එය මතු වන්නට ඉඩ දී සමවත් නො සමවන් බැවින්) කෲර වූ ලොහිතපක්ඛන්දිකා ආබාධය උපන. මරණය ළං කරන තරම් වූ දැඩි දුක් වෙදනාවෝ ඇත. එහි දී භාග්‍යවතුන් වහන්සේ එළැඹ සිටි සිහි ඇති සේක්, නුවණින් පිරිසිඳ දන්නාහු, එයින් නො පෙළෙන්නාහු, එය ඉවැසූ සේක.

8. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන් බණවා, 'ආනන්දයෙනි, එව, යමු. කුසිනාරාව කරා එළැඹෙන්නමු' යි වදළ සේක. 'එසේ ය, වහන්සැ'යි කියා ම ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

"චුන්ද කාර්මාරයාගේ බත වළඳා ඉක්බිති ධීර වූ භාග්‍යවතුන් වහන්සේ ඉතා දැඩි වූ මරණය ළං කරන තරම් වූ ආබාධයක් ස්පර්ශ කළ සේක.

සූකරමාද්දවය හා (බොජුන්) වැළැඳූ ශාස්තෲන් වහන්සේට ඉතා දැඩි ව්‍යාධියෙක් උපන භාග්‍යවතුන් වහන්සේ එක්වන් පැවැති ලොහිතවිරෙචනය ඇති සේක්, 'මම් කුසිනාරා නුවරට යමි'යි වදළසේක."*

---

1. දෙදහසක් කොදිව් පිරිවර කොටැති සතර මහදිවයින්හි දෙවියෝ ඒ සූකරමාර්දවයෙහි දිව ඕජස් බහා දූහ. එ බැවින් කිසිවකු විසින් එය දිරවා ගත නො හෙයි. (අටුවා.)

* මේ ධම් සඞ්ගායකයන්ගේ ගාථා යි.

9. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන අඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි. කිලන්තොස්මි ආනන්ද, නිසීදිස්සාමී”ති. එවං භන්තෙ‘ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, පානීයං ආහර, පිපාසිතොස්මි ආනන්ද, පිවිස්සාමී’ති. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ඉදානි භන්තෙ, පඤ්චමත්තානි සකටසතානි අතික්කන්තානි. තං චක්කච්ඡින්නං උදකං පරිත්තං ලුළිතං ආවිලං සන්දති. අයං භන්තෙ කකුත්ථා නදී අවිදූරෙ අච්ඡොදකා සාතොදකා සීතොදකා සෙතොදකා සුපතිත්ථා රමණීයා. එත්ථ භගවා පානීයඤ්ච පිවිස්සති ගත්තානි ච සීතී කරිස්සතීති. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, පානීයං ආහර. පිපාසිතොස්මි ආනන්ද, පිවිස්සාමී’ති. දුතියම්පි ඛො-පෙ-සීතිං කරිස්සතී’ති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, පානීයං ආහර, පිපාසිතොස්මි ආනන්ද, පිවිස්සාමී‘ති. එවං භන්තෙ’ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සා නදී තෙනුපසඞ්කමි.

10. අථ ඛො සා නදී චක්කච්ඡින්නා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා ආයස්මන්තෙ ආනන්දෙ උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයඤ්හි සා නදී චක්කච්ඡින්නා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා මයි උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දතීති පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයඤ්හි සා භන්තෙ නදී චක්කච්ඡින්නා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා. මයි උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දති. පිවතු භගවා පානීයං. පිවතු සුගතො පානීයන්ති. අථ ඛො භගවා පානීයං අපාසි.

11. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන කකුත්ථා නදී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා කකුත්ථං නදිං අජ්ඣොගාහෙත්වා නහාත්වා ච පිවිත්වා ච[1] පච්චුත්තරිත්වා යෙන අම්බවනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං චුන්දකං ආමන්තෙසි: ‘ඉඞ්ඝ මෙ ත්වං චුන්දක, චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි, කිලන්තොස්මි චුන්දක, නිපජ්ජිස්සාමී’ති. ‘එවං භන්තෙ’ති ඛො ආයස්මා චුන්දකො භගවතො පටිස්සුත්වා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි. අථ ඛො භගවා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා ආයස්මා පන චුන්දකො තත්ථෙව භගවතො පුරතො නිසීදි.

1. පිත්වා ච, ම.

9. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මඟින් පහ වැ එක්තරා රුක්මුලක් කරා වැඩි සේක. වැඩ අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, තෙපි දූන් සඟළ සිවුර සතරපටක් කොට පණවවු. ක්ලාන්තයෙමි. හිඳ ගන්නෙමි'යි වදාළ සේක. 'එසේ ය, වහන්සැ'යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී සඟළ සිවුර සතර පටක් කොට පැනැවූහ. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද එ අස්නෙහි වැඩ හුන් සේක. වැඩහිඳ ම අනඳ තෙරුන් අමතා 'අනඳයෙනි, තෙපි මට පැන් ගෙනෙව. අනඳයෙනි, පවස් ඇත්තෙමි. පැන් බොන්නෙමි'යි වදාළ සේක. මෙසේ වදාළ කල්හි අනඳ තෙරණුවෝ "වහන්ස, දූන් පන්සියක් පමණ ගැල් ඉක්ම ගියේ ය. ඒ ගැල්සකින් සුන් සවල්ප වූ ජලය බොර වූයේ කැළඹුණේ ගලා යෙයි. වහන්ස, පහන් දිය ඇති, මිහිරි දිය ඇති, සිසිල් දිය ඇති, බොර නො වූ දිය ඇති, මනා තොට ඇති මේ කුකුත්‍ථා නදිය නොදුරෙහි ගලා යෙයි. භාග්‍යවතුන් වහන්සේ එහි දී පැන් බොන සේක. ගාත්‍ර ද සිසිල් කැරැ ගන්නා සේකැ"යි කීහ. දෙවෙනි වරද භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා "අනඳයෙනි, දූන් තෙපි මට පැන් ගෙනෙව. අනඳයෙනි, පවස් ඇත්තෙමි. පැන් බොන්නෙමි'යි වදාළ සේක. දෙවනු ද අනඳ තෙරණුවෝ වහන්ස, '...සිසිල් කැරැ ගන්නා සේක් ව'යි කීහ. තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, තෙපි මට පැන් ගෙනෙව. පවස් ඇත්තෙමි. පැන් බොන්නෙමි'යි වදාළ සේක. 'එසේ ය වහන්සැ'යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පාත්‍රය ගෙන ඒ නදිය කරා එළැඹුණහ.

10 එකල්හි ඒ නදිය ගැල්සකින් මැඩුණී, මඳ දිය ඇත්තී බොර වූවා කැලැඹුණී ගලා යන්නී, අනඳ තෙරුන් එළැඹෙන කල්හි පැහැදුණු දිය ඇති ව වෙසෙසින් පහන් ව, නොකැලැඹුණී ගලයි. එ කල්හි අනඳ තෙරුනට "භවත්නි, තථාගතයන් වහන්සේගේ මහත් සෘද්ධි ඇති බව, මහානුභාව ඇති බව එකාන්තයෙන් ආශ්චර්‍ය ය, එකාන්තයෙන් අද්භූත ය. ගැල්සකින් බිඳුණු මඳ දිය ඇති, කැලැඹුණු, බොර ව ගලන මේ නදිය වූ කලි මා එන කල්හි පහන් වැ වෙසෙසින් පැදුණු දිය ඇති ව, නො කැලැඹී ගලා යැ'යි මේ සිත විය. ඉක්බිති පාත්‍රයෙන් පැන් ගෙන, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ, "වහන්ස, තථාගතයන්ගේ මහත් සෘද්ධි ඇති බව, මහානුභාව ඇති බව ආශ්චර්‍ය ය, අද්භූත ය. වහන්ස, මේ නදිය වනාහි ගැල්සකින් බිඳුණී මඳ දිය ඇත්තී, බොර වූවා, කැලැඹුණී ගැලූය. එය මා එළැඹෙන කල්හි පිරිසිදු ව පහන් දිය ඇති ව, කැලැඹුම් නැති ව ගලා යයි. භාග්‍යවතුන් වහන්සේ පැන් වළඳන සේක් වා. සුගතයන් වහන්සේ පැන් වළඳන සේක් වා"යි කීහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පැන් වැළැඳූ සේක:

11. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහත් භික්සඟන කැටුවැ කුකුත්‍ථා නදිය කරා එළැඹුණු සේක. එළැඹ කුකුත්‍ථා නදියට බැස නා ද පැන් වළඳා ද නැවැත ගොඩ නැඟ අඹවනය කරා එළැඹි සේක. එළැඹ චුන්දකතෙරුන් බණවා, 'චුන්දකයෙනි, දූන් මට සඟළ සිවුර සතර පටක් කොට පණවව. චුන්දකයෙනි, ක්ලාන්තයෙමි. වැද හෙන්නෙමි"යි වදාළ සේක. "එසේ ය, වහන්සැ'යි කියා චුන්දක තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, සඟළ සිවුර සතරපටක් කොට පැණැවූහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ දකුණු පයෙහි වම්පය මඳක් හයා තබා සතියෙන් සම්පජඤ්ඤයෙන් යුක්ත වැ නැගිටීමෙහි සංඥව සිත්හි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කළ සේක. චුන්දක තෙරණුවෝ වනාහි එහි ම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි වැඩ හුන්හ.

“ගන්ත්වාන බුද්ධො නදිකං කකුත්ථං
අච්ඡොදකං සාතොදකං විප්පසන්නං,
ඔගාහි සත්ථා සුකිලන්තරූපො
තථාගතො අප්පටිමො’ධ ලොකෙ.

නහාත්වා ච පීත්වා[1] චුදතාරි සත්ථා
පුරක්ඛතො භික්ඛුගණස්ස මජ්ඣෙ,
සත්ථා පවත්තා භගවා’ධ ධම්මෙ
උපාගමි අම්බවනං මහෙසි.

ආමන්තයි චුන්දකං නාම භික්ඛුං
චතුග්ගුණං පත්ථර මෙ නිපජ්ජං,[2]
සො චොදිතො භාවිතත්තෙන චුන්දො
චතුග්ගුණං පත්ථරි ඛිප්පමෙව.

නිපජ්ජි සත්ථා සුකිලන්තරූපො
චුන්දොපි තත්ථ පමුඛෙ නිසීදී”ති.*

12. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “සියා ඛො පනානන්ද, චුන්දස්ස කම්මාරපුත්තස්ස කොචි විප්පටිසාරං උපදහෙය්‍ය: [3]තස්ස තෙ ආවුසො චුන්ද, අලාභා, තස්ස තෙ ආවුසො චුන්ද, දුල්ලද්ධං, යස්ස තෙ තථාගතො පච්ඡිමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා පරිනිබ්බුතො’ති. චුන්දස්ස ආනන්ද, කම්මාරපුත්තස්ස එවං විප්පටිසාරො පටිවිනොදෙතබ්බො: තස්ස තෙ ආවුසො චුන්ද, ලාභා, තස්ස තෙ ආවුසො චුන්ද සුලද්ධං, යස්ස තෙ තථාගතො පච්ඡිමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා පරිනිබ්බුතො. සම්මුඛා මෙතං ආවුසො චුන්ද භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං. ද්වෙ’මෙ පිණ්ඩපාතා සමසමඵලා සමසමවිපාකා, අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරා ච මහානිසංසතරා ච. කතමෙ ද්වෙ? යඤ්ච පිණ්ඩපාතං භුඤ්ජිත්වා තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච පිණ්ඩපාතං භුඤ්ජිත්වා තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති,[4] ඉමෙ ද්වෙ පිණ්ඩපාතා සමසමඵලා සමසමවිපාකා අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරා ච මහානිසංසතරා ච. ආයුසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං, වණ්ණසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං, සුඛසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං, යසසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං, සග්ගසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං, ආධිපතෙය්‍යසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතන්ති. චුන්දස්ස ආනන්ද, කම්මාරපුත්තස්ස එවං විප්පටිසාරො පටිවිනොදෙතබ්බො”ති.

13. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

1. පිවිත්වා, කත්ථචි 2. නිසජ්ජං, ම. 3. උප්පාදෙය්‍ය, ම. 4. පරිනිබ්බුතො, කෙසුචි පොත්ථකෙසු.
* සඞ්ගීතිකාරකත්ථෙරානං ගාථායො

"මෙ ලොවැ අප්‍රතිසම ශාස්තෘ වූ තථාගත බුදුරජුහු ඉතා කල්‍යාණ ස්වභාව ඇත්තාහු පිරිසිදු සිහිරි දිය ඇති වෙසෙසින් පහන් වූ කුකුත්‍ථා නදියට බටහ.

ශාස්තෘහු ස්නානය ද කොට පැන් ද වළඳා ගොඩ නැංගහ. මෙ ශාසන-ධර්මයේ ප්‍රවක්තෘ වූ ශාස්තෘ වූ මහර්ෂි වූ භාග්‍යවත්හු භික්‍ෂුගණයා මැද පුරොගාමී වූවාහු අඹවනයට එළැඹියහ.

චුන්දක නම් භික්‍ෂූහු අමතා 'මා සඟළසිවුර සැතැපෙන්නට සුදුසු කොට සතර පටක් කොට එළව' යි වදාළහ. භාවිතාත්ම වූ බුදුරජුන් විසින් මෙහෙයන ලද චුන්දක මහණ තෙම වහා ම එය සතර පටක් කොට පැනැවී ය.

ශාස්තෘහු ඉතා කල්‍යාණ ස්වභාව ඇත්තාහු එහි වැද හොත්හ. චුන්දක තෙරත් ඉදිරියෙහි හුන්නේ ය."*

12. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා මෙසේ වදාළ සේක: "අනඳයෙනි, චුන්ද කාර්මාරපුත්‍රයාහට 'ඇවැත් චුන්දය, තථාගත තෙම යමක්හුගේ අන්තිම පිණ්ඩපාතය වළඳා පිරිනිවියේ ද, ඒ තට අලාභ ය. ඒ තා විසින් මිනිසත් බව නොයහපත් කොට ලබන ලද්දෙකැ'යි කිසිවෙක් විපිළි-සරක් උපදවන්නේ ය යන්න වියැ හැක්ක. අනඳයෙනි, චුන්ද කාර්මාර-පුත්‍රයාගේ විපිළිසර මෙසේ දුරු කටයුතු ය: 'යම් බඳු තාගේ පශ්චිම පිණ්ඩපාතය වළඳා තථාගත තෙම පිරිනිවියේ ද ඒ තට ලාභ ය, ඒ තා විසින් මිනිසත් බව මොනොවට ලබන ලද්දේ ය. අන් පිණ්ඩපාතයනට වඩා මහත්පල ඇති, වඩා මහත් අනුසස් ඇති, හැම අයුරින් සම පල ඇති, සම විපාක ඇති මේ පිණ්ඩපාතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක් ද යත්: යම් පිණ්ඩපාතයක් වළඳා තථාගත තෙම නිරුත්තර සම්‍යක්සම්බොධියට පැමිණේ ද, යම් පිණ්ඩපාතයක් වළඳා තථාගත තෙම නිරුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරි-නිවේ ද, මේ පිණ්ඩපාත දෙක අන් පිණ්ඩපාතයනට වඩා මහත්පල ඇත්තාහුත් වඩා මහත් විපාක ඇත්තාහුත් හැම ලෙසින් ම මහත් පල ඇත්තාහුත් හැම ලෙසින් ම මහත් විපාක ඇත්තාහුත් වෙත්. ආයුෂ්මත් චුන්ද කාර්මාරපුත්‍රයා විසින් දීර්ඝායුෂ පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය. ආයුෂ්මත් චුන්ද කාර්මාරපුත්‍රයා විසින් වර්ණය පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය. ආයුෂ්මත් චුන්ද කාර්මාරපුත්‍රයා විසින් සුවය පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය. ආයුෂ්මත් චුන්දකාර්මාරපුත්‍රයා විසින් ස්වර්ගය පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය. ආයුෂ්මත් චුන්දකාර්මාරපුත්‍රයා විසින් අධිපති බව පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ යැ'යි. ඇවැත් චුන්දය, භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි ම මා විසින් මෙය අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි ම මෙය මා විසින් පිළිගන්නා ලදැ'යි කියා මෙසේ චුන්ද-කාර්මාරපුත්‍රයාගේ විපිළිසර දුරු කට යුතු" යනු යි.

13. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

* මේ ධර්මසංග්‍රාහකයන් විසින් පසු ව එක් කරන ලද ගාථා යි.

"දදතො පුඤ්ඤං පවඩ්ඪති සඤ්ඤමතො වෙරං න චීයති,
කුසලො ච ජහාති පාපකං රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො"ති.[1]

## 8. 6.

## පාටලිගාමිය සුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, යෙන පාටලිගාමො තදවසරි. අස්සොසුං ඛො පාටලිගාමියා උපාසකා: 'භගවා කිර මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පාටලිගාමං අනුප්පත්තො'ති. අථ ඛො පාටලිගාමියා උපාසකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො පාටලිගාමියා උපාසකා භගවන්තං එතදවොචුං: අධිවාසෙතු නො භන්තෙ භගවා ආවසථාගාරන්ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

2. අථ ඛො පාටලිගාමියා උපාසකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා, ආසනානි පඤ්ඤපෙත්වා, උදකමණිකං පතිට්ඨාපෙත්වා, තෙලප්පදීපං ආරොපෙත්වා, යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො පාටලිගාමියා උපාසකා භගවන්තං එතදවොචුං: සබ්බසන්ථරිසන්ථතං භන්තෙ ආවසථාගාරං. ආසනානි පඤ්ඤත්තානි. උදකමණිකො පතිට්ඨාපිතො. තෙලප්පදීපො ආරොපිතො. යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතීති.

3. අථ ඛො භගවා නිවාසෙත්වා[2] පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝො'පි ඛො පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පච්ඡිමං[3] භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තං යෙව පුරෙක්ඛත්වා. පටලිගාමියාපි ඛො උපාසකා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා නිසීදිංසු භගවන්තං යෙව පුරෙක්ඛත්වා.[4]

4. අථ ඛො භගවා පාටලිගාමියෙ උපාසකෙ ආමන්තෙසි: පඤ්චිමෙ ගහපතයො ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා. කතමෙ පඤ්ච?

ඉධ ගහපතයො, දුස්සීලො සීලවිපන්නො පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං පඨමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන චපරං ගහපතයො, දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

1. පරිනිබ්බුතො. සෙසු ච පොත්ථකෙසු. 2. සායන්හසමයං නිවාසෙත්වා, මහාපරිනිබ්බාන 3. සුත්ත මජ්ඣිමං, PTS. 4 පුරක්ඛත්වා, සී. කත්ථචි.

"දෙන්නහුට පින් වැඩේ. සිල්රක්නහුට වෛර නො පවතී. නුවණැත්තේ පව් දුරු ලයි. හේ මෙසේ (පව් දුරු ලා, රා දෙස් මෝ මුල් උදුරාලීමෙන් කෙලෙස් පිරිනිවනින් එයට පසු කඳපිරිනිවනින් ද) පිරිනිවියෙක් වේ."

## 8. 6.

## පාටලිගාමිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්‍ෂුසඞ්ඝයා හා මගධ රටැ සැරි සරන සේක්, පාටලිග්‍රාමයට වැඩි සේක. "භාග්‍යවතුන් වහන්සේ මහත් භික්‍ෂුසඞ්ඝයා හා මගධ රටැ සැරි සරන සේක්, පාටලිගමට වැඩි සේක් වනැ'යි පාටලිගම් වැසි උපාසකයෝ ඇසූහ. ඉක්බිති පාටලිගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක හිඳ ගත්හ. එක් පසෙක හිඳගත් පාටලිගම් වැසි උපාසකයෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපගේ ආවාස ගෙය ඉවසන සේක්වා'යි කීහ: භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක.

2. ඉක්බිති පාටලිගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවැසීම දැන, හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ආවාස ගෙය කරා එළැඹියහ. එළැඹ ආවාස ගෙය මුළුල්ල ම ඇතිරි අතුට, අසුන් පනවා, මහ දියසැළක් තබා, තෙල්පහන් නංවා, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක සිටියහ. එක් පසෙක සිටි පාටලිගම් වැසි උපාසකයෝ "වහන්ස, ආවාස ගෙය මුළුල්ල ම ඇතිරියෙන් ඇතිරිණ. අසුන් පැනැවිණ. දියසැළෙක් තැබිණ. වහන්ස, යම් ගමනකට භාග්‍යවතුන් වහන්සේ කල්දන්නා සේක් නම්, දැන් එයට කල් යැ යි සලකන සේක් වා"යි සැළ කළහ.

3. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරෙව පාසිවුරු ගෙන බික්සඟන හා ආවාස ගෙය කරා වැඩි සේක. වැඩ පා දෙවැ ආවාස ගෙට පිවිසැ, මැදුම් ටැඹට පිට දී පෙරදිගට මුහුණ ලා වැඩ හුන් සේක. බික්සඟහු ද පා දෙවැ ආවාස ගෙට වැද පැසිම් දිගැ බිත්තියට පිටු දී පෙරදිගට මුහුණ ලා, භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොටැ හුන්හ. පාටලිගම් වැසි උපාසකයෝ ද පා දෙවැ ආවාස ගෙට වැද, පෙර දිගැ බිත්තියට පිටු දී පැසිම් දිගට මුහුණ ලා භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හිඳ ගත්හ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාටලිගම් වැසි උපාසකයන් ඇමතූ සේක: "ගැහැවියනි, දුසිල්හුගේ සිල්විපත්හි මේ දෙස් පසෙකි. කවර පසෙක් ද? යත්:

ගැහැවියනි, මෙහි දුසිල් තෙම බුත් සංවර ඇතියේ පමා හෙයින් මහත් භොගපරිහාණියට පැමිණේ. මේ දුසිල්හුගේ සිල්විපත්හි පළමු වන දෙස ය.

තව ද ගැහැවියනි, බුත් සංවර ඇති දුසිල්හුගේ ලාමක වූ අපකීර්ති-ශබ්දයෙක් පැන නගී. මේ දුසිල්හුගේ සිල්විපතෝ දෙවන දෙස ය.

පුන චපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, අවිසාරදො උපසඞ්කමති මඞ්කුභූතො. අයං තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන චපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන චපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරං මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

ඉමෙ ඛො ගහපතයො, පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා'ති.

5. පඤ්චිමෙ ගහපතයො, ආනිසංසා සීලවතො සීලසම්පදාය. කතමෙ පඤ්ච?

ඉධ ගහපතයො, සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන චපරං ගහපතයො, සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන චපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන චපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන චපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

ඉමෙ ඛො ගහපතයො, පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායා'ති.

6. අථ ඛො භගවා පාටලිගාමියෙ උපාසකෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි: අභික්කන්තා ඛො ගහපතයො රත්ති, යස්සදානි තුම්හෙ කාලං මඤ්ඤථා'ති.[2] අථ ඛො[1] පාටලිගාමියා උපාසකා භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

අථ ඛො භගවා අචිරපක්කන්තෙසු පාටලිගාමියෙසු උපාසකෙසු සුඤ්ඤාගාරං පාවිසි.

---

1. එවං භන්තෙ'ති ඛො, මහාපරිනිබ්බානසුත්ත. 2. භගවතො පටිස්සුත්වා. සී.

තව ද ගෘහපතියෙනි, බුන් සංවර ඇති දුසිල් තෙම ක්ෂත්‍රියපිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ මහණපිරිසකට හෝ යම් ම පිරිසකට එළැඹේ ද නොද තැත්තේ මකු වූයේ (බිමට හෙළූ මුහුණ ඇත්තේ) එළැඹේ. මේ දුසිල්හුගේ සිල්විපත්හි තෙවන දෙස ය.

තව ද ගෘහපතියෙනි, බුන් සංවර ඇති දුසිල් තෙම සිහිමුළා වූයේ කළුරිය කෙරෙයි. මේ දුසිල්හුගේ සිල්විපත්හි සිවුවන දෙස ය.

තව ද ගෘහපතියෙනි, බුන් සංවර ඇති දුසිල් තෙම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුකට තැන් වූ විවස වැ වැටෙන තැන් වූ නිරයට පැමිණේ. මේ දුසිල්හුගේ සිල්විපත්හි පස්වන දෙස ය.

ගෘහපතියෙනි, මොහු වනාහි දුසිල්හුගේ සිල්විපත් දෙස් පස ය.

5. ගෘහපතියෙනි, සිල්වත්හුගේ සිල්සැපත්හි (ශීලසම්පත්තියේ) මේ අනුසස් පසෙකි. කවර පසෙක් ද? යත්:

ගෘහපතියෙනි, මෙහි සිල්වත් තෙමේ ශීලයෙන් යුක්ත වූයේ නො පමා හෙයින් මහත් භොග රැසක් ලබයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ පළමු අනුසස ය.

තව ද ගෘහපතියෙනි, සිල්වත් වූ ශීලයෙන් යුක්තයාගේ උතුම් යස-ගොසෙක් පැත නඟී. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ දෙවන අනුසස ය.

තව ද ගෘහපතියෙනි, සිල්වත් වූ ශීලයෙන් යුක්ත වූ තැනැත්තේ ක්ෂත් පිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගෘහපතිපිරිසකට හෝ මහණපිරිසකට හෝ යම් ම පිරිසකට එළැඹේ ද තෙදැත්තේ බිය නැත්තේ එළැඹෙයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ තෙවන අනුසස ය.

තව ද ගෘහපතියෙනි, සිල්වත් ශීලයෙන් සම්පූර්ණ තැනැත්තේ නොමුළා ව කළුරිය කෙරේ. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ සිවුවන අනුසස ය.

තව ද ගෘහපතියෙනි, සිල්වත් ශීලයෙන් සම්පූර්ණ තැනැත්තේ කාබුන් මරණින් මතු මනාප ගති ඇති සග ලොවට පැමිණෙයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ පස්වන අනුසස ය.

ගෘහපතියෙනි, මොහු වනාහි සිල්වත්හුගේ ශීලසම්පත්තියේ අනුසස් පස ය.

6. භාග්‍යවතුන් වහන්සේ පාටලිගම් වැසි උපාසකයනට රෑ බොහෝ වේලා ධම්කථායෙන් ශීලාදි ප්‍රතිපත් දක්වා එය මොනොවට ගන්වා, එහි උත්සාහවත් කරවා, එහි සතුටු කරවා, ඉක්බිති 'ගෘහපතියෙනි, රැය ඉක්මිණ. තොපට යන්නට කාලය ය. එබැවින් යන්නැ'යි ඔවුන් යැවූ සේක. එකල්හි පාටලිගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේගේ වචනය ආදර කොට පිළිගෙන අනුමෝදවැ හුනස්නෙන් නැඟී, භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මුණහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පාටලි ගම් වැසි උපාසකයන් නික්මුණු නොබෝ වේලායෙහි ශූන්‍යාගාරයට පිවිසි සේක.

7. තෙන ඛො පන සමයෙන **සුනීධවස්සකාරා** මගධමහාමත්තා **පාටලිගාමෙ** නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. තෙන ඛො පන සමයෙන සම්බහුලා දෙවතායො සහස්සසහස්සෙව [1]පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්ති. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තා දෙවතායො සහස්සසහස්සෙව[1] පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්තියො. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුන්ති.

8. අථ ඛො භගවා තස්සා රත්තියා පච්චූසසමයෙ පච්චුට්ඨාය ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'කො නු ඛො ආනන්ද, පාටලිගාමෙ නගරං මාපෙතී?'ති.

"සුනීධවස්සකාරා භන්තෙ, මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහායා"ති.

'සෙය්‍යථාපි ආනන්ද, දෙවෙහි තාවතිංසෙහි සද්ධිං මන්තෙත්වා, එවමෙව ඛො ආනන්ද, සුනීධවස්සකාරා මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය.

9. ඉධාහං ආනන්ද, අද්දසං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායො සහස්සසහස්සෙව පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්තියො: යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුන්ති.

10. යාවතා ආනන්ද අරියං ආයතනං, යාවතා වණිප්පථො, ඉදං අග්ගනගරං භවිස්සති පාටලිපුත්තං පුටභෙදනං. පාටලිපුත්තස්ස ඛො ආනන්ද, තයො අන්තරායා භවිස්සන්ති අග්ගිතො වා උදකතො වා මිථුභෙදතො වා'ති.

---

1. සහස්සෙව, සී.

7. එ සමයෙහි වනාහි මගධරට (අජාසත්) රජහුගේ මහ ඇමැති වූ සුනීධ වස්සකාර දෙදෙන ලිච්ඡවී රජුන් ප්‍රතිබාහනය කරනු පිණිස පාටලී ගමෙහි නුවරක් මවත්. එ සමයෙහි වූ කලී දෙවතාවෝ (එක එක මුළුවකට) දහස් දහස් ව පාටලිගමෙහි ගෙවතු (ගෘහවාස්තූන්) පිරිසිඳ ගනිත්. යම් පෙදෙසෙක මහත් පිරිවර ඇති දෙවතාවෝ වාස්තුපරිග්‍රහණය කෙරෙත් ද, එහි ගෙවල් කරන්නට මහත් පිරිවර ඇති රජුන්ගේ රාජමහාමාත්‍රයන්ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක මැදුම් පෙලෙහි වූ දෙවතාවෝ වාස්තුපරිග්‍රහණය කෙරෙත් ද, එහි ගෙවල් කරන්නට මැදුම් පෙලෙහි වූ රජුන්ගේ රාජමහාමාත්‍රයන් ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක කුදුපෙලෙහි දෙවතාවෝ වාස්තුපරිග්‍රහණය කෙරෙත් ද, එහි ගෙවල් කරන්නට කුදු පෙලෙහි වූ දෙවතාවන්ගේ සිත් නැමේ. භාග්‍යවතුන් වහන්සේ මිනිසැසෙහි විෂයසීමාව ඉක්මැ දක්ක හැකි වූ පිරිසිදු වූ දිවැසින්, 'යම් පෙදෙසෙක මහපිරිවර ඇති දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් ද එහි ගෙවල් තංවන්නට මහපිරිවර ඇති රජ රජමහමැතියන් සිත් නැමේ යැ යි ද, යම් පෙදෙසෙක මැදුම් පෙලෙහි දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් ද එහි ගෙ තංවන්නට මැදුම් පෙලේ වූ රජ රජමහමැතියන් සිත් නැමේ යැ යි ද, යම් පෙදෙසෙක කුදු පෙලේ වූ දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් ද එහි ගෙ තංවන්නට කුදු පෙලේ වූ රජ රජමහමැතියන් සිත් නැමේ යැ යි දැ යි පාටලිග්‍රාමයෙහි ගෙවතු පිරිසිඳ ගන්නා (මුළු මුළු වූ) දහස් දහස් ගණන් ම දෙවියන් දුටුසේක.

8. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ රැයෙහි අලුයම් වේලෙහි නැඟී සිට අනඳ තෙරුන් බණවා,, අනඳයෙනි, කවරෙක් නම් පාටලිගමෙහි නුවරක් මවා දැ!''යි අසා වදාළ සේක.

'වහන්ස, මගධරට රජුගේ මහමැති වූ සුනීධ වස්සකාර දෙදෙන ලිච්ඡවීන් ප්‍රතිබාහනය කරනු පිණිස පාටලි ගමෙහි නුවරක් මවති'යි අනඳ තෙරණුවෝ වදාළහ.

අනඳයෙනි, යම්සේ තව්තිසා වැසි දෙවියන් හා මන්ත්‍රණය කොට කෙරෙත් ද, එසේ ම අනඳයෙනි, මගධමහාමාත්‍ර වූ සුනීධ වස්සකාර දෙදෙනා ලිච්ඡවීන් පිළිබහනුවට පාටලිගමෙහි නුවරක් මවත්.

9. අනඳයෙනි, මෙහි මිනිසැසින් දක්ක හැකි ඉම ඉක්මැ දක්නට පොහොසත් වූ පිරිසිදු වූ දිවැසින් යම් පෙදෙසක මහබලැති දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් නම් එහි ගෙ තනන්නට මහබලැති රජුන්ගේ රජමහමැතියන්ගේ සිත් නැමේ යැ යි ද, යම් පෙදෙසෙක මැදුම් බලැති දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් නම් එහි ගෙ තනන්නට මැදුම්බලැති රජුන්ගේ රජමහමැතියන්ගේ සිත් නැමේ' යැ යි ද, යම් පෙදෙසෙක මඳ බලැති දෙවියෝ ගෙවතු පිරිසිඳ ගනිත් නම්, එහි ගෙවල් තනන්නට මඳ බලැති රජුන්ගේ රජමහමැතියන්ගේ සිත් නැමේ යැයි දැ යි, මෙසේ මුළු මුළු ව දහස් දහස් බොහෝ දෙවිවරුන් ගෙවතු පිරිසිඳ ගන්නවුන් දිටිමි.

10. අනඳයෙනි, යම් පමණ ආර්‍යායතන (ආර්‍යමිනිසුන් පැමිණෙන තැන) වේ ද, යම් පමණ වෙළෙඳපොළ වේ ද, මෙය ඒ හැමට අග්‍ර වූ නොයෙක් දෙසින් ගෙනා බඩුපොදි ලිහන තැන වූ පාටලිපුත්‍ර නම් නගරය වන්නේ ය. ''අනඳයෙනි, පාටලිපුත්‍ර නගරයට ගින්නෙන් ද දියෙන් ද ඔවුනොවුන්ගේ හෙදයෙන් දැ යි තුන් අන්තරාය කෙනෙක් වන්නාහ'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

11. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං එතදවොචුං: අධිවාසෙතු නො භවං ගොතමො අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

12. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවතො අධිවාසනං විදිත්වා යෙන සකො ආවසථො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සකෙ ආවසථෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචෙසුං:[1] කාලො භො ගොතම, නිට්ඨිතං භත්තන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සුනීධවස්සකාරානං මගධමහාමත්තානං ආවසථො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසුං සම්පවාරෙසුං.

13. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සුනීධවස්සකාරෙ මගධමහාමත්තෙ භගවා ඉමාහි ගාථාහි අනුමොදි:

"යස්මිං පදෙසෙ කප්පෙති වාසං පණ්ඩිතජාතියො,
සීලවන්තෙත්ථ භොජෙත්වා සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො.*

යා තත්ථ දෙවතා ආසුං තාසං දක්ඛිණමාදිසෙ,*
තා පූජිතා පූජයන්ති මානිතා මානයන්ති නං.

තතො නං අනුකම්පන්ති මාතා පුත්තං'ව ඔරසං,
දෙවතානුකම්පිතො පොසො සදා භද්‍රානි පස්සතී"ති.

14. අථ ඛො භගවා සුනීධවස්සකාරානං මගධමහාමත්තානං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. තෙන ඛො පන සමයෙන සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති: යෙනජ්ජ සමණො ගොතමො ද්වාරෙන නික්ඛමිස්සති තං **ගොතමද්වාරං** නාම භවිස්සති. යෙන තිත්ථෙන ගඞ්ගං නදිං තරිස්සති තං **ගොතමතිත්ථං** නාම භවිස්සතී'ති.

1. ආරොචාපෙසුං. සාමූ

* යස්මින් ප්‍රදෙශෙ කල්පයතෙ වාසං පණ්ඩිතජාතිකඃ
ශීලවතො භොජයන්ති සංයතාන් බ්‍රහ්මචාරිණඃ

* යාස්තත්‍ර දෙවතා ආසන් කුශලානුෂ්ඨමානසාඃ
තාඃ පූජිතාඃ පූජයන්ති මානයන්ති ච මානිතාඃ.
(සර්වාස්තිවාද මහාපරිනිර්වාණ සූත්‍ර.)

11. ඉක්බිති මගද මහමැති සුනීධ වස්සකාර දෙදෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට නිසි වූ, සිතැ රැඳැවිය යුතු වූ කතාව නිමවා එක් පසෙකැ සිටියහ. එක් පසෙක සිටි මගද මහමැති සුනීධ වස්සකාර යන දෙදෙන භාග්‍යවතුන් වහන්සේට 'භවද්ගෞතමයෝ භික්සඟන හා අද දවසට අප බත ඉවසත් වා'යි මෙය කීහ. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවැසූ සේක.

12. ඉක්බිති මගද මහමැති සුනීධ වස්සකාර දෙදෙන භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියා දැන තමන් වසන ගෙට ගියහ. ගොස් තමන් වසන ගෙහි ප්‍රණීත කෑයුතු බුදියැ යුතු දෑ පිළියෙල කරවා, "භවද්ගෞතමයිනි, බත පිළියෙල කොට නිමැවිණ. වඩනට කල් වේ' යැයි කියා කල් ගෙනූහ. එ කලැ භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි සිවුරු හැඳ පෙරෙව භික්සඟන හා මගද මහමැති සුනීධ වස්සකාර දෙදෙනාගේ නිවෙස කරා එළැඹි සේක. එළැඹැ පණවන ලද අස්නැ වැඩහුන් සේක. එකල්හි ඒ සුනීධ වස්සකාර මගදමහමැති දෙදෙන බුදුපාමොක් භික්සඟන ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් සැතැප්වූහ. මොනොවට වැළැඳැවූහ.

13 ඉක්බිති සුනීධ වස්සකාර මගද මහමැතිහු භාග්‍යවතුන් වහන්සේ වළඳා පාත්‍රයෙන් ඉවතට ගත් අතැති නියා දැක එක්තරා මිටි අස්නක් ගෙන එක් පසෙක හිඳ ගත්හ. එක් පසෙක හුන් මගද මහමැති වූ සුනීධ වස්සකාර දෙදෙනාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථායෙන් අනුමෝදනා බණ වදාළ සේක:

"පණ්ඩිතසවභාවය ඇති තැනැත්තේ යම් පෙදෙසෙක වාසය කෙරේ ද, හේ සිය ගෙහිදී සංයමය ඇති බඹසර රක්නා සිල්වතුන් වළඳවා,

එහි යම් ගෘහදෙවතා කෙනෙක් වෙත් නම් ඔවුනට පින් දෙන්නේ ය. පිනෙන් පුදනු ලැබූ බුහුමන් කරනු ලැබූ ඔහු ඔහුට (රැක ගැනුම් වශයෙන්) පූජා කෙරෙත්, බුහුමන් කෙරෙත්.

ඉක්බිති ඔහු මවක ලෙහි හොවා වඩන ලද පුතක්හට සෙයින් ඔහුට අනුකම්පා කරත්. දෙවිතාවන් විසින් අනුකම්පිත පුරුෂ තෙම හැම කල්හි සොඳුරු දෑ දකී."

14. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මගද මහමැති සුනීධ වස්සකාර දෙදෙනාට මේ ගාථායෙන් අනුමෝදනා කොට හුනස්නෙන් නැඟී නික්මුණු සේක. එ සමයෙහි වූ කලි මගද මහමැති සුනීධ වස්සකාර දෙදෙන, 'අද යම් දොරෙකින් මහණ ගොයුම්හු නික්මෙන්නාහු නම්, එය ගොයුම්දොර නම් වන්නේ ය. යම් තොටෙකින් ගංගානදිය තරණය කරන්නාහු නම් එය ගොයුම්-තොට නම් වන්නේ යැ'යි කියා භාග්‍යවතුන් වහන්සේ පසු පසින් අනුව ගියාහු වෙත්.

15. අථ ඛො භගවා යෙන ද්වාරෙන නික්ඛමි, තං ගොතමද්වාරං නාම අහොසි. අථ ඛො භගවා යෙන ගඞ්ගා නදී තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ගඞ්ගා නදී පූරා හොති සමතිත්තිකා කාකපෙය්‍යා. අප්පෙකච්චෙ මනුස්සා නාවං පරියෙසන්ති, අප්පෙකච්චෙ උළුම්පං පරියෙසන්ති, අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්ති අපාරුපාරං[1] ගන්තුකාමා. අථ ඛො භගවා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව[2] ගඞ්ගාය නදියා ඔරිමතීරෙ අන්තරහිතො පාරිමතීරෙ පච්චුට්ඨාසි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අද්දසා ඛො භගවා තෙ මනුස්සෙ අප්පෙකච්චෙ නාවං පරියෙසන්තෙ, අප්පෙකච්චෙ උළුම්පං පරියෙසන්තෙ, අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්තෙ අපාරුපාරං ගන්තුකාමෙ.

16. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යෙ තරන්ති අණ්ණවං සරං සෙතුං කත්වාන විසජ්ජ පල්ලලානි,
කුල්ලං හි ජනො පබන්ධති තිණ්ණා මෙධාවිනො ජනා"ති.[3]

## 8. 7.

## ද්විධාපථසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **කොසලෙසු** අද්ධානමග්ග-පටිපන්නො හොති ආයස්මතා **නාගසමාලෙන** පච්ඡාසමණෙන. අද්දසා ඛො ආයස්මා නාගසමාලො අන්තරමග්ගෙ ද්වෙධාපථං. දිස්වාන භගවන්තං එතදවොච: 'අයං භන්තෙ භගවා පන්ථො ඉමිනා ගච්ඡාමා'ති. එවං වුත්තෙ භගවා ආයස්මන්තං නාගසමාලං එතදවොච: 'අයං නාගසමාල පන්ථො ඉමිනා ගච්ඡාමා'ති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මා නාගසමාලො භගවන්තං එතදවොච: 'අයං භන්තෙ භගවා පන්ථො ඉමිනා ගච්ඡාමා'ති. එවං වුත්තෙ භගවා ආයස්මන්තං නාගසමාලං එතදවොච: 'අයං නාගසමාල, පන්ථො ඉමිනා ගච්ඡාමා'ති. අථ ඛො ආයස්මා නාගසමාලො භගවතො පත්තචීවරං තත්ථෙව ඡමායං නික්ඛිපිත්වා පක්කාමි, 'ඉදං භන්තෙ භගවතො පත්තචීවරන්ති'

2. අථ ඛො ආයස්මතො නාගසමාලස්ස තෙන පන්ථෙන ගච්ඡන්තස්ස අන්තරමග්ගෙ චොරා නික්ඛමිත්වා හත්ථෙහි ච පාදෙහි ච විහෙඨෙසුං, පත්තඤ්ච භින්දිංසු, සඞ්ඝාටිඤ්ච විප්ඵාලෙසුං. අථ ඛො ආයස්මා නාගසමාලො භින්නෙන පත්තෙන විප්ඵාලිතාය සඞ්ඝාටියා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා නාගසමාලො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ තෙන පන්ථෙන ගච්ඡන්තස්ස අන්තරමග්ගෙ චොරා නික්ඛමිත්වා හත්ථෙහි ච පාදෙහි ච විහෙඨෙසුං., පත්තඤ්ච භින්දිංසු, සඞ්ඝාටිඤ්ච විප්ඵාලෙසු'.න්ති

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:-

"සද්ධිං චරමෙකතො වසං මිස්සො අඤ්ඤජනෙන වෙදගූ,
විද්වා පජහාති පාපකං කොඤ්චො ඛීරපකො'ව නින්නග"න්ති.

---

1. අපරාපරං, (සොසු වි.) 2. එවමෙවං, මූ. පා.
3. යෙ තරන්ත්‍යර්ණවං සරඃ සෙතුං කෘත්වා විසෘජ්‍ය පල්වලානි
කොලං හි ජනාඃ ප්‍රබණිතාඃ උත්තීර්ණා මෙධාවිනො ජනාඃ. (දිව්‍යාවදාන 3. 1)

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් දොරෙකින් නික්මුණෝ ද එය **ගොයුම්දොර** නම් විය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ගඞ්ගානදිය කරා වැඩි සේක. එ සමයෙහි ගඞ්ගා නදිය ගොඩ සිට කවුඩකු විසින් පැන් පිය හැකි පරිදි දෙගොඩ තලා පිරුණී වෙයි. මෙගොඩින් එ ගොඩට යනු කැමැති ඇතැම් මිනිස්සු නැවක් සොයත්. සමහරු උඩුපයක් සොයත්. සමහරු පසුරක් බඳිත්. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ භික්සඝන හා, ශක්තිමත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරන්නේ දිගු කළ අත හකුළන්නේ යම් සේ ද එසේ ම ගඞ්ගා නදියේ මෙ තෙරෙ අතුරුදහන් වූසේක් එ ගොඩ පිහිටිසේක. භාග්‍යවතුන් වහන්සේ, මෙගොඩින් එගොඩ යනු කැමති ව ඇතැමුන් නැවක් සොයනුවන්, ඇතැමුන් උඩුපයක් සොයනුවන්, ඇතැමුන් පසුරක් බඳිනුවන් දුටු සේක් ම ය.

16. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

යම් කෙනෙක් (ගැඹුරු පුළුල් වූ) සංසාර සාගරය හා තෘෂ්ණානදිය තරණය කෙරෙත් ද, ඔහු ආර්‍යමාර්ගී නමැති හෙය කොට පලවලයත් (දිය පිරුණු වළ තැන්) ආමර්ශනය නො කොට මැ තරණය කෙරෙති. මේ ජන තෙම වූකලි (මේ දියත්ත තරණය කරනු සඳහා) පසුරු බඳී. ආර්‍යමාර්ගී ඥානයෙන් යුත් ජනයෝ (පසුරක් නැති වැ මැ) තරණය කළහ.

## 8. 7.

## දව්ධාපථ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **නාගසමාල** තෙරහු පසු මහණ කොට ගෙන **කොසොල්** රටැ දික් මහට පිළිපන් සේක් වෙති. නාගසමාල තෙරණුවෝ අතරමඟැ දෙමං සන්ධියක් දුටුයේ ය. දුක භාග්‍යවතුන් වහන්සේට භාග්‍යවතුන් වහන්ස, මේ මඟ ය. මෙයින් යමු'යි කී ය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නාගසමාල තෙරහට 'නාගසමාලය, යැ යුතු මඟ මේ අනෙක ය. මෙයින් යමු'යි වදාළ සේක දෙවෙනි වර ද තෙවන වර ද නාගසමාල තෙර 'භාග්‍යවතුන් වහන්ස, මේ මඟ ය, මෙයින් යමු'යි කී ය. තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ නාගසමාල තෙරහට 'නාගසමාලය, යැ යුතු මඟ මේ අනෙක ය. මෙයින් යමු'යි වදාළ සේක. එ කල්හි නාගසමාල තෙර තෙල භාග්‍යවතුන් වහන්සේගේ පා සිවුරු යැ'යි කියා භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු බිමැ තබා නික්ම ගියේ ය.

2. ඉක්බිති එ මඟින් යන නාගසමාල තෙරහට මඟ අතුරෙහි සොරු නික්මැ අතින් පයින් තැළූහ. පාත්‍රය ද බින්දහ. සඟළ සිවුර ද ඉරූ දැමූහ. එ කල්හි නාගසමාල තෙර බිඳුණු පාත්‍රයෙන් ඉරී ගිය සඟළ සිවුරින් යුතු ව භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණේ ය එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක හිඳ ගත්තේ ය. එක් පසෙක හිඳ ගත් නාගසමාල තෙර භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, මෙහි ඒ මඟින් මා යද්දී මඟ අතුරු සොරු නික්මැ අතින් පයින් මට පහළහ, පාත්‍රය ද බින්දහ. සඟළ සිවුර ද ඉරූ දැමූහ'යි සැළ කෙළේ ය.

3. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූහ:

"මාර්ගඥානයෙන් සත්‍යාවබොධය කළ නුවණැත්තේ අඥ ජනයා හා එක් වැ හැසිරෙන්නේ එක් වැ වසන්නේ එ පමණෙකින් මිශ්‍ර වූයේ නුමුදු අභද්‍ර වූ ලාමක දූය දුරු ලයි. (දියමුසු කිරි එළැවූ කල) කිරි පමණක් බොන කොස්ලිහිණියා දිය හැර ලන්නාක් මෙනි."

## 8. 8.

## විසාඛාසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **පුබ්බාරාමෙ** මිගාරමාතුපාසාදෙ. තෙන ඛො පන සමයෙන **විසාඛාය** මිගාරමාතුයා නත්තා කාලකතා හොති පියා මනාපා. අථ ඛො විසාඛා මිගාරමාතා අල්ලවත්ථා අල්ලකෙසා දිවාදිවස්ස යෙන භගවා තෙනුපසඞ්කමි. 'උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච: 'හන්ද කුතො නු ත්වං විසාඛෙ ආගච්ඡසි අල්ලවත්ථා අල්ලකෙසා ඉධූපසඞ්කන්තා දිවාදිවස්සා?'ති.

“නත්තා මෙ භන්තෙ පියා මනාපා කාලකතා' තෙනාහං අල්ලවත්ථා අල්ලකෙසා ඉධූපසඞ්කන්තා දිවාදිවස්සා”ති

“ඉච්ඡෙය්‍යාසි ත්වං විසාඛෙ යාවතිකා සාවත්ථියා මනුස්සා තාවතිකෙ පුත්තෙ ච නත්තාරෙ චා”ති.

“ඉච්ඡෙය්‍යාමහං භගවා යාවතිකා සාවත්ථියා මනුස්සා තාවතිකෙ පුත්තෙ ච නත්තාරෙ චා”ති.

2. “කීවබහුකා පන විසාඛෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති?”ති.

“දසපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, නවපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, අට්ඨපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, සත්තපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, ඡපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, පඤ්චපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, චත්තාරොපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, තීණිපි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, ද්වෙ'පි භන්තෙ සාවත්ථියා මනුස්සා දෙවසිකං කාලං කරෙන්ති, එකො'පි භන්තෙ සාවත්ථියා මනුස්සො දෙවසිකං කාලං කරොති, අවිවිත්තා භන්තෙ සාවත්ථි මනුස්සෙහි කාලං කරෙන්තෙහී”ති.

'තං කිං මඤ්ඤසි විසාඛෙ අපි නු ත්වං කදාචි කරහචි අනල්ලවත්ථා අනල්ලකෙසා වා?”ති.

3. “නො හෙතං භන්තෙ. අලං මෙ භන්තෙ තාවබහුකෙහි පුත්තෙහි ච නත්තාරෙහි චා”ති.

“යෙසං ඛො විසාඛෙ, සතං පියානි, සතං තෙසං දුක්ඛානි. යෙසං නවුති පියානි, නවුති තෙසං දුක්ඛානි. යෙසං අසීති පියානි, අසීති තෙසං දුක්ඛානි. යෙසං සත්තති පියානි, සත්තති තෙසං දුක්ඛානි. යෙසං සට්ඨි පියානි, සට්ඨි තෙසං දුක්ඛානි. යෙසං පඤ්ඤාසං පියානි, පඤ්ඤාසං තෙසං දුක්ඛානි.-

8 8.

## විශාඛාසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර මිගාරමාතුප්‍රාසාද නම් වූ **පූර්වාරාම** විහාරයෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි මිගාරමාතු නම් වූ **විශාඛාවගේ** ප්‍රිය මනාප වූ මිනිබිරියක් කලුරිය කළා වෙයි. එ කල්හි මිගාරමාතු නම් වූ විශාඛා තොමෝ තෙත් වස්ත්‍ර ඇත්තී තෙත් හිසකේ ඇත්තී දෙවෙත්දවල භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එක් පසෙක හුනු. භාග්‍යවතුන් වහන්සේ එක් පසෙක හුන්නා වූ ම මෘගාරිමාතෘ විශාඛාව බණවා, "විශාඛාවෙනි, දැන් තෙත් වත් ඇති වැ තෙත් කෙහෙ ඇති වැ තෙපි කොසිත් එවු ද? කොහි සිට මේ මධ්‍යාහනයෙහි මෙහි එළැඹුණුව?"යි වදාළ සේක.

"වහන්ස, මා ප්‍රිය මනාප මිනිබිරියක් කලුරිය කළා ය. එහෙයින් මම තෙත් වත් ඇති වැ තෙත් කෙහෙ ඇති වැ මද්දහන්හි මෙහි එළැඹියෙමි"යි ඕ කිවූ ය.

2. "විශාඛාවනි, සැවැත්නුවර යම් පමණ මිනිස්සු ඇත් නම් එ පමණ ම දූ පුතුන් ද මුනුබුරු බිනිබිරියන් ද කැමැත්තහු ද?"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"භාග්‍යවතුන් වහන්ස, යම් පමණ මිනිස්සු සැවැත්නුවරෙහි ඇත් නම් එපමණ ම දූපුතුනුත් මුනුබුරු මිනිබිරියනුත් කැමැත්තෙමි"යි (ඕ කිවූ ය).

"විශාඛාවනි, දිනපතා කොපමණ මිනිස්සු සැවැත්නුවරෙහි කලුරිය කෙරෙත් ද?"

"වහන්ස, දිනපතා සැවැත් නුවර දශ දෙනෙකුත් මිනිස්සු කලුරිය කෙරෙත්. දිනපතා සැවැත්නුවර නව දෙනෙකුත් මිනිස්සු කලුරිය කෙරෙත්. දින පතා අට දෙනෙකුත් මිනිස්සු කලුරිය කෙරෙත්. දින පතා සත් දෙනෙකුත් මිනිස්සු කලුරිය කෙරෙත්. දිනපතා සදෙනෙකුත්...පස් දෙනෙකුත්...සිවු දෙනෙකුත්...තිදෙනෙකුත්...දෙදෙනෙකුත් කලුරිය කෙරෙත්, දිනපතා සැවැත්නුවර එකමිනිසෙකුත් කලුරිය කෙරෙයි. වහන්ස, කලුරිය කරන මිනිසුන්ගෙන් සැවැත් නුවර නොසිස් යැ"යි (ඕ කිවූ යැ.)

"විශාඛාවනි, ඒ කිමැ යි සිතවු ද? (එසේ කලැ) තෙපි කිසි විටෙකත් නොතෙත් වස්ත්‍ර ඇති වනු නොතෙත් කෙහෙ ඇති වනු හැක්කහු ද?"යි (භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.)

"වහන්ස, මෙය නො වන්නෙකි. වහන්ස, මට එතරම් බොහෝ දූපුතුන්ගෙන් මුනුබුරු මිනිබිරියන්ගෙන් කම් නැතැ"යි ද (ඕ කිවූ ය.)

3. "විශාඛාවනි, යම් කෙනකුන්හට ප්‍රියවස්තු සියෙක් වේ නම් ඔවුනට සියෙක් දුක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු අනූවෙක් වේ නම් ඔවුනට අනූවෙක් දුක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු අසූවෙක් නම් ඔවුනට අසූවෙක් දුක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු සැත්තෑවෙක් නම්, ඔවුනට සැත්තෑවෙක් දුක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු සැටෙක් නම්, ඔවුනට සැටෙක් දුක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු පනසෙක් නම් ඔවුනට දුක් පනසෙක් වේ.

යෙසං චත්තාරීසං පියානි, චත්තාරීසං තෙසං දුක්ඛානි. යෙසං තිංසං පියානි තිංසං තෙසං දුක්ඛානි. යෙසං වීසං පියානි, වීසං[1] තෙසං දුක්ඛානි. යෙසං දස පියානි, දස තෙසං දුක්ඛානි. යෙසං නව පියානි, නව තෙසං දුක්ඛානි. යෙසං අට්ඨ පියානි, අට්ඨ තෙසං දුක්ඛානි. යෙසං සත්ත පියානි, සත්ත තෙසං දුක්ඛානි. යෙසං ඡ පියානි, ඡ තෙසං දුක්ඛානි. යෙසං පඤ්ච පියානි, පඤ්ච තෙසං දුක්ඛානි. යෙසං චත්තාරි පියානි, චත්තාරි තෙසං දුක්ඛානි. යෙසං තීණි පියානි, තීණි තෙසං දුක්ඛානි. යෙසං ද්වෙ පියානි, ද්වෙ තෙසං දුක්ඛානි. යෙසං එකං පියං එකං තෙසං දුක්ඛං. යෙසං නත්ථි පියං, නත්ථි තෙසං දුක්ඛං. අසොකා තෙ විරජා අනුපායාසාති වදාමී"ති.

4. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යෙ කෙචි සොකා පරිදෙවිතා වා දුක්ඛා ච ලොකස්මිං අනෙකරූපා,
පියං පටිච්ච පභවන්ති එතෙ පියෙ අසන්තෙ න භවන්ති එතෙ.

තස්මා හි තෙ සුඛිනො වීතසොකා යෙසං පියං නත්ථි කුහිඤ්චි ලොකෙ,
තස්මා අසොකං විරජං පත්ථයානො පියං න කයිරාථ කුහිඤ්චි ලොකෙ"ති.

## 8. 9.

## පඨමදබ්බසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. අථ ඛො ආයස්මා **දබ්බො** මල්ලපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො භගවන්තං එතද-වොච: 'පරිනිබ්බානකාලො මෙ'දානි සුගතා'ති. 'යස්ස දානි ත්වං දබ්බ කාලං මඤ්ඤසී'ති.

2. අථ ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා පරිනිබ්බායි. අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා පරිනිබ්බුතස්ස සරීරස්ස ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ න මසි. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි, එවමෙව ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා පරිනිබ්බුතස්ස සරීරස්ස ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ න මසී'ති.

1. විසති මූ. ප

යම් කෙනකුන්හට ප්‍රියවස්තු සතළිසෙක් නම් ඔවුනට දුක් සතළිසෙක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු තිසෙක් නම් ඔවුනට දුක් තිසෙක් වේ. යම් කෙනකුන්හට ප්‍රියවස්තු විස්සෙක් නම් ඔවුනට දුක් විස්සෙක. යම් කෙනකුන්හට ප්‍රියවස්තු දසයෙක් නම් ඔවුනට දුක් දසයෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු නවයෙක් නම් ඔවුනට දුක් නවයෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු අටෙක් නම් ඔවුනට දුක් අටෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු සතෙක් නම් ඔවුනට දුක් සතෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු සයෙක් නම් ඔවුනට දුක් සයෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු පසෙක් නම් ඔවුනට දුක් පසෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු සතරෙක් නම් ඔවුනට දුක් සතරෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු තුනෙක් නම් ඔවුනට දුක් තුනෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු දෙකෙක් නම් ඔවුනට දුක් දෙකෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තු එකෙක් නම් ඔවුනට දුක් එකෙකි. යම් කෙනකුන්හට ප්‍රිය වස්තුවෙක් නැත් නම් ඔවුනට දුකෙක් නැත. ඔහු ශොක නැත්තෝ රාගාදි රජස් නැත්තෝ උපායාස නැත්තෝ යැ යි කියමි"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"ලොව්හි යම් නන්වැදෑරුම් ශොක ද හැඬුම් ද වැලැපුම් ද දුක් ද ඇත් නම්, ඔහු ප්‍රියවස්තු හෙතු කොට ගෙන පහළ වෙත්. ප්‍රිය වස්තුවක් නැති කල්හි ඔහු පහළ නො වෙති.

එහෙයින් යම් කෙනකුන්හට ලොව්හි කිසි ද තැනෙක ප්‍රියයෙක් නැත් ද, ඔහු සුවැත්තෝ ය. පහවූ ශොක ඇත්තෝ ය. එ බැවින් ශොක නැති බව කෙලෙස් ධූලි නැති බව (හෙවත් රහත් බව) කැමැත්තෝ ලොව්හි කිසිවකුත් කෙරෙහි ප්‍රිය බවක් නො කරන්නේ ය."

## 8. 9.

## පළමු දබ්බ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර කලන්දකනිවාප නම් වූ **වෙළුවනයෙහි** වැඩ වසන සේක. එකල්හි මල්ලරාජපුත්‍ර වූ **දබ්බ** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ ආදරයෙන් වැඳ පසෙක හුන්හ. පසෙක හුන් මල්ලපුත්‍ර දබ්බ තෙරණුවෝ 'වහන්ස, මට දැන් පිරිනිවෙන්නට කාලය වේ යැ' යි සැළ කළහ. 'දබ්බයිනි, යමකට කලැ යි තෙපි සිතවූ නම් එය කරනු තොප අයත් කාර්‍යයෙකැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

2. එකල්හි මල්ලපුත්‍ර දබ්බ තෙරණුවෝ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ, පැදකුණු කොට, අහස් නැඟ, අහසැ පලඟින් හිඳ තෙජො-කසිණ චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැද, ඉන් නැඟී පිරිනිවියහ. ඉක්බිති මෙසේ අහස් නැග අහසැ පලඟින් හිඳ, තෙජොධාතුසමාපත්තියට සමවැද, එයින් නැඟී පිරිනිවි, ගිනිගෙන දැවෙන මල්ලපුත්‍ර දබ්බ තෙරුන්ගේ සිරුරැ අළු හෝ දැලි නො වී ය. ගිනි ඇවිළ දැවෙන ගිතෙලෙහි හෝ තලතෙලෙහි අළු හෝ දැලි යම්සේ නො පැණේ ද, එ පරිද්දෙන් ම අහස් නැඟ අහසැ පලඟින් හිඳ තෙදකිසුණු සමවතට සමවැද, එයින් නැඟි පිරිනිවි මල්ලපුත්‍ර දබ්බ තෙරුන්ගේ ගිනි ඇවිළ දැවෙන සිරුරේ අළු හෝ දැලි නො වී ය.

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අභෙදි කායො නිරොධි සඤ්ඤා වෙදනා සීතිභවිංසු[1] සබ්බා,
වූපසමිංසු සඞ්ඛාරා විඤ්ඤාණං අත්ථමගමා"ති.

## 8. 10.

## දුතියදබ්බසුත්තං

1 එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: "දබ්බස්ස භික්ඛවෙ මල්ලපුත්තස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා පරිනිබ්බුතස්ස සරීරස්ස ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ න මසි. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස ඩය්හමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි. එවමෙව ඛො භික්ඛවෙ දබ්බස්ස මල්ලපුත්තස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා පරිනිබ්බුතස්ස සරීරස්ස ඣායමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායි න මසී"ති.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"අයොඝනහතස්සෙව ජලතො ජාතවෙදසො,
අනුපුබ්බූපසන්තස්ස යථා න ඤායතෙ ගති.

එවං සම්මා විමුත්තානං කාමබන්ධොඝතාරිනං,
පඤ්ඤාපෙතුං ගති නත්ථි පත්තානං අචලං සුඛං"ති.

**පාටලිගාමියවග්ගො අට්ඨමො.**

තස්සුද්දානං.

නිබ්බානා චතුරෙ වුත්තා චුන්දො පාටලිගාමියො,
ද්විධා පථො විසාඛා ච දබ්බෙන ද්විහි[2] තෙ දසා'ති.

---

වග්ගමිදං පඨමං වර බොධි වග්ගමිදං දුතියං මුචලින්දො,
නන්දකවග්ගවරො තතියො තු මෙඝියවග්ගවරො ච චතුත්ථො.

පඤ්චමවග්ගවරන්තිධ සොණො ඡට්ඨමවග්ගවරං ජච්චන්ධො,[3]
සත්තමවග්ගවරන්ති ච චූළො පාටලිගාමවරට්ඨමවග්ගො.

අසීති මනූනක සුත්තවරං වග්ගමිධට්ඨකං සුවිභත්තං,
දස්සිත චක්ඛුමතා විමලෙන අද්ධා හමුදානමිතීදමාහු.[4]

## උදානපාළි සමත්තා.

---

1. සීතිභවිංසු, මුද්දිතඅට්ඨකථා, විතිරයිංසු, මුද්දිතපාළි. 2. දබ්බෙන සහ. (බහූසු) 3. දසිතං සීමු. 4. උදානන්තිදමාහුති, මු පා. හි නං උදානමිතීදමාහු, සීමු

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"රූපය බිඳිණි: (රූපසංඥදි) සියලු සංඥව නිරුද්ධ විය. සියලු වේදනාවෝ සිසිල් වූහ (නිවී ගියහ) සියලු (සපශ්‍රීාදි) අවශෙෂ සංස්කාරයෝ සංසිඳුණහ. සියලු විඥනය අස්තඞ්ගත වී ය."

## 8. 10

### දෙවන දබ්බ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම්වූ අනේපිඩුසිටුහු අරමෙහි වැඩ වසන සේක එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූනට අඩ ගා වදාල සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාල සේක:

"මහණෙනි, අහස් නැඟ, අහසැ පලඟින් හිඳ, තෙදකිසුණු සමවත සමවැද, එයින් නැඟී පිරිනිවි මල්ලපුත්‍ර දබ්බයන්ගේ ගිනි ගෙන දවෙන සිරුරේ අළු නො ම පැනිණ. දළි හෝ නො ම පැනිණ. මහණෙනි, ගිනි ඇවිළ දවෙන ගිතෙලෙහි හෝ තලතෙලෙහි අළු හෝ දළි යම්සේ නො ම පැනේ ද, මහණෙනි, එ පරිද්දෙන් ම අහස් නැඟ, අහසෙහි පලඟින් හිඳ තෙදකිසුණු සමවත සමවැද එයින් නැඟී පිරිනිවි මල්ලපුත්‍ර දබ්බයන්ගේ ගිනි ඇවිළ ගෙන දවෙන සිරුරැ අළු නො ම පැනිණ, දළි හෝ නො ද පැනිණ" යනු යි.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යකුළෙන් පහළ කලැ නැඟී දිලියෙන පිළිවෙළින් නිවුණු ගින්න ගිය තැනෙක් යම්සේ නො පැනේ ද,

එසේ ම කාමප්‍රබන්ධය ද (හෙවත් කාමෞඝය ද) සෙසු ඔඝ ද තරණය කළ, නොසැලෙන නිවන් සුව පැමිණි රහතුන්ගේ (දෙව්මිනිස් ඈ ගති අතුරෙන් මෙ නම් ගතියකට පැමිණියේ යැ යි) පනවන්නට ගතියෙක් නැත."

### අටවන පාටලිගාමිය වර්‍ගය යි.

එහි උද්දානය:

නිර්‍වාණ සූත්‍ර සතරෙක් ද චුන්ද පාටලිගාමිය අච්ඡාපථ විශාඛා යන සූත්‍ර ද දබ්බ සූත්‍ර දෙක ද සහ සියලු ඒ දශ සූත්‍ර කෙනෙක් කියන ලදහ.

---

මේ පළමු වන වර්‍ගය උතුම් වූ බොධිවර්‍ගය ය. දෙවැන්න මුචලින්ද වර්‍ගය ය. තෙවැන්න වනාහි උතුම් නන්දක වර්‍ගය ය. සතරවැන්න උතුම් මෙඝියවර්‍ගය ය. මෙහි පස්වන උතුම් සොණ වර්‍ගය ය. සවන උතුම් ජච්චන්ධ වර්‍ගය ය. සත්වැන්න උතුම් චූල්ල වර්‍ගය ය. අටවැන්න උතුම් පාටලිගාමිය වර්‍ගය ය. (මෙසේ වර්‍ග අටෙක.)

නො අඩුවූ අසූවක් උතුම් සූත්‍ර ඇති උතුම් වර්‍ග අටෙක් මෙහි මොනොවට බෙදන ලද්දේ ය. එකාන්තයෙන් ඒ මෙය උදාන නමැ යි කීහු.

## උදානපාළිය නිමි.

---

# ඉතිවුත්තකපාළි

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## එකකනිපාතො

### පඨමො වග්ගො

#### 1 1 1

#### ලොභසුත්තං

වුත්තං හේ'තං භගවතා. වුත්තමරහතා'ති[1] මෙ සුතං.

1. එක ධම්මං[2] භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? ලොභං භික්ඛවෙ එකධම්මං පජහථ අහං වො පාටිභොගො අනාගාමිතායා'ති.

එතමත්ථං[3] භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති:

2. "යෙන ලොභෙන ලුද්ධා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,
තං ලොභං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

#### 1. 1. 2.

#### දොසසුත්තං.

වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. එකධම්මං භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? දොසං භික්ඛවෙ එකධම්මං පජහථ අහං වො පාටිභොගො අනාගාමිතායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති:-

2. "යෙන දොසෙන දුට්ඨාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,
තං දොසං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

---

1. වුත්තං අරහතා'ති ඉ. අ. මු. 2. එකං ධම්මං සි. අ. මු. 3. එතං අත්ථං PTS. අ. මු.

# ඉතිවුත්තක පෙළ

## භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

## ඒකක නිපාතය

### ප්‍රථම වර්ගය

#### 1. 1. 1

#### ලෝභ සූත්‍රය

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, එක් සංක්ලේශ ධර්මයක් පහ කරවු. (එසේ ඇති කල්හි) මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද යත්:

මහණෙනි, ලොභ (කාමරාගය) නම් වූ එක ම සංක්ලේශ ධර්මය පහ කරවු. (එසේ ඇති කල්හි) මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් ලොභයෙකින් ඇලුනා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥනයෙන් බලන්නාහු ඒ ලොභය සම්‍යක් ප්‍රඥවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ලොභය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. මා විසින් අසන ලදී.

#### 1. 1. 2.

#### ද්වෙෂ සූත්‍රය

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ම ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, එක් සංක්ලේශධර්මයක් පහ කරවු. මම තොපට අනාගාමි භාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද? යත්:

මහණෙනි, ද්වෙෂ නම් වූ එක ම සංක්ලෙශධර්මය පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් ද්වෙෂයකින් දූෂිත වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥනයෙන් බලන්නාහු ඒ ද්වෙෂය සම්‍යක් ප්‍රඥවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ද්වෙෂය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මා විසින් මෙසේ අසන ලදී.

1. 1. 3.

## මොහසුත්තං

වුත්තං හෙතං භගවතා. වුත්ත මරහතා'ති මෙ සුතං.

1. එකධම්මං භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං?

මොහං භික්ඛවෙ එකධම්මං පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතායා'ති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:-

2. "යෙන මොහෙන මූළ්හා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,
තං මොහං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

1. 1. 4.

## කොධසුත්තං

වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. එකධම්මං භික්ඛවෙ පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? කොධං භික්ඛවෙ එකධම්මං පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:-

2. "යෙන කොධෙන කුද්ධා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං,
තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො,
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

1. 1. 5.

## මක්ඛසුත්තං

වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. එකධම්මං භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? මක්ඛං භික්ඛවෙ එකධම්මං පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතායා'ති.

1. 1. 3.

[මොහසූත්‍රය]

3. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. මහණෙනි, එක් සංක්ලේශධර්මයක් පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද යත්: මහණෙනි, මොහ නම් වූ එක ම සංක්ලේශධර්මය පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙයේ කියනු ලැබේ:

2. "යම් මොහයෙකින් මුළා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥානයෙන් බලන්නාහු ඒ මොහය සම්‍යක්ප්‍රඥයෙන් දැන සහමුලින් පහ කෙරෙත්. මොහය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්".

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

1. 1. 4.

[ක්‍රොධ සූත්‍රය]

4. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, එක් සංක්ලේශ ධර්මයක් පහ කරවු, මම තොපට අනාගාමි භාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද යත්: මහණෙනි, ක්‍රොධ නම් වූ මේ එක ම සංක්ලේශ ධර්මය පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා (ගාථා වශයෙන්) මෙය මෙසේ කියනු ලැබේ:

2. "යම් ක්‍රොධයෙකින් කිපියා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥානයෙන් බලන්නාහු ඒ ක්‍රොධය සම්‍යක්ප්‍රඥයෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ක්‍රොධය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්"

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

1. 1. 5.

[මක්ඛ සූත්‍රය]

5. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. මහණෙනි, එක් සංක්ලේශධර්මයක් පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද යත්: මහණෙනි, ම්‍රක්ෂ (මකු බව) නම් වූ මේ එක ම ධර්මය පහ කරවු. මම තොපට අනාගාමිභාවය පිණිස ඇප වෙමි.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන මක්ඛෙන මක්ඛා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මක්ඛං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

1. 1. 6.

[ මානසුත්තං ]

6. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. එකධම්මං භික්ඛවෙ පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? මානං භික්ඛවෙ එකධම්මං පජහථ. අහං වො පාටිභොගො අනාගාමිතායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන මානෙන මත්තා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මානං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

1. 1. 7.

[ සබ්බපරිඤ්ඤාසුත්තං ]

7. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. සබ්බං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. සබ්බඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් මකුබවෙකින් මෙරමා ගුණ වළහන්නා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනාඥානයෙන් බලන්නාහු ඒ මකුබව සම්‍යක්ප්‍රඥායෙන් දැන සහමුලින් පහ කෙරෙත්. මකුබව පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්".

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 1. 1. 6.

### [ මානසූත්‍රය ]

6. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, එක් සංක්ලේශධර්මයක් පහ කරවු. මම තොපට අනාගාමි භාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්මයක් ද යත්: මහණෙනි, මාන නම් වූ එක ම ධර්මය පහ කරවු. මම තොපට අනාගාමි භාවය පිණිස ඇප වෙමි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් මානයෙකින් මත් වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥානයෙන් බලන්නාහු ඒ මානය සම්‍යක්ප්‍රඥායෙන් දැන සහමුලින් පහ කෙරෙත්. මානය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 1. 1. 7.

### [ සබ්බපරිඤ්ඤා සූත්‍රය ]

7. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය හෙළි කොට වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. මහණෙනි, දත යුතු සියල්ල විශිෂ්ට ඥානයෙන් අවබොධ නො කරන්නේ, සර්ව ප්‍රකාරයෙන් දැන නොගන්නේ, එහි සිත නො ම නො අලවන්නේ, කෙලෙස් දුරු නොකරන්නේ, දුක් කෙළවර කිරීමට සමත් නො වේ. මහණෙනි, දත යුතු සියල්ල විශිෂ්ටඥානයෙන් අවබොධ කරන්නේ, සර්ව ප්‍රකාරයෙන් දැන ගන්නේ, එහි සිත නොඅලවන්නේ, කෙලෙස් දුරු කරන්නේ දුක් කෙළවර කිරීමට සමත් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යො සබ්බං සබ්බතො ඤත්වා සබ්බත්ථෙසු න රජ්ජති,
ස වෙ සබ්බං[1] පරිඤ්ඤාය සො සබ්බදුක්ඛමුපච්චගා[2]"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 1. 1. 8.

## [ මානපරිඤ්ඤාසුත්තං ]

8. වුත්තං හෙතං භගවතා, වුත්තමරහතා'ති මෙ සුතං:

1. මානං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. මානං ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති:

2. "මානුපෙතා අයං පජා මානගන්ථා භවෙ රතා
මානං අපරිජානන්තා ආගන්තාරො පුනබ්භවං
යෙ ච මානං පහත්වාන[3] විමුත්තා මානසඞ්ඛයෙ
තෙ මානගන්ථාභිභූතො සබ්බදුක්ඛමුපච්චගු[4]"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 1. 1. 9.

## [ ලොභපරිඤ්ඤාසුත්තං ]

9. වුත්තං හෙතං භගවතා, වුත්තමරහතා'ති මෙ සුතං:

1. ලොභං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. ලොභං ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති:

---

1. සබ්බ, මජසං. 2. සබ්බදුක්ඛං උපච්චගා, සයා. P.T.S. 3. පහන්ත්වාන, මජසං.
4. සබ්බදුක්ඛං උපච්චගුං, සයා. P.T.S.

2. "යම් යෝගාවචරයෙක් තෙමේ දත යුතු සියල්ල සර්වප්‍රකාරයෙන් දැන සියලු සත්කායධර්මයන්හි නො ඇලේ ද, හෙ තෙමේ ඒකාන්තයෙන් සියල්ල දැන ගැණීමෙන් සියලු සසර දුක් ඉක්මවත්තේ ය."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 1. 1. 8.

### [ මානපරිඤ්ඤා සූත්‍රය ]

8. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1 මහණෙනි, මානය විශිෂ්ටඥානයෙන් අවබෝධ නො කරන්නේ, සර්වප්‍රකාරයෙන් දැන නොගන්නේ, එහි සිත ඇල්ම නො හරින්නේ, කෙලෙස් නොදුරු ලන්නේ, දුක් කෙළවර කිරීමට සමත් නො වේ. මහණෙනි, මානය විශිෂ්ට ඥානයෙන් අවබෝධ කරන්නේ, සර්වප්‍රකාරයෙන් දැන ගන්නේ, එහි සිත නො අලවන්නේ, කෙලෙස් දුරුලන්නේ, දුක් කෙළවර කිරීමට සමත් වේ. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මේ සත්ත්වයෝ මානයෙන් යුක්ත වූවෝ මානයෙන් ගෙතුණෝ, භවයෙහි ඇලුනාහු ය. මානය (ත්‍රිවිධ පරිඥාවන්ගෙන්) පිරිසිඳ නොදන්නාහු පුනර්භවයට පැමිණෙත්. යම් කෙනෙක් මානය සර්වප්‍රකාරයෙන් ප්‍රහාණය කොට අර්හත් ඵලයෙහි පිහිටා (මානය සමග පවත්නාවූ සියලු කෙලෙසුන් කෙරෙන්) මිදුනාහු වෙද්ද, අභිභවනය කළ මානග්‍රන්ථ ඇති ඒ රහත්හු සියලු දුක් ඉක්මියහ."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

## 1. 1. 9.

### [ ලෝභපරිඤ්ඤා සූත්‍රය ]

9. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය හෙළි කොට වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, ලෝභය විශිෂ්ටඥානයෙන් අවබෝධ නො කරන්නේ, සර්වප්‍රකාරයෙන් දැන නොගන්නේ, එහි සිත ඇල්ම නොහරින්නේ, කෙලෙස් දුරු නොකරන්නේ, දුක් කෙළවර කිරීමට සමත් නො වේ. මහණෙනි, එහෙත් ලෝභය විශිෂ්ටඥානයෙන් අවබෝධ කරණුයේ, සර්වප්‍රකාරයෙන් දැන ගනුයේ, එහි සිත නො රඳනුයේ, කෙලෙස් පහ කරණුයේ, දුක් කෙළවර කිරීමට සමත් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යෙන ලොභෙන ලුද්ධා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං ලොභං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## 1. 1. 10.

### [ දොසපරිඤ්ඤාසුත්තං ]

10. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. දොසං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. දොසඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන දොසෙන දුට්ඨා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං දොසං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### [ පාටිභොගවග්ගො පඨමො. ]

**තස්සුද්දානං:**

රාගදොසා අථ මොහො කොධමක්ඛා මානං සබ්බං
මානතො ලොභදොසා පුන පකාසිතා වග්ගමාහු පඨමන්ති.

2. "යම් ලෝභයෙකින් ලුබ්ධ වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥානයෙන් බලන්නාහු ඒ ලෝභය සම්‍යක්ප්‍රඥාවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ලෝභය පහ කළාහු කිසි කලෙකත් මේ ලෝකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. එය මෙසේ මා විසින් අසන ලදි.

## 1. 1. 10.

## [ දෝසපරිඤ්ඤා සුත්‍රය ]

10. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය හෙළි කොට වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. මහණෙනි, ද්වේෂය විශිෂ්ටඥානයෙන් අවබෝධ නො කරණුයේ, සර්වප්‍රකාරයෙන් දැන නොගනුයේ, එහි සිත ඇල්ම නො හරිණුයේ, කෙලෙස් දුරු නො කරනුයේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් නො වේ. එහෙත් මහණෙනි, ද්වේෂය විශිෂ්ටඥානයෙන් අවබෝධ කරනුයේ, සර්වප්‍රකාරයෙන් දැන ගනුයේ, එහි සිත නොරඳවනුයේ, එහි ඇල්ම දුරු ලනුයේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් ද්වේෂයෙකින් දුෂ්ට වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනා ඥානයෙන් බලන්නාහු ඒ ද්වේෂය සම්‍යක්ප්‍රඥාවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ද්වේෂය පහ කළාහු කිසි කලෙකත් මේ ලෝකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

**පළමුවන පාටිභොග වර්ගය නිමි.**

**එහි උද්දානය:**

රාග, දෝස, මෝහ, කොධ, මක්ඛ, මාන, සබ්බ, නැවතත් මාන, ලෝභ, දෝස ද යන මොහු ප්‍රකාශිත ය හ. වර්ගය ප්‍රථම ය යි කීහු.

# දුතියවග්ගො

## 1. 2. 1.

### [මොහපරිඤ්ඤා සුත්තං]

11. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. මොහං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. මොහඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන මොහෙන මූළ්හා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මොහං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 1. 2. 2.

### [කොධපරිඤ්ඤා සුත්තං]

12 වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. කොධං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. කොධඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන කොධෙන කුද්ධා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

# දෙවන වර්ගය

## 1. 2. 1.

### [මොහපරිඤ්ඤා සූත්‍රය]

11. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය හෙළි කොට වදාරණ ලද්දේ ය. අතීත් වූ සර්‍වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. මහණෙනි, මොහය විශිෂ්ටඥනයෙන් අවබොධ නොකරන්නේ, සර්‍ව ප්‍රකාරයෙන් දැන නොගන්නේ, එහි සිත රඳවනුයේ, එය නො දුර ලනුයේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් නො වේ. මහණෙනි, එහෙත් මොහය විශිෂ්ටඥනයෙන් අවබොධ කරන්නේ, සර්‍වප්‍රකාරයෙන් දැනගන්නේ, එහි සිත නො අලවන්නේ, එය දුර ලන්නේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්‍ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් මොහයෙකින් මුළා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්‍ශනාඥනයෙන් බලන්නාහු ඒ මොහය සම්‍යක්ප්‍රඥවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. මොහය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. එය මෙසේ මා විසින් අසන ලදි.

## 1. 2. 2.

### [ක්‍රොධපරිඤ්ඤා සූත්‍රය]

12. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය හෙළි කොට වදාරණ ලද්දේ ය. අතීත් වූ සර්‍වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි:

1. "මහණෙනි, ක්‍රොධය විශිෂ්ටඥනයෙන් අවබොධ නොකරණුයේ, සර්‍වප්‍රකාරයෙන් දැන නොගනුයේ, එහි සිත අලවනුයේ, එය නො දුර ලනුයේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් නො වේ. මහණෙනි, එහෙත් ක්‍රොධය විශිෂ්ටඥනයෙන් අවබොධ කරනුයේ, සර්‍වප්‍රකාරයෙන් දැන ගනුයේ එහි සිත නො අලවනුයේ, එය දුර ලනුයේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඒ අර්‍ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ.

2. "යම් ක්‍රොධයෙකින් ක්‍රුද්ධ වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්‍ශනා ඥනයෙන්. බලන්නාහු ඒ ක්‍රොධය සම්‍යක් ප්‍රඥවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. ක්‍රොධය පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ අර්‍ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 1. 2. 3.

### [ මක්ඛපරිඤ්ඤා සුත්තං ]

13. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. මක්ඛං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. මක්ඛඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙන මක්ඛෙන මක්ඛාසෙ[1] සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මක්ඛං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචන"න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 1. 2. 4.

### [ අවිජ්ජානීවරණ සුත්තං ]

14. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකනීවරණම්පි සමනුපස්සාමි යෙන නීවරණෙන නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති යථයිදං භික්ඛවෙ අවිජ්ජානීවරණං. අවිජ්ජානීවරණෙන හි භික්ඛවෙ නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්තී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "නත්ථඤ්ඤො එකධම්මො'පි[2] යෙනෙවං[3] නිවුතා පජා
සංසරන්ති අහොරත්තං යථා මොහෙන ආවුතා.
3. යෙ ච මොහං පහන්වාන[4] තමොක්ඛන්ධං පදාලයුං
න තෙ පුන සංසරන්ති හෙතු තෙසං න විජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. මක්ඛිතාසෙ, ස්‍යා.ම. 2. එකධම්මොව, සීමු. 3. යෙනෙව, සී. මු
4. පහත්වාන, සීමු; මජසං

## 1. 2. 3.

### [ මක්ඛපරිඤ්ඤා සූත්‍රය ]

13. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මකු බව විශිෂ්ටඥනයෙන් අවබොධ නො කරන්නේ, සර්වප්‍රකාරයෙන් දැන නොගන්නේ, එහි සිත අලවන්නේ, එය දුරු නො කරන්නේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් නො වේ. මහණෙනි, එහෙත් මකු බව විශිෂ්ටඥනයෙන් අවබොධ කරන්නේ, සර්වප්‍රකාරයෙන් දැනැ ගන්නේ, එහි සිත නො අලවන්නේ, (මාර්ගඥනයෙන්) දුරු කරන්නේ, දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථාවශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් මකු බවෙකින් මෙරමා ගුණ වළහන්නා වූ සත්ත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනාඥනයෙන් බලන්නාහු ඒ මකුබව සම්‍යක්ප්‍රඥවෙන් දැන සහමුලින් පහ කෙරෙත්. මකුබව පහ කළාහු කිසි කලෙකත් මේ ලොකයට පෙරළා නො එත්."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. එය මෙසේ මා විසින් අසන ලදී.

## 1. 2. 4.

### [ අවිජ්ජානීවරණ සූත්‍රය ]

14. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, යම් නීවරණයෙකින් වෙළුනා වූ සත්ත්වයෝ (උත්පත්ති වශයෙන්) ඒ ඒ භවයන්හි දිවෙත් ද, හැසිරෙත් ද, මහණෙනි, මේ අවිද්‍යා-නීවරණය යම් සේ ද (එ බඳු වූ) අන් එක ම නීවරණයකුදු මම (ඥණසමනු-පස්සනාවෙන්) නො දකිමි. මහණෙනි, අවිද්‍යානීවරණයෙන් ඇවුරුණා වූ සත්ත්වයෝ බොහෝ කලක් මුළුල්ලෙහි (උත්පත්තිවශයෙන්) ඒ ඒ භවයන්හි දිවෙත්, හැසිරෙත්.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථාවශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම්සේ මොහයෙන් ඇවුරුණාහු ද එසේ යම් නීවරණයෙකින් සත්ත්වයෝ නිතර සසර හැසිරෙත් ද, මේ අවිද්‍යා නීවරණය යම් සේ ද, එබඳු වූ අන් එක ම ධර්මයෙකුදු නැත්තේ ය.

3. යම් ආර්‍යශ්‍රාවක කෙනෙක් මොහය දුරු කොට අර්හත්ත්ව මාර්ගඥන-යෙන් සහමුලින් මොහස්කන්ධය සින්දාහු ද, ඔහු නැවත සසර නො හැසිරෙත්. ඔවුනට සසර හැසිරීමෙහි හෙතුව විද්‍යමාන නො වේ."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

1. 2. 5.

[ තණ්හාසංයොජනසුත්තං ]

15. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකසඤ්ඤොජනම්පි[1] සමනුපස්සාමි යෙන සඤ්ඤොජනෙන සංයුත්තා සත්තා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති යථයිදං භික්ඛවෙ තණ්හාසඤ්ඤොජනං. තණ්හාසඤ්ඤොජනෙන හි භික්ඛවෙ සංයුත්තා සත්තා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්තී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

3. එවමාදීනවං ඤත්වා තණ්හං[2] දුක්ඛස්ස සම්භවං
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

1. 2. 6.

[ පඨමසෙඛසුත්තං ]

16. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො බාහිරං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහූපකාරං යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ භික්ඛු මනසිකරොන්තො අකුසලං පජහති කුසලං භාවෙතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යොනිසො මනසිකාරො ධම්මො සෙඛස්ස භික්ඛුනො,
නත්ථඤ්ඤො එවං බහුකාරො උත්තමත්ථස්ස පත්තියා,
යොනිසො පදහං භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

---

1 සංයොජනම්පි, PTS,
2. තණ්හා දුක්ඛස්ස සම්භවං, සී. මු.

## 1. 2. 5.

## [ තණ්හාසංයෝජන සූත්‍රය ]

15. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්‍වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, යම් සංයෝජනයෙකින් යුක්ත වූ සත්ත්වයෝ දීර්ඝකාලයක් සංසාරයෙහි දිවෙත් ද, හැසිරෙත් ද, මහණෙනි, මේ තෘෂ්ණාසංයෝජනය යම් සේ ද එබඳු වූ අන් එක ම සංයෝජනයකුදු මම සර්‍වඥතාඥානසමනුපස්සනා-වෙන් නො දකිමි. මහණෙනි, තෘෂ්ණාසංයෝජනයෙන් යුක්ත වූ සත්ත්වයෝ දීර්ඝකාලයක් සංසාරයෙහි දිවෙත්, හැසිරෙත්.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2–3. "තෘෂ්ණාව සහාය කොට ඇති පුරුෂ තෙමේ දීර්ඝකාලයක් හැසි-රෙන්නේ මනුෂ්‍යාත්මභාවය හා අවශෙෂ ආත්මභාව සඞ්ඛ්‍යාත සංසාරය නො ඉක්මෙයි. මහණ තෙමේ සමෘතිමත් වූයේ දුඃඛයාගේ හට ගැණීම වූ තෘෂ්ණාව මෙබඳු ආදීනව ඇත්තේ ය යි දැන, පහ කළ තෘෂ්ණා ඇතියේ, උපාදාන රහිත වූයේ, සංසාර ප්‍රවෘත්තියෙන් ඉවත් වන්නේ ය."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය ද වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 2. 6.

## [ පළමු සෙඛ සූත්‍රය ]

16. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්‍වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, නො පැමිණි අර්හත්ත්වය ඇති උතුම් වූ නිවණ පතමින් වෙසෙන ශෛක්‍ෂ භික්‍ෂුහට සිය සතන්හි උපන් අඞ්ගයක් වශයෙන් මේ යොනිසොමනසිකාරය යම්සේ බොහෝ උපකාර ඇත්තේ වේ ද, එබඳු වූ අන් එක ම අඞ්ගයකුදු මම නුවණැසින් නො දකිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කරණ භික්‍ෂු අකුසල් පහ කරයි. කුසල් වඩයි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථාවශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "නුවණින් මෙනෙහි කිරීම් සඞ්ඛ්‍යාත යම් ධර්මයෙක් වේ ද, ශෛක්‍ෂ භික්‍ෂුහට අර්හත්ත්වය ලැබ ගැනීම පිණිස එ සේ මහත් සේ උපකාරී වූ අන් එක් කරුණකුදු නුවණින් නො දක්මි. භික්‍ෂු තෙමේ නුවණින් වීර්‍ය වඩනුයේ දුඃඛක්‍ෂයට (නිවණට) පැමිණෙන්නේ ය."

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 2. 7.

### [ දුතියසෙඛසුත්තං ]

17. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො බාහිරං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහුපකාරං යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තො භික්ඛවෙ භික්ඛු අකුසලං පජහති කුසලං භාවෙතීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කල්‍යාණමිත්තො යො භික්ඛු සප්පතිස්සො සගාරවො,
කරං මිත්තානං වචනං සම්පජානො පතිස්සතො,
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසඤ්ඤොජනක්ඛය"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 1. 2. 8.

### [ සඞ්ඝභෙදසුත්තං ]

18. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. එකධම්මො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. කතමො එකධම්මො? සඞ්ඝභෙදො. සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ භින්නෙ අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි චෙව හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිභාසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිච්චජනා ච හොන්ති. තත්ථ අප්පසන්නා චෙව නප්පසීදන්ති. පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තං හොතී ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො,
වග්ගාරාමො අධම්මට්ඨො යොගක්ඛෙමා විධංසති,
සඞ්ඝං සමග්ගං භෙත්වාන කප්පං නිරයම්හි පච්චතී'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 1. 2. 7.

## [ දෙවන සෙඛ සූත්‍රය ]

17. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සම්බුදුවන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, නො පැමිණි අර්හත්ඵලය ඇති, උතුම් වූ නිවන පතමින් වෙසෙන ශෛක්‍ෂ භික්‍ෂුහට බාහිර වූ අඞ්ගයක් වශයෙන් මේ කල්‍යාණ මිත්‍රයන් ඇති බව බොහෝ උපකාර ඇත්තේ වේ ද, එබඳු වූ අන් එක අභ්‍යාසයකුදු මම නුවණැසින් නො දකිමි. මහණෙනි, කල්‍යාණමිත්‍රයන් ඇති භික්‍ෂු තෙමේ අකුසල් පහ කරයි, කුසල් වඩයි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සුවච වූ, ගෞරව සහිත වූ, කල්‍යාණමිත්‍රයන් ඇති යම් භික්‍ෂුවෙක් වේ ද (හෙ තෙමේ) නුවණ ඇත්තේ, පිහිටි සිහි ඇත්තේ, කල්‍යාණමිත්‍රයන්ගේ වචනය (ඉටු) කරනුයේ, පිළිවෙළින් සියලු සංයෝජනයන්ගේ ක්‍ෂය කිරීම් සඞ්ඛ්‍යාත අර්හත්ඵලයට පැමිණෙන්නේ ය."

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 2. 8.

## [ සඞ්ඝභෙද සූත්‍රය ]

18. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සම්බුදුවන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. "මහණෙනි, එක් (මහා සාවද්‍ය වූ) අකුශල ධර්මයෙක් සත්ත්ව ලොකයෙහි පහළ වනුයේ, බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නො සැප පිණිස, බොහෝ දෙනාට අනර්ථය පිණිස, දෙව් මිනිසුන්හට අහිත පිණිස දුක් පිණිස පහළ වෙයි. කවර එක් ධර්මයෙක් ද යත්: සඞ්ඝභෙදය යි. මහණෙනි, සඞ්ඝයා බිඳුණු කල්හි ඔවුනොවුන්ගේ කලහයෝ ද වෙත්, ඔවුනොවුන්ගේ තර්ජනයෝ ද වෙත්, ඔවුනොවුන්ගේ පිරිහෙළීම්හු ද වෙත්, ඔවුනොවුන්ගේ අත්හැරීම්හු ද වෙත්. එහි නො පහන් වූවෝ ද නො පහදිත්. පැහැදුණු ඇතැමුන්ගේ වෙනස් බවෙක් ද වෙයි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "අපායෙහි ඉපැද්මට සුදුසු වූ අවීචි මහානරකයෙහි ඉපැත්ම පිණිස පවත්නා වූ, කපක් මුළුල්ලෙහි එහි සිටීමට කාරණ වූ ව්‍යග්‍රාරාම වූ (භෙදයෙහි ඇලුණු) අධර්මයෙහි පිහිටියා වූ, සඞ්ඝභෙද කර්මය කරන්නා වූ පුද්ගල තෙමේ නිවනින් වෙසෙසින් පිරිහෙයි. (නිවන් නො ලබයි.) සමග වූ සඞ්ඝයා බිඳ කල්පයක් නරකයෙහි පැසෙයි."

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 2. 9.

### [ සඞ්ඝසාමග්ගිසුත්තං ]

19. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. එකධම්මො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමො එක ධම්මො? සඞ්ඝසාමග්ගී. සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ සමග්ගෙ න චෙව අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිභාසා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිච්චජනා හොන්ති. තත්ථ අප්පසන්නා චෙව පසීදන්ති, පසන්නානඤ්ච භිය්‍යොභාවො හොතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානඤ්චනුග්ගහො
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න [ධංසති,
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදතී'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 1. 2. 10.

### [ පදුට්ඨපුග්ගලසුත්තං ]

20. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉමම්හි චායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො, එවං නිරයෙ. තං කිස්ස හෙතු: චිත්තඤ්හි'ස්ස භික්ඛවෙ පදුට්ඨං. චෙතොපදොසහෙතු ඛො පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජන්ති"ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පදුට්ඨචිත්තං ඤත්වාන එකච්චං ඉධ පුග්ගලං,
එතමත්ථඤ්ච ව්‍යාකාසි බුද්ධො භික්ඛූන සන්තිකෙ.
3. ඉමම්හි චායං සමයෙ කාලං කයිරාථ පුග්ගලො,
නිරයං උප්පජ්ජෙය්‍ය චිත්තඤ්හි'ස්ස පදූසිතං."

### 1. 2. 9.

### [ සඞ්ඝසාමග්ගී සූත්‍රය ]

19. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, එක් කුශල ධර්මයෙක් සත්ත්ව ලොකයෙහි උපදිනුයේ, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, බොහෝ දෙනාට අර්ථ පිණිස දෙවිමිනිස්නට හිත පිණිස, සැප පිණිස, උපදියි. කවර එක් ධර්මයෙක් ද? යත්: සඞ්ඝයාගේ සමගිය යි මහණෙනි, සඞ්ඝයා සමඟ වූ කල්හි ඔවුනොවුන්ගේ කලහයෝ නො වෙත්. ඔවුනොවුන්ගේ තර්ජනයෝ ද නො වෙත්. ඔවුනොවුන්ගේ පිරිහෙළීම්හු ද නො වෙත් ඔවුනොවුන්ගේ අත් හැරීම් ද නො වේ. එහි ලා නො පහන් වූවෝ පහදිත්. පහන් වූවන්ගේ බොහෝ බව ද වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා ඒ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “සඞ්ඝයාගේ සමගිය සැපයට හෙතුවෙකි. සමගවූවනට අනුබල දීම ද සුව එළවන්නේ වේ. සමගියෙහි ඇලුනා වූ, ධර්මයෙහි පිහිටි පුද්ගල තෙමේ නිවනින් නො පිරිහෙයි සඞ්ඝයා සමඟ කොට කල්පයක් දෙව්ලොවැ සතුටු වෙයි.”

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### 1. 2. 10.

### [ පදුට්ඨපුග්ගල සූත්‍රය ]

20. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මම මේ ලෝකයෙහි දූෂිත සිතැති ඇතැම් පුද්ගලයකු මෙසේ මගේ සිතින් ඔහු සිත පිරිසිඳ දනිමි: මේ පුද්ගලයා මේ කාලයෙහි කලුරිය කෙරේ නම් ගෙන එන ලද්දක් යම් සේ බිම තබා ද, එසේ නිරයෙහි උපදනේ වෙයි. ඒ කවර හෙයින? යත්: මහණෙනි, යම් හෙයෙකින් ඔහුගේ සිත ප්‍රදුෂ්ට ද, එහෙයිනි. මහණෙනි, සිත දූෂිත වීම හේතු කොට ගෙණ මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්ත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තා වූ, දුකට හේතු වූ, විවශ ව පතිත වන තැන වූ නරකයෙහි උපදිත්.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි ලා මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයකු ප්‍රදුෂ්ට සිත් ඇත්තකු වශයෙන් දැන බුදුහු භික්ෂූන්ගේ සමීපයෙහි මේ කාරණය ප්‍රකාශ කළහ:

3. මේ කාලයෙහි මේ පුද්ගල තෙමේ කලුරිය කෙරේ නම් නරකයෙහි උපදනේ ය. යම් හෙයකින් ඔහුගේ සිත දූෂිත වූයේ ද එ හෙයිනි.”

4. යථා'හරිත්වා නික්ඛිපෙය්‍ය එවමෙව තථාවිධා
 චෙතොපදොසහෙතු හි සත්තා ගච්ඡන්ති දුග්ගති"න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**වග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

මොහො කොධො අථ මක්ඛො අවිජ්ජා තණ්හා සෙඛා ද්වෙ,
භෙදො සාමග්ගි පුග්ගලො ච වග්ගමාහු දුතියන්ති වුච්චති.

---

# තතියො වග්ගො

## 1. 3. 1.

## [ **පසන්නචිත්ත සුත්තං** ]

21. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: "ඉම්හි චායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය යථා'භතං නික්ඛිත්තො එවං සග්ගෙ. තං කිස්ස හෙතු? චිත්තංහි'ස්ස භික්ඛවෙ පසන්නං. චෙතොපසාද හෙතු ඛො පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තී ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පසන්න චිත්තං ඤත්වාන එකච්චං ඉධ පුග්ගලං,
 එතමත්ථං ච ව්‍යාකාසි බුද්ධො භික්ඛුන සන්තිකෙ.

3. ඉමම්හි චායං සමයෙ කාලං කයිරාථ පුග්ගලො,
 සුගතිං උපපජ්ජෙය්‍ය චිත්තංහි'ස්ස පසාදිතං.

4. යථා'හරිත්වා නික්ඛිපෙය්‍ය එවමෙව තථාවිධො
 චෙතොපසාදහෙතු හි සත්තා ගච්ඡන්ති සුග්ගති"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

4. “යම්සේ යමක් ගෙනවුත් බහා තබන්නේ ද, එසේ ම එවැනි සත්ත්වයෝ චිත්තප්‍රදෙෂ හේතුයෙන් දුගතියට යෙත්.”

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී.

**දෙවන වර්ගය යි.**

**එහි උද්දානය:**

මොහ, කොධ, මක්ඛ, මොහ, අවිජ්ජා (නීවරණ), තණ්හා (සංයොජන) සෙඛ දෙකය, සඞ්ඝභෙද, සඞ්ඝසාමග්ගි, දුට්ඨපුග්ගල යැ යි මේ සූත්‍ර කීහු. වර්ගය දෙවැනි ය යි කියනු ලැබේ.

---

## තුන්වන වර්ගය

### 1. 3. 1.

### [ පසන්නචිත්ත සූත්‍රය ]

21. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, මේ ලෝකයෙහි පැහැදුණු සිත් ඇති ඇතැම් පුද්ගලයකු මෙසේ (මගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දනිමි: “මේ පුද්ගලයා මේ කාලයෙහි කලුරිය කෙරේ නම්, හිසින් ගෙනා බරක් යම්සේ බහා තබනු ලැබේ ද, එසේ ම ස්වර්ගයෙහි උපදියි. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඔහුගේ සිත ප්‍රසන්න ය. එ හෙයිනි. මහණෙනි, සිත පැහැදීම හෙතු කොට ගෙණ මෙසේ සමහර සත්ත්වයෝ කරජකායයාගේ භෙදයෙන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයෙහි උපදිත්.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මෙහි ලා මේ අර්ථය (ගාථාවශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “මේ ලොකයෙහි ඇතැම් පහන් සිතැති පුහුලකු දැන බුදුහු භික්ෂූන්ගේ සමීපයෙහි මේ කාරණය වදාළහ:

3. “මේ කාලයෙහි මේ පුද්ගල තෙමේ කලුරිය කෙරේ නම්, සුගතියෙහි උපදනේ ය. ඔහුගේ සිත ප්‍රසන්න ය. එ හෙයිනි.

4. යම් සේ යමක් ගෙණවුත් බහා තබන්නේ ද, පැහැදුණු සිත් ඇති පුද්ගල තෙමේ ද, එ පරිද්දෙන් ම ස්වර්ගයෙහි උපදනේ වේ. සිත පැහැදීම හෙතු කොට ගෙන සත්ත්වයෝ සුගතියට යෙත්.”

මේ කාරණය ද භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.. මෙසේ මා විසින් අසන ලදී.

## 1. 3. 2.

## [මාපුඤ්ඤභායී සුත්තං[1]]

22. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. මා භික්ඛවෙ පුඤ්ඤානං භායිත්ථ. සුඛස්සෙතං භික්ඛවෙ අධිවචනං ඉට්ඨස්ස කන්තස්ස පියස්ස මනාපස්ස යදිදං පුඤ්ඤානි. අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ දීඝරත්තං කතානං පුඤ්ඤානං ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං. සත්ත වස්සානි මෙත්තචිත්තං භාවෙත්වා සත්ත සංවට්ට-විවට්ටකප්පෙ නයිමං ලොකං පුනරාගමාසිං. සංවට්ටමානෙ සුදං භික්ඛවෙ කප්පෙ ආභස්සරූපගො හොමි. විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි. තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු-දසො වසවත්තී. ඡත්තිංසක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො. අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්තී ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන-සම්පන්නො. කො පන වාදො පදෙසරජ්ජස්ස? තස්ස මය්හං භික්ඛවෙ එතද-හොසි: 'කිස්ස නු ඛො මෙ ඉදං කම්මස්ස ඵලං, කිස්ස කම්මස්ස විපාකො, යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවො'ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: තිණ්ණං ඛො මෙ ඉදං කම්මානං ඵලං, තිණ්ණං කම්මානං විපාකො, යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවො'ති. සෙය්‍යථීදං: දානස්ස දමස්ස සඤ්ඤමස්සා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය ආයතග්ගං සුඛුද්‍රයං
දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ.

3. එතෙ ධම්මෙ භාවයිත්වා තයො සුඛසමුද්දයෙ
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1 මෙත්තසුත්ත. (මජසං.)

## 1. 3. 2.

## [ මාපුඤ්ඤභායී සූත්‍රය ]

22. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් මෙය වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, පිණට බිය නො වවු. මහණෙනි, මේ පින් යනු යහපත් වූ සිත්කලු වූ ප්‍රිය වූ මන වඩන්නා වූ සැපයට නමෙකි. මහණෙනි, බොහෝ කලක් මුලුල්ලෙහි (මා විසින්) කරන ලද පුණ්‍යකර්මවල යහපත් වූ සිත්කළු වූ ප්‍රිය වූ මන වඩන්නා වූ ප්‍රතිඵල වළඳන ලද සි මම හොඳින් දනිමි. සත් වසක් මෙත් සිත වඩා (සංවර්ත විවර්ත) මහාකල්ප සතක් මුළුල්ලෙහි මේ කාම ලෝකයට පෙරළා නො ආයෙමි. මහණෙනි, කල්පය වැනසෙන කල්හි ආභස්සර නම් බඹලොවට යන්නෙම් වෙමි. කල්පය හට ගන්නා කල්හි හිස් වූ (ප්‍රථමධ්‍යාන භූමි සඞ්ඛ්‍යාත) බ්‍රහ්ම විමානයෙක උපදිමි. මහණෙනි, මම එහි (බඹ විහරණයෙන් උපන් හෙයින්) බ්‍රහ්මයා වෙමි. (බ්‍රහ්ම පාරිසද්‍ය බ්‍රහ්ම පුරෝහිතයනට වඩා ශ්‍රෙෂ්ඨ හෙයින්) මහාබ්‍රහ්ම වෙමි. කිසිවකු විසින් මැඩ පැවැත්වියැ නො හැකි වෙමි. කිසි යම් ගුණයෙකිනුදු කිසිසේත් මැඩ පැවැත්විය නො හැකි වෙමි. තුන් කල් දන්නෙම් වෙමි. සෙස්සන්ගේ සිත් තමාගේ වශයෙහි පවත්වන්නෙම් වෙමි. මහණෙනි, මම සතිස් වරක් දෙවියනට අධිපති වූ ශක්‍රයා වීමි. නොයෙක් සියගණන් වාරයන්හි ධාර්මික වූ, ධර්මරාජන් වූ, සතර මහා ද්වීපයට අධිපති වූ, සතුරන් ජය ගන්නා වූ, ජනපදයන්හි ස්ථිරභාවයට පත් වූ, සත් රුවනින් යුක්ත වූ සක්විති රජ වීමි. ප්‍රදේශ-රාජ්‍යලාභය ගැන කියනුම කවරේ ද? මහණෙනි, ඒ මට "මේ මගේ කවර කර්මයෙක ප්‍රතිඵලයෙක් ද? යම් හෙයකින් මම දැන් මෙසේ මහත් සෘද්ධි ඇත්තෙම් නම්, මහානුභාව ඇත්තෙම් නම්, ඒ කවර කර්මයෙක විපාකයෙක් දැ?"යි මෙ බඳු සිතෙක් විය. මහණෙනි, ඒ මට "යමක් හෙතු කොට ගෙණ මම දැන් මෙසේ මහත් සෘද්ධි ඇත්තෙම් ද, මෙසේ මහානුභාව ඇත්තෙම් ද, එය මා විසින් කරන ලද මේ පින්කම් තුනේ ප්‍රතිඵලය යි. ඒ කවරේද? යත්: දානය, ඉන්ද්‍රිය දමනය, කායවාක් සංවරය යන තුන යැ"යි මේ සිත විය.

බුදුහු මේ කාරණය වදාළහ. ඒ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යමෙක් තමහට වැඩ කැමැති නම්, හෙ තෙමේ මහත් ඵල ඇති, සැප විපාක ගෙණ දෙන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාව ම සම්පූර්ණ කරන්නේ ය. දානය ද (සමචර්‍ය්‍යා නම් වූ) ශීලය ද, මෙත් සිත ද වඩන්නේ ය.

3. නුවණැති මනුෂ්‍ය තෙමේ මේ ත්‍රිවිධ ධර්මයන් සම්පූර්ණ කොට දුක් රහිත වූ බ්‍රහ්ම ලෝකයට පැමිණෙන්නේ ය."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය ද වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 3. 3.

### [ උභො-අත්ථ සුත්තං ]

23. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති, දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්ච. කතමො එකධම්මො? අප්පමාදො කුසලෙසු ධම්මෙසු. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චා ති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා.
අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො.

3. දිට්ඨෙච ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතො'ති පවුච්චතී''ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 1. 3. 4.

### [ අට්ඨිපුඤ්ජසුත්තං ]

24. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. එකපුග්ගලස්ස භික්ඛවෙ කප්පං සන්ධාවතො සංසරතො සියා එවං මහාඅට්ඨිකඞ්කලො අට්ඨිපුඤ්ජො අට්ඨිරාසි යථායං වෙපුල්ල පබ්බතො. සචෙ සංහාරකො අස්ස සම්භතඤ්ච න විනස්සෙය්‍යා ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "එකස්සෙකෙන කප්පෙන පුග්ගලස්සට්ඨිසඤ්චයො
සියා පබ්බතසමො රාසි ඉති වුත්තං මහෙසිනා.

3. සො ඛො පනායං අක්ඛාතො වෙපුල්ලො පබ්බතො මහා
උත්තරෙ ගිජ්ඣකූටස්ස මගධානං ගිරිබ්බජෙ.

4. යතො අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති
දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

5. සත්තක්ඛත්තුං පරමඤ්ච සන්ධාවිත්වාන පුග්ගලො
දුක්ඛස්සන්තකරො හොති සබ්බසංයොජනක්ඛයා''ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 1. 3. 3.

### [ උභයත්ථ සූත්‍රය ]

23. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී:

1. මහණෙනි, එක් ධර්මයෙක් වඩන ලද්දේ නැවත නැවත පුරුදු කරණ ලද්දේ මෙලොව යහපත පරලොව යහපත යන උභය ලොකාර්ථසිද්ධිය අත් නොහැර පවතී. කවර එක් ධර්මයෙක් ද යත්: කුශලධර්මයන් කෙරෙහි සිහිය එළැවීම යි. මහණෙනි, මේ එක ම ධර්මය වඩන ලද්දේ නැවත නැවත පුරුදු කරණ ලද්දේ මෙලොව යහපත පරලොව යහපත යන උභයලොකාර්ථසිද්ධිය අත් නොහැර පවත්නේ යි.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඒ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පුණ්‍යක්‍රියා විෂයයෙහි සිහිය එළවීම පණ්ඩිතයෝ පසසත්. සිහි ඇති පණ්ඩිත තෙමේ දෙලොව යහපත වෙසෙසින් සලසා ගනී.

3. මෙලොව දී ලැබිය යුතු යම් අභිවෘද්ධියෙක් වේ නම් එය ද, පරලොව දී ලැබිය යුතු යම් අභිවෘද්ධියෙක් ඇත් නම් එය ද යන දෙලොවෙහි අභිවෘද්ධිය ලැබීම හේතු කොට ගෙණ ඒ නුවණැත් පුද්ගල තෙමේ පණ්ඩිතයෙක් යැ යි කියනු ලැබේ."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය වදාරණ ලදී. මවිසින් මෙසේ අසන ලදී.

## 1. 3. 4.

### [ අට්ඨිපුඤ්ජ සූත්‍රය ]

24. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මවිසින් මෙසේ අසන ලදී:
මහණෙනි, මහා කල්පයක් තුළ සසර ඇවිදින්නා වූ, ඒ ඒ භවයෙහි හැසිරෙන්නා වූ සත්ත්වයකුගේ ඇටගොඩ, අස්ථිපුඤ්ජය, ඇටරැස ඉදින් එක් රැස් කරණ ලද්දේ නො නැසී පවත්නේ නම්, එය මේ වෙපුල්ල පර්වතය සෙයින් මහත් වන්නේ ය.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඒ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2–3. "මගධ රට ගිරිබ්බජ නම් වූ රජගහ නුවර සමීපයෙහි වූ, ගිජ්ඣකූළ පව්වට උතුරින් පිහිටි ඒ මේ වෙපුල්ල පර්වතය (රජගහ නුවර පිරිවරා සිටි කඳු පහ අතුරින්) මහත් යැ යි කියනු ලැබේ. එක් කපක් තුළ රැස් කරණ ලද එක් පුද්ගලයකුගේ ඇට සමූහය ඒ වෙපුල්ල පර්වතයට සම වේ යැ යි මහර්ෂි වූ බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදී.

4–5. 'යම් කලෙක පටන් පුද්ගල තෙමේ දුක ය, දුක ඉපදීමට හෙතුවය, දුක් නැති කිරීමය, දුක් නැති කිරීමේ මාර්ගය යන ආර්ය සත්‍යයන් සම්‍යක්ප්‍රඥාවෙන් දකී ද, හෙතෙමේ සත් වර හිමි කොට (භවයෙහි) ඔබ මොබ හැසිර සියලු සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් දුක් කෙළවර කරන්නේ වෙයි."

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මවිසින් මෙසේ අසන ලදී.

### 1. 3. 5.

### [සම්පජාන මුසාවාද සුත්තං]

25. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං:

1. එකං ධම්මං අතීතස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස නාහං තස්ස කිඤ්චි පාපකම්මං අකරණීයන්ති වදාමි. කතමං එකධම්මං? යථයිදං[1] භික්ඛවෙ සම්පජාන මුසාවාදො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 1. 3. 6.

### [දානසංවිභාග සුත්තං]

26. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං:

1. එවඤ්චෙ භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං දානසංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, න අදත්වා භුඤ්ජෙය්‍යුං. න ච නෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය. යො'පි නෙසං අස්ස චරිමො ආලොපො චරිමං කබළං, තතො'පි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං සචෙ නෙසං පටිග්ගාහකා අස්සු. යස්මා ච ඛො භික්ඛවෙ සත්තා න එවං ජානන්ති දානසංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, තස්මා අදත්වා භුඤ්ජන්ති මච්ඡෙරමලඤ්ච නෙසං චිත්තං පරියාදාය තිට්ඨතී ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "එවං චෙ සත්තා ජානෙය්‍යුං යථාවුත්තං මහෙසිනා
විපාකං සංවිභාගස්ස යථා හොති මහප්ඵලං

3. විනෙය්‍යුං මච්ඡෙරමලං විප්පසන්නෙන චෙතසා
දජ්ජුං කාලෙන අරියෙසු යත්ථ දින්නං මහප්ඵලං

4. අන්නං ච දත්වා බහුනො දක්ඛිණෙය්‍යෙසු දක්ඛිණං
ඉතො චුතා මනුස්සත්තා සග්ගං ගච්ඡන්ති දායකා.

5. තෙ ච සග්ගං ගතා තත්ථ මොදන්ති කාමකාමිනො
විපාකං සංවිභාගස්ස අනුභොන්ති අමච්ඡරා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. යදිදං. මජසං.

## 1. 3. 5.

## [සම්පජානමුසාවාද සූත්‍රය]

26. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය අර්හත් වූ සර්ඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, වාක්සත්‍ය නම් වූ එක් ධර්මයක් ඉක්මි ඒ පුද්ගලයා විසින් නො කළ හැකි කිසි යම් පාපකර්මයෙක් නැතැ යි මම කියමි. කවර එක් ධර්මයෙක් ද? යත්: මහණෙනි, යම් බඳුවූ මේ දැන දැන බොරු කීමෙක් වේ ද එය යි

මේ කාරණය බුදුහු වදාළහ. ඒ අර්ථය ගාථාවශයෙන් මෙසේ කියනු ලැබේ:

2. "එක ම වාක්සත්‍යය ඉක්මි, බොරු කියන සුලු වූ, පරලොව සැපතින් ඉවත් වූ මනුෂ්‍යයා විසින් නො කළ හැකි පවෙක් නැත්තේ ය.".

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි.

## 1. 3. 6.

## දානසංවිභාග සූත්‍රය

26. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. අර්හත් වූ සර්ඥයන් වහන්සේ විසින් වදාරන ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, බෙදා දී වැළඳීමෙහි අනුසස් මම යම් සේ දනිම් ද, එසේ ම සෙස්සෝත් දනිත් නම් නොදී නො වළඳන්නාහු ය. මසුරු මල ඔවුන්ගේ සිත හාත්පසින් අල්ලා ගෙණ නො සිටින්නේ ය. ඔවුන්ගේ යම් අවසන් බත් පිඩෙක් වෙයි නම්, පිළිගන්නෝද වෙත් නම්, ඒ බත් පිඩෙන් ද කොටසක් බෙදා නොදී නො වළඳන්නාහු ය. මහණෙනි, බෙදා දී වැළඳීමෙහි අනුසස් මා දන්නා සේ සෙසු මිනිස්සු යම් හෙයකින් නො දනිත් ද, එ බැවින් බෙදා දී නො වළඳත්. මසුරුමල ද ඔවුන්ගේ සිත හාත්පසින් මැඩ ගෙණ සිටියි.

මේ කාරණය බුදුහු වදාළහ. එයි ලා මේ අර්ථය ගාථා වශයෙන් මෙසේ කියනු ලැබේ:

2-3. "බෙදා වැළඳීමෙහි අනුසස් මහත් ඵල වන පරිදි බුදුහු විසින් යම් ලෙසකින් වදාරණ ලද සැටියෙන් මිනිස්සු දනිත් නම්, මසුරුමල දුර ලන්නාහු ය. යම් තැනකට දෙන ලද්දේ මහත්ඵල වේ ද (එබඳු වූ) ආයතනට සුදුසු කාලයෙහි පහන් සිතින් දන් දෙන්නාහු ය.

4. දන් පිළිගැණීමට සුදුසු ආයතනට පරලොව අදහා දන් දී බොහෝ දායකයෝ මේ මිනිසත් බැවින් චුත ව ස්වර්ගයට යෙත්.

ඒ දායකයෝ ස්වර්ගයට ගියාහු එහි සියලු කම්සැපවලින් යුක්ත ව සතුටු වෙත්. මසුරුමල රහිත වූ ඔහු බෙදා වැළඳීමෙහි ප්‍රතිඵල වළඳත්."

භාග්‍යවතුන්වහන්සේ විසින් මේ අර්ථය ද වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී.

## 1. 3. 7.

## [මෙත්තාචෙතොවිමුත්ති සුත්තං]

27. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං:

1. යානි කානිචි භික්ඛවෙ ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි, සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං. මෙත්තා යෙව තානි චෙතොවිමුත්ති අධිග්ගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච. සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරකරූපානං පභා, සබ්බා තා චන්දිම-පභාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දප්පභා යෙව තා අධිග්ගහෙත්වා භාසතෙ ච, තපතෙ ච, විරොචති ච, එවං ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි, සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං. මෙත්තා යෙව තානි චෙතොවිමුත්ති අධිග්ගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච.

2. සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ නභෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො[1] සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි, සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං. මෙත්තා යෙව තානි චෙතො-විමුත්ති අධිග්ගහෙත්වා භාසතෙ ච, තපතෙ ච, විරොචති ච. සෙය්‍යථාපි භික්ඛවෙ රත්තියා පච්චූසසමයං ඔසධි තාරකා භාසතෙ ච තපතෙ ච විරොචති ච, එව මෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤ-කිරියවත්ථූනි, සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං. මෙත්තා යෙව තානි චෙතොවිමුත්ති අධිග්ගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති:

3. "යො ච මෙත්තං භාවයති අප්පමාණං පටිස්සතො,
තනූ සංයොජනා හොන්ති පස්සතො උපධික්ඛයං.

4. එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො මෙත්තායති කුසලො තෙන හොති
සබ්බෙ ච පාණෙ මනසානුකම්පං පහූතමරියො පකරොති පුඤ්ඤං.

5. යෙ සත්තසණ්ඩං පඨවිං විජෙත්වා රාජීසයො යජමානානුපරියගා,
අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගළං.

6. මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං
චන්දප්පභා තාරගණා'ව සබ්බෙ.

---

1. අබ්භුස්සග්ගමානො. සී. අ. මු. අබ්භුස්සුක්කමානො. සී. අ. කථා.

## 1. 3. 7.

### [මෙත්තා චෙතොවිමුත්ති සූත්‍රය]

27. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. අර්හත් වූ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, උපධි සම්පතට (අත්බැව් සපුවට) හිතවූ යම් ඒ පින්කිරියවත්හු වෙත් නම්, ඒ සියල්ල මෛත්‍රීචිත්තවිමුක්තියගේ සොළොස් වන කලාවකුදු නො වටී. ඒ පින් කිරිය වත් මැඩ පවත්වා මෛත්‍රීචිත්තවිමුක්තිය ම දිලිසෙයි, විරුද්ධ ධර්මයන් තවයි, බබලයි. මහණෙනි, තාරකාවන්ගේ යම් ප්‍රභායෙක් වේ නම් යම් සේ එය සඳපහනින් සොළොස් වන කලාවකුදු නො වටී ද, ඒ තරු එළිය මැඩ පවත්වා සඳ එළිය ම දිලිසේ ද, අඳුරු තවා ද, බබලා ද, මහණෙනි, එ පරිද්දෙන් ම ඖපධික වූ යම් ඒ පින්කිරිය වත්හු වෙත් නම්, ඒ සියල්ල මෛත්‍රීචිත්තවිමුක්තියගේ සොළොස් වන කලාවකුදු නො අගී. ඒ පින්කිරියවත් මැඩ පවත්වා මෛත්‍රී චිත්තවිමුක්තිය ම දිලිසෙයි, විරුද්ධ ධර්මයන් තවයි, බබලයි.

2. මහණෙනි, යම් සේ වස්සාන සෘතුවෙහි කෙළවර ඉල් මස සරත් කාලයෙහි හෙළි වූ, විසුරුණු වැහි වලාකුළු ඇති, පහ වූ වලාකුළු ඇති, අහසෙහි සූර්‍ය්‍යයා ගමන් කරන්නේ අහසෙහි වූ සියලු අඳුරු මැඩ පවත්වා දිලිසේ ද, අඳුරු තසා ද, බබලා ද, මහණෙනි, එ පරිද්දෙන් ම උපධි සම්පතට කරුණු වූ යම් ඒ පින්කිරියවත්හු වෙත් නම්, ඒ සියල්ල මෛත්‍රීචිත්තවිමුක්තියගේ සොළොස් වන කලාවකුදු නො අගී. ඒ පින්කිරියවත් මැඩ පවත්වා මෛත්‍රීචිත්තවිමුක්තිය ම දිලිසෙයි, විරුද්ධ ධර්මයන් තවයි, බබලයි. මහණෙනි, යම් සේ රෑ පැසුලුයම්හි (අලුයම්හි) දවහත් තරුව දිලිසේ ද, අඳුරු තසා ද, බබලා ද, මහණෙනි, එ පරිද්දෙන් ම උපධි සම්පතට කරුණු වූ යම් ඒ පින්කිරියවත්හු වෙත් නම්, ඒ සියල්ල මෛත්‍රීචිත්තවිමුක්තියගේ සොළොස් වන කලාවකුදු නො අගී. ඒ පින්කිරියවත් මැඩපවත්වා මෛත්‍රීචිත්තවිමුක්තිය ම දිලිසෙයි, විරුද්ධ ධර්මයන් තවයි, මැඩ බබලයි.

මේ කාරණය භගවත්හු වදාළහ. එහි මේ අර්ථය ගාථා වශයෙන් මෙසේ කියනු ලැබේ:

3. "යම් ගිහියෙක් හෝ පැවිද්දෙක් එළඹ සිටි සිහි ඇත්තේ මෛත්‍රී ධ්‍යානය අප්‍රමාණය වශයෙන් වඩා ද, නිර්වාණය දක්නා වූ ඔහුගේ සංයෝජනයෝ තුනී වෙත්.

4. ඉදින් එක් ප්‍රාණියකු කෙරෙහි දූෂිත නො වූ සිතින් යුතු ව මෙත් කෙරේ ද, ඒ හෙතු කොට ගෙණ හෙ තෙමේ මහ පින් ඇත්තෙක් වේ. සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පාවෙන් යුත් ආර්‍ය්‍ය තෙමේ බොහෝ පින් කරන්නේ ය යනු කියනු ම කිම?

5–6. මිනිසුන්ගෙන් ගැවැසී ගත්තා වූ මහ පොළොව ජය ගත් සෘෂින් වැනි යම් දැහැමි රජ කෙනෙක් වූ ද (ඔහු) අස්සමෙධ, පුරිසමෙධ, සම්මාපාස, වාජපෙය්‍ය, නිරග්ගළ යන යාගයන් කරමින් හැසුරුණාහු ද, ඒ යාග මනා කොට වඩන ලද මෙත් සිතින් ලැබෙන පිණින් සොළොස් වන කලාවකුදු නො අගී. සියලු තරු සඳපහනින් සොළොස් වන කලාවකුදු නො අගනාක් මෙනි.

7. යො න හන්ති න ඝාතෙති න ජිනාති න ජාපයෙ
මෙත්තංසො සබ්බභූතෙසු වෙරං තස්ස න කෙනචී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**වග්ගො තතියො.**

**තස්සුද්දානං:**

චිත්තං ඣායී උභො අත්ථෙ පුඤ්ඤං වෙපුල්ලපබ්බතං
සම්පජානමුසාවාදෙ දත්වා මෙත්තභාවනා.

සත්තමානීධ සුත්තානි පුරිමානි ච වීසති
එකධම්මෙසු සුත්තන්තා සත්තවීසතිසඞ්ගහා'ති.

**එකකනිපාතො නිට්ඨිතො.**

# දුකනිපාතො

## පඨමො වග්ගො

### 2. 1. 1.

**[ පඨමභික්ඛුසුත්තං ]**

28 *වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං:

1. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා. කතමෙහි ද්වීහි? ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාය ච භොජනෙ අමත්තඤ්ඤුතාය ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා'ති

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. චක්ඛු සොතඤ්ච ඝානඤ්ච ජිව්හා කායො අථො මනො
එතානි යස්ස ද්වාරානි අගුත්තානීධ භික්ඛුනො

3 භොජනම්හි අමත්තඤ්ඤූ ඉන්ද්‍රියෙසු අසංවුතො
කායදුක්ඛං චෙතොදුක්ඛං දුක්ඛං සො අධිගච්ඡති

4. ඩය්හමානෙන කායෙන ඩය්හමානෙන චෙතසා
දිවා වා යදි වා රත්තිං දුක්ඛං විහරති තාදිසො'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

* මෙයට මුලින් "ද්වෙ ධම්මෙ අනුකසාරී" පාඨයෙක් සිංහල බුරුම පොත්හි පෙනේ. මෙය අට්ඨකථාවේ ද සියම් පොතේ ද සඳහන් නො වේ.

7. යමෙක් තෙමේ කිසිවකුට හිංසා නො කෙරේ ද, අනුන් ලවා හිංසා නො කරවා ද, කිසිවකු නො පෙළවා ද, අනුන් ලවා අනෙකකුට හානි නොකරවා ද, සියලු සතුන් කෙරෙහි මෛත්‍රියෙහි අංශයක් බඳු වේ ද ඔහට කිසිකරුණකිනුත් (නොහොත් කිසිවකු හා ද) වෛරයෙක් නැත්තේ ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

**තුන්වැනි වර්ගය යි.**

**එහි උද්දානය:**

පසන්නචිත්ත, මාපුඤ්ඤභායි, උභෝ අත්ථෙ, අට්ඨිපුඤ්ජ, සම්පජානමුසාවාද, දානසංවිභාග, මෙත්තාචෙතොවිමුත්ති යන සත ද පළමු කී විස්ස ද යි සත්විසි සූත්‍රාන්තයෝ එකක නිපාතයෙහි සඞ්ගෘහීත වෙත්.

**එකකනිපාතය නිමියේ ය.**

# දුකනිපාතය

## ප්‍රථම වර්ගය

### 2. 1. 1.

### [ පඨමභික්ඛු සූත්‍රය ]

28. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, අකුශලධර්ම දෙකෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත් බව්හි ම (කායචිත්ත) පීඩාසහිත වූ, දුඃඛ වෙහෙස සහිත වූ, දැවීම් සහිත වූ දුකින් යුක්ත ව වෙසෙයි. ඔහු විසින් මරණින් මතු දුගතිය කැමැති විය යුතු වෙයි. කවර ධර්ම දෙකෙකින් ද යත්: ඉන්ද්‍රිය විෂයයෙහි අසංවර බැවිනුත්, අහරෙහි පමණ නොදන්නා බැවිනුත් ය. මහණෙනි, මේ අකුශල ධර්ම දෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත්බව්හි ම පීඩා සහිත වූ, දුඃඛ වෙහෙස සහිත වූ, දැවීම් සහිත වූ දුකින් යුතු ව වෙසෙයි. මරණින් මතු (ඔහු විසින්) දුගතිය කැමැති විය යුතු වෙයි.

මෙ කරුණ බුදුහු වදාළහ. එහි ලා මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ ද කියනු ලැබේ:

2-3. "මේ ශාසනයෙහි යම් කිසි මහණකුගේ ඇස කණ නැහැය දිව කය සිත යන මේ දොරවල් නොවසන ලද ද, අහරෙහි පමණ නොදන්නා වූ ඉන්ද්‍රියයන්හි නොවැසූ දොර ඇති ඒ මහණ තෙමේ කය සිත පිළිබඳ සර්වප්‍රකාර දුකට පැමිණේ.

4. එබඳු පුද්ගල තෙමේ කායික චෛතසික දුක් නැමැති ගින්නෙන් දැවෙමින් දිවා රෑ දෙක්හි ම දුක සේ වාසය කෙරෙයි."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය ද වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි.

## 2. 1. 2.

## [දුතියභික්ඛු සුත්තං]

29. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා. කතමෙහි ද්වීහි? ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය ච භොජනෙ මත්තඤ්ඤුතාය ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. චක්ඛු සොතඤ්ච ඝාණඤ්ච ජිව්හා කායො අථො[1] මනො
එතානි යස්ස ද්වාරානි සුගුත්තානීධ භික්ඛුනො

3. භොජනම්හි ච මත්තඤ්ඤූ ඉන්ද්‍රියෙසු ච සංවුතො
කායසුඛං චෙතොසුඛං සුඛං සො අධිගච්ඡති.

4. අඩය්හමානෙන කායෙන අඩය්හමානෙන චෙතසා
දිවා වා යදි වා රත්තිං සුඛං විහරති තාදිසො'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 2. 1. 3.

## [තපනීය සුත්තං]

30. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වෙ මෙ භික්ඛවෙ තපනීයා. කතමෙ ද්වෙ? ඉධ භික්ඛවෙ එකච්චො අකතකල්‍යාණො හොති අකතකුසලො අකතභීරුත්තාණො, කතපාපො කතලුද්දො කතකිබ්බිසො. සො අකතං මෙ කල්‍යාණන්ති'පි තප්පති. කතං මෙ පාපන්ති'පි තප්පති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා තපනීයා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං කත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං

3. අකත්වා කුසලං කම්මං කත්වානාකුසලං බහුං
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතීති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. තථා, මජසං.

## 2. 1. 2.

## [ දුතියභික්ඛු සූත්‍රය ]

29 භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, (කුශල) ධර්ම දෙකෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත්බව්හි ම (කායචිත්ත) පීඩා නැති, දුක් වෙහෙස නැති, තත්වැදූරුම් දැවීම් නැති සැපයෙන් යුක්ත ව වෙසෙයි. මරණින් මතු ඔහු විසින් සුගතිය කැමැති විය යුතු වෙයි. කවර (කුශල) ධර්ම දෙකෙකින් ද යත්: ඉඳුරන්හි සංවරයෙනුත්, අහරෙහි පමණ දන්නා බැවිනුත් ය. මහණෙනි, මේ ධර්ම දෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත්බව්හි ම (කායචිත්ත) පීඩා නැති, දුක් වෙහෙස නැති, තත්වැදූරුම් දැවීම් නැති සැපයෙන් යුතු ව වෙසෙයි. (ඔහු විසින්) මරණින් මතු සුගතිය කැමැති විය යුතු වේ.

මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2-3. "මේ ශාසනයෙහි යම් කිසි භික්ෂුවකගේ ඇස කණ නැහැය දිව කය සිත යන මේ සදොර වසන ලද ද, අහරෙහි පමණ දන්නා වූ, ඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වූ ඒ භික්ෂු තෙමේ කය සිත පිළිබඳ සර්වප්‍රකාර සැපයට පැමිණේ.

4. එබඳු පුද්ගල තෙමේ කායික චෛතසික ගින්නෙන් නො දැවෙන්නේ දිවා රෑ දෙක්හි ම සැපසේ වාසය කෙරෙයි."

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදි. මා විසින් මෙසේ අසන ලදි.

## 2. 1. 3.

## [තපනීය සූත්‍රය]

30 භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත්වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරන ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලද්දේ ය.

1. මහණෙනි, (දෙලොව ම) පසුතැවිල්ල ඇති කරණ (පසුතැවිල්ලට හේතු වූ) මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක් ද යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් තෙමේ නොකරණ ලද කලණ දම් ඇත්තේ, නොකරණ ලද කුසල් ඇත්තේ, නොකරණ ලද පුණ්‍ය කර්ම ඇත් තේ, කරණ ලද පාපකර්ම ඇත්තේ, කරණ ලද රෞද්‍ර කර්ම ඇත්තේ, කරණ ලද කිලිටි කම් ඇත්තේ වේ ද, හෙතෙමේ 'මා විසින් පින් නොකරණ ලදූ' යි ද තැවෙයි. 'පව් කරණ ලදූ' යි ද තැවෙයි. මහණෙනි, පසුතැවිල්ලට හෙතු වූ මේ ධර්මයෝ දෙදෙන වෙත්.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි ලා මේ අර්ථය ම (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2-3. "ඒ අඥාන පුද්ගල තෙමේ කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත හා (කර්මපථභාවයට නොගිය) චෙතනා අකුසල් ද කොට, කුසල් නො කොට, බොහෝ අකුසල් කොට, කාබුන් මරණින් මතු අපායෙහි උපදී."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි.

## 2. 1. 4.

### [ අතපනීය සුත්තං ]

31. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ද්වෙ' මෙ භික්ඛවෙ ධම්මා අතපනීයා. කතමෙ ද්වෙ? ඉධ භික්ඛවෙ එකච්චො කතකල්‍යාණො හොති කතකුසලො කතභීරුත්තාණො, අකතපාපො අකතලුද්දො අකතකිබ්බිසො. සො කතං මෙ කල්‍යාණන්ති'පි න තප්පති. අකතං මෙ පාපන්ති'පි න තප්පති. ඉමෙ බො භික්ඛවෙ ද්වෙ ධම්මා අතපනීයා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කායදුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං

3. අකත්වා' කුසලං කම්මං කත්වානකුසලං බහුං
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී"ති[1].

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 2. 1. 5.

### [ පාපකසීල සුත්තං ]

32. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි ද්වීහි? පාපකෙන ච සීලෙන පාපිකාය ච දිට්ඨියා. ඉමෙහි බො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පාපකෙන ච සීලෙන පාපිකාය ච දිට්ඨියා
එතෙහි ද්වීහි ධම්මෙහි යො සමන්නාගතො නරො
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1 සොපපජ්ජති, මජ්ඣං.

## 2. 1. 4

### [ අතපනීය සූත්‍රය ]

31. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, පසුතැවිල්ල ඇති නොකරණ (පසුතැවිල්ලට හෙතු නොවන්නා වූ) මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක් ද යත්: මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් කරණ ලද කලණ දම් ඇත්තේ, කරණ ලද කුසල් ඇත්තේ, කරණ ලද පුණ්‍යකර්ම ඇත්තේ, නොකරණ ලද පාපකර්ම ඇත්තේ, නොකරණ ලද රෞද්‍ර කම් ඇත්තේ, නොකරණ ලද කිලිටි කම් ඇත්තේ වේ ද, හෙ තෙමේ 'මා විසින් පින් කරණ ලදැ' යි ද නො තැවෙයි. 'මා විසින් පව් නොකරණ ලදැ' යි ද නො තැවෙයි. මහණෙනි, පසුතැවිල්ල ඇති නොකරණ මේ ධර්මයෝ දෙදෙන වෙත්.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ ද කියනු ලැබේ:

2. "ඒ ප්‍රාඥ පුද්ගල තෙමේ කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත හා චෙතත් සදෙස් දෑ ද (අකුසල්) හැර පියා,

3. අකුසල් නොකොට, බොහෝ කුසල් කොට, මරණින් මතු සුගතියෙහි උපදී."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 2. 1. 5.

### [ පාපක සීල සූත්‍රය ]

32. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත්වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි.

1. මහණෙනි, කරුණු දෙකෙකින් යුක්ත වූ පුද්ගල තෙමේ ගෙණ හැර සිටවූවක් සෙයින් නිරයෙහි උපදී. කවර නම් කරුණු දෙකෙකින් ද යත්: ලාමක වූ ශීලයෙන් ද ලාමක වූ දෘෂ්ටියෙන් ද යන දෙකෙනි. මහණෙනි, මෙ කරුණු දෙකින් යුක්ත වූ පුද්ගල තෙමේ ගෙණ හැර සිටවූවක් සෙයින් නිරයෙහි උපදී.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ.

2. "ලාමක වූ ශීලයෙන් ද ලාමක වූ දෘෂ්ටියෙන්ද යන මේ කරුණු දෙකින් යුක්ත වූ යම් මනුෂ්‍යයෙක් වේ ද, ඒ අඥාන තෙමේ කාබුන් මරණින් මතු නරකයෙහි උපදී.

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 2. 1. 6.

### [භද්දකසීල සුත්තං]

33. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි ද්වීහි: භද්දකෙන ච සීලෙන භද්දිකාය ච දිට්ඨියා. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "භද්දකෙන ච සීලෙන භද්දිකාය ච දිට්ඨියා
එතෙහි ද්වීහි ධම්මෙහි යො සමන්නාගතො නරො
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 2. 1. 7.

### [අනාතාපී සුත්තං]

34. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා' ති මෙ සුතං.

1. අනාතාපී භික්ඛවෙ භික්ඛු අනොත්තාපී[1] අභබ්බො සම්බොධාය, අභබ්බො නිබ්බාණාය, අභබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. ආතාපී ඛො භික්ඛවෙ භික්ඛු ඔත්තාපී[2] භබ්බො සම්බොධාය, භබ්බො නිබ්බාණාය, භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අනාතාපී අනොත්තාපී[1] කුසීතො හීනවීරියො
යො ථිනමිද්ධබහුලො අහිරීකො[3] අනාදරො
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

3. යො ච සතිමා නිපකො ඣායී ආතාපී ඔත්තාපී ච අප්පමත්තො
සංයොජනං ජාතිජරාය ඡෙත්වා ඉධෙව සම්බොධිමනුත්තරං ඵුසෙ.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. අනොත්තප්පී - සීමු. 2 ඔත්තප්පී - සීමු. 3 අහිරිකො - සී.

## 2. 1. 6.

## [ භද්දක සීල සූත්‍රය ]

33. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, කරුණු දෙකෙකින් යුක්ත වූ පුද්ගල තෙමේ ගෙණ හැර සිටවූවක් සෙයින් ස්වර්ගයෙහි උපදී. කවර නම් කරුණු දෙකෙකින් ද යත්: යහපත් ශීලයෙන් ද, යහපත් දෘෂ්ටියෙන් ද (යන දෙකෙනි.) මහණෙනි, මේ කරුණු දෙකින් යුක්ත වූ පුද්ගල තෙමේ ගෙණ හැර සිටවූවක් සෙයින් ස්වර්ගයෙහි උපදී.

බුදුහු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යහපත් වූ ශීලයෙන් ද, යහපත් වූ දෘෂ්ටියෙන් ද, යන මේ කරුණු දෙකින් යුක්ත වූ යම් මනුෂ්‍යයෙක් වේ ද, ඒ නුවණැති පුද්ගල තෙමේ මරණින් මතු ස්වර්ගයෙහි උපදී.

මේ අර්ථය ද භගවත්හු විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 2. 1. 7.

## [ අනාතාපී සූත්‍රය ]

34. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, කෙලෙස් තවන වීර්යයෙන් තොර වූ, (කුසීත වූ) පවට බිය නැති මහණ තෙමේ ආර්යමාර්ගාධිගමයට සුදුස්සෙක් නො වේ. නිර්වාණාධිගමයට සුදුස්සෙක් නො වේ. රහත් පලයට පැමිණීමට සුදුස්සෙක් නො වේ. මහණෙනි, කෙලෙස් තවන වීර්යය ඇති පවට බිය ඇති මහණ තෙමේ ආර්යමාර්ගාධිගමයට සුදුස්සෙක් වේ. නිර්වාණාධිගමයට සුදුස්සෙක් වේ. අර්හත්ඵලාධිගමයට සුදුස්සෙක් වේ.

මේ කරුණ බුදුහු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. කෙලෙස් තවන වීර්යය නැත්තා වූ, පවට බිය නොවන සුලු වූ, කුසීත වූ, වීර්යය නැති, ථින-මිද්ධය බහුල කොට ඇති, ලජ්ජා නැති, මිත්‍රා පිළිවෙත්හි ආදරයක් නැති යම් මහණෙක් වේ ද, හෙ තෙමේ උතුම් වූ අර්හත්වය ලබන්ට සුදුස්සෙක් නො වේ.

3 යම් කිසි මහණෙක් මතා සිහියෙන් යුක්ත වූයේ, ප්‍රඥා ඇත්තේ, ධ්‍යාන වඩන සුලු වූයේ, කෙලෙස් තවන වීර්යය ඇත්තේ, පවට බිය වන සුලු වූයේ, කම්ටහන් වැඩීමෙහි පමා නොවූයේ, ජාතිජරා සංයොජන ධර්මයන් සිඳ මේ අත්බැව්හි ම උතුම් රහත්මඟ නුවණ ලබන්නේ ය.

මේ අර්ථය ද භගවත්හු විසින් වදාරණ ලද්දේය. මෙසේ මා විසින් අසන ලදි.

2. 1. 8.

[ පඨම ජනකුහන සුත්තං ]

35. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං ජනලපනත්ථං ලාභසක්කාරසිලොකානිසංසත්ථං 'ඉති මං ජනො ජානාතූ'ති. අථ ඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති සංවරත්ථඤ්චෙව පහානත්ථඤ්චාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සංවරත්ථං පහානත්ථං බ්‍රහ්මචරියං අනීතිහං
අදෙසයී සො භගවා නිබ්බානොගධගාමිනං.

3. එස මග්ගො මහත්තෙහි[1] අනුයාතො මහෙසිහි.[2]
යෙ ච තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථුසාසනකාරිනො"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

2. 1. 9.

[ දුතිය ජනකුහන සුත්තං ]

36. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා' ති මෙ සුතං.

1. නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං ජනලපනත්ථං ලාභසක්කාරසිලොකානිසංසත්ථං 'ඉති මං ජනො ජානාතූ'ති. අථ ඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති අභිඤ්ඤත්ථඤ්චෙව පරිඤ්ඤත්ථඤ්චාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අභිඤ්ඤත්ථං පරිඤ්ඤත්ථං බ්‍රහ්මචරියං අනීතිහං
අදෙසයී සො භගවා නිබ්බානොගධගාමිනං.

3. එස මග්ගො මහත්තෙහි[1] අනුයාතො මහෙසිහි[2]
යෙ ච තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථුසාසනකාරිනො"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. මහන්තෙහි සීමු. 2. මහෙසිනො - සීමු.

## 2. 1. 8.

## [ ප්‍රථම ජනකුහන සූත්‍රය ]

35. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ මාර්ගබ්‍රහ්මචර්යය (නොහොත් ශාසන බ්‍රහ්මචර්යය) 'ජන තෙමේ මා මෙසේ දනීවා'යි ජනයා විස්මය පත් කරණු පිණිස, ජනයා ලවා සිය ගුණ කියවනු පිණිස, ලාභසත්කාරකීර්ති සඞ්ඛ්‍යාත අනුසස් පිණිස නො වසනු ලැබේ. මහණෙනි, වැලි දු මේ බ්‍රහ්මචර්යය සංවරය පිණිස ද කෙලශ-ප්‍රහාණය පිණිස ද වසනු ලැබේ.

බුදුහු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. ඒ භාග්‍යවතුන් වහන්සේ සංවරය පිණිස ද, ප්‍රහාණය පිණිස ද, උපද්‍රව රහිත වූ, නිවන් නම්වූ ප්‍රතිෂ්ඨාවට පමුණුවන බ්‍රහ්මචර්යය වදාළ සේක.

3. මේ මාර්ගය උදාර අදහස් ඇති මහාත්මයන් විසින් අනුගමනය කරණ ලද්දේ ය. බුදුරදුන් විසින් දෙශනා කරණ ලද පරිදි යම් කෙනෙක් මේ බ්‍රහ්මචර්යය පිළිපදිත් ද, ශාස්තෘශාසනය කරන්නා වූ (ඔහු තුමූ) සසර දුක් කෙළවර කරන්නාහ.

මෙ කරුණ බුදුහු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 2. 1. 9

## [ දෙවෙනි ජනකුහන සූත්‍රය ]

36. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ මාර්ගබ්‍රහ්මචර්යය (නොහොත් ශාසනබ්‍රහ්මචර්යය) 'ජන තෙමේ මා මෙසේ දනීවා'යි ජනයා විස්මය පත් කරණු පිණිස, ජනයා ලවා ගුණ කියවා ගණු පිණිස, ලාභසත්කාර කීර්ති සඞ්ඛ්‍යාත අනුසස් පිණිස නො වසනු ලැබේ. මහණෙනි, වැලිදු මේ බ්‍රහ්මචර්යය සර්වධර්මයන් විශිෂ්ටඥාන-යෙන් අවිපරීත ලෙස දැන ගණු පිණිස ද ත්‍රෛභූමක ධර්මයන් පිරිසිඳ දැන ගණු පිණිස ද වසනු ලැබේ.

බුදුහු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ.

2. "ඒ භාග්‍යවතුන් වහන්සේ සර්වධර්මයන් ඇති සැටියෙන් විශිෂ්ටඥාන-යෙන් දැන ගණු පිණිස, ත්‍රෛභූමකධර්මයන් පිරිසිඳ දැන ගණු පිණිස ශඞ්කාරහිත වූ නොහොත් උවදුරු රහිත වූ නිවණට පමුණුවන මාර්ගබ්‍රහ්මචර්යය දෙශනා කළ සේක.

3. මේ මාර්ගය උදාර අදහස් ඇති, බුද්ධාදි මහාත්මයන් විසින් අනුගමනය කරණ ලද්දේ ය. බුදුරදුන් විසින් දෙශනා කරණ ලද පරිදි යම් කෙනෙක් මේ මාර්ගබ්‍රහ්මචර්යය පිළිපදිත් ද, ශාස්තෘශාසනය කරන්නා වූ (ඔහු තුමූ) සසර දුක් කෙළවර කරන්නාහ."

මෙ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

2. 1. 10

[ සොමනස්ස සුත්තං ]

37. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති. යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයාය. කතමෙහි ද්වීහි? සංවෙජනීයෙසු ඨානෙසු සංවෙජනෙන, සංවිග්ගස්ස ච[1] යොනිසො පධානෙන. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති. යොනි චස්ස ආරද්ධා හොති. ආසවානං ඛයායාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සංවෙජනීයට්ඨානෙසු සංවිජ්ජෙථ ච පණ්ඩිතො
ආතාපී නිපකො භික්ඛු පඤ්ඤාය සමවෙක්ඛිය.

3. එවංවිහාරී ආතාපී සන්තවුත්ති අනුද්ධතො
චෙතොසමථමනුයුත්තො ඛයං දුක්ඛස්ස පාපුණෙ'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

වග්ගො පඨමො.

තස්සුද්දානං:

ද්වෙ ච භික්ඛු තපනීයා' තපනීයා අපරෙ දුවෙ[2]
අතාතාපී ද්වෙ කුහනා ච[3] සොමනස්සෙන තෙ දසාති.

---

1. සංවෙගස්ස ච, සී. අ. මු. 2. පරපෙළහි, සීමු. 3. දෙව ආතාපි හා කුහනා ච - සීමු. දෙව පාද න කුහනා ච, සී.

2. 1. 10.

[ සොමනස්ස සූත්‍රය ]

37. භගවත්හු විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, කරුණු දෙකෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත්බව්හි ම (කායික චෛතසික වූ) සුව සොම්නස් බහුල ව වෙසේ. ඔහු විසින් ආස්‍රවයන් ක්‍ෂය කිරීම සඳහා (අර්හත්ඵලයට අවශ්‍ය) කාරණය පටන් ගන්නා ලද්දේ නම් වෙයි. කවර නම් දෙකෙකින් ද යත්: සංවෙගයට වස්තු වූ තන්හි සංවෙගයෙන් ද, සංවෙගයට පැමිණියහුගේ සම්‍යක් ව්‍යායාමයෙන් ද (යන දෙකෙනි.) මහණෙනි, මේ ධර්ම දෙකින් යුක්ත වූ මහණ තෙමේ මේ අත්බැව්හි ම සුවසොම්නස් බහුල ව වෙසේ. ඔහු විසින් අර්හත්ඵලය සඳහා අවශ්‍ය කාරණය පටන් ගන්නා ලද්දේ නම් වේ.

බුදුහු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති පාරිහාරික ප්‍රඥාවෙන් යුක්ත වූ නුවණැති මහණ තෙමේ නුවණින් මොනවට බලා සංවෙගයට පැමිණිය යුතු තන්හි සංවෙගයට පැමිණේ ම ය.

3 මෙසේ වාසය කරණ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, යහපත් පැවැතුම් ඇති, වික්ෂිප්ත නො වූ, චිත්තසමථයෙහි යෙදුනු භික්ෂු තෙමේ දුක්ඛක්ෂය සඞ්ඛ්‍යාත නිවණට පැමිණෙන්නේ ය.

මේ අර්ථය ද භගවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

**ප්‍රථම වර්ගය යි.**

එහි උද්දානය:

(අගුත්තද්වාරින්ද්‍රිය - ගුත්තද්වාරින්ද්‍රිය) යන භික්ෂු සූත්‍ර දෙක, තපනීය අතපනීය දෙක, පාපකසීල භද්දකසීල යන දෙක, අනොත්තාපීය,ජනකුහන(බ්‍රහ්මචරිය-අභිඤ්ඤත්‍ථබ්‍රහ්මචරිය)දෙක ද, සොමනස්ස (බහුලය) යන ඒ සූත්‍ර දසය යි.

# දුතියවග්ගො

## 2. 2. 1.

## [විතක්ක සුත්තං]

38. වුත්තං හෙතං භගවතා, වුත්තමරහතා'ති මෙ සුතං.

1. තථාගතං භික්ඛවෙ අරහන්තං සම්මාසම්බුද්ධං ද්වෙ විතක්කා බහුලං සමුදාචරන්ති: ඛෙමො ච විතක්කො පවිවෙකො ච. අබ්‍යාපජ්ඣාරාමො[1] භික්ඛවෙ තථාගතො අබ්‍යාපජ්ඣාරතො.[2] තමෙතං භික්ඛවෙ තථාගතං අබ්‍යාපජ්ඣාරාමං අබ්‍යාපජ්ඣාරතං එසොව විතක්කො බහුලං සමුදාචරති: 'ඉමායාහං ඉරියාය න කිඤ්චි ව්‍යාබාධෙමි[3] තසං වා ථාවරං වා'ති. පවිවෙකාරාමො භික්ඛවෙ තථාගතො පවිවෙකරතො. තමෙතං භික්ඛවෙ තථාගතං පවිවෙකාරාමං පවිවෙකරතං එසෙව විතක්කො බහුලං සමුදාචරති: යං අකුසලං තං පහීනන්ති.

2. තස්මාතිහ භික්ඛවෙ තුම්හෙ'පි අබ්‍යාපජ්ඣාරාමා විහරථ අබ්‍යාපජ්ඣාරතා. තෙසං වො භික්ඛවෙ තුම්හාකං අබ්‍යාපජ්ඣාරාමානං විහරතං අබ්‍යාපජ්ඣාරතානං එසෙව විතක්කො බහුලං සමුදාචරිස්සති: 'ඉමාය මයං ඉරියාය න කිඤ්චි ව්‍යාබාධෙම තසං වා ථාවරං වා'ති. පවිවෙකාරාමො භික්ඛවෙ විහරථ පවිවෙකරතා. තෙසං වො භික්ඛවෙ තුම්හාකං පවිවෙකාරාමානං විහරතං පවිවෙකරතානං එසෙව විතක්කො බහුලං සමුදාචරිස්සති: 'කිං අකුසලං කිං අප්පහීනං කිං පජහාමා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

3. "තථාගතං බුද්ධමසය්හසාහිනං
ද්වෙ විතක්කා සමුදාචරන්ති නං
ඛෙමො විතක්කො පඨමො උදීරිතො
තතො විවෙකො දුතියො පකාසිතො.

4. තමොනුදං පාරගතං මහෙසිං
තං පත්තිපත්තං වසිමං අනාසවං
වෙස්සන්තරං තණ්හක්ඛයෙ විමුත්තං
තං වෙ මුනිං අන්තිමදෙහධාරිං
මාරංජහං[4] බ්‍රෑමි ජරාය පාරගුං.

5. සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථා'පි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමෙධො[5]
පාසාදමාරුය්හ සමන්තචක්ඛු
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛති ජාතිජරාභිභූතන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

---

1. අබ්‍යාපජ්ජාරාමො, සීමු. 2. අබ්‍යාපජ්ජරතො, සීමු. 3. ව්‍යාපාදෙමි, සීමු.
4. මානජහං, සීමු. මාරජහං, ස්‍යා. 5. සුමෙධ, සීමු.

## දෙවෙනි වර්ගය

### 2. 2. 1.

### [විතර්ක සූත්‍රය]

38. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලද්දේ ය.

1. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට විතර්කයෝ දෙදෙනෙක් බහුල ව පවතිත්: ක්‍ෂෙම විතර්කය, ප්‍රවිවෙක විතර්කය (යන දෙකයි). මහණෙනි, තථාගත තෙමේ අවිහිංසාවෙහි ඇලුනේ ද, අවිහිංසාවෙහි නිරත වූයේ ද වෙයි. මහණෙනි, අවිහිංසාවෙහි ඇලුනා වූ, අවිහිංසාවෙහි නිරත වූ, ඒ මේ තථාගතයන්ට මේ විතර්කය බහුල ව පවතී: "මම මේ ක්‍රියාවෙන් (කායවාක් ප්‍රයොගයෙන්) (තෘෂ්ණාප්‍රහීණ නොකළ) තස නම් වූ හෝ (තෘෂ්ණා ප්‍රහීණ කළ) ථාවර නම් වූ හෝ කිසිවකු නො පෙළම්" කියා යි. මහණෙනි, තථාගත තෙමේ උතුම් විවෙකයෙහි ඇලුනේ ද, උතුම් විවෙකයෙහි නිරත වූයේ වෙයි. මහණෙනි, උතුම් විවෙකයෙහි ඇලුනා වූ, උතුම් විවෙකයෙහි නිරත වූ ඒ මේ තථාගතයන්ට මේ විතර්කය බහුල ව පවතී: "යමක් අකුසල් වේ ද එය ප්‍රහීණය" කියායි.

2. මහණෙනි, එසේ හෙයින් තෙපි ද අවිහිංසාවෙහි ඇලුනාහු අවිහිංසාවෙහි නිරතවූවාහු වාසය කරවු. මහණෙනි, අවිහිංසාවෙහි ඇලී අවිහිංසාවෙහි නිරත ව වෙසෙන ඒ තොපට මේ විතර්කය ම බහුල ව පවත්නේ ය: "අපි මේ ක්‍රියාවෙන් (කායවාක් ප්‍රයොගයෙන්) තස නම් වූ හෝ ථාවර නම් වූ හෝ කිසිවකු නො පෙළමු" කියායි. මහණෙනි, උතුම් විවෙකයෙහි ඇලුනාහු උතුම් විවෙකයෙහි නිරත වූවාහු වාසය කරවු. මහණෙනි, උතුම් විවෙකයෙහි නිරතව වෙසෙන ඒ තොපට මේ විතර්කය බහුලව පවත්නේය: "අකුසල් කිම? කුමක් අප්‍රහීණ ද? කුමක් දුරු කරමු ද?" කියා යි.

බුදුහු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

3. "අන්‍යයන් විසින් නො ඉවසිය හැකි ද ඉවසන සුලු වූ, තථාගත බුදුරදුන්ට විතර්කයෝ දෙදෙනෙක් පවතිත්: පළමුව ක්‍ෂෙම විතර්කය කියන ලදී. ඉක්බිති දෙවනු ව ප්‍රවිවෙක විතර්කය ප්‍රකාශ කරණ ලදී.

4. මොහඳුරු දුරු කළා වූ, පාර සඞ්ඛ්‍යාත නිර්වාණට ගියා වූ, (පැමිණිය යුතු සියල්ලට පැමිණි හෙයින්) පත්තිපත්ත වූ, සිත් වසඟ බැව් ඇති, ආස්‍රව රහිත වූ (සියලු සසර දුකින් එතෙර ව සෙස්සන් ද එතෙර කළ හෙයින්) විශ්වන්තර වූ, අර්හත්ඵල විමුක්තියෙන් මිදුනා වූ, පශ්චිමකායධාරී වූ, කෙලෙස් මරුන් දුරු කළා වූ, ජරාවගේ පරතෙරට පත් ඒ තථාගතයන්ට සම්‍යක් විතර්කයෝ දෙදෙනෙක් පවතිත් යැ යි කියමි.

5. එකඝනවූ ගල් පර්වතයක් මුදුනෙහි සිටියෙක් හාත්පස ජනසමූහයා යම් සේ දකී ද, එසේ සුන්දර ප්‍රඥා ඇත්තාවූ, සමන්තැස් ඇත්තා වූ, පහ වූ ශොක ඇති බුදුරජාතන් වහන්සේ ඒ සෙල්පව්වට උපමා වූ දහම් පහය නැඟ ජාති ජරාවෙන් මඩනා ලද ශොකයෙහි ගැලුනු ජනසමූහයා බලන සේක.

මේ කරුණ ද භාග්‍යවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

2. 2. 2.

## [ දෙසනාසුත්තං ]

39. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස ද්වෙ ධම්මදෙසනා පරියායෙන භවන්ති. කතමා ද්වෙ? පාපං පාපකතො පස්සථා'ති අයං පඨමා ධම්මදෙසනා. පාපං පාපකතො දිස්වා තත්ථ නිබ්බින්දථ විරජ්ජථ විමුච්චථා'ති අයං දුතියා ධම්මදෙසනා. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමා ද්වෙ ධම්මදෙසනා පරියායෙන භවන්තීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "තථාගතස්ස බුද්ධස්ස සබ්බභූතානුකම්පිනො
පරියායවචනං පස්ස ද්වෙ ච ධම්මා පකාසිතා:

3. පාපකං පස්සථ චෙතං තත්ථ චාපි විරජ්ජථ
තතො විරත්තචිත්තා සෙ දුක්ඛස්සන්තං කරිස්සථා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත'න්ති.

2. 2. 3.

## [ විජ්ජාසුත්තං ]

40. වුත්තං හෙතං භගවතා . වුත්තමරහතා'ති මෙ සුතං.

1. අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා. අන්වදෙව අහිරිකං අනොත්තප්පං. විජ්ජා ච ඛො භික්ඛවෙ පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා. අන්වදෙව හිරොත්තප්පන්ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යා කාචිමා දුග්ගතියො අස්මිං ලොකෙ පරම්හි ච
අවිජ්ජාමූලකා සබ්බා ඉච්ඡාලොභසමුස්සයා.

3. යතො ච හොති පාපිච්ඡො අහිරීකො අනාදරො
තතො පාපං පසවති අපායං තෙන ගච්ඡති.

4 තස්මා ඡන්දඤ්ච ලොභඤ්ච අවිජ්ජඤ්ච විරාජයං
විජ්ජං උප්පාදයං භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**පඨම භාණවාරං**

## 2. 2. 2.

## [ දේශනා සූත්‍රය ]

39. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේය. මා විසින් මෙසේ අසන ලදි.

1. "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ ධර්මදේශනා කාරණ වශයෙන් (නොහොත් වාර වශයෙන්) දෙකෙකි. කවර දෙකෙක් ද යත්: "පාපය ලාමක වශයෙන් බලවු." යන මෙය පළමු වන ධර්මදේශනාව යි. "පාපය ලාමක වශයෙන් දැක එහි කලකිරෙවු, නො ඇලෙවු, මිදෙවු" යන මෙය දෙවන ධර්මදේශනාව යි. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ ධර්මදේශනා කාරණ වශයෙන් (නොහොත් වාර වශයෙන්) මේ දෙකෙකි.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සියලු සත්ත්වයන් කෙරෙහි අනුකම්පා කරණ සුලු වූ තථාගත බුදුරජානන් වහන්සේගේ කාරණ වශයෙන් (නොහොත් වාර වශයෙන්) පවත්නා වූ දෙශනාව බලවු. උන්වහන්සේ විසින් ධර්මයෝ දෙදෙනෙක් ප්‍රකාශ කරණ ලදහ.

3. පාපය ලාමක වශයෙන් බලවු, එහිදු නො ඇලෙවු ඉක්බිති නො ඇලුනු සිත් ඇත්තාහු දුක් කෙළවර කරවු.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 2. 2. 3.

## [ විද්‍යා සූත්‍රය ]

40. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේය. මා විසින් මෙසේ අසන ලදි.

1. මහණෙනි, අකුශල ධර්මයන්ගේ රැස් කිරීමට අවිද්‍යා තොමෝ පෙරටු වන්නී ය අහිරික අනොත්තප්ප දෙක ඒ අනුව පවතී. මහණෙනි, කුශල ධර්මයන්ගේ රැස් කිරීමට විද්‍යාව පෙරටු වන්නී ය. හිරි ඔතප් දෙක ඒ අනුව පවතී.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මෙ ලොවත් පරලොවත් යම් කිසි දුර්ගතීහු වෙත් නම් ඒ සියල්ල අවිද්‍යාව මුල්කොට ඇත්තාහු වෙත් නොලත් දෙය සෙවීම් ලක්‍ෂණ ඊප්සාවය, ලත් දෙයෙහි ඇලීම් ලක්‍ෂණ ලොභය යන මොවුන් විසින් රැස් කරණ ලද්දාහු වෙත්.

3. යම් හෙයකින් ලාමක් ඊප්සා ඇත්තෝ පවට ලජ්ජා නැත්තෝ ආදර නැත්තෝ වේ ද, එහෙයින් පව් රැස් කෙරෙයි. ඒ හෙතුවෙන් අපායට යෙයි.

4. එහෙයින් ඡන්දය (ඊප්සාව) ද, ලොභය ද, අවිද්‍යාව ද, සහමුලින් නසන්නා වූ මාර්ගවිද්‍යාව උපදවන්නාවූ මහණ තෙමේ සියලු දුර්ගතීන් දුරු කරන්නේය."

මෙ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි.

**පළමුවන බණවරයි**

## 2. 2. 4.

### [ පඤ්ඤාපරිහානි සුත්තං. ]

41. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තෙ භික්ඛවෙ සත්තා සුපරිහීනා, යෙ අරියාය පඤ්ඤාය පරිහීනා. තෙ දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරන්ති සවිඝාතං සඋපායාසං සපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා. තෙ භික්ඛවෙ සත්තා අපරිහීනා, යෙ අරියාය පඤ්ඤාය අපරිහීනා. තෙ දිට්ඨෙව ධම්මෙ සුඛං විහරන්ති අවිඝාතං අනුපායාසං අපරිළාහං. කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පඤ්ඤාය පරිහානෙන පස්ස ලොකං සදෙවකං
නිවිට්ඨං නාමරූපස්මිං ඉදං සච්චන්ති මඤ්ඤති.

3. පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං යායං නිබ්බෙධගාමිනී
යාය සම්මා පජානාති ජාතිභවපරික්ඛයං.

4. තෙසං දෙවා මනුස්සා ච සම්බුද්ධානං සතීමතං
පිහයන්ති හාසපඤ්ඤානං සරීරන්තිමධාරින"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 2. 2. 5

### [ සුක්කධම්ම සුත්තං ]

42. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වෙමෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති. කතමෙ ද්වෙ? හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං, නයිධ පඤ්ඤායෙථ මාතා'ති වා මාතුච්ඡා'ති වා මාතුලානී'ති වා ආචරියභරියා'ති වා ගරූනං දාරා'ති වා. සම්භෙදං ලොකො අගමිස්ස යථා අජෙළකා කුක්කුටසූකරා සොණසිගාලා. යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, තස්මා පඤ්ඤායති මාතා'ති වා මාතුච්ඡා'ති වා මාතුලානී'ති වා අචරියභරියා'ති වා ගරූනං දාරා ති වා'ති.

## 2. 2. 4.

## [ ප්‍රඥාපරිහාණි සූත්‍රය. ]

41. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, ආර්‍ය්‍ය (විදර්ශනාඥාන මාර්ගඥාන) ප්‍රඥාවෙන් යම් කෙනෙක් පිරිහුනාහු වෙත් ද, ඔහු (ලොව් ලොවුතුරු සියලු සැපතින්) මොනවට පිරිහුනාහු වෙති. ඔහු මේ අත්බැව්හි ම පීඩා සහිත වූ, දුක් වෙහෙස ඇති, දැවීම් සහිත වූ දුකින් වාසය කෙරෙත්. ඔවුන් විසින් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දුගතිය කැමැති විය යුතු වේ. මහණෙනි, යම් කෙනෙක් ආර්‍ය්‍ය (විදර්ශනා, මාර්ගසඞ්ඛ්‍යාත) ප්‍රඥාවෙන් නොපිරිහුනාහු වෙත් ද; (ඔහු සියලු සැපතින්) නොපිරිහුනාහු නම් වෙත්. ඔහු මේ අත්බැව්හි ම පීඩා රහිත වූ, දුක් වෙහෙස නැති, දැවීම් රහිත වූ සැපයෙන් වෙසෙත්. ශරීරයාගේ බිඳීම් සඞ්ඛ්‍යාත මරණින් මතු (ඔවුන් විසින්) සුගතිය කැමැති විය යුතු වේ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "නුවණින් පිරිහීම නිසා නාමරූප සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් බැස ගත් සදෙවක ලෝකයා බලවු. (එබඳු පුද්ගල තෙම) මෙය ම ඇත්ත ය (සෙසු සියල්ල හිස්යැ යි) සිතයි.

3. යම් ඒ ප්‍රඥාවක් නිර්වේදගාමිනී (ලෝභාදිකෙලෙස් සිඳලන්නී) වේ ද, යම් බඳු ප්‍රඥාවකින් උත්පත්ති කර්මභවයන්ගේ ක්‍ෂය කිරීම් සඞ්ඛ්‍යාත නිර්වාණය හා අර්හත්ත්වය මැනවින් ප්‍රත්‍යක්‍ෂ කෙරේ ද, එ විදසුන් සහිත මඟනුවණ ම ශ්‍රේෂ්ඨ වන්නේ ය.

4. දෙවියෝ ද, මිනිස්සු ද, සිහියෙන් යුක්ත වූ හාස ප්‍රඥ ඇති අන්තිම සිරුර දරණ ඒ සම්බුදුවරයන්ට කැමැති වෙත්."

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 2. 2. 5.

## [ ශුක්ලධර්ම සූත්‍රය. ]

42. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

1. මහණෙනි, මේ ශුක්ල (කුසල) ධර්මයෝ දෙදෙනෙක් ලොව පාලනය කරත්. කවර දෙදෙනෙක් ද? ලජ්ජාව ද බිය ද (යන දෙක ය.) මහණෙනි, මේ ශුක්ලධර්මයෝ දෙදෙන ලොව පාලනය නොකරන්නාහු නම් මෙහි මව කියා හෝ සුළුමව කියා හෝ නැන්දනියෝ කියා හෝ ගුරුවරයාගේ භාර්‍ය්‍යාව කියා හෝ ගරු කටයුත්තන්ගේ භාර්‍ය්‍යාවෝ ය කියා හෝ නැකිමක් නො පැමිණෙන්නේ ය. ලෝවැසි තෙම එළුබැටළුවන් මෙන් ද, කුකුළන් ඌරන් මෙන් ද, බලු සිවලුන් මෙන් ද, සංකරයට පැමිණෙන්නේ ය. මහණෙනි, යම් හෙයකින් මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ලොව පාලනය කෙරෙත් ද, එහෙයින් මව කියා හෝ සුළුමව කියා හෝ නැන්දනියෝ කියා හෝ ගුරුවරයාගේ භාර්‍ය්‍යාව කියා හෝ ගරු කටයුත්තන්ගේ භාර්‍ය්‍යාවෝ ය කියා හෝ (නැකිමක්) පැණෙන්නේය.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙසං වෙ හිරිඔත්තප්පං සබ්බදා ච න විජ්ජති,
වොක්කන්තා සුක්කමූලා තෙ ජාතිමරණගාමිනො.

3. යෙසඤ්ච හිරිඔත්තප්පං සදා සම්මා උපට්ඨිතා,
විරූළ්හබ්‍රහ්මචරියා තෙ සන්තො ඛීණපුනබ්භවා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 2. 2. 6.

## [ අජාතසුත්තං ]

43. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං

1. අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං. නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "ජාතං භූතං සමුප්පන්නං කතං සඞ්ඛතමද්ධුවං
ජරාමරණසඞ්ඝාතං රොගනීඩං[1] පභඞ්ගුරං[2]
ආහාරනෙත්තිප්පභවං[3] නාලං තදභිනන්දිතුං.

3. තස්ස නිස්සරණං සන්තං අතක්කාවචරං ධුවං
අජාතං අසමුප්පන්නං අසොකං විරජං පදං
නිරොධො දුක්ඛධම්මානං සඞ්ඛාරූපසමො සුඛො'ති".

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

1. රොගනීළං; කෙසුචි - රොගනිළං - සීමු. 2 පභඞ්ගුනං - සී.මු. රොගනීඩං. - මජ්ඣං.
3. ආහාරනෙත්තිප්පභවං - සීමු.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ ද කියනු ලැබේ:

2. "ඉදින් යම්කුන්ට ලජ්ජා භය දෙක හැම කල්හි එළඹ සිටියාහු නො වෙත් ද? ඒ කුශල මූලයෙන් බැහැර වූ ඔහු ජාතිජරා මරණයට පැමිණෙන්නෝ වෙත්.

3. යම් කෙනෙකුන්ට වනාහි ලජ්ජා භය දෙක හැම කල්හි මැනවින් එළඹ සිටියාහු ද වැඩුනු බඹසර ඇති ශාන්තගුණ ඇති ඔහු පුනර්භවය ක්‍ෂය කළෝ නම් වෙත්."

මේ අර්ථය ද භගවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 2. 2. 6.

## [ අජාත සූත්‍රය ]

43. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අතීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, (හෙතු ප්‍රත්‍යයයෙන් හට නොගත් හෙයින්) අජාත නම් වූ, (ඉබේ පහළ නොවූ හෙයින්) අභූත නම් වූ, (කිසිවකින් නොකරණ ලද හෙයින්) අකත නම් වූ, (එ හෙයින් ම) අසඞ්ඛත නම් වූ නිවණ ඇත්තේ ය. මහණෙනි, අජාත-අභූත-අකත-අසඞ්ඛත-සඞ්ඛ්‍යාත නිවණ ඉදින් නොවත්තේ නම්, ජාත-භූත-කත-සඞ්ඛත-සඞ්ඛ්‍යාත සංසකාරධර්මයන්ගේ සංසිඳීමෙක් නො පැණෙන්නේ ය. යම් හෙයකින් අජාත-අභූත-අකත-අසඞ්ඛත-නිවණ ඇත්තේ ද, එ හෙයින් ජාත-භූත-කත-සඞ්ඛත-සඞ්ඛ්‍යාත සංසකාරධර්මයන්ගේ සංසිඳීම පැණේ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ජාත භූත සමුත්පන්න කත සඞ්ඛත අනිත්‍ය ලක්‍ෂණ වූ, ජරාමරණ හා එකට බැඳුනු, රොගයන්ට කැදැල්ලක් වූ, වහා බිඳෙන සුලු, ආහාර තෘෂ්ණාව ප්‍රභව කොට ඇති (ඒ උපාදානසකන්ධ පඤ්චකය) සිත් අලවන්නට සුදුසු නො වේ.

3. ඒ සකන්ධපඤ්චකයාගේ නික්මයාම ම ශාන්ත වේ. (ඒ නිර්වාණය) තර්කඥනයට විෂය නො වේ. නිත්‍ය වේ. අජාත වෙයි. අසමුත්පන්න වෙයි. අශොක වෙයි. විරජ වෙයි. පද (ලදයුතු) වෙයි. දුක්ඛනිරොධ වෙයි. සඞ්ඛාරූපසම වෙයි. (අත්‍යන්ත) සුඛ වෙයි.

මේ කාරණය ද භගවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 2. 2. 7.

## [ නිබ්බානධාතු සුත්තං ]

44 වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වෙ'මා භික්ඛවෙ නිබ්බානධාතුයො. කතමා ද්වෙ? සඋපාදිසෙසා ච නිබ්බානධාතු අනුපාදිසෙසා ච නිබ්බානධාතු.

2. කතමා ච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු?

ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි යෙසං අවිඝාතත්තා[1] මනාපාමනාපං පච්චනුභොති සුඛදුක්ඛං පටිසංවෙදෙති. තස්ස යො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු.

3. කතමා ච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු?

ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස ඉධෙව භික්ඛවෙ සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතී භවිස්සන්ති. අයං වුච්චති භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

4. "දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා
නිබ්බානධාතු අනිස්සිතෙන තාදිනා
එකා හි ධාතු ඉධ දිට්ඨධම්මිකා
සඋපාදිසෙසා භවනෙත්තිසඞ්ඛයා,
අනුපාදිසෙසා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො.

5. යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං
විමුත්තචිත්තා භවනෙත්තිසඞ්ඛයා,
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බභවානි තාදිනො"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

---

1 අවිගතත්තා - සී. අ ක.

## 2. 2. 7.

## [ නිර්වාණධාතු සූත්‍රය ]

44. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අතීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මාවිසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, මේ නිර්වාණධාතුහු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක් ද යත්: සෝපාදිශෙෂ නිර්වාණධාතු, අනුපාදිශෙෂ නිර්වාණධාතු ය.

2. මහණෙනි, සෝපාදිශෙෂ නිර්වාණධාතු කවරේ ද?

මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ රහත් වූයේ, පහ කළ ආශ්‍රව ඇතියේ, වැස නිමවූ බඹසර ඇතියේ, කරණ ලද සිවුමග කිස ඇතියේ, බහා තබන ලද කෙලෙස් බර ඇතියේ, පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇතියේ, පිරිහුනු බවබැඳුම් ඇතියේ, මනා කොට නුවණින් දැන කෙලෙසුන්ගෙන් මිදුනේ වේ ද, ඒ රහත්හු පිළිබඳ යම් ඉන්ද්‍රිය කෙනකුත් නිරුද්ධ නොකළ හෙයින් ඉටු අනිටු අරමුණු ලබයි ද, සැප දුක් විඳියි ද, ඒ පසිඳුරෝ පවත්නාහු ම වෙත්. ඒ රහත්හුගේ රාගක්‍ෂය, ද්වෙෂක්‍ෂය, මෝහක්‍ෂය වේ ද, මහණෙනි, මේ (කෙලශපරිනිර්වාණය) සෝපාදිශෙෂ නිර්වාණධාතු යැ යි කියනු ලැබේ.

3. මහණෙනි, අනුපාදිශෙෂ නිර්වාණධාතු කවරේ ද?

මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ රහත් වූයේ, පහ කළ ආශ්‍රව ඇතියේ, වැස නිමවූ බඹසර ඇතියේ, කරණ ලද සිවු මග කිස ඇතියේ, බහා තබන ලද කෙලෙස් බර ඇතියේ, පිළිවෙළින් පැමිණි රහත්බැව් ඇතියේ, පිරිහුනු බවබැඳුම් ඇතියේ, මනා කොට නුවණින් දැන කෙලෙ-සුන්ගෙන් මිදුනේ වේ ද, මහණෙනි, ඒ රහත්හුගේ සියලු වෙදනාවෝ මේ අත්බැව්හි ම තෘෂ්ණාදීන් නොරුස්නා ලද්දාහු (අතිශයින් සන්හුන් බැවින්) සිහිල් වන්නාහුය. මහණෙනි, මේ (ස්කන්ධපරිනිර්වාණය) අනුපාදිශෙෂ නිර්වාණධාතුයැ යි කියනු ලැබේ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය ගාථා වශයෙන් මෙසේ කියනු ලැබේ:

4. පසැස් ඇත්තා වූ, තෘෂ්ණාදෘෂ්ටීන්ගෙන් ආශ්‍රිත නොවූ, (ඉටු අනිටු අරමුණු විෂයයෙහි) තාදීගුණ යුක්ත වූ, බුදුරදුන් විසින් මේ නිර්වාණ ධාතුහු දෙදෙනෙක් වදාරණ ලදහ: එකක් දිට්ඨධම්මික (මේ අත්බවට අයත් වූ). උපාදි සඞ්ඛ්‍යාත ස්කන්ධශෙෂ සහිත ය. භවනෙත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාවගේ ක්‍ෂයයෙන් වේ. යම් නිර්වාණ ධාතුයෙක්හි සර්වප්‍රකාරයෙන් භවයෝ නිරුද්ධ වෙත් ද, ඒ අනුපාදිශෙෂ' නිර්වාණධාතු තොමෝ සාම්පරායික (හෙවත් මරණින් මත්තෙහි) වේ.

5. යම් කෙනෙක් මේ අසඞ්ඛතධාතු සඞ්ඛ්‍යාත නිර්වාණපදය දැන තෘෂ්ණාව ක්‍ෂය කිරීමෙන් මිදුනු සිත් ඇත්තාහු වෙත් ද, ඔහු ධම්මසාර නම් වූ රහත් බව ලැබීමෙන් නිවණෙහි ඇලුනාහු වෙත්. (නොහොත් ධම්මසාර නම් වූ නිර්වාණාධිගමයෙන් අනුපාදිශෙෂ නිර්වාණයෙහි ඇලුනු) තාදී වූ ඔහු සියලු භවයන් පහ කළාහු වෙත්."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය. මෙසේ මා විසින් අසන ලදී.

**2. 2. 8.**

**[පටිසල්ලාන සුත්තං.]**

45. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. පටිසල්ලානාරාමා භික්ඛවෙ විහරථ පටිසල්ලානරතා, අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තා අනිරාකතජ්ඣානා විපස්සනාය සමන්නාගතා බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. පටිසල්ලානාරාමානං භික්ඛවෙ විහරතං පටිසල්ලානරතානං අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තානං අනිරාකතජ්ඣානානං විපස්සනාය සමන්නාගතානං බ්‍රෑහෙතානං සුඤ්ඤාගාරානං ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙ'ව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙ සන්තචිත්තා නිපකා සතිමන්තො ච ඣායිනො
සම්මා ධම්මං විපස්සන්ති කාමෙසු අනපෙක්ඛිනො.

3. අප්පමාදරතා සන්තා පමාදෙ භයදස්සිනො
අභබ්බා පරිහානාය නිබ්බානස්සෙ'ව සන්තිකෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත'න්ති.

**2. 2. 9.**

**[සික්ඛානිසංසසුත්තං]**

46. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. සික්ඛානිසංසා භික්ඛවෙ විහරථ පඤ්ඤුත්තරා විමුත්තිසාරා සතාධිපතෙය්‍යා. සික්ඛානිසංසානං භික්ඛවෙ විහරතං පඤ්ඤුත්තරානං විමුත්තිසාරානං සතාධිපතෙය්‍යානං ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පරිපුණ්ණසෙඛං අපහානධම්මං
පඤ්ඤුත්තරං ජාතිඛයන්තදස්සිං
තං වෙ මුනිං අන්තිමදෙහධාරිං
මානං ජහං බ්‍රෑමි ජරාග පාරගුං.

3. තස්මා සදා ඣානරතා සමාහිතා
ආතාපිනො ජාතිඛයන්තදස්සිනො
මාරං සසෙනං අභිභුය්‍ය භික්ඛවො
භවාථ[1] ජාතිමරණස්ස පාරගා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. භවථ, සී. මු.

## 2. 2. 8.

### [ ප්‍රතිසංලයන සූත්‍රය ]

45. භගවත් බුදුරදුන් විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේය. අර්හත්වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, හුදෙකලාබව්හි ඇලුනෝ ව, හුදෙකලාබවෙහි නිරත ව, වාසය කරවු. ස්වකීය චිත්තසමථයෙහි යෙදුනෝ වැ බැහැර නොකළ ධ්‍යාන ඇත්තෝ ව විදර්ශනාවෙන් යුක්ත වැ ශුන්‍යාගාරයන්හි වැඩිය යුතු කම්ටහන් වඩන්නෝ වැ වාසය කරවු. මහණෙනි, හුදෙකලා වාසයෙහි ඇලී, හුදෙකලා වාසයෙහි නිරත ව චිත්තසමථයෙහි යෙදී බැහැර නොකළ ධ්‍යාන ඇති ව විදර්ශනාවෙන් යුක්ත ව ශුන්‍යාගාරයන්හි වැඩිය යුතු කම්ටහන් වඩමින් වාසයකරන්නන් විසින් මේ අත්බැව්හි රහත්බව ද, කෙලෙස් උපාදිශෙෂය ඇති කල්හි අනාගාමි බව ද යන ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතුයි.

මේ අර්ථය භගවත්හු වදාළහ. එහි මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් කෙනෙක් ශාන්ත සිත් ඇත්තාහු වෙත් ද, පාරිහාරික නුවණින් යුක්ත වෙත් ද, සිහි ඇත්තාහු වෙත් ද, ධ්‍යාන කරණ සුලු වෙත් ද, කාමයන්හි අපෙක්‍ෂා රහිත වූවාහු පඤ්චස්කන්ධය අනිත්‍යාදි වශයෙන් මොනවට බලත් ද,

3. අප්‍රමාදයෙහි ඇලුනාවූ, ප්‍රමාදයෙහි බිය දක්නා සුලුවූ, ශාන්ත වූ, (ඔහු) පිරිහීමට සුදුස්සෝ නො වෙත්. නිවණ සමීපයෙහි ම වෙත්."

මේ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

## 2. 2. 9.

### [ ශික්‍ෂානෘශංස සූත්‍රය. ]

46. භගවත් බුදුරදුන් විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසනලදී.

1. මහණෙනි, (ත්‍රිවිධ) ශික්‍ෂාවෙහි අනුසස් දක්නා සුලු වූවාහු, ප්‍රඥව ප්‍රධාන කොට ඇත්තාහු, විමුක්තිය හර කොට ඇත්තාහු සිහිය අධිපති කොට ඇත්තාහු වාසය කරවු. මහණෙනි, (ත්‍රිවිධ) ශික්‍ෂාවෙහි අනුසස් දක ප්‍රඥව ප්‍රධාන කොට, විමුක්තිය හර කොට සිහිය අධිපති කොට වාසය කරන්නන් විසින් මේ අත්බැව්හි රහත්බව ද, කෙලෙස් උපාදිශෙෂය ඇති කල්හි අනාගාමි බව ද (යන) ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතු.

මේ කරුණ ද භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "නිවණ දක්නා සුලු වූ, අන්තිම සිරුර දරන්නා වූ, මානය දුරුකළා වූ ජරාවගේ පරතෙරට ගියා වූ ඒ මුනි තෙමේ සම්පූර්ණ ශික්‍ෂා ඇත්තෝ යැ යි ද, අකොප්‍ය (අවිනාශී) ධර්ම ඇත්තෝ යැ යි ද, ප්‍රඥව ශ්‍රේෂ්ඨ කොට ඇත්තෝ යැ යි ද කියමි.

3. මහණෙනි, එසේ හෙයින් හැම කල්හි ධ්‍යානයෙහි ඇලුනාහු, එකඟ සිත් ඇත්තාහු, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාහු, නිවණ දක්නා සුලු වූවාහු, සේනා සහිත මරු මැඩ ලා ජාති (ජරා) මරණයන්ගේ පරතෙරට ගියාහු වවු.

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසනලදී.

## 2. 2. 10.

### [ජාගරිය සුත්තං]

47. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ජාගරො චස්ස භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සතො සම්පජානො සමාහිතො පමුදිතො විප්පසන්නො ච තත්ථ කාලවිපස්සී ච කුසලෙසු ධම්මෙසු. ජාගරස්ස භික්ඛවෙ භික්ඛුනො විහරතො සතස්ස සම්පජානස්ස පමුදිතස්ස විප්පසන්නස්ස තත්ථ කාලවිපස්සිනො, කුසලෙසු ධම්මෙසු ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙ'ව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "ජාගරන්තා සුණාථෙතං යෙ සුත්තා තෙ පබුජ්ඣථ
සුත්තා ජාගරියං[1] සෙය්‍යො නත්ථි ජාගරතො භයං.

3. යො ජාගරො ච සතිමා සම්පජානො
සමාහිතො පමුදිතො[2] විප්පසන්නො
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො.

4. තස්මා හවෙ ජාගරියං භජෙථ
ආතාපී භික්ඛු නිපකො ඣානලාභී
සංයොජනං ජාතිජරාය ඡෙත්වා
ඉධෙව සම්බොධි මනුත්තරං ඵුසෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත'න්ති.

## 2. 2. 11.

### [ආපායික සුත්තං]

48. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වෙමෙ භික්ඛවෙ ආපායිකා නෙරයිකා ඉදමප්පහාය, කතමෙ ද්වෙ? යො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො, යො ච පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තං අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ආපායිකා නෙරයිකා ඉදමප්පහායා'ති.

1 ජාගරිතං - සීමු, අඩා. 2. මුදිතො - සීමු.

## 2. 2. 10.

### [ ජාගරිය සූත්‍රය ]

47. භගවත් බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත්වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මහණ තෙමේ (කමටහන් මෙනෙහි කිරීමෙන්) නිදි දුරු කෙළේ, එළඹ සිටි සිහි ඇත්තේ, සම්‍යක්ප්‍රඥ ඇත්තේ, එකඟ වූ සිත් ඇත්තේ, ප්‍රමුදිත වූයේ, ප්‍රසන්න වූයේ, කුශලධර්ම විදර්ශනායෙහි කාලානුරූප වැ යෙදී වාසය කරන්නේ වේ ද, මහණෙනි, නිදි දුරුකළා වූ, එළඹ සිටි සිහි ඇති, සම්‍යක්ප්‍රඥ ඇති, එකඟ සිත් ඇති, ප්‍රමුදිත වූ, ප්‍රසන්න වූ ඒ කුශලධර්ම විදර්ශනායෙහි කාලානුරූප ව යෙදෙන භික්ෂුහු විසින් මේ අත්බැව්හි රහත් බව ද, කෙලෙස් උපාදිශෙෂය ඇති කල්හි අනාගාමි බව ද යන ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමැති විය යුතු.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "නිදි වර්ජිත කිරීමෙහි යෙදුනාහු තෙපි මේ වචනය අසවු: යම් කෙනෙක් නිද්‍රාවට ගියාහු ද ඒ තෙපි පිබිදෙවු. නිදීමට වඩා නිදි වැරීම ශ්‍රෙෂ්ඨය. නිදි වරන්නාට (අනනානුවාදාදි) බියෙක් නැත්තේ ය.

3. යමෙක් නිදි දුරු කෙළේ, සිහි ඇත්තේ, සම්‍යක්ප්‍රඥ ඇත්තේ, එකඟ සිත් ඇත්තේ, ප්‍රමුදිත වූයේ, විප්‍රසන්න වූයේ, සුදුසු කල්හි බොධිපාක්ෂික ධර්මයන් හාත්පසින් විමසා බලන්නේ, හටගත් ශ්‍රෙෂ්ඨ සමාධි ඇත්තේ වේ ද, හෙ තෙමේ මොහඳුර නසන්නේ වේ.

4. එසේ හෙයින් ඒකාන්තයෙන් නිදි වැරීම භජනය කරවු. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති, ප්‍රඥසම්පන්න ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ අත්බැව්හි ම ජාතිජරාවන් පිළිබඳ සංයොජනයන් නසා නිරුත්තර වූ සම්‍යක්සම්බොධිය ස්පර්ශ කරන්නේ ය. (ලබන්නේ යි.)

මේ කාරණය ද භගවත්හු විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 2. 2. 11.

### [ ආපායික සූත්‍රය ]

48. භගවත් බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ (කියනු ලබන දෙවදූරුම් පාපසමාචාර) අත් නොහැර අපායේ උපදින නිරයේ උපදින මේ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක් ද යත්: යමෙක් බ්‍රහ්මචාරී නොවූයේ බ්‍රහ්මචාරී වෙමි යි ප්‍රතිඥ කෙරේ ද, යමෙකුත් පිරිසිදු බඹසර හැසිරෙන්නහුට අමූලික ග්‍රාමධර්මයෙන් දූන දූන චොදනා කෙරේ ද, මහණෙනි, මෙය අත් නොහැර අපායේ උපදින නිරයේ උපදින මේ දෙදෙන වෙත්.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති:

2 අභූතවාදී නිරයං උපෙති යො වා පි කත්වා න කරොමි චාහ,
උභොපි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ.

3. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ.

4. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො,
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 2. 2. 12

### [ දිට්ඨිගතසුත්තං ]

49. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති එකෙ. අතිධාවන්ති එකෙ. චක්ඛුමන්තො ච පස්සන්ති.

2. කථඤ්ච භික්ඛවෙ ඔලීයන්ති එකෙ?

භවාරාමා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා. තෙසං භවනිරොධාය ධම්මෙ දෙසියමානෙ න චිත්තං පක්ඛන්දති න පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති. එවං ඛො භික්ඛවෙ ඔලීයන්ති එකෙ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. බොරු කියන සුළු පුද්ගල තෙමේ ද, යලි පව්කම් කොට මම නො කෙළෙමි යි කියන පුද්ගල තෙමේ ද නරකයට පැමිණෙති. ලාමක ක්‍රියා ඇති ඒ මිනිස් දෙදෙනා ම මෙයින් සැව ගොස් පරලොවදී සමාන ගති ඇත්තෝ වෙත්.

3. කාෂාවකණ්ඨ වූ (කසාවතකින් කර වෙළාගත්) පව්වුගති ඇති, හොඳ හැසුරුමක් නැති පවිටු පුද්ගලයෝ බොහෝ වෙත්. ඒ පවිටෝ (තමන් කළ) පව්කම් හෙතුවෙන් නරකයෙහි උපදිත්.

4. කායවාක්සංයම නැති දුශ්ශීලයෙක් යම් හෙයකින් රටවැසියා දුන් අහර වළඳන්නේ වේ ද, ඔහු විසින් රත්කළ ගිනිසිළක් බඳු වූ ලෝගුළියක් වළඳන ලද්දේ නම් එයට වඩා උතුම් වේ.

මෙකරුණ ද භගවත් බුදුරදුන් විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 2. 2. 12.

## [ දෘෂ්ටිගතසූත්‍රය ]

49. භගවත් බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, දෘෂ්ටි ද්වයකින් (මිථ්‍යාදෘෂ්ටි දෙකෙකින්) මඩනා ලද ඇතැම් දෙව් මිනිස් කෙනෙක් (ලොකය ශාශ්වත යයි භවයෙහි) ඇලෙත්. ඇතැම් දෙව්මිනිස් කෙනෙක් (ආත්මයත් ලොකයත් මරණින් මතු නැතැ යි උච්ඡෙද වශයෙන් ගෙණ ධර්මතා) ඉක්මවා දුවත්. නුවණැස් ඇත්තෝ වනාහි (මෙ කී අන්ත දෙකට ම නොපැමිණ අවිපරීත වශයෙන් ඇතිසැටියෙන්) දකිත්.

2. මහණෙනි, ඇතැම් දෙව් මිනිස් කෙනෙක් කෙසේ නම් භවයෙහි ඇලෙද්ද?

මහණෙනි, දෙව්මිනිස්සු භවයෙහි ඇලුනාහු, භවයෙහි නිරත වූවාහු, භවයෙහි මැනැවින් සතුටු වූවාහු වෙත් ද, ඔවුන්ට භවනිරොධය පිණිස දහම් දෙසනු ලබන කල්හි සිත එහි බැස නො ගණී, නො පහදියි, නො පිහිටයි, නිමාවට නො පැමිණෙයි. මහණෙනි, මෙසේ ඇතැම් කෙනෙක් භවයෙහි ඇලෙත්.

3. කථඤ්ච භික්ඛවෙ අතිධාවන්ති එකෙ?

භවෙනෙව ඛො පනෙකෙ අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති 'යතො කිර භො අයං අත්තා[1] කායස්ස භෙදා පරම්මරණා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා, එතං සන්තං එතං පණීතං එතං යථාවන්ති[2]. එවං ඛො භික්ඛවෙ අතිධාවන්ති එකෙ.

4. කථඤ්ච භික්ඛවෙ චක්ඛුමන්තො පස්සන්ති?

ඉධ භික්ඛු භූතං භූතතො පස්සති, භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්තීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

5. යෙ[3] භූතං භූතතො දිස්වා භූතස්ස ච අතික්කමං[4]
යථාභූතෙ විමුච්චන්ති භවතණ්හාපරික්ඛයා.

6. ස වෙ[5] භූතපරිඤ්ඤො සො[6] වීතතණ්හො භවාභවෙ
භූතස්ස විභවා භික්ඛු නාගච්ඡති පුනබ්භව''න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

**වග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

ද්වෙ ඉන්ද්‍රියා ද්වෙ තපනීයා සීලෙන අපරෙ දුවෙ
අනොත්තප්පී කුහනා ද්වෙ ච සංවෙජනීයෙන තෙ දස
විතක්කා දෙසනා විජ්ජා පඤ්ඤා ධම්මෙන පඤ්චමං
අජාතං ධාතු සල්ලානං සික්ඛා ජාගරියෙන ච
අපාය දිට්ඨියා චෙව බාවීසති පකාසිතා'ති.

**දුකනිපාතො.**

1. සත්තො, සීමු. 2. යථාවඑවංධාවති, සීමු. 3. යො, සං. 4. අතික්කමං, සීමු.
5. සචෙ, සීමු. සං. P.T.S. 6. භූතපරිඤ්ඤාතො, සාළුවි.

3. මහණෙනි, ඇතැම් කෙනෙක් කෙසේ නම් ඉක්මවා දුවත් ද?

ඇතැමෙක් භවයෙන් ම පෙළනු ලබන්නාහු, ලජ්ජිත වන්නාහු, පිළිකුල් කරන්නාහු උච්ඡේදයෙහි සතුටු වෙත්. (කෙසේ ද යත්:) 'පින්වත්නි, යම් හෙයකින් මේ ආත්මය කාබුත් මරණින් මතු සිඳේ ද, නැසේ ද, මරණින් මතු නො වේ ද, ඒ නොවීම ම ශාන්තය, එහෙයින් ම ප්‍රණීතය, එහෙයින් ම අවිපරීතය, (ඇතිසැටිය) කියා යි. මහණෙනි, මෙසේ ඇතැමෙක් ඉක්මවා දුවත්.

4. මහණෙනි, නුවණැස් ඇත්තෝ කෙසේ නම් දකිත් ද?

මේ සසුන්හි මහණ තෙමේ පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධ වශයෙන් දකී ද, පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධ වශයෙන් දැක එහි කළකිරීම, නො ඇලීම, නැති කිරීම පිණිස පිළිපන්නේ වේ ද, මහණෙනි, මෙසේ නුවණැස් ඇත්තෝ (ඇතිසැටියෙන්) දකිත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ ද කියනු ලැබේ:

5. “යම් කෙනෙක් පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධ වශයෙන් (මාර්ගඥානයෙන්) දැක පඤ්චස්කන්ධය ඉක්මවීමෙන් (භාවනාභිසමයයෙන්) භවතෘෂ්ණාව හාත්පසින් සිඳ ලීමෙන් අවිපරීත සත්‍යය යි කියන ලද නිවණෙහි (ප්‍රත්‍යක්ෂයෙන්) අධිමොක්ෂයට පැමිණෙත් ද,

6. පඤ්චස්කන්ධය පිරිසිඳ දත්තා වූ කුද්‍ර මහත් භවයන්හි පහ වූ තෘෂ්ණා ඇති, ඒ මහණ තෙමේ පඤ්චස්කන්ධයාගේ උත්පාද නිරෝධයෙන් යළි ඉපැද්මට නොපැමිණෙයි.

මේ අර්ථය ද භගවත්හු විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

දෙවෙනි වර්ගයයි.

එහි උද්දානය:

ඉන්ද්‍රිය දෙක, තපනීය දෙක, ශීල දෙක, අනොත්තප්පිය, ජනකුහන දෙක, සංවේජනීය යන සූත්‍ර දහය ද, විතක්කය-දේශනා දෙක, අවිජ්ජාය, පස්වැනි වූ පඤ්ඤාය, අජාතය, නිබ්බානධාතුය, පටිසල්ලානය, සික්ඛාය, ජාගරිය, ආපායිකය, දිට්ඨිගතය යන සූත්‍ර සියල්ල දෙවිස්සකැ යි ප්‍රකාශ කරණ ලදී.

දුකනිපාතය යි.

# තිකනිපාතො

## පඨමො වග්ගො

### 3. 1. 1.

### [ අකුසලමූලසුත්තං ]

50. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තීණි'මානි භික්ඛවෙ අකුසලමූලානි, කතමානි තීණි? ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං. ඉමානි ඛො භික්ඛවෙ තීණි අකුසලමූලානීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං
හිංසන්ති අත්තසම්භූතා තචසාරං'ව සම්ඵලං."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත'න්ති.

### 3. 1. 2.

### [ ධාතුසුත්තං ]

51. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තිස්සො ඉමා භික්ඛවෙ ධාතුයො. කතමා තිස්සො? රූපධාතු, අරූපධාතු, නිරොධධාතු. ඉමා ඛො භික්ඛවෙ තිස්සො ධාතුයොති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "රූපධාතුං පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා
නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චුහායිනො.

3. කායෙන අමතං ධාතුං ඵස්සයිත්වා[1] නිරූපධිං
උපධිප්පටිනිස්සග්ගං සච්ඡිකත්වා අනාසවො
දෙසෙති සම්මාසම්බුද්ධො අසොකං විරජං පදන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. ඵුසයිත්වා - මජසං, ඵුස්සයිත්වා - ස්‍යා

# තිකනිපාතය

## ප්‍රථම වර්ගය.

### 3. 1. 1.

### [ අකුසල මූල සූත්‍රය. ]

50. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ අකුශලමූලයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: ලෝභය අකුසල්මූලකි. ද්වේෂය අකුසල්මූලකි. මෝහය අකුසල්මූලකි මහණෙනි, මේ අකුශලමූලයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙකරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සිත්හි හටගත් ලොභ ද්වෙෂ මොහ යන මොහු පව් අදහස් ඇති පුරුෂයා පෙළත්. (කුමක් මෙන් ද යත්:) සවකීය ඵලය තචසාර වෘක්‍ෂය (හුණ බට ආදි පොත්ත අරටුව කොට ඇති) ගස නසන්නාක් මෙනි."

මෙ කරුණ භගවත්හු වදාළහ. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 1. 2.

### [ ධාතු සූත්‍රය. ]

51. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ ධාතුහු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: රූපධාතුය, අරූපධාතුය, නිරොධ ධාතුය. මහණෙනි, මේ ධාතුහු තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් කෙනෙක් රූපභවය පිරිසිඳ දැන අරූප භවයෙහි නොපිහිටියාහු නිර්වාණය අරමුණු කොට (කෙලෙසුන්ගෙන්) මිදෙත් ද, ඒ ක්‍ෂීණාස්‍රවයෝ මරණය ඉක්මවූවෝ වෙත්.

3 ආස්‍රවරහිත වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ උපධි රහිත වූ නිර්වාණය (නාම) කයින් ස්පර්ශ කොට, උපධීන්ගේ බැහැරලීමේ කාරණය ප්‍රත්‍යක්‍ෂ කොට ශොකරහිත වූ, රජස් රහිත වූ නිර්වාණපදය දක්වන සේක."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

**3. 1. 3.**

## [ පඨමවෙදනා සුත්තං ]

52. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො? සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
වෙදනා ච පජානාති වෙදනානඤ්ච සම්භවං.

3. යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති

**3. 1. 4.**

## [ දුතියවෙදනා සුත්තං ]

53. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං

1. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා.

සුඛා භික්ඛවෙ, වෙදනා දුක්ඛතො දට්ඨබ්බා. දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා. අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දට්ඨබ්බා. යතො ඛො භික්ඛවෙ භික්ඛුනො සුඛා වෙදනා දුක්ඛතො දිට්ඨා හොති, දුක්ඛා වෙදනා සල්ලතො දිට්ඨා හොති, අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දිට්ඨා හොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරියො සම්මද්දසො අච්ඡෙච්ඡි තණ්හං වාවත්තයි[1] සංයොජනං සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යො සුඛං දුක්ඛතො'ද්දක්ඛි දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො.

3. ස වෙ සම්මද්දසො[2] භික්ඛු යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤාවොසිතො සන්තො ස වෙ යොගාතිගො මුනී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති

1 විවත්තයි - මජ්ඣං. 2. සම්මදසො - සීමු. සච්චද්දසො - සෑඒ

## 3. 1. 3.

## [ ප්‍රථම වේදනා සූත්‍රය ]

52. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ වෙදනාවෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: සැප වෙදනාය දුක් වෙදනාය නො දුක් නො සැප (මැදහත්) වෙදනාය යන මොහු යි. මහණෙනි, මේ වෙදනාවෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "එකඟ සිත් ඇති, සම්‍යක්ප්‍රඥ ඇති, සිහි ඇති බුද්ධශ්‍රාවක තෙමේ වෙදනාවන් ද ඔවුන්ගේ හටගැන්ම ද දනී

3. යම් තැනෙක්හි මේ වෙදනාවෝ නිරුද්ධ වෙත් නම් (ඒ නිවණ ද) වෙදනාක්‍ෂයගාමී වූ මාර්ගය ද (දනී). මහණ තෙමේ වෙදනාවන් ක්‍ෂය කිරීමෙන් ආශාරහිත වූයේ පිරිනිවියේ වෙයි.

මේ අර්ථය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 1. 4.

## [ දෙවෙනි වේදනා සූත්‍රය ]

53. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ වෙදනාවෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: සැප වෙදනාය, දුක් වෙදනාය, නොදුක් නොසැප (මැදහත්) වෙදනාය යන මොහු යි.

මහණෙනි, සැපවෙදනාව (විපරිණාම) දුක් වශයෙන් දක්ක යුතු ය. දුක් වෙදනාව (පීඩනාර්ථයෙන්) හුල් වශයෙන් දක්ක යුතු ය. නොදුක් නොසැප වේදනාව අනිත්‍ය වශයෙන් දක්ක යුතු ය.මහණෙනි, යම් හෙයෙකින් මහණ සැප වෙදනාව දුක් වශයෙන් දක්නා ලද ද, දුක් වෙදනාවහුල් වශයෙන් දක්නා ලද ද, නොදුක් නොසැප වෙදනාව අනිත්‍ය වශයෙන් දක්නා ලද ද, මහණෙනි, මේමහණ තෙමේ අයර්‍ය යැ යි ද, සම්‍යග්දර්ශී යැ යි ද කියනු ලැබේ. හෙ තෙමේ තෘෂ්ණාව සිඳැ ලීය. සංයොජන පෙරළා ලීය. මනා කොට මානයාගේ දර්ශනප්‍රහාණාභිසමයයෙන් (සියලු) දුක් කෙළවර කෙළේ ය.

භගවත්හු මෙ කරුණ වදාළහ., එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යමෙක් සැපවෙදනාව දුක් වශයෙන් දුටුයේ ද, දුක්වෙදනාව හුල් වශයෙන් දුටුයේ ද, නොදුක් නොසැප ශාන්තවූ ඒ වෙදනාව අනිත්‍ය වශයෙන් දුටුයේ ද, ඒ මහණ තෙම එකාන්තයෙන් සම්‍යක්දර්ශී නම් වෙයි. යම් හෙයෙකින් ඒ වෙදනාවෙහි සමුච්ඡෙද වශයෙන් මිදේ ද (එහෙයිනි).

3. විශිෂ්ටඥනයෙන් දන නිමවන ලද කෘත්‍ය ඇති ශාන්තවූ ඒ රහත් මහණ තෙමේ එකාන්තයෙන් කාමාදි චතුර්යොගයන් ඉක්මවූයේ නම් වෙයි.

මෙ කරුණ ද භාග්‍යවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 1. 5.

### [ පඨමඑසනාසුත්තං. ]

54. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තිස්සො ඉමා භික්ඛවෙ එසනා. කතමා තිස්සො? කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනා'ති

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
එසනා ච පජානාති එසනානඤ්ච සම්භවං.

3. යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
එසනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 3. 1. 6.

### [දුතියඑසනාසුත්තං.]

55. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තිස්සො ඉමා භික්ඛවෙ එසනා. කතමා තිස්සො? කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා සහ
ඉති සච්චපරාමාසො දිට්ඨිට්ඨානා සමුස්සයා.

3. සබ්බරාගවිරත්තස්ස තණ්හක්ඛයවිමුත්තිනො[1]
එසනා පටිනිස්සට්ඨා දිට්ඨිට්ඨානා සමූහතා
එසනානං ඛයා භික්ඛු නිරාසො අකථංකථී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

1. විමුත්තියා, සී.මු.

## 3. 1. 5.

## [ප්‍රථම එෂණා සූත්‍රය.]

54. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ සෙවීම් තුණෙකි. කවර තුණෙක්ද යත්: කාමය පිළිබඳ සෙවීමය, භවය පිළිබඳ සෙවීමය, බඹසර පිළිබඳ සෙවීමය (යන මේ යි.) මහණෙනි, මේ සෙවීම් තුණ වේ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "එකඟසිත් ඇති, යහපත් නුවණැති, සිහියෙන් යුත් බුද්ධශ්‍රාවක තෙමේ සෙවීම් ද සෙවීම් පිළිබඳ සම්භවය (හටගැන්ම) ද මනා කොට දනී.

3. යම් තැනෙක ඒ සෙවීම් නිරුද්ධ වේ නම් ඒ නිවණ ද, නිර්වාණගාමී මාර්ගය ද දනී. ඒ මහණ තෙමේ එම පයෙෂණයන් ක්‍ෂය කිරීමෙන් ආශාරහිත වූයේ පිරිනිවියේ නම් වෙයි.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

## 3. 1. 6.

## [දෙවෙනි එෂණා සූත්‍රය.]

55. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ එසනා (සෙවීම්) තුණෙකි. කවර තුණෙක් ද යත්: කාමය සෙවීමය, භවය සෙවීමය, බඹසර සෙවීමය. මහණෙනි, මේ සෙවීම් තුණයි.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. කාමෙසනා, භවෙසනා, මේ ම සැබව සෙසු සියල්ල හිස් ය යි දෘෂ්ටිගත වශයෙන් සම්මත වූ බ්‍රහ්මචරියෙසනා සමග එසනා තුණෙකි.

3. සියලු (කාම භව) රාගයන්ගෙන් වෙන් වූ, තෘෂ්ණාක්‍ෂය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි (නිවන අරමුණු කොට) කෙලෙසුන්ගෙන් මිදුණා වූ (රහත්හු විසින්) එසනා බැහැර කරණ ලදහ. දෘෂ්ටීහු (ප්‍රථමමාර්ගයෙන්) නසන ලදහ. ඒ මහණ තෙමේ එම පයෙෂණයන් ක්‍ෂය කිරීමෙන් ආශා නැත්තෙක් ද (කෙසේ කෙසේ දැ යි පැවති) සැක නැත්තෙක් ද වෙයි."

මෙ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

3. 1. 7.

[ පඨම ආසවසුත්තං ]

56. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තයො'මෙ භික්ඛවෙ ආසවා. කතමෙ තයො? කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ආසවාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
ආසවෙ ච පජානාති ආසවානඤ්ච සම්භවං.
3. යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
ආසවානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො'ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුත්තන්ති.

3. 1. 8.

[ දුතිය ආසවසුත්තං ]

57. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.

1. තයො' මෙ භික්ඛවෙ ආසවා. කතමෙ තයො? කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ආසවාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යස්ස කාමාසවො ඛීණො අවිජ්ජා ච විරාජිතා
භවාසවො පරික්ඛීණො විප්පමුත්තො නිරූපධි
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනින්ති"ති[1].

---

1. සවාහනං - සොසුවි.

## 3. 1. 7.

## [ ප්‍රථම ආස්‍රව සූත්‍රය ]

56. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරජුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, මේ ආස්‍රවයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: කාමාස්‍රවය, භවාස්‍රවය, අවිද්‍යාස්‍රවය යි. මහණෙනි, මේ ආස්‍රවයෝ තිදෙන වෙත්.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "එකඟ සිත් ඇති, යහපත් නුවණැති, සිහියෙන් යුත් බුද්ධශ්‍රාවක තෙමේ ආස්‍රවයන් ද, ආස්‍රවයන්ගේ සම්භවය ද (හටගැන්ම ද) මනා කොට දනී.

3. යම් තැනෙක ඒ ආස්‍රවයෝ නිරුද්ධ වෙත් නම් ඒ නිවණ ද, නිර්වාණගාමී මාර්ගය ද (දනී). ඒ මහණ තෙමේ එම ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශා රහිත වූයේ පිරිනිවියේ නම් වේ.

මෙකරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 1. 8.

## [ද්විතීය ආස්‍රව සූත්‍රය]

57. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරජුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී.

1. මහණෙනි, ආස්‍රවයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: කාමාස්‍රවය, භවාස්‍රවය, අවිද්‍යාස්‍රවය යි. මහණෙනි, මේ ආස්‍රවයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යමකු විසින් කාමාස්‍රවය ක්ෂය කරණ ලද ද, අවිද්‍යාව දුරු කරණ ලද ද, භවාස්‍රවය ක්ෂය කරණ ලද ද, කෙලෙසුන්ගෙන් මිදුනා වූ උපධි රහිත වූ, (ඒ රහත් තෙමේ) සේනාසහිත මාරයා දිනා අන්තිම වූ ශරීරය දරයි.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 1. 9.

### [ තණ්හාසුත්තං ]

58. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තිස්සො ඉමා භික්ඛවෙ තණ්හා. කතමා තිස්සො? කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො තණ්හා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "තණ්හායොගෙන සංයුත්තා රත්තචිත්තා භවාභවෙ
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො.

3. යෙ ච තණ්හං පහත්වාන වීතතණ්හා[1] භවාභවෙ
තෙ ච පාරංගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛය"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 1. 10.

### [ මාරධෙය්‍යසුත්තං ]

59. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චො'ව විරොචති. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චො'ව විරොචතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සීලං සමාධි පඤ්ඤා ච යස්ස එතෙ සුභාවිතා
අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චො'ව විරොචතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**වග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

මූල ධාතු අථ වෙදනා ද්වෙ එසනා ච ද්වෙ ආසවා ද්වෙ
තණ්හාතො ච අථ මාරධෙය්‍යතො වග්ගමාහු පඨමන්ති මුත්තමං.

---

1. හිගතණ්හා ච, සිමු.

### 3. 1. 9.

### [ තෘෂ්ණා සූත්‍රය ]

58. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ තෘෂ්ණාවෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: කාමතෘෂ්ණාය (පඤ්චකාමයෙහි ඇල්මය), (ශාශ්වතදෘෂ්ටිසහගත භවයෙහි ඇල්ම නම් වූ) භවතෘෂ්ණාය, (උච්ඡේදදෘෂ්ටිසහගත ඇල්ම නම් වූ) විභවතෘෂ්ණාය. මහණෙනි, මේ තෘෂ්ණාවෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් කෙනෙක් තෘෂ්ණායෝගයෙන් සංයුක්ත වූවාහු, කුදු මහත් භවයෙහි ඇලුණු සිත් ඇත්තාහු වෙද්ද, ඒ සංසාරගත සත්ත්වයෝ මාරපාශ සඞ්ඛ්‍යාත යොගයෙන් බැඳුනාහු වෙත්. සත්ත්වයෝ (නැවත නැවත උත්පත්ති වශයෙන්) සසරට යෙත්. (එ හෙයින්) නැවත ජාති මරණ දුක්වලට පැමිණෙන සුලු වූවාහු වෙත්.

3. යම් සත්ත්ව කෙනෙක් තෘෂ්ණාව දුරු කොට කුදු මහත් භවයෙහි ආශා රහිත වූවාහු ද, යම් කෙනෙකුත් ආස්‍රවක්ෂය සඞ්ඛ්‍යාත නිවණට පැමිණියාහු ද ඔවුහු ලෙව්හි පරතෙරට ගියාහු නම් වෙත්.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 1. 10.

### [ මාරධෙය්‍ය සූත්‍රය ]

59. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ධර්මත්‍රයයකින් යුක්ත වූ මහණ තෙමේ මාරධෙය සඞ්ඛ්‍යාත ත්‍රෛභූමක වෘත්තය ඉක්මවා හිරු මෙන් බබලයි. කවර ධර්මත්‍රයයකින් ද යත්: මහණෙනි, මේ සසුන්හි මහණ තෙමේ අශෛක්‍ෂ ශීලස්කන්ධයෙන් යුක්ත වේ ද, අශෛක්‍ෂ සමාධිස්කන්ධයෙන් යුක්ත වේ ද, අශෛක්‍ෂ ප්‍රඥාස්කන්ධයෙන් යුක්ත වේ ද, මහණෙනි, මේ ධර්මත්‍රයයෙන් යුක්ත වූ මහණ තෙමේ මාරධෙය සඞ්ඛ්‍යාත ත්‍රෛභූමක වෘත්තය (සසර) ඉක්මවා හිරු මෙන් බබලයි.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. යමකු විසින් මේ ශීලසමාධිප්‍රඥාවෝ මනා කොට වඩන ලද්දාහු ද (ඒ පුද්ගල තෙමේ) මාරයාගේ විෂයය වූ ත්‍රෛභූමකවෘත්තය (සසර දුක්) ඉක්මවා හිරු මෙන් බබලයි.

මේ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

### පළමුවන වර්ගය යි.

එහි උද්දානය:

අකුසලමූලය, ධාතුය, වෙදනා දෙක ය, එසනා දෙක ය, ආසව දෙක ය, තණ්හාය, මාරධෙය්‍ය යයි මේ උතුම් පළමු වන වර්ගය කීහු.

# දුතියවග්ගො

## 3. 2. 1.

### [ පුඤ්ඤකිරියවත්ථු සුත්තං ]

60. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ පුඤ්ඤකිරියවත්ථූනි. කතමානි තීණි? දානමයං පුඤ්ඤකිරියවත්ථු, සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු. ඉමානි ඛො භික්ඛවෙ තීණි පුඤ්ඤකිරියවත්ථූනී'ති.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති:

2. "පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය ආයතග්ගං සුඛුද්‍රයං
දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ.

3. එතෙ ධම්මෙ භාවයිත්වා තයො සුඛසමුද්දයෙ
අබ්‍යාපජ්ඣං[1] සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 2. 2.

### [ චක්ඛුසුත්තං. ]

61. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ චක්ඛූනි. කතමානි තීණි? මංසචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු'ති. ඉමානි ඛො භික්ඛවෙ තීණි චක්ඛූනී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "මංසචක්ඛු දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු අනුත්තරං
එතානි තීණි චක්ඛූනි අක්ඛාසි පුරිසුත්තමො.

3. මංසචක්ඛුස්ස උප්පාදො මග්ගො දිබ්බස්ස චක්ඛුනො
යතො ඤාණං උදපාදි පඤ්ඤාචක්ඛු අනුත්තරං
තස්ස චක්ඛුස්ස පටිලාභා සබ්බදුක්ඛා පමුච්චතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1 අබ්‍යාපජ්ජං, මජ්සං.

## දෙවෙනි වර්ගය

### 3. 2. 1.

### [ පුණ්‍යක්‍රියාවස්තු සූත්‍රය ]

60. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ පුණ්‍යක්‍රියාවස්තූහු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: දාන, ශීල, භාවනා ය. මහණෙනි, මේ පුණ්‍යක්‍රියාවස්තූහු තිදෙනයහ.

මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා-වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "තමහට වැඩ කැමැති යම් කුලපුත්‍රයෙක් වේ නම් හේ මතු උතුම් සැප විපාක ඇති තුන් පින්කිරියවත්හි හික්මෙන්නේ ය. දානය ද, සම හැසිරීම ද, මෛත්‍රීසහගත සිත ද වඩන්නේ ය.

3. සැප අනුසස් ඇති මේ (කුශල) ධර්ම තුන වඩා නුවණැත්තේ නිදුක් වූ සැප ඇති බඹලොව උපදී."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 2. 2.

### [ චක්ඛුස්සූත්‍රය. ]

61. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, චක්ෂුස්හු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: මසැස, දිවැස, පැණැස ය. මහණෙනි, මේ චක්ෂුස්හු තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පුරුෂොත්තම වූ බුදුරදහු මසැස දිවැස නිරුත්තර වූ පැණැස (යන) තෙ ඇස වදාළහ.

3. මසැසෙහි පැවැත්ම (ඉපැත්ම) දිවැසට කාරණ යි. යම් විටෙක නිරුත්තර ප්‍රඥාචක්ෂුස වූ ආස්‍රවක්ෂය ඥානය පහළ වී ද, ඒ ඇස ලැබීමෙන් සියලු දුකින් මිදේ."

මෙ අරුත ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

3. 2. 3.

[ ඉන්ද්‍රියසුත්තං ]

62. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතාති මෙ සුතං:

1. තීණි'මානි භික්ඛවෙ ඉන්ද්‍රියානි. කතමානි තීණි: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ තීණි ඉන්ද්‍රියානී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො,
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා

3. තතො අඤ්ඤා විමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො,
අකුප්පා මෙ විමුත්තීති භවසඤ්ඤොජනක්ඛයා.

4. ස වෙ ඉන්ද්‍රියසම්පන්නො සන්තො සන්තිපදෙ රතො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනි"න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

3. 2. 4.

[ අද්ධාසුත්තං ]

63. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතාති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අද්ධා. කතමෙ තයො? අතීතො අද්ධා, අනාගතො අද්ධා, පච්චුප්පන්නො අද්ධා. ඉමෙ ඛො භික්ඛවෙ තයො අද්ධා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා,
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය යොගමායන්ති මච්චුනො.

3. අක්ඛෙය්‍යඤ්ච පරිඤ්ඤාය අක්ඛාතාරං න මඤ්ඤති,
ඵුට්ඨො විමොක්ඛො මනසා සන්තිපදමනුත්තරං.

## 3. 2. 3.

## [ ඉන්ද්‍රියසූත්‍රය ]

62. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අහීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය (සෝවාන් මග නුවණ), අඤ්ඤින්ද්‍රිය (සෝවාන් පෙලෙහි පටන් සතැනක පවත්නා නුවණ), අඤ්ඤාතාවින්ද්‍රිය (රහත්පල නුවණ) යි. මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ තිදෙන වෙත්.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ.

2. "පිළිවෙළින් ආර්‍ය්‍ය මාර්ගය උපදවන්නා වූ, ත්‍රිවිධ ශික්‍ෂා වඩන්නා වූ සෙඛපුද්ගලයාහට පළමු කොට රහත්මග නුවණ උපදී. ඉක්බිති එයට අනතුරුව ම රහත්පල නුවණ ලැබෙයි.

3. නොහොත් සමථවිදර්ශනා වශයෙන් පැවති පූර්වභාග මාර්ගයට පිළිපන්නාවූ ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන තාදී වූ සෙඛපුද්ගලයාහට සොතාපත්ති මාර්ගයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය පහළ වෙයි. එයට අනතුරුව අඤ්ඤින්ද්‍රිය උපදී. භවසංයොජනයන් ක්‍ෂය කිරීම නිසා මාගේ විමුක්තිය අකොප්‍ය වේ යැ යි ඒ අඤ්ඤින්ද්‍රියට පසුව ප්‍රත්‍යවෙක්‍ෂාඥානය උපදී.

4. (යථොක්ත ත්‍රිවිධ) ඉන්ද්‍රියයෙන් සමන්විත වූ ශාන්ත වූ නිවණෙහි ඇලුනාවූ ඒ පුද්ගල තෙමේ සේනා සහිත මරු දිනා පශ්චිම දෙහය දරයි."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදි.

## 3. 2. 4.

## [ අද්ධ සූත්‍රය. ]

63. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, මේ කාලයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: අතීත කාලය, අනාගත කාලය, වර්තමාන කාලය යි. මහණෙනි, මේ කාලයෝ තිදෙන වෙත්.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සත්ත්වයෝ අක්ඛෙය්‍ය සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයන්හි සත්ත්ව-පුද්ගලාදි සංඥා ඇත්තාහු පඤ්චස්කන්ධයෙහි පිහිටියාහු පඤ්චස්කන්ධය පිරිසිඳ නොදන්නා මරුවසයට පැමිණෙත්.

3. පඤ්චස්කන්ධය පිරිසිඳ දන්නා (තිස්ස ඵුස්ස යන ආදි නම් ගොත් වශයෙන්) කියයුත්තකු නොහගී. (යම් හෙයකින්) විමොක්‍ෂ සඞ්ඛ්‍යාත නිරුත්තර නිර්වාණපදය සිතින් ස්පර්ශ කරණ ලද ද, එහෙයිනි.

4. ස වෙ අසෙඛ්‍යසම්පන්නො සන්තො සන්තිපදෙ රතො,
සඞ්ඛාය සෙවී ධම්මට්ඨො සඞ්ඛ්‍යං නොපෙති වෙදගූ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 2. 5.

### [ දුච්චරිත සුත්තං ]

64. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ දුච්චරිතානි. කතමානි තීණි? කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං. ඉමානි ඛො භික්ඛවෙ තීණි දුච්චරිතානී" ති.

එතමත්ථං භගවා අවොච. තත්ථේ'තං ඉති වුච්චති:

2. "කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච,
මනොදුච්චරිතං කත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං.

3. අකත්වා කුසලං කම්මං කත්වානාකුසලං බහුං,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො'පපජ්ජති."ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 2. 6.

### [ සුචරිතසුත්තං ]

65. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ සුචරිතානි. කතමානි තීණි? කායසුචරිතං වචීසුචරිතං, මනොසුචරිතං. ඉමානි ඛො භික්ඛවෙ තීණි සුචරිතානී"ති.

එතමත්ථං භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති:

2. "කායදුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං.

3. අකත්වා'කුසලං කම්මං කත්වාන කුසලං බහුං
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී"[1]ති.

අයම්පිඅත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. සො උපපජ්ජති, සී මු.

4. පඤ්චස්කන්ධය පිරිසිඳ දන්නාවූ ශාන්තවූ නිවණෙහි ඇලුනාවූ, ප්‍රත්‍යවෙක්‍ෂා කොට සිවුපසය සෙවුනා සුලුවූ, අසෙඛ ධර්මයන්හි නොනොත් නිර්වාණ ධර්මයෙහි පිහිටි චතුසත්‍යයෙහි පරතෙරට ගියාවූ ඒ පුද්ගල තෙමේ (දෙව් මිනිස් ආදී) සඞ්ඛ්‍යාවට නොපැමිණෙති."

මෙ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලදී මෙසේ මා විසින් අසන ලදී.

## 3. 2. 5.

## [ දුශචරිත සූත්‍රය ]

64. භාග්‍යවත්හු විසින් මේය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ දුශචරිතයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: කායදුශචරිතය, වාග්දුශචරිතය, මනොදුශචරිතය යි. මහණෙනි, මේ දුශචරිතයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන් ද) මෙසේ කියනු ලැබේ:

2. "ඒ දුෂ්ප්‍රාඥවූ පුද්ගල තෙමේ කායදුශචරිත ද වාග්දුශචරිත ද මනො-දුශචරිත ද කොට රාගාදී කෙලෙසුන් සහිත වෙතත් අකුසල් ද කොට-

3. කුශලකර්ම නොකොට බොහෝ අකුශලකර්ම කොට ශරීරයාගේ භෙදයෙන් නරකයට පැමිණේ."

මෙ කරුණ ද භගවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 2. 6.

## [ සුචරිත සූත්‍රය ]

65. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ සුචරිතයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: කායසුචරිතය, වාක්සුචරිතය, මනසුචරිතය යි. මහණෙනි, මේ සුචරිතයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන් ද) මෙසේ කියනු ලැබේ.

2. "ඒ සප්‍රාඥ වූ පුද්ගල තෙමේ කායදුශචරිතය ද, වාග්දුශචරිතය ද, මනොදුශචරිතය ද හැර රාගාදි කෙලෙසුන් සහිත වෙතත් අකුසල් ද හැර-

3. අකුශලකර්ම නොකොට බොහෝ කුසල් කොට ශරීරයාගේ භෙදයෙන් ස්වර්ගයට ද පැමිණේ."

මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 2. 7.

## [ සොචෙය්‍ය සුත්තං ]

66. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ සොචෙය්‍යානි. කතමානි තීණි? කායසොචෙය්‍යං, වචීසොචෙය්‍යං, මනොසොචෙය්‍යං. ඉමානි ඛො භික්ඛවෙ තීණි සොචෙය්‍යානීති.

එතමත්ථං භගවා අවොච. තත්ථේ'තං ඉති වුච්චති:

2. "කායසුචිං[1] වාචාසුචිං චෙතොසුචිමනාසවං,
සුචිං සොචෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායින"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

## 3. 2. 8.

## [ මොනෙය්‍ය සුත්තං ]

67. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණි'මානි භික්ඛවෙ මොනෙය්‍යානි. කතමානි තීණි? කායමොනෙය්‍යං, වචීමොනෙය්‍යං, මනොමොනෙය්‍යං. ඉමානි ඛො භික්ඛවෙ තීණි මොනෙය්‍යානීති.

එතමත්ථං භගවා අවොච. තත්ථේ'තං ඉති වුච්චති:

2. "කායමුනිං[2] වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපක'න්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 2. 9

## [ පඨමරාගසුත්තං ]

68. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යස්ස කස්සචි භික්ඛවෙ රාගො අප්පහීනො, දොසො අප්පහීනො මොහො අප්පහීනො, අයං වුච්චති භික්ඛවෙ බද්ධො[3] මාරස්ස, පමුක්කස්ස මාරපාසො, යථාකාමකරණීයො ච පාපිමතො.

---

1. සුචි සීමු. 2. මුනි සීමු. 3. බන්ධො සීමු.

3. 2. 7.

[ සොචෙය්‍ය සූත්‍රය ]

66. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සුචි (පිරිසිදු) භාවයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: කායද්වාරයෙහි පිරිසිදු බව, වාග්ද්වාරයෙහි පිරිසිදු බව, මනොද්වාරයෙහි පිරිසිදු බව ය. මහණෙනි, මේ පිරිසිදුබව් තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ආශ්‍රව රහිත වූ කායසුචි, (කායසුචරිත) වාක්සුචි, මනස්සුචි යැ යි පිරිසිදුබව්හු තිදෙනෙකි. මේ පිරිසිදු බැවින් යුත් පිරිසිදු තැනැත්තහු සියලු පව් කිලිටු දුරලත්තහු කොට ආර්‍යයෝ කියත්."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

3. 2. 8.

[ මොනෙය්‍ය සූත්‍රය ]

67. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මුනිභාවයෝ හෙවත් රහත්හු පිළිබඳ සමාචාරයෝ මේ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: කායමොනෙය්‍ය ය, වචීමොනෙය්‍ය ය, මනොමොනෙය්‍යය යි. මහණෙනි, මේ මොනෙය්‍යයෝ හෙවත් රහත්හු පිළිබඳ සමාචාරයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන් ද) මෙසේ කියනු ලැබේ.

2. "ආශ්‍රව රහිතවූ කායමොනෙය්‍යය, වචීමොනෙය්‍යය, මනොමොනෙය්‍යය යන මොනෙය්‍යයෙන් (මුනිගුණයෙන්) සමන්විත ඒ මුනිහු සෝදාහල පව් ඇත්තහු කොට ආර්‍යයෝ කියත්."

මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

3. 2. 9.

[ ප්‍රථම රාගසූත්‍රය ]

68. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් කිසිවකුගේ රාගය ප්‍රහීණ නො වී ද, ද්වේෂය ප්‍රහීණ නො වී ද, මෝහය ප්‍රහීණ නො වී ද, මහණෙනි, මේ තෙමේ කෙලෙස් මරු විසින් බඳනා ලද්දේ යැ යි මොහු විසින් මාරපාශය (සිත් සතන්හි) ලා ගන්නා ලද්දේ වන්නේ යැ යි පවිටු (මර)හු විසින් කැමැති පරිදි කළ හැක්කෙක් ද වේ යැ යි කියනු ලැබේ

යස්ස කස්සචි භික්ඛවෙ රාගො පහීනො දොසො පහීනො මොහො පහීනො, අයං වුච්චති භික්ඛවෙ අබද්ධො[1] මාරස්ස, ඔමුක්කස්ස මාරපාසො. න යථාකාමකරණීයො පාපිමතො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

2. "යස්ස රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා:
තං භාවිතත්තඤ්ඤතරං බ්‍රහ්මභූතං තථාගතං
බුද්ධං වෙරභයාතීතං ආහු සබ්බප්පහායිනන්"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 2. 10.

## [ දුතියරාගසුත්තං ]

69. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා රාගො අප්පහීනො දොසො අප්පහීනො මොහො අප්පහීනො. අයං වුච්චති භික්ඛවෙ න අතරි සමුද්දං සඋම්මිං සවීචිං සාවට්ටං සගහං සරක්ඛසං.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා රාගො පහීනො දොසො පහීනො මොහො පහීනො, අයං වුච්චති භික්ඛවෙ අතරි සමුද්දං සඋම්මිං සවීචිං සාවට්ටං සගහං සරක්ඛසං, තිණ්ණො පාරගතො, ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යස්ස රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා
සො'මං සමුද්දං සගහං සරක්ඛසං
සඋම්මිභයං දුත්තරමච්චතාරී
සඞ්ගාතිගො මච්චුජහො නිරූපධි
පහාසි දුක්ඛං අපුනබ්භවාය,
අත්ථං ගතො සො න පමාණමෙ'ති,
අමොහයී මච්චුරාජන්ති බ්‍රෑමී" ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

දුතියො වග්ගො.

**තස්සුද්දානං:**

පුඤ්ඤං චක්ඛු අථ ඉන්ද්‍රියානි අද්ධා චරියං දුවෙ සොචි
මූතො අථ රාගදුවෙ පුන වග්ගමාහු දුතියමුත්තමන්ති.

---

1. අබන්ධො. සී.මු

මහණෙනි, යම් කිසිවකුගේ රාගය ප්‍රහීණ වී ද, ද්වේෂය ප්‍රහීණ වී ද, මෝහය ප්‍රහීණ වී ද, මහණෙනි, මේ තෙමේ කෙලෙස් මරු විසින් නොබඳනා ලද්දේ ය මොහු විසින් මාරපාසය ඉවත් කරණ ලද්දේ ය, පවිටු (මර) හු විසින් කැමැති පරිදි කළ හැක්කෙක් වේ යැ යි කියනු ලැබේ.

භාග්‍යවත්හු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යමකු විසින් රාගයත් ද්වේෂයත් මෝහයත් නිරුද්ධ කරණ ලද්දහු ද, භාවිතාත්මයත් (රහතුන්) අතුරෙන් එක්තරා කෙනෙක් වූ, බ්‍රහ්මභූතවූ (ශ්‍රේෂ්ඨ රහත් ඵලයට පැමිණි), තථාගත (අන් රහතුන් සේ පිළිපන්නා) වූ, බුදු වූ (සිවුසස් පිළිවිදි) වෛර ද භය ද ඉක්මැවූ ඒ පුද්ගලයා සියල්ල දුරු කළ කෙනකුන් කොට (බුද්ධාදි) ආර්‍ය්‍යයෝ කියත්."

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 2. 10.

### [ දෙවෙනි රාගසූත්‍රය. ]

69. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම්කිසි මහණකුගේ හෝ මෙහෙණකගේ හෝ රාගය ප්‍රහීණ නො වී ද, ද්වේෂය ප්‍රහීණ නො වී ද, මෝහය ප්‍රහීණ නො වී ද, මහණෙනි, මේ තෙමේ (ක්‍රෝධෝපායාස සඞ්ඛ්‍යාත) ලොකු කුඩා රළ සහිත වූ (පස්කම් නමැති) දියසුළි සහිත වූ (මස්කෑසුබු දියරකුස් වැනි) විසභාග පුද්ගලයන් සහිත වූ සංසාර සමුද්‍රය (නොහොත් චක්ෂුරාදි ආයතන සමුද්‍ර ය) තරණය නො කෙළේ යැ යි කියනු ලැබේ.

මහණෙනි, යම් කිසි මහණකුගේ හෝ මෙහෙණකගේ හෝ රාගය ප්‍රහීණ වී ද, ද්වේෂය ප්‍රහීණ වී ද, මෝහය ප්‍රහීණ වී ද, මහණෙනි, මේ තෙමේ (ක්‍රෝධෝපායාස සඞ්ඛ්‍යාත) ලොකු කුඩා රළ සහිත වූ (පස්කම් නමැති) දියසුළි සහිත වූ (මස් කෑසුබු දිය රකුස් වැනි) විසභාග පුද්ගලයන් සහිත වූ සංසාර සමුද්‍රය (නොහොත් චක්ෂුරාදි ආයතන සමුද්‍රය) තරණය කෙළේ යැ යි කියනු ලැබේ. බ්‍රාහ්මණ නම් වූ ඒ (ක්ෂීණාස්‍රව) තෙමේ එතෙර වූයේ පරතෙරට ගියේ (නිර්වාණ සඞ්ඛ්‍යාත) ගොඩබිමැ සිටී යැ යි.

භාග්‍යවත්හු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. යමකු විසින් රාග ද්වේෂ මෝහ නිරුද්ධ කරණ ලද්දහු ද, හෙ තෙමේ විසභාග පුද්ගලයන් සහිත වූ (ක්‍රෝධෝපායාස සඞ්ඛ්‍යාත) රළබිය සහිත වූ තරණයට දුෂ්කර සසර සයුර තරණය කෙළේ යි (රාගාදි පඤ්චවිධ) සඞ්ගයන් ඉක්ම වූ කෙලෙස් මරු දුරු කළ උපධි රහිත වූ දුක් දුරු කෙළේ නැවත ඉපැදීමට නො ඒ යැ යි රාගාදීන් ඉක්මැ වූයේ යැ යි, (එහෙයින් ම) ප්‍රමාණයට නො ඒ යැ යි (එහෙයින් ම) මරු මුළා කෙළේ යැ යි කියමි.

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### දෙවන වර්ගයි.

එහි උද්දානය:

පුඤ්ඤ, චක්ඛු, නැවත ඉන්ද්‍රිය, අද්ධ, චරිය දෙක, සෝචෙය්‍ය, මෝනෙය්‍ය, නැවත රාග දෙකැ යි උතුම් දෙවැනි වර්ගය කීහු.

# තතියො වග්ගො

## 3. 3. 1.

## [ මිච්ඡාදිට්ඨිකම්මසමාදානසුත්තං. ]

70. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

තං ඛො පනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං-උපවාදකා, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

අපි ච භික්ඛවෙ යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා'ති

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "මිච්ඡා මනං පණිධාය මිච්ඡා වාචං ච භාසිය,[1]
මිච්ඡා කම්මානි කත්වාන කායෙන ඉධ පුග්ගලො.

3. අප්පස්සුතො' පුඤ්ඤකරො අප්පස්මිං ඉධ ජීවිතෙ,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතී"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

---

1 මිච්ඡාවාචං අභාසිය - සීමු.

# තෙවෙනි වර්ගය

## [ මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන සූත්‍රය. ]

### 3. 3. 1.

70. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, කායදුශ්චරිතයෙන් යුක්ත වූ වාග්දුශ්චරිතයෙන් යුක්ත වූ මනොදුශ්චරිතයෙන් යුක්ත වූ ආර්‍යයන්ට (බොරුවෙන්) චොදනා කරන්නා වූ මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යාදෘෂ්ටි හෙතුවෙන් දැඩි කොට ගත් කර්‍ම ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරුගති ඇති විවස ව වැටීම් ඇති නිරයෙහි උපදින්නාහු ය.

මහණෙනි, එ කරුණ මම අන් මහණ බමුණකුගෙන් අසා නො ම කියමි.

මහණෙනි, කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් යුක්ත වූ, ආර්‍යයන්ට (බොරුවෙන්) චොදනා කරන්නා වූ, මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යාදෘෂ්ටිහෙතුවෙන් දැඩි කොට ගත් කර්‍ම ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව වැටීම් ඇති නිරයෙහි උපන්නාහු ය.

යළි දු මහණෙනි, යමක් තමා විසින් ම නුවණින් අවබොධ කරණ ලද ද, තමා විසින් ම දක්නා ලද ද, තමා විසින් ම දන්නා ලද ද, එය ම මම කියමි.

මහණෙනි, කායවාග්මනොදුශ්චරිතයෙන් යුක්ත වූ ආර්‍යයන්ට (බොරු-වෙන්) චොදනා කරන්නා වූ මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යාදෘෂ්ටි හෙතුවෙන් දැඩි කොට ගත් කර්‍ම ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුත් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරුගති ඇති විවස ව වැටීම් ඇති නිරයෙහි උපන්නාහු වෙති.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මෙ ලොව පුහුල් තෙම සිත වැරැදි ලෙස පිහිටුවා, වැරැදි බස් තෙපලා, කයින් වැරැදි ක්‍රියා කොට,

3. මේ මිනිස් ලොවැ ජීවත් වන සුළු කාලය තුළ ඇසූ පිරූ තැන් නැති අකුසල් කරණ, නුවණ නැති ඒ පුද්ගල තෙමේ කාබුත් මරණින් මතු නරකයෙහි උපදී."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 2.

## [ සම්මාදිට්ඨිකම්මසමාදාන සුත්තං ]

71. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා.

තං ඛො පනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා.

අපි ච භික්ඛවෙ යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සම්මා මනං පණිධාය සම්මාවාචං ච භාසිය,[1]
සම්මා කම්මානි කත්වාන කායෙන ඉධ පුග්ගලො

3. බහුස්සුතො පුඤ්ඤකරො අප්පස්මිං ඉධ ජීවිතෙ,
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජති"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. සම්මාවාචං අභාසිය, සී.මු.

### 3. 3. 2.

## [ සම්‍යග්දෘෂ්ටි කම්සමාදාන සූත්‍රය ]

71. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, කායසුචරිතයෙන් යුක්ත වූ වාක්සුචරිතයෙන් යුක්ත වූ මනඃසුචරිතයෙන් යුක්ත වූ ආර්‍යයන්ට (බොරුවෙන්) චෝදනා නොකරණ, සම්‍යග්දෘෂ්ටිකවූ සම්‍යග්දෘෂ්ටි හේතුවෙන් දැඩි කොට ගත් කම් ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුන් මරණින් මතු මනාගති ඇති ස්වර්ග-ලොකයට පැමිණියෝ වෙති.

මහණෙනි, එ කරුණ මම අන් මහණ බමුණකුගෙන් අසා නො ම කියමි.

මහණෙනි, කායසුචරිතයෙන් වාක්සුචරිතයෙන් මනඃසුචරිතයෙන් යුක්ත වූ ආර්‍යයන්ට (බොරුවෙන්) චෝදනා නොකරණ, සම්‍යග්දෘෂ්ටික වූ සම්‍යග්දෘෂ්ටි හෙතුවෙන් දැඩි ලෙස ගත් කම් ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලොකයට පැමිණියාහු වෙති.

යලිදු මහණෙනි, යමක් තමා ම (නුවණින්) අවබොධ කරණ ලද ද, තමා ම දක්නා ලද ද, තමා ම දත්නා ලද ද එය ම මම කියමි.

මහණෙනි, කාය වාග් මනඃ සුචරිතයෙන් යුක්ත වූ අයර්‍යයන්ට බොරුවෙන් චෝදනා නොකරණ සම්‍යග්දෘෂ්ටික වූ සම්‍යග්දෘෂ්ටි හෙතුවෙන් දැඩි ලෙස ගත් කම් ඇති සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. ඔවුහු කාබුන් මරණින් මතු මනාගති ඇති ස්වර්ගලොකයෙහි උපන්නාහු යැ යි.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මෙ ලොව පුහුල් තෙම සිත මනා ලෙස පිහිටුවා යහපත් වචන කථා කොට කයින් හොඳ වැඩ කොට,

3. මේ මිනිස් ලොව ජීවත් වන සුළු කාලය තුළ ඇසූ පිරූ තැන් ඇති කුසල් කරණ, නුවණැති ඒ පුද්ගල තෙමේ කාබුන් මරණින් මතු දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) පැමිණේ."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 3.

### [ නිස්සරණීය සුත්තං ]

72. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තිස්සො ඉමා භික්ඛවෙ නිස්සරණීයා ධාතුයො. කතමා තිස්සො? කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං. රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං. යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, නිරොධො තස්ස නිස්සරණං. ඉමා ඛො භික්ඛවෙ තිස්සො නිස්සරණීයා ධාතුයො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කාමනිස්සරණං ඤත්වා රූපානඤ්ච අතික්කමං
සබ්බසඞ්ඛාරසමථං ඵුසං ආතාපි සබ්බදා.

3. ස වෙ සම්මද්දසො භික්ඛු යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤූ වොසිතො සන්තො ස වෙ යොගාතිගො මුනී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 3. 4.

### [ සන්තතර සුත්තං ]

73. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. රූපෙහි භික්ඛවෙ අරූපා සන්තතරා. අරූපෙහි නිරොධො සන්තතරො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙ ච රූපූපගා සත්තා යෙ ච ආරුප්පට්ඨායිනො[1]
නිරොධං අප්පජානන්තා ආගන්තාරො පුනබ්භවං.

3. යෙ ච රූපෙ පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා,
නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චුහායිනො.

4. කායෙන අමතං ධාතුං ඵුසයිත්වා නිරූපධිං,
උපධිප්පටිනිස්සග්ගං සච්ඡිකත්වා අනාසවො,
දෙසෙති සම්මාසම්බුද්ධො අසොකං විරජං පදන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1 අරූපට්ඨායිනො (මජසං.)

## 3. 3. 3.

## [ නිඃශරණීය සූත්‍රය ]

72. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අතීත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, නිශ්‍යරණ (නික්මීම) ප්‍රතිසංයුක්ත වූ ධර්මයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: යම් මේ ප්‍රථමධ්‍යානයෙක් වේ ද, මෙය කාමයන්ගේ නිශ්‍යරණය සි (හෙවත් නික්මීම සි). යම් මේ අරූපාවචර ධ්‍යානයෙක් වේ ද, මෙය රූපයන්ගේ නිශ්ශරණය සි. (හෙතු ප්‍රත්‍යයයෙන්) හටගත් එයින් ම රැස් කරණ ලද හෙතු ප්‍රත්‍යයයෙන් උපන් යම් කිසිවක්, වේ ද, ඒ ධර්මයාගේ නිශ්ශරණය (පහවීම) නිරෙධය ය (නිවණ ය.) මහණෙනි මේ නිශ්ශරණීය සවභාවයෝ තිදෙන වෙත්.

භගවත්හු මෙකරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "හැම කල්හි කෙලෙස් තවන වීයර්‍ය ඇති, කාමනිශ්ශරණය ද, රූපයන්ගේ අතික්‍රමය ද (අතික්‍රමොපායය ද) දූන සියලු සංස්කාරයන්ගේ සංසිඳීම (යැ යි කියන ලද නිර්වාණය) සපයී කරත්තාවූ,

3. ඒ මහණ තෙම එකාන්තයෙන් සම්‍යග්දර්යී නම් වෙයි. යම් හෙයකින් ඒ කාමයන්ගේ නිශ්ශරණයෙහි මිදේ ද (එ හෙයිනි). විශිෂ්ට ඥානයෙන් දූන නිමවන ලද කෘත්‍ය ඇති ඒ රහත් මහණ තෙමේ කාමාදි චතුර්යොගයන් ඉක්මවූයේ නම් වෙයි."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 4.

## [ ශාන්තතර සූත්‍රය ]

73. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අතීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලද්දේ ය:

1. මහණෙනි, අරූපාවචර ධර්මයෝ රූපාවචර ධර්මයනට වඩා ශාන්ත වෙත්. නිවණ අරූපාවචර ධර්මයනට වඩා ශාන්ත වෙයි.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මෙය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "රූපභවයට උත්පත්ති වශයෙන් පැමිණි යම් සත්ත්ව කෙනෙක් වෙද්ද, අරූපභවයෙහි උපන් යම් සත්ත්ව කෙනෙකුත් වෙද්ද, නිවණ නොදන්නාවූ (ඔවුහු) පුනරුත්පත්තියට (නැවත ඉපැත්මට) පැමිණෙන්නෝ වෙත්.

3. යම් සත්ත්ව කෙනෙක් රූපධර්මයන් පිරිසිඳ දූන අරූපධර්මයෙහි නො පිහිටියාහු, නිරොධයෙහි (=නිර්වාණය අරමුණු කොට) කෙලෙසුන් කෙරෙන් මිදෙත් ද, ඒ ක්ෂීණාවස්‍රයෝ මරණය ඉක්මියෝ වෙත්.

4. ආස්‍රව රහිත වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ උපධිරහිත වූ නිර්වාණය (තාම) කයින් සපයී කොට උපධීන්ගේ බැහැර ලීමේ කාරණය ප්‍රත්‍යක්ෂ කොට ශොක රහිත වූ කෙලෙස් රජස් රහිත වූ නිර්වාණ පදය දෙසන සේක."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

3. 3. 5.

[ පුත්තසුත්තං ]

74. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ පුත්තා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො? අතිජාතො අනුජාතො අවජාතො'ති.

කථඤ්ච භික්ඛවෙ පුත්තො අතිජාතො හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති න බුද්ධං සරණං ගතා, න ධම්මං සරණං ගතා, න සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා අප්පටිවිරතා, අදින්නාදානා අප්පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා අප්පටිවිරතා, මුසාවාදා අප්පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතා, දුස්සීලා පාපධම්මා. පුත්තො ච නෙසං හොති, බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො, සීලවා කල්‍යාණධම්මො. එවං ඛො භික්ඛවෙ පුත්තො අතිජාතො හොති.

කථඤ්ච භික්ඛවෙ පුත්තො අනුජාතො හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා, සීලවන්තො කල්‍යාණධම්මා. පුත්තො ච නෙසං හොති බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො, සීලවා කල්‍යාණධම්මො. එවං ඛො භික්ඛවෙ පුත්තො අනුජාතො හොති.

කථඤ්ච භික්ඛවෙ පුත්තො අවජාතො හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා, සීලවන්තො කල්‍යාණධම්මා. පුත්තො ච නෙසං හොති න බුද්ධං සරණං ගතො, න ධම්මං සරණං ගතො, න සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා අප්පටිවිරතො, අදින්නාදානා අප්පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා අප්පටිවිරතො, මුසාවාදා අප්පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතො, දුස්සීලො පාපධම්මො. එවං ඛො භික්ඛවෙ පුත්තො අවජාතො හොති. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුත්තා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

3. 3. 5.

[ පුත්‍රසූත්‍රය ]

74. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය:

1. මහණෙනි, මේ ලොකයෙහි පුත්‍රයෝ තිදෙනෙක් ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත්. කවර තිදෙනෙක් ද යත්: අතිජාත ය, අනුජාත ය, අවජාත ය (යන තිදෙන යි.)

මහණෙනි, කෙසේ නම් පුත්‍ර තෙම අතිජාත වේ ද? මහණෙනි, මේ ලොකයෙහි (යම්) පුත්‍රයකුගේ මව් පිය දෙදෙන බුදුන් සරණ නොගියාහු, දහම් සරණ නොගියාහු, සඟුන් සරණ නොගියාහු වෙත් ද, ප්‍රාණඝාතයෙන් නොවැලකුනාහු, නුදුන් දෙය ගැන්මෙන් නොවැලකුනාහු, කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැලකුනාහු, බොරු කීමෙන් නොවැලකුනාහු, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් නොවැලකුනාහු, සිල් නැත්තාහු, ලාමක ධර්ම ඇත්තාහු වෙත් ද. ඔවුන්ගේ පුත්‍ර තෙම බුදුන් සරණ කොට ගියේ, දහම් සරණ කොට ගියේ, සඟුන් සරණ කොට ගියේ වේ ද, ප්‍රාණඝාතයෙන්, නුදුන් දෙය ගැණීමෙන්, කාමයන්හි වරදවා හැසිරී-මෙන්, මුසාවාදයෙන්, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැළැකුනේ වේ ද, සිල්වත් වේ ද, යහපත් ධර්ම ඇත්තේ වේ ද, මහණෙනි, මෙබඳු වූ පුත්‍ර තෙම අතිජාත නම් වේ.

මහණෙනි, පුත්‍ර තෙමේ කෙසේ නම් අනුජාත වේ ද? මහණෙනි, මේ ලොකයෙහි (යම්) පුත්‍රයකුගේ මව්පිය දෙදෙන බුදුන් සරණ කොට ගියාහු, දහම් සරණ කොට ගියාහු, සඟුන් සරණ කොට ගියාහු, ප්‍රාණඝාතයෙන් වැලකුනාහු, නුදුන් දෙය ගැන්මෙන් වැලකුනාහු, කාමයෙහි වරදවා හැසිරී-මෙන් වැළැකුනාහු, බොරු කීමෙන් වැලකුනාහු, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීමෙන් වැළැකුනාහු, සිල්වත් වූවාහු, කලණ දහම් ඇත්තාහු වෙත් ද. ඔවුන්ගේ පුත්‍ර තෙමේ ද බුදුන් දහම් සඟුන් සරණ කොට ගියේ වේ ද, ප්‍රාණඝාතයෙන්, නුදුන් දෑය ගැන්මෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, මුසාවාදයෙන්, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැලකුනේ වේ ද, සිල්වත් වේ ද, යහපත් ධර්ම ඇත්තේ (සම්‍යග්දෘෂ්ටියෙන් යුක්ත) වේ ද, මහණෙනි, මෙබඳු වූ පුත්‍ර තෙම අනුජාත නම් වේ.

මහණෙනි, පුත්‍ර තෙමේ කෙසේ නම් අවජාත වේ ද? මහණෙනි, මේ ලොකයෙහි (යම්) පුත්‍රයකුගේ මව් පිය දෙදෙන බුදුන් සරණ ගියාහු, දහම් සරණ ගියාහු, සඟුන් සරණ ගියාහු වෙත් ද, ප්‍රාණඝාතයෙන්, නුදුන් දෑය ගැන්මෙන්, කාමයන්හි වරදවා හැසිරීමෙන්, මුසාවාදයෙන්, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැලකුනාහු, සිල්වත් වූවාහු කලණදහම් ඇත්තාහු වෙත් ද, එහෙත් ඔවුන්ගේ පුත්‍ර තෙමේ බුදුන් සරණ දහම් සරණ සඟුන් සරණ නො ගියේ වේ ද, ප්‍රාණඝාතයෙන්, නුදුන් දෑය ගැන්මෙන්, කාමයන්හි වරදවා හැසිරීමෙන්, මුසාවාදයෙන්, මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් නොවැලකුනේ වේ ද, සිල් නැත්තේ ලාමකධර්ම (හීනාචාර) ඇත්තේ වේ ද, මහණෙනි, මෙසේ වනාහි පුත්‍ර තෙමේ අවජාත නම් වේ. මහණෙනි, මේ පුත්‍රයෝ තිදෙන ලොකයෙහි ඇත්තාහු විද්‍යමාන වන්නාහු වෙත් සි.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අතිජාතං අනුජාතං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා,
අවජාතං න ඉච්ඡන්ති යො හොති කුලගන්ධනො.

3. එතෙ ඛො පුත්තා ලොකස්මිං යෙ භවන්ති උපාසකා,
සද්ධා සීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා,
චන්දො අබ්භඝනා මුත්තො පරිසාසු විරොචරෙ"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 3. 6.

### [ වුට්ඨිසුත්තං ]

75. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො? අවුට්ඨිකසමො පදෙසවස්සී සබ්බත්ථාභිවස්සී.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො අවුට්ඨිකසමො හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්බෙසඤ්ඤෙව න දාතා හොති, සමණබ්‍රාහ්මණ-කපණද්ධික වණිබ්බක යාචකානං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ-විලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො අවුට්ඨිකසමො හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො පදෙසවස්සී හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො එකච්චානං දාතා හොති, එකච්චානං න දාතා හොති සමණබ්‍රාහ්මණ-කපණද්ධික වණිබ්බක යාචකානං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ-විලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො පදෙසවස්සී හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො සබ්බත්ථාභිවස්සී හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්බෙසඤ්ච දෙති සමණබ්‍රාහ්මණ කපණද්ධිකවණිබ්බක-යාචකානං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං. එවං ඛො භික්ඛවෙ පුග්ගලො සබ්බත්ථාභිවස්සී හොති. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “නුවණැත්තෝ අතිජාත පුත්‍රයා ද, අනුජාත පුත්‍රයා ද කැමැති වෙත්. යම් පුත්‍රයෙක් කුලය වනසන්නේ වේ ද (ඒ) අවජාත පුත්‍රයා නො කැමති වෙත්.

3. මොහු ම (මේ අතිජාතාදි තිදෙන) ලොකයෙහි පුත්‍රයෝ නම් වෙති. යම් පුත්‍ර කෙනෙක් උපාසක වෙත් ද, ශ්‍රද්ධාවෙන් හා සීලයෙන් යුක්තයෝ (යාචකයන්ගේ) වදන් දන්නාහු, පහවූ මසුරුමල ඇත්තාහු වෙත් ද, (ඔවුහු ම) ඝන වලාකුළින් මිදුනු චන්ද්‍රයා මෙන් පිරිස් අතුරෙහි බබලත්.”

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 6.

## [ වෘෂ්ටිසූත්‍රය ]

75. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත්වූ බුදුරජුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලද්දේ ය:

1. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙනෙක් ලොකයෙහි ඇත්තාහ විද්‍යමානයහ. කවර තිදෙනෙක් ද යත්: අවුට්ඨිකසම (නොවස්නා වැසිවලාවක් වැනි) පුද්ගලයා ද, ප්‍රදෙශවර්ෂී (පෙදෙසකට වස්නා වලාවක් වැනි) පුද්ගලයා ද, සර්වත්‍රවර්ෂී (හැමතැන්හි වස්නා වලාවක් වැනි) පුද්ගලයා ද යන තිදෙන යි.

මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙමේ අවුට්ඨිකසම වේ ද? මහණෙනි, මේ ලොවිහි ඇතැම් පුද්ගලයෙක් මහණ බමුණු දුගී මගී පුලන (වණිබ්බක) යදි යන මේ සියල්ලන්ට ම ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් සෙනසුන් වසන ප්‍රදීප උපකරණ (යන මේ කිසිවක්) නො දෙන්නේ වේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ වනාහි අවුට්ඨිකසම වෙයි.

මහණෙනි, පුද්ගල තෙමේ කෙසේ නම් ප්‍රදෙශවර්ෂී වේ ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මහණ බමුණු දුගී මගී පුලන යදි යන මොවුන් අතුරෙන් ඇතැම් කෙනකුන්හට ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් සෙනසුන් ආවාස ප්‍රදීපොපකරණ යන මේ දෑ දෙන්නේ වේ ද, ඇතැම් කෙනකුන්හට නො දෙන්නේ වේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ ප්‍රදෙශවර්ෂී නම් වේ.

මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙමේ සර්වත්‍රවර්ෂී වේ ද? මහණෙනි, මෙ ලොවිහි ඇතැම් පුද්ගලයෙක් මහණ බමුණු දුගී මගී පුලන යදි යන සියල්ලන්ට ම ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් සයනාසන ආවාස ප්‍රදීපොපකරණ යන සියල්ල දෙයි ද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ වනාහි සර්වත්‍රවර්ෂී නම් වේ. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන ලොවිහි ඇත්තාහ. විද්‍යමානයහ.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "න සමණෙ න බ්‍රාහ්මණෙ න කපණද්ධිකවණිබ්බකෙ,
ලද්ධාන සංවිභජති අන්නං පානඤ්ච භොජනං
තං වෙ අවුට්ඨිකසමො'ති ආහු නං පුරිසාධමං.

3. එකච්චානං න දදති එකච්චානං පවෙච්ඡති,
තං වෙ පදෙසවස්සීති ආහු මෙධාවිනො ජනා.

4. සුභික්ඛවාචො පුරිසො සබ්බභූතානුකම්පකො,
ආමොදමානො පකිරෙති දෙථ දෙථාති භාසති.

5. යථාපි මෙඝො ථනයිත්වා ගජ්ජයිත්වා පවස්සති,
ථලං නින්නඤ්ච පූරෙති අභිසන්දන්තො'ව වාරිනා.

6. එවමෙව ඉධෙකච්චො පුග්ගලො හොති තාදිසො
ධම්මෙන සංහරිත්වාන උට්ඨානාධිගතං ධනං
තප්පෙති අන්නපානෙන සම්මා පත්තෙ වණිබ්බකෙති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

3. 3. 7.

[ සුඛපත්ථනාසුත්තං ]

76. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො. කතමානි තීණි? 'පසංසා මෙ ආගච්ඡතූ'ති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, 'භොගා මෙ උප්පජ්ජන්තූ'ති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, 'කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමී'ති සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො. ඉමානි ඛො භික්ඛවෙ තීණි සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සීලං රක්ඛෙය්‍ය මෙධාවී පත්ථයානො තයො සුඛෙ,
පසංසං විත්තලාභඤ්ච පෙච්ච සග්ගෙ පමොදනං.

3. අකරොන්තො'පි චෙ පාපං කරොන්තමුපසෙවති,
සඞ්කියො හොති පාපස්මිං අවණ්ණො චස්ස රූහති.

මෙසේ මේ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "(යම් පුද්ගලයෙක්) මහණ බමුණු දුගී මඟී පුලනු යදි (යන මොවුන්) ලැබ ආහාරපානභෝජනයන් මිනා කොට බෙද නො දෙයි ද, (ඒ තද මසුරු) තිහින පුද්ගලයා ඒකාන්තයෙන් අවුට්ඨිකසම (නොවස්නා වැසිවලාව වැනි) යයි (පණ්ඩිතයෝ) කියත්.

3. ඇතැම් කෙනකුන්හට නො දේ ද, ඇතැම් කෙනකුන්හට දේ ද, ඔහු ඒකාන්තයෙන් ප්‍රදෙශවර්ෂී යයි නුවණැත්තෝ කියත්.

4. (සුලභ ආහාර ඇති බැවින්) සුභික්ෂ වචන ඇති, සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇති, පුද්ගල තෙමේ තුටුපහටු සිත් ඇත්තේ (ප්‍රතිග්‍රාහක ක්ෂෙත්‍රයෙහි) (දෙයධර්මය) වගුරුවා ද, 'දෙවු දෙවු' යැ යි කියා ද,

5. යම්සේ වනාහි මෙඝය කුදු මහත් ගර්ජනා කොට වසී ද, ජලගැල්-මෙන් උස්පහත් තැන් පුරවා ද,

6. එ පරිද්දෙන් මේ ලොව්හි එබඳුවූ ඇතැම් පුද්ගලයෙක් උත්ථාන-වීර්‍ය්‍යයෙන් ලබනලද ධනය දහමින් රැස් කොට ගෙණ තමා වෙත පැමිණි යාචකයන් සතප්වයි."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කරුණ වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 7.

## [ සුඛප්‍රාර්ථනා සූත්‍රය ]

76. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සැපයට නිමිති වූ මේ කරුණු තුණ පතමින් නුවණැති පුරුෂ තෙමේ සිල් රක්නේ ය. කවර කරුණු තුණක් ද යත්: මට ප්‍රශංසාව ලැබේවා යි නුවණැත්තේ සිල් රක්නේ ය. 'මට වස්තුහු උපදිත්වා'යි නුවණැත්තේ සිල් රක්නේ ය. 'කාබුත් මරණින් මතු මිනා ගති ඇති ස්වර්ග-ලොකයෙහි උපදිම්වා'යි නුවණැත්තේ සිල් රක්නේ ය. මහණෙනි, සැපයට නිමිති වූ මේ කරුණු තුණ පතමින් නුවණැත්තේ සිල් රක්නේ ය.

මේ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "නුවණැත්තේ ප්‍රශංසාව ද, වස්තුලාභය ද, පරලොවැ ස්වර්ගයෙහි සතුටු වීම් ද (යන) සැප තුණ පතමින් සිල් රක්නේ ය.

3. ඉදින් හේ පව් නො කරන්නේ නුමුදු පව් කරන්නකු සෙවුනේ නම්, (සෙස්සන් විසින්) හේ පාපයෙහි සැක කටයුත්තේ වෙයි. ඔහුට අගුණ ද නැගෙයි. (පැතිරේ.)

4. යාදිසං කුරුතෙ මිත්තං යාදිසං චූපසෙවති,
ස වෙ තාදිසකො හොති සහවාසො'පි තාදිසො.

5. සෙවමානො සෙවමානං සම්ඵුට්ඨො සම්ඵුසං පරං,
සරො දිද්ධො කලාපං'ව අලිත්තමුපලිම්පති,
උපලෙපභයා ධීරො නෙව පාපසඛා සියා.

6. පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති,
කුසා'පි පූති වායන්ති එවං බාලූපසෙවනා.

7. තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති,
පත්තා'පි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා.

8. තස්මා පත්තපුටස්සෙව ඤත්වා සම්පාකමත්තනො,
අසන්තෙ නොපසෙවෙය්‍ය සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතො,
අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙන්ති සුග්ගති''න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 3. 8.

## [ භිදුරසුත්තං ]

77. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. භිදුරායං භික්ඛවෙ කායො විඤ්ඤාණං විරාගධම්මං සබ්බෙ උපධී අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කායං ච භිදුරං[1] ඤත්වා විඤ්ඤාණං ච පභඞ්ගුරං[2]
උපධීසු භයං දිස්වා ජාතිමරණමච්චගා[3]
සම්පත්වා පරමං සන්තිං කාලං කඞ්ඛති භාවිතත්තො'ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. සිඥතං (ඝොසුවි) සිඥත්තං - සීඅමු.
2. විරාගුනං - සීඅම. විරාගිකං. (සී. තාලපණ්ණකොසුවි. පභඞ්ගුනං (සභා.)
3. මජ්ඣගො - සීඅමු. මගාජ්ඣ - සීඅ.

4. යමෙක් යම් බඳු පුද්ගලයකු මිත්‍රයකු කෙරේ ද, යමකුත් සේවිතේ ද, හෙ තෙමේ එකාන්තයෙන් එබඳු ම වේ. ඔහු හා සහවාසය ද එබඳු ම වේ.

(කලින් කල නමින්) සෙවනය කරණ (පියෙවින් පිරිසිදු) පුද්ගලයෙකු සෙවනය කරණ (පාප) පුද්ගල තෙමේ (ඒ පරිසිදු පුද්ගලයා විසින් සංසර්ග-වශයෙන්) නිති පහස්නා ලද්දේ, (තෙමේ ද) අන්‍යයා (ඒ පිරිසිදු පුද්ගලයා එසේම) නිති පහස්නේ විෂ පොවන ලද හිය (විෂ නොපෙවූ සෙසු) හී සමූහය (විෂයෙන්) ආලිප්ත කරන්නාක් මෙන් ඒ පිරිසිදු පුද්ගලයා පාපයෙන් තවරයි (එ හෙයින්) නුවණැත්තේ පවින් තැවැරෙණුවට බියෙන් පාපමිත්‍රයන් ඇත්තේ නොවන්නේ ය.

6. යම් පුරුෂයෙක් කුණු මස් කුස තණයෙන් වෙළා ද (ඔතා ද), ඒ කුසතණයෝ ද දුගඳ විහිදුවත්. බාලජන සෙවනය මෙ බඳු ය.

7. යම් මිනිසෙක් තුවරලා නම් සුගන්ධ ද්‍රව්‍යය කොළයෙකින් වෙළා ද, ඒ කොළ ද සුවඳ විහිදුවයි. පණ්ඩිතජන සෙවනය ද එබඳු ය.

8. එ හෙයින් නුවණැත්තේ පත්‍රපුටයාගේ (දුර්ගන්ධ-සුගන්ධභාවයෙන්) තමා පිළිබඳ (අසත්පුරුෂ-සත්පුරුෂ සංසර්ග) ඵලය දැන අසත්පුරුෂ සෙවනය නො කරන්නේ ය. සත්පුරුෂයන් ම සෙවනය කරන්නේ ය. අසත්පුරුෂයෝ නිරයට පමුණුවත්. සත්පුරුෂයෝ සුගතියට පමුණුවත්."

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

3. 3. 8.

[ භිදුර සූත්‍රය ]

77. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ සිරුර බිඳෙන සුලු ය. විඤ්ඤාණය (ත්‍රෛභූමකකුශලාදි චිත්තය) නැසෙන සුලු ය. සියලු උපධීහු අනිත්‍යයහ දුඃඛයහ පෙරළෙන සවභාව ඇත්තාහු ය.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සිරුර බිඳෙන සුලු ය යි ද, සිතත් බිඳෙන සුලු ය යි ද දැන උපධීන්හි බිය දැක ඉපදීම හා මරණය ඉක්මියේ ය. (රහත්වූයේ ය.) උතුම්වූ ශාන්තියට (නිර්වාණයට) පැමිණ භාවනා වශයෙන් වඩනා ලද අත්බව් (ශීලසමාධිප්‍රඥා) ඇත්තේ තමාගේ පරිනිර්වාණ කාලය බලාපොරොත්තු වෙයි."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

3. 3. 9.

[ ධාතුසංසන්දන සුත්තං ]

78. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ධාතුසො භික්ඛවෙ සත්තා සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

අතීතම්පි භික්ඛවෙ අද්ධානං ධාතුසො සත්තා සත්තෙහි සද්ධිං සංසන්දිංසු, සමිංසු. හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු. කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු.

අනාගතම්පි භික්ඛවෙ අද්ධානං ධාතුසො සත්තා සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමෙස්සන්ති. හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමිස්සන්ති. කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමිස්සන්ති.

එතරහි'පි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං ධාතුසො'ව සත්තා සත්තෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති. හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති. කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සංසග්ගා වනථො ජාතො අසංසග්ගෙන ඡිජ්ජති,
පරිත්තං දාරුමාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ.

3. එවං කුසීතමාගම්ම සාධුජීවීපි සීදති,
තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං.

4. පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි,
නිච්චං ආරද්ධවිරියෙහි පණ්ඩිතෙහි සහා වසෙ'ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 3. 9.

### [ ධාතුසංසන්දන සූත්‍රය ]

78. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ධාතුවශයෙන් අදහස් වශයෙන් සත්ත්වයෝ සත්ත්වයන් හා එක් වෙත්. එක් සිත් ඇති ව සමාගමයට පැමිණෙත්. ලාමක අදහස් ඇති සත්ත්වයෝ ලාමක අදහස් ඇත්තවුන් හා එක් වෙත්. ඔවුනොවුන් භජනය කරත්. කල්‍යාණ අදහස් ඇති සත්ත්වයෝ කල්‍යාණ අදහස් ඇත්තවුන් හා එක් වෙත්. භජනය කරත්.

මහණෙනි, ඉකුත් කල්හි ද අදහස් වශයෙන් සත්ත්වයෝ සත්ත්වයන් හා එක් වූහ. සමාගමයට පැමිණියහ. ලාමක අදහස් ඇති සත්ත්වයෝ ලාමක අදහස් ඇත්තවුන් හා ද කල්‍යාණ අදහස් ඇති සත්ත්වයෝ කල්‍යාණ අදහස් ඇත්තවුන් හා ද එක් වූහ. සමාගමයට පැමිණියහ.

මහණෙනි, මතු කල්හි ද අදහස් වශයෙන් සත්ත්වයෝ සත්ත්වයන් හා එක් වන්නාහ. සමාගමයට පැමිණෙන්නාහ. ලාමක අදහස් ඇති සත්ත්වයෝ ලාමක අදහස් ඇත්තවුන් හා ද කල්‍යාණ අදහස් ඇති සත්ත්වයෝ කල්‍යාණ අදහස් ඇති සත්ත්වයන් හා ද එක් වන්නාහ. සමාගමයට පැමිණෙන්නාහ.

මහණෙනි, මෙ කල්හි ද අදහස් වශයෙන් සත්ත්වයෝ සත්ත්වයන් හා එක් වෙත්. සමාගමයට පැමිණෙත්. ලාමක අදහස් ඇති සත්ත්වයෝ ලාමක අදහස් ඇත්තවුන් හා ද කල්‍යාණ අදහස් ඇති සත්ත්වයෝ කල්‍යාණ අදහස් ඇති සත්ත්වයන් හා ද එක් වෙත්. සමාගමයට පැමිණෙත්.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "(සහවාසාදි වශයෙන්) සමායෝගයෙන් උපන් කෙලෙස් අසමායෝගයෙන් (පාපසෙවන ප්‍රතික්ෂෙපයෙන් ද සමුච්ඡෙද විවෙකයෙන් ද) ප්‍රහීණ වේ. දුවමුවා කුඩා පසුරක් නැග මහසයුරෙහි යනුයේ යම්සේ ගිලා බස්නේ ද,

3. එමෙන් ම කුසීත පුද්ගලයා හා සමාගමයට පැමිණීමෙන් ආජීවයෙන් හා ශීලයෙන් යහපත් වූ සාධුජීවී පුද්ගල තෙමේ ද සසර සයුරෙහි ගිලා බසී. එහෙයින් කුසීත වූ වීර්‍ය්‍ය නැති ඔහු දුරු කරන්නේ ය.

4. කායවිවෙකාදියෙන් ප්‍රකර්ෂවිවෙක ඇති, දුරු කරණ ලද කෙලෙස් ඇති නිවණ කරා මෙහෙයූ සිත් ඇති, වඩන ලද ධ්‍යාන ඇති, සැම කල්හි පටන්ගත් වීර්‍ය්‍ය ඇති නුවණැත්තන් හා එක් ව වසන්නේ ය."

මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 3. 10

### [ පරිහාන සුත්තං ]

79. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සං-වත්තන්ති. කතමෙ තයො? ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු කම්මාරාමො හොති කම්මරතො කම්මාරාමතමනුයුත්තො, භස්සාරාමො හොති භස්සරතො භස්සාරාමතමනුයුත්තො, නිද්දාරාමො හොති නිද්දාරතො නිද්දාරාමතමනු-යුත්තො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

තයො'මෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ තයො? ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු න කම්මාරාමො හොති න කම්මරතො න කම්මාරාමතමනුයුත්තො, න භස්සාරාමො හොති න භස්ස-රතො න භස්සාරාමතමනුයුත්තො, න නිද්දාරාමො හොති න නිද්දාරතො න නිද්දාරාමතමනුයුත්තො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කම්මාරාමො භස්සරතො නිද්දාරාමො ච උද්ධතො,
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

3. තස්මා හි අප්පකිච්චස්ස අප්පමිද්ධො අනුද්ධතො,
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**වග්ගො තතියො**

තස්සුද්දානං:

ද්වෙ දිට්ඨි නිස්සරණං රූපං පුත්තො අවුට්ඨිකෙන ච
සුඛා ච භින්දනා ධාතු පරිහානෙන තෙ දසා'ති.

## 3. 3. 10

### [ පරිහාණි සූත්‍රය ]

79. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලදී. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, මේ ධර්මයෝ තිදෙනෙක් ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පිරිහීම පිණිස පවතිත්. කවර තිදෙනෙක් ද යත්: මහණෙනි, මේ සසුන්හි සෙඛ මහණ තෙමේ කර්මාන්තයන්හි ඇලුනේ, කර්මාන්තයන්හි නිරත වූයේ කර්මාන්තාභිරතියෙහි යෙදුනේ, කථායෙහි ඇලුනේ, කථා මාර්ගයෙහි නිරත වූයේ කථාභිරතියෙහි යෙදුනේ, නිදීමෙහි ඇලුනේ, නිදීමෙහි නිරත වූයේ, නිද්‍රාභිරතියෙහි යෙදුනේ වේ ද, මහණෙනි, මේ ධර්මයෝ තිදෙන ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පිරිහීම පිණිස පවතිත්.

මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ නොපිරිහීම පිණිස පවත්නා මේ ධර්මයෝ තිදෙනෙක් වෙත්, කවර තිදෙනෙක්ද යත්: මහණෙනි, මේ සසුන්හි ශෛක්‍ෂ භික්‍ෂු තෙමේ කර්මාන්තයන්හි නො ඇලුනේ; කර්මාන්තයන්හි නිරත නො වූයේ, කර්මාන්තාභිරතියෙහි නො යෙදුනේ, කථායෙහි නො ඇලුනේ, කථායෙහි නිරත නො වූයේ, කථාභිරතියෙහි නො යෙදුනේ, නිදීමෙහි නො ඇලුනේ, නිදීමෙහි නිරත නො වූයේ, නිද්‍රාභිරතියෙහි නො යෙදුනේ වේ ද, මහණෙනි, මේ ධර්මයෝ තුන් දෙන ශෛක්‍ෂ භික්‍ෂුහුගේ නොපිරිහීම පිණිස පවතිත්.

මෙසේ මේ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ ද කියනු ලැබේ:

2. "කර්මාන්තයන්හි ඇලුනාවූ කථා මාර්ගයෙහි ඇලුනාවූ, නිද්‍රායෙහි ඇලුනාවූ, නොසංසුන් සිත් ඇති මේ බඳු මහණ තෙම, උතුම් අර්හත්ඵල සඞ්ඛ්‍යාත සම්‍යක් සම්බෝධිය ස්පර්ශ කරන්නට සුදුස්සෙක් නො වේ.

3. එහෙයින් අල්ප කෘත්‍ය ඇත්තෙක් ද, නිද්‍රා රහිතයෙක් ද, සංහුන් සිත් ඇත්තෙක් ද වන්නේය. එබඳු ඒ මහණ තෙමේ අර්හත්ඵල සඞ්ඛ්‍යාත සම්‍යක් සම්බෝධිය ස්පර්ශ කරන්නට සුදුස්සෙක් වන්නේ ය."

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි.

**තුන්වැනි වර්ගය යි.**

එහි උද්දානය:

දිට්ඨි දෙක, නිස්සරණ, රූප, අවුට්ඨික, සුඛ, භින්දන (භිදුර), ධාතුසංසන්දන, පරිහාණි සූත්‍රයෝ යි ඔහු දස දෙනෙක.

3. 4. 1

# චතුත්ථො වග්ගො

## [ විතක්කසුත්තං ]

80. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අකුසලවිතක්කා. කතමෙ තයො? අනවඤ්ඤත්ති-පටිසංයුත්තො විතක්කො, ලාභසක්කාරසිලොකපටිසංයුත්තො විතක්කො, පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො. ඉමෙ ඛො භික්ඛවෙ තයො අකුසල-විතක්කා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අනවඤ්ඤත්තිසංයුත්තො ලාභසක්කාරගාරවො,
සහනන්දී අමච්චෙහි ආරා සංයොජනක්ඛයා.

3. යො ච පුත්තපසුං හිත්වා විවාහෙ සඞ්ගහානි ච,
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තම"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

3. 4. 2.

## [ සක්කාරසුත්තං ]

81. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා අසක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන ච අසක්කාරෙන ච තදුභයෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

# සිවුවන වර්‍ගය

## 3. 4. 1.

### [ විතක්කසූත්‍රය ]

80. භාග්‍යවතුන් වහන්සේ] විසින් මෙය වදාරණ ලද්දේ ය. අතීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ අකුශල විතර්‍කයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: මෙරමාගෙන් අවඥා ලබනු නොකැමැති බව හා එක්ව යෙදුනු විතර්‍කය, ලාභ සත්කාර කීර්ති යන මොවුන් අරමුණු කිරීම් වශයෙන් ඇසුරු කළ විතර්‍කය, පරානුකම්පා ස්වරූප ගෙහසිතප්‍රේමය හා එක් ව යෙදුනු විතර්‍කය යන තිදෙන යි. මහණෙනි, මේ තිදෙනා අකුශල විතර්‍කයෝ වෙත්.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්‍ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "අනුන් විසින් තමහට අවඥා කිරීම නො කැමැත්තෙන් යුක්ත වූ, ලාභ සත්කාරයන් ගරු කොට ගත්තා වූ රාජාමාත්‍යාදීන් හා අනනුලොමික ගෘහිසංසර්‍ගයෙන් සතුටු වන (පුඟුල් තෙම) සංයොජනක්‍ෂය කෙරෙන් (හෙවත් රහත්බව කෙරෙන්) දුරෙහි වේ.

3. යමෙක් වනාහි අඹුදරුවන් හා සිවුපාවුන් ද ආවාහවිවාහයන් ද පරිජනසඞ්ග්‍රහයන් ද හැර දමා (සිටියේ) ද එබඳු වූ ඒ මහණ තෙමේ උතුම් සම්බොධිය ස්පර්‍ශ කරන්නට (රහත්බවට පැමිණීමට) සුදුසු ය."

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 4. 2.

### [ සත්කාරසූත්‍රය ]

81. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අතීත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සත්කාර හෙතුවෙන් මඩනා ලද, ක්‍ෂයට පැමිණෑ වූ කුසල් සිත් ඇති, ශරීර භෙදයෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවශ ව පතිත වන නරකයෙහි උපන්නාවූ සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. මහණෙනි, අසත්කාර හෙතුවෙන් මඩනාලද, ක්‍ෂයට පැමිණෑවූ කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවශ ව පතිත වන නරකයට පැමිණි සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. මහණෙනි, සත්කාර හෙතුවෙන් ද අසත්කාර හෙතුවෙන් ද යන ඒ දෙකින් ම මඩනා ලද ක්‍ෂපිත කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති, විවශ ව පතිත වන නරකයට පැමිණි සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ.

තං ඛො පනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි. අපි ච භික්ඛවෙ යදෙව මෙ සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමි:

'දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා අසක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන ච අසක්කාරෙන ච තදුභයෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යස්ස සක්කරියමානස්ස අසක්කාරෙන චූභයං,
සමාධි න විකම්පති අප්පමාදවිහාරිනො.

3. තං ඣායිනං සාතතිකං සුඛුමදිට්ඨිවිපස්සකං,
උපාදානක්ඛයාරාමං ආහු සප්පුරිසො ඉති"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 4. 3.

### [ දෙවසද්දසුත්තං ]

82. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ දෙවෙසු දෙවසද්දා නිච්ඡරන්ති සමයා සමයං උපාදාය. කතමෙ තයො?

යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය චෙතෙති. තස්මිං සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති 'එසො අරියසාවකො මාරෙන සද්ධිං සඞ්ගාමාය චෙතෙතී'ති. අයං භික්ඛවෙ පඨමො දෙවෙසු දෙවසද්දො නිච්ඡරති සමයා සමයං උපාදාය.

මහණෙනි, ඒ කාරණය වූ කලී මම අන් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ අතින් අසා නො කියමි. වැලි මා විසින් යමක් ස්වයංඥාත ද (තමා විසින් දක්නා ලද ද) ස්වයංදෘෂ්ට ද (තමා විසින් දක්නා ලද ද) ස්වයං විදිත ද (තමා විසින් ප්‍රකට කොට දන්නා ලද ද) එය ම මම කියමි:

'මහණෙනි, සත්කාර හෙතුවෙන් මඩනා ලද ක්‍ෂයයට පැමිණෑවූ කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති, විවස ව පතිත වන නරකයට පැමිණි සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. මහණෙනි, අසත්කාර හෙතුවෙන් මඩනා ලද, ක්‍ෂෙපිත කුසල් සිතැති, කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ, නපුරු ගති ඇති, විවස ව පතිත වන නරකයට පැමිණි සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ. මහණෙනි, සත්කාර හෙතුවෙන් ද අසත්කාර හෙතුවෙන් ද යන එ දෙකින් ම මඩනා ලද, ක්‍ෂෙපිත කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ, නපුරු ගති ඇති, විවස ව පතිත වන නරකයට පැමිණි සත්ත්වයෝ මා විසින් දක්නා ලදහ' යනු යි.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සත්කාර කරණු ලබන්නාවූ ද, අසත්කාරයෙන් නොතකා හරිණු ලබන්නා වූ ද අප්‍රමාද විහරණ ඇති යම් රහතකුගේ චිත්ත සමාධිය ඒ සත්කාර අසත්කාර දෙකින් ම නොසැලේ ද,

3. ධ්‍යාන කරණ සුලුවූ, සතතයෙන් පැවැති වීර්‍ය්‍ය ඇති, පලසමවත්හි සියුම් ප්‍රඥාවෙන් නිතර පැවැති විදසුන් ඇති, චතුරුපාදානයන්ගේ ක්‍ෂයය (අවසානය) වූ රහත්පලය ආරාම කොටැති උන්වහන්සේ සත්පුරුෂයා යැ යි කියත්."

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 4. 3.

### [ දෙවශබ්දසුත්‍රය ]

82. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, දෙවියන් අතුරෙ මේ දිව්‍යශබ්දයෝ තිදෙනෙක් කලින් කල ඔවුනොවුන්ගේ කථාසංලාප වශයෙන් පවතිත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, යම් කලෙක ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම කෙහෙ රැවුලු බහවා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්මැ සසුන් වදනා පිණිස සිතා ද, එ කලැ "මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙම මරහු සමඟ යුද පිණිස සිතා යැ" යි දෙවියන් අතුරෙ දිව්‍යශබ්දයෙක් පවතියි. මහණෙනි, කලින් කල දෙවියන් අතුරෙ මේ පළමු වන දිව්‍යමය ප්‍රීතිරවය පවතී.

පුන ච පරං භික්ඛවෙ යස්මිං සමයෙ අරියසාවකො සත්තන්නං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො විහරති. තස්මිං භික්ඛවෙ සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති 'එසො අරියසාවකො මාරෙන සද්ධිං සඞ්ගාමෙතී'ති. අයං භික්ඛවෙ දුතියො දෙවෙසු දෙවසද්දො නිච්ඡරති සමයා සමයං උපාදාය.

පුන ච පරං භික්ඛවෙ යස්මිං සමයෙ අරියසාවකො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤාය සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. තස්මිං භික්ඛවෙ සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති "එසො අරියසාවකො විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අභිවිජිය අජ්ඣාවසතී"ති. අයං භික්ඛවෙ තතියො දෙවෙසු දෙවසද්දො නිච්ඡරති සමයා සමයං උපාදාය.

ඉමෙ ඛො භික්ඛවෙ තයො දෙවෙසු දෙවසද්දා නිච්ඡරන්ති සමයා සමයං උපාදායා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "දිස්වා විජිතසඞ්ගාමං සම්මාසම්බුද්ධසාවකං,
දෙවතා'පි නමස්සන්ති මහන්තං වීතසාරදං.

3. නමො තෙ පුරිසාජඤ්ඤ, යො ත්වං දුජ්ජයමජ්ඣගා,[1]
ජෙත්වාන මච්චුනො සෙනං විමොක්ඛෙන අනාවරං.

4. ඉති හෙතං නමස්සන්ති දෙවතා පත්තමානසං,
තඤ්හි තස්ස න පස්සන්ති යෙන මච්චුවසං වජෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 3. 4. 4.

## [ පුබ්බනිමිත්තසුත්තං ]

83. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යදා භික්ඛවෙ දෙවො දෙවකායා චවනධම්මො හොති, පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති: මාලා මිලායන්ති, වත්ථානි කිලිස්සන්ති, කච්ඡෙහි සෙදා මුච්චන්ති, කායෙ දුබ්බණ්ණියං ඔක්කමති, සකෙ දෙවො දෙවාසනෙ නාභිරමතී'ති.

1 මජ්ඣගූ - සී. 2. අජ්ජගූ - සීමුඅ.

තව ද මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවක තෙම (කොටස් වශයෙන්) සතක් වූ බොධිපාක්‍ෂික ධර්මයන් පිළිබඳ භාවනායෙහි යෙදුනේ වාසය කෙරේ ද, මහණෙනි, එ කලැ "මේ ආර්‍යශ්‍රාවක තෙම මරහු හා යුද්ද කෙරේ යැ" යි දෙවියන් අතරැ දිව්‍යමය ප්‍රීතිශබ්දයෙක් පවතී. මහණෙනි, කලින් කලැ දෙවියන් අතරැ මේ දෙවෙනි දිව්‍යශබ්දය පවතී.

තව ද මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවක තෙම ආස්‍රවයන්ගේ ක්‍ෂයයෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵලසමාධිය හා ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාසය කෙරේ ද, මහණෙනි, එකලැ "මේ ආර්‍යශ්‍රාවක තෙමේ දිනූ යුද ඇත්තේ එ ම සංග්‍රාම-ශීර්ෂය දිනා වෙසේ යැ" යි දෙවියන් අතර දිව්‍යමය ශබ්දයෙක් පවතියි. මහණෙනි, කලින් කලැ දෙවියන් අතරැ මේ තෙවෙනි දිව්‍යශබ්දය පවතී.

මහණෙනි, කලින් කලැ දෙවියන් අතරැ මේ දිව්‍යශබ්දයෝ තිදෙන පවත්නාහ.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "දිනන ලද සංග්‍රාම ඇති ශීලාදි ගුණමහත්ත්වයෙන් මහත් වූ, පහ වූ බිය ඇති සම්‍යක්සම්බුද්ධශ්‍රාවකයා දැක දෙවියෝ ද මෙසේ නමසකාර කෙරෙත්.

3. යම් බඳු නුඹ වහන්සේ අන්‍යයන් විසින් වළකා ලිය නොහැක්කා වූ මරසෙනඟ ආර්‍යමාර්ගයෙන් දිනා, දිනීමට දුෂ්කර වූ මරසෙනඟ මැඬලූ සේක් ද, පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඒ නුඹ වහන්සේට නමසකාර වේවා.

4. උක්තප්‍රකාරයෙන් පැමිණි අර්හත්වය ඇති මේ ක්‍ෂීණාස්‍රවයාට දෙවතාවෝ නමසකාර කෙරෙත්. යම් හෙයෙකින් හෙතෙම මරහු වසයට පැමිණිය හෙන්නේ ද, ඒ පුරුෂොත්තමයා පිළිබඳ එබඳු කාරණයක් දෙවියෝ නො දනිත්".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 4. 4.

## [ පූර්වනිමිත්තසූත්‍රය ]

83. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් කලෙක දෙවියෙක් දෙව්ලොවින් චුතවන ස්වභාව ඇත්තේ (එළැඹ සිටි මරණය ඇත්තේ) වේ ද, ඔහුට පෙරනිමිති පසෙක් පහළ වෙයි. එනම්: පැළැඳි මල් මැලැවෙයි. හැඳි වත් කිලිටි වෙයි. කිසිලිවලින් ඩහදිය වැගිරෙයි. සිරුරෙහි දුර්වර්ණ බව ඇති වෙයි. ඒ දෙවි තෙම ස්වකීය දිව්‍යාසනයෙහි නො ඇලෙයි (යන මේ පස යි.)

තමෙනං භික්ඛවෙ දෙවා ‘චවනධම්මො අයං දෙවපුත්තො’ති ඉති විදිත්වා තීහි වාචාහි අනුමොදන්ති: “ඉතො භො සුගතිං ගච්ඡ. සුගතිං ගන්ත්වා සුලද්ධ-ලාභං ලභ. සුලද්ධලාභං ලභිත්වා සුප්පතිට්ඨිතො භවාහීති”.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: “කිං නු ඛො භන්තෙ දෙවානං සුගතිගමනසඞ්ඛාතං, කිඤ්ච භන්තෙ දෙවානං සුලද්ධලාභ-සඞ්ඛාතං, කිම්පන භන්තෙ දෙවානං සුප්පතිට්ඨිතසඞ්ඛාතන්ති?”.

“මනුස්සත්තං ඛො භික්ඛු දෙවානං සුගතිගමනසඞ්ඛාතං. යං මනුස්සභූතො සමානො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං පටිලභති, ඉදං ඛො පන භික්ඛවෙ දෙවානං සුලද්ධලාභසඞ්ඛාතං. සා ඛො පනස්ස සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා දළ්හා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙන චි වා ලොකස්මිං. ඉදං ඛො භික්ඛවෙ දෙවානං සුප්පතිට්ඨිතසඞ්ඛාතන්ති”.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. “යදා දෙවො දෙවකායා චවති ආයුසඞ්ඛයා,
තයො සද්දා නිච්ඡරන්ති දෙවානං අනුමොදතං:

3. ‘ඉතො භො සුගතිං ගච්ඡ මනුස්සානං සහව්‍යතං,
මනුස්සභූතො සද්ධම්මෙ ලභ සද්ධං අනුත්තරං.

4. සා තෙ සද්ධා නිවිට්ඨස්ස මූලජාතා පතිට්ඨිතා,
යාවජීවං අසංහීරා සද්ධම්මෙ සුප්පවෙදිතෙ.

5. කායදුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච,
මනොදුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං.

6. කායෙන කුසලං කත්වා වාචාය කුසලං බහුං,
මනසා කුසලං කත්වා අප්පමාණං නිරූපධිං.

7. තතො ඔපධිකං පුඤ්ඤං කත්වා දානෙන තං බහුං,
අඤ්ඤෙ’පි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසය.[1]

8. ඉමාය අනුකම්පාය දෙවා දෙවං යදා විදූ,
චවන්තං අනුමොදන්ති එහි දෙව පුනප්පුනන්ති.”

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

1. නිවෙසයෙ. සී.

මහණෙනි, දෙවියෝ "මේ දෙව්පුත් තෙම එළඹ සිටි මරණය ඇත්තේ යැ" යි මෙසේ දැන වචන තුනෙකින් ඒ දෙව්පුතු අස්වසත්: "පින්වත, මේ දෙව්ලොවින් චුත ව සුගතියට යව. සුගතියට ගොස් මනාකොට ලැබූ ලාභය ලබව. සුලද්ධලාභය ලැබ සුප්පතිට්ඨිත වව" (යන මේ තුන් වචනයෙනි).

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, දෙවියන්ගේ සුගතිගමන ය යි කියන ලද්දේ කුමක් ද? ස්වාමීනි, දෙවියන්ගේ සුලද්ධලාභය නම් කිමෙක් ද? ස්වාමීනි, දෙවියන්ගේ මනාකොට පිහිටීම යැ යි කියන ලද්දේ කුමක් ද? යි" මෙ බස් කීය.

මහණ, "මිනිසත්බව වනාහි දෙවියන්ගේ සුගතිගමනයැ යි කියන ලදී. මිනිසෙක් වූයේ ම බුදුන් විසින් වදාළ ධර්මවිනයයෙහි යම් සැදැහැයක් ලබා ද, මහණෙනි, මේය වනාහි දෙවියන්ගේ සුලද්ධලාභ ය යි කියන ලදී. එම සැදැහැය වූ කලී මොහුගේ සිත තුළට පිවිසියේ හටගත් මුල් ඇත්තේ පිහිටියේ ස්ථිර වූයේ, ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහමණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බ්‍රහමයකු විසින් හෝ ලොකයෙහි අන් කිසිවකු විසින් හෝ ඉවත ලිය නොහැක්කේ වෙයි. මහණෙනි, මේ වනාහි දෙවියන්ගේ සුප්පතිට්ඨිත" යැ යි වදාරණ ලදී.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "දෙවියෙක් තෙම ආයු ගෙවී යැමෙන් යම් කලෙක දෙව්ලොවින් චුත වේ ද, එකල ඔහු අස්වසන දෙවියන්ගේ ශබ්දයෝ තිදෙනෙක් නික්මෙත්:

3. 'පින්වත, මේ දෙව්ලොවින් චුතව මනුෂ්‍යයන්ගේ සහභාවය වූ සුගතියට යව. මිනිස් වූයේ සද්ධර්මයෙහි නිරුත්තර වූ ශ්‍රද්ධාව ලබව.

4. මොනොවට ප්‍රකාශ කරණ ලද සද්ධර්මයෙහි නුඹගේ ඒ සැදැහැය සිතට ඇතුළු වූයේ හටගත් මුල් ඇත්තේ පිහිටියේ, දිවි ඇතිතෙක් කිසිවකු විසිනුත් බැහැර ලිය නොහැකි ද වෙයි.

5. කායදුශ්චරිතය ද වාග්දුශ්චරිතය ද මනොදුශ්චරිතය ද හැරලා දොෂසංහිත වූ වෙනත් අකුසල් ද හැරලා,

6. කයින් අප්‍රමාණ වූ උපධිරහිත වූ නොහොත් නිර්මල වූ කුසල් කොට වචනයෙන් බොහෝ කුසල් කොට සිතින් කුසල් කොට,

7. ඉක්බිති දානයෙන් උපධිසම්පත් ඇති කරන්නා වූ ඒ ඒ පින් බහුල වශයෙන් කොට අන්‍ය වූ ද මිනිසුන් ධර්මයෙහි ද බඹසරෙහි ද පිහිටුවු වව.'

8. දෙවියෝ යම් කලෙක චුතවන්නාවූ දෙවියකු දකිත් නම් එකලැ මෙම අනුකම්පාවෙන් කියන ලද පරිදි දුක් පහකරණු කැමැත්තෙන් 'දෙවිය' නැවත නැවත මෙහි එව'යි සතුටු කරවත්".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

3. 4. 5.

## [ බහුජනහිතසුත්තං ]

84. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ [භික්ඛවෙ[1]] පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙ තයො?

ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. අයං භික්ඛවෙ පඨමො පුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

පුන ච පරං භික්ඛවෙ තස්සෙව සත්ථුසාවකො අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. අයං භික්ඛවෙ දුතියො පුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

පුන ච පරං භික්ඛවෙ තස්සෙව සත්ථුසාවකො සෙඛො හොති පාටිපදො බහුස්සුතො සීලවතූපපන්නො. සො'පි ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. අයං භික්ඛවෙ තතියො පුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

1 භික්ඛවෙ'ති පොත්ථකෙසු නාදිස්සති.

3. 4. 5

[ බහුජනහිත සූත්‍රය ]

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙනෙක් ලොවැ උපදනාහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපදිත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ (අෂ්ට) විද්‍යා (පසළොස්) චරණ-ධර්මයන්ගෙන් යුක්ත වූ (සුන්දරස්ථානයට පැමිණි හෙයින්) සුගත වූ ලෝකයන් දන්නා සුළු වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිසුන්ගේ ශාස්තෘ වූ චතුස්සත්‍යාවබෝධය කළා වූ භාග්‍යවත් වූ තථාගත තෙමේ මේ ලොකයෙහි උපදී. උන්වහන්සේ මුල යහපත් කොට මැද යහපත් කොට අග යහපත් කොට අර්ථයෙන් යුක්ත කොට ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත කොට සියල්ලෙන් සම්පූර්ණ කොට පිරිසිදු වූ ධර්මයක් දෙශනා කරණ සේක. මහණෙනි, මේ පළමුවන පුද්ගල තෙමේ ලොවැ උපදිනුයේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපදී.

තව ද, මහණෙනි, ඒ ශාස්තෲන් වහන්සේගේ ම ශ්‍රාවක තෙමේ ක්‍ෂය කරණලද ආස්‍රව ඇත්තේ, වැස නිමවූ මගබඹසර ඇත්තේ, කොට නිමවන ලද සිවුමග කිස ඇත්තේ, බහා තබනලද කෙලෙස්බර ඇත්තේ, පැමිණි අර්හත්වය ඇත්තේ, ප්‍රහීණ වූ භවසංයොජන ඇත්තේ, මනා කොට විශිෂ්ටඥානයෙන් දැන මිදුනේ රහත් වේ ද, හෙ තෙමේ ද මුල යහපත් කොට මැද යහපත් කොට අග යහපත් කොට අර්ථයෙන් යුක්ත කොට ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත කොට සියල්ලෙන් සම්පූර්ණ කොට පිරිසිදු වූ ධර්මයක් දෙශනා කරණ සේක. මහණෙනි, මේ දෙවෙනි පුද්ගල තෙමේ ලොවැ උපදිනුයේ, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපදී.

තව ද මහණෙනි, ඒ ශාස්තෲන් වහන්සේගේ ම ශ්‍රාවක තෙමේ ශෛක්‍ෂ-ප්‍රතිපත්ති ඇත්තේ බහුශ්‍රැත වූයේ ප්‍රාතිමොක්‍ෂසංවරාදි ශීලයෙන් හා ආරඤ්ඤිකාදි ධුතාඞ්ගයන්ගෙන් යුක්ත වූයේ ශෛක්‍ෂ පුද්ගලයෙක් වේ ද, හෙ තෙමේත් මුල යහපත් කොට මැද යහපත් කොට අග යහපත් කොට අර්ථයෙන් යුක්ත කොට ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත කොට සියල්ලෙන් සම්පූර්ණ කොට පිරිසිදු වූ ධර්මයක් දෙශනා කරයි. මහණෙනි, මේ තෙවෙනි පුද්ගල තෙමේ ලොවැ උපදිනුයේ, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපදී.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සත්ථා හි ලොකෙ පඨමො මහෙසි තස්සන්වයො සාවකො භාවිතත්තො,
අථාපරො පාටිපදො'පි සෙඛො බහුස්සුතො සීලවතූපපන්නො.

3. එතෙ තයො දෙවමනුස්සසෙට්ඨා පභඞ්කරා ධම්මමුදීරයන්තා,
අපාපුරන්ති අමතස්ස ද්වාරං යොගා පමොචෙන්ති බහුජ්ජනෙ තෙ.

4. යෙ සත්ථවාහෙන අනුත්තරෙන සුදෙසිතං මග්ගමනුක්කමන්ති,
ඉධෙව දුක්ඛස්ස කරොන්ති අන්තං යෙ අප්පමත්තා සුගතස්ස
සාසනෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 4. 6.

## [ අසුභානුපස්සීසුත්තං ]

85. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. අසුභානුපස්සී භික්ඛවෙ කායස්මිං විහරථ. ආනාපානසති ච වො අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතා හොතු. සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සිනො විහරථ. අසුභානුපස්සීනං භික්ඛවෙ කායස්මිං විහරතං යො සුභාය ධාතුයා රාගානුසයො සො පහීයති. ආනාපානසතියා අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතාය යෙ බාහිරා විතක්කාසයා විඝාතපක්ඛිකා තෙ න හොන්ති. සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සීනං විහරතං යා අවිජ්ජා සා පහීයති. යා විජ්ජා සා උප්පජ්ජතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අසුභානුපස්සී කායස්මිං ආනාපානෙ පතිස්සතො,
සබ්බසඞ්ඛාරසමථං පස්සං ආතාපි සබ්බදා

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ලෝකයෙහි මහර්ෂි වූ ශාස්තෲන් වහන්සේ (ප්‍රථම පුද්ගලයා යි) උන්වහන්සේගේ අනුජාත වූ වඩනා ලද ශීල සමාධි ප්‍රඥ ඇති ශ්‍රාවකයා රහත් පුගුලා (දෙවෙනි පුද්ගලයා)යි. නැවත අන්‍ය වූ නොනිමි පිළිවෙත් කිස ඇති බහුශ්‍රැත වූ ශීලයෙන් හා ධුතාඞ්ගයන්ගෙන් යුක්ත වූ ශෛක්‍ෂපුද්ගල තෙමේ (තෙවැන්නා)යි.

3. මේ තිදෙනා දෙව්මිනිසුන් අතුරෙ ශ්‍රෙෂ්ඨයහ. ධර්මාලෝකය කරණ හෙයින් ප්‍රභාකරයහ. සිවුසස් දම් දෙසන හෙයින් ධර්මදෙශකයහ. ඔවුහු නිවන්දොර (ආර්‍යමාර්ගය) විවෘත කරත්. කාමාදි චතුර්යොගයෙන් බොහෝ ජනයා මුදත්.

4. යම් කෙනෙක් තුමූ නිරුත්තර වූ සාර්ථවාහකයාණන් (බුදුරදුන්) විසින් මොනොවට දෙසන ලද ආර්‍යමාර්ගය අනුව යෙත් ද, යම් කෙනෙක් තුමූ බුදුසසුන්හි අප්‍රමාද වූවාහු ද (ඔවුහු) මේ අත්බව්හි ම දුක් කෙළවර කරත්".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 4. 6.

## [ අශුභානුදර්ශි සූත්‍රය ]

85. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, කයෙහි අශුභාකාරය අනුව දක්නෝ ව වසවු. ආනාපාන-සතිය ද තොපගේ ගොචරාධ්‍යාත්මයට අභිමුඛ කොට මොනොවට එළැඹ සිටියේ වේවා. සියලු සංස්කාරයන්හි අනිත්‍යලකුණ අනුව දක්නා සුලු වැ වසවු. මහණෙනි, කයෙහි අශුභය අනුව දක්නා සුලු වැ වසන්නහුට ශුභ අරමුණෙහි යම් කාමරාගානුශයයෙක් වේ නම් එය ප්‍රහීණ වෙයි. ගොචරා-ධ්‍යාත්මයට අභිමුඛ ව (අධ්‍යාත්ම අරමුණට යොමු වැ) ආනාපානසතිය මොනොවට එළැඹ සිටි කල්හි දුඃඛපක්‍ෂයෙහි වූ යම් බාහිර විතර්කාශය (අප්‍රහීණ වූ ආශයානුගත වූ කාමවිතර්කාදි) කෙනෙක් වෙත් නම්, ඔහු නො වෙත්. සියලු සංස්කාරයන්හි අනිත් ලකුණ අනුව දක්නා සුලු ව වසන්නවුන්හට යම් අවිද්‍යාවෙක් වේ ද, එය පහ වෙයි. යම් විද්‍යාවෙක් (රහත්මගනුවණෙක්) වේ ද, එය උපදී.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "කයෙහි අශුභය අනුව දක්නා සුලු වූ, ආනාපානනිමිත්තෙහි එළඹැ සිටි සිහි ඇති, සියලු සංස්කාරයන්ගේ සංසිඳීම (නිවණ) දක්නා, හැම කල්හි අසුභානුපස්සනාදීන්හි යුක්තප්‍රයුක්ත (වෑයම් කරන්නා) වූ,

3. ස වෙ සම්මද්දසො භික්ඛු යතො තත්‍ථ විමුච්චති,
අභිඤ්ඤාවොසිතො සන්තො ස වෙ යොගාතිගො මුනී"ති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 4. 7.

## [ ධම්මානුධම්මපටිපන්නසුත්තං ]

86. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ධම්මානුධම්මපටිපන්නස්ස භික්ඛුනො අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය ධම්මානුධම්මපටිපන්නො'යන්ති. භාසමානො ධම්මඤ්ඤෙව භාසති නො අධම්මං. විතක්කයමානො වා ධම්මවිතක්කඤ්ඤෙව විතක්කෙති නො අධම්මවිතක්කං. තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො'ති.

එතමත්‍ථං භගවා අවොච. තත්‍ථෙතං ඉති වුච්චති:

2. "ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති.

3. චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං,
අජ්ඣත්තං සමයං චිත්තං සන්තිමෙවාධිගච්ඡතී"ති.

අයම්පි අත්‍ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

3. දුක් ඇ විසින් දහමුත් ඇති සැටියෙන් දක්නා ඒ මහණ තෙම එකාන්තයෙන් ඒ නිවන් අරමුණෙහි රහත්පල විමුක්තියෙන් එකාන්තයෙන් මිදෙයි. (ආස්‍රවක්‍ෂයකරඥාන සඞ්ඛ්‍යාත) අභිඥායෙන් අවසන් කළ (සත්‍ය-ප්‍රතිවේධය සම්බන්ධ) ඥාන්‍ය ඇති, ඒ මුනි තෙමේ එකාන්තයෙන් (කාමයෝගාදි සියලු) යෝගයන් ඉක්මවූයේ වේ".

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

## 3. 4. 7.

## [ ධර්මානුධර්මප්‍රතිපන්න සූත්‍රය ]

86. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. ධර්මානුධර්මප්‍රතිපන්න (නව ලොවුතුරු දහම් ලබනු සඳහා පූර්වභාග ප්‍රතිපත්තිධර්මය පිළිපන්) මහණහට මේ තෙමේ ධර්මානුධර්මප්‍රතිපන්නයැ යි කියනුවට[1] මේ යෝග්‍ය වූ සවභාවයෙක් වෙයි. හෙ තෙම කියනුයේ දශ කථාවස්තුධර්මය ම කියයි. (මහිච්ඡතාදිය වඩා ලන) අධර්ම කථාවක් නො කියයි. කල්පනා කරණුයේ ද (නෙක්ඛම්මවිතක්කාදි) ධර්මවිතර්කයක් ම කල්පනා කෙරෙයි. (කාමවිතර්කාදි) අධර්මවිතර්කයක් කල්පනා නො කෙරෙයි. ඒ දෙක ම හැර එහි උපෙක්‍ෂක වැ වෙසේ නම්, (කමටහන් වඩනුයේ) සිහි ඇති වැ නුවණ ඇති ව වෙසෙයි.

මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ධර්මය ආරාම කොට ඇති (ශමථවිදර්ශනා වැඩීමෙහි ලැගුනු) ධර්මයෙහි ඇලුනු, ඒ ධර්මය ම පුනපුනා සිතන, එය මතුමත්තෙහිත් වැඩීම් විසින් අනුස්මරණය කරණ මහණ තෙමේ (සත්තිස් බෝපැකිදහම් ද නවලොවුතුරු දහම් ද යන) සදහම කෙරෙන් නො පිරිහේ.

3. ඒ මහණ තෙම යන්නේ හෝ සිටිනුයේ හෝ හුන්නේ හෝ නැත-හොත් වැද හෝනේ හෝ අධ්‍යාත්මයෙහි (හෙවත් අධ්‍යාත්මාලම්බනයෙහි) කෙලෙස් සංසිඳුවීම් විසින් සිත සංසිඳුවනුයේ අත්‍යන්තශාන්තිය ම (නිවණ ම) ලබයි".

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

---

1. අටුවාවට අනුව: "යම් අනුකූල ධර්මයෙකින් හේ ධර්මානුධර්මප්‍රතිපන්න යැ යි කියන්නේ නම්"

3. 4. 8.

## [ අන්ධකරණසුත්තං ]

87. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අකුසලවිතක්කා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධිකා විඝාතපක්ඛිකා අනිබ්බානසංවත්තනිකා. කතමෙ තයො?

කාමවිතක්කො භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො. ව්‍යාපාදවිතක්කො භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො. විහිංසාවිතක්කො භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො.

ඉමෙ ඛො භික්ඛවෙ තයො අකුසලවිතක්කා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධිකා විඝාතපක්ඛිකා අනිබ්බානසංවත්තනිකා.

තයො'මෙ භික්ඛවෙ කුසලවිතක්කා අනන්ධකරණා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධිකා අවිඝාතපක්ඛිකා නිබ්බානසංවත්තනිකා. කතමෙ තයො?

නෙක්ඛම්මවිතක්කො භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො. අව්‍යාපාදවිතක්කො භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො. අවිහිංසාවිතක්කො භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො.

ඉමෙ ඛො භික්ඛවෙ තයො කුසලවිතක්කා අනන්ධකරණා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධිකා අවිඝාතපක්ඛිකා නිබ්බානසංවත්තනිකා'ති.

## 3. 4. 8.

### [ අන්ධකරණ සූත්‍රය ]

87. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, (යථාභූත දර්ශනය වැළැක්වීමෙන්) අන්ධයකු කරන්නාවූ නුවණැස නැති කරන්නාවූ, අඥානයකු කරන්නාවූ, ත්‍රිවිධප්‍රඥාවන්ගේ නිරොධය කරන්නාවූ, දුඃඛපක්ෂයෙහි වූ (කෙලෙස්) නිවනු පිණිස නොපවත්නාවූ මේ අකුශල විතර්කයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, අන්ධයකු කරන්නාවූ, නුවණැස නැති කරන්නාවූ, අඥානයකු කරන්නාවූ, ත්‍රිවිධ ප්‍රඥාවන්ගේ නිරෝධය කරන්නාවූ, දුඃඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස නොපවත්නාවූ කාමප්‍රතිසංයුක්ත විතර්කය; මහණෙනි, අන්ධයකු කරන්නාවූ, නුවණැස නැති කරන්නාවූ, අඥානයකු කරන්නාවූ, ත්‍රිවිධ ප්‍රඥාවන්ගේ නිරෝධය කරන්නාවූ, දුඃඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස නොපවත්නාවූ ව්‍යාපාදප්‍රතිසංයුක්ත විතර්කය; අන්ධයකු කරන්නාවූ, නුවණැස නැති කරන්නාවූ, අඥානයකු කරන්නාවූ, ත්‍රිවිධ ප්‍රඥාවන්ගේ නිරෝධය කරන්නාවූ, දුඃඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස නොපවත්-නාවූ විහිංසාප්‍රතිසංයුක්ත විතර්කය යන මේ තිදෙනා ය.

මහණෙනි, මේ අන්ධයකු කරන්නා වූ, නුවණැස නැති කරන්නා වූ, අඥානයකු කරන්නාවූ, ත්‍රිවිධප්‍රඥාවන්ගේ නිරෝධය කරන්නාවූ, දුඃඛපක්ෂයෙහි වූ (කෙලෙස්) නිවනු පිණිස නොපවත්නාවූ මේ තුන් අකුශල විතර්කයෝ වෙත්.

මහණෙනි, අන්ධ නොකරන්නාවූ, නුවණැස ඇති කරන්නාවූ, ඥානීම කරන්නාවූ, ත්‍රිවිධප්‍රඥාවන්ගේ වැඩීම කරන්නාවූ, සුඛපක්ෂයෙහි වූ (කෙලෙස්) නිවනු පිණිස පවත්නාවූ මේ කුශලවිතර්කයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, අන්ධ නොකරන්නාවූ, නුවණැස ඇති කරන්නාවූ, ඥානීම කරන්නාවූ, ත්‍රිවිධප්‍රඥාවන්ගේ වැඩීම කරන්නාවූ, සුඛපක්ෂයෙහි වූ (කෙලෙස්) නිවනු පිණිස පවත්නාවූ, නෙක්ඛම්මපටිසංයුත්ත විතර්කය; අන්ධ නොකරන්නා වූ, නුවණැස ඇති කරන්නාවූ, ඥානීම කරන්නාවූ, ත්‍රිවිධප්‍රඥාවන්ගේ වැඩීම කරන්නාවූ, සුඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස පවත්නාවූ අව්‍යාපාද විතර්කය; අන්ධ නොකරන්නාවූ, නුවණැස ඇති කරන්නාවූ, ඥානීම කරන්නාවූ ත්‍රිවිධප්‍රඥාවන්ගේ වැඩීම කරන්නා වූ, සුඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස පවත්නාවූ අවිහිංසා විතර්කය යන මේ තිදෙනා ය.

මහණෙනි, මේ අන්ධ නොකරන්නාවූ, නුවණැස ඇති කරන්නාවූ, ඥානීම කරන්නාවූ, ත්‍රිවිධ ප්‍රඥාවන්ගේ වැඩීම කරන්නාවූ, සුඛපක්ෂයෙහි වූ, (කෙලෙස්) නිවනු පිණිස පවත්නාවූ මේ තුන් කුශල විතර්කයෝ වෙත්.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "තයො විතක්කෙ කුසලෙ විතක්කයෙ
තයො පන අකුසලෙ නිරාකරෙ,
ස වෙ විතක්කානි විචාරිතානි
සමෙති වුට්ඨීව රජං සමූහතං,
ස වෙ විතක්කූපසමෙන චෙතසා
ඉධෙව සො සන්තිපදං සමජ්ඣගා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 3. 4. 9.

## [ අන්තරාමලසුත්තං ]

88. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අන්තරාමලා අන්තරාඅමිත්තා අන්තරාසපත්තා අන්තරාවධකා අන්තරාපච්චත්ථිකා. කතමෙ තයො?

ලොභො භික්ඛවෙ අන්තරාමලො අන්තරාඅමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. දොසො භික්ඛවෙ අන්තරාමලො අන්තරාඅමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. මොහො භික්ඛවෙ අන්තරාමලො අන්තරාඅමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො.

ඉමෙ ඛො භික්ඛවෙ තයො අන්තරාමලා අන්තරාඅමිත්තා අන්තරා-සපත්තා අන්තරාවධකා අන්තරාපච්චත්ථිකා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

3. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං ලොභො සහතෙ නරං.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ත්‍රිවිධ කුශල විතර්කයන් මෙනෙහි කරන්නේ ය. ත්‍රිවිධ අකුශල විතර්කයන් බැහැර කරන්නේ ය. වැසි දිය පොළොවෙහි හාත්පසින් නැඟුනාවූ දූවිල්ල සංසිඳුවන්නා සේ ඒ යොගාවචර තෙමේ ඒකාන්තයෙන් මිථ්‍යා-විතර්කයන් ද ඒ හා යෙදුන විචාරයන් ද සංසිඳුවයි. හෙ තෙම විතර්කයන් සංසිඳුවන්නාවූ ආර්‍යමාර්ග චිත්තයෙන් ඉහාත්මයෙහි ම නිවණට මැනැවින් පැමිණියේ වෙයි".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 4. 9.

## [ අන්තරමල සූත්‍රය ]

88. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සිතෙහි හටගත් මලයෝ (කෙලෙස්) වූ සිතෙහි උපන් අමිත්‍රයෝ වූ සිතෙහි හටගත් සතුරෝ වූ සිතෙහි හටගත් වධකයෝ වූ සිතෙහි උපන් පසමිතුරෝ වූ මේ ධර්මයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, ලෝභය තෙම සිතෙහි හටගත් මලයෙකි. (කිලුටෙකි). සිතෙහි උපන් අමිත්‍රයෙකි. සිතෙහි උපන් සතුරෙකි. සිතෙහි උපන් වධකයෙකි. සිතෙහි උපන් පසමිතුරෙකි. මහණෙනි, ද්වේෂය තෙම සිතෙහි හටගත් කිලුටෙකි. සිතෙහි උපන් අමිත්‍රයෙකි. සිතෙහි උපන් සතුරෙකි. සිතෙහි උපන් වධකයෙකි. සිතෙහි උපන් පසමිතුරෙකි. මහණෙනි, මෝහය තෙම සිතෙහි හටගත් කිලුටෙකි. සිතෙහි උපන් අමිත්‍රයෙකි. සිතෙහි උපන් සතුරෙකි. සිතෙහි උපන් වධකයෙකි. සිතෙහි උපන් පසමිතුරෙකි.

මහණෙනි, මේ තිදෙනා සිතෙහි හටගත් මලයෝ, සිතෙහි උපන් අමිත්‍රයෝ, සිතෙහි උපන් සතුරෝ, සිතෙහි උපන් වධකයෝ, සිතෙහි උපන් පසමිතුරෝ වෙත්.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "ලෝභය තෙම අවැඩ ඇති කරන්නේ ය. ලෝභය තෙම සිත ප්‍රකුපිත කරන්නේ ය. තමාගේ සිත තුළ උපන්නාවූ ඒ ලෝභය තෙම බියට හෙතු යැයි අඥබාල ජන තෙමේ නො දනී.

3. ලෝභයෙන් මඩනා ලද පුද්ගල තෙමේ (ස්වාර්ථපරාර්ථාදි) අර්ථය නො දනී. ලුබ්ධ පුද්ගල තෙමේ (දශකුශලකර්මපථ) ධර්මය නො දනී. යම් කලෙක ලෝභය තෙම මිනිසකු මැඩ පවත්වා ද, එ කල්හි ඔහට මහා සන්ධකාරය වෙයි.

4. යො ච ලොභං පහත්වාන ලොභනෙය්‍යෙ න ලුබ්භති,
ලොභො පහීයතෙ තම්හා උදබින්දුව පොක්ඛරා.

5. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. දුට්ඨො අත්ථං න ජානාති දුට්ඨො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං දොසො සහතෙ නරං.

7. යො ච දොසං පහත්වාන දොසනෙය්‍යෙ න දුස්සති,
දොසො පහීයතෙ තම්හා තාලපක්කංව බන්ධනා.

8. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

9. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං මොහො සහතෙ නරං.

10. යො ච මොහං පහත්වාන මොහනෙය්‍යෙ න මුය්හති,
මොහං විහන්ති සො සබ්බං ආදිච්චොවුදයං තම"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 4. 10.

## [ දෙවදත්තසුත්තං. ]

89. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීහි භික්ඛවෙ අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙව-දත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි තීහි?

4. යමෙක් තෙමේ ලොභය නසා ලොභයට කරුණු වන දෑයෙහි ලොභ නො කෙරේ ද, පොකුරුපතින් ජල බිඳුව මෙන් ඒ (ආයතී) පුද්ගලයා කෙරෙන් ලොභය (ආයතීමාර්ගයෙන්) ප්‍රහීණ වෙයි.

5. ද්වේෂය තෙම අවැඩ ඇති කරන්නේ ය. ද්වේෂය තෙම සිත ප්‍රකුපිත කරන්නේ ය. තමාගේ සිත තුළ උපන්නාවූ ඒ ද්වේෂය තෙම බියට හෙතු යැයි අඥබාල ජන තෙමේ නො දනී.

6. ද්වේෂයෙන් මඩනා ලද පුද්ගල තෙමේ (ස්වාර්ථපරාර්ථාදි) අර්ථය නො දනී. දුෂ්ට පුද්ගල තෙමේ (දශකුශලකර්මපථ) ධර්මය නො දනී. යම් කලෙක ද්වේෂය තෙම මිනිසකු මැඩ පවත්වා ද, එ කල්හි ඔහට මහා අන්ධකාරය වෙයි.

7. යමෙක් ද්වේෂය නසා ද්වේෂයට කරුණු වන දෑයෙහි ද්වේෂ නො කෙරේ ද, තල්ගෙඩිය නටුවෙන් (ගිලිහෙන්නාක්) මෙන් ඒ පුද්ගලයා කෙරෙන් ද්වේෂය (තෘතීයමාර්ගඥානය ඉපදීමෙන්) ප්‍රහීණ වෙයි.

8. මෝහය තෙම අවැඩ ඇති කරන්නේ ය. මෝහය තෙම සිත ප්‍රකුපිත කරන්නේ ය. තමාගේ සිත තුළ උපන්නා වූ ඒ මෝහය තෙම බියට හෙතු යැ යි අඥබාල ජන තෙමේ නො දනී.

9. මෝහයෙන් මඩනා ලද පුද්ගල තෙමේ (ස්වාර්ථපරාර්ථාදි) අර්ථය නො දනී. මූළ්‍හවූ පුද්ගල තෙමේ (දශකුශලකර්මපථ) ධර්මය නො දනී. යම් කලෙක මෝහය තෙම මිනිසකු මැඩ පවත්වා ද, එ කල්හි ඔහට මහා අන්ධකාරය වෙයි.

10. යමෙක් මෝහය නසා මූළ්‍හ විය යුතු දෑයෙහි මූළ්‍හ නො වේ ද, ඒ පුද්ගල තෙමේ උඩට නැගෙන්නාවූ (පායන්නාවූ) හිරු අඳුර (නසන්නාක්) මෙන් සියලු මෝහය චතුර්ථමාර්ගයෙන් නසයි."

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 4. 10.

### [ දෙවදත්ත සූත්‍රය. ]

89. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, අසත්පුරුෂ ධර්ම තුනෙකින් මඩනා ලද්දාවූ හාත්පසින් වැළඳගන්නා ලද්දාවූ දෙවදත්ත තෙමේ අපායෙහි උපන්නේ වෙයි. නරකයෙහි උපන්නේ වෙයි. අතුරු කපක් එහි සිටින්නේ වෙයි. පිළියම් නොකළ-හැක්කේ වෙයි. කවර තුනෙකින් ද යත්:

පාපිච්ඡතාය භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. පාපමිත්තතාය භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. සති ඛො පන උත්තරිකරණීයෙ ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරා වොසානං ආපාදීති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡොති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "මා ජාතු කොචි ලොකස්මිං පාපිච්ඡො උපපජ්ජතු,
තදමිනාපි ජානාථ පාපිච්ඡානං යථා ගති.

3. පණ්ඩිතො'ති සමඤ්ඤාතො භාවිතත්තො'ති සම්මතො,
ජලං' ව යසසා අට්ඨා දෙවදත්තො'ති විස්සුතො.

4. සො පමාණමනුවිණ්ණො[1] ආසජ්ජ නං තථාගතං,
අවීචිනිරයං පත්තො චතුද්වාරං භයානකං.

5. අදුට්ඨස්ස හි යො දුබ්භෙ පාපකම්මං අකුබ්බතො,
තමෙව පාපං ඵුසති දුට්ඨචිත්තං අනාදරං.

6. සමුද්දං විසකුම්භෙන යො මඤ්ඤෙය්‍ය පදූසිතුං,
න සො තෙන පදූසෙය්‍ය යස්මා[2] හි උදධි මහා.

7. එවමෙව තථාගතං යො වාදෙන විහිංසති,
සම්මග්ගතං සන්තචිත්තං වාදෙ තම්හි න රූහති.

8. තාදිසං මිත්තං කුබ්බෙථ තඤ්ච සෙවෙය්‍ය පණ්ඩිතො,
යස්ස මග්ගානුගො භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙ'ති".

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### චතුත්ථො වග්ගො

**තස්සුද්දානං:**

විතක්කා සක්කාර සද්ද චවමාන ලොකෙ,
අසුභ ධම්ම අන්ධකාර මලං දෙවදත්තො'ති තෙ දසා'ති.

---

1. පමාදමනුවිණ්ණො (සී. මු.) 2. තස්මා, සී. මු.

මහණෙනි, ලාමක ඊප්සාවෙන් මඩනා ලද්දාවූ හාත්පසින් වැළඳ ගන්නා ලද්දාවූ දෙවදත්ත තෙමේ අපායෙහි උපන්නේ වෙයි. නරකයෙහි උපන්නේ වෙයි. අතුරු කපක් එහි සිටින්නේ වෙයි. පිළියම් නො කළ හැක්කේ වෙයි: මහණෙනි, පාපමිත්‍රභාවයෙන් මඩනා ලද්දාවූ හාත්පසින් වැළඳ ගන්නා ලද්දාවූ දෙවදත්ත තෙමේ අපායෙහි උපන්නේ වෙයි. නරකයෙහි උපන්නේ වෙයි. අතුරු කපක් එහි සිටින්නේ වෙයි. පිළියම් නොකළ හැක්කේ වෙයි. මහණෙනි, ධ්‍යානාභිඥාවන්ගෙන් මත්තෙහි කළ යුතු මාර්ග-ඵලාධිගමයක් ඇති කල්හිත් ස්වල්පමාත්‍ර වූ උතුරුමිනිස් දහම් ලැබීමෙන් අතරතුර (නොකළ කිස ඇතියේ ම) කළ කිස ඇතියෙමි යි නගතේ හේ නිශ්වයට පැමිණියේ ය.

මහණෙනි, මේ අසත්පුරුෂ ධර්ම තුනෙන් මඩනා ලද්දාවූ හාත්පසින් වැළඳ ගන්නා ලද්දාවූ දෙවදත්ත තෙමේ අපායෙහි උපන්නේ වෙයි. නරකයෙහි උපන්නේ වෙයි. අතුරුකපක් එහි සිටින්නේ වෙයි. පිළියම් නොකළ හැක්කේ වෙයි.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මේ ලොකයෙහි කිසි පුද්ගලයෙක් එකාන්තයෙන් ලාමක ආශා ඇත්තේ නොවේවා. පාපෙච්ඡපුද්ගලයන්ගේ යම් බඳු ගතියෙක් වේ ද, එය මේ (දෙවදත්තයා පිළිබඳ) කාරණයෙන් ද දනිවු.

3. දෙවදත්ත යැ යි ප්‍රකට පුද්ගල තෙමේ පණ්ඩිත යැ යි ප්‍රසිද්ධ වූයේ ධ්‍යානාභිඥාවන්ගෙන් වඩන ලද සිත් ඇත්තේ යැ යි සම්භාවනා කරණ ලද්දේ කීර්තියෙන් දිලියෙමින් මෙන් සිටියේ ය.

4. හෙ තෙම (මම් මහණ ගොයුම් හා සමයෙමියි සිතමින්) තමා ප්‍රමාණ කෙළේ ඒ තථාගතයන් වහන්සේ වෙහෙසා දොරටු සතරක් ඇත්තා වූ භයජනක වූ අවීචිමහානරකයට පැමිණියේ ය.

5. යමෙක් වනාහි පව් නොකරන්නාවූ අදූෂිත සිත් ඇත්තහුට ද්‍රොහ කරන්නේ වේ ද, ඒ පාපකර්මය තෙම දූෂිත සිත් ඇති ආදර රහිත වූ ඒ පුද්ගලයා ම ස්පර්ශ කරයි. (ඔහු කරු ම විපාක වශයෙන් පැමිණෙයි.)

6. යමෙක් තෙමේ විෂ කළයකින් මහමුහුද දූෂණය කරන්නට සිතන්නේ ද, හෙ තෙම එයින් (මුහුද) දූෂණය නොකරන්නේ ය. යම් හෙයකින් මුහුද විශාල ද එ හෙයිනි.

7. එ පරිද්දෙන් ම යමෙක් තෙම ශාන්ත සිත් ඇති තථාගතයන් වහන්-සේට දොස් නැගීමෙන් වෙහෙසන්නට තැත් කරන්නේ ද, ඔහු නගන දෝෂය උන්වහන්සේ කෙරෙහි නො නැගෙයි.

8. යම් කෙනකුන් වහන්සේගේ ප්‍රතිපත්තිමාර්ගය අනුව ගියාවූ මහණ තෙම සංසාරදුඃඛයාගේ ක්ෂයට පැමිණෙන්නේ ද, නුවණැත්තෝ එබඳු නැනැත්තකු තම මිතුරා කැර ගන්නේ ය. එබඳු නැනැත්තකු ම සෙවනය කරන්නේ ය".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## සිවු වන වර්ගයි.

එහි උද්දානය:

විතක්ක, සක්කාර, දෙවසද්ද, දෙවාවවන, (පුබ්බනිමිත්ත), තථාගත-ලොකුප්පත්ති (බහුජනහිත), අසුභානුපස්සී, ධම්මානුධම්මපටිපන්න, අන්ධ-කරණ, මල, දෙවදත්ත සූත්‍රය යි ඔහු දසදෙනෙකි.

# පඤ්චමො වග්ගො

## 3. 5. 1.

## [ අග්ගප්පසාදසුත්තං ]

90. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අග්ගප්පසාදා. කතමෙ තයො?

යාවතා භික්ඛවෙ සත්තා අපදා වා ද්විපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති යදිදං අරහං සම්මාසම්බුද්ධො. යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං අග්ගමක්ඛායති යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ භික්ඛවෙ විරාගෙ ධම්මෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා තථාගතසාවකසඞ්ඝො තෙසං අග්ගමක්ඛායති. යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ භික්ඛවෙ සඞ්ඝෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ තයො අග්ගප්පසාදා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං,
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.

## පඤ්චම වර්ගය

### 3. 5. 1.

### [ අග්ගප්පසාද සූත්‍රය ]

90. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, මේ අග්‍ර වූ (ශ්‍රෙෂ්ඨ වූ) ප්‍රසාදයෝ (පැහැදීම්) තුන් දෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්:

මහණෙනි, පා නැත්තා වූ හෝ දෙපා ඇත්තා වූ හෝ සිවුපා ඇත්තා වූ හෝ බොහෝ පා ඇත්තා වූ හෝ රූපය ඇත්තා වූ හෝ රූපය නැත්තා වූ හෝ සංඥා ඇත්තා වූ හෝ සංඥා නැත්තා වූ හෝ නෛවසංඥී-නාසංඥී වූ හෝ යම් පමණ සත්ත්වයෝ වෙත් ද, ඔවුන් අතුරෙන් මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරජ තෙමේ අග්‍රයා යි (ශ්‍රෙෂ්ඨ යැ යි) කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් බුදුන් කෙරෙහි පැහැදුනාහු නම් ඔවුහු අග්‍ර වූ (බුද්ධරත්නයෙහි) පැහැදුනාහු වෙත්. අග්‍ර වූ බුද්ධරත්නයෙහි පැහැදුන-වුන්ට අග්‍ර (ශ්‍රෙෂ්ඨ) වූ විපාකය වෙයි.

මහණෙනි, හේතුප්‍රත්‍යයෙන් නිපන්නාවූ හෝ හේතුප්‍රත්‍යයෙන් නොනි-පන්නාවූ හෝ යම් පමණ ස්වභාවධර්මයෝ වෙත් නම්, ඔවුන් අතුරෙන් යම් මේ (මානමදාදි) සියලු මද මර්දනය කරන්නාවූ (කාමාදි) පිපාසයන් පහ කරන්නාවූ (කාමාදි) ආලයයන් සහමුලින් නසන, (කම්වට කෙලෙස්වට විවාවට යන) සංසාරවෘත්තයන් සිඳින්නාවූ, තෘෂ්ණාක්ෂය කරන්නාවූ, රාගය දුරු කරන්නාවූ, කෙලෙස් නිරුද්ධ කරන්නාවූ නිර්වාණයක් වේ ද (ඒ ධර්මය) ශ්‍රෙෂ්ඨ යැ යි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් විරාගධර්මයෙහි (නිවණෙහි) පැහැදුනාහු නම් (ඔවුහු) අග්‍ර වූ ධර්මරත්නයෙහි පැහැදුනාහු වෙත්. අගතන්හි පැහැදුනවුන්ට එකාන්ත අග්‍ර වූ විපාකය වෙයි.

මහණෙනි, සඞ්ඝ වූ හෝ ගණ වූ හෝ යම් පමණ (ජනසමූහයක්) ඇද්ද ඔවුන් අතුරෙන් යම් මේ පුරිසයුගල වශයෙන් සතරක් වූ පුද්ගල වශයෙන් අට දෙනෙක් වූ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ශ්‍රෙෂ්ඨ යැ යි කියනු ලැබේ. ඒ භාග්‍යවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ දුරින් ගෙණවුත් දිය යුත්ත පිළිගැණීමට සුදුසු වේ. ආගන්තුගදානය පිළිගැණීමට සුදුසු වේ. පරලොව අදහා දිය යුත්ත පිළිගැණීමට සුදුසු වේ. දෙහොත් මුදුන්හි තබා නමස්කාර කිරීමට සුදුසු වේ. ලොවැස්සාගේ උතුම් වූ පින්කෙත ද වේ. මහණෙනි, යම් කෙනෙක් (මෙබඳු) සඞ්ඝයා කෙරෙහි පැහැදුනාහු නම් ඔවුහු අග්‍ර (සඞ්ඝරත්නයෙහි) පැහැදුනාහු වෙත්. අගතන්හි පැහැදුනවුන්ට අග්‍ර වූ විපාකය වෙයි.

මහණෙනි මොවුහු එකාන්ත අග්‍රප්‍රසාදයෝ තිදෙන වෙත්.

මෙ කාරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "එකාන්තයෙන් (රත්නත්‍රයවිෂයයෙහි) අග්‍ර වශයෙන් පැහැදුනාවූ උත්තම ගුණස්වභාවය දත්තාවුන්ට ද දක්ෂිණාර්හ වූ නිරුත්තර අග්‍ර බුදුන් කෙරෙහි පැහැදුනවුන්ට ද, (අග්‍ර විපාකය වේ.)

3. අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ,
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

4. අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති,
අග්ගං ආයු ච වණ්ණො ච යසො කිත්ති සුඛං බලං.

5. අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්මසමාහිතො,
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

3. 5. 2.

[ ජීවිකාසුත්තං ]

91. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. අන්තමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං, අභිසාපො'යං භික්ඛවෙ ලොකස්මිං පිණ්ඩොලො විචරසි පත්තපාණීති. තඤ්ච ඛො එතං භික්ඛවෙ කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා අත්ථවසං පටිච්ච, නෙව රාජාභිනීතා න චොරාභිනීතා න ඉණට්ටා න භයට්ටා න ආජීවිකපකතා, අපි ච ඛො ඔතිණ්ණම්හා ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති.

එවං පබ්බජිතො චායං භික්ඛවෙ කුලපුත්තො හොති අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරාගො බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසඞ්කප්පො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො.

සෙය්‍යථාපි භික්ඛවෙ ඡවාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං ඵරති න අරඤ්ඤෙ, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි ගිහිභොගා ච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච න පරිපූරෙතී'ති.

3. සියලු කෙලෙසුන්ගේ නොඇලීමට හා සංසිඳීමට හෙතු වූ, සැප ඇත්තා වූ අග්‍ර වූ ධර්මය කෙරෙහි පැහැදුනවුන්ට ද, උසස් පින් කෙතක් වූ අග්‍ර සඞ්ඝරත්නය කෙරෙහි පැහැදුනවුන්ට ද (අග්‍ර විපාකය වේ.)

4. අග්‍ර වූ රත්නත්‍රය විෂයයෙහි දන් දෙන්නවුන්ට අග්‍ර වූ පින් වැඩේ. අග්‍ර වූ ආයුෂය ද, ශරීර වර්ණය ද, පිරිවර සම්පත ද, කීර්තිය ද, (කායික-චෛතසික) සුවය ද, කායබල හා ඥනබලය ද වැඩෙන්නේ ය

5. අග්‍ර වූ රත්නත්‍රයට (අග්‍ර වූ දෙයධර්මය) දෙන්නා වූ නුවණැති පුරුෂ තෙම අග්‍රප්‍රසාදධර්මයෙන් හා අග්‍රදානධර්මයෙන් යුක්ත වූයේ, දෙව් වූයේ හෝ මිනිස් වූයේ හෝ අග්‍ර බවට පැමිණ සතුටු වෙයි."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 5. 2.

## [ ජීවිකා සූත්‍රය ]

91. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් මේ පිඬු සිඟීමෙන් ජීවත්වීමෙක් වේ ද, මේ ජීවිතය ජීවිතයන් අතුරෙන් ලාමක ය. මහණෙනි, "කබලක් ගත් අත් ඇති ව පිඬු සෙවීම ඇසුරු කරන්නෙක් ව හැසිරෙහි" යනු ලොකයෙහි මේ ආක්‍රොශ කිරීමෙක් වේ. මහණෙනි, ඒ (මෙබඳු) ආක්‍රොශ ඇති, පිඬු සිඟීමෙන් කරණ ජීවිකාවට අර්ථවශික (කාරණයට වසඟ) වූ කුලපුත්‍රයෝ කරුණක් නිසා එළඹෙත්. (ඔවුහු) රජුන් විසින් එළවන ලද්දාහු නො වෙත්. සොරුන් විසින් නෙරපන ලද්දාහු ද නො වෙත්. ණය දී ගත නොහැකිව පෙළුනාහු ද නො වෙත්. බියෙන් පෙළුනාහු ද නො වෙත්. ජීවිකාව සවභාවය කොට ඇත්තාහු ද නො වෙත්. යළිදු, ඉපදීමෙන් ද, ජරාවෙන් ද, මරණයෙන් ද, ශොකයෙන් ද, වැලපීමෙන් ද, දුකින් ද, දොම්නසින් ද, දැඩි වෙහෙසින් ද ගැවැසී ගත්තෝ වමු. දුකට බැස ගත්තෝ වමු. දුකින් පෙළන ලද්දෝ වමු. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පැණේ නම් ඉතා යෙහෙක කියා සි.

මහණෙනි, මෙසේ පැවිදි වූ ද ඒ කුලපුත්‍ර තෙමේ අධික ලොභී වූයේ වස්තුකාම ක්ලෙශකාමයන්හි තියුණු ආශාව ඇත්තේ, විපරීත සිත් ඇත්තේ, දූෂිත සිත් ඇත්තේ, මුළා සිහි ඇත්තේ, සම්‍යක්ප්‍රඥ රහිත වූයේ, එකඟ නොවූ සිත් ඇත්තේ, විශෙෂයෙන් නැති ගත් සිත් ඇත්තේ, ප්‍රකෘති ඉඳුරන් ඇත්තේ (අසංවර වූයේ) වේ ද,

මහණෙනි, යම්සේ දෙපසින් ගිනි ඇවිළ ගත්තාවූ, මැද අසුචි තැවරුණු සොහොන් පෙණෙල්ලක් ගමෙහි (කැණිමඬුලු ආදී) දුවකිස සිදු නො කෙරේ ද, වනයෙහිත් (බෙනනකුටිපාදාදී) දුවකිසක් සිදු නො කෙරේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා ද එසේ (සොහොන් පෙණෙල්ලට) උපමා කොට කියමි. (හෙතෙම) ගිහිසැපතින් පිරිහුනේ අර්හත්ඵල සඞ්ඛ්‍යාත ශ්‍රාමණ්‍යාර්ථය ද, සම්පූර්ණ නොකෙරේ යැ සි.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. “ගිහීභොගා ච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච දුබ්භගො,
පරිධංසමානො පකිරෙති ඡවාලාතං ව නස්සති.

3. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ.

4. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො,
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො”ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

### 3. 5. 3.

### [ සඞ්ඝාටිකණ්ණසුත්තං ]

92. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා’ති මෙ සුතං:

1. සඞ්ඝාටිකණ්ණෙ චෙ’පි භික්ඛවෙ භික්ඛු ගහෙත්වා පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො අස්ස, පාදෙ පාදං නික්ඛිපන්තො. සො ච හොති අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරාගො. බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසංකප්පො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො. අථ ඛො සො ආරකා’ව මය්හං, අහං ච තස්ස. තං කිස්ස හෙතු: ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු න පස්සති ධම්මං අපස්සන්තො න මං පස්සති.

යොජනසතෙ චෙ’පි සො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සො ච හොති අනභිජ්ඣාලූ කාමෙසු න තිබ්බසාරාගො අබ්‍යාපන්නචිත්තො අපදුට්ඨමනසංකප්පො උපට්ඨිතස්සති සම්පජානො සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො. අථ ඛො සො සන්තිකෙව මය්හං, අහං ච තස්ස. තං කිස්ස හෙතු: ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු පස්සති ධම්මං පස්සන්තො මං පස්සතීති.

භාග්‍යවත්හු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “ගිහීන් විසින් පරිභෝග කටයුතු කාම සැපතින් ද පිරිහුණා වූ, අර්හත්ඵලසඞ්ඛ්‍යාත ශ්‍රාමණ්‍යාර්ථය ද සම්පූර්ණ නොකරන්නාවූ නිඃශ්‍රීක (කාලකණ්ණී) පුද්ගල තෙමේ දෙපසින් ම පරිබාහිර වූයේ (ශීලාදි ගුණවිශෙෂයන්) ඉක්මෙයි. සොහොන් පෙණෙල්ලක් මෙන් (ශීලාදි ගුණනාශයෙන්) නැසෙයි.

3. කහවත් ගෙල ලාගත් පව්ටු ගති ඇති කායවාක් සංයමයක් (හොඳ හැසුරුමක්) නැති පව්ටු පුද්ගලයෝ බොහෝ වෙත්. ඔහු තමන් කළ පව් හෙතුවෙන් නරකයෙහි උපදිත්.

4. ඉඳින් සංවර රහිත වූ දුසිල් මහණ තෙමේ රට වැසියා විසින් දෙන ලද යම් අහාරයක් වළඳන්නේ නම් (එයට වඩා) රත් වූ ගිනිසිළක් හා සමාන වූ ලෝ ගුලියක් අනුභව කෙළේ උතුම්”.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙකරුණ ද වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 5. 3.

## [ සඞ්ඝාටිකණ්ණ සූත්‍රය ]

92. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත්වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ඉදින් යම් මහණෙක් (මාගේ) සඟළ සිවුරු කොණ අල්ලා ගෙණ (මාගේ) පියවරෙහි පියවර තබමින් පසුපසින් ලුහුබඳනේ වේ ද, හෙ තෙමේත් අධික ලොභී වූයේ, පස්කම් සැපයෙහි තියුණු ඇලුම් ඇත්තේ, විපරීත සිත් ඇත්තේ, දූෂිත චිත්තසංකල්පනා ඇත්තේ, මුළා සිහි ඇත්තේ, සම්‍යක් ප්‍රඥ නැත්තේ, එකඟ වූ සිත් නැත්තේ, විශෙෂයෙන් නැති ගත් සිත් ඇත්තේ, පියෙවි ඉඳුරන් ඇත්තේ (ඉන්ද්‍රියසංවර නැත්තේ) වේ ද, එසේ ඇති කල්හි ඒ මගණ තෙම මට දුරෙහි වේ. මම ද ඔහුට දුරෙහි වෙමි. එයට හෙතු කිම යත්: මහණෙනි, ඒ මහණ තෙම තව ලොවුතුරුදහම් නො දකී. ධර්මය නොදක්නේ මා නොදක්නේ ය (එ හෙයිනි).

මහණෙනි, යම් ඒ මහණෙක් තෙමේ යොදුන් සියක් දුර වාසය කරන්නේ නමුදු හෙ තෙමේත් අධික ලොභී නොවූයේ, පස්කම්හි තියුණු ආශා නැත්තේ, විපරීත සිත් නැත්තේ, දූෂිත චිත්තසංකල්පනා නැත්තේ, එළැඹ සිටි සිහි ඇත්තේ, සම්‍යක්ප්‍රඥ ඇත්තේ, එකඟ සිත් ඇත්තේ, සංවෘත ඉඳුරන් ඇත්තේ වේ ද, එසේ ඇති .කල්හි ඒ මහණ තෙම මාගේ සමීපයෙහි වේ. මම ඔහු සමීපයෙහි වෙමි. එයට හෙතු කිම යත්: මහණෙනි, ඒ මහණ තෙමේ තව ලොවුතුරු දහම් දකී. දහම් දක්නේ මා දකී (එහෙයිනි).

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අනුබද්ධො'පි චෙ අස්ස මහිච්ඡො ච විඝාතවා,
එජානුගො අනෙජස්ස නිබ්බුතස්ස අනිබ්බුතො,
ගිද්ධො සො වීතගෙධස්ස පස්ස යාවඤ්ච ආරකා.

3. සො ච ධම්මමභිඤ්ඤාය ධම්මමඤ්ඤාය පණ්ඩිතො,
රහදො'ව නිවාතෙ ච අනෙජො වූපසම්මති.

4. අනෙජො සො අනෙජස්සනිබ්බුතස්සචනිබ්බුතො,
අගිද්ධො වීතගෙධස්ස පස්ස යාවඤ්ච සන්තිකෙ'ති".

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 5. 4.

## [ අග්ගිසුත්තං ]

93. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තයො'මෙ භික්ඛවෙ අග්ගී. කතමෙ තයො? රාගග්ගි දොසග්ගි මොහග්ගි. ඉමෙ ඛො භික්ඛවෙ තයො අග්ගීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "රාගග්ගි දහති මච්චෙ රත්තෙ කාමෙසු මුච්ඡිතෙ,
දොසග්ගි පන බ්‍යාපන්නෙ නරෙ පාණාතිපාතිනො.

3. මොහග්ගි පන සම්මූළ්හෙ අරියධම්මෙ අකොවිදෙ,
එතෙ අග්ගී අජානන්ති සක්කායාභිරතා පජා.

4. තෙ වඩ්ඪයන්ති නිරයං තිරච්ඡානඤ්ච යොනියො,
අසුරං පෙත්තිවිසයං අමුත්තා මාරබන්ධනා.

5. යෙ ච රත්තින්දිවා යුත්තා සම්මාසම්බුද්ධසාසනෙ,
තෙ නිබ්බාපෙන්ති රාගග්ගිං නිච්චං අසුභසඤ්ඤිනො.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මහත් ආශා ඇත්තා වූ (කැමැති දෑ නොලැබීමෙන්) දුක් ඇත්තා වූ, තෘෂ්ණාව අනුව යන්නාවූ (කෙලෙස් මැඩීමෙන්) නො නිවියාවූ, (රූපාදි විෂයයන්හි) ගිජු වූ (යම් මහණෙක්) මා លුහුබඳින්නේ නමුදු, හේ තෘෂ්ණා රහිත වූ, කෙලෙස් නිවියා වූ, පහ කළ ගිජුබව් ඇති (සම්බුදු රදුන්ගෙන්) යම් තාක් දුරෙහි වේ ද, (එය) බලව.

3. ඒ නුවණැති මහණ තෙම සිවුසස් දහම් දැන, ඒ දහම් මහනුවණින් දැන, තෘෂ්ණාරහිත වූයේ, වාතය නොහමනා තැනෙක දියවිලක් නොසැලෙන්නා සේ (කෙලශවෘතය නොමැති ව) සංසිඳෙයි.

4. ඒ මහණ තෙමේ තෘෂ්ණාරහිත වූයේ (කෙලෙස් මැඩීමෙන්) නිවියේ, (රූපාදි විෂයයන්හි) ගිජු නො වූයේ, තෘෂ්ණාරහිත වූයේ, පිරිනිවියා වූ වීතගෙධ වූ බුදුරජුනට යම් තාක් සමීපයෙහි වේ ද, (එය) බලව."

මෙ කරුණ ද භාග්‍යවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 5. 4.

### [ අග්ගිසුත්‍රය ]

93. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ ගිනි තුණෙකි. කවර තුණෙක් ද යත්: රාග නැමැති ගින්න, ද්වෙෂ නැමැති ගින්න, මෝහ නැමැති ගින්න, යන මේ යි. මහණෙනි, මේ ගිනි තුණ යැයි.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "රාගාග්නි තෙම රාගයෙන් රත් වූ කාමයන්හි මූළා වූ මිනිසුන් දවයි. ද්වෙෂාග්නි තෙම ව්‍යාපාද වශයෙන් පෙරළුණු සිත් ඇති, ප්‍රාණඝාතය කරණ මිනිසුන් දවයි.

3. මෝහාග්නි තෙම ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්‍ෂ වූ වෙසෙසින් මූළා වූ මිනිසුන් (දවයි.) සත්කායයෙහි (ස්කන්ධ පංචකයෙහි) ඇලුනාවූ ඒ සත්ත්වයෝ මේ රාගාදී අග්නීන් නොදන්නාහු වෙත්.

4. ඒ මාරබන්ධනයෙන් නොමිදුනාවූ (ඔහු) නිරය ද, තිරශ්චීන-යොනිය ද, අසුරනිකාය ද, ප්‍රෙතවිෂයය ද (එහි ඉපදීම් වශයෙන්) වඩන්නෝ වෙත්.

5. යම් කෙනෙක් රෑ දවල් දෙක්හි සම්‍යක් සම්බුද්ධශාසනයෙහි (භාවනා වශයෙන්) යෙදුනාහු වෙත් ද, නිතර අශුභ සංඥා ඇති ඔහු රාගාග්නිය නිවත්.

6. දොසග්ගිං පන මෙත්තාය නිබ්බාපෙන්ති නරුත්තමා,
මොහග්ගිං පන පඤ්ඤාය යායං නිබ්බෙධගාමිනී.

7. තෙ නිබ්බාපෙත්වා නිපකා රත්තින්දිවමතන්දිතා,
අසෙසං පරිනිබ්බන්ති අසෙසං දුක්ඛමච්චගුං.

8. අරියද්දසා වෙදගුනො සම්මදඤ්ඤාය පණ්ඩිතා,
ජාතික්ඛයමභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භවන්ති".

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 5. 5.

### [ උපපරික්ඛසුත්තං ]

94. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තථා තථා භික්ඛවෙ භික්ඛු උපපරික්ඛෙය්‍ය යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං හොති අවිසටං, අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය. බහිද්ධා චස්ස භික්ඛවෙ විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාති ජරාමරණ දුක්ඛසමුදයසම්භවො න හොතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සත්තසඞ්ගපහීනස්ස නෙත්තිච්ඡින්නස්ස භික්ඛුනො,
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවො"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

### 3. 5. 6.

### [ කාමූපපත්ති සුත්තං ]

95. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තිස්සො ඉමා භික්ඛවෙ කාමූපපත්තියො. කතමා තිස්සො? පච්චුපට්ඨිතකාමා, නිම්මානරතිනො, පරනිම්මිතවසවත්තිනො. ඉමා ඛො භික්ඛවෙ තිස්සො කාමූපපත්තියො'ති.

6. ඒ තරොත්තමයෝ මෛත්‍රීභාවනායෙන් ද්වේෂාග්නිය ද, යම් මේ කෙලෙස් කඳු විදින ප්‍රඥාවෙක් වේ නම් ඒ ප්‍රඥායෙන් මොහාග්නිය ද නිවත්.

7. ප්‍රඥායෙන් යුක්ත වූ රෑ දවල් දෙක්හි නොමැලි වූ (ඔහු) රාගාදි ගිනි නිවා (අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන්) පිරිනිවෙත්. සියලු සසර දුක් ඉක්මෙත්.

8. ආර්‍ය්‍ය වූ (නිර්වාණය) දුටුවාවූ වෙද සංඛ්‍යාත මාර්ගඥානයෙන් (සසර කෙළවරට) ගියා වූ නුවණැති ඔහු (ස්කන්ධාදිය) මොනොවට දැන නිර්වාණාවබොධය කොට නැවැත ඉපදීමට නො පැමිණෙත්.”

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 5. 5.

## [ උපපරික්ඛා සූත්‍රය ]

94. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් යම් අයුරෙකින් මහණ (සංස්කාරධර්මයන්) විමංසනය කරත් ම ඔහුගේ විදසුන් සිත (රූපාදි) බාහිර අරමුණු විෂයයෙහි නො විසුරුණේ නොපැතුරුණේ වේ ද, අධ්‍යාත්මයෙහි (කමටහන් අරමුණෙහි) (හැකිළීම් වශයෙන්) නොපිහිටියේ දෘෂ්ටි වශයෙන් නොගෙණ (එහෙයින් ම) ත්‍රාස නොවන්නේ ද, ඒ ඒ අයුරින් භික්ෂු තෙම විමසන්නේ ය. මහණෙනි, සිත බාහිර අරමුණෙහි නොවිසුරුණු කල්හි, නොපැතුරුණු කල්හි, අධ්‍යාත්මයෙහි නොපිහිටිකල්හි (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන්) නොගෙණ (එහෙයින් ම) ත්‍රාස නොවන්නාවූ මහණහට මතු ජාතිජරාමරණ දුක්ඛයන්ගේ සම්භවයෙක් නො වේ යැ යි.

මෙ කරුණ භාග්‍යවත්හු වදාහළ. එහි අර්ථය (ගාථා වශයෙන් ) මෙසේ කියනු ලැබේ:

2. “තෘෂ්ණාදි සත්වැදෑරුම් සඞ්ග (කෙලශ) යන් ප්‍රහීණ කළ, භවනෙත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සිඳ දැමූ භික්ෂුහු පිළිබඳ උත්පත්තිසංසාරය ක්ෂීණ වූයේ වෙයි. (එ හෙයින්) ඔහුට පුනර්භවයෙක් නැත්තේ ය.”

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 3. 5. 6.

## [ කාමෝපපත්ති සූත්‍රය ]

95. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලදි. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, කාමලාභයෝ (නොහොත්) කාමසෙවනයෝ මේ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: නිබද්ධකාම ලාභය ද, නිම්මාණරති කාමලාභය ද, පරනිම්මිතවසවත්ති කාමලාභය ද යන තිදෙන වෙති.

එතමත්ථං භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති:

2. ''පච්චුපට්ඨිතකාමා ච යෙ දෙවා වසවත්තිනො,
නිම්මානරතිනො දෙවා යෙ චඤ්ඤෙ කාමභොගිනො.

3. ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තරෙ,
එතමාදීනවං ඤත්වා කාමභොගෙසු පණ්ඩිතො,
සබ්බෙ පරිච්චජෙ කාමෙ යෙ දිබ්බා යෙ ච මානුසා.

4. පියරූපසාතගධිතං ඡෙත්වා සොතං දුරච්චයං,
අසෙසං පරිනිබ්බන්ති අසෙසං දුක්ඛමච්චගුං.

5. අරියද්දසා වෙදගුනො සම්මදඤ්ඤාය පණ්ඩිතා,
ජාතික්ඛයමභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භව''න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 5. 7.

## [ කාමයොගසුත්තං ]

96. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. කාමයොගයුත්තො භික්ඛවෙ භවයොගයුත්තො ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං.

කාමයොගවිසඤ්ඤුත්තො භික්ඛවෙ භවයොගයුත්තො අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං.

කාමයොගවිසඤ්ඤුත්තො භික්ඛවෙ භවයොගවිසඤ්ඤුත්තො අරහං හොති ඛීණාසවො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථේතං ඉති වුච්චති:

2. ''කාමයොගෙන සංයුත්තා භවයොගෙන චූභයං,
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො.

3. යෙ ච කාමෙ පහාත්වාන අප්පත්තා ආසවක්ඛයං,
භවයොගෙන සංයුත්තා 'අනාගාමී'ති වුච්චරෙ.

4. යෙ ච ඛො ඡින්නසංසයා[1] ඛීණමානපුනබ්භවා,
තෙ වෙ පාරං ගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛය''න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

තතියභාණවාරං.

1. ඡින්නසංසාරා. සී. මු.

භාග්‍යවත්හු මේ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පරනිම්මිත වසවත්ති නම් වූ යම් දෙව් කෙනෙක් වෙත් ද, නිම්මාන-රතී නම් වූ දෙව් කෙනෙක් වෙත් ද, නිබද්ධකාමලාභී වූ සෙසු කාමභෝගීහු වෙත් ද,

3. (ඔහු) මේ අත්බව හා උපපත්තිභව සඞ්ඛ්‍යාත මතු අතීත් අත්බව ද යන දෙවැදෑරුම් සසර නො ඉක්මෙත්. නුවණැති පුද්ගල තෙමේ මෙම ආදීනවය දැන කාමභෝග විෂයයෙහි දිව්‍යමය වූ ද මානුෂක වූ ද යම් කාමයෝ වෙත් නම්, ඒ සියලු කාමයන් දුරු කරන්නේ ය.

4. (යම් ආර්‍ය්‍ය කෙනෙක්) ප්‍රියරූප සුඛාදියෙහි ගිජු වූ, ඉක්මීමට දුෂ්කර වූ තෘෂ්ණා ස්‍රෝතස (රහත්මග නුවණින්) සිඳ දමා නිරවශෙෂ ව පිරිනිවෙත් ද, නිරවශෙෂ කොට (සසරදුක්) ඉක්මෙත් ද,

5. නිර්වාණය දුටුවාවූ, වෙද සංඛ්‍යාත මාර්ගඥානයෙන් (සසර කෙළවරට) ගියාවූ නුවණැති ඔහු (ස්කන්ධාදිය) මොනොවට දැන, නිර්වාණාවබෝධය කොට නැවත ඉපදීමට නො පැමිණෙත්".

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කරුණ ද වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

### 3. 5. 7

### [ කාමයෝග සූත්‍රය ]

96 භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, පඤ්චකාමගුණික රාග සඞ්ඛ්‍යාත කාමයෝගයෙන් යුක්ත වූ ද, රූපාරූපභවයන්හි ඡන්දරාගසඞ්ඛ්‍යාත භවයෝගයෙන් යුක්ත වූ ද පුද්ගල තෙමේ මේ මිනිසත්බවට (පිළිසිඳ ගැණීම් වශයෙන්) එන්නේ ආගාමී වෙයි.

මහණෙනි, කාමයෝගයෙන් වෙන් වූ භවයෝගයෙන් යුක්ත වූ පුද්ගල තෙමේ මේ මිනිසත් බවට නොඑන්නේ අනාගාමී වෙයි.

මහණෙනි, කාමයෝගයෙන් වෙන් වූ ද, භවයෝගයෙන් වෙන් වූ ද පුද්ගල තෙමේ රහත් වූ ක්ෂීණාස්‍රවයෙක් වෙයි.

භාග්‍යවත්හු මේ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "කාමයෝගයෙන් ද භවයෝගයෙන් ද යන දෙ පරිද්දෙන් ම යුක්ත වූ සත්ත්වයෝ ජාතිමරණගාමීහු වූවෝ සසර සරත්.

3. යම් කෙනෙක් කාමයන් පහ කොට, ආස්‍රවක්ෂයට නොපැමිණ භවයෝගයෙන් යුක්ත වූවාහු ද (ඔහු) අනාගාමීහු යි කියනු ලැබෙත්.

4. යම් කෙනෙක් මුලුසුන් කරණ ලද සැක ඇත්තාහු ක්ෂය කරණ ලද (නවවිධ) මානය හා පුනර්භවය ඇත්තාහු ද, යමෙකුත් ආස්‍රවක්ෂයට පැමිණියාහු ද, (ඔහු) එකාන්තයෙන් ලොව්හි පරතෙරට ගියෝ නම් වෙත්."

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කරුණ ද වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

**තුන්වන බණවරයි.**

3. 5. 8.

[ කල්‍යාණසීල සුත්තං ]

97. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. කල්‍යාණසීලො භික්ඛවෙ භික්ඛු කල්‍යාණධම්මො කල්‍යාණපඤ්ඤො ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසො'ති වුච්චති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු කල්‍යාණසීලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණසීලො හොති. ඉති කල්‍යාණසීලො.

කල්‍යාණධම්මො ච කථං හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සත්තන්නං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණධම්මො හොති. ඉති කල්‍යාණසීලො කල්‍යාණධම්මො.

කල්‍යාණපඤ්ඤො ච කථං හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණපඤ්ඤො හොති. ඉති කල්‍යාණසීලො කල්‍යාණධම්මො කල්‍යාණපඤ්ඤො ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසො'ති වුච්චතීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කටං,
තං වෙ කල්‍යාණසීලො'ති ආහු භික්ඛුං හිරීමතං.

3. යස්ස ධම්මා සුභාවිතා සත්ත සම්බොධගාමිනො,
තං වෙ කල්‍යාණධම්මො'ති ආහු භික්ඛුං අනුස්සදං.

4. යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො,
තං වෙ කල්‍යාණපඤ්ඤො'ති ආහු භික්ඛුං අනාසවං.

3. 5. 8.

## කල්‍යාණශීල සූත්‍රය

97. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, සොඳුරු (පිරිපුන්) සිල් ඇත්තාවූ, කල්‍යාණ (බොධිපාක්ෂික) ධර්ම ඇත්තාවූ, කල්‍යාණ (මාර්ගඵලාදි) ප්‍රඥා ඇත්තාවූ මහණ තෙම මේ ශාසනයෙහි සියලු ගුණයෙන් යුත් (රහත් වූ) වැස නිමවූ බඹසර ඇති (අසෙඛධර්මයෙන් යුත්) උත්තම පුරුෂයා යි කියනු ලැබේ.

මහණෙනි, කෙසේ නම් මහණ තෙම කලණ සිල් ඇත්තේ වේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ සිල්වත් වූයේ, ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් යුක්තව වෙසේ ද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව අනුප්‍රමාණ (ඉතා සුළු) වූ ද වරදෙහි භය දක්නා සුලු වූයේ, ශික්ෂාපදයන්හි මනා කොට සමාදන්ව හික්මෙන්නේ වේ ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ කලණ (පිරිපුන්) සිල් ඇත්තේ වේ. මෙ පරිද්දෙන් කලණ සිල් ඇත්තේ වෙයි.

මහණෙනි, කලණ දහම් ඇති මහණ තෙමේ කෙබඳු වේ ද? මහණෙනි, මේ සසුනෙහි මහණ තෙමේ කොට්ඨාස වශයෙන් සතක් වූ බොධිපාක්ෂික-ධර්මයන් පිළිබඳ භාවනානුයොගයෙහි යෙදුනෙක්ව වෙසේ ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ කල්‍යාණ ධර්ම ඇත්තේ වේ. මෙපරිද්දෙන් කලණ සිල් ඇත්තේ කලණ දහම් ඇත්තේ ද වේ.

මහණෙනි, කල්‍යාණප්‍රඥා ඇත්තේ කෙබඳු වේ ද? මහණෙනි, මේ සසුනෙහි මහණ තෙමේ ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රවරහිත වූ ඵලසමාධි-යත් ඵලප්‍රඥාවත් මේ ආත්මභාවයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසේ ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ කල්‍යාණප්‍රඥා ඇත්තේ වේ. මෙපරිද්දෙන් කල්‍යාණශීලය ඇත්තේ, කල්‍යාණධර්ම ඇත්තේ, කල්‍යාණප්‍රඥා ඇත්තේ මේ ශාසනයෙහි වැස නිම වූ බඹසර ඇති, රහත් වූ උත්තම පුරුෂයා යැයි කියනු ලැබේ.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් මහණකුට කයින් හෝ වචසින් හෝ මනසින් වන දුශ්චරිත-යෙක් (අකුශලයෙක්) නැත්තේ ද, හිරිසම්පන්න (පවෙහි ලජ්ජා ඇති) ඒ මහණ ඒකාන්තයෙන් කලණ සිල් ඇත්තේ ය යි කියත්.

3. යම් මහණකු විසින් ආර්‍යමාර්ගඥානයට පමුණුවන සත් (බෝපැකි) දහම්හු වඩන ලද්දාහු ද, රාගාදි උසස් රහිත වූ ඒ මහණ කල්‍යාණධර්ම ඇත්තෙකැ යි කියත්.

4. යම් මහණෙක් මේ ආත්මභාවයෙහි ම තමාගේ දුඃඛක්ෂයය මැනැවින් දනී ද, ආශ්‍රවරහිත වූ ඒ මහණ කල්‍යාණප්‍රඥා ඇත්තෙකැයි කියත්.

5. තෙහි ධම්මෙහි සම්පන්නං අනීඝං ඡින්නසංසයං,
අජිතං සබ්බලොකස්ස ආහු සබ්බප්පහායිනන්ති ”

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 3. 5. 9.

## [ දානසුත්තං. ]

98. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා’ති මෙ සුතං:

1. ද්වෙමානි භික්ඛවෙ දානානි ආමිසදානඤ්ච ධම්මදානඤ්ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදානං. ද්වෙමෙ භික්ඛවෙ සංවිභාගා ආමිසසංවිභාගො ච ධම්මසංවිභාගො ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සංවිභාගානං යදිදං ධම්මසංවිභාගො. ද්වෙමෙ භික්ඛවෙ අනුග්ගහා ආමිසා-නුග්ගහො ච ධම්මානුග්ගහො ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං අනුග්ගහානං යදිදං ධම්මානුග්ගහොති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. “යමාහු දානං පරමං අනුත්තරං
යං සංවිභාගං භගවා අවණ්ණයී,
අග්ගම්හි ඛෙත්තම්හි පසන්නචිත්තො
විඤ්ඤූ පජානං කො න යජෙථ කාලෙ.

3. යෙ චෙව භාසන්ති සුණන්ති චූභයං
පසන්නචිත්තා සුගතස්ස සාසනෙ,
තෙසං සො අත්ථො පරමො විසුජ්ඣති
යෙ අප්පමත්තා සුගතස්ස සාසනෙ”ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

5. ඒ (ශීල සමාධි ප්‍රඥා) ධර්මයන්ගෙන් යුක්ත වූ, දුක් රහිත වූ, සිඳින ලද සැක ඇති, තෘෂ්ණාදෘෂ්ටීන් ඇසුරු නොකළාවූ (ඔහු) සියලු සත්ත්වලොකයෙහි සියල්ල පහ කළාවූ පුද්ගලයා යැ යි කියත්".

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ කරුණ ද වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදි.

## 3. 5. 9.

### [ දාන සූත්‍රය. ]

98. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ආමිසදානය ධර්මදානයැ යි මේ දාන දෙකෙකි. මහණෙනි, මේ දාන දෙක අතුරෙන් යම් ධර්මදානයෙක් වේ නම් මෙය අග්‍ර ය. මහණෙනි, ආමිසසංවිභාගය ධර්මසංවිභාගයැ යි මේ සංවිභාගයෝ දෙදෙනෙකි. මහණෙනි, මේ සංවිභාග දෙක අතුරෙන් යම් ධර්මසංවිභාගයෙක් වේ නම් මෙය අග්‍ර ය. මහණෙනි, ආමිස අනුග්‍රහය ධර්මානුග්‍රහයැ යි මේ අනුග්‍රහ දෙකෙකි. මහණෙනි, මේ අනුග්‍රහ දෙක අතුරෙන් ධර්මානුග්‍රහය යන යමෙක් වේ නම් මෙය අග්‍ර ය.

භාග්‍යවත්හු මෙ කරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "භගවත්හු උතුම් වූ නිරුත්තරවූ යම් දානයක් වදාළ ද, (උතුම්) යම් දානසංවිභාගයක් වැණූහු ද, අග්‍ර වූ පින්කෙතෙහි පහන් සිත් ඇති, මැනැවින් අනුසස් දන්නා, කවර නම් නුවණැත්තෙක් සුදුසු කල්හි ඒ දන් නො දෙන්නේ ද.

3. බුදුරදුන්ගේ ශාසනයෙහි පහන් සිත් ඇති යම් (දෙශක) කෙනෙක් කියද්ද, යම් (ප්‍රතිග්‍රාහක) කෙනෙකුන් අසද්ද, ඒ දෙ පක්ෂය පිළිබඳ ධර්මදානාදි පරමාර්ථය (ක්ලෙශමල විශොධනයෙන්) පිරිසිදු වෙයි. යම් කෙනෙක් බුද්ධානුශාසනයෙහි අප්‍රමත්ත වෙත් නම් (ඔවුන්ගේ) පරමාර්ථය (අර්හත්ඵලවිශුද්ධියෙන්) අතිශයින් පිරිසිදු වේ."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 5. 10

### [ තෙවිජ්ජසුත්තං ]

99. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ධම්මෙනාහං භික්ඛවෙ තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤපෙමි නාඤ්ඤං ලපිතලාපනමත්තෙන.

කථඤ්ච භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤපෙමි නාඤ්ඤං ලපිතලාපනමත්තෙන?

ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං.[1] තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. අයමස්ස පඨමා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාති. අයමස්ස දුතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

1. උදපාදිං - කත්ථචි.

3. 5. 10.

[ත්‍රෛවිද්‍ය සූත්‍රය]

99. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මම් (සම්‍යක්ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත) කාරණයෙන් ත්‍රිවිද්‍යා ඇතියහු බ්‍රාහ්මණයා කොට පණවමි. (අට්ටකාදි භාෂිත්) කී දෑ කියන පමණින් ත්‍රෛවිද්‍යයාගෙන් අන්‍ය වූ එකකු බ්‍රාහ්මණ කොට නො පණවමි.

මහණෙනි, කෙසේ නම් කාරණයෙන් ත්‍රෛවිද්‍යක බ්‍රාහ්මණයා පණවම් ද, ලපිතලාපන මාත්‍රයෙන් නො පණවම් ද?

මහණෙනි, මේ ශාසනයෙහි යම් මහණෙක් නන්වැදෑරුම් වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි: ඒ මෙසේ යි. එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පනස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියදහස් ජාතියක් ද, නොයෙක් නැසෙන කල්පයන් ද, නොයෙක් වැඩෙන කල්පයන් ද, නොයෙක් නැසෙන වැඩෙන කල්පයන් ද, අසෝ තැනැ වීමි. එහි මෙනම් ඇත්තෙම් වීමි. මෙනම් ගොත්‍ර ඇත්තෙම් වීමි. මෙබඳු පැහැ ඇත්තෙම් වීමි, මෙබඳු අහර ඇත්තෙම් වීමි, මෙබඳු සැප දුක් විඳින්නෙම් වීමි, මෙබඳු ආයු සීමාවක් ඇත්තෙම් වීමි. ඒ මම් එයින් සැව මෙහි උපනිමි යි මෙසේ ආකාර සහිත ව, උද්දෙසීම් සහිතව, නන් වැදෑරුම් පෙර වුසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. ඔහු විසින් මේ පළමු වන විද්‍යාව ලද්දේ ය. ඔහුගේ පූර්වේනිවාසය වසා ලන මෝහය නැසුනේ ය, (පූර්වේනිවාසය දක්න ගන්නා) විද්‍යාව පහළ විය. මෝහඳුර නැසින. විද්‍යාලෝකය උපන. අප්‍රමත්ත ව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති ව කායජීවිතයෙහි අපෙක්‍ෂා රහිත ව, වසන්නකුට යම්සේ ද එසේ ය.

මහණෙනි, නැවත අනෙකක් කියමි: ඒ මහණ තෙමේ පිරිසිදුවූ මිනිසැස ඉක්මැ පැවැත්තාවූ දිවැසින් චුත වන්නාවූ ද උපදින්නාවූ ද, (ජාතිගොත්‍රා-දියෙන්) හීන වූ ද (ජාතිගොත්‍රාදියෙන්) ප්‍රණීත වූ ද, මන වඩන රූසපුව ඇත්තාවූ ද, විරූපවර්ණ ඇත්තාවූ ද, යහපත් ගති ඇත්තාවූ ද, නපුරුගති ඇත්තාවූ ද සත්ත්වයන් දකී කම් වූ පරිද්දෙන් (ඒ ඒ භවයට) ගියාවූ සත්ත්වයන් දනියි: පින්වත් මේ සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍ය්‍යයන්ට උපවාද කරන්නාහු, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු, මිථ්‍යාදෘෂ්ටි-කර්ම සමාදන් කොට ගත්තාහු වෙත්. ඔහු තුමූ කායභෙදයෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවශ ව පතිත වන නිරයට පැමිණියාහ. මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්විත වූවාහු, වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනෝසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට උපවාද නොකරන්නාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්මසමාදානය ඇත්තාහු වෙත්. ඔහු තුමූ කායභෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග-ලෝකයෙහි උපන්නාහු යි. මෙසේ මිනිසැස ඉක්මැ පැවැත්තාවූ පිරිසිදු වූ දිවැසින්, චුත වන්නාවූ ද උපදින්නාවූ ද හීනවූ ද ප්‍රණීත වූ ද යහපත් වර්ණ ඇත්තාවූ ද දුර්වර්ණවූ ද යහපත් ගති ඇත්තාවූ ද නපුරු ගති ඇත්තා-වූ ද සත්ත්වයන් දකියි. කම් වූ පරිද්දෙන් (ඒ ඒ භවයට) ගියා වූ සත්ත්වයන් දනියි. ඔහු විසින් මේ දෙවෙනි (දිබ්බචක්ඛු) විද්‍යාව ලබන ලද්දේ වෙයි. (ච්‍යුතිප්‍රතිසන්ධිප්‍රතිච්ඡාදක) අවිද්‍යාව නැසිණ විද්‍යාව උපන මෝහඳුර නසන ලදී. විද්‍යාලෝකය උපන. අප්‍රමත්ත වූ, වීර්‍ය්‍යයෙන් යුත්, කාය ජීවිත දෙක්හි නිරපෙක්‍ෂ වැ වසන්නකුට යම්සේ ද, එමෙනි.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයමස්ස තතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

එවං ඛො අහං භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤපෙමි නාඤ්ඤං ලපිතලාපනමත්තෙනා'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි.

3. එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

**පඤ්චමො වග්ගො**

**තස්සුද්දානං:**

පසාදජීවිතසංඝාටි අග්ගි උපපරික්ඛයා
උප්පත්ති කාම කල්‍යාණං දානං ධම්මෙන තෙ දසා'ති

**තිකනිපාතො නිට්ඨිතො**

මහණෙනි, නැවත අනෙකක් කියමි: ඒ මහණ තෙමේ ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් ආශ්‍රව රහිත වූ, ඵලසමාධිය ද ඵලප්‍රඥව ද මේ අත්බැව්හිදී ම තෙමේ ම විශිෂ්ට ඥනයෙන් දැන, ප්‍රත්‍යක්‍ෂ කොට, එයට පැමිණ වෙසෙයි. ඔහු විසින් මේ තෙවෙනි (අර්හත්ත්වමාර්ගී) විද්‍යාව ලබන ලද්දේ වෙයි. (චතුසත්‍යප්‍රතිච්ඡාදක) අවිද්‍යාව නැසින. මොහඳුර නසන ලදී. විද්‍යාලොකය උපන. අප්‍රමත්ත ව වීර්‍ය්‍යයෙන් යුත් හරණ ලද ආත්ම ස්නෙහය ඇති ව වසන්නහුට යම්සේ ද එ මෙනි.

මහණෙනි, මෙසේ වනාහි මම් කාරණයෙන් ත්‍රෛවිද්‍යක බ්‍රාහ්මණයා පණවමි. පෙර සිටි සෑෂින් කියන ලද්ද කී පමණින් ත්‍රෛවිද්‍යකයාගෙන් අන්‍ය වූ එකකු බමුණකු කොට නො පණවමි.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්‍ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් ක්‍ෂීණාශ්‍රවයෙක් තෙම පෙර වුසූ කඳපිළිවෙළ දනී ද, ස්වර්ගය හා අපාය (දිවැසින්) දකී ද, යළි විශිෂ්ට ඥනයෙන් දැන (සිවුමඟින්) කටයුතු නිම කෙළේ ද, අර්හත්ත්වඵලයට පැමිණියේ ද,

3. මේ ත්‍රිවිද්‍යාව කරණ කොට ගෙණ බ්‍රාහ්මණ තෙම ත්‍රෛවිද්‍යක වේ. මම් ඔහු ත්‍රිවිද්‍යාවෙන් යුක්ත යැ යි කියමි. පෙර සිටියන් විසින් කියන ලද වචන කීම් මාත්‍රයෙන් ත්‍රෛවිද්‍යකයාගෙන් අන්‍ය වූ එකකු (බ්‍රාහ්මණ කොට) නො කියමි."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

**පස්වැනි වර්ගය යි.**

එහි උද්දානය:

පසාද, ජීවිත, සංඝාටි, අග්ගි, උපපරික්ඛා, උපපත්ති, කාම, කල්‍යාණ, දාන, ධම්ම (ආදි තෙවිජ්ජ) සූත්‍රය යි ඔහු දස දෙනෙකි.

**තිකනිපාතය නිමි.**

---

# චතුක්කනිපාතො

## 4. 1. 1.

### [ බ්‍රාහ්මණසුත්තං ]

100. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සදා පයතපාණි අන්තිමදෙහධරො අනුත්තරො භිසක්කො සල්ලකත්තො.[1] තස්ස මෙ තුම්හෙ පුත්තා ඔරසා මුඛතො ජාතා ධම්මජා ධම්මනිම්මිතා ධම්මදායාදා නො ආමිසදායාදා.

ද්වෙ'මානි භික්ඛවෙ දානානි ආමිසදානඤ්ච ධම්මදානඤ්ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදානං.

ද්වෙ'මෙ භික්ඛවෙ සංවිභාගා ආමිසසංවිභාගො ච ධම්මසංවිභාගො ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සංවිභාගානං යදිදං ධම්මසංවිභාගො.

ද්වෙ'මෙ භික්ඛවෙ අනුග්ගහා ආමිසානුග්ගහො ච ධම්මානුග්ගහො ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං අනුග්ගහානං යදිදං ධම්මානුග්ගහො.

ද්වෙ'මෙ භික්ඛවෙ යාගා ආමිසයාගො ච ධම්මයාගො ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං යාගානං යදිදං ධම්මයාගොති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යො ධම්මයාගං අයජී අමච්ඡරී
තථාගතො සබ්බභූතානුකම්පී,
තං තාදිසං දෙවමනුස්සසෙට්ඨං
සත්තා නමස්සන්ති භවස්ස පාරගූ"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

1. සල්ලකන්තො.

# චතුෂ්කනිපාතය

## 4. 1. 1.

### [ බ්‍රාහමණ සූත්‍රය ]

100. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, (කැමැති සේ ධර්මදානය කරණ හෙයින්) ඉල්ලීමට සුදුසු වූ හැම කල්හි (ධර්මදානය සඳහා) පිරිසිදු කළ අත් ඇති, අන්තිම සිරුරක් දරණ (සංසාරදුඃඛරොගයන්ට පිළියම් කරණ හෙයින්) උසස් වෛද්‍යවරයෙක් වූ, (රාගාදි හුල් උපුටා ලන හෙයින්) ශල්‍යකර්තෘවෛද්‍යවරයෙක් වූ මම් වනාහි (බැහැර කළ පව් ඇති හෙයින් පරමාර්ථ) බ්‍රාහමණයෙක්මි. තෙපි වනාහි ඒ මාගේ (මුඛයෙන් දෙශිත ධර්මයෙන් උපන් හෙයින්) මුඛයෙන් උපන් (ශාසනධර්මයෙහි උපන් හෙයින්) ධර්මජ වූ, ධර්මයෙන් ම නිර්මිත වූ, ධර්මය දායාද කොට ඇති, ආමිසය දායාද කොට නැති ඖරස පුත්‍රයෝ වහු.

මහණෙනි, ආමිසදානය ධර්මදානයා යි මේ දාන දෙකෙකි. මහණෙනි, මේ දාන දෙක අතුරෙන් යම් මේ ධර්මදානයක් වේ නම් එය අග්‍ර ය.

මහණෙනි, ආමිසසංවිභාගය ධර්මසංවිභාගයා යි මේ සංවිභාග දෙකෙකි. මහණෙනි, මේ සංවිභාග දෙක අතුරෙන් යම් ධර්මසංවිභාගයෙක් වේ නම් මෙය අග්‍ර ය.

මහණෙනි, ආමිසානුග්‍රහය ධර්මානුග්‍රහය යැ යි මේ අනුග්‍රහ දෙකෙකි. මහණෙනි, මේ අනුග්‍රහ දෙක අතුරෙන් යම් ධර්මානුග්‍රහයෙක් වේ නම් මෙය අග්‍ර ය.

මහණෙනි, ආමිසයාගය ධර්මයාගය යැ යි මේ යාග දෙකෙකි. මහණෙනි, මේ යාග දෙක අතුරෙන් යම් ධර්මයාගයෙක් වේ නම් මෙය අග්‍ර ය.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "මසුරුමල රහිත වූ සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇති යම් තථාගතයන් වහන්සේ කෙනෙක් ධර්මදානය දුන් සේක් ද, දෙව් මිනිසුන් අතරෙහි ශ්‍රෙෂ්ඨ වූ භවයාගේ පරතෙරට පැමිණි එබඳු වූ තථාගතයන් වහන්සේට සත්ත්වයෝ නමස්කාර කෙරෙත්."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 2.

## [ චතුරනවජ්ජසුත්තං ]

101. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. චත්තාරිමානි භික්ඛවෙ අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානි. කතමානි චත්තාරි?

පංසුකූලං භික්ඛවෙ චීවරානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං. පිණ්ඩියාලොපො භික්ඛවෙ භොජනානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං. රුක්ඛමූලං භික්ඛවෙ සෙනාසනානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං. පූතිමුත්තං භික්ඛවෙ භෙසජ්ජානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානි.

යතො ඛො භික්ඛවෙ භික්ඛු අප්පෙන ච තුට්ඨො හොති සුලභෙන ච. ඉමස්සාහං අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගන්ති වදාමී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "අනවජ්ජෙන තුට්ඨස්ස අප්පෙන සුලභෙන ච,
න සෙනාසනමාරබ්භ චීවරං පානභොජනං,
විඝාතො හොති චිත්තස්ස දිසා නප්පටිහඤ්ඤති.

3. යෙ චස්ස ධම්මා අක්ඛාතා සාමඤ්ඤස්සානුලොමිකා,
අධිග්ගහිතා තුට්ඨස්ස අප්පමත්තස්ස භික්ඛුනො."[1].

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 3.

## [ ආසවක්ඛයසුත්තං ]

102. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං.:

1: ජානතො'හං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො අපස්සතො, කිඤ්ච භික්ඛවෙ ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති?

---

1. සික්ඛතො, (සී. ක.) සී. අ. මු.

4. 1. 2.

[චතුරනවද්‍ය සූත්‍රය.]

101. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සවල්ප වූ ද සුලභ වූ ද මේ ප්‍රත්‍යයයෝ සිවු දෙනෙක් වෙත් ඔහු නිදොස් ද වෙති. කවර සිවු දෙනෙක් ද යත්:

මහණෙනි, චීවර අතුරෙන් පංසුකූලචීවරය සවල්ප ද සුලභ ද වේ. එය නිදොස් ද වේ. මහණෙනි, භොජනයන් අතුරෙන් පිඬු සිඟීමෙන් ලත් භොජනය සවල්ප ද සුලභ ද වේ. එය නිදොස් ද වේ. මහණෙනි, සෙනසුන් අතුරෙන් රුක්මුල් සෙනසුන සවල්ප ද සුලභ ද වේ. එය නිදොස් ද වේ. මහණෙනි, බෙහෙත් අතුරෙන් පූතිමුත්‍ර නම් වූ බෙහෙත සවල්ප ද සුලභ ද වේ. එය නිදොස් ද වේ.

මහණෙනි, සවල්ප වූ ද සුලභ වූ ද නිදොස් වූ ද මේ ප්‍රත්‍යයයෝ සිවු දෙන වෙත්.

මහණෙනි, යම් හෙයකින් මහණ තෙමේ සවල්ප වූ ද සුලභ වූ ද ප්‍රත්‍යය-යෙන් සතුටු වූයේ වේ ද ඒ (සතුට) මේ මහණහුගේ මහණදම් පිළිබඳ එක් අඞ්ගයෙකැ යි මම් කියමි.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "සවල්ප වූ ද සුලභ වූ ද නිදොස් වූ ද ප්‍රත්‍යයයෙන් සතුටු වූවහුගේ සෙනසුන ද, සිවුර ද ගිලන්පස හා පිණ්ඩපාතය ද අරබයා සිතැ දුකෙක් නැත්තේ ය. (ඔහුට) දිසා ද පටහැනි නො වේ.

3. මහණදම්ට අනුලොම් වූ යම් ප්‍රතිපත්ති ධර්ම කෙනෙක් කියන ලද්දාහු ද (ඒ ධර්මයෝ) සතුටු සිත් ඇති අප්‍රමත්ත වූ මේ මහණහු විසින් (විරුද්ධ ධර්මයන් මැඩ) අයත් කැරැ ගත්තා ලද්දාහු වෙත්."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

4. 1. 3.

[ආස්‍රවක්ෂය සූත්‍රය]

102. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මම දන්නාහට ද දක්නාහට ද ආස්‍රවක්ෂයය (ආයර්මාර්ගාධි-ගමය) කියමි. මහණෙනි, කුමක් දන්නාහට, කුමක් දක්නාහට ආස්‍රවක්ෂය වේ ද?

ඉදං දුක්ඛන්ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛසමුදයො'ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛනිරොධො'ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. එවං ඛො භික්ඛවෙ ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො,
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා.

3. තතො අඤ්ඤා විමුත්තස්ස විමුත්තිඤාණමුත්තමං,
උප්පජ්ජති ඛයෙ ඤාණං ඛීණා සංයොජනා ඉති.

4. න ත්වෙවිදං[1] කුසීතෙන බාලෙන අවිජානතා,
නිබ්බානං අධිගන්තබ්බං සබ්බගන්ථපපමොචන"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 4.

### [ සමණබ්‍රාහ්මණසුත්තං ]

103. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛසමුදයො'ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං නප්පජානන්ති, න මෙ තෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, න ච පනෙතෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං පජානන්ති, අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානන්ති. තෙ ඛො'මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී'ති.

---

1 න තෙවිදං - සී.අ.මු,

මහණෙනි, මේ (සක්කායප්‍රවෘත්තිය) දුක යැයි දන්නාහට ද දක්නාහට ද ආශ්‍රවක්ෂය වෙයි. මහණෙනි, මේ දුක්ඛසමුදය යැයි දන්නාහට ද දක්නාහට ද ආශ්‍රවක්ෂය වෙයි. මහණෙනි, මේ දුක්ඛනිරෝධයැ යි දන්නාහට ද දක්නාහට ද ආශ්‍රවක්ෂය වෙයි. මහණෙනි, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාව යැ යි දන්නාහට ද දක්නාහට ද ආශ්‍රවක්ෂය වෙයි. මහණෙනි, මෙපරිද්දෙන් වනාහි දන්නාහට ද දක්නාහට ද ආශ්‍රවක්ෂය වෙයි.

භාග්‍යවත්හු මෙකරුණ වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පිළිවෙළින් ආර්‍යමාර්ගය උපදවන (ඍජුමාර්ග සඞ්ඛ්‍යාත ආර්‍යමාර්ගය අනුව හැසිරෙන) ත්‍රිවිධ ශික්ෂා වඩන සෙඛ පුද්ගලයාහට පළමු කොට රහත්මග නුවණ උපදී. එයට අනතුරුව අර්හත්ඵලය උපදී.

3. නැවත රහත්ඵල විමුක්තියෙන් මිදුනහුට උතුම් විමුක්තිඥානය ද, සංයෝජනයෝ ක්ෂීණ වූහ යි ආශ්‍රවක්ෂයයෙහි (ප්‍රහීණ කෙලශ ප්‍රත්‍යවෙක්ෂා) ඥානය ද උපදී.

4. (අභිධ්‍යාදි) සියලු කෙලශග්‍රන්ථයන්ගෙන් මිදීමට නිමිත්ත වූ මේ නිර්වාණය (චතුසත්‍යධර්මයන්) නොදන්නාවූ අඥාන වූ කුසීත පුද්ගලයා විසින් ලබන්නට නොහැක්කේ ය."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

## 4. 1. 4.

## [ සමණබ්‍රාහ්මණ සූත්‍රය ]

103. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ දුක යැ යි තතු සේ නො දනිද් ද, මේ දුක්ඛසමුදය යැ යි තතු සේ නො දනිද්ද, මේ දුක්ඛනිරෝධයැ යි තතු සේ නො දනිද්ද, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපත්තිය යැ යි තතු සේ නො දනිද්ද. මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ යැ යි මා විසින් සම්මත නො කරණු ලැබෙත්. බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ යැ යි සම්මත නො කරණු ලැබෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රාමණ්‍යාර්ථය හෝ බ්‍රාහ්මණ්‍යාර්ථය හෝ මේ අත්බව්හි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට එළඹ වාසය නො කෙරෙත්.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ දුක යැ යි තතු සේ දනිද්ද, මේ දුක්ඛසමුදය යැ යි තතු සේ දනිද්ද, මේ දුක්ඛනිරෝධ යැ යි තතු සේ දනිද්ද, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපත්ති යැ යි තතු සේ දනිද්ද. මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙන් ශ්‍රමණ යැ යි ද මා විසින් සම්මත කරණු ලැබෙත්. බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රාහ්මණ යැ යි ද සම්මත කරණු ලැබෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රාමණ්‍යාර්ථය හෝ බ්‍රාහ්මණ්‍යාර්ථය හෝ මේ අත්බව්හි ම තුමූ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙරෙත්.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යෙ දුක්ඛං නප්පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං,
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති,
තඤ්ච මග්ගං න ජානන්ති දුක්ඛූපසමගාමිනං.

3. චෙතොවිමුත්තිහීනා තෙ අථො පඤ්ඤාවිමුත්තියා,
අභබ්බා තෙ අන්තකිරියාය තෙ වෙ ජාතිජරූපගා

4. යෙ ච දුක්ඛං පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං,
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති,
තඤ්ච මග්ගං පජානන්ති දුක්ඛූපසමගාමිනං.

5. චෙතොවිමුත්තිසම්පන්නා අථො පඤ්ඤාවිමුත්තියා,
භබ්බා තෙ අන්තකිරියාය න තෙ ජාතිජරූපගා"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 5.

## [ සීලසම්පන්නසුත්තං ]

104. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤා-සම්පන්නා විමුත්තිසම්පන්නා විමුත්තිඤාණදස්සනසම්පන්නා ඔවාදකා විඤ්ඤාපකා සන්දස්සකා සමාදපකා සමුත්තෙජකා සම්පහංසකා අලං සමක්ඛාතාරො සද්ධම්මස්ස.

දස්සනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. සවණම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. උපසඞ්කමනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. පයිරුපාසනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. අනුස්සරණම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. අනුපබ්බජ්ජම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් කෙනෙක් (ස්කන්ධප්‍රවෘත්තිය) දුක යැ යි නො දනිද්ද, යළි දුකට හෙතුව නො දනිද්ද, යම් තැනෙක්හි හැම ලෙසින් ඉතිරි නොකොට දුක් නැති වේ නම් (එ නිවණ) නො දනිද්ද, දුක් සංහිඳීමට පමුණුවන (ආර්‍ය්‍ය) මාර්ගයත් නො දනිද්ද,

3. ඔවුහු අර්හත්ඵලසමාධියෙන් පිරිහුනාහු යළි අර්හත්ඵල ප්‍රඥාවෙන් පිරිහුනාහු වෙත්. ඔහු දුක් කෙළවර කිරීමට සුදුස්සෝ නො වෙත්. ඒකාන්තයෙන් ඔහු ජාතිජරාදි දුකට පැමිණියෝ වෙත්

4. යම් කෙනෙකුත් දුක යැ යි මනා සේ දනිද්ද, යළි දුකට හෙතුව දනිද්ද, යම් තැනෙක්හි හැම ලෙසින් ඉතිරි නොකොට දුක් නැති වේ නම් (ඒ නිවණ) දනිද්ද, දුක් සංහිඳීමට පමුණුවන (ආර්‍ය්‍ය) මාර්ගයත් දනිද්ද,

5. ඔවුහු ඵලසමාධියෙන් යුක්ත වූවාහු, යළි ඵලප්‍රඥාවෙන් යුක්ත වූවාහු දුක් කෙළවර කිරීමට සුදුස්සෝ වෙත්. ඒකාන්තයෙන් ඔහු ජාති-ජරාදි දුකට නො පැමිණෙත්."

මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 5.

## [ සීලසම්පන්න සූත්‍රය ]

104. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලද්දේ ය:

1. මහණෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් සිල්වත් වූවාහු, සමාධියෙන් යුක්ත වූවාහු, ප්‍රඥාවෙන් යුක්ත වූවාහු, ඵලවිමුක්තියෙන් යුක්ත වූවාහු, විමුක්ති-ඥානදර්ශන (ප්‍රත්‍යවෙක්ෂාඥාන) යෙන් යුක්ත වූවාහු වෙද්ද, අවවාද දෙන්නාහු, කරුණු දන්වන්නාහු, කරුණු දක්වන්නාහු, සමාදන් කරවන්නාහු (උත්සාහවත් කැරවීමෙන්) තෙද ගන්වන්නාහු (අනුසස් දැක්වීමෙන්) සතුටු කරවන්නාහු වෙද්ද, (අනුග්‍රහයෙන්) සද්ධර්මය දේශනා කිරීමෙහි පොහොසත් වූවාහු වෙත්ද

මහණෙනි, ඒ භික්ෂූන්ගේ දැකීම ද බෙහෙවින් උපකාරියැ යි මම් කියමි. මහණෙනි, ඒ භික්ෂූන්ගේ ඇසීම ද බෙහෙවින් උපකාරී යැ යි මම් කියමි. මහණෙනි, ඒ භික්ෂූන් කරා එළැඹීම ද බෙහෙවින් උපකාරී යැයි මම් කියමි මහණෙනි, ඒ භික්ෂූන් (වතාවත් කිරීමෙන්) පයිර්‍යුපාසනය කිරීම ද බෙහෙවින් උපකාරීයැයි මම් කියමි. මහණෙනි, ඒ භික්ෂූන් සිහි කිරීම ද බෙහෙවින් උපකාරී යැ යි මම් කියමි. මහණෙනි, ඒ භික්ෂූන් අනුව පැවිදිවීම ද බෙහෙවින් උපකාරී යැ යි මම් කියමි.

තං කිස්ස හෙතු?

තථාරූපෙ භික්ඛවෙ භික්ඛූ සෙවතො භජතො පයිරුපාසතො අපරිපූරො'පි සීලක්ඛන්ධො භාවනාපාරිපූරිං ගච්ඡති. අපරිපූරො'පි සමාධික්ඛන්ධො භාවනාපාරිපූරිං ගච්ඡති. අපරිපූරො'පි පඤ්ඤාක්ඛන්ධො භාවනාපාරිපූරිං ගච්ඡති. අපරිපූරො'පි විමුත්තික්ඛන්ධො භාවනාපාරිපූරිං ගච්ඡති. අපරිපූරො'පි විමුත්තිඤාණදස්සනක්ඛන්ධො භාවනාපාරිපූරිං ගච්ඡති.

එවරූපා ච තෙ භික්ඛවෙ, භික්ඛූ සත්ථාරොති'පි වුච්චන්ති, සත්ථවාහාති'පි වුච්චන්ති, රණඤ්ජහාති'පි වුච්චන්ති, තමොනුදාති'පි වුච්චන්ති, ආලොකකරාති'පි වුච්චන්ති, ඔභාසකරාති'පි වුච්චන්ති, පජ්ජොතකරාති'පි වුච්චන්ති, උක්කාධාරාති'පි වුච්චන්ති, පභඞ්කරාති'පි වුච්චන්ති, අරියාති'පි වුච්චන්ති, චක්ඛුමන්තොති'පි වුච්චන්තී ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "පාමොජ්ජකරණට්ඨානං[1] එවං හොති විජානතං,
යදිදං භාවිතත්තානං අරියානං ධම්මජීවිතං.

3. තෙ ජොතයන්ති සද්ධම්මං භාසයන්ති පභඞ්කරා,
ආලොකකරණා ධීරා චක්ඛුමන්තො රණඤ්ජහා.

4. යෙසං වෙ සාසනං සුත්වා සම්මදඤ්ඤාය පණ්ඩිතා,
ජාතික්ඛයමභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භවන්ති."

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 6.

## [ තණ්හුප්පාදසුත්තං ]

105. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. චත්තාරො'මෙ භික්ඛවෙ තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. කතමෙ චත්තාරො?

චීවරහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. පිණ්ඩපාතහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. සෙනාසනහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. ඉතිභවාභවහෙතු වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.

---

1. පාමුජ්ජකරණට්ඨානං. සී. මු.

කවරහෙයින යත්:

මහණෙනි, එබඳු භික්ෂූන් සේවනය භජනය පර්‍ය්‍යුපාසනය කරන්නාහට සම්පූර්ණ නොවූ ශීලස්කන්ධය භාවනාවෙන් සම්පූර්ණ බවට යෙයි. සම්පූර්ණ නොවූ සමාධිස්කන්ධය භාවනාවෙන් සම්පූර්ණ බවට යෙයි, සම්පූර්ණ නොවූ ප්‍රඥාස්කන්ධය භාවනාවෙන් සම්පූර්ණ බවට යෙයි, සම්පූර්ණ නොවූ විමුක්ති-ස්කන්ධය භාවනාවෙන් සම්පූර්ණ බවට යෙයි, සම්පූර්ණ නොවූ විමුක්තිඥාන-දර්ශනස්කන්ධය භාවනාවෙන් සම්පූර්ණ බවට යෙයි.

මහණෙනි, මෙබඳු වූ ඒ භික්ෂූහු (අනුශාසනකරණ හෙයින්) ශාස්තෲහු යැ යි ද කියනු ලැබෙත්. (සසර කතරින් එතෙර කරණ හෙයින්) සාර්ථවාහ යැ යි ද කියනු ලැබෙත්. (රාගාදි කෙලෙස් පහකරණ හෙයින්) රණඤ්ජහ යැ යි ද කියනු ලැබෙත්. (මොහඳුරු දුරු කරණ හෙයින්) තමොනුද යැ යි ද කියනු ලැබෙත්, (ප්‍රඥාලොකය ඇතිකරණ හෙයින්) ආලොකකර යැයි ද කියනු ලැබෙත්. (ප්‍රඥාවභාසය ඇති කරණ හෙයින්) ඕභාසකර යැයි ද කියනු ලැබෙත්. (ප්‍රඥාදීපය ඇතිකරණ හෙයින්) පජ්ජොතකර යැයි ද කියනු ලැබෙත්. (දහම් නමැති ගිනිසුල දරණ හෙයින්) උක්කාධර යැ යි ද කියනු ලැබෙත්. (ප්‍රඥාප්‍රභාව ඇතිකරණ හෙයින්) පභඞ්කර යැයි ද කියනු ලැබෙත්. (ක්ලෙශයන්ගෙන් දුරු වූ හෙයින්) ආර්‍ය්‍ය යැයි ද කියනු ලැබෙත්. (ප්‍රඥාචක්ෂුසගේ ප්‍රතිලාභයෙන්) චක්ඛුමන්තූ (ඇස්ඇත්තෝ) යැ යි ද කියනු ලැබෙත්.

මේකරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “වඩන ලද සිත් සතන් ඇති, දැහැමින් ජීවත් වන සුලු වූ ආර්‍ය්‍යයන්-ගේ යම් දැකීම් ආදියෙක් වේ නම් එය ප්‍රාඥයන්ගේ සතුටට කරුණු වේ.

3. ඥානප්‍රභා ඇති කරණ, ප්‍රඥාලොකය කරණ, ප්‍රඥාචක්ෂුස ඇති කෙලෙස් දුරු කරණ ඒ ප්‍රාඥයෝ සද්ධර්මය ප්‍රකට කෙරෙත්. දහම් එළියෙන් ලොව ආලොකවත් කෙරෙත්.

4. නුවණැත්තෝ යම් ආර්‍ය්‍ය කෙනකුන්ගේ අවවාදය අසා සම්‍යක් ප්‍රඥාවෙන් දත ජාතික්ෂය (සඞ්ඛ්‍යාත අර්හත්ත්වය) අවබොධ කොට එකාන්ත-යෙන් පුනර්භවයට නො යෙත්”.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි.

### 4. 1. 6.

### [ තෘෂ්ණොත්පාද සූත්‍රය ]

105. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, යමක් නිමිති කොට භික්ෂුහට තෘෂ්ණාව උපදී නම් තෘෂ්ණොත්පාද කාරණයෝ මේ සිවු දෙනෙක් වෙත්. කවර සිවු දෙනෙක් ද යත්:

මහණෙනි, චීවරය හෙතු කොට ගෙණ ද භික්ෂුහට තෘෂ්ණාව උපදිනුයේ උපදී. මහණෙනි, පිණ්ඩපාතය හෙතු කොට ගෙණ ද භික්ෂුහට තෘෂ්ණාව උපදිනුයේ උපදී. මහණෙනි, සෙනාසනය හෙතු කොට ගෙණ ද භික්ෂුහට තෘෂ්ණාව උපදිනුයේ උපදී. මහණෙනි, මෙසේ-ප්‍රණීත-අති ප්‍රණීත දෑ හෙතු කොට ගෙණ ද තෘෂ්ණාව උපදිනුයේ උපදී.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජතීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

3. එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 7.

### [ සබ්‍රහ්මකසුත්තං ]

106. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. සබ්‍රහ්මකානි භික්ඛවෙ'තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවකානි[1] භික්ඛවෙ, තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, සපුබ්බාචරියකානි භික්ඛවෙ, තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුනෙය්‍යකානි භික්ඛවෙ, තානි කුලානි යෙසං පුත්තානං මාතා-පිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති.

බ්‍රහ්මා'ති භික්ඛවෙ, මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බදෙවා'ති භික්ඛවෙ, මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බාචරියා'ති භික්ඛවෙ, මාතාපිතූනං එතං අධිවචනං. ආහුනෙය්‍යා'ති භික්ඛවෙ, මාතාපිතූනං එතං අධිවචනං. තං කිස්ස හෙතු?

බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "බ්‍රහ්මා'ති මාතාපිතරො පුබ්බාචරියා'ති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා.

---

1. සපුබ්බදෙවතානි සී. මු.

මහණෙනි, යමක් හෙතු කොට භික්ෂූහට තෘෂ්ණාව උපදිනුයේ උපදී ද, මේ ඒ තෘෂ්ණොත්පාද කාරණයෝ සිවු දෙන වෙති.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "තෘෂ්ණාව දෙවෙනි කොටැති (තෘෂ්ණාව සහාය කොටැති) පුරුෂ තෙම දීර්ඝ කාලයක් මුළුල්ලෙහි හැසිරෙන්නේ මේ ආත්මභාවය ද අනාගත ආත්මභාවය ද ලක්ෂණ කොට ඇති සංසාරය නො ඉක්මෙයි.

3. තෘෂ්ණාව සසර දුකට මුල් වන්නේ යැ යි මෙසේ ආදීනව වශයෙන් දැන පහ කරණ ලද තෘෂ්ණාව ඇති (නැවත භවයෙහි පිළිසඳ ගැන්මක් නැති හෙයින්) ආදාන රහිත වූ, සමෘතිමත් වූ (ක්ෂීණාස්‍රව) භික්ෂු තෙමෙ සංසාර ප්‍රවෘත්තියෙන් ඉවත් වන්නේ ය."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි.

## 4. 1. 7.

## [ සබ්‍රහ්මක සූත්‍රය ]

106. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපිය දෙදෙන සවකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ බ්‍රහ්මයා සහිතයෝ වෙත්. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපිය දෙදෙන සවකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ පූර්වදෙවතාවන් සහිතයෝ වෙත්. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපිය දෙදෙන සවකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ පූර්වාචාර්යයන් සහිතයෝ වෙත්. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මවුපිය දෙදෙන සවකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ සාහුනෙය්‍ය (වෙත පමුණුවා දන් දිය යුත්තන් සහිත)වෙත්.

මහණෙනි, බ්‍රහ්ම යන මෙය මවුපියන්ට නමෙකි. මහණෙනි, පූර්වදෙව යන මෙය මවුපියන්ට නමෙකි. මහණෙනි, පූර්වාචාර්ය යන මෙය මවුපියන්ට නමෙකි. මහණෙනි, ආහුනෙය්‍ය යන මෙය මවුපියන්ට නමෙකි. ඒ කවර හෙයින යත්:

මහණෙනි, මවුපිය දෙදෙන පුත්‍රයනට බෙහෙවින් උපකාර ඇත්තෝ වෙත්. ජීවිතාරක්ෂකයෝ වෙත්. (අත් පා වඩා) පොෂණය කරන්නෝ වෙත්. මේ ලොව (ඉට්ඨ අනිට්ඨ අරමුණු) දක්වන්නෝ වෙත්.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පුත්‍රප්‍රජාවට අනුකම්පා කරණ මවුපිය දෙදෙන පුත්‍රයනට බ්‍රහ්මයෝ යැ යි ද පූර්ව ආචාර්යවරයෝ යැ යි ද (දුරින් ගෙණවුත් දිය යුතු ආහාරාදියට සුදුසු) ආහුනෙය්‍යයෝ යැ යි ද කියනු ලැබෙත්.

3. තස්මා හි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො,
අන්නෙන අථ[1] පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච.

4. තාය නං පාරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධෙව[2] නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතී”ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 8.

## [ බහුකාරසුත්තං ]

107. වුත්තං හෙතං, භගවතා. වුත්තමරහතා’ති මෙ සුතං:

1. බහුකාරා භික්ඛවෙ බ්‍රාහ්මණගහපතිකා තුම්හාකං යෙ තෙ පච්චුපට්ඨිතා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. තුම්හෙ’පි භික්ඛවෙ බහූපකාරා බ්‍රාහ්මණගහපතිකානං යං තෙසං ධම්මං දෙසෙථ ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. එවමිදං භික්ඛවෙ අඤ්ඤමඤ්ඤං නිස්සාය බ්‍රහ්මචරියං වුස්සති ඔඝස්ස නිත්ථරණත්ථාය සම්මා දුක්ඛස්ස අන්තකිරියායා’ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. “සාගාරා අනගාරා ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා,
ආරාධයන්ති සද්ධම්මං යොගක්ඛෙමං අනුත්තරං.

3. සාගාරෙසු ච චීවරං පච්චයං සයනාසනං,
අනාගාරා පටිච්ඡන්ති පරිස්සයවිනොදනං.

4. සුගතං පන නිස්සාය ගහට්ඨා ඝරමෙසිනො,
සද්දහානො අරහතං අරියපඤ්ඤාය ඣායිනො.

5. ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගතිගාමිනං,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනො’ති.”

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

---

1. අථො - මජ්ඣං., PTS.  1. ඉධෙච්ච කත්ථචි.

3. එහෙයින් නුවණැති පුද්ගල තෙමේ ඒ මවුපියනට නමස්කාර කරන්නේ ය. යළි ආහාරයෙන් ද, පානයෙන් ද, වස්ත්‍රයෙන් ද, සයන යෙන් ද, ඇඟ ඉලීමෙන් ද, නැහැවීමෙන් ද, පාදෙවීමෙන් ද, සත්කාර කරන්නේ ය.

4. පණ්ඩිතයෝ මවුපියන් කෙරෙහි ඒ (අත්පා මෙහෙකිරීමාදි) උවටැන් කිරීම නිසා මෙ ලොව දී ඔහු පසසත්. මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද අතිශයින් සතුටු වේ.”

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදි.

## 4. 1. 8.

## [ බහුකාර සූත්‍රය ]

107. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, යම් බමුණු ගැහැවි කෙනෙක් චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් තොපට උවටැන් කරන්නාහු වෙත් ද, ඔහු (තොපට) බෙහෙවින් උපකාර ඇත්තාහු වෙත්. මහණෙනි, තෙපි ද ඒ බමුණු ගැහැවියනට යම් හෙයකින් මුල යහපත් වූ මැද යහපත් වූ අවසන යහපත් වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සියලු ලෙසින් සම්පූර්ණ වූ ධර්මය දෙශනා කරවු ද, පිරිසිදු (ශාසනමාර්ග) බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරවු ද, (එහෙයින්) ඔවුන්ට තෙපි ද බෙහෙවින් උපකාරීහ. මහණෙනි, මෙසේ වනාහි ඔවුනොවුන් ඇසුරු කොට චතුරොඝය තරණය කරණු පිණිස මනා කොට සියලු සසරදුක් කෙළවර කරණු පිණිස මේ බ්‍රහ්මචර්‍ය්‍යය වසනු ලැබේ.

මෙ කරුණ භගවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද යන දෙ පක්ෂය ඔවුනොවුන් ඇසුරු කරන්නාහු (ප්‍රතිපත්ති ප්‍රතිවෙධ) සද්ධර්මය ද, අර්හත්ත්වය හා නිර්වාණ ද සම්පාදනය කෙරෙත්

3. පැවිද්දෙ ගෘහස්ථයන්ගෙන් පීඩා උපද්‍රව දුරු කරණ සිවුරුය සෙන-සුන් ය (පිණ්ඩපාත ගිලන්පස යන) ප්‍රත්‍යය ද පිළිගණිත්.

4. ආර්‍ය්‍ය පුද්ගලයා නිසා ගිහිගෙයි වෙසෙන ගෘහස්ථයෝ රහතුන්ගේ වචන අදහන්නාහු සුවිශුද්ධ ප්‍රඥාවෙන් ධ්‍යාන කරණ සුළු වූවාහු,

5. මේ අත්බැව්හිදී (ලොව් ලොවුතුරු) සැපයට මාර්ගය වූ (ශීලාදි) ධර්මයෙහි හැසිර සතුටු වන සුලු වූවාහු දෙව්ලොවෙහි කාමසැප කැමැත්තාහු සතුටු වෙත්.”

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 9.

### [ කුහසුත්තං ]

108. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. යෙ කෙචි භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා, අපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති.

යෙ ච ඛො භික්ඛවෙ භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා, අනපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්තී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

3. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 10.

### [ පුරිසපියරූපසුත්තං ]

109. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො නදියා සොතෙන ඔවුය්හෙය්‍ය පියරූපසාතරූපෙන. තමෙනං චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො දිස්වා එවං වදෙය්‍ය, "කිඤ්චාපි ඛො ත්වං අම්භො පුරිස නදියා සොතෙන ඔවුය්හසි පියරූපසාතරූපෙන, අත්ථි චෙත්ථ හෙට්ඨා රහදො සඋම්මි සාවට්ටො සගහො සරක්ඛසො, යං ත්වං අම්භො පුරිස, පාපුණිත්වා මරණං වා නිගච්ඡසි මරණමත්තං වා දුක්ඛන්ති." අථ ඛො සො භික්ඛවෙ පුරිසො තස්ස පුරිසස්ස සද්දං සුත්වා හත්ථෙහි ච පාදෙහි ච පටිසොතං වායමෙය්‍ය.

## 4. 1. 9.

### [ කුහ සූත්‍රය ]

109. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදි:

1. මහණෙනි, යම් කිසි භික්ෂු කෙනෙක් කුහක වූවාහු (ජනයන් විස්මය පත් කරන්නාහු) (ක්‍රොධයෙන් හා මානයෙන්) දැඩි සිත් ඇත්තාහු (ප්‍රත්‍යය සඳහා ජනයන්) පොළොඹවන්නාහු, ශාඩගසදෘශ වූවාහු (ප්‍රකට කෙලෙස් ඇත්තාහු) උස් වූ මානනල ඇත්තාහු, එකඟසිත් නැත්තාහු වෙද්ද, මහණෙනි, ඒ භික්ෂූහු මා අයත් වූවෝ නො වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් බැහැර වූවෝ වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි (ශීලාදි ගුණයෙන්) වැඩීමට ද නැගීමට ද මහත් බවට ද නො පැමිණෙත්.

මහණෙනි, යම් කිසි භික්ෂු කෙනෙක් කුහක නොවූවාහු (ප්‍රත්‍යය පිණිස) නොපොළඹවන්නාහු ප්‍රාඥ වූවාහු දැඩි නොවූවාහු එකඟ සිත් ඇත්තාහු වෙද්ද, මහණෙනි, ඒ භික්ෂූහු මා අයත් වූවාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ සස්නෙන් බැහැර නොවූවාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ සස්නෙහි ශීලාදි ගුණයෙන් වැඩීමට ද (අවල ව) නැගීමට ද (පතළ බැවින්) මහත් බවට ද පැමිණෙති.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "යම් භික්ෂු කෙනෙක් කුහක වූවාහු, දැඩි වූවාහු (ජනයන්) පොළඹ-වන්නාහු, ප්‍රකට කෙලෙස් ඇත්තාහු, උස්වූ මාන නළ ඇත්තාහු, එකඟ සිත් නැත්තාහු වෙද්ද, ඒ භික්ෂූහු බුදුරදුන් වදාළ ධර්මයෙහි වැඩීමට නො පැමිණෙත්.

3. (යම් කෙනෙක්) කුහක නොවූවාහු (ප්‍රත්‍යය පිණිස) නොපොළඹ වන්නාහු, ප්‍රාඥ වූවාහු, දැඩි සිත් නැත්තාහු, මනා කොට එකඟ සිත් ඇත්තාහු වෙද්ද, ඔහු එකාන්තයෙන් බුදුරදුන් වදාළ සද්ධර්මයෙහි වැඩීමට පැමිණෙත්."

මෙ කරුණ භගවත්හු විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 10

### [ පුරුෂප්‍රියරූප සූත්‍රය ]

109. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ප්‍රිය ස්වභාවය හා සුඛස්වභාවය ඇති සවර්ණාදි වස්තුව නිසා යම්සේ පුරුෂයෙක් ගඟෙහි සැඩ දිය පහරින් පහලට ගෙණ යනු ලැබේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් ගංතෙර සිටියේ, (ඔහු) දැක මෙසේ කියන්නේ ය: "එම්බල පුරුෂය, තෝ ප්‍රියස්වභාවය හා සුඛස්වභාවය ඇති වස්තුව නිසා ගඟෙහි සැඩ දිය පහරින් පහලට ගෙණ යනු ලැබෙන්නෙහි නමුදු මේ නදියේ පහල රළ සහිත වූ දිය සුළි සහිත වූ ග්‍රාහ (චණ්ඩ මත්ස්‍යාදීන්ගේ ගැණීම්) සහිත වූ දිය රකුසන් සහිත වූ මහවිලෙක් ඇත්තේ ය. එම්බල පුරුෂය, තෝ යම් ඒ විලකට පැමිණ මරණයට හෝ මරණය තරම් දුකකට හෝ පැමිණෙන්නෙහි ද, එසේ වූ විලෙක" (කියාහි.) මහණෙනි, එ කල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ වචනය අසා අතින් ද පයින් ද දියපහර තරණය කරන්නේ ය.

උපමා ඛො මෙ අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයමෙත්ථ අත්ථො:

නදියා සොතො'ති ඛො භික්ඛවෙ, තණ්හායෙතං අධිවචනං. පියරූපසාතරූපන්ති ඛො භික්ඛවෙ ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. හෙට්ඨාරහදො'ති ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං අධිවචනං. සඋම්මීති ඛො භික්ඛවෙ, කොධූපායාසස්සෙතං අධිවචනං. සාවට්ටො'ති ඛො භික්ඛවෙ, පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. සගහො සරක්ඛසො'ති ඛො භික්ඛවෙ මාතුගාමස්සෙතං අධිවචනං. පටිසොතො'ති ඛො භික්ඛවෙ, නෙක්ඛම්මස්සෙතං අධිවචනං. හත්ථෙහි ච පාදෙහි ච වායාමො'ති ඛො භික්ඛවෙ, විරියාරම්භස්සෙතං අධිවචනං. චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො'ති ඛො භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. ''සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ
යොගක්ඛෙමං ආයතිං පත්ථයානො[1]
සම්මප්පජානො සුවිමුත්තචිත්තො
විමුත්තියා ඵස්සයෙ තත්ථ තත්ථ
ස වෙදගූ වුසිතබ්‍රහ්මචරියො
ලොකන්තගූ පාරගතො'ති වුච්චතී''ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

## 4. 1. 11.

### [ චරසුත්තං ]

110. වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං:

1. චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති, චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

ඨිතස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති, ඨිතො'පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

---

1. පත්ථමානො. සීමු.

මහණෙනි, අර්ථාවබෝධයට මා විසින් මේ උපමාව කරණ ලදී මෙහි මේ අර්ථය වේ:

මහණෙනි, ගඟෙහි සැඩ දියපහර යන මෙය තෘෂ්ණාවට නමෙකි. මහණෙනි, ප්‍රියස්වභාවය හා සුඛස්වභාවය ඇති වස්තුව යන මෙය සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයනට නමෙකි. මහණෙනි, පහල (භය සහිත) දියවිල යන මෙය පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයනට නමෙකි. මහණෙනි, රළ යන මෙය ක්‍රෝධයට හා උපායාසයට නමෙකි. මහණෙනි, දියසුළිය යන මෙය පඤ්චකාම ගුණයනට නමෙකි. මහණෙනි, සගහසරකබස යන මෙය මාගමට නමෙකි. මහණෙනි, ප්‍රතිස්‍රොතස යන මෙය නෙක්ඛම්මයට නමෙකි. අත්පාවලින් ව්‍යායාමය යන මෙය සතර සම්‍යක් ප්‍රධන්වීර්‍ය්‍යයට නමෙකි. මහණෙනි, ගංතෙර සිටි ඇස් ඇති පුරුෂයා යන මෙය අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයනට නමෙකි.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “මතු (අනාගාමි බව හා අර්හත්වය) පතන්නාවූ භික්ෂු තෙම දුක් සහිතව ම කාමයන් දුරු කරන්නේ ය. සම්‍යක් ප්‍රඥ ඇති, මොනොවට මිදුනු සිත් ඇති (හෙ තෙම) (මාර්ගඵලාධිගමය කළ) ඒ ඒ අවස්ථාවන්හි විමුක්ති-සඞ්ඛ්‍යාත නිර්වාණය ස්පර්ශ කරන්නේ ය. වෙද සඞ්ඛ්‍යාත මාර්ගඥනයෙන් චතුස්සත්‍යාවබෝධය කළාවූ, වැස නිම වූ බඹසර ඇති ඒ භික්ෂුතෙම සත්ත්ව-ලෝකයෙහි අන්තයට ගියේ යැ යි ද (සසර පරතෙර වූ) නිවණට ගියේ යැ යි ද කියනු ලැබේ”.

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 11.

## [ චරසූත්‍රය ]

110. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, හැසිරෙන්නාවූ ද භික්ෂුහට ඉදින් කාමවිතර්කයක් හෝ ව්‍යාපාදවිතර්කයක් හෝ විහිංසාවිතර්කයක් හෝ උපදී ද, මහණෙනි, ඉදින් ඒ මහණ තෙමේ ඒ විතර්කය ඉවසා ද (තදඞ්ගාදි වශයෙන්) පහ නො කෙරේ ද, (සිතින්) බැහැර නොකෙරේ ද, කෙළවර නොකෙරේ ද, නැවැත නොඉපදීමට නොපමුණුවා ද, මහණෙනි, හැසිරෙන්නාවූ ද මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය නැති, පවෙහි බිය නැති, නිතොර කුසීත වූ වීර්‍ය්‍ය නැත්තෙකැ යි කියනු ලැබේ.

මහණෙනි, ඉදින් සිටියාවූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාද-විතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, ඒ මහණ තෙමේ ඉදින් එම විතර්කය ඉවසා ද, පහ නො කෙරේ ද, බැහැර නො කෙරේ ද, කෙළවර නො කෙරේ ද, නැවැත නොඉපදීමට නොපමුණුවා ද, මහණෙනි, සිටියාවූ ද මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය නැති පවෙහි බිය නැති, නිතොර කුසීත වූ, වීර්‍ය්‍යය නැත්තෙකැ යි කියනු ලැබේ.

නිසින්නස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති, නිසින්නො'පි ඛො භික්ඛවෙ භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

සයානස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති, සයානො'පි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියො'ති වුච්චති.

චරතො චෙ'පි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

ඨිතස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාද-විතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, ඨිතො'පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

නිසින්නස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවා-සෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, නිසින්නො'පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

සයානස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා ව්‍යාපාදවිතක්කො වා විහිංසාවිතක්කො වා. තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, සයානො'පි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චතී"ති.

මහණෙනි, හුන්නාවූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය ඉවසා ද, පහ නො කෙරේ ද, බැහැර නො කෙරේ ද, කෙළවර නො කෙරේ ද, නැවත නොඉපදීමට නොපමුණුවා ද, මහණෙනි, හුන්නාවූ ද මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය නැති, පවෙහි බිය නැති, නිතොර කුසීත වූ, වීර්‍ය්‍ය නැත්තෙකැ යි කියනු ලැබේ.

මහණෙනි, නිදන්නාවූ ද නොනිදන්නාවූ ද මහණහට ඉදින් කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය ඉවසා ද, පහ නො කෙරේ ද, බැහැර නො කෙරේ ද, කෙළවර නො කෙරේ ද, නැවත නොඉපදීමට නො පමුණුවා ද, මහණෙනි, නිදන්නාවූ ද නොනිදන්නාවූ ද මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය නැති, පවෙහි බිය නැති, නිතොර කුසීත වූ, වීර්‍ය්‍ය නැත්තෙකැ යි කියනු ලැබේ.

මහණෙනි, හැසිරෙන්නාවූ ද මහණහට ඉදින් කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, මහණෙනි, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය නො ඉවසා ද, පහ කෙරේ ද, (සිතින්) බැහැර කෙරේ ද, කෙළවර කෙරේ ද, නැවත නොඉපදීමට පමුණුවා ද, මහණෙනි, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති පවෙහි බිය ඇති, නිතොර පටන්ගත් වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයන ලද සිතැත්තෙකැ යි (කායජීවිත දෙක්හි අපෙක්‍ෂා රහිතයෙකැ යි) කියනු ලැබේ.

මහණෙනි, සිටියාවූ ද මහණහට ඉදින් කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, මහණෙනි, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය නො ඉවසා ද, පහ කෙරේ ද, (සිතින්) බැහැර කෙරේ ද, කෙළවර කෙරේ ද, නැවත නොඉපදීමට පමුණුවා ද, මහණෙනි, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, පවෙහි බිය ඇති, නිතොර පටන්ගත් වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයන ලද සිතැත්තෙකැ යි (කායජීවිත දෙක්හි අපෙක්‍ෂා රහිතයෙකැ යි) කියනු ලැබේ.

මහණෙනි, හුන්නාවූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, මහණෙනි, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය නො ඉවසා ද, පහ කෙරේ ද, (සිතින්) බැහැර කෙරේ ද, කෙළවර කෙරේ ද, නැවත නොඉපැදීමට පමුණුවා ද, මහණෙනි, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති පවෙහි බිය ඇති නිතොර පටන්ගත් වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයූ සිතැත්තෙකැ යි (කායජීවිත දෙක්හි අපෙක්‍ෂා රහිතයෙකැ යි) කියනු ලැබේ.

මහණෙනි, නිදන්නා වූ ද නොනිදන්නා වූ ද මහණහට කාමවිතර්කයෙක් හෝ ව්‍යාපාදවිතර්කයෙක් හෝ විහිංසාවිතර්කයෙක් හෝ උපදී ද, ඒ මහණ තෙමේ ඉදින් ඒ විතර්කය නො ඉව සා ද, පහ කෙරේ ද, (සිතින්) බැහැර කෙරේ ද, කෙළවර කෙරේ ද, නැවැත නොඉපදීමට පමුණුවා ද, මහණෙනි, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, පවෙහි බිය ඇති, නිතොර පටන්ගත් වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයූ සිත් ඇත්තෙකැ යි (කායජීවිත දෙක්හි අපෙක්‍ෂා රහිතයෙකැ යි) කියනු ලැබේ

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං,
යො විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං.

3. කුම්මග්ගං පටිපන්නො සො මොහනෙය්‍යෙසු මුච්ඡිතො,
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

4. යො චරං වා'ථ තිට්ඨං වා නිසින්නො උද වා සයං,
විතක්කං සමසිත්වාන විතක්කූපසමෙ රතො,
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති".

## 4. 1. 12.

## [ සම්පන්නසීලසුත්තං ]

111. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. සම්පන්නසීලා භික්ඛවෙ විහරථ, සම්පන්නපාතිමොක්ඛා. පාතිමොක්ඛ-සංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛථ සික්ඛාපදෙසු

සම්පන්නසීලානං භික්ඛවෙ විහරතං සම්පන්නපාතිමොක්ඛානං පාතිමොක්ඛසංවරසංවුතානං විහරතං ආචාරගොචරසම්පන්නානං අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවීනං සමාදාය සික්ඛතං සික්ඛාපදෙසු, කිස්ස භික්ඛවෙ උත්තරිං කරණීයං?

චරතො චෙ'පි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථීනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීණා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා,[1] පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

1 අපම්මුට්ඨා. (මජසං.)

භගවත්හු මේ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන් ද) මෙසේ කියනු ලැබේ:

2. "හැසිරෙන්නාවූ හෝ ඉඳින් සිටින්නාවූ හෝ හුන්නාවූ හෝ නිදන්නා වූ හෝ යම් මහණෙක් තෙමේ ලාමක වූ පඤ්චකාමගුණ ඇසුරු කළ යම් විතර්කයක් කල්පනා කෙරේ ද,

3. නිඤ්ඤිත මාර්ගයට බැසගත්තාවූ, මෝහය උපදවන (රූපාදි අරමුණුවල) මුළා වූ, එබඳු මහණ තෙමේ උතුම් සම්බෝධිය (අර්හත්වමාර්ගඥානය) ස්පර්ශ කරන්නට සුදුස්සෙක් නොවේ.

4. හැසිරෙන්නාවූ හෝ සිටින්නාවූ හෝ හුන්නාවූ හෝ යලි නිදන්නාවූ හෝ මහණෙක් කාමාදි ත්‍රිවිධ) විතර්කයන් සංසිඳුවා, විතර්ක සංසිඳුවාලීමෙහි ඇලුනේ වේ නම් එබඳු මහණ තෙමේ උතුම් අර්හත්වමාර්ගඥානය ස්පර්ශකරන්නට සුදුස්සෙක් වේ"

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

## 4. 1. 12

### [ සම්පන්නසීල සූත්‍රය ]

111. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ම ය. අර්හත් වූ බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, සිල්වත් ව වාසය කරවු. පාතිමොක්ඛසංවරයෙන් යුක්ත ව පාතිමොක්ඛසංවරයෙන් සංවෘත ව ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත ව අණුප්‍රමාණ (ඉතා සුලු) වරදෙහි පවා බිය දක්නා සුලු ව වාසය කරවු. ශික්ෂාපදයන් මනා කොට සමාදන් ව ගෙණ හික්මෙවු.

මහණෙනි, සිල්වත් ව පාතිමොක්ඛසීලයෙන් යුක්ත ව පාතිමොක්ඛ සංවරසීලයෙන් සංවෘත ව ආචාරගොචර දෙකින් යුක්තව, අණුප්‍රමාණ වරදෙහි පවා භය දක්නා සුලු ව වසන, ශික්ෂාපදයන්හි මොනවට සමාදන් ව හික්මෙන තොප විසින් මහණෙනි, මත්තෙහි කුමක් කටයුතු වන්නේ ද?

මහණෙනි, හැසිරෙන්නාවූ ද මහණහට කාමච්ඡන්දය පහ වූයේ වේ ද, ව්‍යාපාදය පහ වූයේ වේ ද, ථීනමිද්ධය පහ වූයේ වේ ද, උද්ධච්චකුක්කුච්චය (නොසංසුන් බව හා කුකුස් බව) පහ වූයේ වේ ද, විචිකිච්ඡාව පහ වූයේ වේ ද, වීර්‍ය්‍යය වඩනා ලද්දේ (එ හෙයින්) නො හැකුළුනේ සිහිය එළඹ සිටියේ (එහෙයින්) නො තවුයේ වේ ද, නාමකය හා රූපකය සංසිඳුනේ (එහෙයින්) දරථ රහිත වේ ද, සිත මනා ව පිහිටියේ (එහෙයින් ම) එකඟ වූයේ වේ ද, මහණෙනි, හැසිරෙන්නාවූ ද මෙබඳු මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති පවට බිය ඇති නිතොර සම්පූර්ණ කරණ ලද වීර්‍ය්‍යය ඇති නිවන් කරා මෙහෙයූ සිතැති (කායජීවිතයෙහි අපේක්ෂා රහිත) තැනැත්තෙ කැයි කියනු ලැබේ.

ඨිතස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීණා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, ඨිතො'පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

නිසින්නස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීණා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, නිසින්නො'පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

සයානස්ස චෙ'පි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීණා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා-සති අසම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, සයානො'පි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චතී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "යතං චරෙ යතං තිට්ඨෙ යතං අච්ඡෙ යතං සයෙ,
යතං සම්මිඤ්ජයෙ භික්ඛු යතමෙනං පසාරයෙ.

3. උද්ධං තිරියං අපාචීනං යාවතා ජගතො ගති,
සමවෙක්ඛිතා ච ධම්මානං ඛන්ධානං උදයබ්බයං.

4. එවං විහාරිමාතාපිං සන්තවුත්තිමනුද්ධතං,
චෙතොසමථසාමීචිං සික්ඛමානං සදා සතං,
සතතං පහිතත්තොති ආහු භික්ඛුං තථාවිධ"න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුතන්ති.

මහණෙනි, සිටියාවූ ද මහණහට අධික ලොභය පහ වූයේ වේ ද, ව්‍යාපාදය පහ වූයේ වේ ද, ථිනමිද්ධය පහ වූයේ වේ ද, උද්ධච්චකුක්කුච්චය පහ වූයේ වේ ද, සැකය පහ වූයේ වේ ද, වීර්‍ය්‍ය පටන්ගන්නා ලද්දේ (එහෙයින්) නොහැකුළුනේ වේ ද, සිහිය එළැඹ සිටියේ (එහෙයින්) නොනටුයේ වේ ද, නාමකය හා රූප කය සන්හිඳුනේ (එහෙයින්) දරථ රහිත වේ ද, සිත මනාව පිහිටියේ (එහෙයින් ම) එකඟ වූයේ වේ ද, මහණෙනි, සිටියා වූ ද, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති පවට බිය ඇති නිතොර පිරිපුන් වීර්‍ය්‍ය ඇති නිවන් කරා මෙහෙයූ සිතැත්තෙකැ යි කියනු ලැබේ.

මහණෙනි, හුන්නාවූ ද මහණහට අධික ලොභය පහ වූයේ වේ ද, ව්‍යාපාදය පහ වූයේ වේ ද, ථිනමිද්ධය පහ වූයේ වේ ද, උද්ධච්චකුක්කුච්චය පහ වූයේ වේ ද, සැකය පහ වූයේ වේ ද, වීර්‍ය්‍ය පිරිපුන් කරණ ලද්දේ (එහෙයින් ම) නොහැකුළුනේ වේ ද, සිහිය එළඹ සිටියේ (එහෙයින් ම, නොනටුයේ ද, නාමකය හා රූපකය සන්හිඳුනේ (එහෙයින් ම) දරථ රහිත වේ ද, සිත මනාව පිහිටියේ (එහෙයින් ම) එකඟවූයේ වේ ද, මහණෙනි, සිටියාවූ ද, මෙබඳු වූ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, පවට බිය ඇති, නිතොර පිරිපුන් වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයූ සිත් ඇත්තෙකැ යි කියනු ලැබේ.

මහණෙනි, නිදන්නාවූ ද නොනිදන්නාවූ ද මහණහට අධික ලොභය පහ වූයේ වේ ද, ව්‍යාපාදය පහ වූයේ වේ ද, ථිනමිද්ධය පහ වූයේ වේ ද, උද්ධච්චකුක්කුච්චය පහ වූයේ වේ ද, විචිකිච්ඡාව පහ වූයේ වේ ද, වීර්‍ය්‍ය පිරිපුන් කරණ ලද්දේ (එහෙයින් ම) නොහැකුළුනේ වේ ද, සිහිය එළඹ සිටියේ (එහෙයින් ම) නොනටුයේ වේ ද, නාම කය හා රූප කය සන්හිඳුනේ (එහෙයින් ම) දරථ රහිත වේ ද, සිත මනා ව පිහිටියේ (එහෙයින් ම) එකඟ වූයේ වේ ද, මහණෙනි, නිදන්නාවූ ද නොනිදන්නාවූ ද මෙබඳු මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, පවට බිය ඇති, නිතොර පිරිපුන් කරණ ලද වීර්‍ය්‍ය ඇති, නිවන් කරා මෙහෙයූ සිත් ඇත්තෙකැ යි කියනු ලැබේ.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "භික්ෂු තෙමේ වීර්‍ය්‍ය වඩනුයේ හැසිරෙන්නේ ය. වීර්‍ය්‍ය වඩනුයේ සිටින්නේ ය. වීර්‍ය්‍ය වඩනුයේ හිඳින්නේ ය. වීර්‍ය්‍ය වඩනුයේ නිදන්නේ ය. වීර්‍ය්‍ය වඩනුයේ අත් පා ඈ හකුළුවන්නේ ය. වීර්‍ය්‍ය වඩනුයේ ( අඟපසඟ ) දිගු කරන්නේ ය.

3. උඩ දිශාවෙහි ද, වටා දිශාභාගයන්හි ද, යට දිශාවෙහි ද යම් තාක් සත්ත්වසංස්කාරලොකයාගේ පැවැත්මෙක් වේ ද, (ඒ හැම තන්හි) (නිස්සත්තනිජ්ජීව) ධම්යන්ගේ ද පඤ්චස්කන්ධයන්ගේ ද උදයව්‍යය (ඇති වීම හා නැති වීම) විදර්ශනා නුවණින් බලන්නෙක් වන්නේ ය.

4. මෙබඳු විහරණ ඇති, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති, ශාන්ත පැවතුම් ඇති, සන්හුන් සිත් ඇති, චිත්තශමථයට සුදුසු ප්‍රතිපත්ති (ඤාණදර්ශනවිශුද්ධිය) වඩන්නාවූ, හැම කල්හි සිහි ඇතියේ වූ භික්ෂු තෙම නිවණ කරා යවන ලද සිත් ඇත්තෙකැ යි (ආර්‍ය්‍යයෝ) කියත්."

මෙ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලද්දේ ය.

## 4. 1. 13.

### [ ලොකාවබොධසුත්තං ]

112. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. ලොකො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකස්මා තථාගතො විසඤ්ඤුත්තො. ලොකසමුදයො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකසමුදයො තථාගතස්ස පහීණො. ලොකනිරොධො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො. ලොකනිරොධො තථාගතස්ස සච්ඡිකතො. ලොකනිරොධගාමිනී පටිපදා භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධා. ලොකනිරොධගාමිනී පටිපදා තථාගතස්ස භාවිතා.

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, යස්මා තං තථාගතෙන අභිසම්බුද්ධං, තස්මා තථාගතො'ති වුච්චති.

යඤ්ච භික්ඛවෙ රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බං තං තථෙව හොති. නො අඤ්ඤථා. තස්මා තථාගතො'ති වුච්චති.

යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී. යථාකාරී තථාගතො තථාවාදී. ඉති යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී. තස්මා තථාගතො'ති වුච්චති. සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො. අඤ්ඤදත්ථුදසො වසවත්තී. තස්මා තථාගතො'ති වුච්චතීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "සබ්බලොකං අභිඤ්ඤාය සබ්බලොකෙ යථාතථං,
සබ්බලොකවිසංයුත්තො සබ්බලොකෙ අනූපයො.

## 4. 1. 13.

## [ ලෝකාවබෝධසූත්‍රය ]

112. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, ලෝකය (දුඃඛසත්‍යය) තථාගත බුදුහු විසින් මනා කොට අවබොධ කරණ ලද්දේ ය. තථාගත තෙම ලොකයෙන් වෙන්වූයේ වෙයි. මහණෙනි, ලෝකයට හේතුව තථාගත බුදුහු විසින් මනා කොට අවබොධ කරණ ලද්දේ ය. ,ලොකයට හෙතුව තථාගත බුදුහු විසින් (සමුච්ඡෙද වශයෙන්) ප්‍රහීණ කරණ ලද්දේ ය. මහණෙනි, තථාගත බුදුහු විසින් ලොකනිරොධය (නිවණ) මනා කොට අවබොධ කරණ ලද්දේ ය. තථාගත බුදුහු විසින් ලොකනිරොධය ප්‍රත්‍යක්‍ෂ කරණ ලද්දේ ය. මහණෙනි, ලොකනිරොධගාමිනීප්‍රතිපත්තිය (අරිඅටැඟිමග) තථාගත බුදුහු විසින් මනා කොට අවබොධ කරණ ලද්දේ ය. ඒ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්‍ගය තථාගත බුදුහු විසින් වඩන ලද්දේ ය.

මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයා විසින් ද, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාව විසින් ද, යමක් දක්න ලද ද, අසන ලද ද, (නැහැය දිව කය යන මෙයින්) සම්ප්‍රාප්තග්‍රාහයෙන් ගන්නා ලද ද, සිතින් දැන ගන්නා ලද ද, (සොයා හෝ නොසොයා) ලබන ලද ද, (ලැබුවක් හෝ නොලැබුවක්) සොයන ලද ද, සිතින් විමසන ලද ද, ඒ සියල්ල යම් හෙයකින් තථාගත බුදුහු විසින් මැනැවින් අවබොධ කරණ ලද්දේ ද, එහෙයින් තථාගත යැ යි කියනු ලැබේ.

මහණෙනි, තථාගත තෙම යම් රාත්‍රියෙක්හි නිරුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙරේ ද, යම් රාත්‍රියෙක්හි අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවේ ද, මේ අතුරෙහි යමක් වදාරා ද, ප්‍රකාශ කෙරේ ද, දක්වා ද, ඒ සියල්ල එසේ ම වේ. අන් පරිද්දෙකින් නො වේ. එහෙයින් තථාගත යැ යි කියනු ලැබේ.

මහණෙනි, තථාගත තෙම යම්සේ කියන්නේ ද, එසේ ම කරන්නේ වේ. තථාගත තෙමේ යම්සේ කරන්නේ ද, එසේ ම කියන්නේ වේ. මෙ පරිද්දෙන් යම්සේ කියන සුලු නම් එසේ කරණ සුලු ය. යම්සේ කරණ සුලු නම් එසේ කියන සුලු ය. එහෙයින් තථාගත යැ යි කියනු ලැබේ. මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි, මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාවෙහි තථාගත තෙම අනුන් මැඩ පවත්වන්නේ අනුන් විසින් නො මඩනා ලද්දේ ය. එකාන්තයෙන් සියල්ල දක්නේ සියල්ල තමා වශයෙහි පවත්වයි. (එ හෙයින්) තථාගත යැ යි කියනු ලැබේ.

මෙ කරුණ භාග්‍යවත්හු වදාළහ. එහි අර්‍ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. “මුළු ලොව (ත්‍රෛධාතුක ලොකසන්නිවාසය) මැනැවින් දැන, මුළු ලොව්හි (දතයුතු සියල්ල තත් වූ පරිද්දෙන් (දැන) සියලු ලොකයෙන් වෙන් වූ, සියලු ලොකයෙහි තෘෂ්ණාදෘෂ්ටි ග්‍රහණ රහිත වූ,

3. සබ්බෙ සබ්බාභිභූ ධීරො සබ්බගන්ථප්පමොචනො,
ඵුට්ඨස්ස පරමා සන්ති නිබ්බානං අකුතොභයං.

4. එස ඛීණාසවො බුද්ධො අනීඝො ඡින්නසංසයො,
සබ්බකම්මක්ඛයං පත්තො විමුත්තො උපධිසඞ්ඛයෙ.

5. එස සො භගවා බුද්ධො එස සීහො අනුත්තරො,
සදෙවකස්ස ලොකස්ස බ්‍රහ්මචක්කං පවත්තයි

6. ඉති දෙවා මනුස්සා ච යෙ බුද්ධං සරණං ගතා,
සංගම්ම තං නමස්සන්ති මහන්තං වීතසාරදං.

7. දන්තො දමයතං සෙට්ඨො සන්තො සමයතං ඉසි,
මුත්තො මොචයතං අග්ගො තිණ්ණො තාරයතං වරො.

8. ඉති හෙතං නමස්සන්ති මහන්තං වීතසාරදං,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලො'ති".

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත්තන්ති.

**චතුක්කනිපාතො නිට්ඨිතො.**

**තස්සුද්දානං:**

බ්‍රාහ්මණ චත්තාරි ජාතං සමණ සීලා තණ්හා බ්‍රහ්මා
බහූකාරා කුහ පුරිසා චර සම්පන්න ලොකෙන තෙරසා'ති.

සත්තවීසෙකනිපාතං දුකං බාවීස සුත්තසඞ්ගහිතං
සමපඤ්ඤාසමථ තිකං තෙරස චතුක්කඤ්ච ඉති යම්දං,
ද්වාදසුත්තරසුත්තසතෙ සඞ්ගායිත්වා සමාදහිංසු පුර
අරහන්තො චිරට්ඨිතියා නමාහු නාමෙන **ඉතිවුත්තකන්ති**

## ඉතිවුත්තකපාළි නිට්ඨිතා.

3. (රූපාදි අරමුණු) සියල්ල මැඩ පවත්වා සිටි ඒ ධීර තෙම ඒකාන්තයෙන් සියලු කෙලෙසග්‍රන්ථයන් මුදා සිටියේ වේ. (ඔහු විසින්) උතුම් නිවණ ඥානස්පර්ශයෙන් ස්පර්ශ කරණ ලදී. ඒ නිර්වාණය කොතැනිනුත් බියක් නැතියෙක.

4. දුක් රහිත වූ, සිඳින ලද සැක ඇති, සියලු කර්මයන්ගේ ක්‍ෂයයට පැමිණියාවූ මේ ක්‍ෂීණාස්‍රව බුදුරජ තෙමේ උපධික්‍ෂය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි (එය අරමුණු කොටැති) ඵල විමුක්තියෙන් මිදුනේ වෙයි.

5. ඒ මේ භගවත් තෙමේ (චතුස්සත්‍යාවබෝධය කළ හෙයින්) බුද්ධ ය. මේ (භගවත්) තෙමේ (උපද්‍රවයන් ඉවසන හෙයින් හා කෙලෙස් නසන හෙයින්) නිරුත්තර සිංහ ය. හේ දෙවියන් සහිත ලොකයාට ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පැවැත්වූයේ ය.

6. මෙසේ යම් දෙව්මිනිස් කෙනෙක් බුදුන් සරණ ගියාහු ද, (ඔවුහු) (ගුණයෙන්) මහත් වූ (චතුවෛශාරද්‍යයෙන්) වීතසාරද වූ උන් වහන්සේ කරා පැමිණ නමස්කාර කරත්.

7. තෙමේ දැමුනේ අනුන් දමනය කරන්නවුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ ය. ශාන්ත වූයේ අනුන් ශාන්ත කරන්නවුන් අතුරෙහි ඍෂි ය. තෙමේ මිදුනේ අනුන් මුදන්නවුන් අතුරෙහි අග්‍ර ය. තෙමේ එතෙර වූයේ එතෙර කරන්නවුන් අතුරෙහි උතුම් ය.

8. මෙසේ ගුණ දන මහත් වූ වීතසාරද වූ ඔබ වහන්සේට (දෙව්මිනිස් ආදීහු) නමස්කාර කෙරෙත්. දෙව්මිනිසුන් සහිත ලොකයෙහි ඔබ වහන්සේට සමාන පුද්ගලයෙක් නැත්තේ ය.''

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මෙසේ මා විසින් අසන ලදී.

**චතුෂ්ක නිපාතය නිමි.**

**උද්දානය:**

බ්‍රාහමණ සූත්‍රය, චතුඅනවජ්ජ සූත්‍රය, ජානතොආසවක්ඛය සූත්‍රය, සමණබ්‍රාහමණ සූත්‍රය, සීලසම්පන්න සූත්‍රය, තණ්හුප්පාද සූත්‍රය, සබ්‍රහ්මක සූත්‍රය, බහුකාර සූත්‍රය, කුහ සූත්‍රය, පුරිසපියරූප සූත්‍රය, චරතොආදිවිතක්ක සූත්‍රය, සම්පන්නසීල සූත්‍රය, ලොකාවබොධ සූත්‍රය - මෙතෙකින් මේ වර්ගයෙහි සූත්‍ර තෙළෙසකි.

සත්විසි සුතුරින් යුත් එකකනිපාතය ද, දෙවිසි සුතුරින් යුත් දුක නිපාතය ද, තැවැත සම්පතස් සුතුරින් යුත් තිකනිපාතය ද, තෙළෙස් සුතුරින් යුක් චතුක්කනිපාතය ද යි යන මේ යමෙක් වේ ද, එහි මේ එක්සිය දොළොසක් සූත්‍ර පෙර රහත්හු ශාසනස්ථිතිය පිණිස සංගායනා කොටැ තුබූවාහු ද, එය නමින් **ඉතිවුත්තක** යැ යි කීහු.

## ඉතිවුත්තක පෙළ නිමි.

## ඛුද්දකනිකායෙ

## ඛුද්දක ධම්මපද උදාන ඉතිවුත්තක ගන්ථානං

# ගාථාදිපාදානුක්කමණිකා

---


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අකක්කසං විඤ්ඤාපනිං | 124 |
| අකතං දුක්කතං සෙය්‍යො | 102 |
| අකත්වා කුසලං කම්මං | 350, 352 |
| අකරොන්තො පි චෙ පාපං | 408 |
| අක්කොච්ඡි මං අවධි මං | 26 |
| අක්කොධනං වතවන්තං | 122 |
| අක්කොධෙන ජිනෙ කොධං | 82 |
| අක්කොසං වධබන්ධං ච | 122 |
| අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා | 390 |
| අක්ඛෙය්‍යං ච පරිඤ්ඤාය | 390 |
| අග්ගතො වෙ පසන්නානං | 438 |
| අග්ගස්මිං දානං දදතං | 440 |
| අග්ගස්ස දාතා මේධාවී | 440 |
| අග්ගෙ ධම්මෙ පසන්නානං | 440 |
| අචරිත්වා බ්‍රහ්මචරියං | 64 |
| අචිරං වතයං කායො | 34 |
| අච්ඡෙච්ඡි වට්ටං බ්‍යගා නිරාසං | 278 |
| අඤ්ඤථාභාවී භවසත්තො | 192 |
| අඤ්ඤා හි ලාභූපනිසා | 75 |
| අට්ඨීනං නගරං කතං | 62 |
| අඩය්හමානො කායෙන | 350 |
| අතිජාතං අනුජාතං | 406 |
| අත්තදත්ථං පරත්ථෙන | 66 |
| අත්තනා චොදයත්තානං | 118 |
| අත්තනා'ව කතං පාපං | 66 |
| අත්තානමෙව පඨමං | 64 |
| අත්තානං චෙ පියං ජඤ්ඤා | 64 |
| අත්තා හවෙ ජිතං සෙය්‍යො | 48 |
| අත්තා හි අත්තනො නාථො | 64 |
| අත්ථම්හි ජාතම්හි සුඛා සහායා | 106 |
| අථ පාපානි කම්මානි | 136 |
| අථ වාස්ස අගාරානි | 58 |
| අදසි මෙ අකාසි මෙ | 16 |
| අදුට්ඨස්ස හි යො දුබ්භෙ | 436 |
| අධිචෙතසො අප්පමජ්ජතො | 212 |
| අනඤ්ඤපොසිං අඤ්ඤාතං | 138 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනත්ථජනනො දොසො | 434 |
| අනත්ථජනනො මොහො | 434 |
| අනත්ථජනනො ලොභො | 432 |
| අනවජ්ජෙන තුට්ඨස්ස | 460 |
| අනවඤ්ඤත්තිසංයුත්තො | 416 |
| අනවට්ඨිතචිත්තස්ස | 34 |
| අනවස්සුතචිත්තස්ස | 34 |
| අනාතාපී අනොත්තාපී | 354 |
| අනික්කසාවො කාසාවං | 28 |
| අනුපුබ්බෙන මෙධාවී | 84 |
| අනුබද්ධො'පි චෙ අස්ස | 444 |
| අනූපවාදො අනූපඝාතො | 212 |
| අනෙකජාතිසංසාරං | 62 |
| අනෙජො සො අනෙජස්ස | 444 |
| අන්ධභූතො අයං ලොකො | 68 |
| අන්නං ච දත්වා බහුනො | 344 |
| අපි දිබ්බෙසු කාමෙසු | 72 |
| අපුඤ්ඤලාභො පි ගති ච පාපිකා | 102 |
| අප්පකා තෙ මනුස්සෙසු | 42 |
| අප්පමත්තො අයං ගන්ධො | 38 |
| අප්පමත්තො පමත්තෙසු | 32 |
| අප්පමාදරතා සන්තා | 370 |
| අප්පමාදරතො භික්ඛු | 32 |
| අප්පමාදං පසංසන්ති | 342 |
| අප්පමාදෙන මඝවා | 32 |
| අප්පමාදො අමතපදං | 30 |
| අප්පම්පි චෙ සහිතං භාසමානො | 30 |
| අප්පලාභො'පි චෙ භික්ඛු | 114 |
| අප්පස්සුතායං පුරිසො | 62 |
| අප්පස්සුතො පුඤ්ඤකරො | 398 |
| අප්පියා චාපි දායාද | 18 |
| අභයෙ භයදස්සිනො | 104 |
| අභිඤ්ඤත්ථං පරිඤ්ඤත්ථං | 356 |
| අභිත්වරෙථ කල්‍යාණෙ | 50 |
| අභිවාදනසීලිස්ස | 46 |
| අභූතවාදී නිරයං උපෙති | 216, 374 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අභෙදි කායො නිරොධි සඤ්ඤා | 316 |
| අයසා'ව මලං සමුට්ඨිතං | 84 |
| අයං ඛො දක්ඛිණා දින්නා | 16 |
| අයං ලොකො සන්තාපජාතො | 192 |
| අයොගෙ යුඤ්ජමත්තානං | 78 |
| අඝොසහතසෙසච | 316 |
| අරක්ඛිතෙන කායෙන | 202 |
| අරියද්දසා වෙදගුනො | 446, 448 |
| අලඞ්කතො චෙපි සමඤ්චරෙය්‍ය | 58 |
| අලජ්ජිතායෙ ලජ්ජන්ති | 104 |
| අවජ්ජෙ වජ්ජමතිනො | 104 |
| අවිරුද්ධං විරුද්ධෙසු | 121 |
| අසජ්ඣායමලා මන්තා | 84 |
| අසතං භාවනමිච්ඡෙය්‍ය | 40 |
| අසාතං සාතරූපෙන | 164 |
| අසාධාරණමඤ්ඤෙසං | 18 |
| අසාරෙ සාරමතිනො | 28 |
| අසාහසෙන ධම්මෙන | 88 |
| අසිප්පජීවී ලහුඅත්ථකාමො | 192 |
| අසුභානුපස්සිං විහරන්තං | 28 |
| අසුභානුපස්සී කායස්මිං | 426 |
| අසෙවනා ච බාලානං | 6 |
| අස්සද්ධො අකතඤ්ඤූ ච | 46 |
| අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො | 60 |
| අහඞ්කාරපසුතා අයං පජා | 270 |
| අහන්නාගොව සඞ්ගාමෙ | 320 |
| අහිංසකා යෙ මුනයො | 82 |
| අහු පුබ්බෙ තදා නාහු | 258 |

| ආ | |
|---|---|
| ආකාසෙ පදං නත්ථි | 88 |
| ආපායිකො නෙරයිකො | 334 |
| ආමන්තයී චුන්දකං නාම භික්ඛුං | 300 |
| ආයන්තිං නාභිනන්දන්ති | 140 |
| ආරති විරති පාපා | 6 |
| ආරොග්‍යපරමා ලාභා | 76 |
| ආසා යස්ස න විජ්ජන්ති | 124 |

| ඉ | |
|---|---|
| ඉති හෙතං නමස්සන්ති | 420 |
| ඉතො භො සුගතිං ගච්ඡ | 422 |
| ඉත්ථභාවඤ්ඤථාභාවං | 448 |
| ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං | 106 |
| ඉදං වො ඤාතීනං හොතු | 14 |

| ඉ | පිට්ඨඞ්කා |
|---|---|
| ඉධ තප්පති පෙච්ච තප්පති | 28 |
| ඉධ ධම්මං චරිත්වාන | 470 |
| ඉධ නන්දති පෙච්ච නන්දති | 28 |
| ඉධ මොදති පෙච්ච මොදති | 28 |
| ඉධ වස්සං වසිස්සාමි | 96 |
| ඉධ සොචති පෙච්ච සොචති | 28 |
| ඉමම්හි චායං සමයෙ | 336, 338 |
| ඉමාය අනුකම්පාය | 422 |
| ඉමෙසු කිර සජ්ජන්ති | 262, 266 |

| උ | |
|---|---|
| උච්ඡින්ද සිනෙහමත්තනො | 96 |
| උට්ඨානකාලම්හි අනුට්ඨහානො | 94 |
| උට්ඨානවතො සතීමතො | 30 |
| උට්ඨානෙනප්පමාදෙන | 30 |
| උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය | 66 |
| උදකං හි නයන්ති නෙත්තිකා | 80, 145 |
| උද්ධං අධො සබ්බධි විප්පමුත්තො | 278 |
| උද්ධං තිරියං අපාචීනං | 480 |
| උන්නමෙ උදකං වට්ඨං | 14 |
| උපධිං පටිච්ච දුක්ඛමිදං | 194 |
| උපනීතවයො'ච දානිසි | 84 |
| උපසන්තසන්තචිත්තස්ස | 220 |
| උපාතිධාවන්ති න සාරමෙන්ති | 274 |
| උය්‍යුඤ්ජන්ති සතීමන්තො | 44 |
| උසභං පවරං වීරං | 126 |

| එ | |
|---|---|
| එකච්චානං න දදති | 408 |
| එකං ධම්මං අතීතස්ස | 344 |
| එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො | 346 |
| එකසෙසකෙන කප්පෙන | 342 |
| එකාසනං එකසෙය්‍යං | 100 |
| එතං ඛො සරණං ඛෙමං | 74 |
| එතං ච සල්ලං පටිච්ච පස්සතො | 270 |
| එතං දළ්හං බන්ධනමාහු ධීරා | 346 |
| එතං නාගස්ස නාගෙන | 210 |
| එතං විසෙසතො ඤත්වා | 30 |
| එතමත්ථවසං ඤත්වා | 96 |
| එතම්හි තුම්හෙ පටිපන්නා | 92 |
| එතාදිසානි කත්වාන | 8 |
| එතාහි තීහි විජ්ජාහි | 456 |

එ — පිට්ඨඞ්කා

එතෙ බො පුත්තා ලොකස්මිං 406
එතෙ ච විඤ්ඤා මනසො විතක්කෙ 200
එතෙ තයො දෙවමනුස්සසෙට්ඨා 426
එතෙ ධම්මෙ භාවයිත්වා 340, 388
එථ පස්සථිමං ලොකං 68
එවමාදීනවං ඤත්වා 332
එවමෙතං යථාභූතං 194
එවමෙව ඉධෙකච්චො 408
එවමෙව තථාගතං 436
එවම්භො පුරිස ජානාහි 86
එවං ඔභාසිතමෙව තක්කිකානං 276
එවං කුසීතමාගම්ම 412
එවං චෙ සත්තා ජානෙය්‍යුං 344
එවං දදන්ති ඤාතීනං 14
එවං මහත්ථිකා එසා 20
එවංවිහාරිමාතාපිං 480
එවංවිහාරී ආතාපී 358
එවං සඞ්ඛාරභූතෙසු 38
එවං සම්මාවිමුත්තානං 316
එස දෙවමනුස්සානං 18
එස මග්ගො මහන්තෙහි 356
එසො නිධි සුනිහිතො 18
එසො’ව මග්ගො නත්ථඤ්ඤො 92

ඔ

ඔභාසති තාව සො කිමි 276
ඔවදෙය්‍යානුසාසෙය්‍ය 42

ක

කණ්හං ධම්මං විප්පහාය 42
කම්මාරාමො භස්සරතො 414
කයිරා චෙ කයිරාථෙනං 102
කරණීයමත්ථකුසලෙන 20
කල්‍යාණමිත්තො යො භික්ඛු 334
කාමතො ජායති සොකො 80
කාමනිස්සරණං ඤත්වා 402
කාමන්ධා ජාලසඤ්ඡන්නා 280
කාමයොගෙන සංයුත්තා 448
කාමෙසනා භවෙසනා 382
කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා 280
කායඤ්ච භිදුරං ඤත්වා 410
කායදුච්චරිතං කත්වා 350, 392
කායදුච්චරිතං හිත්වා 352, 392, 422
කායප්පකොපං රක්ඛෙය්‍ය 82

ක — පිට්ඨඞ්කා

කායමුනිං වාචාමුනිං 394
කායසුචිං වාචාසුචිං 394
කායෙන අමතං ධාතුං 378, 402
කායෙන කුසලං කත්වා 422
කායෙන සංවරො සාධු 114
කායෙන සංවුතා ධීරා 84
කාසාවකණ්ඨා බහවො 374, 442
කිං කයිරා උදපානෙන 286
කිඤ්චාපි සො කම්මං කරොති
පාපකං 12
කිං තෙ ජටාහි දුම්මෙධ 122
කුම්භූපමං කායමිමං විදිත්වා 34
කුසො යථා දුග්ගහීතො 102
කුහා ථද්ධා ලපා සිඞ්ගී 472
කො ඉමං පඨවිං විචෙස්සති 36
කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං 80
කො නු හාසො කිමානන්දො 146

ඛ

ඛන්ති ච සොවචස්සතා 6
ඛන්තී පරමං තපො තිතික්ඛා 72
ඛයං විරාගං අමතං පණීතං 8
ඛීණං පුරාණං නවං නත්ථි
සම්භවං 12
ඛුද්දා විතක්කා සුඛුමා විතක්කා 200

ග

ගතද්ධිනො විසොකස්ස 44
ගන්ත්වාන බුද්ධො නදියං
කකුත්ථං 300
ගබ්භමෙකෙ’පපජ්ජන්ති 54
ගම්භීරපඤ්ඤං මෙධාවිං 124
ගහකාරක දිට්ඨො’සි 64
ගාමෙ අරඤ්ඤෙ
සුඛදුක්ඛඵුට්ඨො 152
ගාමෙ වා යදි වා රඤ්ඤෙ 46
ගාරවො ච නිවාතො ච 6
ගිහීභොගා ච පරිහීණො 442

ච

චක්ඛුනා සංවරො සාධු 114
චක්ඛුමා විසමානීව 226
චක්ඛු සොතං ච ඝාණං ච 348, 350
චත්තාරි ඨානානි නරො පමත්තො 102
චන්දනං තගරං වා’පි 38

| ච | පිට්ඨඞ්කා |
|---|---|
| චරඤ්චෙ නාධිගච්ඡෙය්‍ය | 38 |
| චරන්ති බාලා දුම්මෙධා | 40 |
| චරං වා යදි වා තිට්ඨං | 428 |
| චිරප්පවාසිං පුරිසං | 80 |
| චුතිං යො වෙදි සත්තානං | 126 |
| චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා | 296 |
| චෙතියම්හි ච සඞ්ඝෙ වා | 18 |
| චෙතොවිමුත්තිසම්පන්නා | 464 |
| චෙතොවිමුත්තිහීනා තෙ | 464 |

| ඡ | |
|---|---|
| ඡන්දජාතො අනක්ඛාතෙ | 80 |
| ඡන්නමතිවස්සති | 238 |
| ඡින්ද සොතං පරක්කම්ම | 118 |
| ඡෙත්වා නද්ධිං වරත්තං ච | 122 |

| ජ | |
|---|---|
| ජයං වෙරං පසවති | 76 |
| ජාගරන්තා සුණාථෙතං | 372 |
| ජාතං භූතං සමුප්පන්නං | 366 |
| ජිඝච්ඡාපරමා රොගා | 76 |
| ජීරන්ති වෙ රාජරථා සුචිත්තා | 62 |

| ඣ | |
|---|---|
| ඣාය භික්ඛු මා ච පාමදො | 116 |
| ඣායිං විරජමාසීනං | 120 |

| ඨ | |
|---|---|
| ඨිතෙන කායෙන ඨිතෙන චෙතසා | 248 |

| ඩ | |
|---|---|
| ඩය්හමානෙන කායෙන | 348 |

| ත | |
|---|---|
| තගරඤ්ච පලාසෙන | 410 |
| තඤ්ච කම්මං කතං සාධු | 40 |
| තදක්ඛාසිතං සාත්තිකං | 418 |
| තණ්හාදුතියො පුරිසො | 332, 468 |
| තණ්හාය ජායති සොකො | 80 |
| තණ්හායොගෙන සංයුත්තා | 386 |
| තතො අඤ්ඤාවිමුත්තස්ස | 390, 462 |
| තතො ඔපධිකං පුඤ්ඤං | 422 |
| තතො නං අනුකම්පන්ති | 308 |

| ත | පිට්ඨඞ්කා |
|---|---|
| තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය | 44 |
| තත්‍රායමාදි භවති | 116 |
| තථාගතං බුද්ධමසය්හසාහිනං | 360 |
| තථාගතස්ස බුද්ධස්ස | 362 |
| තථෙව කතපුඤ්ඤන්තු | 80 |
| තපො ච බ්‍රහ්මචරියං ච | 6 |
| තමොනුදං පාරගතං මහෙසිං | 360 |
| තයො විතක්කෙ කුසලෙ විතක්කයෙ | 432 |
| තසිණාය පුරක්ඛතා පජා | 110 |
| තස්මා ඡන්දං ච ලොභං ච | 362 |
| තස්මා පත්තපුටස්සෙව | 410 |
| තස්මා පියං න කයිරාථ | 78 |
| තස්මා රක්ඛිතචිත්තස්ස | 202 |
| තස්මා සදා ඣානරතා සමාහිතා | 370 |
| තස්මා හවෙ ජාගරියං භජෙථ | 372 |
| තස්මා හි අප්පකිච්චස්ස | 414 |
| තස්මා හි තෙ සුඛිනො වීතසොකා | 314 |
| තස්මා හි තෙ නමස්සෙය්‍ය | 470 |
| තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ | 8 |
| තස්ස නිබ්බුතස්ස භික්ඛුනො | 194 |
| තස්ස නිස්සරණං සන්තං | 366 |
| තාදිසං චිත්තං කුබ්බෙථ | 436 |
| තාය නං පරිචරියාය | 470 |
| තාව සුනිහිතො සන්තො | 16 |
| තිට්ඨං චරං නිසින්නො වා | 22 |
| තිණදොසානි ඛෙත්තානි | 112, 114 |
| තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති | 14 |
| තුදන්ති වාචාය ජනා අසඤ්ඤතා | 218 |
| තුම්හෙහි කිච්චං ආතප්පං | 94 |
| තුලමතුලං ච සම්භවං | 254 |
| තෙ ච සග්ගං ගතා තත්‍ථ | 344 |
| තෙ ජොතයන්ති සද්ධම්මං | 466 |
| තෙ ඣායිනො සාතතිකා | 30 |
| තෙ තාදිසෙ පූජයතො | 74 |
| තෙ නිබ්බාපෙත්වා නිපකා | 446 |
| තෙ වඩ්ඪයන්ති නිරයං | 444 |
| තෙසං දෙවා මනුස්සා ච | 364 |
| තෙසං සම්පන්නසීලානං | 38 |
| තෙහි ධම්මෙහි සම්පන්නං | 452 |

| ද | පිට්ඨඞ්කා |
|---|---|
| දදතො පුඤ්ඤං පවඩ්ඪති | 302 |
| දදන්ති වෙ යථාසද්ධං | 86 |
| දන්තං නයන්ති සමිතිං | 104 |
| දානං ච ධම්මචරියා ච | 6 |
| දිට්ඨිං ච අනුපගම්ම සීලවා | 22 |
| දිට්ඨෙව ධම්මෙ යො අත්ථො | 342 |
| දිට්ඨා වා යෙව අද්දිට්ඨා | 20 |
| දිවා තපති ආදිච්චො | 120 |
| දිසො දිසං යං කයිරා | 34, 204 |
| දිස්වා ආදීනවං ලොකෙ | 244 |
| දිස්වා විජිතසඞ්ගාමං | 420 |
| දීඝා ජාගරතො රත්ති | 38 |
| දුක්ඛං දුක්ඛසමුප්පාදං | 74 |
| දුට්ඨො අත්ථං න ජානාති | 434 |
| දුද්දසං අනතං නාම | 290 |
| දුන්නිග්ගහස්ස ලහුනො | 34 |
| දුප්පබ්බජ්ජං දුරභිරමං | 100 |
| දුල්ලභො පුරිසාජඤ්ඤො | 74 |
| දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා | 368 |
| දූරඞ්ගමං එකචරං | 34 |
| දූරෙ සන්තො පකාසෙන්ති | 100 |
| දෙසග්ගිං පන මෙත්තාය | 446 |
| **ධ** | |
| ධනපාලකො නාම කුඤ්ජරො | 106 |
| ධම්මං චරෙ සුචරිතං | 68 |
| ධම්මපීති සුඛං සෙති | 42 |
| ධම්මාරාමො ධම්මරතො | 428 |
| **න** | |
| න අත්තහෙතු න පරස්ස හෙතු | 42 |
| න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ | 54 |
| න උදකෙන සුචි හොති | 140 |
| න කහාපණවස්සෙන | 72 |
| නගරං යථා පච්චන්තං | 104 |
| න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි | 20 |
| න චාහං බ්‍රාහ්මණං බ්‍රූමි | 122 |
| න චාහු න ච භවිස්සති | 82 |
| න ජටාහි න ගොත්තෙන | 122 |
| න තං කම්මං කතං සාධු | 40 |
| න තං දළ්හං බන්ධනමාහු ධීරා | 110 |
| න තං මාතා පිතා කයිරා | 36 |
| න තාවතා ධම්මධරො | 88 |
| න තෙන අරියො හොති | 92 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| න තෙන ථෙරො හොති | 88 |
| න තෙන පණ්ඩිතො හොති | 88 |
| න තෙන භික්ඛු හොති | 90 |
| න තෙන හොති ධම්මට්ඨො | 88 |
| නත්ථඤ්ඤො එකධම්මො'පි | 330 |
| නත්ථි ඣානං අපඤ්ඤස්ස | 116 |
| නත්ථි රාගසමො අග්ගි | 86 |
| නත්වෙවිදං කුසීතෙන | 462 |
| න නග්ගචරියා න ජටා න පඞ්කා | 58 |
| න පරෙසං විලොමානි | 36 |
| න පරෙ පරං නිකුබ්බෙථ | 22 |
| න පුප්ඵගන්ධො පටිවාතමෙති | 38 |
| න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය | 120 |
| න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො | 120 |
| න භජෙ පාපකෙ මිත්තෙ | 42 |
| න මුණ්ඩකෙන සමණො | 90 |
| නමො තෙ පුරිසාජඤ්ඤ | 420 |
| න මොනෙන මුනි හොති | 90 |
| න වාක්කරණමත්තෙන | 90 |
| න වායමෙය්‍ය සබ්බත්ථ | 256 |
| න වෙ කදරියා දෙවලොකං වජන්ති | 70 |
| න සන්ති පුත්තා තාණාය | 96 |
| න සමණො බ්‍රාහ්මණො | 408 |
| න සීලබ්බතමත්තෙන | 92 |
| න හි එතෙහි යානෙහි | 104 |
| න හි නත්ථි කසි අම්හි | 14 |
| න හි පාපං කතං කම්මං | 40 |
| න හි රුණ්ණං ව සොකො වා | 16 |
| න හි වෙරෙන වෙරානි | 26 |
| නික්ඛමා නිල්ලපා ධීරා | 472 |
| නිට්ඨඞ්ගතො න පමාණමෙති | 112 |
| නිධාය දණ්ඩං භූතෙසු | 124 |
| නිධි වා ඨානා වචති | 18 |
| නිධිං නිධෙති පුරිසො | 16 |
| නිධීනං ච පවත්තාරං | 40 |
| නෙක්ඛං ජම්බොනදස්සෙව | 82 |
| නෙතං ඛො සරණං ඛෙමං | 72 |
| නෙලඞ්ගො සෙතපච්ඡාදො | 282 |
| නෙව දෙවො න ගන්ධබ්බො | 48 |
| නො වෙ ලභෙථ නිපකං සහායං | 106 |
| න්හාත්වා ච පිත්වා චූදකානි සත්තා | 300 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පච්චුපට්ඨිතයාමා ච | 448 |
| පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ | 116 |
| පඤ්ඤාය පරිහාතෙන | 364 |
| පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං | 364 |
| පටිසන්ථාරවුත්තස්ස | 118 |
| පටිසම්භිදා විමොක්ඛා ච | 20 |
| පඨවිසමො නො විරුජ්ඣති | 44 |
| පණ්ඩිතොති සමඤ්ඤාතො | 436 |
| පණ්ඩුපලාසො'ව දානි'සි | 84 |
| පතිරූපදෙසවාසො ච | 6 |
| පථව්‍යා එකරජ්ජෙන | 70 |
| පදුට්ඨචිත්තං ඤත්වාන | 336 |
| පදෙසරජ්ජං ඉස්සරියං | 18 |
| පමාදමනුයුඤ්ජන්ති | 32 |
| පමාදං අප්පමාදෙන | 32 |
| පරදුක්ඛූපදානෙන | 96 |
| පරවජ්ජානුපස්සිස්ස | 86 |
| පරිජිණ්ණමිදං රූපං | 62 |
| පරිපුණ්ණසෙඛං අපහාණධම්මං | 370 |
| පරිමුට්ඨා පණ්ඩිතාභාසා | 248 |
| පරෙ ච න විජානන්ති | 26 |
| පවිවිත්තෙහි අරියෙහි | 412 |
| පවිවෙකරසං පීත්වා | 76 |
| පසන්නචිත්තං ඤත්වාන | 338 |
| පස්ස චිත්තකතං බිම්බං | 60 |
| පංසුකූලධරං ජන්තුං | 122 |
| පහූතෙ අන්නපානම්හි | 14 |
| පාණිම්හි චෙ වණො නාස්ස | 54 |
| පාපකං පස්සථ චෙතං | 362 |
| පාපකෙන ච සීලෙන | 352 |
| පාපං චෙ පුරිසො කයිරා | 52 |
| පාපානි පරිවජ්ජෙති | 92 |
| පාපො'පි පස්සති භද්‍රං | 52 |
| පාමොජ්ජකරණට්ඨානං | 466 |
| පාමොජ්ජබහුලො භික්ඛු | 118 |
| පිණ්ඩපාතිකස්ස භික්ඛුනො | 186, 190 |
| පියතො ජායතී සොකො | 78 |
| පියරූපසාතගධිතං | 448 |
| පියරූපස්සාදගධිතා තෙ | 158 |
| පුඤ්ඤං චෙ පුරිසො කයිරා | 52 |
| පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය | 340, 388 |
| පුත්තා මත්ථි ධනමත්ථි | 38 |
| පුප්ඵානි හෙව පචිනන්තං | 36 |
| පුබ්බෙනිවාසං යො වෙදී | 456 |
| පූජාරහෙ පූජයතො | 74 |
| පූතිමච්ඡං කුසග්ගෙන | 410 |
| පෙමතො ජායතී සොකො | 78 |
| පොරාණමෙතං අතුල | 82 |

ඵ

| | |
|---|---|
| ඵන්දනං චපලං චිත්තං | 34 |
| ඵුට්ඨස්ස ලොකධම්මෙහි | 8 |
| ඵුසාමි නෙක්ඛම්මසුඛං | 92 |
| ඵෙණූපමං කායමිමං විදිත්වා | 36 |

බ

| | |
|---|---|
| බහුම්පි චෙ සහිතං භාසමානො | 30 |
| බහුස්සුතො පුඤ්ඤකරො | 400 |
| බහූ වෙ සරණං යන්ති | 72 |
| බහූ දෙවා මනුස්සා ච | 6 |
| බාලසඞ්ගතචාරීහි | 78 |
| බාහිතපාපො'ති බ්‍රාහ්මණො | 120 |
| බාහිත්වා පාපකෙ ධම්මෙ | 136 |
| බාහුසච්චං ච සිප්පං ච | 6 |
| බුද්ධං සරණං ගච්ඡාමි | 2 |
| බ්‍රහ්මාති මාතාපිතරො | 468 |

භ

| | |
|---|---|
| භද්දකෙන ච සීලෙන | 354 |
| භද්‍රොපි පස්සති පාපං | 52 |
| භුත්තස්ස ච සූකරමද්දවෙන | 296 |
| භොජනම්හි අමත්තඤ්ඤූ | 348 |
| භොජනම්හි ච මත්තඤ්ඤූ | 350 |

ම

| | |
|---|---|
| මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො | 92 |
| මත්තා සුඛපරිච්චාගා | 96 |
| මධුවා මඤ්ඤතී බාලො | 40 |
| මනුජස්ස පමත්තචාරිනො | 185 |
| මනොපකොපං රක්ඛෙය්‍ය | 82 |
| මනොපුබ්බඞ්ගමා ධම්මා | 26 |
| මමෙව කතං මඤ්ඤන්තු | 40 |
| මලිත්ථියා දුච්චරිතං | 84 |
| මංසචක්ඛු දිබ්බචක්ඛු | 388 |
| මංසචක්ඛුස්ස උප්පාදො | 388 |
| මා ජාතු කොචි ලොකස්මිං | 436 |
| මාතරං පිතරං හන්ත්වා | 98 |
| මාතාපිතුඋපට්ඨානං | 6 |

ම — පිට්ඨඞ්කා

මාතා යථා නියං පුත්තං 22
මානුපෙතා අයං පජා 270
මානුසිකා ච සම්පත්ති 18
මාප්පමඤ්ඤෙථ පාපස්ස 52
මාප්පමඤ්ඤෙථ පුඤ්ඤස්ස 52
මා පමාදමනුයුඤ්ජෙථ 32
මා පියෙහි සමාගඤ්ඡි 78
මාවොච ඵරුසං කඤ්චි 56
මාසෙ මාසෙ කුසග්ගෙන 40
මිච්ඡා මනං පණිධාය 398
මිත්තසම්පදමාගම්ම 18
මිත්තෙ භජස්සු කල්‍යාණෙ 118
මිද්ධී යදා හොති මහග්ඝසො ච 106
මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො 110
මුහුත්තමපි චෙ විඤ්ඤූ 38
මෙත්තඤ්ච සබ්බලොකස්මිං 22
මෙත්තාවිහාරී යො භික්ඛු 116
මොහග්ගි පන සම්මූළ්හො 444
මොහසම්බන්ධනො ලොකො 288

ය

යඞ්කිඤ්චි චිත්තං ඉධ වා හුරං වා 8
යඤ්ච කාමසුඛං ලොකෙ 150
යඤ්ච පත්තං යඤ්ච පත්තබ්බං 274
යඤ්ජීවිතං න තපති 218
යතං චරෙ යතං තිට්ඨෙ 476
යතො අරියසච්චානි 342
යතො ච හොති පාපිච්ඡො 362
යතො යතො සම්මසති 116
යත්ථ ආපො ච පඨවී 146
යත්ථ චෙතා නිරුජ්ඣන්ති 380, 382
යථාගාරං දුච්ඡන්නං 28
යථාගාරං සුච්ඡන්නං 28
යථා දණ්ඩෙන ගොපාලො 56
යථාපි පබ්බතො සෙලො 182
යථාපි පුප්ඵරාසිම්හා 38
යථාපි භමරො පුප්ඵං 36
යථා පි මූලෙ අනුපද්දවෙ දළ්හෙ 108
යථාපි මෙඝො ථනයිත්වා 408
යථාපි රුචිරං පුප්ඵං 36
යථා බුබ්බුළකං පස්සෙ 68
යථා වාරිවහා පූරා 16
යථා සඞ්කාරධානස්මිං 28
යථා හරිත්වා නික්ඛිපෙය්‍ය 338

ය — පිට්ඨඞ්කා

යථින්දඛීලො පඨවිං සිතො සියා 10
යදා ච අත්තනා වෙදී 146
යදා දෙවො දෙවකායා 422
යදා ද්වයෙසු ධම්මෙසු 118
යදා සකෙසු ධම්මෙසු 138
යදා හවෙ පාතුභවන්ති ධම්මා 132, 134
යමාහු දන්තං පරමං අනුත්තරං 452
යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං 8
යම්හා ධම්මං විජානෙය්‍ය 120
යම්හි න මායා වසති න මානො 184
යම්හි සච්චං ච ධම්මො ච 90
යස්මිං පදෙසෙ කප්පෙති 308
යස්ස අච්චන්තදුස්සීල්‍යං 66
යස්ස කාමාසවො ඛීණො 384
යස්ස කායෙන වාචාය 450
යස්ස ගතිං න ජානන්ති 126
යස්ස චෙතං සමුච්ඡින්නං 86
යස්ස ඡත්තිංසති සොතා 108
යස්ස ජාලිනී විසත්තිකා 70
යස්ස ජිතං නාවජීයති 70
යස්ස ජිතො කාමකණ්ටකො 182
යස්ස දන්තෙන සීලෙන 18
යස්ස ධම්මා සුභාවිතා 450
යස්ස නිත්තිණ්ණො පඞ්කො ච 176
යස්සන්තරතො න සන්ති කොපා 168
යස්ස පපඤ්චා ඨිති ච නත්ථි 284
යස්ස පාපං ච පුඤ්ඤං ච 68
යස්ස පාරං අපාරං වා 120
යස්ස පුරෙ ච පච්ඡා ච 126
යස්ස මූලං ඡමා නත්ථි 284
යස්ස රාගො ච දොසො ච 396
යස්ස විතක්කා විධූපිතා 272
යස්ස සක්කරියමානස්ස 418
යස්ස සියා සබ්බදා සති 284
යස්ස සෙලූපමං චිත්තං 206
යස්සාලයා න විජ්ජන්ති 411
යස්සාසවා පරික්ඛීණා 44
යස්සින්ද්‍රියානි සමථං ගතානි 44
යා එසා සත්තී ජම්මි 108
යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ 48
යං කිඤ්චි සිථිලං කම්මං 102
යං චෙ විඤ්ඤූ පසංසන්ති 82
යං හි කිච්චං තදපවිද්ධං 98

| ය | පිට්ඨඞ්කා |
|---|---|
| යා කාචි කඞ්ඛා ඉධ වා හුරං වා | 246 |
| යා කාචිමා දුග්ගතියො | 362 |
| යා තත්ථ දෙවතා ආසුං | 308 |
| යාදිසං කුරුතෙ මිත්තං | 410 |
| යානිමානි අපත්ථානි | 62 |
| යානීධ භූතානි සමාගතානි | 8, 14 |
| යාවජීවම්පි චෙ බාලො | 38 |
| යාවදෙව අනත්ථාය | 40 |
| යාවං වනථො න ඡිජ්ජති | 96 |
| යෙ අරියසච්චානි විභාවයන්ති | 10 |
| යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං | 368 |
| යෙ කෙචි පාණභූතත්ථි | 20 |
| යෙ කෙචි භූතා භවිස්සන්ති | 222 |
| යෙ කෙචි සොකා පරිදෙවිතා වා | 314 |
| යෙ ච කාමෙ පහත්වාන | 448 |
| යෙ ච ඛො ඡින්නසංසයා | 448 |
| යෙ ච ඛො සම්මදක්ඛාතෙ | 42 |
| යෙ ච තණ්හං පහත්වාන | 324 |
| යෙ ච දුක්ඛං පජානන්ති | 464 |
| යෙ ච මානං පහත්වාන | 324 |
| යෙ ච මොහං පහත්වාන | 330 |
| යෙ ච රත්තින්දිවා යුත්තා | 444 |
| යෙ ච රූපූපගා සත්තා | 402 |
| යෙ ච සික්ඛාසාරා | 274 |
| යෙ චස්ස ධම්මා අක්ඛාතා | 460 |
| යෙ චෙව භාසන්ති සුණන්ති චූභයං | 452 |
| යෙ ඣානපසුතා ධීරා | 70 |
| යෙ තරන්ති අණ්ණවං සරං | 310 |
| යෙ දුක්ඛං නප්පජානන්ති | 464 |
| යෙන කොධෙන කුද්ධා සෙ | 320, 328 |
| යෙන දොසෙන දුට්ඨා සෙ | 318, 326 |
| යෙන මක්ඛෙන මක්ඛා සෙ | 322, 330 |
| යෙන මානෙන මත්තා සෙ | 322 |
| යෙන මොහෙන මූළ්හා සෙ | 320, 328 |
| යෙන ලොභෙන ලුද්ධා සෙ | 318, 326 |
| යෙ පුග්ගලා අට්ඨසතං පසත්ථා | 10 |
| යෙ රාගරත්තානුපතන්ති සොතං | 110 |
| යෙ වා පන කෙචි සමණා වා | 192 |
| යෙ වෙ දිවා ච රත්තො ච | 158 |
| යෙ සත්තසණ්ඩං පථවිං විජෙත්වා | 346 |
| යෙ සත්ථවාහෙන අනුත්තරෙන | 426 |
| යෙ සන්තචිත්තා නිපකා | 370 |

| ය | පිට්ඨඞ්කා |
|---|---|
| යෙසං ච සුසමාරද්ධා | 98 |
| යෙසං ච හිරිඔත්තප්පං | 366 |
| යෙසං චෙ සාසනං සුත්වා | 466 |
| යෙසං චෙ හිරිඔත්තප්පං | 366 |
| යෙසං සන්නිචයො නත්ථි | 44 |
| යෙසං සම්බොධිඅඞ්ගෙසු | 44 |
| යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති | 54 |
| යො ඉමං පලිපථං දුග්ගං | 126 |
| යොගා වෙ ජායතෙ භූරි | 94 |
| යො ච දොසං පහත්වාන | 434 |
| යො ච පුත්තපසුං හිත්වා | 416 |
| යො ච පුබ්බෙ පමජ්ජිත්වා | 68 |
| යො බුද්ධං ච ධම්මං ච | 74 |
| යො ච මෙත්තං භාවයති | 346 |
| යො ච මොහං පහත්වාන | 434 |
| යො ච ලොභං පහත්වාන | 434 |
| යො ච වන්තකසාවස්ස | 28 |
| යො ච සතිමා නිපකො ඣායී | 354 |
| යො ච සමෙති පාපානි | 90 |
| යො චෙ ගාථාසතං භාසෙ | 46 |
| යො චෙතං සහති ජම්මිං | 108 |
| යො චෙ වස්සසතං ජන්තු | 48 |
| යො ජාගරො ච සතිමා සම්පජානො | 372 |
| යො දණ්ඩෙන අදණ්ඩෙසු | 58 |
| යො දුක්ඛස්ස පජානාති | 450 |
| යො'ධ කාමෙ පහාත්වාන | 126 |
| යො'ධ තණ්හං පහාත්වාන | 126 |
| යො'ධ දීඝං ච රස්සං වා | 124 |
| යො'ධ පුඤ්ඤං ච පාපං ච | 124 |
| යො ධම්මයාගං අයජී අමච්ඡරී | 458 |
| යො න හන්ති න ඝාතෙති | 348 |
| යො නිබ්බනථො වනාධිමුත්තො | 110 |
| යොනිසො මනසිකාරො | 332 |
| යො පාණමතිපාතෙති | 86 |
| යො බාලො මඤ්ඤති බාල්‍යං | 38 |
| යො බ්‍රාහ්මණො බාහිතපාපධම්මො | 133 |
| යො භූතං භූතතො දිස්වා | 376 |
| යො මුඛසඤ්ඤතො භික්ඛු | 114 |
| යො වෙ උප්පතිතං කොධං | 80 |
| යො සබ්බං සබ්බතො ඤත්වා | 324 |

**ය** — පිට්ඨඞ්කා

යො සහස්සං සහස්සෙන 48
යො සාසනං අරහතං 66
යො සුඛං දුක්ඛතො'ද්දක්ඛි 380
යො හවෙ දහරො භික්ඛු 118

**ර**

රතියා ජායතී සොකො 80
රමණීයානි අරඤ්ඤානි 46
රාගග්ගි දහති මච්චෙ 444
රාජතො වා දුරුත්තස්ස 16
රූපධාතුං පරිඤ්ඤාය 378

**ල**

ලුද්ධො අත්ථං න ජානාති 432
ලොභො දොසො ච මොහො ච 378

**ව**

වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ 12
වරමස්සතරා දන්තා 104
වරො වරඤ්ඤූ වරදො වරාහරො 12
වචීපකොපං රක්ඛෙය්‍ය 82
වජ්ජං ච වජ්ජතො ඤත්වා 104
වනං ඡින්දථ මා රුක්ඛං 96
වස්සිකා විය පුප්ඵානි 118
වාණිජො'ව භයං මග්ගං 54
වාරිජො'ව ථලෙ ඛිත්තො 34
වාරි පොක්ඛරපත්තෙ'ව 122
විතක්කපමථිතස්ස ජන්තුනො 110
විතක්කූපසමෙ ච යො රතො 112
විනෙය්‍යුං මච්ඡෙරමලං 344
වීතතණ්හො අනාදානො 112
වෙදනං ඵරුසං ජානිං 58

**ස**

සචෙ ච පාපකං කම්මං 228
සචෙ නෙරෙසි අත්තානං 56
සචෙ භායථ දුක්ඛස්ස 228
සචෙ ලභෙථ නිපකං සහායං 106
සති කායගතා උපට්ඨිතා 182
සත්තක්ඛත්තුං පරමං ච 342
සත්තසඞ්ගපහීණස්ස 446
සත්ථා හි ලොකෙ පරමො මහෙසි 426
සදා ජාගරමානානං 82
සද්ධිං චරමෙකතො වසං 310
සද්ධො සීලෙන සම්පන්නො 100

**ස** — පිට්ඨඞ්කා

සන්තකායො සන්තවාචො 118
සන්තං තස්ස මනං හොති 46
සන්තුස්සකො ච සුභරො ච 20
සබ්බකම්මජහස්ස භික්ඛුනො 170
සබ්බත්ථ වෙ සප්පුරිසා 42
සබ්බදානං ධම්මදානං ජිනාති 112
සබ්බපාපස්ස අකරණං 72
සබ්බරාගවිරත්තස්ස 382
සබ්බසංයොජනං ඡෙත්වා 122
සබ්බං පරවසං දුක්ඛං 166
සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා 222
සබ්බාභිභූ සබ්බවිදූහමස්මි 112
සබ්බෙ තසන්ති දණ්ඩස්ස 56
සබ්බෙ ධම්මා අනත්තා'ති 94
සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති 94
සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති 94
සමාහිතො සම්පජානො 380, 382,384
සමුද්දං විසකුම්භෙන 436
සම්මා මනං පණිධාය 400
සරිතානි සිනෙහිතානි ච
සලාභං නාතිමඤ්ඤෙය්‍ය 114
සවන්ති සබ්බධි සොතා 108
ස වෙ අක්ඛෙය්‍යසම්පන්නො 392
ස වෙ ඉන්ද්‍රියසම්පන්නො 390
ස වෙ භූතපරිඤ්ඤායො 376
ස වෙ සම්මද්දසො භික්ඛු 380, 402, 428
සහස්සම්පි චෙ වාචා 46
සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ 474
සහස්සම්පි චෙ වාචා 46
සභාවස්ස දස්සනසම්පදාය 12
සංවරත්ථං පහාණත්ථං 356
සංවෙජනීයට්ඨානෙසු 358
සංසග්ගා වනථො ජාතො 412
සාගාරා අනාගාරා ච 470
සාගාරෙසු ච චීවරං 470
සා තෙ සද්ධා නිවිට්ඨස්ස 422
සාරං ච සාරතො ඤත්වා 28
සාහු දස්සනමරියානං 78
සිඤ්ච භික්ඛු ඉමං නාවං 116
සීලදස්සනසම්පන්නො 80
සීලං රක්ඛෙය්‍ය මෙධාවී 408
සීලං සමාධි පඤ්ඤා ච 386
සුකරං සාධුනා සාධු 246

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සුකරානි අසාධූනි | 66 |
| සුඛං වත තස්ස න හොති කිඤ්චි | 154 |
| සුඛකාමානි භූතානි | 150 |
| සුඛං යාව ජරා සාධු | 108 |
| සුඛා මත්තෙය්‍යතා ලොකෙ | 108 |
| සුඛිනො වත යෙ අකිඤ්චනා | 156 |
| සුඛො බුද්ධානං උප්පාදො | 74 |
| සුඛො විවෙකො තුට්ඨස්ස | 148 |
| සුගතං පන නිස්සාය | 470 |
| සුජීවං අහිරිකෙන | 86 |
| සුඤ්ඤාගාරං පවිට්ඨස්ස | 116 |
| සුදස්සං වජ්ජමඤ්ඤෙසං | 86 |
| සුදුද්දසං සුනිපුණං | 34 |
| සුප්පබුද්ධං පබුජ්ඣන්ති | 98, 100 |
| සුභානුපස්සිං විහරන්තං | 26 |
| සුහික්ඛවාචො පුරිසො | 408 |
| සුරාමෙරයපානං ච | 86 |
| සුවණ්ණතා සුස්සරතා | 18 |
| සුසුඛං වත ජීවාම | 74, 76 |
| සෙඛස්ස සික්ඛමානස්ස | 390, 462 |
| සෙඛො පථවිං විචෙස්සති | 36 |
| සෙය්‍යො අයොගුළො භුත්තො | 374, 442 |
| සෙලො යථා එකඝනො | 42 |
| සෙලො යථා පබ්බතමුද්ධනිට්ඨිතො | 360 |
| සෙවමානො සෙවමානං | 410 |
| සො කරොහි දීපමත්තනො | 84 |
| සො ච ධම්මමභිඤ්ඤාය | 444 |
| සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො | 16 |
| සො පමාදමනුචිණ්ණො | 436 |
| **හ** | |
| හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො | 114 |
| හනන්ති භොගා දුම්මෙධං | 112 |
| හංසාදිච්චපථෙ යන්ති | 68 |
| හිත්වා මානුසකං කාමං | 126 |
| හිත්වා රතිං ච අරතිං ච | 126 |
| හිරිනිසෙධො පුරිසො | 60 |
| හිරිමතා ච දුජ්ජීවං | 86 |
| හීනං ධම්මං න සෙවෙය්‍ය | 66 |

## ඛුද්දකනිකායෙ

## ඛුද්දක ධම්මපද උදාන ඉතිවුත්තක ගන්ථානං

# සඤ්ඤානාමානුක්කමණිකා

---


| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අචිරවතී | 232 |
| අජකලාපකස්ස | 138 |
| අජපාලනිග්‍රොධමූලෙ | 134 |
| අඤ්ඤාතකොණ්ඩඤ්ඤො | 282 |
| අනාථපිණ්ඩිකස්ස | 6, 136, 138, 142, 150, 152, 154, 156, 170, 176, 182, 188, 190, 212, 218, 220, 222, 228, 238, 240, 248, 278, 280, 282, 284, 290 |
| අනුපියායං | 164 |

ආ

| | |
|---|---|
| ආනන්දො | 60, 136, 222, 228, 246, 250, 276, 296 |

ඉ

| | |
|---|---|
| ඉච්ඡානඞ්ගලකො | 154 |

උ

| | |
|---|---|
| උදෙනස්ස | 288 |
| උපවත්තනෙ | 202 |
| උපසෙනස්ස | 218 |
| උරුවෙලායං | 130, 148, 192 |

ක

| | |
|---|---|
| කඞ්ඛාරෙවතො | 246 |
| කපොතකන්දරාය | 204 |
| කරෙරිමණ්ඩලමාලෙ | 188 |
| කලන්දකනිවාපෙ | 136, 184, 204, 218, 222, 246, 272 |
| කාළිගොධාය | 168 |
| කිමිකාලාය | 196 |
| කුණ්ඩධානවනෙ | 158 |
| කුණ්ඩියායං | 158 |
| කුසිනාරා | 202, 296 |
| කූටාගාරසාලායං | 178, 250 |
| කොලියධීතා | 158 |
| කොසම්බියං | 208, 288 |

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කොසලස්ස | 156 |
| කොසලෙසු | 202, 248, 310 |
| කොසිය | 186 |

ග

| | |
|---|---|
| ගඞ්ගා නදී | 310 |
| ගයායං | 140 |
| ගයාසීසෙ | 140 |
| ගිජ්ඣකූටස්ස | 342 |
| ගිරිබ්බජෙ | 342 |
| ගොතමකං | 250 |
| ගොතමතිත්ථං | 308 |
| ගොතමද්වාරං | 308 |
| ගොතමසාවකා | 100 |
| ගොතමසාසනම්හි | 10 |

ඝ

| | |
|---|---|
| ඝොසිතාරාමෙ | 208, 288 |

ච

| | |
|---|---|
| චුන්දකං | 298 |

ජ

| | |
|---|---|
| ජෙතවනෙ | 6, 136, 138, 142, 150, 152, 154, 156, 170. 176, 182, 188, 190, 212, 218, 220, 222, 228, 238, 258, 264, 266, 272, 276, 278, 280, 282, 284, 290, 292, 316 |

ත

| | |
|---|---|
| තගරසිඛිං | 226 |
| තාවතිංසානං | 226 |
| තාවතිංසෙසු | 172 |
| තාවතිංසෙහි | 306 |
| තුසිතං කායං | 222 |

**ථ** — පිට්ඨඞ්කා

ථූණං 286
ථූණෙය්‍යකා 286

**ද**

දබ්බො මල්ලපුත්තො 314

**න**

නන්දො 170
නාගසමාලො 310
නෙරඤ්ජරායං 130, 192

**ප**

පවත්ත පබ්බතෙ 238
පසෙනදී 148, 220, 254
පසෙනදිම්හි 164
පසෙනදිස්ස 156
පිණ්ඩොලො 410
පිප්ඵලිගුහායං 136, 184
පුබ්බාරාමෙ 164, 228, 254, 312

**බ**

බාහියො 142
බිම්බිසාරො 148

**ම**

මගධානං 342
මගධෙසු 302
මල්ලානං 202, 286
මල්ලිකා 220
මල්ලෙසු 286, 294
මහාකච්චානො 284
මහාකච්චායනො 136, 238
මහාකප්පිනො 186
මහාකස්සපො 136, 184
මහාකොට්ඨිතො 136
මහාචුන්දො 136
මහාමොග්ගල්ලානස්ස 162, 230
මහාවනෙ 250
මිගාරමාතුයා 164
මිගාරමාතුපාසාදෙ 164, 228, 254
මුචලින්දමූලෙ 148
මුචලින්දො 148
මෙඝියො 194
මොග්ගල්ලානො 136, 182, 204

**ය** — පිට්ඨඞ්කා

යමුනා 232
යසොජප්පමුඛානි 176
යසොජො 178

**ර**

රතනසුත්තං 8
රක්ඛිතවනසණ්ඩො 208
රාජගහෙ 136, 184, 204, 218, 222
246, 272, 314

**ල**

ලකුණ්ටකභද්දියො 278, 282

**ව**

වග්ගුමුදා 178
වග්ගුමුදාතීරියානං 178
වජ්ජී 178
වජ්ජීනං 306
වඞ්ගන්තපුත්තස්ස 218
විසාඛාය 164, 312
වෙපුල්ලො 342
වෙසාලියං 250
වෙසාලි 178, 250
වෙළුවනෙ 135, 184, 204, 218, 222
246, 272, 314

**ස**

සඞ්ගාමජී 138
සත්තම්බං 250
සරභූ 232
සාරන්දදං 250
සාරිපුත්තො 136, 182, 204 218
278
සාවත්ථියං 6, 136, 138, 142, 150
152, 154, 156, 164, 170, 212
218, 220 222, 228, 238, 246
248, 254, 258, 264, 266, 272
276, 278, 280, 282, 284, 290
292, 312,316
සුනීධවස්සකාරා 306
සුප්පවාසා 158
සුප්පාරකෙ 142
සුභූති 272
සෙනියො 148
සොණො 238

## ඛුද්දකනිකායෙ

## ඛුද්දකපාඨ ධම්මපද උදාන ඉතිවුත්තකගන්ථානං

# පදානුක්කමණිකා.


| අ | පිට්ඨඞ්කා |
| --- | --- |
| අකක්කසං | 124 |
| අකතං | 292, 366 |
| අකතකල්‍යාණො | 350 |
| අකතකුසලො | 350 |
| අකතඤ්ඤූ | 46 |
| අකතභීරුත්තාණො | 360 |
| අකථංකථී | 124, 126, 382 |
| අකසිරලාභී | 198 |
| අකාරකා | 216 |
| අකාරියං | 68 |
| අකාලමෙඝො | 148 |
| අකාලො | 144 |
| අකිච්ඡලාභී | 198 |
| අකිඤ්චනං | 80, 122 |
| අකිඤ්චනො | 44, 156 |
| අකිඤ්චි | 120 |
| අකුතොභයං | 484 |
| අකුතොභයෙ | 74 |
| අකුප්පා | 390 |
| අකුබ්බතො | 52 |
| අකුසලමූලානි | 378 |
| අකුසලවිතක්කා | 416, 430 |
| අකුසලානං | 362 |
| අක්කුලපක්කුලිකං | 138 |
| අක්කුලො | 138 |
| අක්කොච්ඡි | 26 |
| අක්කොධෙන | 82 |
| අක්කොසන්ති | 152, 216 |
| අක්කොසො | 182 |
| අක්ඛරුතං | 112 |
| අක්ඛාතාරං | 390 |
| අක්ඛාතාරෙ | 94 |
| අක්ඛාතො | 92 |
| අක්ඛෙය්‍යං | 390 |
| අක්ඛෙය්‍යසඤ්ඤිනො | 390 |

| අ | පිට්ඨඞ්කා |
| --- | --- |
| අක්ඛෙය්‍යසම්පත්තො | 392 |
| අක්ඛෙය්‍යස්මිං | 390 |
| අගන්ධකං | 36 |
| අගාරිනී | 58 |
| අගිද්ධො | 444 |
| අගුත්තද්වාරතාය | 348 |
| අග්ගතො | 438 |
| අග්ගනගරං | 306 |
| අග්ගප්පත්තො | 440 |
| අග්ගප්පසාදා | 438 |
| අග්ගස්ස දාතා | 438 |
| අග්ගි | 86 |
| අග්ගිදඩ්ඪා | 56 |
| අග්ගිසිඛූපමො | 102, 374, 442 |
| අග්ගිහුත්තං | 120 |
| අග්ගී | 444 |
| අග්ගීව | 32 |
| අඝමූලං | 158 |
| අඝාවිනො | 158 |
| අඞ්කුසග්ගහො | 106 |
| අචාරි | 106 |
| අචිරපක්කන්තං | 226 |
| අචිරපක්කන්තස්ස | 204 |
| අචෙලකා | 254 |
| අචොරහරණො | 18 |
| අච්චගා | 126 |
| අච්චතාරි | 396 |
| අච්චන්තදුස්සීල්‍යං | 66 |
| අච්චුතං | 82 |
| අච්ඡරුතං හෙතු | 174 |
| අච්ඡිද්දවුත්තිං | 82 |
| අච්ඡෙච්ඡි තණ්හං | 278, 380 |
| අච්ඡො | 480 |
| අච්ඡොදකා | 298 |
| අජාතං | 292, 366 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අජිනසාටියා | 122 |
| අජිනි | 26 |
| අජෙය්‍යා | 18 |
| අජෙළකා | 364 |
| අජ්ජතග්ගෙ | 246 |
| අජ්ජතනාමිව | 82 |
| අජ්ඣත්තරතො | 114, 254 |
| අජ්ඣත්තං | 182 |
| අජ්ඣත්තං චෙතොසමථමනු-යුත්තො | 370 |
| අජ්ඣත්තිකානි ආයතනානි | 4 |
| අජ්ඣාගාරෙ | 468 |
| අජ්ඣෙසි | 244 |
| අජ්ඣොගාහිත්වා | 196, 298 |
| අජ්ඣොපන්නා | 280 |
| අඤ්ඤතිත්ථියා | 152 |
| අඤ්ඤත්‍ර | 246 |
| අඤ්ඤථාභාවී | 192 |
| අඤ්ඤදත්ථුදසො | 340 |
| අඤ්ඤමඤ්ඤං | 334 |
| අඤ්ඤං ජීවං | 258 |
| අඤ්ඤා | 372 |
| අඤ්ඤා අනුත්තරා | 390 |
| අඤ්ඤාතං | 138 |
| අඤ්ඤාතාවින්ද්‍රියං | 390 |
| අඤ්ඤාපටිවෙධො | 234 |
| අඤ්ඤාය | 92 |
| අඤ්ඤාවිමුත්තස්ස | 390 |
| අඤ්ඤින්ද්‍රියං | 390 |
| අඤ්ඤිංසු | 214 |
| අඤ්ඤොඤ්ඤනිස්සිතා | 47 |
| අට්ටියමානා | 174, 376 |
| අට්ඨකවග්ගානි | 244 |
| අට්ඨඞ්ගිකං මග්ගං | 74 |
| අට්ඨඞ්ගිකො | 92 |
| අට්ඨඞ්ගිකො මග්ගො | 238 |
| අට්ඨි | 4 |
| අට්ඨිපුඤ්ජා | 342 |
| අට්ඨිමිඤ්ජා | 4 |
| අට්ඨිසඤ්චයො | 342 |
| අට්ඨිකත්වා | 290 |
| අට්ඨිතං | 62 |
| අඩ්ඪට්ඨරතනං | 206 |
| අණුකථූලා | 20 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අණුමත්තෙසු | 198 |
| අණුංථූලානි | 32, 90 |
| අණ්ණවං | 310 |
| අතක්කාවචරං | 366 |
| අතන්දිතං | 114 |
| අතන්දිතෙ | 118 |
| අතන්දිතො | 100 |
| අතික්කන්තමානුසකෙන | 140 |
| අතික්කන්තමානුසිකාය | 186 |
| අතික්කමං | 74 |
| අතික්කමන්ති | 248 |
| අතික්කමෙය්‍ය | 80 |
| අතික්කමම | 386 |
| අතිඛිත්තා | 64 |
| අතිච්ච | 272 |
| අතිජාතො | 404 |
| අතිණ්ණපුබ්බං | 278 |
| අතිත්තං | 36 |
| අතිපීසු | 18 |
| අතිධාවන්ති | 274, 374, 376 |
| අතිධොනචාරිනං | 84 |
| අතිරෙචති | 38, 226 |
| අතිවත්තති | 138, 164 |
| අතිවසා | 40 |
| අතිවස්සති | 238 |
| අතිවාක්‍යං | 104 |
| අතිවෙලං | 280 |
| අතෙකිච්ඡා | 436 |
| අත්තකාමො | 222 |
| අත්තගුත්තො | 118 |
| අත්තසඤ්ඤාය | 66 |
| අත්තජා | 66 |
| අත්තතො | 152, 19? |
| අත්තදණ්ඩෙසු | 124 |
| අත්තදත්ථං | 66 |
| අත්තදන්තස්ස | 48 |
| අත්තදන්තො | 104 |
| අත්තභරස්ස | 180 |
| අත්තභාවො | 234 |
| අත්තමනො | 160, 178 |
| අත්තවසං | 440 |
| අත්තවසිකා | 440 |
| අත්තසම්භවං | 66 |
| අත්තසම්භූතා | 378 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අත්තසම්මාපණිධි | 6 |
| අත්තහෙතු | 42 |
| අත්තා | 118, 222, 376 |
| අත්තානුයොගිනං | 78 |
| අත්ථකාමෙන | 178 |
| අත්ථකාමො | 142 |
| අත්ථකුසලෙන | 20 |
| අත්ථද්ධා | 470 |
| අත්ථවසං | 96 |
| අත්ථස්ස විඤ්ඤාපනාය | 474 |
| අත්ථස්ස විඤ්ඤාපනියා | 244 |
| අත්ථං | 78, 82, 88, 118 |
| අත්ථං කාතුං | 212 |
| අත්ථං ගතො | 396 |
| අත්ථමසී | 106 |
| අත්ථාභිසමයා | 342 |
| අත්ථිකො | 140 |
| අත්ථෙ | 16 |
| අත්ථො | 164, 186 |
| අථො පි | 8 |
| අදණ්ඩෙසු | 58 |
| අදස්සනං | 36 |
| අදින්නං | 124 |
| අදින්නාදානා | 2 |
| අදුක්ඛමසුඛා වෙදනා | 380 |
| අදුතියො | 208 |
| අද්දිට්ඨා | 20 |
| අද්ධගූ | 100 |
| අද්ධා | 390 |
| අද්ධානං | 240 |
| අද්ධුවං | 366 |
| අධම්මට්ඨා | 334 |
| අධම්මො | 86 |
| අධිගච්ඡන්ති | 28 |
| අධිගණ්හාති | 342 |
| අධිගමාය | 354 |
| අධිගහෙත්වා | 346 |
| අධිචිත්තමනුයුත්තො | 210 |
| අධිචිත්තෙන | 72, 212 |
| අධිච්චසමුප්පන්නො | 264 |
| අධිට්ඨහානො | 248 |
| අධිට්ඨෙය්‍ය | 22 |
| අධිපන්නස්ස | 96 |
| අධිපාතකා | 274 |
| අධිපාතෙත්වා | 144, 226 |
| අධිමුත්තානං | 82 |
| අධිවාසෙති | 158 |
| අධිසෙස්සති | 34 |
| අධො | 278 |
| අධො කාතුං | 156 |
| අනක්ඛාතෙ | 80 |
| අනඞ්ගණස්ස | 54 |
| අනඞ්ගණො | 84, 112 |
| අනඤ්ඤපොසිනො | 186, 190 |
| අනඤ්ඤපොසිං | 138 |
| අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං | 390 |
| අනත්තං | 290 |
| අනතිමානී | 20 |
| අනත්තසඤ්ඤා | 200 |
| අනත්ථං | 88 |
| අනත්ථජනනො | 432 |
| අනත්ථපදසංහිතා | 46 |
| අනනුගිද්ධො | 20 |
| අනන්තගොචරං | 70 |
| අනන්තවා | 258 |
| අනන්වාහතචෙතසො | 34 |
| අනපලොකෙත්වා | 208 |
| අනපායිනී | 26 |
| අනපෙක්ඛිනො | 110 |
| අනප්පකං | 16, 60 |
| අනභිජාතං | 322 |
| අනභිජ්ඣාලූ | 442 |
| අනභිරතො | 170 |
| අනවජ්ජානි | 6, 460 |
| අනවඤ්ඤත්ති | 416 |
| අනවට්ඨිතචිත්තස්ස | 34 |
| අනවසෙසා | 20 |
| අනාකුලා | 6 |
| අනාගාමිතාය | 318 |
| අනාගාමී | 238 |
| අනාගාරෙහි | 124 |
| අනාගාරෙ | 126 |
| අනාතාපී | 354 |
| අනාතුරා | 76 |
| අනාදරෙ | 354 |
| අනාදානං | 122, 124, 126 |
| අනාදානො | 332 |
| අනාදියිත්වා | 206 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනානුපස්සී | 278 |
| අනාවරං | 420 |
| අනාවිලො | 42, 124 |
| අනාසකා | 58 |
| අනික්කසාවො | 28 |
| අනික්ඛිත්තධුරෙ | 198 |
| අනිච්චතො | 380 |
| අනිච්චසඤ්ඤා | 200 |
| අනිච්චා | 94 |
| අනිච්චානුපස්සී | 426 |
| අනිප්ඵලා | 14, 288 |
| අනිබ්බානසංවත්තනිකා | 430 |
| අනිබ්බිසං | 62 |
| අනිමිත්තෙන | 44 |
| අනිරාකතජ්ඣානා | 370 |
| අනිවෙසනො | 34 |
| අනිස්සටා | 194 |
| අනිස්සිතස්ස | 294 |
| අනිස්සිතො | 44 |
| අනීඝං | 282, 452 |
| අනීඝො | 484 |
| අනීතිහං | 356 |
| අනුකන්තති | 102 |
| අනුකම්පකා | 14 |
| අනුකම්පිකා | 142 |
| අනුගාමිකො | 18 |
| අනුග්ගතා | 200 |
| අනුග්ගතො | 356 |
| අනුග්ගහා | 452, 458 |
| අනුග්ගහො | 336 |
| අනුජාතො | 404 |
| අනුට්ඨහානො | 94 |
| අනුට්ඨානමලා | 84 |
| අනුට්ඨිතා | 260 |
| අනුතප්පති | 40 |
| අනුත්තරං | 354 |
| අනුත්තරෙ | 12, 484 |
| අනුත්ථුනං | 64 |
| අනුත්‍රාසී | 168 |
| අනුද්ධතො | 114, 414 |
| අනුද්ධංසෙති | 372 |
| අනුධම්මචාරී | 30, 252 |
| අනුධම්මො | 428 |
| අනුධාවති | 42 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනුපඝාතො | 212 |
| අනුපතන්ති | 80 |
| අනුපද්දවෙ | 108 |
| අනුපබ්බජ්ජං | 464 |
| අනුපරිගම්ම | 222 |
| අනුපලිත්තො | 112 |
| අනුපවාදො | 212 |
| අනුපාදය | 44, 126 |
| අනුපාදියානො | 30 |
| අනුපාදිසෙසා | 368 |
| අනුපුබ්බකිරියා | 234 |
| අනුපුබ්බනින්නා | 230 |
| අනුපුබ්බපටිපදා | 234 |
| අනුපුබ්බපබ්භාරෙ | 230 |
| අනුපුබ්බපොණා | 230 |
| අනුපුබ්බවිහාරී | 284 |
| අනුපුබ්බසික්ඛා | 234 |
| අනුපුබ්බූපසන්තස්ස | 316 |
| අනුප්පත්තං | 124 |
| අනුප්පත්තසදත්ථො | 368 |
| අනුප්පත්තො | 176 |
| අනුප්පදින්නං | 16 |
| අනුබද්ධො | 444 |
| අනුබ්බිග්ගො | 168 |
| අනුබ්‍රූහයෙ | 40 |
| අනුමත්තො | 96 |
| අනුමොදමානො | 70 |
| අනුමොදරෙ | 14 |
| අනුයුඤ්ජ | 240 |
| අනුයුඤ්ජති | 32, 86 |
| අනුයුඤ්ජෙථ | 32 |
| අනුරුද්ධො | 136 |
| අනුලොමං | 130 |
| අනුවිචින්තයං | 114 |
| අනුවිච්ච | 82 |
| අනුසඞ්කි | 168 |
| අනුස්සදං | 450 |
| අනුස්සරණං | 464 |
| අනුස්සුකා | 76 |
| අනුස්සුතං | 122 |
| අනූපඝාතො | 72 |
| අනූපවාදො | 72 |
| අනූහතෙ | 108 |
| අනෙකජාතිසංසාරං | 62 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනෙකපරියායෙන | 278 |
| අනෙකබ්‍යඤ්ජනො | 186 |
| අනෙකසූපො | 186 |
| අනොජස්ස | 144 |
| අනෙජො | 126, 182 |
| අනෙළගලස්ස | 244 |
| අනොකා | 42 |
| අනොකසාරිං | 124, 192 |
| අනොත්තප්පං | 362 |
| අනොත්තාපී | 354 |
| අන්තකෙන | 96 |
| අන්තකො | 36 |
| අන්තගුණං | 4 |
| අන්තමිදං | 440 |
| අන්තරසරං | 144 |
| අන්තරට්ඨකෙ | 140 |
| අන්තරතො | 168 |
| අන්තරහිතො | 172 |
| අන්තරා | 84, 150 |
| අන්තරා අමිත්තා | 432 |
| අන්තරා කථා | 148 |
| අන්තරාපච්චත්ථිකා | 432 |
| අන්තරාමලා | 432 |
| අන්තරායං | 96 |
| අන්තරාවධකා | 432 |
| අන්තරාසපත්තා | 432 |
| අන්තවං | 258 |
| අන්තළික්ඛං | 134, 232 |
| අන්තළික්ඛෙ | 8, 54 |
| අන්තං | 4 |
| අන්තා | 274 |
| අන්තිමදෙහධරෙ | 458 |
| අන්තිමදෙහධාරිං | 360, 370 |
| අන්තිමසාරීරෙ | 112, 122 |
| අන්තෙපුරෙ | 168 |
| අන්තො | 168 |
| අන්තොපූතිං | 230 |
| අන්ධකරණා | 430 |
| අන්ධතමං | 432 |
| අන්ධභූතෙ | 38 |
| අන්ධභූතො | 68 |
| අන්ධදෙව | 362 |
| අන්ධයො | 426 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අන්වාසත්තා | 196 |
| අන්වෙති | 52 |
| අපගතකාලකං | 224 |
| අපචිතො | 142, 152 |
| අපජිතං | 48 |
| අපත්ථානි | 62 |
| අපදං | 70 |
| අපනාමෙන්ති | 18 |
| අපබොධති | 60 |
| අපමඤ්ඤෙය්‍යුං | 52 |
| අපරඞ්කාරෙ | 264 |
| අපරාජිතා | 8 |
| අපරිජානං | 322 |
| අපරිඤ්ඤාය | 390 |
| අපරිපක්කාය | 198 |
| අපරිපූරෙ | 466 |
| අපලොකෙත්වා | 172 |
| අපලොකෙන්ති | 140 |
| අපසබ්‍යතො | 226 |
| අපහාණධම්මං | 370 |
| අපංසු | 286 |
| අපාචීනං | 480 |
| අපායං | 362 |
| අපාරං | 120 |
| අපාසි | 298 |
| අපුඤ්ඤකරෙ | 398 |
| අපුඤ්ඤලාභං | 102 |
| අපුථුජ්ජනසෙවිතං | 92 |
| අපුනබ්භවාය | 278, 396 |
| අපෙඛා | 110 |
| අපෙතකද්දමො | 44 |
| අපෙතවිඤ්ඤාණො | 34 |
| අපෙතසොකො | 360 |
| අපෙතො | 28 |
| අප්පකා | 42 |
| අප්පකිච්චස්ස | 144 |
| අප්පකිච්චා | 20 |
| අප්පකිලමථෙන | 244 |
| අප්පගබ්භා | 20 |
| අප්පටිකූලා | 178 |
| අප්පටිබද්ධචිත්තා | 80 |
| අප්පටිමො | 300 |
| අප්පතිට්ඨං | 290 |
| අප්පත්තමානසස්ස | 332 |

| අ | පිට්ඨඞ්කා |
| --- | --- |
| අප්පදුට්ඨස්ස | 54 |
| අප්පදුට්ඨෙසු | 58 |
| අප්පභික්ඛුකො | 242 |
| අප්පමත්තා | 8, 30, 158, 452 |
| අප්පමත්තො | 32, 38, 354 |
| අප්පමාදරතා | 106, 370 |
| අප්පමාදවිහාරිනං | 38 |
| අප්පමාදවිහාරිනො | 418 |
| අප්පමාදං | 32 |
| අප්පමාදම්හි | 30 |
| අප්පමාදෙ | 30 |
| අප්පමාදෙන | 32 |
| අප්පමාදො | 6, 30, 342 |
| අප්පමිද්ධො | 414 |
| අප්පම්පි | 30 |
| අප්පලාභො | 114 |
| අප්පසද්දො | 52 |
| අප්පස්මිං | 398 |
| අප්පස්සාදා | 72 |
| අප්පස්සුතායං | 62 |
| අප්පස්සුතො | 398 |
| අප්පහිරිතං | 208 |
| අප්පාතඞ්කං | 158 |
| අප්පානි | 460 |
| අප්පිච්ඡං | 124 |
| අප්පිච්ඡකථා | 198 |
| අප්පිච්ඡො | 210 |
| අප්පියා | 18 |
| අප්පෙන්ති | 232 |
| අප්පො | 68 |
| අප්පොදකපායාසං | 202 |
| අප්පොස්සුක්කො | 106, 168 |
| අබද්ධො මාරස්ස | 396 |
| අබන්ධනං | 282 |
| අබලස්සං | 32 |
| අබ්බණං | 52 |
| අබ්බතො | 90 |
| අබ්භක්ඛාතං | 58 |
| අබ්භඝනා | 406 |
| අබ්භසඤ්ඤසි | 174 |
| අබ්භන්තරං | 122 |
| අබ්භා | 68, 118 |
| අබ්භොකාසො | 138 |
| අබ්‍යාපජ්ජං | 148 |
| අබ්‍යාපජ්ඣං | 340 |
| අබ්‍යාපජ්ඣරතො | 360 |
| අබ්‍යාපජ්ඣාරාමො | 360 |
| අබ්‍රහ්මචරියා වෙරමණී | 2 |
| අබ්‍රහ්මචරියෙන | 372 |
| අබ්‍රහ්මචාරිං | 230 |
| අබ්‍රහ්මචාරී | 372 |
| අභබ්බා | 12, 32, 322, 354, 414 |
| අභයදස්සිනො | 104 |
| අභයො | 88 |
| අභිකිරති | 30 |
| අභික්කන්තවණ්ණා | 6 |
| අභික්කන්තාය රත්තියා | 6 |
| අභික්ඛණං | 164, 214 |
| අභිජ්ඣා | 480 |
| අභිජ්ඣාලු | 442 |
| අභිඤ්ඤාතං | 356 |
| අභිඤ්ඤාය | 112 |
| අභිඤ්ඤාවොසිතො | 128, 380, 402, 428, 456 |
| අභිත්ථරෙථ | 50 |
| අභිනන්දති | 140, 192 |
| අභිනන්දන්ති | 80, 376 |
| අභිනිබ්බුතත්තො | 184 |
| අභිනිම්මිනිත්වා | 148 |
| අභිපත්ථෙන්ති | 18 |
| අභිභුය්‍ය | 106 |
| අභිභූ | 340 |
| අභිමත්ථති | 66 |
| අභිරතිං | 44 |
| අභිරම | 172 |
| අභිරූහති | 104 |
| අභිවට්ටං | 108 |
| අභිවස්සති | 30 |
| අභිවාදනසීලිස්ස | 48 |
| අභිවාදනා | 48 |
| අභිවිජිය | 420 |
| අභිවිහච්ච | 346 |
| අභිසජෙ | 124 |
| අභිසන්දෙන්තා | 408 |
| අභිසමෙච්ච | 20 |
| අභිසම්පරායො | 144 |
| අභිසම්බුජ්ඣති | 482 |
| අභිසම්බුධානො | 36 |
| අභිසල්ලෙඛිකා | 198 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අභිසාපො | 440 |
| අභූතං | 292, 366 |
| අභූතවාදී | 100, 216, 374 |
| අභෙදී | 316 |
| අමතං | 8, 10, 378 |
| අමතං ධාතුං | 402 |
| අමතපදං | 30 |
| අමතොගධං | 124 |
| අමත්තඤ්ඤූ | 26 |
| අමත්තඤ්ඤුතාය | 348 |
| අමමස්ස | 170 |
| අමමො | 184, 192 |
| අමානුසී රති | 116 |
| අමූලකෙන | 372 |
| අමොහසී | 396 |
| අයමහමස්මි | 278 |
| අයොගක්ඛෙමිනො | 386 |
| අයොගා | 94 |
| අයොගුළො | 102, 374, 442 |
| අයොගෙ | 78 |
| අයොසඞ්ඛහතසෙව | 316 |
| අයොජයං | 78 |
| අය්‍යපුත්තා | 158 |
| අය්‍යා | 212, 238 |
| අරඤ්ඤකුටිකායං | 202 |
| අරඤ්ඤගතො | 164 |
| අරඤ්ඤති | 46 |
| අරඤ්ඤෙ | 152 |
| අරතිං | 126 |
| අරහති | 28 |
| අරහත්තමග්ගං | 142 |
| අරහන්තො | 142 |
| අරහා | 4, 238 |
| අරියං ආයතනං | 306 |
| අරියද්දසා | 446 |
| අරියප්පවෙදිතො | 42 |
| අරියභූමිං | 84 |
| අරියසච්චානදස්සනං | 6 |
| අරියසච්චානි | 4, 10, 342 |
| අරියා | 466 |
| අරියානං | 30 |
| අරියානං අනුපවාදකා | 400 |
| අරියානං උපවාදකා | 398 |
| අරියාය පඤ්ඤාය | 364 |
| අරියෙහි | 246 |
| අරියො | 92, 150, 380 |
| අරියො අට්ඨඞ්ගිකො මග්ගො | 4 |
| අරුකායං | 60 |
| අරුණෙ | 180 |
| අරූපධාතු | 378 |
| අරූපසඤ්ඤී | 272 |
| අරූපා | 146, 402 |
| අරූපෙසු | 378 |
| අරොගං | 160 |
| අලං | 204 |
| අලං වතිදං | 196 |
| අලඞ්කතො | 58 |
| අලජ්ජිතාය | 104 |
| අලජ්ජිනො | 214 |
| අලසො | 94 |
| අලාපූනි | 62 |
| අලිකවාදිනං | 82 |
| අලිත්තං | 410 |
| අල්ලකෙසො | 156, 312 |
| අල්ලවත්ථා | 156 |
| අවජානතො | 404 |
| අවජීයති | 70 |
| අවජ්ජදස්සිනො | 104 |
| අවජ්ජෙ | 104 |
| අවණ්ණො | 408 |
| අවත්ථාසි | 206 |
| අවධි | 26 |
| අවන්තිදක්ඛිණාපථො | 242 |
| අවන්තීසු | 238 |
| අවස්සජි | 254 |
| අවස්සුතං | 230 |
| අවික්ඛිත්තං | 446 |
| අවිතක්කසමාධිං | 272 |
| අවිතිණ්ණකඞ්ඛං | 58 |
| අවිජ්ජා | 86, 362 |
| අවිජ්ජානීවරණං | 330 |
| අවිජ්ජාපච්චයා | 13 |
| අවිජ්ජාමූලකා | 362 |
| අවිජ්ජාසවො | 384 |
| අවිතක්කසමාධිං | 272 |
| අවිතිණ්ණකඞ්ඛං | 58 |
| අවිදූරෙ | 20 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අවිජ්ජා | 200 |
| අවිනිපාතධම්මො | 226 |
| අවිරාජයං | 322 |
| අවිරුද්ධං | 124 |
| අවිරූළ්හිවජ්ඥ | 12 |
| අවිසටං | 446 |
| අවිසාරදෙ | 304 |
| අවිහඤ්ඤමානො | 170, 296 |
| අවීචිනිරයං | 436 |
| අවුට්ඨිකසමො | 409 |
| අවෙක්ඛති | 32, 360 |
| අවෙක්ඛන්තං | 68 |
| අවෙක්ඛෙය්‍ය | 36 |
| අවෙච්ච | 10 |
| අවෙරී | 88 |
| අවෙරෙන | 26 |
| අසංවිභජිත්වා | 344 |
| අසංසග්ගකථා | 198 |
| අසංසට්ඨො | 210 |
| අසංහාරියා | 422 |
| අසංහීරා | 422 |
| අසක්කාරෙන | 418 |
| අසඞ්ඛතං | 292, 366 |
| අසඞ්ඛතා | 438 |
| අසජ්ජමානං | 80 |
| අසජ්ඣායමලා | 84 |
| අසඤ්ඤතා | 86, 102, 218, 374 |
| අසඤ්ඤතො | 102, 374 |
| අසණ්ඨිතා | 378, 446 |
| අසතා | 116 |
| අසන්තං | 126 |
| අසද්ධම්මෙහි | 434 |
| අසන්තාසී | 112 |
| අසන්තො | 410 |
| අසපත්තං | 22 |
| අසබ්භා | 42 |
| අසබ්භාහි | 152 |
| අසමාපන්නපුබ්බා | 282 |
| අසමාහිතං | 472 |
| අසමාහිතො | 50 |
| අසම්පකම්පියො | 10 |
| අසම්පජානො | 202 |
| අසම්බාධං | 22 |
| අසයඞ්ඛාරෙ | 264 |
| අසය්හසාහිනං | 360 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අසරීරං | 34 |
| අසස්සතො | 258 |
| අසහමානා | 152 |
| අසංසග්ගෙන | 412 |
| අසංසට්ඨං | 124 |
| අසාතං | 164 |
| අසාධාරණං | 18 |
| අසාධුං | 82 |
| අසාධුනි | 66 |
| අසාරදස්සිනො | 28 |
| අසාරෙ | 28 |
| අසාහසෙන | 88 |
| අසිතං | 452 |
| අසිප්පජීවී | 192 |
| අසුචිසංකස්සරසමාචාරා | 230 |
| අසුභා | 200 |
| අසුභානුපස්සිං | 28 |
| අසුභානුපස්සී | 426 |
| අසුරකඤ්ඤා | 186 |
| අසුරා | 230, 234 |
| අසෙඛෙන | 386 |
| අසෙවනා | 6 |
| අසොකං | 8 |
| අසොකො | 32 |
| අසම්මයං | 66 |
| අසම්මානසමුග්ඝාතාය | 200 |
| අසම්මානස්ස | 148 |
| අස්සතරා | 104 |
| අස්සද්ධො | 46 |
| අස්සමණං | 230 |
| අස්සසිප්පං | 190 |
| අස්සු | 4 |
| අස්සුමුඛො | 40 |
| අහඞ්කාරපසුතා | 270 |
| අහාසි | 26 |
| අහිතානි | 66 |
| අහිරිකෙන | 86 |
| අහිරිකො | 354, 362 |
| අහිං | 150 |
| අහිංසකා | 82 |
| අහිංසා | 90 |
| අහු | 258 |
| අහෙඨයං | 36 |
| අහොරත්තං | 330 |
| අහොරත්තානුසික්ඛිතං | 82 |

| ආ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ආකඞ්ඛමානා | 6 |
| ආකඞ්ඛී | 110 |
| ආකාසගතං | 346 |
| ආකිණ්ණො | 208 |
| ආකිරතෙ | 102 |
| ආගති | 290, 294 |
| ආගන්තුකස්ස | 244 |
| ආගමෙස්සති | 196 |
| ආගමෙහි | 230 |
| ආචරියභරියා | 364 |
| ආචාරකුසලො | 118 |
| ආචාරගොචරසම්පන්නො | 450 |
| ආචික්ඛන්ති | 252 |
| ආචිතං | 52 |
| ආජානීයං | 104 |
| ආජීවිකපකතා | 440 |
| ආතප්පං | 94 |
| ආතාපිනො | 60, 130 |
| ආතාපියො | 222 |
| ආතාපී | 354, 372 |
| ආතුරං | 60 |
| ආතුරෙසු | 76 |
| ආදානපටිනිස්සග්ගෙ | 44 |
| ආදිකල්‍යාණං | 424 |
| ආදිච්චපථො | 68 |
| ආදිච්චො | 120, 146, 386 |
| ආදියන්ති | 10 |
| ආදිසෙ | 308 |
| ආධිපච්චපරිවාරං | 18 |
| ආධිපතෙය්‍යසංවත්තනිකං | 300 |
| ආනන්තරිකං | 8 |
| ආනාපානසති | 200, 426 |
| ආනුපුබ්බිකථා | 224 |
| ආනෙඤ්ජසමාධිනා | 180 |
| ආපදාසු | 16, 256 |
| ආපන්නාති | 186 |
| ආපා | 286 |
| ආපාතපරිපාතං | 274 |
| ආපාදකා | 468 |
| ආපායිකා | 372 |
| ආපායිකො | 334 |
| ආපො | 144 |
| ආබාධං | 58 |
| ආබාධිකො | 136 |

| ආ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ආභස්සරා | 76 |
| ආභස්සරූපගෙ | 340 |
| ආභාති | 120 |
| ආභුජිත්වා | 170 |
| ආමන්තෙති | 170 |
| ආමිසං | 158 |
| ආමිසදානං | 452 |
| ආමිසානුග්ගහො | 452 |
| ආමොදමානො | 408 |
| ආයතග්ගං | 340, 388 |
| ආයතිකෙ | 12 |
| ආයන්තිං | 140 |
| ආයසං | 110 |
| ආයුසඞ්ඛාරං | 254 |
| ආයුසංවත්තනිකා | 300 |
| ආයුසා | 22 |
| ආයොගො | 72 |
| ආරකා'ව | 236, 442 |
| ආරග්ගා | 124 |
| ආරග්ගෙරිව | 122 |
| ආරඤ්ඤිකො | 210 |
| ආරති | 6 |
| ආරද්ධවිරියං | 28 |
| ආරද්ධවිරියො | 198 |
| ආරද්ධා | 358 |
| ආරු | 86, 416 |
| ආරාධයති | 470 |
| ආරාධයෙ | 94 |
| ආරාමරුක්ඛචෙත්‍යානි | 72 |
| ආරියං | 78 |
| ආරුප්පං | 402 |
| ආරුප්පට්ඨායිනො | 402 |
| ආරොග්‍යපරමා | 76 |
| ආරොචෙති | 170 |
| ආලයසමුග්ඝාතො | 438 |
| ආලයා | 124 |
| ආලසියං | 94 |
| ආලොකකරා | 466 |
| ආලොකජාතා | 178 |
| ආලොපො | 344 |
| ආවට්ටති | 156 |
| ආවසථාගාරං | 302 |
| ආවි | 228 |
| ආවිලානි | 208 |

| ආ | පිට්ඨඞ්කා |
|---|---|
| ආසඞ්කථ | 212 |
| ආසජ්ජ | 436 |
| ආසවක්ඛයා | 86 |
| ආසවා | 386 |
| ආසවානං ඛයං | 460 |
| ආසා | 124 |
| ආසාදෙසි | 204 |
| ආසීනං | 120 |
| ආහාරට්ඨිතිකා | 4 |
| ආහාරනෙත්තිප්පභවං | 316 |
| **ඉ** | |
| ඉච්ඡා | 40 |
| ඉච්ඡාදොසා | 114 |
| ඉච්ඡාලොභසමාපන්නා | 90 |
| ඉච්ඡාලොභසමුස්සයා | 362 |
| ඉඤ්ජිතං | 88 |
| ඉණට්ටා | 440 |
| ඉණස්ස | 16 |
| ඉතරීතරෙන | 256 |
| ඉත්ථභාවං | 332 |
| ඉත්ථභාවඤ්ඤථාභාවං | 448 |
| ඉදම්පපහාය | 372 |
| ඉදමෙව සච්චං | 258 |
| ඉද්ධං | 30, 254 |
| ඉද්ධානුභාවො | 186 |
| ඉද්ධිපාද | 238, 250 |
| ඉන්දඛීලූපමො | 44 |
| ඉන්දඛීලො | 10 |
| ඉන්ද්‍රියගුත්ති | 116 |
| ඉන්ද්‍රියසම්පන්නා | 390 |
| ඉන්ද්‍රියානි | 390 |
| ඉන්ද්‍රියෙසු අසංවුතං | 26 |
| ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය | 350 |
| ඉමස්මිං අසති | 132 |
| ඉමස්මිං සති | 130 |
| ඉමස්ස නිරොධා | 132 |
| ඉමස්සුප්පාදා | 130 |
| ඉමෙත්තං | 74 |
| ඉරියාය | 360 |
| ඉසි | 484 |
| ඉසිප්පවෙදිතං | 94 |
| ඉස්සරියං | 18, 40, 164 |
| ඉස්සුකී | 90 |

| ඊ | පිට්ඨඞ්කා |
|---|---|
| ඊසාදන්තස්ස | 210 |
| **උ** | |
| උක්කාධාරා | 466 |
| උක්කුටිකප්පධානං | 58 |
| උක්ඛිත්තපළිඝං | 122 |
| උග්ගමන්ති | 276 |
| උග්ගිරිත්වාන | 156 |
| උච්චයො | 52 |
| උච්චාසද්ද | 176 |
| උච්චාසයන | 2 |
| උච්ඡිජ්ජති | 376 |
| උච්ඡින්ද | 96 |
| උච්ඡින්නභවතණ්හස්ස | 218 |
| උජු | 20 |
| උජුමග්ගානුසාරිනො | 390, 462 |
| උජුං | 34 |
| උජුං කායං | 170 |
| උජ්ජුගතෙසු | 48 |
| උජ්ඣානසඤ්ඤිනො | 86 |
| උජ්ඣාපෙන්තුං | 214 |
| උජ්ඣිතසම්මං | 38 |
| උට්ඨානකාලම්හි | 94 |
| උට්ඨානවතො | 30 |
| උට්ඨානාධිගතං | 408 |
| උට්ඨානෙන | 30 |
| උත්තමත්ථං | 120 |
| උත්තමදමථසමථමනුප්පත්තං | 142 |
| උත්තමපුරිසො | 450 |
| උත්තමපොරිසං | 46 |
| උත්තරාසංගං | 256 |
| උත්තරිකරණීයං | 196 |
| උත්තරෙසු ජනපදෙසු | 142 |
| උත්තානීකරොන්ති | 252 |
| උත්තිට්ඨෙ | 66 |
| උත්තිණ්ණස්ස | 208 |
| උත්‍රාසී | 168 |
| උදකමණිකං | 302 |
| උදකුම්භො | 52 |
| උදතාරි | 278 |
| උදපානා | 286 |
| උදබින්දු | 108, 434 |
| උදබින්දුනිපාතෙන | 52 |

| උ | පිට්ඨඞ්කා |
|---|---|
| උදයත්ථගාමිනියා | 198 |
| උදයබ්බයං | 116 |
| උදයව්‍යයං | 50 |
| උදරියං | 4 |
| උදවා | 248 |
| උදෘතං | 130 |
| උදෘතෙසි | 130 |
| උදීරයෙ | 124 |
| උදීරිතං | 218 |
| උදීරිතො | 360 |
| උදුක්ඛලො | 262 |
| උදෙතං | 260 |
| උද්දිසතු | 228 |
| උද්ධතා | 202 |
| උද්ධතෙ | 180 |
| උද්ධතො | 414 |
| උද්ධරථ | 106 |
| උද්ධරන්ති | 18 |
| උද්ධරිත්වා | 180, 214 |
| උද්ධං | 278 |
| උද්ධං කාතුං | 156 |
| උද්ධංසොතො | 80 |
| උන්නාමෙ | 14 |
| උන්නළා | 202,472 |
| උපකඩ්ඪන්ති | 102 |
| උපකප්පති | 14, 16 |
| උපක්කමන්ති | 272 |
| උපක්කීතකො | 174 |
| උපච්චගා | 104, 124, 126, 194 |
| උපජ්ඣායො | 242 |
| උපට්ඨපෙති | 208 |
| උපට්ඨපෙත්වා | 182 |
| උපට්ඨාකො | 194, 238 |
| උපට්ඨානසාරා | 274 |
| උපට්ඨානසාලායං | 148 |
| උපට්ඨිතා | 84, 182, 366, 480 |
| උපට්ඨිතෙ | 14 |
| උපලිම්බිතෙහි | 172 |
| උපදහෙය්‍ය | 300 |
| උපධික්ඛයං | 346 |
| උපධිපටිනිස්සග්ගං | 378,402 |
| උපධිං | 152, 194 |
| උපධී | 410 |
| උපනය්හන්ති | 26, 419 |
| උපනිසංසන්නියො | 208 |
| උපනිධායං | 172 |
| උපනිධිම්පි | 172 |
| උපනීතවයො | 84 |
| උපපජ්ජන්ති | 54 |
| උපපත්තිං | 126 |
| උපපන්නා | 398, 416 |
| උපපරික්ඛෙය්‍ය | 446 |
| උපමං | 56 |
| උපරිපාසාදවරගතො | 220 |
| උපරිමුද්ධනි | 148 |
| උපලිම්පති | 410 |
| උපලෙපභයා | 410 |
| උපවිජඤ්ඤා | 154 |
| උපසඞ්කමන්තං | 464 |
| උපසන්තසන්තචිත්තස්ස | 220 |
| උපසන්තස්ස | 46, 186 |
| උපසන්තො | 76, 118 |
| උපසමස්ස | 76 |
| උපසමං | 218 |
| උපසම්පදා | 72 |
| උපසම්පදාය | 198 |
| උපසම්මති | 46 |
| උපසෙවති | 408, 410 |
| උපස්සග්ගං | 58 |
| උපහතො | 56 |
| උපාතිධාවන්ති | 274 |
| උපාදානක්ඛයාරාමං | 418 |
| උපාදානං | 130 |
| උපායාසා | 130 |
| උපෙච්චපි | 228 |
| උපෙති | 62, 172 |
| උපෙතො | 28 |
| උපෙහිසි | 84, 110 |
| උපොසථං | 246 |
| උප්පතිතං | 80 |
| උප්පාදෙ | 74 |
| උප්පිලාවා | 200 |
| උබ්බිග්ගා | 164 |
| උබ්භතො | 34 |
| උබ්භිජ්ජ | 108 |
| උභතොපදිත්තං | 440 |
| උභයත්ථ | 28 |
| උභයම්භන්තරෙ | 144, 294 |

| උ | පිටුඅංකය |
|---|---|
| උභො | 124 |
| උභො අඤ්ඤෙ | 342 |

| ක | පිටුඅංකය |
|---|---|
| කකුටපාදිනි | 172 |
| කඞ්ඛති | 246, 410 |
| කඞ්ඛා | 130 |
| කඞ්ඛාවිතරණවිසුද්ධිං | 246 |
| කච්චි | 164 |
| කටසිවඩ්ඪනා | 274 |
| කට්ඨකප්පභෙදනො | 106 |
| කට්ඨකප්ඵලං | 40 |
| කට්ඨකාහි | 156 |
| කට්ඨකස්ස | 66 |
| කණ්ණසුඛාසච්ඡන්නා | 172 |
| කණ්හං | 42 |
| කතකරණීයො | 568 |
| කතකිච්චං | 120 |
| කතකිබ්බිසො | 350 |
| කතඤ්ඤුතා | 6 |
| කතපාපො | 350 |
| කතපුඤ්ඤතං | 6, 20 |
| කතපුඤ්ඤො | 28 |
| කතමෙ | 134 |
| කතස්ස වා පතිච්චයො | 196 |
| කතල්ඵො | 350 |
| කතාකතං | 36 |
| කදරියං | 82 |
| කදරියා | 70 |
| කපණවිසිඛා | 136 |
| කප්පං | 250, 342 |
| කප්පට්ඨො | 334, 434 |
| කප්පාවසෙසං | 250 |
| කප්පිතකෙසමස්සු | 256 |
| කප්පියං | 14 |
| කප්පෙම | 178 |
| කබලං | 106, 344 |
| කම්මන්තා | 6 |
| කම්මපච්චයා | 14 |
| කම්මපථෙ | 94 |
| කම්මරතො | 414 |
| කම්මාති | 6 |
| කම්මාරපුත්තෙන | 294 |
| කම්මාරාමතමනුයුත්තො | 414 |
| කම්මාරාමො | 414 |
| කම්මාරෙ | 84 |
| කයාකකායං | 14 |
| කසිරඤ්ච | 30 |
| කරං | 56 |
| කරණීයං | 20 |
| කරණීයො | 186 |
| කරීසං | 4 |
| කරොතො | 50 |
| කලං | 150 |
| කලභාගම්පි | 172 |
| කලි | 76, 86 |
| කලිඞ්ගරං | 34 |
| කල්‍යාණධම්මො | 404, 450 |
| කල්‍යාණපඤ්ඤො | 450 |
| කල්‍යාණමිත්තො | 198, 200, 334 |
| කල්‍යාණසම්පවඞ්කො | 198 |
| කල්‍යාණසහායො | 198 |
| කල්‍යාණසීලො | 450 |
| කල්‍යාණාධිමුත්තිකා | 412 |
| කල්‍යාණියා | 244 |
| කල්‍යාණෙ | 50, 118 |
| කවචං | 254 |
| කසම්බුජාතං | 230 |
| කසානිවිට්ඨො | 60 |
| කසාමිව | 60 |
| කසි | 14 |
| කසිරෙන | 242 |
| කස්සපෙ | 186 |
| කහාපණවස්සෙන | 72 |
| කංසො | 56 |
| කාකපෙය්‍යා | 310 |
| කාකසූරෙන | 86 |
| කාපොතකානි | 62 |
| කාමකණ්ටකො | 176 |
| කාමකාමා | 42 |
| කාමකාමිනො | 344, 470 |
| කාමගවෙසිනො | 46 |
| කාමතණ්හා | 386 |
| කාමතො | 80 |
| කාමනිස්සරණං | 402 |
| කාමන්ධා | 280 |
| කාමබන්ධාසංහාරිතං | 316 |
| කාමභවපරික්ඛීණං | 126 |
| කාමභොගිනා | 258 |

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කාමයොගයුත්තා | 448 |
| කාමයොගවිසංයුත්තා | 448 |
| කාමරතිසන්ථවං | 32 |
| කාමසඞ්ගසත්තා | 280 |
| කාමසුඛං | 150 |
| කාමානං සමතික්කමො | 148 |
| කාමාසවො | 384 |
| කාමූපපත්තියො | 446 |
| කාමෙසනා | 382 |
| කාමෙසු තිබ්බසාරාගො | 410 |
| කායගතා සති | 182 |
| කායදුක්ඛං | 348 |
| කායදුච්චරිතං | 392, 398 |
| කායුජ්ජු | 148 |
| කායප්පකොපං | 82 |
| කායමුනිං | 394 |
| කායමොනෙය්‍යං | 394 |
| කායසුචරිතෙන | 400 |
| කායසුචිං | 394 |
| කායසොචෙය්‍යං | 394 |
| කායෙන | 378 |
| කායෙන පස්සති | 88 |
| කායෙන සංවරො | 114 |
| කාලඤ්ඤූ | 14 |
| කාලයුත්තං | 240 |
| කාලවිපස්සී | 372 |
| කාලංකතො | 156 |
| කාලං කඞ්ඛති | 410 |
| කාලං මඤ්ඤසි | 196 |
| කාලෙන | 6, 14 |
| කාලෙන කාලං | 188 |
| කාවෙය්‍යසිප්පං | 190 |
| කාසාවං | 28 |
| කාසාවකණ්ඨා | 102, 374, 442 |
| කාසාවමරහති | 28 |
| කාසිකචන්දනං | 258 |
| කිච්චාකිච්චෙසු | 40 |
| කිච්ච | 16 |
| කිච්ඡා | 70 |
| කිච්ඡෙන | 242 |
| කිඤ්චනං | 76, 288 |
| කිඤ්චාපි | 10, 236, 472 |
| කිතවා | 86 |
| කිත්තාවතා | 134, 136 |

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කිත්ති වදෙය්‍යාම | 194 |
| කිමි | 234, 276 |
| කිර | 160, 174, 180 |
| කිලන්තො | 244 |
| කිලිට්ඨං | 28 |
| කිලිස්සෙය්‍ය | 64 |
| කිලොමකං | 4 |
| කිසං | 122 |
| කුක්කුටසූකරා | 364 |
| කුච්ඡිය | 82 |
| කුඤ්ජරො | 104, 106 |
| කුටිසී චීවරෙන | 226 |
| කුණපෙන | 232 |
| කුදුවතං | 26 |
| කුඩ්ඩං | 322 |
| කුබ්බානං | 80 |
| කුමාරකා | 150, 228 |
| කුමාරපඤ්හා | 4 |
| කුම්භාමුඛෙ | 280 |
| කුමුදං | 96 |
| කුම්භූපමං | 34 |
| කුම්මො | 262 |
| කුම්මග්ගං පටිපන්නා | 478 |
| කුරරසරෙ | 238 |
| කුරුතෙ | 36 |
| කුලගන්ධනො | 406 |
| කුල්ලං | 310 |
| කුසග්ගෙන | 40, 410 |
| කුසලානං | 362 |
| කුසලො | 36, 222 |
| කුසාපි | 410 |
| කුසීතං | 26, 412 |
| කුසීතො | 94, 354 |
| කුසො | 102 |
| කුහා | 472 |
| කුහිඤ්චි | 134 |
| කෙවලකප්පං | 6 |
| කෙවලස්ස | 136 |
| කෙවලී | 450 |
| කෙසා | 4 |
| කො චරති | 142 |
| කොඤ්චා | 310 |
| කොට්ඨාගාරෙ | 156 |
| කොට්ඨො | 262 |

| ඛ | පිට්ඨඞ්කා |
|---|---|
| කොධං | 80, 320 |
| කොධුපායාසස්ස | 474 |
| කොපනෙය්‍ය | 206 |
| කොවිදං | 124 |
| කොසජ්ජං | 84 |
| **ඛ** | |
| ඛජ්ජභොජ්ජෙ | 14 |
| ඛණාතීතා | 104 |
| ඛණො | 104 |
| ඛත්තවිජ්ජා | 190 |
| ඛන්ති | 6 |
| ඛන්තිබලං | 122 |
| ඛන්ධසමා | 76 |
| ඛන්ධානං උදයබ්බයං | 480 |
| ඛමනීයං | 164 |
| ඛයං | 8 |
| ඛයං පච්චයානං | 130 |
| ඛයගාමිනං | 380 |
| ඛයගගාමී | 390 |
| ඛරාහි | 156 |
| ඛාරිවිවධං | 254 |
| ඛිත්තො | 34 |
| ඛිප්පං | 38 |
| ඛීණං | 12 |
| ඛීණපුනබ්භවා | 366 |
| ඛීණබීජා | 12 |
| ඛීණසංයොජනා | 136 |
| ඛීරපකො | 96, 310 |
| ඛුද්දං | 20 |
| ඛුද්දපුත්තා | 138 |
| ඛුද්දා විතක්කා | 200 |
| ඛෙත්තානි | 112 |
| ඛෙමං | 8, 72 |
| ඛෙමිනො | 20 |
| ඛෙමී | 88 |
| ඛෙමො | 360 |
| ඛෙළො | 4 |
| **ග** | |
| ගඞ්ගා | 232 |
| ගච්ඡාමි | 2 |
| ගජ්ජිත්වා | 408 |
| ගණනසිප්පං | 190 |
| ගණයං | 30 |
| ගණිකාය | 272 |
| ගතද්ධිනො | 44 |

| ග | පිට්ඨඞ්කා |
|---|---|
| ගති | 102, 118, 144 |
| ගථිතා | 280 |
| ගත්වා | 78 |
| ගන්ධ | 2 |
| ගන්ධජාතානං | 38 |
| ගන්ධබ්බා | 48, 234 |
| ගන්ධබ්බමානුසා | 126 |
| ගබ්භං | 54, 106, 158 |
| ගබ්භසෙය්‍යං | 22 |
| ගබ්භිනී | 154 |
| ගම්භීරපඤ්ඤං | 10, 124 |
| ගරහිතො | 32 |
| ගරුකතො | 142, 152 |
| ගරුකං | 58 |
| ගරුනං දුරු | 364 |
| ගහකාරකං | 62 |
| ගහකූටං | 64 |
| ගහට්ඨා | 470 |
| ගහණං | 122 |
| ගාථාපදං | 46 |
| ගාධති | 146 |
| ගාමෙ | 152 |
| ගාරවො | 6 |
| ගාමී | 144 |
| ගිද්ධා | 280 |
| ගිම්හානමාසෙ | 12 |
| ගිම්හානං පච්ඡිමෙ මාසෙ | 740 |
| ගිරං | 124 |
| ගිහිභොගා | 440 |
| ගුත්තං | 34, 104 |
| ගුහාසයං | 34 |
| ගෙධං | 22 |
| ගෙහනිස්සිතං | 478 |
| ගොචරෙ | 44 |
| ගොචරෙ | 30 |
| ගොත්තෙ | 122 |
| ගොපාලකො | 202 |
| ගොපාලො | 56 |
| ගොපෙථ | 104 |
| ගොපො | 30 |
| ගොරක්ඛා | 14 |
| **ඝ** | |
| ඝටියා | 186 |
| ඝරමෙසිනො | 470 |
| ඝරා | 84 |
| ඝාණෙන සංවරො | 114 |

| ච | පිට්ඨඞ්කා |
|---|---|
| චක්කං | 29 |
| චක්කවත්තීනං | 298 |
| චක්කවත්තිසුඛං | 18 |
| චක්ඛුනා සංවරො | 114 |
| චක්ඛුමන්තො | 376, 466 |
| චක්ඛුමා | 92, 226 |
| චක්ඛූනි | 42 |
| චජන්ති | 42 |
| චතුග්ගුණං | 298, 300 |
| චතුභාගං | 48 |
| චතුසඞ්ගාතිගතො | 272 |
| චතූහපායෙහි | 12 |
| චන්දං ච | 124 |
| චන්දනං | 38 |
| චන්දිමා | 68, 146 |
| චපලං | 34, 202 |
| චරහි | 148, 288 |
| චරිමො | 344 |
| චරෙ | 106 |
| චලිතං | 294 |
| චවති | 18 |
| චවනධම්මො | 420 |
| චාතුරන්තො | 340 |
| චාපා | 64 |
| චාපාතො | 104 |
| චාරිකං | 106 |
| චාලිකායං | 194 |
| චාලිකෙ | 194 |
| චිත්තං | 36, 106, 206 |
| චිත්තකතං | 60 |
| චිත්තක්ඛෙපං | 58 |
| චිත්තක්ලෙසෙහි | 44 |
| චිත්තප්පකොපනො | 432 |
| චිරනිසින්නා | 180 |
| චිරපටිකා | 154 |
| චිරප්පවාසිං | 80 |
| චිරාය | 110 |
| චීයති | 302 |
| චීවරං | 228 |
| චුතිං | 126 |
| චුතූපපාතො | 295 |
| චුන්දස්ස | 294 |
| චෙතසො සමන්නාහරිත්වා | 290 |
| චෙතියම්හි ච | 18 |
| චෙතෙති | 418 |
| චෙතොදුක්ඛං | 348 |

| ච | පිට්ඨඞ්කා |
|---|---|
| චෙතොපදෙසහෙතු | 336 |
| චෙතොපරිවිතක්කං | 142 |
| චෙතොවිමුත්තිං | 420 |
| චෙතොවිමුත්තියා | 198 |
| චෙතොවිමුත්තිසම්පන්නො | 464 |
| චෙතොවිමුත්තිහීනා | 464 |
| චෙතොවිවරණසප්පායා | 198 |
| චෙතොසමථං | 358 |
| චෙතොසමථසාමීචිං | 480 |
| චෙතොසුචිං | 394 |
| චොරතො | 16 |
| චොරාභිනීතා | 440 |
| **ඡ** | |
| ඡන්දං | 52, 362 |
| ඡන්දජාතො | 80 |
| ඡන්නං | 238 |
| ඡමා | 284 |
| ඡම්භිතත්තං | 138 |
| ඡවාලාතං | 440 |
| ඡායා | 26 |
| ඡාරිකා | 314 |
| ඡිජ්ජති | 96, 412 |
| ඡින්නගන්ථි | 208 |
| ඡින්නසංසයං | 452 |
| ඡින්නසංසයො | 484 |
| ඡින්නසංසයා | 448 |
| ඡින්නසොතං | 282 |
| ඡුද්ධො | 34 |
| ඡෙච්ඡති | 112 |
| **ජ** | |
| ජගතිප්පදෙසො | 54 |
| ජගතො ගතිං | 480 |
| ජඞ්ඝාවිහාරං | 196 |
| ජච්චා | 122 |
| ජච්චන්ධා | 260 |
| ජඤ්ඤු | 64 |
| ජටා | 58 |
| ජටාහි | 122 |
| ජටිලා | 140, 244 |
| ජනකුහනත්ථං | 356 |
| ජනපදත්ථාවරියප්පත්තො | 340 |
| ජනපදකල්‍යාණී | 172 |
| ජනලපනත්ථං | 356 |
| ජන්තුගාමිං | 194 |
| ජන්තුනො | 48 |
| ජම්බොනදස්සෙව | 82 |
| ජම්බී | 108 |

| ජ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ජයං | 76 |
| ජරාමරණං | 130 |
| ජරාමරණසඞ්ඛාතං | 366 |
| ජරාය පාරගුං | 360 |
| ජල්ලං | 58 |
| ජහිතා | 12 |
| ජාගරතො | 34, 38 |
| ජාගරන්තා | 372 |
| ජාගරමානානං | 82 |
| ජාගරියං | 372 |
| ජාගරො | 372 |
| ජාතං | 366 |
| ජාතරූප | 2 |
| ජාතරූපං | 232 |
| ජාති | 130 |
| ජාතික්ඛයං | 128 |
| ජාතික්ඛයන්තදස්සිං | 370 |
| ජාතිජරාභිභූතං | 360 |
| ජාතිජරූපගා | 110, 464 |
| ජාතිභයපරික්ඛයං | 364 |
| ජාතිමරණගාමිනො | 336, 366 |
| ජාතිමරණං | 410 |
| ජාතිමරණස්ස | 370 |
| ජාතිසංසාරො | 218 |
| ජාතු | 22 |
| ජානෙත | 38 |
| ජානතො | 460 |
| ජාතිං | 58, 222 |
| ජානුමණ්ඩලං | 256 |
| ජාපයෙ | 348 |
| ජාලං | 86, 110 |
| ජාලමුත්තො | 68 |
| ජාලසඤ්ඡන්නං | 280 |
| ජිගුච්ඡමානො | 974 |
| ජිගුච්ඡමානා | 376 |
| ජිඝච්ඡාපරමා | 76 |
| ජිතං ච | 34 |
| ජිව්හාය සංවරො | 114 |
| ජීරති | 62 |
| ජීවලොකස්මිං | 226 |
| ජීවිතසංඛයම්හි | 106 |
| ජීවිතන්තරායාතං | 144 |
| ජීවිතහෙතුපි | 234 |
| ජීවිතං | 56 |

| ජ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ජීවිතුකාමො | 52 |
| ජුණ්හාය | 204 |
| ජුතිමන්තො | 44 |
| ජුහන්ති | 140 |
| ජෙට්ඨම්හි | 18 |
| ජෙය්‍ය | 48 |
| ජොතන්ති | 146 |
| **ඣ** | |
| ඣානං | 116 |
| ඣාය | 116 |
| ඣායතො | 130 |
| ඣානපසුතා | 70 |
| ඣානලාභී | 372 |
| ඣාපෙථ | 144 |
| ඣායතො | 130 |
| ඣායන්තො | 32 |
| ඣායමානෙසු | 274 |
| ඣායිං | 120 |
| ඣායිනො | 30, 50, 94, 246 |
| ඣායී | 354 |
| ඣායිහි | 412 |
| **ඤ** | |
| ඤත්තං | 40 |
| ඤාතකා | 36 |
| ඤාතකානං | 6 |
| ඤාතිධම්මො | 16 |
| ඤාතිපෙතා | 14 |
| ඤාතීනං | 14 |
| **ඨ** | |
| ඨානසො | 16 |
| ඨානා | 18 |
| ඨිතං | 206 |
| ඨිතධම්මො | 230 |
| ඨිතස්ස | 170 |
| ඨිති | 60,4 28 |
| ඨිතෙන | 248 |
| ඨිතො | 182 |
| **ඩ** | |
| ඩය්හමානො | 116 |
| ඩහං | 32 |
| ඩහති | 58 |

| ඩ | පිට්ඨඞ්කා |
|---|---|
| ඩහනානං | 40 |
| ඩංස -පෙ- සම්ඵස්සා | 148 |

| ත | පිට්ඨඞ්කා |
|---|---|
| තක්කරෙ | 30 |
| තක්කිකා | 276 |
| තගරචන්දනී | 38 |
| තගරමල්ලිකා | 38 |
| තගරං | 410 |
| තචසාරං | 338 |
| තචො | 4 |
| තච්ඡකා | 42 |
| තණ්හක්ඛයරතො | 72 |
| තණ්හක්ඛයවිමුත්තිනො | 382 |
| තණ්හක්ඛයසුඛස්ස | 150 |
| තණ්හක්ඛයෙ | 112 |
| තණ්හක්ඛයෙ (විමුත්තං) | 360 |
| තණ්හක්ඛයො | 112, 438 |
| තණ්හා | 130, 386 |
| තණ්හාඡදනඡාදිතා | 280 |
| තණ්හාදුතියො | 332, 468 |
| තණ්හානුසයෙ | 108 |
| තණ්හාභවපරික්ඛීණං | 126 |
| තණ්හාය | 96 |
| තණ්හානුසයෙ | 108 |
| තණ්හායොගෙන | 386 |
| තණ්හාසංඛයවිමුත්තිං | 282 |
| තණ්හාසමා | 86 |
| තණ්හුප්පාදා | 466 |
| තතියම්පි | 2 |
| තතියා විජ්ජා | 456 |
| තතො | 102, 374 |
| තථාකාරී | 482 |
| තථාවාදී | 482 |
| තථාගතං | 12, 360, 396 |
| තථාගතප්පවෙදිතෙ | 236 |
| තථාරූපස්ස | 48 |
| තථූපමං | 10 |
| තදහුපොසථෙ | 228 |
| තදුට්ඨාය | 84 |
| තදායතනං | 290 |
| තනුකො | 68 |
| තනු | 346 |
| තනතං | 186 |
| තපති | 120, 218 |
| තපතෙ | 346 |
| තපනීයා | 350 |
| තපො | 6, 74 |
| තප්පති | 28, 56, 350 |
| තමොක්ඛන්ධං | 330 |
| තමඞ්ගතං | 346 |
| තමො | 146 |
| තමොනුදං | 360, 466 |
| තයස්සු | 12 |
| තරමානරූපො | 142 |
| තරුණවච්ඡා | 144 |
| තසන්ති | 56 |
| තසරං | 186 |
| තසං | 360 |
| තසා | 20 |
| තසිතං | 110 |
| තසිතාය | 110 |
| තසෙසු | 124 |
| තං ජීවං | 258 |
| තාණතා | 96 |
| තාදී | 44, 194 |
| තාදිතා | 368 |
| තාදිනො | 44, 170 |
| තාරකරූපානං | 346 |
| තාරගණා | 346 |
| තාව | 196 |
| තාවතා | 88 |
| තාවදෙව | 142 |
| තාදිසෙ | 74 |
| තිණ්ණදෙසාති | 112 |
| තිණ්ණසොකපරිද්දවෙ | 74 |
| තිණ්ණො | 396 |
| තිතික්ඛති | 104 |
| තිතික්ඛා | 72 |
| තිතික්ඛිස්සං | 104 |
| තිත්ති | 72 |
| තිබ්බරාගස්ස | 110 |
| තිබ්බාහි | 156 |
| තිමිංගලො | 234 |
| තිමිරපිඞ්ගලො | 234 |
| තිරොකුඩ්ඩෙසු | 14 |
| තීරමෙව | 42 |
| තීරෙති | 164 |
| තීරෙත්වා | 154 |

| ත | පිට්ඨඞ්කා |
|---|---|
| තීහි විතක්කෙහි | 158 |
| තුට්ඨස්ස | 148 |
| තුට්ඨි | 106 |
| තුණ්හිමාසීනං | 82 |
| තුණ්හීභාවො | 150 |
| තුදන්ති | 218 |
| තුලමතුලං | 254 |
| තුලංව | 90 |
| තුවටං | 172 |
| තෙචීවරිකො | 210 |
| තෙජතං | 34, 42 |
| තෙජො | 146 |
| තෙජොධාතුං | 314 |
| තෙලං | 154 |
| තෙලප්පදීපං | 302 |
| තෙවිජ්ජං | 454 |

| ථ | |
|---|---|
| ථණ්ඩිලසායිකා | 58 |
| ථනයිත්වා | 408 |
| ථද්ධා | 472 |
| ථම්භං | 302 |
| ථරුසිප්පං | 190 |
| ථලං | 232 |
| ථලෙ | 34 |
| ථාමවා | 200 |
| ථාවරං | 360 |
| ථාවරෙසු | 124 |
| ථිනමිද්ධබහුලො | 354 |
| ථිනමිද්ධාභිභූ | 202 |
| ථූතං | 286 |
| ථූතො | 262 |
| ථූපං | 144 |
| ථූලං | 32 |
| ථෙරො | 88 |
| ථොකිකා | 102 |

| ද | පිට්ඨඞ්කා |
|---|---|
| දක්ඛිණාමාදිසෙ | 308 |
| දක්ඛිණං | 16 |
| දක්ඛිණෙය්‍යා | 10 |
| දජ්ජා | 16, 82 |
| දජ්ජුං | 344 |
| දඩ්ඪං | 144 |
| දණ්ඩස්ස | 56 |
| දණ්ඩං | 58, 102 |
| දණ්ඩෙන | 66, 150 |
| දදතො මලං | 84 |
| දන්තං | 104, 142 |
| දන්තා | 4 |
| දන්තො | 104 |
| දබ්බං | 50 |
| දබ්බි | 38 |
| දමෙථා | 34 |
| දමයං | 100 |
| දමසච්චෙන | 28 |
| දමස්ස | 340 |
| දමෙන | 18 |
| දමො | 90 |
| දමෙමථ | 64 |
| දසවග්ගං | 242 |
| දසසික්ඛා | 2 |
| දස්සයන්ති | 42 |
| දසහංගෙහි | 4 |
| දස්සනසම්පදාය | 12 |
| දස්සනස්ස විසුද්ධියා | 92 |
| දස්සනං | 6, 464 |
| දස්සනෙන | 22 |
| දහරා | 154 |
| දහෙථ | 152 |
| දළිද්දවිසිඛා | 136 |
| දළ්හපරක්කමො | 30, 198 |
| දළ්හං කයිරා | 38 |
| දළ්හෙන | 10 |
| දාතා | 406 |
| දානානි | 452 |
| දානමයං | 388 |
| දානසංවිභාගරතස්ස | 344 |
| දානං | 6 |
| දානෙන | 18 |
| දායාද | 18 |
| දාරුචීරියො | 142 |
| දාරුජං | 110 |
| දාරුණං | 58 |
| දාරුං | 42, 412 |
| දිට්ඨධම්මිකං | 342, 368 |
| දිට්ඨපදස්ස | 12 |
| දිට්ඨ[illegible]දෙ | 218 |

| ද | පිට්ඨඞ්කා |
|---|---|
| දිට්ඨමත්තං | 444 |
| දිට්ඨිගතෙහි | 374 |
| දිට්ඨිට්ඨානා | 382 |
| දිට්ඨියා | 354 |
| දිට්ඨිං | 22, 274 |
| දිට්ඨෙ | 144 |
| දිට්ඨෙව ධම්මෙ | 174, 372 |
| දිද්ධා | 410 |
| දින්නානි | 10 |
| දිය්‍යති | 156 |
| දිබ්බචක්ඛු | 388 |
| දිබ්බං යොගං | 126 |
| දිබ්බෙන චක්ඛුනා | 140 |
| දිබ්බෙසු | 18 |
| දිවා | 120 |
| දිවාදිවස්ස | 156 |
| දිවාවිහාරං | 138 |
| දිවියං | 150 |
| දිසො | 34, 204 |
| දීපමත්තානො | 84 |
| දීපං | 30 |
| දීපෙති | 114 |
| දුක්කතං | 102, 120 |
| දුක්ඛක්ඛන්ධස්ස | 3 |
| දුක්ඛතො | 380 |
| දුක්ඛපරෙතා | 440 |
| දුක්ඛසමුප්පාදං | 74 |
| දුක්ඛස්සන්තං | 92 |
| දුක්ඛා | 56, 94 |
| දුක්ඛානුපතිතද්ධගූ | 100 |
| දුක්ඛාභිකිණ්ණා | 440 |
| දුක්ඛා වෙදනා | 380 |
| දුක්ඛිතො | 136 |
| දුක්ඛූපසමගාමිනං | 74, 464 |
| දුඛා | 72, 100 |
| දුඛෙන | 42 |
| දුග්ගං | 126 |
| දුග්ගති | 28, 348, 364 |
| දුග්ගතියො | 362 |
| දුග්ගතිතො | 102 |
| දුග්ගා | 106 |
| දුච්චරිතං | 68, 84 |
| දුච්චරිතානි | 392 |
| දුච්ඡන්නං | 28 |
| දුජ්ජයං | 420 |
| දුජ්ජානං | 144, 258 |
| දුට්ඨා | 326 |
| දුතියම්පි | 2 |
| දුතියා විජ්ජා | 454 |
| දුත්තරං | 396 |
| දුද්දමො | 64 |
| දුද්දසං | 290 |
| දුද්දසිකං | 282 |
| දුද්දිට්ඨිං | 108 |
| දුන්නිග්ගහස්ස | 34 |
| දුන්නිවාරයං | 34, 106 |
| දුප්පඤ්ඤෙන | 256 |
| දුප්පඤ්ඤො | 50, 58, 392 |
| දුප්පබ්බජ්ජං | 100 |
| දුප්පමුඤ්චං | 110 |
| දුප්පරාමට්ඨං | 102 |
| දුබ්බණ්ණං | 282 |
| දුබ්භගො | 442 |
| දුබ්භික්ඛෙ | 16 |
| දුබ්බෙහ | 436 |
| දුම්මෙධං | 112 |
| දුම්මෙධා | 40 |
| දුම්මෙධිනො | 32 |
| දුම්මෙධො | 56, 66 |
| දුරච්චයං | 108 |
| දුරතික්කමා | 166 |
| දුරතිවත්තං | 158 |
| දුරන්නයා | 44 |
| දුරභිරමං | 100 |
| දුරාවාසා | 100 |
| දුරුත්තස්ස | 16 |
| දුල්ලභං | 64 |
| දුස්සති | 54, 58 |
| දුස්සීලා | 404 |
| දුස්සීලො | 50, 102 |
| දූරක්ඛං | 34 |
| දූරඞ්ගමං | 34 |
| දූරමං | 42 |
| දෙවකායා | 158 |
| දෙවදත්තො | 246, 434 |
| දෙවදුන්දුභියො | 254 |
| දෙවමනුස්සපූජිතං | 12 |

| ද | පිට්ඨඞ්කා |
|---|---|
| දෙවරජ්ජම්හි | 18 |
| දෙවසඞ්ඝ | 418 |
| දෙවං | 148 |
| දෙවානමින්දස්ස | 172 |
| දෙවො | 138 |
| දෙසෙස්සන්ති | 252 |
| දොසග්ගි | 444, 446 |
| දොසජෙහි | 192 |
| දොසදොසා | 112 |
| දොසසඤ්ඤිතං | 350 |
| දොසසමො | 76, 86 |
| දොසං | 318 |
| දොසො | 124, 378, 394 |
| ද්වත්තිංසාකාරං | 4 |
| ද්වයං කරණීයං | 150 |
| ද්වයෙසු | 118 |
| ද්වාරබාහාසු | 14 |
| ද්විපදානං | 72 |
| ද්වෙධාපථං | 310 |
| ද්වෙ විතක්කා | 360 |
| **ධ** | |
| ධනං | 32 |
| ධනපාලකො | 106 |
| ධමනිසන්ථතං | 122 |
| ධම්මචක්ඛුං | 224 |
| ධම්මචරියා | 6 |
| ධම්මචාරිනො | 214 |
| ධම්මචාරී | 66, 68 |
| ධම්මජා | 458 |
| ධම්මජීවිනං | 66 |
| ධම්මජීවිනො | 30 |
| ධම්මට්ඨං | 80 |
| ධම්මට්ඨා | 88, 392 |
| ධම්මදානං | 452 |
| ධම්මදායාද | 458 |
| ධම්මදෙසනා | 362 |
| ධම්මධරො | 88 |
| ධම්මධරා | 252 |
| ධම්මනිම්මිතා | 458 |
| ධම්මපදං | 36, 46 |
| ධම්මපීති | 42 |
| ධම්මපීතිරසං | 76 |
| ධම්මමයං | 360 |

| ධ | පිට්ඨඞ්කා |
|---|---|
| ධම්මයාගං | 458 |
| ධම්මරතිං | 112 |
| ධම්මරතො | 114, 428 |
| ධම්මරසො | 112 |
| ධම්මවරං | 12 |
| ධම්මවිතක්කං | 428 |
| ධම්මවිනයං | 226 |
| ධම්මවිනයෙ | 236 |
| ධම්මවිනිච්ඡයෙන | 60 |
| ධම්මසවණං | 6 |
| ධම්මසංවිභාගො | 452, 458 |
| ධම්මසාකච්ඡා | 6 |
| ධම්මසාරාධිගමා | 368 |
| ධම්මසෙනාපතිනා | 164 |
| ධම්මස්ස ගුත්තො | 88 |
| ධම්මස්සානුධම්මං | 144 |
| ධම්මං | 328 |
| ධම්මං නප්පමජ්ජති | 88 |
| ධම්මං විපස්සතො | 116 |
| ධම්මා | 26, 94, 130 |
| ධම්මාධිකරණං | 144 |
| ධම්මාති | 42 |
| ධම්මානුග්ගහො | 452 |
| ධම්මානුධම්මපටිපන්නා | 252. 428 |
| ධම්මානුවත්තිනො | 42 |
| ධම්මාරාමො | 114, 428 |
| ධම්මිකො | 42 |
| ධම්මී | 150 |
| ධම්මී වා කථා | 188 |
| ධම්මෙන | 8 |
| ධම්මෙසු | 6 |
| ධම්මො | 90, 122 |
| ධංසිනා | 86 |
| ධාතුයො | 378 |
| ධාතුසො | 412 |
| ධාරණ | 2 |
| ධාරෙථ | 232 |
| ධී | 120 |
| ධීරා | 30 |
| ධීරූපසෙවනා | 410 |
| ධීරො | 32 |
| ධුතවාදෙ | 210 |
| ධුතමානස්ස | 170 |
| ධුවං | 60 |
| ධොරය්හසීලං | 78 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| න කම්පති | 8 |
| නක්ඛත්තපථං | 78 |
| නඛා | 4 |
| නගරං | 104 |
| නගරූපමං | 34 |
| නග්ගචරියා | 58 |
| නඞ්ගලීසා | 262 |
| නඞ්ගුට්ඨං | 262 |
| නච්චගීත | 2 |
| නට්ඨං | 214 |
| නති | 294 |
| න දූතා | 406 |
| නදී | 86 |
| නද්ධිං | 122 |
| නන්දති | 28 |
| නන්දීභවපරික්ඛීණා | 124 |
| නන්දීමුඛියා | 180 |
| න පමාණමෙති | 396 |
| නප්පකාසති | 146 |
| නමස්සමානො | 148 |
| නයන්ති | 42 |
| න රජ්ජති | 324 |
| නලං'ව | 108 |
| නවං | 12 |
| නව සත්තාවාසා | 4 |
| නවොරොපිතෙහි | 204 |
| නහාරු | 4 |
| න හිංසෙ | 222 |
| න හොති පරම්මරණා | 376 |
| නාගරජා | 148 |
| නාගං | 142, 206 |
| නාගා | 234 |
| නාගො'ව | 104 |
| නාගඝති | 150 |
| නාතිමඤ්ඤති | 114 |
| නාතිමඤ්ඤෙථ | 22 |
| නාථො | 64, 118 |
| නාධිගච්ඡෙය්‍ය | 38 |
| නාධිමුච්චති | 374 |
| නානාඛන්තිකා | 258 |
| නානාතිත්ථියා | 258 |
| නානාදිට්ඨිකා | 258 |
| නානාදිට්ඨිනිස්සයනිස්සිතා | 258 |
| නානාරුචිකා | 258 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| නානුභවති | 168 |
| නානුභවන්ති | 164 |
| නාභිනන්දෙය්‍ය | 40 |
| නාමගොත්තානි | 232 |
| නාමඤ්ච රූපඤ්ච | 4 |
| නාමරූපං | 130 |
| නාමරූපපච්චයා | 130 |
| නාමරූපස්මිං | 116 |
| නායකොනෙව | 270 |
| නාවං | 116 |
| නිකාමලාභී | 198 |
| නිකාමසෙය්‍යං | 102 |
| නිකුබ්බෙථ | 22 |
| නිකෙතෙ | 44 |
| නික්කසාවො | 134 |
| නික්කාමිතො | 10 |
| නික්කුහා | 470 |
| නික්ඛන්තො | 228 |
| නික්ඛාමිතො | 230 |
| නික්ඛාමෙත්වා | 230 |
| නික්ඛිත්තො | 354 |
| නික්ඛිපිත්වා | 138 |
| නිඛණාහි | 296 |
| නිඛනිත්වා | 214 |
| නිගච්ඡති | 40, 58 |
| නිගණ්ඨා | 254 |
| නිග්ගය්හවාදිං | 40 |
| නිග්ගහෙස්සාමි | 106 |
| නිච්ඡරන්ති | 418 |
| නිච්ඡාතො | 380 |
| නිච්ඡෙය්‍ය | 88 |
| නිදස්සිතො | 16 |
| නිද්ධමෙ | 84 |
| නිට්ඨංගතො | 112 |
| නිට්ඨුභිත්වා | 226 |
| නිල්ලපා | 472 |
| නිත්තණ්හා | 284 |
| නිත්තිණ්ණො | 176 |
| නිද්දරෙ | 76 |
| නිද්දූසිතා | 106 |
| නිද්දාරතො | 414 |
| නිද්දාරාමමනුයුත්තො | 414 |
| නිද්දාරාමො | 414 |
| නිද්ධන්තමලො | 84 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| නිධාය | 58 |
| නිධිං | 16 |
| නිධෙති | 16 |
| නින්දං | 60 |
| නින්හාතපාපකං | 594 |
| නින්නගං | 310 |
| නින්නං | 14 |
| නින්නෙන | 46 |
| නිපකං | 106 |
| නිපකො | 20, 354, 372 |
| නිපජ්ජං | 300 |
| නිපතිත්වා | 142 |
| නිප්පපඤ්චා | 88 |
| නිප්පාපො | 76 |
| නිබ්බනථො | 76 |
| නිබ්බනන්ති | 12 |
| නිබ්බානං | 158 |
| නිබ්බානගමනං | 96 |
| නිබ්බානගාමිං | 12 |
| නිබ්බානගාමිනං | 40 |
| නිබ්බානධාතුයා | 236 |
| නිබ්බානධාතුයො | 368 |
| නිබ්බානපරමං | 76 |
| නිබ්බානසච්ඡිකිරියා | 6 |
| නිබ්බානසන්තිකෙ | 116 |
| නිබ්බානාය | 354 |
| නිබ්බානොගධගාමිනං | 356 |
| නිබ්බින්දති | 94 |
| නිබ්බින්දථ | 362 |
| නිබ්බුතං | 124 |
| නිබ්බුතස්ස | 194 |
| නිබ්බුතිං | 10 |
| නිබ්බුතො | 74, 126 |
| නිබ්බෙධිකාය | 198 |
| නිබ්බෙධගාමිනී | 364 |
| නිමන්තෙති | 160 |
| නිමුජ්ජති | 140 |
| නිම්මලා | 86 |
| නිම්මානරතිනො | 448 |
| නියං පුත්තං | 22 |
| නිය්‍යන්ති | 68 |
| නිය්‍යන්තා | 226 |
| නිරත්ථං | 34 |

| න | පිට්ඨඞ්කා |
|---|---|
| නිරයං | 374, 392, 398, 416 |
| නිරාකාරෙ | 432 |
| නිරාසං | 276 |
| නිරාසයං | 124 |
| නිරාසො | 192, 382, 384 |
| නිරුජ්ඣති | 132 |
| නිරුත්තිපදකොවිදෙ | 112 |
| නිරූපධිං | 126, 152, 244, 378 |
| නිරොධධාතු | 378 |
| නිරොධෙ | 378 |
| නිරොධො | 132, 402 |
| නිරොධි | 316 |
| නිවාතෙ | 444 |
| නිවාතො | 6 |
| නිවාපපුට්ඨා | 106 |
| නිවාරයෙ | 42 |
| නිවිට්ඨං | 364 |
| නිවිට්ඨා | 422 |
| නිවුතා | 330 |
| නිවෙසනං | 306 |
| නිවෙසනානි | 306 |
| නිවෙසයෙ | 64 |
| නිවෙසෙය්‍ය | 94 |
| නිසජ්ජාය | 244 |
| නිසම්මකාරිනො | 30 |
| නිසාමෙථ | 8 |
| නිසෙධො | 120 |
| නිස්සරණං | 292, 366, 402 |
| නිස්සරණියා ධාතුයො | 402 |
| නිස්සිතස්ස | 294 |
| නිහන්ත්වා | 236 |
| නිහීනකම්මා | 100, 216, 374 |
| නිහුහුංකො | 134 |
| නීවරණෙන | 330 |
| නීහරිතුං | 156 |
| නීහරිත්වා | 144 |
| නු | 60 |
| නුදති | 32 |
| නෙක්ඛං | 82 |
| නෙක්ඛම්මසුඛං | 92 |
| නෙක්ඛම්මූපසමෙ | 70 |
| නෙත්තිකා | 42 |
| නෙත්තිජින්නස්ස | 220, 446 |
| නෙරයිකා | 372 |

| න | පිට්ඨඞ්කා |
| --- | --- |
| නෙරයිකො | 334, 434 |
| නෙරෙසි | 56 |
| නෙවජ්ඣගා | 222 |
| නෙවාසිකෙහි | 176 |
| නොච්චාවචං | 42 |
| න්හාතකං | 126 |
| **ප** | |
| පකාසන්ති | 100 |
| පකිරෙති | 442 |
| පකුබ්බතො | 36 |
| පක්කමන්තිං | 140 |
| පක්කුලො | 138 |
| පක්ඛන්දති | 374 |
| පක්ඛන්දිතා | 86 |
| පක්ඛාලෙත්වා | 244 |
| පගබ්භත | 86 |
| පග්ගය්හ | 90 |
| පඞ්කො | 58, 106, 176 |
| පඞ්කා | 58 |
| පචිතත්තං | 36 |
| පවෙස්සති | 36 |
| පච්චති | 40, 52 |
| පච්චන්තං | 66 |
| පච්චනුභූතං | 340 |
| පච්චනුභොති | 368 |
| පච්චනුභොන්තෙත | 258 |
| පච්චත්තං | 104 |
| පච්චපාදි | 144 |
| පච්චවෙක්ඛමානො | 218 |
| පච්චුපට්ඨිතකාමා | 448 |
| පච්චුපට්ඨිතා | 470 |
| පච්චුප්පන්නෙ | 390 |
| පච්චෙකබුද්ධං | 226 |
| පච්චෙකබොධි | 20 |
| පවෙච්ඡති | 54 |
| පච්ඡතො | 110 |
| පච්ඡාහතත්තං | 148 |
| පච්ඡාසමණෙන | 310 |
| පජා | 42 |
| පජාපති | 154 |
| පජාය | 8 |
| පජ්ජලිතෙ | 60 |
| පජ්ජොතකරා | 466 |

| ප | පිට්ඨඞ්කා |
| --- | --- |
| පඤ්චබලානි | 238 |
| පඤ්චසඞ්ගාතිගො | 116 |
| පඤ්චින්ද්‍රියානි | 238 |
| පඤ්චුපාදානක්ඛන්ධා | 4 |
| පඤ්ජලිකො | 148 |
| පඤ්ඤවතා | 256 |
| පඤ්ඤා | 116, 364 |
| පඤ්ඤාකථා | 198 |
| පඤ්ඤාක්ඛන්ධො | 386, 480 |
| පඤ්ඤාචක්ඛු | 388 |
| පඤ්ඤානිරොධිකා | 430 |
| පඤ්ඤාපයමානො | 176 |
| පඤ්ඤාපෙන්ති | 452 |
| පඤ්ඤාපාසාදං | 32 |
| පඤ්ඤාවිමුත්ති | 174, 420 |
| පඤ්ඤාසම්පන්නා | 464 |
| පඤ්ඤාසීලසමාහිතා | 82 |
| පඤ්ඤුත්තරා | 370 |
| පටික්කොසති | 66 |
| පටික්ඛිපිත්වා | 186 |
| පටිග්ගහණං | 2 |
| පටිසඤ්ඤා | 22 |
| පටිච්ච | 152, 270 |
| පටිච්චසමුප්පන්නං | 402 |
| පටිච්චසමුප්පාදං | 130 |
| පටිච්ඡන්ති | 470 |
| පටිච්ඡන්නකම්මන්තං | 230 |
| පටිච්ඡාදය | 12 |
| පටිජග්ගෙය්‍ය | 64 |
| පටිදණ්ඩා | 56 |
| පටිනිවත්තිත්වා | 140 |
| පටිනිස්සට්ඨා | 382 |
| පටිපජ්ජථ | 92 |
| පටිපජ්ජන්ති | 356 |
| පටිපන්නා | 158 |
| පටිප්පස්සම්භි | 240 |
| පටිබද්ධචිත්තො | 156, 272 |
| පටිබද්ධමනො | 96 |
| පටිබද්ධරූපො | 154 |
| පටිබද්ධො | 164 |
| පටිබාහාය | 306 |
| පටිභාති | 204 |
| පටිභාතු | 244 |
| පටිභාසෙය්‍ය | 180 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පටිමානෙ | 118 |
| පටියාදාපෙත්වා | 202 |
| පටිලාභාය | 172 |
| පටිවෙදඤ්ඤූ | 56 |
| පටිවාතං | 38 |
| පටිසන්ථාරවුත්ති | 118 |
| පටිසම්භිදා | 20 |
| පටිසම්මොදමානා | 176 |
| පටිසල්ලානරතා | 370 |
| පටිසල්ලානා | 148 |
| පටිසල්ලානාරාමා | 370 |
| පටිසල්ලීනස්ස | 142 |
| පටිසංහරිත්වා | 148 |
| පටිසාමයමානා | 176 |
| පටිසෙවති | 40 |
| පටිසොතං | 472, 474 |
| පටිස්සවා | 174 |
| පඨමා විජ්ජා | 454 |
| පට්ඨපෙන්ති | 252 |
| පඨමාභිසම්බුද්ධො | 130, 148 |
| පඨවි | 146 |
| පඨවිසමො | 44 |
| පඨවිංසිතො | 10 |
| පණාමිතා | 178 |
| පණිධාය | 170 |
| පණීතං | 8 |
| පණෙති | 102 |
| පණ්ඩිතජාතියො | 308 |
| පණ්ඩිතමානී | 38 |
| පණ්ඩිතා | 30 |
| පණ්ඩිතාභාසා | 248 |
| පණ්ඩිතානං | 6 |
| පණ්ඩිතො | 144 |
| පණ්ඩුපලාසො | 84 |
| පණ්ණකුටියො | 178 |
| පතිගණ්හන්ති | 80 |
| පතිට්ඨාය | 200 |
| පතිරූපදෙසවාසො | 6 |
| පතිරූපං | 150 |
| පතිරූපෙ | 64 |
| පතිසල්ලීනස්ස | 238 |
| පතිස්සතා | 60 |
| පතිස්සතො | 334, 346 |
| පතීතො | 40 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පත්තං | 274 |
| පත්තපාණී | 440 |
| පත්තපුටසෙව | 410 |
| පත්තබ්බං | 274 |
| පත්තමානසං | 420 |
| පත්තා'පි | 410 |
| පත්තිපත්තං | 360 |
| පත්තිපත්තා | 10 |
| පත්ථයා | 70 |
| පදං | 88 |
| පදාලයුං | 330 |
| පදාලෙය්‍ය | 206 |
| පදීපං | 60 |
| පදීපො | 12 |
| පදුට්ඨචිත්තං | 336 |
| පදුට්ඨමනසඞ්කප්පො | 440 |
| පදුට්ඨෙත්ථ | 26 |
| පදුස්සිතුං | 436 |
| පදෙසරජ්ජං | 18, 340 |
| පදෙසවස්සී | 406 |
| පධානප්පිකස්ස | 196 |
| පධානමනුවිශෙණො | 436 |
| පධානාය | 196 |
| පනිධාය | 398 |
| පනාමෙමි | 178 |
| පනුද | 118 |
| පන්තං | 72, 212 |
| පනුන්නකොධො | 184 |
| පන්නභාරං | 122 |
| පඤ්ඤො | 310 |
| පන්නලොමො | 168 |
| පපඤ්චසඤ්ඤාසඞ්ඛාපහාණං | 284 |
| පපඤ්චසමතික්කන්ත | 74 |
| පපඤ්චාභිරතා | 88 |
| පපඤ්චා | 284 |
| පපතන්ති | 108, 232 |
| පපාතො | 230 |
| පපුප්ඵකානි | 36 |
| පප්ඵාසං | 4 |
| පබාළ්හං | 296 |
| පබුජ්ඣථ | 372 |
| පබුජ්ඣන්ති | 100 |
| පබ්බජ්ජාභිසඞ්ඛාරෙ | 240 |
| පබ්බතකූටං | 206 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පබ්බතට්ඨො | 32 |
| පබ්බතමුද්ධනි | 360 |
| පභඞ්කරං | 276, 466 |
| පභඞ්ගුරං | 52, 62, 366, 410 |
| පභා | 346 |
| පභාසෙති | 68, 118 |
| පහිතත්තං | 106 |
| පමජ්ජිත්වා | 68 |
| පමත්තචාරිනො | 108 |
| පමත්තබන්ධුනො | 280 |
| පමත්තං | 164 |
| පමත්තෙසු | 32 |
| පමත්තො | 30, 102 |
| පමාදං | 32 |
| පමාදධිකරණං | 302 |
| පමාදෙ | 32 |
| පමාදෙ | 30, 84 |
| පමුක්කස්ස | 394 |
| පමුත්ති | 228 |
| පමුදිතො | 372 |
| පමොක්ඛන්ති | 94 |
| පමොක්ඛාය | 16 |
| පමොදති | 28 |
| පමොදතං | 408 |
| පමොහනං | 92 |
| පයතපාණී | 458 |
| පයිරුපාසති | 38 |
| පයිරුපාසතං | 464 |
| පයුඤ්ජතො | 18 |
| පරකුලෙසු | 40 |
| පරක්කමෙ | 226 |
| පරක්කමම | 118 |
| පරඞ්කතො | 264 |
| පරඞ්කාරූපසංහිතා | 270 |
| පරතො | 152 |
| පරත්ථ | 100 |
| පරදවුත්තො | 168 |
| පරදාරං | 102 |
| පරදාරූපසෙවී | 102 |
| පරදුක්ඛුපදානෙන | 96 |
| පරමං | 12, 160 |
| පරමං සන්තිං | 410 |
| පරමදනං | 186 |
| පරමදුක්කරං | 66 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පරවජ්ජානුපස්සිස්ස | 86 |
| පරවසං | 164 |
| පරවෙදියා | 246 |
| පරානුද්දයතා | 416 |
| පරික්ඛයං | 58 |
| පරික්ඛිපිත්වා | 148, 186 |
| පරික්ඛීණභවසංයොජනො | 368 |
| පරික්ඛෙපා | 334 |
| පරිඛාකූපෙ | 214 |
| පරිගණ්හන්ති | 306 |
| පරිග්ගහණං | 12 |
| පරිචරෙ | 48 |
| පරිචිතා | 250 |
| පරිච්ච | 178 |
| පරිච්චජතා | 334 |
| පරිජිණ්ණං | 62 |
| පරිජුන්නා | 158 |
| පරිසුද්ධං | 356 |
| පරිසුද්ධභොජනා | 44 |
| පරිඩය්හමානො | 192 |
| පරිණාමං | 296 |
| පරිතස්සති | 122 |
| පරිතෙස්සය්‍ය | 446 |
| පරිත්තා | 412 |
| පරිදහෙස්සති | 28 |
| පරිදෙවතා | 16 |
| පරිධංසමානො | 442 |
| පරිනිබ්බන්ති | 54 |
| පරිනිබ්බානකාලෙ | 252, 314 |
| පරිනිබ්බුතා | 44, 380 |
| පරිපාකාය | 198 |
| පරිපුණ්ණසෙඛං | 371 |
| පරිඵන්දති | 34 |
| පරිබ්බජන්ති | 110 |
| පරිබ්බජෙ | 126, 332 |
| පරිබ්බාජකා | 152, 254 |
| පරිබ්බාජො | 102 |
| පරිභාසන්ති | 152 |
| පරිභාසා | 334 |
| පරිභූතරූපං | 282 |
| පරිමජ්ජසි | 122 |
| පරිමුඛං | 182 |
| පරිමුච්චති | 98 |
| පරිමුට්ඨා | 249 |
| පරියාදය | 344 |

| ප | පිට්ඨඞ්කා |
| --- | --- |
| පරියාදින්නචිත්තො | 416, 418 |
| පරියායං | 154 |
| පරියායවචනං | 362 |
| පරියායෙන | 362 |
| පරියුට්ඨිතචිත්තො | 250 |
| පරියුට්ඨිතා | 374 |
| පරියෙසනං | 286 |
| පරියොදපෙය්‍ය | 44 |
| පරියොසානකල්‍යාණං | 424 |
| පරිවණ්ණෙසි | 8 |
| පරිවීමංසමානො | 372 |
| පරිසප්පන්ති | 110 |
| පරිසාසු | 406 |
| පරිස්සයවිනොදනං | 470 |
| පරිස්සයානි | 106 |
| පරිහාණාය | 32, 412 |
| පරිහාණෙන | 364 |
| පරිළාහෙහි | 192 |
| පරිළාහා | 44 |
| පරූපඝාතී | 72 |
| පරූළ්හකච්ඡනඛලොමා | 254 |
| පරෙ | 26 |
| පලායනං | 228 |
| පලාසෙන | 410 |
| පලිතං | 88 |
| පලුට්ඨමක්කරී | 172 |
| පල්ලඞ්කො | 170 |
| පල්ලලං | 44 |
| පල්ලලානි | 310 |
| පවත්තන්ති | 14 |
| පවත්තාරං | 40 |
| පවරං | 126 |
| පවස්සන්ති | 408 |
| පවාති | 38 |
| පවාලං | 232 |
| පවාහෙත්වා | 256 |
| පවිවිත්තෙහි | 412 |
| පවිවිත්තො | 210 |
| පවිවෙකකථා | 198 |
| පවිවෙකරසං | 76 |
| පවිවෙකරතො | 360 |
| පවිවෙකාරාමො | 360 |
| පවිවෙකො | 360 |
| පවිස්ස | 54 |
| පවෙච්ඡති | 408 |
| පවෙදයන්ති | 62 |
| පවෙසෙත්වා | 214 |
| පසත්ථා | 10 |
| පසන්නචිත්තං | 338 |
| පසවති | 76, 362 |
| පසහති | 26 |
| පසහෙථ | 54 |
| පසංසා | 408 |
| පසාදනියං | 142 |
| පසාදිතං | 338 |
| පසාරිතං | 172 |
| පසාරෙය්‍ය | 172 |
| පසීදති | 374 |
| පසුතං | 16 |
| පස්සතො | 460 |
| පස්සද්ධි | 249 |
| පහත්වාන | 434 |
| පහරෙය්‍ය | 120 |
| පහස්සථ | 60 |
| පහංසු | 368 |
| පහාණත්ථං | 356 |
| පහාණං | 106 |
| පහාතවෙ | 34 |
| පහාත්වාන | 86, 126, 434 |
| පහාය ගමනීයෙසු | 18 |
| පහාසි | 396 |
| පහිණෙය්‍යාසි | 178 |
| පහිතත්තො | 174 |
| පහිතත්තෙහි | 412 |
| පහීණමානස්ස | 44 |
| පහූතෙ | 14 |
| පළිඝං | 284 |
| පළිපථං | 126 |
| පළෙති | 36 |
| පංසුකූලං | 460 |
| පංසුකූලධරං | 122 |
| පංසුකූලිකො | 210 |
| පංසුපිසාචකම්පි | 294 |
| පාකතින්ද්‍රියා | 202 |
| පාවෙති | 56 |
| පාටලිගාමියා | 302 |
| පාටලිගාමො | 302, 306 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පාටලිපුත්තං | 366 |
| පාටිකඞ්ඛං | 200 |
| පාටිකඞ්ඛා | 364 |
| පාටිපදෙ | 426 |
| පාටිභොගො | 162, 172, 318 |
| පාණභූතා | 20 |
| පාණභූතෙසු | 148 |
| පාණමතිපාතෙති | 86 |
| පාණාතිපාතා | 2 |
| පාණිම්හි | 52 |
| පාතිතො | 124 |
| පාතිමොක්ඛං | 72, 116, 228 |
| පාතිමොක්ඛසංවරසංවුතො | 198 |
| පාතුභවන්ති | 130 |
| පාතුරහෙසුං | 180 |
| පාථෙය්‍යං | 84 |
| පාදසඤ්ඤතො | 114 |
| පානභොජනං | 14 |
| පානීයානි | 208 |
| පාපං | 246, 362 |
| පාපකතො | 362 |
| පාපකම්මිනො | 54 |
| පාපකාරී | 28 |
| පාපකො | 78 |
| පාපචෙතසං | 378 |
| පාපධම්මා | 374, 404 |
| පාපසඛා | 410 |
| පාපා | 6 |
| පාපානි | 52 |
| පාපිච්ඡාය | 436 |
| පාපිකාය ච දිට්ඨියා | 352 |
| පාපිච්ඡො | 362, 436 |
| පාපිමතො | 394 |
| පාපිමා | 252 |
| පාපියො | 34, 40, 204 |
| පාමදෙ | 116 |
| පාමොජ්ජකරණං | 466 |
| පමොජ්ජබහුලො | 118 |
| පාරං | 42, 120 |
| පාරගතො | 360, 396 |
| පාරගවෙයිතො | 112 |
| පාරගා | 370 |
| පාරගාමිනො | 42 |
| පාරගූ | 118, 138 |
| පාරිලෙය්‍යකං | 208 |
| පාවකො | 40 |
| පාවා | 294 |
| පාවායං | 138 |
| පාසාදිකං | 142 |
| පිට්ඨිතො | 282 |
| පිණ්ඩකෙන | 244 |
| පිණ්ඩපාතපටිලාභාය | 186 |
| පිණ්ඩපාතා | 300 |
| පිණ්ඩපාතපටික්කන්තානං | 148 |
| පිණ්ඩපාතිකො | 186, 210 |
| පිණ්ඩියාලොපං | 460 |
| පිණ්ඩොලා | 440 |
| පිණ්ඩොලය්‍යං | 440 |
| පිත්තං | 4 |
| පිපීයති | 68 |
| පිපාසවිනයො | 438 |
| පියං | 314 |
| පියගාහී | 78 |
| පියතරෙ | 220 |
| පියතො | 78 |
| පියරූපසාතගධිතං | 448 |
| පියරූපසාතරූපං | 472, 474 |
| පියරූපස්සාදගධිතාසෙ | 158 |
| පියරූපෙන | 164 |
| පියාපායො | 78 |
| පියාප්පියං | 78 |
| පියො | 156 |
| පිසාචං | 138 |
| පිහකං | 4 |
| පිහයං | 114 |
| පිහයන්ති | 44, 186 |
| පීතිපාමොජ්ජං | 116 |
| පීතිභක්ඛා | 76 |
| පීතා | 76 |
| පීළිතස්ස | 16 |
| පුග්ගලා | 10 |
| පුඤ්ඤං | 106, 340 |
| පුඤ්ඤකිරියවත්ථූනි | 346, 388 |
| පුඤ්ඤක්ඛයො | 18 |
| පුඤ්ඤපාපපහීණස්ස | 34 |
| පුඤ්ඤපෙක්ඛා | 48 |
| පුඤ්ඤසම්පදා | 20 |
| පුටභෙදනං | 306 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පුත්තදාරස්ස | 6 |
| පුත්තපසුං | 416 |
| පුත්තපසුසම්මත්තං | 96 |
| පුත්තසම්බාධසයනං | 258 |
| පුත්තා | 404 |
| පුථු | 194, 222 |
| පුථුභූතං | 254 |
| පුථුමනුස්සා | 158 |
| පුනප්පුනං | 108 |
| පුනබ්භවං | 376, 402 |
| පුනරෙති | 22 |
| පුප්ඵරාසිම්හා | 38 |
| පුප්ඵානි | 36 |
| පුබ්බඞ්ගමා | 362 |
| පුබ්බාචරියා | 468 |
| පුබ්බාපරානි ච | 112 |
| පුබ්බාපරියං විසෙසං | 248 |
| පුබ්බෙ කතං | 16 |
| පුබ්බෙනිවාසං | 454 |
| පුබ්බො | 4 |
| පුරක්ඛතා | 110 |
| පුරාණං | 12 |
| පුරාණකම්මවිපාකජං | 170 |
| පුරාණදුතියිකා | 138 |
| පුරාණසාලොහිතා | 142 |
| පුරාණානි | 64 |
| පුරිසකිච්චං | 214 |
| පුරිසයුගානි | 438 |
| පුරිසාජඤ්ඤො | 74 |
| පුරිසාධමං | 408 |
| පුරිසුත්තමෙ | 42 |
| පුරෙ | 106, 110 |
| පුරෙ කතං | 170 |
| පුරෙක්ඛතො | 300 |
| පුරෙක්ඛත්වා | 302 |
| පුරෙක්ඛාරං | 40 |
| පූගා | 272 |
| පූජනා | 48 |
| පූජනීයානං | 6 |
| පූජා | 6 |
| පූජාරහෙ | 74 |
| පූජිතො | 142, 152 |
| පූතිමච්ඡං | 410 |
| පූතිමුත්තං | 460 |
| පූති | 410 |
| පූතිසන්දෙහො | 62 |
| පූරති | 52 |
| පූරත්තං | 232 |
| පූරා | 16 |
| පූරෙති | 186 |
| පෙච්ච | 28, 150 |
| පෙතා | 14 |
| පෙත්තෙය්‍යතා | 108 |
| පෙමතො | 78 |
| පෙසකාරවණ්ණං | 186 |
| පෙසකාරවිසිඛා | 136 |
| පොක්ඛරපත්තො | 122 |
| පොක්ඛරා | 108 |
| පොසකා | 468 |
| පොසස්ස | 48 |
| ප්ලවති | 108 |
| **ඵ** | |
| ඵණං | 148 |
| ඵන්දනං | 34 |
| ඵරති | 440 |
| ඵරුසං | 56, 58 |
| ඵරුසානි | 152 |
| ඵලන්ති | 66 |
| ඵස්සපරෙතො | 192 |
| ඵස්සයිත්වා | 378 |
| ඵස්සා | 152 |
| ඵස්සො | 130 |
| ඵස්සායතනෙසු | 182 |
| ඵාලො | 262 |
| ඵාසුකා | 64 |
| ඵාසුවිහාරා | 158 |
| ඵීතං | 254 |
| ඵුට්ඨස්ස | 8 |
| ඵුට්ඨං | 156 |
| ඵුට්ඨො | 80 |
| ඵුට්ඨා | 42 |
| ඵුට්ඨුං | 354 |
| ඵුසන්ති | 30, 152 |
| ඵුසයිත්වා | 402 |
| ඵුසං | 402 |
| ඵුසාමි | 92 |
| ඵුසායති | 138 |
| ඵුසෙ | 372 |
| ඵුසෙය්‍යුං | 56 |
| ඵුස්සිතග්ගෙ | 12 |
| ඵෙණූපමං | 36 |

| බ | පිට්ඨඞ්කා |
|---|---|
| බද්ධො මාරස්ස | 394 |
| බන්ධනං | 110, 182 |
| බන්ධවා | 96 |
| බබ්බජං | 110 |
| බලං | 158 |
| බලානීකං | 122 |
| බලිං | 8 |
| බලිවද්දො | 62 |
| බලී | 94 |
| බහිද්වාරකොට්ඨකං | 230, 254 |
| බහිපි | 168 |
| බහුකාරො | 332 |
| බහුදෙවරත්තිං | 244 |
| බහුජනසුඛාය | 424 |
| බහුජ්ජනො | 104 |
| බහුජාගරො | 32 |
| බහුපුත්තං | 250 |
| බහුස්සුතං | 78 |
| බාධිතො | 110 |
| බාධෙන්ති | 228 |
| බාලසංගතචාරිහි | 78 |
| බාලා | 32 |
| බාලානං | 6 |
| බාලූපසෙවනා | 410 |
| බාලෙ | 32 |
| බාල්‍යං | 38 |
| බාහාය | 172 |
| බාහිතපාපධම්මො | 134 |
| බාහිතපාපො | 120 |
| බාහිරං | 122 |
| බාහිරං අංගනානි කරිත්වා | 332 |
| බාහුජඤ්ඤං | 254 |
| බාහුසච්චං | 6 |
| බාහුසච්චෙන | 92 |
| බාහිත්වා | 136 |
| බාහෙත්වා | 90 |
| බාළ්හගිලානො | 136 |
| බිම්බං | 60 |
| බීරණං | 108 |
| බුජ්ඣන්ති | 56 |
| බුද්ධං | 2 |
| බුද්ධපමුඛො | 162 |
| බුද්ධභූමි | 20 |
| බුද්ධසාසනෙ | 116, 118 |
| බුද්ධසෙට්ඨො | 8 |
| බුද්ධස්ස සාවකො | 380 |
| බුද්ධානං සාසනං | 212, 240 |
| බුබ්බුලකං | 18 |
| බොජ්ඣඞ්ගා | 238 |
| බොධිපක්ඛියානං | 420 |
| බොධිරුක්ඛමූලෙ | 130, 192 |
| බ්‍යග්ඝා | 278 |
| බ්‍යාපන්නචිත්තො | 440 |
| බ්‍යාරොසනා | 22 |
| බ්‍යාසත්තමනසං | 35, 96 |
| බ්‍රහ්මවාදං | 134 |
| බ්‍රහ්මචරියං | 6, 102, 254, 356 |
| බ්‍රහ්මං | 22 |
| බ්‍රහ්මා | 468 |
| බ්‍රහ්මචරියෙසනා | 382 |
| බ්‍රහ්මචාරයො | 308 |
| බ්‍රහ්මචාරිපටිඤ්ඤො | 230, 372 |
| බ්‍රහ්මචාරී | 58 |
| බ්‍රහ්මඤ්ඤං | 214 |
| බ්‍රහ්මඤ්ඤතා | 108 |
| බ්‍රහ්මඤ්ඤත්ථං | 462 |
| බ්‍රහ්මභූතං | 396 |
| බ්‍රහ්මවිමානං | 340 |
| බ්‍රහ්මුනා | 48 |
| බ්‍රාහ්මණකරණධම්මා | 134, 136 |
| බ්‍රාහ්මණජාතිකො | 136 |
| බ්‍රාහ්මණසම්මතො | 462 |
| බ්‍රාහ්මණස්ස | 120, 130 |
| බ්‍රාහ්මණො | 136, 140, 146, 396 |
| බ්‍රූහය | 96 |
| බ්‍රූහෙතා | 370 |

| භ | |
|---|---|
| භගිනි | 214 |
| භග්ගා | 64 |
| භජෙථ | 372 |
| භණ්ඩානි | 334 |
| භත්තකවාදෙන | 174 |
| භත්තකො | 174 |
| භද්දකං | 218 |
| භද්දකෙන | 354 |
| භද්දසාලමූලෙ | 208 |

| භ | පිට්ඨඞ්කා |
|---|---|
| භද්දිකාය | 354 |
| භද්‍රං | 52 |
| භද්‍රානි | 52, 308 |
| භද්‍රො | 52, 60 |
| භන්තං | 80 |
| භන්තචිත්තො | 200 |
| භබ්බරූපො | 288 |
| භබ්බො | 224, 354, 414 |
| භමරො | 36 |
| භමස්සු | 116 |
| භයං | 34 |
| භයං මිත්තං | 52 |
| භයට්ඨො | 440 |
| භයතජ්ජිතා | 72 |
| භයදස්සිනො | 104 |
| භයදස්සී | 32 |
| භවතණ්හා | 386 |
| භවතණ්හාපරික්ඛයා | 876 |
| භවනිරොධාය | 374 |
| භවනෙත්තිසඞ්ඛයා | 368 |
| භවපරෙතො | 192 |
| භවයොගයුත්තො | 448 |
| භවයොගවිසඤ්ඤුත්තො | 448 |
| භවරතා | 374 |
| භවවිප්පහානාය | 192 |
| භවසඞ්ඛාරං | 254 |
| භවසත්තා | 192 |
| භවසම්මුදිතා | 374 |
| භවසල්ලානි | 112 |
| භවසංයොජනක්ඛයා | 390 |
| භවස්ස පාරගූ | 110, 458 |
| භවං අට්ඨමං | 10 |
| භවාථ | 60, 370 |
| භවාභවතං | 168 |
| භවාභවෙ | 376, 386 |
| භවාය | 94 |
| භවාරාමා | 374 |
| භවෙත | 194 |
| භවෙසනා | 382 |
| භවො | 130 |
| භසමච්ඡන්නො | 40 |
| භස්සපරෙතො | 414 |
| භස්සාරාමතමනුයුත්තො | 414 |
| භස්සාරාමො | 414 |
| භාගවා | 30 |

| භ | පිට්ඨඞ්කා |
|---|---|
| භාතරි | 18 |
| භාති | 146 |
| භායථ (දුක්ඛස්ස) | 228 |
| භායනානි | 56 |
| භාවකං | 40 |
| භාවනානුයොගමනුයුත්තො | 420 |
| භාවනාපාරිපූරිං | 466 |
| භාවනාමයං | 388 |
| භාවනාය | 100 |
| භාවිතත්තඤ්ඤතරං | 396 |
| භාවිතත්තානං | 48 |
| භාවිතත්තො | 426 |
| භාසිතං | 8 |
| භාසිය | 398 |
| භික්ඛු | 90 |
| භික්ඛුනියා | 396 |
| භිදුරං | 410 |
| භිදුරායං | 410 |
| භියො | 28 |
| භිසක්කො | 458 |
| භිංසනකො | 254 |
| භීතො | 168 |
| භුඤ්ජමානො | 10 |
| භුත්තාවිං | 204 |
| භුත්තාවිස්ස | 295 |
| භුම්මට්ඨො | 32 |
| භුම්මානි | 8 |
| භුසප්පමත්තො | 10 |
| භුසං | 86 |
| භුසස්ස | 286 |
| භුසා | 108 |
| භූතං | 366, 376 |
| භූතපරිසුද්ධ | 376 |
| භූතරතා | 194 |
| භූතස්ස නිබ්බිදාය | 376 |
| භූතස්ස විභවා | 376 |
| භූතා | 20 |
| භූතානි | 56, 150 |
| භූතානං | 234 |
| භූතෙසු | 58, 124 |
| භූරි | 94 |
| භූරිසඞ්ඛයො | 94 |
| භෙත්වාන | 334 |
| භෙදනං | 58 |

| භ | පිට්ඨඞ්කො |
|---|---|
| භොගතණ්හාය | 112 |
| භොගා | 112, 408 |
| භොගෙහි | 148 |
| භොජනෙ මත්තඤ්ඤුතාය | 350 |
| භොවාදී | 122 |
| **ම** | |
| මක්කටකො | 110 |
| මක්ඛං | 320 |
| මක්ඛො | 62, 124 |
| මගධමහාමත්තො | 308 |
| මග්ගානං | 92 |
| මග්ගාමග්ගස්ස | 124 |
| මග්ගො | 92, 94 |
| මඝවා | 32 |
| මඞ්කුභූතො | 304 |
| මඞ්ගලානි | 6 |
| මඞ්ගලසුත්තං | 6 |
| මච්චු | 36, 54, 96 |
| මච්චුධෙය්‍යං | 42 |
| මච්චුනො | 390, 396 |
| මච්චුනො පදං | 30 |
| මච්චුරාජං | 396 |
| මච්චුරාජස්ස | 168 |
| මච්චුරාජා | 68 |
| මච්චුහායිනො | 378, 402 |
| මච්චෙවත | 38 |
| මච්ඡකෙ | 228 |
| මච්ඡරී | 90 |
| මච්ඡවිලොපෙ | 174 |
| මච්ඡෙරං | 86 |
| මච්ඡෙරමලං | 344 |
| මජ්ජපානා | 6 |
| මජ්ඣෙ | 110 |
| මජ්ඣෙකල්‍යාණං | 424 |
| මඤ්ඤති | 38 40, 192 |
| මඤ්ඤන්තු | 40 |
| මඤ්ඤෙ | 176 |
| මණිං | 66, 232 |
| මණිකුණ්ඩලෙසු | 110 |
| මණ්ඩන | 2 |
| මණ්ඩලමාලො | 190 |
| මත්තං | 30 |
| මත්තෙ | 232 |
| මත්තඤ්ඤුං | 28 |
| මත්තඤ්ඤුතා | 72, 212 |
| මත්තා | 96, 322 |

| ම | පිට්ඨඞ්කො |
|---|---|
| මත්තිසම්භවං | 122 |
| මත්තෙය්‍යතා | 108 |
| මත්ථලුඞ්ගං | 4 |
| මදනිම්මදනො | 438 |
| මද්දවානි | 118 |
| මද්දිතො | 176 |
| මධුවා | 40 |
| මනසා | 10 |
| මනසාකාසි | 130 |
| මනසා සංවරො | 114 |
| මනසිකරොතා | 256 |
| මනාපස්සවනා | 108 |
| මනාපිකෙ | 188 |
| මනාපො | 156 |
| මනුජස්ස | 108 |
| මනුජා | 100, 216, 374 |
| මනුස්සකපණො | 222 |
| මනුස්සත්තං | 422 |
| මනුස්සදළිද්දො | 222 |
| මනුස්සපටිලාභො | 70 |
| මනුස්සවරාකො | 222 |
| මනොදුච්චරිතං | 392 |
| මනොපකොපං | 82 |
| මනොපුබ්බඞ්ගමා | 26 |
| මනොමයා | 26 |
| මනොමුනි | 394 |
| මනොමොනෙය්‍යං | 394 |
| මනොරමං | 38 |
| මනොසෙට්ඨා | 26 |
| මනොසොචෙය්‍යං | 394 |
| මන්තභාණී | 114 |
| මන්තෙති | 164 |
| මෙධු | 106 |
| මමායිතං | 116 |
| මරණන්තං | 62 |
| මරණෙන | 218 |
| මරණමත්තං | 272 |
| මරීචිකං | 68 |
| මරීචිධම්මං | 36 |
| මලිත්ථියා | 84 |
| මසාරගල්ලං | 223 |
| මසි | 314 |
| මහග්ඝසො | 106 |
| මහණ්ණවෙ | 412 |
| මහන්තෙහි | 356 |
| මහත්ථිකා | 20 |
| මහද්ධනතරො | 148 |
| මහප්ඵලානි | 10 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මා | 32, 148, 204 |
| මාකත්ථ | 228 |
| මා කඞ්ඛි | 116 |
| මාගධො | 148 |
| මාණවකවණ්ණං | 148 |
| මාණවිකා | 154 |
| මාතා (භගවතො) | 222 |
| මාතාපිතුඋපට්ඨානං | 6 |
| මාතුච්ඡා | 364 |
| මාතුච්ඡාපුත්තො | 170 |
| මාතුලානී | 364 |
| මානගන්ථා | 270, 324 |
| මානගන්ථාභිභූතො | 324 |
| මානඤ්ජහං | 370 |
| මානවිනිබන්ධා | 270 |
| මානසඞ්ඛයෙ | 324 |
| මානං | 192, 322 |
| මානිනො | 142, 152 |
| මානුපෙතා | 270, 324 |
| මානුසකං | 126 |
| මානුසිකා | 18 |
| මානුසියා | 8 |
| මානුසෙ | 48 |
| මානො | 124, 184 |
| මායා | 184 |
| මාරඤ්ජහං | 360 |
| මාරණන්තිකා | 296 |
| මාරධෙය්‍යං | 34, 386 |
| මාරපාසො | 394 |
| මාරබන්ධනා | 34, 112, 220 |
| මාරසෙනං | 134 |
| මාරස්සෙතං | 92 |
| මාරා | 384 390 |
| මාරෙත | 251, 418 |
| මාරෙරු | 48, 252 |
| මාලා | 2, 86 |
| මාලාගුණෙ | 38 |
| මාලුවා | 66, 108 |
| මාවොච | 56 |
| මාසූ | 186 |
| මිගභූතෙන | 168 |
| මිච්ඡා | 398 |
| මිච්ඡාදිට්ඨිකා | 398 |
| මිච්ඡාදිට්ඨිකම්මසමාදානා | 398 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මිච්ඡාදිට්ඨිසමාදානා | 104 |
| මිච්ඡාපණිහිතං | 34, 204 |
| මිච්ඡාසඞ්කප්පගොචරා | 28 |
| මිතභාණිං | 82 |
| මිත්තසම්පදං | 18 |
| මිත්තභෙදතො | 306 |
| මිද්ධී | 106 |
| මිය්‍යන්ති | 30 |
| මිලායන්ති | 420 |
| මිස්සා | 310 |
| මුඛතො ජාතා | 458 |
| මුඛරා | 202 |
| මුඛසඤ්ඤතො | 114 |
| මුඛායාමං | 248 |
| මුච්චති | 40 |
| මුච්ඡිතා | 280 |
| මුඤ්චති | 120 |
| මුඤ්චාම | 174 |
| මුඤ්චම | 120 |
| මුට්ඨස්සතිනො | 202 |
| මුට්ඨිහි | 262 |
| මුණ්ඩකා | 286 |
| මුණ්ඩකෙන | 90 |
| මුතෙ | 144 |
| මුත්තානං | 4 |
| මුත්තා | 232 |
| මුදු | 20 |
| මුද්දාසිප්පං | 190 |
| මුද්ධං | 40 |
| මුධා | 10 |
| මුනන්ති | 92 |
| මුනි | 92, 146 |
| මුනිං | 394 |
| මුසලො | 262 |
| මුසාවාදා | 2 |
| මුහුත්තමපි | 48 |
| මුහුත්තමපි | 38 |
| මූලසච්චං | 86, 90 |
| මූලජාතා | 422 |
| මූලා | 284 |
| මූලෙ | 108 |
| මූළ්හගබ්භා | 158 |
| මූළ්හරූපො | 90 |
| මූළ්හා | 322 |

| ම | පිට්ඨඞ්කා |
| --- | --- |
| මූළ්හා | 434 |
| මෙත්තචිත්තං | 340, 388 |
| මෙත්තං | 8 |
| මෙත්තංසො | 348 |
| මෙත්තා | 200 |
| මෙත්තාචෙතොවිමුත්ති | 346 |
| මෙත්තාවිහාරී | 116 |
| මෙදෙ | 4 |
| මේධගා | 26 |
| මේධාවී | 30, 34 |
| මොක්ඛන්ති | 34 |
| මොඝජිණ්ණො | 88 |
| මොඝම්ඵුල්ලං | 258 |
| මොදති | 28 |
| මොනෙන | 90, 146 |
| මොනෙය්‍යසම්පන්නං | 394 |
| මොනෙය්‍යාති | 394 |
| මොහක්ඛයං | 176 |
| මොහග්ගි | 444 |
| මොහජෙහිපි | 192 |
| මොහදොසා | 114 |
| මොහනෙය්‍ය | 434 |
| මොහසම්බන්ධනො | 288 |
| මොහා | 86, 320 |
| මොහො | 378, 394 |

| ය | |
| --- | --- |
| යකතං | 4 |
| යක්ඛස්ස භවනෙ | 138 |
| යක්ඛා | 18, 204 |
| යජෙථ | 48 |
| යතත්තො | 134 |
| යතා | 480 |
| යතින්ද්‍රියං | 142 |
| යතින්ද්‍රියො | 192 |
| යත්ථකාමනිපාතිනො | 34 |
| යත්ථකාමං | 106 |
| යත්‍ර හි නාම | 160 |
| යථා | 30 |
| යථාකම්මූපගෙ | 454 |
| යථාකාමකරණීයො | 394 |
| යථාගාරං | 28 |
| යථාභිප්පායං | 164 |
| යථාපසාදනං | 86 |

| ය | පිට්ඨඞ්කා |
| --- | --- |
| යථාභතං | 354 |
| යථාභූතෙ | 376 |
| යථාවං | 376 |
| යථාසද්ධං | 86 |
| යදිදං | 154 |
| යදි වා | 74 |
| යන්නූනාහං | 136 |
| යමපුරිසා | 84 |
| යමලොකං ච | 36 |
| යමස්ස | 84 |
| යමාමසෙ | 26 |
| යසො | 30 |
| යසොභොගසමප්පිතො | 100 |
| යාගා | 458 |
| යාචයොගො | 458 |
| යානීකතා | 250 |
| යාතෙහි | 104 |
| යාපනීයං | 164 |
| යාපෙන්ති | 14 |
| යාමං | 64, 130 |
| යාව අප්පායුකා | 220 |
| යාවකීවං ච | 276 |
| යාවජීවම්පි | 38 |
| යාවතා | 88 |
| යාවදත්ථං | 156 |
| යාවදෙව | 40 |
| යාවනත්තා | 108 |
| යාව බාහාගහණා | 230 |
| යාව මුඛතො | 286 |
| යාව සුභාසිතං | 216 |
| යාවං | 96 |
| යිට්ඨං | 48 |
| යුගානි | 10 |
| යුඤ්ජං | 78 |
| යුවා | 94 |
| යෙනිච්ඡකං | 106 |
| යොගක්ඛෙමස්ස | 354 |
| යොගක්ඛෙමං | 30, 332 |
| යොගක්ඛෙමා | 252, 334 |
| යොගයුත්තා | 386 |
| යොගස්මිං | 78 |
| යොගං | 126, 390 |
| යොගා | 94, 164 |
| යොගාතිගො | 380, 402, 428 |

| ය | පිට්ඨඞ්කා |
|---|---|
| යොධෙථ | 34 |
| යොනි | 358 |
| යොනිජං | 122 |
| යොනිසො | 18, 106 |
| යොනිසො පධානෙන | 358 |
| යොනිසො මනසිකාරෙ | 332 |
| යොබ්බනෙ | 64 |
| **ර** | |
| රක්ඛතො මලං | 84 |
| රක්ඛා | 168 |
| රජත | 2 |
| රජතං | 232 |
| රජතං | 224 |
| රජනීයෙසු | 206 |
| රජං | 170 |
| රජානුකිණ්ණං | 274 |
| රජො | 54 |
| රජොජල්ලං | 256 |
| රට්ඨපිණ්ඩං | 102, 374, 442 |
| රණඤ්ජහා | 466 |
| රතනං පණීතං | 8 |
| රතා | 30 |
| රති | 18, 62, 102, 126 |
| රතියා | 80 |
| රත්තවිත්තා | 386 |
| රත්තන්ධකාරතිමිසායං | 138, 274 |
| රත්තා | 280 |
| රත්තින්දිවමතන්දිතා | 446 |
| රථසිප්පං | 190 |
| රථියා | 214 |
| රන්ධුං | 86 |
| රමණීයානි | 46 |
| රමතෙ | 210 |
| රමිතො | 100 |
| රසග්ගගාහො | 80 |
| රස්සකා | 20 |
| රහදෙ | 42, 44, 444, 472 |
| රහො | 228 |
| රහොගතස්ස | 142, 238 |
| රාගග්ගි | 444 |
| රාගජෙහි පි | 192 |
| රාගදොසා | 112 |
| රාගනිස්සිතා | 108 |

| ර | පිට්ඨඞ්කා |
|---|---|
| රාගරත්තා | 110 |
| රාගසමො | 86 |
| රාගානුසයො | 426 |
| රාගො | 124, 394 |
| රාජතො | 16 |
| රාජරට්ඨා | 62 |
| රාජරට්ඨූපමං | 62 |
| රාජාභිනීතා | 440 |
| රාජීසයො | 346 |
| රාමණෙය්‍යකං | 46 |
| රුක්ඛමූලං | 460 |
| රුක්ඛමූලගතො | 164 |
| රුක්ඛා | 108 |
| රුණ්ණං | 16 |
| රූපධාතු | 378 |
| රූපධාතුං පරිඤ්ඤාය | 378 |
| රූපා | 146 |
| රූපානං ච අතික්කමං | 402 |
| රූපූපගා | 402 |
| රූපෙ පරිඤ්ඤාය | 402 |
| රූහති | 408 |
| රොගනිඩ්ඩං | 62, 366 |
| රොදං | 40 |
| රොසෙන්ති | 152, 216 |
| **ල** | |
| ලච්ඡාම | 188 |
| ලජ්ජන්ති | 104 |
| ලජ්ජීතායෙ | 104 |
| ලපයන්ති | 42 |
| ලපා | 472 |
| ලපිතලාපනමත්තෙන | 454 |
| ලපෙතවෙ | 170 |
| ලසිකා | 4 |
| ලහු අත්ථකාමො | 192 |
| ලහුට්ඨානං | 158 |
| ලහුතො | 34 |
| ලහුමෙස්සති | 116 |
| ලාභසක්කාරගාරවො | 416 |
| ලාභසක්කාරසිලොකො | 416 |
| ලාභසක්කාරසිලොකානියං සත්ථං | 356 |
| ලාභා | 218 |
| ලාභී | 152 |

| ල | පිට්ඨඞ්කා |
|---|---|
| ලාභූපනිසා | 40 |
| ලිප්පති | 142 |
| ලුද්ධා | 326 |
| ලුළිතං | 298 |
| ලෙඛාසිප්පං | 190 |
| ලොකධම්මෙහි | 8 |
| ලොකවඩ්ඪනො | 66 |
| ලොකස්ස දස්සෙතාරො | 468 |
| ලොකාධිපච්චං | 70 |
| ලොකායතසිප්පං | 190 |
| ලොණරසො | 232 |
| ලොභනෙය්‍යෙ | 434 |
| ලොභා | 318 |
| ලොභො | 86, 378 |
| ලොමහංසං | 138 |
| ලොමහංසො | 254 |
| ලොමා | 4 |
| ලොහගුළං | 116 |
| ලොහිතකුම්භියං | 164 |
| ලොහිතඞ්කා | 232 |
| ලොහිතපක්ඛන්දිකා | 296 |
| ලොහිතං | 4 |

| ව | |
|---|---|
| වක්කං | 4 |
| වග්ගාරාමො | 334 |
| වචීදුච්චරිතං | 392 |
| වචීපකොපං | 82 |
| වචීමොනෙය්‍යං | 394 |
| වචීසුචිං | 394 |
| වචීසොචෙය්‍යං | 394 |
| වජ්ඣො | 96 |
| වජන්ති | 70, 110 |
| වජිරං | 66 |
| වජ්ජදස්සිනං | 40 |
| වජ්ජමෙඤ්ඤසං | 86 |
| වජ්ජමතිනො | 104 |
| වජ්ජං | 104 |
| වජ්ජාති | 86 |
| වට්ටං | 274, 278 |
| වට්ටූපච්ඡෙදෙ, | 438 |
| වට්ඨං | 14 |
| වණිජ්ජා | 14 |
| වණිප්පථො | 306 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| වණිබ්බකො | 408 |
| වණිං | 256 |
| වණො | 52 |
| වණ්ණපොක්ඛරතාය | 90 |
| වණ්ණො | 236 |
| වත | 158, 196, 218 |
| වතවන්තං | 78, 122 |
| වතං | 102 |
| වත්තබ්බං | 178 |
| වත්ථුකතා | 250 |
| වත්ථුං | 244 |
| වත්ථූති | 306 |
| වදඤ්ඤූ | 406 |
| වද්ධාපචායිනො | 48 |
| වධබන්ධං | 122 |
| වධො | 182 |
| වනථං | 96 |
| වනථො | 96, 412 |
| වනන්තෙ | 100 |
| වනප්පගුම්බෙ | 12 |
| වනමුත්තො | 110 |
| වනං | 96 |
| වනාධිමුත්තො | 110 |
| වන්තකසාවස්ස | 28 |
| වන්තදොසං | 138 |
| වන්තදොසො | 90 |
| වන්තමලො | 90 |
| වන්තලොකාමිසො | 118 |
| වන්තාසො | 46 |
| වනූපෙසි | 164 |
| වපයන්ති | 130 |
| වරඤ්ඤූ | 12 |
| වරත්තං | 122 |
| වරදො | 12 |
| වරං | 104 |
| වරාහරො | 12 |
| වරො | 12 |
| වසලවාදෙන | 184 |
| වසවත්තී | 340 |
| වසං | 36 |
| වසා | 4 |
| වසිමං | 360 |
| වසීභාවො | 18 |
| වස්සං | 96, 178 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| වස්සිකා | 118 |
| වස්සූපගතො | 178 |
| වහන්ති | 108 |
| වාක්කරණමත්තෙන | 90 |
| වාක්‍යා | 218 |
| වාචාගොචරභාණිනො | 248 |
| වාචානුරක්ඛී | 94 |
| වාචාමුත්තිං | 394 |
| වාචාය සංවරො | 114 |
| වාණිජො | 52 |
| වාති | 38 |
| වාතො | 26 |
| වාදිත | 2 |
| වානරො | 108 |
| වායො | 146 |
| වාරි | 122 |
| වාරිජො | 34 |
| වාරිවහා | 16 |
| වාලධිං | 262 |
| වාවත්තෙසි | 380 |
| වාහා | 108 |
| වාහෙති | 232 |
| විකම්පති | 418 |
| විකාලභොජනා | 2 |
| විකිණ්ණවාචා | 202 |
| වික්ඛීණො | 218 |
| විගතමිද්ධො | 22 |
| විගතවලාහකං | 148 |
| විගතිච්ඡසු | 114 |
| විග්ගය්හ | 10, 262 |
| විඝාතපක්ඛිකං | 426, 430 |
| විඝාතවා | 444 |
| විචාරිතානි | 432 |
| විචිකිච්ඡිතං | 12 |
| විචිනථ | 214 |
| විචෙචනාත් | 36 |
| විජාතාය | 154 |
| විජිතං | 106 |
| විජිතසඞ්ගාමො | 420 |
| විජ්ජා | 362 |
| විජ්ජාවිමුත්ති | 18 |
| විඤ්ඤාණපච්චයා | 130 |
| විඤ්ඤාණං | 130 |
| විඤ්ඤාණං අත්ථමගමා | 316 |
| විඤ්ඤුතමපොත | 144 |
| විඤ්ඤුතෙ | 144 |
| විඤ්ඤූපකා | 464 |
| විඤ්ඤුපතිං | 124 |
| විඤ්ඤූ | 38 |
| විතක්කපමථිතස්ස | 110 |
| විතක්කා | 196 |
| විතක්කාසයා | 426 |
| විතක්කූපච්ඡෙදාය | 200 |
| විතක්කූපසමෙ | 112 |
| විතිණ්ණපරලොකස්ස | 68 |
| විත්තලාභං | 408 |
| විත්තං | 8 |
| විද්ධං | 148 |
| විද්ධෙ | 346 |
| විද්වා | 200, 310 |
| විධංසති | 334 |
| විධූපයං | 134 |
| විධූපිතා | 272 |
| විනයො | 148 |
| විනාති | 186 |
| විනිවෙඨෙත්වා | 148 |
| විනීතා | 252 |
| විනෙය්‍ය | 22 |
| විනොදයෙ | 110 |
| විඥති | 38 |
| විපරිණාමධම්මා | 194, 410 |
| විපස්සිනො | 320 |
| විපාකාවසෙසෙන | 226 |
| විපාතයං | 40 |
| විපුලං | 32 |
| විප්පකතා | 148 |
| විප්පකාරං | 140 |
| විප්පජහෙය්‍ය | 80 |
| විප්පටිසාරං | 300 |
| විප්පමුඤ්චථ | 118 |
| විප්පමුත්තො | 12 |
| විප්පමොක්ඛං | 194 |
| විප්පසන්නං | 124 |
| විප්පසන්නො | 372 |
| විප්පහාය | 42 |
| විප්ඵාලෙසුං | 310 |
| විබ්භන්තචිත්තා | 202 |
| විභජන්ති | 252 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| විභවං | 194, 376 |
| විභවතණ්හා | 386 |
| විභාවයන්ති | 10 |
| විභූසනට්ඨානා | 2 |
| විමලං | 124 |
| විමුත්තමානසො | 110 |
| විමුත්ති | 390 |
| විමුත්තිකථා | 198 |
| විමුත්තිඤාණදස්සනකථා | 198 |
| විමුත්තිඤාණදස්සනක්ඛන්ධො | 460 |
| විමුත්තිඤාණදස්සනසම්පන්නා | 464 |
| විමුත්තිඤාණං | 462 |
| විමුත්තිරසො | 236 |
| විමුත්තිසම්පන්නා | 464 |
| විමුත්තිසාරා | 370 |
| විමුත්තිසුඛපටිසංවෙදී | 130, 148, 192 |
| විමුය්හති | 18 |
| විමොක්ඛා | 20, 44 |
| වියත්තා | 252 |
| විරජං | 8, 120, 124, 224 |
| විරජං පදං | 378, 402 |
| විරජ්ජථ | 362 |
| විරති | 6 |
| විරත්තචිත්තා | 12 |
| විරත්තචිත්තා සෙ | 362 |
| විරත්තං | 206 |
| විරාගතා | 148 |
| විරාගධම්මං | 410 |
| විරාගං | 8 |
| විරාගො | 92, 438 |
| විරාජයං | 362 |
| විරාජිතා | 396 |
| විරිච්චමානො | 296 |
| විරියමාරභතො | 50 |
| විරියාරම්භකථා | 198 |
| විරුජ්ඣති | 44 |
| විරුද්ධෙසු | 124 |
| විරූළ්හබ්‍රහ්මචරියා | 366 |
| විලෙපන | 2 |
| විලොමාති | 36 |
| විවරන්ති | 252 |
| විවරං | 54 |
| විවාහෙ | 416 |
| විවිච්ච සයනෙන | 92 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| විවෙකො | 92, 148 |
| විසකුම්භෙන | 436 |
| විසඞ්ඛාරගතං | 64 |
| විසඞ්ඛිතං | 64 |
| විසඤ්ඤුත්තං | 122 |
| විසත්තිකා | 108, 284 |
| විසමානී ච | 226 |
| විසං | 52 |
| විසංයුත්තං | 120, 122 |
| විසාරද | 252 |
| විසීදන්ති | 68 |
| විසුක්ඛා | 278 |
| විසුද්ධං | 28 |
| විසූකදස්සන | 2 |
| විසෙසතො | 30 |
| විසෙසාධිගමෙන | 436 |
| විසොකස්ස | 44 |
| විස්සට්ඨාය | 244 |
| විස්සං ධම්මං | 90 |
| විස්සාසපරමා | 76 |
| විහච්ච | 148 |
| විහඤ්ඤති | 28, 38, 164 |
| විහඤ්ඤමානං | 154, 156 |
| විහතෙ | 372 |
| විහාරං | 22 |
| විහාහිසි | 118 |
| විහිංසති | 56, 150 |
| විහිංසාවිතක්කා | 476 |
| විහෙඨයන්තා | 72 |
| විහෙඨෙසුං | 310 |
| විහෙසෙන්ති | 152, 216 |
| විහෙසෙසි | 144 |
| වීතගෙධස්ස | 444 |
| වීතතණ්හා | 112, 376 |
| වීතද්දරං | 120 |
| වීතමච්ඡරා | 406 |
| වීතමලං | 224 |
| වීතමොහෙසු | 114 |
| වීතලොභො | 184 |
| වීතිවත්තො | 168 |
| වීරං | 126 |
| වුට්ඨිත්වා | 130 |
| වුට්ඨි | 28 |
| වූපසන්ති | 164 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| වුසිතබ්‍රහ්මචරියො | 134 |
| වුසිතවා | 368 |
| වුස්සති | 192, 356 |
| වූපකට්ඨො | 174, 178 |
| වෙදගුනො | 156 |
| වෙදගු | 310, 392 |
| වෙදනං | 58 |
| වෙදනා | 4, 130, 380 |
| වෙදනානං ඛයා | 380 |
| වෙදනානං ච සම්භවං | 380 |
| වෙදනාහි | 156 |
| වෙදන්තගු | 134 |
| වෙධති | 176 |
| වෙය්‍යාකරණාය | 428 |
| වෙරභයාතීතං | 396 |
| වෙරමණී | 2 |
| වෙරසංසග්ගසංසට්ඨො | 96 |
| වෙරං | 26, 302 |
| වෙරා | 302 |
| වෙරානි | 26 |
| වෙරිනෙසු | 74 |
| වෙරී | 34, 204 |
| වෙරොචනම්හා | 276 |
| වෙලා | 230 |
| වෙලායං | 130 |
| වෙස්සන්තරං | 360 |
| වෙහාසං | 186 |
| වෙළුරියො | 232 |
| වොක්කන්තා | 366 |
| වොදිට්ඨා | 214 |
| වොරොපෙසි | 204 |
| ව්‍යන්තීකාහිති | 112 |
| ව්‍යාපාදවිතක්කො | 476 |
| ව්‍යාබාධෙමි | 560 |
| ව්‍යාවටො | 154 |

| ස | |
|---|---|
| සඋපාදිසෙසා | 368 |
| සඋපායාසං | 348, 364 |
| සඋම්මි | 396, 472, 474 |
| සකටසතානි | 298 |
| සකදාගාමී | 238 |
| සකවණ්ණං | 148 |
| සකවෙදියා | 246 |
| සකිඤ්චනං | 154, 156 |
| සකිඤ්චනො | 122 |
| සකුන්තානං | 44 |
| සකුන්තො | 68 |
| සකෙසු ධම්මෙසු | 138 |
| සක්කච්ච | 8 |
| සක්කච්චං | 14, 120 |
| සක්කතො | 142, 152 |
| සක්කරියමානස්ස | 418 |
| සක්කායදිට්ඨි | 12 |
| සක්කායාභිරතා | 444 |
| සක්කාරං | 40, 152 |
| සක්කාරෙන | 416, 418 |
| සක්කො | 20, 186, 340 |
| සඛා | 16 |
| සගන්ධකං | 36 |
| සඞ්ගං | 396 |
| සඞ්ගො | 472, 474 |
| සග්ගං | 392, 400, 408 |
| සග්ගාපායං | 128 |
| සග්ගාය | 68 |
| සඞ්කප්පො | 40 |
| සඞ්කප්පා | 108 |
| සඞ්කස්සරං | 102 |
| සඞ්කාරධානස්මිං | 38 |
| සඞ්කාරභූතෙසු | 38 |
| සඞ්කියො | 408 |
| සඞ්කිලිස්සති | 66 |
| සඞ්ඛතං | 402 |
| සඞ්ඛතා | 366 |
| සඞ්ඛම්පි | 172 |
| සඞ්ඛලිඛිතං | 238 |
| සඞ්ඛාතධම්මස්ස | 154 |
| සඞ්ඛාතධම්මානං | 40 |
| සඞ්ඛාතුං | 74 |
| සඞ්ඛානසිප්පං | 190 |
| සඞ්ඛාය | 90, 392 |
| සඞ්ඛාරපච්චයා | 130 |
| සඞ්ඛාරපරමා | 76 |
| සඞ්ඛාරා | 88, 130 |
| සඞ්ඛාරූපසමං | 116, 118 |
| සඞ්ඛාරූපසමො | 366 |
| සඞ්ඛුභිංසු | 262 |
| සඞ්ඛො | 232 |
| සඞ්ඛ්‍යං | 392 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සඞ්ගහාති | 416 |
| සඞ්ගහො | 6 |
| සඞ්ගං | 272 |
| සඞ්ගා | 140 |
| සඞ්ගාතිගං | 122 |
| සඞ්ගාතිගො | 396 |
| සඞ්ගාමජුත්තමො | 48 |
| සඞ්ගාමසීසං | 420 |
| සඞ්ගාමෙ | 48, 104 |
| සඞ්ගො | 68 |
| සඞ්ඝකම්මානි | 246 |
| සඞ්ඝභෙදෙ | 334 |
| සඞ්ඝසාමග්ගී | 336 |
| සඞ්ඝං | 2 |
| සඞ්ඝාටිකණ්ණෙ | 442 |
| සඞ්ඝාටිං | 298 |
| සඞ්ඝෙ | 8 |
| සචිත්තපරියොදපනං | 72 |
| සචිත්තං | 106 |
| සච්චවෙදිතං | 80 |
| සච්චං | 90, 122, 290 |
| සච්චානං | 92 |
| සචෙචත | 8 |
| සච්ඡිකත්වා | 378 |
| සජ්ජන්ති | 262 |
| සජ්ජු | 40 |
| සඤ්ඤතචාරිනො | 48 |
| සඤ්ඤතස්ස | 30 |
| සඤ්ඤතුත්තමො | 114 |
| සඤ්ඤතෙ | 308 |
| සඤ්ඤතො | 164 |
| සඤ්ඤමතො | 302 |
| සඤ්ඤමය | 118 |
| සඤ්ඤමස්ස | 340 |
| සඤ්ඤමෙන | 30 |
| සඤ්ඤමෙස්සන්ති | 34 |
| සඤ්ඤමො | 6 |
| සඤ්ඤා | 18 |
| සඤ්ඤාපෙත්වා | 164 |
| සඤ්ඤොජනසඞ්ගසත්තා | 280 |
| සඤ්ඤොජනං | 80 |
| සඤ්ඤොජනෙ | 280 |
| සඤ්ඤොජනෙන | 332 |
| සසීලො | 102 |
| සඨො | 86, 90 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සණ්ඨාති | 200 |
| සතතං සමිතං | 478, 480 |
| සතාධිපතෙය්‍යා | 370 |
| සතිපට්ඨානානි | 238 |
| සතිමතො | 30, 44 |
| සතිමා | 106, 354 |
| සති වා උපාදිසෙසෙ | 370, 372 |
| සතිං | 182 |
| සතො | 170, 380 |
| සතො සම්පජානො | 372 |
| සත්තබොජ්ඣඞ්ගා | 4 |
| සත්තසණ්ඩං | 346 |
| සත්තා | 280 |
| සත්තාහවද්දලිකා | 148 |
| සත්ථවාහා | 460 |
| සත්ථාරෙ | 460 |
| සත්ථිං | 262 |
| සත්ථුසාසනකාරිනො | 356 |
| සද්ධා | 108, 422 |
| සන්තවා | 118 |
| සදත්ථපසුතො | 66 |
| සදිසං | 38 |
| සද්ධො | 100 |
| සද්ධම්මදෙසනා | 74 |
| සද්ධම්මා | 114 |
| සද්ධං | 28 |
| සද්ධායමානරූපා | 248 |
| සද්ධිං චරං | 310 |
| සන්තත්තො | 26 |
| සන්තකායො | 118 |
| සන්තචිත්තා | 370 |
| සන්තතරා | 402 |
| සන්තප්පමාණෙ | 192 |
| සන්තමානසං | 142 |
| සන්තරබාහිරං | 104 |
| සන්තවාචො | 118 |
| සන්තවුත්ති | 358, 480 |
| සන්තස්ස | 38 |
| සන්තං පදං | 20 |
| සන්තාපජානො | 192 |
| සන්තාපෙති | 192 |
| සන්තිකෙ | 32 |
| සන්තිට්ඨති | 374 |
| සන්තින්ද්‍රියං | 142 |

| ස | පිට්ඨඞ්කා |
| --- | --- |
| සන්තින්ද්‍රියො | 20 |
| සන්තිපදෙ | 390 |
| සන්තිපරං | 76 |
| සන්තිමග්ගං | 96 |
| සන්තුට්ඨී | 6, 116 |
| සන්තුට්ඨීකථා | 198 |
| සන්තුට්ඨීපරමං | 76 |
| සන්තුට්ඨො | 210 |
| සන්තුසිතො | 114 |
| සන්තුස්සකො | 20 |
| සන්තො | 42, 100, 106, 410 |
| සන්ථරිත්වා | 302 |
| සන්දස්සකා | 464 |
| සන්දස්සිතො | 226 |
| සන්දස්සෙති | 278 |
| සන්දුතං | 284 |
| සන්දුමං | 122 |
| සඞ්ඛාය | 230 |
| සඞ්ඛාරෙතුං | 170 |
| සඞ්ඛිවෙජ්ඡෙදෙ | 46 |
| සඞ්ඛිසිඛසාටකෙහු | 14 |
| සන්නද්ධො | 120 |
| සන්නිච්චයො | 44 |
| සන්නිපතිතානං | 148 |
| සන්නිපාතං | 112 |
| සන්නිවාසො | 78 |
| සන්නිසින්නානං | 148 |
| සපන්ති | 216 |
| සපරිළාහං | 348, 364 |
| සපුබ්බදෙවකානි | 468 |
| සපුබ්බාචරියකානි | 468 |
| සප්පසොණ්ඩු | 400 |
| සප්පිස්ස | 156 |
| සප්පුරිසං | 10 |
| සම්පන්නසීලානං | 38 |
| සබ්බජහස්ස | 170 |
| සබ්බකාමදදෙ | 18 |
| සබ්බගන්ථප්පමොචනං | 462 |
| සබ්බගන්ථප්පහීණස්ස | 44 |
| සබ්බඤ්ජහො | 112 |
| සබ්බත්තතාය | 194 |
| සබ්බත්ථ සංවරො | 114 |
| සබ්බත්ථ සංවුතො | 114 |
| සබ්බත්ථාභිවස්සි | 406 |

| ස | පිට්ඨඞ්කා |
| --- | --- |
| සබ්බදත්තං | 112 |
| සබ්බධි | 44, 278 |
| සබ්බධි විප්පමුත්තො | 192 |
| සබ්බප්පහායිනං | 394 |
| සබ්බභවානි | 194 |
| සබ්බභූතානුකම්පකො | 408 |
| සබ්බභූතානුකම්පී | 362, 458 |
| සබ්බයොගවිසංයුත්තං | 126 |
| සබ්බරාගවිරතස්ස | 382 |
| සබ්බලොකාභිභුං | 126 |
| සබ්බවිදූ | 112 |
| සබ්බවොසිතවොසානං | 128 |
| සබ්බසඞ්ඛාරසමථං | 402, 426 |
| සබ්බසන්ථරිං | 302 |
| සබ්බසංයොජනං | 122 |
| සබ්බසො | 116 |
| සබ්බං | 322 |
| සබ්බාභිභූ | 112, 484 |
| සබ්බාවන්තං | 224, 230 |
| සබ්බූපාදානක්ඛයා | 194 |
| සබ්භි | 62 |
| සබ්‍රහ්මකානි | 468 |
| සබ්‍රහ්මචාරී | 144 |
| සමක්ඛාතාරෙ | 464 |
| සමග්ගතං | 436 |
| සමග්ගරතො | 336 |
| සමග්ගානං | 74 |
| සමචරියා | 120, 388 |
| සමචාරිනො | 214 |
| සමණකා | 286 |
| සමණපටිසද්දං | 230 |
| සමණබ්‍රාහ්මණකපණද්ධික වණිබ්බක යාචකානං | 406 |
| සමණානං | 6 |
| සමණෙසු සමණසම්මතා | 462 |
| සමණො | 80, 90 |
| සමති විජ්ඣති | 28 |
| සමත්ථි | 8 |
| සමථං | 44 |
| සමධිගය්හ | 342 |
| සමන්තචක්ඛු | 360 |
| සමප්පිතා | 104 |
| සමවෙක්ඛිතා | 480 |
| සමවෙක්ඛිය | 358 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සමයා සමයං උපාදය | 418 |
| සමසමඵලා | 300 |
| සමං | 48 |
| සමං චරෙය්‍ය | 58 |
| සමාගකුච්ඡි | 78 |
| සමාගතානි | 8 |
| සමාචරෙ | 20 |
| සමාදපකා | 464 |
| සමාදපෙති | 278 |
| සමාදිසි | 226 |
| සමාධිකථා | 198 |
| සමාධික්ඛන්ධෙන | 386 |
| සමාධික්ඛන්ධො | 460 |
| සමාහිතා | 8 |
| සමාධිමහා | 130 |
| සමාධිලාභෙන | 92 |
| සමාධිසම්පන්නා | 464 |
| සමාධිං | 8 |
| සමාපත්තියා | 362 |
| සමාපන්නා | 142 |
| සමාහිතො | 8, 372, 380 |
| සමිඤ්ජන්ති | 42 |
| සමිතත්තා | 90 |
| සමිතිං | 104 |
| සමීරති | 42 |
| සමුට්ඨිතා | 84 |
| සමුත්තෙජකා | 464 |
| සමුත්තෙජිතො | 226 |
| සමුත්තෙජෙති | 278 |
| සමුදයො | 130 |
| සමුදාචරති | 184, 196, 360 |
| සමුද්දතීරෙ | 142 |
| සමුද්දමපෙක්ඛ | 54 |
| සමුද්දං | 396 |
| සමුප්පන්නං | 366 |
| සමුප්පන්නො | 16 |
| සමුස්සයො | 112, 382 |
| සමුස්සිතං | 60 |
| සමූහතං | 432 |
| සමෙති | 210 |
| සමෙති පාපානි | 90 |
| සමෙන | 88 |
| සමෙන්ති | 412 |
| සම්පජානමුසාවාදෙ | 344 |
| සම්පජානො | 170, 380 |
| සම්පතන්ති | 18 |
| සම්පන්නා | 410 |
| සම්පන්නවිජ්ජාචරණා | 60 |
| සම්පයාතො | 84 |
| සම්පරායිකං | 342 |
| සම්පරායිකා | 368 |
| සම්පරිවත්තසායී | 106 |
| සම්පහංසකා | 464 |
| සම්පහංසිතො | 226 |
| සම්පහංසෙති | 278 |
| සම්පාකං | 410 |
| සම්ඵලං | 378 |
| සම්බූවෙඨා | 410 |
| සම්බූසං | 410 |
| සම්බූසි | 296 |
| සම්බහුලා | 150 |
| සම්බාධො | 244 |
| සම්බුද්ධානං | 364 |
| සම්බොධගාමිනො | 450 |
| සම්බොධාය | 354 |
| සම්බොධිඅඞ්ගසු | 44 |
| සම්බොධිපරායණො | 226 |
| සම්බොධිමනුත්තරං | 372 |
| සම්බොධිමුත්තමං | 354 |
| සම්භවං | 12 |
| සම්භවන්ති | 130 |
| සම්භවෙති | 20 |
| සම්භෙදං | 364 |
| සම්භොති | 194 |
| සම්මජ්ජති | 262 |
| සම්මති | 26, 120 |
| සම්මත්තකජාතං | 280 |
| සම්මදක්ඛාතො | 42 |
| සම්මදඤ්ඤාය | 318 |
| සම්මදඤ්ඤාවිමුත්තානං | 38 |
| සම්මදඤ්ඤාවිමුත්තො | 368 |
| සම්මද්දසො | 380, 402, 428 |
| සම්මප්පජානො | 30 |
| සම්මප්පධානානි | 238 |
| සම්මසති | 116 |
| සම්මා | 400 |
| සම්මාදිට්ඨිකම්මසමාදානා | 400 |
| සම්මාදිට්ඨිකා | 400 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සම්මාදිට්ඨිසමාදානා | 104 |
| සම්මාපණිහිතං | 36 |
| සම්මාමානාභිසමයා | 380 |
| සම්මාසඞ්කප්පගොචරා | 28 |
| සම්මාසම්බුද්ධා | 424 |
| සම්මිඤ්ජිතං | 172 |
| සම්මිඤ්ජෙය්‍ය | 472 |
| සම්මුඛා දිට්ඨා | 242 |
| සම්මොදනීයං කථං | 134 |
| සයඞ්කතො | 264 |
| සයනාසනං | 72 |
| සයානො | 22 |
| සරක්ඛසං | 396 |
| සරක්ඛසො | 472, 474 |
| සරණගමනං | 2 |
| සරණං | 2 |
| සරණං යන්ති | 72 |
| සරදසමයෙ | 346 |
| සරභඤ්ඤං | 244 |
| සරං | 104, 310 |
| සරු | 100 |
| සරිතා | 278 |
| සරිතානි | 110 |
| සරීරකං | 144 |
| සරීරන්තිමධාරිනං | 364 |
| සරෙහි | 218 |
| සරෙ | 410 |
| සලාභං | 114 |
| සල්ලකත්තො | 458 |
| සල්ලතො | 380 |
| සල්ලසන්ථනං | 92 |
| සල්ලහුකවුත්ති | 20 |
| සවන්ති | 108 |
| සවන්තියො | 232 |
| සවාහිනිං | 68, 384, 890 |
| සවිඤ්ඤාතං | 348, 364 |
| සවීචිං | 396 |
| සසො ච | 110 |
| සස්සතා | 88 |
| සස්සතී | 288 |
| සස්සතො | 258 |
| සහතී | 108 |
| සහතෙ | 432 |
| සහනන්දී | 416 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සහනුක්කමං | 122 |
| සහවාසො | 416 |
| සහව්‍යතං | 422 |
| සහායතා | 38, 106 |
| සහා වසෙ | 412 |
| සහිතං | 30 |
| සහෙතුධම්මං | 130 |
| සළායතනං | 130 |
| සංයමෙන | 18 |
| සංයමො | 90, 148 |
| සංයුත්තො | 332 |
| සංයොගා | 118 |
| සංයොජනක්ඛයා | 416 |
| සංයොජනසඞ්ගසත්තා | 110 |
| සංයොජනං | 32, 354, 372 |
| සංවට්ටමානෙ | 340 |
| සංවට්ටවිවට්ටකප්පෙ | 340 |
| සංවරට්ඨං | 356 |
| සංවරෙ | 114 |
| සංවසති | 232 |
| සංවසෙ | 66 |
| සංවාසෙන | 258 |
| සංවාසො | 78, 230 |
| සංවිග්ගස්ස | 358 |
| සංවිභජති | 408 |
| සංවිභාගස්ස | 344 |
| සංවිභාගා | 452, 458 |
| සංවුතො | 82, 182 |
| සංවෙගිතො | 60 |
| සංවෙජනීයෙසු | 358 |
| සංවෙජෙන්ත | 358 |
| සංවෙජිතො | 142 |
| සංවොහාරෙන | 256 |
| සංසග්ගා | 412 |
| සංසන්දන්ති | 412 |
| සංසත්තාසඞ්කප්පමනො | 94 |
| සංසරන්ති | 330 |
| සංසාමෙත්වා | 178 |
| සංසාරං | 126, 386 |
| සංසාරු | 44 |
| සාකියානි | 170 |
| සාඛාභඞ්ගං | 208 |
| සාගරං | 16 |
| සාගරු | 470 |

| ස | පිට්ඨඞ්කා |
| --- | --- |
| සාගාරෙසු | 470 |
| සාතතිකං | 418 |
| සාතතිකා | 30 |
| සාතරූපෙන | 164 |
| සාතසිතා | 110 |
| සාදුතෙසු | 124 |
| සාධු | 246 |
| සාධුකං | 130 |
| සාතොදකා | 298 |
| සාධාරණෙ | 164 |
| සාධුජීවී | 412 |
| සාධුතා | 82 |
| සාධුරූපො | 90 |
| සාධුවිහාරිං | 106 |
| සාමග්ගී | 74 |
| සාමඤ්ඤඞ්ගං | 480 |
| සාමඤ්ඤතා | 108 |
| සාමඤ්ඤත්ථං | 440, 462 |
| සාමඤ්ඤස්ස | 30 |
| සාමඤ්ඤස්සානුලොමිකං | 460 |
| සාමඤ්ඤං | 102, 214 |
| සාමං | 208 |
| සාමං ඤාතං | 398, 400, 418 |
| සාමං දිට්ඨං | 418 |
| සාමං විදිතං | 418 |
| සාමවතිප්පමුඛානි | 288 |
| සාමිකං | 158 |
| සාමීචිපටිපන්නා | 252 |
| සාමුක්කංසිකා දෙසනා | 224 |
| සාරත්තරත්තා | 110 |
| සාරත්තා | 272 |
| සාරථිනා | 44 |
| සාරථිං | 80 |
| සාරදෙ | 62 |
| සාරමතිනො | 28 |
| සාරමෙන්ති | 274 |
| සාරම්භකථා | 56,270 |
| සාරම්භො | 56 |
| සාරාණීයං | 134 |
| සාරෙ | 28, 138 |
| සාලම්බ | 66 |
| සාලවනෙ | 202 |
| සාවකපාරමී | 20 |
| සාවට්ටං | 396 |
| සාවට්ටො | 472 |
| සාසනං | 66, 72 |
| සාසපො | 122, 124 |
| සාහු | 78 |
| සාහුනෙය්‍යකානි | 468 |
| සික්ඛං පච්චක්ඛාය | 170 |
| සික්ඛානිසංසා | 370 |
| සික්ඛාපදං | 2, 234 |
| සික්ඛාසාරා | 274 |
| සිඞ්ගී | 472 |
| සිඞ්ඝාටකෙන | 214 |
| සිඞ්ඝාතිකා | 4 |
| සිඤ්ච | 116 |
| සිත්තා | 116 |
| සිථිලා | 102, 110 |
| සිනෙහං | 96 |
| සිනෙහිතානි | 110 |
| සින්ධවා | 104 |
| සිප්පං | 6, 190 |
| සීතවාතදුද්දිනී | 148 |
| සීතාසු | 140 |
| සීතීභවිංසු | 318 |
| සීතීභූතං | 126 |
| සීදෙ | 412 |
| සීමන්තරිකාසු | 204 |
| සීලකථා | 198 |
| සීලක්ඛන්ධෙන | 386 |
| සීලක්ඛන්ධො | 460 |
| සීලගන්ධො | 88 |
| සීලදස්සනසම්පන්නං | 30 |
| සීලබ්බතමත්තෙන | 92 |
| සීලබ්බතං | 12 |
| සීලමයං | 388 |
| සීලවතූපපන්නො | 426 |
| සීලවිපත්තියා | 302 |
| සීලවිපන්නෙ | 302 |
| සීලසම්පන්නා | 464 |
| සීලසංවුතො | 96 |
| සීලං | 108, 258, 408 |
| සීලෙන | 18 |
| සීලෙසු සුසමාහිතො | 28 |
| සුකරං | 246 |
| සුකරානි | 66 |
| සුකිලන්තරූපො | 300 |
| සුක්කධම්මා | 364 |
| සුක්කමූලා | 366 |
| සුක්කං | 42 |
| සුක්කංසං | 40 |
| සුක්කා | 146 |
| සුඛකාමානි | 56, 150 |
| සුඛදුක්ඛඵුට්ඨා | 152 |
| සුඛදුක්ඛා | 146 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සුඛපරිච්චාගා | 96 |
| සුඛමෙධති | 74 |
| සුඛසමුද්දයෙ | 340, 388 |
| සුඛසංවාසො | 78 |
| සුඛසොමනස්සබහුලො | 358 |
| සුඛා | 106 |
| සුඛානි පත්ථයමානො | 408 |
| සුඛා වෙදනා | 380 |
| සුඛාවහං | 34 |
| සුඛිතත්තා | 20 |
| සුඛිනී | 160 |
| සුඛිතො | 20, 156 |
| සුඛුද්‍රයං | 340, 388 |
| සුඛුමදිට්ඨිවිපස්සකං | 418 |
| සුඛුමා විතක්කා | 200 |
| සුඛෙසිතො | 110 |
| සුඛො | 74, 108 |
| සුගතා | 126 |
| සුගතිගමනසඞ්ඛාතං | 422 |
| සුගතිතො | 54 |
| සුග්ගතිං | 28 |
| සුග්ගහීතානි | 244 |
| සුචරිතං | 66, 68 |
| සුචරිතානි | 392 |
| සුචි | 244 |
| සුචිකම්මස්ස | 30 |
| සුචිගන්ධං | 38 |
| සුචිං | 8, 14 |
| සුචී | 122 |
| සුචජ්ජන්තං | 28 |
| සුජා | 186 |
| සුජීවං | 86 |
| සුඤ්ඤතො | 44 |
| සුඤ්ඤාගාරගතො | 164 |
| සුඤ්ඤාගාරං | 116 |
| සුඤ්ඤාගාරුත්තං | 370 |
| සුතධම්මස්ස | 148 |
| සුතමත්තං | 144 |
| සුතං | 226 |
| සුතෙ | 144 |
| සුත්තං | 36, 96 |
| සුත්තා | 372 |
| සුත්තෙසු | 32 |
| සුදන්තා | 44 |
| සුදන්තෙන | 64, 104 |
| සුදස්සනං | 290 |
| සුදස්සං | 86 |
| සුදුත්තරං | 42 |
| සුදුද්දසං | 34 |
| සුද්ධාජීවිං | 114 |
| සුද්ධාජීවෙ | 118 |
| සුද්ධාජීවෙන | 86 |
| සුද්ධි | 140 |
| සුනිග්ගහීතං | 252 |
| සුනිපුණං | 34 |
| සුනිහිතො | 16 |
| සුන්දරී | 212 |
| සුපටිපන්නො | 158 |
| සුපතිත්ථා | 298 |
| සුපරිසංවුතා | 84 |
| සුපරිහීනා | 364 |
| සුප්පකාසිතං | 254 |
| සුප්පතිට්ඨිතං | 186 |
| සුප්පතිට්ඨිතා | 16 |
| සුප්පතිට්ඨිතො | 422 |
| සුප්පබුද්ධං | 100 |
| සුප්පබුද්ධො | 222 |
| සුප්පයුත්තා | 10 |
| සුප්පං | 262 |
| සුබ්බතා | 60 |
| සුබ්බතො | 44 |
| සුභරො | 20 |
| සුභානුපස්සීතො | 110 |
| සුභානුපස්සිං | 26 |
| සුභාය ධාතුයා | 426 |
| සුභාවිතං | 28 |
| සුභාසිතා | 6 |
| සුභාසුභං | 124 |
| සුභික්ඛවාචො | 408 |
| සුමනසිකතානි | 244 |
| සුමනා | 8 |
| සුමනො | 40 |
| සුමරති | 106 |
| සුමෙධං | 78 |
| සුමෙධසො | 32 |
| සුරක්ඛිතං | 64 |
| සුරභී | 410 |
| සුරාමෙරයමජ්ජපමාදට්ඨානා | 2 |
| සුරියො’ව | 134 |
| සුලද්ධලාභං | 422 |
| සුලද්ධං | 218 |
| සුලභරූපා | 282 |
| සුලභානි | 460 |
| සුවචො | 20 |
| සුවණ්ණතා | 18 |
| සුවත්ථි | 8 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සුවිකප්පිතා | 272 |
| සුවිමුත්තචිත්තා | 30 |
| සුවිලිත්තා | 256 |
| සුසණ්ඨානසුරූපතා | 18 |
| සුසමාරද්ධා | 250 |
| සුසංවුතං | 28 |
| සුසංවුතො | 94 |
| සුසංවිහිතා | 168 |
| සුසික්ඛිතො | 6 |
| සුසුඛං | 74, 158 |
| සුස්සරතා | 18 |
| සුහජ්ජා | 80 |
| සූකරමද්දවං | 294 |
| සූජු | 20 |
| සූවිසටිකං | 230 |
| සූපට්ඨිතාය | 182 |
| සූපධාරිතානි | 244 |
| සෙක්ඛං | 278 |
| සෙඛස්ස | 332, 390, 414 |
| සෙඛො | 36, 414, 424 |
| සෙට්ඨතං | 32 |
| සෙතපච්ඡාදෙ | 282 |
| සෙදෙ | 4 |
| සෙනාසනං | 460 |
| සෙනාසනානි | 176 |
| සෙනානි | 64 |
| සෙම්හං | 4 |
| සෙය්‍යසො | 36 |
| සෙය්‍යං | 38 |
| සෙලං | 28 |
| සෙලූපමං | 206 |
| සෙලෙ | 360 |
| සෙවතා | 6 |
| සෙවමානො | 410 |
| සෙහි | 56 |
| සොකම්මජ්ඣෙ | 218 |
| සොකා | 108 |
| සොකාවතිණ්ණං | 360 |
| සොඛිතිං | 32 |
| සොචති | 28 |
| සොචෙය්‍යසම්පන්නා | 394 |
| සොචෙය්‍යං | 256 |
| සොචෙය්‍යානි | 394 |
| සොණසිගාලා | 364 |
| සොණ්ඩාය | 208 |
| සොණ්ඩා | 262 |
| සොතධාතුයා | 186 |
| සොතං | 110 |
| සොතා | 108 |
| සොතාපත්තිඵලසච්ඡිකිරියාය | 238 |
| සොතාපත්තිඵලං | 70 |
| සොතාපන්නා | 238 |
| සොතෙන සංවරෙ | 114 |
| සොතො | 108, 474 |
| සොත්ථානං | 6 |
| සොත්ථිං | 8 |
| සොත්ථිමාගතං | 80 |
| සොබ්භ | 296 |
| සොමනස්සජාතා | 164 |
| සොවචස්සතා | 6 |
| සොළසිං | 150 |
| **හ** | |
| හතප්පභො | 276 |
| හතාවකාසො | 46 |
| හත්ථසඤ්ඤතො | 114 |
| හත්ථිකළභෙහි | 208 |
| හත්ථිච්ඡාපෙහි | 208 |
| හත්ථිනාගො | 208 |
| හත්ථිසිප්පං | 190 |
| හදයං | 4 |
| හනන්ති | 150 |
| හරායමානා | 376 |
| හරායමානො | 174 |
| හවෙ | 130 |
| හාසපඤ්ඤතං | 364 |
| හාසො | 60 |
| හිත්වා | 32 |
| හිමපාතසමයෙ | 140 |
| හිමවන්තො | 100 |
| හිරි | 364 |
| හිරීනිසෙධො | 60 |
| හිංසති | 56 |
| හිරොත්තප්පං | 362 |
| හිංසන්ති | 378 |
| හිංසමානො | 120 |
| හීනවීරියං | 26 |
| හීනවීරියො | 354 |
| හීනං ධම්මං | 66 |
| හීනාධිමුත්තිකා | 412 |
| හීනායාවත්තිස්සාමි | 170 |
| හුහුඞ්කජාතිකො | 134 |
| හුතං | 48 |
| හුරං | 8, 30, 294 |
| හුරාහුරං | 108, 200 |
| හෙට්ඨාරඞ්ගෙ | 472, 474 |
| හෙතු | 14 |
| හෙමන්තිකාසු | 140 |

# ඛුද්දකපාඨ උපග්‍රන්ථය

(මෙහි අඞ්ක පොතෙහි පිටු පෙන්වති)

## 2

**සරණගමනය**: මෙය කවුරුන් විසින් කවරදා කොතන්හි කාට කුමට කියන ලද්දේ ද යත්: භාග්‍යවතුන් වහන්සේ බුදු වැ ඉසිපතනේ වැඩ දම්සක් පවත්වා පස්වග තවුස් ආදීන් සිය සවුබච්හි පිහිටුවා, ඔවුන් දහම් දෙසනු වස් ඒ ඒ අත යැවූ සේක. එසේ ඉසිපතනේහි ම වැඩ වසන දවස්හි භික්ෂූන් පැවිදි උපසපු ලබනු කැමැති කුල පුතුන් නොයෙක් දෙසින් ඔබ වෙත ගෙනෙති. එ විට භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ පහසුව සලකා "මහණෙනි, තෙපි ම ඒ ඒ පෙදෙස්හිදී පැවිද්දත් උපසපුවත් දෙවු" යි අවසර දී වදාරා එය කරන සැටි දක්වන සේක්, "පළමු කොට කෙස් රවුලු බහවා, කසාවත් හඳවා, උතුරුසඟ (තණිපටසිවුර) එකස් කරවා, මහණුන් පා වඳවා, උක්කුටුක කොට හිඳුවා, දෙහොත් මුදුන් තබවා, 'බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමි, දුතියම්පි – තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි'යි මේ සරණගමන තුනින් පැවිද්දත් උපසපුවත් දෙවු" යි වදාළ සේක. [**මහාවග්ග** – දෙවෙනි බණවර. උපසම්පදා කථාව]

මෙසේ මුල් අවදියේ දී (එහිභික්ඛූපසම්පදාවෙන් පසු) සරණ දීමෙන් මහණ කිරීමත් උපසම්පදාවත් පැණැවූ සේක. ටික කලෙකින් පසු එය වෙනස් කොට ඥප්තිචතුර්ථකර්මයෙන් උපසම්පදා කිරීමට නියම කළ සේක. බුදු වීමෙන් අවුරුද්දක් ගත වූ තැන බුදුරජාණන් වහන්සේ **කිඹුල්වත්පුර** වැඩි සේක. එසේ වැඩි දිනෙන් සත්වන දා **රාහුල** කුමරු මහණ කිරීම **සැරියුත්** තෙරුනට පැවැරූ සේක. 'කෙසේ රාහුල කුමරු මහණ කරම් දැ?' යි සැරියුත් තෙරණුවෝ ඇසූහ. තිසරණ ගැන්වීමෙන් මහණ කරන්නැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එතැන් පටන් හෙරණ පැවිද්ද සරණ සමාදන් කරවීමෙන් සිදු කරනු ලැබේ.

**බුද්ධං සරණං ගච්ඡාමි**: (බුදුරජුන් සරණ යෙමි.) – මෙහි **බුදුරජුහු** නම් පරොපදෙශ රහිත වැ තමන් ම සිය නුවණින් සත්‍යාවබොධය කළ භාග්‍යවතුන් වහන්සේ ය.

**ධම්මං සරණං ගච්ඡාමි**: (දහම් සරණ යෙමි.) යන තැන දහම් යනු සතර මඟත් නිවනත් ය. මාර්ගී වැඩූ නිවන් පසක් කළහු අපායෙනුත් මිදෙති. කෙළවර සියලු සසර දුකින් මිදෙති. මෙසේ තමන් සරණ ගියවුන් අපායෙනුත් සසරිනුත් මිදුණවුන් කොට දරන්නේ ය, උසුලන්නේ ය යනු **ධම්ම** යනුයෙහි අදහස ය.

**සඞ්ඝං සරණං ගච්ඡාමි**: (සඟ සරණ යෙමි.) – මෙහි **සඞ්ඝ** යනු සතරමඟට සතර ඵලයට පැමිණි පුද්ගල සමූහය යි. දෘෂ්ටිශීල දෙකින් එකට සංහත (ගැළපුණ) බැවින් ඔබ හැම **සඞ්ඝ** නමි. මේ සරණ යා යුතු පරමාර්ථ සඞ්ඝයා ය.

**සරණං ගච්ඡාමි**: (සරණ යෙමි.)– සරණ යෑම යනු පිහිට යැ යි දැන ගැනීම යි. 'යෙ ගත්‍යර්ථා තෙ බොධ්‍යර්ථා' - යම් ධාතූහු කෙනෙක් ගමනාර්ථයෙහි වෙත් ද, ඔහු බොධ්‍යර්ථයෙහි ('දැන ගැනීම යන අර්ථයෙහි) වෙති'යි කී බැවින් "සරණ යෙමි" යනු "සරණ යැ යි, පිහිටයැ යි දැන ගනිමි" යන අර්ථ දෙයි.

## 2

**දසසික්ඛාපදං**: (දස සිකපද.) ඉහත දැක්වුණ පරිදි සරණගමනයෙන් සස්නට වැද ගැන්ම දැක්විණ. සස්නට බැසීම උපාසකභාවයෙන් ද ප්‍රව්‍රජිත-භාවයෙන් දැ යි දෙ පරිද්දෙකින් වේ. ඒ කවරකු විසින් වුව ද හික්මියැ යුතු ශික්‍ෂාව දක්වනු වස් ඊළඟට දස සික්ඛාපද මෙහි දැක්විණ. මේ සිකපද ද භාග්‍යවතුන් වහන්සේ විසින් කිඹුල්වතින් සැවැත්නුවරට වැඩ එහි දෙව්රම් වෙහෙරැදී හෙරණුන් විසින් රැක්ක යුතු ශික්‍ෂා දක්වනු විසින් "අනුජානාමි භික්ඛවෙ සාමණේරානං දස සික්ඛාපදානි (මහණෙනි, හෙරණුනට දස සිකපද කෙනකුත් අනුදනිමි;" යි වදරන ලදී. මොහු දස දෙන ම හෙරණුන් විසින් නිති සිල් විසින් රැක්ක යුතු. පළමු දෙවෙනි සිවුවන පස්වන යන සතරත් තෙවැන්නෙහි 'අබ්‍රහමචරියා' යන්න වෙනුවට 'කාමෙසු මිච්ඡාචාරා'යි යොදා ගෙන ගිහියන් විසින් නිති සිල් විසින් ද, මුල් සිකපද සය එසේ ම ගෙන සත්වන අටවන සිකපද දෙක එකක් කොට ගෙන ද දසවන සිකපදය හැර සිකපද අටක් ම ගිහියන් විසින් පොහෝ සිල් විසින් රැක්කැ යුතු.

**සික්ඛාපද**: (සිකපද) "සික්ඛාය පදං සික්ඛාපදං, අධිගමූපායො" යනු අටුවා යි. හික්මීමට මග, හික්මීම ලබන උපාය යනු සික්ඛාපද යන්නේ තේරුම යි.

**සමාදියාමි**: (මනා කොට ගනිමි.) 'සමාදන් කෙරෙමි, මනා කොට ගනිමි' යන්නෙහි අදහස 'අවීතික්කමනාධිප්පායෙන, අච්ඡිද්දකාරිතාය, අසබල-කාරිතාය ච ආදියාමි'යි අටුවාහි කී බැවින්, නොඉක්මෙන නොබිඳින අදහසින්, ඡිද්‍ර සබල කල්මාෂ ඇති නොවනු සේ කොට රක්නා අදහසින්, ගනිමි යනු යි.

**විකාලභොජන**:(විකල්බොජුන්) යනු දවසැ පෙරවරුවෙන් පසු බොජුන් ගැන්ම යි.

**උච්චාසයන-මහාසයන**: (උසසුන් මහසුන්). 'උච්චාසයනං වුච්චති පමාණාතික්කන්තං. තස්ස පමාණං පන යස්ස පාදතො යාව අටනියා හෙට්ඨිමන්තෙන සුගතඞ්ගුලෙන අට්ඨඞ්ගුලප්පමාණො, මජ්ඣිමපුරිසස්ස හත්ථෙන මුට්ඨිරතනප්පමාණො පාදකො හොති තං පමාණිකං නාම වට්ටති. තතො අධිකං පමාණාතික්කන්තං නාම න වට්ටති' (මනොරථපූරණී). මෙහි දැක්වෙන පරිදි උසසුන් යනු පමණට වැඩි **උස් අසුන්** ය. එහි පමණ යනු යම් අස්නෙක පා කෙළවර සිට පාදසන්ධිය තෙක් යටත් පිරිසෙයින් සුගත්-අඟුලෙන් අටඟුල් පමණ වූයේ, හෙවත් මැදුම් මිනිසක්හු අතින් මිට්-රියනක් පමණ උස් වූයේ ය. මෙයට වැඩි උස් වූයේ උච්චාසයන යි. **මහාසයන** නම් සිංහව්‍යාඝ්‍රාදීන්ගේ රූප සහිත කොට තැනූ බොහෝ අගනා පලස් ආදිය අතුරු බිමැ හෝ උඩක හෝ පැණැ වූ අසුන් ය.

## 4

**දෙතිස් ආකාරය නම්**: ආකාර තිස්දෙක යි. සිරුරැ කෙස් ලොම් ආදී කුණප කොටස් දෙතිස යි. කායගතාසති කම්සථානය වඩනුවන්හු මෙහි දැක්වුණු කෙස්ලොම්තිය ඇ පිළිවෙළින් මුළු සිරුර ම නුවණින් බැලියැ යුතු. කෙස් පටන් පැසුණු අහර අවසන් කොටැ එකුන්විසි කුණු ද, කෙළවරැ දැක්වුණු හිස්මොල ද යන විසි පාගුව සම්මතිපඨවිධාතු යැ යි ගැනේ. පිත පටන් සොටූ අවසන් කොටැති දෙළොස් කුණු සමමති ආපොධාතු යි.

## 4

**කුමාර පඤ්හ**: සැඩොල්කුලයෙන් පැවිදි වූ **සෝපාක** නම් හෙරණෙක් විය. හේ සත්හැවිරිදි වයස් ඇත්තේ ම රහත් විය. ඒ ළදරු රහත්හට උපසපුව දෙන අදහසින් බුදුහු මෙහි කී 'එක නම් කිම' ආදී **ප්‍රශ්න** ඇසූහ. හේ ඒ හැම විසැඳී ය. එයින් උපසපුව ලැබී ය. මේ '**පඤ්හබ්‍යාකරණෝපසම්පදා**' නම් විය.

**ආහාර**: ආහාර සතර දෙනෙකි: කබලීකාර ආහාර, ස්පර්ශාහාර, මනස්සංචේතනාහාර, විඥානාහාර යනු ඒ සතර යි. 'ආහාර' යනු ඵලය ගෙනෙන්නා, ඵලය උපදවන්නා යන අරුත් ඇති පදයෙකි. මෙහි කබලීකාරාහාර යනු බත් කැඳ ආදි බොජුන්හි ඕජස යි. මෙයින් සිරුරේ පෘථිවි අප් තේජස් වායු වර්ණ ගන්ධ රස ඕජස් යන, වෙන් වෙන් කොට ලිහිය නො හැකි සේ එකට පවත්නා අටින් යුත් රූප (=ඕජට්ඨමකරූප) නිපදී. ඒ රූප ආහරණය කරන බැවින් හෙවත් ගෙනැ ඒම (ඉපැදවීම) කරන බැවින් බොජුන්වලට ආහාර යන නම යෙදේ. ස්පර්ශාහාර නම්: වෙදනාවන් හට ගන්නට ප්‍රත්‍යය (උපකාර) වූ ස්පර්ශය යි. ඇස් කන් නාස ආදීනට රූප ශබ්ද ගන්ධාදිය හමුවීමේ දී සිතැ ඒ අරමුණු හා හැපීම මෙහි ස්පර්ශ නම්. ඒ හැපීමෙන් සැප වූ හෝ දුක් වූ හෝ මැදහත් වූ හෝ වේදනා උපදී. මෙසේ වෙදනාවන් සිතැ පහළ වන්නට උපකාර වනුයේ ස්පර්ශය යි. පටිච්චසමුප්පාදයෙහි "ඵස්සපච්චයා වෙදනා" යි දැක්වුණේ ද ස්පර්ශාහාරයෙන් වේදනා ඇති වන බව යි. මෙසේ ස්පර්ශාහාර යනු වෙදනාවන් උපදවන ස්පර්ශචෛතසිකය යි.

**මනොසංචෙතනාහාර** යනු: ලෞකිකකුශලාකුශල චෙතනා යි. පටිච්චසමුප්පාදයෙහි සංඛාරපච්චය යැ යි දැක්වුණේ ද මේ මැ යි. තුන් භවයෙහි ප්‍රතිසන්ධිවිඥානය උපදවන ඔවුනට ආහාර යන නම යෙදේ. "සංඛාරපච්චයා විඤ්ඤාණං" යි දැක්වුණේ මේ ලෞකික කුශලාකුශලචෙතනාහෙතුයෙන් භවයෙහි ප්‍රතිසන්ධි විඥානය ඇති වන බව යි.

**විඤ්ඤාණාහාර** නම්: ප්‍රතිසන්ධිවිඥානය යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූප දෙක ඇති වන්නට ප්‍රත්‍යය වන බැවින් ඒ ආහාර නම් වී. පටිච්චසමුප්පාදයෙහි 'විඤ්ඤාණපච්චයා නාම රූපං" යි දැක්වුණේ මේ විඤ්ඤාණාහාරයෙන් නාමරූප වන බව යි.

**නාමඤ්ච රූපඤ්ච (නම් රූ දෙක)— නාම** යනු චිත්තචෛතසික දෙදෙනා යි. අරමුණට නැමෙන්නෝ ය යන අරුතින් මොහු නාම නම්හ. **රූප** යනු පඨවි ආදී භූතරූප සතරත් ඔවුන්ගේ උපාදායරූප සූවිස්සත් ය. ශීතොෂ්ණාදියෙන් පෙරළෙන්නෝ ය යන තේරුම උඩ මොවුනට රූප යැ යි නම් වේ.

**වෙදනා** නම්: අරමුණු රස විඳුනා (සිතෙහි වූ) සවභාවයෝ යි. ඔහු සුඛවෙදනා දුඃඛවෙදනා උපෙක්ෂා-(මධ්‍යස්ථ) වෙදනා යැ යි ත්‍රිවිධ යි.

**චත්තාරි අරියසච්චානි— ආර්යසත්‍යය** යනු දුක, දුක් හෙතුව, නිවන, නිවන් මග යන සතර යි.

**උපාදානක්ඛන්ධා (උපාදානස්කන්ධ)**—තෘෂ්ණා දෘෂ්ටිදෙකින් තදින් ගැන්ම උපාදාන නම්. එයට ගොදුරු වූ රූපාදී රාශි පස උපාදානස්කන්ධ පස නම්. ඔහු නම් රූප වෙදනා සංඥා සංස්කාර විඥාන යි. රූපස්කන්ධ නම්: පඨවි ආදී

**4.**

රූප රැස යි. වේදනාස්කන්ධ නම්: සිතෙහි වන සැපවිඳුම් දුක්විඳුම් මැදහත්විඳුම් රැස යි. සංඥාස්කන්ධ නම්: ඒ ඒ අරමුණු ඇඳුනුම් රැස යි. සංස්කාරස්කන්ධ නම්: වේදනා සංඥා හැර ඉතිරි පණස් චෛතසික යි. විඥානස්කන්ධ නම්: සිත් රැස යි. මෙයින් වේදනා සංඥා සංස්කාර විඥාන යන සතර නාම නම්. රූපස්කන්ධය රූප නම්. ස්කන්ධ පසකට බෙදෙනුයේ ද නාමරූප දෙක ම ය.

**අජ්ඣත්තිකානි ආයතනානි (ආධ්‍යාත්මික ආයතන)**— තමා කෙරෙහි වූ චක්ෂුඃප්‍රසාද ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිහ්වාප්‍රසාද කායප්‍රසාද මනස යන සයයි.

**බොජ්ඣඞ්ගා (බොධ්‍යංග)** — සතර මාර්ගඥානය බොධි නම්. එය පිණිස පවත්නා, ඒ බොධියට අවයව වූ, සති ධම්මවිචය විරිය පීති පස්සද්ධි සමාධි උපෙක්ඛා යන දහම් සත බොධ්‍යංග නම්.

**අරියො අට්ඨඞ්ගිකො මග්ගො (ආර්ය අෂ්ටාංගිකමාර්ග)** නම්: අංග අට ම වූ උතුම් මඟ යි. සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යනු එ අංග අට යි. මේ නිවන් ලබන එක ම මාර්ග යි.

**නව සත්තාවාසා (සත්ත්වාවාස නව ය)**— **සත්ත්වාවාස** නම් නවවිධ සත්ත්වයෝ යි. නානත්තකාය නානත්තසඤ්ඤී (=සිරුරින් ද ප්‍රතිසන්ධි සිතින් ද වෙනස් සත්හු), නානත්තකාය එකත්තසඤ්ඤී (=සිරුරෙන් වෙනස් වූ ප්‍රතිසන්ධි සිතින් එක සම වූ සත්හු), එකත්තකාය නානත්තසඤ්ඤී (=සිරිරින් එක්සම ප්‍රතිසන්ධි සිතින් වෙනස් වූ සත්හු), එකත්තකාය එකත්තසඤ්ඤී (=සිරුරිනුත් ප්‍රතිසන්ධිසිතිනුත් එක්සම සත්හු) අසඤ්ඤී (=සිත් නැති රූපය පමණක් ඇති සත්හු), ආකාසානඤ්චායතනූපග, විඤ්ඤාණඤ්චායතනූපග, ආකිඤ්චඤ්ඤායතනූපග, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග යනු ඒ නවභෙදය යි. මෙයින් මිනිස්සු ද සමහර දෙවියෝ ද විනිපාතිකයෝ ද නානත්තකාය නානත්තසඤ්ඤීහු වෙති. ඒ මිනිස් ආදීහු උනුනට රූපයෙන් වෙනස්හ. ඔවුන්ගේ ප්‍රතිසන්ධිවිඥානයෝ ද ද්විහෙතුක ත්‍රිහෙතුකාදි වශයෙන් නානාවිධයහ. බ්‍රහ්මපාරිෂද්‍ය, බ්‍රහ්මපුරෝහිත මහාබ්‍රහ්ම යන ප්‍රථමධ්‍යානික තුන්බඹතෙලෙහි උපන් බඹුහු ද අපායයෙහි උපන්නෝ ද නානත්තකාය එකත්තසඤ්ඤී නම් වෙති. එකී තුන් බඹතල වැසියෝ සිරිරින් සම නොවෙති. එහෙත් ප්‍රථමධ්‍යානවිපාක සිතින් උපන්නත් බැවින් ප්‍රතිසන්ධි සංඥායෙන් සම වෙති. අපායවල සත්හු කයින් උනුනට වෙනස් වූවෝ නමුදු එක ම අකුශලවිපාකාහෙතුක ප්‍රතිසන්ධි සිතින් උපන් බැවින් සංඥායෙන් සම වෙති. පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්හ යන ත්‍රිවිධ තෘතීයධ්‍යාන බඹලෝවැසි දෙවියෝ එකත්තකාය එකත්තසඤ්ඤීහු ය. ඔහු කයින් එක්සමයහ. ධතුර්ධ්‍යාන විපාක සිතින් ම එහි ඊපදනාහු ය. එ බැවින් සංඥායෙන් ද එක්සමයහ.

**දසහඞ්ගෙහි සමන්නාගතො අරහා**— **අංග දශයෙන්** යුක්තවූ රහත් තෙමේ ය. රහත්හුගේ **දස අංග නම්:** අසෙඛ සම්මාදිට්ඨි, අසෙඛ සම්මාසංකප්ප, අසෙඛ සම්මාවාචා, අසෙඛ සම්මාකම්මන්ත, අසෙඛ සම්මාආජීව, අසෙඛ සම්මාවායාම, අසෙඛ සම්මාසති, අසෙඛ සම්මාසමාධි, අසෙඛ සම්මාඤාණ, අසෙඛ සම්මාවිමුත්ති යන දශය යි. සීල සමාධි ප්‍රඥා යන ශික්‍ෂා තුනින් කිසිත් තව දුරටත් ඉදිරියෙහි පුරන්නට නැති හෙවත් පරිපූර්ණ ත්‍රිශික්‍ෂා ඇත්තේ අසෙඛ (අශෛක්‍ෂ) නම්. රහත් පලය ලද්දහුට ම අසෙඛ යන නම වැහැරේ. ඒ රහත්හු තුළ වූ පරිපූර්ණ වූ සම්‍යග්දෘෂ්ටි ආදි අංග ම මෙහි රහත්හුගේ දශාංග නමින් දක්විණි.

6

## මඞ්ගලසුත්ත:

**මඞ්ගල** නම් කිම් දැ?යි පැනයෙක් මිනිසුන් අතර පැන නැගිණ. කෙනෙක් දුටු ශුභ දෑ, මඟුලැයි ද, ඇතැම් කෙනෙක් ඇසූ ශුභ වචන මඟුලැයි ද, අන් කෙනෙක් සුවඳ, මිහිර රස, කයට වැදුණු ප්‍රිය දෑ මඟුලැයි ද කීහු. දෙවියන් කරා ද මේ මඞ්ගලප්‍රශ්නය නැඟී ගියේ ය. දෙවියෝ සක්දෙවිඳු අතින් විචාළහ. හේ බුදුරජුන් කරා අවුත් මෙය දැන ගන්නට දෙවියකු මෙහෙයී. ඒ දෙව් එක් මැදුම් රැයෙක දෙව්රම් වෙහෙර වැඩ බුදුරජුන්ගෙන් එය ඇසී. බුදුරජහු මේ දෙතිස් මංගල කරුණු වදාළහ.

**සොත්ථාන**: (සවස්ථභාවය) යනු මෙලොව පරලොව දෙක්හි ම **යහපත** ය. **මඞ්ගල** (මඟුල) යනු අභිවෘද්ධිය **සිදු කරන දෑ**, දියුණුව සලසන දෑ ය.

**බ්‍රහ්මචරිය:** (බඹසර) යනු ශ්‍රේෂ්ඨ හැසිරීම, ශ්‍රේෂ්ඨ ක්‍රියාව, මෛථුන්දමින් වැළැක්ම, මහණකම, සස්න, අෂ්ටාංගික ආර්‍ය මාර්ගය යන මේ හැම ඒ ඒ තැන බ්‍රහ්මචර්‍ය යන්නෙන් පෙළෙහි දැක්විණ. මෙතන්හි මෛථුන්දමින් වැළැක්ම, මහණදම් පිරීම, ශාසනය යන තුන ම බ්‍රහ්මචර්‍ය යන්නෙන් ගැනේ.

**ලොකධම්ම - ලෝ දහම් නම්**: ලාභ අලාභ අයශස් යශස් නින්දා ප්‍රශංසා සුඛ දුඃඛ යන (ලොවැ ඇති තාක් ම නොනවත්නා දෑ) අට යි.

ලාභාදියෙන් රහත්හුගේ සිත සතුටු හෝ නො සතුටු බවෙක් හෙවත් ඒ ඒ අතට කම්පායෙක්, සැලීමෙක් නො වේ. කිසිවෙකිනුත් නොසැලෙන ලොකොත්තර බව ඇති කරන හෙයින් රහත්හුගේ ඒ අචල සිත මඞ්ගලකාරණයෙකි. ශොක නැති බව, කෙලෙස්දූලි නැති බව, කාමයොගාදියෙන් නිරුපද්‍රැත බව යනු රහත්හුගේ සිතේ ලක්ෂණ යි. ඒ එක එක ලක්ෂණයක් මඞ්ගලකාරණ බැවින් ශොක නැති සිත යන ආදිය වෙන වෙන ම මඞ්ගල සේ දැක්විණ.

8

## රතනසුත්ත:

පෙර **විසල්පුරැ** රොග අමනුෂ්‍ය දුර්භික්ෂ යන තුනින් උවදුරු ඇති විය. ලිච්ඡවි රජුන්ගේ අයදීමින් බුදුරජුහු සංඝයා හා එහි වැඩියහ. වැඩ, නුවර-දොරැ සිට අනඳතෙරුන් අමතා '**මේ සූත්‍රය** උගෙන ලිච්ඡවි කුමාරයන් හා නුවර හාත්පස මැ හැවිදැ මෙයින් පිරිත් කරවු' යි වදාළහ. එ තෙරහු ද බුද්ධපාත්‍රයෙන් පැන් ගෙන ඉසිමින් පිරිත් බෙණෙමින් මුළු නුවරැ ඇවිද්දහ. අමනුෂ්‍යාදි සියලු උවදුරු දුරු විය.

**ඛයං විරාගං** - මේ සතර වන ගයින් නිර්වාණ ධර්මරත්නයේ අගය දැක්විණි.

**යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී** - මේ පස්වන ගයින් ශ්‍රොත ආපත්ත්‍යාදි සතර මාර්ග **රත්න** වන බව දැක්විණ

10

**යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා** - ශ්‍රොතාපත්තිමාර්ගස්ථ, ශ්‍රොතාපත්ති-ඵලස්ථ යන දෙදෙන එක් යුගයෙකි. සකෘදාගාමිමාර්ගස්ථ සකෘදාගාමිඵලස්ථ යන දෙදෙන එක් යුගයෙකි. අනාගාමිමාර්ගස්ථ අනාගාමිඵලස්ථ යන දෙදෙන එක් යුගයෙකි. අර්හත්තමාර්ගස්ථ අර්හත්ඵලස්ථ දෙදෙන එක් යුගයෙකි. මෙසේ යුග සතරෙකි. පුද්ගලයන් වශයෙන් අට දෙනෙකි.

**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන**— මේ ගයින් අර්හත් සංඝයාගේ රත්නභාවය දැක්විණි.

**යථින්දඛීලො**— නුවර දොර රඳවාලන්නට එළිපතට ඇතුළු පැත්තෙන් අට අතක් හෝ දස අතක් පොළොව කැනැ ගසන ලද හරදඬුමුවා ටැඹ **ඉන්ද්‍රඛීල** නම්. ගෙහි දොරසැඩැ සවි කරන ගල්පුවරුව ද ඉන්ද්‍රඛීල නම්.

මේ 8, 9, 10, 11 වන ගයින් ශ්‍රොතආපන්න සංඝයාගේ රත්නභාවය කියැවිණ.

**11**

**කිඤ්චාපි සො කම්මං කරොති පාපකං**— සෝවන් වූ මහණහු ලොකවද්‍ය ඇවැතකට කිසි සේත් නො පැමිණෙති. ප්‍රඥප්තිවද්‍ය ඇවැත්වලට නම් නො දැනැ අවදිති. කායද්වාරයෙන් කුටිකාර සහශය්‍යා ආදි ඇවැත්වලට ද, වචනයෙන් සංචරිත්ත පදසොධම්මවාචන ආදි ඇවැත්වලට ද සිතින් කිසි අරමුණෙකැ ලොභ හෝ ද්වෙෂ ඉපිදවීම, රන් රිදී ආදිය ඉවැසීම, ප්‍රත්‍යය පරිභොගයෙහි නො පස්විකීම යන ආදි ලාමක දෑ කරති. එහෙත් ඒ වරද්‍ද සි දත් කෙණෙහි ම එය දන්වා එයට පිළියම් කෙරෙති ආයතිසංවරයෙහි පිහිටති

**14**

**යානීධ භූතානි** ... **තථාගතං**- ලොවට හිතැගියන් ඉයැ යුතු පරිදි ආ හෙයින් ද, යැ යුතු පරිදි ගිය හෙයින් ද, ඔවුන් විසින් දතයුතු වූ පරිදි ම දන්නා හෙයින් ද, ඇත්ත ම කියන හෙයින් ද, බුදුරජ **තථාගත** නම්.

එකට බැඳුණු ශමථවිදර්ශනා දෙකේ බලයෙන් යැ යුතු යම්සේ ද, එසේ ම කෙලෙස් නසමින් ගිය හෙයින් සෝවාන් ආදි චතුර්විධ ආර්‍යමාර්ගය තථාගත නම් වී. තථාගත යන්නෙහි පදගතාර්ථය නම් 'එසේ ගිය' යනු යි. නිර්වාණය වනාහි යම්සේ නිසි පරිදි පිළිවිදින ලද්දේ ම සියලු දුක් නසා ද, එසේ ම බුද්ධාදීන් විසින් එය අවබොධ කරන ලදී මෙහි ඒ නිසි පරිදි ම අවබොධ කරන ලද යන අරුතින් නිවන ද තථාගත නම්.

තමහට හිත පිණිස පිළිපන්නන් විසින් යම්සේ යැ යුතු ද එසේ ම ඒ ඒ සෝවන් ආදි මඟින් ගියේ නු සි ආර්‍යසංඝයා ද තථාගත නම්. මෙහි තථාගත යනු 'එසේ ගිය' යන අරුතැ වෙයි.

**14**

# තිරොකුඩ්ඩසුත්ත:

බොහෝ පෙර සංඝයාට වෙන් කළ දෑය කා වැනැසූ ජන කෙනෙක් මැරී නිරයැ ඉපිද දුක් විඳැ මෙසේ නිරයෙන් නිරයට ගොස් ඉක්බිති ප්‍රෙත වැ ඉපිද බෝ කලක් දුක් වින්දහ. අප බුදුරජුන් බුදු වැ දම්සක් පවත්වා ක්‍රමයෙන් රජගහ පුර වැඩැ **බිම්බිසාර** රජු සහිත පිරිසට දම් දෙසා, ඔවුන් සෝවන් පෙළෙහි පිහිටුවා ලූ දිනට දෙවෙනි ද, එ රජ බුද්ධප්‍රමුඛ සංඝයාට මහ දන් දුන එහෙත් යට කී පූර්වජාතියෙකැ ඥාති වූ ප්‍රෙතයනට පින් අනුමෝදන් නො කැරැවී ය. එ බැවින් එදා රෑ ඔහු රජගෙහි බිහිසුණු හඬ පැවැත්වූහු රජ පසු දා බුදුරජුනට එය දන්වී බුදුරජුහු එය පින් ගන්නට සැරැසී සිටින ඥාතිප්‍රෙතයන්ගේ හඬ බව වදාරා, දන් දී ඔවුනට පින් අනුමෝදන් කැරැවියැ යුතු සැටි වදළහ. රජ ද එසේ කෙළේ ය. ඒ පින් අනුමෝදන් කැරගත් ප්‍රෙතයනට එකෙණෙහි දිව්‍යාහාර ආදිය පහළ විය. ඉක්බිති රජහට අනුමොදනා බණ වශයෙන් බුදුරජුහු මේ තිරොකුඩ්ඩ සූත්‍රය වදළහ.

14

1. **සන්ධිසිඞ්ඝාටකෙසු. ච—** සන්ධිස්ථාන යනු සතරමංසන්ධි ගෘහසන්ධි භිත්තිසන්ධි කවුළු ආදිය ය.

**සිංඝාටක** යනු තුන්මංසන්ධි ය. නගරද්වාර ගෘහද්වාරයන්හි උළුවහු කණු **ද්වාරබාහා** නම්.

16

12. **ඤාතිධම්ම** නම්: නෑයන් ගේ යුතුකම යි.

16

## නිධිකණ්ඩසුත්ත:

සැවැත්නුවර ධනවත් කෙළෙඹියෙක් දිනෙක බුද්ධප්‍රමුඛ සඞ්ඝයාට දන් දෙයි. එසමයෙහි කොසොල්රජුට ඔහුගෙන් ධනය වුවමනා වී ඔහු කැඳවා යැවී ය. පණිවුඩය ලත් කෙළෙඹි තෙම තමා දෙන දානය සලකා ‘මම් නිධානයක් තැන්පත් කරමින් ඉඳිමි’යි රජුට දන්වා යැවී ය. එද දන් වළඳා අවසනැ බුදුරජුහු ඔහුට අනුමෝදනා වශයෙන් මේ **නිධිකණ්ඩ සූත්‍රය** වදාළහ.

18

6. **යස්ස දානෙන සීලෙන සංයමෙන දමෙන ච: සංයම**- (චිත්තසංයම) යනු මෙ තන්හි **සමාධිය යි.** සිත නානා අරමුණුවලින් වළක්වා ලන හෙයින් සමාධියට මෙ නම යෙදිණ. අන් ඇදුරැ කෙනෙක් ඉන්ද්‍රියසංවරයැ යි අරුත් බිණූහ.

දම යනු ප්‍රඥාව යි. කෙලෙසුන් මැඩැ ලන හෙයින් ප්‍රඥාව ‘දම’ නම් වී.

7. **චෙතියම්හි ච සඞ්ඝෙ වා**(චෛත්‍යය කෙරෙහි ද සඞ්ඝයා කෙරෙහි ද)— මෙහි **චෛත්‍ය** යනු ‘චයිතබ්බන්ති චෙතියං පූජෙතබ්බන්ති වුත්තං හොති’ යන අටුවා පාඨය පරිදි පිදියැ යුතු වස්තුව චෛත්‍ය නම්. ඒ ද පරිභොග චෛත්‍ය උද්දිස්සක චෛත්‍ය ධාතුචෛත්‍ය යී තුන්වැදෑරුම්. “තත්‍ථ බොධිරුක්ඛො පරිභොගචෙතියං, බුද්ධපටිමා උද්දිස්සකචෙතියං, ධාතුගබ්භථූපා සධාතුකා ධාතුචෙතියං” යන අටුවා පාඨයෙන් දැක්වෙන පරිදි බෝරුක පරිභොගචෛත්‍ය නම්. බුදුපිළිමය උද්දිස්සක චෛත්‍ය නම්. ධාතු සහිත ස්තූප (දාගැප්) ධාතුචෛත්‍ය නම්. උද්දෙසිකචෛත්‍යය ගැන ජාතක අටුවාවේ “උද්දෙසිකං අවත්‍ථුකං මමායනමත්තමෙව හොති”යි දැක්වේ. මේය මූල සඳහන් අටුවා පාඨය හා ගැළැපේ ද? මෙහි නිසි අර්ථය දත් කල්හි පාඨ දෙකින් ම කියේ එකක් බව දැනෙයි. පසු වැ දැක්වූ ජාතක අටුවා පාඨයේ තේරුම “උද්දෙසික චෛත්‍යය” නම් ඇතුළතැ පූජ්‍යවස්තු (ශාරීරික ධාතු) නැති මාගේ බුදුරජුන් වෙනුවෙන් කළ දෑයෙකැයි මමායනයට ප්‍රමාණ වූ එකෙක” යනු යි. ඇතැම්හු මේ පාඨයෙන් “මමායනමත්තං” යන්න “වස්තුවෙක් නො වේ. හුදු මමායන මාත්‍රයෙකැ” යි කියති. ‘අවත්‍ථුකං’ යනු “නත්‍ථි වත්‍ථු එතස්මින්ති අවත්‍ථුකං” (මෙහි ඇතුළැ වස්තුවෙක් නැත්නුයි මේ අවස්තුක නම් වේ) යී විග්‍රහ නයින් දැනෙන බැවින් ‘අවත්‍ථුකං’ යනු වස්තුවක් නොවන්නකි යනු නොව ‘තමා තුළ වස්තුවක් නැති එකක’ යන අර්ථය ලැබේ. එසේ ම ‘මමායනමත්තං’ යනු ද ‘මමායනයට ප්‍රමාණ වූ’ යන අරුත් දෙයි. මමායනය චෛත්‍යයෙකැ යි ගත නො හැකි ය. එය චිත්තස්වභාවයක් පමණෙකි. තව ද දක්ඛිණා විභඞ්ගසූත්‍ර අටුවායෙහි ‘තථාගතෙ පරිනිබ්බුතෙ උභතොසඞ්ඝස්ස පමුඛෙ සධාතුකං බුද්ධපටිමං ආසනෙ ඨපෙත්වා” යන පාඨයෙන් “බුදුරජුන් පිරිනිවි පසු උභතොසඞ්ඝයා ඉදිරියෙහි සධාතුක බුද්ධ ප්‍රතිමාවක් අස්නෙහි තබා” යී දක්වා ඇති පරිදි බුද්ධ ප්‍රතිමාව ඇතුළතැ ධාතුසහිත ව ද කරන බව දැක්වේ.

18

14. **චිත්තසම්පදමාගම්ම ... විජ්ජාවිමුත්තිවසීභාවො ...**

මෙහි **විජ්ජා** යනු පුබ්බේනිවාසානුස්සතිඥානය (පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණ), දිව්‍යචක්ඛුඥානය (දිවැස), ආස්‍රවක්ඛයඥානය සතරමාර්ගසිත්හි වූ ආස්‍රව නසන නුවණ යන ත්‍රිවිද්‍යා යි.

**විමුත්ති** (විමුක්ති) යනු අෂ්ට සමාපත්ති හා නිවන යි. සමවදනට කැමැති විටෙක සමවැදීම් ආදියෙහි හුරු පුරුදු බව එහි වශීභාවය යි.

20

15. **පටිසම්භිදා විමොක්ඛා ච.** මෙහි **විමොක්ඛ** යනු අෂ්ටවිමෝක්ෂ යි.

**අෂ්ටවිමෝක්ෂ**: සිය සිරුරු කෙස් ආදියෙහි කිඳුණු වඩා බාහිර සුවර්ණ හෝ දුර්වර්ණ ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යානසමාපත්ති, සුවර්ණ හෝ දුර්වර්ණ බාහිර පරිකර්ම නිමිත්තයෙන් ලත් ප්‍රතිභාගනිමිත්තයෙහි ඉපැදවූ රූපධ්‍යානසමාපත්ති, බාහිර පිරිසිදු නීලාදිවර්ණයෙහි පිරියම් කොට ලත් අතිපවිත්‍ර ප්‍රතිභාගනිමිත්තයෙහි ඉපැදවූ රූපධ්‍යානසමාපත්ති, ආකාසානඤ්චායතනසමාපත්ති, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති, නිරොධසමාපත්ති යන අට විමෝක්ෂ නම්.

16. **එවං මහිද්ධිකා**- සිවුපිළිසැඹියා ආදිය ලැබීමට මේ පින් උපකාර වේ.

20

## මෙත්තසුත්ත:

බුදුරජුන් සැවැත්නුවර වසන සමයෙහි භික්ෂුහු බොහෝ දෙනෙක් කමටහන් ගෙන හිමවත් පෙදෙස වනයකට වැද එහි මහණදම් කළහ. සිල්වත් භික්ෂූන්ගේ තෙදින් එහි ගස්වල අධිගෘහීත දෙවියනට සිය විමන් හැර බිම බස්නට විය. ඔහු භික්ෂූන් බිය ගන්වා පලවා හරින අදහසින් හොල්මන් කළහ. ඉන් පෙළුණු භික්ෂුහු පෙරළා සැවැත්නුවර ගොස් බුදුරජුනට එපවත් දැන්වූහ. බුදුරජුහු ඔවුනට දෙවියන්ගෙන් ආරක්ෂාව පිණිසත් කම්ස්ථාන පිණිසත් මේ සූත්‍ර වදාළහ

1. **සක්කො උජූ ච සුජූ ච** ... උජු (ඍජු) යනු වක් නො වූ, කායවංක වචීවංක නැති, තමා තුළ නැති ගුණ අනුනට නොපෙන්නන.

**සුජූ** (වඩාත් ඍජු) යනු මායා රැවැටිලි නැති, මනොවංක නැති, තමාට නැති ගුණ ඇත යි අඟවා අන්‍යයන් දුන් දෑ නොපිළිගන්නා.

22

8. **මෙත්තං ච .. මානසං භාවයෙ අපරිමාණං** - **අපරිමාණං** යනු අපරිමාණ සත්ත්වයන් අරමුණු කොට පවත්නා හෙයින් ද එක් සතකු කෙරෙහි වුව ද ප්‍රමාණ (සීමා) නො කොට සියලු දෙනා කෙරෙහි පතුරුවන හෙයින් ද අපරිමාණ වූ මෙත් සිත.

**අසපත්තං** (සතුරන් නැති.)- මෙත් වඩන්නා මිනිස්නට ද, නොමිනිස්නට ද ප්‍රිය වේ. හේ සතුරන් නැත්තෙකි. එබැවින් ඔහුගේ මෛත්‍රිය ද සතුරන් නැති එකෙකැ යි කියන ලදී.

# ධම්මපද උපග්‍රන්ථය

(මෙහි අඞ්කයෝ වර්ගය හා ගාථාව අැඟවීම් පිණිස වෙති.)

**1 — 1**

**මනො** ... අරමුණු දැන ගැනීමට අතිශයින් ඉවහල් වන හෙයින් මන නම්. කාම රූප අරූප ලොකුත්තර භූමි සතරට අයත් සිත යෑ. එද වෙදුට උපන් සිත් වශයෙන් ගණු ලබන්නේ මේ ගයෙහි දෙම්නස් සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තය මැ ලැබෙයි.

**ධම්මා** ... ගුණ දෙසනා පරියත්ති නිස්සත්ත නිජ්ජීව වසයෙන් ධම්ම සතරෙකි. සත්ත්ව පුද්ගල ගති නැති හෙයින් නිස්සත්ත්ව නිර්ජීවාණයෙන් චෛතසිකයෝ ධම්ම වෙති. එයින් කුශලාකුශල චෛතසිකයන් දැක්වෙත තමුදු මෙහි අකුශල චෛතසිකයෝ මැ ගැණෙත්.

**මනොපුබ්බඞ්ගමා** ... සිත නූපන් විට චෛතසිකයන්ගේ උත්පත්තියෙක් නැත. චෛතසිකයන්ගේ උත්පත්තියට සිත පෙරටු වෙයි. කෙසේ ද? බොහෝ දෙනා එකතු ව ගම් පැහැරීම් ආදි කටයුතු කරන විට යමෙක් ඔවුන්හට පෙරටු ව යේ ද, එ මෙන් චෛතසිකයන්හට සිත පෙරටු වෙයි.

**මනොසෙට්ඨා** ... සොරුන්හට සොරදෙටුවා අධිපති වන්නාක් මෙන් චෛතසිකයන්හට සිත අධිපති වෙයි, ශ්‍රේෂ්ඨ වෙයි.

**මනොමයා** ... දැව ආදියෙන් නිපන් බඩු දැවමුවා වූවාක් මෙන් චෛතසිකයෝ සිතෙන් උපදනා බැවින් මනොමය නම් වෙති.

**පදුට්ඨෙන** ... ප්‍රකෘති චිත්තය භවාඞ්ග යෑ. එය පිරිසුදු යෑ. ප්‍රසන්නජලය අමුතුවෙන් එකතු වූ නීලාදිවර්ණය නිසා අපිරිසුදු වන්නාක් මෙන් පිරිසුදු සිත බැහැරින් පැමිණෙන අභිජ්ඣා ආදී දෙෂයන්ගෙන් අපිරිසුදු වෙයි. එසේ කිලිටි සිතින් යුක්ත වූයේ, ද්වාරත්‍රයයෙන් දශඅකුශලකර්ම පිරීමෙන් සිවු අපායෙහි හෝ මිනිසුන් අතර හෝ අඳුරු බවට පැමිණෙයි.

**චක්කං' ව වහතො පදං** ... ගොනු කොතෙක් දවස් රිය ඇද්දේ නමුත් තවතන්නට හෝ හරනට නොහැකියාක් මෙන් දූෂිත සිතින් යුතු වැ ත්‍රිවිධ දුශ්චරිතයන් පුරා සිටි පුද්ගලයා නිරයාදි ඒ ඒ තැන දුසිරිත මුල් කොට පැවැති කායික වූ ද චෛතසික වූ ද දුක ලුහුබඳනේ මැ යෑ.

**1 — 2**

**මනො** ... මෙයින් කාමාවචරාදි චාතුර්භූමක චිත්තය දැක්වෙයි. මෙහි කාමාවචර කුසල් සිත් අට දැක්වෙතත් කථාවස්තුවේ හැටියට සොම්නස්-සහගත ඥානසම්ප්‍රයුක්ත කුශල චිත්තය මැ ලැබෙයි.

**ධම්මා** ... මෙයින් වෙදනාදි සක්ඛන්ධත්‍රයයට අයත් කුශල චෛතසික දැක්වෙයි.

**පුබ්බඞ්ගමා** ... බොහෝ දෙනා එකතු ව භික්සඟනට චීවරාදිය පිදීමෙන් පින්කම් කරන කල ඔවුනට යමකු පෙරටු වන්නාක් මෙන් කුශල චෛතසික-යන්ගේ උත්පත්තියට සොමනස්ස සහගත ඥාණසමපයුත්ත සිත පෙරටු වෙයි.

**මනොසෙට්ඨා** ... සමූහාදීන්හට අධිපති පුරුෂයා **ගණජෙට්ඨ** වන්නාක් මෙන් සමූහයාට ප්‍රධානයා ලෙස සලකන්නා සේ ඒ සිත නූපන් විට චෛතසිකයන් නූපදනා බැවින් ඒ චෛතසිකයනට සිත අධිපති යැ.

**මනොමයා** ... සුවර්ණාදියෙන් නිෂ්පාදිත භාණ්ඩයන් සුවර්ණමය වන්නාක් මෙන් සිතින් උපන් බැවින් මනොමය නම්.

**ඡායා'ව අනපායිනී** ... සෙවණැල්ල ශරීරය පිළිබඳ බැවින් සිරුර යන විට යෙයි, සිටින විට සිටී, හිඳින විට හිඳියි. කිසිසේත් තවතා ලිය නො හැක්ක. එසේ මැ පිවිතුරු සිතින් යුතු වැ දශකුශලකර්මයන් පුරුදු පුහුණු කළ පුද්ගලයාට උපනුපන් තන්හි කායික චෛතසික සැපය විපාක වශයෙන් ලැබේ.

## 1 — 3

**උපනය්හන්ති** ... මෙරමා කළ අනර්ථයක් පිළිබඳ වැ නැවත නැවතත් සිහි කිරීමෙන් උද්ගත වූ ක්‍රොධය සිත්හිලා බැඳගැනීම – දුගඳ හමන කුණු මස් ආදි දෑයක් තණපත් ආදි යමකින් වෙළා තැබීමක් වැනි යැ. කුණු මස් ආදිය එසේ වෙළා තැබීමෙන් දුගඳ වැඩි වන්නාක් මෙන් තමාට කළ අපරාධය නැවත නැවතත් සිහි කිරීමෙන් වෛරය දියුණු වෙයි.

## 1 — 4

**න උපනය්හන්ති** ... මෙරමා කළ අනර්ථයක් සිහි නොකිරීම් ආදි වශයෙන් වරක් උද්ගත වූ වෛරය දර නැති ගින්නක් නිවී යන්නාක් මෙන් සංහිඳෙයි.

**සුභානුපස්සී** යනු ශුභ අරමුණෙහි සිත යොදා වසනුයේ (ස්ත්‍රී පුරුෂ නිමිති හා දත් නිය අත්පා ආදි අනුබ්‍යඤ්ජන ද ශුභ ය යි දක්නේ ද, එය යි.)

**අසංවුත** යනු ඇස කණ ආදි සඳෙරින් සිතට වැදගන්නාවූ ප්‍රියරූපාදි සවැදෑරුම් අරමුණෙහි රාගාදි කෙලෙස් පහළ වන සේ සිහි නැමැති කවුළුවෙන් නොවසා සඳෙර නො රක්නේ ය.

**අමත්තඤ්ඤු** යනු සිවු පසයෙහි පරියෙසනාදි පස්වැදෑරුම් පමණ නොදන්නේ සතර පස් පිඩකට අවකාශ තබා පැන් පියැ යුතු. භාවනාවට සිත මෙහෙයූ භික්ෂුහුගේ සැප විහරණයට එය පමණි එසේ පමණට වඩා බඩ පුරා වළඳන්නේ පමණ නො දනී.

**කුසීත** යනු කාමගුණයන් ගැන සිතීම, මෙරමා නැසේවා යි සිතීම, අනුන්හට අයහපතක් කරන්නට සිතීම– මේ ආදියට වසඟ වැ යහපත් දෑයක් වඩන්නට ව්‍යායාම රහිත වැ විසීම යන මෙයින් යුක්තයා යැ.

**මාර** යනු ගුණධර්මයන් නසන මරණ හෙයින් රාගාදි කෙලශයෝ මැ යැ.

## 1 — 11

**අසාර**... චීවරාදි සිවුපසය හා මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණ මිච්ඡාවිමුත්ති යන දශ මිථ්‍යාත්වය ද එයට උපනිඃශ්‍රය වූ දෙශනා ද යන මොහු යැ.

**සාර**... සම්මාදිට්ඨි ආදි අෂ්ටාඞ්ග හා සම්මාඤාණ සම්මාවිමුත්ති යී කියන ලද දශ සම්‍යක්ත්වය ද තදුපනිඃශ්‍රය වූ ධර්‍මදේශනා ද යන මොහු යැ.

**මිච්ඡාසඞ්කප්ප**... කාමවිතක්ක ව්‍යාපාදවිතක්ක විහිංසාවිතක්ක සඞ්ඛ්‍යාත වරද සහගත කල්පනාවෝ යැ.

## 1 — 12

**සම්මාසඞ්කප්ප**... නෙක්ඛම්මසඞ්කප්ප අව්‍යාපාදසඞ්කප්ප අවිහිංසාසඞ්කප්ප සඞ්ඛ්‍යාත නිවරද කල්පනාවෝ යැ. වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වීමේ කල්පනාව නෙක්ඛම්මසඞ්කප්ප නම්. මෙරමා වැනසේවා යී නො සිතා හැම්දෙන සුවපත් වෙත්වා යී මේ ඈ විසින් මෛත්‍රීසහගත කල්පනාව අව්‍යාපාදසඞ්කප්ප නම්. පරහට වෙහෙස නොකිරීම පිළිබඳ කල්පනාව අවිහිංසාසඞ්කප්ප නම්.

## 1 — 13

**සුභාවිතං**... කුසල් අරමුණෙක සිත පුරුදු පුහුණු කිරීම් සඞ්ඛ්‍යාත භාවනාව ශමථ විදර්ශනා වශයෙන් දෙපරිදි යැ. **ශමථ නම්** නීවරණාදි ක්ලෙශධර්මයන් සංසිඳුවනු පිණිස පඨවිකසිණාදි අටතිස් අරමුණෙන් එක් තැනක සිත රඳවා ගෙන එහි මැ සිත පුරුදු කිරීම යැ. **විදර්ශනා නම්** හෙතුප්‍රත්‍යයයන් නිසා හටගත් සංස්කාරයන් පිළිබඳ වැ අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් නැවත නැවතත් සිත පුරුදු කිරීම යැ.

## 1 — 20

**සුවිමුත්තචිත්තො**... තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ විමුක්තීන්ගේ වශයෙන් කෙලෙසුන් කෙරෙන් මොනවට මිදුනු සිතැත්තේ.

**තදඞ්ගවිමුත්ති** යනු අලොභාදි එක එක කුශලාඞ්ගයෙකින් ලොභාදි අකුශලාඞ්ගයන් දුරු කිරීමෙන් සිත කෙලෙසුන්ගෙන් මිදීම යැ. ප්‍රදීපා–ලොකයෙන් අන්ධකාරය දුරු වන්නාක් මෙනි. එය කාමාවචර යැ.

**වික්ඛම්භනවිමුත්ති** යනු ශමථභාවනායෙන් ධ්‍යාන උපදවා ගෙන කාමරාගාදි කෙලෙස් යටපත් කොට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ධ්‍යානබලය ඇති තෙක් වලකා ලීම ය. ළිඳක දියමත බැඳි දියසෙවෙල් කළය බහා දිය ගන්නා තෙක් ඉවත් වීමක් වැනි යැ. එය ද රූපාවචර හෝ අරූපාවචර යැ.

**සමුච්ඡෙදවිමුත්ති** යනු සෝවාන් ආදි සිවුමඟ නුවණින් ඒ ඒ මඟට අයත් කෙලෙස් මුලුසුන් කොට කෙලෙසුන්ගෙන් සිත මිදීම යැ. හෙණ පහර වන් ගසෙහි මුල් දඬු නොලියලන්නාක් මෙන් මඟ නුවණින් මුලුසුන් කෙලෙස් නැවත නූපදනා හෙයින් ගසකට හෙණ වැදීමක් මෙනි. මේ ලොකොත්තර යැ.

**පටිප්පස්සද්ධිවිමුත්ති** යනු මාර්‍ගයෙන් කෙලෙස් නැසූ සඳ ශෙෂ වන කෙලෙස්විඩාව සංසිඳෙනුයේ ඵල සිතෙනි. එසේ කෙලෙස්විඩායෙන් සිත මිදීම යැ. ගිනි දල්වූ තැනා වූ ගිනිඅඟුරු ඉවත ලූ විට ද එහි රැඳුන උණුසුම් ගතිය දිය ඉසීමෙන් නැති වන්නාක් මෙනි. මේ ද ලොකොත්තර යැ.

**නිස්සරණවිමුත්ති** යනු නිවන් පසක් කිරීමෙන් භවයෙන් මිදීම යැ.

**2 — 3**

**යොග**: සසරෙහි සත්ත්වයන් කම්පල හා යොදන හෙයින් හෝ දුක හා යොදන හෙයින් යොග නම්. කාම භව දිට්ඨි අවිජ්ජා වශයෙන් යොග සතරෙකි. කාමයොග යනු කාමවස්තුවෙහි ඇලීම යැ. භවයොග යනු රූපාරූපභවයන්හි ඇලීම යැ. දිට්ඨියොග යනු දෙසැට මිසදිටු ය. අවිජ්ජා-යොග යනු චතුස්සත්‍යය වසා ලන මොහය යැ.

**2 — 4**

**උට්ඨාන**: මෙලෝ පරලෝ වැඩ සඳහා පවත්නා කටයුත්තෙහි කුසීත වන්නට නොදී කය සිත නැඟිටුවා ලන බලවත් උත්සාහය යැ.

**සති** යනු කුශල චිත්ත වීථියෙහි දී තමන් හා එක් වැ යෙදෙන අවශෙෂ නාම ධර්මයන්ගේ අරමුණු සිහි කරන චෛතසිකයෙකි. මෙය ලක්ෂණ වශයෙන් අපිලාපන උපගණ්හන යි ද්විවිධ යැ. ප්‍රගුණ කළ ධර්මයක් කියන්නාක් මෙන් පෙර කළ කී දෑය පවා සිහි කරන්නී අපිලාපන ලක්ෂණ යැ. සතිය සක්විති රජුගේ භාණ්ඩාගාරිකයා මෙනි. ඔහු දිනපතා උදය සවස 'දෙවයිනි, ඔබගේ ඇත්තු මෙපමණ යැ, අස්හු මෙපමණ යැ, රන් රිදී මුතු මැණික් මෙපමණයැ' යි සිහි කරවන්නාක් මෙන් පෙර කළ කී දෑය හෝ සතිපට්ඨානාදි ධර්මයන් සිහි කරවන හෙයින් අපිලාපන ලක්ෂණයැ. උපගණ්හන ලක්ෂණ යනු මේ දෑය හිතකර යැ, මේ දෑය අහිතකර යැ යනාදීන් අහිතයන් දුරු කොට හිතවත් උපකාරකයන් ළං කොට ගැණීම යැ. රජුට හිතාහිතයන් දැන අහිතයන් දුරු කොට හිතවතුන් ළං කොට ගන්නා සක්විති රජුගේ පරිනායක රත්නය මෙනි.

**නිසම්මකාරී**: 'මෙය කළ විට මෙබඳු යහපතෙක් වෙයි, මෙය කළ විට මෙබඳු අයහපතෙක් වෙයි' සිතා සියලු කටයුතු පිරික්සන සුලු පුද්ගලයා යැ.

**සඤ්ඤත**: ශීලයෙන් කායවාග්ද්වාරයන්ගේ ද සමාධියෙන් මනො-ද්වාරයාගේ ද සංවරයෙහි පිහිටියේ යැ.

**2 — 5**

**දීප** යනු ඉතා ගැඹුරු සංසාරසාගරයට පිවිසියහුට ප්‍රතිෂ්ඨා ස්ථානය වන අර්හත්ඵලය යි.

**ඔඝ**: මහවතුර තමහට විෂය වන හැම තැන් යට කොට හමු වන සියල්ල මුහුදට හැද ගෙන යට ව මැ ගලා යේ ද, එසේ මැ කාමාදි භවත්‍රය යට කොට සත්ත්වයන් සසර සයුරෙහි හෙළමින් අපායාදි පහත් බවට පමුණුවානුයි ඔඝ නම්. කාම භව දිට්ඨි අවිජ්ජා වශයෙන් ඔඝ සතරෙකි. කාම යනු කාමරාගය යැ. භව යනු භවරාගය යැ. දිට්ඨි යනු මිථ්‍යාදෘෂ්ටිය යැ. අවිජ්ජා යනු සිවුසස් නොදන්නා මොහය යැ.

**2 — 11**

**සංයොජන**: නැවත නැවත ඉපදීම් වශයෙන් සත්ත්වයන් සසර බඳනා රැහැනි. කාමභව එකොළොසෙහි උත්පත්තියට හෙතුවන සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, ව්‍යාපාද යන ඔරම්භාගිය සංයොජන

පස ද, රූපාරූපභවයන්හි උපතට හෙතු වන රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගිය සංයොජන පස ද යන මොවුහු දශ සංයොජනයෝ යැ.

**3 — 1**

**චිත්ත**: රූපාදි අරමුණු සිතාතු සි හෝ අරමුණු ගැන සිතීමට උපකාර වේතු සි සිතීම් මාත්‍රය හෝ චිත්ත සි එනම් විඥනය යැ.

**3 — 2**

**මාරධෙය්‍ය**: සසරෙහි උත්පත්තියක් සිදු වීමට හෙතු භූත වන අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන කෙලශ වෘත්තය සි.

**3 — 4**

**සුඛාවහ**: මගසුව පලසුව නිවන්සුව එලවනා.

**3 — 5**

**ගුහාසය** යනු සිත යැ. එය පවත්නේ චක්ෂුරාදි ආයතන ආශ්‍රය කොට ගෙන යැ. සිත ගුහාවක ආසය කෙරේ යි වදාළේ එහෙයිනි.

**3 — 6**

**පඤ්ඤා** යනු කාමාවචර රූපාවචර අරූපාවචර ලොකුත්තර ප්‍රඥ යැ.

**3 — 7**

**ජාගර නම්**: ශ්‍රද්ධා වීර්‍ය සමෘති සමාධි ප්‍රඥ සි.

භය: සෝවන් ආදි ඒ ඒ මගින් සක්කායදිට්ඨි ආදි කෙලෙස්හු මුලුසුන් වත්නාහු නැවත නුපදිත්. රහතුන් වහන්සේට කෙලෙසුන්ගෙන් බියක් නැත්තේ එහෙයිනි.

**3 — 9**

**අපෙතවිඤ්ඤාණ**: පහ ව ගිය විඥනය ඇති. **විඤ්ඤාණ** යනුවෙන් ආයුෂ, කම්මජ තෙජෝධාතුව (සිරුරෙහි උණුසුම), විඥනය (සිත) යන මොවුහු ගැනෙත්. මොවුන් සිරුරෙන් පහ වූ විට මරණය වෙයි.

**මිච්ඡාපණිහිතං**: මෙහි චිත්තය වනාහි දශඅකුශලකම්මපථ සඞ්ඛ්‍යාත වරදෙහි යෙදූ සිත යැ. ඒ සිත මෙලොවැ නින්ද පරිභව – වධ බන්ධනාදියට පමුණුවා පරලොවැ නොයෙක් සිය දහස් ගණන් ජාතීන්හි දී සතර අපායෙහි ලා හිස ඔසවා ගන්නට නො දෙයි.

**3 — 11**

**සම්මාපණිහිතචිත්තය නම්**: දශකුශලකම්පථ සඞ්ඛ්‍යාත සුචරිතයෙහි යෙදූ සිත යැ. ඒ සිත සියලු සම්පත් ලබා දෙන්නට සමර්ථ වෙයි.

## 4 — 1

**විචෙය්‍යසති** යනු: ආත්මභාවාදිය නාමරූප ස්කන්ධ ධාතු ආයතනාදි වශයෙන් හා අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් ද පඤ්චස්කන්ධය බෙදා බලන ඥානයෙන් (විදර්ශනාඥානයෙන්) දැන ගන්නේ ය.

**යමලොක**: සතර අපායයෝ යැ.

**ධම්මපද** යනු: සත්තිස්බොධිපාක්ෂික ධර්මයෝ යැ. සිවුසස් අවබොධ කරන හෙයින් යොගාවචරයාගේ මාර්ගචිත්තොත්පාදය බොධි නම්. එයට පක්ෂපාත ධර්ම වන සතිපට්ඨාන සතර, සම්‍යක්ප්‍රධාන වීර්‍ය සතර, ඍද්ධිපාද සතර, ඉන්ද්‍රිය පස, බල පස, බොධ්‍යඞ්ග සත, මාර්ගාඞ්ග අට යන මොවුහු යැ.

## 4 — 10

**ජාතෙන මච්චෙන**: උපන් මිනිසා වූ කලි අෂ්ට දුෂ්ට ක්ෂණයෙන් මිදී මිනිසත් බව ලද පුද්ගලයා යැ. අෂ්ට දුෂ්ට ක්ෂණ යනු නරක තිර්‍යක් ප්‍රෙත යන අපාය තුන ද, අරූපලොක සතර හා අසංඥතලය ද, ප්‍රත්‍යන්තදෙශය ද, චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන පඤ්චෙන්ද්‍රියයන්ගේ විකල බව ද, දරුණු මිථ්‍යාදෘෂ්ටිය ද, සදහම් අමා දෙන සම්බුදුන්ගේ පහළ නොවීම ද යන මොවුහු පින්කිරියට සුදුසු කල් නො වෙති. එහෙයින් කීහ.

> තයො අපායා ආරුප්පා'සඤ්ඤං පච්චන්තිමම්පි ච
> පඤ්චින්ද්‍රියානං වෙකල්ලං මිච්ඡාදිට්ඨි ච දාරුණා
> අපාතුභාවො බුද්ධස්ස සද්ධම්මාමතදායිනො
> අට්ඨක්ඛණා අසමයා ඉති එතෙ පකාසිතා.

**කුසල**: දාන සීල භාවනාදි පින්කම් කරන්නාහට දානවස්තු ආදිය අරමුණු කොට කුසල්සිත්වල උපදනා චෙතනා චෛතසිකය යැ. ලොභාදි අකුසල් තදඞ්ග වශයෙන් නැසීම කාමාවචර කුසල් සිතෙහි යෙදෙන චෙතනාවෙන් ද, විෂ්කම්භණ වශයෙන් නැසීම රූපාවචර අරූපාවචර ධ්‍යාන සිත්වල යෙදෙන චෙතනාවෙන් ද, සමුච්ඡෙද වශයෙන් නැසීම ලොකොත්තර කුසල් සිත් සතරෙහි යෙදෙන චෙතනාවෙන් ද වෙයි.

## 4 — 13

**දෙවෙසු**: ශීලසුගන්ධය දෙව්ලොවෙහි ද පැතිරෙන්නේය යි වදාළේ දෙවියන් විසිනුදු සිල්වතාගේ ගුණ කියන හෙයිනි.

## 4 — 14

**න වින්දති**: මතු පිළිසඳ නොගන්නා පිරිනිවි රහතුන් වහන්සේ කොහි උපන්නේ දැ'හෝ යි දශ දික්හි මැ සෙවුව ද මරහු විසින් සොයාගත නො හැකි.

## 5 — 1

**දීඝා: ජාගරතො රත්ති**: හිරු උදා වන තෙක් නිදන මහාකුසීතයා හෝ මියුරු බොජුන් වළඳා සිරියහනෙහි හෝනා කාමභොගියා රාත්‍රිය දික්බව නො දනී. මුළු රැය භාවනාවෙහි යෙදෙන යොගාවචරයා ද ධර්මකථිකයා ද

අසුන ළඟ හිඳ බණ අසන උපාසකයා ද ශීර්ෂරෝගාදීන් පෙළෙන්නා ද අත්පාසිඳුම් ආදිය ලද්දේ ද ඉන් බැහැර අන් කිසි වේදනාදියකට ගොදුරු වූයේ ද රාත්‍රියෙහි මගට පිළිපන් මඟියා ද එය දනී.

## 5 — 16

**විවේකය**: කාය චිත්ත උපධි වශයෙන් ත්‍රිවිධ යැ. වෙන් වීම විවේක යැ. පිරිසෙහි ඇලී විසීමෙන් හෝ රූපාදි පඤ්චකාම වස්තුවෙන් වෙන් වීම කාය-විවේක යැ. ක්ලේශසඞ්ගණිකායෙන් පඤ්චනීවරණයන්ගෙන් හෝ ක්ලේශ-කාමයන්ගෙන් වෙන් වීම චිත්තවිවේක යැ. ඛන්ධොපධි කිලෙසොපධි අභි-සංඛාරොපධි යන සියලු උපධීන්ගෙන් වෙන් වූ හෝ වෙන් වීමට ආලම්බන වශයෙන් ප්‍රත්‍යය වන නිර්වාණය උපධිවිවේක යැ

## 6 — 2

**ඔවදෙය්‍යානුසාසෙය්‍ය**: උපන් වරදෙහි හොඳ නොහොඳ කියා දීම අවවාද නම්. වරදක් වන්නට පෙර මතු අපවත් නින්දා පරිභව හටගනු හැකි සී මතුකාලය දක්වමින් වැඩ අවැඩ කියා දීම අනුසාසන නම්. සම්මුඛයෙහි කරුණු කියා පෑම හෝ අවවාද නම්. දූතයකු හෝ හසුනක් යවා අසම්මුඛ-යෙහිදී කටයුතු නොකටයුතු කියා දීම අනුසාසන නම්. වරක් හෝ කීම-අවවාද නම්. නැවත නැවතත් කීම අනුශාසන නම්.

## 6 — 6

**නින්දාපසංසාසු**: මෙහි නින්දාපසංසා යනුවෙන් ලෝකධර්මදෙකක් පමණක් දැක්වුව ද, ලාභ අලාභ අයශ යශ නින්දා පසංසා සුඛ දුක්ඛ යන අෂ්ටලෝක ධර්මයෝ මැ ගැණෙති.

## 6 — 13

**කාම** යනු වස්තුකාම ක්ලේශකාමයෝ යැ. වස්තුකාම යනු කාමරාගයට වස්තු වූ මන වඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ. ක්ලේශකාම යනු මනවඩන රූපාදිය විෂය කොට සිතේ උපදනා ඇලීම යැ.

**චිත්තක්ලේශ** යනු සිත කෙලසන කාමච්ඡන්ද ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන පඤ්ච නීවරණයෝ යැ. කාමච්ඡන්ද යනු කාමවස්තූන්හි ඇලීම යැ. ව්‍යාපාද යනු අන්හු නැසෙත්වා වැනසෙත්වා යනාදීන් පැවැති ද්වේෂ චෛතසික යැ. ථින මිද්ධ යන මෙහි ථින යනු සිතේ ගිලන්බව යැ. මිද්ධ යනු වේදනාදි ස්කන්ධත්‍රය පිළිබඳ චෛතසිකයන්ගේ ගිලන්බව යැ. උද්ධච්චකුක්කුච්චයෙහි උද්ධච්ච යනු සිතේ නොසංහුන් බව යැ. අළු ගොඩකට ගලක් ලූ විට මෙන් නොයෙක් අරමුණුවල විසිර පැතිර පවත්නා බව යැ. කුක්කුච්ච යනු මම අකුසල් කෙළෙමි, කුසල් නො කෙළෙමි යනාදි වශයෙන් පසුතැවීම යැ. විචිකිච්ඡා යනු බුද්ධාදි අට තන්හි පවත්නා සැකය යැ.

## 6 — 14

**සම්බොජ්ඣඞ්ග**: සිවු සස් අවබෝධ කරන පුද්ගලයා හෝ අවබෝධ කිරීමට උපකාර වූ ධර්මසමූහය හෝ බෝධි නම්. නිවන් පසක් කරන පුද්ගලයාහට උපකාර වන හෙයින් හෝ ඒ ධර්ම සමූහය පිළිබඳ අවයව නුයි බොධ්‍යඞ්ග නම් ඔවුහු නම්: සති ධම්මවිචය විරිය පීති පස්සද්ධි සමාධි උපෙක්ඛා යන ධර්මයෝ යැ.

**ආදාන පටිනිස්සග්ග.**: මම යැ මාගේ ය යි ගැනීම ආදාන නම්. නිර්වාණය එයට ප්‍රතිපක්ෂ බැවින් ආදානපටිනිස්සග්ග නම්.

**පරිනිබ්බුතා**: රහත්හු රහත් වූ තැන් පටන් කෙලෙස්වට ගෙවූ බැවින් සොපදිශෙෂ නිර්වාණයෙන් ද චරිමචිත්තනිරොධයෙන් ස්කන්ධ-වෘත්තය ක්ෂය කළ හෙයින් අනුපදිශෙෂ නිර්වාණයෙන් ද යන ද්විවිධ නිර්වාණයෙන් පිරිනිවියාහු යැ.

7 — 1

**සබ්බ ගන්ථ**: නාම කය හා රූප කය හෝ වර්තමාන කය හා අනාගත කය නොමිදියැ හැකි සේ ගැටලන් නුයි, වෙළුන් නුයි, කායග්‍රන්ථ නම්. අභිධ්‍යා ව්‍යාපාද ශීලව්‍රතපරාමර්ශ ඉදංසත්‍යාභිනිවෙශ වශයෙන් ග්‍රන්ථයෝ සිවු වැදෑරුම් යැ. අභිධ්‍යා යනු අන් සතු දෑය ගැන පවත්නා දැඩි ඇලීම යැ. ව්‍යාපාද යනු අන්හු නැසෙත්වා යනාදීන් ද්වෙෂ සහගත සිතිවිල්ල යැ. ශීලව්‍රතපරාමර්ශ යනු ගොශීල ගොව්‍රතාදියෙන් සංසාර ශුද්ධිය වේ යැ යි විපරීත සැලකීම යැ. ඉදංසත්‍යාභිනිවෙශ යනු සත්‍යය නම් මෙය මැ යැ, මෙයින් අන්‍ය වූයේ සත්‍යයෙන් බැහැර යැ යි සිතින් දැඩි සේ ගැනීම යැ.

**පරිළාහ** රහතුන්හට ශීතොෂ්ණාදි වශයෙන් උපදනා කායික පරි-දාහය ඇතද්‍ පරමාර්ථ වශයෙන් කයේ හෝ සිතේ දාහයෙක් (දැවීමෙක්) නැත

7 — 4

**ආසව**: චක්ෂුරාදි සදෙරින් වැගිර පවත්නා හෙයින් ද ඔකාස වශයෙන් භවාග්‍රය දක්වා ද ධර්ම වශයෙන් ගොත්‍රභූ ඥානය දක්වා ද ගලා පවත්නා හෙයින් ද අග් මුල් නැති සසරෙහි අනාදි කාලයක් මුළුල්ලෙහි සිත් සතන් තුළ පැසෙමින් පවත්නා හෙයින් ද ආසව නම්. ඒ කාම භව දෘෂ්ටි අවිද්‍යා වශයෙන් සිවු වැදෑරුම් වෙයි.

7 — 5

**මාන**: තමන් අනුන්හට වඩා උසස් පහත් ආදි වශයෙන් හැඟීම යැ. එය නව විධ යැ, ශ්‍රෙෂ්ඨයාහට වඩා මම ශ්‍රෙෂ්ඨයෙමි. ශ්‍රෙෂ්ඨයාහට සමාන වෙමි, ශ්‍රෙෂ්ඨයාහට හීන වෙමි, සමානයාහට ශ්‍රෙෂ්ඨයෙමි, සමානයාහට සමාන වෙමි, සමානයාහට හීන වෙමි, හීනයාහට ශ්‍රෙෂ්ඨයෙමි, හීනයාහට සමාන වෙමි, හීනයාහට හීන වෙමි යනු යැ.

7 — 9

**රමණීයක**: රහත්හු ගම්හිදී ගණසඞ්ගණිකා ඇති හෙයින් කාය විවෙකය නො ලබතුදු කෙලශසඞ්ගණිකා නැති හෙයින් චිත්තවිවෙකය ලබත්. දිව්‍යරූප බඳු රුව ද උන්වහන්සේගේ සිත සොලවා ලන්නට නො පොහොසති. එහෙයින් ගමෙහි හෝ වෙනෙහි හෝ අන් තැනක හෝ උන් වහන්සේ කෙබඳු තැනක වුසුව ද එ තැන රමණීයක යැ, සිත්කලු යැ.

## 8 — 14

**උදයව්‍යය**: උදය යනු පඤ්චස්කන්ධයාගේ හටගැන්ම යැ. ව්‍යය යනු පඤ්චස්කන්ධයාගේ නිරෝධය යැ, සංසිඳීම යැ. "අවිජ්ජාසමුදයා රූපසමුදයො, තණ්හාසමුදයා රූපසමුදයො, කම්මසමුදයා රූපසමුදයො, ආහාරසමුදයා රූපසමුදයො, නිබ්බත්තිලක්ඛණං රූපසමුදයො"යි මේ නයින් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ආහාර - නිබ්බත්තිලක්ඛණ වශයෙන් පස්විසි අයුරකින් පඤ්චස්කන්ධයාගේ හටගැනීම ද, "අවිජ්ජානිරොධා රූපනිරොධො" යනාදි පස්විසි අයුරකින් පඤ්චස්කන්ධයාගේ නිරෝධය ද වෙයි.

## 8 — 15

**අමතපද**: මාර්ග ඵල ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ගැන්මෙන් මරණින් මිදීමට කාරණ වන හෙයින් ද මරණය නැති කොටස යන අර්ථයෙන් ද අමත පද නම්.

## 8 — 16

**ධම්ම** යනු සතර මග සතර ඵල නිවන් යන නවලෝකෝත්තර ධර්මයෝ යැ.

## 9 — 6

**පාප**: පුද්ගලයා පහත් බවට හෝ දුගතියට පමුණුවා නු යි ප්‍රාණඝාතාදි දුශ්චරිත පාප නම්.

## 9 — 7

**පුඤ්ඤ**: දානාදි කුශල චේතනාවෝ චිත්තසන්තානය පිවිතුරු කරන හෙයින් පුණ්‍ය නමු.

## 10 — 1

**සබ්බ**: සියල්ලය යි කී නමුදු ක්ෂීණාස්‍රවයෝ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ කළ හෙයින් මරණයට බිය නො වෙති. කෙශරසිංහාදීහු සත්කායදෘෂ්ටිය බලවත් හෙයින් බිය නො වෙති.

## 10 — 14

**සම**: කායවිෂමාදියෙන් තොර වීම යැ. කායවිෂමාදිය නම් කායාදි ද්වාරත්‍රයයෙන් කැරෙන ප්‍රාණවධාදි දුශ්චරිතයෝ යැ.

## 10 — 16

**සද්ධා**: උදකප්‍රසාදක මාණික්‍යයක් මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රසන්න කරන හෙයින් ශ්‍රද්ධා නම්. ඒ ලෞකික ලෝකෝත්තර වශයෙන් ද්විවිධ යැ. මාර්ගඵල සිත්වල යෙදෙන ශ්‍රද්ධා චෛතසික ය නිවන් අරමුණෙහි සිත පහදවන හෙයින් ලොකුත්තර යැ. ලෞකික කුසල් සිත්වල යෙදෙන්නේ තුනුරුවන් ගුණ ආදියෙහි සිත පහදවන්නේ ලෞකික යැ.

**සීල:** සතුන් මැරීම් ආදියෙන් තොර වැ වත් පිළිවෙත් පුරන්නහුට ඇති වන චේතනාදි ධර්මයෝ යෑ. චේතනා චෛතසික සංවර අවීතික්කම වශයෙන් සීලය සිවු වැදෑරුම් යෑ. චේතනාසීල යනු ප්‍රාණවධාදියෙන් වළකින්නහුට හෝ වත් පිළිවෙත් පුරන්නහුට හට ගැනෙන චේතනාව යෑ. චෛතසිකසීල යනු ප්‍රාණඝාතාදියෙන් වළක්නහුගේ එයින් යම් වැළැකී-මෙක් වේ නම් එය යෑ. සංවරසීලය යනු වැරදි කරුණුවලින් වැළකීම් සවභාවය යෑ. සංවරසීලය පාතිමොක්ඛ සති ඤාණ ඛන්ති විරිය වශයෙන් පස් අයුරු යෑ. අවීතික්කමසීලය යනු සමාදන් වූ සිල් ඇතියහුගේ කායික වාචසික අව්‍යතික්‍රමය යෑ.

**විරිය:** විධි වශයෙන් පැවැත්විය යුත්තේ වීර්‍ය යෑ. භාරොඋවහනයෙහි ධුර වෘෂභයා මෙන් කුශල ධර්මයන් මතා කොට ප්‍රයොග කරවීමෙහි ලා ගැණෙන උත්සාහ යෑ. වීර්‍යය සිවු වැදෑරුම් වේ. නූපන් අකුසල් නොඉපදීම සඳහා - උපන් අකුසල් ප්‍රහාණය සඳහා - නූපන් කුසල් ඉපදවීම සඳහා - උපන් කුසල් පරිපූරණය සඳහා කරන ව්‍යායාම යෑ.

**සමාධි:** චිත්ත චෛතසික ධර්මයන් මොනවට එක අරමුණක පිහිටුවන බැවින් සමාධි නම්. උපචාර අර්පණා වශයෙන් ද්විවිධ යෑ.

**ධම්මවිනිච්ඡය** යනු කටයුතු නොකටයුතු සදෙස් නිදෙස් කාරණ අකාරණ දනුම් ලකුණු කොට ඇති විදර්ශනාඥානය යෑ.

**විජ්ජාචරණ:** ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයෝ යෑ. ත්‍රිවිද්‍යා යනු පෙර වුසූ කඳ පිළිවෙළ දක්නා නුවණ යෑ, සත්ත්වයන්ගේ උපපත්ති මරණ දක්නා නුවණ යෑ, ආස්‍රවයන් ක්ෂය කරන රහත් මඟ නුවණ යෑ අෂ්ට විද්‍යා යනු විදර්ශනාඥානය, මනොමයර්ද්ධි ඥානය, ඍද්ධිවිධ ඥානය, දිව්‍යශ්‍රොත්‍ර ඥානය, පරචිත්තවිජානන ඥානය, පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, ආස්‍රවක්ෂයකර ඥානය යන අට යෑ. චරණ ධර්ම යනු ප්‍රාතිමොක්ෂ සංවරසීලය, ඉන්ද්‍රියසංවරය, භොජනයෙහි මාත්‍රඥ බව, ජාගර්‍ය්‍යානුයොගය, ශ්‍රද්ධාව, හිරිය, ඔත්තප්පය, බහුශ්‍රැත බව, වීර්‍යය, ස්මෘතිය, ප්‍රඥය, අරූපධ්‍යාන සතර යන මේ පසළොස යෑ.

## 10 — 17

**චිත්තදමන** යනු සියලු කෙලෙසුන් මුලුසුන් කොට රහත් ඵලයට පැමිණීම යෑ.

## 11 — 1

**එකොළොස් ගිනි:** රාග, ද්වෙෂ, මොහ, ව්‍යාධි, ජරා, මරණ, ශොක, පරිදෙව, කායික දුක, සිතේ දුක, දැඩි ආයාසය යන මොවුහු යෑ.

## 11 — 2

**නව මහා ව්‍රණ මුඛ:** මුව, දෙ ඇස්, දෙකන්, දෙ නාසාපුට, මල මූ සිදුරු යන මොවුහු යෑ.

### 11 — 9

**ගෙහ:** පඤ්චස්කන්ධසඞ්ඛ්‍යාත (ආත්මය) ශරීරය ගෘහය යැ. ඒ ගෘහය තනන වඩුවා තෘෂ්ණාව යැ. ඒ ගෙයි කැණිමඬල (මුදුනේ පරාල එකට සම්බන්ධ කරන තැන) අවිද්‍යාව යැ. අවශෙෂ කෙලෙස් පරාල ආදි සෙසු ගෘහොපකරණයෝ යැ.

### 11 — 10

**බ්‍රහ්මචරිය** යනු උතුම් හැසිරීම යැ. බඹුන්ගේ වැනි හැසිරීම යැ. මෙවුන්දමින් වෙන් වීම එක වේලේ වැළඳීම් ආදි මහණදම් පිරීම ය. ලොකොත්තර සීල සමාධි ප්‍රඥාවන්ගෙන් මග බඹසර ද ගැණේ.

### 12 — 1

**අත්තා:** ආත්මය යැ, තමා යැ. මෙය සම්මුති දෙශනා යැ. පරමාර්ථ වශයෙන් පඤ්චස්කන්ධය යැ.

### 12 — 3

**අත්තා** යනු චිත්තය යැ.

### 12 — 6

**අච්චන්තදුස්සීල්‍ය:** උපන් තැන් පටන් දශ අකුශලකර්මපථය පුරන ගිහියා ද උපසපන් දින පටන් ගරුකාපත්තිවලට අවදනා පැවිද්ද ද අත්‍යන්ත දුස්සීලයෝ යැ. උහු නොයෙක් දැහි පුරුදු කොට ආ සදෙර උපන් තෘෂ්ණාව යි කියන ලද ඒ දුශ්ශීල භාවය, සල් රුක වැලඳ සිටි මාලුවා ලිය, වැසි වස්නා කල ගොටු සේ උඩ බලා සිටි මාලුවා පත් පුරා ගත් දිය බරින් ඒ සල් රුක බිඳ සුණු විසුණු කරන්නාක් මෙන්, දුශ්ශීල පුද්ගලයා සුගතියෙන් පහ කොට සතර අපායෙහි හෙළා සතුරකු මෙන් අනර්ථයක් මැ සිදු කරන්නේ යැ.

### 12 — 10

**සදත්ථ** යනු අර්හත්ඵලය යි එය සාත් කර ගැණීමට ව්‍යායාම කරන මහණහු විසින් සෑ පිළිසකර කිරීම් ආදිය ද ආවාසි වත් උපාධ්‍යාය වත් ආගන්තුක වත් ගිලන් වත් ආදි වත් පිළිවෙත් ද නො පිරිහෙළියැ යුතු. ආභිසමාචාරික වත් පිරීම ද මාර්ගඵලාධිගමයට හෙතු යැ. ආභිසමාචාරික (යහපත් හැසිරීම) වත් පිරීම ද ආත්මාර්ථය මැ යැ. ආභිසමාචාරික වත් නොපුරා ආදිබ්‍රහ්මචරියක වත් පිරීමෙක් නැත. ආභිසමාචාරික වත් පුරණ මහණ තෙම ආර්යඵලාදියට පැමිණෙන්නේ ය.

### 13 — 1

**මිථ්‍යාදිට්ඨි** යනු නැණැතියන් නින්දා කළ ශාශ්වත උච්ඡේද යන ද්විවිධ ලාමක ධර්මයෝ යැ. ඔහු කෙවලසස්සත එකච්චසස්සත අන්තානන්තික අමරාවික්ඛෙපික යන වාද සතර බැගින් ගෙන සොළොසෙක, අධිච්චසමුප්පන්න වාද දෙකෙක, සඤ්ඤීවාද සොළොසෙක, අසඤ්ඤීවාද අටෙක, නෙවසඤ්ඤීනාසඤ්ඤී වාද අටෙක, දිට්ඨධම්මනිබ්බාණවාද පසෙක, උච්ඡේදවාද සතෙකි යි දෙසැටෙක් වෙති.

### 13 — 2

**සුචරිතං චරෙ**: එක්විසි අනෙස්නෙන් දුරු වැ ගෙපිළිවෙළින් පිඬු සිඟීම මොනවට පුරන්නේ යැ. එක්විසි අනෙසන යනු දුසිල් මහණුන් සිවුපසය සෙවීමට ගිහියන්ගේ සිත් ගැණුම් සඳහා කෙරෙණ සඳෙස් උපායෝ යැ. ඔහු නම්: ගිහියනට සඟසතු හුණදඬු ආදි දඬු දීම, තල්පත් ආදී පත් දීම, මල් - ගෙඩි - දැහැටි - මුවදෙනා පැන් නහන පැන් දීම, නහන සුණු දීම, පියවි මැටි හෝ පඤ්ච වර්ණ මැටි වර්ග දීම, තමන් පහත් කොට දායකයා උසස් කොට චාටු කථා කිරීම, මුං පැසෙන කල සමහර මුං නො පැසී තිබී අනුභවයේදී හැපෙන්නාක් මෙන් සැබෑ බොරු මිශ්‍ර කොට කරන කථාව වූ මුග්ගසූප්‍යතා යැ, පාරිභට්ටකතා නම් වූ ප්‍රත්‍යයදායකයන්ගේ දරුවන් වැඩීම් සුරතල් කිරීමාදිය යැ, ජඞ්ඝපෙසනිකාය යි කියන ලද ග්‍රාමාන්තර දෙශාන්තරයෙහි වූ ගිහියන්ගේ හසුන් පිළිහසුන් ගෙන යැම් ඊම් යැ, වෙදකම් කිරීම, ගෙන් ගෙට ගිහියන්ගේ පණිවුඩ කීම, පහෙනගමන නම් වූ කෙත් වත් ආදියේ මෙහෙවරට යෑම, පිණ්ඩ පතිපිණ්ඩ ය යි කියන ලද තමන් ලද ප්‍රත්‍යය කුලයකට දී ඔවුන්ගෙන් ලත් දෙය ගැනීම, ලාභාශාවෙන් අල්ලස් ආදිය දීම, වාස්තුවිද්‍යාව නම් වූ ලිං බිම් ගෙබිම් ආදිය දැක්වීම, තිථි හොරාදි නැකැත් විධි දැක්වීම, අඞ්ගවිද්‍යාව ය යි කියන ලද අඞ්ගප්‍රත්‍යඞ්ග ලක්ෂණ දැක්වීම යැ.

### 13 — 3

**දුච්චරිතං** යනු වෙසිය ගොචරාදි අගොචරයෙහි හැසිරීම යැ. අගොචරස්ථාන නම්: වෙසඟනන් වසන තැන්, මළ සැමියන් හෝ බැහැර ගිය සැමියන් ඇති කතුන් වසන තැන්, පතිකුලයට නොගිය ගෙහි ම වැඩුණු ස්ත්‍රීන් වසන තැන්, පණ්ඩකනපුංසකයන් වසන තැන්, බඹසරට විපත් විය හැකි මෙහෙණින් වසන තැන්, සුරාසල්, සස්නට අනුලෝම් නොවන ලෙස ආශ්‍රය කරනු ලබන රජ රාජමහාමාත්‍ය, තීර්ථක තීර්ථකශ්‍රාවකයෝ, අශ්‍රද්ධාවත් කුල යෝ යැ.

### 13 — 5

**සඞ්ග** නම් ඇලීම යැ. තෘෂ්ණා, දෘෂ්ටි, මාන, ක්‍රොධ, අවිද්‍යා, කෙලශ, දුශ්චරිත යන මොහු සප්ත සඞ්ගයෝ ය.

### 13 — 6

**නප්පමජ්ජති**: යොනිසොමනස්කාරයෙහි නො පමා වෙයි. යොනිසොමනස්කාර යනු මගපල ලැබීමට උපාය වසයෙන් අනිත්‍ය අශුභාදි සවභාව යුක්ත සංසකාරයන් ඇති සැටි නුවණින් මෙනෙහි කිරීම යැ.

### 13 — 9

**ඍද්ධි**: සමෘද්ධියට පැමිණෙණ් නු යි, සිද්ධ වේනුයි ඍද්ධි නම්. අධිෂ්ඨාන, විකුර්වණ, මනොමය, ඥාණවිස්ඵාර, සමාධිවිස්ඵාර, ආර්‍ය, කර්‍ම විපාකජ, පුණ්‍ය, විද්‍යාමය, සම්‍යක්ප්‍රයොග වශයෙන් දශවිධ යැ. මෙහි ගැණෙනුයේ කර්මජඍද්ධිය යැ. පක්ෂීන්ගේ අහසින් යෑමේ ශක්තිය ඔවුන් පෙර කළ කර්මයට විපාක වශයෙන් ලැබෙන බැවින් කර්මජඍද්ධිය යැ.

ඡන්ද චිත්ත විරිය වීමංසා යන මොහු සෘද්ධි ලැබීමට උපාය වෙත් නුයි සෘද්ධිපාද නමු.

**මාරවාහිනී**: කාම අරති ඛුප්පිපාසා තණ්හා ථීන මිද්ධ උත්තාස විචිකිච්ඡා මක්ඛ ථම්භ මිථ්‍යාප්‍රතිපත්තියෙන් ලත් ලාභසත්කාර-කීර්ති-යශස්-අත්තුක්කංසන-පරවම්භන යන මොහු මර සෙනග යැ.

**13 — 12**

**සග්ග**: චාතුර්මහාරාජිකාදි කාමාවචර ස්වර්ග සයෙක, බ්‍රහ්මපාරිෂද්‍යාදි රූපාවචර බඹලෝ සොළොසෙක, ආකාසානඤ්චායතනාදි අරූපාවචර බඹලෝ සතරය යන මොහු සවිසි වැදෑරුම් ස්වර්ගයෝ යැ. වෛමානික ප්‍රේතයෝ නම් කලක් දිවසැප ද කලක් ප්‍රේත දුක ද විඳිමින් දිව විමන් වැනි විමන්වල වසන ප්‍රේතයෝ යැ.

**සොතාපත්තිඵලං වරං**: සොත යනු ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය යැ. ඒ මාර්ගශ්‍රොතසට පළමු වර පැමිණි පුද්ගල තෙම සොතාපන්න නම්. මාර්ගචිත්තයට අනතුරු ව එහි ඵලය වශයෙන් උපදනා ලොකොත්තර චිත්තය සොතාපත්ති ඵලය යැ. එක් වරක් භවයෙහි උපදනා හෙයින් එකබීජි යැ. ස වරක් උපදනා හෙයින් කොලංකොල යැ. උඩත් පිරිසෙයින් සත් වරක් උපදනා හෙයින් සත්තක්ඛත්තුපරම යැ. මෙසේ ත්‍රිවිධ යැ. සක්විති රජ වුව ද දෙව්ලොව බඹලොව උපන්නේ ද, මුළුලොවට අධිපති වුව ද සතර අපායෙන් මිදීමෙක් නැත. සෝවන් පුද්ගලයාගේ සතර අපායෙහි ඉපදීමෙක් නැත. එහෙයින් සොතාපත්තිඵලය ශ්‍රෙෂ්ඨ යැ.

**14 — 1**

**බුද්ධ** යනු සුතබුද්ධ පච්චේකබුද්ධ චතුසච්චබුද්ධ සම්මාසම්බුද්ධ යි සිවු වැදෑරුම්. සුතබුද්ධ යනු බොහෝ ඇසූ පිරූ තැන් ඇති උගත් බහුශ්‍රැත පුද්ගලයා යැ. චතුසච්චබුද්ධ යනු සියලු කෙලෙසුන් නසා සිවු සස් අවබොධ කළ රහතුන් වහන්සේ යැ. පච්චෙකබුද්ධ යනු පරොපදෙශයක් නැති වැ තමන්ගේ නුවණින් මැ සිවු සස් අවබොධ කළ පසේබුදුන් වහන්සේ යැ. උන්වහන්සේට ආසයානුසයඤාණය නැති හෙයින් දහම් දෙසා අනුන්හට අවබොධ කරවිය නො හැක්ක. සම්මාසම්බුද්ධ යනු දතයුතු සියලු ධර්මයන් මැනැවින් දත් අනුන් ලවා අවබොධ කරවීමේ සමත් බුදුවරු යැ.

**14 — 5**

**සබ්බපාපස්ස අකරණං** යි අධිශීල ශික්ෂාව ද, **කුසලස්ස උපසම්පදා** යි අධිචිත්ත ශික්ෂාව ද, **සචිත්තපරියොදපනං** යි අධිප්‍රඥා ශික්ෂාව ද දැක්වේ.

**පබ්බජිත**: ස්වකීය චිත්තසන්තානය පිළිබඳ රාගාදි කෙලෙස් බැහැර කොට සිටියේ නුයි හෝ සෝවන් ආදි ඒ ඒ මගින් නැසියැ යුතු ලෙස පළියෙන් පළිය පුරුකෙන් පුරුක කෙලෙසුන් දිනන්නේ නු යි හෝ පබ්බජිත නම්.

**සමණ**: සියලු පවු සංසිඳුවූ හෙයින් ශ්‍රමණ නමුදු වෙයි.

**තණ්හක්ඛය**: සියලු තෘෂ්ණාවන් ක්ෂය කරන (වනසන) හෙයින් තෘෂ්ණාක්ෂය නම් වේ. අර්හත්ත්වඵලය හා නිර්වාණය ද දැක්වේ.

## 14 — 14

**සරණ** යනු පිහිට යැ. බුද්ධ ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය යැ. තුනුරුවන් සරණ ගියවුන්ගේ බිය දුක් වනසා ලයි. තෙරුවන් විෂයයෙහි පැහැදීමෙන් හා ගරු කිරීමෙන් රත්නත්‍රය මට පිහිට වේ යැ යි පැවැති චෛතනාව සරණගමන නම් වේ. එය ලෞකික ලොකොත්තර වශයෙන් ද්විවිධ යැ. පෘථග්ජනයන්ගේ සරණය කෙලසන කිලිටි යටපත් වීමෙන් තෙරුවන් ගුණ අරමුණු කොට පවත්නා සරණගමනය ලෞකික යැ. ආර්යයන්ගේ චතුර්මාර්ග ක්‍ෂණයෙහි සරණගමනය කෙලසන කිලිටි මුලුසුන් කිරීමෙන් නිවන් අරමුණු කොට රත්නත්‍රය විෂයෙහි පවත්නා සරණගමනය ලොකොත්තර යැ.

ඒ සරණගමනය ආත්මසන්නිර්‍යාතනය තත්පරායණතාය ශිෂ්‍යභාවෝපගමනය ප්‍රණිපාතය යි සිවු වැදෑරුම් වේ. මම අද පටන් මාගේ ආත්මය තුනුරුවන් වෙත පුදමි යි මෙසේ ආත්මපරිත්‍යාගය ආත්මසන්නිර්‍යාතන නම්. මම අද පටන් තුනුරුවන් පිහිට කොට ඇතිවෙමි යි රත්නත්‍රය පිහිට කොට ඇති බව තත්පරායණතා නම්. මම අද පටන් තුනුරුවනට අතැවැසි වෙමි යි ශිෂ්‍යභාවයට පැමිණීම ශිෂ්‍යභාවෝපගමන නම්. තුනුරුවන් ගුණ සිහි කොට ගරු බුහුමන් කිරීම ප්‍රණිපාත නම්.

## 14 — 17

**පූජාරහ**: පූජාවට සුදුසු. ප්‍රත්‍යය ප්‍රතිපත්ති වශයෙන් පූජාව ද්විවිධ යැ. චීවරාදි සිවු පසයෙන් පිදීම ප්‍රත්‍යය පූජා යැ. වත්පිළිවෙත් ඈ පිරීම ප්‍රතිපත්ති පූජා යැ.

**පපඤ්ච**: බොහෝ කල් සත්ත්වයා සසර රඳවත්නු යි හෝ මත්තප්‍රමත්තභාවයට පමුණුවත්නු යි ප්‍රපඤ්ච නම්. තෘෂ්ණාදෘෂ්ටි මානයෝ යැ.

## 15 — 4

**කිඤ්චන**: පරිබොධාර්ථයෙන් කිඤ්චන නම්. රාගද්වේෂාදිය යැ.

**ආභස්සර**: ද්විතීයධ්‍යානය උපදවා ඉන් නොපිරිහී කළුරිය කළ පුද්ගලයන් උපදනා බඹලොව යැ. ඒ බඹුන්ගේ සිරුරෙන් වලාපටලයකින් නික්මෙන විදුලිය කලඹක් මෙන් පැහැ විහිදෙන හෙයින් ඔහු ද එනමින් වහරට පත් වූහු.

## 15 — 6

**සන්ති**: පඤ්චස්කන්ධය මතු භවයක පිළිසිඳ නොගෙන දර නැති ගින්න නිවී යන්නාක් මෙන් පස්කඳම වූ දුක් සංසිඳීම යැ, නිවණ යැ.

## 15 — 7

**ජිඝච්ඡාපරමා රොගා**: සෙසු රොග එක වරකදී පිළියම් කළවිට නස්නාහු හෝ බැස යන්නාහු වෙති. සාදුක් රොගය නිතර පිළියම් කටයුතු බැවින් සෙසු රොගයනට වඩා මහත් රොගය වෙයි.

**සඞ්ඛාරපරමා දුඛා**: නාමරූපධර්ම සඞ්ඛ්‍යාත සංස්කාර අනිත්‍ය බැවින් හා පරිහරණය කරන්නට ඉතා දුෂ්කර බැවින් පරම දුක් නම් වෙයි.

**නිබ්බානපරමං සුඛං**: සංස්කාර දුඃඛය ලේශමාත්‍රයක්වත් නැති බැවින් ද සද්භාවී අවේදයිත ශාන්ති සැපය ඇති බැවින් ද නිර්වාණය උතුම් සැපය වෙයි.

## 16 — 3

**ගන්ථා**: අභිධ්‍යා කායග්‍රන්ථය, ව්‍යාපාද කායග්‍රන්ථය, ඉදංසත්‍යාභිනිවේශ කායග්‍රන්ථය, ශීලව්‍රත කායග්‍රන්ථය යි ග්‍රන්ථයෝ සිවු වැදෑරුම් වෙති. සත්ත්ව-සංස්කාරයන් කෙරෙහි ප්‍රියගතිය රහිතයනට අභිධ්‍යා කායග්‍රන්ථය ද අප්‍රියගති රහිතයනට ව්‍යාපාද කායග්‍රන්ථය ද ප්‍රහීණ වෙයි ඒ යුගලය ප්‍රහීණ වූ විට ඉදංසත්‍යාභිනිවේශ ශීලව්‍රතපරාමර්ශ කායග්‍රන්ථයෝ ප්‍රහීණ වෙති.

## 16 — 9

**දස්සන**: මාර්ගඵල සම්‍යග්දෘෂ්ටිය යැ. එනම් මාර්ගඵල චිත්තයන් හා යෙදෙන ප්‍රඥාචෛතසික යැ.

## 16 — 10

**ඡන්දජාතො**: කත්තුකම්‍යතා වශයෙන් උපන් ඡන්දය ඇත්තේ ය. කත්තු-කම්‍යතා කුසල නම්: ශමථ විදර්ශනා භාවනාදි කුශලයන් කරනු කැමැත්ත ලක්ෂණ කොට ඇති කුශලධර්ම විෂයෙහි වූ අභිලාෂය යැ.

**උද්ධංසොත**: අනාගාමි ඵලයට පැමිණ අවිහ නම් බඹලොව ඉපද එතැන් පටන් ප්‍රතිසන්ධි වශයෙන් අකනිට්ඨ බඹලොව තෙක් යන්නේ උද්ධංසොත නම්. හෙතෙම එහිදී රහත් වැ පිරිනිවන් පානේ ය.

## 17 — 1

**කොධ**: අප්‍රිය රූපාදි ආලම්බනයක් හමු වූ විට අරමුණ හා සිත ගැටෙන ප්‍රතිඝය නිසා සිතතුළ හට ගැනෙන කිපීම යැ. 'අසවලා අතීතයෙහිදී මට අනර්ථ-යක් කෙළේය. දැනුදු එසේ මැ කෙරෙයි. මතු ද එසේ මැ කරන්නේ ය. මාගේ ප්‍රිය මිත්‍රයාහට ද එසේ මැ කරනු ඇත. මාගේ හතුරාහට අතීතයෙහිදී වැඩක් මැ කෙළේය. දැනුදු එසේ මැ කෙරෙයි. මතු ද එසේ මැ කරන්නේය'යි සිතන්නහුට නව අයුරෙන් ක්‍රොධය හට ගනී. සමහරෙක් වැසි වසින විට ද නොවසින විට ද සූර්යතාපය ඇති විට ද නැති විට ද ගල්මුල් ආදියෙහි පය හැපුන විට ද අස්ථානයෙහි කිපෙයි. මේ අස්ථාන ක්‍රොධය සමග ගැනීමෙන් ආඝාතවස්තු දශයක් වන්නේ ය.

## 17 — 5

**මුනයො**: මෙලෝ පරලෝ අත්වැඩ පරවැඩ දනී නු යි මුනි නම්. මුනිහු අගාරියමුනි අනගාරියමුනි සෙඛමුනි අසෙඛමුනි පච්චෙකමුනි මුනිමුනි යි සවැදෑරුම් යැ. මාර්ගඵලයනට පැමිණ ධර්මාවබොධ කළ ගිහි පුද්ගලයා අගාරිය-මුනි යැ. එබඳු පැවිද්ද අනගාරියමුනි යැ, ස්‍රොතආපත්ති මාර්ගස්ථයා පටන් අර්හත්වමාර්ගස්ථයා තෙක් ශෛක්ෂ පුද්ගලයෝ සත් දෙන සෙඛමුනි යැ. අර්හත්ව ඵලයට පැමිණි පුද්ගලයා අසෙඛමුනි යැ. පසේබුදුවර තෙම පච්චෙක-මුනි යැ. සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ මුනිමුනි යැ.

## 18 — 2

**අනඞ්ගණ** යනු අඞ්ගණරහිත වූයේ යැ. අඞ්ගණ යනු පුහුලා පහත් බවට හෙළන රාගාදි කෙලශයෝ යැ. කැමැති දෙය ඉටු නො වීමෙන් සිතතුළ පහළ-වන නානාවිධ කෝපාදිය ද අඞ්ගණ යැ.

**දිබ්බං අරියභූමිං**: දිව්‍ය වූ ආර්‍යභූමිය නම් අවිහ අතප්ප සුදස්ස සුදස්සී අකනිට්ඨ යන සුද්ධාවාස භූමි පස යැ. ශුද්ධ සත්ත්වයන්හට මැ එනම් අනාගා-මීන්හටත් රහතුන්හටත් පමණක් ආවාස වෙත් නු යි සුද්ධාවාස නම්. සුද්ධා-වාසවල උපදනාහු අනාගාමී පුද්ගලයෝ මැ යි. ඔවුහු එහිදී අර්හත්ත්වයට පැමිණ පිරිනිවන් පාති..

## 18 — 7

**අසජ්ඣායමලා**: උගත් ධර්මශාස්ත්‍රාදිය නිතොර නොහැදෑරීමෙන් පුහුණු කිරීම් වශයෙන් එහි නොයෙදීමෙන් මල බැඳෙයි, වැනැසෙයි. මන්ත්‍රයනට කිලුට නම් අසජ්ඣායන යැ.

**මන්තා** යනු උගත් ධර්මශාස්ත්‍ර ශිල්පාදිය යැ.

## 18 — 8

**මලිත්ථියා දුච්චරිතං**: ස්ත්‍රියට දුශ්චරිතය කිලුටකි. මෙහි දුශ්චරිතය නම් පොරසැමියන් සෙවීම යැ. ස්වාමියා ද එබඳු ස්ත්‍රිය ගෙයින් බැහැර කරයි. මවු-පියෝ ද 'තෝ අප කුලය කෙලෙසන්නී යැ'යි ඇය නෙරපති. එහෙයින් අතිචාරය ස්ත්‍රියට කිලුටකි.

## 18 — 16

**සමාධි නම්**: උපචාර අර්පණා වශයෙන් හෝ මාර්ගඵල වශයෙන් සිත එකඟවීම යැ. උපචාර සමාධි යනු මරණසතිය උපසමානුස්සතිය ආහාරයෙහි ප්‍රතිකූලසංඥය චතුධාතුවවත්ථානය යන මොවුන්ගේ වශයෙන් ලබන ලද සිතේ එකඟ බව යැ. අර්පණාසමාධි යනු ප්‍රථමධ්‍යාන පරිකර්මයට අනතුරු ව හටගැනෙන එකඟ බව යැ. මාර්ගසමාධි යනු මාර්ග චිත්තක්ෂණයෙහිදී නිවන් අරමුණු කොට සිත තුළ ඇති වන එකඟබව යැ. ඵලසමාධි යනු නිවන් අරමුණෙහි ඵල සිත් උපදවා වසන විට සිතෙහි පහළ වන එකඟබව යැ.

## 18 — 19

**ආසවක්ඛය**: කාමාදි ආශ්‍රවයන් ක්ෂය වූ බැවින් අර්හත්ත්වය ආශ්‍රවක්ෂය නම්.

## 18 — 21

**ආකාසෙ පදං නත්ථි**: ආකාශය අද්‍රව්‍ය බැවින් එහි සතුන්ගේ පාසටහන් නො පිහිටයි.

**සඞ්ඛාරා**: හෙතුප්‍රත්‍යයන්ගේ බලයෙන් හටගෙන පවත්නා සංස්කාර උපාදින්නක අනුපාදින්නක වශයෙන් ද්විවිධ යැ. තෘෂ්ණාදි උපාදානයන් විසින්

මම යැ මාගේ සී ගන්නා ලද බැවින් පඤ්චස්කන්ධය උපාදින්නක ස්කන්ධ නම්. එබඳු උපාදානයක් නැති වෘක්ෂලතාදි අවිඤ්ඤාණක ද්‍රව්‍යයෝ අනුපාදින්නකයෝ යැ.

## 19 — 7

**ඉස්සුකී**: මෙරමා සැපත් නොඉවසීම ලකුණු කොට ඇති චිත්තගතිය ඊර්ෂ්‍යා නම්. එබඳු පුහුලා අනුන්හට යම් කිසිවක් ලැබීම ගැන නොසතුටු වෙයි. නො ඉවසයි.

**මච්ඡරී**: සවකීය සම්පත්තිය සැඟවීම ලකුණු කොට ඇති චිත්තගතිය මාත්සර්‍ය යැ. එයැත්තේ තමා සතු දෙය අනුන්හට සාධාරණ වීම් ගැන සතුටු නො වෙයි. ආවාසමච්ඡරිය කුලමච්ඡරිය ලාභමච්ඡරිය ධම්මමච්ඡරිය වණ්ණමච්ඡරිය සී මච්ඡරිය පස්වැදෑරුම් වෙයි. ආවාසමච්ඡරිය යනු ආවාස පිරිවෙන් රාත්‍රිස්ථානාදිය පිළිබඳ මසුරු බව යැ. ආවාසමච්ඡරිය ඇති මහණ තමා වසන ආරාමාදියට අන් භික්ෂූන්ගේ පැමිණීම නො කැමැති වෙයි. පැමිණියවුන් වහා නික්ම යනු කැමැති වෙයි. කුලමච්ඡරිය යනු උපස්ථායක කුලය හෝ ඥාතිකුලය පිළිබඳ මසුරු බව යැ. ඉන් යුත් මහණ එළඹෙන කුලයනට අන් මහණුන් එළඹීම නොකැමැති වෙයි. ලාභමච්ඡරිය යනු චීවරාදි සිවු පස පිළිබඳ මසුරු බවයැ. ඉන් යුත් මහණ සිල්වත් අන් භික්ෂූන්හට කැප වූ කිසි දෑයක් ලැබෙනු දක නො රිසි වෙයි. ධම්මමච්ඡරිය යනු තමා උගත් ධර්මය පිළිබඳ මසුරු බව යැ. ඉන් යුත් මහණ තමා දත් ධර්මය අනුන්හට කියා දෙනු නොකැමැති වෙයි. වණ්ණමච්ඡරිය යනු ශරීරවර්ණ ගුණවර්ණයන් පිළිබඳ මසුරු බව යැ. එබඳු මහණ අනුන්ගේ සිරුරේ පැහැ සටහන් අසන්නට වත් සිල්වත් බව් ආදි ගුණ වැනීම අසන්නට වත් නොකැමැති වෙයි.

## 19 — 9

**අබ්බතො** යනු ශීලව්‍රත ධූතාඞ්ගව්‍රතයන්ගෙන් විරහිත. ශීලව්‍රත යනු කෙලෙස් වළහාලන ශීල ගුණය සි. ධූතාඞ්ගව්‍රත යනු පංසුකූලිකඞ්ග තෙචීවරිකඞ්ග පිණ්ඩපාතිකඞ්ග සපදානචාරිකඞ්ග එකාසනිකඞ්ග පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ග ආරඤ්ඤිකඞ්ග රුක්ඛමූලිකඞ්ග අබ්භොකාසිකඞ්ග සොසානිකඞ්ග යථාසන්ථිකඞ්ග නෙසජ්ජිකඞ්ග යන තෙළෙස් ධූතාඞ්ගයෝ යැ.

## 19 — 13

**මොනෙන**: මෝන සී වදළේ නිඃශබ්දතාව යි. මොනෙය්‍යපටිපදා යන තන්හි මාර්ගඥානය ද දක්වේ. ඒ මාර්ගඥානයෙන් යුත් පුද්ගල තෙම මුනි නම්.

## 19 — 17

**නෙක්ඛම්මසුඛ**: අනාගාමිඵලයට පැමිණි පුද්ගලයා කාමරාගය ප්‍රහීණ කළ හෙයින් හෝ කාමභවයෙන් නික්මුණු හෙයින් අනාගාමි ඵලය පිළිබඳ සැපය නෙක්ඛම්මසුඛය යැ.

## 20 — 1

**අට්ඨඞ්ගිකමග්ග:** සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන අඞ්ග අටින් යුක්ත මාර්ග යැ. මෙය මධ්‍යමප්‍රතිපත් නමින් දැක්වේ. මේ මගින් විනා අන් මගකින් නිවන් පුරයට නොපිවිසිය හැක්ක.

**සච්ච:** වාක්සත්‍යය සංවෘතිසත්‍යය දෘෂ්ටිසත්‍යය පරමාර්ථසත්‍යය යි සත්‍යයෝ විවිධ වෙති. වාක්සත්‍යය යනු සත්‍යවචන යැ. සංවෘති-සත්‍යය යනු ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි වශයෙන් පැණවීම යැ. දෘෂ්ටිසත්‍යය යනු 'තමා දැඩි කොට සිතින් ගත් ලබ්ධිය මැ සැබැවි, ඉන් බැහැර වූයේ සත්‍යයෙන් තොරයැ' යන දෘෂ්ටිය යැ. පරමාර්ථ සත්‍යය යනු ස්කන්ධධාතු ආයතනාදි වශයෙන් වදාළ දෙශනා යැ. මෙකී සියලු සත්‍යයන් අතුරෙන් දුඃඛ සමුදය නිරොධ මාර්ග යන ආර්ය සත්‍ය සතර ශ්‍රෙෂ්ඨ යැ.

**විරාග** යනු නිර්වාණය යැ. ශාන්ත සැපය ගෙනදෙන බැවින් එය ශ්‍රෙෂ්ඨ යැ.

**දිපදානඤ්ච චක්ඛුමා:** අපාද චතුප්පාද බහුප්පාදාදි හැම සත්ත්වයන්හට වඩා දෙපා ඇති දෙවි මිනිස්සු ශ්‍රෙෂ්ඨ වෙති. පසැස් ඇති සර්වඥයන් වහන්සේ යථොක්ත දෙවි මිනිසුන්හට ශ්‍රෙෂ්ඨ යැ. පසැස් යනු මසැස දිවැස පැණැස බුදුඇස සමතැස යි. මසැස යනු චතුරඞ්ගසමන්නාගත අන්ධකාරයෙහි දු යොදුනක් ඝන විදුරුගල් පවා විනිවිද දක්නට සමත් පස් පැ දිස්නා පියවි ඇස යැ. දිවැස යනු සත්ත්වයන්ගේ ච්‍යුති උප්පත්ති දක්නා චුතූපපාතඤාණ ය යි කියන ලද දිව්‍ය චක්ෂුස යැ. පැණැස යනු තෙකල්හි වූ සියලු ධර්මයන් දක්නා නුවණ යැ. බුදුඇස යනු දශසහස්‍රී ලොක ධාතුවෙහි අල්පරජස්කාදි සත්ත්වයන් දක්නා නුවණ යැ, ආසයානුසය ඥනය යැ. සමතැස යනු සර්වඥතාඥනය යැ. එයට ගොදුරු නොවන දෑයක් නැති.

## 20 — 2

**දස්සන:** සිවුසස් දක්නා හෙයින් මාර්ගඵල ප්‍රඥව දර්ශන නමි.

**මාරප්පමොහන:** ආර්ය මාර්ගප්‍රතිපත්තිය සියලු කෙලෙසුන් නැසීමෙන් කෙලෙස් මරු පරදන හෙයින් හා මරදෙව්පුතුට විෂය නොවන හෙයින් මාරප්පමොහන නමි.

## 20 — 4

**ආතප්ප:** උපන් කෙලෙස් නැසීම යැ, නූපන් කෙලෙස් උපදනට නොදීම යැ, නූපන් කුසල් උපදවාලීම යැ, උපන් කුසල් දියුණු කිරීම යැ යි කෘත්‍ය සතරක් සිදු කරන සම්‍යක්ප්‍රධානවීර්යය කෙලෙසුන් තවන හෙයින් ආතප්ප නමි.

## 20 — 8

**සංසන්තසඞ්කප්පමන:** ත්‍රිවිධ මිථ්‍යාවිතර්කයන් මනා කොට යටපත් කළ සම්‍යක්සඞ්කල්පනා සිතැත්තේ යි. ත්‍රිවිධ මිථ්‍යාවිතර්ක නම්

කාම ව්‍යාපාද විහිංසා විතර්කයෝ යි. ප්‍රියරූපාදි අරමුණු රස විඳ ගැන්ම ගැණ සිතීම කාමවිතර්ක නම්. මෙරමා නැසෙත්වා වැනසෙත්වා යි සිතීම ව්‍යාපාදවිතර්ක නම්. අනුන් තලා මරා වෙහෙසට පත් කිරීමට සිතීම විහිංසාවිතර්ක නම්

## 20 — 9

**ඉසි**: ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානදර්ශන යන පඤ්චවිධ ධර්මයන් එෂණය කළ හෙයින් බුදු පසේබුදු රහත්හු ඉසි නම් වෙත්.

## 20 — 10

**යොග** යනු අටතිස් අරමුණෙහි යෙදීම යි. අටතිස් අරමුණ නම්: පඨවී ආපො තෙජො වායො නීල පීත ලොහිත ඔදාත යන කසින අට ද – උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක ලොහිතක පුළවක අට්ඨික යන අසුභ දසය ද – බුද්ධ ධම්ම සඞ්ඝ සීල චාග දෙවතා උපසමානුස්සති යන අනුස්සති සත ද – කායගතාසති මරණසති ආනාපානසති යන තුන ද – මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන බ්‍රහ්මවිහාර සතර ද – ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූප්‍ය සතර ද ආහාරෙපටිකූලසඤ්ඤා චතුධාතුවවත්ථාන යන සඤ්ඤාවවත්ථාන දෙක ද යන මේ කමටහන් අටතිස යැ.

## 20 — 11

**වන වනථ**: මහරුක් වන නම්. කුඩා රුක් ඒ වනයෙහි ජාත බැවින් වනථ නම්. පළමු උපන් රුක් හෝ වන නම්. පසු පසු උපන්නාහු වනථ නම්. එසේ ම භවය ගෙන දෙන මහත් මහත් කෙලෙස් වන නම්. පැවැත්මෙහි විපාක දෙන කෙලෙස් වනථ නම්. පළමු උපන් කෙලෙස් හෝ වන නම්. පසු පසු උපන්නාහු වනථ නම්. ඒ කෙලෙස් සිව්මග නුවණින් සිඳලිය යුතු.

## 20 — 17

**විසොධනය**: අරිඅටඟිමග පිරිසුදු වන්නේ දාන සීල භාවනා වසයෙන් පූර්වභාග ප්‍රතිපත්ති පුරා විදර්ශනා වැඩීමෙන් සියලු සංස්කාර විෂයයෙහි නිර්වේදයට පැමිණ සෝවාන් ආදි මාර්ග කුශලචිත්තයන් උපදවා ගැනීමට යොග්‍ය පිළිවෙත් පිරීමෙනි.

## 21 — 1

**විපුලං සුඛං**: මහත් සැපය නම් නිවන් සැපය යි. එක් බත් තලියක් සරහා වළඳන්නහුට උපදනේ ස්වල්ප මාත්‍ර සැපයකි. එය නොවළඳා පෙහෙවස් රක්නහුට හෝ දන් දෙන්නහුට මහත් නිවන් සුවයක් ලැබේ ද ඒ නිවන් සුව කැමැත්තේ ස්වල්ප වූ සැපය දුර ලයි.

## 21 — 4

**කායගතා සති**: කෙහෙ ලොම් ආදි වසයෙන් ප්‍රභේදවත් වූ රූපකායය අරමුණු කොට පැවැති සිහිය කායගතා සති නම්. කෙසාදි කොටස් පිළිබඳ ව නැවැත නැවත සිහි කරමින් එය අරමුණු කොට සිත පුරුදු කිරීම කායගතාසති භාවනා නම්.

## 21 — 5

**මාතරං:** "තණ්හා ජනෙති පුරිසං"යි වදාළ හෙයින් භවත්‍රයයෙහි සත්ත්වයන් උපදවන හෙයින් තෘෂ්ණාව මව ය.

**පිතරං:** අසවල් රජුගේ අසවල් ඇමැතිගේ පුත්‍රයෙමි යී පියා නිසා පුතුට මානය උපදනා හෙයින් නවවිධ අස්මිමානය පියා ය.

**රාජානො:** සියලු ලෝවැස්සා රජු භජනය කරන්නාක් මෙන් සියලු දෘෂ්ටීහු ශාශ්වත උච්ඡේද දෘෂ්ටීන් භජනය කෙරෙත් නු යි තද්දෘෂ්ටි දෙක ක්‍ෂත්‍රිය රජහු දෙදෙනා ය.

**රට්ඨං:** චක්ඛාදි දොළොස් ආයතනයෝ පතළ අර්ථයෙන් රටක් වැනි හෙයින් රට ය.

**සානුචරං:** ඒ ආයතනයන් නිසා පවත්නා නන්දිරාගය රටින් අය නගන අයකැමියකු වැනි හෙයින් අනුචර සහිත ය.

## 21 — 6

**වෙය්‍යග්ඝපඤ්චමං** ව්‍යාඝ්‍රසඤ්චාරය ඇති භය සහිත නොබැසියැ හැකි මග වෙය්‍යග්ඝ නම් වෙයි. විචිකිච්ඡා නීවරණය ද ඒ හා සදෘශ හෙයින් වෙය්‍යග්ඝ නම් වෙයි. වෙය්‍යග්ඝය පස්වනු වූයේ මේ කාමච්ඡන්දාදියට ය. කාමච්ඡන්දාදි නීවරණ පඤ්චකය වෙය්‍යග්ඝපඤ්චම නම් වෙයි.

## 21 — 15

**රත්ති:** චතුරඞ්ග සමන්විත සන්ධකාර රාත්‍රිය යි. චතුරඞ්ග නම් කෘෂ්ණ පක්‍ෂයෙහි තුදුස්වකය ඝන වනලැහැබය මේඝ පටලය මධ්‍යම රාත්‍රිය යන මොවුහු ය.

## 21 — 16

**එකාසනං:** ගණසඞ්ගණිකාවෙන් දුරු වුව ද ක්ලේශසඞ්ගණිකාවෙන් දුරු නුවුව හොත් හුදෙකලා ව හුන්නේ නො වෙයි. භික්‍ෂූන් දහසක් මැද ද මූලකර්මස්ථානය නොහැර එම මනස්කාරයෙන් යුක්ත ව හුන්නහුගේ හිඳීම එකාසන නම්.

**එකසෙය්‍යා:** ගණසඞ්ගණිකාවෙන් දුරු වුව ද ක්ලේශ සඞ්ගණිකාවෙන් දුරු නුවුහොත් හුදෙකලා ව හොත්තේ නො වෙයි. ලෝවාමහාපාය වැනි මහ පායක ද භික්‍ෂූන් දහසක් මැද පණවනලද විසිතුරු පසතුරුණු කන්වසින් ඇති මහයහනක වුව ද සිහි එළවා දකුණැලයෙන් මූලකර්මස්ථානයෙන් යෙදී හොත්තහුගේ සෙය්‍යාව එකසෙය්‍යා නම් වෙයි.

## 22 — 6

**කුසො:** සියුම් මුවහත් ඇති යම් කිසි තණපතකි. යටත් පිරිසෙයින් තල් පතක් හෝ ගත යුතු වෙයි.

**22 — 7**

**සිථිලං කම්මං**: දෙමි දේ නොදෙමි දේ කෙරෙමි දේ නොකෙරෙමි දේ යි පසුබට ව කරණ ලද දානශීලාදි කුශලකර්ම යි.

**වතං**: ශීලව්‍රත ධූතාඞ්ගව්‍රත වශයෙන් ද්විවිධ යි. වෙසියගොචරාදි අගොචරයෙහි හැසිරීමෙන් ශීලව්‍රතය ද, මේ නිසා ලොකයා මට සම්භාවනා කෙරෙති යි ලාභාශාවෙන් යුක්ත ව පිරීමෙන් ආරණ්‍යකාදි ධූතාඞ්ගව්‍රත ද කිලිටි වෙයි.

**23 — 3**

**සින්ධව**: සින්ධුදෙශයෙහි උපන් අශ්වයෝ යි.

**23 — 6**

**මහග්ඝස**: තම බඩගිනි පමණ නොදත කැම කන ආහරහත්ථක අලංසාටක තත්‍රවට්ටක කාකමාසක භුත්තවමිතකයෝ ය. බමුණන් මෙන් බොහෝ කොට ආහාරගන්නා ය. කුස නොපොහොනා තරම් අහර ගෙන නැගිට ගත නොහී 'ආහර හත්ථං''යි අත ගෙනෙවයි කියන්නෝ ආහරහත්ථක නම් ද, ඉන ඇඳි කඩ පමණවත් දරා ගත නොහී ''අලං සාටකෙන''යි වස්ත්‍රයෙන් කම් නැතැ යි කියන්නෝ අලංසාටක නම් ද, සිරුර දරාගත නොහී අහර ගත් තැන පෙරළෙන්නෝ තත්‍රවට්ටක නම් ද, කවුඩන් විසින් මුඛයෙහි හොට ඔබා ඇදගත හැකි වන සේ මුව දොර තෙක් අහර ගන්නෝ කාකමාසක නම් ද, කුසෙහි දරාගත නොහී කෑ තැන ම වමාරා දමන්නෝ භුත්තවමිතක නම් ද වෙයි.

**23 — 13**

**මත්තෙය්‍යතා පෙත්තෙය්‍යතා** නම්: මවුපියන් කෙරෙහි මනා පිළිපැවැත් ඇති බව ය. මවුපියවරු තම දරුවන් තමන්හට උවටැන් නොකරන බව දැන සිය ධනය බිම හෝ නිදන් කෙරෙති. අනුන්හට හෝ දෙති. මවුපියන්හට උවටැන් නොකරති යි දරුවන්හට නින්දාව ද වැඩෙයි. මරණින් මතු ගූථනරකයෙහි උපදිත්. මවුපියන්හට උවටැන් කරන දරුවෝ දායාදයට ද හිමි වෙති. ප්‍රශංසා ලබති. මරණින් මතු දෙව්ලොව උපදිති.

**සාමඤ්ඤතා බ්‍රහ්මඤ්ඤතා** යනු මහණ බමුණන් කෙරෙහි සම්‍යක්ප්‍රතිපත්ති යි. චීවරාදි සිවු පසයෙන් පිළිදැගුම් කිරීම යි.

**24 — 5**

**අනුසය**: මූෂිකාවිෂයක් මෙන් තමාගේ උපතට හෙතු වන කාරණය ලැබීමෙන් ඉපදීමට යොග්‍යවූ සියුම් බවට පැමිණ චිත්තසන්තානයෙහි නිදි ගත්තවුන් වැනි වූ කෙලශයෝ අනුශය නම් වෙත්. ඔහු කාමරාග භවරාග පටිඝ මාන දිට්ඨි විචිකිච්ඡා අවිජ්ජා යි සත් වැදෑරුම් වෙති. තෘෂ්ණානුශය යි වදාළේ කාමරාග භවරාග යන අනුශයයන් සඳහා ය.

**24 — 6**

**ඡත්තිංසති සොතා**: චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මනො යන ආධ්‍යාත්මික ආයතනයන් සදෙනා හා රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන බාහිර ආයතනයන් සදෙනා විෂය කොට කාමභවවිභවතෘෂ්ණා යන ත්‍රිභෙදයෙන් පවත්නාහු සතිස් ශ්‍රොතස්හු වෙති.

## 24 — 17

**අසුභ**: උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක පුළුවක ලෝහිතක අට්ඨික යන මොහු දස අසුභ වෙති අසුභාරම්මණයන් අරමුණු කොට උපදවාලූ ප්‍රථමධ්‍යානය අසුභධ්‍යාන නම්.

**විතක්කූපසම**: කාම ව්‍යාපාද විහිංසා විතර්කයන් සංසිඳුවා ලන හෙයින් විතක්කූපසම නම්.

## 24 — 19

**නිරුත්තිපදකොවිදෙ**: සිවු පිළිසිඹියායෙහි දක්ෂය යනු අර්ථයි. සිවු පිළිසිඹියා නම් අර්ථ නම් වූ හෙතු ඵලය ද, ධර්ම නම් වූ හෙතුව ද, නිරුක්ති නම් වූ මාගධී භාෂාව ද, ප්‍රතිභාන නම් වූ ප්‍රඥ විශෙෂය ද ප්‍රත්‍යවෙක්ෂා කරන්නා හට ඒ ඒ අර්ථ ධර්මාදියෙහි ප්‍රභෙදගත වූ නුවණ අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන ප්‍රතිසංවිද් නම් වූයේ සිවු පිළිසිඹියා නම්.

## 24 — 21

**ධම්මදානං**: ලාභ සත්කාරාදියෙහි නිරපෙක්ෂක ව හිතාධ්‍යාශයෙන් යටත් පිරිසෙයින් සතරපද ගාථාවකින් අනුමෙවෙනි වසයෙන් පවත්වන ලද ධර්ම දානය සියලු ආමිස දානයනට වඩා ශ්‍රෙෂ්ඨ යි. ඉදින් යමෙක් ලොව මුළුල්ලෙහි දතින් දත ගසා වැඩහුන් බුදු පසේබුදු මහරහතුන් හට කෙහෙල් ගබ් වැනි වූ සිවුරු ද, ප්‍රණීත පිණ්ඩපාත ද, මහාවිහාරය බඳු ලක්ෂ ගණන් විහාර ද, තෙල් මී සකුරු ආ ගිලන් පස බෙහෙත් පිරිකර ද, දුන්නේ වී නමුත් එයට වඩා ධර්මදානය ම ශ්‍රෙෂ්ඨ යි. කුමක් හෙයින් ද? යත් පින්කම් කරන්නාහු බණ අසා ම කරන්නාහ. නොඅසා නොකරන්නාහු වෙත් ද එහෙයිනි.

**ධම්මරස**: සත්තිස් බොධිපාක්ෂික ධර්මය, නව ලෙකොත්තර ධර්මය, සියලු රසයන්හට වඩා ශ්‍රෙෂ්ඨ යි. උඩත් පිරිසෙයින් දෙවියන්ගේ සුධා-භොජන රසය ද සත්ත්වයන් සසරෙහි හෙළා දුක් අනුභව කරවීමට හෙතු වන්නේ ය. සත්ත්වයන්ගේ ජරාමරණ නැති කරන හෙයින් ධර්මරසය ශ්‍රෙෂ්ඨ යි.

**ධම්මරති**: දහම් දෙසන්නාහට ද අසන්නාහට ද කියවන්නාහට ද සිත තුළ ඇතිවන ප්‍රීතිය යි කියූ. ධර්මරතිය සසර පැවැත්ම කෙළවර කොට අර්හත්ත්ව ඵලයෙන් අවසන් වෙයි. එහෙයින් සියලු රතිවලට වඩා ධර්මරතිය ශ්‍රෙෂ්ඨ යි.

**තණ්හක්ඛය**: කාම භව විභව යන සියලු තැන් කෙරෙහි තෘෂ්ණාවන් ක්ෂය කරන හෙයින් තෘෂ්ණාක්ෂය නම්. අර්හත්ත්ව මාර්ග ය යි. තදනන්තර ව උපන් බැවින් අර්හත්ත්ව ඵලය ද තෘෂ්ණාක්ෂය නම්.

මේ ධර්මය ඇසූ සක් දෙවිඳු බුදුන් වැඳ 'ස්වාමීන් වහන්ස, මෙසේ උතුම් වූ ධර්මදානයෙහි පින් කුමක් හෙයින් අපට නොදෙන සේක් ද, වහන්ස, මෙතැන් පටන් භික්ෂු සඞ්ඝයා ලවා අපට පින් දෙවනු මැනැවැ යි

කී ය. ශාස්තෘන් වහන්සේ එසඳ භික්ෂු සඞ්ඝයා රැස් කොට "මහණෙනි, මෙතැන් පටන් කුදු මහත් ධර්ම දේශනාවන් පිළිබඳ ව පින් හැම සත්ත්වයන් හට අනුමෝදන් කරවූ" යි වදාළ සේක. එවක් පටන් ධර්ම දේශනාවසානයෙහි දෙවියන්හට පින් දීම ඇරැඹිණ.

**24 — 22**

**භොගා:** වස්ත්‍රාභරණාදි උපභොග වස්තු ද, දැසි දස් ගවමහිසාදි පරිභොග වස්තූහු ද ගැණෙත්.

**25 — 7**

**මෙත්තාවිහාරී** යනු මෙත් වඩන්නේ. මෙත් වඩා චතුෂ්ක නය වශයෙන් ප්‍රථමධ්‍යානාදි ධ්‍යානත්‍රය හෝ පඤ්චක නය වශයෙන් ධ්‍යාන චතුෂ්කය උපදවා සිටියේ ද මෙත්තාවිහාරී නම්.

**සඞ්ඛාරූපසමං**: නිවන් අරමුණු කොට සියලු සංස්කාරයන් සංසිඳෙන බැවින් නිර්වාණය සඞ්ඛාරූපසම නම්.

**25 — 16**

**කල්‍යාණමිත්තො**: දශකථාවස්තුලාභී කලණ මිතුරන්. දශ කථාවස්තූහු නම්: අල්පෙච්ඡතාය ත්‍රිවිධ සන්තොෂය ප්‍රකර්ෂවිවෙකය අසංසර්ගය වීර්‍ය්‍යාරම්භය ශීලසම්පත් සමාධිසම්පත් ප්‍රඥාසම්පත් විමුක්තිසම්පත් විමුක්තිඥානදර්ශනසම්පත් යන මොහු ය.

**25 — 17**

**පටිසන්ථාරවුත්ති**: ආමිසපටිසන්ථාර ධම්මපටිසන්ථාර දෙකින් යුක්ත වීම. තමන් ලත් චීවර පිණ්ඩපාතාදි ආමිෂය අනුන්හට ද බෙදා දීම ආමිසපටිසන්ථාර නම්. තමා දත් ධර්මය අනුන්හට කියා දීම ධම්මපටිසන්ථාර නම්.

**26 — 1**

**සොත**: තෘෂ්ණා නැමැති දිය පාර යි. පස් කම් සැප විෂයයෙහි චක්ෂුරාදි සදොරින් මහ දියපාරක් මෙන් වැගිර පවත්නා ආශාව යි.

**පරක්කමම**: සම්‍යක්ප්‍රධාන ය යි කියන ලද වීර්‍ය්‍යය කොට. තද් වීර්‍ය්‍යය ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු යි ත්‍රිවිධ යි. ශමථවිදර්ශනාදි කටයුතු පටන් ගන්නා වීර්‍ය්‍යය ආරම්භධාතු නම්. කුසීතභාවයෙන් නික්මුණු එයට වඩා බලවත් වීර්‍ය්‍යය නික්කමධාතු නම්. නැවත නැවතත් උපදනා කුසීත භාවය මැඬලමින් මතු මත්තෙහි දු ලැබිය යුතු ගුණයන්හට පැමිණෙන බලවත් වීර්‍ය්‍යය පරක්කමධාතු නම්.

**අකත**: රන් රිදී ආදී කිසිවකින් වත් ශක්‍රබ්‍රහ්මාදි කිසි කෙනකුන් විසින් වත් නො කරන ලද හෙයින් නිවණ අකත නම්.

**26 — 3**

**පාරං**: චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මනො යන ආධ්‍යාත්මික ෂඩායතන පාර නම් එ තෙර යි.

**අපාර**: රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන බාහිර ෂඩායතන අපාර නම්, මෙ තෙර යි.

**ආයතන**: රූපාදිය අරමුණු කොට උපදනා චිත්තචෛතසිකයන් උපදනා තැන් හැසිරෙන තැන්ය යන අර්ථයෙන් ද රූපාදි අරමුණෙහි චක්ෂුරාදියෙන් වැගිර පවත්නා ක්ලේශයන්ගේ වශයෙන් මත්තෙහිත් සසර දුකට පමුණුවන අර්ථයෙන් ද ආයතන නම්.

## 26 — 5

**තෙජසා**: සරණ ගුණ ඤාණ පඤ්ඤා ධම්ම යන පස් තෙදිනි.

## 26 — 15

**සබ්බසංයොජනං**: දශවිධ සංයොජනයෝය. සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන සංයොජන හා සියලු සංයොජනයන් පිළිබඳ අපායගාමී ශක්තිය ශ්‍රොතාපත්ති මාර්ගයෙන් ද, කාමරාග ව්‍යාපාද පිළිබඳ ඖලාරිකභාවය සකෘදාගාමී මාර්ගයෙන් ද, මේ දෙක සහමුලින් අනාගාමී මාර්ගයෙන් ද- රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන සංයොජන අර්හත්වමාර්ග-යෙන් ද ප්‍රහීණ වෙයි.

## 26 — 17

**අක්කොසං**: ආක්‍රොෂය දශවිධ යි, සොරෙක බාලයෙක මූඪයෙක ඔටුවෙක ගොනෙක කොටලුවෙක තිරිසනෙක තිරිසනෙක තට සුගතියක් නැත. තා විසින් දුගතිය ම කැමැති වියයුතු යනු යි.

**බන්ධ**: අනුබන්ධන රජ්ජුබන්ධනාදියෙන් බැඳීම යි. සිරගෙයි ලා බැඳීම අනු-බන්ධනය යි. රැහැණින් බැඳීම රජ්ජුබන්ධන නම්.

## 26 — 22

**අසංසට්ඨ**: සංසර්ගයක් නැති. සංසර්ගය පඤ්චවිධ යි. දර්ශන ශ්‍රවණ සමුල්ලපන පරිභොග කායසංසර්ග වශයෙනි.

## 26 — 29

**අඤ්ඤාය**: බුද්ධාදි අට තැන් දැන. බුද්ධ ධම්ම සඞ්ඝ සික්ඛා පුබ්බන්ත (අතීත ස්කන්ධය) අපරන්ත (අනාගත ස්කන්ධය) පුබ්බන්තාපරන්ත (අතීත ස්කන්ධ හා අනාගත ස්කන්ධ) ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නධම්ම (ප්‍රත්‍යය හා ප්‍රත්‍යය බලයෙන් හටගත් දැය) යනු අට තැන යි.

## 26 — 30

**තං**: ඒ ක්ෂීණාශ්‍රවයා. රහත්හු පින් කරති. එහි විපාක නැති. ඒවා කරන සිත් ක්‍රියා මාත්‍ර බැවින් ක්‍රියා සිත් නම් වෙයි.

## 26 — 36

**උපධි**: ඛන්ධ කිලෙස අභිසඞ්ඛාර කාමගුණ වසයෙන් උපධි සතරකි. රූප වෙදනාදි පඤ්චස්කන්ධය, අවිද්‍යා තෘෂ්ණා ආදි කෙලෙස්, කුසලාකුසල චෙතනා, රූපාදි පඤ්චකාම යන මොහු සත්ත්වයා දරන්නුයි උපධි නම්.

## 26 — 37

**චුති උපපත්ති**: චුති චිත්තය හා ප්‍රතිසන්ධි චිත්තය දිවැසින් දක්නට නොහැක්ක. එහෙයින් මෙහි චුතිචිත්තානන්තරය හා ප්‍රතිසන්ධිචිත්තානන්තරය ගත යුතු.

## 26 — 41

**සග්ගාපායං**: සවිසි වැදෑරුම් ස්වර්ගීය ද, සතර අපාය ද. මෙයින් දැක්වේ. සවිසි ස්වර්ග නම්: කාමස්වර්ග සය ද, බ්‍රහ්මලෝක නවය ද, සුද්ධාවාස පස ද, අරූපභව සතර ද, අසඤ්ඤසත්ත තලය ද, වේහප්ඵලය ද යන මොහු ය. සතර අපාය නම්: නිරය, තිරිසන්යෝනිය, පෙත්තිවිසය, අසුරකාය යන මොහු ය.

**අභිඤ්ඤා වොසිතො**: විශිෂ්ට ඥානයෙන් දතයුතු මාර්ගඵලධර්මයන් විශෙෂයෙන් දැන, පිරිසිඳ දතයුතු පඤ්චස්කන්ධය පිරිසිඳ දැන, ප්‍රහාණ කටයුතු සමුදය සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහාණය කොට, ප්‍රත්‍යක්ෂ කටයුතු නිරෝධය (නිවණ) ප්‍රත්‍යක්ෂ කොට, වැඩිය යුතු මාර්ග සත්‍යය වඩා, සිවු මගින් අවසන් කළ කටයුතු ඇත්තේ විශිෂ්ටඥානයෙන් දැන නිෂ්ඨාවට පැමිණියේ නම් වෙයි.

**ධම්මපද උපග්‍රන්ථය නිමි.**

# උදානපාළි උපග්‍රන්ථය

(මෙහි අඞ්කයෝ වර්ගය හා සූත්‍රය ඇඟවීම පිණිස වෙති.)

**උදාන**: බඳුනකට වත් කළ දිය එයින් දැරිය හැකි පමණ ඉක්මුණු විට පිටතට වැගිර යෙයි. එසේ ම ප්‍රීතිවේගයෙන් හෝ ධර්මසංවේගයෙන් හෝ නැංවුණු විතර්කවිචාරය සිතෙහි රැඳී සිටියැ නො හෙන තරම් අධික වූයේ වාග්ද්වාරයෙන් නික්මෙයි. එය අසා පිළිගන්නන් අපේක්ෂා කොට කියැවෙන්නක් නො වෙයි. කිසි තැනෙකැ වාක්‍ය විසින් ද, කිසි තැනෙකැ ගාථාබන්ධන විසින් ද නික්මුණු ඒ වචන **උදාන** නම්. මේ ලොව්තුරු බුදුරජුන් විසින් වදළ උදන් යැ, පසේබුදුවරුන් වදළ උදන් යැ, ශ්‍රාවකභාෂිත උදන් යැ යි තුන් වැදෑරුම්.

**සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං** ඈ විසින් (සුත්තනිපාත) ඛග්ගවිසාණ සුතුරෙහි ආයේ පසේබුදුරජුන්ගේ උදන් යැ. ථෙරගාථා ථෙරීගාථා දෙකෙහි බොහෝ තැන ශ්‍රාවකභාෂිත උදාන වෙයි.

මේ හැර සක්දෙව් ඈ දෙවියන් විසින් **අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතං** ඈ විසින් ඇනූ උදන් ද, **නමො තස්ස** භගවතො ඈ විසින් ආරාමදණ්ඩ බමුණු ඈ මිනිසුන් විසින් ඇනූ උදන් ද තුන් සංගීතිනට නැංවුණාහු ඇත් මය. එයින් 'උදාන' නමින් මෙහි ගැණෙනුයේ ලොව්තුරා බුදුරදුන් වදහළ උදන් ම ය. **තෙවලා** බුදුවදන් සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල යි අඞ්ග නවයෙකින් යුක්ත යැ. මේ ශාසනාඞ්ග නවයෙහි උදාන අඞ්ගයට මෙකී උදාන පාළිය අයත් යැ.

**ආනන්ද** මහතෙරුන් විසින් පළමු සඟියට (සඞ්ගීතියට) නැංවුණු මේ උදන් පෙළ මුචලින්දවග්ගාදි වර්ග විසින් අටක් ඇත්තේ ය. සුතුරු විසින් අසූ සුතුරෙකින් සඞ්ගෘහීත ය.

## 1 — 1

**උරුවෙලා** (උරුවෙල් දනව්ව) – මහවැලිගොඩ යනු මෙයට මහවෙහෙර පරපුරැ දුන් අරුත යි. බුදුරජුන් පහළ වන්නාට පෙර බොහෝ තවුසෝ මෙහි වුසුවෝ ල. ඔහු තමන් සිත සඳෙස් කල්පනාවක් නැංග විට තමනට දඬුවම් විසින් කුඩයෙකින් වැලි ගෙනවුත් දමත්. කලක් ගිය විට එය මහවැලි රැසෙක් විය. එහෙයින් මේ මහවැලිගොඩ යන අරුතින් **උරුවෙලා** නම් වී ල.

මහායානිකාදීන්ගේ (සකු) බණ පොත්හි මෙය **උරුවිල්වා** යි දැක්වේ. මහ බෙලි ඇති පෙදෙස යනු එහි තේරුම යැ. අද දු මහ බෙලිපල වෙසෙසක් ගැන මෙය ප්‍රසිද්ධ ය.

**නෙරඤ්ජරා** (නිල්දලා හොය) – මඩ සෙවෙල් ඈ දොස් නැති බැවින් නෙලඤ්ජලා යි කියැ යුත්තෙහි මිනිසුන්ගේ වහරෙහි නෙරඤ්ජරා යී විය.

**සත්තාහං එකපල්ලඞ්කෙන** (සතියක් එක් පලඟින්) – බුදුරජ්ජු වෙසක් පුණු පොහෝ ද හිරු බස්නාට පෙරතු ව ම හුන් එක් පලඟින් සතියක් ම ගෙවූහ.

**පටිච්චසමුප්පාදං** (පිළිසසමුපා) - පටිච්චසමුප්පාද යනු ප්‍රත්‍යය ධර්ම යි. අවිද්‍යා ආදි ප්‍රත්‍යය (ඵලය උපදවනු සමත් හෙතු) දොළොස යි.

**අනුලොම පටිච්චසමුප්පාදං** (අනුලෝම පිළිසසමුපා)- අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ' යන ආදීන් වූ ප්‍රත්‍යයාකාරය (හෝ මුල පටන් කොට පැවැත්මට අනුකූල වැ ප්‍රත්‍යය වෙයි යන අවිද්‍යාදීහු) අනුලෝමපටිච්චසමුප්පාද නම්.

**අවිජ්ජාපච්චයා සංඛාරා** (අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති.)- මෙහි අවිජ්ජා නම්: දුඃඛාදි සතර සත්‍යයන්හි අනවබොධය යි.

සංඛාර (සංස්කාර) නම්: ලෞකිකකුශලාකුශල චෙතනා (කර්ම) යි. සිවුසස් පසක් නො කෙළේ සසර ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන කුශලාකුශල-කර්ම කෙරෙයි.

**සංඛාරපච්චයා විඤ්ඤාණං** (සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වේ.) - කුශලාකුශල චෙතනාහෙතුයෙන් එහි ඵලය වූ දෙතිස් විපාක විඥානය වේ.

**විඤ්ඤාණපච්චයා නාමරූපං** (විපාක විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ.)- මෙහි **නාම** යනු වෙදනාදි ස්කන්ධ තුන යි. රූප යනු භූතරූප උපාදායරූප විසින් ද්විවිධ වූ රූපස්කන්ධය යි.

**සළායතනං** (ෂඩායතන) - චක්ෂුරාදි සය යි.

**ඵස්ස** (ස්පර්ශ) - සිතෙහි අරමුණ හා ගැටෙන බව.

**වෙදනා** - සුඛ දුක්ඛ උපෙක්ඛා යි ත්‍රිවිධ වෙදනාව, අරමුණු රස විඳුම යි. සිතෙහි වන වෙදනා චෛතසිකය යි.

**තණ්හා** (තෘෂ්ණා) - කාමතණ්හා භවතණ්හා විභවතණ්හා යි ත්‍රිවිධ වූ ආශාව යි

**උපාදානං** - අරමුණු අත් නැර තරයේ ගැන්ම යි.

**භවො** (භවය) - කර්මභව උපපත්තිභව යී දෙවැදෑරුම් ය.

**ජාති** යනු: ඉපැද්ම යි.

මොවුන් ප්‍රත්‍යය වන සැටි විශුද්ධිමාර්ගයෙන් දත යුතු.

**ධම්මා** - බෝපැක්දහම්හු. බොධිපාක්ෂික ධර්මයෝ මෙ තැන ධම්ම නමින් දැක්වුණහ.

**සහෙතු ධම්මං** (සහෙතුක වූ දුඃඛස්කන්ධධර්මය) - දුක් ඇති වීමේ හෙතුන් එයින් ඇති වන දුක් රැසත් ය.

මේ සිවුසස් දහම්හු විවසුන් වඩන කල්හිත් මාර්ගඥානය උපදනා ක්ෂණ-යෙහිත් පහළ වෙත්. විවසුන් වඩන කල්හි ඒ විවසුන් නුවණ ද එය හා එක් වැ යෙදුණු සමෘති ආදි බොධිපාක්ෂික ධර්ම ද තදඞ්ගප්‍රහාණයෙන් ශුභසංඥාදිය දුරු ලමින් කායානුපස්සනාදි වශයෙන් වෙන් වෙන්ව තැවැත තැවැත පහළ වෙත්. මාර්ගක්ෂණයෙහි වනාහි නිවන් අරමුණු කොට සමුච්ඡෙද ප්‍රහාණයෙන් සතුරු කෙලෙසුන් ප්‍රහීණ කෙරෙමින් චතුස්සත්‍යයන් පිළිවිදිමින් එක් වරක් ම උපදිත්.

## 1 — 2

**පටිලොමපටිච්චසමුප්පාදං** (ප්‍රතිලොමප්‍රතීත්‍යසමුත්පාදය)- ප්‍රතිලොම නම් අවිද්‍යාදීන් කටහැකි කිස නො කිරීම සි, නැවැත්ම සි.

## 1 — 3

**මාරසෙනං** (මරසෙන්)- කාම, අරති, ඛුප්පිපාසා, තණ්හා, ථීනමිද්ධ, භීරුකතා, විචිකිච්ඡා, මක්ඛථම්භ, මිච්ඡාලද්ධ ලාභසක්කාර සිලොක, අත්ත-සමුක්කංසන පරවම්භන යන මෙ දස දහම්හු මෙ තැන දස මරසෙන් ය. (විස්තර මතු සුත්‍රනිපාතයේ පධාන සූත්‍රයෙන් දත්තේ යැ.)

## 1 — 4

**හුහුංකජාතික**-මේ බමුණු තෙම 'සුබ පෙර නිමිති දක්මෙන් සුබමඟුල් ද අසුබ පෙර නිමිති දක්මෙන් අසුබපල ද වෙති' යි හදහන දිට්ඨමංගලිකයෙකි. මාන වශයෙනුත් ක්‍රොධවශයෙනුත් තමාට නොරිසි දෑ දුක පිළිකුල් කරනුයේ 'හුහුං' යැ යි හඬ නඟමින් හැසිරී. එහෙයින් හුහුංකජාතික නම් වී. මේ බමුණු තෙම අප බුදුරජුන් බුදු වන්නට පෙර උරුවෙල්හි පස්වගමහණුන් ඔබට උවටැන් කරන කල්හි ඔවුන් සමග හැසුරුණෙකි. ඔවුන් කතා කරනු අසා අප බුදුරජුන් ගොයුම්ගොත් යැ යි දත්තේ ය.

**යතත්තො** (සංයත වූ සිතැත්තේ)- භාවනායෙහි යෙදුණු සිතැති, සිල්වත් බැවින් තැන්පත් වූ සිතැත්තේ.

**උස්සදා** (උත්සදයෝ)-රාග ද්වෙෂ මොහ මාන දිට්ඨි යන පස උස්සද නම් හ.

## 1 — 5

**සතො** (ස්මෘතිමත්ව)- එළැඹ සිටි සිහි ඇති වැ. අවසනට ම වැඩුණු සිහි ඇති බැවින් රූපාදි සාරම්මණෙහි ම, සිවු ඉරියව්හි ම සිහි නුවණින් යුත්. යන අර්ථයි.

## 1 — 6

**අනඤ්ඤපොසිං** (අනෙකකු පොෂණය නො කරන සුලු)- තමා විසින් පොෂණය කළ යුතු අනෙකකු නැති- හුදෙකලා වූ, තමා අයත් ම පැවැතුම් ඇති.

**සාරෙ පතිට්ඨිතං** (විමුක්තිසාරයෙහි පිහිටි)- රහත්පලයට පැමිණි.

## 1 — 7

**සකෙසු ධම්මෙසු** (ස්වකීය ධර්මයන්හි)- මෙහි ස්වකීය ධර්ම නම්: තමහට වැඩ කැමැතියහුගේ ශීල සමාධි ප්‍රඥා විමුක්ති ඥානදර්ශනයෝ යැ.

**පාරගූ** (පරතෙරට ගියේ)-ඒ ශීලාදියෙහි පරතෙරට යැම යනු ඒ සම්පූර්ණ කිරීම යැ. මෙහි ශීල යනු ලොවී ලොවුතුරු විසින් දෙවැදෑරුම් යැ. එයින් පූර්වභාග ශීලය ලොවී සිල් නම. ඒ සැකෙවින් පාතිමොක්ඛසංවරාදි සිවු පිරිසිදු සිල් යැ ලොවුතුරා සිල් නම් මාර්ගශීල ඵලශීල විසින් දෙවැදෑරුම් යැ. එහි මාර්ගශීල යනු මාර්ග ක්‍ෂණයෙහි සිතැ ඇති වන මාර්ගාඞ්ග අට අතුරෙහි වූ සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන තුන් විරතීහු යැ. ඵලශීල යනු ඵලසිත්හි වූ තුන් විරතීහු යැ

සමාධි ප්‍රඥා දෙක ද ලොවී ලොවුතුරා විසින් ද්විවිධ යැ. උපචාරසමාධි ද අර්පණාසමාධි අට ද යන නව දෙන ලෞකික සමාධි නම. මග පල සිත්හි වූ සමාධීහු ලොකොත්තර සමාධි නම්හ. ශ්‍රුතමය චින්තාමය භාවනාමය වූ ආස්‍රව සහිත ප්‍රඥාව ලෞකික ප්‍රඥා නම. මාර්ග සම්ප්‍රයුක්ත වූ ද ඵලසම්ප්‍රයුක්ත වූ ද ප්‍රඥාව ලොකොත්තර ප්‍රඥා නම. විමුක්ති යනු ඵලවිමුක්තියත් නිවනත් යැ. එය ලොකොත්තර ම යැ. ඥානදර්ශන යනු එකුන්විසි පස්විකුම් නුවණ යැ. ඒ ලෞකික ම යැ. රහත්වීමෙන් මේ ශීලාදිය පිරිපුන් කෙළේ **පරතෙර ගියේ** නම් වේ.

## 1 — 8

**සඞ්ගා...මුත්තං** (සඞ්ගයෙන් මිදුණු)- සඞ්ග යනු රාග දෙස මොහ මාන දිට්ඨි යන පසය. මාර්ගක්ෂණයෙහි සමුච්ඡේද විමුක්තියෙන් ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි විමුක්තියෙන් ද ඒ සඞ්ගයන් කෙරෙන් මිදුණේ වෙයි.

## 1 — 9

**සච්චං ච ධම්මො ච** (සත්‍යයත් ධර්මයත්)- සත්‍ය යනු වාක්සත්‍යය (සත්‍යවචනය) විරති සත්‍යය (සම්මාවාචාවිරතිය) යන දෙක යැ. නැතහොත් ඥානසත්‍ය පරමාර්ථසත්‍ය දෙක යැ. ධර්ම යනු ආර්‍යමාර්ග ආර්‍යඵල දෙක යැ.

## 1 — 10

**දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති** (දක්නා ලද්දෙහි දක්නා ලද පමණෙක් වන්නේ ද)- ඇසට රූපයක් හමුවූ කල්හි පහළ වන චක්ෂුර්විඥානය දැකීම පමණක් කෙරෙයි. සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන සිත් ද පිළිවෙළින් ඒ රූපය පිළිගැනීම් විමසීම් නිශ්චය කිරීම් පමණක් ම කරයි. ඒ සිත්හි අරමුණ කෙරෙහි ඇලීමෙක්, අරමුණෙහි ද්වේෂයෙක් හෝ මුළාවෙක් නැත. අරමුණෙහි ඇලීම් (රාග) ආදිය ඇති වනුයේ වොත්ථපන සිතට පසු වැ පහළ වන ජවනයන්හි ය. රූපයෙහි එය දැකීම් පමණ ම සම්පටිච්ඡනාදි ප්‍රමාණය විනා එයට වැඩියෙන් ඇලීම් ආදියක් යම් සේ නො වන්නේ ද, (එසේ මා සතන්හි ජවනය උපදවන්නෙමි යි, මා ජවන සිත්හි රාගාදි කෙලෙස් පහළ නො වන සේ සන්තානය රක්නෙමි යි) මෙසේ මෙහි අර්ථ සැලැකිය යුතු ය. සුතමුතාදියෙහි ද මේ අර්ථය තැනට සුදුසු පරිදි යොදා ගත යුතු ය.

## 2 — 1

## 2 — 2

**ධම්මී වා කථා** (දැහැමි කථාව හෝ)- දැහැමි කථා යනු සිවුසස් දහම් පිළිබඳ කථා යැ. දශ කථාවස්තු පිළිබඳ කථා ද මෙහි ම ඇතුළත් ය.

**අරියො වා තුණ්හීභාවො** (ආර්‍ය වූ තුෂ්ණීම්භාවය හෝ)- **ආර්‍ය** යනු එකාන්ත හිත සුව ඵලවත, විශුද්ධ උතුම් වූ. **තුෂ්ණීම්භාව** යනු ශමථ විදර්ශනා භාවනාහි යෙදීම් වශයෙන් නිහඬ වැ ඉඳීම යි. ඇතැම්හු ද්විතීය ධ්‍යානය ද, අන් කෙනෙක් චතුර්ථධ්‍යානය ද ආර්‍යතුෂ්ණීම්භාව නමින් හඳුනත්.

## 2 — 4

**ඵුසන්ති ඵස්සා** (ස්පර්ශයෝ හැපීම කෙරෙත්)- මෙහි **ස්පර්ශයෝ** සුඛවෙදනා දුඃඛවෙදනා දෙකට කාරණයෝ යි. අදුක්ඛමසුඛ වෙදනාව (උපෙක්ෂා වෙදනාව) ද ශාන්ත බැවින් සුඛවෙදනාවෙහි ම ඇතුළත් ි.

### 2 — 5

**සඞ්ඛාතධම්මස්ස** (මනා කොට සිද්ධ කරන ලද මාර්ග ධර්ම ඇති)- සතර මාර්ගයෝ සඞ්ඛා (සංඛ්‍යා) නම් වෙති. එයින් කළ සොළොස් වැදෑරුම් මාර්ග කෘත්‍යය ඇත්තේ සඞ්ඛාතධර්ම නමි. කෘතකෘත්‍ය වූ ආර්‍ය්‍යපුද්ගලයා ය.

**සකිඤ්චනං** (පළිබොධ සහිත)- කිංචන යනු පළිබොධ යි. රාගාදිකෙලශ-පළිබොධ ද ආමිසපළිබොධ දැ යි ඒ දෙවැදෑරුම්. ඒ ද්විවිධ පළිබොධ ඇත්තේ සකිඤ්චන නමි.

### 2 — 8

**මච්චුරාජස්ස** (මෘත්‍යුරජයාගේ)- මරණයේ.

**පමත්තමතිවත්තති** (ප්‍රමාදී පුද්ගලයා ඉක්මැ යේ)- මෙහි ප්‍රමාදී පුද්ගලයා යනු එළැඹි සිටි සිහිය නැත්තා යි.

### 2 — 9

**සබ්බං පරවසං** (අනුන් අයත් සියල්ල)- තමාගේ යම් කටයුත්තෙක් අනුන් අයත් ද, තමා කැමැති සේ සිදු කරනු නොහැකි බැවින් එය තමහට දුකෙකි.

**සබ්බං ඉස්සරියං** (සියලු ඉසුරු බව - මේ ලොවී ලොවුතුරා විසින් ද්විවිධ යැ. **ලොවී ඉසුරු** බව යනු රජබව් ආදියත් ලෞකික ධ්‍යානාභිඥයෙන් නිපැද වූ සිතේ ඉසුරු බවත් ය.

**ලොවුතුරා ඉසුරු** බව යනු: මාර්ගඵලාධිගමහෙතුයෙන් ලබන දුඃඛ-නිරොධ සංඛ්‍යාත ඓශ්වර්‍ය්‍යය යි.

**යොගං** (කාමාදියොගයෝ)- කාමයොග භවයොග දිට්ඨියොග අවිජ්ජා-යොග යන සතර යොග නම්හ.

### 2 — 10

**දෙවා නානුභවන්ති දස්සනාය** (ක්ෂීණාස්‍රවයා දක්නට දෙවියෝ අසමර්ථ වෙත්)- රහත්හුගේ සිතේ පැවැත්ම දක්නට දෙවියෝ ද සමර්ථ නො වෙත්. මිනිසුන් ගැන කවර කථා ද? ශෛක්‍ෂ පුද්ගලයෝ ද රහතුන්ගේ චිත්ත-ප්‍රවෘත්තිය දකිනු නො හෙත්.

### 3 — 5

**ජඤ්ඤා නිබ්බානමත්තනො** (තමාගේ නිවන දත්තේ ය.)- කෘතකෘත්‍ය බැවින් මත්තෙහි කටයුත්තක් නැති බැවින් තමාගේ අනුපාදිශෙෂ නිර්වාණය ම හෙතෙම දත්තේ ය.

### 3 — 10

**උපධිං පටිච්ච දුක්ඛමිදං සම්භොති** (උපධි ප්‍රත්‍යයයෙන් මේ දුක් හට ගනී)- **උපධි** යනු සකන්ධ කෙලශ අභිසංස්කාර යන තුන ය. මොවුන් ඇති තැන මොක්ෂයෙක් නො වේ.

## 4 — 1

**අප්පිච්ඡකථා** (අල්පේච්ඡකථා)- ඉච්ඡා (ආශා) නැත්තේ අල්පේච්ඡ නම්. ඔහු පිළිබඳ වූ හෝ අල්පේච්ඡ බව පිළිබඳ වූ කථාව **අල්පේච්ඡකථා** නම්. මෙහි ඉච්ඡා වශයෙන් පුද්ගලයෝ චතුර්විධ යි. අත්‍රිච්ඡ, පාපිච්ඡ, මහිච්ඡ, අප්පිච්ඡ විසිනි. තමා ලත් පමණින් සෑහීමට නොපැමිණ මතුමත්තෙහි ලාභ කැමති වනුයේ **අත්‍රිච්ඡ** නම. අතෘප්තයා යි. ලාභසත්කාර කීර්ති කැමැති ව, නැති ගුණ ඇති සේ හඟවන කුහක තෙමේ **පාපිච්ඡ** නම. ලාභසත්කාර කැමැත්තේ තමා තුළ ඇති ගුණ ම පෙන්වනුයේ **මහිච්ඡ** නම. ඇති ගුණ පෙන්වන අදහසක් නැති, පසය පිළිගැන්මේ පමණ දත්තේ **අප්පිච්ඡ** (අල්පේච්ඡ) නම.

අල්පේච්ඡයා ද පච්චයඅප්පිච්ඡ, ධුතඞ්ගඅප්පිච්ඡ, පරියත්තිඅප්පිච්ඡ, අධිගම-අප්පිච්ඡ යැ යි සිව් වැදෑරුම්. සිව්පසයෙහි අල්පේච්ඡ තෙමේ **පච්චයප්පිච්ඡ** නම්. හේ ප්‍රත්‍යයදායකයා ද, දෙය්‍යධර්මය (දෙන දෑ) ද, තමාගේ ශක්තිය ද බලා පසය පිළිගනී. දියයුතු දෑ බොහෝ ඇතත් දායකයා දෙනු කැමැත්තේ ස්වල්පයක් ම නම්, ඔහු අදහස පරිදි ස්වල්පයක් ම ගනී. දියයුතු දෑ ස්වල්ප නම්, දායකයා බොහොවක් දෙනු කැමැත්තේ නුමුදු දෙය්‍යධර්මය බලා මදක් ම හේ පිළිගනී. දෙනු ලබන දෑ බොහෝ ඇතත් දායකයා බොහොවක් දෙනු කැමති වුවත් වැඩියක් නො ගෙන තමාට සෑහෙන පමණ ම පිළිගනී. මෙ වැනි මහණ හට නූපන් ලාභ ලැබෙයි. උපන් ලාභ වැඩෙයි. මේ **පච්චයාප්පිච්ඡ** නම්. තමා ධුතඞ්ග රක්නා බව දන්වනු නොකැමැත්තේ **ධුතඞ්ගඅප්පිච්ඡ** නම්. තමාගේ උගත්කම පෙන්වනු නොකැමැත්තේ **පරියත්තිඅප්පිච්ඡ නම්.** සෝවත්බව් ආදි තමා තුළැ වූ අධිගමය එක් ව වසන මහණුනට ද අඟවනු නො කැමැත්තේ **අධිගමඅප්පිච්ඡ** නම. මෙසේ වූ අල්පේච්ඡතාවේ ගුණ ද අත්‍රිච්ඡතාදියේ දොස් ද දක්වන කථාව **අප්පිච්ඡකථා** නම.

**සන්තුට්ඨිකථා**— ලද දෑයින් සතුට සන්තුට්ඨි නම. එය යථාලාභ-සන්තෝෂ යථාබලසන්තෝෂ යථාසාරුප්පසන්තෝෂ විසින් ත්‍රිවිධ යැ. එහි අගනා හෝ නො අගනා පසය ලැබ එයින් සතුටු වීම, අනෙකක් නොපැතීම **යථාලාභසන්තෝෂ** නම. පියෙවියෙන් දුබලවූයේ හෝ ලෙඩින් මහලු බැවින් මැඩුණේ හෝ බර සිවුරු ආදියක් දරනු නො හැක්කේ සභාග මහණකු හා මාරු කොට ලුහු සිවුරු ආදියක් ලබාගෙන එයින් යැපේ ද, මේ **යථාබල-සන්තෝෂ** නම. මහත් අගය ඇති පසය ලැබ මෙය මහතෙරුනට, බහුශ්‍රුත-යනට හෝ ගිලනුනට සුදුසු යැ යි එවැන්නහුට එය දී තමා මඳ අගය ඇති හෝ ස්වල්ප වූ හෝ දෑයෙකින් යැපේ ද මේ **යථාසාරුප්පසන්තෝෂ** නම්. එක එක පසයෙහි මෙසේ සන්තෝෂ තුන බැගින් සිව්පසයෙහි ම සන්තෝෂ දොළොසෙකි. මේ දොළොස් සතුටෙහි අගයත් අත්‍රිච්ඡතාදියේ දොසත් දක්වා කරන කථාව **සන්තුට්ඨිකථා** නම.

**ප්‍රවිවේකකථා**- නම්: විවේකය පිළිබඳ කථා යැ. කායවිවේක චිත්ත-විවේක උපධිවිවේක යැ යි විවේක තුනෙකි. ඉඳුම්, හිටුම් සැක්මුම් ආදිය එකලාව ම කරනුයේ ගණසඞ්ගණිකාවෙන් තොර වෙයි. මේ **කායවිවේක** නම. අටසමවත්හු **චිත්තවිවේක** නම්හ. නිවන **උපධිවිවේක** නම. මේ විවේක ම **ප්‍රවිවේක** නම. එය පිළිබඳ කථාව **ප්‍රවිවේකකථා** යැ.

**අසංසග්ගකථා** නම් කවර යත්: ශ්‍රවණසංසර්ග, දර්ශනසංසර්ග, සමුල්ලපනසංසර්ග, සම්භොගසංසර්ග, කායසංසර්ග යැ යි **සංසර්ගය** පංචවිධ යැ. මහණෙක් අසෝ තැනැ අභිරූප ස්ත්‍රියක් ඇතැ යි අසයි. එය සිතත් සිතත් ඔහු සිත කැලැඹෙයි, මහණදම් රකිනු නො හැකි වෙයි. ගිහිබවට පෙරළෙයි. මෙසේ ඇසීමෙන් වන කෙලශසංසර්ගය **ශ්‍රවණසංසර්ග** නම්. මහණහට ස්ත්‍රීරූපය ද මෙහෙණහට පිරිමිරුව ද දැ යි මෙසේ විසභාග අරමුණු දැකීමෙන් වන කෙලශසංසර්ගය **දර්ශනසංසර්ග** නම. ස්ත්‍රීපුරුෂයන් උනුන් හා කතාබස් කිරීම් සිනාසීම් ආදියෙන් වන කෙලශසංසර්ගය **සමුල්ලපනසංසර්ග** නම. මහණකුට ස්ත්‍රියක විසින් ද මෙහෙණකට පිරිමියකු විසින් ද දුන් දැයක් පරිභොග කිරීම් විසින් උපන් කෙලශසංසර්ගය **සම්භොගසංසර්ග** නම. මහණකු ස්ත්‍රියකගේ ද මෙහෙණක පිරිමියකු ගේ ද අත් සපර්ශ කිරීම් ඈ විසින් උපන් කෙලශසංසර්ගය **කායසංසර්ග** නම. මේ පැවිද්දනට නොසුදුසු වූ සංසර්ග හැර සසරෙහි කලකිරීම, සංස්කාරයන්හි දුඃඛ භයසංඥාව, සිරුරෙහි පිළිකුල් සංඥාව, සියලු අකුසල්හි පිළිකුල හා ලජ්ජා භය, හැම ක්‍රියාහි එළැඹ සිටි සිහිය යන මේ සියල්ල එළවා හැම තන්හි ම නොලග්නා බව **අසංසර්ග** නම. එය පිළිබඳ වූ කථාව **අසංසග්ගකථා** නම.

**වීර්යාරම්භකථා**-- අකුසල් දුරු ලනුවට කුසල් උපදවනුවට වැර දැරීම **වීර්යාරම්භ** නම. මේ කායිකවීර්ය චෛතසිකවීර්ය යි ද්විවිධ යැ. ඒ ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු යැ යි ත්‍රිවිධ යැ. සම්‍යක්ප්‍රධානාදි විසින් චතුර්විධ යැ. ඒ පිළිබඳ කථාව **වීර්යාරම්භකථා** නම.

**ශීලකථා** නම්: සිල් පිළිබඳ කථා යැ. ශීලය ලොවිලොවුතුරු විසින් දෙවැදෑරුම් යැ. ප්‍රාතිමොක්ෂසංවරාදි සිවුපිරිසිදු සිල් ලොවිසිල් යැ. මාර්ගශීල ඵලශීල ලොවුතුරා සිල් යැ.

**සමාධිකථා**- විදර්ශනාවට පාදක වූ උපචාරසමාධිය ද අටසමවත්හු ද ලෞකික සමාධි නම. මාර්ගසම්ප්‍රයුක්තසමාධිය ලොකොත්තරසමාධි නම. මේ ද්විවිධසමාධි ප්‍රතිසංයුක්ත කථාව **සමාධිකථා** නම.

**ප්‍රඥාකථා** නම්: විදර්ශනාප්‍රඥා මාර්ගප්‍රඥා ඵලප්‍රඥා පිළිබඳ කථා යැ.

**විමුක්තිකථා** නම්: ආර්යඵල විමුක්ති ද නිවන ද පිළිබඳ කථා යැ. අන්හු තදඞ්ගවිමුක්ති විෂ්කම්භණ විමුක්ති සමුච්ඡෙද විමුක්තීන් පිළිබඳ කථා ද මෙහි ඇතුළත් කෙරෙත්.

**විමුක්තිඥානදර්ශනකථා**- විමුක්තිඥානදර්ශන නම්: එකුන්විසි වැදෑරුම් පස්විකුම් නුවණ යැ. ඒ පිළිබඳ කථා **විමුක්තිඥානදර්ශන කථා** නම.

**අසුභා** (අශුභභාවනාව)- එකොළොස් වැදෑරුම් අසුභ අරමුණු අතුරෙන් යම් එකෙක සුදුසු පරිදි කමටහන් වැඩීම.

**අස්මිමානසමුග්ඝාතාය** (අස්මිමානය නසනු පිණිස)- **අස්මිමාන** නම්: මම් ඔහු හා සමයෙමි යන ආදීන් කැරෙන නවවිධ මානය යැ.

## 4 — 2

**මිච්ඡාදිට්ඨිගතෙන** (මිථ්‍යාදෘෂ්ටිය වැදගත්)- ශාශ්වත දෘෂ්ටියෙන් හෝ උච්ඡේදදෘෂ්ටි යැ වැදූ ගෙන දූෂිත වූ.

**වසං මාරස්ස ගච්ඡති** (මරහු වශයට යෙයි)- මෙහි මරහු යනු කෙලශ ස්කන්ධ අභිසංස්කාර මෘත්‍යු දෙවපුත්‍ර යන පස් මරුහු ම ය.

**සම්මාසංකප්පගොචරො** (සම්‍යක් සඞ්කල්පනා ගොදුරු කොටැත්තේ)- ධ්‍යානාදි සම්ප්‍රයුක්ත සම්‍යක්සංකල්පය ම තම සිතට ප්‍රවෘත්තිස්ථානය (පවත්නා තැන) කොට ඇත්තේ.

## 4 — 3

**පාපියො නං තතො කරෙ** (වරදවා පිහිටුවන ලද සිත ඔහු එයටත් වඩා පාපතරයකු කරන්නේ ය)- මේ වස්තුවෙහි දක්වුණු නන්ද ගොපාලක තෙම සෝවත් වූ ආර්‍යශ්‍රාවකයෙකි. ඔහුට විද මැරීමෙන් ඒ පුරුෂයා ආනන්තර්‍යයී අකුශලයක් බඳු බහල වූ අකුසල් රැස් කෙළේ ය. එබැවින් සතුරන් විසින් කට හැකි අනර්ථයට වඩා ඝොර වූ අවැඩ වරදවා පිහිටුවන ලද සිත් තෙමේ කරන්නේ ය.

## 4 — 4

**පංසුපිසාචකම්පි** (පාංශුපිශාචයකුදු)- කසලගොඩ ආදි තැනැ ගැවැසෙන කුඩා ප්‍රෙතවිශෙෂයය පාංශුපිශාචක නමි.

## 4 — 6

**ආරඤ්ඤකො** (ආරණ්‍යක වූ)- ග්‍රාමාන්ත සෙනස්න හැර වෙනෙහි විසන.

**පිණ්ඩපාතිකො** (පිණ්ඩපාතික වූ)- පිඩු සිඟීම ව්‍රත කොටැති.

**පංසුකූලිකො** (පාංශුකූලික වූ)- අයිති තැනැත්තවුන් විසින් ඉවත ලන ලද වස්ත්‍රයෙන් කළ සිවුර පාංශුකූල නමි. එය ම දරන ස්වභාව ඇතියේ පාංශුකූලික යැ.

**තෙචීවරිකො** (ත්‍රෛචීවරික වූ)- සඟළසිවුර, උතුරුසඟ, හඳනය යන තුන තුන්සිවුරු නම. එය දරන ස්වභාව ඇතියේ ත්‍රෛචීවරික යැ.

**ධුතවාදො** (ධුතවාද වූ)- ධුතධර්ම තෙමේත් සමාදන් කොට ගෙන වසන අනුනටත් සමාදන් කරවන තැනැත්තේ ධුතවාද නම. ධුතධර්ම නම්: කෙලෙස් නසා ලන දහම් යැ.

## 4 — 7

**අධිචෙතසො** (අධිචිත්තයෙන් යුක්ත)- අධිචිත්ත නම්: හැම සිත්වලට ම වැඩි තරම් වූ රහත්පල සිත යැ.

**මොනපථෙසු** (මෞනපථයන්හි)- මෞනපථ නම්: අර්හත්ත්වමාර්ගඥාන, සත්තිස් බෝපැකි දහම්, හෝ ත්‍රිශික්ෂා යන මොහු ය. මෙයින් පූර්වභාගප්‍රති-පත්තිය දැක්විණ.

## 5 — 7

**කඞ්ඛාවිතරණවිසුද්ධිං** (කාංක්ෂාවිතරණවිශුද්ධිය)- බුද්ධාදි අට තන්හි සැක දුරු ලනුයෙන් මාර්ගප්‍රඥව මෙ තන්හි **කාංක්ෂාවිතරණවිශුද්ධි** නම.

## 5 — 10

**ඨිතෙන කායෙන** (මනා වැ සිටි කයින්)- සංවර කොට ගත් කයින්. මෙයින් ශීලසංවරය දක්විණ.

## 6 — 1

**ඉද්ධිපාද** (සෘද්ධිපාදයෝ)- සෘද්ධි යනු සමෘද්ධිය යැ හරි යැම යැ. භාවනා පුරුදු කැරුමෙන් උපදවනු ලබනු ධ්‍යාන අභිඥා මාර්ග ඵල යන මේ සියලු මහද්ගත ලොකොත්තර ධර්ම සෘද්ධි යන්නෙන් ගැනේ. ඒ ද ලබනුවට ප්‍රධාන වශයෙන් උපකාර වන බලවත් වූ ඡන්ද චිත්ත විරිය විමංසා යන සතර සෘද්ධිපාදයෝ යැ. සෘද්ධිකොටස් ද සෘද්ධි ලබනුවට ප්‍රතිෂ්ඨා වූ ධර්ම ද සෘද්ධිපාද නම.

**කප්පං වා** (ආයුෂකල්පයක් හෝ)- මේ කාරණයෙහි මහාසීව තෙරුන්ගේ මතයෙක් අටුවාහි මෙසේ දක්වෙයි: "බුදුවරුන්ගේ ශක්‍යතන්හි හෙරුවුමෙක් නම් නැති. බේලුව ගමැ දී පහළ වූ මාරණාන්තික වේදනාව යම්සේ දසමසක් මැඩැ පැවැත්වූහු ද එසේ ම පුන පුනා ඒ සමවතට සමවැද එය මැඩ පවත්වන්නාහු මේ මහාභද්‍රකල්පය මුළුල්ල ම සිටිනු හැක්කාහ."

**යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො** (මරහු විසින් මඩනා ලද සිතැත්තක්හු සේ)- මෙහි මාර යනු දෙවපුත්‍රමාරයා ය පරනිර්මිතවසවර්ති දෙව්ලොවැ වැසි දමරික දෙව්පුත් ය. හේ අනඳ තෙරුනට බිහිසුණු අරමුණක් පෙන්වී ය. තෙරණුවෝ එයට සිත යොමු කළෝ භාග්‍යවතුන් වහන්සේ වදළ බස වටහා ගත නුහුණු වූහ.

252 පිට. **වියත්තා** (ව්‍යක්ත)- ආර්‍යමාර්ගාධිගම වශයෙන් ව්‍යක්ත වූ,

**විනීතා** (විනීත)- කෙලෙස් දුරුලීම් විසින් විනීත වූ,

**විසාරද** (විශාරද)- සාරජ්ජය (තැති ගැන්ම) ඇති කරන දිට්ඨි විචිකිච්ඡා ආදි කෙලෙසුන් ප්‍රහීණ කිරීමෙන් විශාරද වූ.

**බහුස්සුතා** (බහුශ්‍රුත)- තෙවළාදහම් බොහෝ අසා දත උගත්.

**ධම්මධරා** (ධර්මධර)- තෙවළාදහම් සිතැ ලා දරණ.

**ධම්මානුධම්මපටිපන්නා** (ධර්මානුධර්මප්‍රතිපන්න)- ආර්‍යධර්මයට අනුකූල ධර්ම වූ විදර්ශනාභාවනාධර්මයට පිළිපන්.

**සාමීචිපටිපන්නා**- ඥානදර්ශනවිශුද්ධියට නිසි විශුද්ධිපරම්පරාප්‍රතිපත්තියට පිළිපන්.

**අනුධම්මචාරිනො** (අනුරූප ධර්මයෙහි හැසිරෙන සුලු)- කෙලෙස් තුනී කිරීමට සමත් සේ වූ අල්පෙච්ඡතාදි ධර්ම පුරන සුලු.

## 6 — 4

**සස්සතො ලොකො** (ලොව ශාශ්වත ය)- මෙහි 'ලොව' යනු ආත්මය යි. 'එය නිත්‍ය ය, සදාභාවී ය' යනු ඇතැම් කෙනකුන්ගේ දෘෂ්ටිය යි.

**අන්තවා ලොකො** (ලොව අන්තවත් ය)- ආත්මය කෙළවරක් (සීමාවක්) ඇත්තෙක' යනු ඇතැමුන්ගේ දෘෂ්ටිය මෙයින් දැක්විණ. සමහරු ආත්මය ශරීරය පමණ ම මහත් යැ යි ද, සමහරු ආත්මය මහපටැඟිල්ලක් තරම් යැ යි ද, සමහරු එය ඒ ඒ අවයව තරම් මහත් යැයි ද, සමහරු පරමාණු-වක් තරම් යැ යි ද සලකත්. 'ලොව අනන්තවත් ය' යනුවෙන් ඔවුන්ගේ දෘෂ්ටිය දැක්විණ

**අනන්තවා ලොකො** (ලොව අනන්ත ය)- 'ආත්මය අසීම ය, හැම දෙයෙක ම හැම තැනැ ම පැතිර ඇතැ' යි යන දෘෂ්ටිය මෙයින් දැක්විණ. මේ දෘෂ්ටිය ලොව පහළ කළෝ **කපිල කණාද** ආදි ඍෂිවරු ය.

**තං ජීවං තං සරීරං** (ජීවයත් ශරීරයත් දෙක ම එකෙක් ය)- 'ආත්මය රූපවත් ය' යන ආජීවිකාදීන්ගේ දෘෂ්ටිය මෙයින් දැක්විණ

**අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං** (ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙක)- මෙයින් ආත්මය අරූපී ය'' යන දෘෂ්ටිය දැක්විණ

**හොති තථාගතො පරම්මරණා** (ආත්මය මරණින් මතු ඇත)- මෙහි **තථාගත** යනු කාරක වෙදක නිත්‍ය ධ්‍රැව පදාර්ථය යි එ නම්: ආත්මය යි. එය මරණින් මතු නිත්‍ය ව පවතී යි ඇතැම්හු සිතත්. මෙයින් සංඥීවාද සොළොස ද අසංඥීවාද අට ද නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද අට ද දැක්විණ

**න හොති තථාගතො පරම්මරණා** (ආත්මය මරණින් මතු නො වෙයි)- මෙයින් උච්ඡෙදවාදය දැක්විණ.

**හොති ච න හොති ච තථාගතො පරම්මරණා** (ආත්මය මරණින් මතු ඇත්තේත් නැත්තේත් වේ)- මෙයින් එකච්චසස්සතවාදත් සඤ්ඤීවාද සතත් දැක්විණ

**නෙව හොති ච න න හොති ච තථාගතො පරම්මරණා** (ආත්මය මරණින් මතු නො ම ඇත්තේත්, නොම නැත්තේත් නො වේ)- මෙයින් අමරාවික්ෂෙපිකවාද දැක්විණ.

## 6 — 5

**අපස්සා'ව තමොගධං** (ඒ නිවනට නො පැමිණ ම)- මෙහි 'තමොගධං'' යනු 'තං ඔගධං' යි විග්‍රහ වේ. **ඔගාධං** යි කියැ යුතු තැන හ්‍රස්ව **කොට** **ඔගධං** යි කියන ලදී. ''ඔගාධන්ති පතිට්ඨහන්ති එතෙන එත්ථ වා'ති ඔගාධං' යනු අටුවා හෙයින් පිහිටා සිටීමට උපකාර වූ ධර්මය (හෙවත් ආර්‍ය්‍යමාර්ගය) ද පිහිටා සිටුනා තැන (හෙවත් නිවන) ද මෙහි ඔගාධ යන්නෙන් කියන ලදී.

## 6 — 6

**දිට්ඨීසු සාරම්භකථා සංසාරං නාතිවත්තන්ති** (දෘෂ්ටිවිෂයයෙහි විරොධ-කථාව සසර නො ඉක්මවයි)- තමා ගත් දෘෂ්ටිය ම සරි යැ යි සෙස්සන් ගත් දෘෂ්ටිය වැරදි යැයි මෙසේ බැණුම් දෙඩුම් විසින් කලහ විසින් කරන විරොධ කථාව සත්ත්වයන් සසරැ යවන අවිද්‍යාතෘෂ්ණා දුරු ලීමට සමත් නො වෙයි.

## 7 — 5

**නෙලඞ්ගො** (නිදෙස් මං ඇති) – **එල** යනු දෝෂය යි. දෙස් නැතියේ **නෙල** නම්. පිරිසිදු සිල් යැ. ඒ 'නෙලය හෙවත් පිරිසිදු සිල් නැමැති අග්‍රාංගීය ඇති' යන අරුත නෙලඞ්ගො යන්නෙන් කියන ලදී.

**සෙතපච්ඡාදො** (සුදුවැසුම් ඇති) – **පච්ඡාද** යනු රිය මතැ අතුරන කම්බිලාදියයි. 'අර්හත්ඵලවිමුක්තිය නැමැති සුදු කම්බලය ඇති' යනු මෙයින් කියන ලදී.

## 7 — 7

**පපඤ්චසඤ්ඤාසඞ්ඛාපහානං.** (ප්‍රපංචසහගත සංඥා කොට්ඨාසයන්ගේ ප්‍රහාණය) – **මෙහි ප්‍රපංච** යනු ක්ලේශයෝ යි. විශේෂයෙන් රාග ද්වේෂ මෝහ දෘෂ්ටි මාන යන මේ කෙලෙස්හු යැ. යම් චිත්තසන්තානයෙක මොහු පහළ වෙත් ද, එය මොහු බොහෝ කල් සසර තවතා තබත්. එබැවින් සත්ත්වයන් බොහෝ කල් සසර තවතා තබන්නෝ ය යන අරුතෙන් ප්‍රපංච යනු තෘෂ්ණාදි ක්ලේශයෝ යැ. තව ද ප්‍රපංච යන්නෙහි 'සිත්සතන් කෙලෙසන දෑ ය, සිත්සතන්හි වූ කසල යැ' යන තේරුම් ද ඇත.

ඒ ප්‍රපංචයන් හා සහගත සංඥාව **ප්‍රපංචසංඥා** නම්. සංඛා (සඞ්ඛ්‍යා) යනු භාගයෝ ය, කොටස් ය. නිමිති සහිත ව ඒ ඒ ප්‍රපංචයට පක්ෂ වූ ක්ලේශරාශිය යි.

මෙහි ප්‍රපංචයන්ගේ නිමිති දත යුතු. රාගප්‍රපංචයට ශුභසංඥා නිමිත්ත යැ. ද්වේෂප්‍රපංචයට ආඝාතවස්තු නිමිති යැ. මෝහප්‍රපංචයට ආස්‍රවයෝ නිමිති යැ. තෘෂ්ණාප්‍රපංචයට වේදනාව ද, දෘෂ්ටිප්‍රපංචයට සංඥාව ද, මානප්‍රපංචයට විතර්කය ද නිමිත්ත වේ

**සන්දානං** (සන්දානය) – දම්වැල. මෙහි තෘෂ්ණාදෘෂ්ටි දෙක සන්දාන නම්. සසර සතුන් බැඳෙනුයේ මෙයිනි. එබැවින් මොහු බන්ධන වැනි නු යි මෙහි **සන්දාන** යැ යි කියන ලදී.

**පළිඝං** (පළිඝය) – නිවන්පුර යනු නො දී එයට බාධක වැ සිටින පළිඝයක් (කණුයමක්) වැනි බැවින් අවිද්‍යාව පළිඝයෙකැයි මෙහි කියන ලදී.

## 8 — 1

**තදායතනං** ( ඒ ආයතනය) – මෙයින් නිවන කියන ලද. ආයතන යනු **කාරණය** යි. චක්ෂුර්විඥානාදීනට රූපාදීන් මෙන් නිවන ගෝත්‍රභූඥාන මාර්ග-ඥාන ඵලඥානයට අරමුණු වෙයි. ඒ ඥානයනට කාරණ වන නිවණ පරමාර්ථ වශයෙන් විද්‍යමාන ධර්මයෙකි. හුදු ශූන්‍යතාවෙක් නො වෙයි.

## 8 — 7

304 පිට. **සුඤ්ඤාගාරං පාවිසි** (ශූන්‍යාගාරයට පිවිසි සේක) – ශූන්‍යාගාර යැ යි කියැ යුතු වෙන ම ගෙයෙක් එහි නො වී ය. උවසුවෝ බුදුරදුන් සඳහා ඒ ආවාසයෙහි ම එක් පසෙකැ වටා තිර ඇඳ උඩින් වියන් බැඳ එහි තුළ කැප ඇඳක් පණවා කාමරයක් මෙන් පිළියෙල කොට තැබූහ. මෙහි ශූන්‍යාගාරයැ යි දැක්වුණේ එය යැ.

# ඉතිවුත්තකපාළි උපග්‍රන්ථය

(මෙහි අඞ්කයෝ නිපාතය- වර්ග සූත්‍රය ඇඟවීම පිණිස වෙති.)

**ඉතිවුත්තකපාළිය** සූත්‍රපිටකයෙහි කුද්දගත්සඟියට අයත් ග්‍රන්ථ අතුරෙන් සතරවැන්න යැ. සුත්තගෙය්‍යවෙය්‍යාකරණාදි ශාස්තෘශාසනයේ නවාඞ්ග අතුරෙන් සවැන්න ය. මෙහි සූත්‍ර එක්සිය දොළොසෙක. අන් බ්‍රහ්මජාල සූත්‍රාදියෙහි **එවං මෙ සුතං** යන ආදියෙන් නිදානය තබන ලද නමුත් මේ ඉතිවුත්තකයෙහි **වුත්තං හෙතං භගවතා** ආදීන් නිදානය තැබිණ. ඒ කවර හෙයින යත්: ශාස්තෘන් වහන්සේගේ අදහස දන්නා ධර්මසංග්‍රාහක මහතෙරහු ශාස්තෘශාසනයෙහි 'ඉතිවුත්තක' අඞ්ගයට අයත් සූත්‍ර මොහු යැ යි දත්තාහු ඒ බව හඟවනු වස් 'වුත්තං හෙතං භගවතා' යන ආදීන් නිදානය තැබූහ යි අටුවාඇදුරෝ කීහු.

අටුවා ඇදුරන්ගෙන් අන්‍ය වූ ඇතැම් කෙනෙක් මෙය බුදුරජුන් සාමාවතී දේවීන් ප්‍රමුඛ පන්සියක් පමණ ආර්‍යශ්‍රාවිකාවනට වදාළ දහම් ඛුජ්ජුත්තරාව ඉගෙන දෙසූ බවත් ඇයගෙන් මෙහෙණින් ඉගෙන දුරූ බවත් මෙසේ පරම්පරායෙන් භික්ෂූන් අතුරෙහිත් ඇය තැබූ නිදානය ප්‍රකට වූ බවත් අනඳ තෙරුන් ද ප්‍රථමධර්මසංගීතියේදී එ පරිද්දෙන් ම ඒ නිදානය වදහළ බවත් කියත්.

එහෙත් මෙහි පිළිගත යුත්ත නම් "ධර්මසංගීතිකාරක මහතෙරුන් තමනට සුදුසු යැ යි හැඟී ගිය පරිද්දෙන් කිසි තැනෙක **එවං මෙ සුතං** යී ද, කිසි තැනෙක **එකං සමයං** යැ යි ද, කිසි තැනෙක ගාථාබන්ධන විසින් ද, නිදානය තැබූහ. කිසි තැනෙක කිසි ම නිදානයක් නොතැබූහ." යනු යි.

## 1. 1. 1

**එකං ධම්මං** (එක් ධර්මයක්) - මෙහි **ධර්ම** යනු ස්වභාව යි. **එක් ධර්මයක්** යනු' එක් සංක්ලෙශස්වභාවයක්' යැ යි අරුත් ගත යුතු

**පජහථ** (පහ කරවු)- පහ කිරීම (ප්‍රහාණය) පස්වැදෑරුම්. **තදඞ්ගප්‍රහාණ** විෂ්කම්භනප්‍රහාණ සමුච්ඡේදප්‍රහාණ ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ නිඃශරණප්‍රහාණ විසිනි. අලෝභාදියෙන් ලෝභාදිය ද නාමරූප පිරිසිඳ බැලීම් ආදීන්ගෙන් විදසුන් නුවණින් සක්කායදිට්ඨි ආදිය දූ යි ඒ ඒ කුශලාඞ්ගයන් පහළ වන වන **ක්ෂණයෙහි** එයට විරුද්ධ වූ අකුශලාඞ්ග පහ වීම **තදඞ්ගප්‍රහාණ** යි. උපචාරසමාධියෙන් හෝ අර්පණාසමාධියෙන් නීවරණයන් පහ කිරීම (මැඩැලීම) **විෂ්කම්භනප්‍රහාණ** යි. සතර ආර්‍යමාර්ගයෙන් ඒ ඒ **කෙලෙසුන්** නැවැත නො හටගන්නා පරිදි මුලින් සිඳැලීම **සමුච්ඡේදප්‍රහාණ** යි. දික් කලක් සන්තානයෙහි කෙලෙස් ඇති වීමෙන් වූ පීඩාව **ඵලක්ෂණයෙහි** සංසිඳීම **ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ** යි. සියලු සංස්කෘතධර්මකෙරෙන් මිදුණු නිවන **නිඃශරණ-ප්‍රහාණ** යි.

මේ ප්‍රහාණපසින් මෙහි **'පහ කරවු'** යන්නෙන් සමුච්ඡේදප්‍රහාණය කියන ලදි.

1. 1. 4

**කොධං** (ක්‍රොධය) - මෙහි දෙවෙනි සූත්‍රයෙහි කියන ලද ද්වෙෂය ම මෙහි **කොධ** යන්නෙන් දක්විණ. අසත්තන්ගේ අදහසට සරි ලන පරිදි පදවශයෙන් වෙනස් කොට වදාළ බව මුත් අර්ථ විසින් ද්‍වෙස (ද්වෙෂ) යනුත් **කොධ** (ක්‍රොධ) යනුත් **එකෙක්** ම ය.

1. 1. 5.

**මක්ඛං** (මකුබව) - මකුබව යනු අනුන්ගේ ගුණ මැකීම යි. මේ මෙරමා ගුණ මකා ලන අයුරින් පවත්නා දෙම්නස් සහගිය චිත්තොත්පාදය යි.

1. 1. 6.

**සබ්බං** (සියල්ල) - විපස්සනාවට අරමුණු වූ **තුන්** භූමියට අයත් දෑ මෙහි 'සියල්ල' නම්.

**අපරිජානං** (සම්ප්‍රකාරයෙන් **දැන** නොගන්නේ) - මෙහි සම්ප්‍රකාරයෙන් දැන ගැන්ම යනු හැම අයුරින් ම **පිරිසිඳ** දැන ගැන්ම යැ, තුන් පරිඥයෙන් දැනගැන්ම යැ. තුන් පරිඥ නම්: ඥාතපරිඥා තීරණපරිඥා ප්‍රහාණපරිඥා යන තුන ය. නාමරූපයන් **ලක්ෂණ** රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන විසින් වෙන් කොට දැන ගන්නා, කර්ම අවිද්‍යා ආදි ප්‍රත්‍යයයන් පිරිසිඳ දන්නා නුවණ **ඥාතපරිඥා** නම. මෙසේ දැන ඒ සියල්ල අනිත්‍ය විසින් දුක් විසින් රොග විසින් දෙසාළිස් අයුරෙකින් තීරණය කොට දැන ගැන්ම **තීරණපරිඥා** නම. මෙසේ තීරණය කොට රහත්මඟින් සියලු ඡන්දරාගය නසයි. මේ **ප්‍රහාණපරිඥා** නම. දිට්ඨිවිසුද්ධි කඞ්ඛාවිතරණවිසුද්ධි දෙක **ඥාතපරිඥා** නම. මග්ගාමග්ගඥාණ පටිපදාඥාණ විසුද්ධි දෙක කලාප-සම්මසනය පටන් කොට අනුලොමඥාණය අවසන් (කොට ඇති ප්‍රඥව හෝ) **තීරණපරිඥා** නම. ආර්‍ය්‍යමාර්ගයෙන් කෙලෙස් නැසීම **ප්‍රහාණපරිඥා** නම. මෙ තන්හි ඥාතපරිඥා තීරණපරිඥා දෙකින් පිරිසිඳ දැනීම අභිප්‍රෙත යැ.

1. 2. 4.

**න සමනුපස්සාමි** (නො දනිමි) - සමනුපස්සනාව (දැකීම) දෙවැදෑරුම්. දිට්ඨිසමනුපස්සනා ඥාණසමනුපස්සනා විසිනි. රූපාදිය ආත්මවශයෙන් හෝ නිත්‍යසුඛාදි වශයෙන් දැකීම දිට්ඨිසමනුපස්සනා යි. (දෘෂ්ටිවශයෙන් වරදවා දැකීම යි.) රූපාදීන් අනිත්‍යාදි විසින් ඇති සැටියෙන් දැක්ම ඥාණසමනුපස්සනා (නුවණින් දැකීම) යි.

**අවිජ්ජානීවරණං** (අවිද්‍යානීවරණය) - චතුස්සත්‍යය තථාවාකාරයෙන් අවබොධ නොකිරීම අවිද්‍යා යි. චක්ෂුර්විඥානාදීන්ගේ යථාතත්ත්වය, ප්‍රතීත්‍ය-සමුත්පාද ප්‍රතීත්‍යසමුත්පන්න ධර්ම සිතට ප්‍රකට වනු නොදී වසාලන බැවින් අවිද්‍යාව නීවරණයෙකි. නීවරණ නම් වැස්ම යි. තව ද නිවන් දොර වසා **ලන කරුණින් ද** අවිද්‍යාව නීවරණ නම්.

1. 2. 5.

**සංයොජන** - එය ඇත්තහු දුක් හා එකට යොදා ලන හෝ කර්මය විපාකයන් හා යොදා ලන හෝ, භව යොනි ගති විඥානස්ථිති සත්ත්වාවාසයන් අන්‍යභවයොනිගතිආදීන් හා යොදාලන (සම්බන්ධ කැරැ ලන) දෑග සංයොජන යි. සත්ත්වයන් සසරැ බැඳ ලන කෙලෙස් ය. තෘෂ්ණාව ම සංයොජන වූයේ තෘෂ්ණාසංයොජන නම්.

**අනාදනො** (උපාදාන රහිත වූයේ) - සතර උපාදාන අතුරෙන් එකකුදු නැත්තේ. තව ද **ආදාන** යනු මත්තෙහි පිළිසිඳැ ගැන්ම යි. එය නැතියේ අනාදාන යි.

1. 2 8.

**වග්ගාරාමො** (ව්‍යග්‍රාරාම වූ)- සමග්ග (සං-අග්ග) භාවයට, සමගියට විරුද්ධ වූයේ වග්ග (වි - අග්ග) භාවය යි, ව්‍යග්‍ර බව යි. එනම් භෙදය යි ව්‍යග්‍රාරාම යනු භෙදයට කැමැති යන අරුත්හි වෙයි.

1. 3. 2.

**සුඛස්සෙතං ... අධිවචනං යදිදං පුඤ්ඤානං** (පින් යන මෙය ... සැපයට නමෙකි)-මෙහි පින් යනුයෙන් ලෞකික කුසල් දැක්විණ. ඵලය වූ සැපයේ නම. එයට කාරණ වූ පිනට නමක් වශයෙන් අභෙදොපචාරයෙන් මෙහි කියන ලදි.

**සංවට්ටවිවට්ටකප්පෙ** (සංවර්තවිවර්තකල්ප) - සංවර්තකල්ප යනු වැනසෙන ලොකය යි. විවර්තකල්ප යනු හැදෙන ලොකය යි. ලොව නැසී යෑම සංවර්ත නම්. නැසී එසේ ම පවත්නේ සංවර්තස්ථායී යැ. ලොව නැසී තිබී යළි ඇති වීම විවර්ත නම්. එසේ ඇති වැ පවත්නේ විවර්තස්ථායී නම්. මෙහි සංවර්ත සංවර්තස්ථායී දෙක ම සංවර්ත යන්නෙන් ද විවර්ත-විවර්තස්ථායී දෙක ම විවර්ත යන්නෙන් ද ගැනිණ. මෙහි **කල්ප** යනු ලොකය යැ.

**අබ්‍යාපජ්ඣං සුඛං ලොකං** (දුක් රහිත වූ බ්‍රහ්මලොකයට) - කාමච්ඡන්ද ආදි ව්‍යාබාධ නැති (දුක් නැති), ධ්‍යානසමාපත්ති වශයෙන් සැප බහුල වූ බඹලොවට.

1. 3. 8.

**අප්පමාදෙ** (අප්‍රමාදය, සිහිය එළැවීම) - දුසිරිත්හි ද පස්කම්සැපයෙහි ද සිත යෙදීම, කුසල්හි සිත නොයෙදීම ප්‍රමාද නම්. එයට විරුද්ධ වූ එළැඹැ සිටි සිහි ඇති බව අප්‍රමාද නම්.

2 1. 1

**ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාය ච** (ඉන්ද්‍රියවිෂයයෙහි අසංවර බැවිනුත්.)- චක්ෂුරාදි ඉන්ද්‍රිය සයෙහි නොවැසූ දොර ඇති බැවිනුත් මෙයින් ඉන්ද්‍රියසංවරය නැති බව කියැවිණ.

**භොජනෙ ච අමත්තඤ්ඤුතාය** (අහරෙහි පමණ නොදන්නා බැවිනුත්)- පිළිගැන්මේ පමණ දැන්ම, පරිභොගයේ පමණ දැන්ම යැ යි පමණ දැනීම ද්විවිධ ය.

2. 1. 5

**පාපකෙන ච සීලෙන** (ලාමක වූ ශීලයෙන් ද) - ලාමක වූ ශීලය නම්: දුස්සීල බව ය. සිල් නැති බව ය. කායදුශ්චරිත වාග්දුශ්චරිත මිථ්‍යාජීව යන තුන ය.

2 2. 1.

**ඛෙමො විතක්කො** (ක්ෂෙම විතර්කය) - අව්‍යාපාදවිතර්ක අවිහිංසාවිතර්ක යන දෙක ක්ෂෙමවිතර්ක නම්.

**පවිවෙකො** (ප්‍රවිවෙක විතර්කය) - මේ නෛෂ්ක්‍රම්‍යවිතර්කය යි. මෙහි බලයෙන් කායවිවෙක චිත්තවිවෙක උපධිවිවෙක යන ත්‍රිවිධ විවෙකය ද, තදඞ්ගවිවෙක විෂ්කම්භණවිවෙක සමුච්ඡෙදවිවෙක පටිප්පස්සද්ධිවිවෙක නිස්සරණවිවෙක ද යන පංචවිවෙකය ම සම්පූර්ණ බවට යෙයි.

### 2. 2. 8.

**අවිජ්ජා** ... **පුබ්බඞ්ගමා** ... (අවිද්‍යාව පෙරටු වන්නීය )– සහජාත-වශයෙන් ද උපනිඃශ්‍රය වශයෙන් ද යන දෙ අයුරින් අකුශලයනට අවිද්‍යාව පුරඃසර (ප්‍රධාන) වේ. අවිද්‍යායෙන් තොර වූ අකුසලයෙක් නො පහළ වේ.

### 3. 1. 2

**ධාතුයො** (ධාතුහු) – තමන්ගේ ඵලය, තමාගේ සවභාවය දරන්නා යනු ධාතු යන්නේ අර්ථය යි. මෙහි රූපධාතු යනු රූපභවය යි. රූපාවචර ධර්මයෝ යි.) අරූපධාතු නම් අරූපභවය යි. (අරූපාවචර ධර්ම යි). නිරොධධාතු යනු නිවන යි. අන් නය ක්‍රමයෙකින් රූපධාතු යනු සියලු කාමභවය යි. අරූපධාතු යනු අරූපභවය යි. නිරොධධාතු යනු නිවණ යි. මෙහි මාර්ග-ඵලයෝ මේ තුනට ම නො ඇතුළත්හ. (ත්‍රිකවිනිර්මුක්ත හ).

**රූපධාතුං පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා** (රූපභවය පිරිසිඳ දැන අරූපභවයෙහි නො පිහිටියාහු) – රූපාවචරධර්ම ඤාතපරිඤ්ඤාදි තුන් තුන් පරිඥායෙන් පිරිසිඳ දැන, අරූපාවචර ධර්ම ද එසේ ම පිරිසිඳ දැන භවරාගයෙනුත් භවදෘෂ්ටිවශයෙනුත් එහි නො පිහිටියෝ වැ නො-ඇලුණෝ වැ.

### 3. 1. 4.

**සම්මාමානාභිසමයා**(මනා කොට මානයාගේ දර්ශනප්‍රහාණාභිසමයයෙන්)- රහත්මගනුවණින් මානය දක්නා ලැබේ. මේ රහත්මාර්ගයාගේ දර්ශනාභිසමය නම්. රහත්මගනුවණින් දක්නා ලද කෙණෙහි ම මානය ප්‍රහීණ වේ. මේ එහි ප්‍රහාණාභිසමය යි. දෘෂ්ටවිෂ සර්පයා විසින් දක්නා ලදහුගේ ජීවිතය මෙනි. සප් තෙම ඔහු දකී. දැකීමෙන් ම විෂ පැතිරී යැමෙන් දක්නා ලද පුරුෂයා නැසෙයි. රහත්මගින් වන දර්ශනාභිසමය ප්‍රහාණාභිසමය දෙකත් එමෙන් ම එක් කෙණෙහි ම වේ.

**අභිඤ්ඤාවොසිතො** (විශිෂ්ටඥානයෙන් දැන නිමවන ලද කෘත්‍ය ඇති)- මෙහි විශිෂ්ටඥාන යනු ෂඩභිඥා යි. වෙදනාමුඛයෙන් චතුස්සත්‍යකර්මස්ථානය වඩා ෂඩභිඥායෙන් අවසානයට පැමිණී, කර නිමවන ලද මාර්ගකෘත්‍ය ඇති.

### 3. 1. 5

**කාමෙසනා** (කාමය පිළිබඳ සෙවීම)– කාමෙසනා යනු කාමරාගය යි.

**භවෙසනා** (භවය පිළිබඳ සෙවීම) – භවෙසනා යනු භවරාගය යි, රූපාරූපභවයන් පැතීම යි.

**බ්‍රහ්මචරියෙසනා** (බඹසර පිළිබඳ සෙවීම)– මෙහි බ්‍රහ්මචරිය (බඹසර, යනු දිට්ඨිබ්‍රහ්මචරියය යි. එනම් අන්තග්‍රාහික මිසදිටුවත් එය හා එක් වැ සිටි අකුසල් වූ කායවාග්මනඃකර්ම යි.

**එසනානං ඛයා** (පර්යේෂණයන් ක්ෂය කිරීමෙන්) – බ්‍රහ්මචරියෙසනාව (මිසදිටුව) සොවාන්මගින් නැසේ. කාමෙසනාව අනාගාමි මාර්ගයෙන් නැසේ භවෙසනාව රහත්මගින් නැසේ. මෙසේ එෂණාවන් ක්ෂීණ කිරීමෙන්.

## 3. 1. 7.

**කාමාසවො** (කාමාස්‍රවය)- කාමාස්‍රව නම් කාමරාගය යි. රූපශබ්ද ආදිය කෙරෙහි ඇල්ම ද කාමාස්‍රව නම්.

**භවාසවො** (භවාස්‍රවය)-රූපාරූපභව කෙරෙහි ඇල්ම, ධ්‍යානනිකාන්තිය, ශාශ්වතදෘෂ්ටිසහගත රාගය, භවය පැතීම යන මේ හැම භවාස්‍රව නම්.

**අවිජ්ජාසවො** (අවිද්‍යාස්‍රවය) - අවිද්‍යාව ම අවිද්‍යාස්‍රව නම්.

**ආසවානං ච සම්භවං** (ආස්‍රවයන්ගේ සම්භවය ද) - ආස්‍රව හටගන්නට හෙතුව මෙයින් කියන ලදි. අයොනිසොමනසිකාරයද අවිද්‍යාදි කෙලෙස් ද ආස්‍රව හටගැන්මට කාරණ යි.

**මග්ගං ච ඛයගාමිනං** (නිර්වාණගාමිමාර්ගය ද) - මෙයින් ආස්‍රවක්ෂයගාමී ආර්‍යමාර්ගය දක්විණ. එහි ද අනාගාමිමාර්ගයෙන් කාමාස්‍රවය ක්ෂීණ වේ. රහත්මගින් භවාස්‍රවය ද අවිද්‍යාස්‍රවය ද ක්ෂීණ වෙත්. කාමූපාදානය මෙන් කාමාස්‍රවය ද රහත්මගින් නැසේ යැ යි ඇතැම්හු කියත්.

## 3. 1. 8

**කාමතණ්හා** (කාමතෘෂ්ණා) - පංචකාමගුණිකරාගය කාමතෘෂ්ණා නම්. **භවතණ්හා** (භවතෘෂ්ණා)- රූපාරූපභවයන්හි ඡන්දරාගය ද ධ්‍යානනිකාන්තිය ද, ශාශ්වතදෘෂ්ටිසහගත රාගය ද භවප්‍රාර්ථනාව ද භවතෘෂ්ණා නම්.

**විභවතණ්හා**(විභවතෘෂ්ණා)-උච්ඡෙදදෘෂ්ටිසහගත රාගය විභවතෘෂ්ණා යි.

## 3. 1. 9.

**යොගයුත්තා මාරස්ස** (මාරයාගේ මාරපාශ සංඛ්‍යාත යොගයෙන් බැඳුණාහු) - මෙහි **මාරයොග** යනු ද **මාරපාශ** යනු ද රාගය යි.

**අයොගක්ඛෙමිනො ජනා** (සංසාරගතසත්ත්වයෝ) - නිවන ද රහත්බව ද යන දෙක යොගක්ෂෙම නම්. එය නො ලද්දවෝ අයොගක්ෂෙමීහු ය. එ නම්: සංසාරගතසත්ත්වයෝ යැ.

## 3. 1. 10.

**අසෙක්ඛන** (අශෛක්‍ෂ වූ) - රහත් බව පිණිස හික්මෙන්නෝ (පිළිවෙත් පුරන්නෝ) හෙවත් සොතාපත්තිමග්ගට්ඨාදි සත් ආර්‍යපුද්ගලයෝ ශෛක්‍ෂ නම් වෙති. ශික්‍ෂාව අවසන් කළ, මත්තෙහි හික්මියැ යුත්තක් නැතියෝ හෙවත් රහත්ඵලයට පැමිණියෝ අශෛක්‍ෂ නම් වෙති. රහත්ඵල-සිත්හි වූ සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන ඵලාඞ්ග තුන අශෛක්‍ෂශීල නම්. එහි ම වූ සම්මාවායාම සම්මාසති සම්මාසමාධි තුන අශෛක්‍ෂසමාධි නම් වේ. එහි ම වූ සම්මාදිට්ඨි සම්මාසංකප්ප දෙක අශෛක්‍ෂප්‍රඥා නම් වේ.

### 3. 2. 1.

**පුඤ්ඤකිරියවත්ථූනි** (පුණ්‍යක්‍රියාවාස්තු)- පුජ්ජභාවඵලං නිබ්බත්තෙන්තානි අත්තනො සන්තානං පුනන්තීති වා පුඤ්ඤානි. පූජ්‍යභාවය නැමැති ඵලය නිපදවන්නෝ යන අරුතින් ද, තමන් චිත්තසන්තානය පිරිසිදු කරන්නෝ යන අරුතින් ද පුඤ්ඤ (පින්) නම් වෙති. ඒ පින්හු ම කටයුතු දෑ නු යි. පුඤ්ඤක්‍රියා නම් වෙති. ඒ පුණ්‍යක්‍රියාවෝ ම ඒ ඒ ආනිසංසයනට වාස්තු වෙත් නු යි පුණ්‍යක්‍රියාවාස්තු නම් වෙත්.

### 3. 2. 2.

**දිබ්බචක්ඛු** (දිවැස) - දෙවතාවනට පෙර අත්බව්හි කළ සුචරිත කර්මයන්ගේ ඵලවශයෙන් පහළ වූ පිත් සෙම් ලේ ආදියෙන් සම්බාධ නැති බැවින් බොහෝ දුරු අරමුණු ද දක්නා සමත් වූ දිව්‍යප්‍රසාදචක්ෂුස දිවැස නම්. භාවනා බලයෙන් පහළ වන මේ නුවණැසත් ඒ දිවැස බඳු බැවින් **දිවැස** යන නම ලබයි:

**පඤ්ඤාචක්ඛු** (පැනැස)- ආස්‍රවක්ෂයඥානය පැනැස නම්.

### 3. 2. 3.

**ඉන්ද්‍රියානි** (ඉන්ද්‍රියයෝ) - තමන් හා එක් වැ උපදනා ධර්මයන්හි අධිපතිවූ ප්‍රඥාව මෙහි ඉන්ද්‍රිය නම්.

**අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය** (සෝවාන්මඟැ නුවණ) - අනඤ්ඤාතං (පෙර නො දන්නා ලද නිවන) ඤස්සාමි ඉති (දැන ගන්නෙමි. යි) පිළිපන් තැනැත්තාට මේ පූර්ව අවස්ථායෙහි ම උපන් නුවණ-සෝවාන් මඟැ වූ ප්‍රඥාව.

**අඤ්ඤින්ද්‍රියං** (සෝවන් පෙලෙහි පටන් සතැනෙක පවත්නා නුවණ)- අඤ්ඤ යනු පළමු මඟ නුවණින් දුටු සීමාව නො ඉක්මැ දන්නා නුවණ යි. අඤ්ඤින්ද්‍රිය යනු සෝවාන් පල නුවණ පටන් ඉදිරි මාර්ගඵල සයෙහි වූ නුවණ යි

**අඤ්ඤාතාවින්ද්‍රියං** (රහත්පල නුවණ)- අඤ්ඤාතාවී යනු දැන අවසන් කළ තැනැත්තේ යි. එ නම් රහත්පලයට පැමිණි තැනැත්තේ ය. ඔහුගේ රහත්-පල නුවණ අඤ්ඤාතාවින්ද්‍රිය නම්.

### 3. 2. 4.

**අක්ඛෙය්‍යසඤ්ඤිනො** (පංචස්කන්ධයන්හි සත්ත්වපුද්ගලාදි සංඥා ඇත්තාහු)- අක්ඛෙය්‍ය (ආඛ්‍යෙය) යනු කියැයුත්ත කියනු ලබන දෑ යන අරුත්හි යෙදේ. කියනු ලබන දෑ හෙවත් කථාවට වස්තු වනුයේ අතීත හෝ වර්තමාන හෝ අනාගත හෝ රූපාදි ස්කන්ධ යි. එබැවින් අක්ඛෙය්‍ය යනු ස්කන්ධපස යි. එය මම ය, මාගේ ය, හේ දෙවියෙක් ය, මිනිසෙක් ය. යන ආදීන් හඳුනනුයේ අක්ඛෙය්‍යසඤ්ඤී නම.

**අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා** (පංචස්කන්ධයෙහි පිහිටියාහු)- තෘෂ්ණාදෘෂ්ටි ග්‍රාහවශයෙන් පඤ්චස්කන්ධයෙහි පිහිටියාහු නොහොත් රාගාදි වශයෙන් එහි පිහිටියාහු,

### 3. 2. 8.

**කායමොනෙය්‍යං**(කාය මොනෙය්‍ය ය)-ත්‍රිවිධකායදුශ්චරිත දුරුලීම ද,ත්‍රිවිධ කායසුචරිතය ද, කය අරමුණු කොට උපන් නුවණ ද, කය ඤාතපරිඤ්ඤා-දීන් පිරිසිඳ දැන්ම ද, කායපරිඤ්ඤාසහගත ආර්‍ය්‍යමාර්ගය ද, කයෙහි ඡන්දරාගය දුරු ලීම ද, කායසංස්කාර නිරොධය වූ, චතුර්ථධ්‍යානසමාපත්තිය ද යන මේ හැම **කායමොනෙය්‍ය** නම්. සතර වාග්දුශ්චරිත දුරු ලීම ද, සතර වාක්-සුචරිතය ද, වචන අරමුණෙහි නුවණ ද, වචනය ඤාතපරිඤ්ඤාදීන් පිරිසිඳ දැන්ම ද, වාචාපරිඤ්ඤා සහගත මාර්ගය ද, වචනයෙහි ඡන්දරාගප්‍රහාණය ද, වචීසංඛාර නිරොධය වූ ද්විතීයධ්‍යාන සමාපත්ති ද යන මේ හැම **වචීමොනෙය්‍ය** නම්. තුන් මනොදුශ්චරිත දුරු ලීම ද, ත්‍රිවිධ මනස්සුචරිතය ද, මනස් අරමුණෙහි නුවණ ද, මනස ඤාතපරිඤ්ඤාදීන් පිරිසිඳිනා නුවණ ද, මනො-පරිඤ්ඤාසහගත මාර්ගය ද, මනසෙහි ඡන්දරාග ප්‍රහාණය ද, චිත්තසංඛාර නිරොධය වූ නිරොධසමාපත්තිය ද යන මේ හැම **මනොමොනෙය්‍ය** නම්.

### 3. 3. 10.

**සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති** (ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පිරිහීම පිණිස පවතිත්.) – සෝවාන් ආදි ශෛක්‍ෂ පුද්ගලයන් ලැබූ මාර්ගයට පිරිහීමෙක් නො වේ. ලබා ඇති මාර්ගයෙන් මත්තෙහි මාර්ග ලැබීමට උවදුරු වැ සිටීම මෙහි කියන ලදී.

### 3. 5. 9.

**ආමිසදානං** (ආමිසදානය) – සතර පසය **ආමිසදාන** නම.

**ධම්මදානං** (ධර්මදානය) – දහම් දෙසීම ධර්මදාන නම.

### 4. 1. 12.

**සම්පන්නපාතිමොක්ඛා** (ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් යුක්ත ව) – ප්‍රාති-මොක්‍ෂසංවර යනු භික්‍ෂූන්ගේ ශික්‍ෂාපදශීලය යි.

**ආචාර ගොචරසම්පන්න.** (ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත ව)- කුලයන්ගේ සිත් ගැන්ම පිණිස හුණපත් දීම් ආදි මිථ්‍යා ආජීවයෙන් වැළැක්ම, කායිකවාචසික දුශ්චරිතයෙන් වැළැක්ම ආචාර නම්. වෛශ්‍යානිවාසාදී නො-සුදුසු තැන්වලට නොගොස් සැදැහැවත් කුලයන් ඇසුරු කිරීම ගොචර නම්.

නිමි

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධමමපදපාළි - උදානපාළි - ඉතිවුතතකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR

## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第二十八冊》
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
1,000 copies; January 2013
SR228 - 11256